# සද්ධර්මරත්නාකරය

පලාබද්දල වනවාසී ධර්මකීර්ති පරම්පරානුගත

පූජ්‍ය පාද

## ධර්මදින්නාචාර්ය්‍ය විමලකීර්ති

මහා ස්වාමීන් වහන්සේ විසින්

විරචිතයි.

කොළොන්නාවේ මහා විහාරාධිපති

සුගුණසාරාභිධාන ස්ථවිරපාදයන්

වහන්සේ විසින්

ලබ්ධ ශෝධ්‍යාපහරණයෙන්

සංස්කෘතයි.

හෝමාගම

ඩී. සී. වික්‍රමසිංහ අප්පුහාමි

— සහ —

ඩී. ජ. වික්‍රමසිංහ අප්පුහාමි

විසින්

විද්‍යාප්‍රකාශ යන්ත්‍රාලයෙහි

මුද්‍රිතයි.

1923.

# සද්ධර්මරත්නාකරය

පලාබත්ගල වනවාසි ධර්මකීර්ති පරම්පරානුයාත

පූජ්‍ය පාද

## ධර්මදින්නාචාර්ය්‍ය විමලකීර්ති

මහා ස්වාමීන් වහන්සේ විසින්

විරචිතයි.

---

කොලොන්නාවේ මහා විහාරාධිපති

**සුගුණසාරාභිධාන ස්ථවිරපාදයන්**

**වහන්සේ විසින්**

ලේඛක දෝෂාපහරණයෙන්

සංස්කෘතයි.

---


හෝමාගම

ඩී. සී. වික්‍රමසිංහ අප්පුහාමි

— සහ —

ඩී. ජ. වික්‍රමසිංහ අප්පුහාමි

විසින්

විද්‍යාර්ථප්‍රකාශ යන්ත්‍රාලයෙහි

මුද්‍රාංකිතයි.

1923.



පොත් වෙළෙඳශාලාව

# විඥප්ති.

‘**සද්ධර්මා එව රතනානි=සද්ධර්මරතනානි; තෙෂාමාකරඃ=සද්ධර්ම රතනාකරඃ**; සද්ධර්ම නමැති රතනයන්ට උප්පත්ති ස්ථානය වැනි නුයි. අන්වර්ථසංඥ විසින් සද්ධර්මරත්නාකර නම්ලද අනගි ධර්ම ප්‍රකරණයක්වූ මේ ග්‍රන්ථරත්නය වනාහි ශ්‍රී බුද්ධ වර්ෂ එක්වාදහස් නවසිය තෙපනස් වන්නෙහි ලක්දිව් රජ පැමිණි **ජයවර්ධනපුර** අග්‍රරාජධානි කොටගෙන විසූ සවැනි **පරාක්‍රමබාහු මහරජාණන්ට** සත්වනුයෙහි, මහාවිහාර පරම්පරායෙන් අසංභින්නව පැවතවුන් මොබ්බෙහි පලාබත්ගල වනවාසී පරම්පරායයි නාමාන්තරයකින් මුළුලක්දිව්හි හිරු සඳු සෙයින් ප්‍රසිද්ධියටපත් සෞශීල්‍යාදීවූ ගුණභූෂණ විභූෂිත “**ධම්මාදින්නාචරිය විමලකිත්ති**” මහා ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ විසින් බුදුබැව් පතා කරනලද්දකි.

මේ ධර්ම ප්‍රකරණයාගේ නිර්මාණ කාලය, ශ්‍රී බුද්ධ වර්ෂ එක්දහස් නවසිය එකුන්සාලිස් වන්නෙහි ද්විතීය ධර්මකීර්ති මහා ස්වාමිපාදයන්ගේ ප්‍රධානත්වයෙන් මෙණවර **වීරබාහු මහරජාණන්** විසින් දුඃශීලමල පහකොට කරනලද ශාසන ශුද්ධිය හෙතුකොටගෙන බුද්ධශාසනයාගේ අතිශය දියුණුව ඉසිලුයේය.–එසේම දෙමළ යොනකාදී පරසතුරු වියවුලින් කලක් දුර්වලව පැවැති ලංකා රාජ්‍යය එම සතුරු වියවුල් සංසිඳුවාලීමෙන් නිෂ්කලඞ්කවූද එසේම මෙම **ශ්‍රී සංඝබෝධි ශ්‍රී පරාක්‍රමබාහු මහරජාණන්** විසින් කරනලද ශාසන වර්ධනයෙන්ද, ධනසමෘද්ධියෙන්ද, ශාස්ත්‍ර දියුණුවෙන්ද සිංහල ජාතිය අතිශයින් දියුණුව පැවැති කාලයකි.

මේ කාලයෙහි **පැරකුම්බා මහරජු** විසින් අනෙකවිධ සත්කාර සම්මානයෙන් සම්භාවිතවූ සුරක්ෂිත ගෘහස්ථ ප්‍රව්‍රජිත පණ්ඩිත රත්නයන් විසින් නිපදවනලද කාව්‍යශෙඛර ලෝවැඩ සඟරා පඤ්චිකාප්‍රදීප වෘත්තරත්නාකර පඤ්චිකාදි ග්‍රන්ථයෝ පණ්ඩිත ජනයන්ට මනඃප්‍රසාද එලවමින් ශාස්ත්‍රාභිලාෂීන්ට ශ්‍රෙයස්කරව පවත්නාහු එදවස පැවති ශාස්ත්‍රෝන්නතිය ස්වභාෂාවගේ සර්වාඞ්ග සම්පූර්ණව පැවති ශාස්ත්‍රීයත්වයද විචාරක්ෂමයන්ට මැනවින් ප්‍රකාශ කෙරෙත්මැයි වෙසෙසින් මේ වනාහි ලක්දිව්හි ශාස්ත්‍ර දියුණුව පිළිබඳ කාලයන් අතුරෙන් තොටගමුකාලයයි ප්‍රසිද්ධවූද **විජයබා පිරුවන** වැනි ආශ්චර්යශ්‍රීමත් විශ්ව විද්‍යාල සමූහයෙන් හෙබියාවූද කාලයයි. මෙකල සිංහල භාෂාව පවා කෙතරම් ශාස්ත්‍රීය ක්‍රමානුකූලව කෙතරම් ප්‍රවෙසමකින් ව්‍යවහාර කරනු ලැබීද යනු කාව්‍යශෙඛරය සැලලිහිණි අස්න ආදියෙහි පැණෙන අක්ෂර වින්‍යාසයෙන්ම සූක්ෂම බුද්ධිමත්හු දනිත්මැයි.

මෙහි කර්තෲවූ **විමලකීර්ති** මහා ස්වාමිපාදයන් වහන්සේ ධර්මකථා ප්‍රබන්ධන පැදවීමෙහි දත්තාභිෂෙකවූ පලාබත්ගල පරම්පරාවට අයත් සාතිශය පාණ්ඩිත්‍යයෙන් හා බොධිසත්ව චරිතශ්‍රීන් විරාජමානවූ ආශ්චර්ය පණ්ඩිත රත්නයකි.

# සද්ධර්මරත්නාකරය

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

මහාකාරුණිකං නාථං ධම්මං තෙන සුදෙසිතං
නත්වා අරියසඞ්ඝංච දක්ඛිණෙය්‍යං නිරඞ්ගණං

යන මේගාථාව ස්වර්ග මර්ත්‍ය පාතාලසඞ්ඛ්‍යාත භුවනත්‍රයවාසීන්ට අභිමතාර්ථසිද්ධියෙහිතත්පරවූ රත්නත්‍රයශරණපරායනසත්පුරුෂ ජනයන්ට වැඩපිණිස කරුණා පූර්වඞ්ගමවූ නිශ්ශරණාධ්‍යාසයෙන් ධර්මයක් කියනුකැමතිවූ පූර්වාචාර්ය්‍යන්වහන්සේවිසින් ප්‍රකරණාරම්භ යෙහි පරිච්ඡෙදනන්තවිස්තාරායාමයෙන් තුන්දැස් අටසිය සත ළිස් අඟුලක් පමණවූ භූමිප්‍රදෙශයෙක්හි ප්‍රස්තාර කටයුතුවූ සර්ව ගුරුවෘත්ත එකක්හා එකක් ගුරු සතක් ලඝුවෘත්ත අටක් හා දෙකක් ගුරු සයක් ලඝුවෘත්ත විසිඅටක් හා තුණක් ගුරු පසක් ලඝුවෘත්ත පණස්සයක්හා සතරක් ගුරු සතරක් ලඝුවෘත්ත සැත් තෑවක් හා පසක් ගුරු තුණක් ලඝුවෘත්ත පණස්සයක් හා සයක් ගුරු දෙකක් ලඝුවෘත්ත විසිඅටක් හා සතක් ගුරු එකක් ලඝු වෘත්ත අටක් හා සර්වලඝුවෘත්ත එකක් ඇතුළුව දෙසියසපණසක් වෘත්ත ඇති අනුෂ්ටුප් නම් ඡන්දසෙහි සවිසිවන තැනින් පළමු වන පාදය හා අසූනවවන තැනින් දෙවන පාදය හා එක්සිය සත්පණස්වන තැනින් තුන්වන පාදය හා අසූ තුන්වන තැනින් සතරවන පාදය හා මේ ගාථාවෙහි පාදසතර සජාත චතුඃස්ථා නයකින් උගුළුවා ගෙණ ඕරුවර්ත්ත අඞ්සම වෘත්තයට නගා— යගණ සගණ ගුරුළුයකින් පළමුවන විෂමපාදය හා මගණ සගණ ලඝුගුරකින් දෙවන සමපාදයහා තගණ සගණ ගුරුලඝුව කින් තුන්වන විෂමපාදයහා රගණදෙකක්හාලඝුගුරකින් සතර වන සමපාදය ඇතුළුවූ මේ සතරපාදය ලඝුවක් ගුරක් අධිකාවූ

මුන්වහන්සේ ගඩලාදෙණියෙහි විසූ බාලාවතාර ව්‍යාඛ්‍යාදී ප්‍රශස්ත ග්‍රන්ථනිපදවීමෙහි ප්‍රසිද්ධ ග්‍රන්ථ කර්තෘවරයෙකු ලෙස සම්භාවිතවූද කාලෙක ලංකා ශාසන ශ්‍රී භාරධාරී සංඝරාජ මහා ස්වාමිවූද මෙසේම බුද්ධත්වය පතාහුදු නිශ්ශාරණාධ්‍යාශය පෙරටුකොට ගෙන ශ්‍රද්ධාබුද්ධි වර්ධනොපාය ධර්මප්‍රකරණ නිපැදවීමෙන් විශුද්ධ බුද්ධාංකුරවූද විතිය **ධර්මකීර්ති** මහා ස්වාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යයාණ කෙනෙකි.

එ මේ ධර්මප්‍රකරණය කරනලද්දේ චොළිය බුද්ධප්පිය මහා ස්වාමිපාදයන් වහන්සේගේ ශිෂ්‍යවූ **සිද්ධාර්ථාභිධාන** මහා ස්වාමි පාදයන්වහන්සේගේ **සාරසංග්‍රහ** නම් ධර්මප්‍රකරණය ආශ්‍රයකර ගෙනැයි.

එතෙකුදුවූවත් එහි සංගෘහිත සමහර කරුණු මෙහිනොදැක්වීමද අසංගෘහිතවූත් සමහර කරුණු දැක්වීමද පැණේ.

එසේම මෙය සතිස්පරිච්ඡේදයකින් පරිච්ඡින්නවිය. බුද්ධ ධර්මයෙහි මනාපටුත්වයක් බලාපොරොත්තුවන සියලු බෞද්ධයන් විසින්ම මැනවැයි පරිශීලනය කටයුතු අගනා ධර්මෝපදේශයන් ගෙන් පරිපූර්ණයැ භාෂාවද සිලුටුයැ දුර්බෝධස්ථාන ඇතද බොහෝ නොවෙති.

වෙසෙසින්ම මෙය ලක්දිව්හි ධර්මදෙශක භික්ෂූන්වහන්සේලා විසින් හස්ත සාරයක් වශයෙන්ද පාළි නූගත් ශ්‍රද්ධාවතුන් විශිෂ්ට ධර්මපුස්තකයක් වශයෙන්ද බොහෝකලක සිට භාවිත කරගෙනැ එනුලැබේ. එසේහෙයින් මෙය සුලභකරදීම ලොකශාසන සංග්‍රහයකැයි සලකා මේ ධර්මප්‍රකරණය මුද්‍රණයකරවනු කැමතිවූ **ඩී. සී. වික්‍රමසිංහ, ඩී. ජ්. වික්‍රමසිංහ** යන භවතුන් විසින් අප වෙත කරනලද ආරාධනාව පිළිගෙන පුරාණ පොත් කීපයක්ද සසඳා බලා ලෙඛකදොෂ පහරණයෙන් සකස්කෙළෙමු. අපගේ මේ සංස්කරණයෙහිදී පළමු මුද්‍රිත පිටපතද අතිශයොපකාරීවූ බැවි ස්තුති පුරස්සරව මතක්කරමු.

තවද මෙහි සංසයස්ථාන කීපයක් දක්නාලද නමුත් බෙහෙවින් පොත්හි පැණෙනසේ තැබීමු. කෙසේවුවත් නොවරදින සුලුවූ පෘථක්ජනයෙක් ලෙව්හි කිසිකලෙකත් නොලැබෙන නිසා අපගේ මේ සංස්කරණයෙහිද ප්‍රමාද භ්‍රමාදීන් ජනිත යම් කිසි සදොෂස්ථාන අවිද්‍යමානයයි නොකියහැකි. එසේ වීනම් බුද්ධිමත් සමාහිසීලී සජ්ජනයො විමංසනයෙන් ශොධනය කරෙත්වා.

මේවගට,
කොලොන්නාවේ විහාරාධිපති,
**සුගුණසාර ස්ථවිරශ්‍රෙෂ්ඨ.**
K. Suganasara.

# සද්ධර්මරත්නාකරය

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

මහාකාරුණිකං නාථං ධම්මං තෙන සුදෙසිතං
නත්වා අරියසඞ්ඝංච දක්ඛිණෙය්‍යං නිරඞ්ගණං

යන මේගාථාව ස්වර්ග මර්ත්‍ය පාතාලසඞ්ඛ්‍යාත භුවනත්‍රයවාසීන්ට අභිමතාර්ථසිද්ධියෙහිතත්පරවූ රත්නත්‍රයශරණපරායනසත්පුරුෂ ජනයන්ට වැඩපිණිස කාරුණා පූර්ණහෘදයවූ නිශ්ශරණාධ්‍යාසයෙන් ධර්මයක් කියනුකැමතිවූ පූර්වාචාර්‍ය්‍යන්වහන්සේවිසින්ප්‍රකරණාරම්භ යෙහි පරිච්ඡෙදනනවිස්තාරායාමයෙන් තුන්දස් අටසිය සත ළිස් අඟුලක් පමණවූ භූමිප්‍රදෙශයෙක්හි ප්‍රස්තාර කටයුතුවූ සර්ව ගුරුවෘත්ත එකක්හා එකක් ගුරු සතක් ලඝුවෘත්ත අටක් හා දෙකක් ගුරු සයක් ලඝුවෘත්ත විසිඅටක් හා තුණක් ගුරු පසක් ලඝුවෘත්ත පණස්සයක්හා සතරක් ගුරු සතරක් ලඝුවෘත්ත සැත් තෑවක් හා පසක් ගුරු තුණක් ලඝුවෘත්ත පණස්සයක් හා සයක් ගුරු දෙකක් ලඝුවෘත්ත විසිඅටක් හා සතක් ගුරු එකක් ලඝු වෘත්ත අටක් හා සර්වලඝුවෘත්ත එකක් ඇතුළුව දෙසියසපණසක් වෘත්ත ඇති අනුෂ්ටුප් නම් ඡන්දසෙහි සව්සිවන තැනින් පළමු වන පාදය හා අසූනවවන තැනින් දෙවන පාදය හා එක්සිය සත්පණස්වන තැනින් තුන්වන පාදය හා අසූ තුන්වන තැනින් සතරවන පාදය හා මේ ගාථාවෙහි පාදසතර සජාත චතුඃස්ථා නයකින් උගුළුවා ගෙණ පිරුවත්ත අර්ධසම වෘත්තයට නහා— යගණ සගණ ගුරුවයකින් පළමුවන විෂමපාදය හා මගණ සගණ ලඝුගුරකින් දෙවන සමපාදයහා තගණ සගණ ගුරුලඝුව කින් තුන්වන විෂමපාදයහා රගණදෙසාක්හාලඝුගුරකින් සතර වන සමපාදය ඇතුළුවූ මේ සතරපාදය ලඝුවක් ගුරක් අධිකාවූ

ගණ දශයකින්ද අකුරු දෙතිසකින්ද මාත්‍රා එක්පණසකින්ද ගුරු දශනවයකින්ද ලඝු දශතුනකින්ද විශ්‍රාම සතරකින්දැයි මෙසේ වර්ණවිශෙෂයෙන් මිශ්‍රවූ—අසම ගණ අසම වර්ණ අසම මාත්‍රා අසම ගුරු අසම ලඝු අසම විශ්‍රාමවූ සම විෂම පාද සතරක් සම්බන්ධකොට පථ්‍යාවක්ත්‍ර වෘත්තයෙන් රචනාකළාවූ මේ ගාථාවෙන් කෙවලනමස්කාරය ගර්විත නමස්කාරය කෙවල ගර්විතනමස්කාරය ස්වවිෂයනමස්කාර පරවිෂය නමස්කාරයයි කියනලද පංචප්‍රකාරවූ නමස්කාරයන් අතුරෙන් පූර්වක්‍රියාව දැක්වූ කෙවලගර්විතනමස්කාරය ඉෂ්ටදෙවතා ප්‍රණාමය පිණිස දක්වනලදී. ඉෂ්ටදෙවතාප්‍රණාමයනම්—“මහාකාරුණිකං නාථච නාථං තෙන සුදෙසිතං ධම්මඤ්ච නත්වා දක්ඛිණෙය්‍යං තිරඞ්ගණං අරියසඞ්ඝඤ්ච නත්වා” යනුයි—මෙහි “නත්වා” යන පූර්වක්‍රියාව කුමක්පිණිස දක්වනලදද?—ආයුෂාදිවූ චතුර්විධ ධර්මයන් වර්ධනය කරවන කාලත්‍රය වර්තීවූ මේ රත්නත්‍රයට වාරත්‍රයෙන් නමස්කාර කොට මත්තෙහි සමස්ත සත්වයන්ට ත්‍රිවිධ සම්පත් සාධාදෙන මෙනම් ධර්මප්‍රකරණයක් ප්‍රකාශ කොරෙමියි යන අපරක්‍රියාව ගහනුනු පිණිස මේ ගාථාවෙහි ‘නත්වා’ යන පූර්වක්‍රියාව දැක්වූහුයි.

සමුදායාවයව සංඛ්‍යාත ත්‍රිප්‍රකාරාර්ථයන් ප්‍රකාශකරන්නාවූ මේ ගාථාවෙහි අභිප්‍රාය නම් සතරුමරගුරු දිවකුරු බුදුන් හමුවෙහි දිවි පුද පියන්නාක්මෙන් මඩමත්තෙහි අජිතචර්‍ය්‍ය අතුට එහි මුහුණින් වැදහෙව නියතවිවරණ ලැබ සමතිස් පෙරුම්පුරා ලොව්තුරා බුදුවැ ලොකාර්ථසිද්ධිසම්පාදනය කෙරෙමින් සියලු සත්වයන්ගේ ප්‍රසාදනෙත්‍රයට සන්තොෂ එලවමින් පාදතලයෙහි පටන් කෙශාන්තය දක්වා සකල ශරීරය එකාපැහැර සරහා සිට ගත් සුප්‍රතිෂ්ඨිත පාදදිවූ දෙතිස් මහාපුරුෂලක්ෂණයන් හා එම දෙතිස් මහාපුරුෂලක්ෂණයන් අනුව පවත්නාවූ තම්බතුඞ්ගනඛාදී අසූඅනුව්‍යඤ්ජනලක්ෂණ ශ්‍රීශොභාවන් කාරණකොටගෙණ විකසිත පද්මොත්පල පුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිතවූ ජලතලාවක් සේද; තාරකාතිකර ප්‍රභාසමූහයෙන් දීප්තිමත්වූ ශරදම්බරොදරයසේද, මකරන්දහරිත සුපිෂ්පිත පුෂ්පමඤ්ජරීන් ශොභමානවූ මන්දාරවෘක්ෂරාජයාසේද’ අතිශයින් බබලන්නාවූ උපමාවිෂයාතික්‍රාන්තවූ සකලාඞ්ගයෙන් නිගීතව සක්වළගැබ පැතිර දසදික් බබුලුවා ජොතිමත්ව සිටගත්තාවූ නීල මපීත ලොහිතාවදාත

ජෙෂ්ඨ ප්‍රභාස්වරයයිකියනලද සවර්ණක්ෂත බුද්ධරශ්මි මාලාවෙන් නිතනවර්ණීව හාත්පස්හි වටාසිටගත්තාවූ ව්‍යාමප්‍රභාමණ්ඩලය හෙතුකොටගෙණ සන්ධ්‍යාවලාඉන්ද්‍රචාප විද්‍යුල්ලතාවෙන් චලද නාලද ප්‍රභාස්වරවූ රන්මෙරක්මෙන්ද, නාභිමඩල දූවි රන්කොනත සේසත් පබලු වස්දඹු මුතුලැල් ආදිවූ විචිත්‍ර වස්තුවෙන් ප්‍රතිමණ්ඩිතවූ චක්‍රරත්නය මෙන්ද අතිශයින් දීප්තිමත්ව බබලන්නාවූ කොකනද පුෂ්පොදරප්‍රභාවට තිරස්කාරන්නාවූ මෘදු කොමල රතහිලි පෙලින් මනොහරවූ ශ්‍රීපාදද්වය පුරා පිහිටි සර්වාකාර පරිපූර්ණ නාභි නිම්වලලු සහිත දහස් ගණන් දූවිපතරින් විසිතුරුවූ චක්‍ර ලක්ෂණවසක් හා—තවද එම චක්‍රලක්ෂණ පිරිවරසිටි සිරිවස ස්වස්තිකාදීවූ දෙසිය සොළසක් පමණ අනන්‍යසාධාරණොත්තම මඞ්ගල්‍ය ලක්ෂණයෙන් විරාජමානවූ සියලු ජනයන් විසින් මුව නොසෑහෙනලෙස වර්ණනාවට සුදුසුවූ,ලොකාධිපතිවූ අමිතගුණගණොචිත සමස්ත සත්වාධිපති සහම්පති මහාබ්‍රහ්මයා ආදිකොටඇති මහානුභාව සම්පන්නවූ බ්‍රහ්මරාජයන්ගේද, අමරපුරෙශ්වරවූ ශක්‍රදෙවේන්ද්‍රයා ප්‍රධානකොට ඇති මහානුභාවසම්පන්න දිව්‍යරාජයන්ගේද,අසුරපුරාධිපතිවූ වෙපචිත්තිනම් අසුරෙන්ද්‍රයා ප්‍රධානකොට ඇති ශෞර්‍යවීර්‍ය බලපරාක්‍රමයෙන් යුක්තවූ දානවේන්ද්‍රයන්ගේද' උරගපුරෙශ්වරවූ මහාකාල ශඞ්ඛපාල මණිකණ්ඨාදිවූ නාගෙන්ද්‍රයන් ආදිකොටඇති දීර්ඝායුෂ්කවූ උරගරාජයන්ගේද මනුජ ලොකාධිපතිවූ කාශිකොශල බිම්බිසාර බ්‍රහ්මදත්තාදීවූ මහානුභාවසම්පන්න නරපතීන්ගේදැයි යනාදිවූ රාජාධිරාජ ප්‍රශස්තොත්තම රාජයන්ගේ මස්තකාලඞ්කාර කෙරෙමින් බබලන්නාවූ ශ්‍රීපාද යුගලයක් ඇති සර්වඥරාජොත්තමයානන් වහන්සේ තමන්වහන්සේගේ මනොඥ ස්වභාව ඇති චතුර්විධ ඊර්යාපථයට වෙන වෙනම හොබනාසේක, තවද චතුර්විධ කායසම්පත්තියකින් බබලනසේක, චතුර්විධ ලොකයට අද්භූත ප්‍රමාණ ඇතිසේක 'චතුර්විධ ආර්‍ය සත්‍ය ප්‍රකාශකවූ ධර්ම දෙශනාවෙන් හොබමානසේක' චතුර්විධ ප්‍රතිසම්භිදායෙන් යුක්තසේක' චතුර්විධ ඍද්ධිපාදයෙන් යුක්තසේක' චතුර්විධ ඕඝයෙන් එතරවූසේක 'චතුර්විධ සම්‍යක්ප්‍රධානයෙන් යුක්තසේකැයි' මෙසේ මාගේ සර්වඥයන්වහන්සේගේ අටක් පමණ සතර සතර ගුණයෙන් යුක්තවූ ඊර්යාපථාදි දෙතිසක් පමණ ශ්‍රී සෞභාග්‍යයෙන් හොබමානවූ ගුණ සමූහයන් අතුරෙහි ස්ථාන නිෂද්‍ය ශයනගමනාදිවූ පළමුවන ඊර්යාපථ චතුෂ්ක

යෙන් වෙනවෙනම නානා ස්ථානයන්හි බබලන්නාවූ අද්භූතානුභාවයකින් යුක්තසේක' ඒ සතර ඉරියව්වෙන් පළමුවන වැඩසිටි ඉරියව්වට හොබනා විලාසශ්‍රිය නම් කවරහයත්?. හේ මේ මතුකියනලද අතුල බ්‍රාහ්මණ කථාවෙන් දතයුතු— කෙසේදයත්?.

එක්සමයෙක්හි අප්‍රමාණ දශිතාවකාශඇති අප තිලෝගුරු බුදුරජානන්වහන්සේ අද්භූතවූ බුඬලීලාවෙන් යුක්තව මහා සඞ්ඝයා වහන්සේ පිරිවරා රජගහනුවරට වඩනාසේක' එකල්හි රජගහ නුවර වසන්නාවූ අතුල නම් බ්‍රාහ්මණයෙක් තිලෝගුරු බුදුරජානන්ගේ වැඩසිටි උසපමණ දැනගන්ට ශක්‍ර බ්‍රහ්ම විෂ්ණු මහේශ්වරාදීවූ කවර තරම් සෘද්ධිමත් පුරුෂයක් හටත් බැරියයි යනු අසා දොළොස්රියන් පමණ උස ඇති ශ්‍රමණභවද් ගෞතමයන්ගේ මධ්‍යමපුරුෂ රූපයඋස වියතක් කුමක් පිණිස දැනගන්ට බැරිදැයි තමා මහනුවණැති හෙයින්දෝහෝ සැටරියන් උස හුණ දණ්ඩක් ගෙණවුත් බුදුන් රජගහනුවරට වදනාකල්හි මහවහසල්දොර සමීපයෙහිදී උසමැණගන්නා පිණිස බුදුන්ලඟහුණලිය අල්වාගෙණ සිටියේය, එකල්හි බමුණා ගත් සැටරියන් දිග හුණලීය බුදුන්ගේ දනමඬලට විතා මඳකුත් දික්නුවූයේය,එකල්හි මාගෙණාවේ ලුහුඬුහුණදණ්ඩක් වනැයි සිතාදෝහෝ දෙම්තස්ව තමා ගෙටගොස් දෙවනදවස් එසේ සැටරියන් උස හුණදඬු දෙකක් මතුමත්තෙහි තබා බැඳගෙණ එක්සිය විසිරියන් උසඇති එකියන හුණදණ්ඩ ගෙණගොස් මහ වහසල්දොර සිටගෙණ පළමු දවස්මෙන් බුදුන් රජගහනුවරට වදනාකල්හි උසමැනගන්නා පිණිස හුණලීය අල්වාගෙණ ලඟ සිටියේය එකල්හි අද්භූත ප්‍රමාණඇති තිලෝගුරු බුදුහු බමුණා මතුමත්තෙහි බැඳගෙණ සිටි හුණලීදෙක මුදුනෙන් එසේම හුණලිදෙකක් වැඩියක් උසපෙණෙනසේක, එකල්හි හුණලීපිට හුණලී බැඳගෙණ බුදුන් වැඩසිටි ප්‍රමාණයමණන්ට උත්සාහ කරණ බමුණා දැක ඕහට වදාරණසේක් එඹල බමුණ කවර කාරණයක් පිණිස හුණලීපිට හුණලී බැඳගෙණ මාලඟ කෙළින් අල්වාගෙණ සිටිදැයි වදාළසේක. එබසට බමුණු කියන්නේ තොපගේ උස ප්‍රමාණය මෙතෙකැයි දැනගන්නාපිණිසයයිකීය. එබසට බුදුහු වදාරණසේක් එඹල බ්‍රාහ්මණය ඉදින් තෝ මාගේ උස මෙතෙකැයි මැණගණිමියි කියා මේ සැතිස්ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් වටඇති දෙසාළිස් දහසක් යොදුන්

උසඇති සක්වළගබ පුරාලන පමණ හුණලි ගොඩක් රැස්කොට තාගේ කිසියම් සමර්ථභාවකින් ඒ හුණදඬු එකක්පිට එකක් බැගින් සඞ්ගලපා බැඳිකල යම්උසෙක් ඇද්ද ඒ පිළිවෙළින් සිටි හුණදඬු ගෙණවුත් මාගේඋස මණින්ට අල්වාගෙණ සිටියේවී නමුත් මාගේඋස මෙතෙකැයි මැණගත නොහෙන්නේමයැ මාගේඋසට ඒහුණදඬු පරම්පරාව මිටිවන්නේමයැ,හේ එසේමැයි; මනො වාක් ප්‍රණිධාන පූරණයෙන් මස්තක ප්‍රාප්තවූ අෂ්ටධර්ම සමොධානයෙන්යෙදී දීපඞ්කරපාදමූලයෙහිදී විවරණ ලත්තැන්පටන් සාරාසඞ්ඛ්‍යය කප්ලක්‍ෂයක් මුලුල්ලෙහි මා විසින් දන්දුන්නාවූ වස්ත්‍රාභරණ අන්නපාන යානවාහන දැසිදස් ගවමහිෂ ග්‍රාමක්‍ෂෙත්‍ර මුතු මැණික් ආදීවූ නොයෙක් වස්තුවෙහි පමණ දැනගන්ට කිසිවක් හටත් නොපිළිවන. තවද ඇස් ඉස් මස් ලේ පුත්‍රදාරාදීන් දන්දුන්පමණ මෙතෙකැයි පමණ දැනගන්ට මේ ලොකයෙහි ලෞකික කිසිවකුත් අසමර්ථ වන්නේමයැ මා පිරූ සමතිංශත්පාරමිතා සඞ්ඛ්‍යාත බුද්ධකාරකවූ ධර්මයන්ගේ ප්‍රමාණය මේ ලොකයෙහි තාවැනි දහසෙක් ලක්‍ෂයෙක් කොළෙක් අසඞ්ඛ්‍යයෙකුත් බලම්හයි සිතා තම තමන්ගේ නුවණපමණින් උත්සාහපමණින් ආයුපමණින් බැලුවත් ඉදිකටු සිදුරෙන් දුටු අහස් පමණද අබලුවෙන් ගත් මහමුහුදුජලය පමණද ගැඩවිල්තුඩින් ගත් මහපොළොව පස්පමණදැයි මෙසේ ස්වල්ප මාත්‍රයකුත් දක්ක නොහෙන්නාහුය. එසේහෙයින් මාගේ සියලු ප්‍රමාණයෙන්ම මේ ලොකයෙහි අන්‍යසත්වයෙක් ස්වල්පයකුත් දැනගතනොහෙන්නේමය.එසේහෙයින් එඹල අතුල බ්‍රාහ්මණය තෝ මාගේ උසප්‍රමාණය දැනගණිම්යි කියා මඳකුත් උත්සාහ නොකරවයි වදාළසේක. එසඳ අතුල නම් බමුණු ලොවුතුරා බුදුහුනම් මෙසේ අප්‍රමෙය සේක්වනැයි මහත්වූ සන්තොෂයට පැමිණ විස්මය පත්වෙමින් සිටිකල්හි බුදුහු ධර්මපදයෙන් ගාථාවක් වදාළසේක ඒ ගාථාව වදාරා නිමිකල්හි සුවාසූදහසක් ප්‍රාණීහු අමාමහනිවන් දුටහ.එසේහෙයින් මේ වැඩසිටි ඉරියව්ව මුන්වහන්සේටම හොබනේයයි දුටු දුටුවන් ඇසිපිය නොහෙළා බලාසිටිනාතරම් මනහර වැඩසිටි ඉරියව්වෙකින් හොබනාසේක.

ඉක්බිති වැඩහුන් ඉරියව්වට හොබනාලෙස කෙසේදයත්?

සකලලොකානන්දකරවූ අප බුදුහු එක්සමයෙක්හි වෙදියක නම් පර්වතයෙහි ඉඳුසල්ලෙණ වැඩවසනසේක් එකල්හි කොසිය

වංශයෙහි උපන් මහමුහුණු පක්ෂියෙක් බුදුන් දැක පිඬුපිණිස ගමට වඩනාකල්හි මං දක්වා ගමන් † පසුකොට ගොස් දුටුසතුටින් බල බලා සිට එන්නේය. නැවත වෙදියක පර්වතයට බුදුන් වඩනා කල්හි පෙරගමන් කොට නොස් බුදුන්ගේ රූපශ්‍රීය බල බලා සමග අවුත් තමාවසන තෙනට ව යන්නේය මෙසේ යන එන්නාවූ පක්ෂිතෙම එක්දවසෙක සවස්වේලෙහි සිරුරු පිළිදැගැ අසදෘශවූ සර්වඥවේශානුරූපව ත්‍රිමණ්ඩලප්‍රච්ඡාදනාකාරයෙන් හඳනාලද්දාවූ ලාක්ෂාරස රාගියක්සේ අතිරක්ත දෙපට හඳනා සිව්රකින් හා මත්තෙහි බඳනාලද රන්විදුලියක් හා සමානවූ මනහර පටිධාතුවකින් හා එසේම ඌර්ධ්වශරීරය වසා සන්ධ්‍යා වලා පටලයක් වැලඳි රන්මෙරක්සේ ඒකාංශකොට වළඳනාලද නිග්‍රොධඵලවර්ණසමාන සුරක්තවර පාංශුකූල චීවරයක් ධරා සන්ධ්‍යාවලා වැළඳි සුවර්ණගිරි පර්වතයක්සේද රත්පියුම්වනයක් මැද බබලන සහස්‍රපත්‍රයක් මෙන්ද භික්ෂුසඞ්ඝයා වහන්සේ පිරිවරා බුද්ධලීලාවෙන් යුක්තව වැඩහුන්කල්හි කොශියවංශයෙහි උපන් මෙම උලූකනම් පක්ෂියානෝ මහත්වූ ප්‍රසාදවගවූ දෙතිස් මහාපුරුෂලක්ෂණ අසූඅනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා කෙතුමාලාලංකාරයෙන් බබලමින්වැඩඋන්සපිරිවරබුදුන්දැක වෙදියකපර්වතයෙන් බැස අවුත් අභිමුඛයෙහි සිට අප්‍රමාණවූ භක්තිප්‍රෙමයෙන් පක්ෂපත්‍රදෙක විදහැර බිම ඔබා බැසහෙව වැඳ බුදුන්ගේ සඳමඬලක් වැනි මුඛ මඬලය බලබලා පියාපත් දෙහොත් මුදුනෙහි තබාගෙන වැඳවැඳ සිටියේය. එකල්හි වෙදියකපර්වතප්‍රාන්තයෙහි වෘක්ෂයෙක වසන දෙවතාවෙක් ප්‍රසන්නව ඕහට ප්‍රශංසා කරණුයේ:-

“උලූකකොමණ්ඩලක්ඛිකො වෙදියකෙ චිරදීඝවාසිකො
සුඛිතො වත කොසියො අයං කාලුට්ඨිතං පස්සති බුද්ධවරං”

යනාදීන් ස්තුති කළකල්හි මේ කාරණය බුදුරජානන්වහන්සේ දැක මදක් සිනා පහළකළසේක එකල්හි ආනන්දස්ථවිරයන් වහන්සේ සර්වඥයන්වහන්සේ සිනා පහළකළ කාරණාව විචාළසේක. එබසට වදාරණසේක් එම්බා ආනන්දයෙනි මෙතැන්හි සිටි මේ කොශියවංශයෙහි ජාතවූ බකමූහුණුතෙම මේ මහාසඞ්ඝයා වහන්සේ හා මා ‘ප්‍රිය’ නෙත්‍රයෙන් දුටුවාවූ කුශලානුභාවයෙන් මතු මොහුගේ පස් පෑ දිස්නා ඇස්සහලට කිසිකලෙකත් රොගාදිවූ උපද්‍රවයක් උපනුපන් ජාතියෙහි නොවන්නේයයි වදාරා මතු ඔහු ලබන්නාවූ දිව්‍යමනුෂ්‍ය සම්පත් හා නිවන් සම්පත්තිය

---

† පසු ගමන්කොට

භික්ෂුසඞ්ඝයා මධ්‍යයෙහි ප්‍රකාශකරන්නාවූ බුදුරජාණන්වහන්සේ මෙසේ වදාළසේක.

"මයි චිත්තම්පසාදෙත්වා භික්ඛුසඞ්ඝෙ චානුත්තරෙ,
කප්පානි සතසහස්සානි දුග්ගතිං සො න ගච්ඡති.
දෙවලොකා චවිත්වාන කුසලමූලෙන චොදිතො,
භවිස්සති අනන්තඥාණො සොමනස්සොති විස්සුතො"

යනාදීන් එඹා මහණෙනි ප්‍රියවූ පියයුග විදහා මුදුනෙහි තබා ගෙණ වැඳ ප්‍රේමයෙන් බලාගෙණසිටියාවූ තෙළඹකාමුහුණු පක්ෂි තෙම මෙසින්මතු කප් ලක්ෂයක් මුලුල්ලෙහි නරකතිර්යක්ප්‍රෙත අසුරකාය යන සතරඅපායට නොගොස් අපමණවූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් වීඳ දෙව්ලොවින්අවුත් මෙමලොව *නොයෙක් සම්පත් තින්සමෘද්ධවූ පිසිතුරු නුවරෙක්හි එක්තරා කුලයක ඉපද වැඩිවිය පැමිණ 'සොමනස්ස' නම් පසේබුදුවැ අමාමහ නිවන් දක්නේයයි වදාළසේක.

තවද මැඩහුන් ඉරියව්වට හොබනා පරිදි කවරහයත්?

සකලලොකානන්දකරවූ මාගේ තිලෝගුරු බුදුහු බුදුවූ සත් වන අවුරුදු ඇසළපුර පසළොස්වක් ලද උතුරුසළ නකතින් සැවැත්නුවරදී තීර්ථකමානමර්දනයකෙරෙමින් යමාමහපෙළහර දක්වා මාතෘ දිව්‍යපුත්‍රයාණන් ඇතුළුවූ දිව්‍යබ්‍රහ්මයන්ට අනුග්‍රහ පිණිස පරසතුරුකට පිටලා පාණ්ඩුකම්බලශෛලාසනාරූඪව වැඩහිඳ විජම්බණ දෙශනා කරණුපිණිස ශක්‍රභවනයට තුන්පිය වරින් වැඩිසේක එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රයෝසිතන්නාහු දිග සැට යොදුන් පුළුල පණස්යොදුන් උස පසළොස් යොදුන් මේසා මහත් දිගුපුළුල් පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි දෙළොස්රියන් බුදුන් වැඩහුන් කල්හි මහත් දිගුපුළුල් ගලතලයක් මත්තෙහි වටු කුරුල්ලකු † බැස උන්නාක්මෙන් ඉතාම ක්ෂුද්‍රව දුටුවන් ඇසට හොබනාසේක්දෝහෝ නොහොබනා සේක්දෝහෝයි සිතසිත, එසේද වුවත් ඊටවඩා අතික් උතුම් ආසනයක් නැතිහෙයින් මාවිසින් බුදුන්ට උතුමවූ මාගේ පාණ්ඩුකම්බලශෛලාසනය පිළිගැන්වූවමැනව බුදුන්ට එම සුදුසුයයිසිතා දෙදෙව්ලොවදිව්‍ය සෙනාව පිරිවරා ගෙණබුදුන් පෙරමගට නොයෙක් දිව්‍යපූජා භාණ්ඩ ගෙණගොස් මහත්වූ පූජා පෙරහරින් අපමණවූ උත්සව

---

* දඹදිව    † හැඬිගයකු

යෙන් බුදුන් වැඩම කරවා ගෙණගොස් එක පුණ්ඩරීක නම් උය නෙහි පරසතුරුකමුල බබලන්නාවූ පාණ්ඩුකම්බලශෛලාසනය පිළිගැන්වීය. එකල්හි අනොපමෙයවූ බුඩලීලාවෙන් යුක්තවූ බුදුරජානන්වහන්සේ මේසා මහත් දිගුපුළුල් පාඬුකම්බල ශෛලාසනය සමීපයට ගොස් වැඩසිටි කල්හි ඒ ආශ්චර්‍ය්‍යමත්වූ පාඬුකම්බලශෛලාසනය උස් මහත් පුරුෂයකු හිඳිනටලූ කුඩා පුටුවක්සේ බුදුන්ගේදනමඩල උසපමණවිය. එවේලෙහි පරසිත් දන්නාවූ බුදුරජානන්වහන්සේ සක්දෙව්රජහු සිතූ සිතිවිලි දැන බුඩානුභාවය ඔහට දක්වනුපිණිස තමන්වහන්සේගේ සුගත්මහ වියතින් දිග නව වියත් පුළුල සවියත් සඟලසිවුර සතරපටින් වසා මහත් දිව්‍යසේනාව බලබලා සිටියදීම දිග දෙසියසතළිස්ගව් පමණඇති පුළුල දෙසියගව්වක් පමණඇති උස සැටගව්වක් පමණ ඇති වටින් අටසිය අසූගව්වක් පමණ ඇති ඒසා මහත් පාණ්ඩුකම්බලශෛලාසනයෙහි හෙළාලූසේකැ එකණෙහි මහ තෙලිසමක් කුඩා පුටුවක හෙළුවාසේ ධර්‍මාසනයක් බණ වස්ත කින් වැසුවාසේ ආසනය සඟල සිවුර සතර පටින් වැසීගියේය; එකණෙහි බුදුරජානන්වහන්සේ මදකුත් ව්‍යායාමයක් නොවිඳ මිටිපුටුවෙක හිඳිනා උස්පුරුෂයක්හු මෙන් අත ඔබා යෙහෙන් වැඩඋන්සේක; එකල්හි දෙදනමඩල දිගින් ආසනයපුරා සිටගත පුලුලින් පළක් බැඳ වැඩහිඳින්ට ඇතමඳැයි යන්නාක්මෙන් ප්‍රමාණවිය: මේසා මහත් පාණ්ඩුකම්බලශෛලාසනය වැඩහිඳි න්ට පමණමුත් ඉතිරි නුවූයේය එතකුදු උවත් බුදුන් පමණට අස්න කුඩාවූයේත් නොවෙයි අස්නපමණට බුදුහු මහතුත් නුවූ සේක; මෙවැනි බුඩමහිමයෙකින් යුක්තවැ වැඩහිඳිනා විලාසශ්‍රී දැක මේ කෙබඳු බුඩමහිමයෙක් දෝහෝයි මහත්වූ විස්මයට පැ මිණ වැඩහිඳිනා ඉරියව්වටම හොබනාසේකැයි ප්‍රශංසා කොරෙ මින් ඇස ඇසම ඇඳි රසාජනයන්සේ විඳුවිඳු බලන්නවුන් තුඩ තුඩම වර්ණනීයවූ වැඩහිඳිනා ඊර්‍ය්‍යාපථයකින් බබලනසේක.

තවද සියලු ජනයන් නුවනැඳි රසඳුන්මෙන් අද්භූත ප්‍රාති හාර්‍ය්‍යයෙන් යුක්තව සැනපෙන ඉරියව්වට හොබනාසේක-හේ කෙසේදයත්?

එක්සමයෙක්හි වාදීභ කණ්ඨීරවෙෂශ්‍රීන් විරාජමානවූ මාගේ බුදුරජානන්වහන්සේ සැවැත්නුවර පූර්‍වාරාමයෙහි වැඩවසන සේක එසමයෙහි බුදුන් අහින් බණ අසා බුඩමහිම දැකාගියාවූ

දෙවියෝ සතුතිකෙරෙමින්විස්මයපත්ව සන්තොෂයෙන් බුදුගුණ
කියන්නාහු රාහුඅසුරේන්‍ද්‍රයාදැක බුදු ගුණඹිහටත් කියා නොසිත්
බුදුරජාණන්වහන්සේකරා ගොස් බණඅසා එසිකිහ එබසට රාහු
අසුරේන්‍ද්‍රයා කියන්නේ තොපගේ බුදුහු නම් කෙබඳුකෙණෙක්
දැයි විචාළේය එබසට දෙවතාවෝකියන්නාහු අපගේ බුදුහු දෙ
ලොස්රියන් උසඇතිසේක සරියන් බ්‍යාමප්‍රභා මඬලයක් ඇති
සේක. දෙතිස්මහාපුරුෂ ලක්‍ෂණයන් ඇතිසේක දෙවාතිදෙව
සේක ශක්‍රාති ශක්‍රසේක බ්‍රහ්මාති බ්‍රහ්මසේක ඔවුන්වහන්සේගේ
විලාසශ්‍රී මෙබඳුයයි කියන්ට අපඇමට නොපිළිවනැයි කිහ එබ
සට රාහු අසුරේන්‍ද්‍රයා කියන්නේ තොපි කුමක්කියව්ද සාරදහස්
අටසියයක්යොදුන් උසඇති එක්දහස්දෙසියයක්යොදුන් පලල්
උරතුරුඇති නවසියයක් යොදුන් වට හිසක්ඇති තුන්සියය
ක් යොදුන් දිගුපුළුල් නලළක්ඇති පන්සියයක්යොදුන් දෙබැම
තුරුඇති දෙසියයක් යොදුන් මුඛයක් ඇති තුන්සියපණස් යො
දුන් අතුල් ඇති පණස්යොදුන් ඇඟිලිපව් ඇති සත්සියපණස්
යොදුන් දිග පතුල් ඇති එක්දහස් දෙසියයක් යොදුන් දිග රියන
ඇති සසියයක් යොදුන් දිග වියත ඇති එක ඇඟිල්ලෙන් හිර
සඳ පවා මුවාකොට ආලොක මඳකොට පියනතරම් මෙබඳු ආඥා
සම්පන්න උස් මහත් ඇති මම තොපගේ අටළොස්රියන් උස
ඇති බුදුන්කරා ගොස් කෙසේ වඳිම්ද දකිම්ද සත්කාර කෙරෙම්
දැයි කීය. ඒ අසා දෙවියෝ කියන්නාහු අසුරය තෝ කුමක් කි
යාද තාසේම උස මහත් ඇති අසුරයෝ සියයෙක් දහසෙකුත්
උනුන් පිට සිට බලත් නමුත් අපගේබුදුන්ගේ පතුලමුදුන් දැක්ක
නොහෙන්නාහුමයයි කීහ: එබසට රාහුඅසුරේන්‍ද්‍රයා කිපී එසේ
කල ශ්‍රමණ භවද්ගෞතමයන් හා උසමහතට වාද කෙරෙම් දෙ
ලොස් යොදුන් උස ඇති මහාබ්‍රහ්මයෝ පවා මාගේ දත අල්වා
පියනතරම් උස නැත්තාහුය සදෙව්ලොව තුන්ගව් උස ඇති දෙ
වියෝ මාගේ ඇඟිලි පුරුකක් උසත් නැත්තාමහුය අටළොස්
රියන් උස ශ්‍රමණභවද්ගෞතමයන්ගේ උස කියනුම සාවරේදැයි
සිතාසී අද දවස් ඔවුන්ගේ උස මහත දක්නෙම්වේදැයි කියා ප්‍රමා
ණාති ක්‍රාන්තවූ බුදුරජාණන්වහන්සේ කරා එන්ට වනැ. එදවස්
අරුණොද්ගමනවේලෙහි බුදුරජාණන්වහන්සේ මහාකරුණා
සමාපත්තියට සමවැද ලොව බැලූසේක් උස මහතට වාදකරන්
නට එන්නාවූ රාහුඅසුරේන්‍ද්‍රයා දැක අනඳ මහතෙරුන්වහන්සේ

සෑඳමා සැතපෙනලෙසට බිම්ආස්තරණයක් අතුරවයිවදාළසේක. අනඳමහතෙරුන්වහන්සේද එලෙසම අතුළසේක. එකෙණෙහි මාගේ බුදුරජාණන්වහන්සේ දකුණුදිගට සිරස ලා බස්නාහිරට පිටලා උතුරුදිගට ශ්‍රීපාදවසලා නැගෙණහිරට ශ්‍රීමුඛයලා ශ්‍රීපාද දෙක මතුමත්තෙහි පබලුපලඟ දෙකක්සේ තබාගෙණ දක්‍ෂිණ ශ්‍රීහස්ත මස්තකයෙහි ශිරොධාතුව තබාගෙණ වාම ශ්‍රීහස්තය ප්‍රවාලසාගරයෙහි ලීලෝපෙතවැ ගමන් ගත් සුවර්ණනාගරාජයකුසේ ශ්‍රීශරීරපාර්ශ්වයෙහි සුරක්ත සිවුර මත්තෙහි දිගුකොට තබා සීහසෙය්‍යාවෙන් සැතපුනුසේක.

එකල රාහු අසුරේන්ද්‍රතෙම විපුලතර විමල කීර්ති සාගරවූ බුදුරජාණන් වහන්සේගේ පාමුල සිට මෘදු කොමල රක්තාංජලි පඞ්ක්ති නැමැති පෙති පතර ඇති සර්වාකාර පරිපූර්ණ නාභි නිම්වලලු සහිත දහස්ගණන් දෑවිපතර නැමති මුවරඳ කොතුරු ඇති චක්‍රලක්‍ෂණ නැමැති මනහර කර්ණිකා දෙකකින් බබලන්නාවූ—තවද එහිම:—

"තමෙව චක්කං පරිවාරයිත්වා සිරිවච්ඡ සොවත්ථි වටංසකා ච,
පාසාදභද්‍රාසනපුණ්ණපාතී සිතාතපත්තා ච මයූරහත්ථා.
නීලාදිභෙද කමලුප්පලා ච සමෙරු සත්තද්දි මහාසමුද්දා,
සත්තාපගා සත්ත මහාසරා ච හිමාලයො චක්කවාළද්දිකො ච.
චන්දක්කතාරා ච ඡ දෙවලොකා පිතාමහාවාසමනුස්සලොකා
සුවණ්ණනාවා සිවිකාව සඞ්ඛං කෙලාසසෙලා ධජතොරණාච.
චින්තාමණුණ්හීස සවච්ඡධෙනු මීනමයං චක්කවත්තිසසෙනො,
සීහස්සමාතඞ්ගවිහඞ්ගරාජා හංසොසභො කිම්පුරිසො මයූරො.
කොංචා ච එරාවණහත්ථිරාජා සචක්කවාකා මකරාදයො ච,
නානාමහාමඞ්ගලලක්ඛණානි විරොචමානා විලසන්ති නිච්චං".

යනාදීන් දක්වනලද දෙසියසොළසක් පමණ මඟුල්ලකුණු නැමැති මුවරඳ සළාවෙන් ගැවසීගත්තාවූ ශ්‍රීපාද පියුම් දෙකින් මුවාවැ සිට ඔවුන්වහන්සේගේ ශ්‍රීමුඛ මණ්ඩලය දක්නා තබා ශ්‍රීපාදයෙහි සුළඟිලි කෙළවර පමණකුත් දැක්කනොහී පබළුපජීතයක් මුවාවූ ළදරු බිලිඳකු නභොමණ්ඩලගත පූර්ණචන්ද්‍රමණ්ඩලයක් දකින්ට උත්සාහ කරන්නාසේ අක්පත්ලෙන් එසෙවි එසෙවී බලා වෙහෙසවිඳත් බුදුන්ගේ ශ්‍රීමුඛමණ්ඩලය දැක්කනුහුනුයේයැ. එවේලෙහි බුදුරජාණන්වහන්සේ මහමේ ගබක් බැණනංගාසේ බ්‍රහ්මඝොෂා විහිදුවා එම්බල රාහුඅසුරේන්ද්‍රය තෝ

අක්පත්ලෙන් එසෙව් එසෙපී කුමක්බලයි වදාළසේක,ඒ ශබ්දය අසා සිංහනාදයක්ඇසූ කපුටුවකුසේ තික්කුව තැතිගෙණ එසේ ද වුවත් මඳක් ධෛර්‍ය්‍යශීලාගෙණ සිට නිර්භීතඑකක්හුමෙන් කියන්නේ ශ්‍රමණ භවද් ගෞතමයෙනි තොපගේ මුදුන් පත්ලෙහි කොළවරක් බලන්ට උත්සාහ කෙරෙමියිකීය, එබසට බුදුහු වදාරණසේක් එම්බල රාහුඅසුරෙන්ද්‍රය තෝ මෙතැන්පටන් අගනිටා බඹලොව දක්වා බලාත් මාගේ පත්ලෙන් කොළවරක් දක්නා නොහෙයි වදාළසේක, රාහුඅසුරෙන්ද්‍රතෙම ගිරිදරයක් මුවාවෙහි සිට කථාකරණ කුඩාකොල්ලකුසේ ශ්‍රීමුඛය දක්කනොහී මුවාම සිටම කථාකරන්නේය, එකල්හි රාහුඅසුරෙන්ද්‍රයාගේ උස මහතට වාදකෙරෙමියි යන අභිමානය මහමෙරු ළහට පැමිණි උදාටක්සේද මහාසමුද්‍රය ළහට පැමිණි පිණිබිඳුවක්සේද ගුරුළු රජසක්හු ළහට පැමිණි මදුරුවකුසේද මතැතක්හු ළහට පැමිණි කුහුඹුවකුසේද අභිමාන ශූන්‍යව චක්‍රවර්තිරජක්හුගෙන් ඉච්ඡාභොජනයක් ඉල්වන දුගියකුසේ යාඥකොට කියන්නේ මාගේ ස්වාමිදරුවූ බුදුරජානන්වහන්ස, ඔබවහන්සේගේම සරණ ගතිමි ඔබවහන්සේටම ගැතිවීමි එසේහෙයින් ඔබවහන්සේගේ ශ්‍රීමුඛය දක මාගේ මනොරථය සිද්ධකොට ගෙණ පව් ගෙවා ගන්නා කැමැත්තෙමියි කීය, එවේලෙහි බුදුරජානන්වහන්සේ සන්ධ්‍යාවලාපටලයක් මුදුනෙන් පූර්ණචන්ද්‍රමණ්ඩලය දක්වන්නාසේ තමන් වහන්සේගේ ආශ්චර්‍ය්‍යමත්වූ ශ්‍රීමුඛමණ්ඩලය දක්වා ඔහු විස්මයපත් කරවා ධර්මදෙශනාකොට වදාළසේක. එවේලෙහි සුවාසූදහසක් දෙවියෝ අමාමහනිවන් දුටහ. රාහු අසුරෙන්ද්‍රයාද සරණශීලයෙහි පිහිටා සද්ධර්ම ප්‍රීතීන් මත්ව, දෙහොත් මුදුනෙහි තබාගෙණ සැතපෙන ඉරියව්වටම හොබනාසේකැයි ස්තුති කෙරෙමින්:—

"යො වදතං පවරො මනුජෙසු සක්‍යමුනී භගවා කතකිච්චො
පාරගතො බල විරියසමඞ්ගී තං සුගතං සරණත්තමුපෙමි".

යනාදීන් ගත් ශරණශීලනැමැති අමෘතපානයෙන් සන්තොෂව, කුල්මත්ව, නටන්නාක්හුමෙන් අපමණ සමාධීන් යුක්තව තමාගේ නිවා සස්ථානයටම ගියේය. මෙබඳු ආශ්චර්‍ය්‍ය මත්වූ සිංහශයනය සකලප්‍රාණීන්ට ඉතාම ප්‍රියවිය, මෙසේ අතිශයින් ප්‍රසාදවහවූ මේ ඉරියව්වම මූන්වහන්සේට හොබනේයයි යන තරම් සැතපෙන ඉරියව්වකින් හොබනාසේක.

### තවද වඩනා ගමනට හොබනාලෙස කවර හෙයක්?

තවද ත්‍රිවිධමණ්ඩල සඞ්ඛ්‍යාතවූ ග්‍රාම නිගමාරණ්‍ය ජනපද රාජධානි ආදීවූ යම්කිසි තෙනෙක්හි ලෝවැඩපිණිස වඩිමිසි පටන්ගත්සේක් විනම් ඒ ස්ථානය මුන්වහන්සේගේ ගමනටම හොබනේයැ මුන්වහන්සේ වඩනා ගමන් විලාසයත් ඒ ස්ථාන යටමැ හොබනේයැ—

### හේ කෙසේදයක්.?

දවසෙකැ අසහායශ්‍රීන් භ්‍රාජිතවැ ඒකචාරී සිංහරාජයකුසේ විනෙයජනසන්තානය පාලනය කෙරෙමින් තීර්ථක දුල්බිධි මත මතඞ්ග මෘගමාන මර්දනය කෙරෙමින් සමීපාප මිථ්‍යා කුම්භමූල් මූලොත්පාටනය කෙරෙමින් බුඬරශ්මි නැමැති දහසක් රැසින් දිලිහි දිලිහී නභොමණ්ඩලගත ශරත් සූර්‍ය්‍යමණ්ඩලයසේ අචිනී යවැ අභිතමාගී ප්‍රතිපන්නවැ යාත්‍රාවට පටන්ගත්කල්හි ඔවුන් වහන්සේ වඩනා රූපශ්‍රී දක සඤ්ජාතවූ මහත් ප්‍රේම භාරය ධරා ගත නොහී සමීපයට අවුත් ප්‍රිය වචනයෙන් තොප ගුරු කව්රු දැයි විචාළ අභීපාල නම් ආජීවකයක්හට වදාරණසේක්:—

"සබ්බාභිභූ සබ්බවිදූ'හමස්මි
සබ්බේසු ධම්මේසු අනූපලිත්තො,
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං".

යනාදීන් තමන්වහන්සේ ස්වයම්භූවූ නියාව ඔහට ප්‍රකාශ කොට බණවදරා අසහායශ්‍රීන් වඩනාවූ ඒ ආශ්චර්‍ය්‍යමත් මනහර ගමන මුන්වහන්සේටමැ හොබනේයැ තවද යම්කිසි කලෙක්හි ලෝවැඩ පිණිස උපස්ථායකවූ ආනන්ද මහතෙරුන්වහන්සේ පසු මගණ කොට වඩනාකල්හි එකරැසට පැමිණි බ්‍රහස්පති තරුවට පළමුව එක්ව ගමන්ගත් පූර්ණ චන්ද්‍රමඬලයසේ ඉතාම හොබනා සේක. තවද වාදීභ කුම්භ විදාරණ යෙහි උදාරතරකෙශරසිංහ යකු වැනි අප ත්‍රිලෝගුරු බුදුරජානන්වහන්සේ සපිරිවර තුන් බෑ ජටිලයන්ගේ සිත්නැමැති සඳුන්රුක් වෙළා ගෙණ * කලක් පුරුදුව නොහැර විසූ කෙලෙස් නැමැති නයින්ගේ දරණවැලි දහම් නැමැති කොකානදින් මුදා දුරුකොට මාර්ගඵල නැමැති ගුරුළු අරක් තරකොට ලමින් ජනකාන්තය හොබවන සමීඥ

---

තෙහි වෙළාගෙණ *

මයූරෙන්ද්‍රතෙම තුන්බෑ ජටිලාදීන් පසුමහණකොට වෙළුවන
විහාරයට වැඩි දෙවෙනිදවස් මහණගණයා පිරිවරා රජගහ නුව
රට පිඬුපිණිස වඩනා සපිරිවර බුදුරජානන් වහන්සේ දැක
විශෙෂයෙන් ප්‍රීතිමත්වෑ ප්‍රසන්නාකාර දක්වා කීර්තිගීතිකාවන්
ප්‍රකාශ කොට මුව නොසෑහෙනලෙස ස්තුතිකරණ වන්දිභට්ට
යකුසේ:-

"සන්තො සන්තෙහි සහ පුරාණජටිලෙහි විප්පමුත්තො
විප්පමුත්තෙහි සිඞ්ගිනික්ඛසවණ්ණො රාජගහං පාවිසි භගවා".

යනාදීන් මුළුනුවරට ඇසෙනසේ බුදුගුණ අඩගාකියමින්
සපිරිවර බුදුන් වඩනාපවත් සියලු ජනයන්ට ප්‍රකාශකොරෙ
මින් ශක්‍රදෙවෙන්ද්‍රයා ඉදිරිව නික්මුණුකල්හි ශාන්තවූ දාන්තවූ
නිකෙලෙශීවූ මහණගණයා පිරිවරා තාරකාතිකර පිරිවරණ පූර්ණ
චන්ද්‍රමණ්ඩලයසේ සියලඟ රසින් දසදික් පුරමින් සත්සිරුරු
සතුටුකරවා ප්‍රියකරු මනහර ඉරියාපථයකින් මණිකාවචසන්නද්ධ
ත්‍රිමදගලිත හස්තිසේනාවක් පිරිවරා මිහිමඬල මැඬගලන්නාක්හු
මෙන් නික්මුණු මත්ත හස්තිරාජයකුසේද එසේම වෘෂභසමූහයා
පිරිවරා විශෙෂයෙන් නික්මුණු ආජානීය වෘෂභරාජයකුමෙන්ද
හංසසේනාව පිරිවරා මනහර ගමන්ගත් කනකහංසරාජයකු
මෙන්ද සියලඟ සරහා සිටගත් විසිතුරු සිවුරු කෙසුරු සළා
වෙන් ලලිතව රක්තාධරපතල තුර සුදුරැස් විහිදුවා සමදන්ත
පඞ්ක්තීන් හොබනාවූ මුඛමණ්ඩලාදි සර්වලක්ෂණාඞ්ග සම්පත්තීන්
යුක්තවූ සිංහසේනාව පිරිවරා නික්මුණු කෙශර සිංහරාජයකු
සේද අතිශයින් උපමාවිෂයාතික්‍රාන්තවූ විලාසශ්‍රීන් සුරාසුර
ගරුඬොරගාදීන්ගේ මනනුවන් තමන්වහන්සේකරා හයවමින්
අනොපමෙයවූ බුඩලීලාවෙන් නික්මුණුකල්හි:—

"සම්මත්තහත්ථොසභහංසසීහ සමානලීලාය යහිං පයාති,
නින්නුන්නතා හෙරිතලාව භූමි හොනාථ පුප්ඵාදිසුමණ්ඩිතාව.
අපෙන්ති මග්ගා සයමෙව ඛානු සකණ්ටමූලා කඨලා ච සබ්බෙ,
ගම්භීරනීරූපගපඞ්කදුග්ගා ඝිත්ථා සභාවං රමණීයමෙන්ති.
වජන්ති භූමිං ගිරයො පුරත්ථ පසාරිතෙ පාදවරෙ ජිනස්ස,
නිබ්බාති අග්ගි නරකොදරෙපි ගණ්හන්තිපාදෙපදුමාදයොච"

යනාදීන් දක්වනලද අචෙතනක වස්තූහු පවා ඒ වඩිනාවූ
විලාසයට අතිශයින් ප්‍රසන්නවූවාක්මෙන් ක්‍රෑරතරවූ කණුකටු

ගල් මුල් කැට කැබිලිති පමිත ආදීවූ විෂමද්‍රව්‍යයෝ තුමූතුමූම සිටි සිටි තෙතින් මගහැර ඉවත්ව යන්නාහුය. ජල කලල් පිරි මහත් උස් ගැඹුරු වළවලින් යුක්ත දුර්ග මාර්ගයෝද ජලපඞ්ක දුර්ගප්‍රකෘති ආදිවූ තම තමන්ගේ ස්වභාවය හැර ඉතා සිත්කළුවූ වළතැන් හස්ත්‍රාවක්සේ පිරී ගොඩතැන් ගිහිදුවූ වෙඩරුපිඩක්සේ සැදී හැමතැන් එක බෙරඇසක්සේ සමව නොයෙක් සුවඳ මලින් ගැවසීසිට ගන්නේය. ඒ ක්‍ෂණයෙහි තිහි ඇවිල නැගෙණ නරකාගිනිනිවී සිහිල්දියපිරී පියුම්විල්වල සොළනවුන්සේ නරක දුක්විඳිනා ප්‍රාණීහු ඔවුනොවුන් දැක ප්‍රියකථා කොරෙමින් මදක් සැනහී සැපවිඳිනාහුය. සුවණක් රැසින් දිලිහි දිලිහී අනොපමෙයවූ බුඩලීලාවෙන් අසදෘශවූ සර්වඥ මහිමයෙන් වඩනාපිණිස ශ්‍රීපාදය දිගුකාළකල්හි සුවර්ණ කර්ණිකා මකරන්ද ප්‍රවාහයෙන් හරිත විකශිත මහත් ශතපත්‍රයෝ පෘථිවිතලයපළාගෙණ ශ්‍රීපාද යුගලය මුදුනෙන් පිළිගන්නාහුය. එකල පියුමක්පිට පියුමක් කිබිසිහි කරන්නාසේ එබු එබූ පත්ලෙන් කොමිරොන් වසවසා නැගු නැගුපත්ලෙන් සුපිපිපෙතිපතර මුවරඳසළා තුඩුදී අරුණතර වර්ණ තරුණ සුරක්තවර පද්මයන් විඑඹසින් කොමි මුදුන් දක්ව දක්වා ගත් ගත් පත්ලෙහි සියපත් අද්සුන් කරවමින් සුරනර පිරිස් එකහෙළා සාධුකාර දෙවමින් සුගතශ්‍රීන් භ්‍රාජිතවූ නික්මුණුකල්හි මේ වඩනා විලාසශ්‍රිය මුන්වහන්සේටම හොබනේයයි තුඩ තුඩම පතළ කීර්ති ඝොෂාවෙන් දශදිගුත් පුරවන ගමන ඉරියාපථයකින් හොබනාසේක. මෙසේ චතුර්විධ ඊර්යාපථයටම වෙන වෙනම හොබනාහෙයින් නොයෙක බ්‍රහ්ම සුරාසුරොරග ගරුඩ ගාන්ධර්ව කින්නර කිම්පුරිස සිඬ විද්‍යාධරාදීවූ සකලසත්වයෝ තම තමන්ගේ නෙත නෙත ඇදි රසඳුන්සේ විඳ විඳ* බලන්නාහුය. එසේහෙයින් සකලසත්වයන්ගේ නෙත්‍රයට මාධුර්‍ය්‍යවූ සතර ඉරියව්වෙන් හොබනාසේක.

තවද රූපකායය ධර්මකායය නිර්මිතකායය ශූන්‍යකායයැයි කියනලද චතුර්විධ කායසම්පත්තියකින් වෙන වෙනම හොබනාසේක. ඒ චතුර්විධ කායසම්පත්තියෙන් මේ සතර ඉරියව්වට හොබනාලෙස දක්වා වර්ණනාකොළේ රූපකාය සම්පත්තියමවෙයි එසේහෙයින් මේ රූපකාය සම්පත්තිය මසැස් ඇත්තාවූ සකල සත්වයන්ටම පෙණෙනහෙයින් මසැසට විෂයවූයේය. හෙවත්

* "පිටින් විට,,"

ප්‍රඥාචක්ෂුරාදීන් ධර්මකායාදිය දක්කානොහෙන අඥාන සත්ත්වානුග්‍රහයෙන් රූපකායසම්පත්තිය දක්වනලද.

තවද ප්‍රාඥසත්ත්වයන්ට දක්වූවාවූ ධර්මකායසම්පත්තියද අායසී සත්ත්වයන්ට දැක්වූවාවූ නිර්මිතකාය සම්පත්තියද උපධිරහිත අනාශ්‍රව සත්ත්වයන්ට දැක්වූවාවූ ශූන්‍යකායසම්පත්තියදැයි යන මේ ත්‍රිවිධ කායසම්පත්තීන් අතුරෙහි ප්‍රාඥසත්ත්වයන්ගේ නුවණැසට විෂයවූ ධර්මකායසම්පත්තිය නම් කවරේද යතහොත්?

ඒ ධර්මකායසම්පත්තියෙහි විශෙෂය මේ මතුකියන පරිද්දෙන් දතයුතු —

**ගේ ශෛකාසේදශක් ?**

ප්‍රඥාසම්පන්න ජනයන්ගේ නුවණැසට විෂයවෙමින් පාපකාලුෂ්‍ය කර්දම නිරපූරිත චිත්තතටාකයැ උදකප්‍රසාදමාණික්‍යයක් පැමිණි නිර්මල ජලතලාවක්සේ අතිශයින් පහදවන්නාවූ සිතු සිතු සිත්හි ඇඳි ඇඳී බැලූ බැලූ නෙත්හි පෙණී පෙණී ප්‍රීතිසැප විඳුවන්නාවූ යක්ෂ ප්‍රෙත විෂ චොර ව්‍යාධි බන්ධන ශත්‍රු ශස්ත්‍රාග්නි ජලප්‍රපාත බාණ්ඩු කණ්ටකාදී සියලු උපද්‍රවයන් එකහෙළා දුරුකරන්නාවූ සියලු උභයලොකාර්ථසිද්ධි දායකවූ ධර්මාත්මය අද නිදන්කළාවූ ප්‍රාඥජනයන් විසින් :—

“අරහං අරහොති නාමෙන අරහං පාපං නකාරයෙ,
අරහත්තඵලං පත්තො අරහං නාම තෙ නමො,

සම්මාසම්බුද්ධ ඤාණෙන සම්මාසම්බුද්ධ දෙසනා,
සම්මාසම්බුද්ධ ලොකස්මිං සම්මාසම්බුද්ධ තෙ නමො,

විජ්ජාචරණසම්පන්නො තස්ස විජ්ජා පකාසිතා,
අතීතානාගතුප්පන්නා විජ්ජාචරණ තෙ නමො.

සුගතො සුගතත්තාතං සුගතො සුන්දරම්පිච,
නිබ්බාණං සුගතිං යන්ති සුගතො නාම තෙ නමො.

ලොකවිදූති නාමෙන අතීතානාගතෙ විදූ,
සංසාරසත්තාමොකාසෙ ලොකවිදූනාම තෙ නමො.

අනුත්තරො ඤාණසීලෙන යොලොකස්ස අනුත්තරො,
අනුත්තරො පූජලොකස්මිං තන්නාමස්සාමි අනුත්තරො,

සාරථී සාරථිදෙවො යො ලොකස්ස සුසාරථී,
සාරථී පූජලොකස්මිං තන්නාමස්සාමි සාරථී.

දෙවයක්ඛමනුස්සානං ලොකෙ අග්ගඵලං දදං,
දදන්තං දමයන්තානං පුරිසාජඤ්ඤ තෙ නමො.

භගවා භගවා යුත්තො භග්ගං කිලෙසවාහනො,
භග්ග්‍යං සංසාරමුත්තාරෙ භගවා නාම තෙ නමො"

යනාදීන් භක්තිප්‍රෙම පූරිත චිත්තසන්තාන ප්‍රවෘත්තීන් වඳිති යවූ "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො" යනාදීන් නවපෙදෙහි සඞ්ගෘහීතවූ සිටි පංචාභිඥය අෂ්ටසමාපත්තිය සිව්පිළිසිඹියාය යනාදීවූ අනන්තාපරිමාණ කල්‍යාණ ගුණසමූහ නැමැති රත්න සම්භාර සම්තවූ නිධානයක්මෙන් මාංසචක්ෂුසට අවිෂයවූ ප්‍රඥා නෙත්‍රයට විෂයවූ ධර්මකායසම්පත්තියක් ඇතිසේක.

### තවද නිර්මාණකායසම්පත්තිය නම් කවරහයත් ?

එකබීජිය කොලඞ්කොලය සත්තක්ඛත්තුපරම යයි යන සෝවාන් තුන්දෙනා හා කාමභව රූපභව අරූපභවයෙහි අධිගත ඵලඇති ත්‍රිවිධවූ ශකෘදාගාමීන්හා මේහැම සෝවාන් ශකෘදාගාමීහු සුඛාපටිපදා දන්ධාභිඥාදිවූ සතරපටිපදාවන්ගෙන් එකි එකී පටිපදාවකට සයක් සයක්බැගින් සූවිස්සෙක්වන්නාහුය; අන්තරා පරිනිබ්බායීය උපහච්චපරිනිබ්බායිය සසඞ්ඛාර පරිනිබ්බායිය අසඞ්ඛාරපරිනිබ්බායිය උර්ධං සොතඅකණිෂ්ඨගාමීයයි අවිහය අතප්පස සුදස්සය සුදස්සීයයි යන ශුද්ධාවාස බ්‍රහ්මලොක සතරෙහි එකි එකී බඹලොවකට පසක් පසක් බැගින් විස්සක් හා, අකණිෂ්ඨ බ්‍රහ්මලොකයෙහි උර්ධංසොතයන් හැර සෙසු සතරදෙනා ඇතුළුවූ අනාගාමී ආර්ය්‍ය පුරුෂොත්තමයන් සූවිසිදෙනා හා, ශුෂ්ක විදර්ශක සමථයානිකයයි රහත් දෙදෙනාවහන්සේ ඇතුළුව පණසක් පමණ ආර්ය්‍යපුරුෂොත්තමයන් හා, සෝවාන් මාර්ගීය ශකෘදාගාමිමාර්ගීය අනාගාමිමාර්ගීය අර්හත් මාර්ගීයයි චතුරාර්ය්‍ය මාර්ගස්ථයන් ඇතුළුව සිව්පණසක්ම ශ්‍රද්ධාධූර ප්‍රඥාධූර වශයෙන් ද්විගුණකොට එක්සිය අටදෙනෙකැයි මෙසේ අටතුරාසියක් පමණ මාර්ගඵල ප්‍රාප්තවූ යුක්ත ව්‍යක්ත උත්තම පුරුෂයන් විසින් විශෙෂයෙන් දන්නාලද දිවසැට විෂයවූ—චතුෂ්පාරි ශුද්ධිශීල නැමැති ධ්වජමාලා ඇති අභිඥානැමැති

සුදුවැලිතලා ඇති පසලොස්චරණ ධර්මනැමැති මණිතොරණ පඞ්ක්ති ඇති සතර ඍද්ධිපාද නැමැති කප්රුක් සතරක් ඇති සතර බ්‍රහ්මවිහාර නැමැති පියුම්විල් සතරක්ඇති සතරසතිපට්ඨාන නැමති මහ පා පඞ්ක්ති ඇති කීර්ත්තිනැමැති ධවජමාලාඇති අභිඥ නැමැති මහ පවුරු ඇති කෙලෙස් නැමැති පසමිතුරන්ට වැද්ද නොහැකි සතර ආයර්‍යමාර්ග නැමැති වහසල්දොර සතරක් ඇති සප්ත බොධ්‍යඞ්ගනැමැති සල්පිල්පඞ්ක්තිඇති සප්තවිධ ආයර්‍යධන නැමැති රුවන්ගබඩා ඇති ලෝකොත්තරමාර්ග නැමැති මහ පාය කින් මුදුන් පැමිණ සිටියාවූ සොපාදිසෙස නිර්වාණධාතු නැමැති ශාන්තවූ නිවන්පුරයට වැද සර්වඥතාඥාන නැමැති හස්තයෙන් දෙශනානැමැති ඛඩ්ගය ගෙණ විනෙයජනනැමැති සෙවකයන්ට පීඩාකරන්නාවූ කෙලෙස්නැමැති සතුරන්සාධා තෘෂ්ණානැමැති බන්ධනයෙන් මුදාගෙණ විනෙයජන නැමැති මහසෙනග පිරිවරා විමුක්ති නැමැති සේසත්නංවා මෛත්‍රිකරුණානැමැති තරුණීන් දෙදෙනෙකු අග්‍රස්ථානකොට තබා අර්හත්ඵල නැමැති මිණිඔටුනු පැලඳ ධ්‍යානසුව නැමැති ජය පානය පානයකොට ශ්‍රාවක නැමැති සෙවකයන්ට දහම් නැමැති රුව .. බෙදදී සමාපත්ති නැමැති රාජ්‍යසම්පත් වළඳ බුද්ධරාජ්‍යය කෙරෙමින් වැඩහිඳ සකල ප්‍රාණීන්ට ප්‍රතිෂ්ඨාධාරවූ මසැසටද නුවනැසටද අවිෂයවූ දිවැසට විෂයවූ සොපාදිසෙස නිර්වාණධාතුයයි කියනලද නිමිත්ත කායසම්පත්තියක් ඇතිසේක,

**කවද ශූන්‍යකායසම්පත්තිය නම් කවරහයත් ?**

හේ සර්වඥයන්ගේ ශූන්‍යකායසම්පත්තිය මේ මතුකියන පරිද්දෙන් දතයුතු—

**ඒ කෙසේදයත් ?**

අවිද්‍යා නැමැති අන්ධකාරයෙන් මුස්වජාති ජරා මරණ නැමැති යක්ෂාධිගෘහිතවූ භවනැමැති මහවනයට වැද කෙලෙස් නැමැති සතුරන්ට අසුවැ තෘෂ්ණා නැමැති බන්ධනයට පැමිණබොහෝවූ කල්පකාලයක් මුලුල්ලෙහි මහා ව්‍යසන විඳ කුශල නැමැති බාහු බලයෙන් මිදී ප්‍රඥානැමැති ප්‍රදීපාලොකයෙන් මාර්ගඵල නැමැති රජමහවතට බැස සොපාදිශෙෂ නිර්වාණධාතු නැමැති මහවගස ලින් ගොස් නිරුපාදිශෙෂ නිර්වාණධාතු නැමැති අභයපුරයට වැද වර්ණය ප්‍රමාණය රූපය යන සර්වාකාර විරහිතවූ අජරවූ අමරවූ සර්වඥතුයට අවිෂයවූ අනුපාදිශෙෂ නිර්වාණධාතුවෙන්

නිවන් දුටු සකල සත්ත්වයන් විසින් විශෙෂයෙන් දක්මට විෂයවූ දිගුපුළුල් පෙති පතර මුවරඬ කර්ණිකා සහිත ප්‍රභාස්වරවූ මහත් පුෂ්පයෙකැ හැමතැන් පැතිර පවත්නාවූ අමෘත සුගන්ධයක්මෙන්ද සකල ලොකයෙහි එකහෙලා ව්‍යාප්තව රක්ත ශ්වෙත නීල කාල ශ්‍යාම ස්වර්ණ පාණ්ඩුර බර්බුරාදීවූ යම්කිසි වර්ණයක් නොපෙණෙන්නාවූ දුරය ලඟය ආසන්නය මත්තෙහිය පෘථිවියෙහිය අතුරෙහියයි යන ස්ථානාශ්‍රයක් නැත්තාවූ දක්ෂය වෘද්ධිය මෙපමණ ප්‍රදෙශයෙහි මුත් මෙයින් බැහැර නොපෙණෙන්නේයයි යනාදීවූ පරිච්ඡෙදයකුත් නොදක්නහැකිවූ එකෙක දෙසක දශයෙක සියයෙක සහස්‍රයෙක කොටිප්‍රමාණයෙක යනාදීවූ සංඛ්‍යා විරහිත අසංඛ්‍යාතවූ ක්ෂුද්‍රය මහතය වෘත්තය ආයතය චතුරස්‍රය ත්‍රිකොණය දීර්ඝය හ්‍රස්වය උච්චය නීචය යනාදීවූ සණ්ඨාකාර විරහිත නිරාකාරවූ නොපැණෙන දෑනෙත අද්‍රව්‍ය සමීරණය මෙන්දෑයි මෙසේ උපමාවිෂය අතික්‍රාන්තවූ අචින්ත්‍යවූ තෘෂ්ණාවෙන් නිර්ගතවූ ජරා මරණ රහිත අනුපාදිශෙෂ නිර්වාණධාතු සංඛ්‍යාත නිවණැයි කියනලද ශූන්‍යකාය සම්පත්තියක් ඇතිසේක.

මෙසේ අනොපමෙයවූ රූපශ්‍රී විලාසයෙන් දුටු දුටුවන් ඇසූ ඇසූවන් සිතූ සිතූවන් විඳිවිඳිනත් ඇස් නිවමින් කර්ණ නිවමින් සිත්නිවමින් සැප එලවමින් අඥානසත්ත්වය ප්‍රාඥසත්ත්වය ආර්‍ය්‍යසත්ත්වය උපධිරහිත අනාශ්‍රවසත්ත්වයයි කියනලද සකල සත්ත්වයන්ට ප්‍රසාද එලවන්නාවූ රූපකායධර්මකාය නිර්මිතකාය ශූන්‍යකායයයි කියනලද චතුර්විධ කායසම්පත්තියකින් යුක්තසේකැ.

තවද මාගේ බුදුරජාණන්වහන්සේගේ රූපප්‍රමාණය ඝොෂප්‍රමාණය රූක්ෂප්‍රමාණය ධර්මප්‍රමාණයයි යන චතුර්විධ ප්‍රමාණයන් අතුරෙන් පළමුවෙන් දක්වනලද්දාවූ රූපප්‍රමාණය නම් කවරහයත්?

බුදුන්ගේ රූපය නම් අවිෂය ප්‍රමාණහෙයින් නොසිතිය හැක්කේය. කාරණ කිමයත්? යම්කලෙක්හි සෘද්ධි විෂයාතික්‍රාන්තවූ බුදුහු අබලූව ඇතුලෙහිත් සක්මන් කළසේක. එසේකල්හි ඒ ස්වල්පවූ අබලූව බුදුන් සක්මන් කරණ පමණට මහත්වූයේත් නොවෙයි, බුදුහු අබලූවපමණට කුඩාත්නුවූසේක. මේ බුදුන්ගේ එක් රූපප්‍රමාණයෙකැ. තවද එක් සමයෙක්හි මාතෘදිව්‍යපුත්‍රයානන්ට අනුග්‍රහයෙන් ශක්‍රභවනයට වඩනාසේක් බිම ශ්‍රීපාදයක් හා යුගඳුරු මුදුනෙහි ශ්‍රීපාදයක්හා මහමෙර මුදුනෙහි ශ්‍රීපාදයක්

තබා දෙව්ලොවට තුන්පියවරින් වැඩිසේක. මෙසේ තුන්පිය වරින් වැඩියාවූ දුරනම් මේ භූමියෙහි පටන් යුගන්ධර පර්වතය මුදුනට දෙසාළිස් දහසක් යොදුනැ, ඒ යුගන්ධරයැ මුදුනෙහි පටන් මහමෙර මුදුනට දෙසාළිස් දහසක් යොදුනැ මෙතෙක් දුර ශ්‍රීපාදය තබා වැඩිපමණක් විනා බුදුන්ගේ උසපමණ වඩු වෙන් දෙලොස්රියන් පමණමය, එතකුදුඋවත් මෙතෙක් දුර ශ්‍රීපාදය තබනසේකුත් වියතක්උස පඩිකඬක පයතබා යෙහෙන් නැඟෙන උසමහත් පුරුෂයකුමෙන් මඳකුත් ව්‍යායාමයක් නොවිඳ දෙව්ලොවට තුන්පියවරින් වැඩිසේක. මෙසේ වඩිනාවූ බුදුහු මෙතෙක්දුර පියවර තිබීමට මහත් නුවූසේක. තබන්නාවූ පියවරට පර්වතයත් මිටිනුවූයේය. එසේහෙයින් මෙසිදු බුදුන්ගේ එක් රූපකාය ප්‍රමාණයෙකැ එසේහෙයින් මේ රූප ප්‍රමාණයට මේ සක්වළ ඇතුළුවූ සකල ලොකයෙහි සියලු සත්වයන්ම එකසම කොට තුන් කොඨාසයක් කළකල ඒ තුන්කොඨාසයෙන් එක් කොඨාසයක් හැර දෙකොඨාසයෙක් මසැසට විෂයවූ සර්වඥයන්වහන්සේගේ ආධ්‍යාත්මික බාහිර රූපයෙහි අතිප්‍රසන්නවූ සත්වයෝ දෙකොටඨාසයක්වූහ. සර්වඥ රූපයටවඩා ප්‍රසාදවහ රූපයෙක් සමස්තලොකයෙහි නොමඇත්තේය, එසේ හෙයින් රූප ප්‍රමාණ ප්‍රසන්නසත්වයෝ බහුලවූවාහුයි. මේ රූපප්‍රමාණනම් වේ.

**ඝොෂප්‍රමාණ නම් කවරහයක්?.**

මේ සකලලොකයෙහි සමස්ත සත්වයන්ගේ තුඩ තුඩව ජනිතවැ මුළුලෙව්හි පතළාවූ බුදුගුණ ඝොෂාවට වැඩිතරම් ගුණඝොෂාවක් නොමඇත එසේහෙයින් බුදුන්ගේ ගුණඝොෂාවම මහත්වූයේය, එසේහෙයින් මේ යට කියනලද්දාවූ සකලලෝකවාසී සත්වයන් සරියේම පස්කොඨාසයක් කළකල එයින් එක්කොඨාසයක් හැර සතර කොඨාසයෙක් ඝොෂප්‍රමාණ වූවාහුයි—මේ ඝොෂප්‍රමාණ නම් වේ.

**රූක්ෂප්‍රමාණ නම් කවරහයක්?.**

සකලගුණ නිධානවූ භාග්‍යවත් බුද්ධරජානන්වහන්සේගේ රූක්ෂ ප්‍රතිපත්තියටවඩා ප්‍රසාදවහවූ රූක්ෂප්‍රතිපත්තියෙක් සමස්ත ලොකයෙහි අන්කවර සත්වයක්හටත් නුවූයේය,කසීසළු පටපිළි ආදීවූ ශරීරයට සුවපහස් දෙන ශරීරාලඞ්කාර කරණ පැහැපත් මෘදුවූ වස්ත්‍රයන් හැඳපෙරවා කවරතරම්ලෙස සැරහුනත් ඒ සැරසීම් නිශ්ශ්‍රීකයයි හැර සශ්‍රීකවූ ශ්‍රමණවෙශාභිලාෂිතව ගත්

නාවූ මාගේ බුදුන්ගේ නිග්‍රොධඵල සමාන වර්ණවූ නිසක් සාධ
කැබලි එක්කොට නුවා සතරක් තබා මැසුවාවූ පාංශුකූල චීවර
යක් දැරූ බුඩරූපයම හොබනේය, කවරතරම්ලෙස වස්ත්‍රාභරණ
අභිෂෙකාදියෙන් සැරහුනාවූ රූපයකුත් සම්ඝුරූපයට කොටි
ප්‍රකොටි ගුණයෙනුත් සරිනොවින්නේමැයි-ඒ මාගේ තපො
නිධානවූ බුදුරජානන්වහන්සේගේ බුඩරූපයම විශෙෂයෙන්
හොබනේයැ-තවද අනඝීවූ රන්තලිආදින් අහර අනුභවනොට
එහි ආලය ඇරපුහෙයින් ඒ රන්තලි ආදියෙන් ප්‍රයොජන විදි
නා මහත් ශ්‍රීසමෘඩි ඇති සත්වයන්ට වඩා ඉතා කළුපැහැ ඇති
නාවූ සවල්ප අගය ඇති මැටිපාත්‍රයෙක වලදනා මාගේ බුදුන්ගේ
අපරිමිත සශ්‍රිකස්වභාවය කාඥ කිමියන් සම්පයෙහි ශරත් සූර්‍ය්‍ය
මඩලයක් මෙන් ඉතාම ද්‍යුතිමත්වැ බබලන්නේය-තුන් සෘතු
වට සුදුසුවූ ප්‍රාසාදවල තිළිමහරු තිර විතානාදින් හොබනාවූ
යහන් අතුරනලදුව දිවසැපයක්මෙන් සුවපහස්දෙන සෙනාස
නාදීවූ රාජසම්පත්තිය හැර ගියහෙයින් මෙබඳුවූ ඓශ්වර්‍ය්‍යයට
වඩා ජනවිවෙක ස්ථානවූ අරණ්‍ය වෘක්ෂමූල ශූන්‍යගෘහ ලියමඩුලු
ආදීවූ ශ්‍රමණ සාරූප්‍ය රමණීය තැන්වල ශඩකා රහිතව ධ්‍යාන
සුවවිඳ වාසයකරන්නාවූ මාගේ බුදුන්ගේ රූක්ෂ ප්‍රතිපත්තියම
හොබනේය. මුළුලොව සියලු සත්වයන් තම තමන්ගේ ශක්ති
පමණින් උත්සාහ පමණින් උත්සාහව කොට පුරණලද්දවූ ප්‍රති
පත්ති හැම එක්කොට මීට සරිකළත් සියදහස් කොටිප්‍රකොටි
ගුණයෙනුත් නොසරි වන්නේමය. එසේහෙයින් සමස්ත ලොක
වාසී සත්වයන් සමකොට දසකොටසක් කළ කල එයින් එක්
කොටසක් හැර නවකොඨාසයෙක් බුදුන්ගේ රූක්ෂප්‍රතිපත්ති
යෙහි ප්‍රසන්නවෙති; මේ රූක්ෂප්‍රමාණ නම් වේ.

**ධර්ම ප්‍රමාණ නම් කවරහයත්?.**

මේ ලොකයෙහි සියලු සත්වයන්ගේම ශිලසමාධ්‍යාදිවූ ගුණ
ධර්මයෝ මාගේ බුදුන්ගේ ගුණසමූහයෙන් අංශුප්‍රමාණයකටත්
සරිකරත්හොත් මහමෙරට උඳුවසරිකලාක්මෙන්ද මහානක්
හට කුහුඹුවකු සරිකලාක්මෙන්ද ගුරුළක්හට මදුරුවකු සරි
කළාක්මෙන්ද සකල ලොකවාසි සත්වයන්ගේ ගුණයෝ ශත
සහස්‍ර ගුණයෙනුත් බුදුන්ගේ ගුණාංශුවකට සරිනොවන්නාහ.
එසේහෙයින් මාගේ බුදුන්ගේ ගුණධර්මයම අසදෘස වන්නේය,
අනොපමෙය වන්නේය. අද්භූතවන්නේය. එසේහෙයින් මේ
ලොකයෙහි සියළුසත්වයන්කොටසකට අඩු වැඩි නොකොට

සරියේම ලක්ෂයක් කොටස් කළ කල එයින් සෙසු කොටස් හැර එක කොටසෙක සත්වයෝ පමණෙක් ධර්මප්‍රමාණ වූවාහුයි සෙසු අනූනවදස ධර්මප්‍රමාණ නුවූවාහුයි.

මේ මාගේ සර්වප්‍රමාණාතික්‍රාන්තවූ තිලෝගුරු බුදුරජානන්වහන්සේගේ චතුර්විධ ප්‍රමාණ නම් වේ.

### චතුර්විධ ආර්‍ය්‍යසත්‍ය නම් කවරහයත්?.

දුක්ඛසත්‍යය දුක්ඛසමුදය සත්‍යය දුක්ඛනිරොධ සත්‍යය දුක්ඛනිරොධ ගාමිනි පටිපදා ආර්‍ය්‍යමාර්ග සත්‍යයයි චතුර්විධවේ. මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් අතුරෙහි දුක්ඛසත්‍යය නම් කවරහයත්?.

පචකාම සැපයෙහි ඇලුම් කිරිමෙන්ද ආත්ම කැලඹීමෙන් රුස්වූද්‍යයි යන මේ අන්තවශානුයොගයෙන් උපන්නාවූ අනාර්‍ය්‍යවූ අනර්ථසංහිතවූ ජාතිදුක්ඛය ජරාදුක්ඛය ව්‍යාධිදුක්ඛය මරණදුක්ඛය අප්‍රියයන් එකතුවිමෙන්වන්නාවූ දුක්ඛය ප්‍රියයන්වියෝවීමෙන්වන්නාවූ දුක්ඛය කැමැති වස්තුවක් නොලැබීමෙන් වන්නාවූ දුක්ඛය භූතප්පසාද ගොචරභාවරූපාදී අටවිසි රූපස්කන්ධයෙන් වන්නාවූ දුක්ඛය "චක්ඛුසම්ඵස්සජා වේදනා" යනාදිවූ වේදනාස්කන්ධයෙන් වන්නාවූ දුක්ඛය "චක්ඛුසම්ඵස්සජාසඤ්ඤා" යනාදිවූ සංඥාස්කන්ධයෙන්වන්නාවූ දුක්ඛය චිත්තචෛතසිකාදිවූ සංස්කාරස්කන්ධයෙන් වන්නාවූ දුක්ඛය චක්ෂුර්විඥනාදිවූ විඥනස්කන්ධයෙන් වන්නාවූ දුක්ඛයයි යන මොවුන්හා සත්වහි-තා ප්‍රදෙශකාවූ කිසිගුණසාරයක් නොපෙණෙන අපාය දුක්ඛයයි යන මේ සියලු දුක්ඛයෙහිම අසාරත්වය ප්‍රකාශකොට බුදුන් විසින්වදාලාවූ ධර්මදෙශනාව ආර්‍ය්‍යයන්වහන්සේගේ ශ්‍රීමුඛයෙන් පහලවූ සත්‍යවචනයක් හෙයින් දුඃඛාර්‍ය්‍යසත්‍ය නම් වේ.

### දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යය නම්?.

රාගාදිවූ කෙලශවසන චිත්තයෙන්සතුටු සතුටුව මතුමත්තෙහි පව් රුස්කෙරෙමින් කාමතෘෂ්ණාවය භවතෘෂ්ණාවය විභවතෘෂ්ණාවය යන මේ ආදින් දුඃඛයන් රුස්වන කාරණයන් දන එහි අසාරත්වය ප්‍රකාශකොට වදාළාවූ ධර්මය ආර්‍ය්‍යයන් වහන්සේගේ ශ්‍රීමුඛයෙන් පහලවූ සත්‍යවචනයක්හෙයින් දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍ය නම් වේ.

දුඃඛ නිරොධාර්‍ය්‍යසත්‍යය නම්-දෘෂ්ටි විචිකිච්ඡා නැසීමෙන් ලබන්නාවූ සෝවාන් මාර්ගයද, රාගද්වේෂ මෝහයන් තුනීකිරීමෙන් ලබන්නාවූ සකෘදාගාමී මාර්ගයද, කාමරාග ව්‍යාපාදයන් නිරව

ශෙෂකොට නැසීමෙන් ලබන්නාවූ අනාගාමි මාර්ගයද, සකල කෙලශයන් නිරවශෙෂයෙන් ප්‍රහීණකොට ලබන්නාවූ අර්හත් මාර්ගයදැයි යන මේ පුද්ගල භෙදයන් හා, මෙහි සොවාන් සකෘදාගාමි ඵලවශයෙන් සුදුසුලෙස ලද්දාවූ අසාධාරණ සමාපත්තීන්ද, අනාගාමි අර්හත්ඵලවශයෙන් ලබන නිරොධ සමාපත්තීන්ද; පිළිවෙළින්ම ප්‍රථමධ්‍යාන ද්විතීයධ්‍යාන තෘතියධ්‍යාන චතුර්ථධ්‍යාන පඤ්චමධ්‍යානයයි කියනලද මහාද්ගත සමාපත්තියට සමවැද එයින් නැගී එහිම අන්තර්ගතවූ සංස්කාර ධර්මයන් විදර්ශනා වශයෙන් වඩා ප්‍රථමද්විතීයාරූප්‍යයෙහි පඤ්චමධ්‍යාන රසාස්වාදය කොට, ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියටද නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියටද සමවැද ඔවුන්ගේ ද්විප්‍රකාරවූ අර්පණාජවන චිත්තසන්තතිය සිඳ මත්තෙහි නිරොධ සමාපත්තියට සමවැද ධ්‍යානරස වළඳාහිඳ එයින් කල්පනාකළ කාලපරිච්ඡෙදයට සුදුසුලෙස නැගී සිටිනා වේලෙහි අනාගාමීහු අනාගාමීඵලචිත්තයද රහත්හු අර්හත්ඵල චිත්තයද එකවාරයෙහිම පවත්වමින් භවාඞ්ගයට පමුණුවා එයින් මත්තෙහි මේ හැම සලකමින් ක්ෂයවූ තෘෂ්ණාව හා දුඃඛය නිශ්චයකොට ලද්දාවූ නිවන්සැපය මෙතැන්හියයි දක්වා දෙශනාකළාවූ ධර්මය ආර්යයන් වහන්සේගේ ශ්‍රීමුඛයෙන් පහළ සත්‍යවචනයක්හෙයින් දුඃඛනිරොධ ආර්ය සත්‍ය නම් වෙයි.

**දුක්ඛනිරොධගාමිනි පටිපදා ආර්යසත්‍ය නම්?.**

සකල කෙලශයන්ප්‍රහීණකොට නිවන්සැප විඳුවන සියලු කුශලයන්ටම හෙතුවූ සම්‍යග්දෘෂ්ටියද, සම්‍යක්කල්පනාවද, සම්‍යක් වචනයද, සම්‍යක්කර්මාන්තයද.සම්‍යක්ආජීවයද,සම්‍යක් ව්‍යායාමයද,සම්‍යක් ස්මෘතියද,සම්‍යක් සමාධියදැයි යන මේ ආදීවූ සියලුම කුශලකාරණයන් ප්‍රකාශකොට ඒ ඒ කුශල ස්ථානයන් නිශ්චයකොට දෙශනාකළාවූ ධර්මය ආර්යයන් වහන්සේගේ ශ්‍රීමුඛයෙන් පහළවූ සත්‍යවචනයක් හෙයින් දුක්ඛනිරොධගාමිනී පටිපදා ආර්යමාර්ගසත්‍ය නම් වේ.

තවද මෙහි දුක්ඛසත්‍යය නම් ක්‍රෑරතර ආබාධයක් වැන්න, දුඃඛ සමුදය සත්‍යය නම් ඒ ආබාධය ජනිතවීමට කාරණාවූ ත්‍රිවිධ දොෂොත්සන්නතාදී ඍතු විපරීතාදියක් වැන්න, දුඃඛනිරොධ සත්‍යයනම් ඒ ආබාධයෙන්මිදී නිර්ව්‍යාධි වූවාක් වැන්න, දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාආර්ය මාර්ගසත්‍යය නම් ඒ ආබාධය නිරවශෙෂයෙන් සන්හිඳෙනලෙසටලත් දිව්‍යමන්ත්‍ර දිව්‍යඖෂධා

දියක් වැන්නේයි.

තවද සංසාර වෘත්තියෙහි ච්‍යුති ප්‍රතිසන්ධිවශයෙන් සැරිසරා කාලාතික්‍රාන්තකොට ව්‍යසන විඳිනාවූ කායික මානසික දුඃඛය දුක්ඛසත්‍ය නම් වේ. ඒ දුක්ඛයට කාරණාවූ කෙලශ වසඟ කාම භව විභවතෘෂ්ණාදියෙන් දුඃඛයන්ම රැස්කරණබව දුඃඛසමුදය සත්‍ය නම් වේ ඒ දුක්ඛයෙන් මිදී ලද්දාවූ නිර්වාණ සම්පත්තියෙන් තෘෂ්ණාක්‍ෂයකළබව දුඃඛ නිරෝධසත්‍ය නම් වේ. ඒ නිර්වාණ ප්‍රතිලාභයට හෙතුවූ සම්‍යක් ස්මෘති සම්‍යක්සමාධි ආදීවූ මාර්ගඵල ප්‍රතිලාභය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය නම් වේ මේ චතුරාර්‍ය්‍යසත්‍ය ප්‍රකාශකවූ ධර්මදෙශනාවෙන් යුක්තසේක.

**චතුර්විධ ප්‍රතිසම්භිදා නම් කවරහයක්?.**

අර්ථප්‍රතිසම්භිදාය ධර්මප්‍රතිසම්භිදාය නිරුක්තිප්‍රතිසම්භිදාය ප්‍රතිභාණ ප්‍රතිසම්භිදායයි චතුර්විධ වේ-ඒ චතුර්විධ ප්‍රතිසම්භිදාවන් අතුරෙහි,

**අර්ථප්‍රතිසම්භිදා නම් කවරහයක්?.**

“අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදායි” යනුහෙයින් අර්ථයෙහි ප්‍රභෙදගතවූ ප්‍රඥාව අර්ථප්‍රතිසම්භිදා නම් වෙයී; ධම්මෙ ඤාණං ධම්මපටිසම්භිදා”යි යනුහෙයින් ධර්මයෙහි ප්‍රභෙදගතවූ ප්‍රඥාව ධර්මප්‍රතිසම්භිදා නම් වෙයි; ” ධම්මනිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්තිපටිසම්භිදා”යි යනුහෙයින් ධර්මනිරුක්ත්‍යභිලාපයෙහි ප්‍රභෙදගතවූ ප්‍රඥාව නිරුක්තිප්‍රතිසම්භිදා නම් වෙයි; “ඤාණෙසු ඤාණං පටිභාණ පටිසම්භිදා“යියනුහෙයින් ප්‍රතිභාණයෙහි ප්‍රභෙදගතවූ ප්‍රඥාව ප්‍රතිභාණ ප්‍රති සම්භිදා නම් වෙයි.

**මෙහි ප්‍රඥා නම් කවරහයක්?.**

කුසලචිත්තය හා එක්වූ විදර්ශනා ඥානය ප්‍රඥා නම් වෙයි; කවරාර්ථයෙන් ප්‍රඥා නම් වීද?. පජානනාඨෙන පඤ්ඤා” යි යනුහෙයින් ප්‍රජානනාර්ථයෙන් ප්‍රඥානම්වී. පජානනය නම් කවරේද? සජානන විජානනාකාර විශෙෂය නානා ප්‍රකාරයෙන් ඉපදවීමයි.ඒ සංඥා විඥාන ප්‍රඥා”යයිසන තුණම සමාන උවත් සංඥාතොමෝ ජානන සවභාවයෙන් නීලපීතාදීවූ අරමුණු පමණක්ම දැනගන්නේය, අනිත්‍යදුඃඛ අනාත්මයයියන ලක්‍ෂණ ප්‍රතිවෙධය සිඬකිරීමට අසමර්ථ වන්නේය; විඥානය නීලපීතාදීවූ ආරම්මණ සවභාවයත් අදුනන්නේය, අනිත්‍යාදි ත්‍රිලක්‍ෂණප්‍රතිවෙධයද සිඬකරන්නේය” විශෙෂයෙන් චිත්තයට නගා එයින් මත්තෙහි මාර්ගඵලයත් සිඬකිරීමට අසමර්ථ වන්නේය; ප්‍රඥා වනාහි නීලපීතාදීවූ අරමුණුත් හැඳින අනිත්‍යාදීවූ ලක්‍ෂණ ප්‍රතිවෙධයටද පැමිණ විශෙෂයෙන් චිත්තයට නගා මත්තෙහි මාර්ගඵලයද සිඬකරන්නේයි-හේ එසේමැයි-යම්සේ එක් අජාතබුද්ධිකවූ ළදරුවෙක්ද පිටිසරවැසි ග්‍රාමිකපුරුෂයෙක්ද නුවරවැසි හෛරණ්‍යක පුරුෂයෙක්දැයි යන මේ තුන්දෙනම හෛරණ්‍යක ඵලකයෙහි තබනලද්දාවූ කහවනු රැසක් දැක ඔවුන් තුන්දෙනා අතුරෙහි

අජාතබුද්ධිදරකාතෙම කහවණුවෙහි චිත්‍ර විචිත්‍ර අඩු දිගු සතරැස් වටවූ ආකාර පමණක්ම අදුනන්නේය, මේ මනුෂ්‍යයන්ට උපභොග පරිභොග රත්න සමමතාදියෙහි ක්‍රය වික්‍රයට සුදුසුයයි නොදන්නේයි, ග්‍රාමිකා පුරුෂතෙම කහවණුයෙහි චිත්‍ර විචිත්‍ර අඩු ආදියද දිගු වට සතරැස්ආකාර හැඳින වස්ත්‍රාභරණාදියෙහි ක්‍රය වික්‍රයට සුදුසුයයි කියාද දැනගන්නේය. මේ කූටකහවණුය මේ අඞිසාරකහවණුය මේ සජිසාර කහවණුයයි ඒ කහවණුවෙහි විභාගය දැනගතනොහෙන්නේය, හෙරඤ්ඤ පුරුෂතෙම ඒ හැම චිත්‍ර විචිත්‍ර දීඝීචතුරස්‍ර පරිමණ්ඩලාදීවූ අරමුණුද හැඳින රත්න සම්මිතාදියට යහපතැයි යන ලක්ෂණද දැන කහවණු ඉදුරා බලා එහි විභාග දැනගන්නේය. ගැසූහඬිනුත් දැනගන්නේය ගන්ධාඝ්‍රාණයෙනුත් දැනගන්නේය, එහි රස බලාත් දැනගන්නේය, අතින් දරා බර දැන්මෙනුත් දැනගන්නේය. අසවල් ගම් නියම්ගම් රාජධානියෙහිදී ගැසූකහවණුයයි කියාත් දැනගන්නේය, මෙනම් පජීතයෙහිදී මෙනම් වනයෙහිදී මෙනම් නදී තීරයෙහිදී ගැසූ කහවණුයයි කියාත් දැනගන්නේය. මෙසේ නොයෙක් කාරණාදැන කහවණු විභාගකරන්නේය, ඒ කහවණු විභාගකළ තුන්දෙනාගෙන් සංඥාව නම් අජාතබුද්ධික ළදරුවා කහවණු දුටුවාක්මෙන් නිලපීතාදීන් අරමුණට වැටහෙන පමණක් ගැන්මවෙයි. විඥානය නම් ග්‍රාමිකාපුරුෂයා කහවණු දුටුවාක්මෙන් නීලපීතාදී වශයෙන් අරමුණු ආකාර දැනගැන්මද ඒ අරමුණු චිත්තයට නගා මත්තෙහි අනිත්‍යාදී ලක්ෂණ ප්‍රතිවෙධ සිද්ධකිරීමද වෙයි, ප්‍රඥාව නම් හෙරඤ්ඤක පුරුෂයා කහවණු දුටුවාක්මෙන් නීලපීතාදී අරමුණු ගෙණ ලක්ෂණ ප්‍රතිවෙධයටද පැමිණ එයින් මත්තෙහි මාර්ගඵලයද සිද්ධකරන්නේයි, එසේහෙයින් මේ සජානන විජානන විශෙෂය දැනීම පජානන නම් වේ, මේ කාරණය සඳහා පජානනවෙන පඤ්ඤා "සි කීහු

ඒ ප්‍රඥාවෙන් දෙශනාකළාවූ ධර්මය අතිසංක්ෂෙප බැවින් විශෙෂයෙන් දැනගන්නට සියුම් වන්නේය එසේහෙයින් විශෙෂයෙන් දක්වත් නොපිළිවන කාවරහෙයින්දයත් ? ප්‍රඥාව බහුවිධ බැවිනුත් නානාප්‍රකාර බැවිනුත් ඒහැම විභාගකොට විසඳීමට පටන්ගන්නාහට අභිප්‍රායාර්ථය සිද්ධනොවන්නේයමත්තෙහිදු වික්ෂිප්තබවට පමුණුවන්නේය එතකුදුළුවත් මෙතැන්හි ඒ ප්‍රඥාදෙශනාවෙන් ස්වල්පමාත්‍රයක් දක්වනු ලැබේ

**මග් කෙසේදයත් ?.**

ඒප්‍රඥාව ධර්මස්වභාව ප්‍රතිවේධලක්‍ෂණයෙන් එකවිධවෙයි, ලෞකික ලොකොත්තර වශයෙන් ද්විවිධවෙයි, නාමරූප නියමකිරීම් වශයෙනුත් ද්විවිධවෙයි, චින්තන සවණ භාවනා වශයෙන් ත්‍රිවිධ වෙයි, අර්ථ ධර්මනිරුක්ති ප්‍රතිභාණ සඞ්ඛ්‍යාත චතුපටිසම්භිදා වශයෙන් චතුර්විධ වෙයි.

**එසින් ධර්මස්වභාවප්‍රතිවේධලක්‍ෂණ නම් කවරහයක් ?:** ලක්‍ෂණය රසය පච්චුපට්ඨානය පදස්ථානය යන මොවුන්ගේ වශයෙන් දැනගැන්ම එකවිධ වෙයි-

**ලෞකික ලොකොත්තර නම්:**—ලෞකික මාර්ගය හා සම්ප්‍රයුක්තවූ ඥානය ලෞකික නම් වේ, ලොකොත්තර මාර්ගය හා සම්ප්‍රයුක්තවූ ඥානය ලොකොත්තර නම් වෙයි, කියා ලෞකික ලොකොත්තර ඥාන සම්ප්‍රයුක්තවශයෙන් ද්විවිධ වෙයි.

**නාමරූප නම්**-: යම් විදර්ශනාවක් පටන්ගන්නා කැමැත්තාහට සතර අරූපස්කන්ධයන්ගේ නියම කිරීමෙහි පැවැත්තාවූ යම් ප්‍රඥාවෙක් ඇද්ද ඒ ප්‍රඥාව නාමය නියම කරන්නාවූ ප්‍රඥා නම් වෙයි, රූපස්කන්ධයාගේ නියමකිරීමෙහි පැවැත්තාවූ යම් ප්‍රඥාවෙක් ඇද්ද ඒප්‍රඥාව රූපය නියමකරන්නාවූ ප්‍රඥානම්වෙයි කියා මෙසේ නාමරූපදෙදෙනාගේ විභාගකිරීම් වශයෙන් ද්විවිධවෙයි.

**චින්තන සවණභාවනානම්**-: වෙනතෙනකින් නොඅසා තමාගේ සිතීම් වශයෙන්ම නිපදවනලද චින්තාමය ප්‍රතිලබ්ධවූ ප්‍රඥාව චින්තන නම්වෙයි; අනුන්ගෙන් ඇසීමෙන්වූ ශ්‍රවණානුසාරයෙන් ප්‍රතිලබ්ධවූ ප්‍රඥාව ශ්‍රැතිවශයෙන් නිෂ්පන්නවූ හෙයින් සවණ නම් වෙයි; යම්සේ භාවනා වශයෙන් නිපදවනලද එපරිද්දෙන්ම අර්පිනාප්‍රාප්තවූ ප්‍රඥාව භාවනා නම් වෙයි කියාත්‍රිවිධවේ.

**අර්ථධර්ම නිරුක්ති ප්‍රතිභාණවශයෙන් චතුර්විධවීමනම්:**-මෙහි අර්ථයයි යනු පරමාර්ථවශයෙන් හෙතුඵලයටද නමෙක ඒහෙතු අනුසාරයෙන් ගොස් ඵලයට පමුණුවන හෙයින් අර්ථයයි කියනු ලැබේ. ඒ හෙතුඵලාදිවූ යම්කිසි ප්‍රත්‍යයෙක්ද නිර්වාණයද ඒ නිර්වාණයයි කියනලද්දාවූ අර්ථයද විපාකයද ක්‍රියාවදැයි, යන පස්වැදෑරුම්වූ ධර්මය අර්ථය නම් වෙයි. ඒ අර්ථය සලකා සිතට වටහන්නාහට ඒ අර්ථයෙහි ප්‍රභෙදගතවූ ඥානය අර්ථප්‍රතිසම්භිදා නම් වෙයි. ධර්මයයි යනු ප්‍රත්‍යයට නමෙක ඒ ප්‍රත්‍යය වනාහි යම් හෙයකින් ඒ ඒ කාරණයන් සඳහා පවත්නේ හෝ වේද ඒ ප්‍රත්‍ය

යට ඒකාන්තයෙන් පැමිණීම හෝ වේද එහෙයින් ධර්මයයි කියනු ලැබේ. ඒ ප්‍රභේදවශයෙන් යම්කිසි ඵලයක් නිෂ්පාදනය කරන්නාවූ හේතුද ආර්‍යයමාර්ගයද ආර්‍යයමාර්ගය ප්‍රකාශකිරීමද කුශලයද අකුශලය දැයි, යන මේ පඤ්චවිධවූ ධර්මය ධර්ම නම් වේ. ඒ ධර්මය මෙනෙහි කිරීමෙන් එහි ප්‍රභේදගතව පැවැත්තාවූ ඤාණය ධර්ම ප්‍රතිසම්භිදා නම් වේ. තවද දුඃඛයෙහි පැවැත්තාවූ ඤාණය අර්ථ ප්‍රතිසම්භිදා නම් වේ. දුක්ඛසමුදයෙහි පැවැත්තාවූ ඤාණය ධර්ම ප්‍රතිසම්භිදා නම් වේ. හේතුයෙහි පැවැත්තාවූ ඤාණය ධර්මප්‍රති සම්භිදා නම් වෙයි. හේතුඵලයෙහි පැවැත්තාවූ ඤාණය අර්ථප්‍රති සම්භිදා නම් වේ. ජරාමරණ යෙහි පැවැත්තාවූ ඤාණය අර්ථප්‍රති සම්භිදා නම්වෙයි.*සූත්‍රගෙයාදීවූ නවාඞ්ගය †ධර්මප්‍රතිසම්භිදා නම් වෙයි. එහිම කියනලද්දවූ අර්ථය විභාගකොට දැන්ම අර්ථප්‍රති සම්භිදා නම් වේ. කාමාවචර කුශලචිත්තාදියෙහි පැවැත්තාවූ ඤාණය ධර්මප්‍රතිසම්භිදා නම් වෙයි ඔවුන්ගේ විපාකයෙහි පැවැත් තාවූ ඤාණය අර්ථප්‍රතිසම්භිදා නම් වෙයි. මේ පරමාර්ථවශයෙන් විභාගකොට දක්වූ අර්ථධර්මප්‍රතිසම්භිදා නම.

තවද ලෝකාර්ථවශයෙන් සත්වලෝකය අවකාශලෝකය සංස්කාරලෝකයයි කියනලද තුන්ලෙව්හි අතීත අනාගත වර්ත මාන සඞ්ඛ්‍යාත තුන් කල්හිම කර්ම ඍතු හේතු ප්‍රත්‍යයෙන් උපන් සියලු අර්ථයන්ම අනාවරණඥානයෙන් යුක්තවූ මාගේ බුදුරජා නන් වහන්සේ නොවළහාම දන්නාසේක.

**ගේ කෙසේද සක්?.**

යට අජටාකාශමත්තෙහි නවලක්ෂසැටදහසක් යොදුන් බොල ඇති වාපොළොව පිහිටියේය. ඒ වාපොළොව මත්තෙහි සාර ලක්ෂ අසූදහසක් යොදුන් බොල ඇති ජලපොලව පිහිටියේය.

ඒ ජලපොළොව අනන්තාපර්‍යන්ත හැම සක්වළටම ආධාරව පැතිර සිටියේය. ඒ ජලපොළොව මුදුනෙහි පිහිටියාවූ සියලු සක් වළවල් පාංශුජලශෛලාදියෙන් මදක් තබා පිරූ පාත්‍ර සමූහයක් වටින් වටගසා දියපිට තුබූවාක්මෙන් පිහිටියෝය. එයින් සක් වළ තුණක් එක්වූ තැන්අතුර තුණැස්වූ අවකාශයෙහි ලෝකා න්තරික නරකය අප්‍රමාණව පිහිටියේය. විෂයක්ෂෙත්‍ර ආඥාක්ෂෙත්‍ර ජන්මක්ෂෙත්‍රයයි කියනලද ත්‍රිවිධ බුද්ධක්ෂෙත්‍රවූ ඒහැම සක්වළවල සල / පොළොවෙහි පටන් බ්‍රහ්මාණ්ඩය දක්වා වටින් ඒ චක්‍රවාට පර්‍යන්තව මේ අතුරෙහි පිහිටි ධාතු ජීව මූලාදීවූ පෘථිවි පර්වත දීප වෘක්ෂ ලතා දෙව බ්‍රහ්ම භවනාදිවූ සියළු වස්තූන්ම සාධාරණ උවත් ඒ හැම සක්වළින් මේ මඟුල්සක්වළ ගුණානුභාවයෙන්

*ජරාමරණසමුදයෙහි පැවැත්තාවූ ඤාණය ධර්මප්‍රතිසම්භිදා නම් වෙයි.

† "නවාඞ්ගයෙහි පැවැත්තාවූ ඤාණය"

/ "ජල"

උතුම් වන්නේය. සියලු අර්ථයෙනුදු වැඩිතරම් වූයේය. මේ සක්වළෙහිත් යට එක්ලක්ෂවිසිදහසක් යොදුන් ඝනකාඬබොල් සලපොළොව එක්ලක්ෂවිසිදහසක් යොදුන් ඝනවූ පස්පොළොව ධරාගණ පැතිර චක්‍රවාට පර්වතය වටින් උද්ගතව සිටිනේය. ඒ සලපොළොවත් පස්පොළොවත් එක්ව දෙලක්ෂ සතළිස්දහසක් යොදුන් ඝනකාඬබොල් මහපොළොව යයි ලොකප්‍රසිඬ විය. එහි මූදුනෙහි සුවාසූදහසක් යොදුන් ගැඹුරුවූ මහාසමුද්‍රය වටින් සතිස්ලක්ෂ දසදහස් තුන්සියපණස්යොදුන් පමණවූ සක්වළගබ පැහැර සිටිනේය. ඒ සමුද්‍රය අතරතුර පිහිටි සතරමහත් ද්වීපයෙන් එකි එකී දිවයිනක් පිරිවරා පන්සියයක් පන්සියයක් කොදෙව්බැගින් දෙදහසක් කොදෙව් පිහිටියේය. එයින් සකට සණ්ඨානව තුණැස්වූ මේ ජම්බුද්වීපය අයම්විතරින් දසදහසක් දසදහසක් යොදුන් පමණ ඇත්තේය. ආදෘස සටහන්වැ වටවූ අපරගොයානය අයම්විතරින් සත්දහස් සත්දහස් යොදුන් පමණ ඇත්තේය. පීඨසටහන්ව සතරැස්වූ උතුරුකුරුදිවයින අයම්විතරින් අටඅටදහස්යොදුන් පමණ ඇත්තේය. අඬචන්ද්‍රසටහන්ව දෙකොන්වූ පූර්වවිදේහය අයම් විතරින් සත්සත් දහස් යොදුන් පමණ ඇත්තේය. පිරිවරපන්සියයක් පන්සියයක් දිවයින් හා සමග වෙත වෙතම මේ සතර දිවයින වසන මනුෂ්‍යයන්ගේ මුහුනුත් ඒ ඒ සටහන්ම විය මේ සතරමහත්ද්වීපය අතුරෙහි දසදහසක් යොදුන් දිගපුළුලඇති ජම්බුද්වීපයෙන් සාරදහසක් යොදුන් පමණ තැන් පරිභොගාරහ ජනයන්ගේ කුශල ක්ෂයින් මුහුදුවිය තුන්දහසක් යොදුන්තැන් හිමාලයපර්වතයවිය තුන්දහසක් යොදුන්පමණ තැන් සයානූලක්ෂයක් පටුන් ගමින්හා සපණසක් රුවන් ආකරයෙන්හා නවානූලක්ෂයක් ද්‍රොණමුඛයෙන්හා උත්තම මධ්‍යම අධමකාලයෙහි සුවාසූදහසක් තෙසැටදහසක් ඒ සියක් රාජධානියෙන් යුක්තවූ ජම්බුද්වීපය මනුෂ්‍යයන්ට වාසස්ථාන විය හිමාලය පර්වතය අයම්විතරින් තන්තුන්දහස් යොදුන් පමණවිය උසින් පන්සියක් යොදුන්පමණ විය. සුවාසූදහසක් රන්රිදී මැණික් පර්වතවලින් ප්‍රතිමණ්ඩිත විය.

**එයින් කීය පූර්වාචාර්ය විසින්—;**

"යොජනානං සහස්සානි තීණි ආයතවිත්ථතො,
චතුරාසීතිසහස්සෙහි කූටෙහි පතිමණ්ඩිතො" යි

ඒ හිමාලයපර්වතය හිමයට වාශස්ථානව රිදීපර්වතයක් මෙන් දුරට පෙණෙන හෙයින් හිමාලයපර්වත නම් විය. ඒ හිමාලවත

යෙන් පන්සියයක් ගඞ්ගාහුනුයේය. ඒ හිමාලයෙහි දිගින්පුළුලින් පණස්පණස් යොදුන්වූ අනෙකාශ්‍රී දර්ශනීයවූ අනොතත්තවිලය කණ්ණමුණ්ඩවිලය රථකාරවිලය ඡද්දන්තවිලය කුණාලවිලය මන්දාකිණිවිලය සිංහප්‍රපාතවිලයයි මහ විල්සත පිහිටියේය. එයින් අනොතත්තවිල වටකොට සුදර්ශනකූටය චිත්‍රකූටය කාලකූටය ගන්ධමාදනකූටය කෛලාසකූටයයි යන පර්වතපසකින් පරික්ෂිප්ත විය. එයින් සුදර්ශනකූටය රන්වන්පැහැ ඇත්තේය කාකමුඛාකාරව ඇතුළත්ව නැමීසිටිනේය දෙසියයක්යොදුන් උස ඇත්තේය. චිත්‍රකූට පර්වතය සර්වරත්නමයය. කාලකූටය අඳුන්වන් පැහැ ඇත්තේය. ගන්ධමාදනපර්වතය ශ්‍යාමවර්ණය ඇතුළත් මුංවන් පැහැ ඇත්තේය. කාලානුසාරී යනාදීවූ මූලගන්ධය සඳුන්ආදීවූ හරසුවඳය සලලාදීවූ කොවුල්සුවඳය ලමහආදිවූ පොතුසුවඳය කපිත්ථාදීවූ පපටිකාගන්ධය සර්ජාදීවූ රසගන්ධය තමාලාදීවූ පත්‍රගන්ධය නාගකුඞ්කුමාදීවූ පුෂ්පගන්ධය ජාතිඵලාදීවූ ඵලගන්ධය සර්වප්‍රකාරයෙන් පවත්නා නොයෙක් සුවඳ ආදීවූ ගන්ධ ගන්ධයයි යන මේ දසවිධවූ සුගන්ධයෙන්ද අනෙකප්‍රකාරවූ; ඖෂධයෙන්ද ගැවසී සිටිනේය අව පසළොස්වක් රාත්‍රියෙහි සහස්‍ර කිරණාලොකයක් මෙන් බබලන්නේය. එම ගන්ධමාදන පර්වතයෙහි නන්දමූලක නම් පබ්භාරයෙක් ඇත්තේය. ඒ පබ්භාරයෙහි පසේබුදුවරයන් වහන්සේ වසන රන් ගුහාවෙක රිදී ගුහාවෙක මැණික් ගුහා වෙකැයි තුන්ගුහාවෙක් වෙයි. එයින් විසිතුරුවූ මැණික් ලෙන දොරකඩ රුවන්මලුව අස යොදුනක් උසඇති මංජූසක නම් වෘක්ෂයෙක් වෙයි. ඒ ගසෙහි දියගොඩ පිපෙන හැම මල්ම පිපෙන්නේය. පසේබුදුවරයන්වහන්සේ එතැන්හි වඩනා දවස් ඒ රුවන්මලුව පවනෙක් අවුත් හමදනේය පවනෙක්අවුත් මලුවෙහි රුවන්වැලි වළගොඩ තැන් සමකොට හෙරිතලයක්සේ තනන්නේය. පවනෙක් අනොතත්තවිලින් දියගෙණවුත් ඉසිනේය පවනෙක් ඒ වනයෙහි සියලුසුවඳම ගෙණවුත් රුවන් මලුවෙහි බහා මලුව එක සුවඳපිඩක්සේ කරන්නේය. පවනෙක් ඒ මංජුසක නම් ගසෙහි පිපි මල්නටු බිඳ වගුරුවන්නේය පවනෙක් නටු බිඳ හෙලූ මල් මලුවෙහි මලස්නක්සේ තනා අතුරන්නේය. හැමකල්හි හිඳිනා අසුන් පණවා තිබෙන්නේය එහි පසේබුදුවරයන්වහන්සේ වැඩහිඳ කමටහන් විචාරා පොහොය කොට වඩනාසේක. කෛලාසකූටපර්වතය රිදීපැහැ ඇත්තේය. දෙවියන්ගේ ආනුභාවයෙන් හා නයින්ගේ ආනුභාවයෙන් මසකට සතර

වැස්සෙක් වස්නේය. ඒ හැම නදීහු අනොතත්තවිලටම වදනාහුයි දකුණෙන් උතුරෙන් හිරසඳ යන කල්හි පර්වතාන්තරයෙහි සූර්‍ය්‍යාලොක පැහැර මඳක්විල ආලොක කරණපමණක්මුත් මුදුනෙන් හිරසඳ යනකල්හි ආලොකනොවැටෙනහෙයින් ඒ විල අනොතත්තනාම් විය. අනොතත්ත විල වට රිදීපවුරෙක් විය. ඒ පවුර තැනින් තැන සොපානමාලාවෙන් යුක්තවූ තහතතොටවලින් හොබනේය. ප්‍රාණීන් රහිතවූ නිර්මල ජලය බුදු පසේබුදු මහරහතුන් වහන්සේලාට හා සිඬ විද්‍යාධරාදීවූ දෙවියන්ට ප්‍රයොජන විය. ඒවිල සතරදිග සිංහමුඛය හස්තිමුඛය අශ්වමුඛය වෘෂභමුඛයයි සතරමුඛයෙක් විය ඒසතරමුඛයෙන් වෙනවෙනම ගඞ්ගා සතරෙක් හුනුයේය. එයින් සිංහමුඛයෙන් ගිය ගඞ්ගා තීරයෙහි සිංහයෝ බහුලවූහ හස්ති අශ්ව වෘෂභ මුඛවලින් ගිය ගඞ්ගාතීරවලද ඇත්අස්ගවයෝ බහුල වූහ. පශ්චිමොත්තරපූර්වදිශාවෙන් නික්මුණු ගඞ්ගාවෝ තුන්තුන්වට විලවට ප්‍රදක්ෂිණාකොට මහවනමැදින්ම ගොස් සමුද්‍රයට වත්හ. ඉන් දකුණට නික්මුණු ගඞ්ගාව තුන්විටක් විල වටා පැදකුණුකොට දකුණෙන් මහගලතලක් මුදුනෙන් සැටයොත්නක් ගොස් සරස සිටි පර්වතයක පැහැර තුන්ගව්වක් පමණ වට ඇති දියකඳ අහසට පැණ තැගී සැට යොදුනක් ගොස් තියග්ගලානම් ගලතලක් මුදුනෙහි වැටී පණස්යොදනක් පමණ තැන් ගලතල බිඳී පොකුණක්ව එහි පවුර බිඳගෙණ ගලතල මුදුනෙන් සැටයොදුනක් ගොස් බිමහුනු තැන මහපොළව බිඳගණ උමගින් සැටයොදුනක්ගොස් සරස සිටි විඤ්ඣ්‍යනම්පර්වතයෙහි වැදගණ හස්තයෙහි පඤ්චාඞ්ගුලීන්මෙන් ජලධාරා පසෙක් පිටත්ව මනුෂ්‍යපථයෙන් ගොස් සමුද්‍රයට වැටුනාහ. ඒ ගඞ්ගාව මුලින් අනොතත්තවිලවට තුන්විටක් පැදකුණුකළතැන් ආවට්ටගඞ්ගා නම් විය. ගලතල මුදුනෙන් ගිය සැටයොදුන් තැන් කාළගඞ්ගානම් විය අහසින්ගිය සැටයොදුන් තැන් ආකාශගඞ්ගා නම් විය අහසින් ගොස් තියග්ගලාගලතල මුදුනෙහි වැටී පණස් යොදුනක් බිඳුනු වළ තියග්ගලා පොකුණ නම් විය පොකුණේ ඉවුර බිඳගෙණ ගලතල මුදුනෙන් ගිය සැට යොදුන් තැන් බහලගඞ්ගා නම් විය. ගලතලින් බිම ගී පොළොව පළාගණ උමගින් නික්මුණු සැටයොදුන් තැන් උම්මගගඞ්ගා නම් විය. විඤ්ඣ්‍යනම් පර්වතයෙහි වැද බිදගෙණ ධාරා පසෙක්ව පිටත්වූ තැන් ගඞ්ගාය යමුනාය අචිරවතීය සරභූය මහියයි යන පඤ්චමහාගඞ්ගා නම් විය.

ඡද්දන්‍ත විල මධ්‍යයෙහි දෙළොස්යොදුන් පමණ තැන් ශෛවාලාදිරහිතව ඉඳුනිල්මිණිකඳක් මෙන් ප්‍රසන්නවූ ජලයෙන් පිරී සිටිනේය. ඒජලය සිසාරා යොදුනක් පුළුලතැන් සුඹවූ කල්හාර වනය පිහිටියේය.ඒ කල්හාරවනය සිසාරා යොදුනක් පුළුල නිලුපුල් වනය පිහිටියේය.

මෙම ක්‍රමයෙන් යොදුන් යොදුන් පුළුල රක්තෝත්පලවනය ශ්වෙතොත්පල වනය රත්පියුම් වනය හෙළ පියුම් වනය කෞමුද වනය කල්හාරාදී වශයෙන් මිශ්‍රක වනයයි මෙසේ ජලජපුෂ්පවන අටක් සිසාරා සිටි කල්හි ඊට අනතුරුව ඇතුන් පොවුනාතැන්හි යොදනක්පුළුල ඇති රත්හැල්වනය මිශ්‍රක වනය සිසාරා පිහිටියේය ඒරත්හැල් වනයට අනතුරුව ජලාන්‍තයෙහි සුවඳ මල්සුපිපි කුඩාගංගින් හොබනා මිශ්‍රක වනය පිහිටියේය. ඊටඅනතුරුව වෙන වෙනම සුලු මෑ මහ මෑ උඳු මුං ලබු පුසුල් කැකිරි තියඹරා කොමඬු පුසුලැයි යන වනයෝ යොදුන්යොදුන් පමණ තැන් පුළුල පිහිටියාහ. ඊට අනතුරුව යොදනක් පුළුලතැන් පුවක්දඬු පමණවූ උක්වනය පිහිටියේය ඊට අනතුරුව ඇත්දළ පමණ ඵලඇති කොහෙල් වනය පිහිටියේය. ඊට අනතුරුව යොදනක්තැන් සල්වනය පිහිටියේය. ඊට අනතුරුව මහසැල පමණ ඵල ඇති කොස් වනය පිහිටියේය. ඊට අනතුරුව හැමගස් මුසුවූ මිශ්‍රක වනය පිහිටියේය. ඊට අනතුරුව දික්දූවන් විසිනුදු විනිවිද යානොහැකි හුණවනය පිහිටියේය. මේ සියලු වනයන්ටම අනතුරුව පිටතින් සිසාරා පර්වතවලලුසතෙක් පිහිටියේය.එසින් සත්යොදුන් උස ඇති ඇතුළ රන්වන්වූ සුවර්ණ පාර්ශව * පර්වතය පාත්‍රමූවවිටක් මෙන් ඇතුලට නැමී උණවනයට පිටතින් ඡද්දන්‍තවිල සිසාරා පිහිටියේය. එහි රන්වන් පැහැය ඡද්දන්‍ත විල දියට වැටී නිරන්‍තරයෙන් තරුණ රිවිමඬලක් දියෙහි ගැලුනාක් මෙන් බබලන්නේය. ඊට අනතුරුව සයොදුන් උස ඇති මණිපාර්ශවපර්වතය පිහිටියේය. ඊට අනතුරුව පස්යොදුන් උස ඇති සූර්‍ය්‍යපාර්ශ්ව පර්වතය පිහිටියේය. ඊට අනතුරුව සතර යොදුන් උසඇති චන්‍ද්‍රපාර්ශ්ව පර්වතය පිහිටියේය. ඊට අනතුරුව තුන්යොදුන් උසඇති උදකපාර්ශ්ව පර්වතය පිහිටියේය. ඊට අනතුරුව දෙයොදුන් උසඇති මහාකාළ පර්වතය පිහිටියේය. ඊට අනතුරුව යොත්නක් උසඇති චුල්ලකාළපර්වතය පිහිටියේය.

* "එසස"—

මෙසේ සත් පර්වතයකින් වටකළ ඡද්දන්තවිලට අග්නිකොණයෙහි නුදුරුව පවතින් දියබිඳු ඉසෙන පමණ තැන්හි කඳ වට පස්යොදුන් පමණවූ කඳමුලපටන් වෙළපට සත්යොදුන් පමණවූ සතරදිශාවට ගිය අතු සතර සයොදුන් සයොදුන් පමණවූ මුදුන් ශාඛාවද එම පමණවූ ගස මුලපටන් අග දක්වා තෙළෙස් යොදුන් පමණවූ උතුරෙන් දකුණටද ඉදුරෙන් පැළදිගටද දෙළොස් යොදුන් දෙළොස් යොදුන් පමණවූ අටදහසක් අරළු ඇත්තාවූ මහත් මුඹුමිණි කුළක් වැනි නුගරුකෙක් පිහිටියේය. ඒ නුගරුකෙහි අටදසක් අරළු යට ඡද්දන්තහස්තීහු ග්‍රීෂ්මකාලයෙහි වසන්නාහුය වර්ෂාකාලයෙහි සවර්ණපාෂාණාදීවූ පර්වතවල වසන්නාහුය. මේ හස්තීන්ගේ සතර කකුලද සොඬද වාලධියද හිඟුල් මෙන් රතුය කඳමැද සුදුය.

මනුකිණිවිල මැද පස්විසියොදුන් පමණ තැන් සෙවෙල් හෝ ප්‍රාණීන් හෝ නොමැතිව සිහිලස මිහිරි ප්‍රසන්නවූ පිළිමිණිමන් ජලයෙන් පිරී සිටිනේය. ඒසිසාරා දෙගව්වක් පුළුලතැන්හි හෙළ පියුම් වනය පිහිටියේය. ඒ හෙළපියුම් මෙනෙහි නගුලිස් පමණ නෙලුඹුදළු ඇත්තෝය. එහිඅල පොකුරු බෙරපමණ ඇත්තෝය එහි එකිඑකී පුරුකක † වසා සිටි සිවියක් ඇතුළෙහි නැළියක් පමණ කිරි පිරී සිටිනේය. මල් පිපුනු කල්හි සුළඟින් රේණු පැහැර ගොස් පියුම්පතපිට වැගිර පවතින් දිය බිඳු ඉසී හිරුරැසින් පැසී මදරත්යවටක් මෙන් ඝනව රසයෙන් යුක්තවූ පොකුරුම් ධ්‍යානලාභීවූ තපස්වී ආදීන්ට ප්‍රයොජන වන්නේය. මේ හෙළ පියුම් වනයට අනතුරුව රත්පියුම් වනය පිහිටියේය. ඊට අනතුරුවරත්කුමුදුවනය හෙළකුමුදුවනය නිලුපුල්වනය රක්තොත්පලවනය සුවඳ රත්හැල්වනය කැකිරි තියඹරා ලබු පුසුල් ආදී වල් ලීඑලවනයයි යන මේ එකොළොස්වනම ඒ ඒ වනයන් සිසාරා අනුක්‍රමයෙන්පිහිටියාහ. ඊට අනතුරුව අටයොදුන් පුළුල තැන් හුණදඹු පමණ දඹු ඇති උක්වනය පිහිටියේය. ඒ උක් වනයෙහි වසන්නාවූ හස්තීහු උක්දඹු බිඳගණ ගල්අතළවල තබා පයින් මිරිකූ කල උක්පැණි වැගිර ගල්කෙම්වල පිරී සිට ඉරඅව් වෙන් පැසී කිරිවහන මෙන් ඝනවූ උක්සකුරු කැටි තිබෙන්නේය. ඒ උක්සකුරු කිසිකලක හස්ත්‍රාජයෝ ගෙණ පැමිණි බුදු පසේබුදු මහරහතුන් වහන්සේලාට පිළිගන්වන්නාහ. ඒ උක්වනයට අනතුරුව මහත් එලඇති කදලිවනය පිහිටියේය.

† "පොකුරක"

ඊට අනතුරුව කොස්වනය අඹවනය දඹවනය ගිවුළුවනය මිශ්‍රකාවනයයි මෙසේ ඒ විල සිසාරා නොයෙක් වනයෙන් ගැවසීගත්තේය. ඒ හිමාලයෙහි වාසය කරන්නාවූ සිංහ ව්‍යාඝ්‍ර හස්ති අශ්ව ගව ගවර සෙමර සූකර දිවි මුව හංස මයූර පරපුටු කිදුරු ගිජුලිහිණි ආදිවූ නොයෙක් සිපද චතුෂ්පාදාදී ජාතීන් ගෙන් සිංහයන්ගේද කුරවිකොවිල්ලන්ගේද විශේෂත්වය වන්නේය–හේ කෙසේද යත්?.

ඔවුන් අතුරෙහි සිංහයන්ගෙන් තෘණසිංහය කාළසිංහය පාණ්ඩුසිංහය කෙසරසිංහයයි සිංහයෝ සතරකුලයෙක් වෙති. ඔවුන් අතුරෙහි තෘණසිංහයෝ පරෙවි පැහැ ඇත්තාහ. තෘණ අනුභව කරන්නාහ. කාළසිංහයෝ කළුගවයන් වැනියහ තෘණ අනුභව කරන්නාහුමවෙත්. පාණ්ඩුසිංහයෝ පඬුවන්පැහැඇති ගවයන් වැනියහ මාංසඅනුභව කරන්නාහ. කෙසරසිංහයෝද මාංස අනුභවකරන්නාහං ඔවුන්ගේ මුඛයද වාලධියද සතරපාදතලයද අලතා ගැල්වූවාක් මෙන් රතුව තිබෙන්නේය. හිස්මුදුනෙහි පටන් අලතාවන් රෙඛාතුණෙක් පිටිකරින් ගොස් පිටමුදුනෙන් පිඹිපිටට පැමිණ දක්ෂිණාවෘත්තව කරකැවී දෙකොත් සිටිනේය: මැදරෙඛාව වාලධියමුල සරහා සිටිනේය. කඳමැද දහස්ගණන් වටනා පලසකින් වැසුවාක් මෙන් කෙසරු බරින් හොබනේය: සෙසු තැන් හාල්පිටි සක්සුණුපිඩක්මෙන් සුදුපැහැයෙන් බබලන්නේය. මෙබඳුවූ කෙසර සිංහයෝ තමන් වසන්නාවූ රන් රිදී පළිඟු සත්රුවන් රත්නරියෙල් ගිරිගුහාවලින් නික්ම ගොස් සුවණ්ණරජත එලිකමණි මනොසීලාමයවූ ගල් අතලවලින් එක්තරා එක්පර්වතයක් මුදුනට පැණනැගී විදුරුනියපුරු පැහැය අහඬක රයෙන් සිට පශ්චිමපාදවය සමකොට තබා පුරිම හස්තවය ඉදිරියෙහි පසාරණය කොට ශරීරයාගේ පශ්වාද්භාගය ඇද පූර්වභාගය සිටුවා * පාබා පිට වලකොට කරනගා අශනිශබ්දයක් මෙන් නැහැපුට පොළා ශරීරයෙහි ලග්නවූ රජස් පහකොට තරුණ වස්සකු මෙන් ඔබ්මොබ ධාවනය කොරෙමින් සිංහ විජෘම්භණය කරන්නේය. මෙසේ ධාවනය කරන්නාවූ ඔහුගේ ශරීරය අන්ධකාරයෙහි භ්‍රමණය කරන්නාවූ ගිනිපෙණෙල්ලක් මෙන් අතුරු නොහැර සිටින්නේය. මෙසේ සිංහ විජෘම්භණය කොට තුන්යලක් සිංහනාද පවත්වන්නේය. ඒ සිංහනාදය

* “ පශ්වාද් භාගයෙහි පූර්වභාගය පිහිටුවා”

හාත්පසින් තුන්යොදුන්තැන එකතින්නාදව පවත්නේය. ඒ සිංහනාදය ඇසූ තුන් යොදුන් අතුරෙහි අපාද ද්විපාද චතුෂ්පාද ජාතීහු තමන් දූන් දූන් අල්වති ඉගිකැරුව වට බලමින් තැතිගෙණ තම තමන් සිටිතෙන සිටිය නොහී සිදුරුවල වසන අහි නකුලගොධාදීහු තමතමන් වසන සිදුරුවලටම වදනාහ දියෙහි, වසන මස්කැසුප් ආදීහු ගැඹුරු අඳුරු ඝනතිල් දියසලා අතුරෙහි වදනාහ. වෙනෙහි වසන ඇත් අස් ගෝණ මුව ආදීහු ඝනපත්වල වදනාහු. පක්ෂීහු අහස්කුසට පැණනැගී භ්‍රමණය කරන්නාහ මෙසේ සිංහනාද කරන්නාවූ කෙසර සිංහරාජතෙම තමා සිටිතෙන සිට වමින් ඉස්බක් දකුණෙන් ඉස්බක් තැන් පණන්නේය. සිටියාසේම ඍජුව උඩ සතර ඉස්බක් හෝ අට ඉස්බක් හෝ පණින්නේය. සමබිම සිට ආ පස්සෙන් සොළොස් ඉස්බක් හෝ විසි ඉස්බක් හෝ පණින්නේය. ගොඩක සිට හෝ පර්වතයක් මුදුනෙහි සිට හෝ පිටිපස්සෙන් සැටඉස්බක් හෝ අසූ ඉස්බක් හෝ පණින්නේය පණනකල්හි මගඅතුර වෘක්ෂයක් හෝ පර්වතයක් හෝ දුටු එයින් පරිහරණය පිණිස දකුණෙන් හෝ වමින් හෝ මත්තෙන්හෝ ඉස්බක් තැන් නොලංව පණන්නේය මෙබඳුවූ කෙසරීන්ද්‍රතෙම ගල්මුදුනෙහි සිට තුන්යලක් සිංහනාද පවත්වා ඒ ශබ්දය හා සමග ඉදිරියෙන් තුන්යොදනක් පැණ වහා නැවත අවුත් එම ගිරිඅතලෙහි සිට තමා කළ සිංහනාද යෙහි අනුනාදය අසා සිටිනේය. මේ සිංහවික්‍රමය තෘණසිංහය කාළසිංහය පාණ්ඩු සිංහයයි යනතුන්කුලෙහි සිංහයන්ටම නොම ඇත්තේය, මෙබඳු වික්‍රම ඇති කෙසරසිංහ රාජයෝම උතුම් වන්නාහ—එයින් කීහ.

"තිණසීහො කාලසීහො පණ්ඩුසීහො ච කෙසරී,
තෙසං චතුන්නං සීහානං කෙසරී අග්ගතං ගතො"යි.

කුරවිකෙවිල්ලෝ මධුර රස ඇති විලිකුම් මීඅඹ පල තුඩින් පැහැර අඹපැණි බී මත්ව පක්ෂතාල දෙමින් මණිවංසධ්වනියක් මෙන් යට සාඛාවේ සිට නාද පවත්වා මත්තෙහි ශාඛාවට නැගී හිඳ තමාගේ ශබ්දයෙහි අනුනාදරසය කන්පුරා විඳිනාහ. එ කල්හි චතුෂ්පාද ජාතීහු ශබ්දමදයෙන් මත්ව තමතමන් බවත් නොදන්නාහ. ලපලු ලිය ගොප් තණ කන පිණිස මුඛයෙන් ගත් මුව ආදීහු තමුන් කන්නාවූ ගොදුරෙහි ආලය හැර තලු නොපැහැර ඒ ශබ්දය අසා සිටිනාහුය. ගොදුරුලොබින් මුවන්

ලුහුබඳවා දිවන දිවියෝ ඒ ශබ්දය ඇසූ කල්හි දිවන්නට උඩ නැඟූ කකුල බිම නොතබා බිමතුබූ කකුල උඩ නොනඟා සිතියම් රුවක්මෙන් නිශ්චලව ඒ ශබ්දය අසා සිටිනාහුය. දිවියන් දැක ප්‍රාණභයින් දිවන මුවෝද මරණභයින් තැතිගත් සිත් හැර ඒ කුරවීකනාදයම අසා සිටිනාහුය. අහසින් යන පක්ෂීහුද පියා නොසලා පක්ෂපත්‍ර ප්‍රසාරණයකොට නිශ්චලව සිටිනාහුය. දියෙහි මත්ස්‍යයෝද වරල් නොසොලවා ඒ ශබ්දයම අසා සිටිනාහුය. මෙසේ මධුරස්වරයෙන් කාන් කළුවූ කුරවිකොවිල්ලෝ හිමවෙනෙහි බබලන්නාහ. ඒ හිමාලයට දකුණුදිග දඹදිවට හිමිවූ දඹරුක පිහිටියේය ඒ දඹරුකෙහි නමින් දඹදිව නම් වීය ඒ දඹරුකෙහි කඳවට පසළොස් යොදුන මුලපටන් අතුපතර විහිදි තෙනට පණස්යොදුන එයින් මුදුන නැගී ශාඛාව පණස් යොදුන සතරදිගට ගිය ශාඛාසතර පණස් පණස්යොදුන ගස මුලපටන් මුදුන්අතුඅගට සියක්යොදුන පැදුම් ශාඛාග්‍රයෙහි පටන් පශ්චිම ශාඛාග්‍රයටද දකුණු ශාඛාග්‍රයෙහි පටන් උතුරු ශාඛාග්‍රයටද සියක් සියක් යොදුන ශාඛාමණ්ඩලය වටින් තුන් සියක් යොදුන ඒගස පචශාඛාවන්ගෙන් ගහාපසෙක් හුනුයේය එහි දඹගෙඩි මහදිය කළපමණ ඇත්තේය. ඒ දඹගෙඩි හුනු තෙතින් නගුලිස් පමණ රන්පැල නැගෙන්නේය. ඒ රන්පැල ගංඉවුරෙහි රළ පැහැරීමෙන් ඡින්න භින්නව දියෙන් ගොස් දඹදිව් වදනේය මෙ ජාම්බොනද කනක නම. ඒ දඹගසද අසුර භවනයෙහි පළොල්ගසද ගරුඩභවනයෙහි ඉඹුල්රුකද අපර ගොයානයෙහි කොළොම් රුකද උතුරුකුරු දිවයින කපිරුකද පූර්විදෙහයෙහි මහරිරුකද ශක්‍රභවනයෙහි පරසතු රුකද යන කල්පස්ථායී ඒ වෘක්ෂ සතම එක උස මහත ඇත්තේය—

**එයින් කීහ**

“තිපචයොජනක්ඛන්ධා පරික්ඛෙපා නගව්හයා,
පඤ්ඤාසයොජනක්ඛන්ධා සාඛායාමසමන්තතො.
සතයොජනවිත්ථිණ්ණා තාවදෙව ච උග්ගතා,
ජම්බු යස්සානුභාවෙන ජම්බුදීපො පකාසිතො.
පාටලී සිම්බලී ජම්බු දෙවානං පාරිඡත්තකො,
කදම්බො කප්පරුක්ඛො ච සිරීසො-වෙති සත්තමා.
පාටලී අසුරානඤ්ච සුපණ්ණානඤ්ච සිම්බලී,
ජම්බු ඉධ මනුස්සානං දෙවානං පාරිච්ඡත්තකො.

කදම්බොපරගොයානෙ කප්පරුක්ඛො ච උත්තරෙ,
පුබ්බවිදෙහෙ සිරීසො ච කප්පට්ඨායී ඉමෙ මතා.

ඛන්ධා පඤ්ඤා මහාසාඛා උබ්බෙධා පරිමණ්ඩලා,
සබ්බෙ එකපරිච්ඡෙදා සබ්බෙ තිට්ඨන්ති සස්සතා"ති.

උතුරුකුරුදිවයින සත්ත්වයන්ට රෝගාන්තරායෙක් වත් විකලාඞ්ගවිකලින්ද්‍රියයෙක්වත් නොමඇත්තේය හැමකල්හිසොළොස් ඇවිරිදි ස්ත්‍රී පුරුෂයන් ප්‍රථම යෞවනයෙහි පිහිටා සිටිනාහුය. කෘෂි වාණිජ්‍යාදිවූ කිසි ජීවනොපාය කර්මාන්තයෙක ව්‍යාවෘත නොවී කප්රුකින්ම වස්ත්‍රාභරණ අන්නපානාදිය ගෙණ කා බී හැඳ පැළඳ අහසම ගෘහයක්කොට වැස දහසක් අවුරුදු ආයු වළඳා තමන් පෙරකළ කුශලානුභාවයෙන් හා කප්රුකෙහි ආනුභාවයෙන් දිව්‍යසම්පත්තියක් මෙන් සකලශ්‍රී අනුභවකොට වසන්නාහුය. නිරන්තරයෙන් පන්සිල් රක්නා හෙයින් කළුරිය කළාවූ සත්ත්වයෝ සතරඅපායෙහි නොයිපද දිව්‍යමනුෂ්‍යාදි සුගතියෙහිම උපදනාහුය. සමුද්‍රය වනාහි වටින් සක්වළගල පැහැර සිටිනේය සමුද්‍රතීරයෙහිපටන් ක්‍රමක්‍රමයෙන් අඟලෙක දෑඟලෙක වියතෙක දෙවියතෙක රියනෙකදෙරියනෙක යටෙක දසයටෙකඉස්බෙක දසඉස්බෙක ගව්වෙක දෙගව්වෙක යොත්නෙක දසයොත්නෙක සියක් යොත්නෙක දසක් යොත්නෙකැයි මෙසේ සක්වළගල පටන් ගැඹුරු ගැඹුරුව ගොස් මහමෙර සමීපයෙහි සුවාසූ දහසක් යොදුන් පමණ ගැඹුර ඇත්තේය. මේ සමුද්‍රය වටින් සතළිස් දහසක් යොදුන් උසඇති ජලස්කන්ධය දෙසිය තුන්සිය පන්සියයක් යොදුන්ද දස දහසක් යොදුන්ද පමණ දිග ඇති තිමි තිමිඟල තිමිරපිඟල ආනන්ද තිමින්ද අජ්ඣාරොහ මහාතිමි යයි යනාදිවූ ඒමත්ස්‍යරාජයන්ගේ පැළඹීමෙන් කැළඹීචලිතා වූයේය මැද සාරදහසක් යොදුන් උස දියකඳ නිශ්චලව තිබෙන්නේය. ඉන් උඩ සතළිස් දහසක් යොදුන් උස දියකඳරළ ගැසීමෙන් චලිතවන්නේය. ඒ රළින් මහින්ද නම් රළ සැටයොදුන් උස උඩ නභාවැටෙන්නේය ගඞ්ගා නම්රළ පණස්යොදුන් උස ලඞ්ඝනහා හෙන්නේය රොහණනාම් රළසතළිස්යොදුන්උසඋඩනඟා පතිත වන්නේය. තවද ඒ සමුද්‍රයෙ හිම තැනින්තැන ඛුරමාලී සමුද්‍රය අග්ගිමාලී සමුද්‍රය දධිමාලී සමුද්‍රය කුසමාලී සමුද්‍රය නළමාලී සමුද්‍රය ප්‍රවාලනළමාලී සමුද්‍රයයි සවැදෑරුම් වෙයි. එයින් ඛුරමාලී සමුද්‍රය නම් විදුරුවැල්ලෙන් එකාලෙකාහීද මනුෂ්‍යයන් වැනිවූ මත්ස්‍යසමූහයාගේ නාසාය නගා ඔප්නැගූ කරසමූහයක් මෙන්

දිය මුදුනෙන් ඉපිල ගිලේද ඒ සමුද්‍රය ඛුරමාලී නම් වෙයි. යම් තෙනෙක්හි සතරණින් නිමවා ඔප්නැගූ රන්පතක්සේ යට රන් වැල්ලෙන් විහිදි රන්රස් ජලතලාව මුදුනෙන්පෙණේද ඒ අග්ගි මාලී සමුද්‍රය නම් වේ. යම්තෙනෙක්හි යට රිදීවැල්ලෙන් පැණ නැගාවූ ආලෝකය දියෙහි පැතිර කිරිමුහුද මෙන් ඉතා සුදුවූ දධිපටලයක් මෙන් සුදුරැස් විහිදේද ඒ දධිමාලී සමුද්‍රය නම් වෙයි. යම් තෙනෙක්හි ඉඳුනිල්මිණි වැල්ලෙන් විසිරගිය නිල් පැහැයෙන් මුහුද හිතණින් ගැවසීගත් භූමිප්‍රදෙශයක්මෙන්ද තරුණ ගොයම්පැලයෙන් ගැවසීගත් ගොයම් වෙලක් මෙන්ද නිල්පැහැයෙන් බබලන්නේද ඒ කුසුමාලී සමුද්‍රය නම් වේ. යම් තෙනෙක්හි වංසරාග මාණික්‍යයන්ගේ උත්සන්නතාවෙන් තරුණ හුණවනයක් මෙන් පෙණේද ඒ ස්ථානය නළමාලී සමුද්‍රය නම් වෙයි. යම් තෙනෙක්හි පබළු උත්සන්නතාවෙන් ජලතලාව රිවිමඬලක් මෙන් රත්ව පෙණේද ඒ ස්ථානය ප්‍රවාළනළමාලී සමුද්‍රය නම් වෙයි. යම් තෙනෙක්හි තදපවන් වෙගයෙන් වටින් දියකඳ ඇද යොදුන් ගණන් උඩ දියකඳ නැගී වටින් ඉවුර බිඳුනු හෙළක්සේද නටුව නැති අත්බඹරක්සේද කොන බිම බලා සිටුවූ මිටනැති කුඩයක්සේද සියලු දිසාවෙන් පේණි වටින් ප්‍රපාතව උඩ නැගී රළබිඳී වේගයෙන් හුනුකල්හි වටවදිය රැලිය ගොස් මහමෙරද සක්වළගලද පැහැර දසදෙලොස් යොදුන් පමණ උඩ නගා භයජනකවූ ශබ්ද පවත්වා නැවත මහමුහුද හුනුකල ඒ ස්ථානයෙහි යොදුන් ගණන් දිගුපුළුල් ගැඹුරු මහවළවෙයි ඒස්ථානය වඩබාමුඛයයි කියනලද එයින් සක්වළට අභිමුඛව යන්නාවූ ක්‍ෂුද්‍රවූ දියරැලින් වෙරළ ගලා බස්නේය ඒ මුහුද වඩ බාදිය නම් වේ. තවද අවීචිමහනරකායෙහි පැසෙන සත්‍වයන්ගේකර්මවශයෙන් නරකාවාරය හැමදවස්මහැරී වැසෙන්නේය. ඒනිරාදෙර ඇරීගියකල්හි මහගිනිකඳක් නික්මයොදුන් ගණන් දියකඳ මුහුද යට භාගයෙන් දවන්නේය එකල්හි මුදුනෙහි සිටි දිය කරකැවී කැකෑරී මහාශබ්ද පවත්වා අවීචිනිරාදෙර වැගිර සිඳෙන්නේය දියසළාවක් මෙන් කරකැවී වළවූ තැන් වළබාමුඛ නම් වෙයි. තවද මහමුහුද කොතෙක් කල් වැසි වටත් නියම්කළත් අඟලක් පමණක් අඩු වැඩි නොවන්නේය. තවද මේ මහාසමුද්‍රය හැමකල්හි ක්‍ෂුද්‍රමහත්වටදිගු ආදි අනෙකවිධ මුතු රතු නිල් ආදී නොයෙක් පැහැයෙන් යුක්ත මැණික්ද වංසවණ්ණ මහරිමල්වණ්ණාදීවූ අනෙකවිධවූ වෙරළුමිණිද දක්

ණාවෘත්ත තඹොදර ධමනශංඛාදි අනෙකභෙදවූ සක්ද සෙතකාල මුද්ගවර්ණාදීවූ විවිධශෛලද කුදුමහත් මදුරත් ඝනරත් දිගු ලුහුඬුවූ නානාවිධ පබළුද කර්බූරාදීවූ නොයෙක් පැහැ ඇති මැසිරිගල්දෑයි මෙසේ අපමණවූ රත්නයෙන් බබලන්නේය. ඒ මහ මුහුද මැද සළපොළොවෙහි පටන් පැණනැඟී ත්‍රිකූට නම්වූ පර්වත තුණක් මුදුනෙහි එක්ලක්ෂ අටසැටදහසක් යොදුන් උස ඇතිහෙරිසණ්ඨානවූ අෂ්ටවර්ණයකින් බබලන මහාමෙරුපර්වතය පිහිටියේය. ඒ මහමෙර සුවාසූදහසක් යොදුන් මුහුද ගැලී සිටි න්ය සුවාසූදහසක්යොදුන් උද්ගතව සිටිනේය. ඒ මහමෙර පල්ලෙහි ත්‍රිකූට පර්වතය අතුරද සදහසක් යොදුන් පමණතැන් අසුරභවනය පිහිටියේය ඒමහාමෙරුපර්වතය සතරමහදිග සතර පැහැයෙකාසතරඅනුදිග සතරපැහැයෙකැයි අටපැහැයෙක්ඇත්තේය එසින් පූර්වදිගපලිඟුවන් සුදුපැහැයදකුණුදිග ඉඳුනිල්මිණිවන්පැහැය. පශ්චිමදිග පබළුවන්රත් පැහැය උතුරුදිගඝනරන්වන් පැහැය. ඊසාණදිග සුදුරන්වන්මිශ්‍රකාවූ පැහැයඅග්නිදිශාව සුදුනිල් මිශ්‍ර පැහැය නිරිත රත්නිල් මිශ්‍රවූ පැහැය වායුදිග රත්රන් මිශ්‍ර පැහැයය. මෙසින් සතරමහදිග සතර අනුදිග පර්වත සමුද්‍රාදිය සවකීය වර්ණයෙනොරෙමින් සක්වළගල පැහැර සිටිනේය. එසේහෙයින් පූර්වදිශාවෙහි සමුද්‍රය කිරිමුහුද නම්විය. දක්ෂිණ දිශාවෙහි සමුද්‍රය නිල්මුහුද නම්විය. පශ්චිමදිශාවෙහි සමුද්‍රය පබළුමුහුද නම්විය. උත්තරදිශාවෙහි සමුද්‍රය සවර්ණසාගර නම්විය. සතරඅනුදිගද ඒ ඒ වර්ණවීය ජම්බුද්වීපය අපරගොයානය උතුරුකුරුද්විපයින පූර්වවිදෙහ යයි යන සොදෙව් පිරිවරකොට ඇති මේ සතරමහද්වීපයටම මහාමෙරුපර්වතය උතුරුදිගමවිය චක්‍රවාටපර්වතය දකුණුදිගමවී මහාමෙරුපර්වතයාගේ හාත්පස්හි පුලුලින්ද। උසින්ද පන්දහසක් පන්දහසක් යොදුන් පමණ නාගාලින්දය ගරුඬාලින්දය කුම්භාණ්ඩාලින්දය යක්ඛාලින්දයයි නව තිසා භවනයට අරක්ගෙණ සිටින උන් න්ගේ නාමයෙන්ම ප්‍රසිද්ධවූ ආලින්ද සතරෙක් වී. ඒ මහාමෙරුපර්වතය සිසාරා සුවාසූ දහසක් යොදුන් උස ඇති යුගන්ධරපර්වතය පිහිටියේය. එසින් දෙසාළිස් දහසක් යොදුන් උස සයුර ගැලී සිටිනේය. දෙසාළිස් දහසක් යොදුන් උද්ගතව සිටිනේය. ඒ යුගන්ධරපර්වතය සිසාරා දෙසාළිස්දහසක් යොදුන් උසඇති ඊශධරපර්වතය පිහිටියේය. එසින් . එක්විසිදහසක් යොදුන් උස දියෙහි ගැලී සිටිනේය. එක්විසිදහසක් යොදුන්උස උද්ගතවසිටිනේය. ඒ ඊශධරපර්වතය සිසාරා එක්විසි දහසක් යොදුන් උස ඇති කරවීක පර්වතය

පිහිටියේය එයින් දසදහස් පන්සියක් යොදුන් උස දියෙහිගැලී සිටිනේය. එපමණඋද්ගතව සිටිනේයි. ඒ කරවීකපර්වතය සිසාරා දසදහස් පන්සියයක් යොදුන් උස ඇති සුදර්ශනපර්වතය පිහිටියේය. එයින් පන්දහස් දෙසියපණස් යොදුන් උස දියෙහි ගැලී සිටිනේය. එපමණම උද්ගතව සිටිනේයි. ඒ සුදර්ශන පර්වතය සිසාරා පන්දහස් දෙසිය පණස් යොදුන් උස ඇති නෙමිඳර පර්වතය පිහිටියේය. එයින් දෙදස් සසිය පස්විසි යොදුන් උස දියෙහි ගැලී සිටිනේය එපමණම උද්ගතව සිටිනේය. නෙමිඳර පර්වතය සිසාරා දෙදස්සසිය පස්විසි යොදුන් උස ඇති විනතක පර්වතය පිහිටියේය. එයින් එක්දස්තුන්සිය දොළොස් යොදුන් දෙගව්වක් පමණදියෙහි ගැලී සිටිනේය එපමණම උද්ගතවසිටිනේයි. ඒ විනතක පර්වතය සිසාරා එක්දහස් තුන්සිය දොළොස් යොදුන් දෙගව්වක් පමණ උසඇති අශ්වකර්ණපර්වතය පිහිටියේය. එයින් සසියපණස් යොදුන් එක් ගව්වක් පමණ දියෙහි ගැලී සිටිනේය. එපමණ උද්ගතව සිටිනේය –

**එයින් කීහ පූර්වාචාර්‍ය්‍යහු:—**

"චතුරාසීති සහස්සානි අජ්ඣොගාළ්හො මහණ්ණවෙ,
අච්චුග්ගතො තාවදෙව සිනෙරු පබ්බතුත්තමො.

පාචීනපස්සං රජතං දක්ඛිණං ඉන්දනීලකං,
පච්ඡිමං ඵලිකං පස්සං උත්තරං කාචනාමයං.

තතො උපඩ්ඪුපඩ්ඪෙන පමාණෙන යථාක්කමං,
අජ්ඣොගාළ්හුග්ගතා දිබ්බා නානාරතනචිත්තිතා.

යුගන්ධරො ඊසධරො කරවීකො සුදස්සනො,
නෙමින්ධරො විනතකො අස්සකණ්ණො ගිරි බ්‍රහා.

එතෙ සත්ත මහාසෙලා සිනෙරුස්ස සමන්තතො,
මහාරාජානමාවාසා දෙවයක්ඛනිසෙවිතා"යි.

මහමෙරට හා යුගන්ධරපර්වතයට අතුරෙහි සුවාසූදහසක් යොදුන් පුළුල ඇති සීදන්තසමුද්‍රය පිහිටියේය. ඒ සමුද්‍රයෙහි ජලය ඉතාම සියුම්ව මොණරපිළක් දැමුවත් ගැලියනහෙයින් සීදන්ත සාගර නම් විය. ඒ සීදන්තසමුද්‍රයෙහි සප්තකුලපර්වතයෝ අනු පිළිවෙළින් මිටිව වේදිකාකාරයෙන් පිහිටියාහුයි. එයින් යුගන්ධර පර්වතසමුදුනෙහි සතරවරම් මහරජුන්ටවාසස්ථානවූචාතුර්මහාරාජික දිව්‍යලෝකය පිහිටියේය ඒ සිව්මහරජය එක්සියඅට පාදයකින් යුක්තවූ සත්විසිමහත්නක්ෂත්‍රකින්ද දොළොස් රාශීන්ද නවග්‍රහයන් ගෙන්ද යන මේ ආදීවූ බොහෝ තාරකාවිමාන යෙන් ගැවසීගත්තේය. එයින් චන්ද්‍රමණ්ඩලය අගම් විතරින් උසින් උනපණස්යොදුනක් පමණය වටින් එක්සියසත්සාළිස් යොදුන් පමණය. මේ චන්ද්‍ර විමානය ඇතුළෙන් ඉන්ද්‍රනීලමාණික්‍යමය විය පිටතින් රිදීමය විය. එසේහෙයින් ඇතුළතින්ද -ටතින්ද සිහිළස විය—

**එයින් කිහ සූත්‍රාචාර්‍ය්‍යෝ:—**

"ස නිසාකරෝ තෙසු වසෙය්‍ය අනෙතා
මණිනා කතෙ බාහිරතො විමානෙ
රජතාවනධෙ පවරෙ මනුඤ්ඤෙ
සීතප්පභා භාසුරමිත්‍යිමාකාරා"යි.

සූර්‍ය්‍යමණ්ඩලය අයම් විතරින් උසින් පණස් යොදුන් පමණ විය අවටින් එක් සියපණස් යොදුන් පමණ විය. ඇතුළෙන් රන්වන් පැහැ ඇත්තේය. පිටතින් පබළුන් පැහැ ඇත්තේය. එසේ හෙයින් ඇතුළෙනුදු පිටතිනුදු උෂ්ණවිය—

**එයින් කිහ සූත්‍රාචාර්‍ය්‍යෝ:—**

"සො භානුමා කනකාමයෙ විමානෙ
අනෙතා බහි එළිකාමයෙ වසෙය්‍ය
උණ්හං පභං අධිකාමඝොසිතාසස
උභයම්පි තං උණ්හාකාරං තථාපි"යි.

මෙසේ චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙන ගිමන් හිමන් වසන් තුන් ඍතුවම අජ ගජ ගො විථියයි යන තුන් වීථියෙහි හැසිර පූර්‍වපරදක්ෂිණ උත්තර සතර දීපාධික දෙදහසක් දිවයින් වලින් තුණක් අධික යෙල දහසක් දිවයින් වලට එකවිටම ආලොක පතුරුවා සියව් මන්හි බබලන්නාහුයි. චාතුර්මහාරාජිකයෙන් දෙසාළිස් දහසක් යොදතින් මත්තෙහි මහමේර මුදුන දසදහසක් යොදුන් අයම් විතර ඇති නොයෙක් දිව්‍යසම්පත්තීන් බබලන්නාවූ තව්තිසා භවනය පිහිටියේය. මේ දෙදෙව්ලොවම චක්‍රවාටපරියන්තව පිහිටියේය ඒ ශක්‍රභවනයට දෙසාළිස්දහසක් යොදතින් මත්තෙහි යාම නම් දිව්‍යලොකය පිහිටියේය. එසේම තුසිත නම් දිව්‍යලොකය නිර්මාණරතී නම් දිව්‍යලොකය පරනිර්මිත වශවර්ති නම් දිව්‍යලොකාදයි මෙසේඅනුක්‍රමයෙන් මතුමත්තෙහි පිහිටිසදිව්‍ය ලොකයම කාමාවචර නම් වේ —

**එයින් කිහ—:**

"කාමෙව චරතීඝනෙතං කාමාවචරමීරිතං,
සෙසෙ අවචරනතම්පි සඹ්ඝාමාවචරො විය"යි.

ඒ පරනිර්මිත වසවත්ති නම් දිව්‍යලොකයට දෙසාළිස්දහසක් යොදතින් මත්තෙහි බ්‍රහ්මපාරිසජ්ජය බ්‍රහ්මපුරොහිතය මහාබ්‍රහ්මයයි යන ප්‍රථමධ්‍යානය හීනමධ්‍යම ප්‍රණීතවශයෙන් භාවනා කළ වුන්ට වාසස්ථානවූ බඹලෝ තුණ මෙසේ සමව පිහිටියේය. එයින් මත්තෙහි පරිත්තාභය අප්පමාණාභය ආභස්සර යයි යන ද්විතීය ධ්‍යාන බඹලෝ තුණද මෙසේ සමව පිහිටියේය. එයින් මත්තේහි පරිත්තසුභය අප්පමාණ සුභය සුභකිණ්ණක යයි යන තෘතීයධ්‍යාන බඹලොවතුණද මෙසේම සමව පිහිටියේය එයින් මත්තෙහි වෙහප්ඵලය අසඤ්ඤසත්තය යන බඹලෝ දෙක සමව

පිහිටියේය. එයින් මත්තෙහි අවිහය අතප්පය සුදස්සය සුදස්සිය අකණිඨයයි යන සුඬාවාස බඹලෝපස පිළිවෙළින් මතුමත්තෙහි පිහිටියේය. සොළොස් බඹතලය රූපාවචර නම් වේ. එයින් මත් තෙහි ආකාසා නඤ්චායතනය විඤ්ඤණඤ්චායතනය ආකිඤ්චඤ්ඤ යතනය නෙවසඤ්ඤනාසඤ්ඤයතන යයියන අරූපාවචර බ්‍රහ්ම ලොක සතර පිළිවෙළින් මතුමත්තෙහි පිහිටියේය. එයින් මත් තෙහි අජටාකාශ නම් විය. එක්තිස් තලයද මෙහිම අන්තර්ගත විය. මෙසේ දක්වනලද්දවූ කාමරූපාරූප ලොක සඞ්ඛ්‍යාතවූ භුවනත්‍රයෙහි සියලු පරමාර්ථ ලොකාර්ථ වස්තූන්ම අනාවරණ ඥානයෙන් අතඹුලක්සේ නිශ්චය කොට දැනීමෙහි පැවැත්තාවූ ඥාණය අර්ථප්‍රතිසම්භිදා නම් වේ.

**ධර්මප්‍රතිසම්භිදා නම් කවරහ ඥත්?**

මෙ ප්‍රඥාවෙන් යුක්තවූ ඛන්ධායතන ධාතු ඉන්ද්‍රිය සච්ච පටිච්ච සමුප්පාදාදීන් භෙදවූ ධර්මයෝ භූමි නම් වෙති. සීලවිසුඬිය චිත්ත විසුඬියයි යන මේ විසුඬිවය මූල නම් වෙයි. දිඪිවිසුඬිය කංඛා විතරණවිසුඬිය මග්ගාමග්ගඤාණදස්සනවිසුඬිය පටිපදාඤාණ දස්සනවිසුඬිය ඤාණදස්සනවිසුඬි යයි යන මේ පඤ්චවිසුඬීහු ශරීර නම් වෙති එසේහෙයින් ඒ භූමිසඞ්ඛ්‍යාතවූ ධර්මයෙහි උග්ගහපරි පුච්ඡාවශයෙන් ඥාණපරිචයකොට මූල යයි කියනලද සීලවිසුඬි චිත්තවිසුඬි සම්පාදනයකොට ශරීර යයි කියනලද්දවූ දිඪිවිසුඬි ආදී පඤ්චවිසුඬීන් සම්පාදනය කරණු පිණිස භාවනාකොට ඒ භාවනානු ක්‍රමයෙන් පඤ්චවිසුද්ධීන් සම්පාදනය කොට ක්‍රමයෙන් ගොස් සෝවාන් මාර්ගය ඵලය ශකෘදාගාමි මාර්ගය ඵලය අනාගාමී මාර්ගය ඵලය අර්හත් මාර්ගය ඵලය නිර්වාණයි යන මේ නවලො කොත්තර ධර්මය සාක්ෂාත් කොට ලෝවැඩ පිණිස දෙශනාකළාවූ පාලිධර්මය ඇතුළුව දශධර්ම නම් වෙයි ඒ පාලිධර්මය ඇතුළුව දශ ධර්මය පඤ්චවිධවූ ගුණයෙන් යුක්තවූයේය.

**භේ කොසේද යත්?**

"ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහි පස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී,, යි කියා ප්‍රාඥයන් විසින් දැනගන්නාලද්දේයි. එයින් මොනවට වර්ණ ලද්දවූ පර්‍ය්‍යාප්තිධර්මය ආදි මධ්‍ය පරියොසාන කල්‍යාණ වශයෙන් ත්‍රිවිධ වේ. සාර්ථසව්‍යඤ්ජනකෙවල පරිපූර්ණ පරිසුඬ බ්‍රම්මචරිය ප්‍රකාශ කිරීමෙන් පඤ්චවිධ වේ—

**ඒ කවරේදයක්?**

භාග්‍යවත්හු විසින් යම් ධර්මයක් දෙසනලද්දේද එක ගාථාවකින් දෙසනලද ඒ ධර්මදෙශනාව සමන්තභද්‍ර බැවින් ඒ ගාථාවගේ ප්‍රථම පාදය ආදි කල්‍යාණ නම් වෙයි දෙවන තුන්වන පාද මධ්‍ය කල්‍යාණ නම් වෙයි පශ්චිමපාදය පරියොසාන කල්‍යාණ නම් වෙයි. එකානුසන්ධික සූත්‍රයෝ නිදානයෙන් ආදි කල්‍යාණ නම් වෙති නිගමනයෙන් පරියොසාන කල්‍යාණ නම් වෙති. සෙසු මධ්‍යගතවූ ධර්මයෝ මධ්‍යකල්‍යාණ නම් වෙති. නානානුසන්ධිකවූ සූත්‍රයෝ ප්‍රථමානුසන්ධියෙන් ආදි කල්‍යාණ නම්වෙති පශ්චිමානුසන්ධියෙන් පරියොසාන කල්‍යාණ නම් වෙති. ඒ දෙඅතුරෙහි අනුසන්ධිහු මධ්‍යකල්‍යාණ නම් වෙති. මේ ධර්මය සනිදාන සඋප්පත්තිකබැවින් ආදිකල්‍යාණ නම් වෙත් විනෙය ජනයන්ට සුදුසු ලෙසද අර්ථයට අවිපරීතලෙසද හෙතු උදාහරණයෙන් යුක්ත බැවින් මධ්‍යකල්‍යාණ නම් වෙයි. ධර්මය අසන්නවුන්ට ශ්‍රද්ධාප්‍රතිලාභය ජනනනිගමනයෙන් පරියොසාන කල්‍යාණ නම් වෙයි. ලොකොත්තරධර්මවශයෙන් සියලු ධර්මය ආනමාර්ජනකවූ ශීලයෙන් ආදි කල්‍යාණ නම් වේ සමථවිදර්ශනා මාර්ගඵලඥානයෙන් මධ්‍යකල්‍යාණ නම් වෙයි නිර්වාණයෙන් පරියොසාන කල්‍යාණ නම් වෙයි,ශීලසමාධින් ආදිකල්‍යාණනම්වෙයි. විදර්ශනා මාර්ගයෙන් මධ්‍යකල්‍යාණ නම් වෙයි. ඵලනිර්වාණයෙන් පරියොසාන කල්‍යාණ නම් වෙයි. අවබොධ කරණලද්දවූ සම්‍යක්සම්බොධිය ආදිකල්‍යාණ නම් වෙයි, සද්ධර්මයෙහි ධර්මතාව මධ්‍යකල්‍යාණ නම් වෙයි, සංඝයාගේසුප්‍රතිපන්නභාව පරියොසානකල්‍යාණ නම්වෙයි. තථාගතලක්ෂණයෙන් පිළිපන්නාවූ අභිසම්බොධිය ආදිකල්‍යාණ නම් වෙයි, ප්‍රත්‍යෙකබොධිය මධ්‍යකල්‍යාණ නම්වෙයි, ශ්‍රාවකබොධිය පරියොසානකල්‍යාණ නම් වේ, මෙසේ මේ ධර්මය ආදි මධ්‍යපර්‍යවසාන කල්‍යාණ යයි ත්‍රිවිධාකාරයෙන් දෙශනා කළ බැවින් "ස්වාක්ඛාත නම්" වේ.

තවද මෙම ධර්මය යථානුරූපවූ අර්ථසම්පත්තින් සාර්ථ නම් වේ ව්‍යඤ්ජනසම්පත්තින් සව්‍යඤ්ජන නම් වෙයි මෙම ධර්මය සංකාසන පකාසනවිවරණවිභජනඋත්තානී කරණවශයෙන් දෙශනා කළාවූ ප්‍රඥප්ති අර්ථපදයන්ගේ එක්වීමෙන් සාර්ථ නම් වෙයි අක්ෂරපදව්‍යඤ්ජනාකාර නිරුක්ති නිර්දෙශ සම්පත්තින් සව්‍යඤ්ජන

නම් වේ; අර්ථගම්භීරහෙයින්ද ප්‍රතිවේධගම්භීරහෙයින්ද සාර්ථ
නම්වෙයි. ධර්මගම්භීරහෙයින්ද දේශනාගම්භීරහෙයින්ද සබ්‍යඤ්
ජනනම් වේ. අර්ථප්‍රතිභාණ ප්‍රතිසම්භිදාවට විෂය බැවින් සාර්ථ
නම් වෙයි. ධර්මනිරුක්තිප්‍රතිසම්භිදාවට විෂය බැවින් සබ්‍යඤ්ජන
නම් වෙයි, ප්‍රාඥවේදනීය බැවින් භාග්‍යවත් නුවණැත්තන් විසින්
විඳගැන්මටසුදුසුහෙයින්ද පරීක්ෂාකාලවුන්ට ප්‍රසාද එළවනහෙයි
න්ද සාර්ථ නම් වෙයි ශ්‍රද්ධාවෙන් යුක්තවූ ලෞකික ජනයාගේ
චිත්තප්‍රසාදඑළවනහෙයින්සබ්‍යඤ්ජන නම්වේ.ගම්භීරවූ අර්ථ ඇති
හෙයින් සාර්ථ නම් වෙයි අගම්භීරවූ පදයෙන් යුක්තහෙයින්
සබ්‍යඤ්ජන නම් වෙයි. මේධර්මය බැහැපින් ශබ්දයක් පදයක් ලා
සම්පූර්ණකිරීමක් නැතිව සකල පරිපූර්ණභාවයෙන් කෙවල
පරිපූර්ණ නම් වෙයි යටත්පිරිසෙයින් ශබ්දයක් පදයක් පමණ
මේ ධර්මයෙන් හලයුතු දෙයක් නැතිහෙයින් විස්තරවශයෙන්
පිරිසිදුව පවත්නාහෙයින් පරිශුද්ධ නම් වේ. මෙසේ සාර්ථ
සබ්‍යඤ්ජන කෙවලපරිපූර්ණ පරශුද්ධවූ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශකොට
වදාළබැවින් මේ ධර්මය "ස්වාක්ඛාතනම් වේ."

"සන්දිට්ඨිකො"යන්නෙහි පළමුකොට තමාගේ සන්තානයෙහි
පිහිටි රාගාදි කෙලශයන් ප්‍රහීණ කොට තමා විසින්ම සියලු ධර්ම
යන් දුටුහෙයින් "සන්දිට්ඨික" නම් වේ. "අකාලිකො"යන්
නෙහි කුශලඵල විලිකුන්ව සද්ධර්මරසාස්වාදයෙන් මාර්ගඵලප්‍රදානය
කිරීමට වන්කල්හි පඤ්චාහසප්තාහාදි ප්‍රභෙදයෙන් කල් නොය
වනහෙයින් අකාලනම්වෙයි එම "අකාලික" නාම් වේ. "එහි
පස්සිකො"යන්නෙහි අවුදින් මේ ධර්මය බලවයි යන අද්භූතත්‍ව
යක් කිසල්හි කෙතෙක්කතර සිටියත් ඇසූ ක්ෂණයෙහිම නො
මාවඅවුත් දකින්ටම සුදුසුවූ උභයලොකාර්ථ සංසිද්ධියට එකාන්ත
කාරණාවූ අද්භූතත්‍වයක් ධරණහෙයින් "එහි පස්සික" නම් වේ
තවද මේ සද්ධර්මය සවභාවයෙන්ම විද්‍යමානය විගතවලාහකශරද
කාශයෙහි පුන්සඳමඬලක්මෙන්ද නිම්ලවූ පිළිමිණිරුවනක්
මෙන්ද අතිශයෙන් පිරිසිදුහෙයිනුත් දක්නාවුනගේ නෙත්සිත්
පිණවන හෙයින්ද අමුත් දැක්කයුතු හෙයිනද"එහිපස්සික" නම්
වෙයි, "ඔපනයිකො" යන්නෙහි ධර්මය සිතින් ව ා හා එහි ගුණ
මෙනෙහි නිධානකොට රැක්මට සුදුසු හෙයින්ද සාක්ෂාත්කිරී
වශයෙන් ඇල්මට සුදුසු හෙයින්ද, "ඔපනයික" නම් වෙයි,
පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි යන්නෙහි සියලුම උග්ඝටි
තඥාදිවූ ප්‍රාඥයන්විසින් මේ ධර්මය භාවිතාකරණලද්දේය ඵල
යට පැමිණෙනලද්දේය. නිරොධය සාක්ෂාත් කරණලද්දේ යයි
තමතමන් කෙරෙහි පිහිටිධර්මයන් වෙන වෙනම නුවණින්සලකා
දතයුතු බැවිනි හේ එසේමයැ—:උපාධ්‍යායයන් විසින් වඩනා
ලද්දාවූ මාර්ගයෙන් සද්ධිවිහාරිකයන්ගේ කෙලශයෝ ප්‍රහීණ
නොවන්නාහ ඔවුන්ගේසැපවිවරණයෙන්සද්ධිවිහාරිකයන්ටසැප
විහරණයක් නොවන්නේය ඔවුන් විසින් සිද්ධකල නිවන්සම්පත්
තිය සද්ධිවිහාරිකයන්විසින් සිද්ධකරණ ලද්දේත් නොවෙයි

එමෙන් මේකාරණය අනුන් හිසපැළඳි ආභරණයක්මෙන් දත යුත්තේය.

එසේහෙයින් මේ භාවනාවන් තමාගේ චිත්තයෙහිම පිහිටුවා නිවන්රස වින්දේ "විඤ්ඤූ" නම්වේ. මේ හැම අඥතයන්ට අවිෂයබැවින් විඥයන්ටම විෂයලෙස මොනවට දෙශනාකළාවූ මේ ධර්මය "ස්වාක්ඛාත" නම් වේ. සාන්දෘෂ්ටිකබැවින් "සන්දිට්ඨික" නම් වෙයි කල්නොයවන බැවින් "අකාලික" නම් වෙයි. අවුත් දකින්ට සුදුසු බැවින් "එහි පස්සික" නම් වෙයි. ඇල්මට සුදුසුබැවින් "ඔපනයික" නම් වෙයි. යනාදීන් ස්වාක්ඛ්‍යාතාදි භෙදවූ අපමණ ගුණයෙන් යුක්ත සපර්‍ය්‍යාප්තික නවලොකොත්තරසධර්මයෙහිද, මේ ධර්මශබ්දය මාදෘශාර්ථයෙහි වැටෙන බැවින් අෂ්ටලොකධර්මය ආදීවූ සකලලොකධර්මයෙහිද පැවැත්තාවූ ප්‍රඥව හෙවත් මේ සියලු ධර්මයන් කරතලාමලකන්‍යායයෙන් දැනීම ධර්මප්‍රතිසම්භිදා නම් වේ.

**නිරුක්තිප්‍රතිසම්භිදා නම් කවරහෙයක්?** අභිඥපාදකධ්‍යාන යට සමවැද එයින් නැගී පරිකර්මසමාධිචිත්තයෙන් සියලු අර්ථ ධර්මයන් ස්වකීය නාමවශයෙන් ගෙණහැර දක්වන්නාවූ ශබ්දය නිරුක්ති නම් වේ. අර්ථය නම් ද්‍රව්‍යය, ශබ්දයනම් තත්භවය තත් සමයදෙශිකයයි යන ත්‍රිවිධශබ්දමය නාමයයි, එයින් නාමය නම් අර්ථය තමා කරා නමනහෙයින් හෝ තමා අර්ථය කරා නම් නවන හෙයින් හෝ නාමය නම් වේ. ඒ නාමය විභාගවශයෙන් නාමනාමය සර්වනාමය සමාසාන්තනාමය තද්ධිතාන්තනාමය කෘත කාන්තනාම යයි පඤ්චප්‍රකාරවේ, ධාතුප්‍රත්‍යය විභක්තිසම්නාස්වාර්ථ ද්‍රව්‍ය ලිඞ්ග සංඛ්‍යා කාරකාදි වශයෙන් පඤ්චප්‍රකාර වේ, ප්‍රථමාදි විභක්ති වශයෙන් නවවිධ වේ පුල්ලිඞ්ගාදිවශයෙන් සවැදෑරුම් වේ, එකවචනාදිවශයෙන් අටළොස් ප්‍රභෙදයෙක් වේ, මේ නාම පදයන් එක්කොට සංක්ෂෙපකිරීම සමාස නම් වේ. ඒ සමාසය විසිතුරු පදයන්ගේ සංක්ෂෙපවශයෙන් එකවිධ වෙයි. අර්ථසමාස පදසමාස වශයෙන් ද්විවිධ වෙයි. ලුප්තාලුප්තවශයෙනුදු ද්විවිධ වෙයි. ආදිමධ්‍යාන්තපදලොපවශයෙන් ත්‍රිවිධ වෙයි. පූර්වඅපර උභය අන්‍යපදාර්ථ. ප්‍රධානවශයෙන් චතුර්විධ වෙයි අව්‍යයීභාව කර්මධාරය ද්විගු තත්පුරුෂබහුව්‍රීහි ද්වන්ද්වයයි ස්වකීය නාම වශයෙන් සවැදෑරුම්වේ. ඒ සවැදෑරුම්වූ සමාසයන් අතුරෙහි අව්‍යයීභාවසමාසය උපසර්ගපූර්වපදය නිපාතපූර්වපදයයි ද්විවිධ වේ, කර්ම

ධාරයසමාසය විශෙෂණපූර්වපදය විශෙෂණඋත්තරපදය විශෙෂණඋභයපදය උපමානුත්තරපදය සම්භාවනපූර්වපදය අවධාරණපූර්වපදය නනිපාතපූර්වපදය කුපූර්වපදය පාදිපූර්වපදයයි නවවිධ වේ. දිගු සමාසය සමාහාරදිගුය අසමාහාරදිගුයයි ද්විවිධ වේ තත්පුරුෂසමාසය ද්විතීයා තත්පුරුෂය තෘතීයාතත්පුරුෂය චතුර්ථීතත්පුරුෂය පඤ්චමී තත්පුරුෂය ෂෂ්ඨී තත්පුරුෂය සප්තමී තත්පුරුෂය අමාදිපර තත්පුරුෂය අලොප තත්පුරුෂයයි අෂ්ට විධවේ. බහුබ්‍රීහිසමාසය ද්විපදතුල්‍යාධිකරණබහුබ්‍රීහිය ද්විපද භින්නාධිකරණ බහුබ්‍රීහිය ත්‍රිපදබහුබ්‍රීහිය නනිපාත පූර්වපද බහුබ්‍රීහිය සහ පූර්වපද බහුබ්‍රීහිය උපමාන පූර්වපද බහුබ්‍රීහිය සඞ්ඛ්‍යොභයපද බහුබ්‍රීහිය දිසන්තරාලත්ථ බහුබ්‍රීහිය ව්‍යතිහාරලක්ෂණ බහුබ්‍රීහියයි නවවිධ වෙයි, මේ නවප්‍රකාරවූ බහුබ්‍රීහිසමාසය තග්ගුණසංවිඤ්ඤාණ අතග්ගුණ සංවිඤ්ඤාණ වශයෙන් ද්විවිධවේ, ද්වන්ද්වසමාසය සමාහාරද්වන්ද්වය අසමාහාර ද්වන්ද්වයයි ද්විවිධ වේ, මෙසේ සවැදෑරුම් වූ සමාසය දෙතිසක් ප්‍රභෙද වේ—

එසින් කීහ පූර්වාචාර්‍ය්‍යයෝ—:

"ද්විධො අබ්‍යයීභාවො නවධා කම්මධයො
දිගු ද්විධා තප්පුරිසො අට්ඨධා නවධා හමෙ
බහුබ්බීහි ද්විධා චන්දෙ සමාසො චතුරට්ඨධා"යි.

මේ නාමපදය සංක්‍ෂෙපවශයෙන් සමාස නම් වෙයි, පදය හා ප්‍රත්‍යය එක්වීමෙන් තද්ධිත නම්වෙයි ධාතුහා ප්‍රත්‍යය එක්වීමෙන් කිතක නම් වේ—

එසින් කීහ—:

"සමාසො පදසංඛෙපො පදප්පච්චය සංහිතං
තද්ධිතං කිතකං ධාතුපච්චය සහිතං මතං"යි.

මෙසේ දැක්වූ නාමපදය අඛ්‍යාතපදය හා එක්වීමෙන් ක්‍රියාව නිෂ්පාදනය කරන්නේය, ඒ ක්‍රියාව නිෂ්පාදනය කෙළේ කාරක නම් වේ. ඒ කාරකය කර්මකර්තෘකරණසම්ප්‍රදාන අපාදාන ආධාර වශයෙන් සවැදෑරුම්වේ,එසින් කර්මකාරකය නිර්වෘත්තිකර්මය විකෘතිකර්මය ප්‍රාප්තිකර්මය ඊප්සිතකර්මය අනීප්සිතකර්මය ඊප්සිතානීප්සිතකර්මය උක්තකර්මය අනුක්තකර්මය කථිතකර්මය අකථිතකර්මයයි දශවිධ වේ. කර්තෘකාරකය ශුද්ධකර්තෘය හෙතුකර්තෘය කර්මකර්තෘය අභිහිතකර්තෘය අනභිහිතකර්තෘයයි පඤ්චවිධ වෙයි. කරණකාරකය ආධ්‍යාත්මිකකරණය බාහිරකරණයයි ද්විවිධ වෙයි. සම්ප්‍රදානකාරකය අනිරාකරණය අද්‍යෙෂණය අනුමතියයි ත්‍රිවිධ වේ. අපාදාන

කාරකය නිර්දිෂ්ටවිෂයෙහි අපාදානය උපාත්‍යවිෂයෙහි අපාදාන ය අනුමෙයවිෂයෙහි අපාදානය චලඅපාදානය අචලඅපාදානයයි පචවිධ වෙයි, ආධාරකාරකය ඖපශ්ලෙෂිකාධාරය විෂයාධාරය ඛ්‍යාපිකාධාරය සාමීපිකාධාරයයි චතුර්විධ වෙයි. මේ සවැදෑරුම් වූ කාරකයම එකුන්තිස් ප්‍රභෙදයෙක් වේ.

එසින් කීහ—:

"තත්‍ථ පචවිධො කත්තා කම්මං දසවිධං මතං,
කරණං දුවිධං ඤෙය්‍යං සම්පදානං තිධා මතං.

අපාදානං පඤ්චවිධං තථාධාරො චතුබ්බිධො,
එකූනතිංසතිවිධං කාරකානනි පකාසිතං"යි.

මේ නාමපදය සරගා සිටිනාහෙයින් උපසර්ගයයි කියාද ආදි මධ්‍යාන්තයෙහි නිපතිත වනහෙයින් නිපාතයයි කියාද පදම යෙක් වේ.

එසින් කීහ—:

"උපෙච්චත්‍ථං සජන්තීති උපසග්ගා හි පාදයො,
චාදි පදාදිමජ්ඣන්තෙ නිපාතා නිපතන්ති හි" යි.

මෙසේ දක්වනලද්දාවූ නාමපදය අඛ්‍යාතපදය උපසර්ගපදය නිපාතපදයයි ප්‍රධානවූ සතරපදයෙක් වෙති.

එසින් කීහ—:

"පදං චතුබ්බිධං වුත්තං නාමඛ්‍යාතොපසග්ගජං,
නිපාතජච තඤ්ඤූහි අසෙසා බල්වහි ධාවහි"යි.

යනුහෙයින් මෙහි අන්තර්ගතවූ අනෙකප්‍රභෙදගත නිරුක්ති ව්‍යවහාරයෙක්වේද ඒ ශබ්දාභිලාපයෙහි ඒ ඒ භාෂාවෙන් කියන ලද්දාවූ ශබ්දය අසාම මේ ස්වභාවනිරුක්තිය මේ අස්වභාවනිරු ක්තියයි මෙසේ ඒ නිරුක්තිසංඥ ඇතිබැවින් "එසෙසා වෙදනා" යන මේ ආදි වචනයන් අසාම මේ සභාවනිරුක්තියයි කියාද, එස්සාවෙදනො"යනමේ ආදිවූවචනයෙන්ම මේ අසභාවනිරුක්ති යයි කියාද දන මේධර්මය ස්වභාවනිරුක්තිවූ මූලභාෂාවූ මාගධික භාෂාවය එසේහෙයින් මේ ස්වභාවනිරුක්තියයි දැනගන්නේය. මෙයින් අන්‍යවූ "උභො සද්දෙ සුණාති" යන පදෙසපරියාදානවූ දිව්‍යමනුෂ්‍යශබ්දයන්ද "දූරෙ සන්තිකෙ වා" යනාදිවූ නිප්පදෙස පරියාදානශබ්දයන්ද පරසක්වළෙහි පැවැත්තාවූ දසදෙහසන් නිශ්‍රිතවූ "පාණක" ශබ්දයන්ද අතිකුත් අරණ්‍යයෙහි සිංහාදීන්

ගේ ශබ්දයන්ද විහාරයෙහි ගඬිභෙරි සඞ්ඛාදී ශබ්දයන්ද දහර සාමණේර භික්ෂු ආදීන්ගේ ශක්ති පමණින් හඬරන්නාවූ සජ්ඣායනා ශබ්දයන්ද ප්‍රකෘතින් කථාකරන්නාවූන්ගේ "කිං භන්තෙ කිං ආවුසො" යනාදිවූ ශබ්දයන්ද සියලු පක්ෂීන්ගේ ශබ්දයන්ද කූන් එකිඹිල්ලිකාදී ක්ෂුද්‍රප්‍රාණීන්ගේ ශබ්දයන්ද ආපො වායුවෙන්ද ගමන පවනාදීන් පවත්නාවූද ආතපයෙන් ශුෂ්ක තාලපණ්ණාදියෙහි පැවැත්තාවූ ශබ්දයන්දැයි මෙසේ ඖදාරිකයෙහි උපන්අනුක්‍රමයෙන් පැවැත්තාවූ සියලු ශබ්දයන්ද පූර්වපශ්චිම උත්තරදක්ෂිණ දිශානුදිශාවෙහිද හෙඨිමුපරිදිශාවෙහිද පැවැත්තාවූ ශබ්දයන්ගේ විභාගයද, අනන්තාපර්‍යන්ත චක්‍රවාළාභ්‍යන්තරයෙහිම පෘථිවියෙහි පටන් බ්‍රහ්මාණ්ඩය දක්වා භෙරිසංඛසම්මතාලාදිවූ නොයෙක් ශබ්දයන්හා මනුෂ්‍ය දෙවතිරශ්චීනාදිවූ හැමශබ්දයන්හා ජලපවන් ආදීන් පැවැත්තාවූ මේ නොයෙක් ශබ්දයන්ම සම්මිශ්‍රව එක කොලාහලයෙන් පැවැත්තේවීනමුත් ඒ සියලු ශබ්දයන් වෙන වෙනම තොරා විභාගකොට දැනගැන්මෙහි පැවැත්තාවූ නිරුක්ති ප්‍රභෙදගත ඤාණය හෙවත් මේ නිරුක්තීන් විභාගකොට දැන ගැන්ම නිරුක්තිප්‍රතිසම්භිදානම් වේ.

**ප්‍රතිභාණප්‍රතිසම්භිදා නම් කවරහ යත්?**

මේ අර්ථධර්මනිරුක්තිප්‍රතිසම්භිදායෙහි ප්‍රභෙදගතවූ ඥානය අරමුණුකොට ගෙණ ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහු නුවණැසට පෙණෙන්නාවූ යම් ප්‍රඥාවෙක් ඇද්ද ඒ ප්‍රඥාව අර්ථධර්මනිරුක්තිප්‍රතිසම්භිදා ප්‍රභෙදගතවූ ප්‍රඥාවෙහි සගොචරකෘත්‍යාදිවශයෙන් විස්තරව පවතීද ඒ ප්‍රඥාව ප්‍රතිභාණප්‍රතිසම්භිදා නම් වේ. මේ සිව්පිළිසිඹියාම ශෛක්ෂභූමි අශෛක්ෂභූමියයි ද්විවිධ ස්ථාන ප්‍රභෙද වේ. එයින් අග්‍රශ්‍රාවක මහාශ්‍රාවකයන්ගේ වශයෙන් අශෛක්ෂප්‍රභෙද විය. ආනන්දස්ථවිරය චිත්තගෘහපතිය උපාලිගෘහපතිය ධාර්මිකඋපාසකය ඛුජ්ජුත්තරා උපාසිකායයි මේ ආදීන්ගේ වශයෙන් ශෛක්ෂ ප්‍රභෙද විය—මේ ද්විවිධ භූමිප්‍රභෙද නම් වේ.

නවද මේ චතුපටිසම්භිදාම අධිගමය පර්‍යාප්තිය ශ්‍රවණය පරිපුච්ඡාය පුබ්බයොගයයි පංචප්‍රකාරයකින් විශදවේ. එයින් අධිගම නම් අර්හත්ත්වප්‍රාප්තිය, පර්‍යාප්ති නම් බුද්ධවචන ඉගැන්මය. ශ්‍රවණ නම් මොනවට අර්ථකොට මෙනෙහි කිරීමෙන් බණඇසීමය පරිපුච්ඡා නම් පාලිඅර්ථකථාආදියෙහි ග්‍රන්ථිපදයන්ගේ අර්ථ විනිශ්චය කථාය පූර්වයොග නම් පූර්වබුද්ධවරයන්ගේ ශාසනයෙහි අනන ගිතවූ ප්‍රවෘත්තිය ප්‍රත්‍යක්ෂයෙන්ම යම්තාක් අනුලොමයෙන් ගොස් ගොත්‍රභූඥානයසම්පවේද ඒතාක් විදර්ශනායෙහි යෙදීමය

**නවද අනිකුත් ආචාර්‍ය්‍යවරු කියණක්.**

පුබ්බයොගය බාහුසච්චය දෙසභාසාය ආගමය පරිපුච්ඡාය අධිගමය ගරුසන්නිස්සයය මිත්තසම්පත්තියයි ප්‍රතිසම්භිදාප්‍රත්‍යයන් අටදෙනෙකු දක්වූහු එහිදු පූර්වයොගය යටකියනලද ක්‍රමයෙන්ම දතයුත්තේය බාහුසච්ච නම් ඒ ඒ ශාස්ත්‍රයෙහිද ඒ ඒ ශිල්පයෙහිද දක්ෂබවය. දෙසභාෂා නම් සියගණන් ව්‍යවහාර භාෂාදි

යෙහි දක්ෂබවය. විශෙෂයෙන් වනාහි මාගධිකභාෂාවෙහි දක්ෂ බවයි. ආගමනම් යටත්පිරිසෙයින් උපමාවග්ගමාත්‍රවූද බුඬවචන යන්ගේ පුරුදුකිරීමයි. පරිපුච්ඡා නම් එකගාථාවෙක වීනමුත් අර්ථවිනිශ්චය විචාරීමයි. අධිගම නම් සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත්මාර්ගී ඵල සිඬකිරීමයි. ගරුසන්නිස්සය නම් ඇසීම් පිරවීම් බහුලවූ ප්‍රාඥ ගුරුවරයන්ගේ සමීපයෙහි වාසයකිරීමයි, මිත්‍ර සම්පත්තියනම් උභයලොකාර්ථ සංසිඬියට කාරණාවූ ප්‍රාඥ මිත්‍රයන් හා එක්වීමයි. ඒ ශෛක්‍ෂ අශෛක්‍ෂභූමින් අතුරෙහි සම්‍යක්සම්බුඬවරයන් හා ප්‍රත්‍යෙකබුඬවරයෝ පූර්වයොගයද අධිගමයද නිසා ප්‍රතිසම්භිදාවට පැමිණෙන්නාහුය, ශ්‍රාවකයෝ වනාහි මේ සියලුම කාරණයන් නිසා ප්‍රතිසම්භිදාවට පැමිණෙන්නාහු වෙති, වෙනම කර්මස්ථාන භාවනානුයොගයෙක් නම් නොම ඇත්තේය. ශෛක්‍ෂ ඵලයෙන් මිදී මාර්ගීයට පැමිණි ශෛක්‍ෂයන්ටද අශෛක්‍ෂඵලයෙන් මිදී මාර්ගීයට පැමිණි අශෛක්‍ෂයන්ටද ප්‍රතිසම්භිදා ප්‍රාප්තිය වේ.

කුමක්මෙන්ද ? තථාගතවරයන්ට දසබල ප්‍රාප්තිය මෙනි, එහෙයින් උත්තමයන්ට ආර්‍ය ඵලයෙන් මිදී මාර්ගීයට පැමිණීම හා සමග සිව්පිළිසිඹියා ප්‍රාප්තිය වන්නේයි. මෙසේ දක්වනලද මේ චතුර්විධ ප්‍රතිසම්භිදායෙන් යුක්තසේක.

**චතුර්විධ ඍඬිපාද නම් කවරහ යත්?**

ඡන්දිඬිපාදය චිත්තිඬිපාදය විරියිඬිපාදය වීමංසිඬිපාදයයි චතුර්විධ වේ. එයින් ඡන්දිඬිපාදය නම් ඍඬි ප්‍රතිලාභය පිණිස භාවනා කොරෙමී යන නියුණු අදහස ඡන්ද නම් වෙයි. ඒ ඡන්දය හෙතු කොට ගෙණ හෝ ඡන්දය අධිකවූ හෝ ඒ ඡන්දය නිසාම ප්‍රධාන සංස්කාරයෙන් යුක්තවූ සමාධිය ඡන්දසමාධිය නම් වෙයි. ඒ ඡන්ද සමාධිය ප්‍රතිලාභාර්ථයෙන් ඍඬි නම් වෙයි, කල්‍යාණගුණ ප්‍රතිලාභයට පැමිණීම පාද නම් වෙයි, ඒ ඡන්දසමාධි ප්‍රතිලාභයෙන් පැමිණීම ඡන්දිඬිපාද නම් වේ, චිත්තිඬිපාද විරියිඬිපාද වීමංසිඬිපාදයෙහිද මෙසේමැයි. මේ ඍඬිපාදයන් කැමැත්තහු විසින් ඍඬිවිධඥානය දිව්‍යශ්‍රොත්‍රඥානය , චෙතොපරියඥාණය පූර්වෙනිවාසානුස්මෘතිඥානය සත්වයන්ගේ චුතුපපාතඥාණයයි පස්වැදෑරුම්වූ ලෞකික අභිඥාවන් උපදවා පඨවිකසිනය ආපොකසිනය තෙජොකසිනය වායොකසිනය නීල කසිනය පීතකසිනය ලොහිත කසිනය ඔදාතකසිනයයි අටවැදෑරුම්වූකසිනයන්ගෙන් එකි එකි කසිනයකට අටක් අටක්බැගින් සමාපත්තිඋපදවා එහි කසිනානුලොමයෙන්ද කසිනපටිලොමයෙන්ද කසිනානුලොම පටිලොමයෙන්ද ධ්‍යානානුලොමයෙන්ද ධ්‍යානපටිලොමයෙන්ද ධ්‍යානා

නුලොමපටිලොමයෙන්ද, ඣානානුක්කන්තකයෙන්ද කසිනානුක්කන්තකයෙන්ද ඣානකසිනානුක්කන්තකයෙන්ද, අඞ්ගසංකන්තියෙන්ද ආරම්මණසංකන්තියෙන්ද අඞ්ගාරම්මණසංකන්තියෙන්ද අඞ්ගවවත්ථාපනයෙන්ද ආරම්මණවවත්ථාපනයෙන් දැයි මෙසේ තුදුස් ආකාරයෙකින් චිත්තපරිදමනය කටයුත්තේයි. මේ තුදුස්ආකාරයන් අතුරෙහි කසිනානුලෝම නම්!!පඨවිකසින සමාපත්තියට සමවැද එයින් ආපොකසින සමාපත්තිය තෙජොකසින සමාපත්තිය වායොකසින සමාපත්තිය නීලකසින සමාපත්තිය පීතකසින සමාපත්තිය ලොහිතකසින සමාපත්තිය ඔදාතකසින සමාපත්තිය ප් මෙසේ මුලපටන් පිළිවෙළින් සියක්දහසක් වර සමවදනේ කසිනානුලොම නම් වේ.

**කසිනපටිලොම නම්**--:ඔදාතකසින සමාපත්තියට සමවැද එයින් ලොහිතකසින සමාපත්තිය පීතකසින සමාපත්තිය නීලකසින සමාපත්තිය වායොකසින සමාපත්තිය තෙජොකසින සමාපත්තිය ආපොකසින සමාපත්තිය පඨවිකසින සමාපත්තියයි මෙසේ ඔදාතකසින සමාපත්තියෙහි පටන් මූල පඨවීකසින සමාපත්තිය දක්වා ප්‍රතිලොමක්‍රමයෙන් සමාපත්තියට සමවැදීම කසිනපටිලොම නම් වේ.

**කසිනානුලොම ප්‍රතිලොම නම්**—:පඨවිකසින සමාපත්තියෙහි පටන් පිළිවෙළින්ම ඔදාතකසින සමාපත්තියට සමවැද නැවත ඔදාතකසින සමාපත්තියෙහි පටන් ප්‍රතිලොමයෙන් පඨවීකසින සමාපත්තියට සමවැදීම කසිනානුලොම ප්‍රතිලොම නම්වේ.

**ඣානානුලොම නම්**—:ප්‍රථමඣාන සමාපත්තියට සමවැද එයින් ද්විතියඣානය තෘතියඣානය චතුර්ථඣානය ආකාසානඤ්චායතනය විඤ්ඤාණඤ්චායතනය ආකිඤ්චඤ්ඤායතනය නෙවසඤ්ඤානාසඤ්ඤායතනයයි මෙසේ ප්‍රථමඣානයෙහි පටන් අනුලොමයෙන් සියක්දහසක් වර නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය දක්වා සමවැදීම ඣානානුලොම නම් වේ.

**ඣානප්‍රතිලොම නම්**—:නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට සමවැද එයින් ආකිඤ්චඤ්ඤායතනය විඤ්ඤාණඤ්චායතනය ආකාසානඤ්චායතනය චතුර්ථඣානය තෘතීයඣානය ද්විතීයඣානය ප්‍රථමඣානයයි මෙසේ ප්‍රතිලොමයෙන් ඣානයට සමවැදීම ඣානප්‍රතිලොම නම් වේ.

**ඣානානුලොම ප්‍රතිලොම නම්**-ප්‍රථමඣානයෙහි පටන් පිළිවෙළින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට සමවැදනැවත

නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහි පටන් ප්‍රථමධ්‍යානය දක්වා ප්‍රතිලොමයෙන් සමවැදීම ධ්‍යානානුලොමප්‍රතිලොනම්වේ.

**ඣානානුක්කන්තිකා නම්**-පඨවිකසිනයෙහි වනාහි ප්‍රථමධ්‍යානයට සමවැද නැවත එහිම තෘතීයධ්‍යානයට සමවැද ඉක්බිති තෘතීයධ්‍යාන එලිකොට ආකාසානචායතන සමාපත්තියට සමවැද එසින් ආකිචඤ්ඤායතන සමාපත්තියට සමවදිමින් මෙසේ කසිනය අනුව ගොස් ධ්‍යානයාගේම එකාන්තරිකභාවයෙන් යාම ඣානානුක්කන්තිකා නම් වේ. මෙසේම ආපොකසිනාදිය මූලිකකොටද යෙදියයුත්තේයි.

**කසිනානුක්කන්තිකා නම්**-පඨවිකසිනයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද නැවත එම ධ්‍යානය තෙජොකසිනයෙහිද එසින් නීලකසිනයෙහිද එසින් නැගී ලොහිත කසිනයෙහිදැයි මෙම ක්‍රමයෙන් ධ්‍යානය අනුව ගොස් කසිනයාගේම එකාන්තරිකභාවයෙන් යාම කසිනානුක්කන්තිකා නම් වේ.

**ඣානකසිනානුක්කන්තිකා නම්**-පෘථිවිකසිනයෙහිප්‍රථමධ්‍යානයට සමවැද තෙජොකසිනයෙහි තෘතීයධ්‍යානයට සමවැද නීලකසිනය උග්ඝාටනය කොට ආකාසානචායතන සමාපත්තියට සමවැද ලොහිත කසිනයෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවැද මෙමක්‍රමයෙන් ධ්‍යානයාගේද කසිනයාගේද අනුව යාම ඣාන කසිනානුක්කන්තිකා නම් වේ.

**අඞ්ගසංකන්තිකා නම්**—පඨවිකසිනයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද ඒ පඨවිකසිනයෙහිම සෙසුත් විතීයධ්‍යානාදියට සමවැදීම අඞ්ගසංකන්තිකා නම් වේ.

**ආරම්මණ සංකන්තිකා නම්**—පෘථිවිකසිනයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද එම ප්‍රථමධ්‍යානයම ආපොකසිනයෙහිද තෙජොකසිනයෙහිද වායොකසිනයෙහිද නීලකසිනයෙහිද පීතකසිනයෙදහි ලොහිතකසිනයෙහිද ඔදාතකසිනයෙහිදැයි මෙසේ සියලු කසිනයෙහිම එකම ධ්‍යානයක්හුගේ සමවැදීම ආරම්මණ සංකන්තිකා නම් වේ.

**අඞ්ගාරම්මණසංකන්තිකනම්**-පෘථිවිකසිනයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද ආපොකසිනයෙහි විතීයධ්‍යානයට සමවැද තෙජොකසිනයෙහි තෘතීයධ්‍යානයට සමවැද වායොකසිනයෙහි චතුර්ථධ්‍යානයට සමවැද නීලකසිනය උග්ඝාටනය කොට

ආකාසානඤ්චායතන සමාපත්තියට සමවැද පීතකසිනයෙහි විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට සමවැද ලොහිතකසිනයෙහි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට සමවැද ඔදාතකසිනයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියටසමවැද මෙසේ එකාන්තරික වශයෙන් අඞ්ගයන්ගේද ආරම්මණයන්ගේද පිළිවෙළින් යාම අඞ්ගාරම්මණ සංකාන්තික නම් වේ.

**අඞ්ගවවත්ථාපන නම්**—ප්‍රථමධ්‍යානය වනාහි පඤ්චඞ්ගික වෙයි. නියමකොට ද්විතීයධ්‍යානය ත්‍රිඅඞ්ගික වෙයි නියමකොට තෘතිය ධ්‍යානය ද්විඅඞ්ගික වෙයි නියමකොට චතුර්ථධ්‍යානය ද්විඅඞ්ගික වෙයි නියමකොට ආකාසානඤ්චායතනයද විඤ්ඤාණඤ්චායතනයද ආකිඤ්චඤ්ඤායතනයද නෙවසඤ්ඤානාසඤ්ඤායතනයදැයි මෙසේම නියමකොට මෙපරිද්දෙන් ධ්‍යානයන්ගේ අඞ්ගමාත්‍රයක් නියම කිරීම අඞ්ගවවත්ථාපන නම් වේ.

**ආරම්මණවවත්ථාපන නම්**—මේ පඨවිකසිනය මේ ආපො කසිනය මේ තෙජොකසිනය මේ වායොකසිනය මේ නීලකසිනය මේ පීතකසිනය මේ ලොහිතකසිනය මේ ඔදාතකසිනයයි මෙසේ ආරම්මණය නියමකිරීම ආරම්මණවවත්ථාපන නම් වේ.

මේ තුදුස් ආකාරයෙන් චිත්තපරිදමනය කොට පූර්වයෙහි අභාවිතවූ භාවනා ඇති ආදිකර්මික යොගාවචරතෙම ඍද්ධිවිකුර්වණ සම්පාදනය කිරීමට සමර්ථ නොවන්නේමය. එසේහෙයින් ආදිකර්මිකයාහට කසිනපරිකර්මය ගරුවන්නේය ඒ ආදිකර්මිකයන් සියක්දහසකින් එකෙක්ම කසිනපරිකර්මය සිඬකරන්නේය කසිනපරිකර්මය සිඬකළාහටද නිමිත්තොත්පාදනය ගරුවන්නේය, එයින් සියක්දහසකින් එකෙක්ම නිමිත්තොත්පාදනයට සමර්ථ වන්නේය. නිමිත්තය උපන්කල්හි ඒ මෙනෙහි වඩා අර්පණාධිගමයට පැමිණීම ගරුවන්නේය එයින් සියක්දහසකින් එකෙක්ම අර්පණාධිගමයට හැකිවන්නේය. ඒ අර්පණාධිගතයහටද තුදුස් ආකාරයෙකින්චිත්තපරිදමනයකිරීමගරුවන්නේය එයින්සියක් දහසකින් එකෙක්ම චිත්තපරිදමනය කිරීමට හැකිවන්නේය ඒ තුදුස් ආකාරයෙන් චිත්තපරිදමනය කළාහටද ඍද්ධිවිකුර්වණය ගරුවන්නේය. එයින් සියක්දහසකින්එකෙක්ම ඍද්ධිවිකුර්වණයට හැකිවන්නේය. ඍද්ධිවිකුර්වණයට පැමිණියාහටද ඛිප්පනිසන්තිය ගරුවන්නේය එයින් සියක්දහසකින් එකෙක්මඛිප්පනිසන්තියට හැකිවන්නේය. ඒ ඛිප්පනිසන්තියට පැමිණියාහටද පරම ප්‍රතිෂ්ඨාභාවය ගරුවන්නේය. එයින් සියක් දහසින් එකෙක්ම පරම ප්‍රතිෂ්ඨාවට හැකිවන්නේය. එසේහෙයින් මෙබඳුවූ ප්‍රකාර ඇත්තාවූ භාවනානු ක්‍රමයෙන් අභිඥාඵලය පිළිලද්දාහුට මේ ඍද්ධිවිකුර්වණයද සෙසුත් ප්‍රතිසම්භිදාදිප්‍රභෙදවූ ගුණයෝද සිඬවන්නාහුයි—හේ එසේමැයි.

යම්සේ ආභරණාදිවූ සුවර්ණවිකෘතියක් කරනු කැමැති සුවර්ණකාරකයෙක් සුවර්ණයෙහි ගුණ දැන ගින්නෙහි බහා ගිනි පිඹීම් ආදීන් ඒ රත්රන් මෘදුකිරීමෙන් කර්මක්‍ෂමකොට ආභරණාදිවූ සුවර්ණ විකෘතියක් කරන්නේද; තවද යම්සේ භාජ

විකෘතියක්කරණු කැමැති කුම්භකාරයෙක් මැටිමොළොක්කොට පදම් බලා අනාගෙණ මැටිපිඩ සක මුදුනෙහි තබා එකහව හිඳ වලන් උකා ගෙණ පදම් බලා තලා මෙසේ භාජන විකෘතීන් කරන්නේද; එලෙසම ආදිකර්මිකවූ යොගාවචරයා විසින්තුදුස් ආකාරයකින් චිත්තපරිදමනයකොට ඡන්දසීසය චිත්තසීසය විරිය සීසය වීමංසාසීසයයි සමවැදීම් වශයෙන්ම ආවජ්ජනාදිය පුරුදු කොට චිත්තමෘදුත්වයෙන් කර්මක්ෂමකොට ඍද්ධි පිණිස ධ්‍යානානුයොගය කටයුත්තේයි.

**ඍද්ධිනම් කවරහ යත්?.**

"ඉජ්ඣනට්ඨෙන නිප්ඵත්තිඅට්ඨෙන පටිලාභට්ඨෙන ඉද්ධීති අරහත්තමග්ගෙන ඉජ්ඣතීති ඉද්ධි" කියෙයින් කල්‍යාණගුණධර්මප්‍රතිලාභයෙන් කැමැත්තක් සිද්ධකොට ගැන්ම ඍද්ධිනම්වේ. මේ ඍද්ධිතොම දශප්‍රකාරවන්නීය, කෙසේදයත්? අධිෂ්ඨාන ඍද්ධිය විකුර්වණ ඍද්ධිය මනොමයඍද්ධිය ඥාණවිප්ඵාරඍද්ධිය සමාධිවිප්ඵාර ඍද්ධිය ආර්‍ය්‍යඍද්ධිය කර්මවිපාකජඍද්ධිය පුණ්‍යවතොඍද්ධිය විද්‍යාමය ඍද්ධිය ඒ ඒ තැන්හි සම්‍යක්ප්‍රයොගප්‍රත්‍යයාගේ ප්‍රතිලාභාර්ථයෙන්වූ ඍද්ධියයි දශවිධ වේ. එයින් අධිෂ්ඨානඍද්ධිය නම් කවරහ යත්—:ප්‍රකෘතීන්ම උදකලාව සියයක් දහසක් ලක්ෂයක් ගණන් බොහෝ වෙම්වයි සිතින් සලකා නුවණින්ම අධිෂ්ඨානකිරීමෙන් විභාගකොට දක්වූවාවූ ඍද්ධිතොම අධිෂ්ඨානවශයෙන් නිෂ්පන්නවූ බැවින් අධිෂ්ඨානඍද්ධි නම් වේ. විකුර්වණඍද්ධිනම්:—යමෙක් තමාගේ ප්‍රකෘතිවූ රූපය හැර විකෘතිවූ ළදරු රූපයක් හෝ යොවුන් රූපයක් හෝ නාග ගරුඩ යක්ෂ රාක්ෂසාදිවූ රූපයක් මවා දක්වාද මේ විකුර්වණඍද්ධි නම් වේ. මනොමයඍද්ධි නම්:—යමෙක් තමාගේ රූපය හැර එසේම අනික් මනොමයවූ රූපයක් නිර්මිතකොට දක්වාද මේ මනොමයඍද්ධි නම් වේ. ඥාණවිප්ඵාර ඍද්ධි නම්—:ඥාණප්‍රවෘත්තියෙන් වනාහි ආදියෙහි හෝ අන්තයෙහි හෝ ඒක්ෂණයෙහි හෝ ඥාණානුභාව විශෙෂයෙන් පිළිලද්දාවූ ඍද්ධිය ඥාණවිප්ඵාර ඍද්ධිනම් වේ. ඒ ඥාණවිප්ඵාරඍද්ධිය ආයුෂ්මත්වූ බක්කුලස්ථවිරයන්වහන්සේටද සංකිච්චස්ථවිරයන්වහන්සේටද භූතපාලස්ථවිරයන්වහන්සේටද ඥාණවිප්ඵාරඍද්ධිප්‍රතිලාභයවූයේය. **කෙසේද යත්?**

ආයුෂ්මත්වූ බක්කුලස්ථවිරයන්වහන්සේ ළදරු අවස්ථාවෙහි සියකුලෙහි මඟුලෙක් වූයේය එදවස් කිරිමව් ඒ බක්කුලකුමාරයන් නාවනු පිණිස ගඟාවට ගෙණගොස් කුමාරයන් ජලස්නානයකරවා ගොඩ සිටුවා තුමූ නහන්නට වන්හ. එකල්හි ගොඩ සිටි කුමාරතෙම ගඟට බැස දියෙහි වැටුනේය එකල්හි මත්ස්‍යයෙක් ගොදුරු ලොබින් යනුයේ කුමාරයන් ගැල යට ගං බලා ගොස් බරණැස් තොටට පැමිණ දැලක බැඳුනේය. එකල්හි කෙවුළෝ ගඟ බැඳි දැල බැඳුනු මත්ස්‍යයන් ගෙණ ගොස් බරණැස්නුවරට විකුණන්නාහු මේ කුමාරයන්ගිලූ මත්ස්‍යයා සිටුකුලයකට දුන්හ. ඒ සිටුකුලයෙහි නාථකා සිටාණන්ගේ භාර්‍ය්‍යාවූ සිටුකුමාරිකාවෝ

මත්ස්‍යයා දුටුවේලෙහි පටන් මොහු මම්ම පිසෙමියි කියා දැසිත් අතටනොදී තුමූම මත්ස්‍යයාගේ උදර විදාරණයකොට මත්ස්‍යො දරයෙහි උන් කුමාරයන් දැක මා විසින් පූර්වයෙහි මහත් කුශල යක් කරණලද්දේය. ඒ කුශලානුභාවයෙන් දැන් රන්රුවක් වැනිවූ පුත්‍රරත්නක් ලදිමියි මහත්වූ සොම්නසට පැමිණ කුමාර පෙරහරින් වඩා වර්ධනය කළහ. ඒ කුමාරයෝද වැඩිවිය පැමිණ තමන් පෙර කළ කුශලානු භාවයෙන් බුදුසසුන් වැද මහණව විදර්ශනාවඩා රහත්ව බක්කුලස්ථවිරයන්වහන්සේයයි යනනමින් ප්‍රසිඬවූසේක. මෙසේ මත්ස්‍යයා ගිලූකල්හි ඔහු කුස නිරෝගිභාව යෙන් සවකීයවූ ගෘහගර්භයෙහි යානාවක හුන්නාක්මෙන් කිසි වෙහෙසක් නොවිඳ පශ්චිමභවික බක්කුලස්ථවිරයන්වහන්සේට එම ආත්මභාවයෙහි ලබනලද්දාවූ අරහත්තඥාණානුභාවයෙන් පහළ සෘඬිබැවින් මේ ඥාණවිප්ඵාරසෘඬි නම් වේ.

තවද සංකිච්චස්ථවිරයන්වහන්සේ මව්කුස වසන කල්හි දරු ගර්භය මෝරා මව්කුසින් බිහිවන්නට සාල් අසල්ව කීපදවසක් තිබැදී මෑනියන්ගේ ආයුසය පිරිහින, එදවස් කාලක්‍රියා කළාවූ මෑනියන් දවනු පිණිස ගෙණ ගොස් දරසෑයට නගා කුක්ෂිවිදාර ණය කොට දවම්හයි [illegible] යා යහුලකින් උදරාභ්‍යන්තරය විදිකල්හි ඒ යහුල බඩඔත් දරුවන්ගේ නුවන් කෙළවර වැදගත, එකල්හි දරුවෝ ඇසෙන සේ මහත්කොට හැඬූහ අසල සිටියෝ ඒ ශබ්ද අසා දරුගර්භය ජීවත්වීයයි දැන මිනිය දරසෑයෙන් බා උදරවිදා රණය කොට දරුවන් ගෙණ මුත්තනියන් අතට දුන්හ මුත්තනි යෝ ඒ දරුවන් වඩා වර්ධනය කළකල්හි සංකිච්චකුමාරයෝයයි යන නමින් වැඩිවිය පැමිණ බුදුසසුන් වැද මහණව විදර්ශනා වඩා රහත්වූහ. මෙසේ දරසෑයට නැඟූ මෘතගර්භයෙහි වැස පවා නිරෝ ගීවූ ආයුෂ්මත් සංකිච්චස්ථවිරයන්වහන්සේ එම ජාතියෙහි තිවන් දක්නා හෙයින් අනතරායකර ව්‍යසනයක් නොවිඳ අර හත්තඥාණානුභාවයෙන් නිරොගිවූ සේක, මෙයිදු ඥාණවිප්ඵාර සෘඬි නම් වේ.

තවද භූතපාලස්ථවිරයන්වහන්සේ රජගහනුවර දිළිඳුකුලයෙහි උපන්සේක උන්වහන්සේ බාලඅවස්ථාවෙහි පියාණන් හා සමග දරගෙණෙනු පිණිස ගැලකට නැඟී වනාන්තරයට ගොස් දර ගැලක් පුරාගෙණ දෙදෙනම එක්ව රජගහනුවරට එන කල්හි නුවරවහසල්දොරසමීපයෙහිදී ගැලඅදිනා ගොන් සාරඅඹරා විස් දමා ගොස් ඇතුළුනුවරට වන්හ එකල්හි භූතපාලකුමාරයන්ගේ

පිය පුරුෂයා කුමාරයන් දරගැලට රැකවල්පිණිස රඳවා තෙමේ ගොන්ගිය පියෙහි ගොස් ඇතුළුනුවරට වැද ගොන් බලා ඇවිද පරක්කුව නැවත එන්ට වන්කල්හි නුවරවහසල්දොර අගුළුගත් හෙයින් ඇතුළුනුවරම රැඳුනෝය දරගැල රැකවලට උන් භූතපාලකුමාරයෝ තනිවම තුන්යම්රාත්‍රියෙහි මනුෂ්‍යමාංසභක්ෂණාකාරණ යක්ෂප්‍රෙතාදීන් විසින් උපද්‍රව සහිතවූ අමුසොහොන් ආදියෙන් යුක්ත වහසලින් පිටතම ඔවුන්ගෙන් කිසිව්‍යසනයක් නොවිඳ සැපසේ විසූහ තිවන් දක්නා ජාතියෙහි සියළු සත්ත්වයන්ටම තිවන් දැකමුත් අන්තරායමරණක් නොවනහෙයින් මේ අරහත්තඥාණානුභාවයෙන්ලත් ඍද්ධිය හෙයින් මෙසිද්ධ ඥාණවිප්ඵාරඍද්ධි නම් වේ.

**සමාධිවිප්ඵාරඍද්ධිනම්**-සමාධියෙන් පූර්වයෙහිහෝ පසුවහෝ ඒ ක්ෂණයෙහිහෝ සමථානුභාවය නිෂ්පාදනයකරන්නාවූ විශෙෂය සමාධිවිප්ඵාරඍද්ධි නම්වේ. මේ ආයුෂ්මත් සැරියුත්මහතෙරුන්වහන්සේටද සංජීවස්ථවිරයන්වහන්සේටද ඛාණුකොණ්ඩඤ්ඤස්ථවිරයන්වහන්සේටද උත්තරා උපාසිකාවන්ටද සාමාවතී උපාසිකාවන්ටද විශෙෂයෙන් සමාධිවිප්ඵාරඍද්ධි ප්‍රතිලාභය වූයේය. **ඒ කෙසේද යත්?** එක්සමයෙක්හි කරුණානිධානවූ සර්වඥයන්වහන්සේට දකුණත්සව්වෙමියි එකාසංඛ්‍යෙයකප්ලක්ෂයක් පාරමිතාපූරා සසරඅවුත් දකුණත් සව්තනතුරු ලත් ආයුෂ්මත් සැරියුත්මහතෙරුන්වහන්සේද එසේමඑකාසංඛ්‍යෙය' කප්ලක්ෂයක් පාරමිතා පුරා වමත්සව් තනතුරට පැමිණි මුගලන්මහතෙරුන්වහන්සේදැයි කියනලද දෙදෙනාවහන්සේම කපොතකන්දරනම් පියස්හිවසනසේකඑකල්හිඑක්දවසක්අලුයම්වේලෙහි අබ්භොකාසයෙහි වැඩහුන් සැරියුත් මහතෙරුන්වහන්සේ යක්ෂයො දෙදෙනෙක් දුටහ එයින් එක්යක්ෂයෙක් උන්වහන්සේ කෙරෙහි අප්‍රසන්නව අතික් යක්ෂයා වළැක්වියදීම තමා අතින් උන්වහන්සේගේ හිසමුදුනෙහි පහරක් දුන්නේය ඒපහර මහත් සෙණහඬක්සේ ගර්ජනාවදසදිගපැතිරගිය,එකල්හි සැරියුත්මහතෙරුන්වහන්සේ ඔහුපහරදෙන්ට අතනැගූක්ෂණයෙහි නිරොධසමාපත්තියටසමවන්සේක,එවේලෙහි ඒ පහර මැස්සකුහිස උන් පමණත් උන්වහන්සේට නොදැනුනේය ඒ යක්ෂයාගේ අත මහත්වූ පර්වතයෙක්හි ලා තැළුවාක් මෙන් වෙහෙස විය මේ ආශ්චර්‍යය ආයුෂ්මත්වූ සැරියුත් මහතෙරුන්වහන්සේගේ සමාධිවිප්ඵාරඍද්ධි නම් වේ. තවද සංජීවස්ථවිරයන්වහන්සේ ගොපළු

ගමක් සමීපයෙහි වනලැහැබෙක රුක්මුල නිරෝධසමාපත්ති
යට සමවැද වැඩහුන්සේක එකල්හි ගම්වැසි ගොපළුදරුවෝ මුන්
වහන්සේ දැක මහරුපයකැයි සිතා වටින් දරගෙණවුත් වසා
පටවමින් දරසැයක්බැඳ ගොම්වැරටියෙන් දරදඬු අතුරතුර සිදු
රුවසා වියලිතණින් එහි මුදුන පටන් වටසේම කොට දෙකො
ණින්ගිනිදල්වූ කල්හි දෙගිනි සාව ඇවිල නැගෙන්නාවූ ගිනිකඳ
තණගොමවැරටි සහිතවූ ඒසා මහත් දරගොඩද හසමවූයේය
වැඩහුන් තෙරුන්වහන්සේගේ සිවුරෙන් හූ රළක් පමණකුත්
නුහුණුයේය, මේ උන්වහන්සේගේ අනුපූර්වයෙන් සමවත් සමා
පත්තියකරණකොටගෙණපැවැත්තාවූ සමථානුභාවයෙන් ජනිත
සෘඬිය හෙයින් මෙසිදු සමාධිවිප්ඵාරසෘඬි නම් වේ. තවද ඛාණු
කොඩඤ්ඤ ස්ථවිරයන්වහන්සේ බොහෝසේම සමවත් සැප
යෙන් වසනසේක එසේහෙයින් එක්දවසක් විවෙකස්ථාන කැමැ
තිව එක්තරා එක්වන මැද රුක්මුල නිරෝධසමාපත්තියට සම
වැද වැඩහුන්සේක එකල්හි සොරු පන්සියයක් ගම්පැහැර සො
රකම්කොට ගෙණ තමන් වසන තැනට යන්නාහු ඒ වනයට
වැද සිතන්නාහු ඉදින් මෙතෙක් තැන් පලා ආ අප පස්සේ අල්
වන්ට එනකෙණෙක් නැතැයි සැකයක් නැතිව එක්තෙනක
සැතපෙනුකැමැතිව තමන්ගෙණ ගිය බඩුපොදි බා තබන්නාහු
නිරෝධසමාපත්තියට සමවැද වැඩහුන් තෙරුන්වහන්සේ ඉදුරු
දැනගත නොහී මහත්කණුවකැයි සිතා තමන් ගෙණ යන බඩු
පොදි පන්සියයම උන්වහන්සේගේ ඇඟව පටවා, තුමූ සැතපු
නාහ,මෙසේ ඒ බඩුපොදි තබා සැතපී නැඟීසිට තික්වේනුපිණිස
තමතමන් තුබූ බඩුපොදි ඔසවන්ට පටන්ගත්හ එකල්හි නි
රොධසමාපත්තියට සමවදිනා වේලෙහි මෙපමණ කලකින් නැඟී
සිටිමියි කියා නියමකළ කාළය එවේලාවට සම්ප්‍රාප්තවිය එසේ
හෙයින් නිරෝධසමාපත්තියට සමවැද වැඩහුන් තෙරුන්වහන්
සේ නැඟී සිටිනට පටන් ගත්සේක එවේලෙහි උන්වහන්සේගේ
ඇඟ සෙල්වුනා දැක සොරුපන්සියයම මහත්භයින් නැතිගෙණ
මුරගා දිවූහ තෙරුන්වහන්සේ එපවත් දැන උපාසකවරුනි නො
පි නොබව මම භික්ෂුවෙකිමි යි කීසේක එපවත් අසා ඒ හැම සො
රහු තෙරුන්වහන්සේ සමීපයටඅවුත් පසඟපිහිටුවාවැඳ බණඅසා
මහණව සිව්පිළිසිඹියාපත් රහත්වූහ, පන්සියයක් බඩුපොදි තෙ
රුන්වහන්සේගේ සියලඟ පැටවූ අවස්ථාවෙහි ඒතෙරුන් වහන්
සේට කිසිපීඩාවක් නුවූයේ තමන්වහන්සේගේ සෘඬිබලයෙන්ම
හෙයින් මෙසිදු සමාධිවිප්ඵාරසෘඬි නම් වේ. තවද පූර්ණකාසිටා
ණන්ගේ දූවූ උත්තරානම් උපාසිකාවන්ට සිරිමානම් ගණිකාවක්
වෛෂපරව කකියන්නාවූ තෙල් සටාරයක් ගෙණ හිස්මුදුනෙහි
නැමුව එවේලෙහි උත්තරාවෝ සිරිමානම් ගණිකාවකෙරෙහි
මෛත්‍රී පතුරුවා සිටියහ එවේලෙහි සටාරයෙන් සැලූ කකියන
තෙල් නෙළුම්පතක වගළදියත්තක්මෙන් මඳකුත් ඇඟනොඇලී
බිඳුබිඳුව පෙරළී වටින් බිම වැගිරගියේය. මෙසේ මුදුනෙහි

වන්කළාවූ ඒ කාකියන තෙල්පවා උත්තරාවන්ට කිසි පීඩාවක් කොට ගත නුහුනුයේ ඒ උත්තරාවන් සිතින්ම අධිෂ්ඨානකොට සිරිමාවන් කෙරෙහි පතුරුවනලද්දාවූ මෛත්‍රීබලයෙන්ම හෙයින් මෙසිද්ධ සමාධිවිප්ඵාරසෘද්ධි නම් වේ. තවද උදේනී රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් වූ සාමාවතී නම් බිසවක් රජහට ප්‍රියව වෙසෙසි එකල්හි මාගන්දිය නම් බමුණෙක් තමාගේ දුව ඒ රජහට අගමෙහෙසුන් කරනුපිණිස සාමාවතීන් කෙරෙහි රජු බිඳුවනු කැමැතිව දවසෙක බිසවුන්ගේ වීණායෙහි නයකු ලමින් තෙමේම බොරුවක් ගොතාගෙණ රජහට කියනුයේ දේවයන්වහන්ස සාමාවතී නුඹවහන්සේ දෂ්ටකරවනුපිණිස නයකුවීණායෙහි තබාගෙණ පරිහරණය කෙරෙති කිය, උදෙනීරජ එපවත් අසා සාමාවතීන්ට කිපී බිසවුන් ලඟට ගෙන්වා ගෙණ දුන්නක් නගා විෂපෙවූ හියක් පත අවුළුවාගෙන සාමාවතීන් විදිනට උරදුරා ඇදගත්හ බිසව් එවිට සපිරිවර මහරජාණන් කෙරෙහි මෛත්‍රී පතුරුවා සිටියහ. එකල්හි මහරජාණෝ ඇදගත් සැරය විදගතනොහී දුන්නබාගතත්නොහී සිතියම්කළ රුවක්සේ නිශ්චලවසිටියහ එවේලෙහි රජ්ජුරුවන්ගේ සකලාඞ්ගයෙහි ඇට නහර සම්මස් ආදිය යතකලා මිරිකන්නාසේ තද වෙහෙසදෙන්ට වන එපවත් බිසව් දැන කියන්නාහු කිම්ද දේවයන්වහන්ස ඇදගත්හීය අත නොහැර වෙහෙස විඳිනාසේක් වනැයි කීහ එබසට මහරජාණෝ කියන්නාහු එසේය දේවීනි මේ ඇදගත් දුන්නේ හීයත් අතනොහැරෙයි දුන්න බා තබන්ටත් නොපිළිවන එයින් සියලඟටත්බොහෝ වෙහෙස දෙන්නේයයි කීහ, එබසට බිසව් කියන්නාහු දේවයන්වහන්ස මෙවිට ක්‍රොධචිත්තය සන්හිඳුවා අතමදක් ලිහිල් කොටලුව මැනවයිකීහ, බිසවුන්කීලෙසම අත ලිහිල්කොට දුන්නබා හීය තමන්ගේ පාපිටමහෙළා පීහ,එවේලෙහි බිසව්රජහටකියන්නාහු දේවයන්වහන්ස යමෙක් තමහට ක්‍රොධයක් කෙළේවී නම් ඒ ක්‍රොධයෙන් ජයගන්නා කැමැත්තාහු විසින් තමා ඔහු කෙරෙහි මෛත්‍රීම කටයුත්තේයයි රජහට අවවාදකළහ මහරජාණෝද බිසවුන් කී අවවාදධර්මයෙහි පිහිටා අසත්පුරුෂයන්ගේ බස් නොගෙණ සියල්ලවුන්කෙරෙහි මෛත්‍රී පතුරුවා දැහැමෙන් රජය පිළිපැද ස්වර්ගීපරායණ වූහ, මෙසේ ඒරජහු විසින් බිසවුන්ට විදින්ට ඇදගත් සැරය අත නොහැරුනේ මෛත්‍රී ආනුභාවයෙන්ම හෙයින් මෙසිද්ධ සමාධිවිප්ඵාරසෘද්ධි නම් වේ.

**ආර්‍යසෘද්ධි නම් කවරහ යත්?**

කුණපාදි අශුභයක් දුටුකල්හි මේකුණප්පය පළමු දුටු දුටුවන් ප්‍රසාද එලවන්නාවූ විසිතුරු රූපයකැයිකියාද ජරාවක්දුටුකල්හි මේ ජරා රූපය පළමු නවයොවුනේන් සත්වයන් පොලඹන්නේයයිකියා මෙසේ සියලුඅශුභවස්තුයෙහි අනිත්‍යාදිය මෙනෙහි කොට මෙත්සිතින් ධාතුමනස්කාරයකොට මේ කුණපාදියෙහි

නොපිළිකුල් කිරිමද, නොපිළිකුල්වූ යෞවනරූපාදි සුභයක් දුටුකල්හි මේ යෞවනරූපය ජරාවෙන් මිරිකී මරණට පැමිණෙන්නේයයි සුභයෙහි අසුභානුස්මෘති උපදවා මේ සොභමානවූ රූපාදිය එකාකාරයෙන් නොපවත්නේයයි අනිත්‍යාදිය මෙනෙහි කොට අසුභාරම්මණයෙන් යෞවනරූපයෙහි පිළිකුල් කිරීමද ප්‍රතිකූල අප්‍රතිකූලයෙහි සමමෙත් වඩා ධාතූන් මෙනෙහි කොට නොපිළිකුල් වීමද, අප්‍රතිකූල ප්‍රතිකූලයෙහි එම අසුභ මෙනෙහි කිරීමෙන් අනිත්‍යාදිය සිහිකොට පිළිකුල් වීමද, ඇසින් රූපය දැක නොසතුටුවෙමින් වූ ප්‍රතිකූලයද අප්‍රතිකූලයද හැර උපෙක්‍ෂාවෙන් යුක්ත වීමද, මෙසේ චෙතනා වසිප්‍රාප්තවූ ආර්‍ය්‍යයන්ගේ චිත්තයෙහි පවත්නාහෙයින් මේ ආර්‍ය්‍යඍද්ධි නම් වේ.

**කර්මවිපාකජඍද්ධි නම්**—:සියලු පක්‍ෂීන්ගේද සියලු දෙවියන්ගේද සමහර මනුෂ්‍යයන්ගේද සමහර විනිපාතිකයන්ගේද ඍද්ධි කර්මජඍද්ධි නම් වේ. ඔවුන් අතුරෙන් සියලුම පක්‍ෂීහු ධ්‍යානභාවනාදීන් මාර්ගීභූතයක් නොලැබ අහසින් යන්නාහුය මේ පක්‍ෂීන්ගේ කර්මජඍද්ධි නම් වේ. තවද සියලු දෙවියෝම ධ්‍යානවිදර්ශනාඥානාදිවූ කිසිවක් නැතුව තමන් ලද්දාවූ ආත්මවිශෙෂයෙන් අහසින් යන්නාහුය මේ දෙවියන්ගේ කර්මජඍද්ධි නම්වේ. ප්‍රථමකල්පිකාදිවූ සමහර මනුෂ්‍යයන්ගේ ඍද්ධි කර්මජ ඍද්ධි නම් වේ. පියංකරමාතානම් යක්‍ෂිණිය උත්තරමාතා ඵුස්සමිත්තා ධම්මගුත්තා යයි යන මේ ආදි විනිපාතිකයන්ගේ ඍද්ධි කර්මජඍද්ධි නම් වේ.

**පුණ්‍යවතො ඍද්ධි නම්**—:චක්‍රවර්ති රජහු තමන්ගේ චතුරඞ්ගිනී සේනාව හා සමග කැමැති කැමැති යානවාහන නැඟී අහසින් යන්නාහුය, යටත්පිරිසෙයින් ඇත් අස් ගොපාලාදීන් හා තඹයා රන්කරු සම් හූ ඉදිකරු ආදීහුද තමතමන් කැමැති ලෙසම අහසින් යන්නාහුය මේ පුණ්‍යවතො ඍද්ධිනම් වේ. ජොතිය මහ සිටාණන්ට මහපොළව පලාගෙණ රුවන් ප්‍රාසාදයෙක් පැණනැගේය සූසැටක් කප්රුක් පහළවිය මේද ඔහුගේ පුණ්‍යවතො ඍද්ධි නම් වෙයි. තවද ජටිල නම් සිටාණන්ට අසූරියන් උස රන් පර්වතයෙක් උපන්නේය, ඝොෂක නම් සිටුතෙම සත්තෙනකදි මරණු පිණිස කළාවූ උපක්‍රමයෙන් ගැලවුනේය, මෙණ්ඩක සිටාණන් ඉස්සොධා නහා අහස බැලූකල්හි අහසින් සුවඳ රත්හැල් අවුත් දෙළොස්දහස්පන්සියයක්පමණ මහත් ගුළු පිරීසිටිනේය, උන්ගේ භාර්‍ය්‍යාවන් විසින් එක සාල්නැළියෙක බත්පිස ගෙණ සියලු දඹදිව් වැසියන්ට බෙදා දෙනකල්හි සාල් නැළියෙහි බත්

නොතිමෙන්නේය, ඔහුගේ පුත්‍රයා විසින් දහසින්බඳ පියල්ලක් ගෙණ සියලු දඹදිව් වැසියන්ට බෙදදෙන්ට වන්කල්හි පසියෙහි කහවණු නොතිමෙන්නේය, ඔහුගේ යෙහෙලි එකාව වී තිඹක් හැරගෙණ සියලු දඹදිව් වැසියන්ට බෙද දෙන්ට වන්කල්හි ඒ වී තිඹින් ඇටයකුත් ක්‍ෂය නොවන්නේය, ඔහුගේ දාස්හු විසින් එකම නඟුලක් හැරගෙණ සීසානකල්හි වමින් සත්හීවිටක්ද දකුණෙන් සත්හීවිටක් දැයි මෙසේ එකවිටම පසළොසක් හීවිටි යන්නේය, මේ හැම ඔවුන්ගේ පුඤ්ඤවතො ඍද්ධි නම් වේ.

**විජ්ජාමයඍද්ධිනම්:**—විද්‍යාධරයෝ මන්ත්‍රෞෂධාදීවූ විද්‍යා පුරුදු කොට අහස හස්තිඅශ්වරථපත්තිසඞ්ඛ්‍යාතමහසෙනඟ මවා දක්වන්ට සමර්ථවෙති තුමූද අහසින් යන්නාහු වෙති. මේ විද්‍යාමය ඍද්ධි නම් වේ.

**"තත්ථ තත්ථ සම්මා පයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි"** යන්නෙහි—අර්හත් මාර්ගයෙන් සකලක්ලේශයන්ගේ ප්‍රහීණත්ව ප්‍රතිලාභය ඒ ඒ සම්‍යක් ප්‍රයොගප්‍රත්‍යය ප්‍රතිලාභාර්ථඍද්ධි නම් වේ. තවද යම් කිසි ශිල්පකර්මාන්තද වෙදකම්ද වෙදත්‍රය ඉගෙණීම්ද ත්‍රිපිටක ධර්මය ඉගැන්මද යටත්පිරිසෙයින් සූසැටකලා ආදීවූ තමතමන්ට නියුක්ත කර්මාන්ත විශෙෂයන් නිෂ්පාදනය කිරීම්දැයි යන මේ ඒ ඒ සම්‍යක් ප්‍රයොගප්‍රත්‍යය ප්‍රතිලාභාර්ථඍද්ධි නම් වේ.

මෙසේ දක්වනලද්දාවූ දශවිධ ඍද්ධින් අතුරෙහි උදකාලාව සිය දහස්ගණන් බොහෝවෙම්වයි සිතින් ඉටා මවා ගන්නාවූ අධිෂ්ඨාන ඍද්ධිද තමාගේ ප්‍රකෘතිරූපය හැර විකෘතිරූපාදිය මවාගන්නාවූ විකුර්වණඍද්ධිද තමාගේ රූපය හැර එසේම අතිකුත් මනොමය රූපයක් මවාගන්නාවූ මනොමය ඍද්ධිදැයි යන මේ තුන්ඍද්ධිය මෙතැන්හි කැමැතිවන ලද්දේයි.

මෙම ක්‍රමයෙන්ම ඡන්දසමාධිප්‍රතිලාභයෙන් පැමිණීම ඡන්දිද්ධිපාද නම් වෙයි, චිත්තසමාධි ප්‍රතිලාභයෙන් පැමිණීම චිත්තිද්ධිපාද නම් වෙයි. විරියසමාධිප්‍රතිලාභයෙන් පැමිණීම විරියිද්ධිපාද නම් වෙයි. වීමංසා සමාධිප්‍රතිලාභයෙන් පැමිණීම වීමංසිද්ධිපාද නම් වෙයි, මේ චතුර්විධ ඍද්ධිපාදයෙන් යුක්තසේක.

**චතුර්විධ ඔඝ නම් කවරහු ද?**

**කාමොඝ භවොඝ දිට්ඨොඝ අවිජ්ජොඝයයි සතර වැදෑරුම් වෙ।**

**එයින් කාමොඝ නම්:**—වස්තුකාමක්ලේශකාම නැමැති ඔඝයෙහි නිමග්නව කුශලනැමැති බාහුබලයෙන් ගොඩයාමට අසමර්ථවූ

එහිම ගැලීසිටීම කාමෞඝ නම්වේ., භවෞඝ නම්:—ජාතිනැමැති වතුරෙහි ගැලී ගොඩයාමට අසමර්ථව සිටිනා සත්ත්වයන් නැවත නැවතත් උද්ගතවීමට අවසර නොහරණේ භවෞඝ නම් වේ. දිට්ඨෞඝ නම්:-දෘෂ්ටිනැමැති ජලස්කන්ධයෙහි ගැලීවෙහෙස විඳිනා සත්ත්වයන් ගොඩනැගීමට අවසර නොගරණා බව දිට්ඨෞඝනම්වේ. අවිජ්ජෞඝ නම්:—අඥානස්වභාව නැමැති මහවතුරෙහි නිමග්නව සිටිනා සත්ත්වයන් ගොඩයාමට අවසර නොහරණාබව අවිජ්ජෞඝ නම් වේ. මේ චතුරෞඝයෙන්ම මාගේ බුදුරජාණන්වහන්සේ පරතෙර දැක එහි ගැලුනු සත්ත්වයන්ද එතරකළසේක.

**චතුර්විධවූ සම්‍යක්ප්‍රධාන නම් කවරහයක්?.**

උපන්නාවූ පාපයන් දුරුකරණුපිණිස කළමනා ව්‍යායාමය, නූපන්නාවූ පාපයන් නූපදනාපිණිස කළමනා ව්‍යායාමය, නූපන්නාවූ කුශලයන් උපදවනුපිණිස කළමනා ව්‍යායාමය, උපන්නාවූ කුශලයන් වර්ධනවනුපිණිස කළමනා ව්‍යායාමය”යි මෙසේ දක්වනලද චතුර්විධ සම්‍යක්ප්‍රධානයෙන් යුක්තසේක.

මෙසේ අපමණ ගුණසමූහයෙන් යුක්තවූ සකලලෝකානන්දකරවූ සරණගතවජ්‍රපඤ්ජරවූ අසරණසරණවූ ත්‍රිභුවනවත්සලවූ කරුණානිධානවූ දෙවාතිදෙවවූ ශක්‍රාතිශක්‍රවූ බ්‍රහ්මාතිබ්‍රහ්මවූ අනන්‍යසාධාරණවූ සද්ධර්මාමෘතදායකවූ මහාකාරුණිකවූ තිලෝගුරුබුදුරජාණන්වහන්සේට නමස්කාරකොට:—ඔවුන් වහන්සේ විසින් දේශනාකළාවූ සපර්‍යාප්තික නවලෝකෝත්තර සද්ධර්මයටද හෙවත් මඳකලක් සිත හෙලා ඇදහිලි ඇතිව කන් නමා ආදරසිතින් ඇසූවාවූ සකල සත්ත්වයන්ට සදිව්‍යලෝකයෙහි නානාවර්ණ ධවජමාලාලලිත විචිත්‍රමකරකිංකිණීකාරාව ව්‍යාලශාලකාදීවූ නොයෙක් කල්‍යාණනයෙන් යුක්තවූ සත් රුවණින් හොබනා අනෙක භූමිභෙද ඇති යොදුන් ගණන් උස දිගුපුළුල් රත්නප්‍රාසාදවල සුවසේ වාසය කොට විඳිනා අප්‍රමාණවූ දිව්‍යසම්පත්තියද, බ්‍රහ්මලොකවල කප්කෙළගණන් විඳිනා ප්‍රීතිසැප ආදීවූ බ්‍රහ්මසම්පත්තියද,, මිනිස්ලොව චක්‍රවර්ති රාජ්‍යසම්පත් ආදීවූ මනුෂ්‍ය සම්පත්තියද, සෙසු නාග සුපර්ණාදීවූ භවනව විඳිනා ලෞකිකසම්පත්තියද, සම්‍යක් සම්බෝධිසමධිගමාදීවූ ලෝකෝත්තර සම්පත්තියදැයි කියනලද්දාවූ මේ සියලුම ලෞකික ලෝකෝත්තර සම්පත්තිය විශේෂයෙන්ම සාධා දෙන්නාවූ ධර්මරත්නයද, තවද අහේතුකයොනියෙහි උපන් වග්ගුලි මණ්ඩූකාදීවූ තිරිසනුන්ගේ පවා මඳවිගසෙක කණවැක් පමණකින් ස්වර්ගමොක්ෂ සම්පත්තිය සිඩකොට දෙන්නාවූ ධර්මය, තවද ආලවක අඟුලිමාල ශූචිරොම ඛරරොම බකබ්‍රහ්ම සච්චක දෙවදත්තාදීවූ ක්‍රෑරසත්ත්වයන්ගේ පවා අතිශයින් තද සිත් මෘදු කරවන්නාවූ ධර්මය, තවද ජාති වෛරබැඳ උනුන් දුටුකල්හි ක්‍රෑ

නරරොෂයෙන් නොසතුටුවන නර රාක්‍ෂස සුරාසුර ගරුඩොරග නාග මණ්ඩූක ගජ සිංහ දිවි මුව කාකොලූක මාජ්ජාර මූෂිකාදීවූ ප්‍රතිමල්ලයන් ඔවුනොවුන්හා ප්‍රියමිත්‍ර කරවන්නාවූ ධර්‍මය, නවද වචාවෙන් ලොකවාසීන් පොළඹාගෙණ බඩවඩා ඇවිද ඒ පවින් මතු අවීචිමහනරකයෙහි වැටී නිරාගින්නෙන් ද භස්මවන බවට පූර්‍වනිමිත්ත පාණාක්මෙන් සියලඟ අළුනවරා විරූපවූ රූපයෙන් ඇවිදිනා කිරාවලළහුනු නිවට පාෂාණ්ඩයන්ගේ බස්ගෙණ අපාය මාර්‍ගයට පැමිණ සිටි අසොකමහරජහුවැනි මිථ්‍යාදෘෂ්ටිගත් රජහු පවා මඳවිගසෙක බණ ඇසූ පමණින්ම බුද්ධශාසනයෙහි පැහැද තුණුරුවන් උදෙසා දහගැබ් මහබෝ ප්‍රතිමා ගෘහ ධර්‍මශාලා සක් මන්මණ්ඩප රත්පත් සුළුපා මහපා ආදීන් ප්‍රතිමණ්ඩිතවූ සුවාසූ දහසක් විහාර කරවා සැටදහසක් භික්‍ෂූන් වහන්සේට නිරන්තර යෙන් මහදන් පවත්වා අපමණවූ කුශල ධර්‍මයන් පිරීමෙන් එම ජාතියෙහි ධර්‍මාශොකමහරජයයි යන නමින් ප්‍රසිද්ධව දසදහසක් යොදුන් ජම්බුද්වීපයෙහි එකච්ඡත්‍ර නංවා රාජ්‍යාභිෂෙකප්‍රාප්තව සහ ඔටුණුපලන් සුවාසූදහසක් මහරජුන්හා අපමණවූමහසෙනඟ පිරිවරා අහසින් යොත්නෙක පොළවෙන් යොත්නෙක වටින් සාගරජලය පර්‍යන්තව යසොතෙජස් පතුරුවා දීපචක්‍රවර්ත්ති රාජ්‍යසම්පත්තියෙහි පිහිටුවා මෙබඳුකුශලසම්භාරයන් රැස්කර වවාවූ ධර්‍මරත්නය, නවද සබ්බලොකයෙහි අවිද්‍යානැමති ගනඳුරු විදහා නානානය නැමැති සහස්‍රරශ්මීන් විශෘතකොට ප්‍රඥානැමැති සුගඳුරුමුදුනට පැමිණ විනෙයජනනැමති පියුම්විල් ප්‍රබොධකර වන ලඟිරුමඬලක් වැනිවූ පර්‍ය්‍යාප්තිධර්‍මය ප්‍රතිපත්ති ධර්‍මය ප්‍රතිවෙධධර්‍මයයි යන ත්‍රිවිධවූ ධර්‍මයන් අතුරෙන්:—

පාළිධර්‍මයතෙම විනයපිටකය, අභිධර්‍මපිටකය, සූත්‍රපිටකය, යන තුන්පිටකයකින් සඞ්ගෘහිතවිය. එයින් භික්‍ෂූන්වහන්සේට අනුශාසනාපිණිස වදාළාවූ විනයපිටකයෙහි පරිජිය පචිත්තිය සුළුවග්ග මහවග්ගය පරිවාරය යන පඤ්චප්‍රකාරවූ පාළියෙහි ග්‍රන්ථසඞ්ඛ්‍යාව දෙසීය පණසක් අධිකවූ දෙසාළිස්දහසක් පමණ වන්නේය. ඊට සමන්තපාසාදිකානම්වූ විනය අටුවා සත්විසිදහසෙකැයි මෙසේ විනය පිටකය, ශ්‍රීමුඛපාළිය හා අර්‍ථකථාවශයෙන් එකුන්සැත්තෑදහස් දෙසියපණස් ග්‍රන්ථසංඛ්‍යාවකින් සම්පූර්‍ණ විය.

නවද බුදුන් නමන්වහන්සේගේ ප්‍රඥාසාරය දක්වා දිව්‍යබ්‍රහ්මයන්ට වදාළාවූ අභිධර්‍මපිටකයෙහි ප්‍රකරණවශයෙන් සතක්වූ ධම්මසඞ්ගණිය, විභඞ්ගය, කථාවස්තුය, පුද්ගලප්‍රඥප්තිය, ධාතුකථාය මූලයමකය, ඉන්ද්‍රියයමකය, දුකපට්ඨානය, තිකපට්ඨානයයි* නවප්‍රකාරවූ අභිධර්‍මපාළියෙහි ග්‍රන්ථසඞ්ඛ්‍යාව සයානුදහස් දෙසියපණ

* "දුකතික පට්ඨානය,,යි ඇතැම්.

සෙක. ඊටපිළිවෙළින්මඅට්ඨශාලිනීයසම්මෝහවිනෝදනීයසත්තකය යන විජම්අටුවා තුන්පොතෙහි ග්‍රන්ථසඞ්ඛ්‍යාව නිස්දහසෙකැයි මෙසේ විජම්පිටකය ශ්‍රීමූලපාලිය හා අට්ඨකථාවශයෙන් එක්ලක්‍ෂ සවිසිදහස් දෙසියපණස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවකින් සම්පූර්ණ විය.

තවද බුදුවන මහාපුරුෂයන් බෝධිසම්භාර පුරන්නාවූ ප්‍රකාර දක්වාවදාළ පන්සියපණස් ජාතකදේශනාවෝය, සාමාන්‍යයෙන් බුද්ධකාරකපිළිවෙත්හි විභාග දක්වාවදාළ බුද්ධවංශ චර්‍ය්‍යාපිටක දේශනාවෝය, මෙවැනි කුශලයක් කළ කල මෙවැනි මහාපුරුෂ ලක්‍ෂණයපහළවෙයි යනාදී විභාග හා සර්‍වඥවරයන්ගේ ආනුභාව ආශ්චර්‍ය්‍යඅද්භූතධර්‍මවිභාග දක්වාවදාළ සතළොස්දහස් පන්සිය පන්සැත්තෑවක් පමණ සූත්‍රදේශනාවෝය, ප්‍රස්තාවාගතවස්තූන් නිමිත්තකොට ගෙණ කුශලාකුශලදෙක්හි විභාග දක්වාවදාළ දෙසිය නවානූදහසක් වස්තුකථාදේශනාවෝය, යනාදිවශයෙන් මෙසේ විනේයජනයන් නිසාවදාරණලද සූත්‍රපිටකයෙහි හා දික් සඟිය,මැදුන්සඟිය,සංයුත්සඟිය,අඞ්ගොත්තරසඟිය,කුදුගොත්සඟිය'යි පස්මහසඟියෙක්වෙයි-එයින් පළමුවන දික්සඟිය තෙමේ ශීලස්කන්ධවර්ගය මහා වර්ගය පාථිකවර්ගයයි තුන්වර්ගයකින් හා සොළොස්දහසක් පමණ ග්‍රන්ථසඞ්ඛ්‍යාවකින් හා බ්‍රහ්මජාලසූත්‍රය ආදිකොටඇති දීර්ඝප්‍රමාණ සූතිස්මහාසූත්‍රයකින්ද ශෝභාමත්විය. තවද දෙවනමැදුම්සඟිය මූලපණ්ණාසය මජ්ඣිමපණ්ණාසය උපරිපණ්ණාසයයි තුන් පණ්ණාසයකින්හා පසළොස්වර්ගයකින් සඞ්ගෘහිතව එක්විසිදහස් සත්සිය පණස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවෙන් පරිච්ඡින්නව මූලපරියාය සූත්‍රයආදී කොටඇති මධ්‍යමප්‍රමාණවූ එක්සිය දෙපණස් සූත්‍රයකින් සමෘද්ධවිය. තවදතුන්වන සංයුත්සඟියතෙම සගාථවර්ගය නිදානවර්ගය ස්කන්ධවර්ගය සළායතනවර්ගය මහාවර්ගයයන පස්වර්ගයකින් හා පස්විසිදහසක් පමණ ග්‍රන්ථසඞ්ඛ්‍යාවකින් හා දේවතාසංයුක්තාදී වශයෙන් පිහිටියාවූ ඕඝතරණසූත්‍රය ආදිකොට් ඇති සත්දහස් සත්සිය දෙසැටක් පමණ සූත්‍රවලින් සමෘද්ධ විය. තවද සතරවන අඞ්ගොත්තරසඟිය තෙම ත්‍රිකනිපාතය චතුෂ්කනිපාතය පඤ්චකනිපාතය ෂට්සප්තකනිපාතය අෂ්ටකනවකනිපාතය දසඑකාදසකනිපාතයයි ෂට්ප්‍රකාරයකින්හා එකුන්තිස්දහස්සත් සියපණස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවකින් හා එකී එකී අඞ්ගාතිරේකවශයෙන් පිහිටියාවූ චිත්තපරියාදානසූත්‍රය ආදිකොට ඇති නවදහස් පන්සිය සත්පණස්සූත්‍රයකින් සමෘද්ධ විය. තවද පස්වන කුද්දගොත්සඟියතෙම මෙසේ මෙකී දික්සඟිය ආදිකොට ඇති ග්‍රන්ථසඞ්ඛ්‍යාසහිත සතරමහසඟිය හැර චූලනිද්දේශය මහානිද්දේශය ප්‍රතිසම්භිදාය මහාවර්ගය නෙත්පකරණය ජාතකපාළියයි සර්වසඞ්ග්‍රාහිකවශයෙන් ෂට්ප්‍රකාරයකින්හා යථොක්තවූ මින

යාභිධර්මදෙක්හිග්‍රන්ථ සඞ්ඛ්‍යාව හැර සුසාළිස්දහස් දෙසියපණස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවකින් හා, විනයපිටකය අභිධර්මපිටකය ඛුද්දකපාඨය ධම්මපදය උදානය ඉතිවුත්තකය සූත්‍රනිපාතය විමානවස්තුය ප්‍රේතවස්තුය ථෙරගාථාය ථෙරීගාථාය ජාතකනිද්දේශය ප්‍රතිසම්භිදාය අපදානය බුද්ධවංශචර්‍ය්‍යාපිටකයයි විභාගවශයෙන් මෙසේ පසළොස් ප්‍රකාරයකින් සමෘද්ධව සිටියේය.

මෙසේ දක්වනලද මේ පස්මහසඟියෙහි ශ්‍රීමූලපාඨ එක්ලක්‍ෂ දෙසාළිස්දහස් දෙසියපණස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවකින්හා ඊට පිළිවෙළින්ම සුමඞ්ගලවිලාසිනී නම් අටුවාය ප්‍රපඤ්චසූදනී නම් අටුවාය සාරාර්ථප්‍රකාශිනී නම් අටුවාය මනෝරථපූරණී නම් අටුවාය පරමාර්ථජෝතිකා නම් අටුවාය සද්ධර්මජෝතිකා නම් අටුවාය උදාන නම් අටුවාය ඉතිවුත්තක නම් අටුවාය සූත්‍රනිපාත නම් අටුවාය විමානවස්තුනම් අටුවාය ප්‍රේතවස්තු නම් අටුවාය ථෙරගාථා නම් අටුවාය ථෙරීගාථා නම් අටුවාය ජාතක නම් අටුවාය ප්‍රතිසම්භිදා නම් අටුවාය අපදානනම් අටුවාය බුද්ධවංශනම් අටුවාය චරියාපිටක නම් අටුවාය විශුද්ධිමාර්ග නම් අටුවාය නෙත්පවුරුණු නම් අටුවායයි මෙසේ සූත්‍ර අටුවා දෙලක්‍ෂසූපණස්දහස් දෙසියපණස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවක් ඇතුළුවූ සූත්‍රපිටකය ශ්‍රීමූලපාලි හා අර්ථකථා වශයෙන් තුන්ලක්‍ෂසයානූදහස් පන්සියපණස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවකින් සම්පූර්ණවිය.

මේ සියලුම ධර්මසඞ්ඛ්‍යාව රසවශයෙන් එකෙක්වෙයි ධර්මවිනය වශයෙන් දෙකෙක් වෙයි. ආදිමධ්‍යාවසානවශයෙන් තුනෙක් වෙයි පිටකවශයෙන්ද තුනෙක්වෙයි නිකායවශයෙන් පසෙක් වෙයි. අඞ්ගවශයෙන් නවයෙක්වෙයි ස්කන්ධවශයෙන් සුවාසූදහසෙක්වෙයි ශ්‍රීමූලපාලිවශයෙන් දෙලක්‍ෂපන්සැත්තෑදහස් දෙසියපණස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවෙක් වෙයි. උක්තානුක්ත අර්ථකථාවශයෙන් තුන්ලක්‍ෂ එක්සැටදහස් සත්සිය* පණස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවෙක් වෙයි. ඒ සියලුම පිටකත්‍රයෙහි ශ්‍රීමූලපාලිහා අර්ථකථාවෝ භාණවාරසඞ්ඛ්‍යා වශයෙන් දෙදහස් පන්සියසත් සාළිසක්පමණවෙති ග්‍රන්ථසඞ්ඛ්‍යා වශයෙන් සලක්‍ෂසත්තිස්දහසක් පමණවෙති† අක්‍ෂරසඞ්ඛ්‍යාවශයෙන් දෙකෙළතෙයානූලක්‍ෂ අටසැටදහසක් පමණ අක්‍ෂරයෙන්සම්පූර්ණවිය. නයවශයෙන් අසඞ්ඛ්‍යගණන් නයඇත්තාහුය, මෙබඳුවූ ගුණගණාන්විත මේ ධර්මය රාගවිෂවිනාශයට දිව්‍ය මන්ත්‍රයක්වැන්න ද්වෙෂරෝගවිගමනයට දිව්‍යෞෂධයක් වැන්න මෝහාන්ධකාර විධ්වංශනයට මහාප්‍රදීපයක් වැන්න මදමානභුජගගණසමාකීර්ණ ජාති ජරාමරණතෘණගහණ විනාශයට කල්පාන්තාග්නියක් වැන්න මාත්සර්‍ය්‍යමඩවියලීමට සරාහිරුමඬලක් වැන්න ක්ලෙශසම්තිනිර්වාපණයට මහාමේඝයක් වැන්න

* “පන්සිය ඇතම්”

† මෙහි ග්‍රන්ථසංඛ්‍යා සංසන්දනයෙහිදී ආකුලබවක් පෙණේ. සුධීහු විමසත්වා.

අපායගමනනිවාරණයට මහඅකුලක් වැන්න සසරසයුරෙන්
එතරවීමට මහනැවක්වැන්න දුර්ලබ්ධිපටලවිනාශයට දිව බෙහෙ
තක් වැන්න සාධුජනතැමැති කොමුදවන ප්‍රබොධයට සරාසඳ
මඬලක් වැන්න සංසාරනැමැති කාන්තාරමාර්ග තරණයට තන්හි
තන්හි අමෘතඵලහරිත කල්පපාදපපන්තියක් වැන්න දෙව්ලො
වට නැගෙන්ට හිණිපෙණිපෙළක් වැන්න තුන් තරාබොධිසමධි
ගමයට ඍජුරාජපථයක් වැන්න අමෘතමහානිර්වාණ පුරප්‍රවෙශ
යට මහවහසල්දොරක් වැන්න කැමති කැමති වස්තු සිද්ධකොට
දීමට සිතුමිණිරුවණක් වැන්න මූළුතුන්ලොවට විද්‍යමානවූ
සියලු රසයන්ට වැඩිතරම් උතුම්වූ අමෘතරසයෙක ලොකයෙහි
රත්නයන්ට වැඩිතරම්වූ මාහැගි රුවන්ගබඩාවෙක සමස්ත
ලොකයෙහි සකලප්‍රාණීන්ගේ දුක් දුරුකිරීමට එකාන්තකාර
ණයෙකැයි මෙසේ අනන්තගුණඇති සපර්‍යාප්තික නවලො
කොත්තර සද්ධර්මයටද නමස්කාර දක්වා:—

තවද මේධර්මරත්නය සර්වඥපාලිවචනයෙන් මෙහෙහිනිධාන
කොට දිවි මෙන් රක්ෂාකොරෙමින් අප්‍රමාදව ඒ ධර්මයවූ පරිද්
දෙන් පිළිපැද හස්තපාදවාක්සංයමසමාහිතපියොවින් බැලූබැලූ
වන් අතිශයින් සතුටුකරවමින් ගුණයෙහි ප්‍රසන්නවූ ඒ ශ්‍රද්ධාවත්
ජනයන් විසින් කම්පල අදහා දෙන්නාවූ චීවරදානය ආහාර
දානය සයනාසනදානය ගිලානප්‍රත්‍යදානයයි කියන්ලද්දාවූ සිව්
පසදානයම පිළිගැන්මට සුදුසුහෙයින්ද, ගුණමහන්තතායෙන්
දාන්දුන්නාවූ සියලු සත්වයන්ට ස්වර්ගමොක්ෂසම්පත් සිද්ධකොට
දෙන බැවින් අග්‍රදක්ෂිණෙය්‍යවූ තොහොත් මේ ලොකයෙහි දාන
ඵල විඳිනාකැමැතිවූ සකලසත්වයන් විසින් පින්කෙත් හැඳින
දෙන්නාවූ දානය හැර ඌරු බලු කුකුළු ආදිවූ තිරිසනුන් අතු
රෙහි යම්කිසි තිරශ්චීනයක්හට කම්පලඅදහාකුසගන්නාපමණ
බඩපුරා ආහාරයක් දුන්නේවීනම් ඒ දුන්නාවූ දානය ඕහට එකී
එකීආත්මභාවයෙක ආයුසය රූපය සැපය බලය නුවණය යන
පස් අනුසස් දීම් වශයෙන් පසක් පසක්කොට පන්සියයක්
විපාකදෙන්නේය. වැදි කෙවුළු ආදිවූ පරපීඩාවෙහි නියුක්ත
නිෂ්කාරුණික අශ්‍රද්ධාප්‍රාප්ත පුරුෂයක්හට පවා දුන්නාවූ දානය
කියනලද ක්‍රමයෙන් පන්දහසක් විපාකදෙන්නේය. දැහැමෙන්
දවස්යවා ගොශිලාදිය රක්ෂාකරන්නාවූ මනුෂ්‍යයක්හට දුන්නාවූ
දානය පස්ලක්ෂයක් විපාකදෙන්නේය. පඤ්චඅභිඥා අෂ්ටසමාපත්ති
ලාභිවූ බාහිරතාපසයක්හට දුන්නාවූ දානය පස්කෙළලක්ෂයක්
විපාක දෙන්නේයි. එයින් සියක්දෙනාට දුන්නාවූ දානයට වඩා
මේ සස්නෙහි තිසරණ පිහිටියාවූද ඊට වඩා පන්සිල්පිහිටියාවූද
අටසිල්පිහිටියාවූද දසසිල් පිහිටියාවූද සිල්රක්නා උපාසක ජන

යන් අතුරෙන් එකෙක්හට දුන්නාවූ දානය එකිනෙකට වැඩිවැඩි පිළිවෙළින්ම අසඞ්ඛ්‍යෙය අප්‍රමෙයවූ විපාකදෙන්නේය; ඊටවඩා මේ ශාසනයෙහි මහණවූ සාමණේරය සාමාන්‍ය උපසම්පන්නය වෘතසාර උපසම්පන්නය විදර්ශකය ආරබ්ධවිදර්ශකය මාර්ග සමඞ්ගිය ස්‍රොතාපන්නය සකෘදාගාමිය අනාගාමිය අර හත්නයයි කියනලද්දාවූ සතරමග සතරඵලයෙහි පිහිටි මහාසංඝයාවහන්සේ අතුරෙන් පින්කෙත් හැඳින එක් කෙණෙකුන් වහන්සේට වත් කම්පල අදහා තමහට පැහැදෙන පමණකින් තුන්සිත පිරිසිදුකොට කිසිදානවස්තුවක් දුන්නාහු වීනම් ඒ දානය පිළිවෙළින්ව සියක්දහස් ලක්ෂයක් ගුණයෙන් එකිනෙකට වැඩිවැඩි අසඞ්ඛ්‍යෙය අප්‍රමෙය විපාකදෙන්නේය. මෙබඳුවූ කුශලවිපාකදායකදානය පිළිගැන්මට අගතැන්පත් හෙයින් අග්‍රදක්ෂිණෙයව සකලෙන්ද්‍රිය දමනයෙන් වඩනලද එකාකාරවියයි ඇතිව රාගද්වෙෂ මොහ මදමානමාත්සර්‍ය්‍යාදිවූ සකලක්ලේශයන්ට ප්‍රතිපක්ෂවූ කම්ස්ථානයන් චරිතානුකූලව වැඩීමෙන් ප්‍රහීණකරණලද්දාවූ ක්ලේශාංගයන් ඇති, හෙවත් සකලක්ලේශයෙන් විනිර්මුක්තව ධ්‍යානානුක්‍රමයෙන් ලද්දාවූ සොවාන් මාර්ගය සොවාන්ඵලය සකෘදාගාමි මාර්ගය සකෘදාගාමි ඵලය අනාගාමිමාර්ගය අනාගාමිඵලය අර්හත්මාර්ගය අර්හත්ඵලයයි කියනලද චතුරාර්‍ය්‍යයුගප්‍රධානවූ අටතුරාසියක් පමණ මාර්ගඵල ප්‍රාප්ත පුරුෂප්‍රභේද ඇති ලොවට පින්කෙත්වූ ත්‍රිවිධශාසනානුපාලිත අෂ්ටාර්‍ය්‍යපුද්ගල මහා සංඝයාවහන්සේයයි කියනලද මේ සංඝරත්නයදැයි යන මේ ත්‍රිවිධරත්නයට නමස්කාරපිණිස මේ **"සාරසංග්‍රහ"** නම්වූ ධර්මප්‍රකරණය කළාවූ පූර්වාචාරීන් වහන්සේවිසින් ඉෂ්ටදෙවතාප්‍රණාමපූර්වඞ්ගමවදාක්වූ **"මහාකාරුණිකො නාථො"** යන මේ පළමුවන ගාථාවෙහි අර්ථවිශෙෂයෙන් වර්ණනා කරත්හොත් කල්පයක් මුළුල්ලෙහිදු තුනුරුවන්ගේම ගුණ තබා බුද්ධරත්නයෙහි ගුණ පමණක්ම වර්ණනා කරතත් අන්වචනයක් නොවදාරන්නාවූ බුදුකෙණෙකුන් වහන්සේගේ ශ්‍රීමුඛයෙනුත් වර්ණනා කොට නිමවාලිය නොහැක්කේය ඒ බව ප්‍රකාශකොට දක්වනු පිණිස වදාරණ ලදී.

"බුද්ධොපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං
කප්පම්පි චෙ අඤ්ඤමභාසමානො,
ඛීයෙථ කප්පො චිරදීඝමන්තරෙ
වණ්ණො න ඛීයෙථ තථාගතස්ස"යි.

යනුහෙයින් මේ එක බුද්ධරත්නයෙහි ගුණස්කන්ධය බුදුමුඛය කිනුත් වර්ණනා කොට නිමවාලන්ට නොපිළිවන්කල තුණුරුවන්ගේ ගුණ කියනුම කවරේද? එසේහෙයින් මේ භුවන ත්‍ර

යෙහි සකල සත්වයන් ඇලුම්කාරණහෙයින් රත්නයයි ප්‍රසිද්ධවූ අවශෙෂ මුතුමැණික් වෛඩූර්‍ය්‍ය ශඞ්ඛසිලාප්‍රවාලසුවර්ණරජත මසාරගල්ලලොහිතඞ්කමාණික්‍යයයි කියනලද අවිඥානක දශවිධ රත්නයද, ඊටවඩා චක්‍රරත්නය මාණික්‍යරත්නය හස්තිරත්නය අශ්වරත්නය ගෘහපතිරත්නය පරිණායකරත්නය ස්ත්‍රීරත්නයයි කියනලද සප්තවිධරත්නය උතුම් වන්නේය. මෙහි සවිඥානක අවිඥානක රත්නයන් අතුරෙන් සවිඥානක රත්නය උතුම් වන්නේය; සවිඥානකරත්නයන් අතුරෙන් තිරශ්චීනරත්නය මනුෂ්‍ය රත්නයයි කියනලද. එයින් මනුෂ්‍යරත්නය උතුම් වන්නේය. මනුෂ්‍යරත්නයෙනුත් ස්ත්‍රීරත්නය පුරුෂරත්නයයි කියනලද, එයින් පුරුෂරත්නය උතුම්වන්නේය. පුරුෂරත්නයෙනුත් අගාරිකරත්නය අනගාරිකරත්නයයි කියනලද, එයින් අනගාරික රත්නය උතුම් වන්නේය අනගාරිකරත්නයෙනුත් ශ්‍රාවකරත්නය බුද්ධරත්නයයි කියනලද; එයින් බුද්ධරත්නය උතුම්වන්නේය බුද්ධරත්නයෙනුත් ප්‍රත්‍යෙකබුද්ධරත්නය සම්‍යක්සම්බුද්ධරත්නයයි කියනලද, එයින් සම්‍යක් සම්බුද්ධරත්නය උතුම්වන්නේය. මෙසේ රත්නනාමයෙන් ප්‍රසිද්ධවූ සියලුරත්නයන්ට වඩා ත්‍රිවිධරත්නයම උතුම්වනබැවින් මේ තුණුරුවන්ගේ ගුණමහන්තත්වයට උපමා කරත්හොත් තුන්ලොවම සාදෘශ්‍ය වස්තුවක්ඇතැයි නොසිතෙන හෙයින් තුණුරුවන්ගේ ගුණම අසදෘශ වූයේය. අචාච්‍යවූයේය. අද්භූතවූයේය. අනොපමෙයවූයේය අචින්ත්‍ය වූයේයි—

**එයින් දැක්වූහ.**

“එවං අචින්තියා බුද්ධා බුද්ධධම්මා අචින්තියා,
අචින්තියෙසු පසන්නානං විපාකො හොති අචින්තියො”යි.

තවද මේ ත්‍රිවිධරත්නය අප්‍රමාණගුණයෙන් නභොමණ්ඩලය වැනියයි කියත්හොත් ඒ ආකාශය සෘද්ධිවන්තයන් විසිතුදු දැනගත්ඇකිහෙයින් මේ තුණුරුවන්ගේ අප්‍රමාණගුණසමූහයන් සිතූ සිතට මේසා මහත් ආකාශතලය දිගුපුළුල්දෙයක් සේ නොසිතෙන්නේය. ඉතාම ලුහුඬුපටුදෙයක් සේ සිතෙන්නේය. මාගේ තුනුරුවන්ගේ ස්ථිරවූ අකම්පිතවූ ගුණසමූහයන්ට දෙලක්ෂසතළිස්දහසක් යොදුන් ඝනකඩබොල්මහපොළොව සාදෘශ්‍ය කරත්හොත් මේ මහපොළොව නම් ජලපොළොව පිට පිහිටියේය. ජලපොළොව වාපොළොව පිටපිහිටියේය, එසේහෙයින් මහපුළුගින් නොසොල්වන එකද වස්තුවක් ඇතැයි නොසිතෙනහෙයින් එසේවූ වායු මුදුනෙහි පිළිවෙළින්පිහිටි පෘථිවිය කම්පිතවනු කියනුම කිම්ද. එසේහෙයින් මෙබඳු කම්පිතවස්තුව අකම්පිතවූ තුනුරුවන්ගේ ගුණරාසියට සාදෘශ්‍ය කොරෙමියි සිතූ සිතට පෘථිවිය අතිශයෙන් චචලයයි සිතමි. මාගේ ත්‍රිවිධරත්නයෙහි අතිභාරවූ අරන්බුවූ ගුණස්කන්ධයට එක්ලක්ෂ අටසැටදහසක්

යොදුන් උසඇති ඝනභාරවූ මහාමෙරුපර්වතය සාදෘශ්‍ය කරත් හොත් ඒ මහමෙරනම් මුදුනෙහිපටන් පාතකෙළවරම එක්ලක්‍ෂ අට සැටදහසක් යොදුන් පමණක්ම හෙයිනුත් දෙමූනත පුළුල දසදහසක් දසදහසක් යොදුන් පමණක්ම හෙයිනුත් එයින්එක් මුදුන් මූනතෙහි අවට එක්තිස්දස් සාරසිය විසිඅටයොදුන් දෙගව් දෙවිසිඉසුබු දසසත්යට එක්රියනක් පමණම හෙයිනුත් උඩට දෙසාළිස්දහසක් යොදුන් හැර යුගන්‍ධරපර්වතය මුදුනට සමවූතෙන විතර තිස්දහසක්යොදුන් හෙයින් එතැන්පටන්සිව් අනූදස්දෙසිය පසාසූයොදුන් දෙගව් අටසැට ඉසුබු එකොළොස් යට තුන්රියන් පමණක්ම හෙයිනුත් සමමැද විතර පණස්දසක් යොදුන් පමණට වට එක්ලක්‍ෂසත්පණස්දස් එක්සිය දෙසාළිස් යොදුන් තුන්ගව්සිව්තිස්ඉසුබු පස්යටපස්රියන් පමණක්ම හෙයිනුත් එයින් යටභාගයද මත්තෙහි කී අයම්විතරට සමහෙයින් මේ මහා මේරුපර්වතයෙහි ඝනය දිගින්පුළුලින් යොදනක්යොදනක් පමණකඩ කඩකළත් එහි ගණන එක්ප්‍රකොටිතිස්ලක්‍ෂවිසිදසක් කොළපමණක්ම හෙයිනුත් මේඝනය ගව් ඉසුබු යටරියන් වියත් අඟුල් ලණ පමණ බෙදුම් තබා උඳටපමණ කළත් මෙතෙකැයිගණිතඥතයට විෂය වනහෙයිනුත් ඒ මහමෙර කල්පාන්ත පවනින් පුළුන් පෙදක්සේ අහසටදමා අත්බඹාක්සේ භ්‍රමණය කරවා වියලිරඹුක්මදයක් සේ ඔබිනොබ දමදමා සුණුවිසුණු කොට ධූලිකරණහෙයින් මෙබඳුවූ සවල්ප ඝනභාරප්‍රමාණයක් ඇති මහාමෙරුපර්වතය භාරප්‍රමාණාතික්‍රාන්තවූ මාගේ ත්‍රිවිධරත්නයෙහි අතිභාරගුණස්කන්‍ධයට සාදෘශ්‍ය කෙරෙමියි සිතූසිතට මහමෙර පුලුන්රළක්පමණ බරක්සේත් නොසිතෙන්නේය තුනුරුවන්ගේ ගුණභාරයම මහත්ව සිතෙන්නේය. තවද අමෘතප්‍රවාහයක්බඳුවූ ඒ ගුණගම්භීරයක්ඇති මාගේ තුනුරුවන්ගේ මෘදුවූ සිහිල්වූ ගම්භීරගුණසමූහයන්ට සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පණස්යොදුන් චක්‍රවාටපර්වතය පැහැර පැතිරසිටියාවූ සුවාසූදහසක් යොදුන්ගැඹුර ඇති මහමුහුද සාදෘශ්‍ය කරත්හොත් ඒ මහමුහුද නම් කල්පාන්ත සූර්‍ය්‍යරශ්මියෙන් හුණුව ගො කුරක දියත්තක්සේ සිඳී බිමවියලී රුවන් වැලි ධූලි පිපෙන හෙයින් මාගේ තුඅ රුවන්ගේ ගුණගම්භීරත්‍වය සිතූසිතට මහමුහුද ගො කුරක දියත්තක්සේ ක්‍ෂුද්‍රව සිතෙන්නේය. ත්‍රිවිධලොකොත්සව ජනකවූ මාගේ ත්‍රිවිධරත්නයෙහි අගණිතවූ ගුණප්‍රමාණයට තාරකාවන්හැර වෙනගණනවස්තුවෙක් මේ ලොකයෙහි ඇතැයි නොසිතෙනහෙයින් අහස ඒතාරකාවන් පිහිටි චාතුර්මහාරාජික දිව්‍ය ාකය නම් වනින් සක්වළ මෝවිට පිටත් කෙළවර පමණක් පරිච්ඡෙදකොට පිහිටිහෙයින් ඒසක්වළමෝවිට නම් ඇතුළතින් වට සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පණස්යොදුනක් හෙයිනුත් පිටතින්වට තෙසාළිස්ලක්‍ෂසූසැටදස්සසිය පන්තිස්යොදුන් දෙ

දෙරියන් දෙවිසිඅඟුල් එකොළොස් ගව් දෙපණස් ඉසුබු අටයට දෙරියන් දෙවිසිඅඟුල් එකොළොස් ලක්‍ෂ පමණහෙයින් මේ සක්වළ පූර්වදිශාවෙහි පිටත කෙළවර පටන් පශ්චිමදිශාවෙහි පිටතකෙළවරදක්වා මේඅතුර විස්තාරය තෙළෙස්ලක්‍ෂඅටසූදූස්සත්සිය සසාළිස්යොදුන් එක්ගව්පන්සැට ඉසුබු දසයට තුන්රියන් පසඟුලක් පමණහෙයින් ඉන් මහමෙර විතරට තිස්දහසක්යොදුන්හැර හාත්පස්හි මහමෙරපටන් සක්වළමුවවිට බාහිර කෙළවරට එකිඑකි වටින් සලක්‍ෂ නව සැත්තෑ දහස් තුන්සිය තෙසැත්තෑයොදුන් දෙසැත්තෑ ඉසුබු සොළොස් යට එක්රියන් එක්වියත් දෑඟුලක් පමණහෙයින් මේ චාතුර්මහා රාජික දිව්‍යලොකයට අවකාශවිය, එසේහෙයින් එහිපිහිටි කුඩා මහත් මධ්‍යම හැමතරුවිමතින් යොදනකට කුඩා විමනක්නැති හෙයින් එසින් මහත් මධ්‍යමප්‍රමාණ විමානයන් තබා එකයොදනක් පමණ අයම් විතරඇති ක්‍ෂුද්‍රවිමානම ඉදින් චාතුර්මහාරාජික දිව්‍යලොකයෙහි මදකුත් අතුරුනොහැර වටින් වට ගසා පිහිටි යත් ඒ තාරකාවන්ගේ ගණන තමා එක්ලක්‍ෂ අටතිස්දූස් සාර සියසිව්සැටකෙළ තිස්ලක්‍ෂ දසනවදූස්තුන්සිය සතාසූවක්පමණ ගණනට විෂයවූ හෙයින් ඒ සියලු තාරකාසමූහයම මාගේ තුනුරුවන්ගේ අගණිතවූ ගුණසමූහයට ලක් තබන්ටත් මදහෙයින් මේ සවල්පවූ තරුගණන තුනුරුවන්ගේ අගණිතවූ ගුණයට මදකුත් සරිකළ නොහැක්කේමය. එසේහෙයින් මාගේ තුණුරුවන්ගේ ගුණ ගණනම අසඞ්ඛ්‍යෙය අප්‍රමෙය වූයේය. මෙසේ අපමණවූ ගුණ ඇති සවකීය රත්න නාමයෙන් ද්‍යුතිමත්ව ත්‍රිවිධ ලොකයහට ත්‍රිවිධ කාලයෙහිම ත්‍රිවිධ සම්පත්තිදායකවූ ත්‍රිවිධ රත්නයෙහි අප්‍රමාණ ගුණයට අහසත් ප්‍රමාණ නොවන්නේය. ස්ථිරවූ ගුණයට මහපොළොවත් සාදෘශ්‍ය නොවන්නේය. භාරවූ ගුණයට මහාමෙරු පර්වතයත් සරිබර නොවන්නේය. ගැඹුරුවූ ගුණයට මහමුහුදත් ගැඹුරු නොවන්නේය අගණිතවූ ගුණයට අහස තරුත් මහගණනෙක් නොවන්නේය. එසේහෙයින් මේ ත්‍රිවිධ රත්න ගුණ ප්‍රකාශකරවූ මේ ගාථාවෙහි අර්ථ වර්ණනා කොට නිමවත් නොහැකිම වන්නේයි.—කාරණා කිමයත්?

"සක්කාවෙ නහමඞ්ගුලෙන මිණිතුං සිඤ්ඤුදකං බින්දුතො
මෙරුං සාසපභාජනෙනිදහිතුං භූමිතන බගගනනාරෙ
කාමෙපතුං සධරාධරං හිමධරං ආහච්ච තුලං සුතා
නොචෙ නාථගුණොදධිං පතරිතුං කොනාපි ලොකත්තයෙ"

යනුහෙයින් මහත්වූ අහස අඟුලෙන් මැන මෙතෙක් පමණ යයි නියම දැනගන්ට යම් සෘද්ධිවන්තකෙණෙකුන් විසින් පිළිවන් වීනමුත් නැවත මහසයුර ජලය බිඳුවශයෙන් මෙතෙකැයි දැන ගැන්මට පිළිවන්වී නමුත් මහාමෙරු පර්වතය අබළුව ඇතුළෙහි ලා සඟවන්ට යම් සෘද්ධිවන්තකෙණෙකුන් විසින් පිළිවන්වීනමුත් මහ පොළොව නිය අස්සෙහි තබා සඟවාගන්ට යම් සෘද්ධියකින් පිළිවන්වී නමුත් නොයෙක් යොදුන්ගණින් උස මහත්වූ සුවර්ණ පර්වතාදීන් ප්‍රතිමණ්ඩිතවූ තුන්දහසක් යොදුන් ඇති හිමාලය පර්වතය පුලුන් රළකින් සෙලවියහැක්ක නමුත් සර්වඥයන්වහන් සේගේ ගුණ නමැති මහා සමුද්‍රය නුවණැසින් දිග පුළුල දැන වියයි නමැති හස්තයෙන් පිනාගොස් පරතෙරදැක්මට මේ භුවන ත්‍රයෙහි එකාදසනමක්හවත් නොපිළිවන්වන්නේය. එසේහෙයින් බුද්ධරත්නය ධර්මරත්නය සංඝරත්නයයිකියනලද තුනුරුවන්ගේ ගුණයෙන් සැරහුනාවූ මේ ගාථාවෙහි අර්ථ විශෙෂයෙන් වර්ණනා කරත්හොත් යම්සෘද්ධිවන්තකෙණෙකුන් විසින් සියක් දහසක් ලක්ෂයක් තොළක් මුඛ මවාගෙණ වර්ණනා කරන්ට පටන් ගතත් මහාකල්පයක අවුරුදුගණින් නිමවතත් මේ ගාථාවෙහි අර්ථවර්ණනාව නොනිමෙන්නේය. එක්පොත් කිරීමට පර්ණයන් රුස් කළත් බොහෝකලක් අතික්‍රාන්තවන මුත් පර්ණසවයත් කොට ගත නොහැක්කේමය, ලියත්හොත් ගත්තත් පන්හිත් මිට පමණ ගෙවෙමින් අපමණවූ ලෙඛණීන් නිමනමුත් මේ ගාථාවෙහි අර්ථලියා නිමවාගත නොහැක්කේමය-**ශේෂ එසේමය.**

එක් සමයෙක්හි ජිනෞරස මහතෙරුන්වහන්සේ ශාක්‍යපුත්‍ර සර්විරයන්වහන්සේ හා එක් මඟක වඩනාසේක, ඒ දෙදෙනාවහන්සේගෙන් ඉදිරියෙහි වඩිනා මහතෙරුන්වහන්සේට පස්සෙහි වඩනා තෙරුන්වහන්සේ කියනසේක් ස්වාමීනි බුද්ධගුණ ඉතාබෙහෙව අපමණවූ බුද්ධගුණ විස්තරවශයෙන් ලියා පොත් සඟා කරත්හොත් අකණිටා බ්‍රහ්මලොව උස පොත්ගොඩක් කළ හැක්කේයයිසිතමි කිමෙක්, එබසට ඉදිරියෙහි වඩනා මහතෙරුන්වහන්සේ ඇවැත්නි බුද්ධගුණ ඉතා ස්වල්පකොට කියවුන, එසේ කීමෙන් බුද්ධගුණට ඉතාම නින්දාවිය මෙසේ ගුණ ස්වල්පකොටකියා අපමණගුණඇතිධර්මරාජොත්තමයාණන්වහන්සේට නින්දාකරවුනැයි කීසේක එබසට පස්සෙහිවඩනා තෙරුන්වහන්සේ ස්වාමීනි මාගේ නුවණින් දුටු පමණ කීමී කීසේක. එබසට ඉදිරියෙහි වඩනා මහතෙරුන්වහන්සේ කියනසේක් ඇවැත්නි තොපගේ නුවණින් එපමණක් දුටුවිනා බුද්ධගුණ අපමණය, අකණිටාබ්‍රහ්මලොවත් ඉතා උස්නොතෙක්දැයි කීසේක්, එබසට පස්සෙහිවඩනා තෙරුන්වහන්සේ ස්වාමීනි මම දුටුවිවරටකීමුත්බුද්ධ

ගුණට අනාදරපිණිස නොකීම් කියා මහතෙරුන්වහන්සේගේ බුද්ධාලම්බනප්‍රීතීන් පිරුණාවූ චිත්තය තැලී ගියේද්දෝහෝයි සිතා ක්ෂමාකරවූ සේක.

එසේහෙයින් බුද්ධරත්නයෙහි ගුණ මෙසේ මහත්කල ත්‍රිවිධ රත්න ගුණයෙන් ප්‍රතිමණ්ඩිතවූ මේ ගාථාවෙහි අර්ථ මාගේ ප්‍රඥාවටවිෂයවූ පමණක්වර්ණනා කොරෙම්යි වණනොත් මතු කියන ධර්මප්‍රබන්ධයට බාධකවේද්දෝහෝයිසිතා මෙතැන්හි මහාමෙරුපර්වතය කැඩපතින්දක්වූවාසේ සදෙව්ලොව එකගිල්ලෙන්පෑවාසේ සොලොස් බඹතලය නම් මේ දිශාවෙහි යයි ඉඟිපෑවාසේ වෙහෙයකුතුඹින් ගත් පස්පමණකින් මහපොළොව පස් දක්වූවාසේ අබළුවෙන්ගෙණ මහසයුරජලය දක්වූවාසේ ඉදිකටුමලතුළෙන් අහසදක්වූවාසේ මේ ගාථාර්ථයෙන් සවල්පමාත්‍රයක් ගෙණහැර දක්වා තුනුරුවන්ට මේ සතුතිපූර්වඞගමවූ වාක්චාරයෙන්ද භක්ති ප්‍රෙම සහිත මිනෝචාරයෙන්ද දසනඛ සමොධානයෙන් සමුජ්ජ්වලිතබද්ධාජලිවූ හස්තපුට මස්තකයෙහි තබා ප්‍රාග්භාරව නම් නවූකායචාරයෙන්දැයි කියනලදචාරත්‍රයෙන් ආයුර්වර්ණ සැප බලප්‍රඥාභිවෘද්ධිවර්ධනාදියපිණිස ඉෂ්ටදෙව ප්‍රණාමපූර්වඞගමවූ මේ ත්‍රිවිධරත්නයට නමස්කාරකොට හෙවත්, භයලොභ කුලාචාරවිනාභක්තිප්‍රෙමාති භාරාවනතොත්තමාඞගයෙන් මනාකොට වැඳ සකලලොකවාසී සත්ත්වයන්ට උභයලොකාර්ථසිද්ධිය පිණිස කුශලාධ්‍යාශයෙන්යෙදී ධර්මව්‍යාඛ්‍යානයක් කියනුකැමැත්තෙමි, එත කුදුළුවත් සත්ත්වයන්ගේසිත් හැඳින බණකීම නම් අපවැන්නවුන් තබා ලොවුතුරාබුදුන්ටමුත් පසේබුදු අගසව් සෑඩිමත් මහරහත් උත්තමයන්වහන්සේටත් නොපිළිවන්මයෑ, ඊටකාරණා මේ මතු කියන අතුලකථාවෙන් දතයුතු:—

**ඒ කෙසේද යත්?**

එක්සමයෙක්හි අතුල නම් උපාසකයකු ඇතුළුවූ පන්සියයක් උපාසකවරු රෙවතමහතෙරුන්වහන්සේ ලඟට ගොස් පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව සිට ස්වාමීනි ඔබවහන්සේගෙන් බණ අසනුකැමැත්තම්හ එබැවින් අපඇමට ධර්මදෙශනාකළමැනවැයි ආරාධනාකළහ. එකල රෙවත්නම් මහතෙරුන්වහන්සේ ධ්‍යාන යටසමවැද වැඩඋන්හෙයින් මුවෙන් නොබිණූසේක. එවිලෙහි උපාසකවරු කියන්නාහු කිමෙක්ද මේ තෙරුන්වහන්සේ අ

කැටිව පෙර උරණක් ඇතියාසේ එ අපහා සමග කථා නොකොට වැඩඋන්සේක. එසේමුවෙන් නොබැණ වැඩහිඳිනාමුන්වහන්සේ ළඟ සිට කල්යවීමෙන් ප්‍රයොජන කිම්දැයි ඔමුනොවුන් හා කථා කොට එතැනින් නික්ම ගොස්:—

"ගඞ්ගාය වාලුකා ඛීයෙ උදකං ඛීයෙ මහණ්ණවෙ,
මහියා මත්තිකා ඛීයෙ ලක්ඛෙන මම බුද්ධියා"යි.

යනාදීන් ඥනගර්ජිතා කළාවූ නුවණින් අග තැන්පත්වූ ප්‍රථම ශ්‍රාවක අනුබුද්ධ සැරියුත් මහතෙරුන්වහන්සේ සමීපයට ගොස් ඔවුන්වහන්සේ අතින්බණඅසනුපිණිසපළමුසේමආරාධනා කළහ එකල්හි ඒ සැරියුත්මහතෙරුන්වහන්සේ ඒ උපාසකවරුන්ගේ ආරාධනාව පිළිගෙණ තමන්වහන්සේ මහත් ඥනඇතත් ඒ උපාසකවරුන්ගේ අදහස්නොබලාම විස්තරවශයෙන් ප්‍රමාණයක්නැතිවමවිජම්පිටකයෙන්බණවදාළසේක. ඒඅසා උපාසකවරු කිමෙක්ද මුන්වහන්සේ පමණක්නොදැනම වැව්පොකුණුකුඹුරු ආදියෙහි තරම්යර පැහැර බිඳුවා වැස සලාපියන මහත්වැස්සක් සේ ප්‍රමාණයක් නොබලාම ආකාශගඞ්ගාවෙහි තුන්ගව්වක් වට ඇතිමහාජලධාරාව අබඑවෙක්හි පුරාඅසුරවන්ට උත්සාහකරන් නක්හුමෙන් බොහෝවම බණවදාරණසේකැයි ඔවුන්වහන්සේට නොසතුටුව එතැනින් නික්ම ගොස්:—

"චාසීතිං බුද්ධතො ගණ්හිං වෙසහස්සානි භික්ඛුතො,
චතුරාසීතිසහස්සානි යෙමෙ ධම්මා පවත්තිනො"යි.

යනාදීන් සුවාසූදහසක් ධර්මස්කන්ධය දිවග ලෙලවමින් බහුශ්‍රුතව විස්තරවශයෙන් බණ වදාරන්නාවූ ආනන්දස්ථවිරයන්වහන්සේකරා එළඹ පළමුසේම බණ වදාළමැනවයි ආරාධනා කළහ. එකල තමන්වහන්සේ බහුශ්‍රැතවූවත් ඔවුන්ගේ සිත්නොබලා මෙපමණක් මොවුන්ට මඳදැයි සිතා ඡේහෝ මඳක් බණ වදාළ සේක. එකල ඒ උපාසකවරු කිමෙක්ද මුන්වහන්සේ නියංකාලයක මෙඝයක් පතන්නාවූ ඇල්ගොවියන් සන්තොස කරවා විදුලිය සියදහස් පැහැර මෙහෙ කුළුරැලි දෙමින් උද්ගතව මහාගර්ජනාකොට දසදිගුන්පුරා වතුරෙන් උතුරුවන මහවැස්සක් නහා පොදගණනක් ගැසුවාසේ බණකියන්ට පටන්ගෙණ මෙමඇසිල් ලෙහිම තබා වදාළසේක ඉඳුරා අප ඇම බණ අසා පියනාසේ නොවදාළසේකැයි අප්‍රසන්නව පලාඑව සබදීනි කියා එතැනින්

නික්මගොස් සත්වයන්ගේ සිත් හැදින මිහිරි කටහඬින් පරමරම
ණීයවූ ධර්මදෙශනා කරණ ලොවුතුරාබුදුන්කරා එළඹ පසඟපිහි
ටුවාවැඳ දෙහොත්මුදුන්දී එකත්පස්ව සිටියාහ. එසඳබුදුහු උපා
සකවරුන්ගේ අදහස් බලා ඉතා බොහෝත් නොකොට ඉතා
මඳත් නොකොට ඔවුන් සිත් පහදනාපමණක්ම බණ වදාළසේක.
එකල අතුලනම් උපාසකයෝ ඇතුළුවූ පන්සියයක් උපාසකවරු
සිව්පිලියෙහි සිට බණ අසා සෝවාන්ව පළමුවන මගින් අමාමඟ
නිවන් දුටහ.

එබැවින් අනුන්සිත් හැදින බණ කීම නම් සෙසු පසේබුදුමහ
රහතුන්වහන්සේටත් නොපිළිවන්මය මෙසේ කප්කෙළගණන්
පාරමිතා පිරූ කෘතාධිකාර මහොත්තමන්ට පවා සත්වයන්ගේ
සිත්හැදින අභිප්‍රායානුකූලවූලෙස බණකියා පහදවන්ට නොපිළි
වන්කල දිවස්නැති පරසිත්නොදන්නාවූ පෘථග්ජන ප්‍රාඥයන්
විසින් සත්වයන්ගේ සිත්හැදින සර්වාකාරයෙන් පහදවා බණකීම
නම් කැළඹ නොපිළිවන එතකුදුවූවත් රුවන් අතලකාවසන්තක්
හට මැණිකක් දුන්නාක් මෙන්ද උක්වනයකට වත් මතැතක්
හට විළිකුන් රඹඵලයක් දුන්නාක් මෙන්ද දහවල් මැද ඝනාන්ධ
කාරවූගෘහගර්භයකනිබූවස්තුවක්කැමැතියක්හටප්‍රදීපාලෝකයක්
පා එළිකොට දුන්නාක්මෙන්ද සියලු සත්වයන් විසින් ධර්මයෙහි
පරිචයඇතත්ධර්මශ්‍රවණයකිරීම බුදුන්ටත්සවභාවධර්මයක්හෙයින්
කලට සුදුසුවූ ප්‍රස්තාවානුගත ධර්මකථාවකින් සත්වයන් සිත්පහ
දවා ඔවුන් කුශලකරණයෙහි යොදා උභයලෝකාර්ථ සිද්ධිප්‍රදාන
පූර්වඞ්ගමවූ පරවැඩ අදහසින් දෙශනාකළාවූ සද්ධර්මය මාගධික
භාෂාවෙහි නොහසළ සිංහලද්වීපවාසීන්ට විශෙෂයෙන් නොදැ
නෙනහෙයින් මගධභාෂාව පරිවර්තනයකොට සබ්‍රහ්මචාරීවූවික්‍රම
බාහු මහාස්ථවිරයන්වහන්සේ විසින් ලෝවැඩපිණිස හෙළබසින්
ධර්මප්‍රබන්ධයක් කළමැනවැයි කළ ආරාධනාවහා වීරසුන්දර කුමාර
නම්වූ උපාසකයාණන් ලෝවැඩ අදහසින් ධර්මදානානුරක්තව
කළාවූ ආරාධනාවහා කරුණානිධානවූ අපබුදුන්විසින් "භාසයෙ
ජෝතයෙ ධම්මං" යනාදීන් වදාළ බුද්ධානුශාසනාවද පිළිගෙණ
තවද පරමසුඛිතජනයන්විසින් විසිතුරුලෙස ධර්මපූජාකිරීමෙන්
සරහනලද්දාවූ අපබුදුන්ව්‍යක්තසභාන්තරවලනිඃශබ්දතාවෙන් ලී
ලොපෙතවපලහනැඟීහිඳබණකියනතරම්බහුශ්‍රැත ශබ්දඥප්‍රාඥව
රයන් ගැමතන්හි ලැබගැන්ම දුර්ලභවත් ශ්‍රද්ධාඇතිව බණඅසනු
කැමැති තිබෙන සුජනයන් විසින් තමතමන්ගේ අභිප්‍රායානුකූල
ලෙස වසන සවකීය ස්ථානවලට අකුරු පමණක් දන්නාකෙනෙ
කුන් ගෙන්වාගෙණ අභිප්‍රායලෙස බණ අසා ලෞකිකලෝකෝ
ත්තර සම්පත් සාධාගන්නාපිණිස හා හෙළබසින් මේ ධර්මප්‍රකර
ණය ප්‍රකාශ කරන්නෙමි.

**මහාසම්මතරජහු** පටන් **සුදොවුන්මහරජහු** අවසන්කොට දඹ
දිව රජපැමිණි **සත්ලක්ෂ සත්දහස් සත්සිය සතාසූවක්** පමණ

හිරුගොත් රජුන් හා, සිරිලක පළමුවෙන් රජපැමිණි **විජයමහ** රජහු පටන් **මහසෙන්**රජහු අවසන්හි මහවස තෙසැටක් රජුන් හා සුළුවස **කිත්සිරිමෙවන්**රජහු පටන් මෙකලට එක්සිය සොළසක් පමණ නරේන්ද්‍රයන් ඇතුළුවූ **සත්ලක්ෂ සත්දහස් නවසිය පන්සැත්තෑවක්** පමණ මහරජුන් අතුරෙහි, ඔවුනුපලන් **තුන්ලක්ෂ සිව්නිස්දහස් සසිය*** **සිව්සැටක්** පමණ **සූර්යවංශෝද්භූත** කීර්තිප්‍රතාපරූපපෛශ්වර්යයෙන් ශෝභමානවූ මහරජුන් අවසන්හි. **බුද්ධවර්ෂයෙන්** එක්වාදහස් නවසිය තෙපණස් හවුරුද්දක්පිරුණුසඳ **ලඞ්කාඞ්ගනාවට** තිලකයක්වැනිවූ සහායසොබ්හ ගම්භීර සිසිරනීරපූරිතසුපුෂ්පිතකමලකුවලයාදී ජලජපුෂ්පකානනොපසොභිත පඞ්කදුර්ගාකුලපරිඛාවලයාලඞ්කෘතොත්තුඞ්ගගොපුරචාර ශරපඤ්ජර රංජිතශිලාමය විශාලසාලාවලයකින් පරික්ෂිප්ත විචිත්‍රචිත්‍රකර්මනිර්මිතකනක ශෘඞ්ගප්‍රභාවිසරාභිරාම සුධාධවල විමල විපුල විවිධ ප්‍රාසාද රාජභවන විසිඛාදීන් අතිමනොහර අපරිමිත විභූතින් විරාජිත විජයවර්ධන **ජයවර්ධනපුර** ප්‍රවරයෙහි චතුස්සඞ්ග්‍රහවස්තුවෙන් ප්‍රජාපාලනයකොරෙමින් රජසිරිපැමිණි ශාක්‍යකුලකමලිනීරාජහංසායමානවූ මහාසම්මතරාජවංශකල්පලතාග්‍රයෙහි සුපුෂ්පිතසඵලපුෂ්පයක් වැනිවූ ජිනචරණසරොජයෙන් නිජමස්තකාලඞ්කෘතකාලාවූසිලොකාලොකලොකපූජිතවිමත රාජපතඞ්ගප්‍රදීපායමානවූඅනාථජනසංරක්ෂණකාරුණ්‍යනිධානඅනන්‍යසාධාරණවිචාරණදානනිජොපම විශුද්ධ **බුද්ධාඞ්කුරවෘත්ති** සිංහලාධීශ්වර නවරත්නාධිපති ශෞර්‍යබල පරාක්‍රමාන්විත **පරාක්‍රමබාහු මහරජාණන්ට** සත්වන්නෙහි.

විසුද්ධ බුද්ධ දර්ශන සද්ධර්ම ශ්‍රවණ සුගතොරසානුශාසන සාධුජන සෙවනාදීන් ප්‍රතිලබ්ධශ්‍රද්ධාබුද්ධිවර්ධනවූ කුශලඵල සඳහා පුණ්‍ය සමයකරන්නාවූ මෙම මහාරාජොත්තමයාණන් විසින් නිරන්තරව පවත්වනලද චතුර්විධ ප්‍රත්‍යයප්‍රතිග්‍රහණයෙන් රජහට උභය ලොකාර්ථසිද්ධිසම්පාදන කුශලවර්ධනය කොරෙමින් ශ්ලිඳු ඒ සිව්පසපරිභොග කුශලයම මතුනොව ගණයා ශබ්දශාස්ත්‍රාදී ත්‍රිපිටකාගම වචන වාචකව ශාසනාභිවෘද්ධිවර්ධනය කොරෙමින් පරවැඩෙනි තත්පරව වසන්නාවූ මහාවිහාරවාසී ස්ථවිරපරම්පරානුගත පුටහත්තසෙළවනවාසී ධර්මකීර්ති මහාස්වාමිපාදයන්වහන්සේගේ අනුජාතශිෂ්‍යපුත්‍රවූ, **සිද්ධාර්ථස්ථවිරාභිධාන** පූජිතාවප්‍රකාශිතධර්ම**දින්නාචාර්ය විමලකීර්ති** මහාස්ථවිරපාදයෝසත්පුරුෂ

*සත්සිය–ඇතම්.

ජන හිතාර්ත්ථව මතුබුදුවන මෛත්‍රෙයබුදුන් දැක අෂ්ටධර්මසමෝධානයෙන් යෙදී පළමුවන විවරණය ලැබ බුද්ධකාරක ධර්මයන් පූරණයකොට ලොව්තුරාබුදුව සමස්තලෝකයාහට අමෘතමහානිර්වාණ ප්‍රදානයකොට පරාර්ථසංසිද්ධිය කෙරෙම්වයි යන අභිමත ප්‍රාර්ථනාවද සිද්ධකොටගන්නා පිණිස මෙතැන්හි සංක්ෂෙප පමණ පරිච්ඡෙදයෙන් ප්‍රතිමණ්ඩිත කථාවස්තුවෙන් “සද්ධර්මරත්නාකර,, නම්වූ ධර්මප්‍රකරණයක් ගෙණහැරදක්වමි.

එහින් ප්‍රකාශවන්නේ නම් ත්‍රිවිධරත්නයෙහි ගුණ හා කුශලාකුශල දෙදෙනාගේ විභාගමය, එද වනාහි භාෂාවෙන් වෙනස් උවත් පාලිධර්මයම හෙයින් දිව්‍යමනුෂ්‍යසම්පත් හා නිවන්පුරසිරි විඳිනා කැමැති සත්පුරුෂයන් විසින් දහම්සොඬමහරජහුමෙන් සමස්ත වස්තුයෙහි ආලය හැර මෙබඳු කාලයෙහි පවා කුශල කරණයෙහි අප්‍රමාදකාරවත්නාවූ මේසද්ධර්මය සිතහෙලා අසමින් මතුස්වර්ගමෝක්ෂ සම්පත්තීන් සිද්ධකරන්ට උත්සාහකටයුතු—

දක්වනලදමැයි.

“ඉති අම්නසිරිං වා ජීවිතංවාපි සංහනා
න සුමඃශ පස්සං ධම්මංමෙවාචරනති,
තනුතරවිභවානං අප්පමාදූනමමෙහා
ඉහ කුසලපමාදෙ කොනු ආමහාදිසානං”යි.

---

මෙතෙකින් මේ සද්ධර්ම රත්නාකරයෙහි
ප්‍රථම භාගාර්ථ ප්‍රකාශක ප්‍රකීර්ණසංග්‍රහකථා නම්වූ

## පළමුවන පරිච්ඡෙදය

කියා නිමවනලදී.

# දෙවන පරිච්ඡේදය.

**කවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**බුද්ධාදී අභිනීහාර සඞ්ග්‍රහකථා නම් කවරහ යත්?.**

මේ මතුකියන්නේ එහි පිළිවෙළ කථාවස්තුය.

**ඒ කෙසේද යත්?**

**උද්ඝටිතඥය විපචිතඥය ඥෙයය පදපරමයයි** කියනලද චතුර්විධ බෝධිසත්ත්වවරයන් කෙරෙහි අනාගතවූ බුදු පසේබුදු අගසව් මහසව් බුද්ධමාතෘපිතෘ පුත්‍ර උපස්ථායකයයි කියනලද අට වැදෑරුම්වූ උත්තමයන්ගේ මූලප්‍රණිධානකථාවන් මෙසේ දත යුතු—කෙසේදයත්?

ඒ අටවැදෑරුම්වූ උත්තමයන් අතුරෙහි පළමුකොට ලොවුතුරා බුදුන්ගේ ප්‍රථමාභිනීහාරසඞ්ඛ්‍යාත විවරණකථාවන් මේ මතු කියන පරිද්දෙන් දතයුතු—

**කෙසේදයත්?**

අතීතානෙක කල්පකොටි සතසහස්‍රාන්තරයෙහි පූරිතාමිත පාරමිතා බලප්‍රතිලබ්ධ විසුද්ධබුද්ධත්වයෙන්ම සිඳිනාලද රාග ද්වෙෂ මොහ මදමානමාත්සර්‍ය්‍යාදීවූ සකලකෙලශ බන්ධනයන් ඇති ලොවුතුරා බුදුවරයෝ නම් මනොවාක් ප්‍රණිධානපූරණයෙන් මස්තකප්‍රාප්තව ප්‍රථමාභිනීහාරයෙහි පටන් යටත්පිරිසෙයින් සාරාසඞ්ඛෙය්‍ය කල්පලක්‍ෂයක්ද මැදත්පිරිසෙයින් අටාසඞ්ඛෙය්‍ය කාප්ලක්‍ෂයක්ද උඩත්පිරිසෙයින් සොළසාසඞ්ඛෙය්‍ය කාප්ලක්‍ෂයක්ද පාරමිතා පුරන්නාහුය ප්‍රඥා අධිකවූ බොධිසත්ත්වවරයන්ට ශ්‍රද්ධාව මදවන්නේය ප්‍රඥාව තියුණුවන්නේය ශ්‍රද්ධා අධික බොධිසත්ත්වවරයන්ට ප්‍රඥාව මධ්‍යමවන්නේය. ශ්‍රද්ධාව තියුණුවන්නේය. වීර්‍ය්‍යය අධික බොධිසත්ත්වවරයන්ට ප්‍රඥාව මදවන්නේය. වීර්‍ය්‍යය තියුණුවන්නේය. මේ බොධිසත්ත්වවරයෝ තුන්දෙනම කාල පරිච්ඡෙදයෙන් අභිනීහාරක්‍ෂණයෙහි දක්නා ලද්දාහු වෙත්—

**ඔහු කවරහ යත්?**

**උද්ඝටිතඥය විපචිතඥය ඥෙයයයි ත්‍රිවිධ වෙත්.**

ඔවුන් අතුරෙහි උද්ඝටිතඥ නම්වූ බොධිසත්ත්වතෙම ලොවුතුරා බුදුකෙනෙකුන්වහන්සේගේ අභිමුඛයෙන් සතරපදයෙන් යුක්ත

ගාථාවක් අසා සතරපදය කියා නොනිමෙන තෙක්ම ෂට්අභිඥ
හාසමග සිව්පිළිසිඹියාපත් රහත්බවට පැමිණීමට සමර්ථවූ උප
නිශ්‍රයසම්පත් ඇත්තේය ඉදින් ඒ බොධිසත්ත්වතෙම ශ්‍රාවකබොධි
යෙහි පිහිටියේ වීනම් එදවස්ම සසරදුක් ගෙවා අමාමහනිවන්
දක්නේය. විපචිතඥ බොධිසත්ත්වතෙම ලොවුතුරුබුදුන්ගේ සම්
මුඛයෙන් සතරපදයෙන්යුක්ත ගාථාවක් අසන්නේ ගාථාව කියා
අර්ථත් කියා නොනිමෙන තෙක්ම ෂට්අභිඥවෙන් සමන්විතවූ
සිව්පිළිසිඹියාපත් රහත්බවට පැමිණීමට සමර්ථවූ උපනිශ්‍රය සම්
පත් ඇත්තේය. ඉදින් ඒ බොධිසත්ත්වතෙම ශ්‍රාවකබොධියෙහි
පිහිටියේවීනම් එදවස්ම සිව්පිළිසිඹියාපත් රහත්ව සොපාදිසෙස
නිර්වාණ ධාතුයෙන් නිවන් දක්නේය. ඥෙය බොධිසත්ත්වතෙම
සර්වඥයන්වහන්සේ විසින් සතරපදයෙන් යුක්ත ගාථාවක් වදාරු
ඒ ගාථාවෙහි අර්ථවිස්තරවශයෙන් විභාගකොට වදාරානිමිකල්හි
ෂට්අභිඥවෙන් සමන්විතවූ සිව්පිළිසිඹියාපත් රහත්බවටපැමිණී
මට නිසිඋපනිශ්‍රය සම්පත් ඇත්තේය. ඒබොධිසත්ත්වතෙම ශ්‍රාවක
බොධියෙහි පිහිටා සිටියේවීනම් එදවස්මැ සිව්පිළිසිඹියාපත්
රහත්ව සොපාදිසෙසනිර්වාණධාතුයෙන් නිවන්දක්නේය. සම්‍යක්
සම්බොධි සමධිගමයට හෙතුවූ බුද්ධ බොධිසත්ත්වයෙක් වීනම් එදවස්
රහත්බවට නොපැමිණ විවරණශ්‍රීලදින් සාරාසංඛෙය්‍ය කප්ලක්ෂ
යක් හෝ අටාසංඛෙය්‍ය කප්ලක්ෂයක් හෝ සොළසාසංඛෙය්‍ය
කප්ලක්ෂයක්හෝ තත් තත් කුශලානුරූපවූ කාලයක්මුළුල්ලෙහි
සමතිස් පෙරුම්පුරා ලොව්තුරාබුදුව සූවිසි අසංඛ්‍යයක් සත්ත්වයන්
අමාමහනිවන් දක්වන්නාහ. මෙසේ ලොව්තුරා බුදුවන්නාවූ
බොධිසත්ත්වවරයෝ ඉදින් සුහුව බුදුබව සිඬකරම්හයි කප් කෙළ
දහසක් මුළුල්ලෙහි දවස්පතා වෙසතුරු දන්මෙන් විසිතුරු මහ
දන් දෙමින් ඊට අනුරූප ශීලාදීවූ දසපින් කිරියවත් පුරමින්
අප්‍රමාණවූ නොයෙක් කුශලරාශීන් රැස්කොට බුද්ධකාරක ධර්ම
යන් පූරණය කරන්නේද අතුරෙක බුදුබව සාධාගතනොහෙත්
නාහ.

**කවර හෙයින්ද යත්?:**

ඥානගර්භය ගෙණ කාලවිපුලත්වයෙන් මුහුකුරා නොපැසුණු
හෙයින් අකල බුදුවිය නොහැක්කේය—ඒ එසේමැයි—යම්සේ
තුන්මසක් හෝ සාරමසක් හෝ පස්මසක් ඇවෑමෙන් පැසෙන්
නාවූගොයම් ඒ ඒ කාලයට නොපැමිණ දවසකට සියක් දහසක්
විට තෙලන්නේද දිය ඉස්නේදැයි මෙසේ කොතෙක් ප්‍රයත්නය

කලත් අතුරෙහි දෙපෝයකින්වත් මසකින්වත් සුහුව නොපැසෙන්නේය ඒ ඒ කාලය ඉක්මුණුකල්හිම පැසෙන්නේය. එපරිද්දෙන් කලට නොපැමිණ දානශීලාදීවූ බුඬකාරක ධර්‍මයන් නොනෙක් රැස්කලත් අතුරෙක ලොවුතුරාබුදුබව සිඬකොටගත නොහැක්කේය. එසේහෙයින් යථොක්තවූ කාලයක් මුළුල්ලෙහි සමත්‍රිංශත් පාරමිධර්මයන් පූරණයකටයුත්තේය. මෙසේ බුදුබව පතා පාරමිතා පිරීමට නුවණ මුහුකුරුවන පිණිස මනොවාක්ප්‍රණිධානයන් පුරාතිමවා මෙතෙක් කාලයක්වීර්‍ය්‍යකොටබුඬත්වය සිඬකිරීමෙහි අභිප්‍රාය ඇත්තානට පළමුවෙන් විවරණ ලබන දවස් අෂ්ටධර්‍මයකින් යුක්තවූ උත්තම පුරුෂයක්හටමුත් පළමු විවරණය නොලැබෙන්නේය:—

ඔහු කවරහයත්?.

“මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති හෙතු සත්ථාරදස්සනං,
පබ්බජ්ජා ගුණසම්පත්ති අධිකාරො ච ඡන්දතා,
අට්ඨධම්මසමොධානා අභිනීහාරො සමිජ්ඣති”

යනුහෙයින් ප්‍රථම විවරණලබන දවස් මනුෂ්‍යාත්මභාවය ලැබීමය පුරුෂලිඞ්ග සම්පත්තිය හෙතුය ශාස්තෘන් දැක්මය ප්‍රව්‍රජ්‍යාවෙහි පිහිටීමය ගුණසම්පත්තිය අධිකකාරවූ පරිත්‍යාගය ඡන්දතාවයයි යන මේ අෂ්ටධර්‍ම සමොධානයෙන් යුක්තවූ උත්තම පුරුෂයක්හට ප්‍රථමාභිනීහාර නම්වූ ප්‍රණිධානසඞ්ඛ්‍යාත පළමුවෙනි විවරණය ලැබීම සිඬ වන්නේය.

මෙහි “මනුස්සත්තං” යන්නෙහි මනුෂ්‍යාත්මභාවය, මේ මනුෂ්‍ය ජාතියහැර අවශෙෂවූ සෙසු ජාති තබා දෙවජාතියෙහි උපන්නාහටත් පළමුවන විවරණය ලැබීම සිඬනොවන්නේය. මෙතැන්හි වනාහි බුදුබවපතන්නාවූ බොධිසත්වයන්විසින් දානාදීවූ දසපින් කිරියවත් පුරා මනුෂ්‍යාත්මභාවයම ප්‍රාර්ථනා කටයුත්තේය. ඒ මනුෂ්‍යාත්මභාවයෙහි සිට මූලප්‍රණිධානසංඛ්‍යාත ප්‍රථම විවරණය සිඬකටයුත්තේය.

“ලිඞ්ගසම්පත්ති” යන්නෙහි පුරුෂාත්මභාවය ප්‍රකාශකරණ ලද මනුෂ්‍යජාතියෙහි උපන්නත් පුරුෂාත්මභාවය ලැබමුත් ස්ත්‍රීව සිට ප්‍රථමාභිනීහාරය ලැබගත නොහැක්කේය. එසේහෙයින් මනොවාක් ප්‍රණිධාන පූරණයෙන් අනියතවිවරණය ලැබූ බුදුබවපතා සිටිබොධිසත්වවරයොණෙක් සසර සැරිසරණසඳ කලාවූ කිසියම් අකුශලකර්‍මයකින් ස්ත්‍රීව උපන්නාහුවීනමුත් එහි සිඬ

ලොවුතුරාබුදුබව පතන්නාවුන් විසින් දානශීලාදිවූ කුසල්කොට
පුරුෂාත්මභාවයම ප්‍රාර්ථනා කටයුත්තේය. ඒ පුරුෂාත්මභාව
යෙහි සිටියාහටම ප්‍රථම විවරණය ලැබීම සිද්ධවන්නේය.

"**හේතු**" යන්නෙහි රහත්වීමට හෙතුවූ උපනිශ්‍රය සම්පත්තිය
යම් පුරුෂයක්හු එම ආත්මභාවයෙහි ධ්‍යාන භාවනාකොට උත්
සාහ කොළේනම් සකලකෙලශයන් ප්‍රහීණකොට රහත්ව නිවන්
දක්නට සමර්ථවේද ඔහටම ප්‍රථමාභිනීහාරය සිද්ධවන්නේය.

"**සත්ථාරදස්සනං**" යන්නෙහි බුදුකෙණෙකුන්වහන්සේ දැක්
මය එසේ හෙයින් ලොවුතුරාබුදුකෙනෙකුන්වහන්සේගේ අභි
මුඛයෙහි ජීවිතය පුදා පියන තරම් අචලශ්‍රද්ධාවෙන් ගෞරව උප
දවා බුදුන්දැක සතුටු වීමය.

"**පබ්බජ්ජා**" යන්නෙහි ප්‍රව්‍රජ්‍යාව නම් අනගාරිය භාවය, එද
වනාහි ශාසනයෙහි හෝ කර්මවාදී ක්‍රියාවාදීවූ තාපසපරිව්‍රාජකාදී
නිකායෙක හෝ පැවිදි වීමය.

"**ගුණසම්පත්ති**" යන්නෙහි ධ්‍යානාදී ගුණලාභය එද වනාහි
පැවිදි වූවාහටද ගුණයෙන්ම යුක්තවූවහොත් ඔහටම ප්‍රථමාභිනී
හාරය සිද්ධවන්නේය, නෙසු මකුගුණ ඇති සංකූටකෛරාටික
ඥනමායාවීවූ අසත්පුරුෂයන්ට ප්‍රථමාභිනීහාරය සිද්ධ නොවන්
නේය.

"**අධිකාරො**" යන්නෙහි අධිකාරවූ පරිත්‍යාගය යන අර්ථයි,
හෙදවනාහි ජීවිත පරිත්‍යාගයක්මෙන් උත්සාහකොට විවරණශ්‍රී
ප්‍රාර්ථනා කරන්නාහටම සිද්ධ වන්නේය. එසේහෙයින් ලොවුතුරා
බුදුකෙනෙකුන්වහන්සේ අභිමුඛයෙහි විශෙෂයෙන් දැක ඔවුන්
වහන්සේගේ නවඅරහාදි ගුණ මෙනෙහි නිධානකොට මෙබඳු
විපදෙත්තමතෙම ඒකාන්තයෙන් දුකින් මිදී සැපයෙහි පිහිටි
යේය මමද මොවුන්වහන්සේ මෙන් බුද්ධත්වය සිද්ධකරනු කැමැත්
තෙමි ඒ බුදුබව කාවරකලක සිද්ධ වේද්දෝහෝයි විචාළමැනවැයි
වැදහෙව වචනප්‍රමාණයක් ලදමැනවැයි අධිකාවූවීර්යකොට
වැද හොත්තාහට ප්‍රථමාභිනීහාරය සිද්ධවන්නේය

"**ඡන්දතා**" යන්නෙහි බුදුවෙමියි යන තීක්ෂණවූ අභිප්‍රාය ඒ තියු
ණුවූ අදහස් යම් පුරුෂයක්හට බලවත්වේද ඔහටම ප්‍රථමාභි
නීහාරය සිද්ධවන්නේය. ඉදින් කිසි පුරුෂයෙක් ඒ බොධිසත්වයා
හට කියන්නේ එම්බල වීරවත් මහාපුරුෂය සාරාසංඛෙය්‍ය කප්

ලක්ෂයක් ඕලුල්ලෙහි නිරයෙහි පැසි වෙහෙස විඳමුත් බුදුබව
සිඬකොට ගත නොහැක්කේයයි කීයේවීනමුත් මම එසේම
කෙරෙමියි යම් පමණක් අධිකවූ උත්සාහවීර්‍යයකොරේද එසේවූ
අධිකවීර්‍යයවත් ඕහට බුදුබව අදහස මහත්වැ ඇති හෙයින්
එතැන්හි ප්‍රථමාභිනීහාරයයි කියනලද පළමුවන විවරණය
ලැබීම සිඬවන්නේය. මෙසේ අෂ්ටධර්ම සමෝධානයෙන් යෙදී
ලොවුතුරා බුදුන්ගේ බුඬශ්‍රී දැක ඔවුන්වහන්සේගෙන් පළමුවන
විවරණය ලත් බොධිසත්වතෙම එතැන්පටන් ලොවුතුරාබුදුවන
තෙක් අවශෙෂ සත්වයන් පැමිණෙන්නාවූ අටලොස් අභව්‍යස්ථා
නයට නොපැමිණෙන්නේය.

**ඒ අභව්‍යස්ථානයට නොපැමිණීම නම් කවරේදයත්?**

ජාත්‍යන්ධ නොවීමය ජාතිබිහිරි නොවීමය. අවිවෙකඋමතුභාව
නොවීමය දුටුවන් පිළිකුල්වන නිති වැහෙන කෙළතුලු නොවීමය
ජාතියෙන් ගොළු නොවීමය පිළුනොවීමය හුදු ම්ලෙච්ඡජාති
යෙහි නොඉපදීමය අශ්‍රිත මෙහෙඅාදියෙහි නියුක්තවූ දසීන්
කුස නොඉපදීමය නියත මිථ්‍යාදෘෂ්ටි නොගැන්මය ලිඞ්ගපරිවර්ත
නයෙන් තිඳිතවූ අකුශලවිපාක නොවිඳීමය මාතෘඝාතක පිතෘ
ඝාතක අරහන්තඝාතක ලොහිතුප්පාදක සංඝභෙදක යයි කිය
නලද පඤ්චානන්තරිය කර්ම අකුශලසිඬනොවීමය ඔහුගේ සියලඟ
කුෂ්ටකිලාසාදීවූ පාපරොග නැතිවීමය. තිරිසන්යොනියෙහි උප
දිනත් වටුවන්ට කුඩාවූ තිරිසන්යොනියෙහිද ඇතුන්ට මහත්වූ
තිරිසන්යොනියෙහිද නොඉපදීමය යුගඅතුරැකප් අසඞ්ඛ්‍යකප්
මහකප් ගොදුරු නොලැබ ක්ෂුධා පිපාසයෙන් යුක්තවූ ගිනි
ගෙණ දිලියෙන ඇටසැකිලිමයවූ මහාශරීරඇතිව අපමණ දුක්
විඳිනාවූ නිජ්ඣාමතණ්හික අඞ්සඞ්ඛලිකාදිවූ ප්‍රෙතනිකායෙහි
නොඋපදනාබවය විපුලඅකුශල ඵල සඵලකොට විඳිනා කාල
කඤ්ජ අසුරනිකායෙහි නූපදනාබවය කප්ගණන්හි දුක්විඳිනා අවී
චිමහනිරවල්හි නොහෙනබව්ය ක්ෂාරොදක පිරුණු ලොකාන්ත
රික නරකාදියෙහි නූපදනාබවය සප්තවිධකාමසවර්ගයෙන් මාර
භවයෙහි නූපදනාබවය රූපාවචරයෙන් පඤ්චසුඬාවාසයේ නොඋ
පදනාබවය අසඤ්ඤිභවයෙහි නූපදනාබවය උච්ඡෙදශාස්වත
දෘෂ්ටිගෙණ එයින් සංජාත කර්මවිපාකයෙන් කුසල්කිරීමටඅවසර
නොලැබ සසර කල්යන්නාවූ අරූතල අසංඥතලයෙහි නූපදනා
බවය බුදුපසේබුදුමහරහත් සක්විතිරදුන්ට අනියතස්ථානවූ පර
සක්වළ නොඋපදනාබවය මෙබඳුවූ කුශලප්‍රතිපක්ෂ අකුශලස්ථා
නාවූ අටලොස් අභව්‍යස්ථානයට නොපැමිණි විශෙෂවූ ප්‍රඥාවීර්‍ය

අධිෂ්ඨානමෛත්‍රීභාවනායයි කියනලද්දාවූ සතරබුද්ධභූමියට පැමි
ණ එයින් ජනිතවූ ඉෂ්ටවිපාකඵලයෙන් යුක්තවසම්‍යක්සම්බෝධි
ඥාන පරිපාකප්‍රවෘත්තියෙන් සජාතවූ නෛෂ්ක්‍රම්‍යයයි කියන
ලද ප්‍රව්‍රජ්‍යාධ්‍යාශය ප්‍රවිවේකාධ්‍යාසය අලෝභාධ්‍යාසය අද්වේෂා
ධ්‍යාසය අමෝහාධ්‍යාසය නිස්සරණාධ්‍යාසයයි කියනලද භව
යෙන් නික්මුණාවූ නිර්වාණයයි කියනලද සවැදෑරුම්වූ අදහසින්
යුක්තව සමතිස් පෙරුම් පුරා ලොවුතුර බුදුව සත්වයන් අමාමග
නිවන් දක්වන්නාහුය.

පසේබුදුවන්නාවූ බෝධිසත්වවරයෝ දෙයාසඞ්ඛ්‍යය කල්පලක්ෂ
යක් පාරමිතා පුරන්නාහුය. එයින් අඩුඋවහොත් පසේබුදුවිය
නොහැක්ක ප්‍රත්‍යෙකබොධිසත්වවරයන්ගේද පාරමී ධර්මයන්ගේ
පූරණාදිය යටකියනලද පරිද්දෙන්ම දතයුත්තේයි. මෙසේ
දෙඅසඞ්ඛ්‍යය කල්පලක්ෂයක් පාරමිතා පුරා පසේබුදුබව ප්‍රාර්
ථනාකරනනාවූ බෝධිසත්වතෙම ප්‍රථම විවරණ ලබන දවස් පච
ධර්ම සම්පත්තියකින් යුක්තඋවහොත් විවරණශ්‍රී ලැබෙන්නේය.

**හේ කවරේද යත් ?**

“මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති විගතාසවදස්සනං,
අධිකාරෝ ඡන්දතා එතෙ අභිනීහාර කාරණා”යි.

යනුහෙයින් මනුෂ්‍යාත්මභාවය පණ්ඩකනපුංසකාවතීතාදීවූ
ජන්ම විරහිතව පුරුෂවඉපදීමය බුද්ධප්‍රත්‍යෙකබුද්ධආයර්‍ය ශ්‍රාවකා
දිවූ යම්කිසි ලෝකෝත්තරපුද්ගලකෙනෙකුන් දැක්මය අධිකා
රවූ එතැන්හි ජීවිතපරිත්‍යාගය බුදුබවෙහි තියුණුවූ අදහසය.
මෙසේ පචධර්ම සමෝධානයෙන් යුක්තාවූ පසේබෝසතුන්ට ප්‍රථම
අභිනීහාර නම්වූ ප්‍රථම විවරණය ලැබෙන්නේය.

අග්‍රශ්‍රාවකදෙදෙනාවහන්සේ එකාසඞ්ඛ්‍යය කල්පලක්ෂයක් පා
රමිතාපුරා අග්‍රශ්‍රාවකස්ථානයට ප්‍රාප්තවනසේක. එසේම ලොවු
තුරාබුදුන්ගේ මව්පියදෙදෙනාද උපස්ථායකශ්‍රාවක අසීතිමහා
ශ්‍රාවකයන්වහන්සේද පුත්‍රශ්‍රාවකයන්වහන්සේද කල්පලක්ෂයකින්
අඩුව පාරමිතා නුපුරණසේක. මේ ශ්‍රාවක බොධිසත්වවරයන්
වහන්සේ අධිකාර ඡන්දතායයි කියනලද ද්විඅඞ්ගසම්පත්තියකින්
යුක්තව පළමුවෙනි විවරණය ලබනසේක.

මෙසේ මේ සම්‍යක්සම්බොධිඥානය ප්‍රාර්ථනාකොට මනොවාක්
ප්‍රණිධානය පුරා අෂ්ටධර්මසමෝධානයෙන් යෙදීපළමුවෙනි විවර
ණයලැබඑතැන්පටන් සොළසාසඞ්ඛෙය්‍ය කල්පලක්ෂයක්හෝ අටා
සඞ්ඛෙය්‍යකල්පලක්ෂයක්හෝසාරාසඞ්ඛෙය්‍ය කල්පලක්ෂයක්හෝ තම
තමන්ගේ ඥානවීර්‍යශ්‍රද්ධාදියට විෂමවූකාලයක් දසපාරමිතාය දසඋප
පාරමිතාය දසපරමාර්ථපාරමිතායයි කියනලද සමත්‍රිංශත්පාරමි
තාවන්පුරා පාරමිතාභූමියෙහිසිටිනා නොයෙක්කල්අතරලොවපහළ
වූ සර්වඥවරයන්වහන්සේ අතින් නොවරදවා විවරණශ්‍රී ලැබ
වෙස්සන්තර ආත්මභාවයෙන් චුතව තුසිත භවනයෙහි ඉපිදමහ

පස්බැලුම්බලා බ්‍රහ්මාරාධනාවෙන් මනුෂ්‍යලොකයෙහිපශ්චිමාත්මභාවයෙහිඋපදනාවූබොධිසත්ත්වවරයෝ රජකුලයෙහිහෝ බමුණුකුලයෙහි හෝ උපදනාහුය. පසේබෝසත්හු ක්ෂත්‍රියබ්‍රාහමණගෘහපති සඞ්ඛ්‍යාතතුන්කුලයන් අතුරෙන් එක් කුලයෙක උපදනාහුය. අග්‍ර ශ්‍රාවකයෝ වනාහි රජබමුණුකුලයෙහි මුත් අන් කුලයෙක නූපදනාහුය. සෙසු තැන්හු අනියම වන්නාහුය.—මේ සියලුබුදුවරයෝ වනාහි සංවර්තකල්පයෙහි නූපදනාහුය විවර්තස්ථායි කල්පයෙහිම උපදනාහුය. පසේබුදුවරයෝ බුද්ධොත්පාදකාලයෙහි නූපදනාහුය බුදුන් උපදනා සුදුසුවූ කල්හිම උපදනාහුය. සුදුසුකල්නම් ලොවුතුරා බුදුහු අවුරුදු ලක්ෂයකට වඩා මනුෂ්‍යයන්ට ආයුසයඇති කාලයෙහි නූපදනාසේක. අවුරුදු සියයකට අඩුවූ ආයුසයඇති කාලයෙහිත් නූපදනාසේක. එසේ හෙයින් පසේබුදුවරයෝත් මෙබඳුවූ ආයුසයඇති කාලයෙහි මුත් අඩුවැඩිව ආයුසය ඇති කල නූපදනාහුය. බුදුහු තමන්වහන්සේම සම්‍යක්සම්බොධි ඥාන සමධිගමයකොට මුලුලොවට නිවන් අමාබෙදූදී ඔවුන්සසරින් ගලවනසේක, පසේබුදුවරයන්වහන්සේ තමන්වහන්සේම නිවන්දක්නාසේක් සත්ත්වයන්ගෙන් එකප්‍රාණියක්හු විචරත් නිවන් දක්වාගත නොහෙනසේක. තමන්වහන්සේ විඳිනාවූ අර්ථරසයම ප්‍රතිවෙධකරනසේක ධර්මරසය ප්‍රතිවෙධ කිරීමට අසමර්ථසේක. ලොකොත්තරධර්මය ප්‍රඥප්තියටනගා විශෙෂයෙන් දෙශනාකිරීමට අසමර්ථසේක. හේතුමක් මෙන්ද? මූගපුරුෂයෙක් මහත් විසිතුරු ස්වප්නයක් දැක අනුන්ට තත්වූ පරිද්දෙන් කියමි යනඅභිප්‍රාය ඇත්තේ වීනමුත් තමා ගොළුහෙයින් කර්ණරසායනකොට කියා ළගන්නාගත නොහෙන්නේය. තවද වනචරයෙක් කිසියම් දවසෙක තමා වසනවනයෙන්නික්ම අවුත් මහත්නුවරකට පැමිණිකල්හි ක්ෂුධාවෙන් පීඩිතව ඇවිදිනා ඔහු දැක සුවපත් පුරුෂයෙක් තමාගේ ගෙට කැඳවාගෙණ ගොස් ඛාද්‍යභොජ්‍ය සහිතවූ රසමසවුලෙන් යුක්තවූ ආහාරය ඔහු යපෙන පමණක් අනුභවකරවීය. ඒ වනචරකතෙම තමා වසන වනයට අවුත් සියන් දිට එසඳ ඔහු මනුෂ්‍යපථයට ගිය ප්‍රවෘත්ති විචාරා අනුභවකළ ආහාරයෙහි කවර රසයෙක්දැයි විචාළ කල්හි තමා නුපුරුදු හෙයින් මෙබඳු රසයෙකැයි ඔවුන්ට අඟවා කියනුහුනුයේද එමෙන් සත්ත්වයන් ළගන්වා ධර්මදෙශනාකරන්ට සම්‍යක්සම්බුද්ධනොවී පසේබුදුවනොපිළිවත්බව ප්‍රවෙණිචරිතයක්හෙයින් ඒසත්ත්වයන්ට ධර්මාභිසමය නොවන්නේය එතකුදුඋවත් සියලුම ඍද්ධි සමාපත්ති ප්‍රතිසම්භිදා ප්‍රභෙදාදියට පැමිණෙන්නාහුමය. ගුණ විශෙෂත්වයෙන් ලොවුතුරා

බුදුන්ට අග්‍රව ශ්‍රාවකයන්වහන්සේට වැඩිතරම්සේක. අනුන් පැවිදිකරවා ආභිසමාචාරික ශික්ෂාවන් ප්‍රගුණකරවා සිතඅටගත් ක්ලෙශයන් තුනීකරව නමුත් අවසානයට පමුණුවාගත නොහෙන්නාහුය. තවද මේ උද්දෙශවශයෙන් පොහොයකරන්නාහු "අජ්ජ උපොසථො" යන වචන මාත්‍රයකින් පොහොයකරන්නාහුද හිමාලයෙහි ගන්ධමාදන පර්වත ප්‍රාන්තයෙහිවූ මංජූෂක වෘක්ෂමූලයෙහි රුවන්මලුයෙහි රැස්ව වැඩහිඳ සාමටහන් විචාරා පොහොයකොට අභිමතස්ථානවලටම වඩනාසේක.

මෙසේ යථොක්තප්‍රකාරයෙන් දක්වනලද ප්‍රඥාවීර්‍යශ්‍රද්ධාධිකාදිවූ ගුණවිශෙෂාදී ප්‍රභෙදය දක්වනලද්දාවූ ශ්‍රාවක බොධිසත්ත්වය ප්‍රත්‍යෙකබොධිසත්ත්වය සම්‍යක්සම්බොධිසත්ත්වයයි කියනලද මහොත්තමයන් අතුරෙන් සම්‍යක්සම්බොධිඥානසමධිගමයට ඒකාන්ත නියතවූ උද්ඝටිතඥය විපචිතඥයනෙය්‍යයයි ත්‍රිවිධසම්‍යක්සම්බොධිසත්ත්වරයන් අතුරෙන් උද්ඝටිතඥවූ අප මහබෝසතාණෝ සාර්මණ්ඩවරසාරභූෂිත භද්‍රකල්පාදිවූ සවකිය නාමප්‍රභෙද ඇති ගුණාදී ක්‍රමයෙන් අති උදිතවූ කල්පයන් අතුරෙන් මේ මහාභද්‍රකල්පයට, යටගිය දවස විසතාසඞ්ඛෙය්‍ය කප්ලක්ෂයකින් මත්තෙහි තථාගතවර විරහිත පළමුවන නන්දනම් අසඞ්ඛ්‍යයෙහි පරාමීසංසිද්ධියට හෙතුවූ සමුද්‍රතීරව්‍යසනාපන්න අප මහබොසතාණෝ ශෞර්‍යවූ වීර්‍යබලපරාක්‍රමයෙන් යුක්තව මූද පීනන්නාහු කුශලයෙහි ගුණ දැන තිවන් ලොභයෙන් සසර කලකිරී තුටු පහටු වෙෂ්ටීන් විශිෂ්ටව බුදුබව සිඩකෙරෙමියි සිතූය.

මෙසේ මනොවාක් ප්‍රණිධානපූරණයට පටන්ගෙණ සසර සැරිසරන්නාවූ අපමහබෝසතාණෝ එක්කලෙක සිරිමතී නම් නුවර ශත්‍රුතාප නම් රජව ප්‍රතාපයෙන් රජකරණසඳ තමාගේ විනීතනම් මඟුලැතු රාග වසභව වලට වැද නැවතඅවුත් විඳගත් ව්‍යසන දුක පස්කම්හි පෙම්හැර බුදුබවට සිත් යොමුකොළේය.

තවද දඹදිව මගධ දෙශයෙහි දැලිද්දිය නම් බමුණුගම්හි බ්‍රහ්මකුමාරයයි යනනමින් ප්‍රසිඬවැ සසර කලකිරී තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව නාරදාරණ්‍යයෙහි මෙකලඑරක නම්වූ මුඩකනම් පර්වතප්‍රාන්තයෙහි වැස බුදුබව සිතින් පතා වදා වැදූහොත් දිව්වෙරමස් ලෙහෙයෙන් සතුටු කරවිය.

තවද පුරාණදීපඞ්කරබුදුරජාණන්වහන්සේට ප්‍රදීපපූජොත්සවය පිණිස සිදුහතුතෙල්දී බුදුබවට සිත් යොමුකොළේය.

තවද සර්වසාර ගුණ ජනක සාරනම්කප බුදුවූ විපචිතඥ බ්‍රහ්මදෙවනම්බුදුරජාණන්වහන්සේකාරාකණ්ටකනම්නුවරදීඅතිදෙව්

නම් චක්‍රවර්ති රජව බුදුන් දැක තමා පළමු බුදුරුවක්* නුදුටු හෙයින් නොහැඳින භයින් තැතිගෙණ සව් රජහට අභිමුඛව දකුණත ඔසවා ලොවුතුරු බුදුන් අඳුන්වන සිරිගුත්ත නම් අග්‍ර අමාත්‍යවූ මෛත්‍රෙය මහබෝසතාණන් විසින්

"එසබුද්ධො මහාරාජ ලොකෙ උත්තමපුග්ගලො,
සබ්බසත්තාහිතත්ථාය ලොකෙ උප්පජ්ජි සො ජිනො.
අයං ච ඛො මහාරාජ බ්‍රහ්මදෙවො තථාගතො,
භාසන්තො විරියාමජ්ඣෙ පස්සථ' තං පුනප්පුනං".

යනාදීන් දැක්වූ බ්‍රහ්මදෙව නම් බුදුන් දැක භයචකිත රහිතව භක්තිප්‍රෙමාතිභාරවනතොත්තමාඞ්ගයෙන් පසගපිහිටුවා වැඳ බුදුසිරි දැක එහි ලොල්ව බුද්ධභාවාර්ථිව පරාර්ථයෙහි ඇලුම්කොට මෙසේ පළමුවන නන්ද නම් අසඞ්ඛ්‍යයෙහි පටන් සත්වන පුණ්ඩරීක නම් අසඞ්ඛ්‍යය දක්වා මේ සතාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් ඇතුළත දන මානාදිවූ බොහෝ කුසල් රැස්කොට මනොප්‍රණිධානය මුදුන් පත් කළහ.

තවද මේ මහාභද්‍රකල්පයට යට තෙළසාසඞ්ඛ්‍ය කල්පලක්‍ෂයකින් මත්තෙහි වාක්ප්‍රණිධානයට ප්‍රථමාරම්භවූ සර්වභද්‍ර නම් අසංඛ්‍යයෙහි සාරමණ්ඩ නම් කප දඹදිව මධ්‍යදෙශයෙහි ධඤ්ඤවතී නුවර ගුණසාගර සාගරනම් චක්‍රවර්තිරජව ප්‍රජාපාලනය කරන්නාහුය; එකල්හි පුරාණ ගෞතම නම් ඥෙය බුදුරජාණන්වහන්සෙ සිරිනිවාස නුවර සසනිවාස රජහු නිසා විමලා නම් බිසව කුසින් බිහිව වැඩිවිය පැමිණ මහබිනික්මන් කොට බුදුව ලෝවැඩ වඩනසේක් මිගාචිත වනයට වැඩිසේක. එකල සාගරනම් චක්‍රවර්ති රජතෙම ඒ පුරාණ ගෞතම බුදුන් දැක බුදුගුණයෙහි පැහැද මමද මෙබඳු ශාක්‍යවංශයෙහි ඉපද ගෞතම නම් බුදුවෙම්වයිවාක්භෙදයෙන්ප්‍රාර්ථනාකොටඑතැන්පටන්දානමානාදි කුසල් කෙරෙමින් උපනුපන් බුදුවරයන් දුටුදුටු ජන්මයෙහි දැන්ම බුදුබව ලබම් යන අදහසක්මෙන් මඳලසක් නොව සග නොයින්වැඳඔවුන්වහන්සේලා දුන්අනියත විවරණ ලැබ එයින් මෑතභාගයෙහි මේ මහාභද්‍රකල්පයට යටගිය දවස සාර අසංඛෙය්‍ය කල්පලක්‍ෂයකින් මත්තෙහි සෙල නම් අසංඛෙය්‍යාතුර සාරමණ්ඩ නම කල්පයෙහි දඹදිව පුෂ්පවතී නම් නුවර සුනන්ද නම් රජහු නිසා මනොනන්දන සුනන්දානම් බිසව කුසපිළිසිඳ දසළුකාඩ මසින් බිහිව වැඩිවිය පැමිණ ලොවුතුරා බුදුවූ පාණභඞ්කාර නම් ඥෙය බුදුරජාණන්වහන්සේ දැක අනියත විවරණලැබ බුදුවෙම් වයි ප්‍රාර්ථනා කළහ.

ඔබට ඉක්බිති එම කප දඹදිව මධ්‍යමණ්ඩලයෙහි මෙබලා නම් නුවර සුදෙව නම් නරදෙව්හු නිසා යසොධරානම් අගබිසව

---

*බුදුවරුන්. ඇතම්

කුස පිළිසිඳ දසමාසාවසානයෙහි බිහිව වැඩිවියපැමිණ මහබිනික් මන් කොට ලොවුතුරා බුදුවූ මෙධඞ්කර නම් පිපචිතඥ සම්බුදුයන් වහන්සේ දැක අනියත විවරණ ලදහ.

ඔබට ඉක්බිතිව එම කප ජම්බුද්වීපයෙහි මධ්‍යප්‍රදෙශවූ විපුල නම් නුවර සුමඞ්ගල නම් භූපාලොත්තමයා නිසා සුමති යසවතී නම් රාජ යුවතින් කුස පිළිසිඳ දසළුසාඬමසින් ප්‍රසූතව වැඩි යෞවනයට පැමිණ මහණව සම්‍යක්සම්බුද්ධවූ සරණඞ්කර අච්ඡර සොත්තමයාණන්වහන්සේ දැක වැඳ ඔබගෙන් අනියතවිවරණ ලැබ බුදුබව ප්‍රාර්ථනා කළහ. මෙසේ යටකී සර්වභද්‍ර නම් අසංඛ්‍ය යෙහි පටන් සෙලනම් අසංඛ්‍යයෙහි සාරමණ්ඩනම් කල්පය දක්වා මේ නවාසංඛ්‍ය කප්ලක්‍ෂයමුළුල්ලෙහි බොහෝ දානවස්තු පරිත්‍යා ගකොට බුදුබවපතා වාක්ප්‍රණිධානය මස්තකප්‍රාප්ත කළහ.

මෙසේ මනොවාක් ප්‍රණිධානයෙන් සොළසාසංඛ්‍ය කප්ලක්‍ෂ යක් මුලුල්ලෙහි සසර සැරිසරා ඇවිදිනා අප මහබෝසතාණෝ බාහිර නිදානය මහානිදානය අනිදූරෙනිදානයයි කියනලද ත්‍රිවි ධනිදානාන්තරයෙහි දිවස මාස වර්ෂ අන්තඃකල්ප අසංඛ්‍යකල්ප මහාකල්ප වශයෙන් ප්‍රමාණාතික්‍රාන්තවූ අසංඛ්‍යයන් දක් වන්නාහු.

"නන්දො සුනන්දො පඨවී මණ්ඩො ධරණී සාගරො,
පුණ්ඩරීකොතිමෙ සත්ත අසංඛෙය්‍යා පකාසිතා.
සබ්බභද්දො ච ඵුල්ලො ච රතනොසභකක්ඛන්ධකො,
මානිභද්දො ච උදුමො උසභොක්ඛන්ධකමෙවච.
සබ්බසෙලො අසංඛෙය්‍යා නවමොති පවුච්චති,
චවසා පත්ථනා මය්හං තිංදිඨා සඩ්ඛියා ඉමෙ" යි.

මෙසේ සොළසාසංඛෙය්‍ය කප්ලක්‍ෂයක් මුලුල්ලෙහි මනොවාක් ප්‍රණිධානයන් පූරණය කොට නිමවා බුද්ධකාරකධර්මයන් පරික්‍ෂාකොට ඇවිදිනාහු මෑතභාගයෙහි සාරාසංඛෙය්‍ය කප්ලක්‍ෂයක් ඇතුළත ලොවපහළවූ සූවිසි බුදුකෙනෙකුන්වහන්සේ දැක සූවිසි විවරණයක්ලැබ සූවිසිප්‍රාර්ථනාවක්කළහ. ඒහැම මෙතැන්හි විස්තර වශයෙන් දක්වත් බෙහෙව, එහෙයින් විවරණ කථා මාත්‍රයක් සංක්‍ෂෙපයෙන් දක්වනුලැබේ.

**මේ කෙසේදයත්:—**

සකල ලොකාන්ධකාරවූ කාරුණ්‍යනිධානවූ සරණාගත වජ්‍ර පඤ්ජරවූ ධර්මාමෘත දායකවූ ත්‍රිවිධ ලොකහිතවිධායකවූ කකුසඳ කොණාගමන කාශ්‍යප ගෞතම මෛත්‍රෙයයයි යන පස් බුදුකෙනෙකුන් වහන්සේගෙන් ශොභමානවූ මේ. මහාභද්‍රකල්පයට

අතීතයෙහි සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් මතු සාරමණ්ඩ නම් කල්ප
යෙහි සතරවන අතුරු කප, සමස්තවස්තුවිස්තීර්ණජනපදනිගම
ග්‍රාමාභිරාම රාජධානියෙන් ප්‍රතිමණ්ඩිතවූ ජම්බුද්වීපයෙහි. සකල
සම්පත්තීන් ශෝභමානවූ කෛලාසකූට ප්‍රතිභාග සුධාසිතප්‍රති
විතත භිත්තිස්තම්භ සෝපාන මාලාකුල කපෝතපාලිකාශෝභිත
රජතශෘඞ්ගශ්‍රේණීන්සංකීර්ණවූ නා නා ස්ථානයෙහි ප්‍රලම්බප්‍රවාල
හෙමදාමමුක්තාලතාසංකුලිත විචිත්‍ර කූටාගාරහාරිතහෙමසජ්ඣු
මය නානාවිධධ්වජ භුජඞ්ශ්‍රීසුබද්ධමණි කිංකිණී කනාදමෘදඞ්ග
රණ මෙඝධ්වනියෙන් අතිගම්භීර මෙචකමෙඝකූට ශ්‍රේණිශ්‍රීන්
ගෘහමයූරයන් නෘත්‍යාරම්භකරවන උත්තුඞ්ගමඞ්ගලප්‍රාසාද පඞ්
ක්තීන්ප්‍රසාදකරවූ, නිර්ජරවරශරීරසෞන්දර්‍ය්‍යාභිරාමප්‍රභාස්වරරූ
පලාවණ්‍යගුණයෙන් අග්‍රප්‍රාප්තව්‍යක්තතරනාරිගණානුචරිතසූචි
භකනචතුරවතුස්කසඞ්ඝිංඝාටකාදිවිවිධ වීථිවින්‍යාසයෙන් විසි
තුරුවූ නිරන්තරෝද්වහන ඝනචිරසුරභිතර මදජලධාරාවෙන්
ආද්‍රීකෘත පෘථුලස්ථූල කපෝලස්ථලාන්තරාසන්නවගුම්ගුමාරවර
ක්තමත්ත ෂට්පදශ්‍රේණීන් ක්ෂීරාර්ණවමථනයෙන්කිරිබිඳු ඉසුණු
විෂ්ණු දෙහය මෙන් සිඳුරසිඹිතලලිතකර්ණතාලප්‍රහරණයෙන්
ඝන පඞ්කයෙහි නිමග්නකෙරෙමින් ධරණීපාල දුදුරු කෙරෙමින්
නික්මුණුමත්ත හස්තිසේනා සහිත චතුරතර චතුරඞ්ගිනී සේනා
වෙන් ප්‍රතිදිනකාමනීයවූ, දිමුතුමුක්තාදි දශවිධරත්නයෙන්ද
සකලකාලානුකූල ක්‍රය වික්‍රයානුභවකරණ ක්ෂෞමකෞශෙය
කාර්පාස කීචකමෙඝවර්ණ රෙවඞ්කාර හෛරවක්ෂීරෝදක ලෙස
හාටකසගඳවර්ණපූරනාවු දුකූලකම්බලපත්තුන්නචීනාදි නානා
වර්ණ විචිත්‍රවස්ත්‍රාදිවූ සමස්ත වස්තු පූරිත පෘථුලාපණපන්තීන්
හොබනාවූ, උභයකුලපරිශුද්ධ ශ්‍රද්ධාබුද්ධිසම්පන්න ධනාඪ්‍යචාතුර්
වර්ණාදීන් සංකීර්ණ අතුල්‍යකුලතිලයශතයෙන් ප්‍රශස්තවූ ආතත
විතතාදිවූ නානාප්‍රකාර තූර්‍ය්‍යඝෝෂාදීන් කර්ණරසායනවූ, සුපුෂ්
පිත පඤ්චවිධපද්මාමෝදයෙහි අතිරක්තතිසර මධුකරචක්‍රවාකාදී
විජකුලවිලාසිතප්‍රසන්නගම්භීරසිසිරනීරපූරිතගෙ දිගුවිලින් සිත්
කළුවූ, නානාවිධ කුසුමඵලපල්ලවාදීන් ප්‍රතිමණ්ඩිතලතාලිඞ්ගිත
කොවිලාරසහකාරකර්ණිකාරනාළිකෙරපනසාසනාදී තරුවර
නිකර ශාඛාග්‍රයෙන් ප්‍රලම්බව මඳමඳ ගන්ධවාහයෙන් ලලිතපුෂ්ප
මඤ්ජරිමකරන්දයෙහි ලුබ්ධමුඛරමධුකරකොකිලසාරිකාදිවූ විහඞ්ග
ගණයාගේ රාවප්‍රතිරාවයෙන් කන්කලුවූ මනොහර චෛත්‍ය
ච්ඡායාසම්පන්න උද්‍යානපඞ්ක්තීන් හොබනාවූ, නිර්වාණඵලප්‍රදායක
සර්වඥසුරද්‍රුමයාගේ ප්‍රාදුර්භූතියට පාරමිතාබීජරොපණය කළ
තොතැන්නක් වැනිවූ, ධරණීදක්ෂිණතලයෙන් පෙනීගිය දිව්‍යපුර
යක් මෙන් ශොභමානවූ අමරවතී නම් රාජධානියෙහි, අප මහ
බෝසතාණෝ උපභොගපරිභොග සම්පත්තියෙන් අපරිමිතවූ

බමුණු මහසල් කුලයෙක ඉපද විභවොත්සව සෞභාග්‍යයෙන් වැඩිවිය පැමිණනුව්මෙධ සුමෙධකුමාරයයි අන්වර්ථනාමයෙන් ප්‍රසිද්ධව, යෞවනාභිරාම මකරධ්වජයාමෙන් යුවතිජන නයන නාටකනාට්‍යයට රඟමඩුලුවැ ප්‍රමාණාතික්‍රාන්තවූ සපිරසාරභාර ගම්භිරමෘදුඅගණිතවූ ගුණසමූහභූෂණයෙන් භූෂිතවූ, සමාන කුලශිලයෞවනාභිරාමවූ ශරීර පමණක්ම වෙන්වූ ජීවිතයෙන් එක්වූ ඇසිපිය පියූපමණක් මහනල්සේ සිතන්නාවූ වැළඳිසෞම ලඟකාය ලිහිල්මනකින්දිවුහිසින් ලිහිල්කරන්නක් වැනිවූ සසඟ බෝකල්පයක්සේ අසහමදකල් පීනන මහමුහුදසේ ගගින්නාවූ සුපිරිතන බරසේ ප්‍රේමයෙහි මහත්වූ සිහින්වලහසේ අවගුණෙහි තුනුවූ දිකිකෂින්සේ පුරුද්‍ර කම්භි දිගුපුළුල් රක්තාධරසේ අනු රාගයෙහි :ත්වූ මිහිරි නූපුරධ්වනිසේ බසෙහි මධුරවූ හිණ මෙවුල්දම්සේ සිත්බඳනාවූ රූපයෙන් නෙත්‍රමාධුර්‍යයීවූ ගුණයෙන් චිත්තමාධුර්‍යයීවූ මුග්ධතරුණ රමණින්ගෙන් පිරිවරනලද්දුව, චතුවේදාණිවයෙහි පාරප්‍රාප්තවැ සකල විද්‍යාවිෂයෙහි අපිචාර්‍යයීවූ ආචාර්‍යීව උභයකුලයෙන් විමලවූ ලොකබහුමානභාජනව පරමරතිකරවූ ශ්‍රී අනුභවකරණ කල්හිඒ මහබෝසතාණන්ගේ මවුපිය දෙදෙන පරමායු පමණින් වැස සවගී පරායණවූහ එකල්හි කොෂ්ඨාගාර රක්ෂණයෙහි දක්ෂවිචක්ෂණයෝ අවුත් පරමාදර දක්වා සිට ස්වාමිනි ඔබවහන්සේගේ උභයකුල පරම්පරාවෙන් පැවත ආවාවූ මේ ධනරාශියබලා සමන්වා අත්ගත මැනවයි කොටුගුළුඅගුළුහැරදක්වා ස්වාමිනි මේවස්තුරාසිය නුඹවහන්සේ මෙන් අයවියදම්හි ගුණදන්නානොනෙකුන් වහන්සේ තබා වියදම්හි අනවසපිතවූ නොනෙකුනුමුත් කැමැතිලෙස වියදම් කරන් පුරුෂායුඃප්‍රමාණයකිනුත් නිමවාගත නොහැක්කාවූ මේ ධනරාසිය හැරගතමැනවැයි කීහ.

එබස්ඇසූ මහබෝසතාණෝසිතන්නාහු මේ වස්තුරාසියඋපයා තුබූවන් විසින් ඉදුරාප්‍රයොජනයක් විඳගතනුහුනුවක එසේහෙසින් මේවස්තුව මාවිසින්මදනුත් අපවත්නොකොට දූනහූමියෙහි නිධානකොට තබා ගෙණ භවද්‍රගීයෙහිදී ප්‍රයොජන විඳගන්ට උවමැනමැයි සිතා මුළු නුවර බෙර ලවා යාචක සමූහයා රැස්කරවා ඒ සියලුම වස්තුරාසිය යාචකයන්ට දන්දී ඉක්බිතිව තපසට වලට යෙමියි නුවරින් නික්ම ගොස් නානාවිධ රත්න පණිත වෘක්ෂලතානිර්ඣරසරසිකූතන දිවාහිතිවැලිමලු ගලතල දිපද චතුෂ්පදදීන් විසිතුරුවූ හිමාලය වනයට වැද-ශාඛාසමපතහා තරුණතරුනිකරයෙන් විරාජිත වනරාජීන් ගැවසිගත්තාවූ සුපුෂ්පිත ඝනනීලතමාලලතාදී

ලතාසාදම්බචුම්බිතවල්ලිමඩපපංක්තීන් ප්‍රතිමඩිතවූ වනසණ්ඩයෙක්හි ශොභමාන ධාර්මිකනම්වූ ධරණීධර ප්‍රාන්තයෙහි ශක්‍රදෙවෙන්ද්‍රයාගෙන් නියොග ලත් විශ්වකර්මදිව්‍යපුත්‍රයා මවාදුන් පන්සලට වැද තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවවෙසෙමින් සතියක් ඇතුලත පචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යානාමෘත රසාස්වාදයකොරෙමින් ඒ ආශ්‍රමපදයෙහි අභිප්‍රායලෙස වාසය කරන්නාහ, සමස්තලොකයෙහි ජනිත සියලු වස්තූන් නොපවත්නේනම් මේ යයි දැක්වූ මෙහි නගරාරණ්‍ය ස්ත්‍රීපුරුෂ සංවර්ණනාදීවූ හැමතන්හිප්‍රයොජනවිඳගන්ටදීසුභාකාරරතිප්‍රතිබාහනයකොට සියල්ලම ගැමසාල්හි එකාකාරයෙන් නොපවත්නාබව නුවණින් මෙනෙහිකොටඒඒවර්ණනාදියෙහිදීඅතිස්ලකුණුසඳහන්කටයුතු.

එසමයෙහි සුමෙධ තාපසයන්වහන්සේ එක් දවසක් තමන්වහන්සේ වාසයකරන්නාවූ තපොවනයෙන් වනදෙවියන් මන්වියොවගින් තවමින් ඍඬියෙන් අහසට පැණනැඟී ඉදුනිල්මිණිබිමෙක රත්හුයක් ගැසුවාසේ අහසින් නික්ම ක්‍රමයෙන් ගොස් මනුෂ්‍යපථයට පැමිණ රම්‍යගම්නුවර මුදුනට අහස පැමිණිසඳ එකල්හි රුවන් රැසක් තමතමාට යුහුසුලුව උකාගන්නාවුන් මෙන් මහසැලි සාසල පහකොට වලගොඩතනා සුදුවැල්ලෙන් තවරා සුවඳමල් හිස ධජපතාකා නංවා නන්තොරණින් සරහා මෙසේ නොයෙක් පූජාවිධීන් විසිතුරුකොට මහසරහන්නාවූ ජනයා දැක අහසින් බිමට බැස ඔවුන් අතින් විචාරන්නාවූ අප මහබෝසතාණෝ කිමෙක්ද ජනයෙනි මෙබඳුලෙස මනහර මාර්ගයක් කාවුරුන්ට සරහවුදැයි කිහ.

එබසට මහජනයෝ වෙනවෙනම කියන්නාහු ඇයි සුමෙධ තාපසයන්වහන්ස නුඹවහන්සේ කුමක් පිණිස නොදත්සේක්ද ලොකාලොක දිවාකරවූ දීපඞ්කරනම් නරොත්තමයාණන්වහන්සේ බොධිසම්භාරපූරණයෙන් මස්තකප්‍රාප්තව තුෂිතභවනයෙහි ඉපිද සුර [illegible]පිරිවිඳ එයින් අවුත් මෙම දඹදිව මධ්‍යමණ්ඩලගත රම්මවතීනම් නුවර රජකරණ සුදෙවනම් නරදෙවීහු නිසා සුමෙධානම් අගබිසව කුස පිළිසිඳ දසඑකාඩමසක්ඇවෑමෙන්මව්කුසින්බිහිව වැඩිවිය පැමිණ හංස කොඤ්චා මයූරයයි යන තුන්පායෙහි සුරඟනන් බඳු වරඟනන් පිරිවරා දසදහසක් අවුරුදු රජසිරිවිඳ ලක්ෂයක් වරඟනන්ට ප්‍රධානවූ පියුමානම් අගබිසව කුසින් උසභක්ඛන්ධනම් පුත්රුවන වැදූදිනයෙහි සුවාසූදහසක් ගජසෙනඟ පිරිවරා මඟුලැත්වාහනයෙන් මහබිනික්මන් කොට කෙළක් පුරුෂයන් හා සමග මහණව දස මසක් ප්‍රධන්වීර්යකොට මහණගණයා පිරිවරා නගරනන්දාරයකට සිඟාවැඩ දෙවිකොණේසුනන්ට

පිළිසෙලසාළු කිරිපිඩු පිළිගෙණ දිවඹජස්බැහු තමන්වහන්සේ ලන් කොටස එකුන්සණස් පිඩක්කොට වළඳා නිල්තරාගංතෙර පිසල්සල්වෙනෙහි දහවල් කල්යැවා වැස සවස මහණගණයා කෙරෙන් වෙන්ව ගොස් සුනන්දනම් ආජීවකයා දුන් හිතණ පිළිගෙණ පුලිලබෝමුල්හි සලා හෙලා සුපණස්පියන් උස පැන නැගි තණපලඟ මත්තෙහි අනූරියන් උස බෝකඳට පිටලා වැඩ හිඳ හිරු අවරගිරිවදනට පළමුව මාරපරාජයකොට තුන්යම්හි ත්‍රිවිධඥානාධිගමයෙන් අළුයම් ලොවුතුරා බුදුව සත්සති ගෙවා බඹුහුගේ අයැදුමෙන් සුනන්දාරාමයෙහිදී දම්සක්පවත්වා මඞ්ගලය තිස්සයයි යන දෙනමක් අගසව් කොට නන්දාය සුනන්දායයි යන භික්ෂුණීන් දෙදෙනෙකු අග්‍රශ්‍රාවිකාකොට සාගරනම් මහතෙරුන්ගෙන් උපස්ථානවිඳ ලක්ෂයක් අවුරුද්දට ආයුසය ඇතිව අසූරියන් උස බුදුබඳින් මුලුලෝ බබුලුවමින් සාරලක්ෂයක් රහතුන්වහන්සේ පිරිවරා දනව් සැරිසරණසේක් අපගේ සුදගීත පිහාරයට වැඩ ධර්මදේශනාකොරොමින් සත්වයන් අමාමහ නිවන් දක්වා වැඩවසනසේක් සාරලක්ෂයක් රහතුන්වහන්සේ පිරිවරා අද පෙරවරු වැළඳීමට අපගේ නුවරට වඩනාසේක. එසේහෙයින් මෙපමණ මහණගණනකට දන්පිසවන්ට තියලි සිටිනේ කිමදැයි සිතා වඩනා/මඟ ඉදුරා තනාලනුම්ණිස පටන්ගතුම්හයි කීහ. ඒ ඇසූ සුමේධතාපසබෝධිසත්වයාණෝ බුදුකෙණෙකුන්වහන්සේයයි යන වචනය කණවැටෙත්ම මෙදවස්තමන්ගේ මුලුලොවට වනසියලු සන්තොසයම එදවස් තමන්වහන්සේගේ ලෙහි පුරාගන්නාක්මෙන් ප්‍රීතින් මත්ව අද මාතික්මුතුගම නක් ඉතාම යහපත්සේය. මා ලත් ජන්මයේ ඵල සඵලවූයේය සසර නොමිහිරි බස් අසා කණටවූ බැගෑ මේ එක බස ඇසීමෙන් මධුරවූලෙස ආශ්චර්‍ය්‍යසේය බොහෝ කලක් සැහවීසිටි දෛවයා අද එකවිටම ඉෂ්ට ඵලදෙන්ට වත්සේය. බසක මිහිරෙක් මෙපමණකින් වඩා කොයි ඇද්ද, මීට වැඩි බසෙක් කොයින් සොය මෝද්දැයි සන්තොසයෙන් සිට එම්බා පින්වත්නි, තෙපි ඇම එසේවූ දීපංකරනම යාන කෙණෙකුන්වහන්සේ වඩනා මහක් ධරහවූනම් ඒ මෙහෙයට මාත් ඇතුළත්වී මටත් ඉන් භූමිප්‍රදේශයක් දෙවයි කීකල්හි උගු තමන්ට නැතීමට උගගටවූ දියපැහැර බිඳී වළවූ මඩපිරි ගැඹුරු ඇල කාදුරක් දුන්හ. එකල්හි සාඞ්බලයෙන් දිවමල් සඳුන්කලලින් පුරවතත් පිළිවන්ම නිබැඳි මාගේ උත්තමයාණන්වහන්සේට කායශක්තියෙන් ගැතිමෙහෙකිරිම්නම් ඉතාම සුදුසුයයි සිතා ප්‍රසන්නයෙන් සතුටුසතුටුව පස්ඇද පුරවමින් සිටිකල්හි—සාරලක්ෂයක් රහතුන්පිරි

වර දීපඞ්කරබුදුරජාණන්වහන්සේ සඞ්ඛ්‍යාවලාපමලයෙන් මුදුන් කුළුදක්වාවැලඳගත් ඝනකනකපජිතයක්සේද පබළුසාගරයෙහි මඳක්දක්වා ගැලුනු රන්මේරක්සේද ග්‍රීවය දක්වා නිග්‍රොධඵල සමානවර්ණවූ සුගත්මහසිවුරෙන්වසා ගැටවටුගත්වා වැලඳගෙණ එසේම ගැටවටුගත්වා වැලඳගත් ශාන්තදාන්තවූ සාර ක්ෂයක් රහතුන්වහන්සේ පිරිවරු පිටත්වූ කල්හි ඒ මඟ සරහන මහාජනයාවිසින් එම්බල මේ කොබඳු විසමයෙක්දැයි දිගුකළ අතින් තිබූ මෙහෙයෙන් උඩුකුරුකළ මුහුණින් නොහෙළූ ඇසිපියෙන් හෙළූ දෘෂ්ටියෙන්වූ නික්කූයෙන් හැවූ මූබයෙන් නැඟූ සුස්මෙන් නොනැඟූ පියවරින්කළ නිශ්ශබ්දයෙන් ආශ්චර්යමත්චිත්තයෙන් බලබලා සිටිනා සියදහස්ගණන් සත්ත්වයන් විස්මයඑළවමින් සමහරු ධජපතාකා ගන්වමින් පිළිහිසනටවමින් ඔල්වරහඬලවමින් සාධුකාරදෙවමින් දසදිගුන් මැඩගෙණ සළාදිදී නික්මුනුසවණක් ඝනබුද්ධරශ්මීන් මුලුලොව එකාහෙලා විසිතුරු සිනියමක්සේ සදමින් මහපොළොව දෙබේනොටගෙණ සුවණීසාණිණී කාමූවරද සළාවෙන් ගැවසී පැනනැගී සියදහස් ගණන්පමණ පෙතිපතරින්ගැවසීගත් මහපියුම්මුදුනෙහි පියුමක්තබාලන්නාසේ රක්ත මෘදුකොමලශ්‍රීපාදයන් තබතබා මිහිකත සනහසන හා අද්භූත ප්‍රාතිහාර්යයෙන් වඩනාවූ මාරභඞ්කර ලොකසිවඞ්කර සර්වප්‍රියඞ්කර දීපඞ්කරනාම් බුදුරජාණන්වහන්සේ දැක තමන්පෙර නුදුටුවිරූ බුදුබඳක්හෙයින් හිසපිට දෙපල්ලට විඳ විඳ බල බලා දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන් හා අසූඅනුබ්‍යඤ්ජනයෙන්හාකෙතුමාලා ලඞ්කාරයෙන් හොබනාවූ වාක්විෂය උපමාවිෂය මනොවිෂය ලොකවිෂය ඉක්මූනු හුදෙක් බුද්ධවිෂයටම සාධාරණවූ විශෙෂය කැයි සිතූ සිතට බුදුහුයයි ඇසූ කණටම සුදුසුසේ මෙවිට දිටිමි. ආශ්චර්යමත්වූ අසාධාරණ සංසුන් ගමනක් දැන්ම දිටිමි. ශක්‍රබ්‍රහ්මාදීන්ගේ රූප සොභා මා ඇසට අරුචිකරවන සෞන්දර්‍යයක් දැන්ම දිටිමි මේ කවරකුශලයක්හුගේඑලද මෙබඳුමහක්හු ලෙව්හි නොනෙක් ඇද්ද ඇසට මෙබඳු සැනහුමෙක් කොපැන්හි වේද? මෙබඳු උත්තමයන්ට සුදුසු පූජාවක් නොසිත් කරමෝද එසේහෙයින් මේබුදුරජාණන්වහන්සේට ජීවිතයෙන් පූජාකිරීම යහපත්වන්නේයයි සිතා තමන්නමින් අකාලකළ මෙහෙඇති ඇලකාඳුරෙහි මඩපිට අඳුම් දිවිසම් වාකචීවරාදිය අතුට මාලත් ජන්මයෙහි එළ අදම ලදිමියි සතොනාසව.

“නසමිං ජහෙ කන්දරකාමහි පඞ්කෙ
කත්වාන සෙතුං සයි සො සදෙහං,
බුද්ධො අයං ගච්ඡතු පිට්ඨියා මම
බොධිං සවෙ හෙස්සති මෙ අනාගතෙ”යි.

යනාදීන් ඒ සුමෙධ තාපසනම්වූ අප මහබෝසතාණෝ සිතත් නාහු මේ සාරලක්‍ෂයක් රහතුන්වහන්සේ ඇතුළුවූ මේ බුදුහු ශ්‍රී පාදයෙහි මඩ නොවකා පිට මැඩගෙණ වඩනාසේක්වයි රන්ගෙ යක්මෙන් බුදුන් දශාවට හිසලා නිවි සැනහී මමද මේ බුදුරජාණන්වහන්සේ ලෙස මතු ලොවුතුරුබුදුව සූවිසිඅසඞ්ඛ්‍යයක් සත්‍වයන් අමාමහනිවන් දක්වාලිය හෙම්වයි මුහුනින් හොත්කල්හි ඔහුගේ ඉස්සදර දශාවෙන් වැඩි බුදුරජාණන්වහන්සේ:—

"උස්සීසකං යාත ජිනොහි තස්ස
අජ්ඣාසයං සිජ්ඣතිමයසනාගතෙ,
ඤත්‍වාන බ්‍යාකාසි අසෙසතො හි
බුද්ධො අයං හෙස්සති නාගතෙසු"

යනාදීන්බොහු ප්‍රාර්ථනාකලාවූ අදහස අනාගතයෙහි සිඬවන්නේයයි බුඬඥානයෙන් දැනමතු මේ උතුමා මාසේම සූවිසි අසඞ්ඛ්‍යයක් සත්‍වයන් අමාමහනිවන් දක්වා ලොවුතුරාබුදුවන්නේයයි දෙව් මිනිසුන් මධ්‍යයෙහි සාරලක්‍ෂයක් රහතුන්වහන්සේට ප්‍රකාශකොට සුමෙධතාපසයන් දක්වන බුදුරජාණන්වහන්සේ ඔහුගේ නිලකුටිල කෙශපුටජටානනයෙහි සිටම්හිරිකට හඬින් බ්‍රහ්මඝොෂා විහුදුව, සුරනරපිරිසගේ කන් තමන්වහන්සේකරා යොමුකරවමින්:—

"පස්සථ ඉමං තාපසං ජටිලං උග්ගතාපනං
අපරමෙය්‍ය ඉතො කප්පෙ අයං බුද්ධො භවිස්සති"

යනාදීන් එම්බා මහණෙනි උග්‍රවූ තපස්තෙජස්ඇති මේ සුමෙධ තාපසයන් බලව මූතුමූ අවශෙෂ පුරුෂයොකෙණෙක් නොවෙති. මෙසින් මතු සාරාසංඛෙය්‍ය කප්ලක්‍ෂයක් ගියකල්හි මුළු ලොව සරහා ලොවුතුරාබුදුව සත්‍වයන්ට නිවන් අමා ඉබෙදදෙන කෙණෙක එසේහෙයින් මුළුලෙව්හි මෙවැන්නෝ බොහෝ නොවෙති මුළුලොවත් සනාථකරන් මෙවැන්නෝ එක්කෙණෙක්මය මතු තමන් ලොව පහළකරණ ආශ්‍රයෙහි ප්‍රසන්නව කුල්මතින් නටා විඩාවන මහත්වූ භූමඞගනාව අදම නිවා සනහා සංසිඳුවා වැළඳගෙණ හොත් උත්තම පුරුෂයෙකුමෙන් තෙල මඩයෙහි උපදනා නුවර සකාලවස්තුවෙන් විපුලවූ කපිලවස්තුපුර නම් වෙයි. පියවන්නාවූ රජෙක් උභයකුලපරිශුඬ ශුද්ධොදන නම් වෙයි. මව් වන්නාවූ බිසවක් අමායාස්වරූපඇති මහා මායා දෙවී නම් වෙයි. ඔහුට ශ්‍රී පුත්‍රුවනෙක් ගුණබහුල රාහුල නම් වෙයි ඒ පුත්‍රයාගේ මව්බිසවක් රන්බිබුළුයුරුපයොධරබර යසොධරා නම් වෙයි. බොධිවන්නාවූ වෘක්‍ෂයෙක් අත්‍යර්ථයෙන් ශොභ

මානාවූ අශ්වජිත්නම් වෙයි අග්‍රශ්‍රාවකදෙදෙනෙක් ලොකොත්තර ගුණපාලිත කොලිත උපතිස්සනම් වෙති අග්‍රශ්‍රාවිකාදෙදෙනෙක් ක්ෂෙමොත්පලවන් ක්ෂෙමොත්පලවර්ණානම් වෙති උපස්ථායක මහතෙරකෙනෙක් ජනානන්දකර ආනන්ද නම්වෙයි, මූ තුමූ බුදුවනජාතියෙහි ලෙච්සත නමා නතුකළ ගෞතම නම්වෙතියි, යනාදීන් එකල දුන්නාවූ පළමුවන නියතවිවරණය අෂ්ටධර්ම සමොධානයෙන් යෙදීම ලත්හ. එකල්හි දීපඞ්කරසර්වඥයන් වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රීහස්තයෙන්ම මල්පූජාකොට වැඩිසේක. පස්සෙහිවඩනා සාරලක්ෂයක් රහතුන් වහන්සේද වෙනවෙනම මල් අතුල් පුදා වැඩිසේක. එකල්හි නික්මුණු බුදුන්ගේ දර්ශනාවසානයෙහි දිව්‍යමනුෂ්‍යාදීන් පිදූ මල්ගොඩ මුදුනෙහි පලක්බැඳ වැඩහිඳ දෙව්මිනිසුන් විසින් පූජාකරනලද දීපධූපාදීවූනොයෙක් පූජාභාණ්ඩනොසැහෙන පමණකරන්නාවූ ස්තුතිපූජාවිඳ බොධිසත්වතෙම එවිටම තමාලත් බුදුබවක්සේ ප්‍රීතින් පිණාගිය ශරීරඇතිව සසර සත්වයන් විඳිනා දුක් තමන් ලබන නිවන්සම්පත්තියක්සේ ලෙහි පුරාගෙන සත්වකරුණාවෙන් බුද්ධකාරකධර්මයන් පුරනු පිණිස නුවණින් බලන්නාහු:—

"දානං සීලං ච නෙක්ඛම්මං පඤ්ඤා විරියෙන පචමං,
ඛන්ති සච්චමධිට්ඨානං මෙත්තු පෙක්ඛා ති මෙ දස"

යනාදීන් දක්වනලද දසපාමිතාවන් දැක එයින් එකී එකී පාරමිතාවක්ම ලක්ෂණ රසපච්චුපට්ඨානපදස්ථාන වශයෙන් නිශ්චයකොට දෘඪසමාදානයෙන් බුද්ධකාරකධර්මයන් පූරණයට පටන්ගත්හ.

**එසේහෙයින් කියනලදී—**

"දීපඞ්කරං සයති සුගතවරං මනුඤ්ඤං
දිස්වා තනුමපි හදකුමුදුදහං මහිත්වා,
අඞ්ගිකො සයි ස රුචිරතරො සුමෙධො
බුද්ධො භවෙය්‍යමිති පණිධිමකාසිමද්ධා"යි.

තවද විශ්වලොකශිවඞ්කර දීපඞ්කරනම් නරොත්තමයාණන් වහන්සේට ඉක්බිති බුද්ධශූන්‍යවූ කප්අසංඛ්‍යයක් ගියකල්හි මේ මහාභද්‍රකල්පයට තෙයාසංඛ්‍යකප්ලක්ෂයකින් මත්තෙහි එකාම බුදුකෙනෙකුන් වහන්සේගෙන් සාරවූ සාරනම් කපබුදුබවපතා සොළසාසංඛ්‍යකප්ලක්ෂයක් පිරූ පාරමතා ඇති කෞණ්ඩඤ්ඤසර්වඥයන් වහන්සේ සමත්‍රිංශත්පාරමිතාපූරාතිමචා අනෙකනාටකකාමිනීතිකර පරිවෘතතුෂිතභවනයෙන් අවුත් සකලසම්පත්තීන් රම්‍ය රම්‍යවතීනම් රාජධානියෙහි මනොනන්දන සුනන්ද නම් නරෙන්ද්‍රයාණන් නිසා ප්‍රතිරාජ පරාජයකළ පූජ්‍ය

රාජකුලයෙහි සුජාත සුජාතා නම් රාජවතිහාවන් කුසින් ජාත
ව ක්‍රමයෙන් වැඩිවියපැමිණ නවයුවතිජනනයන චකොරයන්
රූපාමෘතසාන්තීන් පිණනයකරවා රාමය සුරාමය සුභයයි යන
තුන්පායෙහි දසදහසක් අවුරුදු රජසිරි විඳ තුන්ලක්ෂයක් පුර
හනන්ට ප්‍රධානවූ සකලාඞ්ගරුචිරවූ සුරුචි නම් අගබිසව කුසින්
සකලලොකවිජිත විජිතසෙනනම් පුත්‍රුවන වැදූ දිනයෙහි
නෙලුම්පත් පැහැයවන් මහඟු තුඟු හයන් යෙදූ රියයහන් පැන
නැඟී මහබිනික්මන්කොට මහබඹුදුන් අටපිරිකර පිළිගෙන දස
කෙළක් පුරුෂයන්හාසමග මහණව දසමසක් ප්‍රධන්වීර්යකොට
වෙසඟමැදි පොහෝදවස් පුරිඳැදපුරවැනි සුරිඳැනම් නියං
ගම යෞවන ප්‍රථම වයොධර යසොධරානම් සිටුදුව දුන් මිහිරි
කිරිබත වලඳ මන්දමන්දගන්ධවාහයෙන් ආන්දොලිත ඵලපල්ලවමා
ලාලලිත සල්වෙනෙහි දහවල් වැස සවස දිනකරකිරණමෘදුතර
වූකල්හි එතැනින් නික්මගුණයෙන් සරච්චන්ද්‍රිකාබඳු සුවත්ථික
නම් ආජීවකයා දුන් කුසතණ අටමිටක් පිළිගෙන චතුර්විධමා
ගීඥනයට ප්‍රථම කල්‍යාණවූ සාලකල්‍යාණ බෝමුල සලා හෙලා
අටපණස්රියන් උස පැනනැඟී වජ්‍රාසනාරූඪව බෝකඳට පිටලා
වැඩහිඳ මාරතුසර දිවාකරව තුන් යම්හි ලත් තුන් නුවණින්
කෙලෙසුන් සිඳ අලුයම ලොවුතුරා බුදුව සත්සති ගෙවා බඹහු
ගේ අයදමෙන් දෙවාතිදෙවශ්‍රීන් දෙව්වන නම් උයන්හී වැඩහිඳ
දම්සක් පවත්වා ක්‍රමයෙන් භද්‍රය සුභද්‍රය යන අගසව්දෙනමක්
හා තිස්සාය උපතිස්සායයි යන අග්‍රශ්‍රාවිකාදෙනමක් ඇතිව අනු
රුද්ධ මහතෙරුන්වහන්සේගෙන් උපස්ථානවිඳ කෙළලක්ෂයක්
රහතන් පිරිවරාඅවුරුදු ලක්ෂයකට ආයු ඇතිව අටඅසූරියන්
බුදුබඳින් මුලුලොව බබුළුවාගම් නියංගම් රාජධානි පිළිවෙළින්
දනව් සැරිසරා සත්වයන්ට මාර්ගඵලදෙවමින් නිවන්දක්වන්සේක්
චන්ද්‍රානනයුවතිජනාකීර්ණ චන්ද්‍රවතී නම් රාජධානියට වැඩිසේක.

එකල අප මහබෝසතාණෝ මෙම නුවර රූපුරජගජසිජ
යෙහි ගජාරිවිජිතාවිනම් ධර්මානුවර්තිවූචක්‍රවර්තිරජව දැහැමෙන්
රජකරනකල්හි සමස්තභූමණ්ඩලමණ්ඩිත පුණ්ඩරීකබන්ධුබන්ධ
කොණ්ඩඤ්ඤනම් සර්වඥයන්වහන්සේ තමන්ගේ නුවරට වැඩිබව
අසා මහත්වූ සොම්නසින් අවුත් වැඳ කෙළලක්ෂයක් වසනු විය
දම් කොට විහාරයක් කරවා බුදුපාමොක් මහාසඞ්ඝයාවහන්සේ
ට පිළිගන්වා තුන්මසක් මහදන්දී කෙළවර කෙළලක්ෂයක් රහ
තුන්වහන්සේ හා සමග සර්වඥයන්වහන්සේට ලක්ෂසුවහස්ව
ටනා සළු පිරිකර පිළිගන්වා සසුන් වැද මහණව බුදුබව පතා
ඔබගෙන් මේ දෙවන විවරණය ලදහ.

එසේහෙයින් කියනලදී.

සප්පඤ්ඤකඤ්ජවිපිනං මුදමාවහන්තං
කොණ්ඩඤ්ඤනාමමුනිචණ්ඩකරං සුදිස්වා,
බුද්ධාය කොටිධනමග්ඝනකං විහාරං
දත්වා අකාසි පණිධිං විජිතාවිරාජා"යි

තවද ගුණසණ්ඩමණ්ඩිතකොණ්ඩඤ්ඤනම් සර්වඥයන්වහන්සේට ඉක්බිති බුද්ධශූන්‍යවූ කප් අසංඛ්‍යයක් ගියකල්හි මේභද්‍රකල්පයට අතීතයෙහි දෙයාසංඛ්‍ය කප් ලක්‍ෂයකින් මතු සංසාරසාගරාවතීර්ණ සකලසත්වයන් තීරොත්තරණයෙහි චතුරතර චතුරඞ්ගීරස වර ප්‍රතිමණ්ඩිත සාරමණ්ඩනම් කල්පයෙහි මඞ්ගලය සුමනය රෙවතය සොභිතයයි සොභිතවූ සතර බුදුකෙනෙකුන්වහන්සේ ලොව පහළවූසේක—ඒ සතරදෙනාවහන්සේ අතුරෙන් සොළසාසංඛෙය්‍ය කප්ලක්‍ෂයක්පාරමිතාපිරූ සකලලොකෛකමඞ්ගලතිලයකළමඞ්ගලනම් ශ්‍රෙයසර්වඥයන්වහන්සේ තුසීපුරවිසීමෙන් දිවසිරිවිඳ දෙව්බඹුන්අයදමෙන් එයින්චුතවඅවුත් දඹදිව මැදමිඹුල්ලෙහි නන්සිරින් විසිතුරූ නිරුත්තර උත්තරානම් නුවර ලොකොත්තර ගුණඇති උත්තරනම් නරදෙව්හුතිසාතනුත්තරිතරවූ උත්තරානම් රජ කතකුස පිළිසිඳ එදවස් පටන් මෑණියන් ඇඟින් නිකුත් ප්‍රභාවෙන් අසුරියන් ස්රියහන් ගෙයි පහන් නොලවාඅඳුරු දුරුකොට දෑරඟ මිණිරුවනක්සේ බබලමින් වැස දසඑකඩමසකින් බිහිව සියලඟ රැස්න් දසදිග් බබුළුවාතුන් සෘතුවටසුදුසුවූ යසවන්තය රුචිවන්තය සිරිවන්තයයියන තුන්පායෙහි තිස්දහසක් නරවරවධූන්ගේ විමල මුඛකමලවිකාසනයෙහි නනොමණිවිලාසයෙන් නවදහසක් අවුරුදු රජසිරිවිඳ එබෝසත් වසුමතිපතිහු මන්ගත් යසවතීනම් රජකත කුසින් අතුලවූ සීලවනම් පුත්රුවන වැදූ දිනයෙහි චණ්ඩකරකරප්‍රාප්ත පුණ්ඩරීකසණ්ඩසන්නිභ අඛණ්ඩපාණ්ඩර පාණ්ඩරනම් තුරඟ වාහනයෙන් අභිනිෂ්ක්‍රමණයකොට තුන්කෙළක් පුරුෂයන් හා සමග මහණව අටමසක් ප්‍රධන්වීර්‍ය්‍යකොට වෙසඟමැදිපොහෝ ලද විසානකනින් මඞ්ගලදිනයෙහි පුවතර උතුරුපුරඋතුරුනම් සිටාණන්ගේ ගුණොත්තර උත්තරානම් සිටුදියණියන්දුන් මධුර කිරිපිඬුගෙණ එකුන්පණස් පිඬුකොටවලඳවිසල්සල්වෙනෙහි හවල්වැස ඤවස කුශලමිත්‍ර උත්තරනම් ආජීවකයාදුන් කුසතණ අටමිටක් පිළිගෙණ බෝමඩටගොස් මාරහෙකනීඹිදුයසා නාග නාගබොධිමූලයෙහි සලා හෙලා අටපණස්රියන් උස පැනතැගී වජ්‍රාසනාරූඪව මාරසාරි විසටවිහෙඨනයෙහි සාණිසිරවෙනළුයක්හුමෙන් බෝකඳට පිටලා වැඩහිඳ මුළුලොව සරහා ලොවුතුරා බුදුව සැත්සප්තාහාතික්‍රාන්තකොට බඹහුගේ අයදමෙන් වනසිරින්යුත් සිරිවන්තනම් උයන්හි දහම්සක්පවත්වා සුදෙවය ධම්සෙනායයි යන අගසව්දෙනමක් හා සීව

ලීය අසොකාය යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇතිව පාලිතමහතෙ රුන් වහන්සේගෙන් උපස්ථාන විඳ අසූරියන් බුදුබඳින් තුන් ලොව බබුළුවා අසූදහසක් අවුරුද්දට ආසිරි ඇතිව කෙළලක්ෂ යක් රහතුන් වහන්සේ පිරිවරා සියලඟරුසින් දසදහසක් සක් වළ රූ දඟවල් වෙනසක් නොදැනෙනසේ එකාලොකකොට බබු ළුවා සත්ත්වයන්ට අමාමහනිවන් දෙමින් දනව් සැරිසරනසේක් නේකලාවෙහි දක්ෂජනයන්ට නිවාසවූ මෙඛලානම් නුවරට වැඩි සේක.

එසමයෙහි අප මහබෝසතාණෝ තමන්ලත් විවරණයටද සමතිස්පෙරුම්පුරමිසි සිතූ සිතටද හලූවාවූ ආත්මප්‍රේමයටද සා ලාවූ සත්ත්වානුග්‍රහයටද සුදුසුලෙසම බොධිසම්භාරපූරණයෙහි තත්පරවසසර සැරි සරනසේක්—සුරුචිනම් නියංගම සුරුචි නම් බමුණුව ඉපද සකලලොකෙකමඞ්ගල්‍ය මඞ්ගලනම් ලොක නාථවූ සත්ත්වානුග්‍රහයට සුදුසුවූ බුදුන් දැක බණඅසා දසබල ශශාංකමණ්ඩලයෙන් වගල සද්ධර්මාමෘතජොතින් තමන්ගේ හෘදය කෞමුදනොමඳින් පුබුදුවා කෙළලක්ෂයක් රහතුන්වහන් සේ පිරිවරකොට ඇති බුදුන්ට දෙළොස්යොදුන් දිගපුලුල ඇති නානාවිධ කුසුමදමයෙන් සැරහුසප්තවිධරත්නමය ආසනයෙන් ප්‍රතිමණ්ඩිතමණ්ඩපයක් ශක්‍රදෙවෙන්ද්‍රයාලවා නිර්මාණකරවා එහි සපිරිවර බුදුන් වඩාහිඳුවා සත්දවසක් අමිශ්‍රොදක කිරිපිඬු වල ඳවාකෙළලක්ෂ යක් අගනා එකිඑකී පිරිකරකබැගින් කෙළලක්ෂ යක් සිවුරු පිරිකර පිළිගන්වා බුදුන්ට අනගිවූ අටපිරිකරක් පිළි ගන්වා එකක් අධිකවූ කෙළලක්ෂයක් පාත්‍රපුරා චතුමධුර හා බෙ හෙත්බඩු දන්දී බුදුබව පතා ඔබගෙන් මේ තුන්වන විවරණය ලදහ.

**එසේහෙයින් කියනලදී—**

“මුනිමඞ්ගලමඞ්ගලදෙහජුතිං තදුදික්ඛිය මොදිතමානසිකො,
සඝචීවරදානජිනාය වරං ගවපාතදදී සුචිජො සුරුචී”යි.

තවද ඒ විශ්වලොකමඞ්ගල මඞ්ගලනම් දසබලධාරීන්වහන් සේට ඉක්බිතිව බුද්ධාන්තරයක් ගියකල්හි එම කප අටාසඞ්ඛෙ ය්‍යකල්පලක්ෂයක් පිරූපාරමිතා ඇති සමස්තසත්ත්වාධිගමදානයෙන් සුමන සුමන නම් විපචිතඥ සර්වඥයන්වහන්සේ පුරා තිමවනලද බුද්ධකාරක ධර්මයන්ඇතිව විසාල තිදසාලය සම්පත්තීන් අවිකලවූ සන්තුෂිතදිව්‍යපුරයෙහි ජගධනවනානාවිධ මුනිවිදගධවිබුධව ධූන්ගේ ප්‍රබන්ධප්‍රේමයෙන් විරක්තව අවුත් දඹදිව මධ්‍ය මණ්ඩලයෙහි සකල නගරාඞ්ගසම්පත්තීන් ක්ෂෙම , ක්ෂෙම නම් රාජධානියෙහි දශරාජධර්මාභිරක්ත සුදත්තනම් ධරණීශ්වර යාණන් නිසා අමිතසිරිමත් සිරිමතීනම් රාජවනිතාවන් කුස පිළිසිඳ දශෙෂභාඞ් මාසයෙන් ප්‍රසූතව ක්‍රමයෙන් යෞවනප්‍රාප්තව ත්‍රිවිධ ඍතුක්ෂමවූවන්ද්‍රය සුවන්ද්‍රය වටංසක

යයි යන තුන් පායෙහි දසදහසක් රාජතරුණීන් කුච කුංකුමා
රුණවක්ෂස්ථල ඇතිව නවදහසක් අවුරුදු රජසිරිවිඳ රජකුලනි
මල සකලමහිලාවන්ට කමලාවතංසක වතසංකා නම් යොෂිතා
වන් ගර්භයෙන් රූපශ්‍රීන් අනූපමවූ අනූපමනම් අත්‍රජාභිරත්නය
ප්‍රසූත දිනයෙහි ක්‍රමයෙන් සතර පූර්වනිමිත්ත දැක ශ්‍රමණවෙසාභි
ලාෂිතව සකල ලක්ෂණාන්විතවිනීත දිරදාභිරූඪව අභිනිෂ්ක්‍රම
ණයෙන්සුරාසුර ප්‍රමොදාය කරවා පඞ්කජාසනකමලාසනානීත
විශිෂ්ටාෂ්ටපරිෂ්කාර ප්‍රතිග්‍රහණයෙන් ත්‍රිකොටිප්‍රමාණ නරභටපරි
වෘතව දීක්ෂණයෙන් දසමාසයක් ප්‍රධන්වීර්‍ය්‍යකොට බුදුවන දවස්
සියලු සැපතින් අනූපමවූ අනූපමනම් නිගම ග්‍රාමයෙහි විශිෂ්ට
රූපනිරූපම නිරූපම නම් ශ්‍රෙෂ්ඨිතු අනූපමානම් සිටුදුව දුන්
මධුරපායාසානුභවකොට විසාලම්බසාලශ්‍රෙණින් අතිමණ්ඩිත
වනසණ්ඩයෙහි දිවාවිහාරකොට දිනකර අවරගිරිවදනාට පළ
මුම නික්ම අතරමඟදී දුටු අනොපම නම් ආජීවකයා දුන් කුස
තණ ගෙණ මාරසංග්‍රාම භූමිප්‍රදෙශයට වැද සමස්තපාදප නාග
නාග බොධිමූලයෙහි තණ සලා හෙලා දෙරණදැදුරුකොට තිස්
රියන්උස පැණතැගී විදුරසුන් මත්තෙහි චතුරඞ්ගවීර්‍ය්‍යාධිෂ්ඨාන
යෙන් පලක්බැඳ හිඳ අභීත කෙශරසිංහරාජයකුමෙන් මාරකු
ඤ්ජරාහංකාරමර්දනය කෙරෙමින් ලොවුතුරාබුදුව සත්සතිගෙවා
බ්‍රහ්මාරාධනාවෙන් දිනකරකිරණ ප්‍රවිජ්ජනාමෙසකුටියක් වැනිවූ
මෙඛලා නම් උයන්හි දම්සක්පවත්වා සරණය භාවිතත්තයයන
අග්‍රශ්‍රාවකදෙනමක් හා සොනාය උපසොනාය යන අග්‍රශ්‍රාවිකා
දෙනමක් ඇතිව උදෙන නම් මහතෙරුන්වහන්සේගෙන් උප
ස්ථාන විඳ අනූදහසක් අවුරුද්දට ආසිරි ඇතිව අසූරියන් බුදු
බඳින් දියනදන්කරවා කොළලක්ෂයක්රහතන්පිරිවරා දනව්සැරි
සරණසේක—එකල අප මහබෝසතාණෝ සකලගුණයෙන් අතු
ලවූ අතුල නම්නාගරජවනේ සුවහස්ගණන් දිව්‍යාසින් පිරිවරා
බුදුන්කරාඑලඹ දිව්‍යමයවූ පුෂ්පදීපධූපතූර්‍ය්‍යාදීන් කොළලක්ෂයක්
රහතුන්වහන්සේ පිරිවරකොට ඇති තිලෝගුරු බුදුන්ට පූජා
කොට දිවබොජුන් වළඳවා එකක් අධිකවූ කොළලක්ෂයක් සිවුරු
පිරිකර පිළිගන්වා පරමාදරයෙන් වැඳ බණඅසා බුදුබව පතා
ඔබගෙන් මේ සතරවන විවරණය ලදහ.

එහෙයින් කියනලදී.

“සුගතොරසසහභාසුරසුමනං වරසුගතං
උරගාධිප අතුලොරගපරිසාභි ච අතුලං,
අමහීසුනසවණ්ණමහාරුචිරං වරමධුරං
සුරදුන්දුභිභවනම්බරසරණෙ මුනිභවිතුං”යි.

තවද ඒ සුමන නම් බුදුන්ට ඉක්බිති බුද්ධාන්තරයක් ගියකල්හි එම කප අටාසංඛ්‍යකල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇති ලෝකාර්ථයෙහි නිරත රේවත නම් විපච්චිතඥ සර්වඥයන්වහන්සේ අපමණ දිව්‍යසම්පත්තීන් සමෘද්ධවූ තුසිතභවනයෙන් අවුත් ජම්බුද්වීපයෙහි ධන ධාන්‍යයෙන් අනූන ධන්‍යවතීනම් * රාජධානියෙහි ශෞර්‍ය්‍ය බල පරාක්‍රම විපුල විපුළ නම් ධරණීශ්වරයාණන්නිසා විමලරුචි නුදුල විපුලානම් රාජමහිලාවන් කුසපිළිසිඳ දසඑකඩමසින්බිහිව යෞවනයෙහි පිහිටා තුන්ඍතුවට සුදුසු සුදර්ශනය රතනාග්ඝිකාය ආවෙලයයි යන තුන්පායෙහි දෙතිස් දහසක් පුරඟනන් පිරිවරා සඳසක්‡හවුරුදු රජසිරිවිඳ පාපපිළිමල් අදසුන්කළ සුදසුන් නම් අගබිසවකුසින් තරුණාරුණකරචරණවරුණනම්පුත්රුවනවැදූ දවස් පූර්වනිමිත්ත දැක පැවිදිවීමෙහි ලොල්ව කුන්දබන්ධුමධූකාසකන්ධසන්නිභ සෛන්ධවසම්බන්ධ රථවාහනයකින් මහබිනික්මන් නික්ම කෙළක් පුරුෂයන්හා සමගමහණව සත්දවසක් † දුෂ්කර ක්‍රියාකොට වෙසක මැදිපොහෝදවස් අතිවිපුලයසොධර යසොධරානම් ප්‍රමදාවන් දුන් මිහිරිකිරිබත වළඳා සල්වෙනෙහි දිවාවිහාරකොට සවස තරුණ රවිඥනන වරුණින්ද නම් ආජීවකයා දුන් හිතණ අටමිටස්පිළිගෙණ බෝමණ්ඩට එළඹ මාරනාගවිනත නාගබෝමුල්හි සලා හෙලා පසළොස්රියන් උස තණඅතිරිමත්තෙහි බෝකඳට පිටලා වැඩහිඳ මාරමකරාකරප්‍රලයදිනකරව බුදුවෙමින් සත්සතියවා බ්‍රහ්මාරාධනාව පිළිගෙණ තරුණතරුනිකරයෙන් විසිතුරු වරුණ නම් උයන් හිඳී දම්සක්පැවතුන් සූත්‍රදේශනාවකොට වරුණය බ්‍රහ්මදේවය යන අග්‍රශ්‍රාවකාදෙනමක්හා භද්‍රාය සුභද්‍රාය යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇතිව සම්භව නම් මහතෙරුන්වහන්සේගෙන් උපස්ථානවිඳ කෙළගණන් රහතුන් පිරිවරා සැටදහසක් අවුරුද්දට ආසිරිඇතිව අසූරියන් බුදුබඳින් නික්මුණුව්‍යාමප්‍රභාමණ්ඩලයෙන් සතරගව්වෙක අඳුරු දුරුකොට මුළුලොව බබුළුවා වැඩවසනකල්හී–අප මහබෝසතාණෝ මනොරම්‍ය රම්මවතීනම් නුවර අතිදෙහසොභාසම්පන්නවූ අතිදෙව නම් බ්‍රාහ්මණව ඉපද බුදුන් දැක සරණශීලයෙහි පිහිටා ගුණ සොළොස්දහසකින් / ස්තුතිකොට ලක්ෂයක් වටනා උතුරු සළුව පුදා බුදුබව ප්‍රාර්ථනාකොට ඔබගෙන් මේ පස්වන විවරණය ලදහ.

එසේහෙයින් කියනලදී.

‘ පඤ්ඤාගුණානිතිමිතතං චින්තාමණීහරෙවතං සුගතං,
දිස්වා අතිදෙවම්ජො බුද්ධාය දදුත්තරම්බරං ථුත්වා යි”

තවද සද්ධර්මාමෘතදායකරේවතනම් නරෝත්තමයාණන්වහන්සේට ඉක්බිතිව බුද්ධාන්තරයක් ගියකල්හි එම කප සොළසාසංඛෙය්‍ය කල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇතිබුදුසිරින් ශොභිත ශෝභිත නම් ඥෙය සර්වඥයන්වහන්සේ සමතිස්පෙරුම් පුරා දිව්‍යාභි

* සුධන්‍යවතී නම් ‡ දසදහසක් † සත්මසක්
/ සොළොස්දහසකින්

වෘර්ධින් විභූෂිත තුෂිතභවනයෙන් අවුත් දඹදිව පරමධර්මාන්විත සුධර්මා නම් නුවර පාලිතරාජධර්මඇති සුධර්මනම් සාර්වභෞමෙන්ද්‍ර යාණන්හිසා ජනනයන මනොරම්‍යවූ සුධර්මාකාම් ප්‍රමදාවන් කුස පිළිසිඳදසළුකාඩමසින් බිහිව ක්‍රමයෙන්වැඩිවිය පැමිණ තුන්සෘතු වටසුදුසුවූ සමස්ත ශ්‍රීවර්ධන නාරිවර්ධනය යශොවර්ධනය ඉන්ද්‍රවර්ධන යයි යන තුන්පායෙහි සැත්තෑදහසක් වරඟනන් පිරිවරා නව දහසක් අවුරුදු රජසිරිවිඳ නිඛිල ගුණගණාන්විත මබිලා නම් බිසවකුසින් පාපම්පසිංහ සිංහනම් පුත්‍රරුවනවැදූ දිනයෙහිසිය පායෙහිදීම මහණව එහිම හිඳසත්දවසක් ප්‍රධන්වීර්යකොට එම මබිලා නම් බිසව දුන් මියුරුකිරිපිඩු පිළිගෙණ එම පායෙහිදීම වළඳා මහබිනික්මන් කොරෙමියි සිතූ ක්ෂණයෙහිම වැඩවූන් මාලි ගාවහා සමග අහසට පැනනැගී බෝමැඩට ගොස් අටාසූරියන් උස කඳඇති මාරවංසකානනොත්පාටනයෙහි නාගවූ නාගබෝ ධීන්වහන්සේ වසාගෙණ බෝ ගෙයක්සේ සිටිකල්හි නළුනාට කාදීවූ සිව්රඟසෙනග මාලිගාවෙන් බැස සියනුවරට ගියකල්හි වැඩවූන් සිංහාසනයෙහිම බෝසාඳට පිටලා වැඩහිඳ මාරවාරණ විදාරණවාරණෙන්ද්‍රශ්‍රීදක්වා තුන්යම ලත් තුන්නැණින් අලුයම බුදුව උදන් අනා ක්‍රමයෙන් සත්සතිගෙවා බ්‍රහ්මාරාධනාවෙන් සුගතධර්මහර්ම්‍යවූ සුධර්මානම් උයන්හි ධර්මචක්‍රප්‍රවර්තන සූත්‍රදෙශ නාකොට අසම්ය සුනෙත්‍රයයි යන අගසව්දෙනමක්හා නකුලාය සුජාතායයි යන අග්‍රශ්‍රාවිකාදෙනමක් ඇතුව අසමනම් * මහතෙ රුන්වහන්සේගෙන් උපස්ථානවිඳ අනූදහසක් අවුරුද්දට ආයු ඇතිව අටපණස්රියන් බුදුබදින් මුළුලොව සරහා තිස්කෙළක් රහතුන්වහන්සේ පිරිවරා දනව් සැරිසරණසේක– එකල අපමහ බෝසතාණෝ සුරම්‍යවූ රම්‍යවතී නම් නුවර ශොභනාඛ්‍යජාතවූ සුජාත නම් † බ්‍රාහ්මණව සතරවෙදයෙහි පරතෙරට පැමිණ දව සෙක බුදුන්කරා එළඹ මධුරස්වරයෙන් සමන්විත ධර්මදෙශනා වන් අසා සරණශීලයෙහි පිහිටා බුදුපාමොක් මහරහතුන්වහන් සේට තුන්මසක් මහදන්දී බුදුබව පතා ඔබගෙන් මේ සවන විව රණය ලදහ.

එසේහෙයින් කියනලදී

“චාරුබ්බධඅසීතිමත්තරතනං සිඞ්ගීනගං සන්නිභං
නානාලක්ඛණසොභිතං ජනහිතං අඞ්ගීරසං සොභිතං,
දිස්වා ධම්මරසං හි සාරමධුරං සුත්වා සුජාතො ඩිජො
තෙමාසං වරදාන දසිරුචිරං සම්බොධියා සොරසං’සී

* අනොමනම් † අජිතනම්

තවද සකලලක්ෂණයෙන්ශොභිතවූ ශොභිතනාම් ධර්මස්වාමීන්වහ
න්සේට ඉක්බිතිව කල්ප අසඞ්ඛ්‍යයක් ගියකල්හි මේ භද්‍රකල්පයට
යට එකාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් මත්තෙහි බුදුවරයන් තුන්දෙ
නෙකුන්වහන්සේගෙන් මනහරවූ වරනම් කප අනොමදර්ශිය
පද්මය නාරදයයි යන තුන්දෙනෙකුන්වහන්සේ ලොව පහළවූ
සේක ඒ තුන්දෙනාවහන්සේගෙන් සොළසාසඞ්ඛ්‍යකල්පලක්ෂයක්
පිරූපාරමිතාඇති සර්වාර්ථදර්ශීඅනොමදර්ශිනාම් ඥෙය මාරජින්
වහන්සේ දිව්‍යසම්පත්තින් අපරිමිත තුෂිතභවනයෙන්අවුත් දඹ
දිව සොඳවත්සපිරි සඳවත් නම් නුවර දිගනයසපත් යසවත්නම්
රජහුනිසා සම්පීණපයොධර සුධර යසෝධරා නම් අගබිසව කුස
පිළිසිඳ එතැන්පටන් බිසවුන් ඇඟින් නිකුත් රැසින් අසූරියන්
තැන්හි අඳුරු දුරුකොට දසඑකඩමසින්බිහිව මුළුලොව රුවන්
වැසිවස්වා ක්‍රමයෙන් වැඩිවියපැමිණ සිරිය උපසිරිය සිරිවඩ්ඪයයි
යන තුන්පායෙහි තෙවිසිදහසක් වරඟනන් පිරිවරා දසදහසක්
අවුරුදු රජසිරිවිඳ සිරිමා නම් අගබිසව කුසින් ජනසනෙතාසජ
නනප්‍රවීණ උපවාණනම් පුත්‍රරත්නය ජාතදිනයෙහි රන්සිවිගෙ
යකින් මහබිනික්මන්කොට තුන්කොළක් පුරුෂයන් හා සමග
මහණව දසමසක් ප්‍රධන්වියර්‍යකොට බුදුවන දවස් අනුපමවූ ඉසු
රුඇති අනුපමනම් බමුණුගම අනූපමා නම් බැමිණි දියණියන්
දුන් රසකිරිබත වළඳ විමලඑළපල්ලවමලින් ආකූල සාලපනතින්
සිත්කළුවූසල්වනපෙදෙස්හී දහවල් වැස හිරුඅවරගල්කොණට
අසල්වූ කල්හී සිහිල් බොල්පවන් විඳ විඳ හුන්තෙතින් නැගීයන
සඳ නදනාගුණඇති අනොපමනම් ආජීවකයා දුන් කුස තණ
ගෙණ බෝමැඩට ගොස් විවිධපාදපපරිවාරිත කකුධබෝමුල්හී
කුසතණ අතුට සිටිකල්හි යටින් පෘථිවිය දෑදුරුකොට නැගී අට
තිස්රියන් උස විදුරසුන් මැද බෝකඳට පිටලා වැඩහිඳ මාරපරා
ජයකොට ලොවුතුරුබුදුව බ්‍රහ්මාරාධනාවෙන් ජනනයනසුදශීන
සුදශීන නම් උයන්හි දම්සක් පවත්වා තිසභය අනොමයයි යන
අග්‍රශ්‍රාවකදෙනමක්හා සුන්දරීය සුමනාය යන අග්‍රශ්‍රාවිකාදෙන
මක්ඇතිව වරුණනම් මහතෙරුන්වහන්සේගෙ ග් උපස්ථානවිඳ
අවුරුදුලක්ෂයකට ආසිරිඇතිව අටපණස්රියන් බුදුබඳින් බබළි,
මින් තිස්දහසක් රහතුන් පිරිවරා දනව් සැරිසරණසේක—එකලී
අපමහබොසතාණො මහෙශාක්‍යවූ යක්ෂසෙනාධිපතිව නෝ
යෙක් යක්සෙනග පිරිවරා බුදුන් කරා එළඹ සත්රුවන් මණ්ඩප
යක් මවා බුදුපාමොක් මහාසඞ්ඝයා වඩාහිඳුවා සත්දවසක් දිව්‍ය
භොජනදන්දී බුදුබවපතා ඔබගෙන් මේසත්වන විවරණයලදහ.

## එසේහෙයින් කියනලදී.—

“අනොමදස්සිං මුනිසාධුදස්සිං දිස්වාන යක්ඛාධිපති යසස්සි,
දිබ්බන්නපානෙනහසත්තමත්තං සම්බොධියාදූසිමූදුරදූනං”යි

ඒ ත්‍රිකාලදර්ශීවූ අනොමදර්ශී නම් මාරජින්වහන්සේට ඉක්මීති බුද්ධාන්තරයක් ගියකල්හි එම්කප අටඅසඞ්ඛ්‍යකල්පලක්ෂයක් පිරූ පාරමිතා ඇති මොක්මුවරදින් සුදනබමරනදදුන් පියුම්සිරි දරූ පියුම නම් විපච්චිතඥ ශාස්තෘන්වහන්සේ සකලවිභව භවනයෙන් භ්‍රාජිත තුෂිතභවනයෙහි ඉපද නානානිමිසයොෂිතාක්ෂිෂට්පද මුඛාරවින්දයන් ප්‍රමුදිතකොට දිවසැපත් විඳ එයින් අවුත් ජනමනඃප්‍රසාද සම්පාදන චම්පානම්නුවර රාජසෘඩින් අසම අසම නම් මහරජහු නිසා රාජකුලප්‍රමදභාලතලතිලකායක්සමානවූ අසමා නම් බිසව කුස පිළිසිඳ පාරවාරපර්‍යන්තජම්බුද්වීපය පද්මවර්ෂාවෙන් සජ්ජිතකරවා ගර්භපරිපාකාවසානයෙහිදු පියුම්වැසිවස්වා ප්‍රසූතව ක්‍රමාභිවෘද්ධි ප්‍රාප්තව පරමරුචිරයෞවනාවතාරමකරධ්වජවිජිතශරීරශොභාඇතිව ත්‍රිවිධසෘතුක්ෂම උත්තරය වසුත්තරය යසුත්තරයයි යන තුන් පායෙහි තිස්දහසක් කැත්සතුන් වත්පියුම් පුබුදුකළ සරා රිවිමෙන් දසදහසක් අවුරුදු නරසිරි විඳ රූපශ්‍රීන් අනුත්තරවූ උත්තරා නම් බිසව කුසින් ජනනයන පරමරම්‍ය රම්‍යනම් කුමාරයා උපන් දිනයෙහි නිජමනොරථසාධනීයආජානීයදහසකින් යොජිත රථවාහනයකට පැනනැගීඅභිවික්‍රමයෙන් අභිනිෂ්ක්‍රමණය කොට විමලකමලාසනොපනිපාවිශිෂ්ටාෂ්ටපරිෂ්කාර ප්‍රතිග්‍රහණයෙන් පූජිවාසනාසහිත නරභට කොටිප්‍රමාණ සහ දීක්ෂණයෙන් අෂ්ටමාසයක් ප්‍රධන්වීර්‍යකොට බුදුවන වෙසඟමැදිපොහෝදවස් සම්ජනසාමාන්‍ය ධාන්‍යවතීනම් ග්‍රාමයෙහි ධාන්‍යනම් සිටුපුත්‍රයාගේ ධාන්‍යවතී නම් සිටුදුව දුන් පරං රසපායාසඅශනයෙන් රූපකායානුග්‍රහකොට දවල් විජකුලවිලාසිත චූතවිපිනයෙහි * මන්දමාරුතොපනීත පාදපප්‍රාන්තයෙක සුවසේවැස සවස තික්ම සවසහි නම් ආජීවකයා දුන් කුසතණ අටමිටක් පිළිගෙණ බෝමැඩටගොස් තරුණඑලපලලවමලින් සැදුනාවූ සොණ නම් මහමූරුතබෝමුල්හි කුසතණ සලෘහෙලා පෘථිවි සමුද්‍රහෙදදිගත අටතිස්රියන් විද්‍රසුන් මුදුනේ බෝසඳට පිටලා චතුරඞ්ගවීර්‍යාධිෂ්ඨානයෙන් පලක්බැඳ වැඩහිඳ මාරරම්භාරණ්‍ය මර්දනයෙහි මත්තමාතඞ්ගයක්හු මෙන් දසදිගුන් බබුලුවා යාමත්‍රයෙහි ඥානත්‍රයාධිගතව අලූයම ලොවුතුරු බුදුව සපත්නඝාති ක්‍රාන්තකොට බ්‍රහ්මාරාධනාවෙන් පාපචිත්තවිජිත ධනජය නම් උයන්හි වැඩහිඳ දහම්සක්පවත්වා ශාලය උප

---

* සල්වෙනෙහි

ශාලයයි යන අගසව් දෙනමක්හා රාමාය සුරාමායයි යන අග්‍රශ්‍රාවිකාදෙනමක් ඇතිව වරුණනම් මහතෙරුන්වහන්සේගෙන් උපස්ථාන විඳ අවුරුදුලක්ෂයකට ආසිරිඇතිව අටපණස්රියන් බුදුබඳින් මුළුලොව බබුළුවා කෙළගණන් මහණගණයා පිරිවරා දනව් සැරිසරණසේක්—

එක්සමයෙක්හි සුරභිතර පරාග රත්ත මුබරමධුකර නිකරනිරන්තරයෙන් කරණලද ඣංකාරරාවයෙන් මනහරවූ මඤ්ජුතිල ප්‍රචලිත තරුණ එලපල්ලවාඞ්කුර පුෂ්පජාලකාදියෙන් ශොභමානවූ ශාඛාඇති කර්ණිකාරසහකාරනාළිකෙරසන්නීරජම්භීරාදීවූ ද්‍රැමගණා නුවරිත චපලකොකිලාදිද්විජකුලයාවිසින් කරනලද කුහකුහාරවයෙන් මනොහරවූ, කණෙරුකාපුරොභූතමත්තමාතඞ්ගසතයාගේ ධූලකපොලභිඝාතීන් නිරන්තරොද්වහනය කරන්නාවූමදජලනිර්ඣරශ්‍රෙණීන්සුරභිභූතවූභූමිප්‍රදෙශඇතිකර්පූරචූර්ණසින්ධුවාරමකරන්‍දප්‍රවාහසන්නිභඅතිධවලවූවාලුකාතලයෙන් නිර්මල භූමිභාග ඇති, ගම්භීර සිසිරනීරපූරිත නිසරරෙහෙර මහවෙල්සකුණවරණපෙබ්‍රත ප්‍රහාර විකිරිත මකරන්‍ද ප්‍රවාහයෙන් සාන්‍ද්‍රභඞ්ගතරඞ්ගමාලාවෙන් සුපිපි මහනෙල් ගලතලා පියුම්මීළ කැකුළු මිණිදූදිරිකරන බිඟුදූල්වතල විල්පෙළින් නෙත්කලුවූ මත්තමයූරපන්තීන්ගේ අභිප්‍රායානුකූලවූලෙස රඟදෙන්ටසුදුසු තමලුලිය චනල තැනිතලා ගලතලන් ඇති, විකසිතවකුලපුෂ්ප මකරන්‍ද ධූලිපටලයෙන් ප්‍රච්ඡන්නාවගුණ්ඨිත උත්තුඞ්ගපර්වතකූට ඇති, අත්‍යුච්චධරණීධරශිඛරයෙහි චන්‍ද්‍රකාන්තිපාෂාණයෙන් ලීලොපෙතව ක්ෂීරධාරාවෙන් පැනනැඟෙන්නාවූ නිර්ඣරඣංකාරයෙන් මනොහරවූ. සුරභිසුන්‍දරමාරුතොපනීතලතාමණ්ඩපපන්තීන් ශොභමානවූ, යටත් යට නිරන්තරනන්තරවිහරණශබරසුන්‍දරීන්ගේ මධුරනාදයෙන් රතිකරවූ, නානාවිධ කූටවිටපලතානදීනිර්ඣරධරණීධර විවරාදීන් ප්‍රතිමණ්ඩිතවූ හිමාලයවනප්‍රදෙශයට වැඩ, අචෙතසකවූ වෘක්ෂයන්විසින් පුෂ්පමඤ්ජරීචාමරයෙන් පිහිදුවන මඳ මඳ පවන් විඳ විඳ වනතටාක කානනාවන් විසින් පියුම් මුව තබා පුඹුනා නිසරශඞ්ඛනාද පූජාවිඳ, නිත්‍යවිරොධිසත්වයන් ඔවුනොවුන්ගේ පරම මෛත්‍රියෙහි රස දන්වමින්, සුපිපි ඡායාසම්පන්න විසිතුරුගසක් මුල නිරොධසමාපත්තියට සමවැදප්‍රෙමකරුණාඉරියව්වෙන්වැඩඋන්සේක, එකල බුද්ධකාරක ධර්මයන් පූර්ණයකොට සසර සැරිසරා ඇවිදිනා අප මහබෝසතාණෝ, එම වනයෙහි කෙශරපන්තීන් විරාජිතසථානොප චිතවර්ණවිශෙෂයෙන් යුක්තවූ අඞ්ගප්‍රත්‍යඞ්ග ඇති කෙශරසිංහව ඉපද, සිංහ වික්‍රමයෙන් ස්වර්ණගිරිගුහාවල රුවන්වැලිතලා මුද්

නෙහි නිශ්ශංකව සගනයකරමින් නැඟීසිට රන්පිඳි ගිරිශිඛර මුදුනෙහි විදුරු නියපඳුරුපැහැසරකෙසුරු විසුරුවා කිලිපොලා උත්තුඞ්ගකර්ණව සිංහ අභිමානයෙන් සිට ගව්ගණන් දුරසිටිනා මත් ගජරළන් බලමින්, කිසිතෙනෙක්හි සුරභිමකරන්‍දවතීර්ණ භූමිප්‍රදෙශ ඇති වනගළින් වනගළට නිශ්ශංකව වැද සිත්සේ ඇවිදිමින් කිසිතෙනෙක්හිපවතින් ලලනතරුනිකරයෙන්හෙන මුවරද සහිත මල්වැස්සෙහි තෙමෙමින්, කිසිතෙනෙක්හි ගව්ගණන්උස මහගිරිකුළු අගින් හෙන ගඟුල්හැල්ලෙන් විසිර ඉසෙන සිසිර දියබිඳු සියලඟ ගස්ව ගස්වා රන්ගිරිඅතලවල්හි සිට සිරුරුසනපමින්, කිසිතෙනෙක්හි සුවපත් විළිකුන් අඹෙහි තුඬුදිදී මධුර අඹ රසවිඳ නාදපවත්වන මුඛර කුරවිකෙවිල්ලන්ගේ කට ගඬට කන් දමාලා කරබිඳබිඳ අසාසිටිමින්, කිසිතෙනෙක්හි මොහාඛව එළඹි ගජාරිතරුණීන්ගේ අතරුණමෙතෙහි රසවිඳිමින් මෙසේ වෙනෙහි තැන තැන ඇවිදිනා සිංහරාජොත්තමයාණෝ එදවස් නිරොධසමාපත්තියටසමවැද වැඩඋන්බුදුන් කරාපැමිණ දෙතිස්මහාපුරුෂ ලක්‍ෂණයෙන් ප්‍රතිමණ්ඩිතවූ බුදුන් දුටු ඇස් අතික් දිශාවකට නමාගතනොහී වෙනතෙනකට පියවරකුත් සොළවාගතනොහී ඇසිපිය හෙලාලන ඇසිල්ලකුත් දිගුකලක් සිතා මහත් ප්‍රෙමයෙන් කර නම නමා වඳිමින් ගෞරවයෙන් ශරීර අවයව නොසොල්වා ගොදුරෙහි ලොභය හැර මෙවෙනි බුදුරුවනකට කුමක් පුදම්දෝහෝයි විමස විමසා ශ්‍රීපාදමූලයට තුදුරුතෙනෙහි හිසතබාගෙන හෙය සත්දවසකින් නිරොධසමාපත්තියෙන් නැඟි බුදුන් ප්‍රදක්‍ෂිණාකොට ප්‍රීතිවෙගයෙන් සිංහනාදකොට තමන්ගේපස්පැදිස්නා ඇස්සහළින් පූජාකොරෙමින් බුදුබව පතා ඔබගෙන් මේ අටවෙනි විවරණය ලදහ.

එසේහෙයින් කියනලදී—

"නානා නාමෙතුදිතතරාසණ්ඩාදිගඬගාභිරාමෙ
රඤ්ඤක්‍ඛන්තං පදුම සුගතං ඣානපත්තංනිසින්නං,
දිස්‍වා සමෙමාදිතසන්තමනසා බොධියා පත්‍ථයිත්‍වා
සත්තාහං සො මිගපති නයනෙනා භිපූජං අකාසි"යි.

තවද සකලලොකොකානම පදුම නම් බුදුන්ට ඉක්බිති බුඬාන්තරයක් ගියකල්හි, එම කප සොළසාසඞ්ඛ්‍යකප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති විසාරද නාරදනම් ශ්‍රෙයබුදුරජාණන්වහන්සේ තුෂිත භවනාරූස්ව නානාවිධ සුධාසන අම්ලමුඛකමලවිකාසනයෙහි දිවස කරුයමානව සජොතීන් දෙව්බඹුන් සතුටුකරවා දිව

සිරිවිඳ වෙසෙමින් දෙව් බඹුන් අයදමෙන් දඹදිව ධඤ්ඤවතීනම්
පුරප්‍රවරයෙහි සුදෙව නම් හරෙජ්‍රයා නිසා අපමණ ගුණොපමා
රහිතවූ අනූපමා නම් අග බිසව කුස පිළිසිඳ සාගරපරියන්තවූ
සියලු දඹදිව ආභරණ වැසි වස්වා මව්කුසින් බිහිව යෞවනප්‍රාප්
තව තුන්සෘතුවට සුදුසුවූ විජිතය විජිතාවීය විජිතාභිරාමයයි
යන තුන්පායෙහි එක්ලක්ෂ විසිදහසක් පුරඟනන්ගේ නුවන්පිළි
මුවනට සුරභිකනකකජානනයෙන් ප්‍රභාමකරන්ද ප්‍රදානයකො
රමින් නවදහසක් අවුරුදු රජ සිරිවිඳ ජනිත රූපාභිරාම විජි
තසෙනානම්බිසවකුසින්ජගදෙකනෙත්‍රානන්දතාරනම්කුමරුවා
උපන් දිනයෙහි සතරපූර්වනිමිත්තයෙන් මහණරුව දැක සුරකත
සිරිපතුල්යානාවෙන් මහබිනික්මන්කොට මහසෙනඟ පිරිවරා
පිවිසවිසල්මඟුළුයනෙහි විමලසලවටපිටහිඳනොයෙක්සුවඳින් ආ
ර්ද්‍රවූ නීලකුටිල කෙස්වැටිය සිඳ හැර මහබඹුදුන්අටපිරිකර පිළි
ගෙන ලක්ෂයක් පුරුෂයන් හා සමග මහණව සත්දවසක් මහා
වීර්‍යකොට බුදුවනදවස් අගබිසව දුන් මීපුරු කිරිබත වළඳා එම
උයන්හි දවල් වැස සවස සකලජන සුදර්ශනීයවූ සුදර්ශන නම් උ
යන්ගොව්වා දුන් තණ ගෙන බොධිමණ්ඩලයට පැමිණ මේඛ
ලක්බඳුසුළුඹුරුතනම්වූ චූලසොණ බෝමුල්හි කුසතණසළාහෙලා
අටපණස්රියන් උස දෙරණ දැදුරුකොට තැභිසමවන් විදුරසුන්
පැනනැඟී මාරබලතුලමාලුනව බෝකඳට පිටලාහිඳ ලොවුතුරා
බුදුව සත්සතිගෙවා බඹුහුගේ අයදමෙන් ධනජය නම් උයන්හි
වැඩහිඳදම්සක්පවත්වා භද්‍රසාලය සුනෙත්‍රයයියන අගසව් දෙන
මක්හා උත්තරාය ඵාල්ගුණීයයියන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇතිව
විශිෂ්ටමහතෙරුන්වහන්සේගෙන් උපස්ථාන විඳ * අසූදහසක්
අවුරුද්දට ආසිරි ඇතිව අටාසූරියත් බුදුබඳින්. නික්මුණු ව්‍යාම
ප්‍රභාමණ්ඩලයෙන් දෙලොස්ගයාදුන් තැන්හි අඳුරු දුරුකොට
අසූකෙළක් රහතුන්වහන්සේ පිරිවරා ගම් නියම්ගම් රාජධානි
පිළිවෙළින් දනව් සැරිසරා දෙව්මිනිසුන්ට නිවන් අමාරස දෙ
දෙමින් ලෝවැඩෙහි යෙදී වැඩවසනසේක.

එකල අපමහබෝසතාණෝතාපසව හිමාලයපර්වතයෙහිවසන්
නාහු තමන්කෙරෙහි කාරුණාමිවත් අසූකෙළක් රහතුන්හා දස
දහසක්අනාගාමි උපාසකවරුන්පිරිවරා තමන්ලඟටවැඩිබුදුරජා
ණන්වහන්සේද්‍රකමහසඟපිරිසටවෙනවෙනමපන්සල්මවාසතපා
රාත්‍රියෙහිබණඅසාඋදසන්හි උතුරුකුරුදිවයිතින්අහරගෙනවුත්

* "අනූදහසක්"

බුදුපාමොක් මහාසඞ්ඝයාවහන්සේවලදවා මෙම ලෙස අනාගාමී උපාසකවරුන් සහිත බුදුපාමොක් මහාසඞ්ඝයාවහන්සේට උපස්ථාන කොට ඉක්බිති ලක්ෂයක් අගනා රත්සඳුන් ඝටයෙකින් පූජාකොට බුදුබව පතා ඔබගෙන් මේ නවවන විවරණය ලදහ.

**එසේහෙයින් කියනලදී.—**

"විසාරදං සත්තාදිනානි නාරදං-සචොරසං ධම්මිසිස්සමාගතං සුඛෙනදිස්වා ඝනරත්තවන්දනං-ජිනාය දත්වානඅකාසි පත්ථනං'සි.

තවද සුරබ්‍රහ්මාදනාදර නාරද නම් බුදුරජාණන්වහන්සේට ඉක්බිතිව බුඬශූන්‍යවූ කප්අසඞ්ඛ්‍යයක් ගියකල්හි මේ මහාභද්‍ර කල්පයට යටගියදවස ලක්ෂයක් වන කප සර්වඥකොනොකුන් වහන්සේගෙන් සාරවූ සාරනම් කල්පයෙහි සොළසාසඞ්ඛ්‍යය කප්ලක්ෂයක් පිරූ පාරමිතා ඇති ජනපරායනදූනයෙහි සෞම්‍යවූ පියුමතුරානම් නරෙන්‍ද්‍රමයාණන්වහන්සේ තුෂිතභවන යෙන් අවුත් දඹදිව ක්ෂත්‍රිය යුවති හංසපන්ති නිසෙවිත කාජිනී සන්නිභ හංසවතීනම් නුවර ජනමනනයනානන්‍ද ආනන්‍දනම් මහීන්‍ද්‍රයාණන් නිසා විශෙෂතරාභිජාත සුජාතානම් අගබිසව කුස පිළිසිඳ දසදහසක් සක්වළ පියුම් වැසි වස්වා මව්කුසින් බිහිව ක්‍රමයෙන් වැඩිවියපැමිණ ඍතුක්ෂමවූ නරවාහනය යසවාහනය හංසවාහනයයියන තුන්පායෙහි එක්ලක්ෂ විසිදසක් පුරඟනන් පිරිවරා දසදහසක් අවුරුදු රජසිරිවිඳ කුශල ඵලප්‍රණීත දත්තාවූ සුදත්තානම් අගබිසව කුසින් උත්තරනම් පුත්රුවන වැදූදවස් නමාහුත් යසවත්නම් මහපායෙන් මහබිනික්මන් කොට කැටුවගියවුන් හා සමග මහණව සඳදවසක් ප්‍රධන්වීර්‍ය්‍ය කොට බුදුවනදවස් උදේනිනම් නියංගම රුචිනන්‍දානම් සිටුදූව දුන් කිරිපිඩු වළඳා සල්වෙනෙහි වැස දිනාපනායෙහි එතනින් යනසඳ මගදී දුටු සුචිපාන නම් ආජීවකයා දුන් කුසතණ අටමිටක් පිළිගෙන බෝමැඩ කරා ගොස් සළලබෝමුල්හි කුසතණ සලා හෙලා පොළොව පලානැගි අවනිස්රියන් උස විදුරසුන් පැනනැගි බෝකඳට පිටලා වැඩහිඳ මරුන්බිඳ ලොවුතුරාබුදුව දසදහසක් සක්වළ පියුම්වැසි වස්වා ඍන්සනිගෙවා මිපිලානම් උයන්හි දම්සක් පවත්වා තීර්‍ථකයන් ඔය්පතින්මැ නැතිකොට නෙදපතුරුවා දෙවලය සුජාතය යන අගසව් දෙනමක්හා අමිතාය අසමාය යන අග්‍ර ශ්‍රාවිකා දෙනමක් ඇතිව සුමනනමහතෙරුන්වහන්සේගෙන් උපස්ථානවිඳ ලක්ෂයක් අවුරුද්දට ආසිරි ඇතිව අටාසූරියන් බුදුබඳින් මුළුලෝ සරහා නික්මුණු බ්‍යාම ප්‍රභාමණ්ඩලයෙන් දොළොස් යොජනෙක එකාලොකකොට සැත්තෑලක්ෂයක් රහතුන්වහන්සේ පිරිවරා..දනව් සැරිසරණ

නොයෙක් කොළ ගණින් සේක. එකල අප මහබෝසතාණෝ ධනඇති ජටිලනම් මහරුහැරිව බුදුන්දුන සපිරිවර මහාසඞ්ඝයා මහන්සේට දන්දී අනන්තයෙහි තුන්සිවුරු පිළිගන්වා බුදුබව් පතා ඔබගෙන් මේ දසවන විවරණය ලදහ.

එසේහෙයින් කියනලදී—

"දිපදුත්තමපදුමුත්තරසුගතං හිතසුගතං
වරභොගිකජටිලො මහරඪිසො මුනි හවිතුං,
පියත'ද්දස දිනසතනසු සුගතොරස සහිතං
පරමාදරමනසා මසනමදසභිරුචිරං"යි.

මෙසේ දක්වනලද මේ සතරඅසඞ්ඛ්‍යය අතරතුරෙහි මුත් අසඞ්ඛ්‍යයට අනාගීත කප්වල බුදුකෙනෙකුන්වහන්සේ නූපන් හෙයින් මේ සතරඅසඞ්ඛ්‍යය ශූන්‍යඅසඞ්ඛ්‍යයයිද කීහෙයින් එහි නම් දක්වන්නාහු මෙසේ කීහ—

"සෙලො හාසො වයො චෙව රුචියා සඞ්ඛියා ඉමෙ,
චත්තාරො තෙ අසඞ්ඛෙය්‍යා විනිපාතා 'තිවුච්චති"යි.

මෙසේ දක්වනලද මේ සාරාසඞ්ඛ්‍යයට ඉක්බිති මේ පියුම තුරා නම් බුදුන්කෙරෙහි පටන් සැත්තෑදහසක් කප් ගියකල්හි මේ භද්‍රකල්පයට තිස්දහසක්වන ගුණකනකාසයම්භුකුණ්ඩලමය කින් ප්‍රතිමණ්ඩිතවූ මණ්ඩනම් කල්පයෙහි සුමෙධය සුජාතයයන සර්‍වඥදෙදෙනෙකුන්වහන්සේ ලොකයෙහි පහළවූසේක. එයින් අටඃසඞ්ඛ්‍ය කප්ලක්‍ෂයක් පාරමිතා පිරූ වජ්‍රමෙධ සුමෙධනම් විපච්චිතඥසර්‍වඥයන්වහන්සේ සකලජනාභිලාෂිත තුෂිතභවන යෙන් අවුත් දඹදිව මධ්‍යමණ්ඩලයෙහි වරසිරිනිකරයෙන් සුදශී නියවූ සුදශීනනම්පුටභෙදනයෙහි සමස්තසම්පත්ප්‍රාප්තසුදත්ත නම් නරෙන්ද්‍රයාණන් නිසාතිජපතිප්‍රිය දයාත සුදත්තාතම් බිසව් කුස පිළිසිඳ දසමස්පුරා බිහිව ක්‍රමයෙන් වැඩිවියපැමිණ තුන් ඍතුවට සුදුසුවූ සුචන්දකය ජයකෙතුය සිරිවඩ්ඪය යන තුන්පා යෙහි අට සාළිස්දහසක් නාටකස්ත්‍රීන්ගේ පයොධර තාමරස ප්‍රවර්ධිත උරසරසින් මනොහරව රජසිරිවිඳිමින් සුමනපුෂ්ප බඳු මෘදුසුමන සුමනානම් බිසවකුසින් තෙජොමිත්‍ර පුනර්සුමිත්‍ර නම් පුත්‍රරත්නය වැදූදිනයෙහි සප්තස්ථානඅවතිෂ්ඨශ්‍රීප්‍රශස්ත ලක්‍ෂණාන්විත විනීතහස්තිහු අරා මහබිනික්මන්කොට කොළ සියයක් පුරුෂයන් හා සමග මහණව අටමසක් ප්‍රධන් වීර්‍ය කොට බුදුවනදවස් නකුලනම් ගම නකුලනම් සිටුදුවදුන් කිරි

පිඬුගෙන පිඬුකොට එකුන්පණස් පිඩක් වලඳා කොකිලාලිකුල කොලාහලින්කාන්තාලු සල්වෙනෙහි දහවල්වැස නික්මුණුසඳ සිරිවඩුනම් ආජීවකයා දුන් කුසතණ අටමිටක් ගෙණ අදම බුදු බව දක්මියි බක්මීබෝමුලට අවුත් කුසතණ සලා හෙලා පොළොවපලා පැනනැඟි විසිරියන් විදුරසුන් මුදුනෙහි බෝකඳට පිටලා වැඩහිඳ මරුන් බිඳ බුදුව සත්සතිගෙවා බ්‍රහමාරාධනාවෙන් සුදර්ශනොද්‍යානයෙහිදී දහම්සක්පවත්වා සරණය සබබකාමයයන අගසව්දෙනමක්හා රාමාය සුරාමාය යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇතිව සාගරනම් මහතෙරුන්වහන්සේගෙන් උපස්ථාන ලදින් අනූදහසක් අවුරුද්දට ආසිරිඇතිව සියලහරුසින් සතරගව්වෙක අදුරුදුරුකොට අටාසූරියන් බුදුබදින් මූළුලොව සරහා කෙළසියයක් රහතුන් පිරිවරා දනව් සැරිසරණසේක.

එකල්හි අප මහබෝසතාණෝ උත්තරනම් මාණවකව අසූ කෙළක් ධනවියදම්කොට බුදුපාමොක් මහාසඞ්ඝයාවහන්සේට දන්දී මහණව බුදුබවපතා ඔබගෙන් මේ එකොළොස්වන විවරණය ලදහ

එසේහෙයින් කියනලදි—

"වාදිහඞ්කුසසත්‍ථනිභං ජනතිධිං සාධුං සුමෙධං ජිනං
දිස්වා උත්තරමාණවො මතිපසන්නො බොධිසත්තො තදා,
දත්වා කොටිඅසීතිමඟ්ගස්තසාහෙසො චොදනෙ චම්බරෙ
චාරොදූරගුණෙන සාසි පවරං සම්බොධියා පත්‍ථනං" යි.

තවද අන්වර්ථනාමයෙන් සුමෙධනම්වූ සුමෙධබුදුන්ට ඉක්බිති බුඬාන්තරයක් ගියකල්හි එම කප අටාසඞ්ඛ්‍යකප්ලක්ෂයක් පිරූ පාරමිතා ඇති අනෙකාද්භූතජාත සුජාත නම් විපච්චිතඥජනොත්තමයාණන්වහන්සේ විබුධජනාභිරත තුෂිතභවනයෙන් අවුත් දඹදිව නිරන්තරමඞ්ගල්‍යයෙන් අනල්පවූ සුමඞ්ගලනම් නුවර කීර්තිප්‍රතාපොද්ගත උග්ගතනම් රජහු නිසා මෘදුතනු ප්‍රභාභාසුර ප්‍රභාවතීනම් රාජවනිතාවන්කුස පිළිසිඳ දසඑකුඩමසින් බිහිව ක්‍රමයෙන් වැඩිවිය පැමිණ ශ්‍රිරිය උපසිරිය නන්දය යන තුන්පායෙහි නෙව්සිදහසක් පුරඟනන් පිරිවරානවදහසක් අවුරුදු රජසිරිවිඳ ජනානන්දසිරිනන්ද නම් අගබිසවකුසින් පාපවිහඞ්ගසෙන උපසෙනනම් පුත්‍රරත්නයජාත දිනයෙහි හංසවසහනම් අශ්වයාපිටටපැනනැඟී මහබිනික්මන්කොට කෙළක් ඇමතියන්හා සමග මහණව නවමසක් මහාවීයයීකොට බුදුවනදවස් පුරිඳදපුරවැනි සුරිඳනම් නුවර රූසිරින්නන්ද සිරිනන්දනම් සිටුදුව දුන් මිහිරි කිරිබත වළඳා විසල්සල්වනයෙක්හි දිවා

විහාරකොට සවස්වේලෙහි වැඩ අමනඥගුණසුගන්ධ සුනන්දනම් ආජීවකයාදුන් කුසතණ අටමිටක්පිළිගෙන අපරාජිතස්ථානයට ගොස් මාරභයදනප්‍රවීණ වෙණුබොධිමූලයෙහි සලාහෙලා දෙතිස්රියන් උස පැනනැගී වජ්‍රාසනාරූඪව මාරවරවාරණ නිවාරණබගහවිෂාණයක්හුමෙන් උග්‍රපරාක්‍රමදක්වා බෝකඳට පිටලා වැඩහිඳ ලොවුතුරාබුදුව සත්සතිගෙවා බඹහුගේ අයදමෙන් ධර්මාලොකයෙන් බබළන සුමඞ්ගලනම් උද්‍යානයෙහි ධර්මචක්‍රප්‍රවර්තනසූත්‍ර දෙශනාකෙරෙමින් සුදස්සනය සුදෙවය යන අගසව් දෙනමක්හා නාගාය නාගසෙනායයි යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇතිව නාරදමහතෙරුන්වහන්සේගෙන් උපස්ථාන විඳ අනූදහසක් අවුරුද්දට ආසිරිඇතිව අටපණස්රියන් බුදුබඳින් තුන්ලෝ බබුළුවා කෙළලක්‍ෂයක් රහතුන් පිරිවරා දනවිසැරි සරමින් සත්‍වයන්ට නිවන් සම්පත් දෙමින් වැඩවසනසේක.

එකල අප මහබෝසතාණෝ සප්තවිධරත්නයෙන් පූර්ණවූ මහානුභාවසම්පන්න චක්‍රවර්තිරජව දෙදහසක් කොදෙව් පිරිවරා සිව් සතරමහද්වීපයෙහි උපදනා සියලු අයගෙණ බුදුපාමොක් මහරහතුන්වහන්සේට රටවැසියන් උපස්ථානකරනසේ නියොගකොට සියලු සම්පත්හා සමග චක්‍රවර්ති රාජ්‍යය බුදුරජාණන්වහන්සේට පූජාකොට බුදුසසුන්වැද මහණව සර්වඥතාඥානය පිණිසඹබගෙන් මේ දෙලොස්වන විවරණය ලදහ.

එසේහෙයින් කියනලදී—

"සපරගිතසුජාතං සාමඳං පාරිජාතං
සුගතවරසුජාතං දස්සනෙ පත්තරජ්ජං.
සහවරත රදනං බොධියා පණසිකා,
අද්දි ගුණතුලිනෙ චක්කවත්ති නරිනෙ" යි.

තවද ඒ සුජාතනම් බුදුන්ට ඉක්බිතිව විසිදහස් අටසිය දෙයාසූකපක් බුඬශූන්‍යවූ කල්හි මේ භද්‍රකල්පයට එක්සිය අටළොස්වන අප්‍රමාණ ගුණමොදවිස්තෘතජාත රූපාරවින්දසනන්හි සර්වඥ තුන්දෙනෙකුන් වහන්සේගෙන් සාරවරනම් කල්පයෙහි දෙතිස්මහා පුරුෂලක්‍ෂණාදින් ප්‍රියදර්ශිවූ ප්‍රියදර්ශීනම් දසබලධාරීන් වහන්සේය අර්ථදර්ශිවූ අර්ථදර්ශීනම් සර්වඥයන්වහන්සේය දසවිධධර්මදර්ශිවූ ධර්මදර්ශීනම් ධර්මරාජන්වහන්සේයයි කියනලද තුන්බුදුකෙනෙකුන්වහන්සේ ලොකයෙහි පහළවූසේක. එයින් අටාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක්පිරූ පාරමිතා ඇති රූපයෙන් සමස්තසත්‍වනෙත්‍රප්‍රියදර්ශිවූ ප්‍රියදර්ශීනම් විප්‍රචිතඥ සර්වඥයන්වහන්සේ සමස්තවස්තුවෙන් මස්තකප්‍රාප්තතුෂිත භවනයෙන් අවුත් දඹදිව මධ්‍යමණ්ඩලයෙහි ධාන්‍යවතීනම්නුවර

සකලගුණඅභයදනා සුදත්තනම් මහරජාණන්හිසා වාක්අමෘත කාන්තීන්ප්‍රසාදකරවූ චන්‍ද්‍රවක්ත්‍රඇති චන්‍ද්‍රවතීනම් අගබිසවකුස පිළිසිඳ දසළුකඩමස් ඇවෑමෙන් මව්කුසින් බිහිව යෞවනප්‍රාප්තව සුනිම්ලය විමලය ගිරිගුහාය යන තුන්පායෙහි තෙතිස්දහසක් නරනාරීහිකරපිරිවරින් නවදහසක් හවුරුදුරජසිරිවිඳ සුවිමල විමලානම් අගබිසවකුසින් කාංචනසාජනිභාතන කාංචනාවෙලනම් පුත්‍රරත්නය ජාතදිනයෙහි ඌගුමගහුම්ගුලසුන් යෙදූ දිගපුළුල්රියයහන් අරු මහබිනික්මන්කොට සියක්ලක්‍ෂයක්අමාත්‍යවරුන් හා සමග මහණව සමසක් දුෂ්කරක්‍රියා පුරා බුදුවනදවස් තරුණජනාකීර්ණ වරුණනම් බමුණුගම සකලලක්‍ෂණයෙන් සුභ වසභානම් බැමිණිය දුන් මියුරු කිරිපිඩු වළඳා ව්සල්සල්වෙනෙහිදහවල්කල්යවා එනනින්නික්ම සුජාතනම් ආජීවකයාදුන් කුසතණ අටමිටක් පිළිගෙන බොධිමණ්ඩලයට ගොස් මහගුතුහු පුවගුබෝමුල සලාහෙලා පොළොව පලාගෙන නැගි තෙපණස් රියන් උස විදුරසුන් මුදුනෙහි බෝකඳට පිටලාවැඩහිඳ මාරපරාජයකොට ලොව්තුරා බුදුව සත්සතිගෙවා මහබඹු අයදමෙන් උසභවතීනම් උයන්හි දම්සක්පවත්වා පාලිතය සබ්බදස්සියයන අගසව් දෙනමක්හා සුජාතාය ධම්මදින්නාය යන අග්‍රශ්‍රාවිකාදෙනමක්ඇතිව සොභිතනම්මහතෙරුන්වහන්සේගෙන් උපස්ථාන විඳ අනූදහසක් අවුරුද්දට ආසිරි ඇතිව අටාසූරියන් බුදුබඳින් මූළුලෝ බබුළුවා සියක්ලක්‍ෂයක් රහතුන්වහන්සේ පිරිවරා සත්ත්වයන්ට ධර්මදෙශනාකොට අමාමහනිවන් දෙමින් ජනපදචාරිකාවේ වැඩිසේක.

එකල අපමහබෝසතාණෝ කොළගණන්වසතුඇති කාශ්‍යපනම් බ්‍රාහ්මණව වෙදත්‍රයෙහි කොටිප්‍රාප්තව බුදුන්දැක බණ අසා කෙළලක්‍ෂයක් ධන වියදම්කොට විහාරයක් කරවා සපිරිවර බුදුරජාණන් වහන්සේට පිළිගන්වා මහත්වූ ප්‍රේමයෙන් පසඟ පිහිටුවාවැඳ බුදුබැව්පතා ඔබගෙන් මේතෙලෙස්වන විවරණලදහ.

එසේහෙයින් කියනලදී—

"සුදස්සනීයං පියදස්සිනාථං – දිස්වා විජෝ කස්සපබොධිසත්තො
කාරාපයිත්වා රුචිරං විහාරං—අදාසි ජෙන්නාය ජිනුස්සතස්ස"යි.

තවද ඒ ප්‍රියදර්ශිවූ ප්‍රියදර්ශිනම් බුදුන්ට ඉක්බිතිව බුද්ධාන්තරයක් ගියකල්හි එමකප සොළසාසඞ්ඛෙය්‍යකප්ලක්‍ෂයක් පිරූපාරමිතා ඇති උභයලොකාර්ථදර්ශීවූ අර්ථදර්ශී නම් භාග්‍යවතුන් වහන්සේ පාපපඞ්කවිශොෂිතභානුභූත තුෂිතභවනයෙන් අවුත් නානාජන මනනයනශොභනවූ ශොභනනම්නුවර විපුලනරේන්

ලක්ෂ්මීනිසාගර සාගරනම් නරපතිහු නිසා යෞවනශ්‍රීන් ප්‍රදර්ශිත වූ සුදර්ශනානම් අගබිසව කුස පිළිසිඳ දසළොසාධමසින් මව්කුසින් බිහිව එක්ෂණයෙහි කුලපරම්පරාගතව කලක් හිමියන්ට සැඟවී නිධානගතවූ වස්තු හිමියන්ට ලාභ කොට ක්‍රමයෙන් යෞවන ප්‍රාප්තව අමරගිරිය සුරගිරිය ගිරිගුහාය යන තුන්පායෙහි තෙ තිස්දහසක්*පුරහනන්ගේ මුඛාරවින්දප්‍රබෝධයෙහි තරුණදිනක රවූ දසදහසක්හවුරුදුරජසිරිවිඳරාජවංසානිම්සපාදපාග්‍රශාඛාස මානවිශාඛානම්බිසවකුසින්නිශ්චලගුණශෛලශෛලනම්පුත්‍රර වනවැදූදිනයෙහිප්‍රාසාදවහඅස්වාහනයෙන්මහබිනික්මන්කොට නවකෙළක්පුරුෂයන් හාසමග මහණව අටමසක් ප්‍රධන්වීර්‍ය්‍ය කොටැ බුදුවනදවස් සුබන්ධුර සුචින්ධර නම් නාගමානවිකාව දුන් කිරිපිඬු පිළිගෙන එකුන්පණස්පිඬක් කොට වළඳා විශාලවිටප යෙන් මෙඝකූටයක්වැනි තුටුපහටු වනසණ්ඩයෙක දහවල් වැස සවස සියකුලගතනගනතිලිපුල පුබුදු කළ සිසිරරුචි වැනි සුරු චිනම් නාගරාජයා දුන් කුසතණ අටමිටක්ගෙන තිරතුරු කුසු මතුර සරණ සපුපෙලින්සපුන් සපුසිරිබෝමුල්හි කුසතණ සලා හෙලා තෙපණස්රියන් උසනැගි වජ්‍රාසනමස්තකයෙහි බෝසඳ වපිටලා වැඩහිඳ මාරපරාජය කොට ලොවුතුරාබුදුව සත්සති ගෙවා බඹහුගේ අයදමෙන් සමෝපමාරහිතවූ අනෝපමනම් උ යන්හි දම්සක් පවත්වා ශාන්තය උපශාන්තය යන අගසව් දෙන මක්හා ධර්මාය සුධර්මාය යන අග්‍රශ්‍රාවිකාදෙනමක් ඇතිව අභයමහ තෙරුන්වහන්සේගෙන් උපස්ථාන විඳ අනූදහසක් අවුරුද්දට ආසිරි ඇතිව සියලහරුසින් සතරගව්වෙක අඳුරුදුරුකොට අසූ රියන් බුදුබඳින් මුළුලොව සරහා †නවකෙළක් රහතුන් පිරිවරා මුළුලොවට තිවන්අමා දෙමින් දනව් සැරිසරණසේක.

එකල අපමහබෝසතාණෝ චම්පානම්නුවර සුසීමනම්බ්‍රාහ්මණව ඉපද සියලු සම්පත් යාචකයන්ට දන්දී හිමාල වනයටවැද තාපසප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව ධ්‍යානලාභීව වෙසෙමින් දවසෙක බුදුන්කරා එළඹ බණඅසා පැහැද තමන්ගේ ආනුභාවයෙන් එකෙණෙහි ශක්‍රභවනයට පැනනැගී ශක්‍රයන්ගේ එකාපුණ්ඩරීක නම් උයනෙහි සියක්යොදුන් උසඇති පරසතුරුසා සලාමල්ගෙනවුත් සතරමහදිවයින එකාපැහැරවර්ෂාකරන්නාවූ මහවැස්සක් සේ දිව්මල්වැසිවස්වා අවට මල්තොරණ මල්මඬුලුමල්ඇගෑ ආදීයෙන් විසිතුරුකොට සරහා පරසතුමල්කුඩයක් බුදුන්සිරසට පුදා පසඟ පිහිටුවා වැඳ බුදුබව පතා ඔබගෙන් මේ තුදුස්වන විවරණය ලදහ.

---

* තිස්දහසක් † සතහා

එසේහෙයින් කියනලදී—

"දිසි විතතයසස්සිං චාරුනාථත්ථදස්සිං
ස පරහිත සුසීමො භික්ඛු ජෙනාය දිස්වා.
තිදිවපුරරුහිත්වා තන්දමන්දාරපුප්ඵෙ
සමහිමතමනෙත්වා තෙසාපූජං අකාසි"යි.

තවද ඒ අත්ථදර්ශිනම්බුදුන්ට ඉක්බිතිවබුද්ධාන්තරයක් ගිය කල්හි එම කප සොළසාසඞ්ඛෙය්‍යකප්ලක්ෂ්යක් පිරූපාරමිතා ඇති ධම්මදස්සී නම් බෝධිසත්වයන්වහන්සේ තුෂිතභවනයෙන් අවුත් දඹදිව මධ්‍යමණ්ඩලයෙහි ශරණනම් නුවර ශරණනම් රජහු තිසා සුනන්දානම් බිසව කුස පිළිසිඳ දසඑකාධමසක් ඇවෑමෙන් මව්කුසින් බිහිව අධිකරණශාස්ත්‍රපොත්වල අධර්ම්ව්‍යවහාර අන්තර්ධානකරවමින් ධර්ම්ව්‍යවහාර නොපිරිහෙලාසිටුවමින්ක්‍රමයෙන් වැඩී අරජය විරජය සුදර්ශනය යන තුන්පායෙහි එක්ලක්ෂවිසිදහසක් නාටකස්ත්‍රීන් පිරිවරා රජ සිරි විඳ විචිකොළිනම් අගබිසවකුසින් පුණ්‍යවර්ධනනම් පුත්රුවන වැදූ දිනයෙහි මහබිනික්කෙරෙමියි සිතූක්ෂණයෙහිම පූර්වෝපචිත කුසලබලයෙන් ආකාශයට පැනනැඟගාවූ සුදර්ශනනම් ප්‍රාසාදයෙන්ම මහබිනික්මන්කොට කෙළලක්ෂයක්පුරුෂයන් හා සමග මහණව සත්දවසක් මහාවීයර්‍යකොට බුදුවනදවස් විචිකොළිනම් අගබිසව දුන් කිරිපිඬු වළඳා දෙබරාරණ්‍යයෙහි දිවාවිහාරකොට සවස්වේලෙහිසිරිවඩ්ඪනම් යවපාලයාදුන් හීතණ අටමිටක් ගෙන අපරාජිතස්ථානයට ගොස් රත්කරව්බෝමුල්හි කුසතණ සලාවගුරුවා පණස්රියන් පැනනැඟි වජ්‍රාසනමස්තකයෙහි බෝකඳටපිටලා වැඩහිඳ මාරපරාජය කොට ලොව්තුරාබුදුව සත්සති ගෙවා බ්‍රහ්මාරාධනාවෙන් ඉසිපතන නම් උයන්හිදී දම්සක් පවත්වා පදුමය ඵුස්සදෙව යයි යන අගසව් දෙනමක් හා ඛෙමාය සබ්බනාමාය යන අග්‍රශ්‍රාවිකාදෙනමක් ඇතිව සුනෙත්‍රනම් මහතෙරුන්වහන්සේගෙන් උපස්ථානවිඳ හවුරුදුලක්ෂයකට ආසිරිඇතිව අටාසූරියන් * බුදුබඳින් මූඑලෝ සරහා කෙළලක්ෂයක් රහතුන්පිරිවරා දනව් සැරිසරමින් සත්‍වයන්ට අමාමහනිවන් බෙදාදෙමින් මූඑලෝ දහම්වැසි වස්වමින් ධර්මධ්වජ නංවමින් මූඑලෝ සාධුකාරදෙවමින් චින්තාමාණික්‍යයක්සේ වැඩවසන සේක.

එකල අපමහබෝසතාණෝ ශක්‍රදෙවෙන්ද්‍රව ඉපද දෙවියන් පිරිවරා මේ ධම්මදස්සිනම් මහර්ෂීන්වහන්සේ කරා අවුත් දිව්‍යමයවූ පඤ්චාඞ්ගික තූර්‍යඝෝෂාවෙන් හා දිව්‍යපුෂ්ප දිව්‍යචන්දනචූර්ණ දිව්‍යසුගන්ධාදීන් බුදුපාමොක් රහතුන්වහන්සේට පූජාකොට බුද්ධත්වය ප්‍රාර්ථනාකොරෙමින් ඔබගෙන් මේ පසලොස්වන විවරණය ලදහ.

---

* අසූරියන්

එසේහෙයින් කියනලදී—

"සිඬ්ඪකිරණභිධරණී ධරණීභධම්මදස්සීමුනිවරං පවරං,
දිස්වා දුන්දුභිකුසුමෙහි ජිනාය මහී මහිතෙහි සුභදෙ"සි.

තවද ඒ සකලලොක විඝම්තධර්මචක්‍ර ඇති ධර්මදර්ශීනම් බුදුරජාණන්වහන්සේට ඉක්බිතිව බුද්ධශූන්‍යව සූවිසිකල්පයක් ගිය කල්හි මේ කපට සූවානුවන කප එකාම අනධිවරයක්හුගෙන් වරතරව සාරවූ සාරනම් කල්පයෙහි අටාසඞ්ඛ්‍යකල්පලක්‍ෂයක් පාරමිතාපිරූ සර්වලොකාඪ්ඪසිඛිකර සිද්ධාර්ථනම් විපච්චිතඥ සර්වඥයන්වහන්සේ විබුධජන පරිවෘත තුෂිතභවනයෙන් චුතව අවුත් දඹදිව මධ්‍යමණ්ඩලයෙහි සකල සම්පත්තින් භාර වෛභාරනම් රාජධානියෙහි දනමන නුවන් අදන යොවුනෙන් හොබනා උදෙනනම් මහරජහුනිසා මනොඥසම්ඵස්ස සුභස්සානම් බිසවකුසපිළිසිඳදසඑසාඩමසින් බිහිවවැඩිවිය පැමිණ කොකනදය*උත්පලය පදුමය යන තුන්පායෙහි අටසාළිස්දහසක් මනුජ ප්‍රමදාතිකර පිරිවරින් දසදහසක් හවුරුදු මනුජශ්‍රීවිඳ ජනමනසෞමනස්‍යජනක සෞමනස්‍යානම් බිසවකුසින් රූපශ්‍රීන් අනූපමවූ අනුපම නම් පුත්රුවන වැදූ දිනයෙහි රන්සිවි ගෙයකින් මහබිනික්මන් කොට කොල්ලක්‍ෂයක් පුරුෂයන් හා සමග මහණව දසමසක් මහාවීර්‍යකොට බුදුවනදවස් සමස්තාවිභූතින් අසදෘශවූ අසදෘශනම්බමුණුගම මෙවකොන්පලදලාකාර දීගුනෙත්ඇති සුනෙත්‍රානම් බැමිණිය දුන් කිරිපිඬුවලඳ මනොහර තරුනිකරයෙන් සංකීර්ණවූ දෙබරවිපිනයෙහි, දිවාවිහාරකොට සවස්වේලෙහි තරුණවූ වරුණනම් යවපාලයා දුන් කුසතණ අටමිටක් ගෙන කිණිහිරිබෝමූල සලාහෙලා සහළිස්රියන් උස පැනනැගි සමවන්සල පලඟමත්තෙහි බෝකඳට පිටලා වැඩහිඳ පස්මරුන් බිඳ බුදුව සත්සතිගෙවා මහබඹහුගේ අයදමෙන් දයාසහිතව ගයානම්මිගදායෙහිදී දහම්සක්පවත්වා සම්බහුලය සුමිත්‍රය යන අගසව් දෙනමක්ගා සිවලිය සුමනාය යන අග්‍රශ්‍රාවිකාදෙනමක්ඇතිව රෙවතනම් මහතෙරුන්වහන්සේගෙන් උපස්ථානලදින් හවුරුදුලක්‍ෂයකට ආසිරිඇතිව සැටරියන් බුදුබඳින් මුළුලෝ සරහා නවකොළලක්‍ෂයක්රහතුන්පිරිවරා දනවසැරිසරමින් ලෝවැඩවසනසේක.

එකල අපමහබෝසතාණෝ අසුරසෙන් වැනි මහසෙනගඇති සුරසෙනනම්නුවර මඞගලනම් බ්‍රාහ්මණව සියසැපත්දන්දීහිමාලයට ගොස් අභිඥා ලදින් ධ්‍යානසුවයෙන් වසන්නාවූ බුදුන්කරා එල්ඹ බණඅසා පැහැද සෘද්ධිබලයෙන් නොලස්ව ගොස් දඹදිවට සලකුණුවූ සියක්යොදුන් උසඇති මහදඹගස සලා මහදියකලසා

* කොකාසය

දඹ ගෙනවුත් සොළදහසක් රහතුන් පිරිවරකොට ඇති සර්‍වඥ
යන් වහන්සේ දඹ වළඳවා ඔබගෙන් මේ සොළොස්වන විවර
ණය ලදහ.

එසේහෙයින් කියනලදී—

“සිද්ධත්‍ථනාමසම්බුද්ධං දිස්‍වා මඞ්ගලතාපසො,
බොධියා ජම්බුයා දූතං අද්‍දසි සුගතොරසං”යි.

තවද සිද්ධාර්‍ථනම් බුදුරජාණන්වහන්සේට ඉක්බිතිව බුද්ධ
ශූන්‍යවූ කල්පයක් ගියකල්හි මේමහාභද්‍රකල්පයට තොයානුවනවූ
සුගත කනකකුණ්ඩලවයකින් මණ්ඩිතවූ මණ්ඩනම් කල්පයෙහි
සමස්ත ලොකනයනාමෘතරූපශ්‍රී ඇති තිස්සය පුස්සයයි යන
ධර්‍මස්වාමීන් දෙදෙනෙකුන්වහන්සේ ලොවපහළවූසේක. එයින්
අටාසංඛ්‍යය කප්ලක්‍ෂයක් පාරමිතා පිරූ සමස්තලොකාවිස්මය
කළ තිස්සනම් විපච්චිතඥසර්‍වඥයන්වහන්සේ නානාසුරසිරින්
විලසිත තුෂිතභවනයෙන් අවුත් දඹදිව්මැදමඬුල්ලෙහි සමස්ත
නගරශෙඛරයමාණ මෙඛලානම්නුවර සකලලොක ව්‍යාප්ත
කීර්තිප්‍රබන්ධඇති ජනසන්ධවනම් මහරජාණන් නිසා රජකුල
කමලාකරාභිජාතපද්මයක්බඳුවූ පද්මානම් අගමෙහෙසුන් කිසව
කුස පිළිසිඳ දසමසක් ඇවෑමෙන් මව්කුසින් බිහිව වැඩිවිය
පැමිණ ගුහසෙළය නාරිසය නිසභය යන තුන්පායෙහි තිස්දහ
සක් රාජසුන්දරීන්ගේ ගිරාමධුර මධුදයක මුවකමලවිකාසනයෙහි
තරුණදිනකරව සත්දහසක්හවුරුදු රජසිරි විඳ සමස්තලොක
භද්‍රවූ සුභද්‍රානම් කිසවකුසින් පරමානන්දමූර්තිවූ ආනන්දනම්
කුමාරයන් වැදූදිනයෙහි සොනුත්තරනම් තුරඟවාහනයෙන්
මහබිනික්මන්කොට කෙළක්පුරුෂයන් හා සමග මහණව අට
මසක් මහාවීර්‍යයී කොට බුදුවනදවස් වීරපුරුෂ කීර්ති වීරනම්
නියංගම් අමිතගුණසාරවූ වීරනම් සිටාණන් දූ මෙචනම් සිටු
කුමරිය දුන් රසකිරිපිඬුවළඳා ප්‍රවාළපල්ලවානිලසලල සරලවන
යෙහි දවල් වැස සවස්වේලෙහි පාසසඞ්ගාමවිජිතයෙහි චතුර
ඞ්ගිවූ විජිතසංග්‍රාමනම් * යවපාලයාදුන් කුසතණ අටමිටක්
ගෙන ජනප්‍රියදර්‍ශනීයවූ අසනබොධිද්‍රැමමූලයෙහි කුසතණ සළා
හෙලා සනළිස්රියන් උසපැනනැගි වජ්‍රාසනමස්තකයෙහි බෝ
කඳට පිටලා පළක්බැඳ වැඩහිඳ මාරබලබහලපඞ්කාරුණව තුන්
යම තුන්නුවණලැබ අලුයම බුදුව සත්සති ගෙවා බ්‍රහ්මාරාධනා
වෙන් යසවත්නම් මිගදායෙහිද් දහම්සක් විදහා දෙසමින් බ්‍රහ්ම
දෙවය උදය යන අගසව්දෙනමක්හා සුඑස්සාය සුදන්තායයියන
අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇතිව සමභවනම් මහතෙරුන්වහන්සේ
ගෙන් උපස්ථාන විඳ සියක්ලක්‍ෂයක් රහතුන් පිරිවරා ලක්‍ෂයක්

* විජිතසහනම්

හවුරුද්දට ආසිරි ඇතිව සැටපියන් බුදුබදින් තුන්ලෝ බබුළුවා, සත්වයන්ට අමාමහ නිවන් දෙමින් දනව්සැරිසරනසේක.

එකල අප මහබෝසතාණෝ යසවතුන්ට වාසස්ථානවූ යසවත් නම් රජධානියෙහි රජසෘද්ධින් නානාද්භූතසුජාත සුජාත නම් ජනොත්තමව රජසැපත් විඳිමින් පස්කම්හි ලොබහැර මහණව ධ්‍යානඋපදවා වනගෙලෙක්හි වෙසෙමින් දවසෙක බුදුන් සාරා එළඹ බණ අසා පැහැද සද්ධර්මමූර්තිවූ මෙබඳු බුදුන්ට සවශක්තින් පූජාකරන්ට උවමැනවැයි සිතා එකෙණෙහි ශක්‍රභවනයට ගොස් චිත්‍රලතාවනය ඵාරුසකාවනය නඳුන්වනය එකාපුණ්ඩරිකවනයයි යන දිවඋයන්සතරෙහි විසිතුරුව මිණිමුතුදිමුතු පෑහැයෙන් බබළන සුරභිසම්පන්න මූවරදසළාසෙන් යුක්ත පද්මවහනෙල් උපුල්හෙල්මැලි ඇසළ මුහුළුසැලඹ දෙඹකොළඹ පලොල පරසතු කොබෝලීල සලල නා සපු දුනුකේ වැටකේ වැකොඳ ඉද්ද සමන් සෙඵාලිකාදීවූ නොයෙක් මල් බිඳගෙන ගව්වක් පමණ දිගු පුළුල් උසඇතිසාරඹුවෙසා පුරගෙන වියතක් උසපමණ මල්ගොටුවක් ගෙනෙන පුරුෂයකුසේ අයත්නයෙන්ම ගෙනවුත් බුදුන්ගේ ශ්‍රීපාදමූලයෙහි විචිත්‍ර වින්‍යාසයෙන් රුවන්මල් පුදා ඉන්ද්‍රනීලමය නටුවක් ඇතී පද්මරාග මාණික්‍යමයවූ පෙතිපතර ඇති රන්වන්වූ රේණුඇති මරම්ණීමයවූ කොමියක් ඇති මනහරපියුමක්සිරසඩ කුඩයක්සේපුදා ඔබගෙන් මේ සනලොස්වන විවරණය ලදහ.

එසේහෙයින් කියන ලදී—

“දිස්වා තිස්සජිනං සුජාත වතිපො චත්වා සරජ්ජං සිරිං
පබ්බජ්ජායතනෙ වනෙ වසන්ති මෙසාහං සුධාසිපුරං,
ගන්ත්වානෙකසුපුප්ඵපූරිතවරං චංගොටකං යොජනං
නෙ ත්වා පූජමකාසි සුද්ධවනසා සම්බොධි සං සිද්ධියා”යි.

තවද සමස්තභුවනභ්‍යන්තරවූ තිස්සනම් බුදුන්ට ඉක්බිති බුද්ධාන්තරයක් ගියකල්හි ඵුස්සනම් ධර්මස්වාමීන්වහන්සේ සමතිස් පෙරුම් පුරා වෙසතුරු අත්බැවින් චුතව බුදුන් දෙවෙනිදා විසිමට නිසිවූ තුසීපුරවිසීමෙන් ස්වර්ගවාසීසිමන්තිනිශ්‍රේණීන්ගේප්‍රණිපාතනයෙන් නිරතුරුවූ දිවසැපත් විඳ දෙව්බඹුන් අයදමෙන් මහපස් බැලුම් බලා කල් දැන එයින් අවුත් දඹදිව මැද අමරපුර සදෘශ කාසිනම් නුවර පිල්මල් විජිත සෙනාපිරිවර ජයසෙන නම් ජගදීශ්වරයාණන් නිසා සිරිමතී නම් අගබිසව කුස පිළිසිඳ දසඑකඩමසින් බිහිව වැඩිවිය පැමිණ ගරුළපක්ෂිය හංසය සවණි

වාරය යන තුන්පායෙහි තිස්දහසක්පුරඟනන් පිරිවරා දසදහසක් හවුරුදු රජසිරි විඳ කිසාගොතමීනම් අගබිසව කුසින් අනුපමනම් පුත්රුවනවැදූදිනයෙහි ඉන්ද්‍රනීලශෛලාද්‍රිසන්නිභ සුභද්‍ර ගජේන්ද්‍රාරොහණයෙන් මහභිනික්මන්කොට කෙළක්පුරුෂයන් හා සමග මහණව සමසක් මහාවීර්‍ය්‍ය කොට බුදුවන දවස් ශ්‍රීවර්ධනානම් සිටුදුව දුන් රසකිරිබත් වළඳා ඉංසළු වෙනෙහි දහවල් වැස සවස ශ්‍රීවර්ධනනම්තපස්විහු දුන් ගිතණ අටමිටක් පිළිගෙන ඵලපල්ලවමලින් විපුලවූ ඇඹුල්බෝතුරුමූල්හි සලා වගුරුවා එතනින් මිහිමඬල දෑදුරුකර පැනනැඟි අටතිස්රියන් උසඇති තණ ඇතිරිමුදුනෙහි බෝකඳටපිටලා වැඩහිඳ පස්මරුන් බිඳ බුදුව සත්සති ගෙවා බඹහුගේ අයදමෙන් ඉසිපතන නම් මිගදායෙහි වැඩහිඳ දහම්සක් පවත්වා සුරක්ෂිතය ධර්මසෙනයයි යන අගසව් දෙනමක් හා චාලාය උපචාලායයි * යන අග්‍ර ශ්‍රාවිකා දෙනමක් ඇතිව සභියමහතෙරුන්වහන්සේගෙන් උපස්ථාන විඳ අනූදහසක් හවුරුද්දට ආසිරි ඇතිව අටපණස් රියන් උස බුදුබඳින් බබලමින් කෙළලක්ෂයක් රහතුන් පිරිවරා දනව් සැරිසරනසේක

එකල අප බෝසතාණෝ ශත්‍රුකුජරවිජයෙහි ප්‍රඛ්‍යාතවූ විජිතාවී නම් රජව බුදුන්හාරඑළඹ පසඟ පිහිටුවා වැඳ බණ අසා පහන් සිත් ඇතිව මහදන්දී තමන්ගේ චක්‍රවර්තිරාජ්‍යය බුදුරජාණන්වහන්සේට පුදා සසුන් වැද මහණව ත්‍රිපිටක ධර්මයෙහි කොටිප්‍රාප්තව ධර්මකථිකව ප්‍රතිපත්තියෙන් ප්‍රසිද්ධව බුදුබව පතා ඔබගෙන් මේ අටළොස්වන විවරණය ලදහ.

එසේහෙයින් කියනලදී.

"සුදස්සනීයං මුනිවුංසසනාදං
ජිනාය දිස්වා විජිතාවිභූමිපො,
සුපූජයිත්වාන සරජ්ජසම්පදං
පසන්නචිත්තො හ අකාසි පත්ථනං"යි.

තවද සමස්තලොකදර්ශීනියවූ ඵුස්සනම් බුදුරජාණන් වහන්සේට ඉක්බිතිව එකාම කල්පයක් ගියකල්හි මේමහාභද්‍රකල්පයට එකානූවන සර්වගුණසාර සාරනම් කල්පයෙහි සර්වාර්ථදර්ශීවූ විදර්ශී නම් බුදුරජාණන්වහන්සේ සමතිස්පෙරුම්පුරා විසිතුරුවූ තුසිතපුරයෙන් අවුත් දඹදිව ප්‍රතිදිනප්‍රභාස්වර සර්වරත්නසිද්ධ බන්ධුමතීනම් රාජධානියෙහි අමන්දබන්ධු බන්ධුමතීනම රජහු තිසාකුන්දබන්ධුරානන න බන්ධුමතීනම් බිසවකුස පිළිසිඳ දසඑකාඩමසින් බිහිව වැඩිවිය පැමිණ නන්දය සුනන්දය සිරිමන්දයයි යන තුන්පා

* මාලාය උපමාලාය

යෙහි එක්ලක්‍ෂවිසිදහසක් පුරඟනන්පිරිවරා අටදහසක් හවුරුදු රජසිරි විඳ සව්ජනප්‍රියනුත්තන ජූහනුඇති සුතනුනම් අගබිසව කුසින් කනකස්කන්ධයක්වැනි සමවත්තක්ඛන්ධනම් පුත්‍රරුවන වැදූදිනයෙහි චතුරතර තුරඟයොජිත පූර්ණමනොරථ රථවා හනයකින් මහබිනික්මන්කොට සුවාසූදහසක් පුරුෂයන් හා සමග මහණව අටමසක් මහාවීය්‍යකොට බුදුවන දවස් සුදසුන් පිරිවැරූ සුදසුන් නම් සිටුදූව දුන් මිහිරි කිරිබත වළඳා විමල් සල්වෙනෙහි දහවල් වැස සවස ගුණාභිජාත සුජාත නම් යවපා ලයා දුන් කුසතණ අටමිටක්පිළිගෙන අතිසුනිල්වූ පළොල් බෝ මුල්හි කුසතණ සලා හෙලා තෙපණස්රියන් උස පැනනැගි තණපලහමැද පලක් බැඳ වැඩහිඳ මාරකිරකුරරාකාර දක්වා ලොවුතුරා බුදුව සත්සති ගෙවා බඹහුගේ අයදමෙන් මිහිදිගු නෙත පැලඳි මෙඛලාවක්වැනිවූ මෙඛලා නම් * මිගදායෙහි දම්සක් පවත්වා ඛණ්ඩය තිස්සයයි යන අගසව් දෙනමක්හා චන්ද්‍රාය චන්ද්‍රමිත්‍රායයි යන අග්‍රශ්‍රාවිකාදෙනමක් ඇතිව අසොකනම් මහ තෙරකෙනෙකුන්වහන්සේගෙන් උපස්ථාන විඳ අවට අටවිසි ගව්වක් තැන් ඛ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් එකප්‍රභාකොට අටාසූරියන් බුදුබදින් තුන්ලෝ බබුළුවා සුවාසූදහසක් රහතුන් පිරිවරා අසූදහසක් හවුරුද්දට ආසිරි ඇතිව සත්වයන්ට අමාමහ නිවන් දෙමින් දනව් සැරිසරා වැඩවසනසේක.

එකල අපමහබෝසතාණෝ යසසින් විපුල අතුලනම් දිව්‍ය නාගරජව ඉපද කොළගණන් දිවනයින් පිරිවරා බුදුන් ලඟට අවුත් උනු පණස්යොදුන් පමණ රුවන් මඩුවක් මවා සපිරිවර බුදුන් එහිසතපා සත්දවසක් දිවඅහර දන්දී මනහර මිණිපළිඟක් පුදා ලොවුතුරා බුදුබවට ප්‍රාර්ථනාකොට ඔබගෙන් මේ එකුන්විසිවන විවරණය ලදහ.

එසේහෙයින් කියනලදී—

සුදස්සනෙරුවිරංවිපස්සිමාරජං
මහිද්ධිකො අතුලතුලොරගාධිපො,
මහග්ඝිකං රතනමයං ච මණ්ඩපං
අදාසි දත්වාඑලකබොධිසිජ්ඣිතුං"යි.

තවද ඒධර්මවිභාගදර්ශිවූ විදර්ශිනම්සම්‍යක්සම්බුද්ධරාජොත්තමයාණන්වහන්සේට ඉක්බිතිව නවපණස්කල්පයක්ගියකල්හි මේ භද්‍රකල්පයට එක්තිස්වනබුද්ධාන්තරයකින්මණ්ඩිතවූ මණ්ඩනම්

* ඛෙම්නම්

කල්පයෙහි අනල්පකල්පකාලයක් අපමණගුණයෙන් ප්‍රකටව සම
තිස් පෙරුම් පුරා කෙළවැමිණි කෙලශකානනදහනසිඛිවූ සිඛිය
වෙස්සභූ යයියන සර්වඥදෙදෙනෙකුන්වහන්සේ මේලොව පහළ
වූසේක එයින් ජනමනරුගොරගසිඛිවූ සිඛිනම් බුදුරජාණන්ව
හන්සේ සමතිස් පෙරුම්පුරා කුශලඵලප්‍රදානයට තිසිවූ තුසිපුර
යෙන් අවුත් දඹදිව තරුණජනසඞ්කීර්ණ අරුණවතීනම් නුවර
දිගුවිතත තෙජසින් අරුණවර්ණ අරුණවතීනම් ධරණීශ්වරයා
ණන් නිසා පතළ සිලොක ප්‍රභාඇති ප්‍රභාවතීනම් බිසවකුස පිළි
සිඳ දසඑකඩමසක් ඇවෑමෙන් මව්කුසින් බිහිව වැඩිවිය පැමිණ
තුන්සෘතුවට සුදුසුවූ චන්ද්‍රකාය සිරිගිරිය වසභය යන තුන්මාලිග
යෙහි සුවිසිදහසක්පුරඟනන්ගේ මුවනඹරනඳ කළසරුහිරුමඬල
මෙන් සත්දහසක් අවුරුදු රජසිරිවිඳ රූපලාවණ්‍යගුණොපෙත
සර්වකාමානම් අගබිසවකුසින් සර්වගුණවිපුල අතුලනම්පුත්රුවන
වැදූදිනයෙහි සරුජරුජ ප්‍රජාපාලනප්‍රවීණගජරුජාරොහණයෙන්
මහබිනික්මන්කොට නිවට කරපුටෙන් වෙතට පත් අටපිරිකර
මූනවට පිළිගෙන නරභටාඞ්කොටියක් හා සමග මහණව අටම
සක් මහාවියර්කොට බුදුවනදවස් ජනමනො නයන සුදශීන සු
දශීනනම් නියංගම සකලජනප්‍රියදර්ශිවූ ප්‍රියදර්ශිනී නම් සිටුදුව
දුන් මිහිරි කිරිපිඬු වළඳා නයනනෘත්‍යකායන්ට නෘත්‍යමඤ්ජිර බදි
රාරණ්‍යයෙහි දිවාවිහාරකොට දිනකර අවරගිරුසනනවූකල්හි
අනොමදශීනීයවූ අනොමදර්ශිනම් තාපසයන් දුන් හිතණ අට
මිටක් පිළිගෙණ බෝමැඩට ගොස් සකලකෙලශමෘගපුණ්ඩරීකවූ
පුණ්ඩරීක බොධිමූලයෙහි කුසතණ සලාවගුරුවා පොළොව පළා
පැනනැගි සුවිසිරියන්උස විදුරසුන් මුදුනෙහි බෝකදට පිටලා
වැඩහිඳ මාරබලනෙළුඹුදලිභෙදයෙහි මහාවරුහ විලාසදක්වා
ලොවුතුරුබුදුව සප්තාහාතික්‍රාන්තකොට බ්‍රහමාරාධනාවෙන් සුපු
ෂ්පිත අගාචිත මිගාචිතනම් උයන්හි දම්සක් පවත්වා අභිභූය
සම්භවය යන අගසව්දෙනමක් හා මඛිලාය පියුමායයි යන අග්‍ර
ශ්‍රාවිකාදෙනමක්ඇතිවක්‍ෂෙමකාරකමහතෙරුන්වහන්සේගෙන්
උපස්ථානවිඳ සැත්තෑ දහසක් රහතුන්වහන්සේපිරිවරා සැත්තෑ
දහසක් අවුරුද්දට ආසිරිඇතිව සියලහරුසින් දෙලොස්ගව්වක්
අඳුරු දුරුකොට සැත්තෑරියන් උස බුදුබඳින් මුළුලෝ බබුළුව
මින් සකලසත්වයන්ට නිවන්අමා බෙදදෙමින් සාධුකාරදෙවමින්
ජනපදචාරිකායෙහි වඩනාසේක.

එකල අප බෝසතාණෝ සකලසමෘඞින් විභූෂිතවූ අපරි
හුතනම් නුවර පරමතරසිරින් පුරිඳුදසුරු අරින්දමනම් රජව බු
දුන් කරු එළඹ බණඅසා පිරිවරසහිත බුදුන් පවරා සත්දමසක්
මහදන්දී අනගි සළුපිරිකර පිළිගන්වා නොයෙක් හස්ත්‍යලංකාර

යෙන් මඟුලැතු සරහා බුදුන්ට පූජාකොට ඔහු උසට කැපබඩු ගොඩකොට දන්දී බුදුබව පතා ඔබගෙන් මේ විසිවනවිවරණය ලදහ.

එසේහෙයින් කියනලදි—

"සන්තකන්තමකරන්දවන්ත සිබිසඤ්ඤකඤ්ජමනිසොභිතං
දස්සනෙ ච රසභොජනෙ ච පචුරම්බරෙ ච වරචීවරෙ,
නෙකකොටිරතනෙන භූසිතිභරාජදන්තදන්තෙන සො
බොධියා සු පණිධිං අකාසි වරභූපතිඳමිතිරිඳමො"යි.

තවද ඒ සිබිනම් සර්වඥයන්වහන්සේට ඉක්බිති එම කප වෙස්සභූනම් සයම්භූ දිපදෙන්ද්‍රමයාණන්වහන්සේ විසිතුරු තුෂිතපුරයෙන් අවුත් දඹදිව සව්සිරින් අනොපමවූ අනොපමනම් නුවර ප්‍රතිමල්ලවසුමතිපතීන් මන්මථනයකොරෙමින් සුප්‍රතීත සුප්‍රතීතනම් මහරජහු තිසා යසවතීන් පිරිවැරූ යසවතීනම් අගමෙහෙසුන් බිසවකුස පිළිසිඳ දසළුසඩමසින් බිහිව වැඩිවියපැමිණ රුචිය සුරුචිය රතිවඞ්නයයි යන තුන්සෘතුවට සුදුසුවූ තුන්පායෙහි තිස්දහසක් පුරඟනන් පිරිවරා දසදහසක්අවුරුදු රජසිරිවිඳ විචිත්‍රවූ සුචිත්‍රානම් අගබිසවකුසින් රජකුලකමලකානනසුප්‍රබුඩ සුප්‍රබුඩනම් අත්‍රජොත්තමයා ජාතදිනයෙහි රන්සිවිගෙයකින් මහබිනික්මන් කොටසැත්තාදහසක්අමාත්‍යවරුන්හාසමග මහණව සමසක් ප්‍රධන්වියර්කොට බුදුවනදවස් විචිත්‍රශ්‍රීන් බබළන සුචිත්‍රනම් නියංගම පිරිතුඩුකිතු ඇති සර්වඥනම් නාමෙණේවිය දුන් මිහිරි කිරිබතවළඳ එලපලලවමල්හි ලොල්වූ කලඳක වලිමූඛකොවුලුසාළිකාදීන්ගේ රාවප්‍රතිරාවයෙන් කණ්රසායන වූ සාලවනොද්‍යානයෙහි දිවාවිහාරකොට සුරෙන්ද්‍රශ්‍රීධර නරෙන්ද්‍රනම් නාගෙන්ද්‍රයා දුන් හිතන අටමිටක් පිළිගෙණ අපරාජිත ස්ථානයට ගොස් සාලබෝධිමූලයෙහි කුසතණ සලා හෙලා සතළිස්රියන් උස පැනනැඟි විදුරසුන් මුදුනෙහි බෝකඳටපිටලා වැඩහිඳ මාරවික්‍රමකර්පූරප්‍රාප්ත ජාතවෙදතෙජසින් දීප්තිමත්ව ලොවුතුරාබුදුව සත්සතිගෙවා බඹහුගේ අයදමෙන් තරුණතරුනිකරාකීර්ණ වරුණනම් උයන්හි දහම්සක් පවත්වා සොණය උත්තරයයි යන අගසව්දෙනමක් හා දමාය සුදමායයි යන අග්‍රශ්‍රාවිකාදෙනමක් ඇතිව් උපශාන්තනම් මහතෙරුන්වහන්සේගෙන් උපස්ථාන විඳ සැත්තෑදහසක් රහතුන්වහන්සේ පිරිවරා සැටදහසක් අවුරුද්දට ආසිරි ඇතිව සැටරියන් බුදුබඳින් මුළුලෝ සරහා සත්වයන් අමාමහනිවන් දක්වමින් දනව් සැරිසරා වැඩවසනසේක.

එකල අප මහබෝසතාණෝ සුදර්ශනශ්‍රී ඇති සුදර්ශනනම් රජව බුදුපාමොක් මහරහතුන්වහන්සේ පවරා චීවර ආහාරදානයෙන් යුක්තව ශ්‍රී ගන්ධකුටියක් ද එහි අවට විහාරදහසක් ද කරවා බුදුපාමොක් මහසඟපිරිසට පිළිගන්වා සියලු රජසැපත් හැර මහණව ඔබගෙන් මේ එක්විසිවන විවරණය ලදහ.

**එසේහෙයින් කියනලදී—**

'දිස්වාන වෙස්සභූ සයම්භූ සයම්භූ රාජං
රාජා සුදස්සන සුදස්සන චක්කවත්ති'
වත්තනම්බුජ ච මනකොමුද බොධසිද්ධා
සම්බොධියාමදදි නෙකාමුදුරදූතං''යි.

තවද සමස්තභූතනාථවූ වෙස්සභූනම් සයම්භූබුදුරජහට ඉක්බිති විසිනවකල්පයක් ගියකල්හි මතුබුදුවන මෛත්‍රෙය බුදුන් ඇතුළුව පස්බුදුකෙනෙකුන්වහන්සේගෙන් සුභද්‍රවූ මේ මහාභද්‍රකල්පයෙහි පළමුවන අතුරුකපජනානන්ද කකුසඳනම් බුදුහුය දෙවන අනන්තඃකල්පයෙහි අප්‍රමාණ ගුණාභරණභූෂිත කොනාගමන නම් ජිනොත්තමයාණන්වහන්සේය තුන්වන අනන්තඃකල්පයෙහි සකලකාශ්‍යපීනාථ කාශ්‍යපනම් දසබලධාරීන්වහන්සේය සතරවන මේඅතුරුකප සෞම්‍යගුණයෙන් සුන්දරවලෙව්. තමනතුකළ ගෞතමනම් අපගේ සුගතොත්තමයාණන්වහන්සේය පස්වන අනන්තඃකල්පයෙහි මෛත්‍රී චරිත ඇති මෛත්‍රෙයනාථයෝ බුදුකුරුදම් පුරා මුදුන්පැමිණ බුදුවන්ට එනලෙස දවස් ගෙන තුසීපුරයෙහි දැන් කල් බලා වසන්නාහුය මේ බුදුවරයන් අතුරෙන් මෙම කප ප්‍රථම අනන්තඃකල්පයෙහි ජනිතවූ සසඳසත්සඳනදදුන් කකුසඳනම් මුනීන්ද්‍රයාණන්වහන්සේ සමතිස්පෙරුම් පුරා මුදුන් පැමිණ අමන්දවිබුධ ජනාවාස ප්‍රාසාදපන්තීන් ප්‍රභාවිස්තෘත තුෂිතභවනයෙහි අපරිමිත රූපසොභාසම්පන්නන සුරසුන්දරීන්පිරිවරා දිව්සිරි විඳ සුරබඹුන්ගේ අයදමෙන් ලොක විලොකනය කොට දඹදිව මැද පිහිටි ජනනෙත් මේතුටුමේකල්වැනි මේඛලානම් නුවර නිජතෙජසින්ජනක්ෂෙම පජරවූක්ෂෙමනම් මහරජාණන්ගේ පුරොහිතවූ පරමන්ත්‍රණවිජිතාග්නිදත්ත අග්නිදත්තනම් ද්විජොත්තමයාණන්නිසා ශශාඞ්කමුඛසොභාසම්පන්න විශාඛානම් බැමිණි දෙවීන්කුස පිළිසිඳ දසමාසාවසානයෙහි මව්කුසින් බිහිව යොවුනෙන් යෙදී කාමය කාමවණ්ණීය කාමසුඛියයි යන තුන්පායෙහි තිස්දහසක් නාටකවෙටිකාවන්ගේ වෙණුවීකාවකොරශ්‍රෙණීන් රූපාමෘතකාන්තීන් පානයකරවා සාරදහසක්හවුරුදු රජසිරි විඳ රූපයෙන් විරොචමාන රොචනීනම් අගබැමිණිදියණියන් කුසින් නිරුත්තරාඞ්ගසම්පත් ඇති උත්තර නම් පුත්රුවන වැදූ

දිනයෙහි රජනිකරරුචිවරාජිතවාජීන් යොජ්‍ය විග්‍රහදරථනිශ්‍රා ශ්‍රිත රථාරූඪව අභිනිෂ්ක්‍රමණයෙන් සතළිස්දහසක් පුරුෂයන් හා සමග මහණව අටමසක් මහාවීර්‍යකොට පුරඳුරපුර සිරිඅනු රුසුවිධරනම්ගම සචෛජ්‍රියප්‍රාසාදවහ වජ්‍රෙජ්‍රියනම්බැමිණිය දුන් රසකිරිබත වලඳා වනසිරින් මිහිකිරි කිහිරිවෙනෙහි දිවාවි හාරකොට දිවසාවසානයෙහි ගුණසුභද්‍ර සුභද්‍රනම් යවපාලයා දුන් තිතණ අටමිටක් පිළිගෙණ බෝමැඩට ගොස් මාරාරිමහරි බෝතුරා මූල්හි සලා හෙලා එතැන්හි මිහිඳුදුරු කාර පැනනැඟි සූහිස්රියන් උස විදුරසුන්මුදුනෙහි බෝකඳට පිටලා වැඩහිඳ පචමාරපාරාවාලප්‍රලය දිනකරශ්‍රීන් දීප්තිමත්ව ලොවුතුරාබුදුව සත්සති ගෙවා බඹයදුමගෙන ඉසිගණපතනොත්පතන ඉසිපතු න උයන්හි දහම්සක්පවත්වා විධුරය සඤ්ජීවයයි යන අගසව්දෙ නමක් හා සාමාය උපසාමායයි යන අග්‍රශ්‍රාවිකාදෙනමක් ඇතිව බුඩජාතනම් මහතෙරුන්වහන්සේගෙන් උපස්ථාන විඳ සතළිස් දහසක් රහතුන් පිරිවරා සතළිස් දහසක් අවුරුද්දට ආසිරි ඇති ව සතළිස්රියන් බුදුබදින් නිගිතවූ බ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් අවී ට සතළිස්ගව්වක් පමණ තැන් අඳුරු දුරුකොට මුළුලොවට නි වන් අමා බෙදදෙමින් වැඩවසනසේක.

එකල අපමනබෝසතාණෝ ක්ෂෙමනම්රජව සතළිස්දහසක් රහතුන්පිරිවරා වැඩසිටි නරොත්තමයාණන් වහන්සේට අඳුන් ආදිවූ බෙහෙත් බඩු හා තවුස්පිරිකර හා සමග සතළිස්දහසක් සිවුරුපිරිකර දන්දී සසුන්වැද මහණව බුදුබවපතා ඔබගෙන් මේ දෙවිසිවන විවරණය ලදහ.

ඒසේහෙයින් කියනලදි—

"සම්බුධං කකුසන්ධසුන්දරතනුං සිඛිගිව ගං සන්නිභං
දිස්වා ඛෙමනරාධිපො ධනමහග්ඝං පත්තචීවරොසධං,
දත්වා දනමනුත්තරං පණිධියා සම්බොධියා සාදරං
හිත්වා සාරසරජ්ජසම්පදසභොගං පබ්බජිත්වබ්භුතං"යි.

තවදම්දුනාවූ භවබන්ධන ඇතිකකුසන්ධනම් ධර්මරාජයාණන් වහන්සේටඉක්බිතිමෙමකපදෙවනඅතුරුකපපපචබාණමානමදින ජනතානභූතකොනාගමනනම්බුදුරජාණන්වහන්සේසමතිස්පෙ රුම්පුරා ත්‍රිජ්ජරතිකරප්‍රසාදවහ තුෂිතභවනයෙන් අවුත් දඹදිව ශොභාවත්වූ ශොභාවතීනම්නුවරඅතිප්‍රාඥවූයඥදත්තනම් බ්‍රාහ්ම ණයාණන් ත්සා තිරුත්තර උත්තරානම් බැමිණිවනිතාවන්කුස පිළිසිඳ දසළුකාඩමසින්බිහිව මුළුලොව සත්රුවන්වැසිවස්වා වැඩි වියපැමිණි තුෂිතය සනතුෂිතය සන්තුෂවයයියනතුන්ප්‍රාසාදයෙ හි සොළොස්දහසක්සුරඟනන්වැනි පුරඟනන්ගේචිත්තකෙරව

කාන්තප්‍රබොධයෙහි ශරත්ශාර්වරීන්ද්‍රයක්හුමෙන් කීර්තිකාන්තින් මුළුලොව ධාවල්‍යකිරීමෙන් රජශ්‍රී විඳ රූපසිංහස්නෙහ කානක පාත්‍රවූ රුචිගාත්‍රා නම් බැමිණිදෙවින් කුසින් පරාර්ථසවා ර්‍යාංග සවාර්ථවාංගනම් පුත්‍රරත්නය ජාතදිනයෙහි අමිතපරාක්‍රම පඤ්ජර කුඤ්ජරවාහනයෙකින් මහබිනික්මන්කොට තිස්දහසක් පුරුෂයන්හා සමග මහණව සමසක් මහාවීර්‍යයකොට බුදුවන දවස් තරුණජනනයන පාශයෙන් විරක්තසෙනවන් අගහිසෙනානම් බැමිණිය දුන් කිරිපිඩු වලඳා රුචිරතර කිහිරිවෙනෙහි දිවාවිහාරකොට හිරු අවරගිරු සනහවූකල්හි එතනින් නික්ම ක්ෂාන්තිකාඞ්ක්ෂවූතධර විනුතනම් * යවපාලයා දුන් කුශතණ අට මිටක් පිළිගෙන බෝමඩ කරා ගොස් මෙචකමෙඝසාදම්බචුම්බිත රජත පර්වතයක් මෙන් සාඩම්බරවූ දිඹුල් බෝමූල්හි කුසතණ සලාඟෙලා ධරණිතල පලානැගි විසිරියන් වීදුරසුන් මුදුනෙහි බෝසාඳට පිටලා මාරවික්‍රමගවපදෛදකශොෂණයෙහි නවිශාම් පනිහු මෙන් වැඩහිඳ බුදුව සත්සතිගෙවා බ්‍රහ්මාරාධනාවෙන් වන සිරින් විසිතුරු ඉසිපතන නම් උයන්හි දහම්සක් පවත්වා සම්බහුලය උත්තරයයි යන අගසව් දෙනමක් හා සමුදූය උත්තරායයි යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇතිව සොත්ථිජන නම් මහතෙරුන් වහන්සේගෙන් උපස්ථාන ලදින් තිස්දහසක් රහතුන්වහන්සේ පිරිවරා තිස්රියන් උස බුදුබඳින් මුළුලෝ බබුළුවා තිස් දහසක් අවුරුද්දට ආසිරි ඇතිව අමාමහ නිවන්පුරදොරගැර සියලු සත්වයන් නිවන්පුර පුරවමින් දහවී සැරිසරනසේක.

එකල අපමහබෝසතාණෝ සකල නගරාඞගසම්පත්තින් අසිපිලවූ මිපිලානම් පුටභෙදනයෙහි ප්‍රතිරාජවරවාරණනිවාරණානන පර්වත නම් ධරණීශ්වරව බුදුන් කරා ගොස් බණ අසා පැහැද බුදු පාමොක් මහරහතුන් පවරා තුන්මසක් දන්දී වස් අන්තයෙහි එක්තිස්දහසක් සළුපිළිකර පිළිගන්වා මනහරමිරිවැඩිසහලක් බුදුන්ටපුදා ඔබගෙන් මේ නෙවිසිවන විවරණය ලදහ.

එසේහෙයින් කියනලදී.

“නානබ්භූත ඤාණං ජන තාතං සොණාගමනං නාමභිජාතං
දිස්වා නරපො පබ්බතනාමො ජේනායද දා සම්බරභාරං’යි.

නවද ඒ ජනනාථ සොණාගමන නම් ජනොත්තමයාණන්වහන්සේට ඉක්බිති මෙම මහාභද්‍රකල්පයෙහි තුන්වන අතුරුකප ලොකාකාඤ්ජනීවිකාසිත සප්තාශ්වසන්නිභ කාශ්‍යප නම් සර්වඥයන්වහන්සේ විබුධසිරිනිකරයෙන් විශිෂ්ටවූ තුෂිතභවනයෙන් අවුත් ධාරාධරශ්‍රෙණී සන්නිභ ප්‍රාසාදපන්තීන් පරමරමණීයවූ බාරාණසීනම්පුරප්‍රවරයෙහි බ්‍රහ්මචාරිජනොපශොභිතබ්‍රහ්මදත්ත

* තිඤ්ඤුක නම්

නම් බ්‍රාහ්මණයාණන් නිසා අති ධනවත්වූ ධනවතී නම් බැමිණි දෙවින් කුස පිළිසිඳ දසඑළඹමසින් බිහිව යෞවනප්‍රාප්තව හංස වන්නය යසවන්නය සිරිවන්නයයි යන තුන්පායෙහි සුරසුන්දරීන් වැනි පුරසුන්දරීන්ගෙන් උපස්ථාන විඳ දෙදහසක් අවුරුදු රජසිරි විඳිමින් ජනනන්ද සුනන්ද නම් බැමිණිදියණියන් කුසින් පාපවිහ හසෙන විජිතසෙන නම් පුත්‍රරත්නය ජාතදිනයෙහි වැඩහුන් මහපහයෙන් මහබිනික්මන්කොට සියක්ලක්ෂයක් පුරුෂයන්හා සමග මහණව සත්දවසක් මහාවියයීකොට බුදුවන දවස් එම සුනන්දනම් බැමිණිවතිතාවන් දුන් මිහිරිකිරිපිඩු වළඳා ඔඩබර වෙනෙහි දිවාවිහාරකොට සවස එතනින් නික්ම බුදුගුණයෙහි සොම්නස්වූ සොම්නස් නම් යවපාලයා දුන් කුසතණ අටමිටක් පිළිගෙන බෝමඩ කරා ගොස් අනගි තුගබෝමුල්හි කුශතණ සලාහෙලා පසළොස්රියන් උස පැනනැඟි විදුරසුන් මුදුනෙහි බෝසාදට පිටලා වැඩහිඳ මාරබල සාමලකාකනානතර නීලවලා හසා විලාශයෙන් දශදික් බබුළුවා ලොවුතුරුබුදුව සත්සතිගෙවා බ්‍රහ්මාරාධනාවෙන් අනවරතානුචරිත මිගාචිගනම් ඉසිපතන උයන්හි දහම්සක් පවත්වා තිස්සය භාරවාජයයි යන අගසව් දෙනමක් හා උරුළාය උරුවෙලායයි යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇතිව සවි චිත්‍ර නම් මහතෙරුන්වහන්සේගෙන් උපස්ථාන විඳ විසිදහසක් අවුරුද්දට ආසිරි ඇතිව විසිරියන් උස බුදුබඳින් මුළුලොව සරහා විසිදහසක් රහතුන් පිරිවරා සියලු සත්වයන්ට බණවදරා සාධුකාර දෙවමින් ඔවුන්ට අමාමහනිවන් ර දෝ හැර වැඩවසන සේක.

එකල අපමහබෝසතාණෝ සකලගුණජොතිපාලවූ ජොතී පාල නම් බමුණුව සකල ශාස්ත්‍රයෙහි අච්චාරියවූ ආචාරීව වසනු වෝ ඝටීකාරනම් අනාගාමි කුම්භකාරයාණන්ගේ සහායයෙන් බුදුන්කරා එළඹ බණ අසා බ්‍රාහ්මණ සැපත් හැර මහණව පිටක ත්‍රයෙහි කෙළ පැමිණ ප්‍රතිපත්තියෙන් බුදුන් පුදමින් බුදු බව පතා ඔබගෙන් මේ සූවිසි වන විවරණය ලදහ.

එසේහෙයින් කියනලදි-

"දිස්වා කාස්සප සම්බුද්ධං ජොතිපාලො මිජො තදා,
පබ්බජිත්වාන ජෙතාය පූජෙසි පටිපත්තියා"යි.

මෙතෙකින් මේ සද්ධර්ම රත්නාකරයෙහි
බුද්ධාදි අෂ්ටවිධබොධිසත්වයන්ගේ අභිනීහාරසඞ්ග්‍රහ කථා නම්වූ

## දෙවන පරිච්ඡේදය.

කියා නිමවන ලදී.

# තුන්වෙනි පරිච්ඡෙදය.

---

## කවද මේ සර්වඥ රත්නාකරයෙහි
## දශපරමාර්ථපාරමිතා සංග්‍රහකථා නම් කවරහයක්?

මෙසේ අපමහබෝසත්තාණෝ බුදුබවපතා සතාසඞ්ඛ්‍යෙය කප්ලක්ෂයක් මනොප්‍රණිධානයපුරමින් නවාසඞ්ඛ්‍යෙයකප්ලක්ෂයක් වාක්ප්‍රණිධානය පුරමින් සාරාසඞ්ඛ්‍යෙයකප්ලක්ෂයක් කාය වාක් ප්‍රණිධානය පුරන්නාහු දීපඞ්කරපාදමූලයෙහිපටන් ලොවපහළවූ මේ සූවිස්සක් පමණ බුදුවරයන්වහන්සේ දක සූවිසි පූජාවක් කොට මේ උතුමා මතු බුදුවන්නේයයි යන සූවිසි විවරණයක් ලැබ ඒ ලත් විවරණයටම සුදුසු ලෙස ඇස් ඉස් මස් ලෙහෙ පුත්‍රදාරාදීවූ උපභොගපරිභොගසම්පත් දන්දීමෙන් ඛදිරඞ්ගාර ජාතකාදීවූ නොයෙක් ජාතියෙහි පිරූවාවූ දානපාරමිතාය දාන උපපාරමිතාය දානපරමාර්ථපාරමිතායයි යන දාන පාරමිතාව ත්‍රිවිධාකාරයෙකින් මුදුන්පත්කොට; තවද භූරිදත්තජාතකාදීවූ නොයෙක් ජාතියෙහි අඛණ්ඩකොට පුරනලද්දාවූ ශීලපාරමිතාය ශීල උපපාරමිතාය ශීලපරමාර්ථපාරමිතායයි ශීලපාරමිතාවද ත්‍රිවිධාකාරයෙන් පුරමින් මුදුන්පමුණුවා; තවද චූලසුතසොම ජාතකාදීවූ නොයෙක්ජාතියෙහි අපමණවූ රත්රුවන් දාසිදාස් ගවමහිෂාදීවූ මහත්රාජ්‍ය සම්පත්තිය අලුයම දමූ කෙළපිඩුසේ සලකා බුද්ධත්වයම පතා පුරන ලද්දාවූ නෛෂ්ක්‍රම්‍යපාරමිතාය නෛෂ්ක්‍රම්‍යඋපපාරමිතාය නෛෂ්ක්‍රම්‍ය පරමාර්ථපාරමිතායයි මෙසේ නෛෂ්ක්‍රම්‍යපාරමිතාවද තුන්ප්‍රකාරයකින් පරිපූර්ණකොට; තවද සත්තුභත්තජාතකාදිවූ නොයෙක් ජාතියෙහි නුවණින් අගපැමිණි සත්වයන් සිතුවාවූ චිත්තය මේයයි දිවසින් දක්නාමෙන් නුවණැසින්ම විදහා මේ මේයයි දක ඔවුන්හද උභය ලොකාර්ථසිද්ධියෙන් සතුටුකොට තමාගේ අභිමත ප්‍රාර්ථනාව මුදුන්පත් කරණු සඳහා පිරූවාවූ ප්‍රඥාපාරමිතාය ප්‍රඥාඋපපාරමිතාය ප්‍රඥාපරමාර්ථපාරමිතායයි මෙසේ ප්‍රඥාපාරමිතාවද ත්‍රිවිධාකාරයෙකින් මස්තකප්‍රාප්තකොට; තවද මහාජනකජාතකාදිවූ නොයෙක් ජාතියෙහි වෙනකෙනෙකුන් කරන්නානබා සිතින් සිතන්ටත් ඉතා අවිෂයවූ මුහුදු පීනීම් මුහුදු ඉසීම් ආදීවූ මහත් වීර්‍ය්‍යයෙන් ප්‍රයත්නකොට සිද්ධකළාවූ අභිමතප්‍රාර්ථනාවෙන් පිරූවාවූ වීර්‍ය්‍යපාරමිතාය වීර්‍ය්‍යඋපපාරමිතාය වීර්‍ය්‍යපරමාර්ථපාරමිතායයි, මෙසේ වීර්‍ය්‍යපාරමිතාවද ත්‍රිවිධාකාරයෙකින් පුරමින් සහිටුහන්කොට; තවද ක්ෂාන්තිවාද ජාතකාදීවූ නොයෙක් ජාතියෙහි සුචිඅසුචිදෙක්හි සමවපවත්නාවූ මහපොළොවපවා සහනය කොටගත නොහැක්කාවූ අසත්පුරුෂයන් කරනදරුණු තද

කාමෙහි පවා [illegible]ත් මඳකුත් නොතළා ප්‍රියපුත්‍රයන් කරන සුරතල්
සේ ඉවසා ක්‍ෂමාවෙන් පිරුණු සිත් ඇතිව පිරූවාවූ ක්‍ෂාන්තිපාර
මිතාය ක්‍ෂාන්ති උපපාරමිතාය ක්‍ෂාන්තිපරමාර්ථ පාරමිතායයි
මෙසේ අවිෂයවූ ක්‍ෂාන්තිපාරමිතාව තුන්ආකාරයකින් පුරා පිරි
සිඳ දූන; තවද මහාසුතසෝම ජාතකාදිවූ නොයෙක් ජාතියෙහි
ජීවිතාදිවූ නොයෙක් සම්පත්තියෙහි ආලයහැරත් තමා කිවාවූ
බසමසබාකොට සත්‍යවචනයෙහි පිහිටා ලොවට වැඩ වඩා
පිරූවාවූ සත්‍යපාරමිතාය සත්‍යඋපපාරමිතාය සත්‍ය පරමාර්ථ
පාරමිතායයි මෙසේ සත්‍ය පාරමිතාව තුන් ආකාරයකින්
පුරා කෙළපැමිණ; තවද තෙමියජාතකාදිවූ නොයෙක්
ජාතියෙහි වැඩපිණිස කියාලූ සත්පුරුෂ වචනයන්ම අද
හාගෙන එහිම පිහිටා තමා ඉටාගත් අධිෂ්ඨානයම මඳකුත්
ලිහිල් නොකොට දුස්ව සිහින් සනිටුහන්කොට සත්වයන්ට වැඩ
පිණිස පිරූවාවූ අධිෂ්ඨානපාරමිතාය අධිෂ්ඨානඋපපාරමිතාය
අධිෂ්ඨානපරමාර්ථපාරමිතායයි මෙසේ අධිෂ්ඨානපාරමිතාව ත්‍රිවි
ධාකාරයෙකින් පුරා කෙළපැමිණ; තවද නිග්‍රොධමිගජාතකාදිවූ
නොයෙක් ජාතියෙහි තමන්වහන්සේ විඳිනා සැප අනුන්ට දෙ
මින් අනුන් විඳිනා දුක් තමන්වහන්සේගේ මෙනෙහි පුරමින්
මහත්වූ කරුණාවෙන් ව්‍යසනයට පැමිණි මුවදෙනකට පවා පිහි
ටව ජීවිතදානයදී ඉතා නොසිතියහැක්කාවූ මෙබඳු මෛත්‍රීකිරි
මෙන් පරවැඩෙහිමයෙදී මෙසේ නොයෙක් ජාතියෙන් ජාති
යෙහි සත්වයන්ට පරම ප්‍රතිෂ්ඨාව මෛත්‍රීසමුද්‍රයක්මෙන් වැඩසිට
පිරූවාවූ මෛත්‍රීපාරමිතාය මෛත්‍රීඋපපාරමිතාය මෛත්‍රී පර
මාර්ථ පාරමිතායයි මෙසේ මේ මෛත්‍රීපාරමීතාවද තුන් ආකාර
යෙකින් පුරා කොටිප්‍රාප්තව; තවද සාරජාතකාදිවූ නොයෙක්
ජාතියෙහි ප්‍රතිඝානුනයරහිතව ගෙඩිදි නොයෙක් වෙහෙස දුන්
නන් කෙරෙහිද උලා නාවා ඇඟ තෙල්ගැල්වූවන් කෙරෙහිද
එක් අංසයක තියුණු මුවසැතින් මස් ලියන්නන් කෙරෙහිද එක්
අංසයක සිහිල් සුවඳ සඳුන් ගල්වන්නන් කෙරෙහිද සම මෛත්‍රී
සිත් ඇතිව තමහට කරන වැඩ අවැඩ දෙක්හිම එකාකාර සම
මෙන්ව පිරූ උපේක්‍ෂාපාරමිතාය උපේක්‍ෂාඋපපාරමිතාය උපෙ
ක්‍ෂාපරමාර්ථපාරමිතායයි යන උපේක්‍ෂාපාරමිතාව ත්‍රිවිධාකාර
යෙකින් පුරමින් මුදුන්කුළුගන්වා;

මෙහි ඇස් මස් ලේ ආදිවූ අඞ්ග පරිත්‍යාගයපාරමිතා නම්වෙයි.
පුත්‍රදාරහස්ත්‍යශ්වදාසි දස් ගවමහිෂ රටදනව් මුතුමැණික් රන්රිදී
ආදීවූ බාහිර පරිත්‍යාග උපපාරමිතාය; සිංහ ව්‍යාඝ්‍ර යක්‍ෂ රාක්‍ෂසා
දීන්ට ගොදුරුවෙමින් ඔවුන්ගේ මනදෙළ පිරූවාවූද සහ ඔවුනු
පලන් හිස් සිඳ දෙමින්කළාවූ ජීවිතපරිත්‍යාග පරමාර්ථපාරමිතා
යයි මෙසේ එකිඑකි පාරමිතාවක්ම තුන්තුන් ආකාරයකින්
විභාගකොට මෙසේ සමතිසක් පැරුම්පුරා පාරමිතා නැමැති
මහමුහුද පීනා පරතෙරට පැමිණ බුදුකුරු දහම් මුහුකුරුවා

මුළුලොවට අග්‍රප්‍රාප්තව කරුණා ප්‍රඥාවෙන් යුක්තවූ අපගේ බෝධිසත්ත්වයන්වහන්සේ වෙස්සන්තරාත්ම භාවයෙහි ඉපද විසිතුරුවූ ඇත් අස් ගවමහිෂ රථභූමිභවනයානවාහනආසනසයන විතාන බිසිබිඹෝහන වීජනී ඡත්‍ර චාමර වතීතාතනයමුතුමිණි රන්රිදී තඹලොහො වස්ත්‍රාභරණඔදනනවනීතඝෘතක්ෂීරමිශ්‍රක තක්‍රශක්කීරාරම්භාම්බජම්බුසන්නීර කර්පූර ශෘංගිවෙරතක්කොල ලමහ නාගවල්ලි පූගඵලපුෂ්ප චන්දනාදිවූ නානාප්‍රකාර ද්‍රව්‍යයෙන් සම්පූර්ණකොට සත්තසතක මහදන්දෙමින් අපමණවූරජ සැපත්විඳ ඒ වෙස්සන්තරාත්මභාවයෙන් චුතවනෝසුවහස්ගණන් රන්රිදී ආදීවූ දදපෙළින් සැදුම්ලත් සත්රුවන් මය ප්‍රාසාදයෙක්හි නිර්ජරාභරණභාරයෙන් සාරවූ සුරසුඳුරින්පිරිවරා සිසලගහරුසින් දශදික්බබුළුවා සුරසිරින් අපරිමිතවූ සතරවන තුසිතභවනයෙහි උපන්හ.

දක්වන ලදමැයි.

"උප්පජ්ජිත්වා සුරාවාසෙ සුන්දරෙ තුසිතෙ පුරෙ,
වසන්තො සුචිරං කාලං භුත්වා නානන්තසම්පදං"සි.

---

මෙතෙකින් මේ සද්ධර්ම රත්නාකරයෙහි
දශපරමාර්ථපාරමිතාසංග්‍රහකථා නම්වූ
තුන්වන පරිච්ඡේදය
නිමවන ලදී.

---

## සතරවන පරිච්ඡේදය.

නවද මේ සද්ධර්ම රත්නාකරයෙහි
අභිනිෂ්ක්‍රමණසංග්‍රහකථා නම් කවරහෙත්?

මෙසේ මේයටකියනලද්දාවූ ක්‍රමයෙන් බුද්ධකාරකධර්මයන් පූරණයකොට නිමවා සමස්තවිබුධශ්‍රීන් විභූෂිතවූ තුෂිතභවනයෙහි **සන්තුෂිත** නම්දිව්‍යරාජව ඉපද දිව්‍යබ්‍රහ්මයන්ට අමෘතමහාමෙඝයක් වර්ෂාකරන්නාසේ මධුරස්වරනිර්ඝෝෂයෙන් බණ වදාරා දෙවිබඹුන් සාධුකාරදෙවමින් තුෂිතභවනයෙහි අපමණවූ දිව්‍යසම්පත් වළඳා බොහෝකාලයක් එහිම වාසයකරන කල්හි:—

"කතඤ්ජලීහි දෙවෙහි යාචිතො දිපදුත්තම,
සම්බොධාය මහාවීර කාලො තුය්හන්ති ආදිතා"

යනාදීන් තුෂිතභවනයට නානාස්ථානයෙන් රැස්වූ දිව්‍යබ්‍රහ්මයන් විසින් දෙහොත්මුදුන්දිදී සිට ඇයි සන්තුෂිතනාම් දිව්‍යරාජයාණන්වහන්ස නුඹවහන්සේ මේතුෂිතභවනයෙහි දිව්‍යසම්පත් තියපිණිස කාලක්ෂෙපකිරීම යහපත් නොවන්නේය, පස්බුදුකෙනෙකුන්වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිතවූ මේ මහාභද්‍රකල්පයෙහි සතරවැනිව තමන්වහන්සේ බුදුවීමට කලැයි එකපැහැර දෙහොත්මුදුන්දෙමින් සාධුකාර දිදී ආරාධනාකළ කල්හි; අපමහ බෝසතාණෝ පෙර මහාත්මයන්ගේචාරිත්‍රධර්මයනොවරදවාම-

"විලොකෙත්වාන කාලාදිංඤත්වා කාලන්ති බොධියා,
පටිඤ්ඤං දෙවසංඝස්ස දත්වා සන්තුසිතාධිපො"

යනාදීන් එතැන්හි රැස්ව ආරාධනාකරනලද්දවූ දිව්‍යබ්‍රහ්ම සෙනාවම්මධ්‍යයෙහි යහපත බුදුවන්ට මිනිස්ලොවට යෙමියි ප්‍රතිඥදීලා කාලාදීවූපචමහාවිලොකනයකොටමේබුදුවන්නටකලැයි දැන තුෂිතභවනයෙන් අවුත් චක්‍රවර්තිනරොත්තමාධාරවන ජම්බුද්වීපයෙහි සකලජන මනොනයන ප්‍රසාදවහප්‍රාසාද ප්‍රාකාර ගොපුරතොරණාපණ පුෂ්කරණී උපවනාදීවූ නොයෙක් පුරසිරින් විසිතුරු රාජධානි සමූහයෙන් පිරිවරනලදමධ්‍යමණ්ඩලයෙහි දිව්‍යපුරයක් මෙන් බබළන්නාවූ-

"සුසජ්ජිතඞ්ගාරුතුරඞ්ගමාකුලෙ
විචිත්තනානාපණපණ්‍යසම්පදෙ,
මනොරමුත්තුඞ්ගගජින්ද රාජිතෙ
විභූසිතෙ තොරණකෙතුරාසිහි.
අලංකතට්ටාලවිසාලමාලයෙ
සුගොපුරෙ සුන්දරිසුන්දරාලයෙ,
සුදස්සනෙය්‍යෙ කපිලව්හයෙ පුරෙ
පුරින්දදස්සාපි පුරස්ස හාසකො"යි.

යනාදීන් වර්ණනීයවූ හස්ති අශ්ව රථ පත්ති සඞ්ඛ්‍යාත චතුරඞ්ගිනී සෙනාවෙන්හා නිරන්තරයෙන් කෙළි නළුවෙහි ඇලුම්කළ දිව්‍යසමූහයක්මෙන් සැරහී සරන නරනාරිගණයා විසින් නිරන්තරවූ තොරණාපණාශ්ශික ධජමාලාදීන් විලාසිතවූ විදුලියසහ නැඟී ඝනකුළුපෙළක්මෙන් ප්‍රසාදවහප්‍රාසාදපඞ්ක්තීන් සොභමාන වීථි සමූහයෙන් නිරන්තරවූ ගොපුරපරිඛාපරික්ෂෙප අට්ටාලසාලාදීවූ නගරාවරණයෙන්ද ශොභමානවූ විපුල වස්තුවෙන් අවිකල කපිලවස්තුපුර ප්‍රවරයෙහි දානප්‍රියවචන අර්ථචර්‍යා සමා

ත්තතායයි යන සතරසංග්‍රහ වස්තුවෙන් යුක්තව දශරාජධර්මය නොවරදවා රාජ්‍යයකරන්නාවූ අපමණරාජර්ද්ධිසම්පන්න ප්‍රශස්ත උත්තම රාජ්‍යයන්ගේ මකුටමණිකාන්තීන් ඒකොභාසවූ පාදප ඞ්කජ ඇති—

"භූපාලමෞලි රතනාලි නිසෙවිතඞ්ඝි
පඞ්කෙරුහං විමලතෙජ ගුණාධිවාසං,
ඔක්කාකරාජකුලකෙතුමනාථනාථං
සුද්ධොදනං නරපතිං පවරං පටිච්ච"

යනාදීන් සකලපුරවරාධීශ්වර නරපතීන්ගේ කිරීටකූටමාණික්‍ය භ්‍රමරාවලීන් කිලිනයකළ පාදපද්මයුවළ ඇති සකලකුලනිධාන වූ ඔක්කාකවංශ දිගුයටග බඳ ධවජයක් හා සමානවූ සකලවිභූතීන් විභූෂිතවූ අසරණසරණසරණාගතවජ්‍රපඤ්ජර උභයකුලපරිශුද්ධ සුද්ධොදන නම් මහරජහුනිසා අපමණගුණගණාඪ්‍ය රූපශොභාසම්පන්නවූ—

"බිම්බාධරාය විකචුප්පලලොචනාය
දෙවින්දචාපරතිවඩ්ඪනභූලතාය,
සම්පුණ්ණසොමවිමලින්දු වරානනාය
සොවණ්ණචාරුයුගහංසපයොධරාය.

පාදාරවින්දකරපල්ලවසුන්දරාය
සොවණ්ණවණ්ණතනුවණ්ණවිරාජිතාය,
සීලාදිනෙක ගුණභූසනභූසිතාය
මායාය රාජවනිතායුපගඤ්ජ*කුච්ඡිං"යි.

යනාදීන් ප්‍රශංසා කටයුතුවූ රූපශොභාසම්පන්න මහමායා දෙවීන්කුස පිළිසිඳ දසමසක් මුළුල්ලෙහි දූවානකරඬුවෙක වඩාලූ සතරන් පිළිමයක්සේ සියල්ලවුන්ටම පෙනි පෙනී අදට මෙතෙක් උස වැඩුණුසේක, අදට මෙතෙක් උස වැඩුණුසේකැයි සතුටුවඩමින් මව්කුස දැහැමෙන් වැස වෙසඟ මැදිපොහෝ ලද් මඞ්ගලදින විසාතකතින් සවකීයවූ නුවර දක්නා පිණිස සුද්ධොදන රජහට කියා මහපෙළහරින් සිව්ගෙයකට පැනනැඟී මඟුල් වෙස්ගත් නේසුවහස්ගණන් ජනසමූහයා පිරිවරා පචාඞ්ගිකතූර්‍යඝොෂාවන් එකපැහැර වයන සඳ ගොස ගමන්ගත් සමුද්‍රය සේ සිරිබර විසල්මඟුල් මහවේමැදින් උත්සවයෙන් නික්මගොස්—

සුරභි කුසුමසණ්ඩා, ලඞ්කතා සාලසණ්ඩං
සමද භමරමාලා ගීයමානඞ්ගනාදං,
නයන විහගසඞ්ඝ අව්හයන්තාංව දිස්වා
විපුල රතිනිවාසං ලුම්බිනීකානනන්තං"යි.

---

* රාජවනිතායුපපජ්ජි, ඇතැම්.

යනාදීන් පුෂ්ප ඵලපල්ලවසැදි සිනිඳුසුනිල්වනගහනමුදුනෙන්
හමන සුවඳමලතුර මුවරදසළාවෙන් තිකුත් සුරභි ඇල්බොල්පව
නින් වනයඑකසුවඳපිඩක්සේ කොට දනගිමන් නිවනසිහිල්මත
කාල් ඡායාසම්පන්නවූ; නාග පුන්නාග පූග ලතා හින්තාල සලල
සන්තීර රම්භාම්බ ජම්බුජම්බීර සින්ධුවාර මධුගන්ධිකාසොක කෙත
කාදී නානාප්‍රකාර තරුසණ්ඩමණ්ඩිතලුම්බිනී උපවනසණ්ඩයෙ
හි කුරර චකෝර මධුකර කීර මයූර බඹර කිරළ කෝකිල සාළි
කාදී නානාවිධවිහගගණයාගේ මධුරඣඞ්කාර කුහකුහාරව ගුම
ගුමාරවාදීන්කන්කලුවූසුපුෂ්පිතයොහොඹුවැකොඳනාමාලලතාදී
ලතාකදම්බචුම්බිත පාදපශ්‍රේණීන් විසිතුරුවූලුම්බිනීවනෝද්‍යාන
යටවැද එහිනන්විසිතුරු බලන්නාහු විසිතුරුතුරඟපොකුරුලඹ
දෙන සුවපත් විලිකුන් මියුරු මීඅඹ සිඹ තුඩුනබා මධුරරස උර
බී මත්ව සන්දිදී උනුනඹා දිව තුරින් තුර කෙළනා නදුන් කළ
දුන් දැක; සිහිල් ගඟුලැලි යටන්යට වැලිතලාවල මියුල්කැල සඟ
තොලුදිදී කෙළනා රන්නිප් වෙහෙල්කැල දැක; කොකාසර නහා
රහා බස්නා මත්මොනරකැලන්ගේ සඳස් පිල්කැලකැලුමෙන්
එකලුවූ දිගුපුලුල්තැනිතලා ගලතලන් දැක; හමන මඳමඳ පවන්
විඳ විඳ සපිරිවරින් පැමිණියාවූ ඒ මහාමායාදෙවි නම් බුඩමාතා
තොමෝ උයන් මැද සිට—

“විපුලතරරතිං සා තම්හි කානන රමෙව
අමරයුවතිලීලා චාරුලීලාභිරාමා’
විකසිතවරසාලස්සෝපගන්ත්වාන මූලං
සයමතිනමිතෙකං සාලසාඛං අගණ්හි”

යනාදීන් ඒ ලුම්බිනීනම්වූ වනෝද්‍යානයෙහි සුපිපි අතුපත
රින් සැදුනාවූ මඟුල්සල්තුර මුලට දෙවඟනක ලීලාවෙන් ලීලෝ
පෙතව ගොස් මිහිලොලින් බමණ මත්බමර වැළින් විසින් එක
කොලාහලවූ සුපිපිසල් අතුපතරක්කරා අත දිගුකළකල්හි නැමී
පිළිගත් අතුල්තල ඇති එම සල් අත්ත අතින්ගෙන මහමේ ගැ
බක්මැද පහළ විදුලියක් මෙන් සිටි කල්හි—

“තස්මිං ඛණෙ කම්මජමාලුතස්ස
චලිංසු සාණිහි පරික්ඛිපිත්වා,
දෙවිං ජනො තං අභිපාලයන්තො
තම්හා පටික්කම්ම සුසණ්ඨිතොථ.
සා චාරුහෙමවලයාදි විභූසිතෙන
අච්චන්ත තම්බනඛරංසි සමුජ්ජලෙන,
තූලාතිකොමලසුරත්ත කරෙන සාඛං
ඔලම්බ තත්ථ මජනෙසි ඨිතාව ධීරං.

යනාදීන් කර්මජ සමීරණ චලනව බොධිසත්වොත්පත්ති කාරණය පෙණුනුකල්හි වැඩපසස්නා මඟුල්මහඇමතියන් විසින් විසිතුරු ඝන තිරවට බඳවා මුවාකොට වට රුකවල් ලවාගෙන එතනින්පහව මඳක් අවසරදීසිටිකල්හි මනොඥවූ හෙමකංකණ වලයාභිරාම උත්තුඞ්ග තම්බනඛ රංසි සමුජ්ජලිත නිර්මල තල තෙලගැලූ කර්පාසතුලකලඹක් මෙන් කොමලවූ කොකනද පද්මාභ්‍යන්තරයෙක්හී සොභාවට අපහාස්‍ය දුන් මෘදු කාන්ති ඇති සුරකත හස්තතලයෙන් ශාලශාඛාව අල්වාගෙන සිටිකල් හිම ධර්මාසනයකින් බස්නා ධර්ම කථිකයක්හුසේ අත පය දිගු කොට අපමහබෝසතාණෝ මව්කුසින් බිහිවූහ. එක්ෂණයෙහිම මහබඹු බෝසතාණන් රන්දලකින් පිළිගෙන දෙවීනි තොපගේ කුසින් සකලලොකානුග්‍රහකරවූ පුත්රුවනෙක් උපන. සතුටුව වයි කියා මඟුල් තෙපුල් කියමින් ඉදිරියෙහි සිටි කල්හි; ඔහු අතින් දෙවියෝ අඳුන්දිවිසමින් පිළිගත්හ, ඔවුන්අතින් මනුෂ්‍යයෝ සිනිඳු මෘදු දුහුලින් පිළිගත්හ. මෙසේ කොළ ලක්ෂයක් සක්වළ මහමෙර යුගඳුර හිමගිරි ශෙෂ ධරාධර සමුද්‍ර ආදිය කම්පා කරවමින් ලොකාන්තරික නරකාදියෙහිද උදාරතර විපුල ආලොක පතුරුවමින් සියලු දිග එකහෙලා ප්‍රසන්නකරවමින් භූමිගත හැම රන්රුවන් මතුව එකහෙලා ජොතිමත්කරවමින් විසිතුරු පොකුරුවැසි වස්වමින් සංසිඳුනු රළපතර ඇති නැතිතලා ගලතලක්බඳුවූ කරසයුර මිහිරිජලකරවමින් අතික්‍රූරවූ තදගිනි දැල් ඇවිල නැගෙන සියලු නරකවල් සිහිල්දියෙන් පුරා පියුම් විල්සේ මලින් සුපුෂ්පිතකරවමින් මිහිමඬල සිලාතල මහතුරු කඳවෙලෙප් පලාගෙන රන්වන් මුවරදසළාවෙන් බබළන සුපිපි රන්පියුම් ආදියෙන් මුළුලෝ සදමින් ඹීවරුවන් වැසි වස්වමින් ජාත්‍යන්ධයන් පිළුන්ගේ නවනාට්‍යරසොපෙත විසිතුරු නැටුම් බලවමින් ජාති බිහිරුන් ගොළුවන්ගේ සප්තස්වරොපෙතවූ මධුර ගීතිකාවන්අස්වමින් ගජ සිංහ මෘග ව්‍යාඝ්‍ර අශ්ව මහිෂ නාමොණර කාකොලූකගරුඬනාග නාගමණ්ඩූකබිලාරඋන්දුරාදීජාතීන් විරුඬයන් ඔවුනොවුන් හා ප්‍රියකෙළියෙහි රස දන්වමින් මුළුලොව සියලු තූර්යභාණ්ඩයන් තිබු තිබූ තැනම වයන්නන් නැතිවස්වභාවයෙන්ම පඤ්චාඞ්ගිකනාදපවත්වමින් හස්ත්‍යශ්වසිංහ ව්‍යාඝ්‍ර මයුර බර්බරකීර පරපුටු වටු ආදීවූ දිපද චතුෂ්පාදාදීන් ගේ මධුරනාදයෙන් මුළුලොව එකතින් නාද කරවමින් දිවමල් දිවසුවඳ දිවසුණු දිවපහන් දිවසුවඳදුමින් මුළුලෝ පුරවමින් ඝනෙනාෂ ගීතිකානාද ගායනාවෙන් මුළුලොව එකතින් නාද කරවමින් දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ යක්ෂ රාක්ෂස සිඬවිද්‍යාධර ගන්ධර්ව කිම්පුරුෂාදීන් විසින් කරනලද පුදපෙළහරින් මුළුලොව එකමඟුල්ගෙයක්සේ කරවමින් මොහඳුරටදිවයුරුවූ කාරුණාවට

යනාදීන් පුෂ්ප ඵලපල්ලවසැදි සිතිදුසුනිල්වනගහනමුදුනෙන් හමන සුවඳමලතුර මුවරදසළාවෙන් නිකුත් සුරභි ඇල්බොල්පව නින් වනයඑකසුවඳපිඬක්සේ කොට දනගිමන් නිවනසිහිල්මත කල් ඡායාසම්පන්නවූ; නාග පුන්නාග පූග ලතා හින්තාල සලල සන්තිර රම්භාම්බ ජම්බුජම්බීර සින්ධුවාර මධුගන්ධිකාසොක කෙත කාදි නානාප්‍රකාර තරුසණ්ඩමණ්ඩිතලුම්බිනි උපවනසණ්ඩයෙ හි කුරර චකෝර මධුකර කිර මයූර බඹර කිරළ කොකිල සාළි කාදී නානාවිධවිහගගණයාගේ මධුරඣඞ්කාර කුහකුහාරව ගුම ගුමාරවාදින්කන්කලුවූසුපුෂ්පිතයොහොඹුවැකොඳතමාලලතාදී ලතාකදම්බචුම්බිත පාදපශ්‍රෙණීන් විසිතුරුවූලුම්බිනීවනොද්‍යාන යටවැද එහිනන්විසිතුරු බලන්නාහු විසිතුරුතුරඟපොකුරුලම දෙන සුවපත් විලිකුන් මියුරු මිඅඹ සිඹ තුඩුනබා මධුරරස උරා බි මත්ව සන්දිදි උනුනඹා දිව තුරින් තුර කෙළනා නදුන් කළ දුන් දැක; සිහිල් ගඟුලැලි යටත්යට වැලිතලාවල මියුල්කැල සහ තොලුදිදී කෙළනා රන්තිප් වෙහෙල්කැල දැක; කෙකාසර නහා, රහා බස්නා මත්මොනරකැලන්ගේ සඳස් පිල්කැලකැලුමෙන් එකලුවූ දිගුපුලුල්තැනිතලා ගලතලන් දැක; හමන මඳමඳ පවන් විඳ විඳ සපිරිවරින් පැමිණියාවූ ඒ මහාමායාදෙවි නම් බුඩමාතා තොමෝ උයන් මැද සිට—

"විපුලතරරතිං සා තම්හි කානන රමෙම
අමරයුවතිලීලා චාරුලීලාභිරාමා'
විකසිතවරසාලස්සොපගන්ත්වාන මූලං
සයමභිනමිතෙකං සාලසාඛං අගණ්හි"

යනාදීන් ඒ ලුම්බිනීනම්වූ වනොද්‍යානයෙහි සුපිපි අතුපත රින් සැදුනාවූ මනුල්සල්තුර මූලට දෙවඟනක ලීලාවෙන් ලීලො පෙතව ගොස් මිහිලොලින් බමණ මත්බමර වැළුන් විසින් එක කොලාහලවූ සුපිපිසල් අතුපතරක්කරා අත දිගුකළකල්හි නැමි පිළිගත් අතුල්තල ඇති එම සල් අත්ත අතින්ගෙන මහමේ ගැ බක්මැද පහළ විදුලියක් මෙන් සිටි කල්හි—

"තස්මිං ඛණෙ කම්මජමාලුතස්ස
චලිංසු සාණිහි පරික්ඛිපිත්වා,
දෙවිං ජනො තං අභිපාලයන්තො
තම්හා පටික්කම්ම සුසණ්ඨිතොථ.
සා චාරුහෙමවලයාදි විභූසිතෙන
අච්චන්ත තම්බනඛරංසි සමුජ්ජලෙන,
තූලාතිකොමලසුරත්ත කරෙන සාඛං
ඔලම්බ තත්‍ථ මජ්ජනෙසි ඨිතාව ධීරං.

යනාදීන් කාමීජ සමීරණ චලනව බොධිසත්වොත්පත්ති කාරණය පෙණුනුකල්හි වැඩපසස්නා මඟුල්මහඇමතියන් විසින් විසිතුරු ඝන තිරවට බඳවා මූවාකොට වට රුකවල් ලවාගෙන එතනින්පහව මඳක් අවසරදීසිටිකල්හි මනොඥවූ හෙමකාංකණ වලයාභිරම උත්තුඞ්ග තම්බනඛ රංසි සමුජ්ජලිත නිම්ල තල තෙලගැලූ කාර්පාසතූලකාලඹක් මෙන් කොමලවූ කොකනද පද්මාභ්‍යන්තරයෙක්හී සොභාවට අපහාස්‍ය දුන් මෘදු කාන්ති ඇති සුරකාන හස්තතලයෙන් ශාලශාඛාව අල්වාගෙන සිටිසාල් හිම ධර්මාසනයකින් බස්නා ධර්ම කථිකයක්හුසේ අත පය දිගු කොට අපමහබෝසතාණෝ මව්කුසින් බිහිවූහ. එක්ෂණයෙහිම මහබඹු බෝසතාණන් රන්දැලකින් පිළිගෙන දෙවීනි තොපගේ කුසින් සකලලොකානන්දකරවූ පුත්රුවනෙක් උපන. සතුටුව වයි කියා මඟුල් තෙපුල් කියමින් ඉදිරියෙහි සිටි කල්හි; ඔහු අතින් දෙවියෝ අඳුන්දිවිසමින් පිළිගත්හ, ඔවුන්අතින් මනුෂ්‍යයෝ සිනිඳු මෘදු දුහුලින් පිළිගත්හ. මෙසේ කෙළ ලක්ෂයක් සක්වළ මහමෙර යුගඳුර හිමගිරි ශෙෂ ධරාධර සමුද්‍ර ආදිය කම්පාකරවමින් ලොකාන්තරික නරකාදියෙහිද උදාරතර විපුල ආලොක පතුරුවමින් සියලු දිග එකහෙලා ප්‍රසන්නකරවමින් භූමිගත හැම රත්රුවන් මතුව එකහෙලා ජොතිමත්කරවමින් විසිතුරු පොකුරුවැසි වස්වමින් සංසිඳුනු රළපතර ඇති තැනිතලා ගලතලක්බඳුවූ කරසයුර මිහිරිජලකරවමින් අතික්‍රෑරවූ තදගිනි දැල් ඇවිල නැගෙන සියලු නරකවල් සිහිල්දියෙන් පුරා පියුම් විල්සේ මලින් සුපුෂ්පිතකරවමින් මිහිමඬල සිලාතල මහතුරු කඳවෙලෙප් පලාගෙන රන්වන් මූවරදසළාවෙන් බබළන සුපිපි රන්පියුම් ආදියෙන් මුළුලෝ සදමින් ඕවරුවන් වැසි වස්වමින් ජාත්‍යන්ධයන් පිළුන්ගේ නවනාට්‍යරසොපෙත විසිතුරු නැටුම් බලවමින් ජාති බිහිරුන් ගොළුවන්ගේ සප්තස්වරොපෙතවූ මධුර ගීතිකාවන්අස්වමින් ගජ සිංහ මෘග ව්‍යාඝ්‍ර අශ්ව මහිෂ නාමොණර කාකොලූකගරුඩනාග නාගමණ්ඩූකබිලාරඋන්දුරාදීජාතීන් විරුඬයන් ඔවුනොවුන් හා ප්‍රියකෙළියෙහි රස දන්වමින් මුළුලොව සියලු තුර්යභාණ්ඩයන් තිබු තිබූ තැනම වයන්නන් නැතිවස්වභාවයෙන්ම පඤ්චාඞ්ගිකනාදපවත්වමින් හස්ත්‍යශ්වසිංහ ව්‍යාඝ්‍ර මයූර බර්බර කීර පරපුටු චටු ආදීවූ දිපද චතුෂ්පාදාදීන්ගේ මධුරනාදයෙන් මුළුලොව එකතින් නාද කරවමින් දිව්මල් දිව්සුවඳ දිව්සුණු දිව්පහන් දිව්සුවඳදුමින් මුළුලෝ පුරවමින් ඝනොෂ ගීතිකානාද ගායනාවෙන් මුළුලොව එකතින් නාද කරවමින් දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ යක්ෂ රාක්ෂස සිඬවිද්‍යාධර ගන්ධර්ව කිම්පුරුෂාදීන් විසින් කරනලද පුදපෙළහරින් මුළුලොව එකමඟුල්ගෙයක්සේ කරවමින් මොහඳුරටදිව්යුරුවූ කරුණාවට

ප්‍රවාහවූ සසර සයුරට හෙයක්වැනිවූ සන්තොෂාමෘතයට සයුරක් වැනිවූ සිද්ධිමාර්ගයට උපදෙශකවූ ප්‍රඥචක්‍රයට නැබක්වැනිවූ ලොභාර්ණවයට වඩබානලවූ රාගපල්ලවයටදවානලවූ, කුශලසඤ්චයට අසහායස්ථානවූ ඒ බුද්ධාඞ්කුරයාණන්වහන්සේ කමලාසනාතිම් සමානුසකරතලාමලහෙමජාල අජිතචම්දුකූලයෙන් වැඩ සිරිපතුල් සුංදෙසා බිමට දිගුකළකල්හි මහපොළෝ පලාගෙන රත්වන් පද්මයක් පැනනැගී සිරිපතුල් පියුම්දෙසා පිළිගත -

එකල්හි බොධිසත්වයන්වහන්සේ එදවස්ම ජනිතවූයේත් සොළසවස්සිකානක්හුමෙන්ද, වස්ත්‍රරහිතවූයේත් කාසිසළු ගවසා හැඳ සැරසුනාක්මෙන්ද, ආභරණ නොපැළැන්දේත් සර්වාභරණයෙන් සැරසුනු චක්‍රවර්ති රජක්හුමෙන්ද, භූමියෙහි ගමන්ගත්තේත් අහසින් යන්නක්හුමෙන්ද, සකලලොකවාසි සත්වයන්ට එකහෙලා සන්තොෂ වඩවමින් ඔවුන්ගේ මනනෙත් තමන්වහන්සේ කරා හයමින් සත්පියවරක් ගොස් දශදිශාව බලා අභීත සිංහනාද පවත්වමින් සිටිකල්හි; මේ ආශ්චර්යය දුටු සකල ලොකවාසීන් දෙහොත් මුදුන් දිදී සාධුකාරදෙමින් මිනිස්ලොව පටන් බ්‍රහ්මලොකය දක්වා ප්‍රීතිවෙගයෙන් අත්පොළසන්දීම් ඔල්වරහඬගැසීම් පිළී හිසනැටවීම්ආදීවූ මහත් කොලාහලයෙන් සැණකෙළියට පටන්ගත්කල්හි; මහත් රජපෙළහරින් උයනින් නික්ම සවකීයවූ කිඹුල්වත්පුරයට ගොස් රාජභවනයට වන්හ. එකල්හි අප මහබෝසතාණන් මව්කුසින්බිහිවූ උත්සව මඟුලෙහි සදිව්‍යලොකවල දිවඋයන් ආදීවූ ඒ ඒ ස්ථානයෙහි කෙළනා දෙවියන් අතුරෙන් තව්තිසා වැසි දෙවියන්ගේ සතුති ඝොෂාව හා චෙලුක්ඛෙප හසනපොථන උදග්ගචිත්තනන්දනාදි අභිනව නානාද්භූතොත්පත්තිය ශක්‍රභවනයෙහි නදුන්වන මැද දිවා විහාරකොට හුන් කාළදෙවල නම් ඍෂින් විසින් දුටහ.

ඒබව ප්‍රකාශකොට දක්වනු ලදුයේමැයි.

"ආනන්දජාතෙ තිදසගණෙ පතීතෙ
සක්කඤ්ච ඉන්දං සුඛවසනෙ ච දෙවෙ,
දුස්සං ගහෙත්වා අතිරිව ථොමයන්තෙ
අසිතො ඉසී අද්දස දිවාවිහාරෙ" යි.

මෙසේ තව්තිසාවැසි දෙවියන්ගේ සැණකෙළි දැක ඔවුන් අභින් විචාරනුයේ කිමෙක්ද දෙවතාවෙනි තොපගේ ශක්‍රයෝ අතික් ශක්‍ර සම්පත්තියක් ලද්දහුද ඉතාමසන්තොෂයට පැමිණෙන්ට කාරණා කිම්දැයි කිය. එබසට දෙවියෝ කියන්නාහු ඇයි කාළදෙවල තාපසයන්වහන්ස නුඹවහන්සේ නොදන්නාසේක්ද අද සුද්ධොදන රජ්ජුරුවන්ගේ පුත්‍රුවනෙක් උපන. ඔහු

ලොවුතුරු බුදුවන බැවින් සන්තොෂයට පැමිණියම්හයි කීහ. කාළදෙවලතාපසයෝ එබස් අසා දෙව්ලොවින්අවුත් සුඬොදන රජහුගේ ප්‍රාසාදයට පැමිණ බුඬාඞ්කුරයාණන් වහන්සේගේ ශ්‍රීපාදයුග්මය මුදුනෙන් පිළිගෙන අටතුරුසියක් මඟුල් ලකුණු ආදීවූ සකලලක්‍ෂණයන් දැක ලොවුතුරාබුදුවන බව නියමකළ කල්හි; එසින් මැනභාගයෙහි කලාවෙන් කලාවට වඩනා පූර්ණ චන්‍ද්‍රයාසේ වප්මඟුල් ආදියෙහි නොයෙක් අද්භූතධර්‍මයන් පහළ කොට සොළොස්හැවිරිදි වයසට පැමිණ සකලකලාවෙහි නිපුණව සතළිස්දහසක් පුරඟනන් පිරිවරා අතිමනොහරවූ ශක්‍රදෙවෙන්‍ද්‍ර ලීලාවෙන් චක්‍රවර්තිරාජ්‍ය සම්පත්තියක් හා සදෘශවූ රජ සිරි විඳිනාහු–

"යස්මිං විචිත්තමණිමණ්ඩිතමන්දිරානං
නානාවිතාන සයනාසනමණ්ඩිතානං,
නිස්සෙනිසෙනි පුථුභූමිකභූසිතානං
තිණ්ණං උතූනමනුරූපමලඞ්කතානං" යි.

යනාදීන් සෘතුක්‍ෂමවූ වර්‍ණනීය රම්‍යය සුරම්‍යය සුභයයි යන තුන්පායෙහි එකුන්තිස් අවුරුද්දක් රජසිරිවිඳ ගිහිගෙයි වසන් නාහු දවසෙක රජපෙළහරින් මහසෙනඟ පිරිවරා උයන්කෙළි යට යන්නාහු අතරමඟ දෙවියන් විසින් මවාපෑ ජීර්‍ණ මෘත ව්‍යාධිතයයි කියනලද ත්‍රිවිධ රූප දුටු තුන්වාරයම නැවත මාලිගාවටම අවුත් සතරවැනි වාරයෙහි උයන්කෙළියට යන්නාහු දෙවියන් මවා පෑ මහණ රූපය දැක මහණවීමෙහි ලොල්ව එද වස් සඟපිරිවරින් නික්ම ගොස් මඟුලුයනට වැද එහි විසිතුරුවූ සුපුෂ්පිත වෘක්‍ෂ සමූහයෙන් ගැවසීගත්තාවූ සුදුවැලිතලාවෙන් යුක්ත ලතාමණ්ඩප පඞ්කතීන් හා නානාවිධ පද්මුප්පලකල්හාරාදී ජලජ කුසුමයෙන් ගැවසීගත්තාවූ සිහිල් ජලයපිරි පතැස් පෙළින්හා ඵලපලලව මල්හි ලොල්වූ විලිමුව සිලිමුව මලිකි කොබලිකි ආදීන්ගේ රුව්පිළිරුවින් කන්කලුවූ වනසිරින් සැදි නන්දනොද්‍යානය මෙන් හොබනාවූ මඟුලුයනට බටහ.

**ඒබව භගවනුපිණ්ස දක්වන ලදමැයිජිනචරිතයෙහි.**

සුඵුල්ලනානාතරුසණ්ඩමණ්ඩිතං
සිඛණ්ඩිසණ්ඩාදි දිජූපකූජිතං,
සුදස්සනීයං විය නන්දනං වනං
මනොරමුය්‍යාන මගා මහායසො".

යනාදීන් නන්විසිතුරු බලමින් ගොස් මහබෝසතාණන් වහන්සේ මඟුල්සලවටපිට පැනනැගී උන්කල්හි, ශක්‍රදෙවේන්‍ද්‍රයාගෙන් නියොගලත් විශ්වකර්මදිව්‍යපුත්‍රයා විසින් දහසක් දිවසළුවෙන් හිසවෙලා දහසක් වලුකොඩොක්කුවෙන් යුක්තකොට විසිතුරු සළුවඩා සුසැට ආභරණයෙන්සරහා ඔවුනුපලඳවා ශක්‍රදෙවේන්‍ද්‍රයාමෙන් සැරහුකල්හි සපිරිවරින් මඟුල්සල වටපිට උන්හ. එකල්හි යසොධරාදෙවීන් රාහුල නම් පුත්රුවන වැදූහයි යන අසුන් සුඩොදනරජහු විසින් කියා යවූකල්හි සකල ස්මෘඞින් මඟුලුයතින් නික්ම සියනුවරට අවුත් මාලිගාවටම වන්හ; එදවස් නාටක සමූහයා අවුත් මහතාණන් සතුටුකරවම්හයි රුස්ව නෘත්‍යගීතයට පටන්ගත්හ. එසඳ අපමහබෝසතාණෝ මහණවිමෙහි අභිප්‍රායයෙන් පඤ්චකාම සම්පත්තියෙහි නිරාලයව එබඳුවූ නෘත්‍යගීතයෙහි සිත්නොඅලවා යානෙහි මඳක් සැතපුණාහ; එකල්හි නාටකභටවෙටිකාදීහු තමතමන් ගත් තූර්‍ය්‍යභාණ්ඩයන් තැනතැනම තබා නෘත්‍යගීතවාද්‍යයන් හැර තුමූතුමූද තැන තැන නිදිගත්හ. එවිට අපමහබෝසතාණෝ පිබිද සිරියහන් මැඳ හිඳ නිදන නාටක භටවෙටිකාවන්ගේ විකාර දැක එතන සිත් නොඇලෙනහෙයින් නැගීසිට දොරකඩට ගොස් එළිපත හිස තබා වැදහොත් ඡන්න නම් අමාත්‍යයා පුබුදුවා අසු සඳ ගෙනෙවයි කීකල්හි, එබස් අසා ඡන්නනම් අමාත්‍යයා රජගෙන් නික්ම ගොස් කණ්ථකනම් අශ්වයා සඳ රජගෙයි දොරටුවෙහි ගෙන සිටිකල්හි මහබෝසතාණෝ සිතන්නාහු පළමු රාහුලකුමාරයන් දැක පසුව මහබිනික්මන් කෙරෙමියි තමන් සැතපුණු සිරියහන් ගබඩාවෙන් නික්ම ගොස් අන්තඃපුර ගබඩාවෙහි දොරහැර ඉන්ද්‍රඛීලයෙන් ඇතුළෙහි පයතබාසිට—

"පෙසලානතකරඞ්ගිපඞ්කජාභාසවණ්ණහමුවිචිභාසුරා,
නෙත්තනීලකමලා යසොධරා කොමුදීව නයනාලිපත්ථිතා".

යනාදීන් වර්ණිතවූ යසොධරාදෙවීන්හා සැතපෙන කුමාරයන් දැක මොවුන් පුබුදුවා මපුතණුවන් වඩාගෙන සිඹ සනහාපීත්නම් අද රෑ මා බුදුවන්ට යන ගමනට අන්තරාය වෙයිසිතා බුදුව ආකල පසුව දකිම්යි එළිපත ඇතුළතින්තිබූ පය ඇදගෙන ගොස් ඡන්නයා සඳ ගෙනවුත් සිටි කන්ථකනම් අසු පිටට පැනනැගී වශවර්තිමාරයාගේ බස් නොගෙන මහවහසලින් යනුපිණිස නික්මුණාහ; එවිටම දහසක් යොධයන් හැරලන පියාලන තරම් බර ඇති මහවාසල්දොර දෙවියන් විසින් හළකල්හි ඡන්නයා වාලධිය ගන්වා කන්ථකනම් අශ්වරාජයාපිටින් අපමණවූ පූජොත්සවයෙන් යුක්තව දෙවියන් දුන් අතුල්තල මුදුනෙන් අසු පන්වා, මහබිනික්මන්කොට තිස් යොද

නක් මග ගෙවාගොස් දෙපස සුපුෂ්පිත වනපෙතින් හා සුදුවැලි තලාවෙන් සැදි ඉන්ද්‍රනීලමාණික්‍යසකණ්ඩයක් සේ සිසිරනීර පූරිතවූ සිත්හි ගිම් දුරුකරන්නාවූ ගංගාතීරයට පැමිණ එතරව;-

"පත්වා' නොමානදීතීරං පිට්ඨිතො තුරගස්ස සො,
ඔතරිත්වාන විමලෙ සීතලෙ සිකතාතලෙ"

යනාදීන් අනෝමානම් ගඟ එතරව සඳරැස්කළඹක් බඳුවූ සුදු වැලිතලාවට අසුපිටින් බැස විදුලිය කළඹක් බඳුවූ මඟුල් කඩුව හයා අතටගෙන සුවඳින් ආර්ද්‍රවූ සිනිඳු මෘදු සුනිල් කෙස් වැටිය සිඳ අහසට දැමූ ක්ෂණයෙහි රන්සුමුගින් පිළිගෙන සක් දෙව්රජහු සිළුමිණි සෑයක් කරවා වැඳපුදනු පිණිස ශක්‍රභවනයට ගෙනගියකල්හි මහබඹහු දුන් අටපිරිකර පිළිගෙන මහණව එතනින් නික්ම;—

"නාමෙනා නුපියං නාම ගන්ත්වා අම්බවනං තහිං,
සත්තාහං වීතිනාමෙත්වා පබ්බජ්ජා සුඛතො තතො."

යනාදීන් අනුපියනම් අඹවනයට ගොස් පැවිදිවූ සැපයෙන් සත්දවසක් එතැන්හි වැඩහිඳ අටවන දවස් තිස්යොදනක් මග ගෙවා රජගහනුවරට ගොස් ගෙපිළිවෙළින් පිඬුසිඟා වීථියෙහි වඩනාකල්හි මොවුන්වහන්සේගේ රූපශොභාසම්පත්තිය දුටුදුටු එනුවරවාසීන් විසින් ආශ්වය්‍යියට පැමිණ ශක්‍ර බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වරනාගමදනචන්ද්‍ර සූය්‍යාදීන් අතුරෙන් කවරනම් දිව්‍ය රාජයෙක් දෝහෝයි සැකව ඔවු නොවුන් විචාරමින් මහතාණන්වහන්සේගේ රූපශ්‍රී බල බලා දෑහොත් මුදුන් දිදී සාධුකාර දෙමින් පිරිවරාගත්කල්හි;ශාන්තදාන්තවූ අනොපමෙය්‍යවූ ලීලාවෙන් ගෙපිළිවෙළින් සිඟාවඩනා මහොත්තමයාණන්වහන්සේ බව දැනගත් නුවණැති ජනයන්විසින්—

"කාමං පාරමිතාපුණ්ණ පසත්ථො පුරිසො අයං
නිච්චං වන්දථ පූජෙථ ථොමෙථෙතං මහාජුතිං,
එවං වදන්තා සබ්බෙ තෙ නාගරා පුරිසුත්තමං,
ගන්ධපුප්ඵෙහි පූජෙන්තා නමස්සන්තා තමච්චගුං."

යනාදීන් ස්තුතිකෙරෙමින් පුරුෂොත්තමතෙම එකාන්තයෙන් සම්තිස්පෙරුම් පුරා මඝාතප්‍රාප්තකළාවූ ලොවට කාරුණාපිඩක්වැනිවූ සියල්ලවුන්ටප්‍රතිෂ්ඨාධාරවූ මහොත්තමයෙකැයි කියමින් එම්බා සබඳිනි ශාන්තවූ විලාසයටම හොබනා ගමනක් බලව, සුපිළිසන්ව වැළඳ ගත් සුරක්ත සිවුරටම හොබනා රන්වන් ශරීරරූපශොභාවක්බලව,තමන්බලනුපිණිස මෙතෙක්ජන සමූහයා රැස්වූ නුවර මධ්‍යයෙහි කිසිකෙනෙකුන්හා නොබැණ

අප හැම දැසාව නුවනගිනුත් නොබලා අභිනගම්යෙන් තමන්
යන ගමන්මගොස් ගෙපිළිවෙළින් සිඟන තුන්වැනිවූ ව්‍යක්ත
මහත්තත්වයක් බලව, මේ කවර ආශ්චර්යයෙක්ද කොබඳුවිස්ම
යෙක්ද කෙසේවූ ලොකොත්සවයෙක්ද කාවුරුන් දුටු විරූ දෙ
යෙක්ද කවරදා ලබන නෙත්සැනසුමෙක්ද කවරකලක දැකපිය
හැකි කෙනෙක්ද එබැවින් වදුව පුදව සත්කාරකාරවයි නුවරවා
සීන් සුවඳමල් අතුල් ආදියෙන් ඔවුනොවුන් පරයා පූජාකෙරෙ
මින් දෙහොත් මුදුන්දිදී සාධුකාරදෙමින් අපමණ සන්තොෂ
යන් විඳ විඳ බල බලා සිටිකල්හි මහතාණන්වහන්සේ ගෙපිළි
වෙළින් සිඟා යපෙනමාත්‍රයක්අහරලදින් නුවරින් බැහැරනික්ම
පාණ්ඩවපර්වතච්ඡායාවෙහි සහලසිවුර සතරපටින් පණවා පලක්
බැඳ වැඩහිඳ පාත්‍රයෙහි පෙර නුදුටු ප්‍රතිකූලමිශ්‍රක භොජනය
ප්‍රත්‍යවෙක්ෂාකොට අමෘතයක් මෙන් වලඳා පාත්‍රය වත්සපයා
මඳක් වැඩහිඳ එතැන්හි පැමිණි බිම්සරරජහටබුදුවඑමියි ප්‍රතිඥා
දීලා උරුවෙල්දනව්වටගොස් සාවුරුද්දක් දුෂ්කරක්‍රියාකොට
එයින් මැනහාගයෙහි මධ්‍යමප්‍රතිපත්තියෙහි යෙදී දැහැමෙන්
රූපකායානුග්‍රහකොට ප්‍රසන්න ඉන්ද්‍රියෙන් යුක්තව වෙසඟමැදි
පොහෝදවස් බුදුවනු පිණිස බෝමඩට වඩනා අපමහබෝසතා
ණන්වහන්සේ—

“මූලෙජපාලනිග්‍රොධ පාදපස්ස මහාමුනි,
නිසිදි නිජසොභාහි ඔභාසෙන්තො දිසොදිසං”

යනාදීන් අජපාලනම් නිග්‍රොධමූලයෙහි සවකීයවූ සොභා
වෙන් දිලිහි දිලිහී වැඩඋන්කල්හි එදවස් සෙනානීනම් නියංගම
වසන්නාවූ මස්තකප්‍රාප්ත ප්‍රාර්ථනාචිත්තසංකල්පනාඇතිසුජාතා
නම් සිටුදුව විසින් මොනවට පිළියෙළකොට සතරන්තලියෙන්
ගෙනා මියුරු කිරිපිඩුපහන්සිතින් වෘක්ෂයෙහි වසන දිව්‍යරාජයා
ණන්වහන්සේයයි සිතාපිළිගැන්වූකල්හි කිරුපිඩුපිරූරන්තලිය
සවහස්තයෙන් ගෙන නෙරංජරානම් ගඞ්ගාතීරයට ගොස් මුතු
රැසක්සේ අතිධවලවූ වැලිතලායෙහි සහලසිවුර සතරපටින්
පණවාවැඩහිඳ ප්‍රත්‍යවෙක්ෂාකොට රන්තලියෙන්ම එකුන්පණස්
පිඩක් කොට මිහිරි කිරිපිඩුවළඳා තලිය උඩුගංබලා හැර දූවටු
කෘත්‍යය සිඩකොට රජතගිරිගුහායෙන් නික්මුණු එකචාරි සිංහ
රාජයකුමෙන් එතනින්වැඩ ජනමනොනන්දනතුරුපෙතින්
හොබනාවූ—

“ජනනාලිපාලිමනනෙත්තවිලුම්පමානං
සම්ඵුල්ලසාලවනරාජිවිරාජමානං;
දෙවින්දනන්දනවනං වහිනන්දනීයං
උය්‍යානමුත්තමතරං පවරොපගන්ත්වා”

යනාදීන් සුපුෂ්පිතවූ ලතාලිඞ්ගිතතරුනිකරයෙන් සොභමාන විසල් සල් වනයට ගොස් දහවල් සිහිල් බොල් පවන් විඳ තුරුසෙවනෙක්හි අභිප්‍රාය ලෙස දිවාවිහාරකොට වැඩහිඳ සවස් වේලෙහි එතැන්හි දෙවියන් විසින් සරහනලද දිව්‍යපථයෙන් නික්ම අතරමගදී දුටු ප්‍රශස්ත ස්වස්තිකනම් බ්‍රාහ්මණයකු දුන් කුසතණ අටමිටක් පිළිගෙන බෝමඩට වඩනාසේක්; එකල්හි දෙවියන් විසින් කුමුදු කොකනද කුවලය පද්ම පළොල කොබලීල ඇසළ මුහුළු සපු නා දෙඹ යෝධු ඉද්ද වැකොඳ සවුගෙඳ සමන් සෙඵාලිකාදීවූ නොයෙක් සුවඳමල් වැසි වස්වමින් රිදී කළයෙන් කිරිදහර ඉස්නාසේ කෙළගණින් රිදීමිටිබඳචාමර විහිදුවමින් රන්ගිරිහිසින් විසිරෙන සරත් වලාකඩවල්සේ අපමණ දිවසළු හිස නටවමින් ඛණ ඛණාරව රණිතකංකණාභරණවිභූෂිත රතතුල්තනාලෙලවා බුදුගුණකියා සතුතිකෙරෙමින් නානාවිධ තූර්යභාණ්ඩයන් ගෙන කුල්මතින් මුළුලොව එකකොලාහල කොට ඝොෂාවපවත්වමින් දිව්‍යමයවූ දීපධූපාදීන් මුළුලොව එකසුවඳපිඩක්සේ කෙරෙමින් මෙසේ අහස්කුස් අවසර නොහැර බුදුමඟුලට පටන්ගෙන දිව්‍යබ්‍රහ්ම නාග සුපර්ණ සිද්ධවිද්‍යාධරාදීන් එකපැහැර පූජාභාණ්ඩගෙන සාධුකාරදෙමින් බුදුගුණ කියකියා සන්තොෂයෙන් මුළුලොව තමතමන්ම ගෙන බුද්ධපූජොත්සව මඟුලට පටන්ගත්කල්හි; තවද අපමණවූ ගුණ ඇති බෝසතාණන්ට සතුටින් සතුති කරන්නාවූ—

මනොරමා කින්නර කින්නරඞ්ගනා
මනොරමඞ්ගා උරගොරගඞ්ගනා
මනොරමා තම්හි ච නච්චගීතියො
මනොරමෙ නෙකවිධා පවත්තයුං"

යනු හෙයින් දිව්‍යබ්‍රහ්මාදීන්විසින් කරනලද්දාවූ අපමණ පූජා විඳ දිව්‍යමයවූ රන්රිදී මිණිතොරණින්හා නානාරාගවිචිත්‍ර ධ්වජමාලාවෙන් සැදුම්ලත් දෙවනිර්මිත විසිතුරු මහවතින් ගොස් එලපලලවාඞ්කුර විද්‍යුල්ලතා කාදඹ චුම්බිත මෙචක මෙඝකූටයකින් වටකළ මුදුන් කුළුඇති රිදීපර්වතයක්හා සදෘශවූ ප්‍රශස්තවූ අශ්වත්ථබොධිමූලයට වැඩියාහ.

**එසේහෙයින් දක්වනලදුයේමැයි-**

**ජිනචරිතයෙහි.**

"තදා මහොසෙව මහාමහෙ ජිනො
පවත්තමානෙ ඉති සො මහායසො;
තිණෙ ගහෙත්වා තිභවෙකනායකො
උපාගතො බොධිදුමින්දසන්තිකං"

මෙසේ මහොත්තමයාණන් වහන්සේ කුසතණ අටමිටක් ගෙන ශ්‍රී මහාබොධින්වහන්සේ වට ප්‍රදක්ෂිණාකොට පූර්වදිශාභාගයෙහි බෝමුල කුසතණ සලාවගුරුවා එතනින් මහපොළොව පළාගෙන පැනනැගි සමවන්වූ තුදුස්රියන් වජ්‍රාසන මස්තකයෙහි චතුරඞ්ගවීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් යුක්තව බොධින්වහන්සේට පිටදී පළක්බැඳ වැඩ උන්කල්හි වශවර්තිමාරතෙම් තමාගේ කාලක් පුරුදුකොටගෙන ආවාවූ ඒ ක්‍රොධ චෙතනාව සහනයකොටගතනොහී තමාගේ අවිද්‍යා ස්වභාවය පෙරදූරිකොට අද සිද්ධාර්ථකුමාරයන් බුදුවිය නොදෙමියි පිරිවර සහිතව මහත් වෙගයෙන් යුක්තව එනුයේ:—

"මාපෙත්ව භිංසන තරොරු සහස්සබාහුං
සංගය්හ නානි ජලිතා විවිධායුධානි
ආරුය්හ චාරු දිරදං ගිරිමෙඛලාඛ්‍යං
චණ්ඩං දියඩ්ඪසතයොජනමායතං තං.

නානානනාය තලවණ්ණසිරොරුහාය
රත්තොරුවට්ට බහිනිග්ගතලොචනාය.
දඨොඨභිංසනමුඛායුරගබ්භුජාය
සෙනාය සො පරිවුතො විවිධායුධාය.

තත්‍ථොපගම්ම අතිභීමරවං රවන්තො
සිද්ධත්ථමෙථ ඉත ගණ්හථ බන්ධථෙමං
ආණාපයුං සුරගණං සහදස්සනෙන
චණ්ඩාතිලූනහතපිච්ඡං ව පලාපයිත්ථ."

යනාදීන් බුදුවිය නොදෙමියිඑනවසවර්තිමාරතෙමඅතිඝනාකාලමෙඝකූටයක්වැනි සෙළසියයක් යොදුන් උස ගිරිමෙඛලා නම් ගජරජු පිටට පැනනැගී තමා මවාගත් දහසක් අතින් අල්වනලද ගිනිගෙන දිලියෙන තියුණු මූවහත්ලූ අනෙකප්‍රකාර ආයුධසමූහයන් අමෝරා විදුලිය කැලමෙන් දසදිග මූනලලා භ්‍රමණයකෙරෙමින් ගිනියවටමෙන් වටවූ රතැස් කරකවකාවා ඉදිරිපසු බලමින් දස බිම්බරක් මාරසෙනාව සුහුයුහුව මෙහෙයාපැළ දිගින් සක්වළගලමුවවිටට පැනනැගී වහාතික්මඑන්නේය එසඳ ඹහු පිරිවර. අති රෞද්‍ර භයංකර සිංහ සූකර අස් තරස් දිවිවලස් වග ගවරගව මහිස නාග ගරුඬ බළු බැල බකමූහුණු අජගජන් වැනි මහමුහුණු මවාගෙන නා පොළොන් කරවැලූත් කර ලලා ගිරිපතර මහ රුක්මුලින් ඇද උදුරමින් සිරසවට කරකවා සිංහ ගජනඛින්ගෙන පොළෝතල අපුලමින් බඩ මැදෙහි මවාගත් මහකටින් දිවුහෙලා මුවකොනින් වැහෙන්නාවූ කුණුකෙල ධාරාදමදමාපෙරපසුවඔවුනොවුන්අඹඅඹාදිවමින්;එකකුගත්වෙසක් එකෙක්නොගෙන වෙනවෙනම තද්කුරිරුගුණඇතිව විරූප

රූපයෙන් දුවුදුටුවන් දිරිදූදුරුකරවමින් කොළවගළමලපඹ වැ
හැප්ලෙස ගහණව තදවූ දැළිරවුළුපිටින් ඉඳුල්වැටිපිටහට ඇඹරී
තිබෙන්නාවූ රළුවිසුලුමැලිහුන් දත්මුල් වැසූ රකතාධරසරහා ස
න්ධ්‍යාවලාපටලයෙන් කොන්වැසුනු අඩසඳයුවලක්මෙන් දෙකො
ළින් නික්මුණුකුටිල කාඨිනදළයුවළකොළවරින් ඩැහැගත් මහත්
වටවූ බොල් කොපොල්රළි උපුල්වා දැල්වූකටින් ගිනිකඳු ඉසි
මින්; මැදින්බුන් අක් පෙතෙලි තුන්පුටැතිනාසාග්‍රයෙන් දමන
තද සුසුම්හා සමග ගිනිපුපුරු ඉසිමින් කප් කෙළ දලන ගිනිදැල්
මෙන් සප්සුඹුළුවෙළු හිසින්හිස තඹකෙස්ලෙලවමින් රත්වූසවට
මෙන් වටව ඇසිපිය නොවැසී උස්ව පිටතට නෙරුණු රතැස් බ
මව බමවා පිටිකරපිටට බිඳ උඩුකුරුකළමුහුණින් බැම නඟනඟා
තඹරවුළුකෙළවමින්ලුහුඹු පටු කැකුළු අතුල්ඇඟිලි දිගු නියඇති
රත්අතින් තදව ගත්නාවූ කඩු කොනතු තොමර පාරාවලලු වළ
තඩි යකඳ මුගුරු කැති කෙටේරි ආදීවූ නානායුධයෙන් උනුන්
ඇඟ පැහැර රුධිරධාරා ඉසිමින් සියදහස්ගණන් සෙනඟඩසේ
දසදික් බිහිරිකොට හඩ ගස ගසා වඩපරුෂබස් කටකටම දෙ
ඩ දෙඩා කොළ සිද්ධාර්ථකුමාරයන් යානොදෙව වටලව බුදුවන්ට
උන් රිසි පලවා නොහැර අල්වවයි කිය කියා ගිරිමෙවුලාපැහී
වශවත්තිමාරයා හා සමග මරකීකරුසෙනගවටින්ම ලඟවෙමින්;
ඉබිපිටුමෙන් උස්වූ පිටිපතුල් ඇති රසුපටදූවටු කකුල්ද වැඩව
ලින් අඹිඹබාදිවෙමින් වැඩඋන් බෝමඩටගලාගත්හ.

එකල නොයෙක් සක්වළින් බෝමඩටරැස්වූ බුදුමඟුල්කෙරෙ
මින් පිරිවරා සිටියාවූ අපමණ දිව්‍යබ්‍රහ්මාදී මහා සෙනාව වසවත්
සහිතවූ මරසෙනගදැක නලපත පුළුන්මෙන් පලාගියහ. එකල
මහතාණන් වහන්සේ මදකුත් චකිතනොව නාගසෙනාවක් මැ
දටපැමිණි ගුරුළු රාජයක්හුසේද දුර්වල මෘගසෙනාවක් පිරිවැරූ
අභීතකෙශර සිංහරාජයකුසේ භයචකිතරහිතව එසා මහත් මර
සෙනඟ මධ්‍යයෙහි විදුරසුන්මැද බෝකඳටපිටලා වැඩඋන්සේක්

එකල්හී වශවර්තිමාරතෙම තමාගේ ආනුභාවයෙන් බුදුවිය
නොදී පරසක්වළටසුළඟින් දම්මමිසිතා කප්කෙළ පවතක්මෙන්
මහපවතක් මවා මහතාණන්ගේ සිවුරු රළකුත් සොලවාගත
නොහී; වතුරෙන්උපුල්වා මහමුහුදට දම්මමිසිතා මහාමෙඝයක්
මවා සිවුරු කොනකුත් තෙමාගතනොහී; ගලින් තළමි ගල්වැස්
සක්වස්වා එසිදූ මල්වටසේ පාපිටහුනුබවදැක; සියලඟ මස්ලියා
හෙලමි ආයුධ වර්ෂාවක් වස්වා හෙද මූණ කාමා දසාවට පෙරලී
හුනුබව දැක; සහල ගුරෙන් දවමි අඟුරුවැස්සක් වස්වමින් හෙද
මනාසපුමල්වැස්සක්සේ බෝමඩ සිහිල්වූබව දැක; හුණුඅළුයෙන්
වසමි අළුවැස්සක් වස්වා එසිදූ සඳුන් සුණුමෙන් බෝමඩ වගල

බව දැක; වැල්ලෙන්පුරා ඔබමියි වැලිවැස්සක් වස්වා එයිදු මලු
වෙහිලූ සුදුවැලිමෙන් වතල කල්හි; කලලෙහි නිමග්නකෙරෙමි
මඩ මෙඝයක් වර්‍ෂාකරවා හෙද පිරිබඩසුවඳකලලක්වූ කල්හි; අඳු
රෙන් ත්‍රස්තකෙරෙමියි මහ අඳුරක් මවා ඒ අඳුරෙහි ළහිරුමඩ
ලක්මෙන් බබළන මුඛමණ්ඩලය දැක නොසතුටුවෙමින්; මෙසේ
නවවිධවර්‍ෂාවක්වස්වමින් බුදුබවට කිසිවකුත් කොටගතනොහී;
තෙමේම වෙහෙස විඳ;නවද සටන් නොවරදවාමජයගෙනදෙන
චක්‍රායුධය ගසා ඉනුත් පැරද නොවන විදුරස්නට යුකයි බැණ
බොරුදෙස් කියවමින් ඒ තමහටම බොරුබව දැනී ලජ්ජාවෙන්
තෙමේම අස්වගිය. එකල්හි සාරාසඞ්ඛ්‍යය කප්ලක්‍ෂයක් මුළුල්
ලෙහි පිරූ සමතිස් පෙරුම් බලයෙන් අදමබුදුබව සිඩකෙරෙමියි
සිතා දසබිම්බරක් මාරසෙනාව පිරිවරා ආවාවූ වශවර්තිමාරයා
ගේ දසාව මෛත්‍රියෙන් බැලූසේක එකල්හි ඒ බැලූබැල්මෙන්ම
ගිරිමෙවුලා වෙවුලවෙවුලා දනඇන තමාගේ ඉසපන්නා වසවතු
සලා හෙලමින් වසවතු වැදවැනිරගිය. ඒ දුටු කුරිරු මහසෙනඟ
අතින් අතනීබූආයුධදමා හන්පළන් වස්ත්‍රාභරණ වගුරුවාගෙන
යන අත් නොදැන හිස් ලූ ලූ අත දිවමින් උනුන් පරයා ගොස්
මරුහා සමග සක්වළමෝවිටින් පිටතට වැගිරගියහ.

දක්වනලදමැයි.

"පහායායුධවත්ථානි ලඞ්කාරානි අනෙකධා,
චක්කවාලාචලා යාව සසෙනාය පලායි සො"

එකල්හි මාරකුඤ්ජරකෙශරීවූ අප මහතාණන්වහන්සේ
හිරුඅස්තයට යන්නාට පළමුව මාරපරාජයකොට ජයගෙන්වැඩ
උන් කල්හි; දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්ම නාග සුපර්ණ යක්‍ෂ
රාක්‍ෂස සිඬවිද්‍යාධරාදීහු එසඳ මරු පැරදිබවට සතුටුව අප බුදුහු
දිනූහයි අප බුදුහු දිනූහයි සටින්නට මහත්හඬ පවත්වා කුල්ම
හිපා කෙලගණින් පිළීහිසනටවමින් උනුන් ‍ෙවත අතුල්පෑ අතින්
අත් පහරමින් පසින් පය තබ තබා හිසවටා අත් නහා අසුරු
මින් දණ්ඩිතන්ත්‍රි ආලවන්නි රුද්‍රවීණා එකතින්ගෙන උඩනහා
තතීන් තත් සන් දිදී මදින්මද රඟදිදී උරෙන් උර පහරමින්;
බෙරදවුල් මොරසු ඈ පසඟතුරු බඩුත්ගෙන වයමිනුදු සුවඳමල්
සුවඳතෙල් කපුරු අගරු කලුවැල් ගුගුල් දුම් ලමින් රන්මොලා අ
තින්ගෙන පුන්කළස පිල්කලඹ ධජපිසිරි තල්වැට ආදීවූ පූජා
භාණ්ඩයෙන් අතින්අත සරහමින් උනුන් සෙද පරදව්, දිවඅවුත්
බෝමැඩට රැස්ව—

"සමෙමාදමානා අභිපූජයන්තා
ධීරං සුගන්ධප්පභුතීහි නාසමිං,
පුනාගනාතෙකාවුතිහි සමමා
උග්ඝොසමානා ජිණවෙසධාරී."

යනාදීන් බුදුමහුලට පටන්ගෙන දිව්‍යමයවූ මල්දම් මල්කාලප් මල්වට මල්මාලා මල්කලස් මල්රුක් ආදියෙන්ද; සුවඳතෙල් වතළ රන්වැට රිදීවැට මිණිවැට ලොහොවැට දඹුවැට ලියවැට ආදීවූ දීපධූප පුෂ්පාදීන් ගෙන බෝමඩපුරා ඉතිරදඹදිව සක්වළ මුවවිටට උරෙන් උරගසා ගැහැටි ගැහැටිසිට අපමණවූ පූජාකොරෙමින්; මුතු මැණික් රන් රිදී මල් දිව්‍යාභරණ වර්ෂාකොරෙමින් මල්සහිත නාලිය හෝපලු සපු දෙඹ කීන කැන් අහස්කුස සාඩා ඉසිමින්, විලඳ සුන්සාල් අබ සමන්කැකුළු ගිනණයසියන පස්මල් අතුරුනොහැර ඉසිමින්; පෘථිවියෙහි පටන් බ්‍රාහ්මාණ්ඩය දක්වා, අප්‍රමාණවූ උත්සවයෙන් එකාමඟුල්ගෙයක්සේ මුළුලොව බුඩපූජාවෙන් පිරීගියකල්හි;

"සම්පත්තාථ නිසාකන්තා පූජෙතුංව මුනිස්සරං,
පුබ්බාපරම්බරෙ ලග්ග රවින්දුකණ්ණභූසණා.;;

යනුහෙයින් මුළුලොව එකාලොකවූ සඳරැස් නැමැති, සිහිදුදිගුපුළුල් සිහිල් සළුවක් විදුහැඳ සන්ධ්‍යාවලා නැමැති උතුරුසළුවක් පයොධරවසා පෙරව චන්ද්‍ර සූර්‍ය්‍යදෙදෙනා නැමැති කර්ණාභරණ දෙකක් පැලඳ අහස්කුස නැමැති සුනිල් මුහුලස පුරා තාරකා නැමැති ඉද්දමල් ගවසා බැඳගත බිඟුරැව් නැමැති කාන්තාළු වූ ගායනාකොරෙමින් විහඟස්වර නැමැති මධුර ගීතිකාවෙන් ස්තුතිකොරෙමින්නිසා නැමැතිවනිතාව බුඩපූජා කරනුපිණිසපැමිණියාක්මෙන් රාත්‍රිය සම්ප්‍රාප්තවිය.

එකල්හි ප්‍රථමයාමයෙහි පූර්වේනිවාසානුස්මෘතිඥානයද මධ්‍යමයාමයෙහි දිව්‍යංචක්ෂුරභිඥානයද පශ්චිමයාමයෙහිආශ්‍රවක්ෂයකරාභිඥානයදැයි මෙසේතුන්යමෙහි ත්‍රිවිධඥානසමධිගම්යකොට; කොළලක්ෂයක් සක්වළ ඝනකඩ බොල්මහපොළොව ශතසහස්‍රරාවයෙන් ගර්ජනාකරවමින් මහාමෙරු යුගන්ධර සක්වළගල් හිමව්කුළු එකහෙළා නටවමින්; මහසයුර පෙරළාදමන රළපහර සංහිඳුවා නිශ්චල කරවමින්; යටිගං නික්මුණු හැම ගං හෝවල ජලප්‍රවාහය උඩුගංබලා නික්මවමින්; හැම ප්‍රෙතයන්ගේ ක්ෂුත්පිපාසා සංහිඳුවමින්; හැම නරකවල ගිනි නිවමින්; හැම තිරිසනුන්ගේ භය චකිත සංහිඳුවමින් සකල ප්‍රාණීන්ගේ උදග්‍රමත්තාරාවයෙන් ජගත්ත්‍රය එකකොලාහල කරවමින්; මුළුලොව එකහෙලා

චිත්තානන්දනයෙන් සාධුකාරදෙවමින් අලුයම්වේලෙහිලොවුතුරු බුදුව විදුරසුන්මැදෙහි වැඩහිඳ; කෙළගණින් සමාපත්තියට සමවදනාසේක.

ප්‍රථමයෙන් නීලකසිණ සමාපත්තියට සමවැද, නිලුපුල්කසාමල් ගිරිනිල්මල් අතුල්ගෙන කෙළගණින් මුළුලොවට ඉස්නාක්මෙන් කෙශරොමනෙත්‍රකෘෂ්ණමණ්ඩලාදී ස්ථානවලින් නීලබුද්ධ රශ්මිමාලාවන් විහිදුවමින් මේ මහුල්සක්වළ පුරා උතුරුවා දස දහසක්සක්වළ පතුරුවා කෙළලක්ෂයක් සක්වළ එකාලොකකෙරෙමින් අනන්තා පරියන්ත සක්වළ ව්‍යාප්තකරවමින්; පීතකසිණ සමාපත්තියට සමවැද, සපුමල් කිණිහිරි බැලිලමල් අනොජා තුවර රණවරාමල් ඇදිලි කෙළගණින් දසදිසාවෙහිඉස්නාක්මෙන් රන්කඳක්වෙනි ශ්‍රීශරීරයෙන් පීතබුද්ධරශ්මිමාලාවන් විහිදුවා ත්‍රිවිධබුද්ධක්ෂෙත්‍රය ප්‍රභාවත්කෙරෙමින්, ලොහිතකසිණ සමාපත්තියට සමවැද කොකනද වද බඳුවදමල් කැල පාලිභද්‍රමල් ආදීවූ පුෂ්පාඤ්ජලීන් ගෙනහැර අහස විසුරුවන්නාක්මෙන් හස්තපාද තලඅධරනබවිවරාදීවූ අරුණ වර්ණස්ථානවලින් ලොහිත බුද්ධ රශ්මි පතුරුවා ත්‍රිවිධ බුද්ධමණ්ඩලය ජොතිමත්කරවමින්' අවදාත කසිණ සමාපත්තියට සමවැද පියුම් එල්මැලි දෙඹ නා කොබලීල ඉද්ද කොඳ වැකොඳමල් අතුල්ගෙන හැර දසදහසක් සක්වළට ඉස උතුරුවන්නාක්මෙන් දන්තධාතුනඛධාතු අක්ෂිශ්වෙත මණ්ඩලාදීවූ නානාස්ථානවලින් විහිදුවන අවදාත බුද්ධරශ්මීන් චක්‍රවාලාන්තරවලද එකාලොකකොරෙමින්; ලොහිතාවදාත සමාපත්තියට සමවැද පලොල කොකනද රතුපුල්මල් කලප්ගෙනහැර අහස වසන්නාක්මෙන් කරහකරවීරාන්ත ජිව්හාධාත්වාදීන් විහිදුවනලද මාංජෙෂ්ඨ බුද්ධරශ්මීන් මුළුලොව එකාහෙළිකරමින්; කෙළලක්ෂයක් සමාපත්තියට එකවිටම ක්ෂණයෙකසමවැද සිහින්ගෙඩි සවුගෙඩි සිතිඳ සුමනමල් සෙඵාලිකාමලින්යුක්ත අනෙකප්‍රකාර වර්ණපුෂ්පාඤ්ජලීන් ගෙනහැර කෙළලක්ෂයක් සක්වළට අතුරු නොහැර ඉස්නාසේ සකලශරීරයෙන් එකවිටම අනෙකවර්ණ මිශ්‍රප්‍රභාශ්වරබුද්ධරශ්මීන් විහිදුවා මුළුලොව බබුළුවමින්; මෙසේ මඟුල්සක්වළ පිරිවරාසිටි දසදහසක් සක්වළකෙළවර කෙළලක්ෂයක් සක්වළ එකාහෙළා නානාවර්ණයෙන් විසිතුරු සිතියමක් කරන්නාම ! සවණක්ඝන බුදුරැස් විහිදුවා සන්ධ්‍යාවලා ඉන්ද්‍රචාප විජ්ජුලතාවෙන් වැළඳි රන්මෙරක්සේ දිලිහි දිලිහි වැඩහිඳ උදන් අනා වදරනසේකා—

"අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො දුක්ඛාජාති පුනප්පුනං,
ගහකාරක දිට්ඨොසි පුනගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ග හ කූටං විසඞ්ඛිතං,
විසංඛාරගතං චිත්තං තණ්හානංඛ යමජ්ඣගා"ති.

මෙතෙකින් මේ සඬම් රත්නාකරයෙහි අප බුදුන්ගේ
අභිනිෂ්ක්‍රමණ සංග්‍රහකථානම්වූ

## සතරවන පරිච්ඡෙදය

නිමා නිම වනලදී.

---

## පස්වන පරිච්ඡෙදය;

තවද මේ සඬම්රත්නාකරයෙහි යමකප්‍රාතිහාර්‍ය්‍යයෙහි දක්වූ
මෙතෙනයෘසඞ්ග්‍රහකථානම් කවරහයත් ?

මෙසේ උදානප්‍රීතිගිරාතිච්ඡාරණයෙන් ප්‍රමෝදය්ව ප්‍රීතිසැපඅනුභවකෙරෙමින් වජ්‍රාසනයෙහි නොයෙක් ගුණසලකා එහිමකොළලක්‍ෂයක් සමාපත්තියට සමවැද සත්දවසක් වැඩහිඳ එයින් නැගී දෙවියන්ගේ සැක දුරුකරනුපිණිස අහසටපැනනැගී ප්‍රාතිහාර්‍ය්‍යකොට බෝධින්වහන්සේගේ ගුණ සලකා දෙවන සතියෙහි සත්දවසක් වැඩසිට නෙත්‍රපූජාකොට තුන්වන සතියෙහිසත්‍වානුග්‍රහයෙන් රුවන්සක්මන සක්මන්කොට සතරවන සතියෙහි රුවන්ගෙයි වැඩහිඳ ධර්‍මසම්මර්‍ශණයකොට පස්වන සතියෙහි අජපාලනිග්‍රොධමූලයෙහි වැඩහිඳ මාරසත්‍රින්ගේ මානමර්දනයකොට සවන සතියෙහි මුචලින්දනම් නාගරාජයාගේ භොගාවලියෙහි වැඩහිඳ ඕහට චිත්තානන්දනාභිවෘද්ධිපමුණුවා සත්වන සතියෙහි රාජායතනමූලයෙහි වැඩහිඳප්‍රීතිසැප අනුභවකෙරෙමින් සත්දවසක් වැඩහිඳ, මෙසේ එකුන්පණස්දවසක් මූළුල්ලෙහි ප්‍රීතිසැප වළඳමින් පණස්වනදවස සක්දෙව්රජහුවිසින් එළවනලද්දාවූ නාලියන්දෑවටු වළඳ අනොතත්තජලයෙන් මුවපිරිදුකොට වෙළඳදෙබෑයන් ගෙනා විලඳවට සතරවරම්රජදරුවන් ගෙනාවුත් දක්වූ මිණිපාසතර මකුමත්තෙහි තිබූසඳ බුදුන්ගේ අධිෂ්ඨානයෙන් එකක්වූ මුවවිටිරෙබෑසතර වෙන් වෙන්වපෙණෙන මුංවන්පැහැති

සලපාත්‍රයෙන් ඒ විලඳවට පිළිගෙන ඔවුන්ට බණවදාරා ඔවුන්ට වැඳපුදනු පිණිස කෙශධාතු මිටක් දෙමින් පහදවා වැඩහුන්කල්හි, සහම්පතිමහාබ්‍රහ්මයාසහිත දිව්‍යබ්‍රහ්මසෙනාවරුස්ව දෙහොත්මුදුන්දිදී තථාගතගුණස්තුතින් දීප්තිමත්කොට දිගුබිතසදමින් ස්වාමිනි සද්ධර්මදෙශනාකිරීමටකාලයයිකියා ආරාධනාකළකල්හි, භාග්‍යවත් බුදුරජතෙම හුනස්නෙහිම වැඩහිඳ ආරාධනා ඉවසා දම්සක්පැවතුන් සූත්‍රදෙශනාකරනු පිණිස ඒ අජපාල උදයගිරිපර්වතයෙන් නික්මුණු ළහිරුමඬලක්සේ සවණක්ඝන බුද්ධරශ්මීන් නභොමණ්ඩලයෙහි ව්‍යාප්තකොට දිළිහි දිළිහි නික්මුණු සේක.

දක්වනලදමැයි.

"තතොජපාලොදයපබ්බතොදිතො
මහප්පභො බුද්ධදිවාකරො නභෙ,
මණිප්පභාසන්තිභභාසුරප්පභො
පමොචයං භාසුරබුද්ධරංසියො.

පමොදයන්තො උපකාදයො තදා,
කමෙන අට්ඨාරසයොජනඤ්ජසං,
අතික්කමිත්වාන සුඵුල්ලපාදපෙ
විජුම්භමානාලිගණාභිකූජිතං,
නිරන්තරං නෙකදිජූපකූජිතං
සුඵුල්ලපඞ්කෙරුහගන්ධවාසිතං,
ගතො යසස්සී මිගදායමුත්තමං
තහිං තපස්සී අථ පඤ්චවග්ගියා"යි.

යනාදීන් දම්සක්පැවතුන් සූත්‍රදෙශනා කරණු පිණිස අජපාල නිග්‍රොධමූලයෙන්නික්මඅතරමගදීදුටුඅඹිපාලතපස්වීන්සන්තොෂකරවමින් අටලොස්යොදනක් මගගෙවා ඉසිපතන නම් මිගදායට ගොස් එතැන්හිපස්වගමහණුන්වහන්සේහා කොළගණන්බ්‍රහ්මසෙනාවපිරිවරා වැඩහිඳ දම්සක්පැවතුන් සූත්‍රදෙශනාකොට බොහෝසත්වයන් අමාමහනිවන්දක්වා ගම්නියංගම් රාජධානිපිළිවෙළින් අපමණවූ පූජාවිඳිමින්දනව් සැරිසරා වැඩවසනසේක් ක්‍රමයෙන්රජගහනුවර වෙළුවනාරාමයට වැඩ සකලලොකවාසී සත්වයන්ට අමාමහනිවන්සම්පත්දී අපමණසාධුකාරදෙවමින්වැඩවසනසේකඑකල සුද්ධොදනරජ්ජුරුවෝතමන්ගේපුත්‍රවූසිද්ධාර්ථකුමාර නම් මහබෝසතාණන්වහන්සේ ලොවුතුරාබුදුවූවයි යනුඅසා උන්වහන්සේගේඅනොපමෙය්‍යවූ බුද්ධශ්‍රී දක්නාකැමතිවඅමාත්‍ය

යෙකු කැඳවා එම්බා සගය මාගේ සිද්ධාර්ථකුමාරයාණන්වහන්සේ දැන් ලොවුතුරු බුදුව රජගහනුවර වේළුවනාරාමයෙහි වැඩවසන සේක්ල; උන්වහන්සේ කැඳවාගෙනවුත් මා ඇස දක්වා ලවයි කියා දහසක් පුරුෂයන්හාසමග ඔහු බුදුන්කරා යැවීය. එතෙම අතුරුමගගෙවාගොස් වේළුවනාරාමයට වැද සකලලෝකානන්ද කරවූ බුදුරජාණන් වහන්සේ විසින් මධුරධ්වනි විහිදුවා වදාරනලද සද්ධර්මදේශනාවන් අසා ප්‍රීතිමත්ව දහසක් පුරුෂයන්හා සමග මහණව අමාමහනිවන්දුටහ.

මෙසේ නවවාරයෙක අමාත්‍යවරුන් නවදෙනෙකුහා නව දහසක් පුරුෂයන් බුදුන්කරා ගමන්කරවමින් බුදුන්දක්නා තබා ගියපුරුෂයන් නවදෙසින් එකෙකුත් නොදක මහාමේඝයක් පතන චාතකයකුසේ දසවැනිවාරයෙහි තමහට පක්ෂපාතවූ කාළුදායිනම් අමාත්‍යයාණන් කැඳවා එම්බා කාළුදායිනි!! මාගේ ලොවුතුරුබුදුන් දක්නා කැමැතිව නවවාරයක නවදහසක් පුරුෂයන්හා අමාත්‍යවරුන් නවදෙනෙකු යැවීමි. ඔහු හැම බුදුන් දක්වාලිය නුහුනුවාහ. තෙපි ගොස් මාගේ ස්වාමිදරුවූ බුදුරජාණන්වහන්සේ මා ඇස දක්වාලවයි කියා දහසක් පුරුෂයන් ඔහට පිරිවරකොට සලස්වා බුදුන් සමීපයට යනලෙසට කීහ. එබසට කාළුදායිනම් අමාත්‍යයාණෝ කියන්නාහු දේවයන්වහන්ස මම ගියෙම්වීනම් ලොවුතුරුබුදුන් නුඹවහන්සේ දක්වාලමි මා මහණවන්ට අවසරදුනමැනවැයි කියා රජහු අතින් අවසර ගෙන රජගහනුවර බුදුන් වැඩවසන වේළුවනාරාමයට ගොස් බුදුන් දැක පිරිස් කෙළවරසිට බණ අසා රහත්ව දහසක් පුරුෂයන්හා සමග එහිභික්ෂුභාවයෙන් මහණව බුදුසසුන් බබුළුවමින් කාළුදායි මහාස්ථවිරයන්වහන්සේයයි මේ නමින් ප්‍රසිද්ධව වසනසේක් මහණවූ කිපදවසකින්ම මැදින්දින මැදි පොහෝලත් දවසට හෙමන්තඍතුව ඉක්මවා වසන්තකාලය සම්ප්‍රාප්තවිය. එකල්හි සමස්තභූමිමණ්ඩලය ඉතානිල්වූ මොලොක්වූ අමුතු ගොප්නැගෙන තෘණගහණයෙන් ශොභමානවිය. වනලැහැප් කුසුම ඵලපල්ලවයෙන් සැදුම්ලද්දේය. එසේහෙයින් බුදුරජාණන්වහන්සේ කිඹුල්වත්පුරයෙහි නෑයන්දක්නාපිණිස වැඩීමට කලැයි සිතා ඒ කාළුදායිනම් මහතෙරුන්වහන්සේ සුපිළිසන්ව මොනවට හැඳ පෙරව බුදුන්කරා එළඹ අභිමුඛයෙහි සිට දෝහොත් මුදුන් දිදී ආදරයෙන් නැමි නැමි වැඳ තමන්වහන්සේ ඈ පවත් දක්වනසේක්;

'!!අගාරිනො දැති දුමා භදන්තෙ
ඵලෙසිනො ඡදනං විප්පහාය'
තෙ අච්චිමන්තොව පභාසයන්ති
සමයො මහාවීර භගීරසානං.

නාතිසීතං නාතිඋණ්හං නාතිදුබ්භික්ඛඡාතකං
සද්දලා හරිතාභූමි එස කාලො මහාමුනි”

යනාදීන් ගාථාසැටකින් මාර්ගවර්ණනාකොරෙමින් සාමිදරු
වාණන්වහන්ස නුඹවහන්සේගේ පිතෘවූ සුද්ධොදන මහරජාණන්
වහන්සේට අනුග්‍රහකොට සැටයොදුන්නක් මග ගෙවා කිඹුල්වත්
පුරයට වැඩීමට සුදුසු කාලය' එසේහෙයින් වැඩවදාළමැනවැයි
ආරාධනාකළහ. එකල්හි විසිදහසක් රහතුන්වහන්සේ පිරිවරා
සැටයොදුන් මග දවස යොදුනක් බැගින් ලැග ලැග සැටයො
දුන සැටලැග්මකින් ගොස් වෙසඟමැදි පොහෝදවස් කිඹුල්
වත්පුරයට වඩනාසේක. එදවස් සුදොවුන් මහරජතෙම බුදුන්
වඩනා පවත්අසා පුදපෙළහරදී රජකුමරුවන් පෙරමගට ගමන්
කරවා තෙමේද එක්ලක්‍ෂසැටදහසක් ශාක්‍යරජුන්හා තෙසුත්
බොහෝ ඥාතිගණයා පිරිවරා සෙත වෙලාවච්ඡාදනාවදාතමාලාවි
ලෙපනාදීන් මඞ්ගල්‍යවෙෂභූෂිතව පෙර ගමන්කොට බුදුන්
ප්‍රධානකොට ඇති විසිදහසක් රහතුන්වහන්සේ උත්සවයෙන්
වැඩමකරවා ගෙනගොස් නිග්‍රොධාරාමය පිළිගැන්වූහ, එදිනෙහි
රුස්වූ ඥාතිසමූහයා බුද්ධමහිම නොදන සහමහලුපිළිවෙළින්
පෙර ඇති නෑකම් බැණ අභිමානයෙන් බාලරජකුමරුවන් ඉදිරි
කොට මහලු රජදරුවෝ පස්සෙහිසිට වැඳි ආකාර දක්වාමූවාව
නොවැඳම සිටියාහ.

එකල්හි පරසිත්දන්නාවූ බුදුරජතෙම ඔවුන් සිතු සිත් දැන
බුදුබලසැ පහදවා තිවන්සම්පත්තිය දෙනුපිණිස ප්‍රාතිහාර්‍ය්‍ය දක්
වනු කැමැතිව එක්‍ෂණයෙහි දසදහසක් සක්වළ දසදහසක් මහා
මෙරු පර්වතයන් අෂ්ටවර්ණරත්නසනමන පාළියක්මෙන් පිළි
වෙළින් සිටුවා පූර්වසක්වළගලමුදුනෙහි පටන් පශ්චිම සක්වළ
ගලමුදුන දක්වා දිගින් එක්දහස් දෙසියතුන්කොළ පන්සාළිස්
ලක්‍ෂයක් යොදුන්හා, පුළුලින් දසදහසක් යොදුන් පමණ,
මේ අතුරු නොහැර දසදහසක් සක්වළ දසදහසක් ජම්බු
වෘක්‍ෂවලින් පතිතවූ හැම ජම්බුඵලයෙන් නැගි රන්පාලගෙන
ඒ රන්රන් එක්පත්කොට තළා අතුළ රන්පතක් මෙන්ද,
දසදහසක් සක්වළ දසදහසක් රිවිමඬුලුවල කොළක් රශ්මීන්
එක්කොට අතුළාවූ හිරුරැස්කලඹක් මෙන්ද, මෙරගිරිමුදුනෙහි
රන්බිමක් මවා ඒ සුවර්ණභූමියෙහි දසදහසක් යොදුන් පුළුලින්
මැද දෙදසක් යොදුන් තන්හි ලෙහෙවන් රුවන් වැල්ලෙන්
හා ඒ ලොහිතාඞ්කරත්නවාලුකාපටට දෙපාර්ශ්වයෙහි දෙදස්
දෙදස් යොදුන් පුළුල තනාහි මුතු පබළු පලිඟු වෛඩූර්‍ය්‍ය මසාර
ගල්ලමරකතකොමලප්‍රභෙදආදිවූ මිශ්‍රසාරුවන්වැල්ලෙන්හා මිශ්‍ර
කරුවන් වැලිපටදෙකින් දෙපිටදෙදසක්දෙදසක්යොදුන්පුළුළු
තන්හි ඉන්ද්‍රනීලමාණික්‍යමයවූරුවන්වැල්ලෙන්හාමෙසේපූර්වසක්

වළ පටන් පශ්චිමසක්වළ මුවවිට අතුරුදිග නානාවර්ණරුවන් වැල්ලෙන් විසිතුරු සිරියමක් පැහැ සිව්ගා ඔප්ලූවාක්මෙන්ද, නොහොත් බුදුන්ගේ අවබද්ධවූගුණයෙහි පැහැද ස්වකීය වර්ණය හැරසෑජුවෙමින් බුදුන් පාපිට හුනු දෙව්දුන්නක් මෙන්ද අතිශයින් ශොභාමත්වූ රුවන්සක්මනක් මවා ඒ රුවන්සක්මන මුදුනෙහි උදයගිරි පර්වතමස්තකයට පැමිණි දහසක්රශ්මින් පතළ සූර්යමණ්ඩලයමෙන් සවර්ණක්සත බුද්ධරශ්මිමාලාවන් දශදිග විහිදුවා කොළගණින් සමාපත්තියටසමවැද පූර්වසක්වළමුවවිටින් පශ්චිම සක්වළමුවවිටටද පශ්චිම සක්වළ මුවවිටින් පූර්වසක්වළ මුවවිටටද ඔබ්බනොබ සතරරියන් මණ්ඩපයෙක යෙහෙන් සක්මන් කරන්නාසේ බණවදාරමින් සක්මන්කරනසේක. තෙජොකසිණ සමාපත්තියට සමවැද දකුණු උරමඩලෙන් නාඹතල්කඳක් සා ගිනිකඳක් හළසේක. එසඳ බුදුසිරිබල බලා සිටි දිව්‍යමනුෂ්‍ය සෙනාව ඉගිකරුවඑම්බල තෙල කිමෙක්ද දකුණු උරමඩලෙන් ගිනිකඳෙක් නැඟෙන්ට වනැයිකියා සුස්ම නොහෙළනතුරුම ආපොකසිණ සමාපත්තියට සමවැද වම් උරමඩලෙන් නාඹතල්කඳක් සා දියකඳක් හළසේක ඒ දුක සොලමෙවිට බලග දකුණු උරමඩලෙන්නැගි ගිනිකඳම නොවෙයි බල වම් උරමඩලෙනුත් දියකඳෙක් නික්මිනැයි කියා බස නොහරනතුරු ගිනිකඳනැඟි උරෙන් දියකඳෙක් බසි[illegible]ට වන, මේ කිමෙක්ද ගිනිකඳ නැඟි තැනින් දියකඳ බසින්ට වනැයි ඔබ්බනොබ බලනකල්හි දියකඳ බට උරෙන් ගිනිකඳෙක් නැඟෙන්ටවන මේසාවර ආශ්චර්යයෙක්දැයි බල බලා සිට සබදිනි මේ දියකඳෙයි සිහිලසක් බලවයි කියනි සමහරු දියේ සිහිලස කියනු එකිම්ද මේගිනිකඳ දියකඳටත් වඩා සිහිලසය බලව බලවයියෙනි, ඒ බලා ඇසිපිය නොහෙළනකලින් අඩුතුන්කොළක් කෙහෙයෙන් කැව්වූ තුන්සිය සැටක් කොස් පුඩුවෙන් දියකඳ බසින්ට වන; නවානූදහසක් ලොමකූපයෙන් ගිනිකඳ නැඟෙන්ටවන' ගිනිකඳ නැඟි තැනින් දියකඳ බසී දියකඳ බට්තෙතින් ගිනිකඳ නැඟෙයි; මෙසේ සමබ්‍යාමොත්සෙබලක්ෂණාන්විත සකලශරීරයෙන් ගිනිකඳ දියකඳ මෙහෙයායමකප්‍රාතිහාර්ය්‍ය කරනකල්හි නික්මුණු දියකඳින් දසදහසක් සක්වළ මුළු පොළොව එකාහෙළා වතුරෙන් උතුරුවා අතුරුනොවිය; ගිනිකඳින් බඹතල දක්වා ලෝකසවැසිගිය. මෙසේමුළුලොව පතළගින්නෙන් මකුළුහුයකුත් කළුවන්නොවන්නේමය. වතුරෙන් කුහුඹුවකුටත් බැසනයක් නොවන්නේමය. මෙසේ හැම සත්වයෝම ඔවුනොවුන් දක්නාහුය යටත් පිරිසෙයින් බඹහු කුහුඹුවන් පවා දකිති කුහුඹුවෝ බඹුන් දකිති දසදහසක් සක්වළ මනුෂ්‍යයෝ තම තමන්ගේදොර සිටම සක්මන්කරන බුදුන් දකිති වදාරන බණ අසති. මෙසේ යමකප්‍රාතිහාර්ය්‍ය කෙරෙමින් නැවත තමන් වහන්සේ සේම බුදුකෙනෙකුන් වහන්සේ නිර්මිතකළසේක.

එසඳ මුළුලොව ගලා සිටිනා මනුෂ්‍යයන්හා නෙළුම්පත් සකොක පිරූ රන්සුණුමෙන් අහස්කුසපුරා සිටිනා සුර බඹ පිරිස් ඔල්වර හඬගසමින් තෙල කිමෙක්ද ආදි එකාබුදුකෙනෙක දූන් දෙබුදු කෙනෙකැයි කියමින් සාධුකාරදුන්හ. එසඳ නිර්මිත බුදුහු සක් මන් කෙරෙමින් බණවදුරනසේක අපබුදුහු වැඩඉඳ බණවදුරන සේක වැඩළුන් බුදුහු සක්මන්කරනසේක සක්මන්කළ බුදුහු වැඩහිඳිනාසේක විටෙක දෙදෙනාවහන්සේම සක්මන් කරන සේක් සක්මන් දෙකෙළවරසිට අවුත් මැදදී උතුන්වහන්සේට ආදරදක්වා අවසරහැර සක්මන් දෙකෙළවරට වැඩ නැවතත් උතුන්වහන්සේගේ ඉදිරියට වැඩ ළංවෙමින් ප්‍රශ්න විචාරණසේක නිර්මිත බුදුන් විචාළ ප්‍රශ්න අපබුදුහු විසජ්ජනයකරනසේක අප බුදුන් විචාළ පැන නිර්මිතබුදුහු විසඳනසේක

මෙසේ ඤාතිගණයාගේ අවඥතියමානමර්දනයකෙරෙමින්මුළු ලොවවෙවුල්වා ප්‍රාතිහාර්‍ය්‍යකරනකල්හි රජගහනුවර ගිජුකුළුපවු වෙහි වසන ධම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ ඒ යමක ප්‍රාතිහාර්‍ය්‍ය දූක මං එතනට ගියකල්හි මුළුලොවට වැඩවෙසිසිනා පන්සියයක් රහතුන්වහන්සේ පිරිවරා අහසින් නිග්‍රොධාරාමයට බසින්ට වන්සේක. ඒ ආශ්චර්‍ය්‍යදූක එම්බල ආදි එකාබුදුකෙනෙක්පසුව දෙබුදු කෙනෙකදූන් තුන්බුදුකෙනෙකැයි කියනි. කෙනෙක් තුන් බුදුහුම මතු නොවෙති බල ගැණගත් පන්සියයක් බුදුහු නොවෙද්දූයි කියති මෙලෙස හැම බුදුපිරිස් බලබලාසිටිය දීම වැඩියාවූ ධම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ රුවන් සක්මන් කෙළවරටවැඩ චක්‍රවර්තිරජක්හු සමීපයට පැමිණි පරිනායක රත්නයක්මෙන් මහත් ආදරදක්වා අපමණවූ සනොතෂයෙන් දෙහොත් මුදුනෙහි තබාගෙන වැඳ වැඳ බුදුන්ගේ ශ්‍රීමුඛ මණ්ඩලය බල බලා සිට මෙසේ දන්වනසේක

කෙසේදසත්?.

"කිදිසො තෙ මහාවිර අභිනීහාරො නරුත්තම,
කම්හි කාලෙ තයා ධිර පත්‍ථිතං බොධිමුත්තමං."යි.

යනාදීන් බොහෝ දිව්‍යමනුෂ්‍ය සෙනාවට ඇසෙනසේ මිහිරි කටහඬින්යුක්තව මාගේ බුදුරජාණන්වහන්සේ කවරකාලෙක පළමුවන විවරණය පටන්ගන්නාලදද කවරකාලෙක සම්‍යක්සම්බොධිය ප්‍රාර්ථනා කරනලදද ඒ හැම දෙව්බඹ පිරිස් මධ්‍යයෙහි ප්‍රකාශකොට වදාළමැනව මම ආශ්චර්‍ය්‍යමත්වූ අභිනීහාරයන් විශෙෂයෙන් අසනුකැමැත්තෙමියි ආරාධනා කළසේක. එකල්හි බුදුහු අසඟ ශාරිපුත්‍රයයි වදාරා මෙහි යටකියනලද ප්‍රථමාභිනීහා

රශ පටන්ගෙන බුඬවංශදෙශනාව ගෙනහැරදක්වා වදාරා මතු මෛත්‍රෙය බුදුකෙනෙකුන්වහන්සේ මෙම කප බුදුවෙති වදාළ සේක්. එකල්හි ධම්සෙනෙවි සැරියුත්මහතෙරුන්වහන්සේ සත්ව යන්ගේ ධම්ලොභය නුසුන්සේ දැක ත්‍රිකාලඥවූ මාගේසර්ඥයන් වහන්ස මතු මෛත්‍රෙයබුදුහු කවරකාලෙක්හි උපදිද්ද ඔවුන්ගේ බුඬශ්‍රී කෙබඳුද ඒ හැම මේ දෙව්බඹපිරිස් මධ්‍යයෙහි ප්‍රකාශකො ට වදාළමැනවැයිආරාධනාකළසේක. එකල්හිබුදුරජාණන්වහන් සේ අනාගතවංශදෙශනාවට පටන්ගෙන අසඟ ශාරිපුත්‍රය මතු උපදනා ඒ මෛත්‍රෙයබුදුරජාණෝ යටගියදවස නොයෙක් ආදී නවයෙන්යුක්තවූ සසරසැරිසරා ඇවිදිනාහු මේමහාභද්‍රකල්පයට සොළසාසඞ්ඛෙය්‍ය කප්ලක්‍ෂයකින් මත්තෙහි දඹදිව මධ්‍යමණ්ඩ ලයෙහි ප්‍රභාවනන්තනම් චක්‍රවර්තිරජව දෙදසක්කොදෙව් පිරිවර කොටඇති සතරමහාවිපයෙහිවසනසත්වයන්ට අනුශාසනාකොට සතිස්යොදනෙක පැතිරසිටිනාවූ අච්කලාඹග මහසෙනග පිරි වරා චක්‍රවර්තිරාජ්‍යයකරන්නාහු මුහුතීනම් බුදුරජාණන් වහන් සේ දැක චක්‍රවර්තිරාජ්‍යය බුදුන්ට පුදා සසුන්වැද මහණව රත්නසප්විරයන්වහන්සේයයි යන නමින් ප්‍රසිඬව වීයසීාඩික ම ඞ්‍යම ශ්‍රඬාඇති ඥෙයබොධිසත්වඑ අෂටධම්සමොධානයෙන් යෙදී දුනයෙන් අගපැමිණ මේ උත්තමයා මීට සොළසාසඞ්ඛ්‍ය කප්ල ක්‍ෂයෙකින් මත්තෙහි පස්බුදුකෙනෙකුන්වහන්සේගෙන් ප්‍රති මණ්ඩිතවූමේ මහාභද්‍රකල්පයෙහි මෛත්‍රෙයනම් බුදුවන්නේයයි විවරණලැබ එතැන්පටන් සොළසාසඞ්ඛ්‍යය කප්ලක්‍ෂයක් මුළුල් ලෙහි සමතිස් පෙරුම්පුරා මස්තකප්‍රාප්තකොට දැන් තුෂිතභව නයෙහි වැස මෙ කරුණා ශාසනය පන්දසක් අවුරුදු පැවති කල්හි එයින්මත්තෙහි ක්‍රමයෙන් මේ අතුරුකප කෙළවර සත්ව යන්ට දසඅවුරුද්දක් පමණට පරමායුවූකල්හි මෘගසංවර්ෂයයි සකලලොකයාහට එතැන්හි සඞ්ඛයක් පෙණී එතැන්පටන්සියලු සත්වයන්ට කුශලමූලයෙන් ආයුශ්‍රීආදීවූ සකලාභිවෘඬිවඬනයවී මෙන් අසඞ්ඛ්‍යයක් අවුරුද්දට පරමායු වඬනව නැවත කුශලකා රණයෙහි ප්‍රමාදවීමෙන් ආයුසය අසඞ්ඛ්‍යයෙහි පටන් අඩුව අඩුව අවුත් අසූදහසක් අවුරුද්දට ආයුසයෙයි. එකල දැන් බරණැස් නම්නුවර නම්පෙරළී උත්පලනම් වෙයි නැවත පදුමනම් වෙයි නැවතඑම නම් පෙරළී මනූරනම් වෙයි ඒ මනූරනම් නුවර නම් පෙරළී දිගදෙළොස්යොදුන් පුළුල සත් යොදුන් අවට තිස්යො දුන්පමණඇති සත්රුවන්මයවූ ප්‍රාසාද විචිත්‍රන්‍යාස පවුරු තො රණ තාලපන්ති පොකුණුකප්රුක් ආදියෙන් ශොභමානවූ කෙ තුමතීනම් රාජධානියෙක්වෙයි.

ඉසික් වදළහ.

"තදා කෙතුමතිනාම රාජධානී භවිස්සති,
ද්වාදසයොජනායාමා සත්තයොජන විත්ථතා"යි.

යනාදීන් ප්‍රමාණාතික්‍රාන්තවූ. ශ්‍රීසෞභාග්‍යයෙන් යුක්තවූ කෙතුමතිනම් රාජධානිය ප්‍රධානකොට ඇති සුවාසූදහසක් පමණ මහ නුවරවලින් ගැවසිගත්තාවූ ජම්බුද්වීපයෙහි සියලු ඓශ්වර්‍ය්‍ය දිව්‍ය සම්පත්තියටත් වඩනේය එකල්හි මෛත්‍රෙයබොධිසත්ත්වයන් වහන්සේ දිව්‍යඓශ්වර්‍ය්‍ය විඳවසන්නාවූ තුෂිතභවනයට දසදහසක්සක්වළ දිව්‍යබ්‍රහ්මයෝ රැස්ව බුදුවන්ට කලැයි මහතාණන්ට ආරාධනාකළකල්හි; කාලද්වීප දෙශාදී මහ පස්බැලුම් බලා බුදුවන්ට කලැයි දැන ඔවුන්ට ප්‍රතිඥාදීලා තුෂිතභවනයෙන් චුතව අවුත් දඹදිව මධ්‍යමණ්ඩලයෙහි කෙතුමතිනම් නුවර සඞ්ඛනම් චක්‍රවර්ති රජහට අග්‍රපුරොහිතවූ සුබ්‍රහ්මනම් බ්‍රාහ්මණොත්තමයාණන්තිසා බ්‍රහ්මවතීනම්බැමිණිදේවින්කුස පිළිසිඳ දසඑකඩමසක් ඇවෑමෙන් මුළුලොව නොයෙක් ආශ්චර්‍ය්‍ය පහළකොරෙමින් ඉසිපතන නම් නාගවනොද්‍යානයෙහි බිහිව සිරිපාපිහුම් මිහිකත සනහා සිංහනාද කොට ක්‍රමයෙන් වැඩිවිය පැමිණ අජිතනම් බ්‍රාහ්මණකුමාරව යෞවන ප්‍රාප්තව තුන්සෘතුවට සුදුසු වඩ්ඪමානක සිරිවඩ්ඪක සිද්ධත්ථක චන්ද්‍රකයයි යන දෙලොස්යොදුන් උසඇති සෘතුක්ෂම වශයෙන් මාල්හෙදවූ තුන්පායෙහි සතළිස් සත්දහසක් නාටකස්ත්‍රීන්පිරිවරා අටදහසක් අවුරුදු ගිහිගෙයිවැස දෙවියන් විසින් මවාපෑ සතර පූර්විනිමිත්තදැක චන්ද්‍රමුඛීනම් අගමෙහෙසුන් බිසවකුසින් බ්‍රහ්මවඩ්ඪනනම් පුත්රුවන වැදූදිනයෙහි වසන්තනම් පායෙහි සත්රුවන් ගබඩාවෙක හිඳ සත්දවසක් ප්‍රධන්වීර්‍ය්‍යකොට වෙසහමැදි පොහෝදවස් මහබිනික්මන් කෙරෙමියි සිතූ සිත හා සමග ඒ දෙලොස් යොදුන් ප්‍රාසාදයහා පිරිවර එක්ව අහසට පැනනැගී දෙවන සඳමඬලක්සේ බෝමඬ සමීපයට එළඹ පාය දෙරකඩට ගොස් රුවන් කඩුවෙන් කෙස්වැටිය සිඳහැර අහසට දමා මහබඹුදුන් අටපිරිකරපිළිගෙණ දනවි අසූදහසකින් * සත් ලක්ෂ පණස්දහසක් ස්ත්‍රී පුරුෂයන්හා අවශෙෂ ලක්ෂගණන් ස්ත්‍රී පුරුෂයන් සමග මහණව ශීලසංවර සමාදන කොට ගඟට වැඩ ජලස්නානය කිරීමෙන් රන්වන් රූපකාය සෘතුගන්වා චන්ද්‍රමුඛීනම් අගබිසව දුන් මියුරු කිරිපිඩු වළඳා තලිය උඩුගංබලා හැර මිශ්‍රක වනයෙහි දිවාවිහාර කොට වැඩගිඳ සවස් වේලෙහි එක්තරා පුරුෂයකු දුන් කුසතණ අටමිටක් පිළිගෙණ දෙවියන් සැරහූ දිවමහවතට බැස දකුණු දිගින් ගොස් රිදී කඳක් මෙන් සමවටවූ එක්සිය විසිරියන් කඳ ඇති එතැන්හිදී පිහිදුනු ශාඛා

* "සුවාසූදහසකින්"—"නවඅසූදහසකින්"

පසක් ඇතිව ගසමුලපටන් මුදුන් ශාඛාව අග දක්වා දෙසිය සත
ළිස්රියන් උසඇති නැගෙණහිර ශාඛාග්‍රය පටන් බටහිර ශාඛාග්‍ර
යට දෙසිය සතළිස්රියන්පමණඇති දකුණුදිග ශාඛාග්‍රය පටන්
උතුරුදිග ශාඛාග්‍රයට එපමණ ඇති වටින්සත්සියවිසිරියන්ශාඛා
මණ්ඩලයක් ඇති දෙළොස්නැළියක්පමණ දියගන්නා මහත් කැ
කුළු ඇති අසූදහසක් අවුරුදු පරනොවනත්තරම් නැළියක් පමණ
රේණු ඇති මහාරථයක්සා වටඇති අතිශුභ්‍රවූ පෙත්තෙන්ගැවසී
ගත්තාවූ මල් ඇති අතිනීලවූ මහත් ඵල ඇති අතිරක්තව ලිලො
පෙතවූ මෑදු සිතිදු පල්ලව ඇති රන්කැකුළුමෙන් බබළන අංකුර
ඇති මෙසේ ඵලපල්ලවාංකුර පුෂ්පයෙන් යුක්ත නාගබොධිමූල
යට එළඹ තුන්යළක් වට පැදකුණුකොට අපරාජිත ස්ථානයෙහි
කුසතණ සලා වගුරුවා එකොණෙහිම මහපොළොව දෙබෑකොට
නැගී වජ්‍රාසනමස්තකයෙහි ශ්‍රී මහා බොධීන් වහන්සේට පිටලා,
නැගෙණහිරට මූණලා චතුරඞ්ග වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් යුක්තව ප
ළක්බැඳ හුන්කල්හි; එසඳ වශවර්තිමාරයා තමාගේ මාරසෙනාව
මෙහෙයාගෙන මෛත්‍රෙයබුදුන් බුදුවියනොදෙමියි අවුත්සක්වළ
ගල මුවවිටින් ඉස ඔසවා බලා මෛත්‍රිපිඩක් වැනිවූ මුඛමණ්ඩලය
දුක හයින් තැතිගෙන තමා ආ ගමන්තබා ආපසුබිඳී පලාගොස්
තමාගේ වාසස්ථානයටම වන්නේය. මෙසේ දසබිම්බරක් මාර
සෙනාව පිරිවරා ආවාවූ වශවර්තිමාරයා පරදවා තමන්ගේ සිය
ලඟරසින් දිලිහි දිලිහී බෝමඩ එකාලොක කොට බබුළුවමින් හි
දිති, එකල්හි හිරු අස්තගිරිපර්වතගතව දිනාන්තවන්නේය. එසඳ
යාමත්‍රයෙහි ඥානත්‍රය සාක්ෂාත්කොට අලුයම් වේලෙහි ලොවුතුරු
බුදුව මුළුලොව සවණක්ඝන බුදුරැසින් එකාලොක කොට දිව්‍ය
බ්‍රහ්මාදීන් අපමණ සන්තොෂකරවා රන්මෙරක් මෙන් නිශ්චලව
හිඳ, "අනෙකජාතිසංසාරං" යනාදීන් ප්‍රීතිවාක්පවත්වා වජ්‍රාසන
යෙහි ගුණ සලකා සොළලක්ෂයක් සමාපත්තියට සමවැද සත්දව
සක් එහිමහිඳබෝමඩසමීපයෙහිම සත්සතිඉක්මවාබඹහුගේඅයද
මෙන් ඉසිපතන නම් නාවෙනෙහිදී දම්සක් පැවතුන් සූත්‍ර දෙශ
නාකොට මනුෂ්‍යයන්ගෙන් කෙළලක්ෂයක් සතරමග සතරඵල
යෙහි පිහිටුවා දිව්‍යබ්‍රහ්මයන්ගෙන් අප්‍රමාණව නිවන් දක්වා මුළු
ලොව එකහෙළා සාධුකාරදෙවමින් මෙසේ ලෝවැඩ කරන්නාහු
වෙති.

වදාළේමැනෝ-

"උපෙච්ච උය්‍යානවරං ඵුල්ලං නාගවනං ජිනො,
අනුත්තරං ධම්මචක්කං එවං සො වත්තයිස්සති"යි.

මෙසේ ඒ මෛත්‍රෙය සර්වඥරාජෝත්තමයාණන්වහන්සේ දහම්සක් පවත්වා අසෝකාය බ්‍රහ්මදේවය යන අගසව් දෙනමක් හා පදුමාය සුමනායයි යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇතිව සිංහනම් මහතෙරුන්වහන්සේගෙන් උපස්ථාන විඳ අග්‍රඋපස්ථායකාවූ සුධනය සඞ්ඝය යන සිටුවරු දෙදෙනෙකු ඇතිව අග්‍රඋපස්ථායිකාවූ යසවතීය සඞ්ඝාය යන උපාසිකා දෙදෙනකු ඇතිව අසූදහසක් අවුරුද්දට ආයුඇතිව පස්විසි යොදනක් පැතිරසිටිනාවූ ව්‍යාම ප්‍රභාමණ්ඩලයක් ඇතිව අටඅසූරියන් බුදුබඳින් මුළුලොව සරහා බහුශ්‍රැතවූ සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මධරවූ ව්‍යක්තවූ ශීලාදිගුණධර්මයෙන් සමන්විතවූ සඞ්ඝශොභනවූ අර්ථපටිසම්භිදාය ධර්මපටිසම්භිදාය නිරුත්තිපටිසම්භිදාය පටිභානපටිසම්භිදායයි යන සිව්පිළිසිඹියායෙහි දක්ෂවූ පූර්වේනිවාසානුස්මෘතිඥානය දිව්‍යචක්ෂුරභිඥානය දිව්‍යශ්‍රොත්‍රඥානය චෙතොපරියායඥානය ඍද්ධිවිධඥානය ආශ්‍රවක්ෂයකරඥානයයි යන අභිඥා හා සමවත් ඍද්ධිආදීන් යුක්තවූ කෙළලක්ෂයක් රහතුන් පිරිවරා බ්‍රහ්මසෙනා පිරිවැරූ සහම්පතීනම් මහා බ්‍රහ්මයාසේ ස්වකීය ජොතීන් මුළුලොව සරහා තුන්සියයක් යොදුන් පමණඇති අන්තො මණ්ඩලය හා සසියක් යොදුන් පමණ ඇති මධ්‍යමණ්ඩලය හා නවසියයක් යොදුන් පමණ ඇති මහා මණ්ඩලයයි යන මේ ත්‍රිවිධ මණ්ඩලයෙහි ජනපදචාරිකා කොට ලෝවැඩ වඩමින් වෙසෙති. එකල ඒ මෛත්‍රෙය බුදුන්ගේ ධර්මදෙශනා අසා ධර්මාලම්බන ප්‍රීතීන් මත්ව දේහොත් මුදුන් දිදී වැඳ වැඳ සාධුකාර දෙමින් ධර්මයට කන්නමා රූපයට නෙත් යොමුකෙරෙමින් ගුණයට සිත්පහදවා ඔවුනොවුන් පරයා පරදුක්ඛදුක්ඛිත සරණාගත වජ්‍රපඤ්ජර ත්‍රිභුවන චූඩාමාණික්‍ය ධර්මාභරණ විභූෂිත සද්ධර්ම පූජක සද්ධර්මාමෘතදායක යනාදීන් ස්තුතිඝොෂා කෙරෙමින් නික්මුණු දිව්‍යබ්‍රහ්මාදීවූ මහසෙනග පිරිවරා ජනපදචාරිකායෙහි වැඩ සත්වයන්අමාමහනිවන් දක්වන්නාහුය. එකල්හි පළමු එක් ජාතියෙක දිඹුල්දණ්ඩන් ගෙයක්කොට පසේබුදුකෙනෙකුන්වහන්සේට පිළිගැන්වූ කුළපොතු දෙපුතු පියකෙනෙකුන්ගේ පුතණුවෝ ඒ කුශලානුභාවයෙන් සදිව්‍යලොකයෙහි අපමණවූ දිව්‍යසම්පත්විඳ එයින් අවුත් මිනිස්ලොව නොයෙක් සම්පත්තීන් යුක්ත රාජ්‍යශ්‍රීන් සමෘද්ධවූ මහාපතාදනම් රජව ඉපද අසංඛ්‍යයක් අවුරුදු චක්‍රවර්තිරාජ්‍යය කොට එයින් චූතව ගොස් දිව්‍යලොකයෙහි ඉපද දිවසැපත්වළඳ මේ බුද්ධොත්පාදයෙහි භද්දියනම් නුවර භද්දියනම් සිටුව ඉපද මාගේ සසුන් වැද මහණව රහත්ව අමාමහනිවන් දුටහ. ඒ කුළපොතු දෙපුතු පියන්ගෙත් පියාණෝ තමන්කළ පින් වැඩිතරම් හෙයින් මේ බුද්ධාන්තරය මුළුල්ලෙහි සදෙව්ලොව දිව්‍යසම්පත්

වලද ඒකෙතුමතීනම් රාජධානියෙහි සංඛ නම් චක්‍රවර්ති රජව ඉපද පෙර මහාපනාද චක්‍රවර්තිරජ්ජුරුවන් රාජ්‍යයකරණ සම යෙහි ඔවුන්ගේ කුසලානුභාවයෙන් උපන්නාවූ පස්විසියොදුන් ප්‍රාසාදය ගඞ්ගානම් ගඞ්ගාව යමුනානම් ගඞ්ගාව එකතැන්වූතැන දියසළාව ඇතුළෙහි ගැලී තිබී මේ මතු කියනලද සඞ්ඛනම් චක්‍ර වර්ති රජ්ජුරුවන්සමයෙහි අහසටපැනනැඟී කෙතුමතීනම් රාජ ධානියට අවුත් නුවර මධ්‍යයෙහිම පිහිටන්නේය සඞ්ඛනම් චක්‍ර වර්ති රජ්ජුරුවෝද ඒ ප්‍රාසාදයෙහිවැස රාජ්‍යයකරන්නාහු මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ දැක බණ අසා පැහැද තමන්විසූ පස් විසි යොදුන් උසඇති සත්රුවන්ප්‍රාසාදය බුදුපාමොක් මහාසඞ්ඝ යාවහන්සේට පිළිගන්වා කෙළදහසක් පමණ පුරසත්‍රීන්හා සමග මාගීඵලයට පැමිණ එහිභික්ෂුභාවයෙන් මහණව නිවන්දක්නාහ.

එකල්හි ඒ කෙතුමතීනම් රාජධානියෙහි දණ්ඩන් පතින් කළගෙයක වාසයකරන්නාවූ සත්වයෝ ඉතා බහුල නොවෙති, සත්රුවනින් විසිතුරුවූ ප්‍රාසාදවල නිරන්තරයෙන් සොළිනළ යෙහි ඇලුම්කර තම තමන්ගේ සකල සම්පත්තිය දැක සතුටුව වෙ මින් වාසය කෙරෙති, සියලු ජම්බුද්වීපයෙහි කෘෂිවාණිජ්‍යාදිවූ කිසි යම් කර්මාන්තයෙක නියුක්තව බඩනිසා දුක්ගන්නාවූ සත්වයෝ බහුල නොවෙති, සුදුසුභූමිප්‍රදෙශවල සයංජාතහැල් ජනිතවපැසී කුඩු නොමැතිව මුතුසේ සහල්ගෙන සුවඳ හැල්කරල් නමා සිටි නේය, එක බිජුවටක් හුණුප්‍රදෙශයෙන් නැඟී පඳුරකින් කරල් කපා මිරිකූ කල දෙදැස් දෙසිය දෙසැත්තෑ ගැලක්පුරා සොළසා මුණු අටලාසක් සාල් ඉතිරිව තිබෙයි. ඒ සාල් සවණිභාජනයෙහි බහා සූයහිකාන්ත මැණික් උදුනෙහි තුබූකල ජොතිඋද්ගතව පැ සුණු කල සකල සත්වයෝම අනුභවකෙරෙති, මලමූත්‍රාදිවූ සියලු කෘත්‍යයෙහිද ආවාට පෙනී වලාවෙන් පරිච්ඡින්නව අන්තර්ධාන වෙයි, මෙසේ ඒ කෙතුමතීනම් රාජධානියෙහි ඓශ්වය්‍ය වණිනා කරත් මුබනොසෑහෙන පමණ ශ්‍රී සෞභාග්‍යයෙන් දිව්‍යලොකය වත් වඩනේය, එකල සකල ජම්බුද්වීපයද එක මහුල්ගෙයක්සේ සැලසී ඒ ඒ තැන්හි නිකමල්රේණු කපුරුසුණු මුතුසුණුසේ අති ධවල සුදු වැලිතලාවෙන් යුක්තව ප්‍රසන්න සිහිල්ජලයෙන්යුක්ත ගඟුල් හැලි විල් පොකුණු පතැස් ළිං ආදියෙන් ශොභමානවිය. ජම්බුද්වීපවාසිවූ ජනයෝ දිව්‍ය සම්පත්තියක් හා සාදෘශ්‍යවූ මනුෂ්‍ය සම්පත් විඳ ජරාවිළිපිළි රොගාන්තරායක් නැතිව දිව්‍ය ශරීර හා සමානවූ නිර්ව්‍යාධි ශරීර ඇතිව කායිකමානසිකදුඃඛයෙහි ගුණ

නුගුණනම් කෙසේබවත් නොදත සත්වයෝ දිව්‍යසමූහයක්සේ වාසය කරන්නාහුය.

ඒබව ප්‍රකාශකොට දක්වනලද මැයි මෙතොනාශ්‍ය වශ්‍යාවෙහි-

"අනන්තභොගෙහි ජනෙහි පූජිතං
මනුඤ්ඤපාසාදමනෙක තොරණං,
සුගොපුරං දෙවපුරංව භාසුරං
පුරං භවෙ කෙතුමතීති විස්සුතං.

සදාවිභවසමිද්ධිං පෙක්ඛතෙ ජම්බුදීපා
සතතමුදිතචිත්තා පඤ්චකාමාභිරත්තා,
විවිධසුරභිභූසා භූසිතත්තා සුරූපා
විගත සකලරොගා දෙවදෙහාව හොන්ති"යි.

මෙසේ ඒ සුවාසූදහසක් රාජධානියෙන් ශොභමානවූ ජම්බුද්වීපයෙහි සකල සත්වයන්ට කුශලක්ෂෙත්‍රව සුදසු ජනයන් සෝවාන්මාර්ගයෙන්ද ඵලයෙන්ද සකෘදාගාමිමාර්ගයෙන්ද ඵලයෙන්ද අනාගාමි මාර්ගයෙන්ද ඵලයෙන්ද අර්හත්මාර්ගයෙන්ද ඵලයෙන් දැයි යන මේ සතරමග සතර ඵලයෙන් නිවන්දක්වා නිරන්තරයෙන් කෙළලක්ෂයක් රහතුන්පිරිවරා සිව්වණක්පමිත් සතුටුකරවමින් ත්‍රිවිධමණ්ඩලාදියෙහි සැරිසරා බුද්ධශ්‍රීන් විරාජමානව වඩිමින් ජගදභිවෘද්ධ්‍යසාවූ ඒ මෛත්‍රෙයබුදුන්ගේ ප්‍රමාණාතික්‍රාන්ත බුද්ධශ්‍රීය මෙබඳුයයි ප්‍රකාශකොට දක්වන්ට බුදුකෙනෙකුන්වහන්සේටවිනා ලෞකික සාවර සත්වයක්හටත් නොපිළිවන. එසේහෙයින් අසග ශාරිපුත්‍රස්ථවිරයයි වදාරා මෛත්‍රෙයබුදුන්ගේ බුද්ධශ්‍රීය සර්වප්‍රකාරයෙන් වර්ණනාකරන්ට නොපිළිවනැයි වදාරන අපබුදුහු මේ මතු කියන ගාථාව වදාළසේක.

"අනප්පකං පුඤ්ඤරාසිං මෙත්තෙය්‍යස්ස මහායසං,
න සක්කා සබ්බසො වත්තුං විත්ථාරෙනෙව කස්සචි"යි.

මෙසේ ප්‍රථම ශ්‍රාවකවූ ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේගේ ආරාධනාවෙන් බුද්ධවංශදෙශනාව කොළවර අනාගතවංශදෙශනාව ප්‍රකාශකොටනිමවා වදාරා තමන්වහන්සේවඩිනට මැලිවූ ඥාතිගණයා මධ්‍යයෙහි මෙසේ අද්භූතවූ යමකප්‍රාතිහාර්‍ය්‍ය දක්වා ඔවුන් මහ සුලඟින් මුලිනුපුළ සල්වනයක්සේ එකහෙළා සාධුකාර දෙවමින් වැඳ වැතිර ගිය කල්හි ඔවුන්ට අමා මහ

නිවන්සැපත් බෙදදෙමින් අපමණ සතුටුකරවා රුවන්සක්මනින් බැස ශ්‍රාවකගණයා පිරිවරා නිග්‍රොධාරාමයෙහි ධර්මසභා මණ්ඩපයමැද පණවනලද බුඩාසනමස්තකයෙහි වැඩහිඳ චතුර්විධ බ්‍රහ්ම විහරණයෙන් එදවස් කාලාතික්‍රාන්තකොට දෙවන දවස් උදසන්හිම ශරීරප්‍රතිජග්ගනකෘත්‍යයනිමවා විසිදහසක් රහතුන්වහන්සේ පිරිවරා ගැටවටුගන්වාගෙන පාත්‍රයගනිමින් ශ්‍රමණසාරුප්‍යවෙෂභූෂිතව අනොපමෙය්‍යවූ බුඩ ලීලාවෙන් කිඹුල්වත්පුරයටවැද ගෙපිළිවෙළින්පිඩුසිඟන්ටපටන්ගත්සේක.

එකල්හි සුඩොදන රජ්ජුරුවෝ බුදුහු නුවරටවැඩ ගෙපිළිවෙළින් පිඩුසිඟනියි යනු අසා දොම්නස්ව මට මෙසේවූ පරිභවයෙක් කුමක් පිණිස කරනසේක්දැයි වහා අවුදින් මහවේ මැද බැස සිඟන්නාවූ බුදුරජහු දැක ස්වාමිනි මෙබඳුවූ රාජ්‍යශ්‍රීයක් විඳිනාවූ මාගේ නුවරටපැමිණ කුමක්පිණිස සිඟනසේක්දැයි නොයෙක්පරිද්දෙන් කියමින් පසඟ පිහිටුවා වැඳ රජගෙට වැඩිය මැනවැයි ආරාධනා කොරෙමින් සිටිකල්හි බුදුහු ඕහට රුවන්ගබඩාවකින් උත්කෘෂ්ටමාණික්‍යරත්නයක් තෝරා ගෙන හැර දෙන්නාක්මෙන්,

"උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය ධම්මං සුචරිතං චරෙ,
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හිච"

යනුහෙයින් තමාගේ ගෘහද්වාරයෙහි සිට ලැබියයුතු භික්‍ෂායෙහි ප්‍රමාදනොවන්නේය. හෙවත් යහපත්වූ ආහාර ඛාද්‍ය භොජ්‍යයන් උවමැනවැයි සෙ,යා නැතින්නැත නොහැම්දඅලෙපවජවූ සිතින්ම ගෙපිළිවෙළින් සිඟාසිට ලදදෙයකින් යැපී ජීවිතය රක්‍ෂාකොට නිවන්දැක්මට උත්සාහකරන්නේය, තෘෂ්ණාවසඟව සිහිමුළානොවී සුචරිතවූ මේ ධර්මයෙහි හැසිරෙන්නේය. මේ ධර්මයෙහි හැසිර පවත්නාවූ සත්පුරුෂතෙම මේ ලොකයෙහිද පරලොකයෙහිද සියලු සත්වයන්ට ප්‍රියමනාපව කායික චෛතසික දුක්ඛයකට නොපැමිණ සැපයෙන්ම දිව්‍යමනුෂ්‍ය සම්පත් වළඳා කෙළවර අමාමහ නිවන් දක්නේයයි යනාදීන් පිතෘස්ථානයෙහි සිටි සුදවුන්මහරජහට ධර්මදෙශනාකොට පළමුවන සෝවාන්මාර්ගඵලයෙන් නිවන් දක්වා වදාළසේක. එකල සුඩොදන මහරජතෙම මහත්වූ සන්තොෂයෙන් වැඳ සිටියේය. බුදුහු දෙවනගාථාවෙන් ධර්මදෙසා ඔහු සකෘදාගාමීමාර්ගඵලයෙහි පිහිටවූ සේක. මෙසේ සෝවාන් සකෘදාගාමි මාර්ගඵලයෙහිපිහිටා බුදුන් ප්‍රධානකොට ඇති විසිදහසක් රහතුන්වහන්සේ තමාගේ මාලිගාවට වැඩමකරවාගෙන ගොස් රසමසවුලෙන් යුක්තවූ අග්‍ර භොජනය වළඳවා ඉක්බිති පස්පලවතින්යුත් බෙහෙත් පිළි

ගන්වා බුදුපාමොක් මහා සඞ්ඝයාවහන්සේ වැද එකත්පස්ව හුන්නාවූ සුදොවුන් මහරජාණන් ඇතුළුවූ රජපර්ෂත් මණ්ඩපයෙහි දනානිසංසයෙන් අනුමෙවෙනි බණ වදාරමින් බුද්ධාසනාරූඪව වැඩහුන්සේක. එකල්හි සුද්ධොදන මහරජාණන් ඇතුළුවූ එක් ලක්ෂ සැටදහසක් පමණ ශාක්‍ය රජ දරුවෝ බුදුන් හා සමග මහරහතුන් වහන්සේ උත්සවයෙන් වැඩම කරවාගෙන ගොස් නිග්‍රොධාරාමයෙහිම * රැස්වූහ.

එකල්හි අප බුදුහු මුළුලොව එකමඟුල් ගෙයක්සේ සද්ධර්මමෘදඞ්ග ඝොෂාපවත්වමින් දහම්නැමැති පහන් දල්වමින් අමෘත වාක් නැමැති සුධා භොජනය වළඳවමින් බ්‍රහ්මඝොෂා නැමැති ජයකෙතු නංවමින් මුදිතවචන නැමැති විතානයෙන් සදමින් ලලිතවාක් නැමැති මල්දම් එල්වමින් රතිකරගිරා නැමැති පස් මල් ඉසිමින් මධුර භාරති නැමැති පුන්කලස් තබමින් නානා නයනිපුණ බණදෙසුම් නැමැති සුවඳදුම් ලවමින් මෙසේ අපමණවූ ධර්මොත්සවයෙන් බබුළුවා ශාරිපුත්‍ර මෞද්ගල්‍යායන නම්වූ අගසව් දෙදෙනාවහන්සේහා ක්ෂෙමාස උත්පලවර්ණායයි යන අග්‍රශ්‍රාවිකාදෙදෙනෙකුඇතිව අනඳමහතෙරුන්වහන්සේගේ උපස්ථාන විඳ අසූමහසව්වන්වහන්සේහා බොහෝරහතුන්වහන්සේ පිරිවරා සිව්වණක් පර්ෂත්හා සමග ගම්නියංගම් රාජධානි පිළිවෙළින් දනව්සැරිසරා සඤ්චානුග්‍රහයෙන්මහවනවිහාර ජෙතවනවිහාරාදි බොහෝ ආරාම පිළිගෙන එහි මෙත්තා කරුණා මුදිතා උපෙක්ෂායයි යන සතරබ්‍රහ්මවිහරණයෙන් යුක්තව චතුර්විධ ඊර්‍ය්‍යාපථයෙන් වාසයකෙරෙමින්;

තවද ආලවක අඞ්ගුලිමාල සූචිරොම ඛරරොම බකබ්‍රහ්ම චූළොදර මහොදරාදීවූ අති දරුණු සත්වයන්ගේ චිත්තයන් මෘදු කරවනු පිණිස කරුණාවෙන් ඔවුන් වාසයකරන්නාවූ ස්ථානවලට තමන්වහන්සේම වැඩ බණදෙසා සංසාරබන්ධනයෙන් මිදීමට උපදෙස්දෙමින්, සමස්තජනයන්කෙරෙහි පතළාවූ මෛත්‍රියෙන් මො හුරාග චරිතයහ වෙෂ චරිතයහ මොහචරිතයහ ශ්‍රද්ධාචරිතයහ බුද්ධිචරිතයහ විතර්කචරිතයහයි සිත් හැඳින ඔවුන්ගේ චරිතානුකූලවූ ලෙසට සූවිසිතැනක වැඩහිඳ සූවිසි ධර්මදෙශනාවක් කොට සූවිසිඅසඞ්ඛ්‍යයක්සත්වයන් සෝවාන්මාර්ගඵලයෙන්ද සූවිසිඅසඞ්ඛ්‍යයක් සත්වයන් සකෘදාගාමි මාර්ගඵලයෙන්ද සූවිසිඅසඞ්ඛ්‍යයක් සත්වයන් අනාගාමිමාර්ගඵලයෙන්ද සූවිසිඅසඞ්ඛ්‍යයක්සත්වයන් අර්හත් මාර්ගඵලයෙන්දඅමාමහනිවන්දක්වා; තවද එකානුසන්ධික නානානුසන්ධික ජාතක සූත්‍රාභිධර්මදෙශනාස්ථානාදියෙහිදී සොළ කොටිගණන් සත්වයන් සතරමග සතර ඵලයට පමුණුවාතිවන්පුරපුරවමින්පූර්වබුද්ධවරයන්වහන්සේවිසින්කළාවූ බුද්ධ කෘත්‍යයන් නොවරදවාම පුරා, මතුබුදුවෙන බුදුවරයන්ට නය තගාතබමින් සකල සත්වයන්ගේ පිණින් පෙනීගිය අද්භූත

* "වස්වැස්සවූහ."

කල්පවෘක්ෂයක්සේ අචින්ත්‍යචින්තාමාණික්‍යයක්සේ මුළුලොව සජ්ජිතකෙරෙමින් වැඩවසනසේක. ඒබවප්‍රකාශකොට දක්වන ලදමැයි අපගේගුරුවූධර්මකීර්ති මහාස්වාමිපාදයාණන්වහන්සේ විසින් **ජිනබොධාවලියෙහි;**

"එවං සො ලොකනාථො සභයජලකරෙ සංසරන්තො භවස්මිං
දිස්වා බුඬෙ ජිනන්තෙ සතතරතමනො පාරමී පූරයිත්වා;
පත්තො අස්සත්ථමූලෙ නිඛිලසුඛපදං බුඞරජ්ජනන්ති සුඞං
වන්දේතං චාපි බොධිං හතදුරිතතමං ගොතමං නාම නාථං"යි

මෙසේ මේඅභිනීහාරකථාවෙහි දක්වනලද දීපඞ්කරාදීවූසියලු බුදුවරයෝම තමතමන් එමවිට ලැබන නිවන්සම්පත් හැර සත්ත්ව කාරුණ්‍යවෙන් සසරවිඳිනාදුක් නිවන්සේගෙන සංසාරදුර්ගයට වැද ඒ ඒ ජාතියෙහි නොසිතියහැකි දානවස්තූන් යාචකයන්ට දන්දීමෙන් ශ්‍රද්ධාදිවූ පඤ්චවිධකුශලයන්ද ලොකාර්ථචර්‍ය්‍යාදිවූ ත්‍රිවිධචර්‍ය්‍යාවන්ද දානශීලාදිවූ දශවිධපුණ්‍යක්‍රියාවස්තූන්ද දානාදිවූ සමතිස් පෙරුම්දපුරමින් සත්ත්වකාරුණ්‍යවෙන් ආත්මප්‍රේමය හැර අවිෂය්‍ය සසරදුක් සහනයකොට පරවැඩ කළබැවින් දැන් සකලසත්ත්වයන්ට වඩා ගුණයෙන් අගපැමිණ දුක්න් මිදී සැපයෙහි පිහිටා තමන්වහන්සේලාසිතූ අදහසම සිඬකෙරෙමින් අපමණසත්ත්වයන් සසරින් ගොඩලූහෙයිනුත් ඒ කළාවූ සත්ත්වානුග්‍රහයෙන් සමස්තලොකවාසීන්ට ප්‍රියකාරුවෙමින් ඔවුන් තුඞ තුඞම් තමන්හා සමකෙනෙක් ලෙව්හි නැතැයි සනෙත්‍රාෂගීතිකාහා කීර්ත්තිඝොෂාවන්පවත්වා සත්ත්වාධිපතිවූබව නුවණැතිමධ්‍යස්ථ සත්පුරුෂයන්විසින් සිත්හෙලා පරීක්ෂාකළකල ප්‍රත්‍යක්ෂයෙන් දැනුණේවීනම් කවරනම් සත්ත්වයෙක් ආත්මප්‍රේම කෙරේද පර වැඩකිරීමෙහි මදවිගසක් ප්‍රමාද වේද එසේහෙයින් නුවණැති උත්තමයන් විසින් රුදෙවෙහි නොපමාව පරවැඩෙහිම නියුක්තව සියලු අකුසල් දුරුකොට කුසල්රුස්කොට ලෞකික ලොකොත්තරසම්පත් සිඬකරන්ට උත්සාහ කටයුතු.

දක්වනලදමැයි.

"මහාදයස්සාපි ජිනස්ස කඩ්ඪනං
විහාය පත්තං අමතං සුඛම්පි තෙ'
කරිංසු ලොකස්ස හිතං තහිං තහිං
භවෙය්‍ය කො ලොකහිතෙ පමාදවා"

මෙතෙකින් මේ සඬර්මරත්නාකරයෙහි
සමකප්‍රාතිහාර්‍ය්‍යයෙහි දැක්වූ
මේඝනාඝ්‍යසඞ්ග්‍රහකථානම්වූ
## පස්වන පරිච්ඡේදය
කියා නිමවනලදී.

# සවන පරිච්ඡේදය.

---

## තවද මේ සද්ධර්ම රත්නාකරයෙහි

## බුද්ධාද්භූත ක්‍රියා සඞ්ග්‍රහ කථා නම් කවරහයත්?

යට කියනලද සූවිසිවිවරණයෙහි මෙන් ලබනලද ප්‍රථමාභිනීහාර නම්වූ පළමුවන විවරණයලත් බෝධිසත්ත්වවරයන්ගේ චිත්තය අකුසලයෙහි සංකුචිතව කුසලයෙහි ප්‍රබෝධවන්නේය. කුමක්මෙන්දයත්' අකුශලකර්මය අරමුණුවූකල්හි චිත්තය ගින්නට පෑ කුකුළුපතක්මෙන් හැකිලෙන්නේය. කුශලකර්මයෙහි අතිවිශාලව පවත්නේය කුමක්මෙන්දයත්; දිගුපුළුල් ශුක්‍රවිතානයක් මෙන්ද ප්‍රසන්න ජලතලාවක් මුදුනෙහි ව්‍යාප්තවූ තිමිල තෛලයක් මෙන්ද පැතිරපවත්නේය. එමෙන් කුසිතභාවයෙහි චිත්තය සංකුචිතව වීර්‍ය්‍යවැඩීමෙහි චිත්තය පැතිර පවත්නේයි. මේ කුශලකරණයෙහි පැවැත්තාවූ වීර්‍ය්‍යවත් චිත්තය ශ්‍රමණ බ්‍රාහ්මණ දිව්‍ය බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වරාදීවූ කවර තරම් පුරුෂයක්හු විසිනුත් පසුබස්වාලිය නොහැක්කේමය.

### ඒ එසේමැයි.

එක් සමයෙක්හී වීරවික්‍රමෛකමන්දිරවූ අප මහබෝසතාණන් වහන්සේ අපරාපරයවේද්‍ය අකුශලකර්මයකින් ලෙහෙනව උපන් සේක. එසමයෙහි එක් වනලැහැබක කැඳුල්ලක් බැඳ පැටියන් ලවමින් වටින් ගොදුරු ගෙනවුත් ලමින් පැටියන් රක්ෂාකොට එතැන්හි වසනකල්හි එක්දවසක් මහාමෙඝයෙක් උද්ගතව දස දිග අඳුරු බිහිරිකොරෙමින් සියදහස්ගණන් විදුලිය පැහැර ඉඳු සැව් නමා මහත්වූ මේඝනාද පවත්වා ධාරානිපාතයෙන් වැසි වසින්ට පටන්ගත. එකල්හි ඇළ අමුණු ගං හෝ එකහෙළා දිය පිරී ඉතිරී මහවතුරෙන් රුක් මුලිනුපුටහෙළමින් කඳක් බිඳ උපුල්වාගෙන තැනතැන ගල් මූල්හි පැහැරඋදුරමින් කුද්‍ර මහත් ද්විපදචතුෂ්පද ජාතීන්ට බොහෝව්‍යසනකොරෙමින් මහත්වනාය එකහෙළා වෙවුල්වා තඹවතුරෙන් අතුරුනොහැර භයානකවූ

ශබ්ද පවත්වමින් රළ රැළිදිදී හැළි ගසා දිවනට වන. එකල්හි දිවගත් මහවතුරෙන් කලන්දකබෝධිසත්වයන්ගේ දරුපැටියන් හා සමග කැදැල්ල උපුල්වා ගෙනගොස් මුහුදටවන. එකල්හි ලෙහෙනව උපන් අප මහ බෝසතාණෝ මුහුද වැටුණාවූ තමන්ගේ දරුපැටියන් ගොඩලා ගනිමියි යන උදාරතර වියසීයෙන් මහමුහුද ඉසිමියි පටන්ගෙන වාලධිය මුහුද ගළගළා දිය ගොඩ ඉස ඉස මහමුහුද දිය ඉස නිමවමියි සිතූසේක. මෙසේ දිය ඉස මුහුද වේලවා දරුපැටියන් ගොඩලා ගනිමියි යන වියසී අදහසින් උත්සාහකරන්ට වන්සඳ සත්දවසක් ඉක්මුණුකල්හි අප මහබෝසතාණන්ගේ උදාරතරවියසීධ්‍යාසයේ මහත්වයෙන් ශක්‍රදෙවේන්ද්‍රයාගේ පාණ්ඩුකම්බලශෛලාසනය හුණුවිය. එකල්හි දහසක් නුවණැස් ඇත්තාවූ ශක්‍රදෙවේන්ද්‍රතෙමේ ප්‍රඥානයනයෙන් මිනිස්ලොවබලනුයේ පුරනලද බොධිසම්භාරඇති මහබෝසතාණන්ගේ මේ චරිතාධ්‍යාසය දැක මිනිස්ලොවට අවුත් මහමුහුද ඉස්නා බෝසතුන්ට අභිමුඛව සිට තමා දක්වා කියනුයේ එම්බා ලෙහෙණාණෙනි වාලධිය මහමුහුදදියේ ගළගළා දිය බිඳු ගොඩ ඉස ඉස ඉඳිනෝ කවරකාරණයක්පිණිසද ඒකාරණය මට නොවළහා ඉඳුරාම කියවයි කීහ.

අප මහබෝසතාණෝ ඔහු කී බසටකියන්නාහු: මහවතුරෙන් උපුල්වා කැදැල්ලහා සමග මාගේ දරුපැටියන් ගෙනගොස් මේ මහමුහුද හෙළනලද්දේය, එසේහෙයින් මේමුහුදුදියත් තමාගේ වාලධිය තෙමා ගොඩඉස මුහුදවියලවා දරුපැටියන්ඇරගන්නා පිණිස උත්සාහකෙරෙමියිකීහ. එබස්අසාශක්‍රදෙවේන්ද්‍රයාකියනුයේ එම්බාලෙහෙණ නුඹ තිරිසන්යොනියෙහි උපන්හෙයින් නුවණමදව නොදන්නේමුත් මේමහා සමුද්‍රයනම් සතිස්ලක්ෂදසදහස් තුන්සියපණස්යොත්නක් වට ඇත්තේය, සුවාසූදහසක් යොදුන් ගැඹුර ඇත්තේය, මෙසේවූ මහමුහුද වාලධිය තෙම තෙමා ගොඩ ඉස ඉස දිය නිමවන්නේ කවරකලෙකද්දැයි එසේහෙයින් තිරිසන්යොනියෙහි උපන්ක්ෂුද්‍රප්‍රාණීවූ නුඹ වැන්නවුන් තබා බලසම්පන්නවූ දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදිවූ යම්කිසි ආනුභාව සම්පන්න මහාපුරුෂයෝ සියෙක් දහසෙක් කෙළෙක් විනමුත් සෘද්ධිආදිවූ ආනුභාවයක් නැතිව තමාගේශක්තියෙන් මේ මහමුහුද දියකද ඉස නිමවාගත නොහෙති කීහ. එබසට වීරවික්‍රමෙක මන්දිරවූ අප මහබෝසතාණෝ මේ කීවාවූ ශක්‍රදෙවේන්ද්‍රයාබලා ඔහට කියන්නාහු: එම්බල ශෞරවියසීඇති කාපිකාවූ මහාපුරුෂයාණෙනි නුඹ සේම කීපදෙනෙකු ලද හොත් මුහුද දිය ඉස්නා තබා කවරනම් කාරියක් සිඬ නොකොටගත නොහැක්කේද, නුඹ කාරනකථාවෙන් මසිතඇති වියසීවන්කාම්ප්‍රකාශවිය එසේහෙයින් නුඹවැනි නිරුත්සාහ කුසීතයන් හා සමග කථා

කොට දුන් කාලක්ෂෙපකිරිම අපවැන්නවුන්ට සුදුස්සෙක් නොවෙයි එසේහෙයින් මෙතන මද විගසකුත් නොසිට වහා නික්මයවයි කීහ. එබස් අසා ශක්‍රදෙවෙන්ද්‍රතෙම සිතනුයේ; මෙබඳු අසදෘශවූ වීර්‍ය්‍යවත් මහාපුරුෂයාණන්විසින් සිතූ කාරිය සිඬකොට දුනමැනවයි සිතා තමාගේ ශක්‍රාත්මභාවයෙන් සැදීපැහැදීසිට බොධිසත්වයන්ගේ දරුපැටියන් ගොඩලා දෙමින් අභිමතාර්ථය සිඬකොළේය;

මෙසේ මහත්වූ වීර්‍ය්‍යඇති බොධිසත්වයෝ පාරමිතාපුරන්නාහු දශපාරමිතාවන්ම වීර්‍ය්‍යපෙරදැරිකොටම පුරන්නාහ. එසේහෙයින් බුඬකාරකධර්මයන් පූරණයකිරිමට ප්‍රඥාවීර්‍ය්‍යම ප්‍රධානවන්නේය. එසේ හෙයින් බුඬත්වය ප්‍රාර්ථනාකරන්නාවූ සියලු සත්වයන්විසින්ම ප්‍රඥාවීර්‍ය්‍යයෙන් යුක්තවනලෙස ප්‍රාර්ථනා කටයුත්තේය.

**එසේහෙයින් කියනලදි—**

**බුද්ධකාරකධම්මපූරණෙ පධානං හිතිබීචිද්දං ධනං’**
**දසපාරමිතො තථා පි වෙ පුරක්ඛත්වා විරියං සුපූරති’’**

——

මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
**ප්‍රථමබුද්ධාද්භූත ක්‍රියා සංග්‍රහ කලණ්ඩක කථානම්වූ**
**සවන පරිච්ඡෙදය.**
කියා නිමවනලදී.

——

## සත්වන පරිච්ඡෙදය.

තවද මේ සද්ධර්මරත්නාකරයෙහි මිළිඳුකථාවනම් කවරහයත්?
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාය.

**ඒ කෙසේදයත්?**

එක්සමයෙක්හි සාගලනුවර රජකරන මිළිඳුමහරජතෙම **නාගසෙන** මහතෙරුන්වහන්සේඅතින් උභතොකොටික ප්‍රශ්නයක් විචාළේය. ඊට කාරණා කිමයත්? පූර්වොපචිත කුශලබලයෙන් ඒ මිළිඳු මහරජතෙම නුවණින් අගපැමිණ එසේම අපරි

මිත ප්‍රඥානුභාව සම්පන්නවූ නාගසේන මහතෙරුන්වහන්සේ විසින් විසඳීමට විෂයවූ නොයෙක් ප්‍රශ්නයන්විචාරන්නාහු; මේ මතු කියන උභතොකොටික ප්‍රශ්නය විචාළහ. ඒ පූර්වොපචිත කුශලකර්මය නම් කාවරහයත්?

ඍටගියදවස කාශ්‍යප බුදුරජාණන්වහන්සේගේ බුද්ධශාසනය පවතිනාකල්හි එක්ගඞ්ගාවක්සමීපයෙහි මහාවිහාරයෙක්වූයේය ඒ විහාරයෙහි බොහෝ භික්ෂුසඞ්ඝයාවහන්සේ වැඩවසනසේක, එයින් එක් පිරිවෙණක වසන වත්පිළිවෙත් සරු ශීලාචාරගුණයෙන් යු ත එක් භික්ෂුකෙනෙකුන්වහන්සේ බුදුගුණ සිහිකෙරෙමින් මළුව හැමද කුණුගොඩකොට අතවැසි සමණේරනමකට කියනසේක්: එම්බා සාමණේරයෙනි! මෙසේ අවුත් මේහැමද රැස්කළ කුණුදමවයි කීසේක. එබස් අස අසාම නෑසුණුකෙනෙකුන්සේ යන්ට වන්සේක. නැවත නැවතත් දෙතුන්වැනිව කුණු දමන්ට කියදීත් නොඇසූ කන්වම යනහෙයින් මේ නොකීකරු සාමණේරයෙකැයි හික්මවනුපිණිස ඔහට කිපුණු ආකාරයක්මෙන් දක්වා ඔහු ළහට වහ වහා ගොස් අතතුබූ මුසුන්මිට මුලදසාට පෙරළා, අල්වාගෙන පිටට පාරකීපයක් දුන්සේක එවේලෙහි සාමණේරතෙමේ හ න්නැතිගෙන අඬඅඬා කීකරු නමක්සේ යුහුයුහුව කුණුගොඩළහට ගොස් උක්කුට්ටකයෙන් හිඳ කරකැවී පහරදුන් නැතැත්තන්වහන්සේගේ මුහුණ යට සින් බලබලා කුණුගොඩ උක ගෙන ගොස් බැහැරදමමින් ගංතොටටපැමිණ අතසෝදමින්හිඳ කියනුයේ: මම මේ කුණුදැමූවාවූ කුශලානුභාවයෙන් නිවන්දක්නා ජාති දක්වා මේ අතර උපනුපන් ජාතියෙහිමධ්‍යාහ්න සූර්‍ය්‍යමණ්ඩලය මෙන් මහත් තෙජස් ඇතිවෙම්වයි මහෙශාඛ්‍යව සර්වාධිපතිව මහත්වූ ප්‍රඥාවෙන් යුක්තව මහත් ඉසුරු ඇති වෙම්වයි ගුණරූපාදීන් දුටුදුටුවන් සතුටුකරවම්වයි මේ ගඞ්ගාවෙහි රළසමූහය ජනිතව අගණිතව මතුමත්තෙහි යුහුයුහුව වෙගයෙන් එන්නාක් මෙන් ක්ෂයනොවන්නාවූ සර්වානොත්පත්තික ප්‍රඥාව පහළ වෙවයි කියකියා ගඞ්ගාතීර වෙරළස උන්හ.

**ඒසේහෙයින් කියනලදී—**

"ඉමිනා කචවරබ්‍රෑහ ඡඩ්ඩපුඤ්ඤෙනිතොපරං,
නිබ්බාණං යාව පප්පොමි තාව එත්ථන්තරෙ අහං
භවෙ භවෙසු නිබ්බත්තො ඨානෙ ඨානෙ මනොරමෙ,
අනෙකසිරිසම්පත්තිං ලභිත්වා * දෙවමානුසෙ.

* අභුත්වා

සුරියො විය මජ්ඣන්හලොකපජ්ජොතජොතිනො,
ආභාතු ජනමද්ධිත්වා තෙජසා මෙ දිසො දිසං.
මහෙසක්ඛො මහාපඤ්ඤො ජනාධිපමහිස්සරො,
භවෙය්‍යං ගුණරූපාදීකාච සාදිච්චනසන්නිභො.
ගඟරාය ගතං ගංගා උම්මිහි ඓනුදික්ඛිය,
ඉමාව පටිභානා මෙ සදා භවතු අක්ඛයං.
ඨානුප්පත්තිකපඤ්ඤාය ජන්තූනමවනිතලෙ,
භවෙය්‍යං මතිමුත්තානං ගජානං කෙසරී යථා''ති.

යනාදීන් තමන් කළාවූ කුශලාවර්ජනාකොරෙමින් උන්කල්හි මළුවහැමදි භික්ෂුතෙම මූස්න මුසුන්හලතබා ජලස්නානය කරනු පිණිස ගංතොටට ගියේ සාමණේරයන් කරන්නාවූ මෙබඳු ප්‍රාර්ථනාව අසා මේ සාමණේරතෙම මා හැමදි මළුවෙහි කුණුවිචරක් බලයෙන් දැම්මූවාට මෙසේ අභිමානයෙන් ප්‍රාර්ථනා කොළේය. මළුව හැමද කුණුදැම්මූ මට කවරතම් ප්‍රාර්ථනාවක් සිඩනොවේදැයි සිතා උන්වහන්සේත් ප්‍රාර්ථනාකරනසේක් මම මේ මළුව හැමන්දවූ කුශලානුභාවයෙන් නිවන්දක්නාජාති දක්වා උපනුපන්ජාතියෙහි මේ ගඞ්ගාරළපහරදවගත් වෙගය මෙන් ක්ෂය නොවන්නාවූ අප්‍රමාණප්‍රඥයෙන් යුක්තවෙම්වයි මොහු විචාළාවූ කිසියම් ප්‍රශනයෙක් ඇද්ද ඒ හැම වෙරළටපැමිණි රළමෙන් මකා විද ඒ රළඔබා මතුව එන රළමෙන් මාගේ වචනයම මුදුන් පත්වේවයි යනාදීන් ඒ භික්ෂූන්වහන්සේද ප්‍රාර්ථනා කළසේක.

එසේහෙයින් කියනලදී—

"සුත්වා සො භික්ඛු ආගන්ත්වා සාමණෙරස්ස පත්ථනං.
මයා පයොජිතං පුඤ්ඤං කත්වා වදති ඊදිසං
මය්හං කිංනු න සිජ්ඣති කතසම්මජ්ජනාදිනා,
ඉති සො භික්ඛු චින්තෙත්වා අකාසි පටිපත්ථනං.
යාවාහං සන්තනිබ්බාණං පප්පොමෙත්ථ භවන්තරෙ,†
උප්පන්නුප්පන්නඨානෙසු භවෙය්‍යං විබුධාධිපො.
අයං ගඞ්ගාතරඞ්ගොසො ආගන්ත්වා තීරසන්තිකං,
විලීයන්ති තථෙවස්ස කත්වා වචනමද්දනං.
පුනාගතූම්මිවෙගොව වචනං මෙ නිරන්තරං;
වත්තතු මත්ථකං පත්වා සබ්බසං පියමාවහං.
ඉමිනා පුච්ඡිතං පඤ්හං විජටෙත්වාන දස්සිතුං;
සමත්ථොහං භවෙය්‍යං තං හත්ථාමලකසන්නිභං''ති.

† පප්පොමෙත්ථන්තරෙ භවෙ,

යනාදීන් ප්‍රාර්ථනාකළාවූ ඒ භික්ෂු සාමණේර දෙදෙනා වහන්සේම දිව්‍යමනුෂ්‍ය ලෝකවලයෙහි ඉපද බුද්ධාන්තරයක් මුළුල්ලෙහි නරසුරඉසුරුවිඳ මේ බුද්ධොත්පාදයෙහි අපබුදුන්බුදුවඅමෘතමහාමේඝයක්සේ ධර්මදෙශනාකොට සත්වයන් අමාමහ නිවන් දක්වා නිවන්පුර පැමිණි පන්සියයක් අවුරුදු ගියකල්හි ඒ සාමණේර තෙම ජම්බුද්වීපයෙහි යොන්රට සාගලනම් නුවර අපමණ ශ්‍රීසමෘද්ධියෙන් යුක්තව ඉපද මිලිඳුරජ නම් විය. මෙසේ කරනලද්දාවූ ප්‍රාර්ථනා බලයෙන් එනුවර රජපැමිණි මිලිඳු මහරජතෙම ප්‍රඥාප්‍රවාහයන්ට සමුද්‍රයක් වැනිවිය. සිව්සැටකලා ශිල්පනැමැති ගඟ නගඬගාව වතළ තියග්ගලය වැනිවිය. එකුන්විසිවාදීන් නැමැති හස්තීන්ට කේශරසිංහරාජයකු වැනිවිය. අපරිමිතතීර්ථකනැමැති මෘගසණ්ඩමර්දනයට පුණ්ඩරීකයක්හු වැනිවිය. සියලුදඹදිව මිලිඳු රජහු සාදෘශ්‍යප්‍රාඥයෙක් නොමඇත්තේයයි ප්‍රසිද්ධවිය තවද බලයෙන්ද ජවයෙන්ද ශෞර්යයෙන්ද භොගයෙන්ද ධනයෙන්ද බලවාහනයෙන්ද මිලිඳු මහරජහට වැනිතරම් රජෙක් මුළුදඹදිව නැතැයි ප්‍රසිද්ධවිය. මෙසේ අපමණවූ ශ්‍රීසමෘද්ධියෙන් රජසිරිවිඳින මිලිඳුමහ රජතෙම එක්දවසෙක්හි බලසෙනග පිරිවරා සිව්රඟ සෙනග සමෘද්ධි දක්නාපිණිස නුවර වහසලින් නික්මගොස් නුවරින්පිටත මහඑළියකදී සිව්රඟසෙනඟ දුටුගස්වා වාදීන්හා කථාකරනු අභිප්‍රායෙන් යොන්ඇමතිවරුන් ලඟට කැඳවා කිම්ද ඇමතියෙනි සවස්වන්ට තවබොහෝ වේලාය, දැන්ම නුවරට වැද සාවරකාරියක් කරමෝද? එහෙයින් කිසිතෙනෙක්හි පණ්ඩිතවූ ශ්‍රමණයෙක්හෝ බ්‍රාහ්මණයෙක් හෝ සඞ්ඝපරිනායකයෙක් හෝ ගණාචාර්යයෙක් හෝ ඇද්ද, එතෙම නිකෙලශ්වූ සර්වඥයන්වහන්සේගේ ධර්මකාය දනීද ඒ ප්‍රාඥතෙම මාගේ සිත ඇත්තාවූ කාංශාව දුරුකොට මාහා සමග කථාකරන්ට සමර්ථවන්නේද, එසේහෙයින් එබඳු නුවණ ඇතියක්හු සමීපයට යම්හයි කිය. එපවත් අසා පන්සියයක් පමණ යොන් ඇමතිවරු වෙන වෙනම කියන්නාහු: ඇසිදෙවයන්වහන්ස නුඹවහන්සේනොදන්නාසේක්ද අපගේ ශාස්තෲවූ පූරණකාශ්‍යපය මක්ඛලිගොසාලය නිගණ්ඨනාථපුත්‍රය අජිතකේශකම්බලය කකුධකාත්‍යායනය සඤ්ජය බෙලට්ඨිපුත්‍රයයි සදෙනෙකුන්වහන්සේ සඞ්ඝප්‍රධානසේකගණ ප්‍රධානසේකගණාචාර්යසේක ප්‍රාඥසේක යශස්ඇතිසේක සකලසත්වයන්ට සාධුසම්මත සිද්ධස්ථානයක් වැනිසේක. එසේහෙයින් දෙවයන්වහන්ස නුඹවහන්සේට වැඩක් කැමැතිසේක්වීනම් ඒ ශාස්තෲන් වහන්සේලා ලඟටයම්හ ඔවුන්වහන්සේලා කීබණ බණනම්වෙයි විසඳූ පැන පැන නම්වෙයි ඔවුන්වහන්සේලාවිසින් දුරුකළ කාංශාවෙක්ම නිඃශාංකාවෙයි උන්වහන්සේලා කී බසෙක්ම බස් නම්

වෙයි. එහෙයින් තොපමාව ඒ ශාස්තෘන්වහන්සේලා වැඩඋන් තැනට ගොස් සිතඇති සැකයක් දුරුකොට බණඅසා පවිගෙවා ගතමැනවැයි කිහ මිලිඳු රජ්ජුරුවෝ එපවත් අසා අසූන් යෙදූ රථවාහනයකට පැනනැගී පන්සියයක් යොන් ඇමතියන් පිරිවරා පූරණකාශ්‍යප නම්වූ ශාස්තෘහු ළඟට පැමිණ පන්සියයක් යොන් ඇමතියන් හා සමග මහත් ආදරකොට ඔහු පිරිවරා හිඳ ප්‍රශ්නයක් විචාරන්නාහු: ස්වාමිනි පූරණ කාශ්‍යපයාණන්වහන්ස නුඹවහන්සේගෙන් මා සිතට උපන්නාවූ කාංශාවක් විචාරමි ඒ මට ඉදුරාම වදාළමැනවැයි කිහ, එවිට පූරණකාශ්‍යපයෝ සිතන්නාහු: මෙවිට මාගේබුදුකමෙහි විශෙෂයක් මාගේදනුමැතිකමුත් කපිකකමුත් මෙසේවූ ප්‍රස්තාවෙහි නොපා තබාගෙන ඉඳ පසුව කවුරුන්ට පාම්දැයි මහත්වූ අහංකාරයෙන් උද්දරගම්සිතින් කියනුයේ: මහරජ මා අහින් අසානෙගත් ප්‍රශ්නයක් පසුව තොපට කවුරු කියද්ද එසේහෙයින් තොපසිත ඇති සියලු කාංශාවන්ම මා ඉදිරියෙහි සිරුවා හෙළාපියව ඒ හැම දැන් තොප සිතට හැනෙතසැටියේ හස්තාමලකයක්මෙන් දක්වා නොවළහා කියාලමියිකීහ එබසට මිලිඳුමහරජ සමාධිව කියනුයේ: පූරණකාශ්‍යපයාණන් වහන්ස මේ ලොව කවුරු රක්ෂාකෙරේද්දැයි විචාළේය. එබසට රහත්ගුණයයි යන රහස් ගුණයක් ඇති පූරණකාශ්‍යපයෝ කියන්නාහු: මහරජ මේපාද ග්‍රන්පිස්ථානයෙක් නොවෙයි, එසේහෙයින් මෙපමණකුත් නොදනුද මේ මුළුලොව රකිනෝ මහපොළොවමය ඒ මහපොළොව නිසා මේ සත්වලොකයා රැකෙන්නේයයි කිහ. එබසට මිලිඳුමහරජාණෝ කියන්නාහු: පූරණකාශ්‍යපයාණන් වහන්ස මේ මුළුලොව පොළොව නිසා රැකෙනකල අවිචිමහ නිරයෙහි වැටෙන්නාවූ සත්වයෝ පොළොව ඉක්ම යන්නාහ සමහරු පොළොව පලාගනක් යන්නාහ එසේ අවීචි මහනරකයෙහිවැටෙන්නාවූසත්වයන් මපොළොව කුමක්පිණිස නවතාලිය නොහෙන්නේදැයි කී. මෙසේ මිලිඳු මහරජාණන් කීකල්හි ඒ පූරණකාශ්‍යපනම්වූ ශාස්තෘනිච්චයා පිපිකර පහරක් කෑවාසේ තිත්කුව ඉඟිකරුව සටකින් වටබලා ගෙළෙහිගත් රළකැපිල්ලක් ගලන්ටද වමාරන්ටදබැරිව උගුර අඹන්නාක්හුමෙන් ඇස් උඩ ඉදුවා පිටවක්කොට ළැපැනි තනාදී කඳට සිටුවා කරමදක්නමාදෑපටියටහෙළානැහගවිමසා අමුතුවබලන්නාක්හුමෙන් පරකාකුලා තුෂ්ණීම්භූතව අවිදපාධ්‍යානයට සමවන්නාක් මෙන් මූවෙන් නොබැණ උන්නේය. මෙසේ උන්, පූරණකාශ්‍යපයන් බලා මිලිඳුමහරජාණෝකියන්නාහු: ඈයි පූරණකාශ්‍යපයාණන්

වහන්ස සිත ඇති සියලු කාංශාවන්ම දුරුකොට ප්‍රශ්නවිසඳීමට
මාමුත්කාවූරුදැයි සුරුකම්බෑණිලා මෙපිටබසකටත් ලෙවමු:වන්
නොබෑණිහිඳිනාසේක්නැයිකියා,තක්පරපිමෙනුත්එසින්මත්පෙ
හි බසකුත් එවාගහනොගී මඳක්බලාහිඳ එපූර්ණකාශ්‍යපයන්
ළඟින් නික්මගොස් දෙවෙනිවත් මක්ඛලිගොසාල ශාස්තෘනම්වූ
බසටබුහුටි නිවටකු ළඟට ගොස් පිරිවරමහත්යොන් ඇමතියන්
හා සමග ඔහට මහත් ආදරදක්වා එකත්පස්වහිඳ ඔහුඅතින් වි
චාරන මිලිඳුමහරජතෙම මක්ඛලිගොසාලයන්වහන්ස මා සිතට
උපන් කාංශාවක්විචාරමි එකාංශාව දුරුකළමැනැවයි කීහ. එබ
සට මක්ඛලිගොසාලයෝකියන්නාහු: අපහැර අතික්පැනකිනුත්
සිතටඋපන් කාංශාවක් දුරුකොටගතඇක්ද අපට සත්‍වයන්ගේ
සිතසැකදුරුකිරීමූක් අරුමයෙක්ද එසේහෙයින් මහරජතොපට
නොදැනුනුදෙයක් අපඅතින් විචාරාගනුවයි කීහ. එබසට මහ
රජාණෝ කියන්නාහු:මක්ඛලිගොසාලයන්වහන්සකුසල්අකුසල්
දෙකනම් ඇතිදෙයෙක්ද සැපය දුකොයියනදෙකෙහි ඵලය විපා
කයයි යන දෙකෙක් ඇද්දැයි විචාළෝය, එබසට මක්ඛලිගොසා
ලයෝ තමන්ගේ දනුමැතිකමෙහි තත්‍වය ප්‍රකාශකොට කියන්
නාහු: මහරජතෙපි කුමක්කිවූද අපකීවක්ම තොපිඅදහාගනුව
එසේහෙයින් කුශලාකුශලකර්මදෙක ඇතිදෙයකැයි නොසිතව
සැපදුකෙහි ඵලවිපාකත්ඇතිදෙයකැයි නොසිතව එසේහෙයින්
කුසල් අකුසලුත්නැත සැපදුකුත් නැනැයිකියා: මිලිඳුමහරජහට
මක්ඛලිගොසාලයෝ තමන්ට ප්‍රගුණවූ බණක්කියන්නාහු: එම්බා
මහරජාණෙනි මා කියන්නාවූ ධර්මය ඉඳුරා අසා සිතනබවයි ආ
මන්ත්‍රණයකොට හඟවන්නාහු මහරජාණෙනි මෙලෙවුහි රජව
උපන්කෙනෙක් පරලෙවුහින් රජවම උපදනාහ, මෙලොව බමු
ණුව උපදුනොත් පරලොවත් බමුණුවමඋපදනාහ,මෙලොව වෙ
ළඳ ගොවියාත් පරලොවදීත්වෙලඳ ගොවියාමය, මෙලොව චණ්
ඩාලවඋපන්නාහු පරලොව්දීත්චණ්ඩාලාදී නිචකුලයෙහිම උපද
නාහුමය, එසේ හෙයින් කුසල් අකුසල් දෙකි ප්‍රයොජනනැති
නියාවමෙයින්ම දැනගනුවයිකීහ.මෙසේ මක්ඛලිගොසාලයන් කී
බණ අසා මිලිඳු මහරජාණෝ කියන්නාහු: එසේවීනම් මක්ඛලි
ගොසාලයෙනි තොපකීයේ සැබෑවී නම් අපදැන් මෙලොවදී කුසල්
කිරීමෙන්ප්‍රයොජන කිම්ද, අභිප්‍රායක්මකාර:හ කුසල අකුසලය
යියන දෙක තමාත් කාවර කාරණයක් පිණිස පෙරකිවූද එසේ
හෙයින් මක්ඛලිගොසාලයෙනි මෙලොවදී තපයසිඳුනාලද්දැහු
පරලොවදීත් අතපය සිඳුනා ලද්දැහුමනොවෙත්ද? මෙ ලොවදී
කන් නාසා සිඳුනා ලද්දැහු පරලොවදීත් එසේම උපදනාහුනො
වෙද්දැයි කීහ. එඇසූ මක්ඛලිගොසාලයෝ මුවෙන්නොබෑණ මූග

වූන ගෙන ධ්‍යානයක් මෙන් උන්නෝය. මේ ප්‍රකාර දුටු මිලිඳු මහරජාණෝ තමන්ගේ පන්සියයක් පමණවූ යොන් ඇමතියන් හා සමග අභිනගම්යෙන් නැගිසිට **"තුච්ඡො වත භො ජම්බුදීපො පලාපො වත භො ජම්බුදීපො නත්ථි කොචි සමණො වා බ්‍රාහ්මණො වා යො මයා සද්ධිං සල්ලපිතුං සක්කොති කඞ්ඛං පටිවිනෙතුන්ති"** යනාදින් එම්බා ඇමතියෙනි මේ සකල ජම්බුද්වීපය මා හැරශ්‍රමණ බ්‍රාහ්මණ වෛශ්‍ය ශූද්‍රාදීවූ ව්‍යක්තතර පණ්ඩිතයක්හු නැතිව සිස්වූයේය. පණ්ඩිතගොචරවූ බසක් අසන්ට නොමැතිහෙයින් මෙජම්බුද්වීපය ප්‍රලාපය, එසේහෙයින් මාසිත සැකදුරුකිරීමටත් මාහා කථාකිරීමටත් සමර්ථපණ්ඩිතයෙක් මෙදඹදිව් තෙලෙහි ඇතැයි නොසිතමි කියා මහත් අභිමානයෙන් ඒ නිගණ්ඨයන්ට නිරාදරව නික්ම තමාගේ පන්සියයක් යොන් ඇමැතියන් ළඟට කැඳවා එම්බා ඇමැතියෙනි චන්ද්‍රකාන්තින් බබළන්නාවූසිහිලල රාත්‍රිය සිත්කලුව තිබෙයි, අද කවරතැනකට ගොස් ප්‍රශ්නවිචාරා සාංකා දුරු කරමෝදැයි කීහ. එබසට අමාත්‍යවරු බැණ නොනැගී රජ්ජුගේ මුහුණ බලබලාම සිටියාහ. එකල මහ රජාණෝ මහසෙනඟ හා සමග පන්සියයක් යොන් ඇමැතියන් පිරිවරා රථවාහනාරූඪව නුවරට වැද තමන්ගේ මාලිගාවට වන්හ.

එසමයෙහි සාගලනුවර ශ්‍රමණබ්‍රාහ්මණගෘහපතිපණ්ඩිතවරුන් නොමැතිව දෙළොස්අවුරුද්දක් පණ්ඩිතසඤ්චාර නැතිවිය. යම් තැනෙක්හි ශ්‍රමණ බ්‍රාහ්මණ ගෘහපති ආදිපණ්ඩිතකෙනෙක්වසති ඇසුවහොත් මිලිඳුමහරජාණෝ එතැන්හි ගොස් ප්‍රශ්නවිචාරති එසියලු පණ්ඩිතවරුම ප්‍රශ්නවිසඳීමෙන් රජහු ගිවිස්වාගතනොහී එසාගලනුවර හැර ඒ ඒ තැන්හි ගියාහුය. යම් පණ්ඩිතකෙනෙක් ඔහු විචාළ ප්‍රශ්න විසඳීමට වෙහෙසනොවිඳ තුෂ්ණිම්භූතව නොදනුම්හයි කියා හිඳිනාහු වීනම් ඒ නුවරම හිඳුනාහුය; භික්ෂූහුව නාහි ප්‍රශ්න පෘච්ඡාවෙන් වෙහෙසී බොහෝසේ හිමාලවනයෙහිම වසන්නාහුය.

එසමයෙහි කොළසියයක් රහතුන්වහන්සේ **හිමවත්කාරක්ඛිත** තලනම් පර්වතයෙහි වසනසේක. ඉක්බිති ආයුෂ්මත්වූ අස්සගුත්ත මහතෙරුන්වහන්සේ මිලිඳුරජ්ජුරුවන් කියන පණ්ඩිත ගර්වවචන යන් දිව්‍යකතින් අසා යුගන්ධර පර්වතමුදුනට භික්ෂුසංඝයා රැස්කරවා මහාසඞ්ඝයාවහන්සේට කියනසේක් ඇවැත්නි මිලිඳුරජ්ජුරුවන් හා සමග කථාකොට ඔවුන්සිත උපන් සාංකාදුරුකිරීමට සමර්ථවූ භික්ෂුකෙනෙක් මෙතැන්හි ඇද්දැයි විචාළසේක.

එබස්ඇසූ කොළසියයක්රහතුන්වහන්සේ මුවෙන්නොබැණ වැඩ
උන්සේක, නැවතත් දෙතුන්වැනිව විචාළදීත් හැමදෙනාවහන්
සේම මුවෙන් නොබිණූසේක, එකල්හි ආයුෂ්මත්වූ අස්සගුත්ත
මහතෙරුන්වහන්සේ කියනසේක්: ඇවැත්නි තව්තිසාභවන
යෙහි වෛජයන්ත ප්‍රාසාදයට පූර්විදිග කේතුමතීනම් දිව්‍ය විමා
නයෙහි මහාසේනනම් දිව්‍යරජයෙක්වෙසෙයි, ඒ දිව්‍යරජතෙම
යසොතෙජප්‍රතාප රූප ඓශ්වර්‍ය්‍ය ප්‍රඥාදීන් සෙසුදෙවියන් අභි
භවනය කොට බබළන්නේය.ඒ දිව්‍යපුත්‍රතෙම මිලිඳුරජ්ජුරුවන්
හා සමග කථා කිරීමටද ඔහුවිචාළ ප්‍රශ්න විසර්ජනයකොට සිත
සැක දුරලන්ටද පූර්ව වාසනාබලයෙන් සමර්ථ වන්නේයයි
කීසේක, එපවත් අසා කොළසියයක් රහතුන්වහන්සේ යුගන්ධර
මුදුනෙහිදීම අන්තර්ධානව ශක්‍රභවනයෙහිදී පෙණීසක්දෙව්රජහු
ළඟට පෙළසැදී වඩනට පටන්ගත්සේක. මෙසේ වඩනා රහ
තුන්වහන්සේ දුටු ශක්‍රදෙවෙන්‍ද්‍ර තෙම මහත් ආදරයෙන් පෙර
ගමන් කොට ළඟට ගොස් පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව සිට
සංඝ පරිනායකවූ ආයුෂ්මත් අස්සගුත්ත මහතෙරුන්වහන්සේ
අතින් විචාරතුයේ: ස්වාමීනි ඇමදෙනා වහන්සේ කුමක් පිණිස
මෙතනට වැඩිසේක්ද, මාගෙන් වියයුතු ප්‍රයොජන කවරේදැයි
කීහ, එබසට ආයුෂ්මත් අස්සගුත්තමහතෙරුන්වහන්සේ කියන
සේක්: ශක්‍රදෙවෙන්‍ද්‍රයාණෙනි ජම්බුද්වීපයෙහි සාගලනුවර මිලිඳු
නම් මහරජෙක් වාදීභ සිංහරාජයකු මෙන් වෙසෙයි: ඒ මහරජ
භික්ෂු සංඝයා සමීපයට එළඹ දෘෂ්ටිවාදයෙන් ප්‍රශ්න විචාරා වෙ
හෙස දෙන්නේයයි කීසේක. එබසට ශක්‍රදෙවෙන්‍ද්‍රතෙම කියනු
යේ: ස්වාමීනි ඒ මිලිඳු මහරජ තෙම තව්තිසා භවනයෙන් චුතව
ගොස් සාගල නුවර උපන්නේය. ඒ මිලිඳු මහරජහුගේ මාන
මර්දන කිරීමට තෙල කෙතුමතී නම් දිව්‍යවිමානයෙහි වාසය
කරන මහාසෙන නම් දිව්‍යරාජයාණෝ සමර්ථයෝය. එසේ හෙ
යින් ඒ දිව්‍යපුත්‍රයාණන් මිනිස්ලොව උපදින්ට ආරාධනා කර
නු පිණිස යම්හයි කීය. එකල්හි අස්සගුත්ත මහතෙරුන්වහන්
සේ ඇතුළුවූ කොළසියයක් රහතුන්වහන්සේහා සමගශක්‍රදෙවෙ
න්‍ද්‍රතෙම ගොස් කෙතුමතී නම දිව්‍ය විමානයට වැද මහාසෙන
දිව්‍යපුත්‍රයාණන් දැක වැඩසිටිකල්හි ඒ මහාසෙනනම්වූ දිව්‍යරජ
යාණෝ වැඩි රහතුන්වහන්සේවැඳ එකත්පස්වසිට ශක්‍රදෙවෙන්‍ද්‍ර
යන් අතින් විචාරන්නාහු: දෙදෙව්ලොවට අධිපතිවූ මහානුභාව
සම්පන්න ශක්‍රදෙවෙන්‍ද්‍රයාණන් වහන්ස රහතුන් වහන්සේ හා
සමග මෙතනට වැඩි කාරණා කිම්දැයි විචාළහ. එබසට ශක්‍රදෙ
වෙන්‍ද්‍රයෝ කියන්නාහු: සබඳ මහාසෙනයෙනි තොප මනුෂ්‍ය

ලොකයෙහි උපදිනා පිණිස ආරාධනාවට ආම්හයි කීහ. එබසට මහාසෙනනම්දිව්‍යරාජයාණෝ කියන්නාහු: ස්වාමිනි මිනිස්ලොව ඉපදීමෙන් මට ප්‍රයොජන කිම්ද මේ දෙව්ලොව පටන් මතු මත් තෙහි දිව්‍යලොකවල ඉපද දිව්‍යසම්පත් වළඳ නිවන්දක්නා කැමැත්තෙමි මනුෂ්‍ය ලොක සම්පත්තියනම් ඉතාම පිළිකුල; එසේ හෙයින් නොකමැත්තෙමියි කීහ. ඉක්බිති ආයුෂ්මත්වූ අස්සගුත්ත මහ. තෙරුන් වහන්සේ කියනසේක්; එම්බා මහාසෙන දිව්‍ය රාජයාණෙනි දිව්‍ය මනුෂ්‍ය ලොකවල දිවසින් බලන්නමෝ, සාගල නුවර මිලිඳු රජ්ජුරුවන්ගේ වාද බිඳ බුද්ධශාසනය උසස් කොට දක්වීමට සමර්ථයක්හු නොපහැර අන්කිසි තැනක නුදුටුම්හ. එසේ හෙයින් පරවැඩ කැමති තොප විසින් මේ බුද්ධශාසනය පන්දහසක් හවුරුදු උසස්කොට පවත්වනලෙස උත්සාහ සිතා ඔහුගේ වාද මදිනය කරනු පිණිස තොපි මිනිස්ලොව උපදින්ට නික්මෙවයි කීසේක. මහාසෙන දිව්‍යරාජයාණෝ එපවත් අසා ස්වාමීනි කවරක්හු විසිනුත් බැරිවූ මිලිඳු රජහුගේ වාද බිඳ බුද්ධශාසන උසස්කොට දක්වා බබුළුවන්ට මමසමර්ථයෙම්ද, එසේ විනම් මිනිස්ලොව උපදිම්සි තුටුපහටුසිහින්යහපතැයිගිවිස්සාහ.

එකල්හි ඒ රහතුන්වහන්සේ ඔහු මිනිස්ලොව උපදිමියි කියා ප්‍රතිඥ දුන් වචනයඅසා සමාධිව දෙව්ලොවින්අවුත් හිමාලයෙහි රක්ඛිතතලනම් ගල්අතලෙහි වැඩඋන්සේක. එකල්හි ආයුෂ්මත්වූ අස්සගුත්ත මහතෙරුන්වහන්සේ කියනසේක්: ඇවැත්නි මේ භික්ෂූසන්නි පාතයට නොපැමිණියාවූයම් ගණප්‍රධානවූ භික්ෂූකෙනෙක් ඇද්දැයි විචාරා රොහණ සප්විරයන්වහන්සේ ධ්‍යානයට සමවැද නොපැමිණි බවඅසා උන්වහන්සේළඟට දූතයක්හු නික්මවන්ට කී කල්හි රොහණ සප්විරයන්වහන්සේත් ඒක්ෂණයෙන්ම ධ්‍යානයෙන් නැඟී රක්ඛිත තලයෙහි රැස්වූ කොළසියයක් රහතුන් වහන්සේ ළඟට පැමිණිසේක. එකල්හි අස්සගුත්ත මහතෙරුන්වහන්සේ රොහණසප්විරයන්වහන්සේට කියනසේක්: කිම්ද රොහණ සප්විරයෙනි බුද්ධශාසනය පසු බසිමින් සිටියදී සංඝසන්නිපාතයට රැස්නොව උදාසීනව උන්නැයි කීසේක, එබසට රොහණ සප්විරයන්වහන්සේ කියනසේක්. දැන දැන උදාසීනව උන්නෙම් නොවෙමි මෙපවත් මෙතෙක් නොකළෙමියි කීසේක්. එකල්හි අස්සගුත්ත මහතෙරුන්වහන්සේ කියනසේක්: ඒවැරැද්දට දඬුවම් කරමියි කීසේක, ස්වාමීනි කවර දඬුවමක් කොරෙහිදැයි රොහණ තෙරුන්වහන්සේ කියනසේක්: එබසට අස්සගුත්ත මහතෙරුන් වහන්සෙ කියනසේක්. රොහණ සප්විරයෙනි හිමාලයපසින අස කජංගලා නම් බමුණු ගමෙක් ඇත, ඒ බමුණුගම මහත් සම්පත් ඇති සොනුත්තර නම් බමුණෙක් වෙසෙයි, ඔහුගේ ඇඹේනිවූ බැමිණිදෙවීන් කුස පිළිසිඳිනාවූ නාග

සේන නම් බමුණු කුමාරයෙක් ඇත, ඒ බමුණු කුමාරයා සත් හැවිරිද්දෙහි ගෙනහැර මහණ කැරවූ කල්හි මේ දඩුවමින් මිදෙවයි කීසේක. එබසට රොහණ ස්ථවිරයන්වහන්සේ එවඳන් යහපතැයි පිළිගත්සේක.

ඉක්බිති තව්තිසා දෙව්ලොව කෙතුමතීනම් දිව්‍යවිමානයෙහි වසන්නාවූ මහාසෙනනම් දිව්‍යරාජයාණෝ දිව්‍යාත්ම භාවයෙන් චුතව අවුත් කජඟලානම් බමුණුගම සොනුත්තර බමුණාණන්ගේ භාර්‍ය්‍යාවූ බැමිණි දෙවීන්කුස පිළිසිඳ ආයුධ පජ්ජලනාදීවූ ත්‍රිවිධ ආශ්චර්‍ය්‍යයක් පහළකොට දසඑකඩමසින් මවුකුසින් බිහිවූහ. රොහණ ස්ථවිරයන්වහන්සේද ඔහු මවුකුස පිළිහුන්තැන්පටන් ඒ බමුණාණන්ගේ ගෙයි ඇමදවස්ම සිඟනසේක් දසඑකඩමසක් අධික සත් අවුරුද්දක් සිඟුසේක, එකදවසකුත් කැඳබත් ආදිය තබා අරුණුයයියත බසකුත් නොලත්සේක. ආක්‍රොශ පරිභවම අසනසේක. දසමසක් අධිකවූ සත්අවුරුද්දක් ඇවෑමෙන් එක් දවසක මුන්වහන්සේ දොරසිඟා වැඩසිටිකල්හි ගෙන් දොරට කරපෙවූ හෙල්ලක් මදක්කරුණා උපදවා දරුණුසිත් ඇර අරුණුයයිනිව. එබසට රොහණ ස්ථවිරයන්වහන්සේ සතුටුආකාර පවත්වා වඩනටනමාගත්සේක, එදවස් සොනුත්තරනම් බමුණු බැහැර කිසිකාරියෙක ගොස් එනුයේ තෙරුන්වහන්සේගේ ප්‍රසන්නාකාර දැක කිසිවක් ලදුදැයි විචාළේය. තෙරුන්වහන්සේද මෙතෙක් කලක් නොලත් වචන මාත්‍රයක් ලත්හෙයින් බ්‍රාහමණයාණෙනි ලදුම්හයි කීසේක, එබස් අසා බමුණා නොසතුටුව වහා ගෙට අවුත් කියනුයේ: මෙතනට සිඟා ආ මහණුට කිසිවක් දුනුදැයි විචාළේය. එබසට ඔහුකියන්නාහු: අපගේ ගෙන් කිසිවකුත් ඕහට නුදුම්හයි කීහ. එඅසා බමුණු සිතන්නේ මහණු නම් බොරුකිය නොහැක්ක, බොරුනම් සියලුපාපයටම මූලකාරණය, එසේහෙයින් මොහුවිසින් නුදුන්දෙය දුනැයි බොරුකියන්ටකාරණා කිම්දැයි කියා සෙටදවස් මහණු දුටුකල බොරුකිවාට මුසාවාද රොපණයෙන් වෙහෙසම් සිතා හුන්කල්හි දෙවනදවස් රොහණ තෙරුන්වහන්සේ බමුණාගේ ගෙදරට පෙරසේම සිඟාවැඩිසේක, බමුණා උන්වහන්සේ වෙහෙසනුපිණිස වෙනකාරියෙහි ව්‍යාවෘතනොවී ගෙහිම උන්නේ සිඟා වැඩසිටි තෙරුන්වහන්සේ දැක සුහුසුලුව බස් කීපයක් ගෙහිම සිට අඬහා කියමින් මිදුලට පැන එම්බල මහණ මුසාවාදදීන් දුරුවූම්හයි බැහැවෙනකල ඊයේ දවස අපගේ ගෙන්කිසිවකත් නොලැබ ලදුම්හයි කීකල මුසවානොවේද: එසේකිව මහණුන්ට සරුපදැයි කිය, එබසට තෙරුන්වහන්සේ කියනසේක්: එම්බා බ්‍රාහමණයාණෙනි තොපගේ ගෙහි දසඑකඩමසක් අධිකවූ සත් අවුරුද්දක්ම හැමදවස්ම සිඟා අරුණුයයියත බස්පමණකුත් නොලදුම්හ, ඊයේදවස් තොපගේ

ගෙන් එපමණ බසක් ලදුම්හ. ඒ ලද්දාවූ වචනයපිණිස ලදුම්හයි
කීම්හ, එසේහෙයින් අප කී බස මුසවා නොවෙයි කීසේක. බමු
ණා එබස් අසා සිතනුයේ: මොහු වචනමාත්‍රයක් ලැබ ජනයා ම
ධ්‍යයෙහි ලදුම්හයි ප්‍රශංසාකොට කියන ගුණවත් සත්පුරුෂයා
ණකොතෙක, ඉදින් කන බොනදෑ ආදීවූ කිසිවස්තුවක් ලදුනම්
කෙසේනම් ප්‍රශංසා නොකෙරද්දැයි ශ්‍රමණරූපයෙහි අතිශයෙන්
පැහැද තමහට පිළියෙළකළාවූබතින් ත්සැන්දක්හා එපමණට
පොහෝනා ව්‍යඤ්ජන යක්හා එදවස් පිළිගන්වා මේ අද දුන් ආ
හාරපමණෙක්ම හැමදවස් මෙගෙන් සම්භාවෙවයිකියා ආරාධනා
කෙළේය මහතෙරුන්වහන්සේද මුවෙන් නොබැණ ඉවසා කීප
දවසක් සිඟා අහර ලැබගෙන වඩනාසේක. එයින් මැතභාගයෙ
හි උන්වහන්සේගේ ඉන්ද්‍රිය සංයමාදිවූ ඉරියාපථයෙහි පැහැද හැ
ම දවස්ම තමාගේ ගෙහිදීම වළඳනාලෙස ආරධනා කෙළේය.
තෙරුන් වහන්සේද මුවෙන් නොබැණ ඉවසා දවසින් දවස ඒ
බමුණාගේ ගෙහිදීම වළඳා වඩනාසේක් බුදුබණින් මඳක් මඳක්
ඔහට කියා වඩනාසේක.

එකල්හි ඒ බ්‍රාහමණයාගේ පුත්‍රවූ නාගසෙන කුමාරයෝද වෙ
දත්‍රයෙහි පාරප්‍රාප්තව තෙසුන් සූසැටකලා අටළොස් ශිල්පයෙහි
නිපුණව තමා උගත්තාවූ ඒ සියලු ශිල්ප ශාස්ත්‍රයන්ම ආදිමධ්‍යා
වසානය නුවණින් පරීක්ෂාකොට බලනුවෝ: මඳකුත් සාරත්වයක්
නොදැක මේ සියලුවෙද ශාස්ත්‍රාදිහුම තුච්ඡය ප්‍රලාපය අසාරයයි
නොසතුටුසිත් ඇතිව උන්නාහ. එදවස් ආයුෂ්මත්වූ රොහණ
ස්ථවිරයන්වහන්සේ ඔහුගේ ගෙදොරට සිඟා වැඩිසේක. එකල්හි
නාගසෙන කුමාරයෝ තෙරුන්වහන්සේ දැක සතුටුව ප්‍රීතිප්‍රමො
ද්‍යවූ සොම්නස් සිතින් පෙරගමන්කොට ආයුෂ්මත්වූ රොහණ
ස්ථවිරයන්වහන්සේටකියන්නාහු:කිමෙක්දයහළුවනොපගේශරි
රය කාෂායවස්ත්‍රයකින්වසාපොරොනාලද්දේයයිකීහ,එබසටඋන්
වහන්සේ කියනසේක්: එසේයදරුව අපිප්‍රව්‍රජිතයම්හයිකීසේක,
එබසට නාගසෙන කුමාරයෝ කියන්නාහු: යහළුව නොපි කවර
කාරණයක් පිණිස පැවිදිවූදැයි කීහ එබසට රොහණ ස්ථවිරයන්
වහන්සේ කියනසේක් දරුව අපි පාප නැමැති මල ප්‍රක්ෂාලනය
කරනහෙයින් ප්‍රව්‍රජිත යම්හයි කීසේක, එබසට නාගසෙනකුමා
රයෝකියන්නාහු යහළු නොපගේ හිසකෙස් සෙස්සවුන්ගේකෙ
ශයන්මෙන් දිගුනොව ලුහුඬුවතිබෙතැයි විචාළහ. එබසට තෙ
රුන්වහන්සේ කියනසේක්: හිසකේ වඩා පරිහරණ කිරීමෙන්
සොළොස් පළිබොධයක් දැක කෙසමස්සුන් බහාපැවිදිවුම්හයිකී
සේක,එබසට නාගසෙනකුමාරයෝ කියන්නාහු:කෙසමස්සු පරි
හරණයෙන් සොළොසක්පළිබොධයනම් කවරේදැයිවිචාළහ.තෙ
රුන්වහන්සේ එබසට සොළොස් පළිබොධයන් වෙනවෙනම

දක්වනසේක්: එම්බා දරුව කොසමස්සුපරිහරණයකරනකල අලංකාර කිරීම පළමුවන පළිබෝධය, සැරහීම දෙවනුපළිබෝධය, තෙල් ගැල්වීම තුන්වනපළිබෝධය, ධෝවනයකිරීම සතරවන පළිබෝධය, මල්පැළඳීම පස්වනපළිබෝධය, සුවඳගැල්වීම සවන පළිබෝධය, දුම්ආදියදී සුවඳ කැවීම සත්වන පළිබෝධය, අරළු සුණුගෑසීම අටවන පළිබෝධය, තෙල්ලිඅඹරා ලීම නවවන පළිබෝධය, සාළුයෙන් රැඳීම දසවනපළිබෝධය; බැඳීමඑකොළොස්වන පළිබෝධය; පනා ආදියෙන් පීරාතැනීම දොළොස්වන පළිබෝධය, නිරන්තරයෙන් එහිම සිත්අලවා පරිහරණකිරීම තෙළෙස්වන පළිබෝධය, අවුල්හැරීම තුදුස්වන පළිබෝධය, උකුණන් හැරීම පසළොස්වනපළිබෝධය, හිසකෙස් වගළ කල සෝක ගැන්මද කැළඹීමද ප්‍රලාප කිමද සිහිමුලාවීමද යන මේ ආදිය සොළොස්වන පළිබෝධයයි; මෙසේ සොළසක් පමණ පළිබෝධයෙන් යුක්තවූ කොසමස්සුන් පරිහරණයකරන මනුෂ්‍යයෝ සියලුම ගැඹුරුවූ සියුම්වූ ශිල්පයන් නසන්නාහුයයි කීසේක. නාගසෙන කුමාරයෝ එපවත්අසා නැවතවිචාරන්නාහු: හඳනා පොරෝනාවස්ත්‍රයෝද සෙසු සත්‍වයන් හඳනා වස්ත්‍රයන් මෙන් නොවෙති, ඊට කාරණා කිම්දෑයි විචාළහ. එබසට තෙරුන්වහන්සේ කියනසේක්: එම්බා දරුවයහපත් වස්ත්‍රයන්ට සියලු සත්‍වයෝම කැමතිවන්නාහ. එසේ කල්හි නොයෙක් දෙනාගෙන් භයව වස්ත්‍රය නිසාම උපදනේය, එබදු භය මෙ කාෂාය වස්ත්‍රය ඡේදන බන්ධන රජනාදිය කළහෙයින් නූපදනේය, එසේහෙයින් මෙහඳනා පොරෝනා වස්ත්‍රයෝ ගිහිවස්ත්‍රයන්ට අසදෘශ වූවාහුයයි කීසේක, මෙකාරණාවන් අසා නාගසෙන කුමාරයෝ මඳක්සතුටුව යහළුව නොපි කිසියම් ශිල්පයක් දනුදෑයි විචාළහ, එසේය දරුව ශිල්පයනුත් දනුම්හ ලොකයෙහි උතුම්වූ යම් මන්ත්‍රයෙක් ඇද්ද එමන්ත්‍රයත් ඉදුරා අපි දනුම්හයි කීසේක. එබසට නාගසෙන කුමාරයෝ කියන්නාහු යහළු එසේවිනම් ඒ ශිල්ප මන්ත්‍රාදිය අපටත් දෙන්ට පුළුවන්දෑයි කිහ, එබසට තෙරුන්වහන්සේ එසේය දරුව දියහැක්කේයයිකීසේක. එසේවීනම් දැන්මමට ශිල්ප මන්ත්‍රාදිය දුනමැනවැයි කිහ තෙරුන්වහන්සේ කියනසේක්. ශිල්ප මන්ත්‍රාදිය දීමට කල්නොවෙයි අතුරුමග පිඩුසිහා අවුත් සිට දැන්ම කෙසේ ශිල්ප උගන්වමෝදෑයි කීසේක.

ඉක්බිති නාගසෙන කුමාරයෝ රොහණ ස්ථවිරයන්වහන්සේ අතින් පාත්‍රයගෙන ගෙට වඩාගෙනවුත් ප්‍රණීතවූ ඛාද්‍ය භොජ්‍යයෙන් යුක්ත රස මසවුලෙන් යුක්තවූ ආහාරය සවහස්තයෙන් වළඳවා වතාවත් කොට, ඉක්බිති මන්ත්‍ර මට දැන් දුනමැනැවයි කීහ, එබසට තෙරුන්වහන්සේ කියනසේක්: එම්බා දරුව යම් දවසක නොපි අපසේම නිෂ්පළිබෝධව මවුපියන් ගිවිස්වාගෙන

අප ගත්තාවූ වේෂය මෙන් ප්‍රව්‍රජ්‍යාවේෂය ගතුද, එදවස් තොපට මන්ත්‍ර උගන්වම්හයි කීසේක එඅසා නාගසෙන කුමාරතෙම තමාගෙ දෙමවුපියන්ලඟට ගොස් යාච්ඤාකොට කියනුයේ: මෙ ප්‍රව්‍රජිතයෝ මේ ලොකයෙහි උතුම්යම් මන්ත්‍රයෙක්ඇද්ද ඒමන්ත්‍රයම දනිමියි සෙති තමුන්ලඟ පැවිදිවූ කෙනෙකුන්ට විනා අනිකක්හට නොදෙමියි කියති, එසේහෙයින් මම ඔහුලඟ පැවිදිව උතුම්වූ මන්ත්‍රයන් ඉගනගත්කල පසුව තුඹ ඇමගේ අභිප්‍රායට සුදුසුවූ සතිවුකන් සිතා ගන්නෙම්වේදැයි කිය, එබසට මවුපිය දෙදෙන අපගේ පුතණුවෝ මහණුනොරෙහි පැවිදිවීනමුත් ලොකයෙහි උතුම්වූ මන්ත්‍රයන් ඉගෙනගෙන නැවත අප ගේ ගෙවම එන්නෝවේදැයි සිතා කියන්නාහු: එසේ තොපට වැඩෙක්වේනම් මහණ වීනමුත් මන්ත්‍ර උගනුවයි කියා අවසරදුන් ඉක්බිති රොහණ ස්ථවිරයන්වහන්සේ නාගසෙන කුමාරයන් කැඳවාගෙන විජම්භ වස්තුවෙහි වර්තනීය සෙනාසනයට ගොස් එතැන්හි එදවස් රාත්‍රියෙහිවැස දෙවනදවස් රක්ඛිතතලයෙහි වසනකෙළ සියයක් පමණවූ රහතුන්වහන්සේලඟට පැමිණ නාග සෙනකුමාරයන් ඒ කෙළසියයක් රහතුන්වහන්සේ මැද මහණකරවූසේක. එදවස් නාගසෙන කුමාරයෝ මහණ වෙමින්ම රොහණ ස්ථවිරයන්වහන්සේට කියන්නාහු: ස්වාමිනි තුඹවහන්සේගේ වේෂය දැන් මාවිසින් ගන්නාලද්ද, එසේහෙයින් තුඹ වහන්සේ දන්නා මන්ත්‍රයන් වහා මා උගන්වුව මැනවැයි කිහ ඉක්බිති රොහණ ස්ථවිරයන්වහන්සේ නාගසෙනසාමණේරයන්ට පළමුකොටත්‍රිපිටක ධර්මයෙන් කවර පිටකයක් උගන්වම් දෝහෝයි සිතා නාගසෙන තෙම මහනුවණඇත්තේය, එසේහෙයින් පළමුකොට අභිධර්මපිටකය උගන්වමියි සිතා නාගසෙන සාමණේරයන් සමීපයට කැඳවා එම්බා නාගසෙනයිනි ඉදින් අපගෙ මන්ත්‍රයන් ඉගෙන ගනුවයි කියා අභිධර්මපිටකය ප්‍රථමයෙහිපටන්ව "කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මායි" යනාදින් තිකදුක ප්‍රතිමණ්ඩිතවූ ධම්මසඞ්ගණිද ඛන්ධවිභඞ්ගාදිවූඅටළොස් විභඞ්ගයෙන් ප්‍රතිමණ්ඩිතවූ විභඞ්ගප්‍රකරණයද සංග්‍රහ අසංග්‍රහ ආදීවූ තුදුස් ආකාරයකින් විභාගකළාවූ ධාතුකථා ප්‍රකරණයද ඛන්ධප්‍රඥප්ති ආයතන ප්‍රඥප්තියයන මේආදී ෂට් ආකාරයකින් විභාගකළාවූ පුද්ගල ප්‍රඥප්තියද ස්වකීයවාදයෙහි පන්සියයක් සූත්‍රද පරවාදයෙහි පන්සියයක් සූත්‍රදැයි මෙසේ සූත්‍රදහසක් එක්කොට විභාගකළාවූ කථාවස්තු ප්‍රකරණයද මූලයමකය ඛන්ධයමකයයි යනාදීන් දශප්‍රකාරයකින් විභාගකලාවූ යමක ප්‍රකරණයද හෙතුප්‍රත්‍යය ආරම්මණ ප්‍රත්‍යයයනාදි සූවිසි ආකාරයකින් විභාගකළාවූ පට්ඨානප්‍රකරණය දැයි මෙසේ අභිධර්ම පිටකය හැම එකවිටම

වදාළ පමණින්ම එකාක්ෂර ව්‍යඤ්ජනයකුත් නොපිරිහෙළා ඉගෙන ගුරුන්වහන්සේට කියන්නාහු: ස්වාමීනි වැඩසිටියමැනැව, ඉදින් වදාළ ධර්මයක් දෙවිටක්මට නොවදාළමැනව එකවිට වදාළායෙන්ම හැම මට ප්‍රගුණවිය, එසේහෙයින් මම නුඹවහන්සේ ඉදිරියෙහි මාගේ වනපොත්බැණ පිරිවහම්කීසේක එබසටගුරුන්වහන්සේ කියනසේක්. මා ඉදිරියෙහි තබා කෙළසියක් රහතුන්වහන්සේ මධ්‍යයෙහිපිරිවහා අස්වවයිකීසේක එබසට නාගසෙන සාමණේරයන්වහන්සේ යහපතැයිගිවිස කෙළසියයක්රහතුන්වහන්සේ මධ්‍යයට ගොස් මෙපවිත් දන්වා අවසරගෙන එකවිට හදාළායෙන් එකදවස් උගත්තාවූ ධර්මය සත්මසකින් සප්තප්‍රකරණය වනපොත්පිරිවහා කෙළසියයක්රහතුන්වහන්සේට ඇස්වූසේක. ඒක්ෂණයෙහිම මහපොළොව ශතසහස්‍ර රාවයෙන් ගුගුරන්ටවන, සදෙව්ලොව දිව්‍යස්ත්‍රීහු එකවිටම සාධුකාර දෙන්ට වන්හ. සොළොස් බඹතලයෙහි බ්‍රහ්මසෙනාව අත්පොළසන් දෙන්ට වන්හ, දිවසඳුන් සුණු වැසි වසින්ට වන, දිවමදාරාමල් වර්ෂාකරන්ටවන, මෙසේ නොයෙක් ආශ්චර්ය්‍ය දුටු රහතුන්වහන්සේ නාගසෙන සාමණේරයන්ට ප්‍රශංසා කළසේක.

ඉක්බිති නාගසෙන සාමණේරයන්වහන්සේ විසිවයස් පිරුණු කල්හි කෙළසියයක් රහතුන්වහන්සේ එක්ව රක්ඛිත තලයෙහිදීම උපසම්පදා කරවූසේක, උපසම්පදාවූ දෙවනදවස්උදසන්හිම හඳනා සිවුරු හැද ගැටවටුගන්වා පාත්‍රය අතින් ගෙන උපාධ්‍යායන්හාසමග ගමට පිඬුසිගා වඩනාසේක්: මෙබඳුවූ සිතිවිල්ලක් සිතූසේක; කෙබඳුදයත්, මාගේ උපාධ්‍යායන්වහන්සේ සුබුඬවචනයන් තබා පළමුකොටම ඉතාගැඹුරුවූ අභිධර්මයම ඉගැන්වූසේක. එසේහෙයින් මූන්වහන්සේ නිෂ්කාරුණාසේක. තුච්ඡසේක, අඥානසේකැයි සිතූකල්හි රොහණ ස්ථවිරයන්වහන්සේද නාගසෙනයන්වහන්සේ සිතුවචනය දැන නාගසෙනයන්වහන්සේට කියනසේක්: නොපසිතූ සිතිවිලි නොප වැන්නවුන්ට සුදුසුනොවෙයි කීසේක. එබස්අසා නාගසෙනයන්වහන්සේ සිතනසේක්: මාගේ උපාධ්‍යායන්වහන්සේ ඒකාන්තයෙන්ම ආශ්චර්ය්‍යමත්වූ ගුණඇතිසේක අද්භූතවූ ගුණඇතිසේක, පණ්ඩිතසේක, යම්තැනෙක්හි මාසිතින් සිතූකාරණයන් තමන්වහන්සේගේ සිතින්ම සනිටුහන්කොට දැනගත්සේක, එසේ හෙයින් මා සිතූ අපරාධයෙන් සිත තැලීගියේ වීනමුත් මාගේ උපාධ්‍යායන්වහන්සේ ක්ෂමාකාරගත මැනවයි සිතා දෙහොත් මුදුනෙහි තබා ගෙන ආදරයෙන් නැමී ස්වාමීනි මාසිතින් සිතූ අපරාධයට ක්ෂමාකළ මැනව. මතු එබන්දක් නොසිතාමි කීසේක; එබසට රොහණ ස්ථවිරයන්වහන්සේ කියනසේක්: නාගසෙනයෙනි මමනොපට මෙ

පමණකින් ක්‍ෂමාතොකරමි ඉදින් තොපි මාක්‍ෂමාකරනුකැමැත්
තාහු වීනම් සාගලනුවර මිලිඳුරජ්ජුරුකෙනෙක් මෙකාලට රාජ්‍ය
යකෙරෙති. ඒ මිලිඳුරජතෙම දෘෂ්ටිවාදයෙන් ප්‍රශ්න විචාරා භික්‍ෂු
සංඝයා වෙහෙසෙන්නේය. ඉදින්තෙපි එසාගල නුවරට ගොස්
මිලිඳුරජුහා තර්ක කොට ඔහුගේ දෘෂ්ටිවාදය බිඳ දමනයලා පහද
වාගත්තානම් එදවස් මම තොපට ක්‍ෂමාකෙරෙමියි කීසේක එබ
සට නාගසෙනයන්වහන්සේ කියනසේක්: ස්වාමීනි වැඩසිටිය මැ
නව. මෙසිත් මහත් ආශ්චර්යයෙක්ද. ඒ එක මිලිඳුරජහු තබා ස
කලජම්බුවීපයෙහි සියලු රජදරුවෝම එක්ව අවුත් මා අනින්
ප්‍රශ්නවිචාරත් නමුත් එසියල්ලවුන් විචාලාවූප්‍රශ්නමහසාමලක
යක්සේ දැක විසඳ සම්ප්‍රදලනයකෙරෙමි ඊට කිසිසැකයක් නො
සිතා දැන්ම ක්‍ෂමාකල මැනවැයි කිහ. එබසට රොහණ ස්ථවිර
යන්වහන්සේ කියනසේක්: මෙසිත් මතු තුන්මසක් ගිය කල මි
ලිඳුරජහුගේ දෘෂ්ටිවාදමර්දනය කොට පැහැදවූ කලමුත් ක්‍ෂමා
නොකෙරෙමියි කීසේක. එබසට නාගසෙනයන්වහන්සේ යහ
පතැයි ගිවිස මේ තුන්මස මම කවුරුන් වහන්සේසමීපයෙහි වෙ
සෙම්දැයි කීසේක. එබසට උපාධ්‍යායන්වහන්සේ කියනසේක්:
වත්තනියසෙනාසනයෙහි ආයුෂ්මත්වූ අස්ස ගුත්ත මහතෙරුන්
වහන්සේ වසනසේක. තොපිඋන්වහන්සේළඟටගොස්මාගේවච
නයෙන් උන්වහන්සේවැඳ ස්වාමීනිමාගේ උපාධ්‍යායන්වහන්සේ
නුඹවහන්සේගේ පාදවන්දයවැඳ අල්පාබාධාදීවූපංචකාරණයන්
විචාරා මා නුඹවහන්සේ ළඟට මෙතුන් මස වසනු පිණිස එවූ සේ
කැයි කියව; එසේකල්හිතොපගේ උපාධ්‍යායෝනම් කිනම්හුදැයි
කිවහොත් රොහණ ස්ථවිරයන්වහන්සේයයි කියව මම කිනම්
දැයි විචාළසේක්වීනම් ඔබවහන්සේගේ නාමය අපගේ උපාධ්‍යා
යන්වහන්සේදන්නාසේකැයිකියවයි මෙසේ උගන්වා නාගසෙන
යන්වහන්සේටඅවසරදී අස්සගුත්තස්ථවිරයන්වහන්සේළඟටයවූ
සේක එකල්හිනාගසෙනයන්වහන්සේ දනවුසැරිසරා ක්‍රමයෙන්
ගොස්වත්තනිය සෙනාසනයෙහිවැඩඋන්අස්සගුත්තමහතෙරුන්
වහන්සේ දැක වැඳ එකත්පස්ව සිට කියනසේක්: ස්වාමීනි මාගේ
උපාධ්‍යායන්වහන්සේ ඔබවහන්සේගේ පාදවන්දය උත්තමාඞ්ගය
කරණකොටගෙන නමස්කාරකොටඅල්පාබාධාදිය විචාරාමාඔබ
වහන්සේ සමීපයෙහි මතු තුන්මස වසනුපිණිස එවූසේකැයි දැන්
වූසේක. එකල්හි අස්සගුත්ත මහතෙරුන් වහන්සේ තොපි කින
මුදැයි විචාළසේක, එබසට ස්වාමීනි මම නාගසෙන නම් වෙමි
කීසේක. තොපගේ උපාධ්‍යායෝ කිනම්හුදැයි විචාළසේක, එබ
සට මාගෙ උපාධ්‍යායන්වහන්සේ රොහණස්ථවිරනමැයි කීසේක
උන්වහන්සේ හා උපාධ්‍යායන්වහන්සේගේ නම විචාරා ඉක්බිති
අස්සගුත්ත මහතෙරුන් වහන්සේ මම කිනම්දැයි විචාළ සේක

එබසට නාගසෙනයන්වහන්සේ කියනසේක්: ස්වාමීනි ඔබවහන්
සේගේ නාමය අපගේ උපාධ්‍යායන්වහන්සේ දැනවදාරන සේකැ
යි දැන්වූ සේක, එවේලෙහි යහපත නාගසෙනයෙනි පාත්‍ර සිවුරු
වත් දැන තබවයි කී කල්හි යහපත ස්වාමීනියි සිවිස පාසිවුරු
තැන්පත්කොට තබා එදවස් සැතපී දෙවන දවස් උදෑසන්හි පිරි
වන වට ඇමද දැවටු දිය පිළියෙළ කොට එළවූසේක, අස්සගුත්ත
මහ තෙරුන්වහන්සේද ඇමදි මළුව නැවත ඇමද පිළියෙළකළ
දැවටු දිය දමා වෙනම දැවටුදිය ගෙනවුත් වළඳ නාගසෙනයන්
වහන්සේ හා සමග ඉදිරිපසු කථාවකුත් නොකළසේක, මෙසේ
සත්දවසක් ගියකල්හි සත්වන දවස් පළමුසේම ආසැලැස්ම විචා
රා ඇතිලෙසම අසා එදවසට වස්වසන දවස් එළඹ සිටිකල්හි
වස්විසීමට උන්වහන්සේටද අනුදැන අවසර දුන්සේක.

එදවස් මහත්වූ භොගයෙන් ආඪ්‍යවූ එක් උපාසිකාකෙනෙක්
අස්සගුත්ත මහතෙරුන්වහන්සේට ආරාධනාකොට වස් තුන්මස
උපස්ථාන කෙරෙමින් ඉක්බිති වස් අන්තයෙහි අස්සගුත්ත මහ
තෙරුන්වහන්සේ වැඩවසන වෙහෙරට එළඹ දැක වැඳ පුදා මහ
ත්වූ ආදරයෙන් එකත්පස්ව සිට අස්සගුත්ත මහතෙරුන් වහන්
සේ අතින් විචාරන්නාහු: ස්වාමීනි ඔබ වහන්සේ ළඟ අතිකුත්
භික්ෂු කෙනෙකුන් වහන්සේ ඇද්දැයි කිහ. එබසට අස්සගුත්ත
මහතෙරුන් වහන්සේ කියන සේක්: උපාසිකාවෙනි අප ළඟ
නාගසෙන නම්වූ එක් භික්ෂු කෙනෙක් වෙසෙති යී කීසේක. එබ
සට උපාසිකාවෝ කියන්නාහු: ස්වාමීනි එසේවීනම් සෙටදවස්
මාගේ ගෙසිදී වැළඳීමට ඒකියන නාගසෙන ස්වාමීන්වහන්සේත්
කැඳවාගෙන වැඩිය මැනවැයි කිහ. එකල ඒ උපාසිකාවන් කී
වචනයට මුවෙන් නොබැණම ඉවසා දෙවන දවස් උදෑසන්හිම
හඳනා සිවුරු හැඳ ගැටවටු ගන්වා ගෙන පාත්‍රය අතින් ගෙන
නාගසෙනයන්වහන්සේ පසු මහණකොට කැඳවාගෙන ඒ උපා
සිකාවන්ගේ ගෙදොරට ගොස් සිඟමින් එම ගෙයි පනවනලද්දාවූ
ආසනයෙහි වැඩහිඳ උපාසිකාවන් විසින් පිළියෙළ කොට පිළි
ගැන්වූ උතුම් කන බොනදෑආදීවූ ආහාරය නාගසෙනයන්වහන්
සේ ඇතුළුව වැඩ හිඳ වළඳ ඉක්බිති වූකල්හි දැවටු වළඳ උපාසි
කාවන්ට අනුමෙවෙනි බණ කියන්ට නාගසෙනයන් වහන්සේට
භාරකොට තමන්වහන්සේ හුනස්නෙන් නැඟී විහාරයටම වැඩි
සේක. එදවස් උපාසිකාවෝ නාගසෙනයන් වහන්සේට කියන්
නාහු: පුතාණුවන් වහන්ස මම ඉතාම වයෝවෘඬයෙම් එසේ හෙ
යින් මට ගැඹුරුවූ බණකථාවකින් අනුමෙවෙනි බණ වදාළ මැන
වැයි කිහ, එපවත් අසා නාගසෙනයන් වහන්සේ ඒ මහා උපාසි
කාවන්ට ගම්භීරවූ අභිධර්ම කථාවෙකින් ලොකොත්තර ධර්මය

ප්‍රකාශකොට අනුමෙවුනි බණ වදාළ සේක. ඉක්බිති ඒ උපාසිකාවෝ හුනස්නෙහිම හිඳ කෙලෙශයන් ප්‍රහීණ කොට අමාමහනිවන් දුටුහ. ආයුෂ්මත්වූ නාගසෙනයන් වහන්සේද ඒ උපාසිකාවන්ට අනු මෙවුනි බණ වදරා ඉක්බිති තමන්වහන්සේ දෙසුවාවූ ධර්‍ම සිතින් සලකමින්ම විදර්ශනා වඩා එම අස්නෙහිම හිඳ සොවාන් ඵලයෙහි පිහිටිසේක. අස්සගුත්ත මහතෙරුන් වහන්සේ වසන වෙහෙර මණ්ඩලමාලකයෙහි උන්සේක්: මෙදෙදෙනා ලත් සද්ධර්ම ප්‍රතිලාභයදිවසින්දූකසාධුසාධුනාගසේනයෙනි එකශරප්‍රහාරයෙකින්ම දෙදේනකු විද්දක් මෙන් එකවිට දෙසුවාවූ අනුමෝදනා ධර්‍මයෙන්ම දෙදෙනාටම ධර්‍මප්‍රතිලාභය වූයේ යහපතැයි සාධුකාරදුන්සේක. එක්ෂණයෙහි සියදහස් ගණන් බොහෝ දිව්‍යබ්‍රහ්ම සමූහයා තම තමන් මුවනොසෑහෙන ලෙස සාධුකාරදුන්නාහුය.

ඉක්බිති නාගසෙනයන් වහන්සේ ඒ උපාසිකාවන්ගේ ගෙයි වැඩඋන් අස්නෙන් පැනනැගී අස්සගුත්ත මහතෙරුන් වහන්සේ සමීපයට එළඹ පරමාදරයෙන් වැඳ එකත්පස්ව වැඩඋන්සේක. එකල්හි අස්සගුත්ත මහතෙරුන්වහන්සේ නාගසෙනයන් වහන්සේට කියනසේක්; එම්බා නාගසෙනයෙනි තොපි පැළලුප්නුවරට ගොස් අශෝකාරාමයෙහි වසන ධර්‍මරක්ඛිත ස්ථවිරයන්වහන්සේගේ සමීපයෙහි වැස බුද්ධවචනයන් නිපුණව උගනුවයි කීසේක. එබසට නාගසෙනයන් වහන්සේ කියනසේක්: ස්වාමීනි පැළලුප් නුවර මෙතනට කොතෙක් දුරදැයි විචාළසේක, එබසට පැළලුප්නුවර සියක් යොදුනැයි කීසේක. එකල්හි නාගසෙනයන් වහන්සේ ස්වාමිනී ඉතාම දුරුකතරය අතුරුමඟ භික්ෂාව දුලීභ වි නමුත් කෙසේයෙම්දැයි කිසේක එබසට නාගසෙනයෙනි අතුරුමඟ තොපට දවස් පතාම ඉතා සුදුසුවූ සුවඳ හැල් සාලේ අහර නොයෙක් සූප ව්‍යඤ්ජනයෙන් යුක්තව ලැබෙසිකියා අවසර දුන්සේක නාගසෙනයන් වහන්සේද වැඳ අවසරගෙන පැළලුප්නුවරට යන්ට නික්මුණුසේක් අතුරුමඟට පැමිණිසේක. එකල්හි පැළලුප්නුවර වසන සිටාණකෙනෙක් ගැල් පන්සියයක් පටවාගෙන වෙළඳාමේ ගොස් නැවත පැළලුප් නුවරටම එන්නාහු අතුරුමඟට පැමිණි නාගසෙනයන්වහන්සේ දුරවඩනා දැක ගැල් රඳවා ආයුෂ්මත්වූ නාගසෙනයන් වහන්සේගේ ළඟට ගොස් පසඟ පිහිටුවා වැඳ ආදරයෙන් සිට ස්වාමීනි නුඹවහන්සේ කවර තැනකට වඩනාසේක්දැයි විචාළේය. උපාසකය අපි පැළලුප් නුවරට යම්හයි කීසේක. වෙළඳුණෝ එබස් අසා සමාධිව ස්වාමීනි අපිත් පැළලුප් නුවරට යම්හ යහපත නුඹවහන්සේ අප හා සමග සැපසේ වැඩියමැනවැයි කීහ.

එබස් අසා නාගසෙනයන් වහන්සේ මුවෙන් නොබැණම ඉවසූ
සේක එකල්හි ඒ සිටාණෝ නාගසෙනයන්වහන්සේගේ ඉන්ද්‍රිය
සංයමාදිවූ සියලු ඉරියා පථයෙහි පැහැද දවසින් දවස වඩ වඩා
උතුම්වූඛාද්‍යභොජ්‍යයන්හා අනෙකවිධවූසූපව්‍යජනයෙන්යුක්ත
සුවඳහැල් සාලේ බත් සියඅතින් වළඳවා ඉක්බිති සිටාණෝ තුමූ
එක්තරා නිවාසනයක ඉඳ නාගසෙනයන් වහන්සේ අතින් විචා
රන්නාහු: ස්වාමීනි නුඹවහන්සේගේ නාමය කවරේදැයි කීහ. සි
ටාණෙනි අපි නාගසෙනයම්හයි කිසේක. නුඹවහන්සේ බුදුන්
වදාළාවූ ධර්මයෙන් කිසි දහම් පදයක් දන්නාසේක්දැයි කීහ. සිටා
ණෙනි අභිධර්මයෙන් බණ දනුම්හයි කිසේක එපවත් අසා බො
හෝ සමාධිව අද මා ලත්ලාභය උතුම්ලාභයෙකැයිසිතා ස්වාමීනි
නුඹවහන්සේ අභිධර්මය දනුමැනිසේක් වීනම් මමද පූර්වයෙහි ම
දක් අභිධර්මය පුරුදුකෙළෙමි එසේහෙයින්මට අභිධර්මයෙන්බණ
වදාළ මැනවැයි කීහ. එබසට නාගසෙනයන් වහන්සේද අභිධර්ම
යෙන් ඔවුන්හට බණ කියන්ට පටන්ගත් සේක එකල්හි උන්
වහන්සේ බණකියත් කියත්ම සිටාණෝ පහවූරාග රජස් ඇතිව
විගතවූ කෙලශමලයෙන් යුක්ත ධර්මචක්ෂුෂ ලැබ අමාමහ නිවන්
දුටහ. ඉක්බිති සිටාණෝ තමන් සැටුව යන පන්සියයක් පමණ
ගැල් ඉදිරියෙහි ගමන්කරවා තෙමේ පසුපස්සෙහි යනුයේ: පැළ
ලුප්නුවරට නුදුරුතැන දෙමංසන්ධියකසිට වහන්ස මේ අසොකා
රාමයට යන මග්යයිකියා මඳක්තැන්ගොස් මහපෑ දිගදෙළොස්
රියන් පුළුල අටරියන් මාගේ රත්නකම්බලය මාකෙරෙහි අනු
කම්පා උපදවා පිළිගනමැනවැයි කීහ, එබසට මුවෙන් නොබැණ
ඉවසා ඒ රත්නකම්බලය ඔහුකෙරෙහි අනුකම්පායෙන් පිළිගත්
සේක එකල්හි ඒසිටාණෝ බොහෝ සතුටුව උදග්‍රවූ ප්‍රීතිප්‍රමොද්‍ය
යෙන්ආයුෂ්මත්වූ නාගසෙනයන්වහන්සේ පැදකුණුකොටපසඟ
පිහිටුවා මැඳ තමා වසන පැළලුප් නිවරටම ගියේය.

එකල්හි නාගසෙනයන් වහන්සේ අසොකාරාමයෙහි වැඩවස
නධම්මරක්ඛිත ස්ථවිරයන්වහන්සේ දැක එකත්පස්ව සිට තමන්
වහන්සේ වැඩි කාරණා දැන්වූකල්හි ධම්මරක්ඛිත ස්ථවිරයන් ව
හන්සේ කියනසේක්: යහපත මෙතැන්හි වැස ත්‍රිපිටක ධර්මය
උගනුවයි අවසර දුන්සේක, නාගසෙනයන්වහන්සේ උන්වහන්
සේ කෙරෙහි වැස ත්‍රිපිටක ධර්මය උගන්නාසේක්: ගුරුමුඛයෙන්
එකාවිට ඇසූපමණින්ම ප්‍රගුණකොට ත්‍රිපිටකධර්මය තුන්මසකින්
ඉගෙන නිමවා අර්ථසහිතව තුන් මසකින් මෙනෙහි කළසේක,
ඉක්බිති ධම්මරක්ඛිත ස්ථවිරයන්වහන්සේ නාගසෙනයන් වහන්
සේට කියනසේක්: එම්බා නාගසෙනයෙනි යම්සේ ගවපාලයෝ

ගවයන් රක්නා මුත් පංච ගව්‍යරසයන් අනුභවකරන්නෝ අතික් කෙනෙක, එමෙන් තොපි ත්‍රිපිටක ධර්මය ඉගෙන සාමාන්‍යයෙන් ධරණමුත් එහි මධුරවූ අර්ථරසය දැන්මට යෝග්‍ය නොවන්න වූදැයි කීසේක: එබසට නාගසෙනයන් වහන්සේ කියනසේක්: ස්වාමීනි ඒ කුමක්වේවයි ඔබවහන්සේ විසින් මට ඉගැන්නුවාවූ ධර්මය මේ විවරකින්ම පමණ, අර්ථ සහිත ඉගැන්වීමට වෙහෙස නොගත් මැනවැයි කීසේක. මෙසේද කියා ඉක්බිති එදවස් රාත්‍රි භාගයෙහි උගත්තාවූධර්මයෙහි අර්ථ රසාස්වාදකොරෙමින් සිව්පිළිසිඹියාපත් රහත්වූසේක. එකල්හි මහපොළොව ශතසහස්‍ර රාවයෙන් ගුගුරා පැනනැගේය, සදෙව්ලොව දෙවියෝ එකාපැහැර සාධුකාරදුන්හ, සොළොස් බඹතලයෙහි බ්‍රහ්මයෝ එකාපැහැර අත්පොළසන්දුන්හ, දිව සඳුන් සුවඳ සුණු වර්ෂාකාරන්ටවන, මල් වැසිවසින්ටවන, දිවසුවඳින් මුළුලොව එකාසුවඳ පිඬක්සේ සුගන්ධ ප්‍රවාහයෙන් ආද්‍ර වූයේය, මෙසේ උන්වහන්සේ රහත්වූකල්හි හිමාල පර්වතයෙහි රක්ඛිතතල නම්වූ පර්වතය සරහා වාසයකළාවූ කොළසියයක් රහතුන්වහන්සේ නාගසෙනස්ථවිරයන් දක්නා අභිප්‍රාය ඇත්තාම්හ, එසේහෙයින් මෙතනට යුහුව සැඳවාගෙන එවයි දූතයන්එවූසේක, එකල්හි නාගසෙනස්ථවිරයන්වහන්සේ දූතයන්ගේ වචනයඅසා අසොකාරාමයෙහිදී අන්තර්ධානව හිමාල පර්වතයෙහි රක්ඛිතතලයට රැස්වවැඩහුන් කොළසියයක්රහතුන් වහන්සේ මධ්‍යයෙහි මහපොළොව දෙබේකොටගෙන තමන්වහන්සේගේ සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය විශෙෂය උන්වහන්සේලා මධ්‍යයෙහි ප්‍රකාශකොට තමන්වහන්සේ රහතවූබව දක්වා පෙනීගියසේක. එකල්හි කොළසියයක් රහතුන්වහන්සේ නාගසෙනතෙරුන් වහන්සේදැකකියනසේක්: එම්බා නාගසෙනස්ථවිරයෙනි යොන් රට **සාගල** නම් නුවර මිලිඳු නම්රජෙක් දෘෂ්ටිවාද ප්‍රතිවාදයෙන් ප්‍රශ්නවිචාරා භික්ෂුසංඝයාහට වෙහෙසදෙන්නේය, තොපිගොස් ඒ රජහුගේ දෘෂ්ටිවාද බිඳුවා දමනය ලවයි'කීසේක. එබසට නාගසෙන ස්ථවිරයන් වහන්සේ කියනසේක්: ස්වාමීනි මෙපමණකාට ඇමදෙනා වහන්සේ මහොත්සාහනොකොට වැඩසිටිය මැනව, මේ එක මිලිඳු රජහුතබා ඉදින් සකල ජම්බුද්වීපයෙහි හැම රජදරුවෝ මිලිඳු රජුමෙන් අවුත් මා අතින් ප්‍රශ්න විචාළෝ නමුදු ඒ සියල්ලවුන් විචාළ ප්‍රශ්න වෙන වෙනම විසඳ ජයගනිමි; එසේ හෙයින් ඇම දෙනාවහන්සේ නිර්භීතව යම්හයිකීසේක. ඒ හැම දෙනා වහන්සේම උන්වහන්සේගේ නිර්භීත ගර්ජනාව අසා යහපතැයිගොස් සාගලනුවර කාෂායවස්ත්‍රයෙන් බබුළුවා ජෝතිමත් කළසේක.

එකල්හි ආයුෂ්මත්වූ ආයුපාල ස්ථවිරයන්වහන්සේ සංඛෙය්‍ය පිරිවෙනෙහි වසනසේක, එසමයෙහි මිලිඳුරජ්ජුරුවෝ එක් දවසෙක ශරත් චන්ද්‍රකාන්තියෙන් බබළන්නාවූ රාත්‍රියෙහි අමාත්‍යවරුන් කැඳවා කියන්නාහු: එම්බා සගයෙනි අදමේරාත්‍රිය ඉතාම සිත්කළුය කොතැන්හි ශ්‍රමණ බ්‍රාහ්මණ පණ්ඩිතයෙක් වෙසේද, ඔහු සමීපයට ගොස් ප්‍රශ්න විචාරා සාකච්ඡා කරනු පිණිස යම්හ. කවරෙක් මා හා කථාකොට මා සිත ඇති කාංක්ෂා දුරුකෙරේදැයි කීහ, මෙසේ මිලිඳුමහරජු කීකල්හි පන්සියයක් යොන් අමාත්‍යවරු කියන්නාහු: දේවයන්වහන්ස ආයුපාල ස්ථවිරයන්වහන්සේ ත්‍රිපිටකධරසේක, බහුශ්‍රැතසේක, බුද්ධාගමයෙහි දක්ෂසේක, දැන් උන්වහන්සේ සංඛෙය්‍යපිරිවන වසනසේක. එසේහෙයින් උන්වහන්සේ ලඟට ගොස් ප්‍රශ්න විචාරම්හයි කීහ. සගයෙනි එසේවීනම් අප එන පවත් උන්වහන්සේට සැළකරවයි කීහ. එපවත් අසා යොන් අමාත්‍යවරු ආයුපාල ස්ථවිරයන්වහන්සේ ලඟට දූතයකු යවූහ, ඒ දූතයා සංඛෙය්‍ය පිරිවනට ගොස් ආයුපාල ස්ථවිරයන්වහන්සේට කියනුයේ: ස්වාමීනි දැන් රජ්ජුරුවන්වහන්සේ නුඹවහන්සේ දක්නා පිණිස එනු කැමතිසේකැයි කීය. උන්වහන්සේ එපවත් අසා යහපත එසේවී නම් එන්ට කියවයි කීකල්හි මිලිඳු රජ්ජුරුවෝ එපවත් අසා පන්සියයක් යොන්ඇමතියන් පිරිවරා රථවාහනාරූඪව පැන නැඟී සංඛෙය්‍ය පිරිවනට අවුත් ආයුපාල ස්ථවිරයන්වහන්සේ දැක වැඳ එකත්පස්ව උන්හ, මෙසේ එකත්පස්ව හුන්නාවූ මිලිඳුරජතෙම ආයුපාල ස්ථවිරයන්වහන්සේට කියනුයේ: ස්වාමීනි ආයුපාල ස්ථවිරයන්වහන්ස නුඹවහන්සේලාගේ ප්‍රව්‍රජ්‍යාවෙන් කවර ප්‍රයොජනද, කවර අර්ථසිද්ධියෙක්වේදැයි කීය. තෙරුන්වහන්සේ එපවත් අසා මහරජ අපගේ ප්‍රව්‍රජ්‍යාව ධර්මයෙහි හැසිරෙනු පිණිසද සමචර්‍ය්‍යාව පිණිසද වෙයි කීසේක. එබසට මිලිඳුමහරජ කියනුයේ: ස්වාමීනි ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යාව සමහර ගෘහස්ථයෝත් සිද්ධකරන්නාහු වේදැයි කීය, එසේය මහරජ ගිහිත් ධර්මචාරී සමචාරී වන්නාහු වෙති, මහරජ අප ත්‍රිලෝගුරු සම්‍යක්සම්බුද්ධරජාණන්වහන්සේගේ බරණැස්නුවර ඉසිපතන නම්මිගදායෙහිදී දම්සක්පවතුන්සූත්‍රදෙශනායෙහිඅට්ළොස්කෙලක්බ්‍රහ්මයන්ට ධර්මාභිසමයවූයේය.දෙවිය ගෙන්අගණිතය,එසියල්ලෝම ගිහි මූත් ප්‍රව්‍රජිතයෝ නොවෙති, තවද මහරජ අනිකුත් මහාසමය සූත්‍ර දේශනායෙහිද රාහුලසූත්‍ර දේශනායෙහිද සමචිත්තපර්‍ය්‍යාය සූත්‍ර දේශනායෙහිද පරාභව සූත්‍ර දේශනායෙහිද අගණිතවූ දෙවතාවන්ට ධර්මාභිසමය වූයේය. එහැම ගිහ් මූත් ප්‍රව්‍රජිත නොවෙතියි කීසේක. එබසට මිලිඳු රජ්ජුරුවෝ කියන්නාහු ස්වාමීනි එසේවීනම් නුඹවහන්සේගේ ප්‍රව්‍රජ්‍යාවෙන් ප්‍රයොජන්නැත. නුඹවහන්සේ පෙර කළාවූ අකුසලකර්මවිපාක

යෙන් ශරීර අලංකාරවූ දළි රවුළු හිසකෙස්වැටි බහා යහපත් පිළි මැඩිලි කපා එක්කොට මසා දෙපටකොට ඇඟට . සුවපහස් නොදෙන සතරළු සිවුරුපෙරවා දුක්විඳ, සයට බත් නොලැබ, කලට නිදි නොලැබ, සැතපෙන්ට ඇඳ පුටු කොට්ට තිලිමහරු යහපත් සෙනසුන් සිත්සේ නොලැබ, මෙකීදෙය ලදත් එයින් ප්‍රයොජන නොවිඳ, කයට දුක්දී තෙළෙස් ධුතාංගයයි කියාත් රකිනාසේක. ස්වාමීනි ආයුපාලස්ථවිරයන්වහන්ස යම්කෙනෙකුන් වහන්සේ ඒකාසනිකාංගය රක්නාසේක: ඒ රක්‍ෂාකිරීම ගුණධර්මයක් උදෙසා නොවෙයි. අකුසලකර්මයෙන් විඳිනා දුකැයි සිතමි. ඒ කවර අකුසලයෙකින්දැයි යත්හොත්: උන්වහන්සේ පූර්වජාතියෙහි අනුන්ගේවස්තුවැදුරුගත් සොරුණෝය. ඒ වස්තු උදුරුගත් අකුසල විපාකයෙන් මේ ජාතියෙහි දෙවේලේ බත් නොලැබ එක්වේලේලත්විචරක් අනුභවකොට දෙවේලේ ලදත් සිත්සැටියේ කාබී ගත නොහෙන්නාහ. එපමණක්මුත් ඔහට ශීලව්‍රතයෙක්වත් තපොගුණයෙක්වත් බ්‍රහ්මචර්යයෙක්වත් ඇතැයි නොසිතමි. එසේහෙයින් එයින් එක් අකුසල කර්මවිපාකයෙක; තවද ආයුපාල ස්ථවිරයන් වහන්ස අබ්භොකාසිකාංගය රක්‍ෂාකරන්නාහු: ගියජාතියෙහි ගම් පැහැර ගෙවල්ගිනිලා සත්වයන්ට වෙහෙස දුන් ගම්පහරන සොරුය. එසේහෙයින් ඔහු තමන් පෙරජාතියෙහි කළාවූ අකුසල විපාකයෙන් දැන් මේ ජාතියෙහි ගෙවල් නොලැබ සිතසුළඟින් දුක් විඳ අබ්භොකාසයෙහිම වෙසෙති, මෙපමණක් මිස ඔවුන්ගෙ සිල්රැකීමෙක් වත් තපොගුණයෙක්වත් ඇතැයි නොසිතමි තවද ආයුපාල ස්ථවිරයන්වහන්ස නෙසජ්ජිකාංගය රක්‍ෂාකරන්නාවූ භික්‍ෂුහු පූර්වජාතියෙහි මංපහරන සොරුය, මග යනු එන්නන්ට වෙහෙසදී කොල්ලකමින් ඔවුන් අල්වාගෙන රැඳුවල් තිදියනොදී බැඳසිටුවා බොහෝ වෙහෙසදී භයගැන්වූවාහු ඒ පූර්වඅකුසල කර්මවිපාකයෙන් දැන් රැඳුවල් නොතිඳ සැප සයනයෙක රස නොදැන උන්වනාම ඉඳ දුක්විඳිනාහ එපමණක්මුත් ඔවුන්ගේ සිල්රැකීමෙක්වත් තපොගුණ විශෙෂයෙක්වත් ඇතැයි නොසිතමි මෙයින් අන්‍යවූ සෙස් ධුතාංග රක්‍ෂාකරන්නාහු පූර්වජාතියෙහි තමන් කළ ඒ ඒ අකුසල විපාක බලයෙන් මේ ජාතියෙහිත් ධුතාංග රකිම්හයි පෙරකළ අකුසල විපාකයම විඳිනා කර්ම කළාහුය.

මෙසේ ඒ මිලිඳු මහරජාණන් කී කල්හි ආයුෂ්මත්වූ ආයුපාල ස්ථවිරයන්වහන්සේ සිතනසේක්: මේමහරජ කියන්නේකිමෙක්ද බණ විචාරන්ට අවුත් විචාරන බණ තබා වෙනම මගකයෙයි; එසේවූ රජහු හා සමග කථාකිරීමෙන් ප්‍රයොජන කිම්දැයි බැණ නොනැඟි වැඩහුන්සේක. උන්වහන්සේ මුවෙන් නොබැණ වැඩ

හිඳිනා දැක පන්සියයක් යොන් ඇමතියෝ මිලිඳු රජහට කියන්නාහු: දෙවයන්වහන්ස තෙරුන්වහන්සේ මහා පණ්ඩිතසේක. එතකුදුවුවත් විසාරද සාපිත කමක් නැතිහෙයින් බැණ නොනැගී වැඩ හුන්සේකැයි කීහ. එකල්හි මිලිඳු මහරජාණෝ අමාත්‍යවරුන් කියන බස් නොඇසූ කන්වම අත්පොළසන් දී ඔල්වරහඬ ගසා පිරිවරා සිටි යොන් ඇමතියන්ට කියන්නාහු: එම්බා සගයෙනි මේ සකල ජම්බුද්වීපය පණ්ඩිතයක්හු නැතිව සිස්වූයේය පණ්ඩිත ගොචරවූ සුශබ්ද ශබ්දාර්ථාදියක් ප්‍රකාශව අසන්ට නොලබන හෙයින් ප්‍රලාපය, මාහැර වෙන පණ්ඩිතයකු දඹදිව ඇතැයි නොසිතම්, එසේහෙයින් මම් පණ්ඩිතයෙමියි කවරෙක් මා හා කැටිව කථාකොට මා සිතට උපන් සැකයක් දුරුකොට පියහේදැයි. මහත් පණ්ඩිතාභිමානයෙන් හුන්නාවූ මිලිඳු මහරජ සභායෙහි හුන් අමාත්‍යවරුන් මූහුණ බැලීය, එකල්හි අභීතව අමංකුභූතව ගර්වයෙන් හුන් යොන් ඇමැත්තන් දැක මහරජ සිතනුයේ: මොහු කිමෙක්ද කිසි සැකයක් නැතිව හිඳිති අතිකූත් මා හා කැටිව කථාකරන්ට සමර්ථ පණ්ඩිත භික්ෂුවක්හු ඇතිවන, එසින් ඒහෙයි මේ අමාත්‍යවරහු අමංකු භූතව හුන්නාහුයයි සිතා අමාත්‍යවරුන්ට කියනුයේ: එම්බා සගයෙනි අතිකූත් පණ්ඩිත භික්ෂුවෙක් මා හා කැටිව කථාකරන්ට සමර්ථ වේදැයි සිතා කියා මහත් අභිමානයෙන් එතැනින් නික්ම අවුත් තමා වසන රාජ භවනයටමගියේය. හේ එසේමය. දිවැසට නුවණැසවැඩිතරම් හෙසිනුත් වාසනා බලයෙනුත් රහතුන්වහන්සේ ඔහුහා සමග කථාකොටගත නුහුණුසේක මොවුන් වහන්සේ වාසනා බලයෙන් තකීසොට දිණුසේකැයි දතයුතු.

එකල්හි ශ්‍රමණගණ පරිවෘතවූ ගණාචාර්‍යවූ ප්‍රඥවත්වූ දිගුබිතපතළ කීර්ති ඇතිහෙයින් කීර්තිමත්වූ සාධුජන මනොරම්‍ය සකලාගම ශාස්ත්‍රාදියෙහි නිපුණවූ සාධුජන විනීතවූ විසාරදවූ බහුශ්‍රැතවූ චතු ප්‍රතිසම්භිදා ප්‍රභෙදඥතවූ නවාඞ්ග ශාස්තෘ ශාසනපර්‍යාප්ති ධරවූ ශ්‍රාවකබොධිඥන රත්නාකර පාර ප්‍රාප්තවූ ජිනවචන ධර්මාර්ථ දෙශනා ප්‍රතිවෙධයෙහි දක්ෂවූ අක්ෂරය විචිත්‍ර ප්‍රතිභානොචිත චිත්‍රකථිවූ මධුරරස වාණිවාණිනිපතිවූ කුදෘෂ්ටිකුඤ්ජර විදාරණයෙහි හරිඳුවූ දුරුතනර පිචු පුජප්‍රක්ෂාලිත මාරුතවූ වාදි භාඞ්කුශ සනාන්භවූ පරෂිගණ සිඬු මථන මන්දරගිරිවූ පරතීර්ථකාර තස්කර නිකාර නිසාකරකිරණවූ භික්ෂු භික්ෂුණීගෘහපති ගෘහ පත්නි දෙව නාගිනී බ්‍රහ්මාදීන් මානිත පූජිතවූ චතුප්‍රත්‍යයලාභාග්‍ර ප්‍රාප්තවූ විඥ කර්ණාමෘත ධර්මකථා කථනප්‍රභෙදයෙහි දක්ෂවූ ධර්මප්‍රදීපයෙන් ලොකාලොක කළාවූ ධර්ම ධ්වජයෙන් ලොකසජ්ජිත කළාවූ ධර්ම චක්‍රයෙන් ජනමන ප්‍රසාදවහවූ ධර්ම හෙරි

නාදයෙන් මුළුලොව එක කොලාහල කළාවූ ධර්මමේඝනාදයෙන් ජගදෙකතින් නාද කළාවූ ආයුෂ්මත්වූ නාගසෙන තෙරුන්වහන්සේගේ ක්ෂණවිද්‍යුත්ප්‍රභා භාසුරවචන ගර්ජිත සම්පන්න කාරුණ්‍ය ජලභරිත ධර්මාමෘතමේඝයෙන් සකලලොක ක්ෂෙත්‍රයෙහි ජන හෘදය ශස්‍යයන් සන්තොෂ කරවා ගම් නියංගම් රාජධානි පිළිවෙළින් දනවු සැරිසරා අනුක්‍රමයෙන් අවුත් යොන්රට මිලිඳු මහරජහුගේ සකල ශ්‍රීභරිත සර්ව දුර්ගාන්විත පරශත්‍රු විකල විලොපයෙහි සුළු සාගල නුවරට පැමිණ අසූදහසක් භික්ෂු සංඝයාවහන්සේ පිරිවරා සංඛෙය්‍ය පිරිවන වැඩවසනසේක, එසින් කීහ.

"බහුස්සුතො චිත්තකථී නිපුණො ච විසාරදො,
සාමයිකො ච කුසලො පටිභානෙ ච කොවිදො.
තෙ ච තෙපිටකා භික්ඛූ පඤ්චනෙකායිකාපි ච,
චතුනෙකායිකා චෙව නාගසෙනං පුරක්ඛරුං.
ගම්භීරපඤ්ඤො මෙධාවී මග්ගාමග්ගස්ස කොවිදො,
උත්තමත්ථං අනුප්පත්තො නාගසෙනො විසාරදො.
තෙහි භික්ඛූහි පරිවුතො නිපුණෙහි සච්චවාදිහි,
චරන්තො ගාමනිගමං සාගලං උපසංකමී.
සංඛෙය්‍යපරිවෙණස්මිං නාගසෙනො තදා වසී.
කථෙති සො මනුස්සෙහි පබ්බතෙ කෙසරී යථා"යි.

යනාදීන් අප්‍රමාණවූ ගුණඥතානුභාවාදීන් සොභමානවූ ආයුෂ්මත් නාගසෙන තෙරුන්වහන්සේ සපිරිවරින් සංඛෙය්‍ය පිරිවන වැඩ වසනකල්හි එක්දවසෙක මිලිඳු මහරජ ඇමතිගණ පිරිවරා දෙවෙන්ද්‍ර විලාසයෙන් රාජසභා මධ්‍යයෙහි හිඳ කියනුයේ: එම්බා සගයෙනි යම්තැනෙක්හි ශ්‍රමණබ්‍රාහ්මණ පණ්ඩිතාදී යම්ප්‍රාඥයෙක් හු වසනතැනක් දනුනම් කියව, මම උන් හා සමග කථාකරනු කැමැත්තෙමි කිය එබසට දෙව්මන්තිනම් අමාත්‍යයා කියනුයේ: දෙවයන්වහන්ස මඳක් ඉවසුව මැනව, පණ්ඩිතවූ වියත්සාමීන් අගපත්වූ මෙධාවී විනීතවූ විසාරදවූ බහුශ්‍රැතවූ චිත්‍රකථීවූ නාගසෙන නම් ස්ථවිරොත්තමයෙක් ඇත ඒ ශ්‍රමණෙන්ද්‍රයන් වහන්සේ සංඛෙය්‍ය පිරිවෙනෙහි වැඩවසන සේක, එසේ හෙයින් දෙවයන් වහන්ස නුඹවහන්සේ කිසිසැකයක් නොසිතා දැන්ම උන් වහන්සේ ළඟට වහා නික්මුණු මැනව, ඒ නාගසෙන තෙරුන් වහන්සේගෙන් ප්‍රශ්න විචාළ මැනව, උන්වහන්සේ නුඹ වහන්සේගේ සිතට උපන්නාවූ කාංක්ෂාවන් දුරුකොට විචාළාවූ ප්‍රශ්න විසර්ජනය කොට පණ්ඩිත වාදයෙන් නුඹවහන්සේ හා කථා කරන්ට සමර්ථසේකැයි කීය. එකෙණෙහි මිලිඳුමහරජාණෝ නාගසෙනයයි යන ශබ්දය කනවැකොත්ම භයින් ත්‍රස්තව ලොමුදැහැගත්

ශරීරයෙන් යුක්තව එහකුදුවුවත් රාජධෛර්‍ය්‍යයෙන් හිඳ දෙව
මන්ත්‍රියාට කියන්නාහු: කිමෙක්ද සගය නාගසෙන ස්ථවිරයන්
වහන්සේ මා හා කැටිව කථාකරන්ට සමර්ථසේක්දැයි කීහ. එබ
සට දෙවමන්ත්‍රි නම් අමාත්‍යයාකියනුයේ: දෙවයන්වහන්ස නුඹ
වහන්සේ කුමක් කියනසේක්ද, ඉන්ද්‍ර යම වරුණ කුවෙර පජා
පති සුයාම සන්තුෂිත පිතු පිතාමහ බ්‍රහ්මාදීන් හා සමග කථා
කරනත් සමර්ථසේක. මනුෂ්‍යයන් හා සමග කථා කිරීම කියනුම
කවරේදැයි කීය. ඉක්බිති මිලිඳු මහරජතෙම දෙවමන්ත්‍රියා කී
බස් අසා ඔහට කියනුයේ: එම්බල දෙවමන්ත්‍රිය එසේවූ කොතෙ
කුන්වහන්සේ වීනම් උන්වහන්සේ ළහට දූතයකු ගමන් කරවා
මා උන්වහන්සේ අද දක්නා කැමති බව කියන්ට කියවයි කීය.
දෙවමන්ත්‍රි අමාත්‍යතෙම එපවත් අසා යහපතැයි ගිවිස රජහු
කීලෙසම නාගසෙන ස්ථවිරයන් වහන්සේ ළහට දූතයකු ගමන්
කරවනුයේ: අපගේරජ්ජුරුවන්වහන්සේ අදදවස් නුඹවහන්සේ
දක්නා කැමතිසේක, ඊට ප්‍රස්තාවඇති ඇනිලෙසම කිව්මැනවැයි
කියා යවීය. එපවත් අසා නාගසෙන තෙරුන්වහන්සේ එසේ
වීනම් මහරජාණන්ට එන්ට කියවයි කීසේක. එපවත් ඇසූ දූත
තෙම පිළිවෙළින්ම අසාගත් මෙහෙවර වූලෙස මහරජහට
දැන්වීය.

එබස් අසා මිලිඳුමහරජාණෝ පන්සියයක් යොන් ඇමතියන්
පිරිවරා සෛන්ධව අශ්වයන් යෙදූ උතුම් රථවාහනයකට පැන
නැඟී සිවුරඟ සෙනඟ පිරිවරා නාගසෙන ස්ථවිරයන්වහන්සේ
වැඩවසන සංඛෙය්‍ය පිරිවනට නික්මුණාහ. එකල්හි නාගසෙන
ස්ථවිරයන් වහන්සේද අසූදහසක් භික්ෂූන් වහන්සේ පිරිවරා
මණ්ඩලාකාරයෙන් වැඩඋන්සේක. එකල්හි මහසෙනඟ පිරිවරා
එන්නාවූ මිලිඳු මහරජාණෝ මඬල මාළකයෙන් වැඩහුන් මහා
සංඝයාවහන්සේ දුරදීම දැක දෙවමන්ත්‍රිය තෙල මහසඟ පිරිස
කවර නම් කෙනෙකුන්ගේ පර්ෂද්දැයි විචාළහ. එබසට දෙවමන්
ත්‍රියා කියනුයේ: දෙවයන්වහන්ස වාදීභ කෙසරීහුවූ නාගසෙන
ස්ථවිරයන්වහන්සේගේ පිරිවර මහසඟ පිරිසයයි කීය. එබස්
ඇසූ මිලිඳු මහරජතෙම නාගසෙන ස්ථවිරයන්වහන්සේ පිරිවරා
හුන් මහසඟපිරිස් දුරදීමදැක තැතිගෙන ලෝමුදූ දැහැගත් ශරීර
යෙන් යුක්තව මහත්වූ භයට පැමිණ, ඛාග වෙනෙනුන් විසින්
පිරිවැරූ ඇතකුමෙන්ද ගුරුළසෙනාව පිරිවැරූ නයකු මෙන්ද
මහිස සමූහයා පිරිවැරූ වලසකු මෙන්ද නයකු දුටු මැඩියකු
මෙන්ද දිවියකුදුටු මුවපැටවකු මෙන්ද බළලකුසමීපයට පැමිණි
මීයකු මෙන්ද යකාදුරකු සමීපයට පැමිණි ප්‍රෙතයකු මෙන්ද
රාහු මුඛයට ළංවූ චන්ද්‍රයා මෙන්ද පැසකට හසුවූ නයකු මෙන්ද

මැඳිරියකට හසුවූ පක්‍ෂියකු මෙන්ද දැලක හසුවූ මසකු මෙන්ද දිවියන් වසන වනයකට පැමිණි පුරුෂයකු මෙන්ද වෙසමුණු රජහට අපරාධ කළ යක්‍ෂයකු මෙන්ද මහබල සුරන් දුටු අසුර යකු මෙන්‍ද මහත්වූ භයින් තැතිගෙන ලයවියලී මුව කෙල සිඳී සිහිමුළාව දුර්මුඛව දෙදරීගිය සිත් ඇතිව වික්‍ෂිප්ත සිත් ඇතිව, මහරජතෙම මාගේ පිරිවර ජනයෝ මෙපවත් දත්තු නම් මට නිඥා කරන්නාහුයයි සිතා රාජාභිමානයෙන් ධෛර්‍ය්‍ය උපදවා ගෙන මදක් අහංකාරයෙන් සිට දෙවමන්ත්‍රියාට කියනුයේ: එම්බා දෙවමන්ත්‍රිය ආයුෂ්මත්වූ නාගසෙනස්ථවිරයන්වහන්සේ තොපි මට නොකියව, මම්ම ඇඳින ගනිමියි කිය. එබසට දෙව මන්ත්‍රියා කියනුයේ: යහපත දෙවයන්වහන්ස නුඹවහන්සේම දැක හැඳිනගනමැනැවැයි කිය. එකල්හි සතළිස්දහසක් භික්‍ෂූන් වහන්සේට බාලව සතළිස් දහසක් භික්‍ෂූන්වහන්සේට වැඩිමහ එව මඬල මාලකයෙන්හුන් සඟ පිළිවලමැද වැඩහුන් නාගසෙන ස්ථවිරයන්වහන්සේ දුරදීම දැක සඟපිළිවළ ආදි මධ්‍යාවසාන යෙන් මුන්වහන්සේම නාගසේනස්ථවිරයන්වහන්සේයයි නියම කොට දෙවමන්ත්‍රියාට කියන්නාවූ මිලිඳුමහරජතෙම, එම්බා දෙවමන්ත්‍රිය තොප මට කියන්නාට පළමුම නාගසෙන ස්ථවිර යන්වහන්සේ හැඳිනගතිමියි තෙලෙ සතළිස් දහසක් භික්‍ෂූන් වහන්සේට පළමුව සතළිස් දහසක් භික්‍ෂූන්වහන්සේට පසුව මැද වැඩහිඳිනාසේක් නාගසෙන ස්ථවිරයන්වහන්සේයයි කිය. එබසට දෙවමන්ත්‍රියා නාගසෙන ස්ථවිරයන්වහන්සේ දැනගත් තියාව ඉතාම යහපතැයි මිලිඳු මහරජහට මුව නොසෑහෙන ලෙස ප්‍රශංසා කෙළේය. එකල්හි මහරජාණෝ කිසිකෙනෙකුන් විසින් නොහඳුන්වාම මා නාගසෙනස්ථවිරයන්වහන්සේ හැඳින ගත් තියාව ඉතාම යහපතැයි බොහෝ සමාධිව මුනවට සාන්ත දාන්තවූ ශ්‍රමණ ගුණමිණිබරණින් සැරහුණාවූ උදාරාමයාණන් වහන්සේ දැක මාගේචිත්තය විශෙෂයෙන් තැතිගත්තේය; පෙර බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණ ගෘහපති පණ්ඩිතවරුන් හා කථාකරන කල්හිද දක්නා කල්හිද ප්‍රශ්න විචාරන කල්හිද මෙබඳු භයක් තබා චිත්තොත්‍රාස මාත්‍රයකුත් නුදුටු විරිමියි එසේහෙයින් අද දවස් නාගසෙන ස්ථවිරයන්වහන්සේට ජයත් තමහට පරාජ යත් වීම සැකනැතැයි සිතුයේය. **එසේහෙයින් කිහ,**

“චරණෙන චෙව සම්පන්නං සුදන්තං උත්තමෙදමෙ,
දිස්වා රාජා නාගසෙනං ඉදං වචනමබ්‍රවි:
කථිකා මයා බහූ දිඨා සාකච්ඡා ඔසටා බහූ,
න තාදිසං භයං ආසි අජ්ජ තාසො යථා මම;

නිඃසංස යං පරාජයො මම අජ්ජ භවිස්සති,
ජයො ච නාගසෙනස්ස යථා චිත්තං න සංඨිතං."යි

මෙසේ සිතින්ම විමසා නිශ්චයකොට දූත මහසෙනඟ හා සමඟ ඇමති මඬුළු පිරිවරා පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය ඝොෂාවෙන් දසදිගුන් පුරමින් සංඛෙය්‍ය පිරිවෙන සමීපයට එළඹ රථයෙන් බැස රාජ තෙජසින් දිලිහිදිලිහී ත්‍රිමදගළිත හස්තිරාජයකුමෙන් මහත් ගජ ප්‍රතාපයෙන් නාගසෙන ස්ථවිරයන් වහන්සේ සමීපයට ගොස් සිටියාහ.

"මිලින්දො නාම සො රාජා සාගලායං පුරුත්තමෙ,
උපගඤ්ජි නාගසෙනං ගඞ්ගාව යථ සාගරං."

යනුහෙයින් සකල නගරාඞ්ග සම්පත්තීන් සමෘද්ධවූ සාගල නුවර යම් මිලිඳු රජෙක් වෙසේද, ඒරජතෙම යම්සේ මහාසමුද්‍රයට පැමිණි ගඞ්ගාවක්සේ නාගසෙන ස්ථවිරයන්වහන්සේ සමීපයට පැමිණියේද,එසේ පැමිණියාවූ මිලිඳුමහරජතෙම නාගසෙන ස්ථවිරයන්වහන්සේ දැක සමඟ සතුටුව ප්‍රිය කථා කෙරෙමින් ලත් අවසරින් එකත්පස්ව හුන්නේය. ආයුෂ්මත්වූ නාගසෙන ස්ථවිරයන් වහන්සේද පිළිසඳර කථාවෙන් මිලිඳු මහරජහු සිත් ගෙන වැඩහුන්සේක. එකල්හි එකත්පස්ව හුන්නාවූ මිලිඳු මහ රජතෙම නාගසෙන ස්ථවිරයන්වහන්සේට කියනුයේ; ස්වාමීනි නුඹවහන්සේ කවර නාමයක් ඇතිසේක්දැයි කීය. එබසට නාග සෙන ස්ථවිරයන් වහන්සේ මහරජ මම නාගසෙන නම් වෙමියි මාගේ සබ්‍රම්සරුන්වහන්සේද මට නාගසෙනයයි වදාරනසේක; දෙමවුපියෝද නාගසෙනයයි නමක් තබා ඒනාමයෙන් ආමන්ත්‍රණය කෙරෙති; එතකුදු වුවත් මාගේ නාමය නාගසෙන වෙවයි සූරසෙන වෙවයි වීරසෙන වෙවයි සිංහසෙන වෙවයි ප්‍රඥප්ති බැව්හාරයෙක්මය; ඉදින් මේ නාමය නාගසෙනයයි කියා පුද්ගලතෙම නොලබන්නේයයිකීසේක. එබසට මිලිඳුමහරජාණෝ කියන්නාහු: මේ සභායේ රැස්වූ පන්සියයක් යොන්ඇමැතියන් හා අසූදහසක් සංඝයාවහන්සේ මුන්වහන්සේ කියනබස් ඉඳුරා අසුව මැනව, පළමු නාගසෙන නමක් ඇත්තෙමියි කියා දැන් මේ නම පුද්ගලයෙක් නොලබන්නේයයි කීසේක. එසේ කීම යහපත්ද නාගසෙන ස්ථවිරයන්වහන්ස ඉදින් ඒ නාගසෙනයයි යන නම පුද්ගලයෙක් නොලබන්නේවීනම් කවරෙක් නුඹවහන්සේට සිවුරු දේද, ආහර දේද, සෙනසුන් දේද, ගිලන්පසදේද, කවරෙක් ඒ සිවුරු වළඳීද, කවරෙක් ආහාර අනුභව කෙරේද, කවරෙක් සෙනසුන් පරිභොගකෙරේද, කවරෙක් ගිලන්පස වළඳද, කවරෙක් සිල්රකීද කවරෙක්භාවනාකෙරේද,කවරෙක්

මාගීඵල සිඹකෙරේද, කවරෙක් ප්‍රාණඝාතකෙරේද, කවරෙක් අදත්තාදනය ගනිද, කවරෙක් පරදර ක්‍රියාවෙහි නියුක්තවේද කවරෙක් මුසාවාදකියාද,කවරෙක් පචානනතාරිය කම්කෙරේද; එසේහෙයින් කුසලුත් නැත, අකුසලුත් නැත. කුසල් අකුසල් දෙක කරන්නෝත් නැත. කරවන්නෝත් නැත, කුසල් අකුසල් කිරිමෙහි ඵලත් නැත, විපාකත් නැත. එසේහෙයින් නාගසෙන ස්ථවිරයන් වහන්ස යමෙක් නුඹවහන්සේ මැරුයේ වීනමුත් ඕහට ප්‍රාණඝාතත් සිඹනොවෙයි; ඉදින් නුඹවහන්සේට ආචාරින් නැත. උපාධ්‍යායයෝත්නැත. එසේහෙයින්නුඹවහන්සේට සබ්‍රම්සරුන්වහන්සේ හා දෙමවුපිය ඥති ආදීහු නාගසෙනයයි කියති කිසේක්නොවේද, එසේහෙයින්දූන් නාගසෙනනම්වූයේ නුඹවහන්සේගේ හිස අඩුතුන්කෙළක් පමණ කෙසයෝදූයිකීහ. එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ මහරජ අඩුතුන්කෙළක් කෙසයෝ නාගසෙන නම් නොවෙතියි කිසේක සියලඟ නවා නූදහසක් රෙමයෝ නාගසෙන නම් වෙත්දූයිකීහ. මහරජරෙම යෝත් නාගසෙනනම් නොවෙතියිකිසේක.නුඹවහන්සේගේවිසි තියපොත්තෝ නාගසෙන නම් වෙත්දූයි කීහ නොවෙතියි කිසේක. නුඹවහන්සේගේ දෙතිස් දන්තයෝ නාගසෙන වෙද්දූයි කීහ. නොවෙතියි කිසේක. සම් මස් ඇට නහර ආදීවූ දෙතිස් කුණප කොට්ඨාසයෙන් කවර කොට්ඨාසය නාගසෙන නම් වේ දූයි කීහ, ඒ දෙතිස් කුණපකොට්ඨාසයෙන් එකකුත් නාගසෙන නම් නොවෙතියි කිසේක. එහැම නාගසෙන නම් නොවන කල රූපය වෙදනාව සංඥව සංස්කාරය විඥනය නාගසෙන වේදූයි කීහ. නොවෙතියිකිසේක. එසේ කල සෙසුතැන්හි රූප වෙදනා සංඥ සංස්කාර විඥනය නාගසෙන නම් දූයි කීහ. නොවෙතියි කිසේක. එබසට මිලිඳු මහරජාණො කියන්නාහු: කිමෙක්ද නාගසෙන ස්ථවිරයන්වහන්ස මා විචාළාවූ සියල්ලම නාගසෙන නොවෙයි කියනසේක.පළමු නාගසෙනයයියන නමක් කීසේක. විචාරත් විචාරත් නැතැයි කියනසේක. මමද පළමු නාගසෙන යයි යන නමක් ඇසිමි, දූන් නුදුටුයෙමි, එසේහෙයින් සභා යේ හැම ඇසුව මැනව. මුන්වහන්සේ පළමු කී බසට දූන් කියන බස විරුඩය, එසේහෙයින් මුන්වහන්සේ කියනුයේ මුසාවාද නොවේදූයි කීහ. මෙසේ මිලිඳු මහරජාණන් කී බස් අසා හිඳ නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්: මහරජ තෙපි රජසිව්‍රමැළියහ. මේමධ්‍යාහ්නවේලෙහි ඉරඅවුවෙන්හුණුවූ ගල් බොරළු වැලි මිරිකාගෙන පයින්එන්නාහට ඉතාම වැසනයෙ එසේහෙයින් මෙ දුදුලුමඟ පයින්ම අවුද. යානවාහනකින් නැගී අවුදූයි විචාළසේක, එබසට මිලිඳුමහරජාණෝකියන්නාහු: ස්වාමීනි මම රථවාහනයකට නැගී ආමියිකීහ එබසට නාගසෙන ස්ථ

ථිරයන් වහන්සේ කියනසේක්: තෙපි රථයක් නැගී ආවාහම් ඒ
රථ නම්වූයේ කවරද, රථ හිස රථයදැයි කීසේක. එබසට මිලිඳු
මහ රජාණෝ කියන්නාහු: ස්වාමීනි රථ හිස රථය නම් නොවෙ
යිකීහ. රථ අකුර රථයදැයි කීසේක, නොවෙයි කීහ. රථ චක්‍රය
රථයදැයි කීසේක, රථචක්‍රයත් රථය නොවෙයිකීහ, රථපඤ්ජරය
රථයදැයි කීසේක, නොවෙයි කීහ. රථ දඬකය රථයදැයිකීසේක
මහරජාණෝ නොවෙයිකීහ, වියදඬ රථයදැයිකීසේක. නොවෙයි
කීහ. රථ රැහැණ රථයදැයි කීසේක, නොවෙයි කීහ. කැවිටිලිය
රථයදැයි කීසේක. කැවිටිලියත් රථය නොවෙයි කීහ. කිමෙක්ද
මහරජ රථ හිසරථ අකුර රථ චක්‍රය රථ පජරය රථ දඬකය රථ
වියය රථ රැහණ කැවිට රථයදැයිකීසේක ඒ හැම රථය නම් නො
වෙයි කීහ. එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්
මහරජ තෙපි පළමුවෙන් රථයක් නැගී ආම්හයි කීව, මා විචා
රත් විචාරත් රථයක නමක් පෙනෙන්නටමනැත, නොපකීවාවූ
බස්ම රථයෙක්ද, මහරජ රථය කොයිද, තෙපි මේ දඹදිව යො
නක දෙශාධිපතිවූ අගරජ තනතුරට පැමිණි මහරජාණන් උව;
තෙපි කවුරුන්ට භයින් කවර අබ සිඹියක්පිණිස මෙසේම බො
රුකියවුද; ඇසුව මැනව පන්සීයයක්පමණ යොන් ඇමැන්තන්
හා සමග මහසෙනඟත් අසූදහසක් භික්ෂූන්වහන්සේත් මේ මහ
රජ කියන්නාවූ බසයහපත්ද, පළමුරථයකින් ආම්යිකියාලා රථ
යක නමක් නොකියති. මහරජ තොපි රථයකින් අවුනම් මට ඒ
රථයකියව, නොකිම යහපත්දැයි කීසේක. නාගසෙනස්ථවිරයන්
වහන්සේ කී බස් අසා පිරිවරා හුන් යොන් ඇමතියන් හා හැම
දෙනම උන්වහන්සේගේබසට අපමණ සන්තොෂයටපැමිණ එක
පැහැර සාධුකාර දෙමින් මිලිඳු මහරජහුගේ මුහුණ බලා වාදීන
සිංහවූ දෙවයන් වහන්ස මෙවිට නුඹවහන්සේ කථාකරන්ට සම
ර්ථසේක් වීනම් නාගසෙන ස්ථවිරයන් වහන්සේ හා සමග කථා
කොට බැලුව මැනව, මෙතෙක්කල් මුළුල්ලෙහි කථාවට පණ්ඩිත
වරුන් බලා ඇවිදිනා සේක් මහමේ පතන ඇල්ගෙවියක්හුසේ
නොලැබ හිඳ දූන්වාතුද්ධිපික මහාමෙඝයක් එකාදිවයිතක වසින්
ට පටන්ගත්තාසේ කථාවට පටන්ගත් සැලැස්ම ඇසූසේ වේදැයි
කීහ, එබසට මිලිඳුමහරජාණෝ කියන්නාහු: ස්වාමීනි මමබොරු
කීවෙම් නොවෙමි; රථ හිසත් රථ අකුරත් රථ චක්‍රයත් රථ පජ
රයත් රථ දඬකයත් රථ වියත් රථ කැවිටත් ඇතුළුවූ මේ හැම
එක්වූ කල්හි රථ නම් වෙයි කීහ, එබසට නාගසෙන ස්ථවිරයන්
වහන්සේ කියනසේක්: යහපත මහරජ තොප කී බස පූර්වාපර
විරුඬයෙක්නැත්තේය,මෙවිටතොපකීයේ සබාමයඉඳුරාම තොපි
රථය අඳුනවයි කීසේක ඉක්බිති නාගසෙන ස්ථවිරයන්වහන්සේ

තමන් වහන්සේ අතින් විචාළාවූ නාගසෙන නාමයෙහි ප්‍රශ්නය තෝරා කියනසේක්: එම්බා මහරජ කෙශය රෝමය නඛය දන්තය යනාදීවූ දෙතිස් කුණප කොඨාසයෙන්හා රූපය වෙදනාය සංඥවය සංස්කාරය විඥනයයි යන මේ හැම උදෙසා නාගසෙන යයි යන බැවහාර සංඥ ප්‍රඥප්තිනාම මාත්‍රයෙක් පවත්නේය. පරමාර්ථවසයෙන් මෙතැන්හි පුද්ගලයෙක් නම් නොලබන්නේය, එසේහෙයින් මහරජ බුදුන්:සම්මුඛයෙහි මේ මතු කියන්නාවූ ගාථාව වජ්‍රා නම් භික්‍ෂුණිය විසින් අසනලදී—

"යථාහි අංගසම්භාරා හොති සද්දො රථො ඉති,
එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති"යි.

යන මේ ගාථාව නාගසෙන ස්ථවිරයන්වහන්සේ මිලිඳු මහරජහට කීසේක. එකල්හි මිලිඳු මහරජතෙම අපමණවූ සන්තොෂයට පැමිණ ස්වාමීනි නුඹවහන්සේ ඉතාම ආශ්චර්‍ය්‍යමත්වූ ඉතාම චිත්‍ර කථිකවූ ඉතාම අද්භූතවූ ප්‍රශ්නයක් තෝරම විසඳනලද්දේය. මෙකලටඉදින් තිලෝගුරුසම්‍යක්සම්බුධරාජයාණන්වහන්සේ ජීවමානව වැඩ සිටි සේක් විනම් මේ ප්‍රශ්නය විසඳූ බවට සාධුකාරදෙන සේක. එසේහෙයින් සාධු සාධු නාගසෙන ස්ථවිරයන් වහන්ස ප්‍රශ්නය විසඳූ බව ඉතාම යහපතැයිඅපමණවූ සන්තොෂයටපැමිණියහ. ඉක්බිති මිලිඳුමහරජතෙම නාගසෙනස්ථවිරයන් වහන්සේව කියනුයේ: ස්වාමීනි කීහැවිරිදිසේක්දැයි කීය. මහරජ මම උපසම්පදාවූ සත්හැවිරිද්දෙමියි කීසේක. එබසට මිලිඳු මහරජාණෝකියන්නාහු ස්වාමීනි නුඹවහන්සේට සවරනම් සතෙක්ද; අවුරුදුගණනට නුඹවහන්සේ සතක් වූසේක්ද, නුඹවහන්සේට අවුරුදු ගණන් සතෙක් වීදැයි කීහ එබසට නාගසෙන ස්ථවිරයන් වහන්සේ කියනසේක්: හිර සඳ ප්‍රදීප දර්පණාදියෙන් තොපගේ ඡායා පෙනෙන්නේය ඒ ඡායාව මිලිඳු රජද නොහොත් තොපි මිලිඳු රජදැයි කීහ. එබසට මිලිඳු මහරජාණෝ කියන්නාහු: ස්වාමීනි මම මිලිඳු රජමුත් ඡායාව රජනම්නොවෙයි, මානිසා ඡායාව පවතිනේයයි කීහ එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්: මහරජ ඒ ඡායාවෙහි උපමාව මෙන් මා උපසම්පදාවූ තැන් පටන් ඉක්මුණාවූ අවුරුදු ගණන නම් සතෙක් වෙයි, මම වර්ෂයන්ට සත්වැනි වූයෙම් නොවෙමි, මා නිසාම සත් හැවිරිද්දෙක් පැවැත්තේයයිකීසේක, එබසට මිලිඳුමහරජාණෝ "**කල්ලොසි භන්තෙ නාගසෙන**"යි කියාප්‍රශ්නය විශෙෂයෙන් දැනෙන ලෙස විසඳූ තියාව ඉතා යහපතැයි ප්‍රශංසා කළහ. ඉක්බිති මිලිඳු මහරජාණෝ කියන්නාහු: නාගසෙන ස්ථවිරයන් වහන්සනුඹවහන්සේමා හාකැටුවකථාකරනසේක්දැයිකීහ. එබසට

නාගසෙන ස්ථවිරයන් වහන්සේ මහරජ තෙපි ඉදින් පණ්ඩිත වාදයෙන් කථා කරවු නම් මමත් පණ්ඩිත වාදයෙන් කථා කෙරෙමි, තෙපි රාජ වාදයෙන් කථා කරවු නම් මම තොප හා සමග කථා නොකෙරෙමියි කීසේක, එබසට මිලිඳුමහරජාණෝ කියන්නාහු ස්වාමීනි පණ්ඩිතවරු කෙසේ කථා කෙරෙද්දැයි විචාළහ, මහරජ පණ්ඩිතවරු කථා කරනකල ගම්භීරවූ අර්ථ ඇති නොදැනෙනතද පදගෙන රැහැණින් වෙළන්නාක්මෙන් වෙහෙසදී විචාරති, එසේ විචාළ තැන් තෝරා කියා ගත නොහෙත් නම් උන්ට නිඥකොට තොප දැනගත නොහෙනකල මම් දනිමියි මා අතින්ම තොපි ඉගෙන ගනුවයි තද ගැට මුදන්නාක්මෙන් ප්‍රකාශකොට කියති. සමහරු ශාස්ත්‍ර ප්‍රශ්නාදිය විචාරන කල කථනයට අවිෂයවූ ගැඹුරු තැන් විචාරා ඔහු කිය නොහෙත්නම් නැවත නැවතත් කෘත්‍ය ගම්භීර අර්ථ ගම්භීරත්වයෙන් විචාරමින් නැතිගන්වා චිත්ත වික්ෂිප්ත කරවා බොහෝ වෙහෙස දෙමින් පසුබස්වා කථාකෙරෙති, ශාස්ත්‍රාගම දැනීම් වසයෙන් තමන්ගේ විශේෂම දක්වති. එකල්හි පණ්ඩිතවරු නම් සියල්ලටම නොකිපී ගජියෙනුත් නොහිඳ තමන් දන්නා දෙය කියා නොදන්නා දෙය විචාරා සංසන්දනය කොට ඇති ගුණ ප්‍රශංසාකොට නැති ගුණ නොකියති, එසේ හෙයින් මහරජ පණ්ඩිතවරු මෙසේ කථා කෙරෙතියි කීසේක. එසේ කල ස්වාමීනි රජහු කෙසේ කථා කෙරෙද්දැයි කීහ. එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්: මහරජ රජදරුවෝ කථාකරන කල යම් වස්තුවක් දැන විචාළ කල්හි ඒ වස්තුව ඇතිසැටියේ නොකියා නැසුණැයි කියාහෝ නොදනිමියි කියාහෝ වංචාවෙවයි සහසං වෙවයි කීයේ වීනම් ඔහටකිපී මෝහට දහස්ගෙඩි දෙවයි කියා මොහුගෙන් දහස් දඩගනුවයි කියා හෝ මෙයින් අන්‍යවූ නෙසුත් වධ යොදා ඔහට බොහෝ නිග්‍රහ පමුණුවන්නාහ මහරජ රජහු මෙසේ කථාකරන්නාහුයයි කීසේක, එබසට මිලිඳු මහරජ කියනුයේ: ස්වාමීනි මම එසේ වීනම් පණ්ඩිත වාදයෙන්ම කථා කෙරෙමි රාජ වාදයෙන් කථා නොකෙරෙමි තුඹ වහන්සේ මා රජයයි නොසිතා පණ්ඩිතයෙක්මයයි සිතාගෙන මා හා නැවිව සැකනැතිව කථාකළමැනව, නොහොත් සබ්‍රහ්මචාරිවූ භික්ෂුකෙනෙකුන් වහන්සේ හා සමග කථා කරන්නාක්මෙන්ද නොහොත් සාමණේරයක්හු හා සමග කථාකරන්නාක්මෙන්ද නොහොත් උපාසකයක්හු හා සමග කථා කරන්නාක්මෙන්ද නොහොත් ආරාමිකයක්හු හා සමග කථා කරන්නාක්මෙන්ද කිසි සැකයක් නැතිව කථා කළ මැනවැයි කීහ. එබසට නාගසෙන ස්ථවිරයන් වහන්සේ යහපතැයිගිවිස වැඩහුන්සේක. එකල්හි මිලිඳු මහරජාණෝ කියන්නාහු: ස්වාමීනි තුඹ වහන්සේ

අතින් මම ප්‍රශ්නයක් විචාරමි කිහ. එබසට යහපත මහරජ ප්‍රශ්නය විචාරවයි කීසේක, ස්වාමීනි මම විචාරාපීමිකිහ. මහරජ මම විසඳූපීමියි කීසේක විසඳුයේ කවර ප්‍රශ්නයෙක්දැයිකිහ, මහරජ තොපවිචාළේ කවරප්‍රශ්නයෙක්දැයි කීසේක එකල්හි මිලිඳු මහරජාණෝ සිතන්නාහු මූන්වහන්සේ මාහා සමග විශෙෂයෙන් කථා කිරීමට සමර්ථසේක, එසේහෙයින් මාගේ සිතඇති කාංශාවක් මූන්වහන්සේ ගෙන්ම දුරුකරවා ගනිමියි අද දවස් හිරු අස්තයට ගියේය එසේහෙයින් සෙට මාගේ මාලිගාවෙහිදී කථා කෙරෙමියි සිතා දෙව මන්ත්‍රියාට කියන්නාහු: එම්බා සගය අද දවස් කථා කිරීමට කල්මද සෙට රජගෙසිදී කථාකිරීම වන්නේය. ඒ සැලැස්ම නාගසෙන ස්ථවිරයන් වහන්සේට දක්වාලවයි කියා හුනස්නෙන් නැගී නාගසෙන ස්ථවිරයන් වහන්සේ ඇතුළුවූ හැම රහතුන් වහන්සේ වැඳ අවසරගෙන අස්වාහනයකට පැන නැගී නාගසෙන ස්ථවිරයන්වහන්සේගේ ගුණසිහිකෙරෙමින් නාගසෙනයයි යන නමම කියමින් ඉහත් සොම්නසින් නික්මුණේය. ඉක්බිති දෙව මන්ත්‍රියා ආයුෂ්මත්වූ නාගසෙන ස්ථවිරයන් වහන්සේ වැඳ කියනුයේ: ස්වාමිනි අපගේ දෙවයන් වහන්සේ සෙට දවස රජගෙසිදී කථාකරන්ට අභිප්‍රාය ඇතිසේක. එපවත් දැන වදාළ මැනවයි කියා අවසර ඉල්වාගෙන නික්මුණේය.

නැවත ඒ දෙවමන්ත්‍රියා දෙවන දවස් උදෑසන්හිම තෙමේද **අනන්තකාශ** නම් අමාත්‍යයාද මංකුර නම් අමාත්‍යයාද **සබ්බදින්න** නම් අමාත්‍යයාදැයි යන මෙකී අමාත්‍යවරු සතරදෙනම එක්ව රජ ගෙට ගොස් මිලිඳු මහරජාණන් දැක දන්වන්නාහු දෙවයන් වහන්ස නාගසෙන ස්ථවිරයන් වහන්සේ අද පෙරවරු භාගයෙහිම රජගෙසිදී වැළඳීමට වඩනා සේකැයි කිහ එබසට මහරජාණෝ කියන්නාහු: රජගෙසිදී වළඳන්ට වඩනා ලෙස ආරාධනා කරවයි නියොග කළහ එකල්හිම අමාත්‍යවරු කියන්නාහු: දෙවයන් වහන්ස කොපමණ භික්ෂූන්වහන්සේ නාගසෙන ස්ථවිරයන් වහන්සේ හා සමග රජගෙට වඩනාසේක්දැයි කිහ. එබසට මහරජාණෝ කියන්නාහු; නාගසෙන ස්ථවිරයන් වහන්සේ යම්පමණභික්ෂූන්වහන්සේ ගෙනවඩින්ට අභිප්‍රායඇතිසේක්ද එපමණ භික්ෂූන්වහන්සේ හා සමග වඩින්ට කියවයි කිහ. එබස් අසා සබ්බදින්නඅමාත්‍යයා කියනුයේ: දෙවයන්වහන්ස නාගසෙන ස්ථවිරයන් වහන්සේ දසනමක්හා සමග වඩනාසේක්දැයි විචාළේය. එබසට මහරජාණෝ කියන්නාහු: යම් පමණ භික්ෂූන් වහන්සේ කැමති සේක්ද එපමණ කැඳවාගෙන වඩින්ට

කියවයි කීහ. එබසට දෙවෙනි තුන්වෙනි වත් සබ්බදින්න නම් අමාත්‍යයා කියනුයේ: දෙවයන් වහන්ස දස නමක් හා සමග වඩනා සේක්දැයි විචාළේය. එබසට මහරජාණෝ කියන්නාහු: සියලුම දානොපකරණයන් සපයා හැමදෙනා වහන්සේට දන් පිළියෙළකරනලද්දේය. එසේහෙයින් උන්වහන්සේ කැමති පමණක් සංඝයාවහන්සේ කැඳවාගෙන ' වඩනාසේක්වයි කියම්, එම්බා සගයෙනි සබ්බදින්නයා මා හා කැටිව අන්පරිද්දෙකින් කථාකරන්නේය, කිමෙක්ද මම ඒහැම භික්ෂූන්වහන්සේට දන් පමණක් දීගත නොහෙම්දැයි උදහස්වූහ. එකල්හි සබ්බදින්නයා කිසිවකුත් කියනොහී හයින් නැතිගෙන වැඳ වැඳ සිටියේය,ඉක්බිති දෙවමන්ත්‍රි අමාත්‍යයාද අනන්තකාය අමාත්‍යයාද මංකුර අමාත්‍යයාදැයි යන තුන්දෙන මහරජහු අතින් අවසරගෙන නාගසෙන ස්ථවිරයන්වහන්සේවසන සංඛෙය්‍ය පිරිවනට ගොස් ආරාධනාකොට ස්වාමීනි නුඹවහන්සේ කැමැතිපමණක් භික්ෂූන් වහන්සේ කැඳවාගෙන රජගෙට වැඩිය මැනැවයි කීහ. ඒ අමාත්‍යවරුන් කළාවූ ආරාධනා ඉවසා ගැට වටු ගන්වා ගෙන අසූ දහසක් භික්ෂූන් වහන්සේ හා සමග කයින් සිවුරු හා අතින් පාත්‍රය ගෙන සාගල නුවරට වැද අනන්තකාය නම් අමාත්‍යයා හා සමග ප්‍රශ්න විසර්ජනාදීවූ කථාකොරෙමින් අභිධර්මයෙන් බණ කියමින් ඔහු පහදවමින් ගොස් මිලිඳු මහරජාණන්ගේ මාලිගාවටම වන්හ. එකල මිලිඳු මහරජාණෝ අසූදහසක් රහතුන්වහන්සේට අසුන් පනවා එහි වඩා හිඳුවා නොයෙක් ඛාද්‍ය භොජ්‍ය සූප ව්‍යඤ්ජනාදීවූ රස මසවුලෙන් යුක්ත ආහාරය පිළියෙළ කරවා සිය අතින් වළඳවා ඉක්බිති දැවටු දිය දී පස් පලව තින් යුතු බෙහෙත් පිළිගන්වා ඒ අසූදහසක්රහතුන්වහන්සේට අසූදහසක් පිළිසඟල පිළිගන්වා ආයුෂ්මත්වූ නාගසෙන ස්ථවිරයන් වහන්සේට තුන්සිවුරු පිළිගන්වා ස්වාමීනි නුඹවහන්සේ හා දසනමක් ගෙන මෙතෙන වැඩහුන මැනව, සෙසු ඈම්දෙනා වහන්සේ නැවතත් විහාරයට වඩනාසේක්වයි කීහ.

නාගසෙන ස්ථවිරයන්වහන්සේද යහපතැයි ගිවිස දසනමක් ලඟ රඳවාගෙන සෙසු ඈම්දෙනාවහන්සේ විහාරයටවඩින්ට අවසර දුන්සේක. එකල්හි මිලිඳුමහරජාණෝ නාගසෙන ස්ථවිරයන් වහන්සේ වැඳ එකත්පස්ව හිඳ නාගසෙන ස්ථවිරයන්වහන්සේ අතින් විචාරන්නාහු: ස්වාමීනි මේ ලොකයෙහි සත්වයන් කරන්නාවූ කුසලාකුසල දෙකින් කුසල්බොහෝවේද,අකුසල් බොහෝවේදැයි විචාළහ. එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්:මහරජ කුසලය බොහෝ වන්නේය,අකුසලය මඳවන්නේ

යයි කියේය. එපවත් අසා මිලිඳු මහරජාණෝ කියන්නාහු: ස්වාමීනි ක්‍රෑරතර වේදනා දෙන්නාවූ අකුසලය මඳවන්ටත් සියුම්ව සුවපහස් දෙන්නාවූ මෘදුවූ කුසලය බොහෝවන්ටත් කාරණා කිම්දැයි විචාළහ. එබසට නාගසෙන ස්ථවිරයන්වහන් සේ කියනසේක්: මහරජ අකුසලය කරන්නාවුන් විසින් අකු සල් කරන්ට පූර්වයෙහිත් අකුසල් කොරෙමින්සිටත් අකුසල් කළ ඉක්බිතිත් මා කෙළේ අකුසලය මේ කළාවූ අකුසලයෙන් විඳින් නේ දුක් මුත් සැපයෙක් නම් නැතැයි සිතසිතා විපිළිසරව සිත් තැලි තැලී මාවිසින් කෙ ළ් ස්වර්ගමොක්‍ෂයට බාධකවූ අකුසල යයි සිත තැලෙන්නේය. තවද අකුසලය කරන කල පින් කො ටලා ස්වර්ගමොක්‍ෂ සම්පත් විඳිම්යි ප්‍රාර්ථනාකරන්නාසේ පව් කොටලා මේකළාවූ අකුසලයෙන් අකුසල භූමිවලදී විඳිනා දුක් වෙන වෙන ලබම්හයි කියා ප්‍රාර්ථනාත් නොකරන්නේය. එසේ හෙයින් තැලීගිය බීජුවටෙක අංකුරය වර්ධනය නොවන්නාක් මෙන් පාපය වර්ධනය නොවන්නේය. මහරජ පින් කරන කල පින් කරන්ට පූර්වයෙහිද පින් කරන කලද පින්කොට ඉක්බිත් තෙහිද මහත්වූ සොම්නසින් යෙදී පින්කම් නම් සියලු සත්ව යන්ම සැප විඳුවන දෙයැකෑ, එසේ හෙයින් පින්කම් කිරීමම යහපත් දෙයෙකෑ, සාධු සාධු මෙ කළාවූ කුශලයෙන් මම සදිව්‍ය ලොකයෙහි අපමණවූ දිව්‍ය සම්පත් හා මිනිස්ලොව චක්‍රවර්ති රාජ්‍ය සම්පත් ආදීවූ මනුෂ්‍ය සම්පත් හා බ්‍රහ්ම ලොකවල ප්‍රීති සැප සංඛ්‍යාතවූ බ්‍රහ්ම සම්පත් විඳ නිවන් දකිම්වයි ප්‍රාර්ථනා කො රෙමින් පින්කම් කොට, ඒ කළාවූ පින්කම සිතූ සිතූ විටම මා විසින් කළේ යහපත්වූ පින්කමකැයි සතුටු සතුටුව ප්‍රීති සැප විඳ දුටු දුටුවන්ට මා කළාවූ පින්කම තුඹ ස්ය අතින්ම කළාසේ පින් අනුමෝදන් වන්නැයි පින් දිදී සමාධි වන්නේය. එසේ හෙයින් මහරජ යහපත් බීජ වටක් රෝපණය කොට දිය වත් කළ කල වර්ධනව දළු ලලා පත්‍ර පුෂ්ප ඵලයෙන් සැදී සියල්ලවු න්ට බොහෝ මධුර ඵල දේද, එපරිද්දෙන්ම කළාවූ කුශල කර්මය ස්වල්පවීනමුත් බොහෝ වෙමින් විපාකදෙන්නේය, එහෙ සින් අකුශලය වර්ධනය නොවන්නේය, කුශලය වර්ධනයවන්නේ යයි කීසේක. එකල්හි මිලිඳු මහරජාණෝ මහත්වූ සන්තොෂ යට පැමිණ සාධු සාධු නාගසෙන ස්ථවිරයන් වහන්ස ප්‍රශ්නය විසඳූ නියාව ඉතාම යහපතැයි සමාධි වූහ තවද මිලිඳු මහරජා ණෝ කියන්නාහු: ස්වාමීනි යම් සත්වයෙක් අකුසල් කළ කාලි දරුණුවූ දුක්විඳිනා නියාවදැන දැනම අකුසල්කොළේය යම් සත්ව යෙක් අකුශලයෙහි විපාක නොදැනම කොළේය, මේ දෙදෙනා ගෙන් අකුසලඵල කවරක්හට බොහෝවේදැයි කීය. එබසටනාග සෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්: මහරජ යමෙක් අකුසල

යෙහි ඵල නොදැන කෙළේ වීනම් ඔහට අකුසල් බොහෝ වන්නේය, යමෙක් අකුසල ඵල දැන දැනම කෙළේ වීනම් ඔහට අකුසල් මඳ වන්නේයයි කීසේක. එබසට මිලිඳුමහරජාණෝ කියන්නාහු: ස්වාමීනි අකුසල ඵල නොදන්නාහට පව් බොහෝ වන්වත් අකුශල ඵල දැන දැන කරන්නාහට පව් මඳ වන්වත් කාරණා කිම්ද, අපගේ රාජ පුත්‍රයෙක් හෝ අමාත්‍යයෙක් හෝ යම් කවර තරම් අභ්‍යන්තරයෙක්වීනමුත් දැනවත් නොදැනවත්, යම් කිසි වැරැද්දක් කෙළේ වීනම් ඔහට කළ වැරදිවූ නියාවට බොහෝ නිග්‍රහ කරම්හයි කීහ. එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්: මහරජ තෙපි කුමක්සිතවුද යවටක් රත්කොට ඒ යවට දන්නා එකකුත් නොදන්නා බිලිඳකුත් සැඳවා ඒ දෙදෙනාට තෙල රත්වූ යවට ගනුවයි කී කල්හි කවුරුන් ඒ යවට ඇල්වූ කල බලවත් කොට අත දැයි කීසේක. එබසට මිලිඳු මහරජාණෝ කියන්නාහු: ස්වාමීනි ඒ රත්වූ යවට අත දවන බව දන්නා පුරුෂ තෙම අල්ලන්ට උවමැනැවැයි සිතා තම් අත නොදනසේ කිසියම් බෙහෙදක් අත ගාගනා හෝ මන්ත්‍රයක් ජපකොට හෝ යන්ත්‍රයක් ගෙන හෝ තන්ත්‍රයක් සිහිකොට හෝ භය ඇතිව ඇතිව අතින් අල්වන්නේය, නොහොත් තණ පරඬලා ආදීවූ කිසිවක් අල්වා ගෙන හෝ නොහොත් ලැහැලි රෙදි අතින් ගෙන හෝ අත දවා නොගනිම්යි සිතා අතට පරිහරණ කොට අල්වන්නේය. නොහොත් යුහුව ඇරගෙන අත මඳක් දව දවා ඉවත දමන්නේය, නොහොත් ඒ රත්වූ යවට ගෙන කළමනා මෙහෙයක් ඇත්තම් අඬුවකින් අල්වාගෙන එයින් වන්නාවූ කාරිය සිඬකොට ගන්නේය. ඒ රත්වූ යවට අත දවන බව නොදන්නා මුග්ධ තෙම යුහුව ඒ රත්වූ යවට තද කොටම අල්වා ගන්නේය, එකල්හි ඔහුගේ අත බලවත්ව දදු බොහෝ වෙහෙස දෙන්නේයයි කීහ. එසේහෙයින් මහරජ යමෙක් දැන දැන අකුසලය කෙරේනමුත් නොයෙක්කාරණයන් සිතා අකුසල් කළ කල එයින් විඳිනාවූ සියලු අකුසල කර්මයන්ගේ තද බව සිහිකොට තමා නුවණැති හෙයින් මේ අකුසලය කෙරෙම්දෝහොයි නොකෙරෙම් දෝහොයි සිතසිතා භය ඇතිව ඉදින් අකුසලය කරන්නෙත් මේ අකුසලය කළ කල කිසි සත්පුරුෂ කෙනෙක් දුටුවූ නම් නිඝ කෙරේනි සිතාද, නොහොත් මේ අකුසලය කොට දැන යාග මන්ත්‍ර ජපනාදීන් නමුත් සංසිඳුවන්ට ප්‍රයොගයක් කොට ගතනොහෙමීයි සිතාද, නොහොත් අතිතක්හු ඇඟ ගස්වා කළ ආයුධ ප්‍රයොග ආදීන් තමාගේ වචන පෙරළී මෙන් හෝ නොහොත් වෙන කිසියම් උපායෙකින් අනුන් ලවා හෝ කරවන්නේය; මෙසේ නුවණින් දැන කිසි කාරියක් පිණිස අකුසලය කරත් භය ඇතිව ඇතිව

කරන හෙයින් ඔහට පව් බොහෝ නොවන්නේය. නොදන්නා අඥානයා විසින් පව් කරන කල ඒ කළාවූ පාපයෙන්ම මතු විඳිනා වෙහෙසත් නොදන්නේය. මෙලොවදීම තමහට සත්පුරුෂයන් කියන කරන නිඤත් නොදන්නේය. එසේ හෙයින් තමා කරන අකුසලය සියල්ලවුන්ටම නොසඟවා ලව නැතිව ක්‍රෑරතරව සිට නිෂ්කරුණාවෙන් කරන හෙයින් ඒ අකුසලය විපාක දෙන කලත් පැකිලීමක් නැතිව තදව විපාක දෙන හෙයින් නොදැන කළ අකුසලය බොහෝ වන්නේයයි කීසේක. එකල්හි මිලිඳු මහරජාණෝ ස්වාමීනි නුඹවහන්සේ විසින් මේ ප්‍රශ්නය විසඳූ වදළ නියාව ඉතාම යහපතැයි කියා සාධුකාර දුන්හ

නැවත මිලිඳු මහරජාණෝ නාගසෙන ස්ථවිරයන්වහන්සේ අභිත් ප්‍රශ්නයක් විචාරන්නාහු: ස්වාමීනි දෙවදත්ත ස්ථවිරයන්වහන්සේ කවුරුන් වහන්සේ විසින් මහණ කරවනලදදැයි කීහ. එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්: මහරජ භද්දිය ස්ථවිරයන්වහන්සේද අනුරුද්ධ ස්ථවිරයන්වහන්සේද ආනන්ද ස්ථවිරයන්වහන්සේද බක්කුල ස්ථවිරයන්වහන්සේද කිම්බිල ස්ථවිරයන් වහන්සේද දෙවදත්ත ස්ථවිරයන් වහන්සේද උපාලි ස්ථවිරයන්වහන්සේ දැයි යනමේ සත්දෙනා වහන්සේම ශාක්‍ය කුලයෙන් බොහෝ ජනයා නික්ම බුද්ධශාසනයෙහි මහණ වන කල්හි මහණවූ සේක, මේ සත්දෙනා වහන්සේත් මහණ කරවූ සේක් බුදුහුම වේද්ද මහරජයි කීසේක. එබසට මිලිඳු මහරජාණෝ කියන්නාහු: ස්වාමීනි මහණවව උපසම්පදාවූ දෙවදත්තා ස්ථවිරයන්වහන්සේ විසින් සංඝභෙද කර්ම කරන ලද්දෙදැයි කීහ. එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්: එසේය මහරජ දෙවදත්ත ස්ථවිරයෝ මහණව උපසම්පදාව සංඝභෙද කර්මය කළෝ වේදැයි කීසේක. ස්වාමීනි දෙවදත්ත ස්ථවිරයන්වහන්සේ මහණ නොකර වුවොත් උපසම්පදාත් නොලබන්නෝය, එසේ හෙයින් සංඝභෙද කර්මයත් සිද්ධ නොවන්නේයයි කීහ. එසේය මහරජ ගෘහස්ථයන්ටත් භික්ෂුණීන්ටත් ශික්ෂමාණයන්ටත් සාමණේරයන්ටත් සාමණේරීන්ටත් සංඝභෙද කර්මය සිද්ධනොවෙයි, භික්ෂු භාවයේ සිට සමාන සංවාසවූ භික්ෂූන් සමාන සීමාවෙහිදී භින්න කොළේවිතම් ඔහට සංඝභෙද කර්මය සිද්ධවන්නේයයි කීසේක. එබසට මිලිඳු මහරජාණෝ කියන්නාහු: ස්වාමීනි සංඝභෙද කර්මය කළාවූ පුද්ගලයෙක් කවර අකුශලඵලයක්විඳුනේදැයි කීහ, එබසට නාගසෙනස්ථවිරයන්වහන්සේ කියනසේක්: මහරජ මහා කල්පයක් මුළුල්ලෙහි නරකයෙහි පැසී දුක් විඳිනේයයි කීසේක, එබසට කිමෙක්ද ස්වාමීනි දෙවදත්ත ස්ථවිරයන්වහන්සේ සංඝභෙදකර්මකොට නරකයෙහි උපදනා බව සර්වඥයන්වහන්සේ නොදන්නා /සේක්දැයි කීහ.

එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්: මහරජ දෙවදත්ත ස්ථවිරයෝ පැවිදිව් උපසම්පදාව සංඝභෙද කර්මය කොට නරකයෙහි උපදිති අපගේ බුදුහු දැන වදාරන සේක්යයි කිහ. එබසට මිලිඳු මහරජාණෝ කියන්නාහු: ඉදින් බුදුහු එප වත් දැන දැනම මහණ කළසේක්වීනම් සකල සත්ත්වයන් කෙරෙහි පතළාවූ කරුණාව දෙවදත්ත ස්ථවිරයන් කෙරෙහි නැතැයි සිතමි, එසේ නොවේ නම් බුදුහු සකල සත්ත්වයන් කෙරෙහි පත ළාවූ කරුණා ඇතිසේක්යයි ලොකවාසීන් කියන බස මිථ්‍යා වච නයක. ඉදින් බුදුහු දෙවදත්ත ස්ථවිරයන්වහන්සේ සංඝ භෙද කර්මයකොට නිරයෙහි උපදනා බව නොදැන මහණ කළසේක් වීනම් අනාවරණවූ සර්වඥතාඥාන නැතිසේක්යයි සිතමි, එසේ හෙයින් මේ කාරණයෙන් කරුණා ඇතිසේක් වීනම් අනාවර ණවූ සර්වඥතාඥානය නැතිසේක, සර්වඥතාඥානය ඇතිසේක් වීනම් කරුණා නැතිසේක, එසේ හෙයින් මේ උභතොකොටික ප්‍රශ්නය විසඳා මේ උභතොකොටික ප්‍රශ්න නැමැති මහ අවුල විදහා එනදවස තමන්වහන්සේ හා සාදෘශ්‍යවූ නුවණැති උත්තම කෙනකුන් වහන්සේ ලැබගන්ට දුර්ලභ හෙයින් මෙතැන්හිම තමන් වහන්සේගේ ප්‍රඥාබලය දක්වා වදාළ මැනවැයි කිහ එබ සට නාගසෙන ස්ථවිරයන් වහන්සේ කියනසේක්: මහරජ බුදුහු කරුණාත් ඇතිසේක, සර්වඥතාඥානයත් ඇතිසේක, එසේ හෙ යින් ලොකා ලොක දිවාකරවූ බුදුන් විෂයෙහි එසේ නොසිත වයි කීසේක. එබසට මිලිඳු මහරජාණෝ කියන්නාහු: ස්වාමීනි බුදුහු අනාවරණවූ සර්වඥතාඥානයෙන් දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ මතු විඳිනා දුක් දුටුසේක් වීනම් කරුණා නැතිව මහණ කරවූසේක, කරුණාවෙන් මහණ කරවූසේක් වීනම් මතු විඳිනා දුක් නුදුටුසේක්යයි කිහ, එබසට නාගසෙන ස්ථවිර යන්වහන්සේ කියනසේක්: එම්බා මහරජ අපගේ බුදුරජාණන් වහන්සේ දෙවදත්ත ස්ථවිරයන් නරකයෙන් නරකයට ගොස් ගොඩ නොදැක කප්කෙළ ලක්ෂගණනක් මුළුල්ලෙහි දුක්විඳිනා බව අනාවරණවූ සර්වඥතාඥානයෙන් දැක මොහු කෙළවරක් නොදැකම දුක් විඳුනෝයයි සිතා ඔහු කෙරෙහි කරුණාවෙන් මහත් අකුශල කර්මය ක්ෂුද්‍රකොට මඳක් දුක් විඳුවා වහා නිවන් දක්වනු පිණිස තමන් වහන්සේගේ ශාසනයෙහි මහණ කරවූ සේක, එසේ ශාසනයෙහි මහණ නොකරවූසේක් වීනම් දෙව දත්ත ස්ථවිරයෝ බොහෝවූ කල්ප කාලයක් මුළුල්ලෙහි නිර යෙහි පැසී ගොඩ නොදක්නාහුය, එසේ හෙයින් කෙළවරක්

නැත්තාවූ මහත් අකුශලකර්මය අනාවරණවූ සර්වඥතාඥානයෙන් දැක සසර ලුහුඬු කොට අකුසලය ස්වල්ප කොළේ ඔහු කෙරේ කරුණායෙනැයි කීසේක. එබසට මිලිඳු මහරජාණෝ කියත් නාහු: ස්වාමීනි එසේ වීනම් බුදුහු ගෙඩිදී ප්‍රාණය පමණක් රඳන විවර වබකොට තෙල් ගල්වා සැපදෙන සේක්ද. යොදුන් ගණනක් උසඇති මහත් පර්වතය මුදුනෙන් හෙළා නැවත හියනොදී අල්වාගෙන ඒ පර්වතය මුදුනෙහිම පිහිටුවන සේක්ද, නොහොත් භයානකවූ ගැඹුරු තිරාවල ආදී ප්‍රපාත ස්ථානයට සත්වයන් දමා නැවතත් අතදී ගොඩ නඟනසේක්ද, නොහොත් සත්වයන් මරා නැවත ජීවිතය එම ශරීරයෙහි පිහිටුවා ජනිත කරන සේක්ද, කිමෙක්ද ස්වාමීනි බුදුහු පළමු කොට සත්වයන්ට දුක්දී පසුව සැප දෙනසේක්දැයි කීහ එබසට නාගසෙන ස්ථවිරයන් වහන්සේ කියනසේක්:මහරජ අපබුදුහු වධ කරනත් සත්වයන්ට හිත වශයෙන්ම වධ කරනසේක. ප්‍රපාත ස්ථානයෙන් දමතත් මත වන වැඩක් සලකාම දමනසේක, මරනත් හිත සැපයක් පිණිසම මරනසේක, හේ එසේමැයි, මහරජ මවුපිය දෙදෙන දරුවන්ට තලතත් මරනත් වධ කරනත් හිත පිණිසමය, එසේ හෙයින් බුදුරජාණන්වහන්සේත් සත්වයනට වෙහෙස දෙන සේක් වීනමුත් යම් යම් කාරණයකින් ගුණ නුවණ ශ්‍රී සම්පත් ආදිය වර්ධන වේනම් ඒ ඒ කාරණයෙන්ම සියලු වැඩම සිතා වදාරනසේක්මය එසේහෙයින් මහරජාණෙනි දෙවදත්ත ස්ථවිරයෝ මහණ නොවී ගිහි භාවයෙහි සිටියෝ වීනම් ලවනැතිව පව් කොට නරකාදියෙහි ඉපද දුක් විඳ කාලක් ගොඩ දැකගත නොහැක්කාවූ පාප සම්භාරයන් රැස්කොට කප්කොළ ලක්ෂ ගණන් මුළුල්ලෙහි නරකයෙන් නරකයට විනිපාතයෙන් විනිපාතයට අඳුරෙන් අඳුරට ගොස් බොහෝ දුක්විඳිනා බව සර්වඥතාඥානයෙන් දැක ඒ අනල්පවූ පාපය ස්වල්ප කරවනු පිණිස කාරුණ්‍යවෙන් මහණ කරවූහයි කීසේක, එකල්හි මහරජ කියනුයේ: ස්වාමීනි ඊට උපමාවක් කිව මැනවැයි කීය. එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියන්සේක්: එම්බා මහරජ ධනයෙන්ද ඓශ්වර්‍ය්‍යයෙන්ද බලයෙන්ද මහත්වූ රාජාභ්‍යන්තර,එක් පුරුෂයෙක් තමාගේ නෑ කෙනෙකුන්ට හෝ මිත්‍ර කෙනෙකුන්ට හෝ රජක්හුගෙන් පමුණුවන දණ්ඩනයක් දැක තමා රජගෙට වල්ලභ හෙයින් සැකනැතිව තමාගේ සමර්ථතාවෙන් ඒ මහත්වූ දණ්ඩනය මඳකින්සංසිඳුවාඒඥාතිමිත්‍රආදීන්භාගැලවීදඑපරිද්දෙන්මහරජාණෙනි මාගේබුදුහු කප්කොළලක්ෂයක් මුළුල්ලෙහි දෙවදත්ත ස්ථවිරයන් විඳිනා දුක්ඛසම්භාරය අනාවරණඥ සර්වඥතාඥානයෙන් දැක ඔහුකෙරේ කාරුණ්‍යාවෙන් මහණකොට සීල සමාධි ප්‍රඥා විමුක්ති බලයෙන් ලඝුඵලබව කීසේක, එබසට මහරජාණෝ කියන් නාහු: ස්වාමීනි නැවතත් උපමාවක් කිව මැනවැයි කීහ. එබසට නාගසෙන ස්ථවිරයන්වහන්සේ කියනසේක්:මහරජවෙදකාමෙන්

දක්‍ෂවූ නුවණැති කාරුණිකපුරුෂයෙක් වාතපිත්ත ශ්ලේෂ්මයන්
උස්සන්නා වීමෙන්ද විෂම ඍතු පෙරළීමෙන්ද අනිකුත් කිසියම්
උපක්‍රම විපරීතයකින් ජනිතව කකියා සිහිල්ව ඔඩු දුවූ මහත්
පිළිකයෙකින් දුක් විඳිනා පුරුෂයෙකු දැක ඔහු කෙරෙහි කරු
ණාවෙන් ලේ සාරය පෙරළී දිය කුණු මස් වැදලි වැගිර දුර්ගන්ධ
යෙන් දුවූ දුවූවන් පිළිකුල් කරන ඒ මහත් පිළිකය දැක එයින්
මතු ඔහු විඳිනා මරණ සමාන වේදනාව නුවණින්ම සලකමින්
මේ වණයට මම බෙහෙත්කොට පාසු නොකළෙම් නම් අනිකෙක්
හට කැලම නොපිළිවනැයි සිතා ඔහු කෙරේ කරුණාවෙන් තමා
ගතමනා කුලී නොගිවිස ඔහුගෙන් බෙහෙත් මිලයකුත් නොගෙ
න තමහට මතුවන උපකාරයකුත්නොසලකා බොහෝබෙහෙත්
රැස්කොට තමාගේ සමර්ථතාවෙන්ම වණමුණ සුඛකොටගන්නා
පිණිස කුණු මස් වැදලි කැපෙන තද කාරම්වූ බෙහෙදක්ඇලවා
එයින් දුර්ගන්ධ කුණප දුර්මාංශ කැපී වණ මූණත සුඛව මොලොක්
වූ කල්හි තියුණු සත් කටුවකින් කුණු මස් දුර්මස් හිඳ හැර යද
ඩක් රත්කොට ඔඩු දුවූතැන් පලා පුළුස්සා ඊටසුදුසු කාරම් බෙ
හෙත් යදඩින් වණ ඔඩුවෙහි ඔබා ගති සිඳුවා මස් වැඩෙන පි
ණිස බෙහෙත් බඳිමින් තෙල් බෙහෙත්ලමින් මෙසේ නොයෙක්
ප්‍රයොගකොට ඒසා මහත් පිළිකාවණය සුවකොට ඔවුන් නිරෝ
ගී කොට දුකින්මුදා සැපදුන්නේද, එසේහෙයින් මහරජ මෙසේ
තදබෙහෙත් දී කපා පුළුස්සා බැඳවෙලා ඕහට තද වෙහෙසදුන්
කාරුණිකවූ ප්‍රඥාවන්ත පුරුෂ තෙම ඔහු විඳුනා දුකෙහි අකුශල
ඵල විඳුනේදැයි කියේක, එබසට මිලිඳුමහරජාණෝ කියන්නාහු
ස්වාමිනි එතම් කවර බසෙක්ද. ඕහට මෛත්‍රීයෙන් වැඩ පිණිස
බෙහෙත්කොට පාසු කළාවූ කුශලයෙන් ස්වර්ග මොක්‍ෂ සම්පත්
විඳිනාමුත් ඔහු විඳගත් ව්‍යසනයෙක් නැත, තමා පෙරජාතියෙහි
කොට ගත් අකුශලය ඵල දුන් විනා එයින් මෝහට කවර අකු
ශලයෙක් දැයි කිහ. මහරජ එසේවිනම් අපගේ බුදුරජාණන්ව
හන්සේත් අනාවරණවූ බුඩ ඥානයෙන් දෙවදත්ත ස්ථවිරයන්
තමන් තමන්ම කොටගත් අකුශල විපාකයෙන්ම මතු බොහෝ
කාලයක් විඳුනා දුක් දැක ඔහු කෙරෙහි කාරුණාවෙන් සසර දු
කින් ගලවා නිවන් සම්පත්තිය සාධාදෙනු පිණිස ශාසනයෙහි ම
හණ කරවූසේක, එසේ හෙයින් අප බුදුහු අනාවරණවූ බුඩ ඥාන
යක් ඇතිසේක, කාරුණාවෙනුත් යුක්ත සේකැයි කීසේක, මිලිඳු
මහරජාණෝ එබසට අප්‍රමාණවූ සොම්නසට පැමිණ ස්වාමීනි තා
වතත් උපමාවක් වදාළ මැනවැයිකිහ. එබසට නාගසෙන ස්ථවිර
යන්වහන්සේ කියනසේක්: මහරජ ආත්මාර්ථ පරාර්ථයෙහිඇලුම්
නොකරන අඥාන අලස වාසී එකෙක්මග යනුයේ තමාගේ අලස

වාසි කාමින් උල් සැත්තක පිට පය ඔබා උලක් ඇනුණු කල්හි අලස කාමින්ම සෙමෙන් ගලවා ගතනොහී පය අඹරා උල පයට කඩාගෙන එයින් මරණ සමානවූ තද දුක් විඳිමින් එක් තැනක වැදහොත්තේය, එකල්හි සියලු සත්වයන් කෙරෙහි කාරුණා ඇති නුවණැති සත්පුරුෂයෙක්ද ඔහු දැක එයින් මතු ඔහු විඳිනා දුකුත් නුවණින් දැක මොහු මේ දුකින් මුදලන්ට උවමැනවැයි සිතා තියුණුවූ සත් කටුවක් ගෙන උල ඇමුණුණු මුණත වටින් මස් කපා හැර උල් කෑබැල්ල අඬුවකින් ඩහවා සොළවා ලේ පෙර පෙරා ඇද දමමින් ඔහට බොහෝ වෙහෙසදී වණ මුණත ඇතුළ කුණු කසල පෙරත ලේ සැවරආදිය කඩ වැටියක් ඇතුළට පොවා පිස හැර සුඬකොට බෙහෙත් දිය කකාරා වත් කොට වණය බැඳ තිසි බෙහෙත්ලමින් සුවකොට ඔහු නිරොගී කෙළේද; මහරජ ඒ කාරුණික පුරුෂයා විසින් ඔහු විඳනා දුක් දැක උල ඇද දමා බෙහෙත් බැඳ පාසු කෙළෙන් විනා ඒ තෙමේ මරණ සමාන දුක් බොහෝකලක් විඳිනේය, මරණයටහෝ පැමිණෙන නේය. එපරිද්දෙන්ම දෙවදත්ත ස්ථවිරයන්විසින් තමන්ගේ නුවණ මදකමිනුත් අලසවාසි කමිනුත් බොහෝ කාලයක් පුරුදු කොට ආ පාපචේතනාවෙන් විඳිනාවූ අකුශල ඵල දුක්ඛ සම්භාරය අනාවරණඥානවූ බුඬඥානයෙන් දැක කාරුණාවෙන් මහණ කරවා අකුශලයෙන් විඳිනා දුකට ප්‍රතික්‍රියා කොට සසර විඳිනා දුකින් ගොඩලූසේක, එසේහෙයින් අප බුදුහු අනාවරණවූ බුඬඥානයත් ඇතිසේක, සකලසත්වයන් කෙරෙහි පැවැත්තාවූ කාරුණාවත් ඇතිසේකැයි කීසේක.

තවද මිලිඳු මහරජාණෝ කියන්නාහු: ස්වාමීනි නැවතත් උපමාවක්වදළ මැනවැයිකීහ. මහරජ අඥනඑකෙක් මංපැහැර ගම්පැහැර අනුන් සන්තක වස්තු උදුරා සොරකම්කොට එයින් රාබ් පරදාරක්‍රියාවෙහි නියුක්තව ඊට සුදුසු බොරුත්කියා අනුන්නසා ප්‍රාණඝාතකොටමෙසේමනොයෙක් නොකටයුතුකොට ඇවිදිනා දුර්ජනයකු දැක ගම්රැකවල්හු අල්වාගෙනඅවුත් රජහටදක්වා මේ තෙම මෙසේ නොයෙක්නොපනත්කම් කරන සොරෙකැයිකීහ මහරජාණෝ එපවත්අසා කියන්නාහු: සගයෙනි මොහුසොරකම් ආදිවූ බොහෝ නොපනත් කරන කල ඊට රිසිපලවා පිටිතොලී හයා බැඳ කටුසැමැටිආදියෙන සියදහස්ගණන් පිට පලාගෙඩිදී ඉස පස් කොඩයක් කොට බැඳ කෑලමල් කනේරුමල් වතුක්මල් රත්මල් වදමල් මල්වඩම් සියලඟබැඳවදබෙර ගස්වාගෙනමහවේ කොවේමැදින්වධකොටගෙන නුවරින්පිටතටගෙනගොස් ආඝාත භූමියෙහි හිඳුවා මොහුගේ හිස් සිඳුවයිකීහ. මෙසේ රජුගෙන්

නියොගලත් රාජපුරුෂයෝ ඔහු ඉදිරිකොට රජගෙන් පිටත් කෙරෙමින් දම දමා ගෙනගොස් රජහු කී සැටියේම නුවරින් පිටතට ගෙනගොස් ආඝාත භූමියෙහි හිඳුවා හිස සිඳින්ට පටන්ගත්හ. එකල්හි රාජවල්ලභවූ කාරුණික එක් පුරුෂයෙක් මොහු දැක වධයෙහි නියුක්තව සිටියන්ට කියනුයේ: පින්වත්නි මොහුගේ හිස සිඳීමෙන් තොප ඇමට ප්‍රයොජන කිම්ද, එසේහෙයින් මොහුගේ අතක් හෝ ඇඟිල්ලක් හෝ කන් නාස හෝ කපා ජීවිතය නොනසා පින්පිණිස මොහු ඇරපියව, මම මහ රජාණන්වහන්සේ සමීපයෙහිදී මීට කාරණයන් සකාරණ කොට කියා තොපඇම නිවරෙදි කෙරෙමියිකීය. එබසට අල්වාගෙනගිය ගම් රකවල්හු එසේවීනම් මොහුගේ ජීවිතය නැසීමෙන් අපට ප්‍රයොජන කිම්දැයි තොප කීලෙසම කරම්හයි කියා ඔහුගෙන් අතක් ඇර ජීවිතය රැක දුන්හ. මහරජ ඒ සොරහුගේ අත ඇරවූ ඒ කාරුණික පුරුෂයාහට අකුසල් වේදැයි කීසේක, එබසට මිලිඳු මහරජාණෝ කියන්නාහු: ස්වාමීනි ඒ සොරු තමාගේ නපුරෙන් පමුණුවාගත් ජීවිතාන්තරායෙන් ගලවාඅත විවරක් ඇරවූ කාරුණික පුරුෂයාට කුශල වර්ධනයවන විවරක් විනා අකුසලයෙක් නැතැයි කීහ, මහරජ එසේ වීනම් ඒ කාරුණික පුරුෂයා කැප්පු අතින් ඔහු විඳිනා වෙදනාව යම් පමණෙක්ද ඒ වෙදනාවෙන් අත කැප්පු පුරුෂයා කිසි අකුශල ඵලයක් විඳිනේ දැයි කීසේක, එබසට මිලිඳු මහරජාණෝ කියන්නාහු: ස්වාමීනි ඒ සොරු තමා නොපනතින් එපමණ දුක් විඳුනේය ජීවිතය රැක දුන් පුරුෂයාට කිසි අකුසලයක් නැතැයි කීහ. එකල්හි නාගසෙන ස්ථවිරයන්වහන්සේකියනසේක්: මහරජ එබැවින් අපගේ බුදුරජාණන්වහන්සේ කාරුණායෙන් දෙවදත්ත ස්ථවිරයන්වහන්සේ මහණ කරවූසේක. මහණ කරවනසේකුත් මාගේ ශාසනයෙහි මහණව බොහෝ කාලයක් විඳිනා දුක් මඳකලකට පැමිණ අප්‍රමාණවූ කාලය ප්‍රමාණ කොට අනල්පවූ දුක්ඛය ස්වල්ප කළසේක. එසේ හෙයින් මහරජ දෙවදත්ත ස්ථවිරයන් මහණ කරවූ හෙයිනුත් ඔහට ධර්මදෙශනා කළ හෙයිනුත් කර්මස්ථාන දුන්හෙයිනුත් මෙලෝ පරලෝ දැන පෙර කාලක් පුරුදුවූ ද්‍රිගුණය හැර ගුණයෙහි පිහිටා එම කාරණය හෙතු කොටගෙන මතු සංසාර නම් පසේ බුදුවන්ට හෙතු වන්නේය, බුදුන්ගෙන් ඇසූ බණෙහි අනුසසින් මෙම ජාතියෙහි කාලක්‍රියා කරන දවස් කාරුණා නිධානවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේට මුඛ නොසැහෙන පරිද්දෙන් ස්තුති කරන්නාහු:

"ඉමෙහි අඨිහි තමග්ගපුග්ගලං–දෙවාතිදෙවං නරදම්මසාරථිං සමන්තචක්ඛුංසතපුඤ්ඤලක්ඛණං පාණෙහිබුද්ධංසරණංඋපෙමි"යි

යනාදීන් බුදුන් ගුණ කියා සරණ ගතවූ කුශලානුභාවයෙන්
ඒ දෙවදත්ත ස්ථවිරයෝ මේ කප සකොඨාසයක් කොට ඉන් ප
ලමුවෙනි කොඨාසයෙහි සංඝභෙද කර්මය කොට පස් කොඨාස
යක් නිරයෙහි පැසී එයින් ගොඩනැඟී අට්ඨිස්සර නම් පසේ බුදු
වන්නාහ, එසේහෙයින් මහරජ දෙවදත්ත ස්ථවිරයන්ට බුදුරජා
ණන්වහන්සේ කළාවූ උපකාරයෙහි මහත්බවය නුවණින් සලක
වයි කීසේක. එබසට මහරජාණෝ සැබැව ස්වාමිනි දෙවදත්ත
ස්ථවිරයන්වහන්සේට බුදුන් නුදුන් දෙයෙක් නම් නැත, නොක
ළ උපකාරයෙක් නම් නැත, සියල්ලම දෙවූසේක, සියලු උපකා
රම කළසේක, දෙවදත්ත ස්ථවිරයන් මහණකරවා උපසම්පදා ක
රවා ධර්මදෙශනා කොට සියලු වැඩම සාධා මතු පසේ බුදු බවත්
සිද්ධකොට දෙනසේකැයි සමාධිවූහ.

මෙසේ ඒ මිලිඳු මහරජාණන් විසින් විචාළාවූ සියලු පැනම
විසඳා ඔහු සිත සැක දුරුකරවා බුද්ධ ශාසනයෙහි පහදවා ඕහට
සකලාභිවෘද්ධි වර්ධනය කරවූසේක, මේ හැම නාගසෙන ස්ථවිර
යන් වහන්සේ හා මිලිඳු මහරජාණන්ගේ පූර්ව හෙතු බලයෙන්
සිද්ධවීයයි දතයුතු, මෙසේ ඒ කාශ්‍යප සර්වඥයන්වහන්සේගේ
ශාසනයෙහි පැවිදිව මහණ දම් පුරමින් වත පිළිවෙත් සරුව
වසනසේක්: දවසෙක බුදු ගුණ මෙණෙහි කෙරෙමින් සිත එක
ගව මළුව හැමැන්දවූ අසංස්කාරික කුශලයෙන් ඒ කාශ්‍යප
බුදුන් පටන් මේ ගෞතම බුදුන් දක්වා බුද්ධාන්තරයක් මුළුල්
ලෙහි නරක තිර්යක් ප්‍රෙත අසුරකාය යන සතර අපායට නො
ගොස් මිනිස්ලොවින් දෙව්ලොවට යෙමින් දෙව්ලොවින් මිනිස්
ලොවට එමින් සසර සැරි සරා දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ මේ
බුද්ධොත්පාදයෙහි බුදුන් නිවන් පුර වැඩ පන්සියයක් අවුරුදු
ගිය කල්හි දිව්‍යලොකයෙන් අවුත් ජම්බුද්වීපයෙහි කජංගලා නම
බමුණුගම සොනුත්තර බ්‍රාහ්මණයාණන්ගේ බැමිණිදෙවීන් කුස
පිළිසිඳ දසඑකඩමසින් බිහිව කුමාර පෙරහරින් වැඩිවිය පැමිණ
නාගසෙන කුමාරයයි යන නමින් ප්‍රසිද්ධව වෙද ශාස්ත්‍රාදීවූ සකල
ශාස්ත්‍රයෙහි කොටිප්‍රාප්තව බොහෝ ආශ්චර්‍යයි ලොව පහළ කො
රෙමින් ගිහි ගෙයි වැස එහි ආදීනවඅසා බුදුසසුන් වැද මහණව
ත්‍රිපිටකධර්මය හදාරා පිරිවහා මහීගජ්ජනාකරවමින් විදර්ශනාවඩා
රහත්ව බුද්ධශාසනය ජොතිමත්කොට මිලිඳු මහරජුගේපණ්ඩිතාභි
මානය මර්දනකෙරෙමින් ඔහු සතුටුකරවා බොහෝසත්වයන් අමා
මහනිවන් දක්වා උභයලොකාර්ථ සිද්ධි සම්පාදනය කළසේක,
හැමදි මළුයෙහි කසලදැමුවාවූ සසංස්කාරික කුශලයෙන් අනාඃ
කල්පයක්මුළුල්ලෙහි දෙව්මිනිස්ලොව සුරතර සැපත් විඳ මේ බු
ද්ධොත්පාද කාලයෙහි සාකල නගරාඞ්ග සම්පන්න සමෘද්ධවූ සාගල

නම්නුවර අමිත ශ්‍රී සෞභාග්‍යයෙන් අනූනවූ රජකුලයෙහි මිලිඳු නම් රජව ඉපද සකල කලායෙහි කෙළ පැමිණ පූර්‍ව වාසනා බල යෙන් නාගසෙන ස්ථවිරයන්වහන්සේ හා සමග විබුධ මදෙදෘම ප්‍රමුදිත මධුර සාර භාරතීන් විපන්නාභෙද්‍ය සංසන්දනයෙන් තමා සිත සැක දුරුකොට ගෙන බුඩ්ඝාසනා නුබඩ ශුඩාඩ්‍යාසයෙන් අති ප්‍රසන්නව ශ්‍රඩාදීවූ සප්තවිධ ධන රශින් රැස්කොට රජ සිරි විඳ වාසයකොට ස්වර්‍ග මනුෂ්‍ය සම්පත්තිය හස්ත ප්‍රාප්ත කළහ, මෙසේ හැමැන්දුවූ අසංස්කාරික කුශලයෙන් නාගසෙන ස්ථවිර යන් වහන්සේ මොක්ෂ සම්පත්තිය හස්ත ප්‍රාප්ත කළසේක, කසළ දූමුවාවූ සසංස්කාරිකකුශලයෙන් මිලිඳුමහරජතෙම ස්වර්ගීමනුෂ්‍ය සම්පත්තිය හස්ත ප්‍රාප්ත කෙළේය. එහෙයින් ස්වර්ගී මොක්ෂ සම්පත් සිඬකරනු කැමති සත්පුරුෂ ජනයන් විසින් තුනුරු වන් පිහිවියාවූ ස්ථානවල ශ්‍රඩාචිත්තයෙන් හැමදීමද පිරිබඩගැන් මද මල් පිදීමද පහන් පිදීම දූසි යන මේ චතුර්විධ කුශලයෙහි අනුසස් දැන ලත් අවසරයෙක තම තමන්ගේ ශක්ති පමණින් හැමද සුවඳ පිරිබඩ ගත මල් පහන් පුදා මතු ස්වර්ගී මොක්ෂ සම් පත් සිඬකරන්ට උත්සාහ කටයුතු. ඒ බව භගවතු පිණ්ඩස දක් වතලද මැසි—

"සම්මජ්ජනි සතං පුඤ්ඤං සහස්සම්පි ලිම්පනෙ,
පුප්ඵානි සතසහස්සානි දීපපූජා අසංඛියා,"

මෙතෙකින් මේ සඬර්‍ම රත්නාකරයෙහි

දෙවන බුඩාද්භූත ක්‍රියා සංග්‍රහ මිලිඥ ප්‍රශ්න කථා නම්වූ

සත්වන පරිච්ඡේදය

කියා නිමවනලදී.

# 8 වෙනි පරිච්ඡේදය.

නවද මේ සද්ධර්ම රත්නාකරයෙහි
බුද්ධාද්භුත ක්‍රියා සංග්‍රහ නන්ද ස්ථවිරකථාව නම් තරංගයක්,
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

ඒ කෙසේදයත්? එක් සමයෙක්හි අප බුදුන්ගේ මල්වූ නන්ද මහ තෙරුන්වහන්සේ සිවුවණක් පමිත් පිරිවරාගිඳ රාත්‍රි බණක් දෙසනසේක, එදවස් අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධරාජෝත්තම යාණන්වහන්සේ මෙපවත්දැන අද නන්දයෝ රාත්‍රි බණක් දෙසති එසේහෙයින් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි ජෝතිමත්ව පවත්නාවූ මාගේ සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මයෙහි සමස්ත ලොකවාසී සත්ත්වයන් භය භක්තිපුරස්සරව කර්‍ණාලංකාරකොරෙමින් ධර්ම පූජා කරන ලෙස නාය නගා තබනු පිණිස මමද බණ ඇසුව මැනවැයි සිතා, විවිධ කුසුමදාමක රක්ත පල්ලවාවලම්බක රජත සුවර්‍ණ මණිතාරකානුසජ්ජිත නානා රාග විතානානුබද්ධ සුගන්ධ පුෂ්පොපහාර සමලංකෘත භූමිභාගයෙන්ගා සද්ධර්මශ්‍රවණ බුද්ධ දර්‍ශනාදියපිණිස පැමිණියාවූ බ්‍රහ්ම සුරා සුර නර නාග ගරුඩ ගන්ධර්ව සිද්ධ විද්‍යාධරාදීන්ගේ ශරීර ප්‍රභාවයෙන් එකොද්භාසවූ ශ්‍රීගන්ධකුටියෙන් නික්ම, සුවර්‍ණගිරි ගුහාවකින් නිකුත් එකාචර සිංහරාජයකු සවකීයමෘගෙන්ද්‍ර පොතකයක්හු අමෘතුවප්‍රගුණකරවූකර්‍ණසීර වචනියක්ශ්‍රවණයකොට ප්‍රෙමයෙන්අමෘතරසාස්වාදනයකොරෙමින් පැකිල නීලවන රෙඛාවක් මුවාව සිටියාක්මෙන් එම ශ්‍රීගන්ධකුටිනිස මත්තෙහි සියලුබණපිරිසට නොපැණීමතියමූ රූසිටිපිය හොසොල්වා වැඩ සිට බණ අසා මහතෙරුන්වහන්සේ අලුයම් බණ සමහරකළකල්හි ඝන නීලමෙඝකූටයක් විවිධකොට සකලා ලොක පතුරුවා හැමසික් චලිතකොට දෘශ්‍යමානවූ ළහිරුමඩලක් සේ හුන්නාවූ බණපිරිස චලිතකරවමින් බුදුහුපෙණි ශ්‍රී මුඛගර්භයෙන්නිකුත් සුගන්ධසකන්ධයෙන් සකල ධර්ම පර්‍ෂද සුවඳගන්වමින් සාධු සාධු නන්දය මාගේ අභිප්‍රායානුකූල ලෙසම බණ කීයෙහිවේදැයි සතුතිකොට වදාළසේක, ඒක්ෂණයෙහි බුද්ධ ගෞරවණයන්බණ පිරිස ඉපිලනැයී දෙහොත් මුදුන්ඥදමින් අද්භූතවූසූයෙර්‍ෂාදයෙහි චක්‍රාමෙහොරුහ විකසකෞමද ප්‍රබොධවකරතලා මලකමල මුකුලිතවූ නළිනාකාරයක් මෙන් සජ්ජිතව සිටියහ, එවේලෙහි මහ තෙරුන්වහන්සේ ගිණි මස පැහැළ තල රොනක් මෙන් සුහුව

හුනස්නෙන් පැන නැඟී බුදුන් කරා ගොස් දෙහොත් මුදුනෙහි තබාගෙන සිට ස්වාමීනි ඔබවහන්සේ රාජ සිවූ මැලිව බුඩ සුබුමාලව තුන්යම් රාත්‍රියෙහි කොසේ නම් වැඩ සිටම බණ අසා වදාළසේක්දැයි දැන්වූසේක. එබසට සනරාමර ලොකහිත තථාගතයන් වහන්සේ මධු මද මුදිත ලලිත රතිකර මනොහර කුරවික නාද නිර්විශෙෂ අෂ්ටාඞ්ග සමුපෙත බ්‍රහ්ම ඝොෂාවිහිදුවා වදාරනසේක්: එම්බා නන්දයෙනි මා එක දවසක් සිට බණඅැසූයේ කවර නම් ආශ්චර්‍යයෙක්ද ඉදින්තොපි තොපගේ ආයුෂ්කල්පය මුළුල්ලෙහි මුව නොහැර බණ කියවූ නමුත් මමද මෙසේම සිටි වනම සිට බණ අසන්නෙම්වේදැයි වදාළසේක, එවේලෙහි එතැන්හි රැස්වූ බොහෝ බණ පිරිස මුව නොපොහොනා ලෙස සාධුකාර දුන්හ, එතැන් පටන් හැම ශ්‍රඬාවන්ත සත්වයෝ සද්ධර්‍මයෙහි ශ්‍රඬාඬ්‍යාශයෙන්ම බහුමාන උපදවා පූජා සත්කාර පැවැත්වූහ. එසේ හෙයින් ස්වාක්ඛාතතාදී ගුණගණාන්විත සපර්‍ය්‍යාප්තිකා නවලොකොත්තර සද්ධර්‍මය නම් ධර්‍මෛශ්වරවූ බුදුන් ගෙන් පවා ශ්‍රොත්‍රපථ සජ්ජිතවූ පූජොත්සව ලත් හෙයින් ප්‍රාඥවූ ශ්‍රඬාවන්තයන් විසිනුදු මෙපවත් මෙනෙහි තබාගෙන හැම කල්හිම ආදර සහිතව සිත හෙළා අසමින් ත්‍රිවිධ සම්පත්තිය හසුන ප්‍රාප්ත කරන්ට උත්සාහ කටයුතු. **කියන ලද්දේ මැයි—**

> **"සුධාභිධම්මරසපානමනොමපඤ්ඤ,**
> **සක්කච්ච සොතපුටභාජපුමා පිවන්තු,**
> **ධම්මිස්සරොපි භගවා සකලම්පි රත්තිං**
> **ගෙහා විරම්පි* සීතඝොරව සුණිත්ථ ධම්මං."**

**මෙතෙකින් මේ සද්ධර්‍මරත්නාකරයෙහි**

**තුන්වන බුඬාද්භූත ක්‍රියා සංග්‍රහ නන්ද ස්ථවිර කථා නම්වූ**

## අටවන පරිච්ඡෙදය.

**කියා නිමවනලදී.**

—:○:—

* ගෙහාවිරතනා.

# 9 වෙනි පරිච්ඡේදය.

**තවද මේ සද්ධර්ම රත්නාකරයෙහි කාල බුද්ධරක්ඛිත ස්ථවිර කථාව නම් කවරහෙයක්,**

මෙතැන්හි මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**යේ කෙසේදයත්?** සමස්ත රත්නාකර රුචිරාභරණ භූසිත මහා වාලුකාපගාදී මුක්තා ලතා ලංකෘත නිරන්තරා වති කල්ලෝලමාලී නීල වස්ත්‍රයක් හැඳ ත්‍රිවිධ රත්නාඞ්ගරාගයෙන සජ්ජිතවූ **ලංකාඞ්ගනාවගේ** නළල බබළන තිලකාභරණයක්මෙන් සෝභමානව, දිගු බිත විතත කීර්තින් ශ්‍රැතාවලෝකිත ජන නයනෝන්මත්තකර සිරිනිකර මනෝහර අනන්තරානන්තර ගොපුර රත්න සුබද්ධ සුවිසුද්ධ මුතු වැලක් වැනිවූ නිර්මල ප්‍රාකාරවලයකින් හා හිම ගිරි ශිඛරාකාර අනෙකභූමි භෙදෙදිත නවුනි තිසත සහස්‍රාමිත ප්‍රාසාදශ්‍රේණීන් ප්‍රඛ්‍යාතවූ, නානාවර්ණ නර නාරි ගණානුචරිත ප්‍රචුර චච්චර සන්ධි සිංඝාටකාදී සතසහස්‍ර ප්‍රමාණ වීථි පන්තීන් හා සුධාසිතාති ධවල කෛලාසකූටාද්භූත ධාතු ගර්භ විජෘම්භිත විද්‍යුල්ලතාවලම්බිත මෙචක මෙඝ කාදම්බ චුම්බිත රජත පර්වතාකාර අශ්වත්ථද්‍රැම රාජරාජිත කමලාසනාලය තුල්‍ය දසබල සම්භවාලය ලොකනාථ ප්‍රතිබිම්බ මන්දිරාදී නානා රාමාභිරාම නාතිදූරාසන්න සමන්තානන්ත විහාරශ්‍රේණීන් ප්‍රතිමණ්ඩිත සකල නගරාඞ්ග සම්පත්ති නිෂ්පත්තිප්‍රාප්ත සමස්ත ශ්‍රීන් පුරන්දර පුරාකාරවූ,

"අනුරාධපුරං ආසි–රම්මෙ සීහළභූතලෙ,
මෙදිනීභාමිනීභාල–තිලකංව මනෝරමං.

සාලාවලයමුත්තුඞ්ග–සගොපුරමුදාවහං,
රතනන්තරසම්බද්ධ–මුත්තාවලයසන්නිභං.

හිමාලසෙලසංකාස–මෙඝචුම්බිතමුද්ධනි,
නෙකභූමිකපාසාද–සෙනීහි තුරියද්ධනි.

අඤ්ඤමඤ්ඤමුඛමෙභාජ–මධුපානෙසු ලාලසා,
නෙත්තමින්දීවරානන්ද–නරනාරිගණාකුලං.

පුප්ඵලාපනසෙනීහි–කොසාකරමනොහරං,
කිංකිණිනාදසංකිණ්ණ–නානාරාගධජාකුලං.

හත්ථසසරථපන්තීහි–නානාවණ්ණසමාකුලං,
නච්චගීතාලයාරම්ම–රච්ඡාදිපතිමණ්ඩිතං.

චම්පෙය්‍යනාගපුන්නාග–පූගඅජ්ජුනගාදිහි,
කජ්ජිකාජසමාකුල–තුල්‍යමුය්‍යානපන්තිහි,

බොධිචෙතියසම්බුද්ධ-බිම්බාලයසමාකුලං,
පාකාරගොපුරාරාම-චංකමාදිමනොරමං.

සුගතොරස සංකිණ්ණං-පඤ්ඤසිද්ධුවතාදිනා,
සාමඤ්ඤගුණසම්පන්න-වාණීකාමිනිසාමිනා.

සංඝාරාමාදිසාරම්මං-බ්‍රහ්මාවාසමිවබ්භුතං,
සමන්තානන්තවාරොරු-විහාරපතිමණ්ඩිතං.

ඵොමතාවිසයසෙසව-විසයං සිරිසංචිතං,
මසක්කසාරසංකාසං-මනුඤ්ඤං හදයාවහන්ති.

යනාදීන් වර්ණිතයවූ **අනුරාධපුර** නුවරට පූර්ව දිසාභාගයෙහි මධ්‍යාහ්නන්ත කුම්භකාර පෘථුල නීල මහීධර මස්තකයෙහි ශරද බ්‍රසංජනිත ශරත් ගගන තලයමෙන් සුධාසිතාතිධවල ශෛල ස්තූප ප්‍රධාන තුන්සිය සැටක් දාගැබින් හා සියයක් පමණ පිළිම ගෙවලින් හා බෝමළු පෙත් ළිං පොකුණු ආදියෙන්ද එක් දහස් සාරසිය සතළිසක් පමණ පිරිවෙනින් හා සොළොස් දහසක් පමණ සංඝාරාම ප්‍රාසාද කූටාගාර චංක්‍රමණ ධර්මශාලා රාත්‍රි ස්ථාන දිවා ස්ථාන කූපාලය පානීය ශාලා ගොපුරද්වාර ප්‍රාකාර පබ්භාර දරිමුඛය අටසැටක්පමණ ගිරි ගුහාවෙන් හා පුෂ්පාරාම ඵලාරාම උපවන වන රේඛා සහිත අප්‍රමාණ විහාර වින්‍යාස යෙන් ශොභමානවූ **මිහින්තලාගල**, සිසිරකර කිරණ විස්තෘත පයොදධි නිභ විශද පුලිනයෙන් නිර්මල ශ්වෙතාඞ්ගණ පන්තීන් හා කිරි මුහුද අළලන සඳ පාර්ශ්වාන්තතොද්ගත ලහරිස්කන්ධ මෙන් නානා නීචොච්ච ඵලිකා ප්‍රාකාරපන්තීන් පරික්ෂිප්තව අහස් ගඟ පැන නැඟි තුඹුන් රළවිළි පන්තියක් මෙන් ක්‍රමොන්නතවූ සොපාන මාලාවෙන් විරාජිත **රාජගිරි ගුහායෙහි** වැඩ වසන්නාවූ **කාලබුද්ධරක්ඛිත** ස්ථවිරයන්වහන්සේ පොහෝ දවසෙක අඞ්ගුත්තර නිකායෙහි චතුෂ්ක නිපාතයෙන් **කාලකාරාම සූත්‍රය** දෙශනා කරණු පිණිස **කාල තිම්බරු වෘක්ෂ** මූලයෙහි වැඩහුන් සේක. එසඳ ධර්ම දෙශනාවෙන් ශ්‍රාන්තවන ශරීරයෙන් ග්‍රීෂ්ම නිවාරණයට විජනය පිණිස සමීපස්ථ කළ රජත රත්න තාල වෘන්තවයක් දෙපස මාණික්‍ය භිත්තිවයෙහි ප්‍රාලම්බ කළක් මෙන් චන්ද්‍ර සූර්ය්‍ය දෙදෙන පූර්වාපරාම්බරාන්තයට පැමිණ ධර්ම කථිකයාණන්වහන්සේගේ කීර්තිතෙජඃ ප්‍රභාසම්මිශ්‍රව මුළුලොව පත්ලාක්මෙන් දිනු බිත දීප්තිමත්විය, මෙ ආශ්චර්ය්‍ය දැක සන්තොෂයෙන් මද මදින් කෙශර දන්න පන්තීන් ප්‍රකාශ කොට පත්‍රාධර පොබයා පුෂ්ප මුඛයෙන් වනශ්‍රිය හඬදෙන්නාක් මෙන් හැම වන හිස මිණි දූදර කැකුළු කැන් එකහෙළා පුබුදින්ට

පටන්ගත්හ, එපවත් දත් මත් බමර මුළු ධර්මදේශනාවට පළමුව සාධුනාද පූජාවක් කළමැනැවැයි යනු මෙන් වන හිස එකහෙළා භෘඞ්ග නාද කෝලාහලයට පටන්ගත්හ. තවද කීර මයූර බර්හ කපිඤ්ජර පාරාපතාදීවූ හැම විහඟ සමූහ තෙම සද්ධර්මශ්‍රවණයට බාධා නොකරවයි ඔවුනොවුන්හා බැණ ගිවිස් වන්නාක් මෙන් සඞ්ඛාරාව ප්‍රතිරාවදෙමින් සුහුව නිශ්ශබ්දව තමන් තමන් වසන වෘක්ෂ ශාඛාග්‍ර තරු කෝටර ධරණීධර විවරාදීවූ ස්වකීය ස්ථාන වලම හැසිර ධර්ම ප්‍රාරම්භය දැන් දැන් වෙයි සිත සිතා කන් නමාලා හිඳිනාවුන්මෙන් නිශ්ශබ්ද වූහ. සුපුල්ල තමාල මල්ලිකා දීවූ ලතාලිඞ්ගිත සමන්තානන්තඋපවනාදියෙහි පාදපාදීහු දැන් දැන් ධර්මය පටන්ගනිති, තෙපි ඊට නිශ්ශබ්ද වනලෙස් නොගඬා හිඳුවයි සාඛාමෘගාත්‍ර ජාදීන් සා අතින් වඩාගෙන පළු රත තුල් වලින් සෙනඟ ප්‍රහරණදිදී සනඟ සනහා නළවන්නවුන් මෙන් සාමූව රුදි මඳ සළල අතු පතරින් සැදී සිට ඉන්ද්‍ර නීල මාණික්‍ය ස්කන්ධයක් මුලින් උද්ගතවූ විද්‍රැමාංකුරයක් මෙන් තිඹිරි කඳම පිටදී හස්තපාදදීවූ කාය විකාර රහිතව ශාන්ත දාන්ත ලීලා වෙන් ධර්ම දේශනාවට වැඩහුන් විනීත ව්‍යක්ත භාවයක් බලවයි ශිරශ්චාලනය කෙරෙමින් සතුති කරන්නාක්මෙන් සන්ධ්‍යාමන්ද මාරුතයෙන් කම්පිත වෘක්ෂාග්‍රයෙන් සුවඳ ඇල් බොල් පවන් අමා බසින්ට වන, එසඳ රුස්වූ ධර්ම පර්ෂත් මධ්‍යයෙහි වචන නැමැති මෙඝ ගර්ජනා කොට මෘදු ලවන් නැමති දෙව් දුනු නඟමින් චපල ලලිතා ජිහ්වා නැමැති විදුලිය පැහැර සුවිසුද්ධ සම දන්ත පන්ති නැමැති බලාකාවලින් මඳින් මඳ දක්ව දක්වා ප්‍රාඥ ජනහෘදය නැමැති මහ වැවු එකහෙළා සම්පූර්ණව වහන් දක්නා තරම් ඔහු මුඛ මෙඝ ගර්භයෙන් සද්ධර්මාමෘත වර්ෂා වසින්ටවන.

එකල්හි අනුරාධපුර නුවර චතුස්සංග්‍රහවස්තුයෙන් ප්‍රජා පාලනය කෙරෙමින් වැස රාජ්‍යශ්‍රී අනුභව කරන්නාවූ සද්ධාතිස්සනම් මහරජද,එදවස් පෙහෙවස් සමාදන් වෙමින් බණ අසනුකැමැතිව මිහින්තලාගල රාජගිරිලෙන වැඩවසනා කාළ බුද්ධරක්ෂිත ස්ථවිරයන්වහන්සේ කළු තිඹිරි ගස මුල වැඩහිඳ කාළකාරාම සූත්‍රයෙන් රාත්‍රි බණක් දේශනා කරන සේකැයි යනු අසා වැඩකරු සත්පුරුෂ ගණනක් දෙනා ගෙන සද්ධාතිස්ස මහ රජ අප්‍රසිද්ධව නුවරින් නික්ම ගොස් උන්වහන්සේ බණට පටන් ගෙන පූර්වෝක්ත ගාථාව කොළ නොපැමිණෙන තෙක් එතැන්හි පැමිණ අප්‍රසිද්ධව බණ පිරිස් කෙළවර සිට තුන්යම් රාත්‍රියෙහි බණ ඇසූහ. එකල්හි රුස්වූ ධර්ම පර්ෂත් සිත්හි කෙලශ කාලුෂ්‍යාපගමව නික්මුණාක් මෙන් අසන ගිරි ශිඛරොන්මුඛවැ නිසාන්ධකාරය දුරින් දුරුවන්ට වන්කල්හි,එපවත්

දුටු උදයගිරි පර්වත රාජයා දුන් මඥසම්තයක් මෙන් ගොඩින් එළිවන්ට වන එසඳ අරුණොද්ගමනයෙහි තෙරුන්වහන්සේ බණ සමහර කොට බණ පිරිසට පන්සිල් දුන්සේක, එවිට සද්ධා තිස්ස මහරජාණෝද පන්සිල් ගෙන මහත් කොට සාධුකාර දෙමින් තමන් එතන සිටි බැව් හඟවා තෙරුන්වහන්සේට පෙණුනාහ. එකල්හි තෙරුන්වහන්සේ රජහුදැක එම්බාමහරජාණෙනි තෙපි මෙතනට කවර විටක අවුදැයි විචාළසේක, එබසට මහරජ කියනුයේ: ස්වාමිනි නුඹවහන්සේ යම්විටක ධර්මදෙශනා කරණු පිණිස මේ සූත්‍රයෙහි පූර්ව ගාථාව පටන්ගෙන සමාප්ත නොකළසේක්ද. එවෙලෙහිම මෙතනට පැමිණියෙම් වේදැයි කීහ. එබසට තෙරුන්වහන්සේ විස්මය පත්ව කියනසේක්: මහරජ තෙපි ඉතාම රාජ සිවු මැලියව, එබැවින් තුන්යම් රාත්‍රියෙහි සිටිවනම් සිට කෙසේ සිත එකඟ කොටගෙන බණ අසා ගතුදැයි පුළුවුත්සේක. එබසට ස්වාමිනි මෙබඳුබණක් නුඹවහන්සේ දෙසනසේක්විනම් මේ එක රාත්‍රිය තබා නුඹවහන්සේගේ හා මාගේ ආයුෂ්කල්පය මුළුල්ලෙහිදු මෙසේම සිටි වනමයිට බණඅසමි, එතකුදු උවත් බණ පටන් ගත් වේලෙහි පටන් එක පද ව්‍යජනයකුත් නොපිරිහෙළාම සිතහෙළා බණ ඇසීමි; එසේ නොඇසුයෙම්වීන් නම් මේ ශ්‍රී ලංකාද්වීපයෙන් කැවිටි මූලක් හෙළාලන පමණ තෙනෙකටත් හිමි නොවෙම්වයිකියා ධර්මගෞරවයෙන් සපථ කළහ. එකල්හි තෙරුන්වහන්සේ සාධු සාධු මහරජයිකියාරජහට තුන් යළක් සාධුකාර දුන්සේක. සිසාරු සිටි බණ පිරිසද රජහට සාධුකාර දෙමින් මහත් ශබ්ද පැවැත්වූහ. දෙවියෝද රජහට සාධුකාර දුන්හ. ඉක්බිති මහරජතෙම තෙරුන්වහන්සේ වැඳ සිට කියනුයේ ස්වාමිනි මෙබඳුවූබණක් මෙතෙක් දවස් නොඇසූවිරිමි බුදුන්ගේ ධර්මය මෙසේම බොහෝ බව නොදතුයෙමි, මේ එක සූත්‍ර දෙශනාවෙන්ම බුදුගුණ කියා නිමවනලදද, මෙසේවූ ධර්මයක් නිපුණකොට නුඹවහන්සේ කෙසේ ප්‍රගුණකොට ගත්සේක්දැයි කිය. එබසට තෙරුන්වහන්සේ කියනසේක්: එම්බා මහරජ තෙපි කුමක් කියවුද, අපබුදුන් **ත්‍රිපිටකයෙහි** දෙශනාකළාවූ පන්සිය පණස් ජාතක දෙශනාවෝය. මෙසේම දෙසිය තවානු දහසක් ගාථාවස්තු දෙශනාවෝය, සතළොස්දහස් පන්සිය පන්සැත්තෑවක්පමණ සූත්‍ර දෙශනාවෝයයි යනාදීන් ධර්මයබොහෝ බව හඟවමින් කියනසේක් මහරජාණෙනි අද මාවිසින් තොපට කීයේ ඒ බොහෝ ධර්ම රාශියෙන් එක සූත්‍රයක බණ පමණෙක් වේද: නොකී බුදු බණ ඉබොහෝයයි කීසේක. එබස් අසා මහරජතෙම ධර්මාලම්බන ප්‍රීතින් මත්ව තෙරුන්වහන්සේට පසඟ පිහිටුවාවැඳ එසඳස්වාමිනි නුඹවහන්සේ මඬලබණටත්වඩා වෙසෑත්

බණ බොහෝදැයි කිය. එබසට තෙරුන්වහන්සේ කියනසේක්: මහරජාණෙනි මීට වඩා බණ බොහෝයයි කීසේක. එපවත් අසමින් මහරජ කියනුයේ: ස්වාමීනි දෙසූ බණ මඳ නියාවටත් නොදෙසූ බණ බොහෝ නියාවටත් උපමාවකින් හඟවා වදාළ මැනැවැයි කිය එබසට තෙරුන්වහන්සේ නොදෙසූ ධර්මය බොහෝ නියාවත් දෙසූ ධර්ම මඳ නියාවත් හඟවා නොයෙක් උපමාවෙන් රජහට දක්වනසේක්: එම්බා මහරජාණෙනි දහසක් කිරිපැසුණු ඇල්කෙතකින් එකකරලක වී ස්වල්පව තෙසු ධාන්‍ය රාසිය අනල්පවූවාසේ මාවිසින් දෙසුවාවූ ධර්මය ප්‍රමාණයක; නොදෙසූ ධර්මය අප්‍රමාණය. තවද මහමුහුදටදැමූ අබඑවෙහි පිරුණාවූජලය ශෙෂයක, අවශෙෂවූ සමුද්‍ර ජලය විශෙෂයක; එපරිද්දෙන් මාවිසින් දෙසූ ධර්මය මඳෙක, නොදෙසූ ධර්මය නොමඳය. තවද මහපොළවින් කුරකුපය ඇලුණු පස් ප්‍රමාණයෙක, තෙසු මහපොළොව පස්අප්‍රමාණය; එලෙසම මේඑක සූත්‍රයෙහිබණ පමණෙක තෙසු බණ අපමණය, තවද ඇත් බඳකික් කුහුඹුවකු තුඩින්ගත් මස් බිඳුවට තෙසු මස්බොහෝවූවාසේ මාවිසින් දෙසූබණ ශෙෂයක නොදෙසූ බණ විශෙෂයක, තවද චාතුද්දීපික මහා මෙඝයක් වර්ෂා කරන කල්හි එක ලියද්දෙක වැසපු වැසි පොදට වඩා තෙසු වර්ෂාව අප්‍රමාණවූවාසේ මේ සූත්‍රයෙන් කථිත ධර්මය ලෙසයක, තෙසු ධර්මය බහුලය. තවද ගඟා ප්‍රවාහයකට පැවාවූ සූචිපාසයෙන් නික්මුණාවූ ජලධාරාව කෘශය, අවශිෂ්ට ජලප්‍රවාහය ස්ථූලය; එසේම දෙසූ බණ අණුමාත්‍රයක, නොදෙසූ බණ අප්‍රමාණය තවද මහරජ අහස ලිහිණියක පක්ෂ ප්‍රහාර කරන කල්හි පක්ෂ පත්‍රයකින් වැසුණාවූ අහස මඳය නොවැසුනාවූ අහස අප්‍රමාණ වූවාසේ මාවිසින්කිවාවූ පාලිධර්මය යම්තමෙක, නොකිවාවූ පාලිධර්මය බොහෝයයි යනාදීන් මෙසේ නොයෙක් උපමායෙන් බුදුබණ බොහෝ.බව ප්‍රකාශ කොට මහරජහට හඟවා කීසේක.

**එහෙයිංහයින් කියනලදී—**

"භූපාලභො බාරි සතෙපිබෙතෙන -සාලෙසාසීසප්පතරංවධඤ්ඤං
මයා මධීතමපි ලවං සුධම්මං-බහු හවෙ පාවචනම්පි අඤ්ඤං.

සමුද්දකාං සාසපභාජනම්හි-සුපූරිතප්පං අවසෙසකාං භූසං
තථා මයා වුත්තමිදං පි ධම්මං-අණුං අවුත්තං විය සින්ධුතොයං.

මහාඝනායාමකුපංසුතො යං-අල්ලීනමත්තාං විය කුන්ථපාදෙ,
පමාණකාං රාජ මයා සුවුත්තං-භූමිං වනන්තාඤ්ඤමුනින්දභාසං.

වස්සානකාලෙ චතුදීපමෙඝෙ-භූමිප්පදෙසෙ වතුහත්ථමත්තෙ,
සුපූරිතං වාරි ලහුං තදඤ්ඤං-බහුං මයා වුත්තමවුත්තධම්මං.

නදීපවාහෙනපිසුච්පාසතො   ගතොහිආපොවියථොකමත්තකං
මයා මහාරාජ සුදෙසිතං ඉදං–සුධම්මගණාය භවෙය්‍ය අප්පකං.

පිපීලිකා වාරණභාරඛන්ධතො–සුදණ්මත්තං විය භාසිතං මයා,
අනන්තමාකාසසකුන්තපක්ඛතොතිලීනමත්තංවියවුත්තපාලියංයි

යනාදීන් තෙරුන්වහන්සේ වදාලාවූ ධර්ම්ගම්භීරත්‍වයෙහිද වාක් ලීලාවෙහිද අතිප්‍රසන්නවූ සැදෑතිස්ස මහරජ තෙම උපමාවෙන් උපමාවට දණ්ඩ නමස්කාරයෙන් වැඳ වැතිර උද්වෙගක්ෂණිකාදීවූ පස් වනක් ප්‍රීතින් පිනා ලොමු දූහැගත් ගාත්‍ර ඇතිව අමෘතාර්ණව යෙක ගැලුනාක්මෙන් සද්ධර්මශ්‍රවණයෙන් මත්ව ස්වාමීනි අද නුඹ වහන්සේ විසින් ගෙනහැර දක්වා වදාල මේ සද්ධර්මෝපමාවන්ට මම සක්විතිරජවීම්නම් සප්තවිධරත්නයහා දෙදහසක්සොළදිව් පිරිවර කොට ඇති සතර මහාද්වීපය ඇතුළුවූ සක්වළ සියලු සක් විති රාජ්‍යයෙන් පූජා කෙරෙම්මය, මම මුළු දඹදිවට අගරජ වීම් නම් ජම්බුද්වීපයෙහි සියලු අග්‍රරාජ්‍යයෙන් පූජා කෙරෙම්මය,දෙව් රජවීම්නම් දිව්‍ය රාජ්‍යයෙන් පූජාකෙරෙම්මය,එසේහෙයින් ඔබ වහන්සේට පූජා කිරීමට තරම්වූ වස්තුවෙක් මාගේ දූන් නොම ඇත්තේය, එසේවීනමුත් මාගේ ශක්ති පමණින් පූජාකරන්නාවූ මේ දූගී පඬුරෙකැයි කියා මේ සියක් යොදුන් ලංකාද්වීපය ඇතුළුවූ හැමරාජ්‍ය සම්පත්තිය තෙරුන්වහන්සේට පූජා කළහ එසඳ මහතෙරුන්වහන්සේ මහරජ තොප විසින් පූජා කළාවූ රාජ්‍යය තොපට පින් පිණිස අපිපිළිගතුම්හ, රාජ්‍ය ධුර දෙකක්දරීම එක විට නොපිළිවන ,සද්ධර්ම රාජ්‍යය අපට පමණ, අපසන්තක ලංකා ද්වීපයෙහි සත්‍වයන්ට හිංසා පීඩා නොකොට ත්‍රිවිධරත්නය රක්ෂා කොරෙමින් දැහැමෙන්සෙමෙන් රාජ්‍යයකරවයිකියාදෙවෙනිවත් රාජ්‍ය සම්පත්තිය රජහටම පාවාදී මහරජාණන් රාජ්‍ය සම්පත්තියෙහිම පිහිටුවා උභයලොකාර්ථ සිද්ධිසම්පාදනාය කළසේක එකල්හි මහරජ තෙම කාළ තිඹිරු වෘක්ෂ මූලයෙහිදී කාළකාරාම සූත්‍ර දෙශනා කළාවූ කාලබුද්ධරක්ෂිත ස්ථවිරයන්වහන්සේ කෙරෙහි අතිප්‍රසන්නව පසහ පිහිටුවා වැඳ අවසර ගෙන සකා ශ්‍රීසමෘද්ධි භාරයෙන් සාරවූ අනුරාධ පුරප්‍රවරයෙහි තමා වසන රාජ භවනයට ගියේය. මේ චතුස්සත්‍යය බුද්ධවූ ස්ථවිරයන්වහන්සේ දෙසූ එකාම සූත්‍ර දෙශනාවකට රාජ්‍යය පුදවා ගත්කල හෙසු ශ්‍රැත බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ සම්‍යක් සම්බුද්ධයයි යන බුදුවරයන් වහන්සේගේ ධර්මදෙශනාහා සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය හා බුද්ධ මහිම කියනුම කවරේද, එතකුදු උවත් චතුර්විධ බුදුවරයන්වහන්සේගෙන් සම්‍යක් සම්බුද්ධවරයන්වහන්සේ අතිශ්‍රෙෂ්ඨසේක,උන්වහන්සේට අනතුරුව පසේ බුදුවරයන්වහන්සේ බලවත්සේක, පසේ බුදුවරයන්වහන්

ස්ට අනතුරුව චතුඃසත්‍ය බුදුවරයන්වහන්සේ බබළනසේක,
ඒ චතුඃසත්‍ය බුදුවරයන්වහන්සේට අනතුරුව ශ්‍රැත බුදුවරයන්
වහන්සේ බබළනසේක, ශ්‍රැත බුද්ධවරයෝ නම්: බොහෝ ඇසූ
පිරූ තැන් ඇතිව කරුණා පුරස්සර සත්ගුරුවරයන්ගේ ශික්ෂා
වෙහි හැසිර නවලොකොත්තර සද්ධර්මයවූ පරිද්දෙන් පිළිපැද
තමාගේඅතවැස්සන්ට දෙලොවින් වැඩවනුපිණිස අවවාදකොට
ඔවුන්ට ධර්මාගමාදිය ප්‍රගුණකරවා ඔවුන් විසින් මතු මතුත් බුද්ධ
ශාසනය වර්ධනය කොට සත්පුරුෂ ජනයාට මෙලොවින් පර
ලොවින් වන අර්ථ සිද්ධි සම්පාදනය කොට උත්සාහ වඩනා උප
දෙශ දෙමින්,

“අත්තානමෙව පඨමං-පතිරූපෙ නිවෙසයෙ,
අථඤ්ඤමනුසාසෙය්‍ය-න කිලිස්සෙය්‍ය පණ්ඩිතො”යි

යනාදීන් වදාළ බුද්ධ වචනය මෙන් පළමුව ස්වකීය ආත්මය
දමනයලා ඉක්බිති ධර්මාන්තෙවාසිකය,නිශ්‍රයාන්තෙවාසිකය,පබ්බ
ජ්ජන්තෙවාසිකය,උපසම්පදන්තෙවාසිකයයියන චතුර්විධඅන්තෙ
වාසිකයන්ගෙන්, ධම්මන්තෙවාසිකයන්ට අසන පිරිවහන තැන්
කියා සූත්‍රාභිධර්ම විනයාදිය පුහුණුකරවමින් නිශ්‍රයාන්තෙවාසික
යන්ට වස්ත්‍ර වද්‍ය පර්යෙෂණාදීන් හිතෙසිව, නිරන්තරයෙන්
ඔවුන් සත්පථයෙහි යොදා ඔවුන්ගේ මෛත්‍රී චිත්තය තමා වෙත
ආමකාඞ්ක්‍ෂාවන පත්‍රයක්මෙන් ඇලවා ඔවුන්තමා උදෙසාවිසීමට
ප්‍රියවර්ධනකරවමින්;පබ්බජ්ජන්තෙවාසිකයන්ටද උපසම්පදන්තෙ
වාසිකයන්ටද සිවුපසය තමහට පිළිපැදෙන පමණින්අනුභව ප්‍රති
පාදනයකොට නිරන්තරයෙන් කලමනා වත් පිළිවෙත් ආදියද
හස්තපාද පිෂ්ඨ සම්බාහනාදිවූ මෙහෙයෙන්ද භික්‍ෂාචාරාදිවූගමනා
ගමනයෙහි ඉදිරිපසුයාම්රැම් දැවුටුදියපෙරහාදීම්ආදිවූ වත්තප්‍රති
වත්ත ප්‍රතිග්‍රහණයෙන් ඔවුන් තමන්වෙත ප්‍රියලෙස වාසයකරවා
වැස්වීමද; තවද අතිජාත ශිෂ්‍ය පුත්‍රය, සහජාත ශිෂ්‍ය පුත්‍රය,අනු
ජාත ශිෂ්‍ය පුත්‍රය අවජාත ශිෂ්‍ය පුත්‍රයයි යන චතුර්විධවූ ශිෂ්‍ය
පුත්‍රයන් හැඳින ඔවුන් අතුරෙන් අති ජාත ශිෂ්‍ය පුත්‍රයන් වැඩ
පිණිසකියාලූ අවවාදයෙහිපිහිටුවා උභයලොකාර්ථ සිද්ධිසම්පාදන
යට ඔවුන්කියාලූ සම්‍යක්වචනයන් නොපිරිහෙළා මෙනෙහිකර,
ගෙන එවූ පරිද්දෙන් වාසය කිරීමද; සහජාත ශිෂ්‍ය පුත්‍රයන් හා
ධර්ම සාකච්ඡාදිවූ සාමීචිවචනයෙන් සන්තොෂව විසීමද;අනුජාත
ශිෂ්‍ය පුත්‍රයන්ගේ ශාස්ත්‍රාභිලාෂිත චිත්තය නොකලඹා පුළුවුත්
තැන්ඔතැතිනොකොටග්‍රන්ථිස්ථානවිදහාශාස්ත්‍රාගමාදියපුහුණු
කරවමින්බහුමානභාජනවවිසීමදඅවජාතශිෂ්‍යපුත්‍රයන්ටදණ්ඩකර්ම

සම්පරායික අර්ථ සිද්ධියට හෙතුවූ වචන පමණක් නොකියන හෙයිනුත් ප්‍රබුද්ධ පද්ම පත්‍රයක් මෙන් මුඛ සන්තොෂය දක්වා සිහිලස සඳුන් මෙන් මියුරු වදනින් සිත්ගෙන උගතමනා ශාස්ත්‍රාගමාදිය ඉගන හෘදය නැමති සාතුරෙන් ගෞරව ගුණ නැමති උත්පල පත්‍ර ච්ඡෙදනය කරන්නාක්මෙන් ගුරුන් ගුණමකු කොට අත්තනොමතියෙන් ප්‍රගුණ කළ ශාස්ත්‍රාගම මෙන් බැහැරට හඟවමින් ඔවුන්ගෙන් බහුමාන උපදවනු පිණිස;

“වාමෙන සූකරො හොති-දක්ඛිණෙන අජාමිගො,
සරෙන නෙලකො හොති-විසාණෙන ජරග්ගවො.

යනු මෙන් තන්හි තන්හි අනුවන ජනයන් විස්මය පත් කරවමින් ගුරුන්ගේ පරම්මුඛයෙහි ප්‍රස්තුත වචනයන් සම්මුඛයෙහි නොකියා උන්ගේ ගුණ අවගුණ මෙන් ප්‍රකාශකොට අහිතෙයිව හිතෙසි කමක්සේ හඟවති. එසේ හෙයින් ඒ අවවාද ව්‍යාජ වචනාදිය තමාගේ නුවණින් පරීක්ෂාකොට තත්වූ පරිද්දෙන් දැනගෙන ඔවුන් නොතලා සිහි ඇතිව ගැලවී විසීමද; දානය සීලය ශ්‍රද්ධාය ත්‍යාගය ප්‍රඥායයි යන පංච ධර්මයෙන්ද ප්‍රතිඝාතනය රහිතව ධර්මානු ධර්ම ප්‍රතිපත්ති පූජාදීන් බුද්ධ පූජාකොට ලෞකික ලොකොත්තර සම්පත් සිද්ධකරනු පිණිස යෙහෙන් වසන්නාවූ ශ්‍රාවකයන්වහන්සේ **ශ්‍රැත බුද්ධනම්** සේක, **චතුස්සත්‍ය බුද්ධ නම්:** චතුරාර්‍ය්‍යසත්‍ය ප්‍රකාශකරවූ ධර්මදෙශනාවන් අසා සකලක්ලෙශයන් ප්‍රහීණ කොට සතරමග සතර ඵලයට පැමිණ සකල ලොකාවබොධනය කෙරෙමින් ප්‍රතිවෙධ ශාසනානු පාලිතව අග්‍ර දක්ෂිණෙය්‍ය වූවාහු චතුස්සත්‍ය බුද්ධ නම් වෙති. **ප්‍රත්‍යෙක බුද්ධ නම්:** විගතාශ්‍රවයක්හුගේ දර්ශනයෙන් ශ්‍රැත ව්‍යාකෘත සත්පථානු වර්ත්තවූ මෙ මහොත්තමයන් විසින් පූර්ව වාසනා බලයෙන් ඇස දුටු අනිත්‍ය ලක්ෂණාදියක් අරමුණු කොටගෙන ලත් කර්මස්ථානයෙන් සකලකෙලශයන් ප්‍රහීණකොට නානා ස්ථානයෙහිදීම බුදුවූවාහු **ප්‍රත්‍යෙක බුද්ධ** නම් වෙති. **සම්‍යක් සම්බුද්ධ නම්:** අප්‍රමෙය අවිනෙය්‍යවූ ගුණ ඥානාදීන් අග්‍ර ප්‍රාප්තවූ සකල ලොකාර්ථ සංසිද්ධියට කෘත්‍යව සමස්ත සත්වයන්ට හැම ගුණයෙන් අග පැමිණියාහුයි. මෙබඳු සම්‍යක් සම්බුද්ධ වරයෝ බොධිසත්ව භූමියෙහි සිට පරාර්ථයෙහිම තත්පරව වසන්නාහ. තමන් නිසා පරවැඩෙක් සිද්ධවේනම් අසිපත්‍ර වනයෙහි වසන්නාහුද නඳුන් වනයෙක්හි මෙන් වෙසෙති, පරවැඩෙක් සිද්ධනොවේනම් නඳුන්

වනයෙක්හි වසන්නාහුද අසිපත්‍ර වනයෙක්හි මෙන් වෙසෙත්. ඒ එසේ මැයි. පාරමිතා භූමියෙහි සසර සැරිසරන්නාහු අප්‍රමාණවූ කුසල සම්භාරයන් රැස්කොට එයින් ජනිතවූ කුසල ඵල විඳුවන්ට සුදුසුවූ දිව්‍ය ලොකවල දිව්‍ය සම්පත් හා බ්‍රහ්මලොකවල බ්‍රහ්ම සම්පත් විඳිනා පිණිස දීඝායුවූ දිව්‍ය බ්‍රහ්ම ලොකවල උපනත් එතැන්හි වැස දිව සැපත් විඳීමෙන් තමහට සැපමුත් පරවැඩ සිඬ නොවන හෙයින් දිවසැප විඳින්ට මැලිවෙති, එත කුදුවුවත් ඒ ස්ථානවල අන්තර මරණ නැතිහෙයින් ඒ ඒ ස්ථානයෙහි ආයු පමණින් වැසමුත් අතුරෙක මිනිස්ලොව උපදින්ට අවශෙෂ සත්වයන්ට නොපිළිවන බොධිසත්වවරයන්ගේ අභිප්‍රාය සිඬවන්ට උවමනා හෙයින් දීඝායුවූ දිව්‍ය බ්‍රහ්ම ලොකයෙහි සම්පත් විඳිමින් වැස පරවැඩ අදහසින් පුරන්නාවූ බොධි සම්භාරයට බාධක වන හෙයින් දිව්‍ය බ්‍රහ්ම ලොකවල පරමායු නොගෙවෙන නෙක් අතුරෙක කාලක්‍රියා කරනු කැමති උව හොත් සවකීයවූ විමානයට වැද දිව යහන්හී සැතපී මෙයින් මත්තෙහි තමන්ගේ ජීවිතය නොපවතීවයි අධිෂ්ඨාන කොට ඇස වසාගත් කල්හි චිත්තාධිෂ්ඨානයට අනතුරුවම ඔවුන්ට කාලක්‍රියාව සිඬව පාරමිතා පූරණයටසුදුසුවූ මනුෂ්‍යලොකයෙහි කැමති තැනක උපදනාහ. මේ අධිමුත්ති කාලක්‍රියාව නම්වේ, මේ අධිමුත්ති කාලක්‍රියාව සම්‍යක් සම්බොධි සත්වයන්ට මුත් සෙසු ප්‍රත්‍යෙක බොධිසත්වාදිවූ කවර සත්වයක් හටත් සිඬනොවන්නේය. එසේ හෙයින් බුදුවරයන්ගේ අද්භූතක්‍රියාව අචින්ත්‍ය වන්නේය. ගේ එසේමැයි.

එතකුදුඋවත් මනොවාක් ප්‍රණිධානයන්පුරා මුදුන් පැමිණ නියත විවරණය ලත් තැන් පටන් සොළසාසංඛ්‍ය කල්පලක්ෂයක් හෝ අටාසංඛ්‍ය කල්පලක්ෂයක්හෝ සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් හෝ පාරමිතා පුරම බුදුවන හෙයින් ඒ ත්‍රිවිධාකාරයෙන් බොහෝ කල්වූ අටාසංඛ්‍යය සොළසාසංඛ්‍යය හැර යටත් පරිච්ඡෙදවූ සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් පාරමිතා පුරා බුදුවනත් ඒ සාරාසංඛ්‍ය කල්පලක්ෂයෙන් තෙයාසංඛ්‍ය කල්පලක්ෂයක් හැර කල් එකාසංඛ්‍යයක් ගණන තබා අසංඛ්‍යයක් අවුරුදු ගණන බොහෝව තිබෙන ලෙ

සින් ඒ අසංඛ්‍යයට ගණනා නම්: * එකින් එක දසයක, දස දස යෙක් සියයෙක, දසසියයෙක් නම් දහසෙක. සියක් දහසෙක් නම් ලක්‍ෂයක, සියක්ලක්‍ෂයෙක් නම් කොටියක, කොටි සියෙක් නම් ප්‍රකොටියෙක, ප්‍රකොටි සියෙක් නම් කොටිප්‍රකොටියෙක, කොටිප්‍රකොටි සියෙක් නම් නහුතයෙක, නහුතකොටියෙක්නම් නින්නහුතයෙක, නින්නහුත කොටියෙක්නම් හුතනහුතයෙක, හුතනහුත කොටියෙක් නම් ඛම්භයෙක, ඛම්භ කොටියෙක්නම් විෂ්කම්භයෙක, විෂ්කම්භ කොටියෙක් නම් අබබයෙක, අබබ කොටියෙක් නම් අටටයෙක, අටට කොටියෙක් නම් අහහයෙක අහහකොටියෙක් නම් කුමුදයෙක, කුමුද කොටියෙක් නම් සෞගන්ධියෙක, සෞගන්ධි කොටියෙක් නම් උත්පලයෙක, උත්පල කොටියෙක් නම් පුණ්ඩරීකයෙක, පුණ්ඩරීකකොටියෙක් නම් පදුම යෙක, පදුමකොටියෙක්නම් කථානයෙක, කථානකොටියෙක්නම් මහා කථානයෙක, මහකථාන කොටියෙක්නම් අසංඛෙය්‍යයෙක් නම් වේ. මෙසේ දක්වූ අසංඛ්‍ය වර්‍ෂගණනට ලක්තබන්ට ලොක යෙහි එකනමින් යුත් සියලු වස්තුව මඳවන්නේය. එසේහෙයින් ජම්බුද්වීපයෙහි මනුෂ්‍යයන්ට පරමායු දස අවුරුද්දෙහි

---

* "දසදසකංසතං, දසසතං සහස්සං, සහස්සානං සතං සත සහස්සං, සතසහස්සානං සතං කොටි, කොටීනං සතසහස්සං පකොටි, පකොටීනං සතසහස්සං කොටිප්පකොටි, කොටිප්ප කොටීනං සත සහස්සං නහුතං, නහුතානං සතසහස්සං නින්නහුතං නින්නහුතානං සතසහස්සං හුතනහුතං, හුතනහුතානං සතසහ ස්සං ඛම්භං, ඛම්භානං සතසහස්සං විකඛම්භං, විකඛම්භානං සත සහස්සං අබබං, අබබානං සතසහස්සං අටටං, අටටානං සතසහ ස්සං අහහං, අහහානං සතසහස්සං කුමුදං, කුමුදානං සතසහස්සං සොගන්ධිකං, සොගන්ධිකානං සතසහස්සං උප්පලං, උප්පලානං සතසහස්සං පුණ්ඩරීකං, පුණ්ඩරීකානං සතසහස්සං පදුමං පදුමානං සතසහස්සං කථානං, කථානානං සතසහස්සං මහා කථානං, මහා කථානානං සතසහස්සං අසඞ්ඛෙය්‍යං,,

"සතං සහස්සං නහුතං ලක්ඛං කොටි පකොටියො,
කොටිප්පකොටි නහුතං තථා නින්නහුතං පිච,
අක්ඛොභිනිං ඛිඤ්ඤ අබ්බුදං ච නිරබ්බුදං,
අහහං අබබං චෙවා ටටං සොගන්ධි කුප්පලං,
කුමුදං පුණ්ඩරීකංච පදුමං කථානං පිච,
මහා කථානා සංඛෙය්‍යා නිච්චෙවනාසු සතාදිච,
කොට්‍යාදිකං දසගුණං සතලක්ඛ ගුණං කමා,,

මේ සංඛ්‍යාකථනය ඒ ඒ තන්හි මෙසේ නානාවිධවූ දක්නා ලැබේ.

පටන් වැඩි වැඩි ගොස් අසංඛ්‍යයට වැඩි අසංඛ්‍යයෙන් අඩුවු
අවුත් දස අවුරුද්දට ආයුෂය වැටුනු කල්හි මෙ අතුර අන්තඃ
කල්පයෙක් නම්මේ. එසින් කියා-

"වස්සානං දසතො පඩා-අසංඛෙය්‍යස මුග්ගතෙ,
දසවසෙස පුනප්පත්තෙ-අන්තකප්පො නි ඊරිතො,,

යනාදින් මේ දක්වූයේ සංක්‍ෂෙපයෙන් අන්තඃ කල්පයට සළ
කුණුය. මෙසේම විසි අන්තඃ කල්පයක් එක් අසංඛ්‍ය කල්පයෙක්
නම් වෙයි, එසේම අසංඛ්‍ය කල්පසතරෙක් මහා කල්පයෙක්නම්
වේ. මේමහා කල්පඑකෙකැයි ගැණිදසයෙක සියයෙක දහසෙක
ලක්‍ෂයෙකැයි යටකීලෙසට ගැණ සතරඅසංඛ්‍යයක්හා කල්පලක්‍ෂ
යක් දතයුතුවූයේ එක් පාරමිතා භූමියෙක් නම්වේ. මේ පාරමිතා
භූමියෙහිසිට සමතිස්පෙරුම් පුරන්නාවූ බොධිසත්වවරයෝඉදින්
දහසක්ජාතියෙකින් දහසක්ජාතියෙක එක ලේබිඳුවෙක්දදන්දු
නත් සාරාසංඛ්‍යකප්ලක්‍ෂයක් ඇතුළතදුන්ලෙයමෙසේමසමුද්‍රදහ
සකටත් අධිකවෙයි දහසක්ජාතියෙන් ජාතියෙක උදටක්පමණ
මස්බිඳුවක් දන්දුනත් මෙසේම දෙලක්‍ෂසතළිස්දහසක්යොදුන්
ඝන කඩ බොල් මහ පොළෝ දහසෙක පස් ප්‍රමාණයටත් අධික
වන්නේය, දහසක් ජාතියෙන් ජාතියක එක් ශිෂියක් දන්දුනත්
මෙසේම එක්ලක්‍ෂ අට සැට දහසක් යොදුන් උස ඇති මහමෙර
දහසක් මතු මත්තෙහි තබාලූ උසටත් හිස්ගොඩ උස්වන්නේය.
දහසක් ජාතියෙන් ජාතියෙක එකානෙත්‍රයක් දන්දුනත් මේචක්‍ර
වාලාභ්‍යන්තරයෙහි අහස් කුස මෙන් දහසක් ආකාශවල තරු
ගණනටත් වඩා අධිකවන්නේය. දහසක් ජාතියෙන් ජාතියෙක
එක්පුත්‍රදර කෙනෙකුන්බැඳ දන්දුනත් ඒ වැල්ගොඩට මහමෙර
දහසක් මතු මත්තෙහි තුබූ උසත් මඳ වන්නේය. එසේ හෙයින්
පාරමිතාභූමියනම් ඉතාම දීර්ඝකාලයෙක් නම්වෙයි. එසේහෙයින්
කිසිකෙනෙකුන් පාරමිතාපුරනඅතුරෙහිආයුෂය බොහෝවූදිව්‍ය
බ්‍රහ්මලොකවල උපන්කලපාරමිතාපුරන්ට කල්මඳවේදැයිසිතත්
නමුත් විවරණලත් තැන් පටන් බුදුවන තැන් දක්වා අතුර
ප්‍රමාණාතික්‍රාන්තවූ දීර්ඝකාලයක්හෙයින් ඒඅතුර හැම දිව්‍ය බ්‍රහ්ම
ලොකවල පරමායු පමණින් දිව සිරි විඳ උනත් පාරමිතාපිරීමට
කල් මඳනොවන්නේය. එසේහෙයින් චාතුම්මහාරාජිකාදිවූ දිව්‍ය
බ්‍රහ්ම ලොකවල ආයුෂ නම්: මනුෂ්‍යායු ගණනාවෙන් පණස් අවු
රුද්දෙක් චාතුම්මහාරාජික දිව්‍ය ලොකයට එකාදවසෙක,මෙදව
සින් තිස් දවසෙක් මසෙක, එමසින් දොළොස් මසෙක් අවුරුද්
දෙක, ඒ අවුරුද්දෙන් පන්සියයක් අවුරුද්දට චාතුම්මහාරාජික

දිව්‍ය ලොකයෙහි ආයුෂයවෙයි. මේ පන්සියයක් අවුරුදු මනුෂ්‍ය ගණනාවෙන් අනූ ලක්‍ෂයක් අවුරුදු වෙයි. මෙසේම **තාවතිංස** භවනයට මනුෂ්‍යායු ගණනාවෙන් තුන් කෙළ සැට ලක්‍ෂයක් අවුරුද්දට ආයුෂය වෙයි. **යාම** නම් දිව්‍යලොකයට තුදුස්කෙළ සතළිස් ලක්‍ෂයක් අවුරුද්දට ආයුෂය වෙයි. **තුෂිත** භවනයට සත්පණස් කෙළ සැට ලක්‍ෂයක් අවුරුද්දට ආයුෂය වෙයි. **නිම්මාණරති** දිව්‍යලොකයට දෙසිය තිස්කෙළ සතළිස්ලක්‍ෂයක්අවුරුද්දට ආයුෂය වෙයි. **පරනිම්මිතවසවර්ති** දිව්‍යලොකයට නවසිය එක්විසිකෙළ සැටලක්‍ෂයක් අවුරුද්දට ආයුෂයවෙයි. **බ්‍රහ්මපාරිසජ්ජ** නම් බඹලොවටඅසංඛ්‍ය කල්පයතුන්කොටසයක්කළකලඑයින් එක් කොටසයකට ආයුෂය වෙයි, **බ්‍රහ්මපුරොහිත** නම් බඹලොවට අසංඛ්‍ය කල්පයෙහි දෙභාගයෙන් භාගයකට ආයුෂය වෙයි. **මහාබ්‍රහ්ම** නම් බඹලොවට අසංඛ්‍ය කල්පයකට ආයුෂය වෙයි. **පරිත්තාභ** නම් බඹලොවට මහා කල්ප දෙකකට ආයුෂය වෙයි. **අප්පමාණාභ** නම් බඹලොවට මහා කල්ප සතරකට ආයුෂයවෙයි. **ආභස්සර** නම් බඹලොවට මහාකල්පඅටකට ආයුෂය වෙයි. **පරිත්තසුභ**නම් බඹලොවට මහාකල්පසොළසකටආයුෂය වෙයි. **අප්පමාණ සුභ** නම් බඹලොවට මහා කල්ප දෙතිසකට ආයුෂය වෙයි. **සුභකිණ්හ** නම් බඹලොවට මහාකල්ප සූසැටකට ආයුෂය වෙයි. **වෙහප්ඵල අසඤ්ඤසත්ත** යයියන බඹලෝ දෙකට මහාකල්ප පන්සියයකට ආයුෂයවෙයි පඤ්ච සුද්ධාවාසයෙන් **අවිහ** නම් බඹලොවට මහා කල්ප දහසකට ආයුෂය වෙයි. **අතප්ප** නම්බඹලොවට මහාකල්ප දෙදහසකට ආයුෂයවෙයි. **සුදස්ස** නම් බඹලොවට මහාකල්ප සාර දහසකට ආයුෂය වෙයි **සුදස්සී** නම් බඹලොවට මහා කල්ප අට දහසකට ආයුෂය වෙයි. **අකනිට්ඨ** නම් බඹලොවට මහාකල්පසොළොස්දහසකටආයුෂයවෙයි සතර ආරූප්ප බ්‍රහ්ම ලොකවලින් **ආකාසානඤ්චායතන** නම් බඹලොවට මහා කල්ප විසි දහසකට ආයුෂය වෙයි. **විඤ්ඤාණඤ්චායතන** නම් බඹලොවට මහාකල්ප සතළිස්දහසකට ආයුෂය වෙයි. **ආකිඤ්චඤ්ඤායතන** නම් බඹලොවට මහාකල්ප සැට දහසකට ආයුෂය වෙයි. **නෙවසඤ්ඤා නාසඤ්ඤායතන** නම් බඹලොවට මහා කල්ප * සුවාසූදහසකට ආයුෂය වෙයි. මෙසේ දක්වනලද මේ විසි බඹලොවහා සදිව්‍යලොකයෙහි පරමායු හැම එක්කොට පිඬු කළ කල † දෙලක්‍ෂ සතිස්දහස් එක්සිය විසිඅට කල්පයක් හා, එක්ප්‍රකොටි දෙසිය අට විසි කෙළ පණස් ලක්‍ෂයක් අවුරුදු හෙයින්; මේ හැම දිව්‍ය බ්‍රහ්මලොකවල පරමායු එක්කොට පිඬු

* "අසූදහසකට,".
† "දෙලක්‍ෂ එක්තිස්දහස් සසියවිසිඅට," පොත්හි

කලත් සාරාසංඛ්‍ය කප්ලක්‍ෂයක් තබා එයින් එක කප් අසංඛ්‍යයක් ගෙන කෙළ ගණන් කොට්ඨාස කලත් එයින් එකකොට්ඨාසය කටත් මේ දිව්‍ය බ්‍රහ්මලෝකවල පරමායු ප්‍රමාණය මඳවන්නේය. ඉතුත් බෝධිසත්ත්වවරයෝ පාරමිතා භූමියෙහි සිට පච සුද්ධාවාස බ්‍රහ්ම ලෝකවල හා සතර අරූ තලහා අසංඥතලයෙහි නූපදනා හෙයින් අසඤ්ඤ සත්ත නම් බඹලොවින් යට දසබඹලොව හා සදිව්‍ය ලෝකයෙහි පරමායුෂ සසිය විසි අටකප් එක් ප්‍රකෝටි දෙසිය අටවිසි කෙළ පණස් ලක්‍ෂයක් අවුරුදු හෙයින්, මේ දිව්‍ය ලෝකවල සිය දහස් ගණන් ජාතියෙහි ඉපද එහි ආයු පමණින් දිව සිරි විඳ නැවත මනුෂ්‍ය ලෝකයෙහි ඉපද අභිප්‍රාය ලෙස සමතිස් පෙරුම් පුරතත් පාරමිතාවට කල්මඳ නොවන්නේය. එසේහෙයින් දිව්‍ය බ්‍රහ්ම ලෝකවල දිව සැපත් විඳ කල්ගිය කල්හි බුදුකුරු දහම් පුරන්ට කල් මඳයයි නොසිතිය යුත්තේය. එසේහෙයින් බෝධිසත්ත්වවරයන් අධිමුක්ති කාලක්‍රියා කරන්නේ නම් සමතිස් පෙරුම් පුරන්ට කල් මඳ හෙයින් නොවෙයි. බෝධිසත්ත්වවරයෝ නම් හැමවෙලෙහිම පරාර්ථව වාසය කරන්නාහ. කිසිස්ථලෙක පරවැඩක් සිද්ධ නොවේ නම් එතැන්හි විසීමට මැලිව පරවැඩ සිද්ධවන තෙනක විසීමට අභිප්‍රාය වෙති, ඒ කාරණයෙන් දිව්‍ය ලෝකයෙහි විඳිනා දිව්‍ය සම්පත්තියටත් වඩා පරවැඩෙහිම සතුටු වන හෙයින් අධිමුක්ති කාල ක්‍රියාවෙන් චුතව පරවැඩ සිද්ධ වන තෙනක වාසය කරනු පිණිස මනුෂ්‍ය ලෝකයෙහි උපදනාහුයයි දතයුතු.

මෙබඳු බෝධිසත්ත්වවරයෝ බුදුබව ලැබීමට මහත් වීර්‍ය්‍ය කොට පාරමිතා සාගරයෙහි පරතෙරට පැමිණ සිට බුදුවන ජාතියෙහි දිව්‍ය බ්‍රහ්ම යෝනියක නොඉපදම මනුෂ්‍ය යෝනියෙහි කුමක් පිණිස උපදනා සේක්දැයි යතහොත්, දෙව්ලොවවැස බ්‍රහ්මචර්‍ය්‍යාව රක්‍ෂා කිරීම උගහට හෙයින් දෙවාත්ම භාවයෙහි උපන් කල බුද්ධානු භාව දැක්වීම ආශ්චර්‍ය්‍ය නොවන්නේය, සියලු සත්ත්වයෝම බුද්ධශ්‍රී දැක දෙවානු භාවයයි කියාම සිතති, බුද්ධානුභාවයයි නොඅදහති, එකල්හි බුදුහුයයි ආදර නොකෙරෙති, වදාළ සද්ධර්මයෙහි නොපහන් වෙති, සාශ්වත වාදයෙන් නොමිදෙති, එසේහෙයින් සත්ත්වයන්ගේ මෙබඳුවූ ග්‍රාහය මුදනු පිණිසම මනුෂ්‍ය සුගතියෙහි උපදනාසේක. මනුෂ්‍ය සුගතියෙහි උපදනාසේකුත් ඖපපාතිකව නූපදනාසේක කුමක් හෙයින්දයත්, ධර්ම විනය නායඥ සත්ත්වයන්ට ධර්ම පාළිය තබන්නාක් මෙන් ධාතු වෛනෙය්‍ය සත්ත්වයන්ට ධාතු තබනු පිණිස ඖපපාතිකාව නූපදනාසේක. තමන්වහන්සේගේ ධර්මදේශනා ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය ආදිවූ බුද්ධ මහිමයෙහි සියලු සත්ත්වයන් සැක නූපදවනු, පිණිස මනුෂ්‍ය සුගතියෙහි පිළිසිඳ මව්

කුසින් බිහිව හැම දෙවි බඹුන් සිත සැක දුරුකොට ලොවුතුරා බුදු වනසේක. මෙබඳුවූ අචින්තායවූ බුද්ධානුභාව සම්පන්න සෘද්ධි ප්‍රාතිහාර්යයෙන් යුක්තවූ බුදුන් වැඩි තැන පියවර සටහන නොපෙණෙන්නේයැ කුමක් පිණිස දයත්, සියුම්වූ ගමන් ඇති හෙයිනුදු මහත්වූ බල ඇති බැවිනුදු, මහාජනයාට අනුග්‍රහයෙනුදු, ශ්‍රීපාදය එබූ තැන් නොපෙණෙන්නේය සියුම්වූ ගමන් ඇති බව කවරහයත්, බුදුන්ගේ ශ්‍රීපාදය පුලුන් පිඩක්සේ සියුම්වන්නේය එසේහෙයින් ශ්‍රීපාදය තුබූතැන් පුලුන් පිඩක් හුණුතැනක්මෙන් සටහන් නොපෙණෙන්නේයි. මහත් බල ඇති බව නම් කවරහයත්, බල සම්පන්න සෛන්ධව අශ්වයකු පියුම් පත් පිට විහිදුවූ කල ඒ පියුම් පත් පිට ධාවනය පෙණෙන්නේය, එබූ පියවර සටහන නොපෙණෙන්නේය. එසේ හෙයින් බුදුන් මහ බල ඇති හෙයින් වඩනා පමණක්ම පෙණෙන්නේය, පියවර සටහන නොපෙණෙන්නේයි. ජනානුග්‍රහයෙන් පියවරසටහන නොපෙණෙන බව නම් කවරහයත්, මහාජන සමූහ තෙම පූජා කෙරෙමින් බුදුන් පිරිවරාඅනුව නික්මෙන්නාහ. එසේකල්හි වැඩිතැන පියවර පෙණේ නම් එ පියවර මැඩ ගෙන යන්ට හැම සත්වයෝ නොසිතති, බුද්ධ ගෞරවයෙන් ශ්‍රීපාදය එබූතැනට ආදර කෙරෙමින් තමන් යන ගමනට උත්සාහ නොකෙරෙති, එසේ හෙයින් වැඩි තැන පියවර සටහන නොපෙණී අන්තර්ධාන වන ලෙසට අධිෂ්ඨාන කොට වඩනාසේක. එසේ හෙයින් බුදු රජහු නම් අචින්තායවූ අද්භූත ක්‍රියාවෙන් යුක්තයහ. බුදුන්ගේ අද්භූතත්වය බුදු මුඛයකිනුත් කියා නිමවාලන්ට නොපිළිවන. **මේ එසේමය.**

අපබුදුහු එක්දවසෙක **අරුණවතීසූත්‍ර** දෙශනාවකරනසේක් සිඛී නම් බුදුන්ගේ ශ්‍රාවකවූ **අභිභූ** නම් එක් මහතෙර කෙනෙකුන් වහන්සේ බඹලෙව්හි සිට දහසක් සක්වළ එකහෙළා ශරීරලොකයෙන් අඳුරු දුරුකොට බණ දෙසමින් සෘද්ධි ප්‍රාතිහාර්යයක් කළ ලෙස වදාළහ. එසඳ **අනඳ** මහතෙරුන්වහන්සේ ලොවුතුරා බුදුන්ට බද්ධාඤ්ජලිව නමස්කාර කෙරෙමින් නමනව සිටවිචාරනසේක්: ස්වාමීනි බුද්ධ ශ්‍රාවකයන් දහසක් සක්වළ ආලොක පතුරුවා බණ දෙසන කල ලොවුතුරා බුදුහු කොතෙක් තැන් ශරීරලොකයෙන් අඳුරු දුරුකොට මධුරස්වරයෙන් ධර්මදෙශනා කරන්ට සමර්ථ වනසේක්දැයි විචාළසේක. එබසට බුදුහු වදාරනසේක්: ආනන්ද ස්ථවිරයෙනි තොපි කුමක් කියවුද, ඒ ප්‍රදෙශික ඥනයෙහි සිටි ශ්‍රාවකයෙක, බුදුවරයෝ වනාහි සමතිස් පෙරුම් පුරා දසවිධ බුද්ධ ඥනය සාක්ෂාත් කොට අප්‍රමාණ ගුණයෙන්

යුක්තව සිටියහ. අසග ආනන්ද ස්ථවිරයෙනි නියගින් ගත් පස් පමණකට මහ පොළව සරිකරන්නාක් මෙන් ශ්‍රාවකයන් බුදුන් හා සාදෘශ්‍ය නොකරව, ශ්‍රාවකයන්ගේ විෂය අනිකෙක,බුදුන්ගේ විෂය අනිකෙක, ශ්‍රාවකයන්ගේ ගොචර අනිකෙක, බුදුන්ගේ ගොචර අනිකෙක, ශ්‍රාවකයන්ගේ බල අනිකෙක, බුදුන්ගේ බල අනිකෙකැයි, බුදුන්ගේ ගුණ අප්‍රමෙය බව වදාරා වැඩ උන් සේක. එකල ආනන්ද මහ තෙරුන් වහන්සේ දැන් බුදුන් දම් දෙසන්ට කලැයි දැන දෙහොත් මුදුන්දී නමස්කාර කෙරෙමින් වැඩසිටි කල්හි,බුදුහු වදාරනසේක්:ආනන්දස්ථවිරයෙනි සූර්ය්‍ය චන්ද්‍ර දෙදෙනා දීප්තිමත්ව ආලොක පතුරුවන තැන් එක්සක්වළෙක් නම් වෙයි. මෙසේ එකී එකී සක්වළක හිර සඳ දෙකක් බැගින් දෙදහසක් හිර සඳ ඇති දහසක් මහමෙර ඇතිසත් දහසක් කුල පව් ඇති සාරදහසක් මහ දිව් ඇති සදහසක් දෙව්ලෝ ඇති සොළොස් දහසක් බඹලෝ ඇති දහසක් සක්වළ සහශ්‍රී චූළනිය ලොකධාතු නම්වෙයි. මේ ශ්‍රාවකයන්ගේ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යදෙශනා දියට විෂයවෙයි. මෙයින් මත්තෙහි ගණිතානුසාරයෙන් විසහශ්‍රී ලොක ධාතුයයි කියනලද දසලක්‍ෂයක් සක්වළ මධ්‍යම ලොක ධාතු නම් වෙයි. ත්‍රිසහශ්‍රී ලොක ධාතුයයි කියනලද කෙළ සියක් සක්වළ මහා සහශ්‍රී ලොක ධාතු නම්වෙයි. මේ හැම බුදුන්ට මුත් ශ්‍රාවකයන්ට විෂය නොවෙයි ලොක ධාතු නම් අනන්තය අප්‍රමාණය. එසේහෙයින් උපමාවෙන් දක්වත්මුත්ගණිතයෙන් දක්වීමට අවිෂය වෙයි, ඒ කෙසේදයත්, කෙළ ලක්‍ෂයක් සක්වළ පමණ වට ඇති විසිවන බඹලොව දක්වා උස ඇති මහත් කොටුවෙක සුදු අබ පිරූකල එයින් එකී එකී අබ ඇටක් බැගින් ගෙන පූර්ව පශ්චිම උත්තර දක්‍ෂිණයයියන සතරදිගින් තුන්දිගක් තබා පූර්ව දිශාභාගයෙහි එක සක්වළකට එක අබ ඇටක් බැගින් ඍද්ධිවන්ත කෙනෙකුන්විසින් ඉදින්දමනලද්දේ වීනමුත් කොටුවෙහි අබ නිමන පමණක් විනා එක පූර්ව දිශාභාගයෙහි සක්වළවල් නොනිමන්නේය. සෙසු තුන් දිසාභාගයෙහිද සක්වළවල් අගණ්‍යතාවයද එසේ මැයි, මෙසේ අනන්ත අප්‍රමෙයවූ මේ ලොක ධාතුවෙන් හෙවත් සක්වළවලින් බුදුන්ගේ අද්භූත ක්‍රියා ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය දෙශනාදියට අවිෂයවූ එකද සක්වළක් නම් නොම ඇත්තේය, එසේ හෙයින් බුදුහු හුනස්නෙහිම හිඳ ක්‍ෂුද්‍ර මධ්‍යම මහා ලොක ධාතු ආදීවූ අනන්ත අප්‍රමාණ චක්‍රවාළොද්භූත සකලසත්වයන්ට අහස්මැද බබළන චන්ද්‍ර බිම්බයක්මෙන් පෙනී පෙනී සකල චක්‍රවාළාභ්‍යන්තරයෙහි සත්වයන් අතුරෙන් එකක් එකක්හුගේම මුහුණ බලා වැඩහිඳ ධර්‍ම දෙශනා කරන්නාක්මෙන් මෙතාක්

තැන්හි වසන සකල සත්ත්වයන්ටම බණ වදාරතත් පොහොසත් හයි වදාළසේක.

එසඳ අනඳ මහතෙරුන්වහන්සේ කියනසේක්: ස්වාමීනි සකල ලොකය සම නොවෙයි, විෂමය, සක්වලවල් අනන්තය, එසේ හෙයින් එක සක්වළක හිරු උදා කරන කල්හි එක් සක්වළක හිරු අස්තයට යෙයි, එක්සක්වළක හිරුමුදුන් පැමිණෙන කල්හි එක් සක්වලෙක මධ්‍යම රාත්‍රි වෙයි, ඒ ඒ සක්වළ වසන්නාවූ සත්ත්වයෝද කෘෂිවණිජ්ජාදිවූ ජීවනොපායකාරියෙහිව්‍යාවෘතවෙති සමහරු උයන් කෙළි දිය කෙළි සැණ කෙළි දූ නෙත්තම් රාජ විල් ආදිවූ නොයෙක් ක්‍රීඩාවෙහි ව්‍යාවෘත වෙති, සමහරු ව්‍යඤ්ජන එෂණ ඡෙදන මදීන තණ්ඩුල කොට්ටන ධොවන පචන භුඤ්ජන ඛාදන ලෙය්‍ය පෙය්‍යාදිවූ ආහාර කෘත්‍යයෙහි ව්‍යාවෘතවෙති, මෙසේ ඒ ඒ කාරණයෙන් වික්ෂිප්තද ප්‍රමත්තද වෙති; එසේ හෙයින් බුදුහු තමන්ගේ ධර්මදෙශනාවෙන් ඔවුන් කෙසේප්‍රබොධ්‍ය කර වද්දැයි කීසේක. එසඳ බුදුහු වදාරනසේක්: ආනන්දය යම් සක්වලෙක්හි හිරු උදාවීනම් තමන්ගේ ආනුභාවයෙන් හිරු අස්තයට ගියාක්මෙන් දක්වති, යම් සක්වලෙක හිරු අස්තයට ගියේවීනම් එවිටම උදාවන්නාක්මෙන් දක්වති. යම් සක්වලෙක මධ්‍යම රාත්‍රි වූයේවීනම් එතැන්හි හිරමුදුනෙහි සිටියාක්මෙන් දක්වති. එකල්හි ඒ ඒ සක්වළ ජනයෝ දැන්ම හිරුඋදාව දැන්ම අස්තයටගියේය දැන්ම මධ්‍යම රාත්‍රිව දැන්ම ඉර මුදුනෙහි සිටියේයි කියාද මහත් විස්මයට පැමිණ මේ නාගාවතියෙක්ද භූතාවතීයෙක්ද දෙවතාවතියෙක් දැයි සිතති තවද මනුෂ්‍යයෝ ආලොක අන්ධකාර දෙක දැක මෙ කවර කාරණයෙකින් වීද්දෝයි පරීක්ෂා කරන කල්හි බුදුහු නීලකසිණසමාපත්තියටසමවැද බහලාන්ධකාරය පතුරුවා ඒ ඒ කාර්‍ය්‍යයෙහි ව්‍යාවෘතවූ සත්ත්වයන් අන්ධකාරයෙන් තැති ගන්වති, ඔවුන් අඳුරෙන් තැතිගත් බව දැන අවදාත කසිණ සමාපත්තියට සමවැද සුදු බුදුරැස් විහිදුවා හැම තැන්ම එකාලොක කෙරෙති, ඒ සකල චක්‍රවාලාන්තරය එකාලොක කරන්නාහුද ශරීරයෙහි තල බිඳුවක් පමණ ප්‍රදෙශයෙන් සුදු බුදුරැස් කඳ විහිදුවා අනන්තා පරිමාණ සක්වළ එකාලොකකොරෙති, යම්සෘද්ධිවන්ත පුරුෂයෙක් සක්වළක් සා පහන් මලාවක මහමුහුද දිය පමණ තෙල් වත්කොට මහමෙර පමණ පහන් කඩක් ලා පහන් දැල්වූයේවීනමුත් පහන එක සක්වළක්ම එළි කරන මුත් වෙන සක්වළකට ඛජ්ජොත ප්‍රභාපමණකුත් ආලොකකොටගත නොහෙන්නේමය, බුදුහුවූකලි තල බිඳුවක්පමණ ශ්‍රී ශරීර ප්‍රදෙශයකින් නික්මුණු බුදුරැසින් ත්‍රිසහශ්‍රී ලොකධාතුආදීවූ අනන්ත අප්‍රමාණ චක්‍රවාලාන්තරයන් එකාලොක කෙරෙති, යම් සෘද්ධිවන්ත පුරුෂ

යෙක් චක්‍රවාළ වෘත්තයක් පමණ බෙර කාදෙක මහ පොළොව පමණ පළල චර්මයකින් සද, මහ මෙර පමණ කඩුප්පුවකින් ගසා ශබ්ද පැවැත්වූයේ වී නමුත් ඒ ශබ්දය එක සක්වළකමුත් දෙවෙනි සක්වළට මදුරුවෙකු පියා පහළ ශබ්ද පමණකුත් නොඇසෙන්නේය. බුදුහු වූකලී බුද්ධාසනයෙහි වැඩහිඳ බණ දෙසනකල්හි පෙර කීදුහතුයෙන් උපමා කළ අනන්ත අප්‍රමාණ සක්වළ සියලු සත්ත්වයන්ගේ අභිමුඛයෙහිම වැඩහිඳවදාරන ධර්මදේශනාඛක්මෙන් සියලු සත්ත්වයන්ටම ළඟ න්වා හඟවා මධුර ස්වරයෙන් ධර්ම දේශනා කරන්නාහුයයි වදාළසේක. එකල්හි ආනන්ද ස්ථවිරයන්වහන්සේ එතැන්හි රැස්වූ දිව්‍ය මනුෂ්‍යයන්හා සමග අපමණ සන්තොෂයට පැමිණ බුද්ධාලම්බන ප්‍රීතින් සාධුකාර දෙමින් මුඛ නොසෑහෙන ලෙස සතුති කොට බුදුහු නම් මෙබඳුවූ අද්භූත ක්‍රියාවෙන් යුක්ත සේක්වනැයි විස්මය පත්වූසේක. මෙසේ බුදුවරයන් වහන්සේ අප්‍රමෙයවූ අද්භූත ක්‍රියාවෙන් සකල ලොකයාහට අභිවෘද්ධි වර්ධනය කළසේක එසේ හෙයින් සියලු සත්ත්වයන් විසින් මෙබඳුවූ බුදුන් කෙරෙහි අතිශයින් පැහැද ශක්ති පමණින් පූජා කොට මතු දිව්‍ය මනුෂ්‍ය සම්පත්හා නිවන් පුරසිරි හස්තප්‍රාප්ත කරන්ට උත්සාහ කටයුතු. **එසේ හෙයින් කියනලදී—**

"ඉත්ථම්භූතං පවර කිරියං පාතුභාවං ච කත්වා
පඤ්ඤාසුද්ධයත්තානජන කරුණායුද්ධරිත්වා භවොඝා,
සත්තානං නිබ්බාන පුරවර සම්පත්තසංබුද්ධරාජං
පූජෙත්වාමෙනා තිදිවසිවසම්පත්ති හත්ථේ කරොථ,,

**මෙතෙකින් මේ සද්ධර්ම රත්නාකරයෙහි**

**සතරවන බුද්ධාද්භූත ක්‍රියා සංග්‍රහ. කාළ බුද්ධරක්ඛිත**

**ස්ථවිර කථා නම්වූ**

## නවවන පරිච්ඡේදය

**කියා නිමවනලදී.**

# 10 වෙනි පරිච්ඡේදය.

**කවද මේ සද්ධර්ම රත්නාකරයෙහි බුද්ධාද්භූත ක්‍රියා සංග්‍රහ කථාවන්ට අනතුරුව පම අන්තර්ධාන කථාව නම් කවරහෙයක්?**

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**හේ කෙසේදයත්?** හෙද ප්‍රතිවේධ අන්තර්ධානය, ප්‍රතිපත්ති අන්තර්ධානය, පර්යාප්ති අන්තර්ධානය, ලිඞ්ග අන්තර්ධානය, ධාතු අන්තර්ධාන යයි පචවිධ වේ. එයින් **ප්‍රතිවේධ අන්තර්ධාන** නම් කවරහයත්? සෝවාන් මාර්ගය ඵලය සකෘදාගාමි මාර්ගය ඵලය අනාගාමි මාර්ගය ඵලය අර්හත් මාර්ගය ඵලයයි යන චතුර්විධ මාර්ග ඵලයද, අර්ථ ප්‍රතිසම්භිදාය, ධර්ම ප්‍රතිසම්භිදාය, නිරුක්ති ප්‍රතිසම්භිදාය, ප්‍රතිභාන ප්‍රතිසම්භිදායයි යන චතුර්විධ ප්‍රතිසම්භිදාදීවූ මෙ හැම විදර්ශනාදිය පිරිහෙන කල්හි සිවුපිළිසිඹියාවෙහි පටන් ප්‍රතිලොමයෙන් පිරිහෙන්නේය. මෙසේ ප්‍රතිලොමයෙන් පිරිහීඅවුත් සෝවාන් මාර්ග ඵලයට පිරිහී එයින් නීලකසිණසටද එයින් ප්‍රථමධ්‍යානයටද එයින් කසිණ පරිකර්මාදියයි යන ධ්‍යානානුලොමයටද එයින් නිමිත්තොත්පාදනයට දැයි මෙසේ ක්‍රම ක්‍රමයෙන් පිරිහී මාර්ග ඵල ලත් හැම ශ්‍රාවකයන්ගෙන් කෙළවර අධිගම ලද් දුහුගේ ජීවිතක්ෂයින් අධිගම ශාසනය පිරිහුණේ නම්වේ. මේ ප්‍රතිවේධ අන්තර්ධාන නම් වෙයි. **ප්‍රතිපත්ති අන්තර්ධාන** නම් කවරහයත්? මෙසේ කල්යාමෙන් චතුර්විධ මාර්ගඵල ප්‍රාප්තවූ හැම තැන් ලෝ වැස වඩා වැස ක්‍රමයෙන් පරමායු ගෙවුණු කල්හි පූර්වයෙහි ඔවුන් වහන්සේලාගෙන් ලත් කර්ම ස්ථානානුකූල කසිණ පරිකර්මාදිය කොට තුදුස් ආකාරයකින් චිත්තපරිදමනය කෙරෙමින් ඍද්ධි විකුබ්බනය සම්පාදනයද නිමිත්තොත්පාදනයද අභිඥාධිගමයද පරප්‍රතිජ්ඥාවන්ද ඡන්දසීසාදීන් චිත්තය මෘදුකිරීමද අධිෂ්ඨාන විකුබ්බනාදීවූ දශවිධ ඍද්ධි සම්පත් ආදියද නොහැකිව විදර්ශනොපදේශයන් නොලැබීමෙන් මාර්ග ඵල උපදවන්ට නොහැකි වෙති. එතකුදුඋවත් උත්සාහකළ මැනවැයි ප්‍රතිපත්ති ශීලාදිවූ ගුණ ධර්මයන් රක්ෂා කෙරෙමින් මත්තට හෙතු උපමැනවැයි ධ්‍යාන භාවනාදිය කෙරෙති. මෙසේ උත්සාහ කිරීමෙන් ඔභාස පමණකුත් නොලැබ කල් යත් යත් චතුපාරිශුද්ධි සීලය පමණක් රක්ෂා කෙරෙති එයින්කල් යත් යත් භික්ෂූහු සිතනකල සිල්රකිම්හ. භාවනා කරම්හ, මාර්ග ඵලයක් සිඩයොටගත නොහෙම්හ, මෙකලට ආර්ය ධර්ම ප්‍රතිවේධයක් නැත්තේ නියමයයි

කුසිතව අප කොතෙක් ප්‍රයත්නකළත් නොවන දෙයක්නොවන්
නේමය, තත්පරව වැසන විඳ කිම් දැයි ඔවුන් කොරෙහි වරද
නිවරද නොසොයා නිශ්ශංකව ක්‍ෂුද්‍රා නුක්‍ෂුද්‍ර ශික්‍ෂාපදයන් අව
දනේ මේ මෙපමණ සවල්ප වරදෙක්මය, එසිදු උනුන් දෙස්ගන්
වා කියා ගැලවීමට බුදුන් වදාළ ධර්මය ඇතැයි වදාළ ලෙසම ඔවු
නොවුන් පාමුල්හිදී දෙස්ගන්වා කියමින් සමගිවවෙසෙති එසින්
කල්ගිය කල සුඛිත මුදිතාදීහු සවකීය කායවැසන දීමට නොපිළි
වන්ව රූක්‍ෂ ප්‍රතිපත්ති පිරීමෙහි ප්‍රමාද විහාරී වෙති, ඔවුන් දුටු
තෙසුත් භික්‍ෂූහු ප්‍රතිපත්ති රක්‍ෂා කිරීමෙහි උත්සාහ නොවඩති,
රූක්‍ෂ ප්‍රතිපත්ති රක්‍ෂාකරන්නාවූ භික්‍ෂූන් රෑ දෙවෙහි සම විෂම
කල් නොදුන නිදිවර්ජිත කිරීම් ආදියෙන් ත්‍රිවිධ දොෂොත්
සන්නධාතු ක්‍ෂොභයෙන් ජීවිතක්‍ෂයට පැමිණීම් ආදිවූ වැසන
දැක දිවි රැක්ක සිල් රැකෙයි, සිල් රැක්ක නිවන් දහම් පසක්
කළ හැක්කේයයි කියමින් මෙහැම ආදීනව මෙනෙහි කොට
පිළිවෙත්පිරීමෙහි නිරුත්සාහවෙති. එතැන් පටන් ප්‍රතිපත්ති
ශාසනය පසු බැස බැස ප්‍රතිපත්තුපදෙශ පිරිහී විද්‍යමාන කාල
යාගේ අසාරත්වයෙන් ප්‍රතිපත්ති ශාසනය අන්තර්ධාන වෙයි. මේ
ප්‍රතිපත්ති අන්තර්ධාන නම්.

**පර්‍යාප්ති අන්තර්ධාන** නම් කවරගයත්? මේ පර්‍යාප්ති අන්
තර්ධානය නම් සකල ලොකාවබොධය පිණිස කරුණා නිධානවූ
බුදුන්විසින් දෙශනා කළාවූ ත්‍රිපිටක ධර්මයාගේ නොපැවැත්මයි.
ඒ සපර්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මය පවත්නාකල්හි ප්‍රති
වෙධශාසනය ප්‍රතිපත්තිශාසනය පර්‍යාප්තිශාසනයයියන ත්‍රිවිධ
ශාසනයම පවත්නේනම්වේ, ඒ ත්‍රිපිටකධර්මසංඛ්‍යාතවූ පර්‍යාප්ති
ශාසනය පිරිහෙන්ටවන්කල්හි මේකලියුගකාලයෙහි ධර්මවිපර්‍යා
සයෙන් කල් යත් යත් උපන් සත්වයාගේ කාල සම්පත්ති විපාක
විශෙෂය දැනය පිණිස ලොකපාල දෙවතාවන්ගේ චිත්ත කාරු
ණ්‍යය මඳ වෙයි, එසින්ම සූර්‍ය්‍ය චන්ද්‍ර රාශි නක්‍ෂත්‍ර තාරකාදීහු
විෂමව පවතිති, එසේකල්හි කලින්කලට ලොකානුශාසකවූ පෘථි
වීශ්වරයන්ගේ චිත්තය කැළඹී සත්ව කාරුණාව මඳ වෙයි, ඔවුන්
එසේ රාජ ධර්මයෙහි නොපවත්නා කල්හි රාජ අමාත්‍යයෝ අධි
කරණ ශාස්ත්‍ර ව්‍යවහාර ක්‍රමයෙහි නොපැවත අධාර්මික වෙති, ඒ
අමාත්‍යවරුන් විශිෂ්ටන්‍යායමාර්ගයෙහි නොපැවැත්මෙන්ජනපද
ධිපතිහු අධාර්මික වෙති, ඔවුන්ගේ අධර්මතාවෙන් ජනපදවාසීහු
අධාර්මිකවෙති, මෙහැමදෙනාගේ අධර්මතාවෙන් වස්ස වලාහකා
දීවූ දෙවතාවෝ අධර්මිෂ්ඨව කලට පවත්නා මෙඝ පවනාදීහු
සම්‍යක්වර්තනයෙන් නොපවත්නාහ, එසේකලට වැසිනොවස්නා

කල්හි ශස්‍ය රොපණාදියට කල් වරදනේය. කල් වරදවා කළාවූ හැම ශස්‍යයෝ කලට නොපැසෙති, එසේ කල්හි රාජ්‍යය දුර්භික්ෂ වන්නේය, ඒ දුර්භික්ෂතාවෙන් සත්වයෝතුමූද කලට වේලාවට අන්නපානාදිය ලැබගත නොහී ශරීර ධාතු පරිවර්තනයෙන් ක්ලාන්තව භික්ෂාචාරයෙහි නියුක්තව සංචාරණය කරන්නාවූ ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට ප්‍රත්‍යයෙන් උපස්ථාන කොටගත නොහෙන්නාහ, ඒ කාරණයෙන් ප්‍රත්‍යය ලැබගත නොහෙන්නාවූ භික්ෂුහු අන්තේවාසිකාදීවූ පර්ෂත් සංරක්ෂණය කොටගත නොහෙන්නාහ, එසේ ගුරුවරයන් විසින් ප්‍රත්‍යය දී රඳවාගත නොහෙන කල්හි ප්‍රත්‍යයෙන් මර්දිතවූ අන්තේවාසිකයෝ ප්‍රත්‍යය එෂණයෙන් සෙවජ්ජාවෙහි ඇවිදිනාමුත් ගුරුන්ගේ ශික්ෂාවෙහි හැසිර උවමනා පර්යාප්ති ධර්මය පුහුණුකොට සට්ඨකථා වශයෙන් ධැරීමට නොපිළිවන් වෙති, පාළි වසයෙන්ම ධරා සට්ඨකථා බැවහාර වැවඟින කෙරෙති, ඉක්බිති කල් යත් යත් පාළියද හැම ධරන්ට නොපිළිවන් වෙති, එසේ හෙයින් ගම්භීරවූ **අභිධර්ම පිටකය** පළමුවෙන් පිරිහෙයි, ඒ ප්‍රථමයෙන් පිරිහෙන්නාවූ අභිධර්ම පිටකයෙනුත් පළමුව **පට්ඨාන ප්‍රකරණය** පටන් **යමකය**, **කථාවස්තුය**, **පුග්ගලප්‍රඥප්තිය**, **ධාතුකථාය**, **විභඞ්ගය**, **ධම්මසඞ්ගණිය**යි විජම්පිටකය ප්‍රතිලොමයෙන් ප්‍රකරණාග්‍රයෙහි පටන් මූලාවසානකොට ක්‍රමයෙන් පිරිහෙයි, මෙසේ අභිධර්ම පිටකය ප්‍රතිලොමයෙන් පිරිහුණු කල්හිද **සූත්‍ර විනය පිටක** දෙක නොපිරිහී සිටිනාතෙක් පර්යාප්ති ශාසනය නොපිරිහුණේ නම් වෙයි, එයින් **සූත්‍රපිටකය** පිරිහෙන්ට වන්කල්හිද ප්‍රකරණ පරිච්ඡෙදාග්‍රයෙහි පටන් ප්‍රතිලොමයෙන් ක්‍රම ක්‍රමයෙන් පිරිහෙන්නේ; ප්‍රථමයෙන් **අඞ්ගුත්තර නිකාය** තෙම **එකාදසක**යෙහි පටන් **එකකය** දක්වා ප්‍රතිලොමයෙන් පිරිහෙන්නේය, ඊට අනතුරුව **සංයුක්ත නිකාය** තෙම **චක්කපෙය්‍යාල** ක්‍රමයෙන් අගපටන් මූල **ඔඝතරණ** සූත්‍රය දක්වා ප්‍රතිලොම ක්‍රමයෙන් පිරිහෙන්නේය, ඊට අනතුරුව **මධ්‍යම නිකාය** තෙම **ඉන්ද්‍රිය භාවනා** ප්‍රකරණයෙහි පටන් මූල**පරියාය** සූත්‍රය දක්වා ප්‍රතිලොම ක්‍රමයෙන් පිරිහෙන්නේය, ඊට අනතුරුව **දීඝ නිකාය** තෙම **දසොත්තර**සූත්‍රය පටන් **බ්‍රහ්මජාල** සූත්‍රය දක්වා එසේම පිරිහෙන්නේය, ඒ දීඝ නිකායෙහි මූල බ්‍රහ්මජාල සූත්‍රය පිරිහුණු තැන්පටන් සූත්‍රපිටකය හැම පිරිහුණේ නම් වෙයි, එතකුදුඋවත් භික්ෂුහු **විනයපිටකය** හා **ජාතක** පමණක්ම ධරති, ඉනුත් විනයපිටකය පරලොකාධ්‍යාශයඇත්තාවූ ලජ්ජී භික්ෂූහුම ධරති ලාභ ලබනු කැමති ලාමකභික්ෂූහු සිතනාකල ගැඹුරු බණ කිවයි කාවුරු අප කෙරෙහි පහදිද්ද, එසේ බණකීමෙන් ප්‍රයොජන කිම්ද, ඔවුන් සිත්ගෙන ලඟන්වා බණ කියම්හයි සිතා, බොහෝ

සේ ජාතක බණ පුහුණු කොට බණ අසනු කැමැත්තවුන් සිත් ගෙන බණ කියති, එසේ කල්‍යාමෙන් ඒ ජාතක බණ නිපුණව ධැරීමට නොපිළිවන් වෙති, එසේ හෙයින් පළමුකොට වෙස්සන්තර ජාතකය පිරිහෙයි, එතැන්පටන් දසජාතකාදිය පිරිහී මූල අපණ්ණක ජාතකය දක්වා සියලු ජාතකම පිරිහෙයි. එයින් මැත භාගයෙහි විනයපිටකය පමණක් ධරති, එතාක්කල් පර්‍යාප්ති ශාසනය පිහිටියේ නම් වෙයි, නැවත ඒ විනය පිටකයෙහුත් පරිවාර ප්‍රකරණය පටන් ප්‍රතිලෝමයෙන් පිරිහෙමින් අවුත් ඛන්ධකවිභඞ්ග දක්වා පිරිහී කංඛාවිතරණී ප්‍රකරණ මාත්‍රයක් ධරති, ඒ තැන් දක්වා පර්‍යාප්ති ශාසනය නොපිරිහුණේ නම් වෙයි, ඒ කංඛාවිතරණී ප්‍රකරණයද පිරිහී මනුෂ්‍යලොකයෙහි සතරපදයෙන් යුක්ත ගාථාවකින් විභාවූත් බුද්ධගුණයෙක් පවතීනම් ඒ තැන් දක්වා ශාසනය පවත්නේනම්වෙයි, යම් දවසක ශ්‍රද්ධාවන්ත රජෙක්තෙම බුදුගුණ අසන්ට උවමැනවැයි සිතා ධම්කාමිකයක්හු පරීක්ෂාකොට නොලැබ දහසින් බඳ පියල්ලක් ඇතුපිට තබා බුදු බණින් ගාථාවක් පමණ දත් කෙනෙක් මෙ දහසින් බඳ පියල්ලගෙන බණ කියවයිකියා නුවර බෙර ලවාත් එසේ ධම් කාමිකයක්හු නොලැබ එතකුදුඋවත් තුන්විටක බෙර ලැවූ කල ඒ දහසින් බඳ පියල්ල ගෙන බණ කියන්නක්හු නොලැබ ඒ දහසින් බඳ පියල්ල ගෙනවුත් රජගෙයි කොෂ්ඨාගාරයෙහිම තබනලෙස පාවාදෙද්ද මෙසේ නොයෙක් ප්‍රයත්න කිරීමෙන් බණ දන්නා කෙනෙකුන් ලැබගත නොහෙන කල්හි පර්‍යාප්ති ශාසනය අන්තර්ධානවූයේ නම්වේ. මේ පර්‍යාප්ති අන්තර්ධාන නම.

ලිඞ්ග අන්තර්ධාන නම් කවරහයත්? මේ ශාසන පිරිහීමෙන් කල් යත් යත් භික්ෂූහු සිවුරු වළඳනාකල ශික්ෂාපද පැනවූලෙස නොවළඳිති, ගන්තපාදදීවූ ඉන්ද්‍රිය සංයමයෙන් සත්පුරුෂයන් හා විනයඥ උපාසක ජනයන්ට ප්‍රසාදවහ නොවෙති, භික්ෂූහු පාත්‍රය පසියෙහි බහා ග්‍රීවයෙහි එල්ලාගෙන භික්ෂා වෘත්තියෙහි හැසිරෙති, එයින් කල යත් යත් පාත්‍රය අත්ලෙහි තබ, ගෙන හෝ සාල්ලෙක තබාගෙන හෝ අලාබු පාත්‍රයදරන තීර්ථකයන් මෙන් භික්ෂාවෘත්තියෙහි හැසිරෙති වළඳනා සිවුරුත් රඳගන්නා කල විනයානුකූල ලෙස සරුප් සැටියේ නොරඳති, රඳගත් ඔටු ඇට ප හැයක් මෙන් මඳක් කාෂාය වර්ණ හෙද කොට රඳනා පමණකින්ම මඳදූයි කියා සිවුරෙහි අගෞරවයෙන් කැප ලෙස නොරඳම සිවුරු වළඳති, තවද කල්‍යාමෙන් එපමණක් රඳන් නොකොට කඩෙහි දූවදු පමණක් සිඳ හැර දියත්තකින් තෙමා කැළල කොට වළඳන, එයින් කල්ගිය කල්හි නැවත දනවලූ පම්

ණක් සිඳ හැර පරිව්‍රාජකයන් මෙන් වස්ත්‍රය දෙපට කොට හිණමට පොටක් දවටා පොටකින් උරය වසා පෙරවගෙන දඬු බිමට යන්නාවුන් මෙන් භික්ෂුම්හයි ඇවිදිති. තවද කල් යත් යත් මෙපමණකිනුත් ප්‍රයොජන කිම්දැයි වස්ත්‍රය හැඳගෙන කසා කඩ රෙද්දක් බොටුවෙහි බැඳගෙන හෝ ඉස වසා බැඳගෙන හෝ භික්ෂුම්හයි ඇවිදිති, එපමණ භික්ෂු භාවයකින් සපුත්‍රදාරාදී තුමූ සැපයෙන් ජීවත්වගතනොහී කෘෂි වණිජාදීවූ අගාරික කර්මාන්තයෙන් ජීවත්වෙති, එතැන් දක්වා ඔවුන්ට දන්දෙන්නාහු: සංඝයා උදෙසා දක්ෂිණාවදෙද්ද එසේ කල්හී ඒ දානය සංඝයා උදෙසා දුන් හෙයින් දායකයන්ට අසංඛෙය්‍ය අප්‍රමෙය විපාකදෙන්නේයයි **ආනන්ද** ස්ථවිරයන්වහන්සේට වදාරන බුදුරජතෙම:

“භවිස්සන්ති ඛො පනානන්ද අනාගතමද්ධානං ගොත්‍රභුනොකාසාවකණ්ඨා දුස්සීලා පාපධම්මා, තෙසු දුස්සීලෙසු සංඝං උද්දිස්ස දානං දස්සන්ති, තදා පහං ආනන්ද සංඝගතං දක්ඛිණං අසංඛෙය්‍යං අප්පමෙය්‍යං වදාමි,,යි.

සංඝගත දානයෙහි අනුසස් මහත් බව වදාළසේක, එයින් කල් යත් යත් ඔහු සිතනකල අපි ප්‍රාණඝාතාදි අකුසලුත් කරම්හ, සී වප් ආදීවූ කෘෂි කර්මාන්තාදියත් කරම්හ' මෙසේ ශ්‍රමණ වෙෂයට පිටත් නොපනත් කෙරෙමින් අහිත් ධජය කරලා බැඳගෙන ඉඳ පව් පුරාගන්නේ කිම්දැයි බොටුවෙහි දවටාගත් කසා කඩරෙද්ද කඩා කැලෑවට දමා දෑතින් හිස පිරිමැද ඉදින් යහපත ගත්වෙෂයෙන් මිදී ගියම්හයි ස්වකියවූ ගෘහයට ගොස් පුත්‍රදාරවන්ට එපවත් කියා එතැන්පටන් ශ්‍රමණ වෙෂයෙන් මිදී තමන්ගේ පුත්‍රදාරාවන් රක්ෂා කොට ජීවත් වෙති. මේ ලිඞ්ග අන්තර්ධාන නම්වේ.

**ධාතු අන්තර්ධාන** නම් කවරහයත්? සම්‍යක් සම්බුද්ධවරයන්ගේ ක්ලේශ පරිනිර්වාණය, ස්කන්ධ පරිනිර්වාණය, ධාතු පරිනිර්වාණ යයි ත්‍රිවිධවේ, එයින් ක්ලේශ පරිනිර්වාණය බොධි මූලයෙහි වැඩහිඳ මාරබල ප්‍රලයකොට අලුයම ලොවුතුරා බුදුවූ ක්ෂණයෙහිම සිද්ධවිය, ස්කන්ධ පරිනිර්වාණය වෙසඟ මස මැදි පොහොදවස් විසා නකතින් **කුසිනාරා** නුවර මල්ල රජුන්ගේ **උපවත්තන** නම් සාලවනොද්‍යානයෙහි යුග්ම ශාලාභ්‍යන්තරයෙහිදීම විය. ධාතු පරිනිර්වාණය එන දවස බොධි මූලයෙහිදීම වෙයි. **ඒ කෙසේදයත්?** මේ බුද්ධ ශාසනය පන්දසක් අවුරුදු පැවතිකල සත්වයන්ගේ ශ්‍රද්ධා බුද්ධි මඳවීමෙන් පූජා සත්කාර නොලබන්නාවූ ධාතුවරුන්වහන්සේ බුදුන් සදිවියෙහි කළාවූ අධිෂ්ඨාන ලෙසම පූජා සත්

සාර කරන්නාවූ ස්ථානවලට රැස්ව ගොස් මේ ලංකාද්වීපයෙහි
සිඬස්ථානවලට රැස්වෙමින් ඉනුත් අනුරාධ පුර නුවර රුවන්
වැලි මහසෑය රැස්ව එතනින්නික්ම නාගද්වීපයෙහි රාජායතන
නම් චෛත්‍යයට රැස්වෙමින්, මෙසේ බුදුන්ගේ අධිෂ්ඨානවූ ලෙ
සම රැස්වූහැම ධාතුවරුන්වහන්සේලාම ඒ රාජායතන චෛත්‍ය
යෙන් නික්ම අප රාජිත ස්ථානවූ බෝධි මණ්ඩයෙහි ශ්‍රීමහා බෝ
ධින්වහන්සේට පිටලා පූර්ව දිසාභි මුඛව වජ්‍රාසනාරූඪව බුදුන්
බුදුවන්ට වැඩ උන් දවස් මෙන් දිව්‍ය බ්‍රහ්ම නාග භවනාදී හැම
තැන්හි වැඩහුන් ධාතුවරුන්වහන්සේලා හැම රැස්ව තම තමන්
වහන්සේලා බුඬ ශරීරයෙහි පිහිටියාවූ ස්ථානනොවරදවාම ලලා
ට ධාතු අකු ධාතු දන්ත ධාතු ග්‍රීවා ධාතු ආදීවූ හැම ධාතුවරුන්
වහන්සේලාම ශරීර අවයව නොවරදවා පිහිටමින් දෙලොස්රි
යන් බුඬ ශරීර මවාගෙන බෝමඬ බුඬලීලායෙන් වැඩඋන් කල්හි
ධාතු ශරීරයෙන් සවණක් ඝන බුඬරශ්මි මාලාවන් දස දිග විහි
දුවා සියලු ලොව වසන්ට වන්කල්හි ඒ දුටුවාවූ දිව්‍ය බ්‍රහ්ම නාග
සුපර්ණ යක්ෂරාක්ෂසසිඬවිද්‍යාධරාදීහුඅපබුදුන්ගේධාතුපරිනිර්වාණය
අද්දවස් වන්නේයයි මහත් සංවේගයට පැමිණ ධාතු කෙතකුන්
වහන්සේ මෙසින්මතු දර්ශනයෙක් දුර්ලභය. එසේහෙයින් මෙ අන්
තිම දර්ශනයෙහි අපගේ ඓශ්වර්ය්‍ය පමණින් ශක්තිපමණින් පූජා
කොට මේ පශ්චිමදර්ශනය දක එම්හයි උනුන්හට කිය කියා පම
සුද්ධාවාසයන් හැර දස දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මාදීහු ඇසිල්ල
කින් බෝධි මණ්ඩයට රැස්ව පුෂ්ප දීප ධූප නෘත්‍ය ගීතවාද්‍යාදීන්
අප්‍රමාණවූ පූජාවට පටන්ගෙන බුදුවූ දවස් මෙන් බුදු මඟුලට
පටන්ගත් කල්හි,ධාතුරූපයද ඔවුන්ගේ ප්‍රසාදෞන්මත්‍ය භාවය
අධික වන ලෙස ප්‍රාතිහාර්ය්‍ය දක්වා ඒ ප්‍රාතිහාර්ය්‍යට අනුවම නැ
වත දක්වන්නාවූ ප්‍රාතිහාර්ය්‍යයක් මෙන් පලක්බැඳ වැඩහුන්ධාතු
ශරීරයෙන් ජ්‍යොතිස්ස්කන්ධයෙක් උද්ගතව බ්‍රහ්මලොකයදක්වා
පැන නැගී මහත් අද්භූත ප්‍රභා දක්වමින් ධාතු ශරීරය ආදාහන
කෘත්‍යය කොට ධාතු ස්කන්ධයෙන් මඳකුත් ශෙෂ නොකොට කර්
පූර ප්‍රදීපයක් නිවුණාක් මෙන් ශාන්තවූකල්හි ඒ හැමප්‍රාතිහාර්ය්‍ය
දුටු දිව්‍ය බ්‍රහ්මාදීහු චිත්ත ඛෙදයටපැමිණ “අහො බුඬො අහො
බුද්ධො” යනාදීන් අපමණ පරිදෙව රාවයෙන් ප්‍රකාතාව මහ පව
ණින් ඇලලී ගිය සවර්ණමහීරුහ නිකරයක්මෙන් එකාහෙළා කම්
පිතව බෝධිමණ්ඩය ක්‍ෂුභිතකොරෙමින් අනිත්‍යාදීන්ප්‍රතිසංයුක්ත
අමුතක ගීතිකාවෙන් භූමියෙහි පටන් බ්‍රහ්මාණ්ඩය දක්වා දස
දහසක් සක්වළ එක නින් නාද කෙරෙමින්, කිමෙක්ද සබදිනි

බලව අද දවස් බුද්ධ ආලෝකය භවාන්ධකාරයෙන් ප්‍රච්ඡන්න විය, බුද්ධශ්‍රිය ගව අසාරයෙන් නිඃශ්‍රීක විය, බුද්ධ තේජස භව තිමිරයෙන් මලින විය. බුද්ධාංශුව භව තමඃ සකන්ධයෙන් අන්ධවිය, බුද්ධ කීර්තිය භවච්ඡායාවෙන් ලීන වීයයි, මෙසේ මුළු ලොවට පැමිණි අද්භූතාන්ධකාරය කවර දවසක පහව ජගදාලෝක වේදැයි කිය කියා වීප්සා පෘච්ඡාවෙන් අමුසානවූ මුඛ ඇතිව ඒ ස්ථානය නොයෙක්විට ප්‍රදක්ෂිණා කොට පසඟ පිහිටුවා වැඳ මෙයින් මතු මෙමෙනත්‍රා බුදුන්දකිමෝවයි කියමින් මුව නොපොහොනාලෙස ප්‍රාර්ථනා කොට තම තමන්ගේ නිවාසස්ථානවූ දිව්‍ය බ්‍රහ්ම භවනාදියට ගොස් දිව යහන් මුදුනෙහි පවා නොහිඳ චිත්ත ව්‍යසනය චඞ්ක්‍රමණාදීන් සංහිඳුවා කල්යාමෙන් දිව්‍යශ්‍රී විඳ ප්‍රමාදව සිහි මඳව තම තමන්ගේ චිත්තානුකූලලෙස ස්වකීයවූ දිව්‍යශ්‍රී අනුභව කරන්නාහ, මෙසේ බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ආර්‍ය්‍ය ශ්‍රාවකයෝද අසංඛ්‍යායුෂ්ක චක්‍රවර්ති රජහුද කල්පායුෂ්ක බ්‍රහ්මයෝදැයි යන මෙකී සියලු සත්ත්වයෝම එකාකාරයෙන් නොපවත්නාහුය එසේහෙයින් සියලු සත්ත්වයන් විසින්ම අනිත්‍යාදිය මෙනෙහිකොට නිරන්තරයෙන් භාවනා කෙරෙමින් කෙලෙසුන් නැසීමට උපදෙස තබා දිව්‍ය මනුෂ්‍යසම්පත් වළඳ නිවන්දකින්ට උත්සාහකටයුතු.

**දක්වනලද මැයි-**

"ඉති විහිතවිචිත්තාසෙසලොකත්ථචාරො
තිභවපතිමහිද්ධී ධම්මරාජා මුනින්දො,
රවිසතජුතිසොභො සො පි යාතො විනාසං
මරණමකරුණං තං කං හි ලොකෙ ජහෙය්‍ය."

**මෙතෙකින් මේ සද්ධර්ම රත්නාකරයෙහි**

**පංච අන්තර්ධාන නම්වූ**

## දසවන පරිච්ඡේදය

**කියා නිමවන්ලදී.**

# 11 වෙනි පරිච්ඡේදය.

---

**තවද මේ සඬම රත්නාකරයෙහි පංච අන්තර්ධානයට අනතුරුව චක්‍රවර්ති විභාවන නම් කවරහෙයක්?**

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**හේ කෙසේදයත්?** සමස්ත ලෝකවාසී සත්වයන්ගේ කර්මානු කූල ලෙස ජනිතවූ මහදිව් කොදිව් හිමව් කුළපව් මෙර සයුරු ආදිය එකහෙළා එළි කල දිනිඳු තිසයුරුකර පතුරුවා පවත්නා තැන් සක්වළෙක් නම් වෙයි. මෙසේ පවත්නාවූ අගණිත චක්‍රවාළාන්තරවලින් බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ ආර්‍ය්‍යශ්‍රාවක චක්‍රවර්ති නරෝත්තමයන්ට ජන්මවූ මේ මඞ්ගල්‍ය චක්‍රවාළය සර්ව ගුණානු භාව යෙන් උත්කෘෂ්ටවිය. එසේ හෙයින් මේ චක්‍රවාළාන්තරයෙනුත් ජම්බුද්වීපය විශිෂ්ට වූයේය. මෙබඳුවූ සක්වළෙහි එක්කලට චක්‍රව ර්ති රජහු දෙදෙනෙක් නූපදනාහුය. එසේ උපදනාහුද ශූන්‍ය කල්පයෙහි නූපදනාහුය. බුදු පසේ බුදු මහරහතුන් උපදනා අශූන්‍ය කල්පයෙහිම උපදනාහුය අශූන්‍ය කල්ප නම්: **සාරකල්පය, මණ්ඩ කල්පය,** වර කල්පය, **සාරමණ්ඩ කල්පය, භද්‍ර** කල්පයයි යන පස්වැදෑරුම්වූ කල්පම අශූන්‍ය බැවින් චක්‍රවර්ති රජහුද මේ පච කල්පයෙහිම උපදනාහුය. ඉනුත් එක මහා කල්පයක අසංඛ්‍ය කල්ප සතරක් හෙයිනුත් එක අසංඛ්‍ය කල්පයක විසි අන්තඃ කල්ප හෙයිනුත් ඒ විසි අන්තඃ කල්පයෙන් යම් අන්තඃ කල්පයක බුදුකෙනෙකුන් වහන්සේ උපදනාසේක් වීනම් ඒ අන්තඃ කල්පයෙහිම චක්‍රවර්ති නරෝත්තමයෝත් ප්‍රාදුර්භූත වෙති, එහෙකුදුඋවත් සර්වඥවරයන් හා චක්‍රවර්ති රජහු එක්කලෙක නොපැළඹෙන්නාහුය. එක්කල්ම උපනත් බුදුන් ලොවුතුරු බුදු වන කාලයට චක්‍රවර්ති රජහු කලුරිය හෝ කෙරෙති, නොහොත් බුදු සසුන් වැද මහණවෙති, තවද බුද්ධප්‍රත්‍යෙක බුද්ධ අර්‍ය්‍ය ශ්‍රාවකයන් හා චක්‍රවර්ති මහරජහු මේ මඞ්ගල්‍ය චක්‍රවාළයෙහි මුත් ප්‍රත්‍යන්ත චක්‍රවාළයෙක නූපදනාහ. මේ මඟුල් සක්වළිනුත් දෙදහසක් කොදෙව්හා පූර්වාපර උතුරුකුරු දිවයිනැයි යනහැම දිවයින්වල නූපදනාහුය මේ ජම්බුද්වීපයෙහිම උපදනාහුය. මේ ජම්බුද්වීපයෙහුත් ත්‍රිවිධ මණ්ඩලය හැර ප්‍රත්‍යන්ත දෙශවල් නූපදනාහුය.

**චක්‍රවර්ති** රජහුනම්: පූර්වයෙහි සමුපචිත අප්‍රමාණ කුසලසම්භාරයන් ඇතිව පෙෘෂධාඞ්ග ශීලාදිය රක්‍ෂා කිරීමෙන්ද ධ්‍යාන භාවනාදිය කිරීමෙන්ද කාමාවචර රූපාවචර කුසලයන් පූර්වයෙහි රැස්කොටතුබුවාවූ අපරාපරිය වෙද්‍යකර්ම ආදීන් බොහෝ

කොට එකවිට විපාක දෙන්ට සුදුසු කාලෙක්හි උභය කුල පරිශුද්ධ ලොක පූජ්‍යවූ රජකුලයෙක ඉපද කුමාර පෙළහරින් වැඩිවිය පැමිණ යුවරාජ පදප්‍රාප්තව සකල ජම්බුද්වීපයෙහි චීපචවක්‍රවර්ති රජව දසරාජ ධර්මය නොවරදවා පිළිපැද චතුස්සංග්‍රහ වස්තූවෙන් ප්‍රජා පාලනය කෙරෙමින් දානසීලාදිවූ දසවිධ සක්විතිවත් පුරා දැහැමෙන් රජ සිරි විඳිමින් කල් යවනසඳ, එක් දවසක පුර පසළොස්වක තරුණ සූර්යොදයෙහි ලක්ෂයක් වස්තුවියදම් කොට මහ දන් පවත්වා ෂොඩශ ඝටයක් සුගන්ධොදකයෙන් ඉස්සොධා නහා සතසහස්‍ර අර්ඝනක අතිධවල ශ්වෙතාම්බරච්ඡාදනයෙන් අනෙකප්‍රකාර රසාද්‍රවූ සූප ව්‍යඤ්ජනාදි දිව්‍ය භොජනයක් හා සදෘශවූ සවයඤ්ජාත සුවඳරත්හැල් සහලේ බත කල්තබා මෙහෙ නිමවා, පොෂථාඞ්ග සීල සමාදානයෙන් නානාප්‍රකාර සම්පත්ති නිකරයෙන් සාර ප්‍රසාදකර ප්‍රාසාදයෙහි අතුළ මතු මහල් තලයට පැනනැගී සුවඳ තෙල් වතළ රන්වැට ප්‍රදීප ජාතිරඞ්ග මාණික්‍ය ප්‍රභාවයෙන් දීප්තිමත්වූ ශ්‍රීයහන් ගර්භයෙහි කුඳ පුෂ්ප රාශියක් හා සදෘශවූ පාණ්ඩරාම්බරාදීන් විචිත්‍ර ආස්තරණයෙන් විරාජමානවූ ශ්‍රී යහන් මස්තකාරූඪව සුබද්ධ පර්ය්‍යඞ්කයෙන් හිඳ ක්ෂීරාර්ණවයෙන් උද්ගතවූ ළහිරු ප්‍රභාධර උත්තර සාටකයක් එකාංශ කොට බහා දාන සීලාදී කුශල ධර්මයන් ආවර්ජනා කෙරෙමින් උන්කල්හි, ඔවුන්ගේ පූර්වොපචිත කුශලානුභාවයෙන් **චක්‍ර රත්නය** පහළවෙයි. **කෙසේදයත්?**

සර්වාකාර පරිපූර්ණවූ ඉන්ද්‍රනීලමය නාභියක් ඇතිව ඒ නාභි මැද රිදීමයවූ කර්ණිකා වට සුදු සිනිඳුවූ දන්ත පන්ති ඇතිව මැද සිදුරු චඳ මණ්ඩලයක් මෙන් වෘත්තව සුභ්‍රවූ එහි දෙපස බාහිරන්තරයෙහි රජතපට්ටයකින් පරික්ෂෙප සාළාක්මෙන් විභාගවූ ඒ නාභි පණාලියගේ පරික්ෂෙප පට්ටයෙහි යුක්තාන යුක්ත ස්ථානවල පරිච්ඡෙද රෙඛාවෝ විභාගවදක්නා ලැබෙති. සර්වාකාර පරිපූර්ණවූ නාභියෙන් මත්තෙහි නිම්වළලු වෙයි. ඒ නාභි කෙළවර යට නිම්වළල්ල දක්වා සප්ත රත්නමයවූ දහස් ගණන් අරයෝ සූර්ය්‍ය රශ්මිමෙන් ප්‍රභාස්වර ස්වභාවයෙන් ලීලොපෙතවසිටිනාහ, එහි අතරතුර නීල පීත ලොහිතාවදාත මාඤ්ජෂ්ඨ ප්‍රභාස්වරවූ ෂට්වර්ණ ද්‍යුතියෙන් හා, එහි අතුර තුර දිව්‍යමයවූ නානාවර්ණ රෙඛා දහස් ගණනින් ශොභමාන විය. ඒ රෙඛා මිශ්‍ර වර්ණ රශ්මියෙන් හා ඒ රශ්මි අග මුතු පබළු රන් රිදී බිඳු එපමණම වෙයි. නිම්වළලු වට පෙළින් පෙළදිව්‍යමයවූ නොයෙක් පැහැඇති පූර්ණඝට පන්තියද, එහි දෙපස තොඩුවෙක වටින්වට ගසා කෙවීති තබා එබූ ගල් පන්තියෙක් මෙන්ද වෘත්තායත ත්‍රිකොණ චතුරස්‍ර මාණි

ක්‍යයෝ උන්නතව නිම්වළලු අතුරතුර පෙළින් පෙළ සැදීසිටිති.
ඒදිව්‍යමයවූ නෙමිමඬුලු හැමබාලක් රශ්මි කලාපපසන්තීන්මෙන්
අතිරක්ත සිනිදු ජොතින් නෙත් බමවා කඳුලු ගන්නා තරම්
ප්‍රභාසම්පන්නව විද්‍රැමමය වූවාහුය. එහිඅතුර ජාම්බොනද කනක
වර්ණවූප්‍රභාස්වර රන්රේඛාවෝ මොනවට විභාගකොට පෙනෙන්
නාහුය. සර්වාකාර පරිපූර්ණවූ නෙමි වෘත්තය පිට දසයක් දසයක
ට අතුරෙහි එකක් එකක් බැගින් ස්වභාවයෙන්ම පිඹිනා වස් කු
ලල් මෙන් ඇතුලතින් සිදුරුව විචිත්‍රවූ ජිද්‍ර මණ්ඩලිකායෙහි ප
වන්ගෙන පඤ්චාඞ්ගික තූර්යනාදයක් මෙන් මධුරධ්වනි පවත්නා
වූ මනහර පබළු දඬු සියයකින් හා ඒ ප්‍රවාලයෂ්ටි මස්තකයෙහි
ක්ෂීරාර්ණව මථනයෙන් උද්ගතවූ දුඩබුබ්බුලශ්‍රේණියක් මෙන් අති
ධවලවූ ධවලාතපත්‍ර ශතයක් හා එසේ සත්දෙපස දිව්‍යමයවූ නා
නාවර්ණ පුෂ්ප දමානුබඩව ලීලොපෙතවූ රත් කොන්ත දෙසිය
යකින් සැදුම්ලද්දේය, මැද නෙමියෙන් පරික්ෂෙපවූ නාභි පණා
ළියගේ අනෙතාභාගයෙන් උභය පාර්ශ්වයෙහි සිංහ මුඛ දෙකෙක්
වෙයි. ඒ සිංහ මුඛ දෙකින් තරුණ තාලකඛණ්ඩප්‍රමාණ චන්ද්‍රමරීචි
ස්කන්ධමෙන් ප්‍රභාසම්පන්නවූ මුතුලැල් කඳු දෙකෙක් නික්ම ලඹ
දෙයි. ඒ මුක්තාලතිකාග්‍රයෙහි ළහිරුමඩල දෙකක් මෙන් අති
රක්තවූ ජලස් හුවට දෙකක්බබළයි. මෙසේ ඒ පංචානනාහානතම
යෙන් නිගීතවූ මුතුලැල් කඳු දෙක චක්‍රරත්නය පරිවර්තනයෙන්
නික්මුණු කල්හි දෙපිටින් චක්‍රරත්නදෙකක්සේ ආවර්තියවෙමින්
එක්ව දිවන රථසක් තුනක්සේ දුටු දුටු දනන් සිත් පහදවත්ය.
මෙසේ ඒ චක්‍රවර්ති මහරජුන් සත්විතිවත් පිරූ බොහෝ දවස්
නගරවාසීන් රාත්‍රි භොජනානු භවකොට ස්වකීය ස්වකීයවූ ගෘහ
ද්වාර වල සාමීචි කථායෙහි නියුක්තව හිඳ තම තමන්ගේ ප්‍රෙම
කරු තරුණ පුත්‍රාදීන්පිපි චතුෂ්කාදියෙහි කෙළනවුත් බල බලා
හිඳිනා කල්හි උදයගිරි පර්වතයෙන් ශාර්වරිප්‍රමදාම ප්‍රලොභ කර
වන්නාක්මෙන් මඳින් මඳින් චන්ද්‍රකාන්ති විහිදින්ට වන්කල්හි
ඒ චන්ද්‍රබිම්බයාහා සමග චක්‍රරත්නයද උද්ගතවෙමින් ස්වයන්ට
දෘශ්‍යමානව දීප්තිමත් විය.

එකල්හි පූර්ව දිශාභාගය බැලූ ජනයෝ එම්බාසබඳිති මෙකවර
ආශ්චර්යයෙක්ද, තෙලෙ බලාගනු පින්වත්නි පෙර එසැම පූර්ණ
චන්ද්‍රයෙක් උද්ගතවෙයි. අද දවස් පූර්ණ චන්ද්‍රයෝ දෙදෙනෙක්
පාණ්ඩර තිසර විවුනයක් මෙන් ඉදිරිපසු-වොව වියත් පයොද්
ගත වූහයි තෙලෙප සමහරකෙනෙක් කුමක්කියවුද, මඳයෙනි
කවර කලෙක්හි එකවට චන්ද්‍ර බිම්බ දෙදෙනෙක් ගගනතලයෙහි
පැන නැංගා දුටුද, එනම් කවරබසෙක්ද මෙතෙම තපනීයප්‍රභා

සමූහයන් දේවානුභාවයෙන් මාදුවයට පමුණුවාගෙන චන්ද්‍රයා
මෙන් අමෘත රශ්මීන් මුළුලොව සිහිල් කළ මැනවැයි කියාදෝ
හොයි වෙස්වලා පැමිණි සූර්ය මණ්ඩලයෙකැයිකියති. හෙද අති
කොකැයි කියා කිසිවෙක් කියනුවෝ: කොල උමතුවීද දූන්ම
හිරු අස්තගිරි ප්‍රාප්තවූයේ වේද, මෙම ඇසිල්ලෙහිම ශීඝ්‍ර ගමන්
ඇයි චන්ද්‍ර බිම්බය පසුපස්සෙහි ගොස් එක්ව ගතිද, හේ කවර
නම් බසෙක්දැයි යෙති සමහරු නොවෙයි බල ඒ හැම කුමන
බස්ද, මේතෙම කිසිවක්හුගේ කුසලානුභාවයෙන් පහළවූ සත්
රුවන්මය දිව්‍ය විමානයෙකැයි කියති. ඒහැමදෙනා කියන්නාවූ
වචනයන්ට අපහාස කොට ප්‍රඥවන්තයෝ කියන්නාහු: තෙපි
බොහෝ කොට ප්‍රලාප නොදෙඩව, මේ තෙම එකාන්තයෙන්
දෙවන පූර්ණ චන්ද්‍රයෙකුත් නොවෙයි; ප්‍රභා මෘදුවූ ධාමෙන්ද්‍රයෙ
කුත් නොවෙයි, ශ්වේතහංස මිථුනයෙකුත් නොවෙයි, දෙව විමා
නයෙකුත් නොවෙයි, මෙපුරවරාධිශ්වරවූ අප මහරජාණන් වහ
න්සේ විසින් බොහෝ පින් රැස්කරනලද, එසේ හෙයින් උන්
වහන්සේගේ කුසලානුභාවයෙන් පාරාවාරාභ්‍යන්තරයෙන් අම්බ
රෙද්ගතව මෙතැන්හි පැමිණෙන්නාවූ චක්‍රරත්නය වියයුතුයයි
මෙසේ ඔවුනොවුන් හා බොහෝ අල්ලාප සල්ලාපයෙන් යුක්තව
පූර්ව දිසාව බල බලා සිටි කල්හි එක්ව නැගී චන්ද්‍ර බිම්බය හැර
චක්‍රරත්නය වෙන්ව නුවරට අභිමුඛව ඉතා උස් නොව ඉතා මිටි
නොව වන මුදුනට ආසන්නයෙන් පුෂ්ප ඵල පල්ලව ස්පර්ශ කෙ
රෙමින් දොළොස් යොදනකට ප්‍රකාශවන තරම් පඤ්චාංගිකා
තූර්ය ඝෝෂාව පවත්වා එනුයේ යොදනෙක පටන් ස්වකීය ප්‍රභා
ශ්‍රේණීන් සත්ව නයනාකර්ෂණය කෙරෙමින් චක්‍රවර්ති රජුන්ගේ
ධර්මානුභාවය භුවනාභ්‍යන්තරයෙහි ප්‍රකාශ කරන්නාක් මෙන්
ඔවුන් වසන රාජධානියට අභිමුඛව අවුත් පුරා නිමවනලද සක්
විති වත් ඇති පෘථිවීශ්වරයන්ගේ කුසලානුභාවයෙන් ආබව
ප්‍රකාශ කරන්නාක්මෙන් සත්විටෙක එනුවර ප්‍රාකාර මස්තක
යෙහි ප්‍රදක්ෂිණා කොට ඇතුළු නුවරට වැද රජහුගේ අන්තඃ පුර
යද එසේම ප්‍රදක්ෂිණා කොට උත්තර දිශාභාගයෙහි සිංහ පජර
සන්තව සඬයන් දීප ධූප ගන්ධ මාලාදීන් පූජාවට සැපයෙන්
හැකිවූ ඉතා උස් මිටි නොව අහස් කුස අකුරග බුන්නාක් මෙන්
නිශ්චලව සිටගත්තේය. එසේ සිටියාවූ චක්‍රරත්නයෙහි දිව්‍යප්‍රභා
සමූහය රජහුගේ ප්‍රාසාදයෙහි සිංහ පඤ්ජර ගජපඤ්ජර ව්‍යාළ
පජර කපිපඤ්ජර මෘග පජර පක්ෂිපඤ්ජර ලියපඤ්ජර ශාලපඤ්ජ
රාදීවූ හැම කවාට වලින් ප්‍රාසාදය අභ්‍යන්තරයට ප්‍රවිෂ්ටවෙමින්
සියලු ප්‍රාසාද කුක්ෂිය එකාහෙළා ප්‍රභාවයෙන්ජ්‍යොතිර්මත්ව සර
හා සිටගත්තේය. එකල්හිපෙරඵාඩගශිලසමාදානයෙන් ශ්‍රියඟන්

මස්තකයෙහි පලක් බැඳහුන් මහරජහු චක්‍රරත්නයෙහි ප්‍රභාව් දැක ප්‍රමුදිතව චක්‍රරත්නය දක්නා කැමති වෙති. එතකුදු උවත් රාජ අමාත්‍යාදිවූ පරිවාර ජනයෝ රජහු සමීපයට චක්‍රරත්නය පහළවූ බව ප්‍රිය පඬුරුමෙන් ගෙනවුත් සිට දෙවයන්වහන්ස නුඹවහන්සේගේ ප්‍රාසාදයෙහි සිංහ පඤ්ජරයට නුදුරුව චක්‍රරත්නය අහස සිටිනේයයි කියති. චක්‍රවර්ති රජතෙම එපවත් අසමින් මැ බලවත්වූ ප්‍රීති ප්‍රමොද්‍යයෙන් පූජිතවූ සවකියාත්මය ඇත්තේ බද්ධපර්‍යඞ්කය හැර හුනස්නෙන් පැන නැගී සිංහ පඤ්ජරය සමීපයට ගොස් ඒ චක්‍රරත්නය දැක මාවිසින් පළමු චක්‍රරත්නයක් ඇතැයි යනු ඇසිමි. දැන් ප්‍රත්‍යක්‍ෂයෙන්ම දිටිමියි මහත් සොම්නස් බවට පැමිණියහ. මේ චක්‍රරත්නය පහළවීමය.

**හස්තිරත්නය** නම් කවරහයත්? මෙසේ චක්‍රරත්නය පහළවූ කල්හි චක්‍රවර්ති රජහුගේ වැඩ පසස්නා අමාත්‍යවරුරැස්ව පළමු සිටි මඟුලැතු සිටි තැනින් ඉවත්කොට ඔහු සිටියාවූ ස්ථානය හෙරි තලයක් මෙන් තනවා චන්දන කුංකුමාදීන් සුවඳ පිරිබඩ ගෙන නානාවර්ණ පුෂ්පදාමයෙන් හා, පද්මොත්පල නාග ලතා නාග පල්ලව අසොක පල්ලවා වලම්බක සවර්ණ රජත මණිතාරකාදීන් ලලිත විතානානුබද්ධ වටතිර බඳවා සුවඳ තෙල් වතළ රන් රිදී වැට පහනින් එකාලොක කොට විලඳ සුනු සාල් අබ දූ සමන් කැකුළු හීතණයසී යන පස්මල් විසුරුවනලද භූමි ප්‍රදෙශයෙහි අගිල් කළුවැල් ගුගුල් දෙව්දුරු කපුරු ආදියෙන් සුවඳ දුම් ලමින් දෙව් විමනක් මෙන් සරහා ඇමතිවරහු චක්‍රවර්තීන් කරා එළඹ දෙහොත් මුදුන් දෙමින් දෙවයන්වහන්ස හස්තිරත්නය පහළ වන ලෙස සිතුව මැනවැයි කියා යාච්ඤා කෙරෙති. එකල චක්‍රවර්ති රජහු පළමුවෙන් මහ දන්දී පෙහෙවස් සමාදන්ව එම කුසලය සිහිකෙරෙමින් මතු මහල් තෙලෙහි ශ්‍රී යහන් ගබඩාවට වැද ශ්‍රී යහන් මස්තකයෙහි පෙරසේම පලක් බැඳ හිදිති. එකල්හි ඔහුගේ කුසලානුභාවයෙන් උපොසථ කුලයෙන් හෝ ඡද්දන්ත කුලයෙන් හෝ සත්ඛ සත්කාර විදීමට පින්වත්වූ සෑඟි සම්පන්න විනීතවූ තරුණ විහාකර ප්‍රතිබිම්බයක්මෙන් අරුණ වර්ණවූ මුඛ මණ්ඩල ශ්‍රීව පුෂ්කරාග්‍ර හස්ත පාදාදීන් ඇති මනොහරවූ සන්ධ්‍යාභ්‍ර මිශ්‍ර රජත පර්වතයක් මෙන් සුවිසුද්ධ ශරීරවයව ඇති සප්ත ස්ථාන අවනි ස්පර්ශීවූ කාරි වරෙන්ද්‍රයෙක් අවුත් එතැන්හි සිටිනේය. එකල්හි ඇත්ගොවුවන් ආදීවූ ඇමැත්තෝ තුටු පහටු සිත් ඇත්තාහු වහා අවුත් එපවත් චක්‍රවර්ති රජුන්ට කියති, රජහු නොපමාව එතැන්හි ගොස් ඒ හස්ති රත්නය දැක පහන් සිතින් එතැන්හි සිට ඇතරුවන්ට කියන්නාහු එම්බා පින්වත්නි මේ චිරදෙන්තනමයා වැඩකරුදැයි පුළුවුත, එකල්හි

හස්ති ගොපකයන් මුවෙන් නොබැණ සිටි කල්හි මහරජහු ඒ
සින්ධුරේන්ද්‍රයා දිසාවට අත දිගු කෙරෙති. එකල්හි ඒ පණීත් අභි
ප්‍රාය දැන ඒ නාගෙන්ද්‍රයා රන්පොරොදු මුතුලැල් ආදීවූ හස්ත්‍යා
ලංකාරයෙන් සරහාලති එකල්හි සත්රුවන් හිණින් ඉහ මස්ත
කයට පැනනැගී චක්‍රවාලාන්තරයෙහි සපිරිවරින් අහසින්ගොස්
එදවස් පෙරවරුම අවුත් රජ භවනයටවැද දහවල් බත අනුභව
කරන්නාහ. මෙබඳු නෛක විපාධිප ප්‍රධානවූ දහස් ගණන්
වාරණගණ ප්‍රාදුර්භූත වන්නාහ මේ හස්ති රත්නය පහළවීම
නම් වෙයි.

**අශ්ව රත්නය** නම් කවරහයත්? මෙසේ ප්‍රාදුර්භූතවූ ඒ විපා
ධිප රත්නයට අනතුරුව අශ්ව රත්නය පළමුවන ලෙස පූර්‍ණ
මඞ්ගල තුරග ස්ථානය තිද සාලය සාලාවක් මෙන් සරහා චක්‍ර
වර්ති නරෝත්තමයාණන්ට දැන්වූ කල්හි චක්‍රවර්ති රජහු පූර්‍ව
යෙහි මෙන් දැනාදීවූ සකල ක්‍රියාවන් නිෂ්පාදනය කොට අශ්ව
රත්නය පහළවනලෙසට ආවර්ජනා කෙරෙමින් ශ්‍රී ශයන මස්ත
කාරූඪව හුන් කල්හි ඔවුන්ගේ පූර්වෝපචිත දෛවයෙන් ශරද
බ්‍රභ්‍ර කූටයක් මෙන් අති ධවල ස්කන්ධ රක්ත පාද මුඛඇති කාක
ග්‍රීවයක් මෙන් ඉන්ද්‍ර නීලමණි වර්‍ණ ශීර්ෂයක් ඇති මෘදු ස්නිග්ධ
ඍජුවූ කෙශ කලාපයෙන් යුක්තවූ සමීරණ පථොද්ගතව ධාවන
යට සමර්ථවූ අතිශීඝ්‍ර ජවසම්පන්නවූ වලාහක කුලයෙහි ජාතා
ජානෙයෙශ්වරයෙක් පැමිණ සකස්කළ මඞ්ගල්‍ය අශ්ව ස්ථාන
යෙහි සිටිනේය. එකල්හි එපවත් චක්‍රවර්තිරජුන්ට දැන්වූ කල්හි
රජහු අවුත් පෙරසේම අමාත්‍යවරුන්ට කියා ඔවුන් විසින් සර
හා මෙහෙයනලද හයවරාරූඪව සහ පිරිවරින් අහසින් දිග්
විජය කොට පෙර බත මෙහෙ වඩන්ට සිය නුවරටම එන්නාහ.
මෙබඳුවූ යුග වාජිරාජ ප්‍රධාන දහස් ගණන් සෛන්ධව සෙනාව
ප්‍රාදුර්භූත වන්නාහ. මේ අශ්වරත්නය පහළවීමය.

**මාණික්‍යරත්නය** නම් කවරහයත්? අශ්වරත්නයට අනතු
රුව චක්‍රවර්ති නෘපතින්ගේ කුශලානුභාවයෙන් සුවාසූ දහසක්
මැණික් පිරිවරා රාත්‍රි දිනයෙහි හාත්පසින් යොදනක් පමණ
තැන් අඳුරු දුරුකොට විතත නිර්‍මල මයූඛ ස්කන්ධයෙන් එකො
ද්‍යාත කළාවූ සතරරියන් දිගඇති අටස්වූ දෙපස සක් නැඹක්
වැනි වෘත්ත වංශාභ්‍යන්තර කර්‍ණිකාග්‍රයෙන්විනිර්ගත අභි ශුභ්‍ර
නිජඣර ධාරාමෙන් ලීලොපෙතව ලම්බමානවූ මුක්තා ලතිකාග්‍ර
යෙහි ස්වර්‍ණ මුකුලයෙන් අලංකෘතවූ මාණික්‍යරත්නය වෛපුල්ල
පර්‍වතාභ්‍යන්තරයෙන් නික්ම රජුන්ට ප්‍රාප්තවෙයි. ඒ චින්තා මා
ණික්‍ය රත්නය ප්‍රාප්තවූ කල්හි නානා වර්‍ණාභිරාම රත්න
නිමග්න ග්‍රන්ථි ස්ථාන ඇති මුක්තා ජාලයක බහා සැටරියනක්
උස වෙණුයෂ්ටි අග්‍රෛඃකලග්නකොට හැමජනයන්ට පෙනෙන

ලෙස පිහිටුවූකල්හි රාත්‍රින්දිනයෙහි හාත්පසින් යොදනක් පමණ තැන් ජෝති පැතිර ඒකාලෝක කරන්නේය, ඒ හැමතැන් නිරන්තරයෙන්ම අරුණොද්ගමන වෙලාව මෙන් එක් එළිවන්නේය. එයින් හැම සත්ත්වයෝ සිතූ සිතූවිටම තම තමන්ගේ කෘෂිකර්මාන්තාදියෙහි නියුක්ත වන්නාහ. වෙළඳහු සල්පිල් සදමින් වෙළඳාමෙහි නියුක්ත වන්නාහු. ශිල්පී කර්ම කාරකාදීහු තඹ යාලෝහ කලදේ කනා රුවන් තුනාන පෙසකාර චර්ම දාරුදන්ත ශෛල ඉෂ්ටිකා චූර්ණ ක්‍රියාදිවූ ස්වකීය ස්වකීය කර්මාන්තයෙහි නියුක්තව වෙසෙති. මෙබඳුවූ චින්තාමාණික්‍ය රත්නය ප්‍රධාන කොට ඇති සහස්‍ර සංඛ්‍යා පථානික්‍රාන්ත මාණික්‍ය රත්නයෝ ප්‍රාදුර්භූත වන්නාහ. මේ මාණික්‍ය රත්නය පහළවීම නම්වෙයි.

**ස්ත්‍රී රත්නය** නම් කවරහයත්? මෙසේ ප්‍රාප්තවූ මාණික්‍ය රත්නයන්ට අනතුරුව චක්‍රවර්ති රජුන්ගේ කුසලානුභාවයෙන් මෘදුවූ ඡවිවර්ණ ප්‍රභා භාසුර තමාල කලාප නිභ සිරෝරුහාභිරාම වක්ත්‍ර පයොධරොරු කටි ප්‍රදෙශාදීවූ ස්ථූල ස්ථාන ප්‍රභාවත්ව ස්ථූලවූ, ග්‍රීවාඞ්ගුලි මධ්‍ය ප්‍රදෙශ මණි සන්ධි ආදීවූ කෘශ ස්ථාන මනොඥව කෘශවූ, හස්තපාද පෘෂ්ට ගලවාට ඝ්‍රාණාදීවූ උන්නත ස්ථාන විශෙෂයෙන් උස්ව සොභාවත්වූ නාභිපර්ව රෙඛා ඹූඛාන්ත කරවිර කර්ණ චූලිකාදිවූ නිම්න ගම්භීර ස්ථාන විශිෂ්ටව නිම්නවූ, ජංඝා බාහු කාජීර ස්කන්ධා ස්ථි ග්‍රීවාදීවූ ස්ථාන අති දීර්ඝ නොව සම ප්‍රමාණ හෙයින් ආයත විරහිතවූ, උභයාඞ්ග සම ප්‍රමාණහෙයින් ආයත විරහිතවූ, උභයාඞ්ග සම ප්‍රමාණ හෙයින් උභයවාමනක නොවැ සමොත්සෙධ ප්‍රමාණවූ අත්‍යොදත අති කෘෂ්ණ නොව ශ්‍යාමවර්ණයෙන් ශොභමානවූ අතිස්ථූල අතිකෘශ අත්‍යුච්ච අති නීච නොව සම ප්‍රමාණවූ; සකලාඞ්ගයෙන් බැහැර ප්‍රමාණයක් නික්ම ආසන්නව බබළන්නාවූ ප්‍රභා ඇති මනුෂ්‍ය රූපය ඉක්මුණාවූ දිව්‍ය රූපයට නොපැමිණියාවූ දෙළොස් රියනක් ඇතුලත තුනු පැහැවිහිද සියක්වරගසා නැගූ පුළුන්රුසක් ගිතෙල ගැලුවාක් මෙන් ඉතා මෘදුවූ චක්‍රවර්ති රජහු උෂ්ණ කැමැති කල්හි තෙජො ගුණ පවත්නාවූ සිහිලස කැමති කල්හි සිසිරත්වය පවත්නාවූ, නිරන්තරයෙන් මොනවට සැවූ අභිනව චතු ජාති චන්දන මිශ්‍රව සමව යෙදුණු චන්දන සුගන්ධයක් මෙන් ආත්මයෙන් සුවඳ වහනාය ව ා නාවූ මන්දස්මිත පූර්වඞ්ගම මධුර ගිරා නිච්ඡාරයෙන් මුඛපද්මය ප්‍රබොධවූ කල්හි අද්භුතා මොදයක් මෙන් මහනෙල් මල් සුවඳ මුඛයෙන් වහනය වන්නාවූ, මෙබඳුවූ රූපලාවණ්‍ය ගුණොපෙත ස්ත්‍රීතොම තමහට වල්ලභවූ චක්‍රවර්ති රජහු දැක පූහුව භූතස්තෙන් නැගී සිටිනීය. රජහු සිර ශහන හුත් කලහිද සැතපුණු කල්හිද ග්‍රීෂ්ම සංසිඳුවනු පිණිස තල් වැට විහිදුවමින් සිට ඔහු නිද්‍රාවට පැමිණි කල්හි

පසුව සැතපෙන්නීය. යලිදු දෙවියන් වහන්ස මාවිසින් දුස කම් කරාදින්ට නියොග කටයුතුකිම්දැයි විචාරමින් රජහුගෙන් මෙහෙවර කිලෙස්ම දුස කම්කරාදීන්ට මෙහෙවර යොදමින් රජහට ප්‍රියවූ වචනයක්ම කියමින් වාග් අමෘතාණීවයෙහි ගලා නිරන්තරයෙන් ප්‍රසාද එලවන්නීය රජහුකෙරෙහි ප්‍රතිබඩ සුඩ චෙෂ්ටිතාව හැර අන් තැනෙක්හි සිත් නොඇලවන්නීය, මෙබ දුවූ ගුණානුභාව රූපශොභා සම්පන්න ස්ත්‍රී රත්නයක් මද්‍රරට රජ කුලයෙන් හෝ උතුරුකුරු දිවින් හෝ තුමූම පැමිණෙන් නාහ. මේ ස්ත්‍රී රත්න ප්‍රාදුර්භූතවීමය.

**ගහපති රත්නය** නම් කවරහයත්? මෙසේ පැමිණියාවූ ස්ත්‍රී රත්නයට අනතුරුව රජහුගේ කුශලානුභාවයෙන් මහපොළොව ඇතුලෙහි යොදනක් පමණ තැන තුබූ නිධාන දක්නා තරම් ආනුභාව සම්පන්න දිවස් ඇති ගහපති රත්නය ප්‍රධාන කොට ඇති දහස්ගණන් සිටුවරු පහළවන්නාහ. මේ ගහපති රත්නය පහළවීමය.

**පරිනායක රත්නය** නම් කවරහයත්? මෙබඳු ගහපති රත්නයට අනතුරුව චක්‍රවර්ති රජුන්ගේ ධර්මානුභාවයෙන් සතිස් යොදනක පැතිර සිටි මහ සෙනග හා සමග චක්‍රවර්ති රජහුගේ අභිප්‍රාය දැන ඒවූ පරිද්දෙන් අභිප්‍රාය ලෙස පිළිපදනට සමත්වූ පර සිත් දන්නා ද්ව්‍යඥන ඇති කාය්‍යා කාය්‍ය දැන්මෙහි දක්‍ෂවූ ජ්‍යෙෂ්ඨ පුත්‍රරත්නය ප්‍රධාන කොටඇති දහස්ගණන් සෙවක රජහු පහළ වෙති. මේ පරිනායක රත්න පහළවීමය. මෙසේ සප්ත විධ රත්නයන් ප්‍රාදුර්භූතවූ චක්‍රවර්ති රජුන්ට සතිස් යොදනෙක පැතිරසිටිනාවූ විද්‍යාධර පර්ෂදක් හා සඳගවූ අවිකාලාඞ්ග සම්පත් ඇති චක්‍රවර්ති මහ සෙනග රජහු පිරිවරා සිටිනාහ. තවද පිරිවරසහිත සතරමහා විපවාසීහු රුස්ව තම තමන් සිත්ලෙස උකාගතුස් අඩුනොවන්නාවූ ගවු දෙගවු තුන්ගවු සතරගව් අයම්වූ ගම්භීරයෙන් එක්ලක්‍ෂ විසිදහසක් යොදුන් ඝනකඩ බොල් මහපොළොව කොළවර දක්වා නොයෙක් රත්නයෙන් පිරිසිටියාවූ සතර මහා නිධානද පහළවෙයි. තවද පඤ්චඞ්ගික තූය්‍යීනාද මෙන් මධුර ධවනි විහිදුවා මිණි කිකිණි දැල් බඳ නානාවණි ධජ මාලා ලලිත ත්‍රිවිධ යෘතුමයවූ භූමි භෙද ඇති ප්‍රාසාදත්‍රය සිසාරු දිව්‍ය වස්ත්‍රාභරණාදීන් සජ්ජිතවූ කල්ප වෘක්‍ෂයෝ අප්‍රමාණ වෙති. දිව රන් කාඩු ගත් අත් ඇති විද්‍යාධරයෝ සතරදෙනෙක් සිවුදිග රුකවල් ගෙන සිටිති. මූබයෙන් මහනෙල් මල් සුවඳ පැතිර පමිත් එක සුවඳ පිඩක්සේ ආමොද ගන්වයි. සවකීයවූ මූර්තීන් චන්‍දන සුගන්‍ධය පැතිර අස හාය මලයජ සුගන්‍ධ පුඤ්ජයක්සේ දිශා මොදයෙන් ජන තන්‍දනය කරන්නේය.

මෙබඳුවූ චක්‍රවර්ති රජහු පරාර්ථය පිණිස දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතර මහා ද්වීපය ඇතුළුවූ චක්‍රවාළාන්තරයෙහි සපිරිවරින් දිග් විජයකොට එනු කැමතිව ප්‍රාසාදයෙහි සිංහ පඤ්ජරයට නුදුරුව මහිත ස්ථානයෙහි ප්‍රතිෂ්ඨිතවූ චක්‍ර රත්නය සමීපයට ගොස් සුවර්ණභිංකාරයෙන් සුගන්ධෝදකය තරුණ පල්ලවාකාර අරුණ වර්ණ කරතලයෙන් ගෙන "පවත්තතු භවං චක්කරතනං අභිවිජිනාතු භවං චක්කරතනං" යනාදීන් තුන්විටෙක වාක් නිශ්චාරය කොට චක්‍රරත්නයට දියවැඩූ කල්හි චක්‍රරත්නය පළමු අහසට පැන නැඟී නික්මෙන්නේය. එකල්හි චක්‍රවර්ති මහරජහු රාජාභරණයෙන් සැරහී හස්ති රත්නය අශ්ව රත්නය දෙකින් අභිප්‍රාය වාහනයකට පැනනැඟී, එසේම සර්වාභරණයෙන් සැරහුණාවූ දෙවඟනන්හා සදෘශ වරඟනන්හා එසේම අනේකාලංකාරයෙන් විභූෂිතව තල්වැට චාමර විසිරිපත් පුන්කලසයෙන් කොල් පිල් කලඹ කුඩ කොඩි සේසත් මඟුල් කඩු ආදී නොයෙක් මඟුල් පෙළහර ගත්තාවූ පරිවාර ජනයන්ද පිරිවරා සිට, නවද නගරවාසීවූ හැම ජනයා කෙරෙහි කාරුණාවෙන් තමන් දිග් විජය කරන බව ප්‍රකාශ කොට නුවර බෙර පියවි කරවති. එකල්හි නුවරවාසීහු තුටු පහටු සිතින් සබඳිනි අපගේ මහරජාණන්වහන්සේ අද දවස් සතර මහාද්වීපයෙහි සමස්ත සත්වානු ශාසනා කරනු පිණිස නික්මෙනසේක. එසේ හෙයින් හැමදෙනම තම තමන්ගේ ශ්‍රී විභූතියට අනුරූප ලෙසම සැරහී වහා නික්මෙවයි උනුන්හට අඬනසේ කියමින් නික්මුණාවූ චක්‍රරත්නයෙහි මධුර ධ්වනියද ශ්‍රවණය කොට එම්බල කොල චක්‍රරත්නය හා සමග අපගේ මහරජ නික්මිණ, දූන් දූන් අපි පසු ගැසෙම්හයි බසින් සමහරක් කියා ගතනොහී ඉඟිපෑ අත්සන් කෙරෙමින් අනේකවිධ කාම්‍ය‍ෝපභෝග විශේෂයෙන් විචිත්‍ර රජදූ කුප්පායම් ආදීවූ නානාවර්ණ සත්තාංග සන්නද්ධව බහා පළඳනාලද අනේකප්‍රකාර ආභරණයෙන් දිලියෙමින් අතින් ගන්නාලද අසි සත්ති තෝමර භෙණ්ඩිවාලාඹවජ්‍ර චක්‍රාදි විවිධායුධ ප්‍රහරණ ප්‍රභාවයෙන් ඒකාලෝක කෙරෙමින් තම තමන්ලත් කුඩ කොඩි නංවා විරිදු බණමින් ස්වකීය පරිවාර ජනයන් හා සමග අහසින් අවුත් චක්‍රවර්ති රජහු පිරිවරා සිට ගත්තාවූ යුවරජ සෙනවිරත් ඇපා මාපා ආදීවූ මණ්ඩලික වරුන් හා එපරිද්දෙන්ම පිළිවෙළින් සැරහී අවුත් සතිස් යොදනක් පමණ තැන් අතුරු නොහැර දිව්‍ය සේනාවක් මෙන් සැරහී සිට ගත්තාවූ අවිකලාඞ්ග මහ සෙනඟ පිරිවරා තරු පිරිවැරූ පූර්ණ චන්ද්‍රයාසේ දිලිහි දිලිහී සුරස්ජසයෙන් නික්මෙන්නාහ. එකල්හි සක්විති රජහට පෙරටුව සැට දහසක්පමණ නාටක වටුකාදීහු වෛකුණ්ඨ වටුමයෙන් වෙෂ්ඨා

තුෂ්ටි ඉෂ්ට ලීලා දක්ව දක්වා නට නටා යෙති. එ නාටක ජනයන්ට පෙරටුව එසේම දිව්‍යප්සරාවන් මෙන් සජ්ජිතවූ සැටදහසක් පුරවර වධූශ්‍රෙණීහු වෙණු වීණා වගි වස් දඹු එකච්ඡද්‍ර මණී පණී විජයොධවනි ඔහතු තතනිරිපට සිරිවිලි කොඵලස්වර ආදීවූ ශුෂිර තූර්‍ය්‍ය භාණ්ඩයෙන් මධුර නාද පතුරුවා ගායනා කෙරෙමින් ලීලා දක්ව දක්වා නික්මෙති. තවද දෙව් කුමරුවන් වැනි සැටදහසක් මනුජ ගන්ධර්ව පුත්‍රයෝ නොයෙක් ලෙසින් සැරහී ගැටබෙර පණා බෙර තුණ්ඩි බෙර පොකුරු බෙර රොඳු බෙර එකස් බෙර මිහිඟු බෙර මහ බෙර තම්මැට්ට නිසාන ආදීවූ අනෙකප්‍රකාර භෙරි තූර්‍ය්‍යභාණ්ඩයන් එකවිට අනෙව මිහි මඩල උපුල් වන්නාක්මෙන් එක කොලාහල කෙරෙමින් නික්මෙති. මෙසේ සතිස් යොදනෙක පැතිර සිටිනාවූ චක්‍රවර්ති පමිත් පිරිවරා නික්මුණාවූ චක්‍රවර්ති රජ චක්‍රරත්නය ඉදිරිකොට ඊට අනතුරුව ප්‍රයාණයට වන්හ. එකල්හි චක්‍රරත්නය තෙම ඉතා උස්ව අහසින් නොගොස් යම්සේ භූමියෙහි සිටිය උන් විසින් තෙලෙ යනුයේ: චක්‍රවර්ති මහරජය, මොහු යුවරජහුය, මෝහු අමාත්‍යවරහුය, තෙලෙ සෙනෙවිරද්දුය, මොහු මෙනම් මෙනම් පිරිවරයයි ඇඳින ගන්නා තරම් උස අහසින් වෘක්ෂ ශාඛාග්‍රයට නුදුරුව එහි පුෂ්ප ඵල පල්ලව කැමැත්තවුන් විසින් අත දිගු කොට සැපයෙන් සිඳගතහැකි පමණ උයින් අහසින් නික්මෙන්නාහ. ඒ නික්මෙන්නාවූ හැම පර්ෂදින් යමෙක් හිඳිනා අභිප්‍රාය ඇත්තේද, යමෙක් ශයන අභිප්‍රාය ඇත්තේද. යමෙක් සිටිනා අභිප්‍රාය ඇත්තේද ඔහු ඒ ඒ ඉරියා පථයෙන්ම නික්මෙති. තවද කිසිකෙනෙක් චිත්‍ර කර්මාන්ත ස්වර්ණ මණි කර්මාන්ත ආදීවූ ඒ ඒ කර්මාන්තයෙහි නියුක්තයෝද, ඒ හැම තම තමන් කරන කර්මාන්ත කෙරෙමින්ම නික්මෙන්නාහ.

මෙසේ චක්‍රවර්ති පෘථිවීශ්වරයාණන් නික්මුණු කල්හි චක්‍ර රත්නය තෙම මහාමෙරු පර්වතය වටකොට මහාසමුද්‍රය මුදුනෙන් අටදහසක් යොදුන් අයම් විතර ඇති **පූර්ව විදෙහ** දිවයිනට වදනේය. ඒ පූර්ව විදෙහයෙහි අයම් විතරින් දොළොස් දොළොස් යොදුන් පමණ හා වටින් සතිස් යොදනක් පැතිර සිටිනාවූ මහ සෙනග හා සමග සක්විති නරඉසුරාණන් සැතපීමට ඉඩම් ඇති ඡායූදක සම්පන්නවූ සමතල රමණීය භූමි භාගයෙක් ඇද්ද එතැන්හි අහස චක්‍රරත්නය අක්ඛාහත ස්වභාවයෙන් පිහිටන්නේය. එසඳ සක්රුවන සිටි සංඥවෙන් සතිස් යොදනෙක පැතිර සිටිනාවූ මහ සෙනග නිජරාජසයෙන් අවනි මණ්ඩලයට අවතීර්ණව ස්නාන පානාදිය කොට එතැන්හි මඳක් සැතපී ඉඳිනාහුයි. එකල්හි ඒ පූර්ව විදෙහයෙහි අධිපතිවූ රජහු තම තමන්ගේ විභවානුරූපවූ සැරහී සේනාවාහන සනාථ

ඔව පර රාෂ්ට්‍රයෙන් යුද්ධයට රැපු සෙනගෙක් ආවාහුයයි කියා
යුද්ධයට සැරහීමට ආයුධ ගැන්මට උත්සාහ කළත් අතට ආයුධ
නොපැමිණෙන්නේය. සෙනාවාහන චක්‍රරත්නානුභාවයෙන්
එකකුත් නොවන්නාහුය, එකල්හි පූර්ව විදෙහයෙහි වසුධාධි
පතීහු ස්වකීය පරිවාර සහිතව මඟුල් වෙස්ගෙන තම තමන්
ලත් රාජ්‍යසම්පත්තියට සුදුසුලෙස දක්නා පඬුරු ආදීවූ පූජනීය
වස්තු ගෙන්වාගෙන මහත් උත්සවයෙන් චක්‍රවර්ති රජහු කරා
අවුත් වැඳ වැතිර තමතමන්ගේ උත්තමාඞ්ගයෙහි පලන් මෞලි
මාණික්‍ය කාන්ති ජලධාරාවෙන් ශ්‍රී චරණ ප්‍රක්ෂාලනය කොට
කර කමල කැකුළු නළල් තෙලෙහි පුදමින් දෙවයන් වහන්ස
අපගේ නුවරට වැඩිය මැනවැයි අපවිසින් කළමනා කාරිය කිම්
දැයි පිළිසඳර කථාකෙරෙමින් සිටි කල්හි සක්විති වසුමතී පතිහු
ඔවුන්ට ප්‍රෙමණීයවූ මධුරභාරතින් ධර්මානුශාසනය කරන්නාහු:
එම්බා පින්වත්නි තෙපි හැම ප්‍රාණඝාත නොකරව, පරද්‍රව්‍යය
ඔවුන් නොකැමැති කරවා නොගණුව, පරදාරසෙවනය නොක
රව, මුසාවාද නොකියව, සුරාපානය නොකරව, දෙලෙ වටම
අනර්ථකාරීවූ මෙ අකෘත්‍යය කළ කෙනෙක් ඇත්නම් ක්‍රෑරතරවූ
නිරාවල වැටී අපමණ දුක් විඳිනාහුයයි ඔවුන් ප්‍රථමයෙන් තැති
ගන්වමින් නැවත දාන පරිත්‍යාගයෙහි නියුක්තව නිත්‍ය චාරිත්‍ර
ශීල පංචාඞ්ග අෂ්ටාඞ්ගශීලාදිය රක්‍ෂාකරව, අනිත්‍යාදි ත්‍රිලක්‍ෂණ
භාවනාදිය කරව, සද්ධර්මශ්‍රවණය කරව, ශක්ති පමණින් ධර්මදානා
දීන් ජනනන්‍දනයකරව, මාතෘ පිතෘ කුල ජ්‍යෙෂ්ඨ සජ්ජනයන්ට
වතාවත් කිරීමෙන් උපස්ථාන කරව, තොප ලත් රාජ්‍යයෙහි
සමස්ත සත්වයන්ට හිංසා පීඩානොකොට දැහැමෙන් රාජ්‍යශ්‍රී
විඳුවයි යනාදීන් අවවාද කොට ඔවුන්ට අවසරදී උන් උන්ගේ
රාජ්‍ය සම්පත්තියෙහිම පිහිටුවමින් නැවත පූර්ව ක්‍රමයෙන්ම චං
රත්නයට ස්වර්ණභිංකාරයෙන් ආමොද ජලය වඩමින් ඒ ක්‍ෂණ
යෙහි උද්ගතව ආකාශ පථයෙන් නික්මුණු චක්‍රරත්නය හා
සමග සපිරිවර මහ සෙනග අහසට පැන නැගී ගොස් පූර්ව පාරා
වාර පර්‍ය්‍යන්තය ප්‍රාප්තවන්නාහ.

එකල්හි චක්‍රවර්තික්‍ෂිතිපතිහුගේ කුශලානුභාවයප්‍රකාශකරණු
පිණිස චක්‍රරත්නය පූර්ව සමුද්‍රයට බසින්නේය. එකල්හි දිව්‍ය
ඖෂධගන්ධයක් ආඝ්‍රාණකළාවූ උරගෙන්ද්‍රයක්හු පතලපෙනගබක්
අකුලන්නාසේ මහත් රළ පතරින් නිරතුරුවූ සමුද්‍ර ජලය සංකු
චිත වෙමින් යොදනක්පමණතැන් පසුබැස උභය පාර්ශ්වයෙහුද්
යොදුන්ගණන් තැන් දියකඳ දෙවනත්ව මැද රුවන්වැල්ල බබ
ළමින් වටින් පිළිමිණි භිත්තියක් මෙන් දියකඳ උද්ගතව සිටින්
නේය. ඒක්‍ෂණයෙහි චක්‍රරත්නය මුහුදටබැස පළමුව නික්මෙන්

නේය. මහරජ චක්‍රරත්නයට අනතුරුව සෙනඟට ඉදිරිව නික්මෙන්නේය. චක්‍රවර්ති මහරජහට අනතුරුව පසු පස්සෙහිම මහ සෙනඟ නික්මෙන්නාහ. එසඳ සාමුද්‍රික හැම රත්නයෝ චක්‍රවර්ති රජහුගේ සමෘද්ධිය දක්නා පිණිස හාත්පසින් රැස්වන්නාක් මෙන් සමස්ත සරිත්පති අභ්‍යන්තරයෙහි විස්තෘතාභිඥත සර්වරත්නයෝ සර්වතොමුඛාවකාශ පදිනාභස්ථානයට ප්‍රාප්තව සජ්ජිතවූහ. එසඳ සක්විති මහ සෙනඟ නොයෙක් රත්නයෙන් සම්පූර්ණවූ රුවන්වැලි තලාව දැක තම තමන් අභිප්‍රායානුකූලවූ පරිද්දෙන් උතුරු සළු පිළිපට හිණිවල් පුරා රුවන් උකාගත් කල්හි චක්‍රරත්නය නැවත එනු පිණිස සමුද්‍ර තීරාභිමුඛ මන්නේය. එකල්හි මහ සෙනඟද චක්‍රවර්ති රජද සිටි තැනම සිට ගොඩට අභිමුඛව කරකැවී ආපසු එන්නාහ. එසඳ තීරාභිමුඛාරිඳුම මහරජහට පසුව ගලාඑන දිය කඳ වලකන්නාක්මෙන් ස්වකීය ප්‍රභාවයෙන් සමුද්‍රාභ්‍යන්තරය ජ්‍යොතිෂ්මත් කෙරෙමින් නෙමි මණ්ඩලය පැහැර එන ජලස්කන්ධය වළකා වළකා චක්‍රරත්නය පසුබස්නා කල්හි මහසෙනඟ පළමුව ගොඩනැඟෙති. අනතුරුව මහරජ තීරප්‍රාප්ත වන්නේය. පස්සෙහි චක්‍රරත්නය ගොඩනැඟී අහසට පැන නැඟෙයි.

මෙසේ චක්‍රවර්ත්ති නරපතිහු සමුද්‍රය කෙළවර කොට ඇති පූර්ව විදෙහයෙහි දිග් විජය කොට ජයගෙන දක්ෂිණ සමුද්‍රය පර්යන්තකොට ඇති දසදහසක් යොදුන් ජම්බුද්වීපය ජයගන්නා පිණිස චක්‍රරත්නය හා සමග දක්ෂිණ දිශාභාගයට අවුත් ජම්බුද්වීපයෙහි දසහිස් යොදනක පැතිරසිටිනාවූ චක්‍රවර්ති සේනාවට වාසයට සුදුසු ප්‍රදෙශයෙක්හි චක්‍රරත්නය අහස සිටි කල්හි පෙර සේම ඒ ස්ථානයෙහි භූමියට සක්විති සෙනඟ බැස ස්නාන පානාදි චිත්තානුකූල කෘත්‍ය සම්පාදනයෙන් එතැන්හි සැතපී හිඳිනාහ. එසඳ චක්‍රවර්ත්ති නරෙන්ද්‍රයාණන් හා මහසෙනඟ එතැන්හි පැමිණි බව අසමින්ම ඒ ජම්බුද්වීපයෙහි රජහු සපිරිවරින් සතුටු පඬුරු ගෙනවුත් පුද වැඳ බිණ අසා පන්සිල් ගෙන අවවාද පිළිගනිමින්තම තමන්ගේ නිවාසස්ථානවූ රාජධානිවලටම නික්මෙන්නාහ. ඉක්බිති චක්‍රවර්ති රජහුහා මහසෙනඟ අහසට පැනනැඟී දක්ෂිණ සමුද්‍රය සමීපයටගොස් පූර්ව සමුද්‍රයෙහි කී ලෙසම රත්නාකරාවතීර්ණව රුවන් පොදි බැඳගෙන චක්‍රරත්නය හා සමග අහසට පැනනැඟී සත්දහසක් යොදුන් අපරගොයානය ජයගෙන එනු පිණිස මහමෙර දකුණට කොට සමුද්‍රය මුදුනෙන් චක්‍රරත්නය හා සපිරිවර මහරජ අහසින්ගොස් අපරගොයාන දිවයිනට පැමිණ චක්‍රරත්නය සුදුසුවූ ස්ථානයෙක්හි අකුරඟ බුන්නාක් මෙන් අහස සිටි කල්හි රජු සහිත මහ සෙනඟ ඒ ස්ථානයෙහි භූමියට බැස සැතපී උන් කල්හි අපරගොයාන ප්‍රධාන රජහු

පූර්වයෙහි සෙසු දිවයින්වල රජුන් මෙන් පුද පඬුරු සරහාගෙන සපිරිවරින් අවුත් චක්‍රවර්ති රජහට පූජාකොට ඔවුන් කී අවවාද යෙහි පිහිටා කුශල සම්භාරයන් රැස්කෙරෙමින් ස්වකීයවූ රාජ්‍ය සම්පත් අනුභව කරන්නාහ. එකල්හි නැවතත් චක්‍රරත්නය අහසට පැන නැගී පළමුව තික්මෙයි. එසඳ දසරුජ පමිත්නු සක් රුවන හා සමග ගොස් පශ්චිම සමුද්‍රයට බැස පෙරසේම සත් රුවන් හැරගෙන අහසට පැනනැගී අටදහසක් යොදුන් උතුරු කුරු දිවයින ජයගන්නා පිණිස ගොස් පූර්වොක්ත ක්‍රමයෙන්ම ජයගෙන ඔවුන්ට අනුශාසනා කෙරෙමින් කුසලයෙහි පිහිටුවා උතුරු සමුද්‍රයට ගොස් රුවන් උකාගෙන අහසට පැනනැගී චක්‍රවර්ති රජු සහිත සතිස් යොදනෙක පැතිර සිටිනාවූ මහ සෙනග චක්‍රරත්නය හා සමග දෙදහසක් කොදිව් පිරිවර කොට ඇති සතර මහා ද්වීපයෙහි දිග් විජයකොට සක්වළ තුළ සියලු සත්වයන්ට දෙලොවින්ම වැඩ සිඩකොට නැවත හැමදිවයින් එකවිටම දක්නා කැමතිවූහ. එකල්හි පරමතර විචිත්‍ර චක්‍රරත්නය අහසට සෘජුව පැනනැංගේය. එකල්හි සපිරිවර චක්‍රවර්ති මහරජද චක්‍රරත්නය හා සමග අහසට පැනනැගී දෙදහසක් කොදිව් පිරිවර කොට ඇති සතරමහා ද්වීපය පද්මොත්පල පුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිතවූ පියුම් විල් සමූහයක් මෙන් දැක මහත් ප්‍රීතින් චක්‍රරත්නය පෙරටුකොට ප්‍රථමයෙන් ස්වකීය නුවරින් නික්මුණාක්මෙන් නැවත සිය නුවරටම අවුත් වදනේය. එකල්හි චක්‍රරත්නය පළමු සිටියාවූ සිව්මැදුරු කවුළුව සමීපයෙහි අහස සුගන්ධ දීපධූප පුෂ්පාදීන් පූජාවිදීමට සුදුසුවූ නිර්මල ස්ථානයෙහිම සිටිනේය.

එකල්හි චක්‍රවර්ති මහරජාණන්ගේ අන්තඃ පුරයට ප්‍රදීප මාණික්‍ය ප්‍රභාවයෙන් ප්‍රයොජනමඳව චක්‍රරත්නයෙහි ආලොකයෙන්ම දව රෑ එකලු කොට අන්ධකාර විධමනයෙන් ජ්‍යොතිෂ්මත්ව බබළන්නේය. යමෙක් වනාහි අඳුරු කැමැත්තේ වීනම් ඔහට අඳුරුම වෙයි. ආලොක කැමැත්තේවීනම් ඔහට සර්වප්‍රකාරයෙන් හැමතැන්හි එකාලොක වෙයි. මෙසේ ඒ චක්‍රවර්ති නරොත්තමයාගේ කුසලානුභාවයෙන් ප්‍රාදුර්භූතවූ චක්‍රරත්නය චක්‍රවාළාන්තරයෙහි හැම ශත්‍රැමර්ථනය කොට සකල සත්වයන්ට දෘෂ්ට ධර්ම සාම්පරායික කුශල ඵල ප්‍රතිපාදනය කෙරෙමින් ඔවුන්ගේ චිත්තානුකූලව අභිමතාර්ථයන් සිඬකරන්නේය.

**මෙසේහෙයින් දක්වන ලද්දේමැයි—**

"චක්කානුභාවෙන හි තස්ස රඤ්ඤෝ-අරි අසෙසා දමථං උපෙන්ති,
අරින්දමං නාම නරාධිපස්ස-තෙනෙව තං වුච්චති තස්ස චක්කං" යි

මෙබඳුවූ ඓශ්වර්‍යමත් චක්‍රරත්නය,හස්ති රත්නය,අශ්වරත්නය, මාණික්‍ය රත්නය, ස්ත්‍රී රත්නය, ගහපති රත්නය, පරිණායක රත්නයයි කියනලද සප්තවිධ රත්නයන් ප්‍රධානවූ සකල ඓශ්වර්‍යම චක්‍රවර්ති රජුන් පූර්වයෙහි කළාවූ දාන ශීලාදීවූ කුශලානු භාවයෙන්ම පාදුර්භූත විය. එසේහෙයින් ස්වකීයවූ ආත්ම ප්‍රේමානුබද්ධ චිත්ත සංකල්පනා ඇති සකල සත්වයන්විසින් කුශල කරණයෙහි අප්‍රමාදව ඝනාන්ධකාරයෙහි පහළ විදුලියක්මෙන් භවාන්ධ කාරාන්තරයෙහි පහළවූ අෂ්ට දුෂ්ට ක්ෂණයෙන් විනිර්මුක්ත මේ නව වන බුද්ධෝත්පාද ජෝතිය බබළන ඇසිල්ලෙහි දානසීල භාවනාදීවූ කුශලයන් රැස්කොට මතු දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් පුර සිරි හස්තප්‍රාප්ත කරන්ට උත්සාහ කටයුතු. කියනලද්දේමැයි–

"ඉති සකලසමිද්ධිං ච [illegible]වන්තීති සම්මා
කතඅමිතසුපුඤ්ඤෙනෙව ලද්ධානි ඤත්වා,
සතතසමුපචිත්වා දානසීලාදිධම්මං
ලභථ තිදිවභොගං වාථ මොක්ඛං ච හමෙහා."

මෙතෙකින් මේ සද්ධර්ම රත්නාකරයෙහි

චක්‍රවර්ති විභාවන නම්වූ

එකොළොස්වන පරිච්ඡේදය

කියා නිමවනලදී.

# 12 වෙනි පරිච්ඡේදය.

## කවද මේ සද්ධර්ම රත්නාකරයෙහි චක්‍රවර්ති විභාවනයට අනතුරුව ධර්මෝද්භූත සංග්‍රහ කථා නම් කවරහෙයක්?

මේ මතු කියන්නෝ එහි පිළිවෙළ කථාවය.

**හේ කෙසේදයත්?** කරුණා සමුද්‍රවූ අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ සර්වඥරජෝත්තමයාණන්වහන්සේ සකල ජනානුකම්පාවෙන් චාතුර්ද්වීපිකා මහාමේඝයක් වර්ෂා කරන්නාසේ නානානය නිපුණ අර්ථ ව්‍යඤ්ජන සම්පන්න ප්‍රාඥ වේදනීයවූ සපර්යාප්තික නවලොකොත්තර සද්ධර්මය දේශනා කොට මහාකාශ්‍යප ස්ථවිරාදිවූ ත්‍රිවිධ ශාසනානුපාලිත මහාසංඝයා වහන්සේට භාරකොට පන් දහසක් අවුරුදු පවත්නා ලෙස සද්ධර්ම ප්‍රතිෂ්ඨාව කළ කල්හි මහාසංඝයාවහන්සේද ධර්මයට බැහැරින් උපද්‍රවයක් නොවදනා ලෙස පඬනගි කොටගෙන රක්ෂා කළ මැනැවැයි සිතා ධර්ම සංගායනා කළසේක, ඒ ධර්ම සංගායනා නම්: පචසතිකය, සතන සතිකය, සහස්සිකයයි ත්‍රිවිධවේ. එයින් **පචසතිකා** නම් කවරහයත්? මේ සර්වඥ ශාසනයෙහි තෙලෙස් ධුතාඞ්ගය උත්කෘෂ්ට වශයෙන් පූරක ප්‍රතිපත්තිසාර යතීශ්වරයාණන් වහන්සේගෙන් අග්‍රවූ **මහාකාශ්‍යප** මහාස්ථවිර ප්‍රමුඛ පන්සියයක් ගණ ප්‍රධාන ස්ථවිරයන් වහන්සේ රජගහනුවරට රැස්ව කළාවූ ධර්ම සංගායනාවය. ඒ කාශ්‍යප මහා ස්ථවිරයන් වහන්සේ තෙලෙස් ධුතාඞ්ගධරයන් කෙරෙහි අග්‍රවූ ස්ථානාන්තර ලැබීමට කවර කාලෙක්හි පටන් විවරණ ලැබ ප්‍රාර්ථනා කළසේක්දයත්?

**කකුසඳ කෝණාගමන කාශ්‍යප ගෞතම මෛත්‍රෙයයි** යන පස් බුදු කෙනෙකුන්වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිතවූ මේ **මහා** භද්‍ර කල්පයට යටගියදවස ලක්ෂයක්වන කපින් මත්තෙහි මුළුලොව එකහෙළා පියුම් වැසි වැස්වූහෙයින් **පදුමුත්තර** නම් බුදු කෙනෙකුන් වහන්සේ ලොකයෙහි පහළව දෙව් මිනිසුන් සහිතවූ සියලු ලෝවැසියන් සංසාර සාගරයෙන් එතර කොට නිවන් පුරයෙහි පිහිටුවමින් වැඩවසන සේක. එකල **හංසවතී** නම් නුවර කෙළි ගණින් වසනුඇති **වෛදේහ** නම් කෙළෙඹි පුත්‍රයෙක් වෙසෙසි. ඒ කෙළෙඹි පුත්‍ර තෙම දවසෙක බුදුන්ගෙන් බණ අසා පහන් සිත් ඇතිව බුදු පාමොක් මහා සංඝයා වහන්සේට ආරාධනා කොට

තමා වසන්නාවූ ගෘහය බිම සුවඳ පිරිබඩගෙන විලඳ සුනු සාල් අඹ දෑ සමන් කැකුළු ගිතණයසියන පස්මල්විසුරුවා සෙල්වියන් බැඳමල ලොඹුඑල්වමින් දිව්‍යවිමානයක්මෙන්සරහාබුඩාසනයක් පනවා මහා සංඝයා වහන්සේ වැඩ හිඳිනා ලෙස පිළිවෙළින්ම අසුන් පනවා බුදුන් වැඩ වසන විහාරයට ගොස් මහත් ගෞරවයෙන් පසඟපිහිටුවාවැඳ භාග්‍යවතුන්වහන්ස ගැත්තවුටකරුණා කොට දන් භොජන ශාලාවට වළඳන්ට වඩනා වෙලායයි ආරාධනා කොළේය. ඉක්බිති කරුණා ගුණාකරවූ ඒ පියුම තුරා නම් බුදුරජාණන් වහන්සේ ශ්‍රමණ ගණයා පිරිවරා සන්ධ්‍යාවලා විදුලිය කැලවැළඳි රන් මෙරක්සේ දිලිහි දිලිහී මහාජනයාගේ මහ නුවන් තමන් වහන්සේ කරා හයමින් එබු එබූ පත්ලෙහි පියුම් දක්ව දක්වා මිහිකත සනහමින් වැඩවිකැර එ කෙළෙඹි පුත්‍රයාගේ ගෙහි පනවතලද බුඩාසන මස්තකයෙහි මහ සඟ පිරිවරින් වැඩ උන්සේක. එකල්හි කෙළෙඹි පුත්‍රතෙම තමාගේ පරිවාර ජනයන් හා සමග රුස්ව පිළියෙළ කළාවූ මධුර අන්නපානාදියෙන් බුදුපාමොක් මහා සංඝයා වහන්සේ වළඳ වන්නට පටන් ගත්තේයි එකල්හි එබුදුන්ගේශාසනයෙහි ධූතාඞ්ගධර භික්ෂූන් වහන්සේ කෙරෙන් අග්‍ර ස්ථානාන්තර ප්‍රාප්තවූ වසභ නම් එක් මහතෙර කෙනෙකුන් වහන්සේ සපදානචාරිකායෙන් පිඬු සිඟාගෙ පිළිවෙළින් වඩනාසේක් ඒ කෙළෙඹි පුත්‍රයාණන්ගේ ගෘහද්වාරයට පැමිණ සිඟා සිටිසේක. එක්බිති ඒ කෙළෙඹි පුත්‍රතෙම වැඩසිටි තෙරුන් වහන්සේදැක ස්වාමීනි බුදුහු මහසඟ පිරිවරින් දන් මේ ඇතුළු ගෙහිදී වළඳනු පිණිස වැඩහුන්සේක එසේහෙයින් නුඹවහන්සේත් ගැත්තවුට කරුණා කොට වැළඳීමට වැඩිය මැනවැයි ආරාධනා කොළේය. ඒ තෙරුන් වහන්සේ වනාහි තමන් වහන්සේ උත්කෘෂ්ට සපදාන චාරික හෙයින් ඇතුළු ගෙට නොවැද උත්තමාධම මධ්‍යම සත්වයන් කෙරෙහි සමව පවත්නා චන්ද්‍රා[illegible]නහිසේ සියලු සත්වයන් කෙරෙහි මෙත් සිත් පතුරුවා ගෙපිළිවෙළින් සිඟමින් වෙන ගෘහද්වාරයකට වැඩිසේක. එවෙලෙහි ඒ කෙළෙඹි පුත්‍ර තෙම බුදුන් කරා ගොස් එපවත් දක්වා කිමෙක්ද ස්වාමිනි දෙව් මිනිසුන් සහිත මේ සමස්ත ලොකයෙහි සියලු ගුණ ධර්මයෙන්ම ලොවුතුරා බුදුන්ට වඩනා කෙනෙක් ඇද්දැයි විචාළේය. එසේ කෙළෙඹි පුත්‍රයා විචාළ කල්හි අසම සමවූ බුදුරජාණන් වහන්සේ ඔහට පුත්‍රොපමාවක් දක්වා තෙරුන් වහන්සේගේ අප්‍රමෙයවූ ගුණ සමූහයන් ප්‍රකාශ කිරීම වශයෙන් වර්ණනාකොට දක්වා වදාරනසේක්:

"පාලෙන්ති නිම්මලං සත්වා පාතිමොක්ඛාදි සංවරං
සමාදින්නධුතඞ්ගා ච-අප්පිච්ඡා මුනිසූනවො.

නිච්චමන්තකසුඛම්හි-තඬ්ඩයොධාව දප්පිතා,
පුඤ්ඤක්ඛෙත්තං චතුබ්භූතා තෙ-දෙවමානුසකාදිනං.

ධාරෙමහං වණ්ණවන්තං-සිවෙය්‍යං පි ච චීවරං,
බුද්ධපුත්තා මහානාගා-න ධාරෙන්ති තථා විධං.

ධාරෙන්ති තෙ පංසුකූලං-සංඝාටෙත්වා පිලොතිකෙ,
චත්තච්ඡාදනචොළං ච-ඉච්ඡාමොහ විවජ්ජිතා.

සාදියාමි සදා හමෙහා-උපාසකාතිමන්තනං,
නෙව සාදෙන්ති සංබුද්ධ-පුත්තොපාසකයාචනං.

සපදානෙන යං ලද්ධං-ලූඛං වාපි පණීතකං,
තෙන තුස්සන්ති මෙ පුත්තා-රසගෙධවිවජ්ජිතා"යි.

යනාදීන් එම්බල කොළෞඹි පුත්‍රය මාගේ ශ්‍රාවකයෝ චතුර්වි සිව්පස ලාභයෙහි ඉතා අල්පේච්ඡයෝය, සතර සංවර සීලය තමන්ගේ ජීවිතය මෙන් රක්‍ෂා කරන්නාහ. පාංසුකූලිකාංගයයි යනාදිවූ නාම ව්‍යවහාර වශයෙන් තෙළෙසක් ප්‍රභෙද ඇත්තාවූ උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් එකුන් සතලිසක් ප්‍රභෙද ඇත්තාවූ ඉම් සියලුම ධූතාඞ්ගගුණයන් නොපිරිහෙළා සමාදන්ව අඛණ්ඩ කොට රක්‍ෂා කරන්නාහ. එම්බල කොළෞඹිපුත්‍රය මාගේ ශ්‍රාවකයෝ කුලයා කෙරෙහිද චතුර්විධ ප්‍රත්‍යය ලාභයෙහිද ඇල්මක් නැතිව අනුනය ප්‍රතිඝ රහිතව නිෂ්පලිබොධව වසන්නාහුය. එසේ වසන්නාවූ මාගේ ශ්‍රාවකයන්කෙරෙහි ඇතුළත්වූ මේ වසභ නම් මහතෙර තෙම ධූතාඞ්ගධරයන් කෙරෙහි අග්‍ර ස්ථානාන්තර ලත් උත්තමයාණ කෙනෙක් වේදැයි ඒ තෙරුන් වහන්සේගේ අප්‍රමෙයවූ ගුණ ප්‍රකාශකොට වදාළසේක. ඉක්බිති ඒ කොළෞඹි පුත්‍ර තෙම තෙරුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍යමත්වූ ඒ ගුණ විශෙෂයඅසා තෙමේද ඒතනතුරු කැමතිව මමද එතෙවස එක්තරා ලොවුතුරා බුදු කෙනෙකුන් වහන්සේගේ ශාසනයෙහි ධූතාඞ්ගධරයන් කෙරෙහි අග්‍ර වෙම්වයි ප්‍රාර්ථනා කෙරෙමින් බුදුන්ගේ ශ්‍රීපාද මූලයෙහි වැදහොත්තේය බුදුහු ඒ කාරණය අනාගත ඥානයෙන් දැක වදුරා ඔහුගේ ප්‍රාර්ථනාව සිද්ධවනසේ දැක එම්බල කොළෞඹි පුත්‍රය තෙපි මේකල්පයට ලක්‍ෂයක් වන කල්පයෙකින් මත්තෙහි ලොකුත්තමවූ **ගෞතම** නම් බුදු කෙනෙකුන්ගේ ශාසනයෙහි මහණව ධූතාඞ්ගධරයන්කෙරෙහි අග්‍ර ස්ථානාන්තරලදින් **මහාකාශ්‍යප** ස්ථවිරයයි යන නාමින් ප්‍රසිද්ධව මුළුලොවට අග්‍ර දක්‍ෂිණෙය්‍යව එකල බුද්ධශාසනය බබුළුවන්නේ වේදැයි විවරණ දී වදාළසේක.

එවෙලෙහි කොලෙඹි පුත්‍රයාණෝ එමවිටම ලද්දාවූ ස්ථානා
න්තරයක් මෙන් මහත්වූ සන්තොෂයට පැමිණ එතැන්පටන්
බොහෝ කුශල සම්භාරයන් රැස්කොට ඒ ආත්ම භාවයෙන්
චුතව දිව්‍යලොකයෙහි ඉපද බොහෝ දිවසැපත් විඳිමින් මෙසේ
දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි චුති ප්‍රතිසන්ධි වශයෙන් සුරනරසිරි
අනුභව කොට මිට යට එකානූවන කල්පයෙහි බුදුවූ **පියදස්සී**
නම් බුදුන් සමයෙහි දිව්‍ය ලොකයෙන් චුතව අවුත් දඹදිව **එක
සාටක** නම් බමුණුව ඉපද මහ දන්දී බුදුන්ට උපස්ථාන කොට
මෙම ස්ථානාන්තරය පිණිස ඔවුන් වහන්සේගේ පාදමූලයෙහි
වැදහෙව ඒ පියදස්සී නම් බුදුන්ගෙන්ද විවරණ ශ්‍රී ලදින් දිවි
පමණින් බොහෝ පින් රැස්කොට අමරසිරි නිකරයෙන් අපරි
මිතවූ සුරපුර ජනිතව දිව්‍ය සම්පත් විඳිමින් මේ මහා භද්‍ර කල්ප
යෙහි තුන්වෙනිව බුදුවූ **කාශ්‍යප** සර්වඥයන් වහන්සේ ලොවැඩ
වඩා බුදුව වැඩසිට නිවන්පුර පැමිණි පසු **බරණැස්** නුවර සියලු
උපභොග පරිභොග වස්තුවෙන් ආඪ්‍යවූ සිටුකුලයෙක්හි ඉපද
වැඩිවිය පැමිණ මහත්වූ ශ්‍රී සම්පත් අනුභවකොට වාසය කරන්
නාහු: පූර්ව හෙතු බලයෙන් ලද්දාවූ ශ්‍රද්ධා ඇතිව බුදුන්ගේ ශරීර
ධාතූන් වහන්සේට බොහෝ පූජාසත්කාරකිරීමෙන් අප්‍රමාණවූ
කුශල සම්භාරයන්රැස්කොට ඒ ආත්මභාවයෙන් චුතව සංසාර
වෘත්තයෙහි සංචාරය කරන්නාහු. එම අනන්තඃ කල්පයෙහි දස
දහසක් හවුරුද්දට ආයුෂය පැමිණි කල්හි නැවත දඹදිව **බර
ණැස්** නුවර කෙලෙඹි පුත්‍රව ඉපද වැඩිවියපැමිණ සහඹුව රැකෙ
මින් දවසෙක කිසි කටයුත්තක් පිණිස වලට වැද එ වෙනෙහි
ඇවිදිනාහු වනමැද රුකක්මුල වැඩහුන් පසේ බුදු කෙනෙකුන්
වහන්සේ සිවුරක් ගෙත්තම් කරනු දැක ඒ කෙලෙඹි පුත්‍රයාද
උන්වහන්සේ කරා එළඹ මහත් ප්‍රේමයෙන් පසඟ පිහිටුවා වැඳ
එකත් පස්ව සිටියේය එකල්හි පසේ බුදුන් වහන්සේ ගෙත්තම්
කරමින් සිටි සිවුර නුවා මඳහෙයින් පත්කොට තබන්ට වන්
සේක. ඒදැක කෙලෙඹි පුත්‍රයා උන්වහන්සේ අතින් විචාරනුයේ
ස්වාමීනි කිමෙක්ද සිවුර ගෙත්තම් නොකොට පත්කොට තබන
සේක්නැයි විචාළේය. එබසට පසේ බුදුන් වහන්සේ අල්පෙච්ඡ
තාවෙන් කිසිවකුත් නොවදාළසේක එපවත් දැන කෙලෙඹි පුත්‍ර
යාණෝ සිවුරට නුවා මඳහෙයින් ගෙත්තම් නොකොට තබන
සේක්වනැයි සිතා තමන් එකාංශ කොට බහා ගෙනගිය උත්තර
සාටකය ගෙන පසේ බුදුන් වහන්සේගේ පාමුල තබා ස්වාමීනි
ගැත්තවුට කරුණා කොට සිවුරු ගෙත්තම් කොට වදාළ මැන
වැයි කියා පසඟ පිහිටුවා වැඳ අවසර ගෙන තමාගේ වාසස්ථාන
යටම ගියේය. ඉක්බිති පසේ බුදුන්වහන්සේ ඒ උතුරු සළුවෙන්

සිවුරෙහි නුවාලා ගෙත්තම් කොට නිමවා කැපසරුප්ලෙසරඳන් කෙරෙමින් ඒ සිවුරු වැළඳගත්සේක. කෙළෙඹි පුත්‍රයාද උත්තර සාටකය සිවුරට දුන්නාවූ කුශලානුභාවයෙන් ඒ ආත්ම භාවයෙන් චුතව නිදා පිබිදියාක්හු මෙන් තව්තිසා භවනයෙහි ඉපදතුන්කෙළ සැටලක්‍ෂයක් අවුරුද්දට ආයු ලදින් එහි වැස අපමණවූ දිවසිරි අනුභව කොට ආයු කෙලවර ඒ දිව්‍ය ලොකයෙන් චුත් ජම්බුද්වීපයෙහි බරණැස් නුවරට නුදුරුතැනෙක්හි යොත්තක්පමණ දිගු පුළුල් විපි සල්පිල්ආදීන් විශිෂ්ටවූ එක්තරා නියංගමක නාම ගොත්‍රයෙන් අප්‍රසිඬවූ කුලගෙයක උභයකුල පරිසුඬව ජාතවූහ. මෙසේ උපන්නාවූ ඒ කුමාරයන්ට මව්පිය දෙදෙන නන්දියයෝයයි නම් තිබූහ.

තවද ඒ නන්දියයන්ගේ සහොදරවූ සත්බෑ කෙනෙක් වූහ. එසින් වැඩි මහලු සබෑයෝම කෘෂිවණිජාදිවූ නොයෙක් කර්මාන්තයෙහි ව්‍යාවෘතව තමන්ගේ පුත්‍රදාරාදීන් හා තුමූද ජීවත්ව තමන්ගේ මව්පිය දෙදෙනා රක්‍ෂා කරන්නාහ. නන්දියයෝ වනාහි කෘෂිවණිජාදීවූ කිසි කර්මාන්තයකුත් නොකොට දෙමවුපියන් හා තමන් රැකිමට සුදුසු කාය්‍යීකාත් ව්‍යාවෘත නොවී ගෙසිම හිඳිනාහ. එසේ ගෙසිම හිඳිනා හෙයින් වැඩි මාලු සැබෑයෝම ඔහු කෙරෙහි අප්‍රසන්නව මේ මෙහෙවර සොරු බඩපුරා බත කාලා බිජුවට රකිනා කිරළක සෙයින් සිහිල් සෙවන ගෙට වැදලා හින්දදී අපි කුමක් පිණිස මෙහෙවර කොට ඇවිදිමෝදැයි කියා නිරන්තරයෙන් නන්දියයන්ට කිපී අප්‍රසන්නව කථා කරන්නාහ. එ තෙපුල් අසා නන්දියයන්ගේ මව්පිය දෙදෙනා ඔහු ලඟට කැඳවා එම්බා පුතඞ! දුක්පත්ව ගිහිගෙයි වසන්නාවුන් විසින් කිසි කර්මාන්ත නොකොට හැම දවස්ම ගෙට වැදලා හිඳ රැකිගත නොහැක්කේය. එසේහෙයින් තමාගේ උපයා සොයාලන වහලක් සරකාක් නැතිකල දුක් සැප නොසිතා සල් නොවරදවා දඩ බිම කළමනා මෙහෙවර පත්කොටගෙන හැම වේලෙහි අප්‍රමාදව සිහිනුවණ ඇතිව ආලිස්සම් නොවී රැකුන මනාවේදැයි යනාදීන් අවවාද කියන්නාහ එසේ මව්පිය දෙදෙනා අවවාද කරන කල්හි නන්දියයෝ බසකුත් නොබැණ හිඳිනාහ. මෙසේ ඔහු වසන කල්හී එක් දවසෙක රාජ පුරුෂයෝ සියලු ගම්වැස්සන්ම නකත් කෙළියක් කෙළින්ට රුස්උවමැනවැයි කියා රාජ විධානයෙන් බෙරලැවූහ. එකල්හි නන්දියයෝ තමන්ගේ මෑණියන් සමිපයට ගොස් කියන්නාහු: මෑණියන් වහන්ස මමත් අද දවස් නකත් කෙළි කෙළියට යනු කැමැත්තෙමි, එසේහෙයින් මා හැඳගන්ට යහපත් සැටියේ හිණකඩක් දුන මැනවැයි කීහ. එ තෙපුල් අසා නන්දියයන්ගේ මෑණි

යෝ යහපතැයි ගිවිස තමන්ගේ ගෙන් තිසි සාඩක් ගෙන තෙල
හිණකාඩ ගැඳගෙන කොළින්ම පලායවයි කියා යහපත් හිණ
සාඩක් දුන්නාහ. ඒ වස්ත්‍රය දැක නන්දියයෝ මෑණියන්ට කියන්
නාහු: මෑණියන් වහන්ස මේ හිණකාඩ ඉතාම දළය අතික් හිණ
සාඩක් දුන මැනවයි කීහ. කෙනෙක් නොකීකරු උවත් දරුවන්
ගේ බස් මව්පියන්ට ප්‍රියවන බැවින් නැතැයිනොකියා දෙවෙනි
වත් අතික් සිහින් වස්ත්‍රයක් දුන්හ. නන්දියයෝ මෑණියන් දුන්
ඒ වස්ත්‍රය අතින්ගෙන බලා මෙසේවූ පිළිද අප අඳිනේයයි කියා
නොකමැතිව මෑණියන් ඉදිරියට දැමූහ. එසඳ නන්දියයන්ගේ
මෑණියෝ කියන්නාහු: එම්බා පුතණුවනි අපගේ මේ කුලයෙහි
මීට වඩා තිසි සිහින් මොලොක් පිළියෙක් ඇත්තේ නොවෙයි.
ඉදින් යහපත් පිළියෙක් ඇත්නම් මෙබඳු උත්සව දිනයෙක
කොළිනා තොපට නොදී තව කාවුරුන්ට දෙන්ට තබමෝදැයි
කීහ. එ තෙපුල් අසා නන්දියයෝ මෑණියන්ට කියන්නාහු: මේ
කුලයෙහි යහපත් වස්ත්‍රයක් නැතිකල මෑණියන් වහන්ස මම
යහපත් පිළී ලබන තැනකට දැන්ම යෙමී කීහ. එසඳ මෑණියෝ
කියන්නාහු: පුත තෙපි කුමක් කියුවුද, සෙසු දෑ තබා අදදවසම
බරණැස් නුවර රාජ්‍ය සම්පත්තිය තොෂට පැමිණේ නම් මමත්
එම කැමැත්තෙමි, එසේ හෙයින් තොපට එන යම්ම අභිවෘධි
යෙක් අද දවස්ම පැමිණේවයි කියා නන්දියයන්ට කීහ. එසඳ
නන්දියයෝ මෑණියන් කී බසට සතුටුව වැඳ අවසර ඉල්වාගෙන
ගෙන් තික්මුණාහ. ඔවුන් යනවා බලා සිට අඳින්ට දුන් පිළි
නපුරයි උරණින් යනමුත් මාගේ පුතණුවෝ මා කෙරෙහි ප්‍රෙම
ඇත්තෝය. එසේහෙයින් මෙගම ඇර තිරිසන් දරුවෝ කොයි
යෙද්ද, පළමුසේම තම තමන්ගේ අඳුනන ඉතාපුරුදු යහළු මිත්‍ර
යන්ගේ ගේක හිඳ උරණ සංසිඳුවාගෙන සවස බත්කන වෙලා
වට වීනමුත් ගෙට එන්නෝ වේදැයි සිතා ශොක සංසිඳුවා
ගෙන සිටියාහ.

එසඳ නන්දියයෝ තමන් පූර්ව ජාතියෙහි කළාවූ කුසල කර්ම්ය
විසින් මෙහෙයන ලදුව කිසි කෙනෙකුන්ගේ ගෙදරකටත්
නොගොසින් එ නියංගම්න්පිටත්ව මහටතික්මුණාහු: බරණැස්
නුවරට ගොස් සෙනෙවිරදුන් දැක ඔවුන්ගේ ගෙහිම රැඳුණාහ.
ඉක්බිති නන්දියයෝ එක්දවසෙක සෙනෙවිරදුන්ගේ දසකම්
කාරයන් හා සමග කථා කෙරෙමින් හිඳ නිඳන්නාහු: සීනයක්
දැක මහත් භයපත්ව මොරගාපීහ එ ශබ්දය සෙනෙවිරද්දු අසා
කුමක් පිණිස මොරගාපීදැයි විචාළහ. එබසට නන්දියයෝ සෙ
නෙවිරදුන්ට කියන්නාහු: භයපත්වූ සීනයක් දැක මොරගාපී
මියි කීය කොසේවූ ස්වප්නයෙක්ද තොප දුටුයේයයි විචාළ
කල්හි නන්දියයෝ දුටු සීනය කියන්ට මැළිඋවද සෙනෙවිරදුන්

තත්පරව විචාරන හෙයින් ඇති සැටියේම කියන්නාහු: සෙනෙවිරදුන් වහන්සයි කියා නන්දියයෝ තමන්ගේ බඩවැල තුඹස් සිදුරකින් පිටත නික්මුණු හැළි නාගරාජයකුසේ තමන්ගේ මුඛයෙන් පිටත්ව නික්ම මේ දසදහසක් යොදුන් දඹදිව් තෙලෙහි පැතිර නැවත අවුත් තමාගේ මුඛයටම වන්නාසේ දැක භයින් ත්‍රස්තව මොරගාපීමියි කීහ. එසඳ සෙනෙවිරද්දු මේ සිනය විමසනු පිණිස තමන්ගේ කුලූපගවූ පරිබ්‍රාජිකා කෙනෙකුන් සමීපයට ගොස් විචාරන්නාහු: ස්වාමීනි! යම්කිසිවෙක් ස්වප්න යෙන් තමාගේ අතුණු මුඛයෙන් නික්ම සකල ජම්බුද්වීපයෙහි පැතිර නැවත අවුත් මුඛයෙන් ප්‍රවිෂ්ටව උදරාභ්‍යන්තර වන් නාක් මෙන් දුටුයේ වීනම් ඔහට කෙබඳුවූ විපාකයෙක් වේදැයි විචාළහ. එකල පරිබ්‍රාජිකාවෝ කියන්නාහු: ඉදින් යම් ස්ත්‍රියෙක් මෙසේවූ ස්වප්නයක් දුටුවුනම් සත්දවසක් ඇතුළත අභිෂේක ප්‍රාප්ත රජක්හට අගමෙහෙසි වන්නීය. පුරුෂයෙක් මෙබඳුවූ ස්වප්නයක් දුටුයේවීනම් සත්දවසක් ඇතුළත රාජ්‍යශ්‍රියට පැමිණෙන්නේයයි කීහ. මෙසේ පරිබ්‍රාජිකාවන් කී තෙපුල් අසා සෙනෙවිරද්දු තමන් ගෘහයට ගොස් සිතන්නාහු: මිනිසුන්ගේ පින් පව්නම් කවරෙක් බවත් නොදැනෙයි. එසේහෙයින් මුන් හා සමග කල්තබාම ඥාතිසම්බන්ධයක් වීමට යුත්තේයයි සනිෂ්ඨාන කොට තමන්ගේ වඩිනව සිටි දූන් සත්දෙනෙකු ඇතිගෙයින් එයින් එක්කෙනෙකුන් නන්දියයන් අතුරෙහි රඳවනු අභිප්‍රාය ඇතිව එකියන දූන් සත්දෙනාම ළඟට කැඳවා ඔවුන්ට වෙන වෙනම කියන්නාහු: එම්බා දරුවෙනි! තොප සත්දෙනාගෙන් මේ නන්දියයන් අතුරෙහි හිඳින්ට අභිප්‍රාය ඇත්තාහු කවුරුදැයි විචාළහ එබසට වැඩිමහලු සදෙනම වෙනවෙනම කියන්නාහු: මේ නන්දියයෝනම් වෙන රටින් මෙතෙනට අමුතුව ආකෙනෙක. එතකුදු උවත් මොවුන්ගේ ජාතිගොත්‍රත් අප ඇමට නොදැනෙන්නේය, රක්ෂාවක් ඇතිකෙනෙකුත් නොවෙයි, අපි උන්ළඟ හිඳ කවර සැපයක් විඳිමෝද, එසේහෙයින් මෙසේවූ දීග අප ඇමට කුමටදැයි කීහ. ඔවුන් අතුරෙන් සදෙනාටම බාල දියණියෝ කියන්නාහු: දෙමව්පියෝනම් දරුවන්ට එකාන්තයෙන්ම වැඩක් මිස අවැඩක් නොකමැත්තාහ, එසේහෙයින් මාගේ මව්පියදෙදෙන යම්කෙනෙකුන්ට පාවා දෙත්නම් එම යහපත් වේදැයිසිතා යහපත නන්දියයන් අතුරෙහි හිඳිමියි කීහ, එතෙපුල් අසා සමාධිව සෙනෙවිරද්දු නන්දියයන් ළඟට කැඳවා තමන්ගේ දියණියන් ඔවුන්ට පාවාදී බොහෝ සැපැක් දුන්හ.

එයින් සත් දවසක් ගියකල එක් දවසෙක ගෙන් නික්ම ඒ ඒ තැන්හි සිත්සේ කෙළඇවිදිනාහු: රජ්ජුරුවන්ගේ මඟුල් උයනට වැද නොයෙක් විසිතුරු බලමින් ගොස් මඟුල්සල වට මුදුනට පැනනැගී හිස වසා පෙරවගෙන වැද හොත්තාහ. එදවසට බරණැස් රජහු කාලක්‍රියාකළ හත්දවසෙක් ඉක්මිණ එ සත් දවස ඇතුළත පුරොහිත සෙනෙවිරද් මණ්ඩලිකාදී හැමදෙනම රජහට කළමනා අවමඞ්ගල්‍ය කෘත්‍යය සියල්ලම නිමවා සත්වන දවස් හැමදෙනම රාජාඞ්ගණයෙහි රැස්වමන්ත්‍රණය කරන්නාහු: මහරජතෙම සවර්ගස්ථවිය, ඔහු ඉක්බිතිව රටරැකලන්ට සුදුසුවූ පුත්‍රරත්නයකුත් නොම ඇත, ඇතිසේඝුත් එකම දියණිකෙනෙකුන් වහන්සේය, රාජ්‍යයනම් කවර තරම් මන්ත්‍රිබල ඇතත් පෘථිවීශ්වර කෙනෙකුන්නැතිව රක්ෂාකොට ගතනොහැක්කේය. එසේහෙයින් මේරාජ්‍යානුශාසකවූ ක්ෂිතිපාලයක්හු පරීක්ෂාකල මැනවැයි නොයෙක් ප්‍රයොග විමසා මෙසේ කටයුතුයයි හැමදෙනම මන්ත්‍රණය කොට පඤ්චකකුධ භාණ්ඩයන් මඟුල් රථයෙහි තබා ආජානීය සෛන්ධවයන් යොදා, මේ රථයගොස් රට රැකගන්ට සුදුසුවූ උත්තමයක්හු ළඟට ගොස් සිටීවයි කියා මඟුල් රථය හැරපීහ. එ හළවාවූ රථය ඉදිරියෙහි නික්මුණුකල්හි එ රථය අනුව පුරොහිතයන්හා මන්ත්‍රිවරුන් සහිතවූ චතුරඟිනී සෙනාව පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය ඝොෂාකරවමින් පසුපස් සෙහි නික්මුණාහ. එකල්හි එ රථය නුවර තුන්විටෙක ප්‍රදක්ෂිණා කොට නැගෙනහිර වහසලින් මඟුල් උයනට නික්මුණේය, එපවත් දැක සමහරකෙනෙක් කියනකල මේ රථය පළමු රජහු උයන් කෙළියට නැඟී යනකල්හි අදිනා අශ්වයෝ තමන් ගියාවූ මාර්ගයෙහි පුරුදුකමින් දුනුත් මඟුලුයනටම නික්මුණාහයි කියා රථය යන ගමන් වළකමෝදැයි කීහ. ඔවුන් කියන්නාවූ ඒ වචනයන් අසා පුරොහිතයන් ඇතුළුවූ ප්‍රාඥ මන්ත්‍රිවරු සුහුසුලුව එසේ නොකියව මඟුලුයනෙහි පින්වත් පුරුෂයක්හු ඇති බවක් නොදෙනෙයි, රථය කැටිවම අපිත් නික්මෙම්හයි කියා රථය නොනවතාම පසු පස්සෙහිම නික්මුණාහ. එකල්හි මහ පෙරහරින් සපිරිවරින් නික්මුණු රථය එල පල්ලව මලින් සශ්‍රීකවූ මඞ්ගලොද්‍යානයට වන: එකල්හි මඟුල්රථය තුන්විටක් උයන ප්‍රදක්ෂිණා කොට තාඤ්ඤියයන් වැදහොත් මඟුල්සල වට සම්පයට ගොස් සලවටද තුන්විටක් පැද කුණුකොට ඔහු නැඟෙන ලෙස් රථය අභිමුඛකොට අශ්වයෝ නුවර දසාවට නමා සිටගත්හ: එකල්හි පුරොහිත බ්‍රාහමණයාණෝ සලවට සම්පයටගොස් තාඤ්ඤිය කුමාරයන් හිසවසා පෙරවහොත් වස්ත්‍රය හරනලෙස ඉස දසාවට අත දිගුකරන්ට හසින් පතුල් දෙක වසා තුබු කඩපොට පහකොට පතුල්දෙක දැක දෙපතුල් තෙළෙහි ලක්ෂණ බලා මේ දසදහසක්

යොදුන් ජම්බුද්වීපය තබා දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සතර මහා ද්වීපයෙහි එකාතපත්‍ර චක්‍රවර්තිරාජ්‍යය කරන්ට සුදුසු මහ පින් ඇතිබව දැන මෙබඳුවූ සලක්ෂණ පුරුෂොත්තමයාණන්ගේ චිත්තධෛර්‍ය්‍ය කිම් දෙහෝයි පරීක්ෂා කරනු පිණිස නොයෙක් සියදහස් ගණන් තූර්‍ය්‍ය ඝොෂාවන් එකවිටම අත්පැහැර අහස්පොළෝ සමුද්‍රය එකවිට ගුගුළාක් මෙන් මහත් ඝොෂා තුන්විටෙක පැවැත්තූහ. එසඳ නන්දිය කුමාරයෝ මේ කිමෙක්දැයි යිසවසා තුබූ වස්ත්‍රය මඳක් පහකොට වට බලමින් සලවට වටකොට සිටි පුරොහිත මැතිවරුන් සහිත මහසෙනඟ දැක තෙපි මෙතැන්හි කුමක් පිණිස අවුදැයි විචාළහ: එබසට පෙරවි බමුණු කියනුයේ දෙවයන්වහන්ස මේ බරණැස් නුවර රාජ්‍යය නුඹවහන්සේට පැමිණියේය: එසේහෙයින් නුඹවහන්සේ නුවරට කැඳවාගෙන යනු පිණිස ආම්හයි කීහ.

එකල්හි නන්දිය කුමාරයෝ යෙහෙන් නැඟීසිට සලවට මුදුනෙහි හිඳ කියන්නාහු: එම්බා පුරුෂයෙනි මෙසේම තොප රජුන් සොයා ඇවිදිනේ කවර කාරණයක් පිණිසද, තොපගේ නුවර රාජ්‍යසම්පත් අනුභවකළ රජ්ජුරුවෝ කොයිදැයි විචාළහ. එබසට අමාත්‍යවරු කියන්නාහු: අදට සත්වන දවස් ස්වර්ගස්ථවූසේකැයි කීහ, එබසට රාජ්‍යය කරන්ට සුදුසුවූ පුත්‍රරත්නයෙක් නැද්දැයි කීහ: එකම කුමාරිකා කෙනෙකුන් වහන්සේ මුත් රාජකුමාරවරු නොමැතැයි කීහ; එබසට නන්දියකුමාරයෝ එසේවීනම් යහපතැයි කියා රාජ්‍යය ගිවිස්සහ. ඒ ක්ෂණයෙහි රැස්වූ අමාත්‍යවරහු එ මඟුලුයනෙහිම මඞ්ගලසම්මතවූ විසිතුරු මණ්ඩපයක් කරවා බරණැස් රජහුගේ ධීතෘවූ රාජ කුමාරිකාවන් සර්වාභරණයෙන් සරහමින් ශ්වෙතචෛල මාලා විලෙපනාදීන් මඞ්ගල වෙශයෙන් භූෂිතකොට මහත් උත්සවයෙන් එවිටම මඟුලුයනට කැඳවාගෙන අවුත් නන්දියකුමාරයන්ට අභිෂෙක පළඳවනු පිණිස ලක්ෂයක් වටනා සළුවක් ගෙනවුත් සළුවඩන්ට අතට දුන්හ: එසඳ නන්දිය කුමාරයෝ එ සළුව දැක කියන්නාහු. සගයෙනි මේ කුමක්දැයි පුළුවුත්හ: එබසට අමාත්‍යවරු කියන්නාහු නුඹවහන්සේ සූසැට ආභරණ සහිත අභිෂෙකප්‍රාප්තවනු පිණිස වඩන්ට ගෙනා සළුවෙකැයි කීහ: එබසට නන්දියකුමාරයෝ කියන්නාහු: එම්බාසගයෙනි තොපගේ පළමුරජ්ජුරුවන් ඇන්දේත් මෙසේම පිළිද, මෙසේවූ දළපිළි අපට කුමක් පිණිස අඳින්ට ගෙනවුදැයි කීහ. එබසට අමාත්‍යවරු කියන්නාහු: මේ වස්ත්‍රයට වැඩිතරම් සාටකයෙක් අපගේ රාජභාණ්ඩාරයෙහි නොමැත්තේය: මීට වැඩිතරම් පිළියෙක් අපවිසින් ඔබවහන්සේට වඩනා ලෙස හෙනනොහෙම්හයි කීහ එබසට නන්දියකුමාරයෝ කියන්නාහු: තොප භාණ්ඩාරයෙහි සිහින් පිළි නොමැත්තේ වීනම්

සුවර්ණභිංකාරයෙන් දිය පුරාගෙනෙවයි කීහ. එපමත් ඇසූ අමාත්‍යවරු ක්ලේසම කනකාභිංකාරයෙන් ජලය එළවූහ: එසඳ හුනස්නෙන් පැනනැඟී හස්ත මුඛ ධොවනය කොට සතරදිගට ජලාඤ්ජලීන් සම්පූර්ණකොට වැඩූකල්හි මහාපෘථිවිය දෑදුරුකොටගෙන සතරදිග කප්රුක් සූසැටක් පැනනැංගාහ: එසඳ රැස්වූ මහජනතාව එපවත්දැක මහත්වූ ආශ්චර්යයට පැමිණ මහත් සන්තොෂයෙන් සාධුකාර දෙමින් ඔල්වරහඬගසමින් අත්පොළසන් දෙමින් පිළී හිස නටවමින් සාධුක්‍රීඩා කළහ: එසඳ නන්දිය කුමාරයෝ කල්පවෘක්ෂයට අත දිගුකොට දිව්‍යවස්ත්‍රගෙන අභිප්‍රාය ලෙස හැඳ දිවසළුවක් එකාංශකොට:බහාගෙන රත්පට රුවන්යෝළු ආදීවූ සූසැට ආභරණයෙන් සැරසී අභිෂෙකප්‍රාප්තව රාජකන්‍යාව අගබිසෝකොට එ මඟුල් මඩුවෙහි සරහන ලද සිංහාසන මස්තකයෙහි වැඩහුන්කල්හි, විදුලියකැල වැළඳි ශ්‍යාමමෙඝකූටයක්මෙන් සර්වාභරණයෙන් සරහන ලද්දාවූ මඟුලැතු ගෙනවුත් ස්වාමීනි නුවරට වැඩිය මැනවැයි කීකල්හි සතරන් පාදුකා මුදුනෙන් හස්තීන්ද්‍ර සමීපයට ගොස් රුවන්හිණින් වරවාරණාරූඪව සියදහස්ගණන් ධවලච්ඡත්‍රනංවා රන්රිදී මිණිමිටිබඳ නානාවර්ණ චාමර විහිදුවමින් මහත්උත්සවයෙන් සමස්ත සත්ත්වයන්ට දෙවෙන්ද්‍රශ්‍රී දක්ව දක්වා බරණැස් නුවරට වැද පියුම් වැසූ සුවඳ දියපිරී පුන්කලස් පෙළින් දෙපස සැරසූ මඟුල් මහවේ මැදින් ගොස් සුරවිමනක් වැනිවූ ඒ රාජභවනයටවැද බරණැස් නුවර රාජ්‍යශ්‍රී අනුභවකරන්නාහු:එතැන්පටන් නන්දියරජ්ජුරුවන්ගේ අණසක පවත්නා විජිතයෙහි වස්ත්‍ර පිණිස සියලු සත්වයෝම වෙහෙස නොවිඳ කල්පවෘක්ෂයෙන්ම වස්ත්‍රගෙනඅඳිත්වයි කියා නුවර බෙරලවා දැහැමෙන් රාජ්‍ය කරන්නාහු: දවසෙක තමන්ගේ බිසවුන්ගේ යාච්ඤාවෙන් දනක් දෙනුපිණිස ජයකුසුම මල්මිටක් අහසට දමා පද්මවතී බිසවුන්ගේ පුත්වූ මහාපදුම නම් පසේබුදුන්වහන්සේ ඇතුළුවූ පන්සියයක් පසේබුදුවරයන් වහන්සේ හිමාලය පර්වතයෙහි ගන්ධමාදනකුළ අස නන්දමූල ප්‍රාග්භාරයෙන් බරණැස්නුවරට ගෙන්වා ආරාධනාකොට මහදන් දෙමින් තමන්ගේ උයනෙහිම වස්වා ඔවුන්වහන්සේලා අනුපාදිසෙස නිර්වාණධාතුයෙන් නිවන්පුර වැඩිපසු ධාතුගෙන බරණැස බොහෝ දහගබ් බඳවා සපිරිවර නගරවාසීන් හා සමඟ අප්‍රමාණවූ පූජාසත්කාර පවත්වමින් තමන්විසින් ප්‍රත්‍යක්ෂයෙන් දුටු මේහැම අනිත්‍යයමෙනෙහිකොට මහත් සංවෙගයට පැමිණ සසර කලකිරී තමන්ගේ ජ්‍යෙෂ්ඨපුත්‍රයාණන් රාජ්‍ය සම්පත්තියෙහි පිහිටුවා තුමූ මහණව තමන්ගේ මඟුලුයනෙහි වැස ශ්‍රමණ

ධර්මයන් පූරණය කරන්නාහ. බිසව්ද එලෙසම ප්‍රව්‍රජ්‍යාවට පැමිණ එම උයනෙහි එක්පසෙක වෙසෙමින් මහණදම් පුරා දෙදෙනම නොබෝකලකින් පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන සැපයෙන් වැස කෙළවර දෙදෙනම අපරිහීණ ධ්‍යානයෙන් බ්‍රහ්මලොකයෙහි උපන්නාහ.

මෙසේ බ්‍රහ්මලොකයෙහි ජනිතවූ නන්දිය මහරජාණන්හා බිසව් එහි ආයුපමණින් ධ්‍යානසැප විඳ වැස අප **මහාගෞතම** බුදුන් සමයෙහි එයින් චුතව දඹදිව එක්තරා ගමක **කාශ්‍යප ගොත්‍රවූ** බමුණුමහසල් කුලයෙක්හි ඉපද **පිප්පලි කුමාරයයි** යන නමින් සකල ලොකවාසීන්ගේ මනනුවන් නමන් කරා හයන රූපශ්‍රීන් යුක්තව වැඩිවිය පැමිණියහ. එකල්හි පෙර නන්දිය රජ්ජුරුවන්ගේ බිසව්ද ඔවුන්හා සමඟ බ්‍රහ්මලොකයෙහි උපන්නාහු; නැවතත් එයින් චුතව එම බමුණුගම බ්‍රාහ්මණ කුලයෙක්හි ඉපද **භද්‍රකාපිලානියයි** යන නමින් ප්‍රසිද්ධව මනොඥවූ රූපශ්‍රීන් යුක්තව වැඩිවඩිනවූවාහු: පූර්ව ජාතියෙහි හෙතු බලයෙන් පිප්ඵලි කුමාරයන්කෙරෙහි වැස කල්යාමකින් දෙදෙනම ගිහිගෙයි කලකිරී ලොකොත්තර ගුණ ඇති උත්තමයාණ කෙනෙකුන් වහන්සේගේ නමට මහණ වම්හයි කියා වාසය කරන කල්හි, දවසෙක ලොකයෙහි ලොවුතුරා සර්වඥයන් වහන්සේ ප්‍රාදුර්භූතව අමෘතමහාමෙඝයක් වර්ෂාකරන්නාසේ සද්ධර්ම දෙශනාකොරෙමින් සකලසත්වයන්ට නිවන් පුරසිරි ගෙන හැර දෙනසේකැයි යනු අසා අපිද ඒ උත්තමයාණන්වහන්සේ උදෙසාම මහණවම්හයි කාෂාය වස්ත්‍රයන් ගෙනහැඳ පෙරව මහණවෙස්ගෙන බුදුන් දක්නාපිණිස සවකිය ස්ථානයෙන් නික්මුණාහ එදවස් අලුයම්වේලෙහි බුදුහු කෙළලක්ෂයක් සමාපත්තියට සමවැද අද්දවස් කවරක්හු සසරින් ගොඩලා නිවන්පුර සිරි ගෙනහැර දෙම්දෝහොයි සිතා කාරුණාවෙන් ලෝ බලනසේක් මේ දෙදෙනා දිවසින් දැක ඔවුන්කෙරෙහි ජනිතවූ මෛත්‍රියෙන් තුන්ගව්වක් පමණ තැන් ඉදිරියට වැඩ මගින් ඉවත එක්තරා වෘක්ෂ මූලයෙක්හි වැඩසිටිසේක එදවස් නික්ම එන්නාවූ මේ පිප්ඵලි කුමාරයන් හා භද්‍රකාපිලානී දෙදෙන උනුන්හා කථා කරන්නාහු: අපිදැන් යෞවන අවස්ථාවෙහිසිට මහණව එකමඟ යන කල්හි දුටු දුටු කෙනෙක් නින්දාකරන්නාහුයයි කියා අතුරෙහි මං දෙකක් බෙදුණු තැනක් දැක දකුණත් මඟ පිප්ඵලී කුමාරයෝනික්මුණාහ. වමත භද්‍රකාපිලානී තොම නික්මුණාය. මෙසේ වෙන්ව නික්මුණාවූ ඒ දෙදෙනාගෙන් පිප්ඵලීකුමාරයෝ අවුත් එපෙරමඟ සමීපයෙහි වෘක්ෂමූලය සරහා වැඩසිටි

සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ දැක මහත්වූ ප්‍රීතීන් ප්‍රමෝ
ද්‍යව පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව තමන් පෙර නුදුටු විරූ
රූපශ්‍රියක් හෙයින් විඳ විඳ බල බලා සිටියහ. එකල්හි කරුණා
නිධානවූ විපදෝත්තමයාණන්වහන්සේ ඕහට ගොත්‍රනාමයෙන්
කාශ්‍යපයෙනියි ආමන්ත්‍රණය කොට ධර්මදේශනා කරනසේක්:
ත්‍රිවිධ අවවාදයෙන් උපසම්පදා කරවා ඔහු ලඟන්නවා බණ වදාළ
සේක. මේ කවර සිත් සැනහීමෙක්දැයි සද්ධර්මප්‍රීතීන් ප්‍රමුදිතව
සද්ධර්මාමෘත රසාස්වාදනය කෙරෙමින් රහත්ව වැඩසිටිසේක්:
තමන්වහන්සේගේ කර තුබූ පටපිලොතිකා සංඝාටි චීවරය
සතරපටින් ඒ වෘක්ෂමූලයෙහි පනවා භාග්‍යවතුන්වහන්ස මට
බොහෝ කලක් වන්නාවූ හිතසැප පිණිස මේ සංඝාටි චීවරය
මස්තකයෙහි පලක්බැඳ වැඩහුන මැනවැයි දෙහොත් මුදුන්
දිදී ආරාධනා කළසේක. එසඳ සර්වඥයන්වහන්සේ පට පිලො
තිකා චීවර මස්තකයෙහි වැඩහිඳ රත්නපද්මයක් වැනිවූ තමන්
වහන්සේගේ මෘදු කොමල ශ්‍රී හස්තයෙන් වැඩඋන් සඟළසිවුර
පිරිමැද වදාරන සේක්:. කාශ්‍යපයෙනි තොපගේ මේ පටකඩ
සඟල සිවුර ඉතාම මෘදුයයි වදාළසේක. එසඳ මහාකාශ්‍යප
ස්ථවිරයන් වහන්සේද බුදුන් ඒ සිවුරෙහි ගුණ වදාළහෙයින්
නැවත ඒ සිවුර තමන්වහන්සේ හැරගෙන වැළඳගැන්ම සුදුසු
නොවෙයි සිතා මහතුන්විසින් කිසියම් වස්තුවෙක ගුණ කිව
හොත් ඒ වස්තුව ඒ මහාත්මයන්ට පැමිණවීම චාරිත්‍ර ධර්මයක්
හෙයිනුත්, බුදුන් වදාළ වචනය අසා දන්ඵන සේක්: ධර්මස්වාමීන්
වහන්ස මාකෙරෙහි අනුකම්පාකොට පටකඩ සිවුර පිළිගන
මැනැවැයි කීසේක. එසඳ සර්වඥයන් වහන්සේද තමන් වහන්
සේ වැළඳි පාංශුකූල චීවරය මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ
මුත් මේලොකයෙහි වැළඳගන්ට කිසිවක්හටත් නොපිළිවන්
හෙයින් කාශ්‍යපයෙනි මාවිසින් කලක් වැළන්දවූ සඟල සිවුර
ධරන්ට තොපවිසින් පිළිවන්දැයි වදාළසේක උන්වහන්සේ එප
වත් මුදුනෙන් පිළිගෙන ස්වාමිනි ඒ පාංශුකූල චීවරය ධරන්ට
මට පිළිවනැයි දැන්වූසේක. බුදුහු උන්වහන්සේ ඇතුන් පස්
දෙනකුගේ බල දරන බව දැන මේ සිවුර ධරන්ට පිළිවන්දැයි
වදාළේ නම් මතු තෙළෙස් ධුතාඞ්ගයම උත්කෘෂ්ට වශයෙන් පුර
මින් මාගේ ප්‍රතිපත්තිශාසනය බබුළුවන්ට හැක්කේදැයි විචාළ
නියාය. උන්වහන්සේද එසේම ප්‍රතිපත්ති ශාසනය බබුළුවන්ට
සමර්ථහෙයින් මේ සුගත චීවරය පිළිපදනෙම් මම්මයයිසිතා ධර්ම
රාජොත්තමයාණන් වහන්ස සාණවාත පාංශුකූල චීවරය ධර
මියි කීසේක.

එකල්හි බුදුහු චීවර පරිවර්තනය කරනසේක් උන්වහන්
සේගේ සිවුර තමන්වහන්සේ වැළඳගත් සේක. සර්වඥයන්
වහන්සේ වැළඳි සිවුර මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ පෙරව

ගත් සේක. එසඳ දෙලක්‍ෂ සතළිස්දහසක් යොදුන් ඝනකඩ
බොල්මහපොළොව ජලපොළොව දක්වා මහත්පවන් පහළ
පල්ලවයක්සේ කම්පිතව ශතසහස්‍රරාවයෙන් ගර්ජිතා කෙළේය.
මෙසේ බුදුහු මේ පාංශුකූල චීවරය පූර්ණානම් දාසියක කාලක්‍රියා
කළ පසු අනර්ඝවූ වස්ත්‍රයකින්වසා අමුසොහොනකට ගෙනගොස්
දැමූකල්හි ඉදිම තිල්ව කෘමිකුලයාවිසින් ආකුලව වැසූ වස්ත්‍රය
බරව තිබූ තිඹක් පමණ කෘමි සමූහයා සලා මහත්වූ ආර්යවංශ
යෙහි සිට ඇරගත්තාවූ චීවර හෙයිනුත්, එ සිවුර හැරගත් දවස්
දසදහසක් සක්වල දසදහසක් මහාපෘථිවීහු විවර වන්නාක්
මෙන් ගර්ජිතාකළහ. අහසද එසේම මහත්කොට ගර්ජිතා කෙ
ළේය. දසදහසක් සක්වළ හැම දෙව්බඹහුද සාධුකාර දුන්හ.
එසේ හෙයින් ලොව්තුරාබුදුන් හැර මේ සිවුර ධරන්නාවූ අන්
භික්‍ෂුවෙක් ඇත්නම් ඔහු විසින් තෙළෙස් ධූතාඞ්ගයම උත්කෘෂ්ට
වශයෙන් පිරිය යුත්තේය. සර්වඥයන් වහන්සේද උන්වහන්
සේගේ සිවුර කුමක් පිණිස පරිවර්තනය කිරීමට අභිප්‍රායවූ
සේක්දයත්? ඒ සිවුරගෙන තමන්වහන්සේගේ අනුසස් මහත්වූ
පාංශුකූල චීවරය දෙමින් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේද
තමන්වහන්සේට සමවූ ස්ථානාන්තරයෙහි තබනුපිණිස චීවරය
පරිවර්තනය කරනු කැමති වූසේක. කිමෙක්ද, එකාසංඛ්‍ය කප්
ලක්‍ෂයක් පාරමිතා පුරා අග්‍ර ශ්‍රාවකස්ථානාන්තරයට ප්‍රාර්ථනා
කොට ආවාවූ **සැරියුත් මහමුගලන්** දෙදෙනාවහන්සේ වැඩ
සිටියදී කුමක්පිණිස මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ තමන්
වහන්සේටසමවූ ස්ථානාන්තරයෙහි තුබූ සේක්දයත්? ඒ අගසව්
දෙදෙනාවහනසේ තම බුදුන් ජීවමානකල්හිම පිරිනිවන් පානා
සේක. මහා කාශ්‍යප ස්ථවිරයන්වහන්සේ වනාහී එක්සියවිසි
අවුරුද්දක් සම්පූර්ණවූ ආයුෂය ඇතිසේක. එසේහෙයින් බුදුන්
පිරිනිවියත් උන්වහන්සේ බුදුන් වැඩසිටියාසේම සපර්යාප්තික
නවලොකොත්තරසද්ධර්ම පාලිකොටතබාගෙන නවාඞ්ග ශාස්තෘ
ශාසනය නිර්මලකොට බබුළුවා බුදුන් වදාළාවූ ධර්මය පන්දහසක්
හවුරුදු පවත්නාලෙස සංගායනා කරන සේකැයි කියා බුදුහු
තමන්වහන්සේට සමවූ ස්ථානාන්තරයෙහි පිහිටුවූකල භික්‍ෂූන්
වහන්සේත් උන්වහන්සේට ආදර බහුමාන කිරීමට සිතනසේ
කැයි යනම් හැමබුදුහු අනාවරණඥානයෙන්මදැක සනාථ්ඥාන
කොට චීවර පරිවර්තනය කළසේකැයි දතයුතු. එසඳ චක්‍රවර්ති
රජක්හු සවකීය රාජවංශය කලක් පවත්නාවූ පුත්‍රරත්නයකට
තමාගේ ශරීරයෙහිබඟනලද්දාවූ කවචයක් ඔහු ප්‍රසාධනයකරවා
මත්තට ලෝවැඩ පිහිටුවූවාක්මෙන් තමන්වහන්සේ වැළඳී
මෙබඳු චීවරය දෙමින් මත්තෙහි ශාසන රක්‍ෂාව කරනලෙස

කාශ්‍යප ස්ථවිරයන්වහන්සේට භාරකෙළේ ඉතාම යහපත ලොකස්වාමිවූ බුදුරජාණන්වහන්සේගේ කාරුණ්‍ය මහිමයකැයි මුළු තුන්ලොව දිව්‍ය බ්‍රහ්මාදීහු එකාපැහැර සාධුකාර දුන්හ. මෙසේ එතැන්හි වැඩහුන් කල්හි බුදුන්ගේ අධිෂ්ඨාන බලයෙන් භද්‍රකාපිලානීද එතැන්හි පැමිණ ජනිතවූ අප්‍රමාණ සන්තොෂයෙන් යුක්තව පසඟ පිහිටුවා වැඳ සර්වඥයන්වහන්සේ විසින් වදාරන ලද්දාවූ සද්ධර්මාමෘත පානයකොට මාර්ගඵල ප්‍රාප්තව අමෘත මහා නිර්වාණය සාක්ෂාත්කළහ.

මෙසේ ඒ මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ මීට යටලක්ෂයක් වන කල්පයෙහිදී **පියුමතුරා** නම් බුදුන් දැක ලත් විවරණයටම සුදුසුලෙස ප්‍රාර්ථනා කෙරෙමින් අත්වූ මෙකල බුදුසසුන් වැද මහණව බණ අසා රහත්ව ප්‍රාර්ථනාකළ ලෙසම අප බුදුන්ගේ ශාසනයෙහි තෙළෙස් ධූතාඞ්ගධර ප්‍රතිපත්තිසාර මහා සංඝයාවහන්සේට අග්‍රප්‍රාප්තව ධූතාඞ්ගධරයන් කෙරෙන් මහාකාශ්‍යප ස්ථවිරයෝ අග්‍රප්‍රාප්තයෝයයි බුදුන් අතින් ස්ථානාන්තර ලැබ තෙළෙස් ධූතාඞ්ගයන්ම උත්කෘෂ්ටවශයෙන් පිරූසේක.

**තෙළෙස් ධූතාඞ්ග නම් කවරේදැයි යතහොත්?** පංසුකූලිකාඞ්ගය තෙචීවරිකාඞ්ගය පිණ්ඩපාතිකාඞ්ගය සපදානචාරිකාඞ්ගය ඒකාසනිකාඞ්ගය පත්තපිණ්ඩිකාඞ්ගය ඛලුපච්ඡාභත්තිකාඞ්ගය ආරඤ්ඤකාඞ්ගය රුක්ඛමූලිකාඞ්ගය අබ්භොකාසිකාඞ්ගය සොසානිකාඞ්ගය යථාසන්ථිකාඞ්ගය නෙසජ්ජිකාඞ්ගයයි යන මේ තෙළෙස් ධූතාඞ්ග නම්වේ. මේතෙරස ධූතාඞ්ගයම උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් තිස්නවයෙක් වෙයි සමාදාන විධානප්‍රභෙද ආනිසංස වශයෙන් පන්සැටක් ප්‍රකාරවෙයි. ගුණවශයෙන් අනෙකවිධවේ මෙබඳුවූ තෙළෙස් ධූතාඞ්ගය උත්කෘෂ්ටවශයෙන්ම පුරමින් ප්‍රතිපත්ති ශාසන නැමැති පද්මශරසිය ප්‍රබොධකළාවූ ළහිරුමඬලක්මෙන් සුගතශාසන නැමැති ආකාශයෙහි බබළනසේක්: අපමණවූ දිව්‍ය මනුෂ්‍යයන්ට ස්වර්ගමොක්ෂ සම්පත් සිඞකොට දෙමින් සකල ලොකානන්ද කැර වැඩවසනසේක. මෙසේ තෘතීය ශ්‍රාවකවූ මහසුප් මහතෙරුන්වහන්සේ බුදුන් හා සමග **සැවැත් නුවර ජෙතවනාරාමයෙහි** වසනකල්හි, එනුවර එක්තරා උපාසිකාවක් මහසුප් මහතෙරුන්වහන්සේ දැක තමා පූර්වජාතියෙහි උන්වහන්සේට මාතෘවූ හෙයින් ඒ ජාතියෙහි උපන්නාවූ පුත්‍රස්නෙහය මේ ජාතියෙහි දුටුගමනේම ස්නෙහ ඉපද මාගේ පුත්‍රණුවත් වහන්සේයයි කියා දුටුතැන් පටන් උන්වහන්සේට දවස බත්සැන්දක් තබා දෙන්නීය. ඒ මහසුප් මහතෙරුන් වහන්සේ නම් බුදුන්ට සතරඟුලක් පමණ මිටිබව මුත් බුදුන්හා එක්වැනිවූ රූපසොභා සම්පන්නසේක. මහසුප් මහතෙරුන්වහන්සේ දුටුවාවූ සත්වයෝ බුදුහු වැඩිසේකැයි බොහෝසේ

කියති. මෙසේ එක්දවසෙක සර්වඥයන්වහන්සේ එකාචාරි සිංහ
රාජයකුසේ ආනන්ද ස්ථවිරයන්වහන්සේ විවරකුත් කැටුව
කැඳවා නොගෙන අප්‍රසිද්ධව දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්හා
අසූ අනු ව්‍යඤ්ජන ලක්ෂණයන් ප්‍රච්ඡන්න කොට ගෙන වෛනෙය්‍ය
ජනයන් උදෙසා ඒ සැවැත්නුවර ගෙපිළිවෙළින් සිඟා වඩනා
සේක. එදවස් මහසුප් මහතෙරුන් වහන්සේට බත්සැන්ද පිළි
ගන්වන ඒ ස්ත්‍රී තොම බුදුන් දැක තමාගේ පුතාණුවන්වහන්සේ
යයි සිතා බුදුන්ට ඒ බත්සැන්ද පිළිගන්වා පුව, බුදුහු ඒ බත්
සැන්ද පිළිගෙන ඒ ගෙදොර පියවා මඳක්තැන් වැඩපි කල්හි
මහසුප් මහතෙරුන්වහන්සේ අවුත් සිඟා වැඩසිටිසේක එවේ
ලෙහි ඒ උපාසිකා තොම උන්වහන්සේ දැක මපුතාණුවන් වහ
න්සේ මෙතෙක සිටියදි මාදෙන බත්සැන්ද අද ගෙනගියසේක්
කවුරුන්වහන්සේදැයි කියා මේ කිමෙක්ද මෙසේවූ නොදැන්
මෙක් කාට විදැයි තොමෝම තමාටම කියකියා සුහුව සුහුව
බුදුන්හඹා ගොස්මඳක්සිටිනවිහන්සැයිකියාබුදුන්පාත්‍රයෙහිතිබූ
බත් සැන්ද තමා පිළිගැන්වූ පමණම උකාගෙන බුදුන්ගේ අධිෂ්
ඨාන බලයෙන් පාත්‍රයෙන් වෙන බත් උලකුත් මිශ්‍ර නොකොට
බත් සැන්ද ගෙනවුත් මහසුප් මහතෙරුන් වහන්සේගේ පාත්‍රය
ටම පිළිගැන්වුව. එසඳ සර්වඥයන්වහන්සේ මේ කවර කාරණ
යෙක් දෝහොයි දිවසින් බැලූසේක්: තමන්වහන්සේ සාරාසං
ඛෙය්‍ය කප් ලක්ෂයක් මුළුල්ලෙහි දානපාරමිතාව මස්තක ප්‍රාප්ත
කරනු පිණිස සකල ලොක සත්වයන් සිත් පුරා වත්නාවූ සත්ත
සතකාදි මහාදානයෙන් වෝතොමෝ බත්උලක් විවරත් නො
ලද්දිය එතෙක් කල් මුළුල්ලෙහි පරසක්වළම ඇවිදි හෙයින්
දැන් මට දන්දීමට ඇට හෙතුමදැයි දැක වැඩවදාළසේක. එවේ
ලෙහි මහසුප් මහතෙරුන් වහන්සේ බුදුන්ට මේ කළාවූ 'අනාද
රය දැක බුදුන්හා මා හා එක නුවර සිඟන හෙයින් මෙසේවූ
අනාදරයෙක් බුදුන්ට වියයි සංවෙග උපදවා අදපටන් ජීවිතා
න්තය දක්වා මාගේ සර්වඥයන් වහන්සේ සිඟාවළඳන එකානුව
රෙක නොසිඟමියි සිතා එදවස්ම හිමාලය වනයට ගොස් එක්
තරා පබ්භාරයක වසනසේක්: ඉදින් බුදුහු යම් දවසෙක පිරිනි
වන් පෑසේක් විනම් මා නො මධ්‍යයෙහි විතානයෙහි ජොති උද්
ගත නොවෙවයි, මේ මාගේ ලෙනදොරසිටි සුපුෂ්පිත වෘක්ෂයෙහි
හැම මල් එදවස් පරවෙවයි කියා අධිෂ්ඨාන කොට ඒ හිමවත
වැඩවසනසේක.

මෙසේ ඒ හිමාලය පර්වතයෙහි වාසය කරන්නාවූ මහසුප්
මහතෙරුන් වහන්සේ කල්යාමෙන් එක් දවසෙක ඒ වෘක්ෂයෙහි
මල්පරව බිම හුණුවාදැක දිවසින් බලා මාගේ ත්‍රිලොගුරුසම්‍යක්

සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේ පිරිනිවන් පෑසේකැයි මහා
සංවේග උපදවා එදවස්ම පන්සියයක් රහතුන් වහන්සේ පිරි
වරා දෙවන බුදුකෙනෙකුන් වහන්සේ පහළ වූවාක් මෙන් දෙවි
බඹ පිරිස් විසින් කරනලද මහත් පූජා විඳිමින් හිමාලය පර්වත
යෙන් නික්ම අවුත් පාවා නම් නුවරට පැමිණ එතැන්හි සිහා
වළඳ කුසිනාරා නුවරට වඩනා පිණිස පන්සියයක් රහතුන්
වහන්සේ හා සමග කාන්තාර මාර්ගයට පැමිණ නික්මුණුසේක්:
මහට නුදුරුව සිටි සිහිල් සෙවණින් යුත් විසිතුරු රුකක් මුල
හැමදෙනා වහන්සේම මදකලක් පාසිවුරුතබා සැතපී වැඩහුන්
සේක. එකල්හි එක්තරා ආජීවකයෙක් කුසිනාරා නුවර සිට
මහත්වූ මඳාර පුෂ්පයක් හිසට කොටගෙන පාවානම් නුවරට
යනු පිණිස එම අධ්වාන මාර්ග ප්‍රතිපන්නවිය. එකල්හි වෘක්ෂ ඡායා
වෙහි වැඩහුන් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ඇතුළුවූ පන්
සියයක් භික්ෂූන් වහන්සේ ඔහු දුරම එනු දැක සමීපයට කැඳවා
එම්බා ආජීවකයාණෙනි දැන් තෙපි කොතැන්හි සිට කොයි
යවුදැයි පුළුවුත් සේක. එබසට ආජීවකයා කියනුයේ: මම කුසි
නාරා නුවර සිට පාවානම් නුවරට යෙමි කීය. එපවත් අසා විචා
රනසේක්: තොපි අපගේ ලොවුතුරා බුදුන් හඳුනවුදැයි කීසේක
එසේය වහන්ස මම බුදුන් හඳුනමි ඒ තොපගේ බුදුහු අද දව
සට සත්වැනි දවස්හි පිරිනිවීගිය, ඒ ශ්‍රමණ භවත් ගෞතම
යන්ගේ පරිනිර්වාණ පූජාවට දෙවියන් වැස්වූ මඳාර පුෂ්ප වර්ෂා
වෙන් මේ එක් මදාරා මලෙකැයි කියා තමා අත තුබූ ඒ පාරිජා
තක පුෂ්පය දැක්වූයේය. එකල්හි මදාරාවල දුටු භික්ෂූන්
වහන්සේ අතුරෙන් අවීතරාගීවූ පෘථග්ජන භික්ෂූන් වහන්සේ
හිස අත තබතබා අඬමින් බිම හෙමින් ඔබ්මොබ පෙරළෙමින්
නොයෙක් බුදුගුණ කියකියා සමස්ත සත්ව මාතෘවූ සද්ධර්මාමෘතය
පානය කරවන්නාවූ සණරන්කඳක් වැනිවූසිතුසිතූ වස්තුසිඩ
කොට දෙන්නාවූ තිලෝගුරු සර්වඥයන් වහන්සේ ඉතාමයුහුව
නිවන්පුර වැඩපුසේක. කලක් දැක දැකහිඳ නෙත්සතහා ගත්
තාවූසතරන් කඳක්වැනි සකල ලක්ෂණාන්විත ශ්‍රී ශරීරයක්ඇති
මෙබඳු බුදුබඳක් ගෙන කොතනක වැඩපුසේක්දැයි කටින් කට
අඳෝනාතෙපුල් කියකියා හඬන්නාවූ පෘථග්ජන භික්ෂූන්වහන්
සේට රහතුන් වහන්සේ නළවා කියනසේක්: ඇවැත්නි මේ
ලෝකයෙහි සියලු සංස්කාර ධර්මයෝම අනිත්‍යයහ දුක්ඛයහ
අනාත්මයහයි අනිත්‍යාදී ප්‍රතිසංයුක්ත බණකියමින් උන්වහන්
සේලා නොහඬනලෙස සංසිඳුවූසේක එකල්හි එපවත් දුටු අභද්‍ර
ගුණඇති සුභද්‍රනම්වූවෘද්ධ ප්‍රව්‍රජිත අශ්‍රද්ධාදූජින පාපී මහණෙක්
පූර්වයෙහි එක්දවසෙක ආතුමානම් නුවරට බුදුන් වැඩිකල්හි
අකප්පිය සමාදනයෙන් තමා පිළියෙළ කළාවූ කැඳක් නොවැ

ලදිය යුතුයයි වදාළ බණට අසන්තුෂ්ටව හිතෙමිව වදාළ බුදු බණට අනාදරයෙන් වෛරබැඳ එතැන්පටන් රොෂයෙන් තිබු හුන්නේ: එදවස් බුදුන් පිරිනිවන් පෑහයි අසා මහත් සමාධිව එතැන්හි ශොකයෙන් වලප්නා ඒ හැම භික්ෂූන්ගෙන් එකී එකී නමක් සමීපයටම ගොස් සතුටු සතුටුව ඔවුන් ඉදිරියට මඳක් මුහුණ දිගුකොට හිස සලා බැම නහමින් මන්ද සමිත දක්වා ඇයි මහණෙනි දැන් තෙපි කුමක් පිණිස හඬවුද මේ කැපය මේ අකැපය මේ කළමනාදෙයය මේ නොකළමනා දෙයය මේකාරියය මේ අකාරියයයි ඇමවිට අප ඇමටකියා වෙහෙස දෙන්නාවූ මහණු පිරිදූකාපුම්හ, ඉදින් අපිහැම කැමැත්තක් කරම්හ, නොකැමැත්තක් නොකරම්හ, එසේ හෙයින් මේ ප්‍රස්ථාවයෙහි අප සොම්නස් උපමනා තැන කුමක් පිණිස දොම්නස් වවුද භවත් ගෞතම ශ්‍රමණයන්ගේ වචන මලෙහි බැඳී බොහෝ වෙහෙස විඳ දැන් මොනවට මිදුනමෝ අපි හැමදෙනම සැපසේ අභිප්‍රායලෙස වසම්හයියිකිය කියා හඬන භික්ෂූන්වහන්සේ සංසිඳුවා ඇවිදිනේය.

එකල්හි ඒ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ඒ වෘද්ධ පබ්බජිතයා දැක සිතනසේක්: මෙබඳු පාපී භික්ෂුහුණේ කර තිබූ සිවුරුකඩ උදුරාගෙන හිස කසාකඩක් සිසාරු චණ්ඩාල කොට හළමැනැවැයි සිතා නැවතත් සිතනසේක්: බුදුන් පිරිනිවී ඇසිල්ලෙහි උන්ගේ ශ්‍රාවකයෝ උනුන්ගේ සිවුරු උදුරන්ට වන්නාහුයයි තීර්ථකයෝ අපට නින්දා කරන්නාහ, එසේහෙයින් පසුව ඊට සුදුසු කාරිය සිතා ගනුම්හයි දැන, එසඳ හැම්දෙනා වහන්සේ වැලප සංහිඳුණු කල්හි මඳක් හිඳ යෙහෙන් පාත්‍ර සිවුරු කරලාගෙන රුවන් වැලයක්සේ කුසිනාරානුවර මල්ලරජුන්ගේ උපවත්තන නම් සල්වනයට අවුත් ඔවුන්ගේ ඔටුනුශාලාවෙහි බුදුන් වැඩූරන්දෙණ පිහිටි චන්දනචිතකය දැකාමහත්වූ ධර්මසංවෙග උපදවා එහි වට තුන්විටෙක ප්‍රදක්ෂිණාකොට ශ්‍රීපාදය දසාවෙන් මඳක් අහසට පැනනැඟී බුදුන් වැඳ හොත්සේක. එසඳ සුවර්ණ භිත්තියෙක වතුරුවා තිබූ විද්‍රුම එලදෙකක් සේ රන්දෙණ පාමුලින් ශ්‍රීපාද දෙක පෙති උන්වහන්සේගේ මස්තකයෙහි පිහිටියේය. එවේලෙහි මහසුප් මහතෙරුන්වහන්සේගේ මෘදු කොමල රන්පියුම් සහලක්වැනිවූ අතුල්දෙකින් බුදුන්ගේපතුල් දෙක අල්වාගෙන,

"සබ්බසංඛත ධම්මෙසු-ඔත්තප්පාකාර සණ්ඨිතං,
ඤණමොගිත භාරානං-ධම්මසංවෙග සන්දිතං"යි.

යනාදීන් දක්වනලද මහත්වූ ධර්මසංවෙගයටපැමිණ ශ්‍රීපාද දෙක මුදුනෙහි තබාගෙන බුදුන්ට සතුතිකොට රූපය වර්ණනා කරනසේක්:

"සසඞ්ඛිතරෙ නාථ-කෙතුමාලාසලංකතො,
දක්ඛිණාවත්තකෙසොසි-නීලාමලසිරොරුහො.

උණ්හීසසීසො රුචිරො-පරිපුණ්ණසිරෙ වරෙ,
අනොලොකිතමුද්ධාසි-සුගන්ධතරමුද්ධනො.

උණ්හීසරුචිරොදර-ලලාටතටසොභිතො,
මුදුතුලනිභොදත-උණ්ණාමණ්ඩලමණ්ඩිතො.

ඉන්දචාපනිභානීල-භූපටාකාසුසජ්ජිතො,
කාංචනංකුසසංකාස-තුංගනාසො විරොචසි.

ලොචනවයමාභාති-පංචවණ්ණසමුජ්ජලං,
දෙහදෙවවිමානම්හි-මණිජාලූපමං තව"යි.

යනාදීන් ගාථා සතකින් රූපවර්ණනා කොට මහතෙරුන් වහන්සේ වැඳිකල්හි ශ්‍රීපාදයුග්මය රත්වලා ගබකින් වැසුණු ළහිරු මඩලක් සේ රත්දෙණි අභ්‍යන්තරයටම වන. එසඳ මහ සුප් මහතෙරුන්වහන්සේ ඇතුළුවූ මහාසංඝයා වහන්සේ සාධුකාරදෙමින් වැඩසිටිසේක. එසඳ සත්දවසක් මුළුල්ලෙහි මඟුල් වෙස්ගත් මල්ලරජුන් මිණි තල්වැට සිය දහස් ගණින් විහිදුවා මොලවාගත නුහුණු ගිනි කපුරු රැසක ඇවිලගත් ගිනිකඳක් සේ සඳුන් දරසෑය මුදුනෙන් මහත් ජොතිසිඛාවපැනනැංගේය. එසේ පැනනැංගාවූ ගිනිකඳින් සල්ගස් අතු පතර තුර හුන් මකුළු දිම් කිඹි ආදීවූ යම් කිසි ක්‍ෂුද්‍ර ප්‍රාණියක්හටත් ගිනිභයක් නුවූයේය. ඒ ගිනිසිළු මුදුනෙහි සිහිල් දියෙහි කොළතා දියකාවත් මෙන් මලිතිකො බොලිති කොවුලු ආදීහු ඔබිනොබ හැසිරෙති. සල් අතුපතර ආදියෙන් පල්ලවයක්පමණකුත් මලානික නුවූයේය මෙසේ නොයෙක් අද්භූතයන් බල බලා මහජනයා සාධුකාර දීදී සිටීනා කල්හි, සංඛ්‍යාපථාතික්‍රාන්ත මහා සංඝයා' වහන්සේගේ මධ්‍යයෙහි මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ එතැන්හි ආතුමා නම නුවර සිට කුසිනාරා නුවරට එන අධ්වන මාර්ගයෙහි සැතපී හුන් තැනදී ආජීවකයා කී වචනයන් අසා වලප්නා භික්‍ෂූන් වහන්සේ සංසිඳුවනු පිණිසයයි සුභද්‍රනම්වූ වෘද්ධ ප්‍රව්‍රජිත අශ්‍රද්ධාධ්‍යාශය ඇති ශාසන ප්‍රතිපක්‍ෂවූ භික්‍ෂුහු කීවාවූ ශාසනාර්බුද අවිදු ලක්‍ෂු බස් ප්‍රකාශකොට කියමින් ඉදිරියේ දවස මෙබඳු පාපී භික්‍ෂුහු මේ පාලිධර්මය වෙන වෙන පක්‍ෂ බල සොයාගෙන නොබෝ දවසකින් නසන්නාහුය, ඉදින් ඒ ධර්ම විනය දීප්තිමත්ව පිහිටියේ විනම් බුදුන් වැඩසිටියාක් වැනි වෙයි.එබැවින් අපිගැම රැස්ව ධර්මය පන්තිකොට තිබුව මැනව, එසේ නොකලොත් මතු අධර්මයදීප්තිමත් වෙයි, ධර්මයපසුබස්සී, අවිනය දීප්තිමත්වෙයි, විනය පසුබස්සී, අධර්ම වාදීහු බලවත් වෙති, ධර්මවාදීහු දුර්වලවෙති, අවිනයවාදීහු බළවත්වෙති, විනය

වැදිහු දුර්වලවෙති යි කීසේක. එපවත් ඇසූ මහා සංඝයාවහන්
සේ කියනසේක්: මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්ස එසේවීනම්
ධර්මය පන්තිකොට ගන්නාලෙස සුදුසුවූ භික්ෂූන්වහන්සේ අදම
තෝරාගත මැනවැයි කීහ. එබසට මහා කාශ්‍යප ස්ථවිරයන්
වහන්සේ යහපතැයි ගිවිස එතැන්හිරුස්වූ නායක සත්ලක්ෂයක්
මහාස්ථවිර වරයන්වහන්සේ ප්‍රධානකොට ඇති නවාඞ්ගශාස්තෘ
ශාසන ප්‍රභෙද පර්‍යාප්තිධර පෘථග්ජන සොතාපන්න සකෘදා
ගාමි අනාගාමි ශුෂ්ක විදර්ශක සමථයානික මහානුභාව සම්පන්න
නොයෙක් කෙළ කොටි ගණන් භික්ෂූන්වහන්සේ හැර ත්‍රිපිටක
පර්‍යාප්ති ප්‍රභෙදධරවූ චතු ප්‍රතිසම්භිදා ප්‍රාප්ත සාරසිය නවානු
වක් පමණ භික්ෂූන්වහන්සේ තෝරාගෙන ආනන්ද ස්ථවිරයන්
ˎහන්සේ රහත් නුවූ හෙයින් රහත්වූකල ඇතුලත් කටයුතුයයි
කියා පන්සියයට තමක් අඩු කළසේක. ඉක්බිති කොතැන්හිදී
ධර්මසංගායනා කරමෝදැයි සාකච්ඡා කොට රජගහනුවරදී යහ
පතැයි නියම කළසේක. එසඳ හැමදෙනාවහන්සේ කියනසේක්
එසේවිනම් මේ හවුරුද්දෙහි කිසිකෙනෙකුන් වහන්සේත් රජ
ගහනුවර වස්වසනු පිණිස නොයායුත්තෝයයි කියා කතිකා
කොට සන්නිෂ්ඨාන කොරෙමින් වැඩහුන් සේක.

එකල්හී සැටදහසක් මල්ල රජහු මඟුල් වෙස් ගෙන චිතක
යෙහි කළමනා සියලු මංගලකෘත්‍යයන් සිද්ධකොට නිමවා නුවර
මැද සන්ථාගාරය සකස් කොට සිවුදෑ සුවඳින් පිරිබඩගෙන පස්
මල විසුරුවා රන් රිදී තරු පෙළින් විසිතුරුවූ සෙල් වියන් බඳ
වා එහි මල්දම් රුවන්දම් එල්වා ඒ සන්ථාගාරයෙහි පටන් අභි
ෂෙක භූෂණශාලාව දක්වා උභය පාර්ශවයෙහි කඩතුරා ඇද
මුදුනෙහි වියන්බඳවා මනහර මලලොඹු එල්වා පරික්ෂෙපකොට
සරහමින් හස්ත්‍යලංකාරයෙන් මඟුලැතු සරහා රන්දෙණින්
මුතුරුසක්සේ තුන්තරමෙක භින්නවතුබු ධාතුවරුන්වහන්සේ
දැක මූඛ නොසෑහෙන පරිද්දෙන් සාධුකාරදෙමින් මහත්
ඝොෂා පවත්වා නැවත පිධානය වසා සියගණන් පිළියෙන්
වෙළා සේම කොට මඟුලැතු මුදුනෙහි පිහිටුවා සිව්දිගින් ඇතුම්
ලංකොට මංගල දන්තීන්සරහා අල්වාගෙන ඔවුන්මස්තකයෙහි
දහස්ගණන් ධවලච්ඡත්‍ර නංවා අප්‍රමාණ චාමර ශ්වෙත සාටක
විහිදුවමින් අපමණ හෙරි තූර්‍ය භාණ්ඩයන් වයමින් වර්ණනා
කොට නිමවත් නොපිළිවන්වූ මහ පෙරහරින් ඇතුළු නුවරට
ගෙන ගොස් සන්ථාගාරයෙහි මෘගෙන්ද්‍රාසන මස්තකයෙහි සධා
තුක කාංචනද්‍රොණිය ප්‍රතිෂ්ඨාකොට මත්තෙහි ධවලාතපත්‍ර
යෙන් සජ්ජිත කොරෙමින් අඩයටිගත් පුරුෂයන් වළල්
ලක් සන්ථාගාරය වට සිටුවා දෙවෙනිව කුඹින් කුඹ පැහැර

සිටිනා ඇත් වළල්ලක් වටලමින් කරින්කර පැහැර සිටිනා ජව සම්පන්න චතුරතර තුරඟුන් පෙළක් සිටුවා ඊට ඉක්බිති චක්‍රයෙන් චක්‍රය පැහැර සිටිනා යොධයන් සහිත රථ වළල්ලක් සිටුවා උරයෙන් උර පැහැර සිටිනා ආයුධ සන්නද්ධ යොධ භටයන් වළල්ලක් සිටුවා ඊට ඉක්බිතිව දුන්නෙන් දුන්න පැහැර සිටිනා යුද්ධක්ෂම ධනුර්ධරයන් වළල්ලක් සිටුවා, මෙසේ හාත් පසින් යොදනක්තැන් මුළුල්ලෙහි සිරිසක් ඉඩව් කට්වූතල සාටි වම් මුතුසැට්ටි කුප්පායම් රජදූ ආදියෙන් සජ්ජිතවූ නානායුධ ගත් මහ බලපිරිස වටලා මෙසේ අනෙක ප්‍රකාරයෙන් වට රැක වල් තරකොට තුන්වනසතියෙහිසපිරිවරසැටදහසක්මල්ලරජහු සාධුක්‍රීඩාවට පටන්ගත්හ මෙසින් මත්තෙහි ධාතුභාජන කථා දීවූ සියල්ලම මතු කියන ථූපාරාමකථාවෙහි ප්‍රකාශවනහෙයින් මෙතැන්හි ධර්ම සංගායනා කළ පරිදි සංක්ෂෙපයෙන් දක්වනු ලැබේ.

**ශේ කොසේදසක්?**

මගධෙශ්වරවූ **අජාසත්** මහරජහට අටවන්නෙහි වෙසක මැදි පොහෝලද අභහරුවාද දවස් විසානකතින් බුදුන් තිවන් පුර පැමිණි තුන්වන සතියෙහි එතැන්හි රැස්වූ මහාසංඝයා වහන්සේ **කාශ්‍යපානුමතින්** තික්ම වස්වසන අතුර ජම්බුද්වීපයෙහි සවකීය සවකියවූ විහාරවල බණ්ඩුල්ල පටිසංඛරණයෙන් කල්යවා ගම් නියංගම් රාජධානි පිළිවෙළින් දනව් සැරිසරා ගොස් **රජගහනුවරට** පැමිණ අජාසත් රජහුදක ධර්මසංගායනා කරනු පිණිස මහාසංඝයාවහන්සේ රැස්ව හිඳිනාවූ ස්ථානයක් උවමැනවැයි කිහ. එබස් අසා අජාතශත්‍රු පෘථිවීශ්වරතෙම යහපතැයි මූදුනෙන් පිළිගෙන **වෛභාර පර්වත** ප්‍රාන්තයෙහි **සප්තපර්ණි ගුහා** මාරයෙහි විශ්වකර්ම නිර්මාණයක් මෙන් භිත්ති ස්තම්භ සොපානාදීන් විචිත්‍රකොට විවිධ මාලාකර්ම ලතාකර්මාදීවූ චිත්‍රකර්මාන්තයෙන් විසිතුරුකොට සකලලොක රමණීය ශ්‍රීන් ප්‍රතිමණ්ඩිත මණ්ඩපයක් කරවා සුවර්ණ රජත මණි තාරකාදීන් විභූෂිතවූ ශ්වෙත විතාන බඳවා නොයෙක් සුවඳ බඩුයෙන් පිරි බඩගත් භූමිප්‍රදෙශයෙහි අනෙකප්‍රකාර සුවඳ මල්අතුල් ඉසිමින් නානාවර්ණ වටතිර බඳවා බ්‍රහ්ම විමානයක් මෙන් මණ්ඩපය සරහමින්, එහි සැපසරුප් පසතුරුණුසහිත පන්සියයක් ආසන පනවා මණ්ඩප මධ්‍යයෙහි පූර්විදිශාභිමුඛව ධර්මාසනයක් පනවා එහි අනර්ඝවූ ආස්තරණ අතුටා මුදුනෙහි අස්නපිට දළකඩ විජිනි පත්‍රයක් තබා මණ්ඩපය සිසාරා ගසන් අශ්ව රථ පත්ති ධනු ඛඩ්ග කුන්තාදීන් සත්වළල්ලක් ආරක්ෂා වටලමින් මගධෙශ්වර අජාතශත්‍රු ශත්‍රුගජසිංහතෙම මහාසංඝයාවහන්සේපිළිවෙළින් පසක පිහිටුවා වැඳ දන්වනුයේ: ස්වාමීනි මාවිසින් ධර්මසංගායනාවට

වැඩහිඳිනාලෙස කළම්නා මණ්ඩපාදීවූ සියලු කෘත්‍යයම නිෂ්ඨාපිත විය, මත්තෙහිදු සුදුසු කාරිය දැන වදාළ මැනවැයි කීහ. ඉක්බිති **මහාකාශ්‍යප** ස්ථවිරයන් වහන්සේ ප්‍රධානකොට ඇති සාරසිය අනූ නව දෙනෙකුන් වහන්සේ ඒ ධර්මශාලාවට රුස්ව ආසනයක් තබා මහලු පිළිවෙළින් තමන්වහන්සේලාට පැමිණි ආසනවලවැඩහිඳ තෙල ආසනය කවුරුන්වහන්සේටදැයි විචාළ කල්හි, ඒ ඉතිරිව තිබෙන්නාවූ ආසනය **ආනන්ද** ස්ථවිරයන් වහන්සේටයයි කියමින් ඇමදෙනා වහන්සේ හුන්සඳ ආනන්ද ස්ථවිරයන් වහන්සේද එදවස් ස්ථාන නිෂද්‍ය ශයන ගමනාදීවූ සතර ඉරියව්වෙන් එක ඉරියව්වෙකත් රහත් නොවී ආශ්චර්‍යමත්වූ ඉරියාපථයකින් රහත්ව තමන්වහන්සේ රහත්වූබව මණ්ඩපයෙහි වැඩහුන් කාරක මහා සඞ්ඝයා වහන්සේට හඟවනු පිණිස ධර්මශාලා මධ්‍යයෙන් මහපොළව කිමිදහෙන උඩනැඟී තමන්වහන්සේට පැමිණි ආසනයෙහිම පෙනී ගියසේක. එසඳ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විගත වලාහක ශරච්චන්ද්‍ර බිම්බයක් වැනිවූ ප්‍රභාස්වර ශ්‍රීකරමුඛ බිම්බය දැක රහත්වූබවදැන සර්වඥයන්වහන්සේ අද ජීවමානව වැඩසිටිසේක් විනම් ආනන්ද ස්ථවිරයන් වහන්සේට සාධුකාර දෙනසේක්වේදැයි කියා බුදුන් විසින් දෙනලද්දාවූ සාධුකාර අපවිසින් දුනමැනවැයි කියා හැම දෙනා වහන්සේම තුන් යලක් සාධුකාර දුන්සේක.

ඉක්බිති මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ප්‍රමුදිත කමල වනයක්වැනිවූ අතිනිර්මල සුපිළිපන් මහාසංඝයා වහන්සේට ආමන්ත්‍රණය කොට ඇවැත්නි විනයාභිධර්මයන්අතුරෙන් පළමු කොට කවර ධර්මයක් සංගායනා කරමෝදැයි විචාළසේක. එපවත් ඇසූ මහාසංඝයා වහන්සේ ඔවුන් වහන්සේට දන්වනසේක්; මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්ස විනය නම් සර්වඥශාසනයට ප්‍රාණයක් වැන්න, එසේහෙයින් **විනයපිටකය** අසිපිලව සිටිකල්හි බුද්ධ ශාසනයත් නිශ්චලව සිටියේනම් වෙයි, එසේහෙයින් පළමු කොට විනයපිටකය සංගායනා කරම්හයි කීසේක. එබසට මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේකියනසේක්: ඇවැත්නි කවුරුන් වහන්සේ මූල්කොට විනය සංගායනා කරමෝදැයි විචාළසේක. එබසට භික්ෂූන්වහන්සේ කියනසේක්: සම්‍යක් සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේ ජීවමාන කල්හිම විනය පිණිස **උපාලි** ස්ථවිරයන් වහන්සේ "**එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං විනයධරානං යදිදං උපාලි**" යි වදාරා උන්වහන්සේම එතදග්ග පාලියෙහි තැබූසේක. එසේ හෙයින් මෙ උපාලි ස්ථවිරයන් වහන්සේ පිළිවිසම විනයපිටකය පාළිකරම්හයි කීකල්හි මහාකාශ්‍යප ස්ථවිර

යන් වහන්සේ විනයපිටකය පිළිවිස්නා පිණිස ඈමදෙනාවහන්සේම ගිවිස්වා විනය පිළිවිස්නෝ යහපතැයි අවසර ලැබගෙන උන් කල්හි ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේද එසේම හැමදෙනා වහන්සේ අතින් සමු ලැබ හුනස්නෙන් නැඟී ස්ථවිර භික්ෂූන් වහන්සේ වැඳ අවසරගෙන ධර්මශාලා මධ්‍යයෙහි පනවන ලද ධර්මාසන මස්තකයට පැනනැඟී දළකඩ විජිනි පත්‍රය අතින් ගෙන පූර්වදිශාභිමුඛව වැඩහුන්සේක. එකල්හි මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ උන්වහන්සේට අභිමුඛව වැඩහිඳ විනය විචාරන සේක. **“පඨමං උපාලි පාරාජිකං කත්ථ පඤ්ඤත්තං කං ආරබ්භ කිස්මිං වත්ථුස්මිං”** යනාදීන් උපාලි ස්ථවිරයෙනි විනය පිටකයෙන් ප්‍රථම පාරාජිකාව කොතැන්හිදී කවරක්හු අරභයා කවර වස්තුවක් නිමිත්තකොට ගෙන පනවන ලද්දේදැයි පුළුවුත් කල්හි උපාලි ස්ථවිරයන් වහන්සේ වදාරන සේක්: ස්වාමීනි ප්‍රථම පාරාජිකාව බුදුහු **විශාලා** මහනුවරදී **සුදින්න නම් කලන්දක පුත්‍රයා** අරභයා මෛථුන ධර්ම වස්තුව නිමිත්තකොට ගෙන පනවන ලදැයි කීසේක. මෙසේ ප්‍රථම පාරාජිකාපත්තියට නිදානද පුද්ගලද වස්තුද ප්‍රඥප්තිද අනුප්‍රඥප්තිද වද්‍යාවද්‍යද විචාරා මෙම ක්‍රමයෙන් විනයපිටකයෙහි හැමශික්ෂාපදයන්ට නිදාන පුද්ගල වස්තු ප්‍රඥප්ති අනුප්‍රඥප්ති වද්‍යාවද්‍ය ආදීවූ හැම විචාල කල්හි මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පුළුවුත් හැමධර්මය උපාලි ස්ථවිරයන්වහන්සේද විසර්ජනය කළසේක. මෙසේ විනය පිටකය පාළිකොට මේ හැම උපාලි ස්ථවිරයන් වහන්සේ ඇතුළුවූ ඔවුන් වහන්සේගේ ශිෂ්‍යහැමදෙනාවහන්සේට මෙයින් අක්ෂරපද ව්‍යඤ්ජනයක් පමණ නොපිරිහෙළා රක්ෂාකරන ලෙස භාරකොට දුන්හ. මෙසේ විනය පිටකය සංගායනාකොට අවසානවූ කල්හි උපාලි ස්ථවිරයන් වහන්සේද දළකඩ විජිනි පත්‍රය ධර්මාසන මස්තකයෙහි තබා හුනස්නෙන් බැස ස්ථවිර භික්ෂූන් වහන්සේ වැඳ පැවිදි පන්තීන් වැඩහුන්සේක. **මේ විනය සංගායනාවය.**

නැවත සූත්‍රාභිධර්ම සංගායනාකරනු පිණිස ආයුෂ්මත්වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ මහාසංඝයා වහන්සේ අතින් විචාරන සේක් ඇවැත්නි විනයපිටකය උපාලිස්ථවිරයන් විසින් පනති කරන ලද්දේය. සූත්‍රාභිධර්මය කවුරුන් මූල්කොට සංගායනා කරමෝදැයි පුළුවුත්සේක. එබසට මහාසංඝයා වහන්සේ කියන සේක් බුදුන් ජීවමාන කාලයෙහි **ආනන්ද** ස්ථවිරයන් වහන්සේ **“එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං බහුස්සුතානං යදිදං ආනන්දො”** යනාදීන් එතදග්ග පාළියෙහි තබා

වදාළ බැවින් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මුල්කොට සූත්‍රාභිධර්ම සංගායනා කරම්හයි කීසේක. එකල්හි මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ධර්මය විචාරනු පිණිස අවසර ගෙන වැඩහුන් කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද සමුලැබ ස්ථවිර භික්ෂූන් වහන්සේ වැඳ අවසර ගෙන ධර්මාසනයට පැනනැගී විජිනිපත්‍රය ගෙන වැඩහුන්සේක. එකල්හි මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් වහන්සේ අතින් ධර්මය විචාරනසේක්: "බ්‍රහ්මජාලං ආවුසො ආනන්ද කත්ථභාසිතං කංආරබ්භ කිස්මිංවත්ථුස්මිං" යනාදීන් ආනන්ද ස්ථවිරයනි බ්‍රහ්මජාල සූත්‍රය කොතැන්හිදී කවුරුන් අරභයා කවර වස්තුවක් නිමිත්ත කොට ගෙන දේශනා කරන ලද්දේදැයි පුළුවුත්සේක. එපවත් අසා ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසර්ජනය කරනසේක්: මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්ස අප බුදුහු බ්‍රහ්මජාල සූත්‍රය රජගහ නුවරටද නාලන්දාවටද අතුරෙහි අම්බලට්ඨිකා නම් උයන මැද කරවනලද රජගෘහයෙහිදී බ්‍රහ්මදත්ත මාණවකයාද සුප්‍රිය නම් පරිබ්‍රාජකයාද අරභයා වර්ණාවර්ණයන් පිණිස දේශනා කරන ලද්දේයයි කීසේක. මෙසේ බ්‍රහ්මජාල සූත්‍රයට නිධාන පුද්ගල වස්තුයයි යන හැම ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසර්ජනය කළසේක. නැවත මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ශ්‍රාමණ්‍ය ඵල සූත්‍රය විචාළසේක ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඒ හැම විසර්ජනයකොට විස්තර වශයෙන් ධර්මදේශනා කරනසේක.

මෙසේ ආනන්දමහතෙරුන් වහන්සේ මහ සඟපිරිස් පිරිවරා ධර්මාසනාරූඪව වැඩහිඳ මධුරස්වර විහිදුවා ධර්ම සංගායනා කරන කල්හි බණ අසනු පිණිස එතැන්හි රැස්වූ තිදිවාධිප විධාතෘ පන්නග ගරුළ මහිස නිසාචර නභශ්චර විද්‍යාධරාදිවූ හැම දෙවියන් අතුරෙන් සමහර දෙවතාකෙනෙක් තමන් සිතට උපන් කාඞ්ක්ෂා මෙසේ සිතූහ. කෙසේදයත්? ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ ශාක්‍යවංශයෙහි ජාතවූසේක. ලොවුතුරා බුදුන්ගේ මලණුවන් වහන්සේය, බුදුන් ජීවමාන කල්හිම එතදග්ගපාළියෙහි තබා වදාළසේක, ආශ්චර්ය්‍ය අද්භූතවූ ගුණයෙනුත් යුක්තවූසේක, භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකායයි යන සිවුවණක් පර්ෂත් මධ්‍යයෙහිදී ප්‍රියකරවූ ධර්මදේශනාවෙනුත් යුක්තසේක, එසේ හෙයින් තථාගතපොතතමයාණන් වහන්සේගේ සද්ධර්මරාජ්‍ය දායාද ලැබ දැන් සම්‍යක් සම්බුද්ධත්වයට ප්‍රාප්තව මහාසඞ්ඝයා වහන්සේ පිරිවරා වැඩහිඳ ධර්මදේශනා කරනසේක්වනැයි සිතූහ. මෙසේ දෙවතාවන් විසින් සිතූ කාරණාවන් ඒ ආනන්ද ස්ථවිරයන් වහන්සේ දිවසින් දැක තමන්වහන්සේ කෙරෙහි අසත්‍ය ගුණසම්භාවනාවන් නොඉවසනසේක්: තමන්

වහන්සේ බුඩත්වයට නොපැමිණි බවත් සර්වඥයන් වහන්සේට ශ්‍රාවකව වැඩ සිටි බවත් බුදුන් අතින්ම ධර්මය උගත් බවත් මෙසි සියලු ගුණයෙන්ම එතැන්හි රැස්වූ දිව්‍ය සෙනාව මධ්‍යයෙහි ප්‍රකාශකොට දක්වනසේක්: "එවම්මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ" යනාදීන් එක්සමයෙක්හි සැවැත් නුවර සමීපයෙහිවූ ජෙත නම් රාජකුමාරයා විසින් රොපිත සංවර්ධිත පාදපශ්‍රෙණීන් ප්‍රතිමණ්ඩිතවූ ජෙතවනයෙහි අනේපිඩු මහ සිටුහු විසින් කරවනලද ආරාමයෙහි ස්ථාන නිෂද්‍ය ශයන ගමනාදිවූ චතුර්විධ ඊර්යාපථයෙන් උපලක්ෂිතව වැඩවසන්නාවූ භාග්‍යවත් බුදුරජතෙම මේ සූත්‍රදෙශනාව සත්ව හිතොපදෙශය පිණිස වදාළසේක, මා විසිනුදු ඒ සූත්‍ර දෙශනාව මේ ආකාරයෙන් අසනලදැයි යනාදීන් තමන්වහන්සේ ලොවුතුරා බුදු නොවන බව දිව්‍ය බ්‍රහ්ම සෙනාව මධ්‍යයෙහි ප්‍රකාශ කොට කියා හඟවමින් හැම දෙවියන්ගේම සිත සැක දුරුකළසේක. එකල්හි රැස්වූ පන්සියයක් රහතුන් වහන්සේ හා අප්‍රමාණවූ දිව්‍ය සෙනාව ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ කෙරෙහි අප්‍රමාණ සන්තොෂව පෘථිවි ගගනය ස පූර්ණ කෙරෙමින් උතුරුවා එක පැහිර සාධුකාර දුන්හ. එකල්හි යුගන්ධර මේරු මන්දර ධරාධරාදිග ස්තුති නාද පවත්වන්නාක් මෙන් ශතසහශ්‍රරාව පවත්වමින් එකහෙළා නෘත්‍යයට පටන්ගත්හ. අහසින් නානාරාගයෙන් විචිත්‍ර මකරන්ද මොද ප්‍රවාහ වහණය කරන්නාවූ ගන්ධපුෂ්ප වර්ෂා වසින්ට වන. අනිකුත් අවාදිත තූර්යනාද ශ්‍රුබරපරගෘත කර්ණසීරව රාව සප්තවිධ රත්න ප්‍රාවෘත වෙළුක්ඛෙපාදී අනෙකප්‍රකාර ආශ්චර්ය ප්‍රාතුර්භූත විය.

ඉක්බිති ආනන්ද ස්ථවිරයන් වහන්සේ මෙසේ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පුළුවුත් හැමතැන් විසර්ජනය කොට මෙම ක්‍රමයෙන් ත්‍රිවර්ග සංගෘහිතවූ සිවුතිස් සූත්‍රයෙන් ප්‍රතිමණ්ඩිතවූ සැටක් බණවරින්යුක්ත පාළිය සඞ්ගායනාකොට දීඝනිකාය නමැයි කියා ආයුෂ්මත්වූ ආනන්ද ස්ථවිරයන් වහන්සේට ඒ දීඝ නිකායරක්ෂා කරනු පිණිස භාරකළහ. ඊට අනතුරුව අසීතිභාණවාර ප්‍රමාණවූ මධ්‍යම නිකායපාළිකොට ධර්මසෙනාපති සැරියුත් මහ තෙරුන්වහන්සේගේ ශිෂ්‍යවූ ස්ථවිරයන් වහන්සේට මේ මධ්‍යම නිකාය රක්ෂාකළ මැනවැයි භාරකළහ. ඊට අනතුරුව සියක් බණවරින් පමණ කරනලද සංයුක්තනිකාය පාළිකොට මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ හා උන්වහන්සේගේ ශිෂ්‍ය ඇමදෙනා වහන්සේට භාරකළසේක. ඊට අනන්තරව විංශති භාණවාර ශතාද්ධප්‍රමාණවූ අඞ්ගුත්තර නිකාය සංගා

යනාකොට අනුරුද්ධ ස්ථවිරයන්වහන්සේ හා උන්වහන්සේගේ අන්තේවාසිකස්ථවිරයන් වහන්සේටභාරකළහ ඊට අනතුරුව

ධම්මසඞ්ගනි විභඞ්ගඤ්ච-කථාවත්ථුඤ්ච පුග්ගලං,
ධාතුයමකපට්ඨානං-අභිධම්මො'ති වුච්චති"යි

මෙසේ වර්ණනීයවූ සූක්ෂ්ම ඥාන ගෝචරවූ අභිධර්මපිටකය සඞ්ගායනාකොට පන්සියයක් රහතුන්වහන්සේ එකාවිටම ගණ සජ්ඣායනා කළසේක ඊට අනතුරුව සූත්‍රනිපාත ධර්මපද ඉතිවුත්තක විමාන වත්ථු ථෙරගාථා ථෙරීගාථා ජාතක නිද්දේස ප්‍රතිසම්භිදා අපදාන බුද්ධවංස චරියාපිටකාදිවූ *නොයෙක් ප්‍රභෙද ඇති ඛුද්දක වස්තූන් පන්තිකොට හැමදෙනා වහන්සේ සමග සජ්ඣායනා කළසේක මෙසේ ඉම් සියලු ධර්මය සඞ්ගායනා කරන්නාවූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛවූ භික්ෂු සඞ්ඝයාවහන්සේ විසින් මේ ධර්මයැ මේ විනයයැ මේ ප්‍රථම බුද්ධ වචනයැ මේ මධ්‍යම බුද්ධවචනයැ මේ පශ්චිම බුද්ධවචනයැ මේ විනය පිටකයැ මේ අභිධර්ම පිටකයැ මේ සූත්‍රපිටකයයි කියාද, මේ දීඝ නිකායයැ මේ මධ්‍යම නිකායයැ මේ සංයුක්ත නිකායයැ මේ අඞ්ගුත්තර නිකායයැ මේ ඛුද්දක නිකායයයි කියාද. නවාඞ්ග වශයෙන් උභතොවිභඞ්ගයෙහි සංක්ෂෙපයෙන් කියනලද්දාවූ ඛන්ධක වස්තු පරිවාරකොට ඇති සූත්‍රනිපාතයෙහි සූත්‍රයයි දක්වූ මේ හැම සූත්‍රයෝ සූත්‍ර නම්වෙති, තවද ගාථාවෙන් කියනලද්දාවූ හැම සූත්‍රම ගෙය්‍ය නම් වෙයි. විශෙෂයෙන් සංයුක්තකයෙහි සගාථක වර්ගය තවද අගාථක අභිධර්මාදිවූ හැම බුද්ධ වචන වෙය්‍යාකරණ නම් වෙයි, තවද ධර්මපද ථෙරගාථා ථෙරී ගාථා සූත්‍රනිපාතයෙහි නොසූත්‍රයෝද කොළවර දක්වූ සුද්ධික ගාථාද ගාථා නම් වෙයි, තවද සෞමනස්‍ය ඥානමය ගාථා ප්‍රති සංයුක්තවූ දෙඅසූවක් සූත්‍රයෝ උදාන නම් වෙති, තවද "වුත්තං හෙතං භගවතා" යනාදී නයින් පැවැත්තාවූ එක්සිය දස යක් පමණ සූත්‍රයෝ ඉතිවුත්තක නම් වෙති. තවද අපණ්ණක ජාතකාදිවූ පන්සියපණසක් ජාතක දෙශනාවෝ ජාතක නම් වෙති, තවද "චත්තාරොමෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ" යන මේ ආදී නයින් පැවැත්තාවූ හැම ආශ්චර්ය්‍ය අද්භූත ධර්මයෝ අද්භූත ධර්ම නම් වෙති, තවද චූලවෙදල්ල මහා වෙදල්ල ආදීවූ හැම පුච්ඡිත ප්‍රශ්නාදියෙහි දෙශනාකළාවූ ධර්මයෝ වෙදල්ල නම් වෙති, මෙසේ දක්වනලද

---

* ඛුද්දකපාඨය ධම්මපදය උදානය ඉතිවුත්තකය සූත්‍රනිපාතය විමානවත්ථුය යනුවෙන් අන්‍ය ප්‍රකරණයන්හි පෙනේ.

සූත්‍රගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අද්භූතධර්ම වෙදල්ලයයි යනාදිවූ මෙහැම නවාඞ්ගයයි කියාද එකානුසන්ධික නානානුසන්ධිකාදීන් පරිච්ඡෙදකොට දෙසුයේ ඛන්ධක යයි කියාද යන මේ සියලු ධර්ම ප්‍රභෙදයෙන්ම නිමකොට අනිකුත් උද්දානසංග්‍රහවර්ගී සංග්‍රහ පෙය්‍යාල සංග්‍රහාදීන් අනෙකවිධ වූ ත්‍රිපිටකයෙහි දෘශ්‍යමානවූ සංග්‍රහ ප්‍රභෙදයන්ම නියමකොට මෙසේ සත්මසක් ඇතුළත සුවාසූදහසක් ධර්මස්කන්ධයෙන් යුක්තවූ හැම ධර්මයන්ම සඞ්ගායනා කළසේක. මෙසේ මහාකාශ්‍යප ස්ථවිරාදීවූ පන්සියයක් සඞ්ඝ ස්ථවිරයන් වහන්සේ පන්දහසක් හවුරුදු පවත්නාලෙස ධර්මසඞ්ගායනා කොට මස්තකප්‍රාප්තකළසේකැයි සංජාත ප්‍රීතිප්‍රමොද්‍යයෙන් සාධුකාර දෙන්නාක් වැනිවූ මහා පෘථිවිය ජලපොලොව දක්වා අනෙකප්‍රකාරයෙන් රඟ දෙමින් ගර්ජනා කළාය. දක්වනලදමැයි —

“සාධුකාරං දදන්තිව-සාසනට්ඨිතිකාරණා,
සංගීතිපරියොසානෙ-අකම්පිත්ථ මහාමහී” යි.

මේ ප්‍රථම මහා සඞ්ගායනාව පන්සියයක් මහා ස්ථවිර නාගයන් රැස්ව කළ හෙයින් ථෛරිකායයි කියාද, ස්ථවිරයන් වහන්සේ සම්බන්ධවූ වචනයන් හෙයින් ථෙරවාදයයි කියාද, සමස්ත ලොකයෙහි විද්‍යමානවූ අනෙකාර්ථයන් විභාගකළ හෙයින් හා විභජ්ජවාදි නම් බුදුන් විසින් දෙශනාකළ හෙයිනුත් විභජ්ජවාදයයි කියාද, මේ සපර්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මයම මේ ත්‍රිවිධ නාමයෙන් ප්‍රසිද්ධවිය. ඒ මහාකාශ්‍යප ස්ථවිරාදිවූ ගණප්‍රධාන හැම ක්ෂීණාශ්‍රව මහාසඞ්ඝයා වහන්සේම ප්‍රඥාජ්‍යොති යන් මුළුලොව බබුළුවා වැඩසිට අනුක්‍රමයෙන් ක්ෂීණාවර්තිනි සෙනහවූ ප්‍රදීපමෙන් වූසේක, එසේ හෙයින් නුවණැති හැම ජනයන් විසින්ම ජීවිතමද යෞවනමදාදිය අස්ථිරයයි නොසිතා උභයලොකාර්ථ සිද්ධිය පිණිස කුසලකාරණයෙහි අප්‍රමාදවියයුතු. **දක්වන ලදමැයි**—

“ථෙරාපි තෙ මතිපදීපහතන්ධකාරා
ලොකන්ධකාරහනනම්හි මහාපදීපා,
නිබ්බාපිතා මරණඝොරමහානිලෙන
තෙනාපි ජීවිතමදං මතිමා ජහෙය්‍ය” යි

**මෙතෙකින් මේ පංචශතික නම්වූ ප්‍රථම සංගායනාව කථා නිමවකළදී.**

**සප්තශතිකනම් කවරහෙයක්?** යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්තනම් රජහුගේ පුත්‍රනප්තෘ ආදී පරම්පරානුගත රූපශොභා සම්පන්න අභිනන එකීභූතවූ චිත්තසංකල්පනා ඇති සත්දහස් සත්සිය සත්දෙනකු රජකරන **විශාලා මහනුවර** භින්නකොට ජයගන්නා පිණිස වස්සකාර බ්‍රාහ්මණයා විසින් ගංගා නම් නදියෙහි **ගොතම** නම් තීර්ථයට නුදුරු තැන පාටලි ග්‍රාමයෙහි කරවන ලද්දාවූ **පාටලිපුත්‍ර** නම් නුවර වැස රාජ්‍යශ්‍රී අනුභවකළාවූ **අජාතශත්‍රු** නම් මහරජය, ඔහුට ඉක්බිති **උදයභද්‍ද අනුරුද්ධ මුණ්ඩක නාගදාසක සුසුනාගය**යි යන සවැදෑරුම්වූ මගධෙශ්වරයන් ඇවෑමෙන් ප්‍රාප්තාභිෂෙක **කාලාශොක**රජහට දසවන්නෙහි බුදුන් පිරිනිවී සියක් අවුරුදු සම්පූර්ණවිය, එකල්හි ආයුෂ්මත්වූ **කාකණ්ඩපුත්‍රයස** නම් එක් මහතෙර කෙනෙකුන් වහන්සේ වජ්ජිරට ගම් නියම්ගම් රාජධානි පිළිවෙලින් දනව් සැරිසරනසේක්: විශාලානුවර මහාවන විහාරයෙහි වසන වජ්ජිභික්ෂූහු "කප්පති ජාතරූප රජතං—කප්පති ද්වඞ්ගුල කප්පො—කප්පති ආචිණ්ණ කප්පො—කප්පති සිඞ්ගිලොණ කප්පො—කප්පති අමථිත කප්පො—කප්පති ගාමන්තර කප්පො—කප්පති ආවාසකප්පො—කප්පති අනුමතිකප්පො—කප්පති ජලොගි පාතුං—කප්පති අදසං නිසීදනං" යනාදීන් අනුත පූර්වවූ අභිප්‍රායානුකූල දශවස්තුවක් උපදවාගෙණ විනය ප්‍රඥප්තිය පරිවර්තනය කොට රන් රිදී ආදිය පිළිගනිමින් ශාසන භෙදකරති යනු අසා නියමදූත ගොස් දොළොස් ලක්ෂයක් රහතුන් වහන්සේ රැස්කරවා ඒ මහාසඞ්ඝයා වහන්සේ මධ්‍යයෙහි **රෙවත** නම් මහතෙර කෙනෙකුන් වහන්සේ ලවා ඒ දශවස්තුව පිළිවිස්වා සර්වඥපසර්ථායක ආනන්ද ශ්‍රමණෙන්ද්‍රයාණන් වහන්සේගේ සද්ධිවිහාරික ලොවුතුරු බුදුන් දුටුවාවූ එක්සිය විසිවයස් පිරුණු **සබ්බකාමී** නම් මහතෙර කෙනෙකුන් වහන්සේ ලවා ඒ දශවස්තුව විසර්ජනයකරවා විනයානුචිත නොවනබව ප්‍රකාශකොට ඉක්බිති අධර්මවාදීන් මර්දනය කරවා ධර්මය බබුළුවමියි සිතා මහසඟ පිරිස් පිරිවරමින් විසාලා නුවර මහා විහාරයබලා නික්මුණුසේක.

එකල්හි වජ්ජි භික්ෂූහු කාලාශොක රජහුකරා ගොස් නොයෙක් ලෙස යාඥකොට මහරජ අප වසන මහාවන විහාරය නිසා යසනම් මහ තෙර කෙනෙක් බොහෝ සඟ පිරිස් පිරිවරාගෙන එමින් සිටියහ, ඔවුන් හැම නවත්වාපියවයි කීහ. එතෙපුල් අසා මහ රජතෙම තමා ශාසන ප්‍රවෘත්ති විභාගයක් නොදන්නා හෙයින් ඔවුන්ගේ මැසිවිලි මුසු අදෝනා බස් අසා සැබවයි එන්නාවූ යස මහා ස්ථවිර ප්‍රමුඛ ශ්‍රමණ ගණයා මගේ

විජිතයට ආ නොදෙවයි විධාන කොට රඳවන ලෙසට මහසෙනග ගමන්කරවා ඒ ගියාවූ මහ පිරිස දෙවතානුභාවයෙන් මංමැරද අන්‍ය පථයකින් ගිය කල්හි එම දවස් රාත්‍රි භාගයෙහි මහරජතෙම යහන්පත්ව සැතපුණේ ඒමනුෂ්‍ය ශරීරයෙන්ලොහොකුඹු නිරයේ හුනුවාක් මෙන් සිහිනෙන් දැක පිබිද නොනිදා ගිඳ පහන් කොට දෙවන දවස් තමාගේ සහෝදර ජ්‍යෙෂ්ඨ භගිනිවූ රහත් මෙහෙණින්නක දැක එපවත් කී කල්හි ඒ ඇසූ මෙහෙණින්න විසින් මහ රජ මේ ලොකයෙහි ගෘහස්ථ ප්‍රව්‍රජිතාදිවූ යම්කිසි කෙනෙක් නැත්ත ඇතැයි කියාද, ඇත්ත නැතැයි කියාද, සිතු සිතු ලෙස පක්ෂග්‍රාහීව යහපත නපුරැයි කියාද, නපුර යහපතැයි කියාද, සපක්ෂ ගිවිසවා පරලොව නොසලකා අභිප්‍රාය ලෙස මෙලොවින් ජීවත්වන්නා පමණකට සත්වයන් පොළඹා දවසරන පාපීවූ අලජ්ජී මහණුන්ට බලයලා බුදුන් විසින් පනවනලද විනය ප්‍රඥප්ති පිරිහෙළා කෙළ සුවහසක් සක්වළ පැතිර පවත්නා බුදුන්ගේ ආඥව මර්දනය කෙළේවීනම් එතෙමේ එකාන්තයෙන් අපායෙහි උපදනේය, ජීවත්වේ නමුදු ලෝකුඹු නිරයෙහි හුණුවාක් වැනි වෙයි යනු බුදුන් විසින්ම වදාළ හෙයින් මෙකීවාවූ වචනය මෙනෙහි තබාගෙන ඒ අලජ්ජී වර්ජින් හැර ඡන්දගතිය දොෂාගතිය මොහාගතිය භයාගතියයි යන සතර අගතියට නොගොස් මධ්‍යස්ථවූ ශ්‍රමණ ගුණාන්විත භික්ෂූන්වහන්සේට බලයලා පස්වාදහසක් පවත්නාවූ බුද්ධශාසනයට පිටිවහල්ව කල්පයක් කල් මුළුල්ලෙහි දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳිනාලෙසට කුසල් රැස්කොට ගනුවයි අවවාදකොට ගියකල්හි එදවස්ම විසාලාමහ නුවරට ගොස් ඒ දශවස්තු ඉපදවූ දසදහසක් පමණ මහණුන් සස්නෙන් පිටත්කරවා එතැන්හි රැස්වූ දොළොස් ලක්ෂයක් රහතුන් වහන්සේ අතුරෙන් සබ්බකාමී ස්ථවිරයන් වහන්සේ හා යස නම් මහතෙරුන් වහන්සේ ඇතුළුවූ සත්සියයක් රහතුන් වහන්සේ විසාලාමහනුවර **වාලුකාරාමයෙහි** රැස්කරවා එම කාලාශොක මහරජතෙම ස්ථවිරවාද නම්ලද සියලු ධර්මවිනය දෙසා පිටක නිකායාදී වශයෙන් විභාග කරවා අටමසකින් ධර්මසංගායනාව මස්තකප්‍රාප්තකොට ස්ථවිරීය නිකාය ජ්‍යොතිෂ්මත් කළහ.

එකල්හි ද්විතියසංගීතිකාර මහාස්ථවිරයන් විසින් නෝරාහළවාවූ දසදහසක් පමණ පාපී භික්ෂූහු ශාසන ප්‍රතිෂ්ඨා නොලදින් ප්‍රත්‍යන්ත දෙශයකටගොස් පක්ෂබල සොයන්නාහු ධර්මා ධර්ම දැනීමෙහි අසමර්ථවූ මණ්ඩලික රජක්හු ලදින් ස්ථවිරවාද බිඳ අපි මෙවිට ධර්ම සංගායනාවක් කරම්හයි ඔවුනොවුන් හා මන්ත්‍රණය කොට අභූත පූර්වවූ අපූර්ව පාඨ බහා පූර්වාපර විරොධකොටලා අභිප්‍රායානුකූලවූ අර්ථකථා උපදවා ධර්ම පරිවර්තනයකොට **මහා සංඝීක නම්** ආචාර්ය නිකායක් වෑ විෂ වෘක්ෂයකින්

බෙදුණු පංචමහා ශාඛාමෙන් එතැන් පටන් ක්‍රමයෙන් අවුරුදු සියයක් ඇතුළත මහා සංඝික නිකායෙන් ගෝකුලිකය, එකබ්බොහාරිකය, ප්‍රඥප්තිවාදිය, බාහුලිකය, චෛත්‍යවාදියයි යන මේ පංච ආචාර්‍ය්‍යවාදීහු, පහළවූහ. ඉක්බිති මහාබෝධියෙන් බටුවාවූ නීයග්‍රෝස කැටිමෙන් ස්ථවිරවාදීන්ගෙන් පිටත් කළ පාපී භික්ෂූහු ඒ ඒ තැන්හි රැස්ව මහිංසාසකය, වජ්ජිපුත්තකය, ධර්මොත්තරීයය, භද්‍රයානිකය, ඡන්නාගරිකය, සම්මිතිකය, සර්වාස්තිවාදිය, ධර්මගුප්තිකය, කාශ්‍යපීය, සංක්‍රාන්තිකය, සූත්‍රවාදීයයි මෙසේ එකොළොස් නිකායභේද ඇතුළුව ස්ථවිරනිකායෙන් පිටත් සතළොස් නිකායෙක් භේදව වන් දනස්කන්ධයෙන් නිකුත් ගිනිකඳක් මෙන් දෙවන සියක් අවුරුද්දට පැමිණි තැන්පටන් මෑතභාගයෙහි ලාභසත්කාර නිශ්‍රිතව ගන්නාලද භික්ෂුවේශ ඇත්තාහුද වේදයෙහි නිපුණ අන්‍යතීර්ථකයෝද පාළි ධර්ම තීර්ථක ධර්මයෙහි බහා ඒ පාළි ධර්මය හා අන්‍යතීර්ථක ධර්මය එක්කොට යොදා පෘථග්ජන ජනයා වඤ්චා කොට ඒ ඒ වචනයන්ම කියමින් මි අඹ ආකාරවූ කිම් තම් ඵල විශේෂය අඹයනට දුන්නාක්මෙන් අධර්මය ධර්ම ලෙසයෙන් දක්වා මේ බුද්ධවචනයයි බැවහාර කෙරෙමින් පවත්වන්ට සිතන්නාහු හෙමවතය, රාජගිරිය, සිද්ධාර්ථිකය, පූර්වශෛලිය, අපරශෛලිය, වාජිරීයයි යන මේ නිකාය සය ඉපිදවූවාහුය, මෙසේ සූවිසි නිකායෙක් ජම්බුද්වීපයෙහි ජාතවිය. ධර්මරුචිය සාගලිකයයි යන නිකායවයෙක් ලංකාද්වීපයෙහි ජාතවිය මේ සියලු භින්න නිකාය ජාතවුවද ස්ථවිරවාදය වනාහි බුදුන් පිරිනිවී තැන්පටන් ගගන ගඞ්ගා ප්‍රවාහයක් මෙන්ද නිර්මලවූ ජාතිරඞ්ග මාණික්‍යයක් මෙන්ද සුවිශුද්ධවූ පුෂ්කර පත්‍රෝදකයක් මෙන්ද නිකායාන්තරයන් හා අසම්මිශ්‍රව අමෘත රශ්මිප්‍රවාහයෙන් යුක්ත ශරච්චන්ද්‍රමණ්ඩලය මෙන් දෙව්මිනිසුන් සහිත සකල ලෝකවාසීන් සන්තර්පණයකොට අදදක්වා පැවැත්තේය. දක්වනලදමැයි—

එත්තාවතා දසසහස්සපාප භික්ඛූ,
නිබ්බුය ධූතදසවත්ථුමලං අකංසු.
යසෙන සුනිම්මලයසෙන යසෙන සද්ධිං,
සංගීති උජ්ඣිතමලා අපි දස්සිතා සා. "යි

**මෙතෙකින් සප්තශතික නම්වූ ද්විතීය සංගීති කථා කීසා නිමවනලදී.**

---

තවද තෘතීය සංගායනාව-නම් කවරහයත්? ඒ කාලාශෝකනරපතිහු පටන් භද්‍රසේනය, කෝරණ්ඩවර්ණය, මඬගරය,

සර්වඥජයෑ ජාලිකයෑ උභකයෑ සඤ්ජයෑ කොරව්‍යයෑ නන්දිවර්ධනයෑ පඤ්චමකයෙයි යන දසබෑරජුන් හා ඉක්බිති උග්‍රසේනනන්දයෑ පණ්ඩුකනන්දයෑ පණ්ඩුගතිනන්දයෑ භූතපාලනන්දයෑ රට්ඨපාලනන්දයෑ ගොවිසාණිනන්දයෑ දශසිද්ධකනන්දයෑ කෙවට්ටනන්දයෑ ධනපාලනන්දයෑ යන නවනන්ද රජුන් හා මෙසේ දස නවරජුන්ට ඉක්බිති විඩූඩභ සංග්‍රාමයෙහි කපිලවස්තුපුරයෙන් නික්ම ආවාවූ ශාක්‍ය පුත්‍රයන් විසින් මාපිතවූ මෞර්ය නුවරෙහි ශාක්‍යවංස ප්‍රසූත චන්ද්‍රගුප්ත කුමාරතෙම චාණක්‍ය ද්විජපතිහුගේ උත්සාහයෙන් පාටලිපුත්‍ර නම් නුවර රජවිය, ඔහුගේ පුත්‍රවූ බින්දුසාර නම් කුමාරතෙම පිතෘහුගේ ඇවෑමෙන් පාටලිපුත්‍ර නම් නගරයෙහි රාජ්‍යශ්‍රීයට පැමිණ එක්සියයක් පුත්‍රයන් ලද්දේය, එයින් ජ්‍යෙෂ්ඨවූ සුමන රාජකුමාරයන් යුවරාජ පදවියෙහි පිහිට විය, ඔවුන් අතුරෙන් මෞරිය වංශයෙහි ජාත ධර්ම නම් බිසවුකගේ පුත්‍රවූ පියදස්ස තිස්සයයි යන පුත්‍රයන් දෙදෙනාගෙන් ජ්‍යෙෂ්ඨවූ පියදස කුමාරතෙම අවන්ති රට වෙසෙමින් පිතෘහු විසින් නික්මවන ලදුයේ පැළලුප් නුවරට පනස් යොදුනකින් මත්තෙහි විඩූඩභ සංග්‍රාමයෙහි භයින් ගියාවූ ශාක්‍යයන්ට වාසස්ථානවූ වෙදිස නම් නුවරට ගොස් එනුවරෙහි සුරඟනක සදෘශවූ රූප සෞභාග්‍යසම්පන්න වෙදිය නම් ශාක්‍ය කුමාරිකාවන් ගෙනවුත් තමහට අගමෙහෙසුන්කොට තබා උදෙනිරම රාජ්‍යය කෙරෙමින් සකලලෝක සිවඞ්කර මහෙන්ද්‍ර පුත්‍ර රත්නය හා සත් පුරුෂ ජන සංඝමිත්‍රාවූ සංඝමිත්‍රා නම් ධීතෘ රත්නයක්ද ලැබ ඔවුන්ගේ මුඛ පද්ම විලෝකනය කොට චිත්ත නන්දනානුභාව කෙරෙමින් වසනුයේ: දවසින් දවස සියලු සම්පත්තීන් වඩිනව නිශෝකීව චිත්ත නන්දනයෙන් සුවසේවෑ වසනහෙයින් අශෝක කුමාරයෝයි දෙවන නමකින් ප්‍රසිද්ධව වසනුයේ: දවසක පිය රජහු ගිලන් බව අසා වහාම් අවුත් පැළලුප් නුවරට වැද පිය රජහු දැක ඔහට ගිලන් උපස්ථාන කොට වෙසෙමින් පිතෘහුගේ අයාමෙහි කුසුම පුරයෙහි රාජ්‍යයගත්තේය. මෙසේ රාජ්‍යශ්‍රීයට සම්ප්‍රාප්තව අශෝක කුමාරයන් කුසුම පුරයෙහි රජකරනකල්හි එපවත් ඇසූ යුවරාජ්‍යශ්‍රීන් විරාජමානවූ සුමන රාජකුමාරතෙම රාජාභිමානයෙන් ආමර්ෂිගරීන්ද්‍ර සමාන වික්‍රම දක්වමින් ජංගම ගජකූට ඝටා රූඪ කෙසරී නිකර සරිකබක අශූට නවුති භ්‍රාතෘ රාජ කුමාර වර වීර පරිවෘත විස්ඵුරිත රවිකිරණ පරාමර්ශිත නීලෝත්පල මුකුල ඉළුනිභ කුන්තලතා සමුද්ගත ඝනාස්ථල විමල විවිධ යෝධාරෝධ සහ සන්නාහ යුද්ධ සන්නද්ධරාවුනා රෞද්‍ර නානා වර්ණාර්ණව තරංග භංග සංඝාත තුරඞ්ග තුරඞ්ග පටුංගතික කඨිනතර ඛුර සිඛර මුඛරිතොඬත ධූලි පාලිඬරණී ගගන

තිමිර රූක්ෂපක්ෂ පාටව ප්‍රකට සිරඛඩ්ග තොමර වජ්‍ර සත්ති ක්ෂුරිකා ශ්‍රීකරතද්‍ය අච්චි මත්ත ශස්ත්‍ර පන්ති සංඝට්ටිත විස්ඵුලිංග සංගමෙඝොද්‍යෝත විද්‍යුජ්ජටා වෙෂ්ටිත මෙඝාංකුර ක්‍රූර පාරු වලය භ්‍රමණාඞ්ගුලීන් උද්ගතකොට දවට දවටමින් ලූෂිත කූටම් වාමදිදිතාගත නරභට සහස්‍රාදීන් නිරන්තරව ඉන්ද්‍ර ධනු නිභ ගම්භීරාදීජ්‍යා සන්නිතචාපවිජෘම්භිත ධාරාධරාසාර නිෂ්ක්‍රාන්ත සත සහස්‍ර සංඛ්‍යා පරිමිත ශරවර්ෂා වස්වමින් කල්පාන්තා නිල ලුලිත ජලනිධි කීලාල ලහරි ප්‍රහරිත ධ්වනි නිභ ප්‍රහත භීෂ්ම පටහ පනව නිස්සාන මෘදඞ්ග දුන්දුභි සුසිර කාහල ප්‍රලයා සනි සම්පාත භූත දිගන්තර බධිරී කෘත රණ රඞ්ග ඝොෂා භසාපාසණ ප්‍රරභණාකාර සහසීව වහසී බස් බෙණෙමින් රණක්‍රීඩා ලිඞ් උදග්‍ර මත්ත ලාලසයෙන් දෙසෙනඟ දෙසයුරක්ෂෙස් එක්ව යුධයට වැද ගත්හ.

එසඳ යුඬක්ෂමහෘද්නිර්ජිත යොධ භට වටලා රණාභිමාන මත්ත උජ්ජනීනභීාධිප **අශොක** රජකුමාරතෙම රණොත්සවයෙහි උන් මත්ත පරයොධ වික්‍රම දර්ශන වෙෂ්ටි දෘෂ්ටින් නිර්ගත කොපානල සිඛර ධූම රෙඛා සක අසිපත්‍රය අතටගෙන ධාරාසඟස්‍රොාදගත වෘත්තිමුක්තාහාරාකාර භ්‍රමණයකොට සම්පිත සතසහස්‍ර පටව විද්‍යුත් කදම්බයක්මෙන් මූණය මිට පහරන ලෙස කගපට දෙපට කොට තිරිප්පු දි දී හස්ත මස්තකොද්ගත කොට වටදවටමින් රණක්‍රීඩා මඩලයට අසනිපාතයක් මෙන් සෙඳවැද ගියැහ. එකෙණෙහි භයින්මොහිනීවූ චතුරඟිනී වාහිනීන්ගේ ධෛර්‍ය්‍ය වීර්‍ය්‍ය ජර්ජර කෙරෙමින් සවකීය පරාක්‍රම දක්වා අරාති මථනය කොට නිර්වීධ කෙරෙමින් රණධරණී නභස්ථල විමල සහස්‍ර කරණ පරිවෘත විභාකර ශ්‍රීන් යුවරාජ සුමනරාජ කුමාර වර නිශාකරයා සමර අස්ත ගිර පතිත කරවා අෂ්ට නවූති ප්‍රතිරාජ කුමාර නිකර තාරකාවන් අන්තර්ධානකොට, කුසුමපුර සරසියෙහි ජනකමල වන විකාසන විරොචනයා මෙන් දීප්තිමත්ව දිගු බිත විතත තෙජඃප්‍රභාවයෙන් එකලු කෙරෙමින්, ජිනවර පරිනිර්වාණය කළ දෙසියඅට **සොළොස් අවුරුද්දක්** පිරුණුසඳ, සකල ජම්බුද්වීපයෙහි එකරාජ්‍යාභිෂේක ප්‍රාප්තව සහොදර මල්වූ **තිස්ස**රාජ කුමාරයන් යුවරාජ තනතුරෙහි පිහිටුවා සූවාසූදහසක්කිරීටධර නරපතීන් විසින් උපසේවිතවූ තුන්ඍතුවට සුදුසුවූ **මහාකල්පික්ක මයූරග්‍රීවය මඞ්ගලප්‍රාසාද**යයි යන තුන්ප්‍රාසාදයෙහි අනෙක ප්‍රකාර නළුනාටිකාදින් පිරිවරා සොළොස් දහසක් බිසෝවරුන්ට නායකවූ **අසන්ධිමිත්‍රා**වුන් අගබිසෝ කොට අමරසිරි නිකර සරික්ඛක නරඉසුරු අනුභව කරන්නේය එකල මද්‍යූ සත්ත්කරුණාවෙන් යුක්ත චණ්ඩපරුෂව වසන හෙයින් **චණ්ඩාශොක** නම් වියැ, එකල ගගනමෙදිනී යොජනානුගතාවගත

තේජසින් යුක්තව දෙවියන් විසින් ප්‍රතිදින උපනීත අනවතප්ත ජල සොළස ඝටයක් හා මෘදු සනිග්ධ නාගලතා දන්තකාෂ්ඨ තථානීත අගදාමලක අගද හරීටක මධුර රසාන්විත සුගන්ධ සම්පන්න සහකාර ඵලයක්හා, ඡද්දන්ත සරසී සමීපයෙහි සමන්තාතනන්ත කල්පවෘක්ෂ වලින් පස්වණක් පැහැයෙන් බබළන්නාවූ නිවාසන පාරුපණ සාටක යුග්මයක්ද කණකවණී හස්ත පුජනයක්ද සුමනපුෂ්පාකාර ආවාසිත සමන්මල් පටක්මවූ උත්තර සාටකයක්ද දෙවියන් විසින් දවස්පතා ගෙනවුත් දෙන ලද්දේය, තවද දිව්‍යමයවූ පානවගීද ඇඟගල්වන සුවඳසුණුද දිව්‍යමයවූ අඳුන් පිඬක්ද නාගභවනයෙන් ගෙනවුත් දෙන්නාහ, ඡද්දන්තවිල අස ජලාසයෙහි සවයංජාත සුවඳ රත්හැල් තරල් කපා කිරනිකර සහ පිරිවරින් ගෙණවුත් දවසකට නවදහසක් යාල බඩහල පුරයෙති, ඒ ධාන්‍යරාසිය උන්දුර සමහාර සඤ්චිතවැ එක තඹුලපලයකුත් කඩනොකොට සුවඳහැල් පොතුහැර කුඩු නොහැර රුසිකෙරෙති, මධුමක්ෂික ශ්‍රේණීහු සම්ප්‍රාප්තව භාජන කණිකූටාදිවූ සුදුසු තැන්වල මීබැඳ පුරා මදකුත් නොබී තබායෙති. කම්හල්වල වලසැඹියෝ කුළුගසති, දිවියෝ දහවල් සරක් රැක සවස තමා ගෙනවුත් ගාල්වල ලා රාත්‍රිභාගයෙහි තුමූ ගොදුරු සොයා යති. කුරවිකෙවිල්ලෝ අවුත් රජගෙයි කුළුගෙවල් පදනම් පිට හිඳ මධුරනාද පවත්වා සෙවයකොට යෙති, මයුරයෝ අවුත් රජගට පෙනෙන්ට සුදුසු තැන්වල සිට නටා සෙවයකොට යෙති, එරජහුගේ **පරන්තපනම්** ඛඩ්ගපත්‍රයෙක් සියක් යොදුන් දක්වාගොස් ශත්‍රු මථනයකොට නැවත අවුත් හස්ත තලයෙහිම පිහිටයි. මෙකී රාජ ඍද්ධීන් යුක්තව චණ්ඩාශෝක ප්‍රථුවිශ්වරයාණන් රාජ්‍යයකරන කල්හි පළමු තමන්ගේ **චන්ද්‍රගුප්ත** නම් මුත්තණුවන් හා **බින්දුසාර** නම් පිය මහරජාණන් දවස පැවති පරිද්දෙන්ම සැටදහසක් තීර්ථකයන්ට තමන්ගේ රාජභවනයෙහිදීම දවස්පතා බත් දෙමින් උපස්ථාන කොට දවස් හරනාහ.

එක්දවසෙක සිවුමැදුරුකවුළුව සමීපයෙහි සිටියාවූ මහරජ තෙම නොසන්හුන් කායවාක් සමාචාරයෙන් යුක්ත උච්චා ශබ්ද මහා ශබ්ද පවත්වමින් හිඳ බත් අනුභවකරන තීර්ථකයන් දැක මාගේ මේ දෙන්නාවූ දානය සුදුසු තැනක් පරීක්ෂාකොට දුන මැනවැයි සිතා අමාත්‍යයන්ට ආමන්ත්‍රණයකොට එම්බා සගයෙනි තොප උපස්ථානකරන කුලදෙවතාවන් අන්තඃපුරයට කැඳවා ගෙන එව, ඔවුන්ට මාගෙන් දනක්දෙනු කැමැත්තෙමි කීහ, එතෙපුල් අසා අමාත්‍යවරු යහපත දෙවයන්වහන්සැයි කියා තමතමන් උපස්ථාන කරන පඬරඞග පරිබ්‍රාජක නිගණ්ඨ ආජීවක ආදීවූ තීර්ථකයන් කැඳවා ගෙනවුත් දෙවයන් වහන්ස

මෙහාමන්දනා වහන්සේ අප කළාවූ පාපයන් දුරුකොට කුසල සම්පත්තියෙහි පිහිටුවා සසර සයුරෙන් ගොඩලා නිවන් දක්වන රහතුන්වහන්සේයයි කියා රජහට දැක්වූහ. එබස් අසා මහ රජාණෝ තමන්ගේ රාජ භවනයෙහි අසුන්පනවා ඔවුන් ගෙන්වා සුදුසු අසුන්වල වැඩහුන මැනවයි කීහ. එකල්හි එයින් සමහරෙක් භද්‍රපීඨවල හුන්හ. සමහරෙක් අඹී පීඨවල හුන්හ, සමහරෙක් ක්ෂුද්‍ර පීඨවල හුන්හ සමහරෙක් භූමියෙහි කටසාර වස්ත්‍රාදීවූ ආස්තරණවල උන්නාහ. මෙසේ සඟ මහලු පිළිවෙළක් නැතුව හුන්නාවූ ඒ තීර්ථකයන් දැක එදවස් ඔවුන්ට සුදුසු ඛාද්‍ය භෝජ්‍ය දෙමින් අනුභවකරවා නික්මවමින්, දෙවනදවස්ද පළමු දවස් මෙන් නීචොච්චාසන පනවා තීර්ථකයන් ගෙන්වා අභිප්‍රායානුකූලව හිඳිනාලෙස නියොගකළ කල්හි පළමුදවස් උච්චාසනයෙහි හුන්නාවූන් දෙවන දවස් නීචාසනවල හිඳිනා නියාවද නීචාසනවල හුන්නාවූන් උච්චාසනවල හිඳිනා නියාවද සංයම විරහිතවූ ආලොකන විලොකන සම්මිඤ්ජන පසාරණාදී ක්‍රියාවන්දැයි යනාමේ නොයෙක් අනාචාර දැක එකාන්තයෙන්ම මොවුන්ගේ අන්තඃසාරත්වයෙක් නැතැයි නියම දැන අභ්‍යන්තර සාරගුණ කල්‍යාණ පුරුෂයන් පරීක්ෂාකොට සොයන්නාවූ රජතෙම: එයින් නොබෝදවසක් ගියකල්හි දවසෙක වඩනා **නිග්‍රොධසාමණෙරයන්** වහන්සේගේ ඉන්ද්‍රිය සංයමාදී ඉරියාපථයෙහි ප්‍රසන්නවූහ. ඒ නිග්‍රොධ සාමණෙරයන්වහන්සේ නම් එක් ජාතියෙක්හි එම අසොක මහරජහුගේ සහෝදර බෑණන්වහන්සේය.

**හේ කෙසේදයත්?** යටගිය දවස **බරණැස්**නුවර මධුවාණිජවූ **තුන්බෑණනෙක්** එයින්ම තම තමන්ගේ පුත්‍රදාරාදීන් රක්ෂාකොට ජීවත්වෙති, ඒ තුන්දෙනාගෙන් වැඩිමහලු වෙළඳාණෝ රටමැද ඇවිද එහි වසන්නවුන් අතින් මිළදී මීගෙන තබති, මැදිබෑ වෙළඳාණෝ ඔවුන් ඇර තුබූ මී නුවරට ගෙනවුත් මලණුවන්ට දෙති මලණුවෝද ඔහු ගෙන ගෙනා මී එවුසැටියේම ගණන් දැන විකුණති, එකල ගඳ මහත් පවු අසනන්දමූලපබ්භාරයෙහි වසන එක් පසේබුදු කෙනෙකුන් වහන්සේ රොගයකින් ආතුරව විඳිනා වෙහෙස දැක වෙන පසේබුදු කෙනෙකුන් වහන්සේ ඒ වණ රොගය මීපැනියෙන් සන්හිඳෙන බව දැන එම පබ්භාරයෙහිම වැඩසිට සිවුරු ගැමවටු ගන්වාගෙන පාත්‍රය දරා සෘද්ධියෙන් අහසට පැනනැගී වැඩ නුවර වහසල්දොර සමීපයට බැස මී වෙළඳාම්කරන වෙළඳුන් සමීපයට යනුපිණිස එපියට බටසේක, එකල්හි ඒ බරණැස් නුවර කුලගෙයක වසන බැලමෙහෙකොට ජීවත්වන්නාවූ ස්ත්‍රියක් කළය ගෙන පැන් ගෙනෙනු පිණිස යන්නී ඒ පසේබුදුන් දැක මගින් පහව පසඟ පිහිටුවා වැඳ ස්වාමීනි කුමක් පිණිස වැඩිසේක්දැයි විචාළාය. එබසට

එම්බා නැගනියනි මීයෙන් ප්‍රයොජන ඇති හෙයින් ආමිහයි කීසේක, ස්වාමීනි එසේ වීනම් තෙලෙ පෙනෙන්නේ මී විකුණන පිලයයි අත දිගුකොට දක්වා සිටි කල්හි උන්වහන්සේ එතන සිගා වැඩිසේක. එදවස සත්‍රී සිතන්නී ඉදින් මූන්වහන්සේ එතන්හි සිගා ඒ මී පිලින් මී තොලත් සේක්නම් මාගේ තිණ තුබූ කඩ විකොට වීනමුත් මීගෙන දන්දෙමියි සිතා එතැන්හිම බල බලා සිටි කල්හි පසේබුදුන්වහන්සේ මධුවාතිජයාණන්ගේ පිල සමීපයෙහි සිගා වැඩිසේක, එසඳ වෙළඳුණෝ වහා නැගිසිට අවුත් පසේබුදුන් පසඟ පිහිටුවා වැඳ පාත්‍රයගෙන වළල්ලක් මුදුනෙහි තබා මී කලයක් ගෙනවුත් පාත්‍රයෙහි වත්කරන්නාහු සුහුව නමාලූහ. එසඳ වත්කළ මී කලයෙන් පාත්‍රය පිරී ඉතිර වටින් වැගිර මී මිහිමඩල ගලා සිටගත, එබවදුටු වෙළඳුණෝ මහත් සනෙතාෂයෙන් ප්‍රාර්ථනා කරන්නාහු: මේ පාත්‍රය පුරා මී දන්දුන්නාවූ කුසලානුභාවයෙන් දසදහසක් යොදුන් දඹදිව් තෙලෙහි මම එකාච්ඡත්‍ර නංවා රාජ්‍යය කෙරෙම්වයි මේ මී පාත්‍රය පිරී උඩනැගක්මෙන් මාගේ ආඥාව අහසින් යොත්නක පවතී වයි පාත්‍රය මුවවිටින්ඉතිර වටින් බිමවැගිර මී මිහිමඩලෙහි ගලා පැතිරසිටියාක් මෙන් මාගේ ආඥාව පොළොවින් යොත්නෙක පැතිර වටින් මුළු දඹදිව එකහෙළා අණසක පවතීවයි යනාදීන් නොයෙක් ලෙස ප්‍රාර්ථනාකළහ. **කියනලද්දේමැයි.**

"පුණ්ණං ච උප්පතන්තං ච පතිතඤ්ච මහීතලෙ,
දිස්වා මධුං පසන්නො සො-එවං පණිදහි තදා.
ජම්බුදීපෙ එකරජ්ජං-දානෙනානෙන හොතු මෙ.
ආකාසෙ යොජනෙ ආණා -භූමියා යොජනෙ තථා" යි

යනාදීන් ප්‍රාර්ථනාකොට මී පාත්‍රයගෙන පිලින් බැස ආදරයෙන් නැමි නැමී පසේබුදුන් පමීපයට ගොස් පිළිගැන්වූයේය. එසේහෙයින් දක්වන ලදමැයි මහාවංසයෙහි-

"තස්ස පත්තස්ස බුද්ධස්ස වාණිජො සො පසාදවා,
විස්සන්දයන්තො මුඛතො පත්තපූරං මධුං අදා." යි

මෙසේ මී පාත්‍රය පිළිගැන්වූ කල්හි ඔහට අනුමෝදනා පිණිස පසේබුදුන්වහන්සේ වදාරනසේක්:

ඉච්ඡිතං පත්ථිතං තුය්හං- ඛිප්පමෙව සමිජ්ඣතු,
පූරෙන්තු චිත්තසංකප්පා-චන්දොපණ්ණරසී යථා." යි

යනාදීන් මී පිළිගැන්වූ වෙළඳුණන්ට අනුමෙවෙනි බණ වදාරා එන්ට නාමාගත්සේක, එකල්හි අත දිගුකොට මී විකුණන පිල දැක්වූ ඝට චෙටිකාතොම සිතන්නී: ඉදින් මූන්වහන්සේ මී

ලත් පසු මා දෙමි සිතූ හිරණකඩත් පිළිගන්වමි සිතා සිටි සඳ පසු වැඩි පසේබුදුන්වහන්සේ දැක පසඟ පිහිටුවා වැඳ සවාමීනි මී පිළිගැන්වූ වෙළඳුණෝ කවර ප්‍රාර්ථනාවක් කළෝදැයි විචාළිය. එබසට ඔහු ප්‍රාර්ථනාකළ ලෙස වෙනවෙනම කියා මුළු දඹදිවට අගරජ වන ලෙසට ප්‍රාර්ථනා කළහයි වදාළසේක. එසඳ එදූරි තොම යහපත සවාමීනි මාකෙරෙහි අනුක පාවෙන් මෙතැන්හි මඳක් වැඩසිටිය මැනවැයි කියා නොමෝ සුහුව තමාගේ ගෙට ගොස් පරණ කඩකැබැල්ලක් හැඳගෙණ තමා හිණතුබූ වස්ත්‍රය සෝදගෙනවුත් වළල්ලක් ගසා පාත්‍ර පල්ලට තබනලෙසට පිළිගන්වා සවාමීනි මේ මී දුන්වෙළඳුණෝ මුළුදඹදිවට අගරජකරණ කල්හී මමද ඔවුන්ට අගබිසෝ වෙම්වයිකියා ප්‍රාර්ථනා කරත්නී:

"යදා තෙ මධුදේ භතෙත-භූභුජො හොති භූතලෙ,
තසස හෙසසාමහං භතෙත-පියා අගගමහෙසිකා.
සුරූපා ච සුවණ්ණී ච සුයසා සුබ්බතා සුභා,
අසස තසස පියා චාථ-මනාපා ඉච්ඡිතා සදා" යි.

යනාදීන් ප්‍රාර්ථනා කළාවූ සත්‍රියට තොප පැතූලෙසම සිඩ වේවයි කියා ඈ බල බලා සිටියදීම එතැන්හිදීම අහසට පැන නැඟී දඹගෙඩියක් තුඩින් ගෙන නික්මුණු සවර්ණකිර රජෙකුගේ ඇසිල්ලකින් ගන්ධමාදන පර්වතයට වැඩ ගෙනගිය මී භාත්‍රයෙන්ම උන්වහන්සේගේ ආබාධය සංහිඳුවූසේක. ඉක්බිති ඒ වෙළඳ තුන්බෑයෝ එකතැන්වූ දවසෙක කළාවූ මී වෙළඳාමෙහි අය වියදම් පරීක්ෂාකොට එක මී කලයක අය වැඩ නොදැක වැඩිමහලු දෙබෑයෝ කියන්නාහු: ඇයි මලණ්ඩ එක් මී කලයක් විකොට ගත්තාවූ රන් කොයිදැයි විචාළේය. ඒ බස් ඇසූ මලණුවෝ කියන්නාහු: මී සිහාවැඩි පසේබුදු කෙනෙකුන් වහන්සේගේ පාත්‍රය ගෙන ඒ මී කලය පාත්‍රය පුරා වත්කොට දන් දුනිමි නුඹ ඇම එපින් උවමනා වීනම් පින් අනුමෝදන්ව ගත මැනව. මී උවමනා වීනම් වෙන මී කලයක් හෝ වටිනා මිල හෝ මම දෙමි කීහ. එබසට වටින් මී ගෙනවුත් දෙන දෙබෑයෝ කියන්නාහු: මලණ්ඩ නුඹ වියදම්කොට ගත් මී යෙහි අපි ණය ගන්ට උනුමෝද, ගෙනාවා නොනසා විකොට ගත්තේවීනම් නුඹටත් අපටත් ප්‍රයොජනය නුඹතමා මී දන්දුන්නේ කෙසේවූ කෙනෙකුන්ට දැයි විචාළහ. එබසට ඒ දෙදෙනාගේ මලණුවෝ කියන්නාහු: නුඹවහන්සේලා එසේ මෙසේ නොසිතුව මැනව. අප්‍රමාණ ගුණ ඇති නිහත මානීවූ සීලාචාර ගුණ සමපනන ඉන්ද්‍රිය සංයමාදීන් යුක්ත කාෂාය වස්ත්‍රයක් දරන්නාවූ එක් පසේබුදු කෙනෙකුන් වහන්සේට දුනිමියි කීහ. වැඩිමහළු වෙළඳුණෝ කියන්නාහු: එඹා මලණ්ඩ චණ්ඩාලයෝත් කාසාය

පළි පෙරවගෙන ඇවිද්දනාහුය, එසේවූ හෙයින් තුඹ මී දන් දුන්නේද එසේවූ චණ්ඩාලයක් හටයයි සිතමි කීහ. මැදිබෑ වෙළඳුණෝ කිපී කියන්නාහු: ඒ තොපගේ පසේ බුදුන් ගෙන ගොඩබූදින් එතර දමාපියව, තුඹගේ මී දන්ගත් පසේ බුදුන්ගේ ගුණ අපටද කියන්නේයයි කීහ. මෙසේ වැඩිමහළු දෙබෑයන් කියන පරුෂවචනයන් අසා බාල වෙළඳුණෝ කියන්නාහු: මහානුභාව සම්පන්න පසේබුදුවරුන් වහන්සේට එසේ මෙසේ නොකිය මැනව. සිල්වත් ගුණවත් තැනට අක්‍රොශ කළ කෙනෙක් මතු අපායෙහි ඉපිද මහදුක් විඳිනාහුයයි යනාදීන් ධර්‍මාන්විත කථා කියමින් ඔවුන් පහදවා බුදුවරයන් වහන්සේගේ ගුණ හා දනයෙහි අනුසස්කියා උගන්වූ කල්හි එ ධර්‍මාන්විත කථා අසමින් වැඩි මහළු දෙබෑයෝ කියන්නාහු: එසේවී නම් තොප මී දන්දුන්නේම යහපත, අපිත් ඒ මධුදනයෙහි පින් පහන් සිතින් අනුමෝදන් වුම්හ, සාධු සාධු තොප දුන්නාවූ දනය මැනවැයි කියා අනුමෝදන්වූහ. මෙසේ තුන්දෙනම සමගිව පින් අනුමෝදන්ව කුසලය වර්‍ධනය කළාවූ ඒ වෙළඳ තුන්බෑයෝ ඒ ආත්මභාවයෙන් චුතවච්‍යුති ප්‍රතිසන්ධි වශයෙන් දිව්‍ය මනුෂ්‍ය සම්පත් අනුභව කෙරෙමින් මේ බුද්ධොත්පාදයෙහි බුදුන් පිරිනිවී දෙසිය අටළොස් හවුරුද්දක් පිරුණු සඳ එතුන් දෙනා ගෙන් මී දන්දුන් බාල වෙළඳුණෝ දඹදිව **ධර්‍මාශොක** නම් රජවූහ. මී විකුණන පිලනම් තෙලෙයයි අත දිගුකොට පැවාවූ සට චෙටිකා තොමෝ පැතූ ලෙසම ඒ ධර්‍මාශොක රජුහට **අසන්ධිමිත්‍රා** නම් අගබිසෝවූහ. පසේ බුදුන් සයුරෙන් එතර දමවයි කී අකුසලයෙන් මැදිබෑ වෙළඳුණෝ මේ ශ්‍රීලංකාද්වීපයෙහි **දෙවෙනිපෑතිස්ස** නම් රජවූහ. චණ්ඩාල වාදයෙන් බෑණී අකුසලයෙන් වැඩිමහළු වෙළඳුණෝ පැළලුප් නුවර සමීපයෙහි චණ්ඩාල ගමෙක නුග ගසක්මුළ සාලාවෙකදී ඉපද **නිග්‍රොධ කුමාර** නම්වූහ. එයින් කීහ **මහාවංසයෙහි.**

"අසොකො මධුදෙ සන්ධි-මිත්තා දෙවී තු චෙටිකා,
චණ්ඩාලවාදී නිග්‍රොධො-තිස්සො සො පාරවාදිකො"යි.

යනුහෙයින් ඒ නිග්‍රෝධ කුමාරතෙම අසොක රජුගේ එක් පිතෘ පුත්‍රවූ සුමන යුවරජහට දුව උපන්නේය. කෙසේදයත්? යට කියනලද බින්දුසාරරජහු ඇවෑමෙන් රාජ්‍යලොභයෙන් ජනිතවූ සහභාතු කුමාර සංග්‍රාමයෙහි හුණු සුමන නම් යුවරජහුගේ බිසෝවූ සුමිනා නම් රාජ කන්‍යා තොම ගර්භිණීව හුන් සඳවල්ලහවූ සුමන යුව රජහු සටනෙහි වැටුණැයි අසා භයින් තැතිගෙන සැඟවී ගොස්එම නුවරට නුදුරු ගොපලුගමෙක ජ්‍යෙෂ්ඨ ගවපාලයාගේ ගෘහාසන්නයෙහි නිග්‍රොධ වෘක්ෂයක් සමීපයට පැමිණියහ එසඳ දරුගර්භානු භාවයෙන් ඒ නුගරුක

වසන දිව්‍යපුත්‍රයා බිසවුන් දැක මෙසේ අවමැනව සුමනා වෙතියි ගඩගීය ඒ ශබ්දය අසා බිසව් දෙවතාවා සමීපයට ගියාහ. එසඳ ඒ දිව්‍යපුත්‍ර තෙම තමාගේ ආනුභාවයෙන් එතැන්හි ගෘහයක් මවාදී මෙතැන්හි හිඳුවයි කියා තෙමේ බැහැර නික්ම අන්තර්ධානවිය. බිසව්ද එ ගෙයි හිඳ එදවස්ම පුතණු කෙනෙකුන් ලැබ ඒ පුතණුවන් නිග්‍රොධ මූලයෙහි ජනිතවූ සාලාවෙහිදී ලත්හෙයින් නිග්‍රොධ කුමාර යයි නම්තිබූහ. ඒ ග්‍රාමයෙහි ගවපාල ජ්‍යෙෂ්ඨතෙම බිසව් දුටුතැන් පටන් ස්වාමිදියණි කෙනෙකුන්ට පක්ෂපාත දසයක්හු මෙහෙ කරන්නාක් මෙන් නිරන්තරයෙන් අන්න පානාදිය ගෙනහැර දෙමින් උපස්ථානකෙරෙයි. මෙසේ එතැන්හි වසන්නාවූ බිසවුන්ට සත්අවුරුද්දෙක් අතික්‍රාන්තවිය එකල්හි **මහාවරුණ** නම් එක් තෙරකෙනෙකුන් වහන්සේ ඒ නිග්‍රොධ කුමාරයන් රහත්වන්ට හෙතු ඇති බැව් දැන මහණ කරවන්ට කල් බලාහිඳ මෙකල මේ කුමාරයෝ සත්හැවිරිදිවූහ. එස් හෙයින් මහණ කරවන්ට කලැයි සිතා ඒසුමනා නම්වූ මව් බිසව් ගිවිස්වාගෙන නිග්‍රොධ කුමාරයන් වෙහෙරට කැඳවා ගෙනවුත් කෙසච්ඡෙදනය කරවා මහණ කරවූසේක. එදවස් නිග්‍රොධ සාමණෙරයන් වහන්සේ කරගෙසිදීම කම්ස්ථාන ලැබ රහත්ව ක්ෂීණාශ්‍රවවූසේක. කියන ලදුයේමැයි, **මහාවංශයෙහි**-

"තං මහාවරුණත්ථෙරො–තදා දිස්වා කුමාරකං,
උපනිස්සයසම්පන්නං–අරහා පුච්ඡි මාතරං.
පබ්බාජෙසි ඛුරග්ගෙ සො–අරහත්තමපාපුණී"යි

මෙසේ සත්හැවිරිද්දෙහි රහත්වූ ඒ නිග්‍රොධ සාමණෙරයන් වහන්සේ එක්දවසෙක්හි උදැසන්හිම ශරීර ප්‍රතිජග්ගනයෙන් ආචාර්‍ය්‍ය උපාධ්‍යායන් වහන්සේට කළමනා වත්ත ප්‍රතිවත්ත කෘත්‍යය නිමවා සිවුරු ගැට වටුගන්වා කයින් සිවුරු හා අතින් පාත්‍රය ගෙන මව් බිසවුන්ගේ ගෙදෙරට යෙමි සිතා තමන් වහන්සේ වසන විහාරයෙන් නික්ම වඩනාසේක්: පැළලුප් නුවර දකුණු වහසල් දොරින් නුවරට වැද වීථියෙන් ගොස් නැගෙනහිරි වහසලින් පිටත්ව මව් බිසවුන් වසන ගමට යාසුතු හෙයින් නුවරට වැද සංහුන් ඉඳුරන් ඇතිව එකඟවූ සිතින් වියදඬු පමණකින් වඩා නොබලා බැලූ බැලූවන්ට රිසියෙන තපොලීලාවෙන් රාජාඞ්ගණයට පැමිණිසේක. එසඳ චණ්ඩාශොකමගධෙශ්වර තෙම මතු මහල් තෙලෙහි සිවුමැදුරු කවුළුවෙන් නැගෙනහිරි දිසාව බල බලා සක්මන් කරනුයේ: රාජාඞ්ගණයෙහි වඩනා නිග්‍රොධ සාමණෙරයන් වහන්සේ දැක සිතන්නාවූ මහරජතෙම බොහෝ සත්වයෝම වික්ෂිප්තවූ සත් ඇතියහ,

එසේහෙයින්ම භයින් භ්‍රාන්තවූ මෘගයන් මෙන් දෘෂ්ටි විකාර දක්වන්නාහ, ක්‍රීඩාපර බාල පරායෙහිවූ මේ බාල දරුවෝ වනාහි අවික්ෂිප්තව ශාන්තදාන්තවූ ලීලාවෙන් ඉදිරිපසු නොබලා හස්තපාද චලනාදී කාය විකාර රහිතව සොභමානවූ ගමනින් යෙහෙන් නික්මෙති, එසේහෙයින් ඒකාන්තයෙන් මොවුන්ගේ සන්තානයෙහි ලොකොත්තරවූ ගුණධර්මයෙක් ඇත්තේමයයි සිතා දැක්ම හා සමග පූර්ව හෙතුවෙතුත් සාමණෙරයන් වහන්සේ කෙරෙහි රජහුගේ සිත් පහන්විය. මෙසේ මහ වතුරක්මෙන් උතුරුවනලද්දවූ ප්‍රෙමඇති රජතෙම තෙලෙ යන සඟුරුවන් කැඳවාගෙන එවයි කියා අමාත්‍යයකු යවූය. ඒ ගිය අමාත්‍යයා කි වචනයඅසා වඩනා ප්‍රකෘති ගමනින් සුහුනොවී වඩිනාසේක. එපවත් දුටු නරෙන්‍ද්‍රතෙම සුහුව කැඳවාගෙන එවයි කියා දෙතුන් විටෙකම මිනිසුන් ගමන් කරවියදීත් සාමණෙරයන්වහන්සේ ඈත මෑත නොබලා සංහුන් ගමනින්ම වැඩිසේක. එකල නරෙන්‍ද්‍ර තෙම උන්වහන්සේ දැක නුඹවහන්සේට සුදුසු අස්නක් බලා වැඩහුන මැනවැයි කීහ, එසඳ සාමණෙරයන් වහන්සේද ඈතමෑත බලා එතැන්හි තමන්වහන්සේට මූල වැඩහිඳිනා අනික් භික්ෂුකෙනෙකුන් වහන්සේ නුදුටුහෙයින් මුදුනෙහි නගනලද ශ්වෙතච්ඡත්‍රයෙන් යුක්තවූ සිංහාසන සමීපයට ගොස් රජහට පාත්‍රය දී එම මහ රජහට අතදෙමින් සිංහාසන මස්තකයට පැනනැගී වැඩහුන්සේක එසඳ රජතෙම සාමණෙරයන්වහන්සේ සිංහාසනයෙහි වැඩහුන් විලාසය දැක අදම මූන්වහන්සේ මේ රජගෙට ප්‍රධානවූ සේකැයි සිතූහ. එසඳ මහීන්‍ද්‍රතෙම තමහට පිළියෙළකල රස මස වුලෙන් යුක්තවූ ආහරය එළවූකල්හි එයින්තමන් වහන්සේට යැපෙන පමණක් පිළිගත්සේක. වළඳා ඉක්බිතිවූ කල්හි ඔවුන් වහන්සේ කෙරෙහි ප්‍රෙමවූ චිත්තයෙන් කියන්නාවූ මහරජතෙම පුතණුවන්වහන්ස නුඹවහන්සේ බුදුන් වදාලාවූ අවවාද ධර්මය දන්නාසේක්දැයි පුළුවුත්හ. එබසට එසේය මහරජ, අපි අලුත මහණවූ හෙයින් විස්තර වසයෙන් කියත් පොහොසත් නොවම්හ. එතකුදු උවත් එකදෙස මාත්‍රයක් දනුම්හයි කීසේක. එසේ විනම් පුතණුවන් වහන්ස තමන්වහන්සේ දන්නා පමණකින් මදක් අපටත් කිව මැනවැයි කීහ. එබස් අසා සිතනසේක්: මේ මහරජතෙම ඉතා චණ්ඩ පරුෂය, බොහෝ ප්‍රාණඝාත කරවීය, එසේහෙයින් කුසල කරණයෙහි ප්‍රමාදය, මෝහට කවර ධර්මයකින් බණ කියා අනුශාසනා කොරෙම්දෝහෝයි හැම ධර්මයන් පරීක්‍ෂාකොට ධම්මපදයෙහි අප්‍රමාද වගීයෙන් ධර්මදෙශනා කරනසේක්:

"අප්පමාදො අමතපදං-පමාදො මච්චුනො පදං,
අප්පමත්තා න මීයන්ති-යෙ පමත්තා යථා මතා" යි.

යනමේ ගාථාවෙහි පළමුවන පදමයපමණක් අසාම ස්වාමීනි පුතණුවන් වහන්ස නුඹවහන්සේ දෙශනාකළාවූ මේ බණ පද දෙකින්ම මාගේ සිත සැක දුරුවිය, ධර්මය දැනපීයි, බොහෝ කොට බණ කියා වෙහෙස නොවිඳ සමාප්ත කළ මැනවැයිකීහ. සාමණේරයන් වහන්සේද මෙසේ අනුමෙවුනී බණවදාරා රජහු ගෙන් දෙවන දවස් දෙතිස් ලඟ බතක් ලැබ දෙතිස්දෙනකුන් වහන්සේ කැඳවාගෙන අවුත් අහර වළඳා එදවස් අනුමෝදනා වසානයෙහි පමිත් හා සමග ඒ චණ්ඩාශොකා රජහු තිසරණ ගන්වා පඤ්චශීලයෙහි පිහිටුවා පෘථග්ජන ශ්‍රද්ධායෙන් අචලශ්‍රද්ධා වෙහි පිහිටවූසේක. එකල නරවීරතෙම නිග්‍රොධ සාමණේරයන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ ස්වාමීනි පුතණුවන් වහන්ස සෙට නුඹවහන්සේ හාසමග අතිකුත් දෙතිස් දෙනෙකුන් වහන් සේ කැඳවාගෙන වැඩිය මැනවැයි ආරාධනාකොට මෙම ක්‍රම යෙන් දවසින් දවස භික්ෂූන්වහන්සේ වඩ වඩා ගෙන්වමින් සැටදහසක් පමණ පාසාණ්ඩයන්ට දෙන්නාවූ බත් වැටුප් හරවා නිග්‍රොධ සාමණේරයන් වහන්සේ කෙරෙහි උපන්නාවූ චිත්ත ප්‍රසාදයෙන්ම සැටදහසක් භික්ෂූන්වහන්සේට දනවෘත්ති සිටුවා නිරන්තරයෙන් තමන් ඇතුළු රජ භවනයෙහිදීම දන්දෙන්ට පටන්ගත්හ. **දක්වනලදමැයි.**-

'තතො රාජා පසන්නො සො-දිගුණෙන දිනෙ දිනෙ,
භික්ඛූ සට්ඨිසහස්සානි-අනුපුබ්බෙන වඩ්ඪයි.
තිත්ථියානං සහස්සානි-නික්කඩ්ඪිත්වාන සට්ඨි සො,
සට්ඨිභික්ඛුසහස්සානි-ඝරෙ නිච්චමභොජයි" යි.

මෙසේ නිරන්තරයෙන් මහදන් දෙන්නාවූ ඒ මහරජතෙම එ සැටදහසක් දෙනා වහන්සේට තමන්නමින් අශොකාරාම නම් විහාරයක් කරවා දුන්හ. එකල්හි නිග්‍රොධ සාමණේරයන් වහන්සේ ක්‍රමයෙන් විසි වයස් පිරී උපසම්පන්නව නිග්‍රොධ නම් මහතෙරව මහත්වූ පින්බලයෙන් ලාභ සත්කාරයෙන් අග පැමිණ හිරසඳසේ ලොක ප්‍රසිද්ධ වූසේක. මෙසේ චණ්ඩාශොක මහරජතෙම සම්බුද්ධ ශාසනයෙහි ප්‍රසන්නවූ තැන් පටන් ධර්මාශොක මහරජයයි ලොක ප්‍රසිද්ධ විය. මෙසේ ඒ ධර්මාශොක මහ රජතෙම දවස පස්ලක්ෂයක් බැගින් ධන වියදම් කරවා බුද්ධශාසනයට මහත් ලාභ සත්කාර පැවැත්වූහ.

**කෙසේදයත් ?** එකල්හි දසදහසක් යොදුන් දඹදිව සුවාසූ දහසක් රාජධානියෙන් හා සපනසක් රුවන් ආකරයෙන් හා නවානූ දහසක් ද්‍රෝණ මුඛයෙන් හා සයානූ කෙළ ලක්‍ෂයක් පටුනු ගම්වලින් දවස්පතා නිමන්නාවූ අගහැර එ පැළලුප් නුවර සතර වහසල් දොරින් සාරලක්‍ෂයක් හා නුවර මැද අධිකරණ ශාලාවෙන් ලක්‍ෂයක් හා මෙසේ දවස්පතා පස්ලක්‍ෂයක් ධන උපදනේය. එයින් අධිකරණ ශාලාවෙන් උපදනා ලක්‍ෂයක් සතර වහසල් දොර පොකුණු බිඳුවා ගිලන්පසයෙන් පුරා මහා සංඝයා වහන්සේට දෙන බෙහෙත් පසයටම නිමන්නේය. සතර වහසල් දොරින් උපදනා සාරලක්‍ෂයක් ධනයෙන් දවස්පතා බුදුන්ට බත් මල් පහන් පූජා පිණිස ලක්‍ෂයක් වියදම් කෙරෙති. ධර්ම පූජා පිණිස ත්‍රිපිටකධාරී බහුශ්‍රැතවූ භික්‍ෂූන් වහන්සේට සිවුපස දානය පිණිස ලක්‍ෂයක් වියදම්කෙරෙති, සාමාන්‍ය සංඝයාවහන්සේට සිව්පස දානය පිණිස ලක්‍ෂයක් දෙති. එක නිග්‍රොධ මහතෙරුන් වහන්සේට දවස්පතා ලක්‍ෂයක් වියදම් දෙති. කෙසේදයත් ? උන්වහන්සේට උදෑසන්හිම තුන්සිවුරක් මගුලැතුපිටනබා සුවඳ සුණු පන්සියයක් අඹුණු හා පන්සියයක් මල් කරඬු හා මෙහැම දවස්පතා මහ පෙරගරින් ගෙනගොස් පිළිගන්වයි, දහවල්ද එසේම තුන් සිවුරු පිරිකර හා සුවඳ සුණු මල් කරඬු ගෙන ගොස් පිළිගන්වති, සවසද එසේම තුන් සිවුරු ආදිය ගෙන ගොස් පිළිගන්වති, ධර්මාශොක මහරජ දවසකට තුන්විටක් සළුපෙරලා සළු වඩන සඳ අපගේ මහතෙරුන් වහන්සේට සිවුරු පිළිගන්වන්ට යවුදැයි විචාරම සළුපෙරළති. මහතෙරුන්වහන්සේද තුන්වෙලෙහි වැළඳතිබූ සිවුරු සමීපයට වැඩි භික්‍ෂූන්වහන්සේට දෙනසේක. එකල්හි දඹදිව සංඝයාවහන්සේ බොහෝසේ නිග්‍රොධමහතෙරුන්වහන්සේ දුන් සිවුරුම වළඳිනාසේක. බොහෝසේ මහාසංඝයා වහන්සේ උන්වහන්සේගෙන්ම ආහාර ප්‍රත්‍යය ප්‍රයොජන විඳිනාසේක. තවද ඒ ධර්මාශොක මහරජාණන් ඔටුනුපලන් සතරවන අවුරුද්දෙහි ඔහුගේ සහෝදර මල්වූ තිස්‍ස නම් යුවරජාණෝද සංඝමිත්තාවන්ගේ වල්ලභවූ අග්ගි බ්‍රහ්ම * නම් රාජ කුමාරයන් හා දෙදෙන ලක්‍ෂයක් පුරුෂයන් හා සමග සසුන් වැද මහණව රහත්වූහ. ඉක්බිති මහරජතෙම දවසක අමාත්‍යවරුන්ට ආමන්ත්‍රණය කොට එම්බා සගයෙනි මම බුදුන් සමයෙහි උපතිය නම් මුළු දඹදිව රාජ්‍යයෙන් බුදුන්ට පූජා කෙරෙමි, දෙව්රජව උපන්නෙම් නම් දිව්‍ය රාජ්‍යයෙන් පූජා කෙරෙමි; දැන් මම එ බුදුන් අවදියෙහි ඉපද උන්වහන්සේගේ රූපය දක නෙත් සතභාගත නුහුණුයෙමි, එසේහෙයින් බුදුන් දුටු කෙනෙක් මෙකලට කවුරු ඇද්දැයි විචාළහ. එබස් අසා අමාත්‍යවරු කියන්නාහු: දෙවයන් වහන්ස බුදුන් පිරිනිවියේ මෙකලට දෙසිය එක්විසි හවුරුද්දෙක, එසේහෙයින් පුරුෂ ආයුසංඛ්‍යා දෙසොක් ඉක්මෙමින්ගිවියේය, එසේහෙයින්

* "අග්ගි බ්‍රාහ්මණ" පොත්.

බුදුන් අදුනන මනුෂ්‍ය කෙනෙක් මෙකලට නොම ඇත්තාහ, මාඤ්ජරික නම් නාග භවනයෙහි පාතාල වාසීවූ මහාකාළ නම් භෝගීන්ද්‍ර තෙම දීර්ඝායු ඇත්තේය, මේ කල්පයෙහි බුදුවූ සතර බුදුන් දුටහ, එසේහෙයින් බුද්ධරූපය මවා දක්වනත් සමර්ථවූ ආනුභාව ඇතියහයි කීහ. එබසට ධර්මාශෝක ලෝකාධිපතිතෙම සිතනුයේ: ඒ ඵණීන්ද්‍රයාණන් ගෙන්වා බුද්ධරූපය දකිමියි සිතා කනක සංඛලිකයක් කරවා ස්වකීය හස්තයෙන් ගෙන එකාන්තයෙන් මම ත්‍රිවිධ රත්නයෙහි අචලවූ ශ්‍රද්ධාවක් ඇත්තෙක් නම් මෙ රන් ඇකිල්ල වහා ගොස් ඒ මහාකාළ නාරජහු වහා ගෙන එවයි සත්‍යක්‍රියා කොට තමන්ගේ ආඥාව දපකොට භූමියට දැමූයේය.

එකෙණෙහි ඒ ස්වර්ණ දාමය ඝන මෙදිනීය විවිධ කොරෙමින් මඳකුත් ලස්නොව ක්ෂණයකින් ගොස් නාරජහුගේ පාද ස්පර්ශ කොරෙමින් බඳගිණ, එසඳ උරගෙන්ද්‍ර තෙම . මේ කවර කාරණයෙක්දෝහෝයි දිවසින් බලා රජහු-ගේ ශ්‍රද්ධා තෙජෝ බලයන් දැක ඇසිල්ලකුත් නාග භවනයෙහි නොසිට නාගභටයන් සහස්‍ර ගණන් පිරිවරාගෙන එසඳ පොළොව කිමිද රාජාඞ්ගණයෙහි පෙනී මග රජාණන් ඉදිරියෙහි සහ පිරිවරින් සිටියේය, මහරජ තෙම එ සපිරිවර උරග රාජයා දැක තෙපි කීනාමීහුදැයි විචාරා මහකෙළ නම් උරගාධිපතියෙමි කීකල්හි මහත් සන්තොෂයෙන් තමන් සිතූ අභිප්‍රාය සිද්ධිවියයි උද්දාම චිත්තයෙන් කියන්නාහු: කිමෙක්ද සත්පුරුෂයාණෙනි තෙපි බුදුන් දුටුදැයි පුළුවුත්හ. එසේය දෙවයෙනි මෙකපබුදුවූ සතරදෙනා වහන්සේම දුටුමෝවේදැයි කීහ. එබසට මහරජ නැවතත් රාජ්‍යශ්‍රීයක් පැමිණියාක් මෙන් කුල්මත්ව දෙහොත් මුදුනෙහි තබාගෙන සාධුකාර දෙමින් ධවලාතපත්‍ර උස්සාපිත සිංහාසන මස්තකයෙහි නාරජහු වඩා හිඳුවා ජල ථලජ නානාවර්ණ ප්‍රසූනඝෂාරක වල්ලරි නිකරයෙන්හා කලධෞතඝාටක සුමන සුගන්ධ ප්‍රදීප ධූප චූර්ණාදිවූ නානාවිධ පූජාද්‍රව්‍යයෙන් සත්කාරකොට නානාභූෂණ භූෂිත යොෂිත ෂොඩශ සහස්‍ර ප්‍රමාණ පරිවෘත කොට සිටුවා මහත් ආදරයෙන් උරගෙන්ද්‍රයාණන් දසාවට නම්නව සිට මහරජතෙම කියනුයේ: එ සතර බුදුන්ගේ බුද්ධ ශරීරය නිර්මාණය කොට දැන් මට දක්වාලුව මැනව, මම බුද්ධ රූපයක් දක්නා කැමැත්තෙමියි කීහ, එබසට මහකෙළ ඵණීපතිතෙම කියනුයේ: එම්බා මහරජ මම සරාගීයෙමි. බුදුහු අරාගීසේකෑ, මම සද්වේෂීයෙමි, බුදුහු අද්වේෂීසේක මම සමෝහීයෙමි, බුදුහු අමෝහීසේක, මම සමදීයෙමි, බුදුහු අමදීසේක, මම සමානීයෙමි, බුදුහු අමානීසේක, මම සමාත්සර්‍ය්‍යීයෙමි, බුදුහු අමාත්සර්‍ය්‍යීසේක, එසේ හෙයින් අප වැන්න

වුන් තබා දස ඇඟිල්ලක් දිගුකොට දස දහසක් සක්වළ එකා ලෝකකරන්ට සමර්ථවූ වීතරාගීවූ මහබඹෙක්වී නමුත් බුදුන්ගේ රූපයට කොළකොටි ගණිතිනුත් සදෘශ කොට මවා දක්වාගත නොහෙයි, එතකුදුවුවත් බුදුන්ට අනාදරයෙක් නොවෙවයි අද හස් ලෙසටත් බුදුන්ගේ රූප විලාසයෙන් එකාදෙශයෙන් එක දෙශයක් බැලුව මැනවැයි කියා මෙ කල්පයෙහි පළමු අතුරුකප බුදුවූ කකුසඳ නම් බුදුන්ගේ සතළිස් රියන් බුඩකාය මවාගෙන සතළිස් දහසක් රහතුන් පිරිවරා අහස්කුස වැඩසිටියාක් මෙන් දක්වූ කල්හි ඒ බුඩරූපය දැක ධර්මාශොක නම් උර්වින්ද්‍රතෙම ප්‍රීතින් මත්ව තමන් ලත් ආත්මයෙහි එල ලදිමියි මුව නොපො හොනාලෙස සාධුකාර දුන්හ, යළිදු කොනාගම නම් ජිනොත්ත මයාණන් වහන්සේගේ ත්‍රිංශද්‍රතනොත්සෙධ බුඩකාය මවා තිස්දහසක් ශ්‍රාවකයන් පිරිවරා නභොමණ්ඩලගතව සිටියාක් මෙන් දක්වාලීය. එවෙලෙහිද නරොස්වාමියාණන් හා මහසෙනඟ එකපැහැර සාධුකාර පැවැත්වූහ, තුන්වැනිව කාශ්‍යප සර්වඥ යන් වහන්සේගේ විසි රියන් බුදුබඳ මවා විසිදහසක් රහතුන් පිරිවරා ගගනතලයෙහි වැඩසිටියාක්මෙන් දක්වීය, එවෙලෙහි සරාජ පර්ෂද් විරාජමාන බුඩශ්‍රිය දැක සාධුකාර ධ්වනියෙන් එක කොලාහල කළහ. සතරවැනිව අප මහා ගෞතම ලෝතුමා ණන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා අසූඅනු ව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා කෙතුමාලාලංකාරයෙන් විරාජමානවූ අටළොස් රියන් උස සර්වඥ මූර්තිය මවා බොධිමණ්ඩලයෙහි වලපණී ද්‍රැමෙන්ද්‍රයාණන් වහන්සේට පිටදී වජ්‍රාසනාරූඪව මාර පරාජය කොට බුදුවන්ට වැඩහුන්නාක්මෙන් දක්වාලීය. එසඳ මෙබඳුවූ නයන රසායන බුඩශ්‍රී විලාසය බල බලා බුඩාලම්බන ප්‍රීතින් මත්ව මුළු දඹදිව බුදුන්ට පුදා සොළොස් දහසක් බිසෝවරුන් හා සමග සත් දවසක් මුළුල්ලෙහි බුදුන් බලබලා වැඳගෙන සිට නෙත්‍ර පූජාකළ කල්හි මහකොළ නාරජතෙම සපිරිවරින් තමා වසන නාගභවනයට ගියේය.

මෙසේ දවසින් දවස වඩ වඩා බුඩශාසනයෙහි ප්‍රෙමවර්ධනය කොට කුශල ධර්මයන් රැස්කොට රාජශ්‍රී අනුභව කරන්නාවූ මෙදිනින්ද්‍ර තෙම තමන් ඔටුනු පලන් එම සතරවන හවුරුද්දෙහි එක් දවසෙක අසොකාරාමයෙහි වැඩ වසන සැටදහසක් භික්ෂූන් වහන්සේට පාත්‍ර චීවර කායබන්ධන පරිස්සාවන බුර සූචි සංඛ්‍යාත අෂ්ට පරිෂ්කාරයන් හා මඤ්චපීඨ ආස්තරණ විතාන බිසි බිම්බොහනාදිවූ සමණකප්පිය පරිෂ්කාර පිළිගන්වා මහාසංඝයා වහන්සේ මධ්‍යයෙහි පැමිණ එකත්පස්ව හිඳ ස්වාමීනි බුදුන් වදාළ ධර්මය ප්‍රමාණ වශයෙන් කොපමණෙක්දැයි පුළුවූත්හ.

එකල්හි මත්තෙහි වියයුතු ශාසනොපකාර පිණිස බ්‍රහ්මලොකයෙන් අවුත් මනුෂ්‍යලොකයෙහි උපන්නාවූ මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන්වහන්සේ කියනසේක්: මහරජාණෙනි අප බුදුන් සකල ලොකාභිවෘද්ධි වර්ධනය පිණිස දෙශනා කළාවූ සපර්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මය අඞ්ගවශයෙන් නවාඞ්ගයෙක, ස්කන්ධවශයෙන් සුවාසූදහසක් ධර්මස්කන්ධයයි වදාළසේක එබස් අසා ජනොත්තම තෙම ධර්මයෙහි අතිප්‍රසන්නව එකි එකි ධර්මස්කන්ධයකට එක් එකී විහාරයකින්ම පූජාකෙරෙමියි එක දවස්ම සයානූකෙළක් ධන වියදම්කොට ජම්බුද්වීපයෙහි එකිඑකි නුවර එකි එකි විහාරයක් බැගින් සුවාසූ දහසක් රාජධානිවල සුවාසූ දහසක් විහාර කරවා ඒ සුවාසූ දහසක් විහාරවල කරන්නාවූ සියලු පූජොත්සවම අසොකාරාමයෙහි සිට රහතුන්වහන්සේගේ ආනුභාවයෙන්ම දැක මහත්වූ ප්‍රීති ප්‍රමොද්‍යයෙන් මහාසංඝයාවහන්සේ මධ්‍යයෙහි සිට දෙහොත්මුදුන්දී කියනුයේ: ස්වාමීනි බුද්ධශාසනයෙහි කවරෙක් මහත්වූ පරිත්‍යාගයක් කොළේද කවරහුගේ දන පරිත්‍යාගයෙක් මහතැයි කියද්දැයි පුළුවුත්හ එකල්හි මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන්වහන්සේ කියනසේක්: මහරජ තොපවැනි ප්‍රත්‍යය දායක පුරුෂයෙක් බුදුන් දමසන් තොම ඇත, එසේහෙයින් ප්‍රත්‍යය දායකයන් කෙරෙහි අග්‍රයයි වදාළසේක. එ බස් අසා නරෙන්ද්‍ර තෙම කියනුයේ: ස්වාමීනි එකල බුද්ධශාසනයට ඇතුළත්වීම්ද නොවිම්දැයි පුළුවුත්හ. එසඳ මහතෙරුන්වහන්සේ මහරජ තෙපි ශාසනයට ඇතුළත් නොවෙයි කීසේක එ බස් අසා මහ රජාණෝ කියන්නාහු: ස්වාමීනි ශාසනයෙහි මෙතෙක් ලාභ සත්කාර ප්‍රතිෂ්ඨාකොට අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූ අපවැනි කෙනෙකුන් ශාසනයට හිමි නොවන කල ඉදින් කෙබඳු කෙනෙක් හිමිවෙද්දැයි පුළුවුත්හ. එවෙලෙහි මහ තෙරුන් වහන්සේ කියනසේක්: යම්කිසි කෙනෙක් තමන්ගේ ඖරස පුත්‍ර දුහිතෘ කෙනෙකුන් බුද්ධශාසනයෙහි මහණ කරවාලූනම් ශාසනයට හිමිවූවෝ නම් ඔහුමයයි කීසේක. එ තෙපුල් අසා මහ රජාණෝ තමන් ශාසනයට ඇතුළත් වනු පිණිස ළඟ සිටි විසි වයස් පිරුණු *මහින්ද්‍ර රාජකුමාරයාණන් මුහුණ බලා කිමෙක්ද නුඹ ශාසනයෙහි මහණ වන්නේදැයි විචාළහ. රාජකුමාරයෝද තමන්ගේ සුළු පියවූ තිස්ස නම් යුව රජාණන් මහණවූ තැන් පටන් තුමුත් මහණවනු කැමතිව උන්හෙයින් පිය රජහු කී වචනය අසමින්ම සතුටුව දෙවයන්වහන්ස මා මහණ කරවා ශාසනයට ඇතුළත් වුව මැනවැයි කීහ. මෙසේ රාජකුමාරයන් කී බස් අසා සමීපයෙහි සිටි අටළොස් ඇවිරිදි සංඝමිත්‍රා නම් දියණියන් මුහුණ බලා අම්ම මහණවීම පිළිවන්දැයි විචාළහ. එ සඳ කුමාරිකාවෝද තමන් ස්වාමී පුත්‍රවූ අග්ගිබ්‍රහ්ම නම්

* “මහින්ද„ පොත්.

කුමාරයන් මහණවූ තැන් පටන් තුමූත් මෙහෙණි සස්නෙහි මහ
ණවනු කැමතිව හුන්නාහු: පිය රජහු කී බස් අසා යහපත දෙව
යන් වහන්ස මහණවෙමියි ගිවිස්සාහ. මෙසේ රජතෙම තමාගේ
දරු දෙදෙනා මහණ වම්හයි කීහෙයින් සතුටුව තෙමේ මහා
සංඝයා වහන්සේ වැඳ ස්වාමීනි මාගේ මේ දරු දෙදෙනා මහණ
කරවා මා ශාසනයට ඇතුළත්කොට වදාළ මැනවැයි කී . එසඳ
භික්ෂූන් වහන්සේ යහපතැයි ගිවිස **මොග්ගලිපුත්තතිස්ස** මහා
ස්ථවිරයන් වහන්සේ උපාධ්‍යාය කොට **මහාදෙව** මහා ස්ථවිර
යන් වහන්සේ ආචාර්‍ය කොට **මහේන්ද්‍ර** රජ කුමාරයන් මහණ
කරවූසේක. නැවත **මජ්ඣන්තික** මහා ස්ථවිරයන් වහන්සේ
ආචාර්‍යකොට උපසම්පදා කළසේක. ඒ උපසම්පදා මළුවෙහිදීම
සිවු **පිළිසිඹියාපත්** රහත් වූසේක. ඉක්බිති **සංඝමිත්‍රා** නම් දිය
ණියන් මෙහෙණිවරට ගෙන ගොස් **ආයුපාලි** නම් රහත් මෙ
හෙණි කෙනෙකුන් උපාධ්‍යාය කොට **ධම්මපාලි** නම් මෙහෙණි
කෙනෙකුන් ආචාර්‍ය කොට මහණ කරවූහ පසුව ඒ සංඝමිත්‍රා
නම් සාමණෙරීතොම වත්පුරා වස්පිරී උභතො සංඝයා කෙරෙහි
උපසම්පදාව ලබා සිවුපිළිසිඹියා පත් රහත් වූහ. මෙසේ මහේන්ද්‍ර
සංඝමිත්‍රා යයි යන රාජ නන්දන දෙදෙන ධර්මාශොක මහ රජ
හට සවන්නෙහි මහණවූහ. දක්වන ලදමැයි. **මහාවංශයෙහි**-

"උභො සාසනපජ්ජොතා-ලංකාදීපොපකාරිනො,
පබ්බජ්ජුං ඡඨමෙ වස්සෙ-ධම්මාසොකස්ස රාජිනො" යි.

ඉක්බිති මහේන්ද්‍ර යතීන්ද්‍ර තෙම උපසම්පදාවූ තැන් පටන් තුන්
හවුරුද්දක් ඇතුළත සංගායනා දෙකට ආරූඪවූ අර්ථකථාසහිත
ස්ථවිරවාද සියල්ලම උපාධ්‍යායන් වහන්සේගෙන්ම පුහුණු
කොට නිපුණවූසේක. මෙසේ ධර්ම විනය ප්‍රගුණ කොට උපාධ්‍යා
යන් වහන්සේගේ අතවැසි දහසක් භික්ෂූන්වහන්සේට ජ්‍යෙෂ්ඨ
වූසේක. මෙසේ ශාසන විශෙෂය දැක ප්‍රසන්නවූ මහජනයා
විසින් දවස්පතා පවත්වන ලද්දාවූ ලාභ සත්කාර දැක පළමු
ලාභයෙන් පිරිහුණු තීර්ථකයෝ ලාභසත්කාර ලොභයෙන් තුමූම
මහණව නොයෙක්ලෙස ශාසනාර්බුද උපදවා විනයානුවින
නොව සිතුවක් කරන්ට පටන්ගත්හ. එකල ධර්මාශොක ලොක
නායක තෙම මෙපවත් අසා නිර්මල ශාසනය මලින කරන ශඨ
කූට කෛරාටි[illegible]ඥාන සැටදහසක් තීර්ථක භික්ෂු ප්‍රතිරූප සවරූප
යෙන්ම නපුරු බව දැන මොග්ගලිපුත්තතිස්ස මහා ස්ථවිරයන්
වහන්සේට ප්‍රතිබලව සිට ඒ තීර්ථකයන් බුද්ධ ශාසනයෙන් පිටත්
කොට ගෘහස්ථ කරවා බුද්ධ ශාසනය ශුද්ධකොට සැට ලක්ෂයක්
පමණ රැස්වූ ස්ථාවිරීය නිකායෙහි භික්ෂූන්වහන්සේ අතුරෙන්

මොග්ගලිපුත්ත තිස්ස මහා ස්ථවිරයන් වහන්සේ ප්‍රධානකොට ඇති ගණ ප්‍රධාන දහසක් රහතුන් වහන්සේට ධර්ම සංගායනා කරන ලෙස ආරාධනාකළහ. එකල්හි ඒ දහසක් රහතුන් වහන්සේ ධර්මාශෝක මහරජහුගේ ආරාධනාවෙන් **පැළලුප්** නුවර **අශෝකාරාමයෙහි** වැඩහිඳ නවමසකින් ධර්ම සංගායනා කොට නිමවූසේක. **දක්වනලදමැයි.**-

යා සඞ්ගීතිඤ්චිය සහස්සතිසාගතං තං
දුල්ලද්ධිඝොරතිමිරං විනිහච්ච සම්මා,
සා තිස්සථෙරරවිනා ගමිතා විකාසං
සංගීතිචාරුනලිනී අපි දස්සිතා මෙ.” යි

**මෙතෙකින් මේ සාහස්සික නම්වූ තුන්වන ධර්ම සංගායනාව කියා නිමවන ලදි.**

---

මෙසේ තුන්වෙනි ධර්ම සංගායනාව **ධර්මාශෝක** මහරජ හට සතළොස් වන්නෙහි බුදුන් පිරිනිවි දෙසිය පන්තිස් හවුරුද්දක් ඉක්මුණු පසු සමාප්තවිය. එසඳ ශාසනයෙන් හළ තීර්ථකයෝ ක්‍රොධයෙන් මඩනාලද සිත්ඇත්තාහු: රජගහ නුවර සමීපයෙහි **නාලන්ද** නම් ගමට රැස්ව ඔවුනොවුන් හා මන්ත්‍රණය කොට සත්වයන් බුද්ධශාසනයෙහි ගෞරව නොකරන ලෙස ධර්ම විනය හිනන කල මැනවැයි සිතා, එද වනාහි ඔවුන්ගේ සමය භෙද නොදැන නොපිළිවන, එසේ හෙයින් කිසියම් උපායකින් නැවත මහණවූව මැනවැයි ඔවුනොවුන් හා කථාකොට ගෙන අවුත් ස්ථාවිරිය නිකායනම්වූ විභජ්ජවාදීන්කරා වැද්ද නොගී එයින් හළ මහා සංඝිකාදිවූ සතළොස් නිකාය වාසින් කරා එළඹ තමන් තීර්ථක බව නොහඟවා මහණව තුම්දු පිටකත්‍රය අසා පිරිවහා විපර්යාශ කොට පෙරළාගෙන **කොසඹෑ** නුවර ගොස් ධර්මය විනය බිඳිනා ක්‍රම බැණගෙන බුදුන් පිරිනිවි දෙසිය පන්තිස් වන්නෙහිම සරසක්ව බෙදී සතෙනක වෙසෙමින් මෙසේ වසන්නාහු: **හෙමවතය රාජගිරිය සිද්ධාර්ථකය පූර්වශෛලිය අපරශෛලිය වාජිරිය වෛතුල්‍යය අන්ධකය අන්‍යමහාසංඝික** යයි නව නිකායෙක්වූහ. එයින් හෙමවතයෝ බුදුන් වදාළාවූ ධර්මයයිකියා **වර්ණපිටකය** කළහ රාජගිරිහු **අංගුලිමාලපිටකය** කළහ සිද්ධාර්ථකයෝ **ගූඪවෙස්සන්තරය** කළහ. පූර්වශෛලීහු **රත්ථපාලගර්ජිතය** කළහ. අපරශෛලීහු **ආලවකගර්ජිතය** කළහ, වජ්‍රපර්වත වාසීහු **ගූඪවිනය** කළහ. තවද ඔහුම **මායාජාලතන්ත්‍රය සමාජතන්ත්‍රය මහාසමය තත්ත්වය තත්ත්වසංග්‍රහය භූතඩාමරය වජ්‍රාමෘතය චක්‍රසංවරය මාද්‍රශචක්‍රය හෙරුකාද්භුදය**

ම්හාමායාය පදනික්ෂෙපය චතුෂ්පීඨය * පරාමදීය මරීචපුද්භවය සම්බුද්ධ සම්ගුහ්‍යය සමුච්චයය යනාදීවූ තන්ත්‍රද, මායාමරීචිකල්පය හෙරම්බකල්පය † ත්‍රිසමයකල්පය රාජකල්පය වජ්‍රගන්ධාරී කල්පය මරීචිගුහ්‍යකල්පය ශුද්ධසමුච්චය කල්පය යනාදී කල්පශාස්ත්‍රද ඉපදවූහ. වෛතුල්‍යවාදියෝ වෛතුල්‍යපිටකය කළහ. අන්ධකයෝ රත්නකූටාදීවූශාස්ත්‍රාන්තරරචනා කළහ. අන්‍ය සංඝිකයෝ අක්ෂරසාරීසාදිසූත්‍රාන්ත රචනා කළහ. ඔවුන් ඒ ප්‍රකරණ රචනා කළ ක්‍රම වෙන වෙන දක්වත් ඉතා බෙහෙව. මෙසේ නොයෙක් ශාසන භෙද ඉපදවූවද සම්බුද්ධ ශාසනය තුන්වන සංගායනාවෙහි පටන් දෙසිය එකුන්විසි අවුරුද්දක් නිර්මලව පැවැත්තේමය.

එකල්හි භික්ෂු ප්‍රතිරූප තීර්ථකයන් විසින් උපදවනලද සද්ධර්ම ප්‍රතිරූපයන් අතුරෙන් වර්ණපිටකාදීවූ සද්ධර්ම ප්‍රතිබිම්බ ජම්බුද්වීපයෙහිම නිවෘත්ත විය. වෛතුල්‍යවාදය වාජිරීය වාදය රත්නකූටාදීවූ ශාස්ත්‍රය යන මේ තුන ශ්‍රී ලඞ්කාද්වීපයට උපගතවිය. එද වනාහි මෙරට ප්‍රථමයෙන් රජකළ විජයරජය උපතිස්සය පණ්ඩුවාසය අභාරජය පණ්ඩුකාභය මුටසිවය යන රජුන් සදෙනා ඇවෑමෙන් සත්වැනිව ජනිතවූ දෙවනපෑතිස්ස නම් රජෙක් බුදුන් පිරිනිවී දෙසිය සතිස්වන අවුරුදු දඹදිව ධර්මාශොක රජහට අටළොස්වන්නෙහි මෙලක රජවිය. එකල ධර්මාශොක මහරජාණන්ගේ පුත්‍රවූ මිහිඳු මාහිමියන් වහන්සෙ උපසම්පන්නවූ දොළොස් වස් පිරී දෙවනපෑතිස්ස රජහට පළමුවන්නෙහි පොසොන් මස මැදි පොහෝ දවස් මූල නැකතින් සිරිලකට වැඩ සසුන් පිහිටුවූසේක. ඉක්බිති ඒ දෙවනපෑතිස්ස රජහු පටන් උත්තියරජය මහාසිවය සූරතිස්සය අශ්වාචාර්‍යය අසේලය එළාලය මානාරජය යටාලතිස්සය ගොඨාභය කාවන්තිස්සය දුටුගැමුණුය සැදෑතිස්සය තුල්නත්තිස්සය ලැමැණිතිස්සය කළුන්නාරජය පඤ්චද්‍රාවිඩය යනමේ සත ළොස් රජුන් ඇවෑමෙහි වලගම්අභා නම් රජෙක් බුදුන් පිරිනිවි සාරසිය එකුන්සාළිස් හවුරුදු නවමස් දස දවසක් ගියකල්හි සිරිලක රජ පැමිණියේය. නමා රජයලත් පස්වැනි මස පරදෙසින් මෙරට බට සෙබල දෙමළුන් සදෙනෙකු හා යුද්ධකොට බිදී වල් වන. එකල පළමු බෝමැඩ වැඩහිඳ බුදුන් ලොවුතුරා බුදුව උදන් අනාවදළ "අනෙකජාති සංසාරං" යනාදීන් සංමර්ශනය කළාවූ ප්‍රථම බුද්ධ වචනය ආදි කොට "වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ" යන පශ්චිමබුද්ධවචනයඅවසන් කොටමේ දෙඅතුර පන්සාළිස්අවුරුද්දක් මුළුල්ලෙහි දිව්‍යබ්‍රහමාදීන්ට අනුශාසනා පිණිස දෙශනා කළාවූ ධර්මය විද්‍යමාන

* "චතුෂ්පීඨය" "පරමාද්‍යය" † "ත්‍රිසමය රාජකල්පය"

ලෙසම අක්ෂර වශයෙන් පද වශයෙන් ග්‍රන්ථ වශයෙන් බණවර වශයෙන් පරිච්ඡින්න සංඛ්‍යා සහිතව අනූනව අනධිකව සඤ්ඤුල්බ්බි හා අමිශ්‍රව ත්‍රිවිධ සංගායනාරූඪව හස්තාමලකයක්සේ නිර්මලව අමෘත මහා මෙඝයක්සේ මුළුලොව සතපමින් ත්‍රිවිධ බොධියට පැමිණීමට ඍජු රාජපථයක්ව සර්ව සම්පත්තිලාභයට එකාන්ත කාරණාවූ පිළිවෙළින්ම උපාලිය දාසකය සොණකය සිග්ගවය* මොග්ගලිපුත්තතිස්සය මහෙන්ද්‍රය ඉට්ඨියය උත්තියය සම්බලය භද්දසාලය අරිට්ඨය තිස්සදත්තය කාළසුමනය † දීඝනාමය දීඝසුමනය කාළසුමනය මහානාගය බුද්ධරක්ඛිතය තිස්සය දෙවය සුමනය චූලනාගය ධම්මපාලය ඛෙමය උපතිස්සය ඵුස්සදෙවය සුමනය මහාපදුමය සිවකය උපාලිය මහානාගය අභයය තිස්සය සුමනය චූලාභයය තිස්සය චූලදෙවය සිවය යනමේ මහා ස්ථවිර පරම්පරාවෙන් මුඛ පාඨ වශයෙන් පැවතගෙන ආවාවූ ත්‍රිපිටක ධර්මය එක්තරා ජනපදාධිපතියක්හුගේ ආරක්ෂාවෙන් පන්සියයක් රහතුන් වහන්සේ මාතුලරට අලුවිහාරයෙහි වැඩහිඳ පොත් සංගායනා කොට ලියවූසේක.

ඉක්බිති වළගම්අභා මහරජතෙම තුදුස් අවුරුදු සත්මසක් ගිය කල්හි සිංහල බළ පිරිස් පිරිවරා අවුත් ද්‍රවිඩ ප්‍රලය කොට ත්‍රිසිංහලය එකච්ඡත්‍ර කොට රාජ්‍යය කරනුයේ: ගිරිනම් නිවටකු විසූ තිත්ථකාරාමයක් බිඳවා තමාගේ අභය නාමය හා ඔහුගේ ගිරිනාමය එක්කොට අභයගිරිනම් විහාරයක් කරවා පූර්වොපකාරීවූ තිස්සනම් මහ තෙර කෙනෙකුන් වහන්සේට පිළිගැන්විය. එකලට ලංකා සසුන් පිහිටි දෙසිය සතළොස් හවුරුදු දසමස් දස දවසක් අතික්‍රාන්ත විය. ඉක්බිති ඒ අභයගිරි වෙහෙර පිළිගත් කෙළිගලු තිස්ස මහ තෙරහු කුල සංසට්ඨව වෙසෙති කියා මහා විහාරයෙහි වසන සංඝයා වහන්සේ එක්ව ඔවුන් ශාසනයෙන් පිටත්කරන කල්හි ඔවුන්ට ශිෂ්‍යවූ මහ දළියාතිස්ස නම් භික්ෂුවෙක් අප මහ තෙරුන් වහන්සේට එසේ නොකළ මැනවයි කීය. එබසට ඔහු අශුභානුවර්තීකායයහි එතනින් ඉගුළුවූසේක. එකල්හි ඒ භික්ෂු තෙම කොපයෙන් දිලිහී පන්සියයක් පමණ භික්ෂූන් හැරගෙන ස්ථවිර නිකායෙන් භින්නව අභයගිරි වෙහෙර ගොස් වසනුයේ: යටකී වජ්ජි පුත්‍ර නිකායෙහි ධර්මරුචි නම් ආචාර්‍ය්‍යයන්ගේ ශිෂ්‍යයන් දඹදිව පල්ලරාරාම විහාරයෙන් මෙරට අවුත් තමා කරා වන් කල්හි ඔවුන්ගේ සමය කැමතිව ඒ ධර්මරුචි නම් ආචාර්‍ය්‍යව විසිය.

---

* "සිග්ගවය, සොණකය" † "කාළසුමනය, අරිට්ඨය දීඝනාගය" පොත්.

එතැන්පටන් භගිරි වෙහෙර වාසීහු ධර්මරුචිනම්වූහ. මෙසේ ධර්මරුචිනම් නිකායෙක් බුදුන් පිරිනිවී සාරසිය සිවුපනස් හවුරුද්දක් ගියපසු වලගම්අභා රජහට පසළොස් වන්නෙහි විභජ්ජවාදි නම්වූ ස්ථාවිරීය නිකායෙන් භින්නව භගිරි වෙහෙර ප්‍රසිද්ධවිය.

ඉක්බිති ඒ වලගම්අභා රජු කෙරෙහි පටන් **මහදැළියාතිස්සය චෝරනාගය කුඩාතිස්සයබල්ලත්ශිවය වටුකාය*** **පුරෝහිතය වාහුබිය බැලතිස්සය අනුලාය මකලන්තිස්සය භාතියය මහදැළිනාගය අමඬගැමුණුය† කිණිහිරිදළය කුඩාඅභාය**ශිවල්ලීය එළුනාගය සඳමුහුණුය යසඹිළුය සුභබලනාගය වහප්ජය වක්නෑහැතිස්සය ගජබාහුය මහලුමානාරජය භාතියතිස්සය චූලතිස්සය කුඤ්චනාගය කුඩානාගය කුඩාශිරිනාගය** යනමේ එකුන්තිස් රජුන් ඇවෑමෙහි බුදුන් පිරිනිවී සත්සිය තෙපනස් හවුරුදු සාරමස් දස දවසක් පිරුණු පසු ධර්ම ව්‍යවහාරයෙහි දක්‍ෂවූ **ව්‍යවහාරතිස්ස** නම් රජෙක් සිරිලක රජවිය, එ රජහු දවස ධර්මරුචි නම්වූ අභයගිරි වාසීහු යටකී ධර්මාශෝක ලොකනන්දනයාණන් දවස ශාසනය නසනු පිණිස මහණවෙස්ගත් වෛතුල්‍ය නම් තීර්ථක බ්‍රාහ්මණයා විසින් උපදවනලද වෛතුල්‍යපිටකය ගෙන බුදුන් වදාළ ධර්මයයි ලොකප්‍රසිද්ධ කළහ, එකල ස්ථාවිරීය නිකායවාසීවූ භික්ෂූන් වහන්සේ ධර්මවිනය හා සංසන්දනයෙන් පරීක්ෂා කොට බලා ඒ වෛතුල්‍යවාදය අධර්ම වාදය බව දැන ධර්මයට නොගෙන දුරුකළහ. එපවත් අසා ව්‍යවහාරතිස්ස නම් නරෝත්තම තෙම සර්ව ශාස්ත්‍රයෙහි නිපුණවූ **කපිල** නම් අමාත්‍යයකු ගෙන විනිශ්චයකරවා බුද්ධභාෂිත නොවන බව දැන වෛතුල්‍ය වාදය ගෙන්වාගෙන ගින්නෙහි ලා දවා ඒ භක්ති ගත් පාපී භික්ෂූන්ට නිග්‍රහ කොට බුදුසසුන් බැබළවීය. **දක්වන ලදමැයි.-**

"වෙතුල්ලවාදං මද්දිත්වා–කාරෙත්වා පාපනිග්ගහං,
කපිලෙන අමච්චෙන–සාසනං ජොතයීධ සො,, සි.

ඉක්බිති ඒ ව්‍යවහාර තිස්ස රජහු පටන් **අභාතිස්සය සිරිනාගය විජයිඳුය සංඝතිස්සය දහැමිසිරිසඟබෝ** යනී රජ සපරම්පරාවක් ගිය කල්හි සත්වැනිව සිරිලක රජ පැමිණි **ගොඨාභය** නම් මහ රජහට සතර වන්නෙහි එම ධර්මරුචි නම්වූ අභයගිරි විහාරවාසීහු නැවතත් වෛතුල්‍ය වාදය ගෙන ධර්මයයි දක්වූහ. එකල එසින් **උස්සිලියාතිස්ස** නම් මහතෙර කෙනෙක් ව්‍යවහාරතිස්ස රජු දවස වෛතුල්‍ය වාද ගත් භික්ෂූන්ට නිග්‍රහ

* "බැලතිස්සය, තිලිය පුරෙහිතය, අනුලාය."
† "කිණිහිරිදළය,, ** "සිවලීය,, වෙන පොත්.

කළ නියාව අසා මෙසිදු විචාර චතුර රජකු දවසත් එලෙසවූම යහපත් නොවන්නේයයි අපි ඔවුන් හා එක්නොවම්හයි සඟ තුන්සියයක් දෙනා හැරගෙන දකුණුගිරි වෙහෙර ගොස් ධර්මරුචි නිකායෙන් වෙන්ව විසූහ. ඔවුන් කෙරෙන් **සාගල** නම් මහතෙර කෙනෙක් එහිම හිඳ ආගම ව්‍යාඛ්‍යාන කළහ. එතැන් පටන් ඔවුන් අතවැසිව එතැන්හි වසන භික්ෂූහු එම නමින් **සාගලිය නිකාය** නම් වූහ. මෙසේ නැවත සාගලිය නම් නිකායෙන් බුදුන් පිරිනිවී සත්සිය පස.නූ හවුරුද්දක් ගියපසු ගොඨාභය රජහු දවස ධර්මරුචි නිකායෙන් භින්නව දකුණුගිරි වෙහෙර සඤ්ජාතව මහසෙන් රජහු දවස දෙනා වෙහෙර ජාත විය. ඉක්බිති ගොඨාභය රජ පඤ්ච මහා ආවාසයෙහි මහාසංඝයා රැස්කරවා එපවත් විචාරා වෛතුල්‍ය වාද බුද්ධභාෂිත නොවන බව දැන එ ගත් පාපි භික්ෂූන් සැටදෙනෙකු පිට සන්ගස්වා දෙෂ ත්‍යාගකරවා වෛතුල්‍යවාද ගෙනදවා බුදු සසුන්බැබ විය

එකල දෙශ ත්‍යාග කළ මහණුන් සැටදෙනා අතුරෙන් සමහරු ගොස් **කාවිරපටුන්ගම** විසූහ. එකල එක් තීර්ථක මාත එකයෙක් දෙශාන්තරයෙහි සිට කාවේරියට අවුත් පටුන්ගම් වැස්සන් ඔවුන්ට කරන උපස්ථාන දැක ලාබසත්කාර සඳහා ඔවුන් කෙරෙහි මහණව **සංඝමිත්‍රයයි** යන නමින් ප්‍රසිද්ධව වසනුයේ; දවසෙක වත් තෙරුන් ජල ස්නානයට බටදී සිවුරු අල්වාගෙන ගොඩසිටියේ: ඔවුන් පිට එබු ලකුණු දැක මේ කිමෙක්දැයි විචාළේය. එබසට එතෙම කියනුයේ: ලක්දිව ගොඨාභය නම් රජෙක් මහාවිහාර වාසින්ගේ බස් ගෙන අප වෛතුල්‍යවාද ගත් අභයගිරි වාසීන් සැටදෙනකු පිට සන් ගස්වා නැවී නංගා දෙශ ත්‍යාග කරවීයයි කීය එබසට සංඝමිත්‍ර තෙම සාහසිකව ස්වාමීනි ඊට මාවිසින් කුමක් කටයුතුදැයි විචාළේය. එබසට ඒ භික්ෂු තෙම කීයනුයේ, එම්බා සංඝමිත්‍රයෙනි තෙපි සමර්ථ උවහොත් සතුරන්ට නොකළමනා දෙයෙක් ඇද්දැයි කීය. එබසට සංඝමිත්‍ර තෙම ස්වාමීනි එසේවීනම් මාගේ සමර්ථකම් බැලුව මැනව, මම එ ලක්දිව ගොස් මහ වෙහෙර වැස්සන් වෛතුල්‍යවාද ගෙහි ගන්වමි. ඔවුන්ගේ විහාර හෝ මූලොත් පාටනය කොට නස්වා ඔවුන් ඒ ඒ දිග ලුහුබඳවමියි සැහැසීව නොබෝ දවසකින් සිංහලයට බැස ගොඨාභය රජහු දැක උපායෙන් සිත් ගෙන ඔහුගේ පුත්‍රවූ **දෙටතිස්** කුමරු හා **මහසෙන්** කුමරු දෙදෙනා ශාස්ත්‍ර උගන්වම්යි පටන්ගෙන නවමනව දන්නා දෙටතිස් කුමරු හැර බාලවූ මහසෙන් කුමරු ගෙන මතු මා සිතන කටයුත්තට මොහු කීකරු කරවාගත හැක්කැයි ශාස්ත්‍ර ඉගැන්විය ගොඨාභය මහරජ තෙළෙස් හවුරුද්දක් රාජ්‍යයකොට ජන්මාන්තර ගතවිය. එකල සංඝමිත්‍රයා දෙටතිස් කුමරු කෙරෙහි

හසින් **සොළීරට** ගොස් **කාවේරි** පටුන්ගමෙහි වසනුයේ: දෙට තිස් කුමරු රජව දසහවුරුද්දක් ඇවෑමෙන් සවර්ගී පරායනවූ කල්හි එපවත් අසා නැවත ලක්දිව් බැස හගිරි වෙහෙර වෙසෙමින් නොයෙක් ලෙස උත්සාහ කොට පවා මහා විහාරවාසීන් වෛතුල්‍ය වාද ගැන්විය නොහී බුදුන් පිරිනිවි අටසිය අටළොස් වන හවුරුදු සිරිලක රජපැමිණි තමාගේ ශිෂ්‍යවූ **මහාසෙන** නරවීරයා සාරා එළඹ නොයෙක් ලෙස කාරණා කියා සිතට නංවා මහාවිහාර වාසී මහණක්හට අහරක්දුන් කෙනෙක් ඇත් නම් සියයක් දඩයයි රජුගේ විධානයෙන් නුවර බෙර ලවා පීහ එකල්හි මහාවිහාර වාසීහු නුවර බැස සිඟා තුන් දවසක් අහර නොලදින් **ලෝවාමහපායට** රැස්ව සාකච්ඡා කරන්නාහු: ඉදින් අපි හසින් වී නමුත් අධර්මය ධර්මයයි ගතුමෝ නම් බොහෝ ජනයා එම යහපතැයි ගෙන අපාය ගතවෙති, නිරපරාධයෙන් උන් අපි ඇමත් සාපරාධ වම්හ එබැවින් ජීවිත බ්‍රහ්මචර්‍ය්‍යී අන්තරාය වේ නමුත් වෛතුල්‍ය වාද නොගනුම්හයි කථා කොට **මහාවිහාරය මිරිසවැටි විහාරය සෑගිරි විහාරය** ඇතුළුවූ හැම විහාරවල භික්ෂූහු විහාර හැර රුහුණු ජනපදය හා මලය දෙශයට නික්මුණාහ. එකල පාප මිත්‍රවූ සංඝමිත්‍රයා **සොණ** නම් අමාත්‍යයකු උපස්ථම්භකොට ගෙන රජහට කියා අස්වාමික භාණ්ඩය රාජායත්තය ඒ රාජායත්තවූ විහාර අපට දෙවයි ඉල්වා ගෙන ලෝවාමහපාය ඇතුළුවූ තුන්සිය සැටක් පිරිවෙන් ප්‍රාසාද මුලිනුපුටවා විහාර භූමි හැම සීසෑ උඳු වපුරාපීය. එකල හගිරි වෙහෙර වැසි ධර්මරුචිහු ගොස් සෑගිරි වෙහෙර විසූහ.
**දක්වන ලදමැයි**–

"මහාවිහාරෙ පාපෙන–මහාසෙනෙන නාසිතෙ,
වසිංසු ධම්මරුචිකා–භික්ඛුචෙතිය පබ්බතෙ' යි.

නැවත ඒ මහසෙන් රජ **මෙඝවර්ණ අභය** නම් කල්‍යාණමිත්‍ර අමාත්‍යයකුගේ සමවායෙන් නැවත ඒ මහා විහාරය කරවා ඒ ඒ දිග වැඩි මහා සංඝයා ගෙන්වාගෙන විහාරවල වස්වා සිවුපසයෙන් උපස්ථාන කොළේය. එ රජහුගේ අගබිසෝවූ ලැමැණි දුවක් **ථූපාරාමය** කරවන්නී වඩුවකු ලවා සංඝමිත්‍රයාගේ හිස සිඳුවා උල තබවා වෛතුල්‍ය වාදය ගෙන්වාගෙන ගිනි ගස්වා පුව, නුවරවාසීහු කිපී සංඝ මිත්‍රයාහට උපස්ථම්භවූ සොණ නම් අමාත්‍යයාගේ ගේ බිඳ පොඩිකොට ගෙන වැද ඔහු නලා කසල ගොඩට ඇදපීහ. එකල මහසෙන් රජ සංඝමිත්‍රයා නැතත් පාප මිත්‍ර සංසර්ගයෙන් යහපත් නපුරු භික්ෂූන් නොහැඳින දකුණුගිරි වෙහෙර වසන වංක සිත් ඇති **කොහොන්තිස්ස** නම් මහතෙ

රුන් කෙරෙහි භක්ති උපදවා ඔවුන්ට මහ වෙහෙර සිමින් ඇතුළත ජෝතිශලසන්ති දෙනාවෙහෙර කරන්ට පටන්ගත. එකල්හි මහ වෙහෙර වසන භික්ෂූන් වහන්සේ කියනසේක්: අපගේ ඇතුළු සීමා නානාසංවාසකයන්ට විහාර කළ නොහැක් කැයි කියා වැළක් වියදීම අභයගිරි වෙහෙර වාසීන්ගේ බස් ගෙන නැවත එසේ වීනම් සීමා ඉගුළුව මැනවැයි රජහු විසින් නියොග කළ කල්හි ශාසනාන්තර්ධානය දක්වා පවත්නා සීමාව අපි නුගුළු වම්හයි රහසින් සඟ සත් නමක් බිම්ගෙයක රඳවා විහාරය හැර ගියහ. එකල දෙනානකයෙහි භික්ෂූහු සීමා උගුළු වම්හයි කියා පටන්ගත්හ. එපවත් අසා සිතුල්පව් වෙහෙර වසන අභිඥලාභීවූ සාමණේර කෙනකුන් වහන්සේ රාක්ෂස වේශයක් මවා ගෙන යගදුවක් අතින් ගෙන අමෝරා සඟ පිරිස් මැදට වැද දෙනානකයෙහි භික්ෂූන් ඒ ඒ දිග ලුහුබඳවා නුවර බලා නික්මුණුසේක. මහසෙන් රජ එපවත් අසා රාක්ෂසයකු යගදුවක් ගෙන මෙනුවර දශාවට එන්නේල, ඔහට කුමක් කළ මනාදැයි විචාළහ. එබසට නුවරවාසීහු කියන්නාහු: දෙවයන් වහන්ස මහාවිහාරවාසීවූ භික්ෂූ සංඝයා දැක මූත් නොනවතිම්යි කියා එන්නේයයි කී කල්හි එසින් භික්ෂූන්වහන්සේ බලා කැඳ වාගෙනෙවයි නියොග කොළේය. එකල්හි රජහු නියොග ලත් අමාත්‍යවරු භූමිගෘහයෙහි වැඩහුන් රහත් සත්දෙනා වහන්සේ ගෙන ඔහට දැක්වූහ. එකණෙහි රාක්ෂස වේශයෙන් ආවාවූ සාම ණේරයන් වහන්සේ අන්තර්ධානව සිතුල්පව් විහාරයට වැඩිසේක

එකල මහසෙන් රජ සිම් ඉගිළිය නොහී සීමාව ඇතුළත දෙනා වෙහෙර කරවා කොහොන්තිස්ස මහතෙරුන්ට දන්දින. ඉක්බිති ඒ තිස්ස මහ තෙරුන්ට අභිම වස්තුයෙන් සඟ මැද චොදනා උපන් කල්හි රජහුගේ ධාර්මික නම් අධිකරණ අමාත්‍යයෙක් විනිශ්චය කොට බලා විද්‍යමාන චොදනාව හෙයින් රජහු නොකමැති උවද මහ තෙරුන් දැහැමින්ම ශාසනයෙන් පහකොළේය එකල සාගලිය නිකාය වාසීහු දකුණුගිරි වෙහෙ රින් අවුත් දෙනා වෙහෙර වැස අබහෙරණසලමෙවන් රජහු දවස වෛතුල්‍ය වාදය දැක්වූහ. කෙසේදයත්? මෙකී මේ මහා සෙන රජහු පටන් කිත්සිරිමෙවන්රජය දෙටතිස්ස බුජස් රජය ලඳකතිස්ස යන මේ පස් රජුන් ඇවෑමෙහි මහානාම නම් රජෙක් මෙරට රජවිය. එකල බුද්ධඝෝෂ නම් අටුවා කර්තෘන් වහන්සේ ජම්බුද්වීපයෙන් සිරිලකට පැමිණිසේක. මෙසේ වැඩියාවූ අන්වර්ථනාම ප්‍රසිද්ධවූ බුද්ධඝොෂාචාර්යයන් වහන්සේ බුදුන් වදාළ දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසිය පනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ත්‍රිපිටක පාළි ධර්මයට තුන්ලක්ෂ එක්සැටදහස් සත්සිය පනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අර්ථකථා ලියමින් පාළි ධර්මය

බැබළුවූසේක. ඉක්බිති සෙන්ගොත්රජය ලැමැණිතිස්සසමි ත් සෙන්රජය සරජද්‍රමිඩය දසෙන්කැලිය සිගිරිකසුබුය මුගලන් රජය කුමාරදසය කිර්තිසෙනය මැදිශිවරජය ලැමැණිඋපතිස්සය සත සොළොස් රජුන් ඇවෑමෙන් බුදුන් පිරිනිවි තීය වර්‍ෂ සහස්‍රයෙහි අඹහෙරණසලමෙවන් නම් රජෙක් ලක්දිව රජ විය, එ රජහට දොළොස්වන්නෙහි මෙරටින් කසීරට ගිය පූණී නම් වෙළඳ පුත්‍රයෙක් වෛතුල්‍ය වාද පොතක් ලැබ සැබෑ ධර්‍ම යෙකැයි සිතා මෙරට ගෙනවුත් රජහට පඬුරුකොටදින. එකල එ රජ පෙර රජුන්සේ ධර්‍මා ධර්‍ම විභාග දැනීමට අසමර්‍ථව අභය ගිරි වාසීන් හා මන්ත්‍රණය කොට දෙනා වෙහෙර වෛතුල්‍ය වාද ගෙන තබා භික්‍ෂූන් ඊට සත්කාර කරනසේ විධාන කෙළේය. එකල්හි දකුණුගිරි වෙහෙරින් අවුත් දෙනා වෙහෙර වසන සාගලිය නිකායවාසීහු පෙර රජුන් දවස් වෛතුල්‍යවාද ගත් භික්‍ෂූන්ට නිග්‍රහකොට දෙශ ත්‍යාග කරවූහයි යනු අසා වෛතුල්‍යවාදයට සත්කාර කිරීමට මැලිවූහ. එකල අභයගිරි වාසිහු අවුත් කාරණා කියා ගිව්ස්වා දෙනා වෙහෙර අන්‍ය භික්‍ෂූන්ලවා සත්කාර කරවූහ. එතකුදු උවත් මහාවිහාර වාසීන් හා අනුරාධ පුර වාසීවූ නුවණැති ජනයෝ සත්කාර නොකළාහුමය. ඉක්බිති දඹදිවින් බට ජොතිපාල නම් මහා සර්‍වඥවායී කෙනෙක් වෛතුල්‍යවාදීන් මර්‍දනය කොට තමන් දවස ලක්දිව් තෙලෙහි වෛතුල්‍යවාද නොපවත්නා ලෙස නිශෙසාහා කළහ. දක්වන ලදමැයි, චූලවංසයෙහි–

"තදා එකො මහාථෙරො–ජොතිපාලස නාමකො,
පරාජෙසි විවාදෙන–දීපෙ වෙතුල්ලවාදිනො" යි.

ඉක්බිති ඒ නිකායවය වාසීහු වෛතුල්‍යවාද ගන්නවුන් නැතිහෙයින් රජගෙයි වසන පුරුෂයෙකු සිත්ගෙන අසනතැන් කියන මැතියක්හට වියත්නා නනතුරු ගෙනදී ඔහුලවා රජහට වෛතුල්‍ය වාද දැක්වූහ. ඔහු කාලක්‍රියා කළපසු දෙනා තක යෙහි භික්‍ෂූහු නිහතමානීව මහා විහාරවාසීන්ට අවනතව විසූහ. මෙසේ වෛතුල්‍ය වාද තුන්වරෙක ලක්දිවට පැමිණ පරම බෞද්ධ නරවරොත්තමයන් විසින් ව්‍යංහිත කරන ලද්දේය. තවද මේ ලංකාවීපයෙහි ශාසන ප්‍රතිෂ්ඨාවූ අටසිය දෙපනස් අවුරුද්දක් ගියපසු බුදුන් පිරිනිවී එක්වාදහස් අටාසු අවුරුද්දක් පිරුණු සඳ සතරවන වාරයෙහි ඒ පූණී නම් වෙළඳ පුත්‍රයා විසින් ගෙනෙන ලදුව අඹහෙරණ සලමෙවන් රජහුදවස පටන් මෙරට බාලවූ අඥාන ජනයන් කෙරෙහි පැවැත්තේමය. ඉක්බිති අඹහෙරණ සලමෙවන් රජහු පටන් දපුළුසෙන්රජය දළමු

හලක්‍ය කුඩාකිත්සිරිමෙවණ්‍ය සෙනෙවිමහනාරජය ලැමැණි සිඟානාය යනමේ රජුන් ඇවෑමෙහි අග්‍රබොධි නම් රජෙක්විය. ඔහු දවස සද්දමල් නම අසද්දමල් නම මාමල් නම දැමි නම බැබැමිදලබිසෝ* නම අනුරුඬකුමාර නම දලගොත්කුමාර නම දලසලකුමාර නම කිත්සිරිකුමාර නම පුරවඩුකුමාර නම සූරියබාගු නම සාසුප්කොටඇපා නමැයි යනමෙ දෙලොස් කවීහු ඇතිවූහ. ඉක්බිති අග්බෝ රජහු පටන් කුඩාඅක්බෝය සංඝතිස්සය ලැමැණිබෝනාය අසිඟහාහසාය සිරිසඟබෝය ලැමැණිවඩුරය දළුපතිස්සය පැසුළුකසුබුය දපුළුරජය ලැමැණි දළුපතිස්සය පැසුළුදළුපතිස්සය පැසුළු සිරිසඟබෝය වල්පිට වසුදත්තය හුණන්න රුයියන්දළය මහ ලැපාණෝය අග්‍රබොධිය සුළුකසුබුයපැසුළු අක්බෝය කුඩාඅග්බෝය සල - මෙවන්මිහිඳුස උදයරජය සොම්හිඳුස මැදිඅග්බෝස කුඩා දපුළුස පැසුළු අග්බෝසයි මෙසේ පස්විස්සක් පමණ රජදරුවන් රාජ්‍යය කළ ඉක්බිති ලකාසසුන් පිහිටි එක්වාදහස් එක්සිය සවිසි හවුරුද්දක් ගිය කල්හි බුදුන් පිරිනිවී එක්වාදහස් තුන්සිය දෙසැට අවුරුද්දක් අතික්‍රාන්තවිය

එකල සිංහල ද්වීපයෙහි අව්‍යක්තවූ මත්වල සෙන්නම් රජෙක් විය. එරජහුදවස වජ්‍රපර්වත නිකායවාසීවූ භික්‍ෂු ප්‍රතිරූපතිපිටකයෙක් දඹදිවින් ලක්දිව් අවුත් වීරාංකුරා රාමයෙහි වසනුයේ, තමා ගෙනා රත්රන් පසළොස් කලඳක් රජගෙයි වසන ගිරිවෑසසෙන් නම් අරක්කැමියක්හට දී ඔහුලවා තමාගේ ගුණ රජහට කියවීය. එකල එ රජතෙම ඔහුගේ ගුණ අසා රත්‍ර හැයි සිතා ගිනිවදනා පළඟක්හු සේ එ කීයන. නිවටිහු කරා එළඹි කල්හි එතෙම රහස බණෙකැයි කියා සඟවා අධර්මවූ වාජිරීය වාදම ඔහට කීය. එකල්හි එ රජතෙම කෙළසුවහසක් සක්වළ ආඥාපැතිර දිලියෙමින් සිටි රුවන් සූත්‍රාදී රසාන්විත අප්‍රමාණ ගුණඇති ධර්මයන් හැර එම වාජිරීය වාදනම්වූ අධර්මය ගෙන එම අකාර්‍ය්‍යය නිසාම නොයෙක් ජනයා විසින් නින්‍දිතවහුන් තැතිනුත් සප්‍ාන පතිතව දෙමළුන්ට සවකීය පුරප්‍රවරය හා රාජ්‍යශ්‍රීය හැර පොළොන්නරු ගොස් කාලක්‍රියා කොළේය. රතනකූටාදීවූ ශාස්ත්‍රද එම කල්හි ලක්දිවට පැමිණියේය. ඉක්බිති ඒ මත්වලසෙන් රජහු ඇවෑමෙහි සිරිලක රජ පැමිණි මුගසින්සෙන් නම් මහරජෙක් සිංහල බල - රිස් ගෙන දිවගොස් පාඬිරජුන් මර්දනයකොට මත්වලසෙන් රජු දවස ගෙනගිය ජයබෙර මිණිපා රුගෙන ලක්දිව් බැස ලෝවා මහපාය කටුකොහොල් පෙරළවා තුන්නකාය දහම් ගන්වා ලෝසසුන් සෙමෙහි තබා සද්ධර්මයට විරුඬ අධර්මයක් ලක්දිවට වැද්ද නොදෙන

* සක්දමලය, අසක්දමලය, දූමිය, බැබිරිය, දලබිසෝය, නිකායසංග්‍රහ.

ලෙසට සමුද්‍රාන්තය වට රැකවල් ලවා දැහැමෙන් ශ්‍රී ලංකාද්වීප යෙහි රාජ්‍යශ්‍රී අනුභව කෙළේය. දක්වනලදමැයි,-

“සද්ධම්මපතිරූපානං-දිස්වා ලොකෙ පවත්තනං,
ගණ්හාපෙසි තදා රක්ඛං-සාගරන්තෙ සමන්තතො” යි.

එතකුදු උවත් වාජිරිය වාදය රහස් බණයයි සඟවා පරිහරණකොට රක්නා හෙයින් මත්වලසෙන් රජහු පටන් මෙවක් පෙරවා අඥතයන් කොරෙහි පැවැත්තේය. තවද **නීලපට දර්ශනය** ප්‍රකාශයට ගියහෙයින් ශෙෂවිය. කෙසේදයත්? ලක්දිව යට කියනලද කුමාරදාස රජහු දවස ජම්බුද්වීපයෙහි **ශ්‍රී හර්ෂනම්** නුවර **භොජරජ** රාජ්‍යානුශාසනය කරනකල්හි **සම්මිතතික නිකාය** වාසීවූ ප්‍රාඥවූ ශ්‍රද්ධාවිරහිත ශ්‍රමණයෙක් ත්‍රියාමාන්තර යෙහි මෙචකාම්බරොගුණ්ඨිතව ගණිකා නිකාය ප්‍රවිෂ්ටව නිද්‍රා ප්‍රමත්තවූයේ: ප්‍රභාත කාලයෙහි ස්වකීය විහාරයට පැමිණියේය. එකල්හි ඔහු විසින් විද්‍යාශික්ෂිතවූ අශික්ෂිතාචාර ශිෂ්‍යයෝ ඔහු දැක මේ කවර දර්ශනයෙක් දැයි පුළුවුත්හ. එබසට නීලපට ධර තෙම තමාගත් වෙශය සුවෙශයක් නොවන බව දැනදැනම ශිෂ්‍යයන් අභිලෂිත වනලෙස අනුසස් කියනුයේ: එම්බා මේ නීලපට දර්ශනය ඉතාම යහපත, එසේ හෙයින් මාගේ ශිෂ්‍යවූ තෙපි හැමදෙනම මේ දර්ශනය ගනුවයි කියා එහි බොහෝ අනුසස් ප්‍රකාශ කෙළේය. එතෙපුල් අසා ඔහුගේ වචනකර ශිෂ්‍යයෝ කාෂාය වස්ත්‍රය හැර නීල වස්ත්‍ර පෙරවියහ. ඉක්බිති නීලපටාචාර්‍ය්‍ය තෙම කැමැත්තක් කොට බොහෝ අව්‍යවස්ථා උපදවා නීලපට දර්ශන නම්වූ ග්‍රන්ථ සංඛ්‍යාවක් රචනා කෙළේය. මෙසේ නීලපට දර්ශනය ජම්බුද්වීපයෙහි ව්‍යාප්තවන්ට වන් කල්හි ශ්‍රීහර්ෂ දෙවයෝ ඔවුන් හා ඔවුන්ගේ ශාස්ත්‍ර ගෙන්වා ගෙන අසමින් මේ වනාහි ධර්මයෙක් නොවෙයි, ඒකාන්ත යෙන්ම ශාසන භෙදකර අධර්මයෙකැයි සිතා මාවැනි අඥ චක්‍රවර්තියක්හු දවස මීට උපෙක්ෂා උවහොත් බුදුසස්න පසු බස්නේයයි සිතා ලොකවාසීහුදු අපායෙහි නොහෙන ලෙස පස්වා දහසක් පවත්නා බුද්ධ ශාසනයට පිළිවහල් උවමැනවැයි සිතා ඔවුන්ගේ දර්ශනයෙහි ප්‍රසන්නවූ එකක්හු මෙන් නීලපට ධරයන් හා ඔවුන්ගේ ආගම ශාස්ත්‍රාදිය ගෙන්වා ගෙන ප්‍රාසාදයක් ඇතුළෙහි ලා චාරප්‍රච්ඡන්න කොට අග්නි පූජා කෙළේය. එකල එයින් වැරදගිය ශෙෂය මැනභාග යෙහි මුල් නුසුන් ව්‍යාධියක් මෙන් මෙවක් පෙරවා පැවැත් තේමය.

ඉක්බිති යටකී මූගසින්සෙන් රජහු කෙරෙහි පටන් සිරිලක රජකළ **උදුරජය කසුප්රජය පැසුළුකසුබුය දපුළුරජය කුඩාදපුළුය උදයරජය සෙන්නම් රජය උදුමහරජය පැසුළු සෙනය මැදිපයණ්රජය කුඩාමිඳෙල්රජය ශෛලමෙඝවර්ණ මණහඳ**

ගජය වික්‍රමබාහුය මහල්රජය වික්‍රමපාණ්ඩ්‍ය ජගත්පාලය පරා ක්‍රමපාණ්ඩ්‍ය ලෝකේශ්වරසෙනෙවිශයි යනමේ එකුන් විසි රජුන් ඇවෑමෙහි සිරිලක රජ පැමිණි මහලුවිජයබාහු මහරජ තෙම සයාසූ හවුරුද්දක් මුළුල්ලෙහි සිරිලක්දිව ගම් නියම්ගම් රාජධානි පුර උන් දෙමළ සතුරුසෙන් සාධා සිරිලක්දිව එක් සත්කොට ශාසන ප්‍රතිෂ්ඨාව පිණිස මාඑකාම් කාරවම් පටන් ගෙන යටත් පිරිසෙයින් ගණපූරණයට සඟ පස්නමක් පමණ නොලදින් ලක්‍ෂගණන් වස්තු දෙශාන්තරයට ගමන් කරවා අර මණරට වැසි තෙර පිසිනමක් හා පත් පොත් ගෙන්වාගෙන මාඑකාම් කාරවා ලක්දිව නොයෙක් දහස් ගණන් මහාසංඝයා වඩින කාරවා ශාසනය ජ්‍යොතිෂ්මත් කළහ. ඉක්බිති ඒ මහලු විජයබාහු රජහුපටන් ජයබාහුය වික්‍රමබාහුය ගජබාහුය යන මේ තුන් රජුන් ඇවෑමෙහි අප බුදුන් පිරිනිවී එක්වාදහස් සසිය සයානූ හවුරුද්දක් ගියකල්හි සිරිලක රජපැමිණි පරාක්‍රමබාහු පෘථිවීශ්වර තෙම රාජ්‍යශ්‍රී පුරුදුව තුන්සිය සිවුසැටක් වන්නි පත්තු සාධා චිපචවක්‍රවර්තිව පළමු අන්‍යොන්‍ය විවාදයෙන් නැසුණාවූ ලංකාවීපයෙහි ඇති විවර සිංහල සෙන් රැස්කරවා සූවිසි ලක්‍ෂ පස්විසි දහසක් රන්සිරි බන් අගම්පඩි සෙනඟ හා එසේම ජයවිරිදුලා සිපිනා නවලක්‍ෂ පසානූ දහසක් නැවැණි මහා සෙනඟ හා සමග කොට දෙමළ මහසෙනඟ අතුරෙන් සියෙන් දශදෙනා බැගින් තෝරා එක් 7සි ලක්‍ෂ පස්විසි දහසක් දෙමළ සෙනාව හා මෙසේ සිංහල දෙමළ යොධයන් දෙශාන්තර ප්‍රයාණය කාරවා සොළී පාණ්ඩි රට පට්‍ය අරමණ දෙශය දක්වා යුධ කාංවමින් ජයගෙන දෙශ දෙශාන්තර දෙක්හි එක පැහැර අණසක පතුරුවා ශ්‍රී ලංකාවීපයෙහි බහු නායකත්වය නොකා රන ලෙස රාජ ආඥව පවත්නා ලෙස අධිකාර සෙනෙවිරත් ඈපා මාපා මහලෑණ මහරුථිනා අනුනා සභාපතිනා සිටුනා සිරිත්ලේනා වියත්නා මහවෙදනා මහනැකතිනා දහම්පසක්නා යයි යන මෙකී ප්‍රධාන ප්‍රවෘත්තියද, වියත්පත් අට ගණයද අට මඩිගයද සතරමුදලද නියමකොට අටකුරුවද දෙනවදහසක් ගජාතර ඉවරද යන මෙකී සියල්ලම අඛණ්ඩව පැවැත්ත මැන වයි ව්‍යවස්ථා කාරවා මහත් රජසිරි විඳිනාහු:

"සොෂිප්පසත්‍ථජනතා ජනතාණභූත-
භූපා සලීලරමණී රමණීයරූපා,
පීතා පුළත්ථිනගරී නගරාජගුඩ්‍ය-
ගෙහා මහාධිපවරා පවරා පුරාණං."

යනාදීන් වණ්නිතවූ පොළොන්නරු පුර ප්‍රවරය සිසාරා පූර්වාරාමය දක්‍ෂිණාරාමය පශ්චිමාරාමය උත්තරාරාමය කපිල විහාරය ඉසිපතනවිහාරය කුසිනාරාවිහාරය වෙළුවනවිහා

රය ජේතවනවිහාරය ලංකාතිලකවිහාරය ත්‍රිවංකවිහාරය ගණ්ඩිබඩලේනවිහාරය යයි යනාදීවූ විසිතුරු විහාර කරවා එහි නොයෙක් දහස් ගණන් භික්ෂුසංඝයා වස්වා, තවද ශත්‍රුරාජ චොළකුලාන්තක උද්ධත රාජනිර්මූල දුර්ලබ්ධිමථන දුර්නීතිවාරණපරම ප්‍රඥාතඥ සකලදිග්විජය අනනශ්වර ශත්‍රුවිජය ශරණාගතවජ්‍රපඤ්ජර පරමන්ත්‍රප්‍රභේද වික්‍රම ප්‍රතාප අකලංක සර්වශාස්ත්‍රශිරොමණි කෘතඥානුකෘතඥතිශ්චය පරරාජගොධූජිජී නෘහරි කේසරවරරාජහංස පරනාරිසහොදර අරිරාජ වේශ්‍යාභුජඞ්ග, යනාදිවූ තමන්ගේ අභිනව විරවිරුද නාමයෙන් තුන්සිය සැටක් පිරිවෙන් කරවා තුන්දහස් සත්සියයක් සංඝයා වහන්සේට නිරන්තරව සිවුපසයෙන් උපස්ථාන කෙරෙමින් සුවසථයෙන් වසන්නාහු: පූර්වොක්ත ක්‍රමයෙන් ශාසන හීනකරනු සඳහා අන්‍යතීර්ථකයන් විසින් උපදවනලද්දූව පැවත එන වෛතුල්‍යවාදදීවූ අධර්මය ධර්මයයි, යන පාපී මහණුන් නිසා යටකී වලගම්අභා මහරජහට පසළොස් වන්නෙහි පටන් තමන්ගේ සතරවන හවුරුද්දට එක්වා දහස් දෙසිය සිවුපනස් හවුරුද්දක් මුළුල්ලෙහි හීනන නිකායව ශාසනය පිරිහෙන පවත් අසා සුපරිශුද්ධවූ බුද්ධ ශාසනය පිරිහෙනබව අස අසා මාවැනි ආඥචක්‍රවර්තියක්හු නිරුත්සාහ වූවහොත් බුදු සස්න කිලුටු වෙයි, එ කිලුටින් බොහෝ සත්හු අපායගාමී වෙති, පස්වා දහසක් පවත්නා බුද්ධ ශාසනයට මා පිටිවහල් උවමැනවැයි ප්‍රඥ පුරස්සරව කරුණාවෙන් සංවේගවාදිතවූ හෘදයෙන් යුක්තව කවර කෙනෙකුන් වහන්සේ ඉදිරි කොට ගෙන ශුද්ධකෙරෙම් දෝහෝයි සිතා දිඹුලාගල විහාරයෙහි වසන වනවාසීවූ මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ප්‍රධානවූ මහා විහාර වාසීවූ භික්ෂූන් වහන්සේ කාරු එලඹ එපවත් දන්වා ස්වාමීනි නිර්මල සර්වඥ ශාසනය දුෂ්ප්‍රතිපන්නීන් කෙලසන්නාවූ ධර්මරුචිය සාගලිකය වෛතුල්‍යවාදීයයි, යන නිකාය වාසීවූ සියගණන් පාපී භික්ෂූන් රුස්කරවූව මැනවැයි කියා එලෙසම ලියමඬුයෙක්හි රුස්කරවා තුන්යම් රාත්‍රියෙහි සිටි පියෙහිම සිට හල යුතුතන් හැම ශාසනයෙන් පහකරවා බුද්ධ ශාසනය ශුද්ධකොට තුන්නිකාය සමග කරවා එම කුසලානුභාවයෙන් අවසානයෙහි හිමාලයෙහි රන්ගිරි කුළෙක කල්පස්ථායීවූ නරදෙව නම් දිව්‍ය රාජව උපන්හ. එසේ එකල පැවැත්තාවූ ශාසන ශුද්ධිය එරජහු ස්වර්ගස්ථවූ අවුරුද්දෙහි පටන් සතිස් හවුරුද්දක් නිර්මලව පැවත නැවත පෙරසේම පිරිහෙන්නට වන්කල්හි එම මහලු පරාක්‍රමබාහු මහරජහු කෙරෙහි පටන් පණ්ඩිතවිජයබාහුය කලිංගමිහිඳුය කීර්තිනිශ්ශංකය වීරබාහුය වික්‍රමබාහුය චොඩගංගය ලීලාවතිය සාහසමල්ලය කල්‍යාණවතිය ධර්මාශොකය අනිකංගය ලීලාවතිය ලොකේශ්වර

වරය **ලීලාවතීය** පරාක්‍රමපාණ්ඩ්‍ය යන මේ පසළොස් රජුන් ඇමෑ
මෙහි සිරිලක රජපැමිණි මාඝ නම්වූ පූර්වාභිධාන **කාලිඞ්ගවිජය**
බාහු මහ රජහුගේ අවධියට පූර්වභාගයෙහි පැවැති මහ සතුරු
වියවුලින් **පුලස්තිපුරාදිවූ** පුරාතන ස්ථානවලින් ඉගිළ පත්
පොත් ආදී ශ්‍රමණ පරිෂ්කාර තුබුතුබූ තැන්වලින් උගුළුවා ගෙන
අවුත් මායා රජයට පැමිණ ඒ ඒ තැන්හි වසන මහාසංඝයා
වහන්සේට චීවරාදී චතුර්විධ ප්‍රත්‍යයෙන් උපස්ථාන කෙරෙමින්
වනවාසීවූ **සැරියුත්** මාහිමියන් වහන්සේගේ ශිෂ්‍යවූ ත්‍රිවිධ
ශාසන නමැති සර්වරත්නයන් රක්ෂාකරනා සමුද්‍රයක් වැනිවූ
**සංඝරක්ෂිත** මාහිමියන් වහන්සේ හා දිඹුලාගල අරණ්‍යවාසී
මෙධංකර මහා ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන කොට ඇති තෙසු
ගම්වාස වනවාස මහාසංඝයා වහන්සේ දඹදෙණි පුරවරා සනන
යෙහි තමන් නමින් කරවූ **විජයසුන්දරාරාම** විහාරයෙහි රැස්ක
රවා මහාසංඝයා වහන්සේගේ නොයෙක් විවාද සන්හිඳුවා
අමුතු කතිකාවතක් කරවා බොහෝ ශාසනොපකාර කළ විජය
බාහු **වත්හිමි** මහ රජාණන්ගේ අතිජාත පුත්‍රවූ කලිකාල
සාහිත්‍ය සර්වඥ **පණ්ඩිත පරාක්‍රමබාහු** මහරජාණෝ සිරිලංකා රජ
පැමිණ අධිකතර රාජාභිමාන උපදවා පොළොන්නරු පුළ
චෙවරි කොටසර ගහතලා සාවුඩාපුලූ කුරුඳු පදිමානමතුගොණ
ඩෙබරපටුන් ඌරාතොට ගොමුඩු මීපාතොට මඩලි මනතාරම්,
ආදීවූ ඒ ඒ තැන්හි කොටාව බැඳගෙන වසන්නාවූ දෙමළ මලළ
ජාවකාදීවූ සතුරු වියවුල් සංසිඳුවා සකල ලංකාතලය හස්ත
ප්‍රාප්ත කොට රාජ්‍යශ්‍රීවිඳිමින් ජම්බුද්‍රෝණි පුර ප්‍රවරයෙහිවාසය
කරන්නාහු: ශ්‍රීවර්ධනපුරාදීවූ නානා ස්ථානයෙහි විසිතුරු විහාර
කරවා මහාසංඝයා එහිවස්වා උපස්ථාන කෙරෙමින් වසන්නාහු:
ඒ ඒ තැන්හි ප්‍රමාද විහාරිව වසන කුල පුත්‍රයන්ගේ අනාචාර
අසා වනවාසීවූ මෙධංකර මහා සාමීන් ප්‍රමුඛ උභය වාසයෙහි
මහ සංඝයා වහන්සේ සන්නිහිත කරවා සාදර සිතින් සඟමැදට
වැද ශාසන සවරූප නියම දැන භික්ෂුභාවයට අයොග්‍යවූ තැන්
ශාසනයෙන් පහකරවා ශාසනය ශුද්ධකොට ප්‍රමාද විහාරීන්ට
අවසර නොහරනා ලෙස අවවාදානුශාසනා කොට ග්‍රන්ථධුර
විදර්ශනා ධුරයෙහි යෙදී වසන ලෙස විනයානු කූලව පැවතඑන
ශාසන චාරිත්‍රය පන්දහසක් හවුරුදු පවත්නා පරිද්දෙන්
කතිකා කරවා උභයවාසයම නන්වූ පරිද්දෙන් අඛණ්ඩව
පැවැත්ත මැනවැයි **පුවභනකසෙලාභිධාන පලාබත්ගල** බ්‍රහ්ම
විමානයක් මෙන් විහාරයක් කරවා රූක්ෂ ප්‍රතිපත්ති පූරණයට
ආත්මක්ෂමවූ අල්පෙච්ඡතාදී ගුණොපෙත ප්‍රතිපත්ති සාර වන

වාසීවූ මහාස්ථවිරාදීවූ භික්ෂූන් වහන්සේ එහි වස්වා දහස් ගණන් මහාසංඝයා උපසම්පදා කරවා තමන්ගේ සහෝදර මල් බෙලිගල භුවනෛකබාහු ඈපාණන් ලවා බොහෝ මහණ ගණයාට අසන පිරිවහන තැන් කියවා අප්‍රමාණ ශාසනාභිවෘද්ධි වර්ධනය කරවා බුදුසසුන් බැබලවූහ. එකලට අප බුදුන් පිරිනිවී එක්වාදහස් අටසිය නව අවුරුද්දෙක් අතික්‍රාන්තවිය.

යට කී මහානාම රජහු දවස කීවාවූ බුද්ධඝොෂ අටුවාචාර්‍ය්‍ය මහා ස්ථවිරයන් වහන්සේ පටන් මේ අතුරෙහි ආගමධර ආචාර්‍ය්‍ය වරයෝ නම්: බුද්ධදත්තය ධර්මපාලය ජෝතිපාලය ක්ෂේමය ධර්මශ්‍රීය නන්දය ආනන්දය අනුරුද්ධය උපතිස්සය බුද්ධරක්ෂිතය මොග්ගල්ලානය යනාදීවූ මහාස්ථවිරයන් හා, එසේම එක ශ්‍රැතීන් නෛකසහස්‍ර ග්‍රන්ථ ධාරණයට සමර්ථවූ වජ්‍රඥාන ඇති ශාරිපුත්‍ර මහා ස්වාමිපාදයන් පටන් සංඝරක්ෂිතය සුමංගලය වාගීශ්වරය ධර්මකීර්තිය නාගසේනය දානන්දය වෙදෙහය බුද්ධප්‍රියය අනවමදර්ශීය යනාදීවූ ස්ථවිරවරයෝ නොයෙක් ටීකා අර්ථකථා හා තත් ප්‍රවෙශොපායවූ අනේක ප්‍රකාරවූ ධර්ම ප්‍රබන්ධයන් හා සන්න ගැටපද පිටපත් ආදිය උපදවා බුදුන්ගේ පර්‍ය්‍යාප්ති ශාසනය බැබලවූහ. තවද එසේම ලෝකසිද්ධාර්ථය සාහිත්‍ය විලගම්මූලය අනුරුද්ධය දීපංකරය මයූරපාදය සාහිත්‍යධර්මසේනය යනාදී ස්ථවිරවරයන් හා, ගුරුපාදය ධර්මකීර්තිපාදය ධීරනාගපාලය රාජමුරාරිය කවිරාජශෙඛරය ගුරුළුගෝමිය ආගමචක්‍රවර්තිය පරාක්‍රමපණ්ඩිතය අග්‍රපණ්ඩිතය යනාදීවූ ගෘහස්ත පණ්ඩිත ජනයෝ ධර්මානුගත ශ්ලොක ප්‍රබන්ධ හා විචිත්‍රාර්ථ ප්‍රකාශකවූ සන්න ගැටපද ආදීවූ ස්වභාෂාවෙන් ධර්ම ප්‍රබන්ධ ඉපදවූහ. එම ව්‍යාඛ්‍යාන මුඛගත මෙකල් දක්වාම කාලානුරූප ලෙස ධර්ම ව්‍යාඛ්‍යාන උපදවමින් ප්‍රාඥවරයෝ බුදුන්ගේ පර්‍ය්‍යාප්ති ශාසනය බබුළුවමින් සිටියාහුමය. ඉක්බිති මේ පණ්ඩිත පරාක්‍රමබාහු මහරජාණන් කෙරෙහි පටන් බෝසත් විජයබාහුය යාපව්පුරනිවාසී මහාභුවනෛකබාහුය පරාක්‍රමබාහුය වත්හිමිභුවනෛකබාහුය කුරුණෑගල් පුර නිවාසී පණ්ඩිත පරාක්‍රමබාහුය වන්නිභුවනෛකබාහුය විජයබාහුයයි, යන මේ සත් රජුන් ඇවෑමෙහි මහවැලිගං අස ගංගාශ්‍රීපුර නම්වූ රාජධානියෙහි රජ පැමිණි සතරවැනි භුවනෛකබාහු මහ රජාණන් සතර වන්නට අප බුදුන් පිරිනිවී එක්වා දහස් අටසිය සිවු අනූ අවුරුද්දෙක් අතික්‍රාන්තවිය.

එකල මේණවර වංශාභිජාත සේනාලංකාධිකාරසේනවිරත් මන්ත්‍රියාණ කෙණෙක් මුතු මැණික් ආදීවූ බොහෝ වස්තු කාඤ්චීපුරයට ගමන්කරවා සල්පිළිම ගෙයක් කරවමින්, තවද දෙවිනුවර තුන්මහල් සිටිපිළිම ගෙයක්ද අක්බෝ

වෙහෙර අටළොස්රියන් තුන්මහල් පිළිමගෙයක්ද තමන්ගේ ජන්ම ප්‍රවේණිවූ සිඳුරුවාණ ළබුනුවර පන්ගල් ගලයයි යන පර්වතය මුදුනෙහි කෛලාසකූටයක් මෙන් ඉතා උස්වූ අති ශුභ්‍ර අභිනව ලංකාභිලඛණයි යන නාමින් ප්‍රසිද්ධවූ රජමහ විහාරයක් කරවා ඊට උවමනා ගම්බිම් ක්ෂෙත්‍ර වස්තු දැසි දස් ගව මහිෂාදිවූ බොහෝ ද්‍රව්‍ය සම්භාරයන් පවත්නා ලෙස පූජා කෙරෙමින් තෙසුත් බොහෝ කුශල වර්ධනය කොට වසන් නහු: ශාසනයෙහි මමත්වයෙන් ප්‍රඥාවත් ස්ථවිර මහා ස්ථවිරාදි භික්ෂූන්වහන්සේට සත්කාර ආදර බහුමාන උපදවා බුද්ධ ශාසනය බැබ වූහ. තවද භුවනෙකබාහු මහරජහු ඇවෑමෙහි රජයලත් පරාක්‍රමබාහු මහරජහට ඉක්බිතිව එම පුරෙහි රජ පැමිණි වික්‍රමබාහු මහරජාණන් දවස ගිරිවංශාභිජාත අලගක්කෝනාර නම් මන්ත්‍රියාණ කෙනෙක් මහත් තෙජොබල වික්‍රම යෙන් ලොක පූජ්‍යව වසන්නාහු:

"පාසාදබොධිවරචංකමමණ්ඩපෙහි.
පාකාරසාලපටිමාලයචෙතියෙහි,
කල්‍යාණී නාම නගරී රුචිරාපණෙහි.
රාජෙති චාරුතරගොපුරතොරණෙහි."

යනාදීන් වර්ණිතයවූ කල්‍යාණි පුර ප්‍රවරයට නුදුරුවූ කදම්බාභිදාන ද්‍රෝණි මුඛාසන්නයෙහි නිරන්තරයෙන් ජල යෙන් පිරි සුරක්ෂිතව වටා සිටි තටාක මධ්‍යයෙහි ගැඹුරු පුළුලින් මහත්කොට අගල බිඳුවා එඅගලෙහි පටන් මත්තෙහි සර්වශෛලමයවූ අත්‍යුච්ච ප්‍රාකාරයක් බඳවා එහි ශරපඤ්ජර කුරුතල තබා සරහනලද ප්‍රාකාරයකින් සුරක්ෂිත කොට ජයවර්ධන යයි යන නාමින් ප්‍රසිද්ධවූ ලොක රක්ෂණය පිණිස කෝට්ටයක් ලවා ශ්‍රීලංකාද්වීපයෙහි ත්‍රිවිධරත්න විලොපයෙන් ජනයන්ට වෙහෙස දෙනු පිණිස දෙමළ ප්‍රතිබල ගෙන පැමිණි ආර්‍ය්‍යචක්‍රවර්තීන් වරින් වර ලුහු බඳ වමින් ලංකාද්වීප නමැති ස්වර්ණගිරි ගුහාවෙහි සිංහරාජයකු මෙන් වික්‍රමාන්විතවැ වසන්නාහු:

"තත්‍රාහනත්‍ර සාකානබ්බසුදරභූතො
රුලංකාරලංකාසුවණ්ණද්දිවාසො,
සපත්තනගකුම්භබ්භෙදෙ පවීණො
විරාජෙති වීරාලකාධීසසීහො."

යනාදීන් නෙක කවිවරයන් විසින් වර්ණිතයවූ චිපාධිරාජය මණ්ඩලිකරාජය ප්‍රදෙශරාජය අන්තරභොගිකරාජය අනුශාසක රාජයයි යන පඤ්චප්‍රකාර රජුන් කෙරෙහි අනනාගීතව ශාසනාබ්‍ය භ කුශල වික්‍රමයෙන් ප්‍රජාපාලනය කෙරෙමින් පරලොක

ප්‍රතිෂ්ඨා පිණ්ඩ බොහෝ දානමානාදී කුශල් රැස්කොට සිදුරුගිරි විහාරාදීවූ නොයෙක් විහාරකරවා, වඩ්ඩිපුරපුරන්දර ගිරිවංශශෙඛර නිශ්ශඞ්ක අලකෙශ්වර යනාදිවූ වංසානුගත විරුදනාමයෙන් පිරිවෙන් ව්‍යවස්ථා කරවා නානාදෙසවාසීන් විසින් ප්‍රාර්ථනීයවූ සමස්ත වස්තුයෙන් යුක්ත ජන්ව ප්‍රවෙණි **රයිගම්පුර** වරාසන්නයෙහි සිවුදිග ග්‍රාමාරණ්‍ය වාසී මහාසංඝයා වහන්සේට වෙන වෙනම විහාර කරවා සිවුපස දානයෙන් උපස්ථාන කොරෙමින් ශ්‍රාද්ධාසම්පන්නව වසන්නාහු: ඒ ඒ ස්ථානයෙහි ස්වච්ඡන්දිකව වසන ශාසනාවචරකුල පුත්‍රයන්ගේ අනාචාර ස්වරූප අසා **පලාබද්ගල** වනවාසී පරම්පරානුගත අසම්භින්නභාව පැවත ආවාවූ ප්‍රතිපත්ති ප්‍රඥාසාර දිගු තිතපතල සිලොකා ලොක ඇති ශීලවංශාභිධාන පූජිතාම ප්‍රකාශිත **ශ්‍රීධර්මකීර්ති** මහාස්වාමි පාදෛකනාමවූ ඇගේ උපාධ්‍යායන් වහන්සේට එපවත් දන්වා උභය වාසයෙහි කාරක මහාසංඝයා වහන්සේ රැස්කරවා බුදුන් පිරිනිවී එක්වාදහස් නවසිය දෙළොස් වනහවුරුදු රැස්වූ මහාසංඝයා වහන්සේ මධ්‍යයෙහි විනයානුකූලව විනිශ්චයකොට ශාසනය ශුද්ධ කොරෙමින් බුදුසසුන් කාලක් පවත්නාලෙස සෙමෙහි තුබූහ. එකල්හි කලාවූ සංඝ සාමග්‍රිය පස්වන **භුවනෛකබාහු** පසළොස්වනු පෙරවා කාලානුරූපව පැවැත්තේය. මෙම භුවනෛකබාහු පසළොස්වන්නට අප බුදුන් පිරිනිවී එක්වාදහස් නවසිය එකුන්තිස් හවුරුද්දක් සම්පූර්ණවිය. ඊට ඉක්බිති ඒ අලංගශ්වර නම්වූ ප්‍රභුරාජයාගේ ඖරස පුත්‍රවූ **කුමාර අලකෙශ්වරය** ඔහුගේ පිතෘහට බෑනාවූ **වීරඅලකෙශ්වරය** ඔහු මල්වූ වීරබාහු ඈපාණය ඔහුගේ පුත්‍රවූ විජය ඈපාණය ඔහුගේ මල්වූ **තුනයෙසශ** ඔහුගේ මහලු පිතෘවූ පළමු කී **වීරඅලකෙශ්වර** තෙම රයිගම්පුරයෙහිදී මල්වූ **වීරබාහු**ඈපාණන් හා යුද්ධයෙන් පැරද දෙශාන්තර ගතව නැවත අවුත් මෙහි දෙළොස් අවුරුද්දක් රාජ්‍යයකළ ඉක්බිති පුරාකෘත කර්මයෙන් චීනමායමට අසුව ගිය සඳ පළමු කී සෙනෙවිරදුන්ගේ මුණුබුරුවූ **පරාක්‍රමබාහු ඈපාණයයි** යන මෙ සත්දෙනා ඇවෑමෙන් අප බුදුන් පිරිනිවී එක්වාදහස් නවසිය අටපනස් වනු පොහොන්මසට ලඟා සසුන් පිහිටි එක්වාදහස් සත්සිය දෙවිසි අවුරුද්දෙක් පිරුණේය.

එකල්හි ශාක්‍යකුල පරම්පරානුගත අමිතශ්‍රී වික්‍රමාන්විත **පරාක්‍රමබාහු** මහරජ තෙම ශ්‍රීලංකා ද්වීපයෙහි රාජ්‍යශ්‍රියට පැමිණියේය හෙද පූජියෙහි සුද්ධොදන මහරජහු පරම්පරාවෙන් කිඹුල්වත් නුවර රජකළ ශාක්‍ය රජුන්ගෙන් විඩූඩභ විඳවූලෙහි කිඹුල්වත් පුරෙන් නික්ම ගොස් පැළඳුප් නුවරට පනස් යොදනකින් මත්තෙහිවූ වෙඩිස නුවරට අවුත් රාජ්‍ය

කළු ශාක්‍ය රජහුගේ ධීතෘව වෙදිස දෙවීන් ධර්මාශෝක මහ
රජහට අගමෙහෙසුන් කොට තුබූ පසු ඔහු කෙරෙහි වැස ලත්
මිහිඳු කුමාරයන් හා සංඝමිත්‍රා කුමාරිකාවන්ට මයිල්වූ සූර්‍ය්‍ය
වංශොද්භූත එම වෙදිස දෙවීන්ගේ සහොදර මල්වූ රාජකුමා
රවරුන් අටදෙනා හා සුමිත්‍ර බොධිගුප්ත යයි යන රජකුම
රුවන් දෙදෙනා හා මෙකී දසදෙනම ධර්මාශෝක මහරජ තම
හට සමවූ ස්ථානාන්තරයෙහි පිහුටුවා සවකීය වංශයෙන් රාජ
කුමාරිකාවරුන් දසදෙනකු හා සංඝමිත්‍රා ස්ථවිරීන් හා සමග
නොයෙක් ජනයා සලස්වා බොධි වඩා ලක්දිවට එවූ කල්හි,
අනුරාධපුර නුවර මහමෙවුනා උයනෙහි බොධීන් වහන්සේ
වඩමින් එකල රජකරන දෙවනපෑතිස්ස මහරජහු ජීවමාන
කල්හිම ඔහුගෙන් රාජ්‍යය ලැබ ලංකාවීපයෙහි වැස වඩිත
වෙමින්, ක්‍රමයෙන් සමූහව ගණීවූ හෙයින් ගණවැසිවංශ
යයි කියාද, උභයකුල පරිශුද්ධ වංශ ගුණඥත ආචාරශීල යශඃ
තෙජසින් මහත්ව අලාමකව ලම්බකණ්ණව පැවත ආ හෙයින්
ලැමණීවංසයයි කියාද, බොධි වඩා ආ ශාක්‍යවංශයෙන්ම
ශ්‍රී ලංකාවීපයෙහි රජ බිජුවට පහළව ලංකාව හිමිවූ හෙයින්
එම වංස පරම්පරානු ගතවූ මෙකල දැහැමෙන් රාජ්‍යශ්‍රීයට
ප්‍රාප්තවූ ශ්‍රී පරාක්‍රමබාහු නම් මහරජ තෙම සුපරිශුද්ධ කීර්තිප්‍ර
භාවයෙන් මුළුලොව එක් එළිකොට අප්‍රමාණ තෙජඃ ස්කන්ධයෙන්
ශත්‍රුතිමිර නිසාර දූරිභූත කෙරෙමින් පූර්වොපචිත කුශලානුගත
ප්‍රඥාචක්ෂුසින් කුශලාකුශල විභාගඥවූ සකල ඥෙයමණ්ඩලය
හස්තාමලකයක් මෙන් දැන කුශලට ආකාරවූ ත්‍රිවිධ රත්නය
හස්ත ප්‍රාප්තකොට ගෙන දන්තධාතූන් වහන්සේට තුන්මහල්
ප්‍රාසාදයක් හා මහත් මණ්ඩපයක් කරවා රන්කොත් පළඳවා
ඊන් ගෘහාභ්‍යන්තරයෙහි දන්තලොහාදි විචිත්‍ර චිත්‍රකර්මාන්ත
යෙන් සොභමාන කොට සජ්ජිතකරවා දන්තධාතූන් වහන්සේ
වැඩහිඳිනා ලෙස නවරත්න බැඳි රන්කරඬුවක් හා එකරඬුව
වසා ගල්බැඳි රන්කරඬුවක් හා එහිදු වසා රත්රත් දහසකින්
සතරන් කරඬුවක් හා, තවද සතරන් රැසියක්මෙන් සවණ්
ලිම්පතග කොට තාම්‍රමය චෛත්‍යයක් මෙන් මහත් කරඬුවක්
කරවමින් මෙසේ මතුමත්තෙහි සතරන් රුවන් කරඬු සතරක්
ඇතුළෙහි දන්තභාතූන් වහන්සේ වඩමින් සතරන් රිදී හලි
රන් ඉලත්තට්ටු කෙණ්ඩිකා සිටිවැට ධමන සුසිරාදිවූ පූජා
භාණ්ඩයනුදු ලවමින් දවස්පතා බොහෝ පුෂ්ප පූජා හා දීප
ධූප කර්පූර ප්‍රදීප සුගන්ධතෛල ප්‍රදීප තාම්බූල දීවූ නොයෙක්
ප්‍රයොජනවත් පූජාද්‍රව්‍යයන්ද යාගු ඛජ්ජකාදී සහිත සූපව්‍යඤ්ජන
යෙන් යුක්ත ආහාර පූජාවෙන් හා මාස්පතා පොතලිකා සහිත
නොයෙක් පූජා පවත්වමින් මාසයක් පාසාම දෙපෝදවස්
සාංඝික අටපිරිකරක්ද පවත්වා දෙමින් මස්සාර පොහො
යෙහි ධර්මසමාදනයෙන් යුක්තව ප්‍රාඥජනයන් පිරිවරා හිඳ

බණඇසීමද, තවද අභිනව ශාසනාභිවෘද්ධිප්‍රාප්ත සුදුසුතැන් රජගෙට ගෙන්වා දැක අභිවෘද්ධි මඞ්ගල්‍යයෙන් ශාසන බහුමාන කිරීමද, තවද අවුරුදුපතා සියගණන් භික්‍ෂු සංඝයා වහන්සේට ඇතිරිලි වියන් ආදීවූ ශ්‍රමණ පරිෂ්කාරයන් පිළිගන්වා වස්ආරාධනා කොට නිරන්තර දන වෘත්තියහැර වස් තුන්මස මහදන් පවත්වා දෙමින්, තවද නිරන්තරයෙන් සාංඝික පාත්‍ර පවත්වා දෙමින් තවද වස් අන්තයෙහි බොහෝ කෙළින් සිව්රු අටපිරිකර වැටවිල් කොණ්ඩි ඡේලි හිලව්වරු විතාන බිසි බිම්බෝහණ බේත්බඩු සාසත් කපුරු සහිත කරඬුවිත් ආදීවූ බොහෝ කප්පියභාණ්ඩයන් සරහාගෙන මහාසත්කාරයෙන් විහාරයට ගොස් සත්පුරුෂ දනයෙහි ලක්‍ෂණවූ පරිද්දෙන් සවහස්තයෙන් මහසංඝයා වහන්සේට පිළිගන්වමින්, එදවස් පැමිණි සියගණන් ආගන්තුග භික්‍ෂූන්වහන්සේට ආගන්තුග පිරිකරද පිළිගන්වමින්, රැස්වූ ඇමදෙනා වහන්සේටම මහදන් පවත්වමින්, මස්සාරපොහොයෙහි බුදුපාමොක් මහාසංඝයා වහන්සේ වළඳවමින්, ගණ ප්‍රධාන තැන් බලා පරිෂ්කාර පිළිගන්වමින්, මෙසේ වෙන වෙන කියත් නොපිළිවන්වූ මහත් සත්කාර භික්‍ෂුසංඝයා විෂයෙහි පවත්වා කුශල වර්ධනකොට, තවද අවුරුදුපතා සදෙස දෙස වාසීවූ බොහෝ යාචක සමූහයා රැස්කරවා හස්ති අශ්ව රථ දාසි දාස් ගව මහිෂ ග්‍රාම ක්‍ෂෙත්‍ර කනක කාර්ෂාපණ වස්ත්‍ර අන්න පානාදීවූ බොහෝ වස්තු යාචකයන් විෂයෙහි පරිත්‍යාග කෙරෙමින්, බොහෝ කුශල් කොට බොහෝ ආහාර ප්‍රත්‍යය වස්ත්‍රාදිය පරිත්‍යාග කොට මහණ මහළුකම් කරවා ශාසනාභිවෘද්ධිවර්ධනය කෙරෙමින්, සමන්තකූට පර්වතයෙහි ජිනවර චරණ ලාඤ්ඡනය නමස්කාරකරනු පිණිස යනු එන්නවුන් අන්තරා මාර්ගස්ථානාන්තරයෙහි යාත්‍රාස නාදීන් විඳගන්නා ව්‍යසන අසා අම්බලමක් එතැන්හි කරවා ආහාර සප්පායාදිය පිණිස ගම් කුඹුරු දාසි දාස් ගව මහිෂාදීවූ බොහෝ ලාභ සලස්වා පර්වතා රෝහයට උගහට තැන සංබලිකා බන්ධනයකරවා, මෙසේ නොයෙක් කුශල සඤ්චයකොට **සපරගමු** විහාරයෙහි ඔත්පිළිමගෙය මුල් පිස කරවා, තවද **කැලණි** විහාරයෙහි මහා චෛත්‍යය සුන් බුන් තැන් ප්‍රකෘතිවත් කොට සුණු ගස්වමින් පස්මහල් පාය මුල් පිස කරවමින් සල පිළිමගෙය වටදාගෙය ඔත්පිළිමගෙය නාමෙණෙවිගෙය සමාධි පිළිමගෙය මළුසුන්ගෙය මහාත්‍රිවංකගෙය සිවුරුදාගෙය තෙල් කටාරගෙය ඇතුළුවූ ප්‍රතිමා ගෘහ වහසල් පවුරු පදනම් ජරාවාස නවාවාස ප්‍රකෘතිවත් කරවා එහි ප්‍රතිබද්ධ අනාදිම තිබූ ග්‍රාමක්‍ෂෙත්‍රාදීවූ සියල්ලම පෙර ලෙසම පවත්නාසේ සලස්වා අභිනවද ගම්බිම් පුදමින් විහාර දෙවාලයන් වර්ධන කොට, තවද **පැපිලියාණෙහි** අභිනවයෙන් භූමිය සකස්කොට

ප්‍රාකාරාඞ්ගණ ගොපුර සංඝාරාම බොධි ගෘහ මණ්ඩපාදීන් විසිතුරු කොට විභූෂිත ප්‍රතිමා ගෘහයක් කරවා ගම්බිම් කෙත් වත් පුෂ්පාරාම ඵලාරාම දාසි දාස් ගව මහිෂාදීවූ විහාර ගරු භාණ්ඩද යන මෙයින් අනූනව කාලක් පවත්නා ලෙස සලස්වා මීටම ධර්මාගම පොත් ලියවාලවා, තවද එහි ස්වකීය මාතෘ නාමයෙන් අමුතු පිරිවෙනක් අස්වා උවමනා කප්පිය පරිෂ්කාර පවත්වා නිරන්තරයෙන් සංඝයා වහන්සේ වස්වා කුශල වර්ධනය කෙරෙමින්, තවද ලුණුගම ප්‍රාග්භාරාන්තරයෙහි දිග දශරියන් පුළුල සරියන් පිළිමගෙයක් කරවා බෝමඩ වජ්‍රාසනාරූඪව දිවසෙනෙග පිරිවරා බුදුවන්ට වැඩඋන්නාක්මෙන් වඩු දෙරියන් උස වැඩඋන් පිළිමයක් කරවා එසේම සිටි පිළිම දෙදෙනෙකුන් වහන්සේ හා නාථ මෛත්‍රෙය රූප පිහිටුවා විහාර කත්‍රැප්පාදදිය පුදමින් මතු වර්ධනවන ලෙස සලස්වා, තවද **අභයනාගල** විහාරයෙහි දෙමහල් සාංඝික සංඝාරාමයක්ද දාගැබක්ද ගල්ලෙනක්ද ප්‍රථමාරම්භයෙහි පටන් කරවා සමෘද්ධ කොට හෙද කාලක් පවත්නා ලෙස ලාභසත්කාර සලස්වා, තවද **දෙරණාගොඩ** විහාරයෙහි පළමු පිහිටි දාගැබ ජරාවාස හරවා උළු සුණු කර්මාන්ත කරවා කාලක් පවත්නා ලෙස ප්‍රකෘතිවත් කෙරෙමින්, තවද ගඩලාදෙණි **ලංකාතිලක** රජමහා විහාර දෙක ජරාවාස පිරිමස්වා බොහෝ වස්තු පරිත්‍යාග කෙරෙමින් සුණු කර්මාන්ත කැරවූහ, තවද **මහියඞ්ගණ** චෛත්‍යය පාර්ශ්වයක් භින්නව හුණු බව අසා බොහෝ වස්තු ගමන් කරවා බඳවමින් ප්‍රකෘතිවත් කළහ, තවද පින්කමක් කරවන යම්තැනකින් ආවාවූ සියල්ලවුන්ට සුදුසුවූ ලෙස වස්ත්‍ර කර්මාපණ දෙමින් ගමන්කරවා පින්කම් සමෘද්ධ කරවමින්, මෙසේ ලොකශාසනයට උපකාරීව කරුණා පුරස්සරව රාජධර්ම පථානු වර්තීව වෙසෙමින්, පූර්වයෙහි මහරජුන් ධර්මය පැවැත්වූ ලෙස අසා පන්දහසක් අවුරුදු පවත්නාවූ ධර්මය අප දවසත් ජොතිෂ්මත් කළමැනවැයිසිතා ආදර සහිතව පවත්වමින් ඉදිරියේ දවසත් ඇතී වන්නාවූ ශ්‍රද්ධාවත් පෘථිවීශ්වරාදීන් සද්ධර්මයෙහි භය භක්තිඇතිව පවත්වා කුශල වර්ධනය කොට ගන්නේ මෙලෙසයයි කියා නය නගා තබන්නාක්මෙන් ලොකනීති ධර්මනීති රාජනීති විනයාධිකරණ නීතියයි යනාදීවූ සියල්ලම පැවැත්වූහ. මෙසේ ධර්මොදය ජොතින්භුවනොදයකොට රාජ්‍යශ්‍රී විඳිනා මහා පෘථිවීශ්වරයන් විසින් මෙකල් දක්වා ශාසන ධර්මය නිකායාන්තරයන් හා අසම්මිශ්‍ර කොට පිරිසිදු ලෙස පැවැත්වූ නියාවදැන ශ්‍රද්ධාවත් රජ යුවරජ මහාමාත්‍යාදීන් විසින්ද මධ්‍යස්ථ භික්ෂු සංඝයා වහන්සේ විසින්ද මතු මතුත් අගති විරහිතව ස්වකර්ණ ජල්පික අසත් පුරුෂයන්ගේ බසට කන් නොදී විද්‍යමානත්‍වය දැනගෙන වජ්‍ර පර්වතමෙන් ඍජුව නිශ්චලව

සිට සම්‍යක් අධ්‍යාශයෙන් සම්‍යක්සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේ විසින් භාෂිත සපර්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මය පවත්වාගෙන එන මහා විහාරවාසීවූ සුගන්ධතාරස පරම්පරානුගත සර්වාවිරීයනිකාය සුවිශුද්ධකොට පවත්වා, ස්වර්ගමොක්ෂ සම්පත්තිය සිත්වූ පරිද්දෙන්සිද්ධකොට ගනිත්වා. **දක්වනලදමැයි.**

“යො දූරවාරුමතිමා ජිනසාසනම්හි
සංජාතසාසනමලං යදි සොධයෙය්‍ය,
පුඤ්ඤෙන තෙන තිදිවෙසු චිරං චරිත්වා
තෙනෙව යාති වරසන්තිපදං සුරම්මං.”

**මෙතෙකකින් මේ සද්ධර්මරත්නාකරයෙහි**
**ධර්මාද්භූත සංග්‍රහ කථා නම්වූ**

## දොළොස්වන පරිච්ඡේදය

**කියා නිමවනලදී.**

—o:o—

## 13 වෙනි පරිච්ඡේදය.

**තවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**ධර්මාද්භූත කථාවන්ට අනතුරුව සම්බුද්ධ චක්‍රවර්තීන්ගේ**
**චෛත්‍ය කථාකම් කවරහයත්?**

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කේ කෙසේදයත්?** යට කියනලද සප්තවිධ රත්නාධිපතිවූ චාතුර්ද්වීපික සත්ත්වානුශාසක චක්‍රවාල චක්‍රවර්ති රජුන් ජාතික්ෂය කාල කල්හී ඔවුන්ගේ ධාතූන් රැස්කොට බඳනාලද්දවූ චෛත්‍යයෙහි හැමදීම් ආදීන් සකස් කොට පුෂ්ප දීප ධූපාදීන් පූජා කළාවූ සත්ත්වයන්ට චක්‍රවර්ති රාජ්‍ය සම්පත් ආදිවූ මනුෂ්‍ය සම්පත්තිය හා ශක්‍ර සම්පත්ති ආදීවූ දිව්‍ය සම්පත්ති දැයි යන විවිධ සම්පත්තිය ලැබෙන්නේය. මේ චක්‍රවර්ති රජුන්ගේ චෛත්‍ය විභාග නම. සම්‍යක් සම්බුද්ධවරයන් වහන්සේගේ චෛත්‍ය නම් කවරහයත්? පාරිභොගික චෛත්‍යය ධාතු චෛත්‍යය ධර්ම චෛත්‍යයයි ත්‍රිවිධවේ. එයින් පාරිභොගික චෛත්‍යය නම්, පාත්‍ර ධාතු පටි ධාතු ජලසාටිකා ධබරා ආසන බොධි පත්‍ර දරු ආදිවූ පාරිභොගික වස්තූන් වඩමින් බඳනා ලද්දවූ චෛත්‍යය පාරිභොගික චෛත්‍යය නම්වෙයි. දන්ත ධාතු අකු ධාතු ග්‍රීවා ධාතු ලලාට ධාතු කෙස ධාතු ආදිවූද තෙසුත් ශාරීරික ධාතූන් පිහිටුවා බඳනාලද්දවූ චෛත්‍යය ධාතු

චෛත්‍යය නම්වෙයි. ධර්ම චෛත්‍යය නම්, ධර්මසඟුණු ප්‍රතීත්‍ය සමුත්පාදදීවූ බණ පොත් ලියා පිහිටුවා බඳනාලද්දාවූ චෛත්‍යය ධර්ම චෛත්‍යය නම්වෙයි. තවද ශාරීරික චෛත්‍යය පාරිභොගික චෛත්‍යය උද්දේසික චෛත්‍යයයි ත්‍රිවිධවේ. හෙද චිත්ති කෘතාඵයෙන් චෛත්‍යය නම්වේ. එයින් ශාරීරික චෛත්‍යය නම් ධාතු ආදිය වෙයි. පාරිභොගික චෛත්‍යය නම් බොධි ආසනාදියයි. උද්දේසික චෛත්‍යය නම් බුද්ධ ප්‍රතිබිම්බ ආදිය වෙයි. මේ හැම චෛත්‍යයන්ට තමා ශක්ති පමණින් ආසන පුෂ්ප ප්‍රදීප පූජා කොට භක්ති ප්‍රේමයෙන් නමස්කාර කොට ඒ ස්ථානයෙහිදී පෞෂධාඞ්ග ශීලාදිය සමාදන්ව තිලකුණු මෙනෙහි කෙරෙමින් භාවනා කොට චිත්තෛකාග්‍රතාව කළාහට ත්‍රිවිධ සම්පත්තියම සිද්ධවන්නේයි. චෛත්‍ය වන්දනාදියෙහි අනුසස් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වදාරන සර්වඥයන්වහන්සේ මෙසේ වදාළසේක. **ඒ බව භගවනු පිණ්ස දක්වන ලදමැයි-**

"චෙතියං චක්කවත්තීනං-ජග්ගිත්වාන පමොදිතා,
දෙවමානුසසම්පත්ති-වයං භුඤ්ජන්ති සජ්ජනා
බුද්ධානං චෙතියං චාපි-සම්මජ්ජිත්වා පසන්නකො,
මනුස්සසග්ගමොක්ඛාති-ලභන්ති තිවිධං පදං.
චෙතියාදිසු ආනන්ද-ආහිණ්ඩන්තා පමොදිතා,
ලභන්ති පෙච්චසග්ගෙසු-දෙවිස්සරියමබ්භුතං.
ජග්ගන්තා තත්‍ථ තත්‍ථෙසු-බොධිචෙතිය අඞ්ගණෙ,
ආසනානි ච ධොවන්තා-පූජෙන්තා පුප්ඵදීපකෙ.
සිසිරොදකසිඤ්චන්තා-බොධියම්හි පමොදිතා,
ඡඩ්ඩෙන්තා තං ච උක්ලාපං-කුසලං පන කා කථා?
අමුකස්මිං විහාරම්හි-වන්දිස්සාමාති චෙතියං,
පසන්නමනසා තිට්ඨ-මිත්වා මග්ගන්තරෙ තදා.
කාලං කරොන්තා යං කිඤ්චි-ව්‍යසනෙනාපි අන්තරා,
සග්ගෙ පතිට්ඨහිත්වාන-ලභන්ති සුරසම්පදං."

යනුයෙයින්, "යෙ හි ඛො පනානන්ද චෙතියචාරිකං ආහිණ්ඩන්තා පසන්නචිත්තා කාලං කරිස්සන්ති සබ්බෙ තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජිස්සන්ති." යි වදාළ බැවින් **ආනන්ද** ස්ථවිරයෙනි තෙපි පූජා තබා දාගැබ් මහ බෝමළු ප්‍රසන්නචිත්තයෙන් බලා චාරිකා කළාහු වී නමුත් ඔව්හු පවා කාබුන් මරණින් මත්තෙහි ඒකාන්තයෙන්ම දිව්‍ය ලොකයෙහි උපදනාහුයයි වදාරා දාගැබ්මළු බොධිමළු සුද්ධ චිත්තයෙන්ම හැමන්දාවූද මලසුන් සොධා සුවඳ පසහුල් දී බොධි සනාන කොට දීප ධූප පුෂ්පාසන පූජාදිය කළාහු වී නම් ඔවුන් ලබන්නාවූ ස්වර්ග මොක්ෂ සම්පත්තිය කියනුම කවරේද, එහත් සිතින්

අඝවල් විහාරයෙහි චෛත්‍යය වඳින්ට යම්හයි කියා නික්ම ගොස් අතරමගදී කාලක්‍රියා කළාහු විනමුත් ස්වර්ගයෙහිම ඉපද අප්‍රමාණ දිව්‍යසම්පත් අනුභව කරන්නාහුයයි යමක ශාලාභ්‍යන්තරයෙහිදී ආනන්ද ස්ථවිරයන් වහන්සේට, වදාළසේක. තවද අප බුදුන්ගේ පාරිභොගික ධර්ම ධාතුයයි යන ත්‍රිවිධ චෛත්‍යයෝද ශාරීරික පාරිභොගික උද්දෙශිකයයි යන ත්‍රිවිධ චෛත්‍යයෝද විත්ති ස්තූපයෙන් චෛත්‍ය නම්වූ, ඒ සිද්ධස්ථාන පිහිටි තැන් මෙසේ දතයුතු.

කෙසේදයත්? අප බුදුන් බුදුවූ නවවැනි දුරුතු මස මැදි පොහෝ දවස් මේ ලංකාද්වීපයට වැඩ මහා වාලුකා ගංගාතීරයෙහි දිග තුන් යොදුන් පුළුල දෙ යොදුන් පමණ සුපුෂ්පිත නාග වනොද්‍යානයෙහිදී ඔවුනොවුන් හා කිසි විරුද්ධයෙකින් යුද්ධයට පටන් ගත් නල සිළු අඟුරු හිසින් හිස පුපුරුවිතාම්‍ර සිරොරුහ භ්‍රමණයෙන් යමරාජ ධනුනිභ කුටිල ක්‍රූර භ්‍රෑයුග නහ නහා දීප්තිමත් ගිනි වට වැනි රතැස් කරකව කරකවා අර්ධචන්ද්‍රාකාර දළ කොළවරින් ඩැහැ ඩැහැ ගඩු නැගී කපොල ඇති රක්තාධර පෙරළි විරල දන්තයෙන් සංජනිත භූමි ගර්භයෙන් දිව් දිගු කොට ලෙළවමින් කන්හි තබතලද සක් පත් බමව බමවා ඔබිනොබ බලමින් නානා යුධ ගෙන සෙනහඬ මෙන් ඔවුනොවුන්ට වහසි බස් කිය කියා හඬ ගසමින් සටනට පටන් ගත් මහයක් සෙනග මධ්‍යයෙහි අහස බුදුහු වැඩ සිට ඔවුන්ගේ හඬට වැඩිතරම් ලෙස අහස් පෘථිවි ගුගුරවමින් වෛශ්‍රවණාපරාධ කළ පිසාචකයන් මෙන් ඒ යක් සෙනග නැතිගන්වා සමාරූඪ ජීමූත ඝනාන්ධකාරයක් මවා භය දෙවමින් එම ඝනාන්ධකාරය දෙවෙනිවත් පහනොට දීප්තිමත්වූ ළහිරු මඩලක්සේ අහස් කුස පෙනී තමන්වහන්සේගේ සකල ශරීරයෙන් නිකුත් දුම්කඳින් යක්සෙනග භයගන්වා නැවත පඤ්චොපක්ලෙශ විරහිත චන්ද්‍ර බිම්බයක් මෙන් අමෘත රශ්මි විහිදුවමින් පෙනි පෙනී වැඩසිටි කල්හි මේ ආශ්චර්‍ය්‍යය දුටු යක්සෙනග විසින් බුදුන් වැඩහිඳිනාලෙස අවසරදුන් මහියඞ්ගණ චෛත්‍යස්ථානවූ භූමි ප්‍රදේශයෙහි චර්මඛණ්ඩාස්තරණයෙන් යක්සෙනග මැද වැඩහිඳ සම්කඩ සතර දසාවෙන් ගිනිකඳ සතරක් මවා දසදික් විහිදුවමින් යක්ෂයන් නැතිගන්වා ඒ ඒ දිග ළුහුබඳවමින් මුහුදු වෙරළස රැස්කරවා බුද්ධානුභාවයෙන් යක්ගිරිදිවයින සමීපයට ගෙන්වා පැවාක්මෙන් යක්ෂයන්ට දක්වා මහ යක් සෙනග ඒ යක්ගිරි දිවයින වාසස්ථානකරවා වැඩහුන් කල්හි, ඒක්ෂණයෙහි වෘක්ෂ පර්වතාරණ්‍යාදියෙහි වසන ආකාශස්ථ විමානස්ථාදිවූ හැම දෙවියන් සහිත සමනළ කුළ වසන සුමන දිව්‍යරාජයාණන් විසින් එතැන්හී පැමිණ අපමණවූ දීපධූප සුගන්ධ

පුෂ්පාදීන් පූජා කෙරෙමින් සිටි කල්හි, එතැන්හි වැඩහුන් බුදුහු සමන්දෙව් රජහු ආදිකොට ඇති හැම දෙව දෙව සතුන්ට සද්ධර්ම දේශනා කොට කෙළගණන් දිව්‍ය සමූහයා මාර්ගඵලයෙහි පිහිටුවා අසංඛ්‍යයක් පමණ දෙවියන් සරණ සිලයෙහි පිහුටුවා එදවස් සෝවාන් මාර්ග ඵලයට පැමිණි සුමන දිව්‍යරාජයාණන්ට පුදන ලෙස හිස පිරිමැද කෙසධාතු මිටක් දෙමින් ලංකාවීපය සිසාරා තුන් විටෙක අන්ධකාරයෙහි ශීඝ්‍රව දැවටූ අලාතයක් මෙන් ප්‍රදක්ෂිණා කොට ආරක්ෂාලමින් එදවස්ම ජම්බුද්වීපයෙහි උරුවෙල් දනව්වට වැඩිසේක.

එකල මහසමන් දෙව්රජහු තමා ලත් කෙසධාතු මිට සත් රුවන් කරඬුවෙක බහා බුදුන් යක්ෂ ප්‍රලයට වැඩහුන් භූමි ප්‍රදේශයෙහි රත්න රාශියක් කොට ඒ රුවන් රැස මුදුනෙහි කෙසධාතු සහිත රුවන් කරඬුව වඩා සත්රියනක් උස ඉඳුනිල මාණික්‍යමයවූ දාගැබක් බැඳ අප්‍රමාණවූ පූජා කොළේය. එසින් මෑත භාගයෙහි ක්ෂීණාශ්‍රවවූ සරභූ නම් තෙර කෙනකුන් වහන්සේ බුදුන් පිරිනිවී පසු ග්‍රීවා ධාතූන් වහන්සේ ගෙනවුත් කොත් කැරැල්ල මුදුනෙහි පිහිටුවා මෙඝ වර්ණ පාෂාණයෙන් ඉඳු නිල්මිණි චෛත්‍යය වසා දොළොස්රියනක් උස සල දාගැබක් බැඳ පූජා කළසේක. එසින් මෑතභාගයෙහි **චූලාභය** නම් පෘථිවීශ්වරයෙක් ඒ මෙවන් පාණින් බැඳි චෛත්‍යය වසා තිස්රියනක් උස උළුයෙන් මහසෑයක් බඳවා පූජා කළේය. ඉක්බිති දුටුගැමුණු මහරජ තිස්රියන් චෛත්‍යය වසා සුසැටරියනක් උස මහ දාගැබක් බඳවා සනරන් පතින් වසා තමාගේ ධන පමණින් පූජාකොළේය. අසූරියනක් උස යසිද කියත්. **දක්වනලද්දමැයි**–

"චූළාභයවහවතිපො අපරමහි කාලෙ
තං එව තිංසරතනුච්චමකාසි ථූපං, *
දුට්ඨාදිගාමණිනුපො දමිළෙ හනනෙතා
කාරෙසි කඤ්චුකමථො චතුසට්ඨිහත්ථං."

**නවද**– "පඨමො සතතායතෙථා ච–දුතියො වාදසහත්ථකො,
තතියො තිංසහතෙථා ච–චතුතෙථා සිතිහත්ථකො."

මෙතෙකින් මහියඞ්ගණ චෛත්‍යය කළපරිදි සැබෙවින් දක්වනලදී. මේ බුදුන් ලංකාවීපසට වැඩි **පළමුවෙනි ගමනාග.** දෙවැනි ගමන නම, අප බුදුන් බුදුවූ පස්වන හවුරුදු බග අව පසළොස්වක් දිනයෙහි '**චූළෝදර මහෝදර** නම් දෙමයිල් නාරජුන් දෙදෙනා මිණිපලඟක් නිසා **වඩුණ්නාගල** තිස්කොළක් නයින් හා කැලණියෙහි විසිකෙළක් නයින් හා **මණිනාගදිවයින** තිස්කොළක් නයින් හා මේ ජලථලජවූ අසූකෙළක්

* ඡත්තිං ස හත්ථ මකාරිත්ථ වරොරු ථූපං, සි. ස. කු. ව.

ප්‍රමාණ විවිධ නාගසේනාව යුද්ධයට සැරහී සාහසික වහසිබස් බෙණෙමින් පවන් වේගයෙන් ඇළලි ගොඩ ගමන්ගත් දෙසයුරක්සේද, එහි මතුමත්තෙහි දිවන රළ පෙළක් මෙන් පෙළින් පෙළ සැදී කඩු පලඟ පත්හිරම් පාරාවළලු වලකුඩ දුනු තෙප් කොන්ත සෙන් කොල් යගද මුගුරු සිරා ආදීවූ නානායුධ ගෙන විදුලිය කැලක්මෙන් ලෙළවා රණ දෙරණ එකලු කෙරෙමින් උතුන් පසු කැර රණෝන්මත්ත චිත්තයෙන් දපී සහිතව ඉදිරි ඉදිරිව දිවෙමින් සටනට දෙපිට දෙසෙනග ඇණිලා සිටගත්හ. දක්වනලදමැයි **සමන්තකූට වණ්ණනායෙහි**-

"මතවති ජනකිස්සා * තෙථ පල්ලංකහෙතු
ජලජථලජනාගා යුද්ධසජ්ජා අහෙසුං,
අථ ථලජභුජඞ්ගා භඞ්ගකල්ලෝලමාලා
සදිසලුලිතචිත්තා ගබ්බිතෙවං රවන්ති.

කිමුදධිජථණ්ණිනං කිත්තිසම්පත්තියා නො
අපි යසපරිවාරා කිං බලෙනිඩ්ඪියා කිං,
අහමහමිති ගබ්බා කිං කිමිස්සාය තෙසං
භවති තිමිරරීනං භානුමග්ගුත්තනා කා.

අථ ජලජලගද්ධා ගජ්ජනං ගජ්ජයන්තා
භයජනකපගබ්භා පොථයන්තා භුජාතං,
අහමහපභු රෙ රෙ පබ්බතෙය්‍යානමෙතං
පටුතරඩස්සතොඩ්ඩා කක්ඛළෙවං රවන්ති.

පටුතරගුරුනාද නාව ගජ්ජන්ති දන්තී
නයනපථම්බුපෙන්තො යාව කණ්ණීරවා නං,
තථරිව ථලජාතා ජුම්භයන්තා සමග්ගා
නයනපථගතා නො සුක්ඛදප්පා භවන්ති.

ඉති තදුභයසෙනාසට්ටයන්තාක්ඛණක්ඛණං
විවිධපහරණෙහා උග්ගිරන්ති ගිරන්ති,
සතතබුභිතවෙලා සාගරූමීව හන්තා
ලුලිතලුලිතචිත්තා යුද්ධිනිස්සාසිතාසුං."

යනාදීන් මෙසේ වහසි බස් බැණ සංග්‍රාම භූමියෙහි රැස්වූ නාග දෙසෙනග විඳගන්නා ව්‍යසන අප බුදුහු දිවසින් දැක ඔවුන් කෙරෙහි කරුණාවෙන් එදවස් පෙරවරුම **දෙව්රම්** වෙහෙරින් නික්ම ඒ **ජේතවන** දොරටුව සමීපයෙහි සිටි කිරිපළුරුක අරක්ගත් **සමිද්ධිසුමන** නම් දිව්‍යරාජයා විසින් මූලොත්පාටනයෙන් ගෙන සිරසට අල්වනලද එම කිරිපලුරුක සෙවණින් අහසින් අවුත් මණිනාග දිවයිනට වැඩ ක්‍රූරතර යුද්ධයට පටන්ගත් නාග දෙසෙනඟට මැද පෙනී අහස්කුස කිරිපලුතුරු සෙවන නැමති

---

* දුහිතරිමතකාලෙසී, ඇතම්.

ඉන්ද්‍රනීල මාණික්‍ය ඡත්‍රය යට පලක් බැඳ වැඩහිඳ නයින් භයගන්වනු පිණිස අන්ධකාරයක් මවා එයින් ත්‍රස්තව භයගත් නයින්ට ළහිරුමඬලක් මෙන් ආලොක පතුරුවා නොයෙක් පෙළහර දක්වා ධර්මදෙශනාකොට දෙසෙනග සමඟ කැරවූ කල්හි ස්වකීය නාගකන්‍යාවන් සහිතවූ සියලු නාගසෙනාවම තම තමන් අත තුබූ ආයුධ දමා අනෙකප්‍රකාරවූ පුද පඬුරු සරහාගෙන අවුත් පුදකොට අහසින් භූමියට බුදුන් වැඩමකරවාගත්හ. ඔවුන්විසින් පිළිගන්වනලද මිණිපලඟ මත්තෙහි වැඩහිඳ නයින් පිළිගැන්වූ දිව බොජුන් වළඳා අසූකෙළක් නයින්ට ධර්මදෙශනාකොට සරණ සීලයෙහි පිහිටුවා ඔවුන්ට අභිවෘද්ධි කුශල වර්ධනය පිණිස වැඳ පුදා ගන්නාලෙස කිරිපලුරුක හා මිණිපලඟ පාරිභොගික චෛත්‍යය කාරණු සඳහා කිරිපලුරුකට පිටදී මිණිපලඟ පිට වැඩහුන්සේක. දක්වන ලදමැයි, **සමන්තකූටවණ්ණනායෙහි**-

“තරුණතරණිසොභං කෙතුමාලාවිලාසිං
සුභරුචිමුඛචන්දං ලක්ඛණාකිණ්ණගත්තං,
තිභවවිභවදස්සිං තං විදිත්වාන නාගා
චුතපහරණහත්ථා වන්දමානා මහංසු.

සිරසි නිහිතපාණීරත්තපඞ්කෙරුහෙහි
විකචවදනනෙත්තාමන්දකඤ්ජුප්පලෙහි,
සකසකධනනානාවණ්ණවම්මාදිකෙහි
විවිධකුසුමවත්ථාමන්දදීපධජෙහි

උරගභවනවාසා නාගකඤ්ඤා සමෙච්ච
කුචකලසසඝස්සං ධාරයන්ති සලීලං,
ලලිතකනකවල්ලීලීලමාධන්තගත්තා
ථුතිමුඛරමුඛා තා සාධුකීළං අකංසු.

අථ මුනි උරගානං විග්ගහං තං සමෙතුං
සුතිමනකමනීයං නිච්ඡරං බ්‍රහ්මඝොසං,
අජරමමරමග්ගං සුප්පසත්ථං සුධීහි
වරමති වරධම්මං දෙසයී තං ඵණීනං.

ඉති තිබ්බණසුධීමා කතනුමෙතෙ සමග්ගා
අවදි පවරධම්මං සාධු විඤ්ඤූප්පසත්ථං,
අථ මුදිතමනා තෙ පීණිතාතස්ස නාගා
මණිමයමතුලං තං ආසනං පූජයිංසු.

අථ මුනිගගනමහා රුයහ භූමිප්පදෙසං
තරුණරවිව තස්මිං ආසනෙ ආසි භාසං,
අථ භුජග ගණා තෙ දිබ්බඛජ්ජාදිකෙහි
පරිවිසිය මුනින්දං සාධු ධම්මං සුණිංසු.

අථ ජලථලජානං තත්‍ථ යුඛාගතානං
අගණිතභුජගානං සීතිකොටී භුජඞ්ගා,
විමලසරණසීලෙ සුප්පතිඨා සුතුඨා
අකරුමතිඋළාරං සත්‍ථු පූජාවිධානං.”

යනාදීන් උරග රණ නිවාරණය කොරෙමින් පිළිගත් මිණි පලඟද දෙව්රජහු දෙව්රමින් එක්ව හිසට සෙවණ කොටගෙනා කිරිපලුරුකද චූලෝදර මහෝදර මණිඅක්ඛිකයසියනනාරජුන් ප්‍රධානකොට ඇති නාගභවන තුනෙහි වසන අසූකෙළක් නයින් හා නාගාඞ්ගනාවන් අභිප්‍රායානුකූල ලෙස වැඳ පුදා කුශල් රැස් කරන ලෙස පාරිභොගික චෛත්‍යය කොට තබමින් ශ්‍රී ලංකා ද්වීපයට ආරක්ෂා පිහිටුවා නැවතත් ජම්බුද්වීපයෙහි සැවැත්නුවර දෙව්රම් වෙහෙරටම වැඩිසේක. **එසේහෙයින් දක්වනලදමැයි**-

“ජලඨෙ ථලඨෙ භුජඞ්ග පතෙවං
සමගෙහ කාරිත්‍වා මුනී සීති කොටි,
පතිඨාපයිත්‍වා තතො වාදසීලෙ
අගා ජෙතනාමං විහාරං උළාරං ”යි

මේ දෙවනවාරයෙහි අප බුදුන් ලක්දිව මණිනාගදිවයිනට වැඩ එහි සාමුද්‍රික නාගභවනයෙහිද, සමුද්‍රතීරයෙහිද පිහිටුවූ මිණිපලඟද කිරිපලුරුකද පාරිභොගික චෛත්‍යය නම්වේ. මේ ලක්දිවට වැඩි. **දෙවැනි ගමනය.**

තවද අප බුදුහු බුදුවූ අටවන අවුරුදු **සූනාපරන්තක** නම් මහතෙරුන් වහන්සේගේ ආරාධනාවෙන් පන්සියයක් රහතුන් හා සමග සක්දෙව්රජහු මවාදුන් පන්සියයක් සත්රුවන්සිවිගෙවලට පැනනැඟී **සූනාපරන්තක** නම් ජනපදයට වැඩ මුහුළු නම් ආරාමයෙහි වෙළඳුන් විසින් කරනලද **චන්දනමණ්ඩලමාළක** නම් සාලාව පිළිගෙන සත්‍වයන්ට ධර්මදෙශනාකොරෙමින් මාගීඵලයෙහි පිහිටුවා එතැන්හි කීපදවසක් වැස **පූර්ණ** සථ්විරයන් වහන්සේගේ ආරාධනාවෙන් **සුප්පාරක** නම් පටුන්ගමට ගොස් එහි ජනයන්ට ධර්මදෙශනාකොට ආපසු **සැවැත්** නුවරට වඩනාසේක්: **නම්මදා** නම් ගංගාතීරයට වැඩ ඒ ගංගාතීරයෙහි වසන්නාවූ **නම්මදා** නම් නාගරාජයාගේ ආරාධනාවෙන් ඔහු පිළිගැන්වූ ද්‍රව්‍ය භොජනය වළඳා ඔහට අනුමෙවුනි බණ වදාරා

බොහෝ උරග ගණයා සරණසීලයෙහි පිහිටුවා එම නම්මදා නම් උරගේන්ද්‍රයාගේ ආරාධනාවෙන් එම ගංගාතීරයෙහි රළ පහරන තෙන මුතුසුණු රැසක් වැනිවූ මනහර වැලිතලාව මුදුනෙහි අටතුරුසියක් මඟුල් ලකුණෙන් විරාජමානවූ **දක්ෂිණ ශ්‍රීපාදය** පිහිටුවමින් නයින්ට කුශල ප්‍රතිලාභය සම්පාදනය කළසේක. ඒ යොන්රට ගංගාතීරයෙහි ශ්‍රීපාදය එබූ වැලිගොඩ මුදුනෙන් රළපතර ගැසූකල්හි ජලයෙන් ශ්‍රීපාදය වැසී තරඟ පහවූකල්හි සකල ලක්ෂණාන්විත පාදලාඤ්ඡනය අත්‍යන්තාර්දිත සික්ථපුඤ්ජයක් මුදුනෙහි නිමග්නකළ ලාඤ්ඡනයක් මෙන් සකල ලක්ෂණයෙන් අනූනව දුටු දුටුවන් නෙත් සනහමින් අදදක්වා ජගදහි වෘද්ධි වර්ධනයකරන්නේයි. මේ පාරිභොගික චෛත්‍යය නම්වේ. තවද එතනින් **සච්චබද්ධ** පර්වතයට වැඩ **සච්චබද්ධ** නම්වූ එක් තෙරකෙනෙකුන් වහන්සේගේ ආරාධනාවෙන් ඝනනීලවූ එනම් පර්වත මස්තකයෙහි තෙත් මැටිපිඩෙහි ස්නෙහයෙන් ආර්ද්‍රවූ පාදයක් නිමග්නකළාක් මෙන් සිරිවස ස්වස්තිකාදීවූ අෂ්ටොත්තර ශත මඞ්ගල ලක්ෂණයෙන් සොභමානවූ ශ්‍රීපාදය ඒ මඟුල්ලකුණු අවයව බින්දුවක් පමණ නොවරදවා දුටු දුටුවන්ගේ මාංශචක්ෂුසට පෙනෙන ලෙසම ප්‍රකාශකොට ශ්‍රීපාදය පිහිටුවූසේක. මෙසිදු මාගේ බුදුන්ගේ එක් පාද චෛත්‍යස්ථානයෙක;

තවද ඒ සච්චබද්ධ නම් පර්වතයෙන් නික්ම ශ්‍රීලංකාද්වීපයෙහි **සමන්තකූට** පර්වත රාජයා ශ්‍රීපාදලාඤ්ඡනාභිෂෙකය පැලඳීමට ප්‍රථම ශුද්ධිය පිණිස කල්‍යාණාභිෂෙක ජලය මස්තකයෙහි වත් කළ කල්හි සර්වාංග සුපරිශුද්ධ ශඞ්ඛධෞතයෙන් පර්වත පාදයෙහි පතිතව සමුද්‍රයට නික්මුණු කල්‍යාණ ජලස්කන්ධයක්වැනි හෙයින් ඒහෝ **කල්‍යාණිගංගා** නම්වූ නදී ප්‍රවාහය ආශ්‍රයකොට ප්‍රාදුර්භූතවූ නාගභවනයෙහි උරගශ්‍රී පරිභොගකරන **මණිනාඝන** නම් නාගරාජයාණන් තමන්ගේ බෑනවූ **මහොදර** උරගාධිපතිහු **චූලොදර** භුජගෙන්ද්‍රයා හා කරණලද යුද්ධයට සහායවනු පිණිස **මණිනාග දිවයිනට** ගියතෙන කරුණාවෙන් වැඩි බුදුන් දැක කැලණි වඩිනාලෙස පළමු දවස කළ ආරාධනාවක් මෙනෙහිකොට වෙසඟ මැදි පොහෝදවස් අසූ මහ සව්වන් වහන්සේ ඇතුළුවූ පන්සියයක් රහතුන් වහන්සේ පිරිවරාගෙන ලංකාද්වීපයෙහි කැලණිගඟ මණිනයන එණිපතිහුගේ උරගපුරයට වැඩ ඔහු විසින් මවනලද සත්රුවන් මණ්ඩපයෙහි සර්වරත්නයෙන් නිර්මිත කළාවූ බුද්ධාසනාරූඪව සපිරිවරින් කල්‍යාණි චෛත්‍යස්ථානයෙහි වැඩහිඳ එම නාරජහු විසින් පිළිගන්වන ලද්දාවූ දිවබොජුන් වළඳා ඔහට අනුමෙවුනි බණ දෙශනාකොට ඒ මණිඅක්ඛික නම් නාගරාජයාගේ ආරාධනාවෙන් එම කැලණිගඟ යට ඔහු පුදනු පිණිස ශ්‍රීපාදයක් ඔබා නේසුවහස්

නයින් තිසරණ ගන්වා කුශල වර්ධනය කරවමින් වැඩහුන් කල්හි එපවත් ඇසූ සුමන ගිරිශිඛර මස්තක සුරවිමනෙහි වසන මහ සමන් දෙව්රජතෙම තමාගේ සපිරිවර සුරනිකරය හා සමග පූජාභාණ්ඩ සරහාගෙන කල්‍යාණි චෛත්‍යස්ථානයට අවුත් බුදුන් දැක භෙරිතූර්‍ය්‍යභාණ්ඩයෙන් හා අපරිමිත දිව්‍යමය ගන්ධ මාලා දීප ධූපාදීන් පූජාකොට පසඟ පිහිටුවා වැඳ සමනතකූට පර්වතයට වැඩමකරන ලෙස නා සෙනඟ මැදසිට බුදුන්ට ආරාධනාකරන්නාහු:

"නගාධිරාජෙ සුමනාභිධානෙ -වසං සුමෙධො සුමනාභිධානො,
දෙවො තදාගම්ම සපාරිසජ්ජො-කල්‍යාණියං තත්‍ථ ජිනෙහි සද්ධිං.

දත්වා පවග්ගස්ස නිදානදානං-සුත්වාන ධම්මං සුතිසීතිභූතං,
පහට්ඨචිත්තො උපගම්ම බුද්ධං-නත්වාන එවං කතපඤ්ජලීකො.

න වෙ ජිනානං නපි මානුසානං-නානිමිසානං න පිතාමහානං,
හිතත්‍ථමෙවාඛිලලොකනාථා-ජායන්තිලොකෙ කරුණාගුණග්ගා.

අනොඝාගධා නූන මයම්පි තුය්හං-දයාය තස්මා ජිනං විමෙසං,
කරොහි මය්හං භවනම්පි ධීර-පාදංසුනා නිච්ච පවිත්තරූපං.

යො යත්‍ථගො දිස්සති මෙ පුරත්‍ථ-භූමණ්ඩහා මොළිසිරිං වහන්තො
සමන්තකූටො'ති සමන්තචක්ඛු-ජානාති ලොකො වසතිං මමෙතං.

යො නීලනානාවනරාජිරාජිතො-ආසාරධාරාගිරිනිජ්ඣරාකුලො,
ආපීතනීලාරුණපල්ලවාවලී-ජීමූතකූටො විය භාති උග්ගතො"

යනාදීන් සමනතකූටපර්වතයෙහි වසන්නාවූ සුමනදිව්‍යරජ තෙම දෙහොත් මුදුන් දිදී බුදුන්ට අභිමුඛව සිට කියනුයේ: සකල ලොක ස්වාමිවූ බුදුරජාණන් වහන්ස ඔබවහන්සේ දීපංකර පාදමූලයෙහිදී විවරණ ලත් තැන් පටන් දුගීවූ සංසාරයට වැද අප්‍රමාණවූ කාලයක් මුළුල්ලෙහි වෙහෙස විඳ ඇවිද සමතිස් පෙරුම් පිරූයේ සත්වකාරුණ්‍යවෙන්මය, ඒ කාරුණ්‍යවෙන් ජනිතවූ ඉෂ්ටවිපාක විඳිනා දිව්‍ය බ්‍රහ්ම අසුර නර නාග සුපර්ණ යක්ෂ රාක්ෂස සිද්ධ විද්‍යාධරාදීවූ සියලු සත්වයන් කෙරෙහි මමත් ඇතුළත්මි, එසේහෙයින් මා කෙරෙහි අනුග්‍රහකොට සමස්තශ්‍රීන් සොභමානව අත්‍යුච්චවූ නීලපර්ණ පල්ලවාංකුර ඉන්ද්‍රචාපයෙන් සජ්ජිතව මාරුත ප්‍රහරණයෙන් ප්‍රචලිතවූ ප්‍රසූන ස්තබක විද්‍යුල්ලතා කලාපයෙන් සොභමානව සමීරණ නාද මෙඝරණ ගර්ජිතවූ සුවිසද ප්‍රචුරනිර්ඣර ආසාරධාරාසම්පාත උද්ගත මෙචක මෙඝ කූටයක් මෙන්ද තෙල පෙනෙන සමනතකූටපර්වතාරණ්‍යයෙහි මනොඥ ප්‍රසූන මකරන්ද අඞ්ගරාග නවරා කොල හිස සුපිෂ්පිත කුසුම් හිස්වෙළු බඳිමින් සුපුල් මල්කැන් කැකුළු පල්ලව අඞ්කුර දීන් විචිත්‍රවූ ගුම්බාම්බර හැඳ මධුපානොන්මත්තවූ බිඟුවැළ නාමැති නත් බැඳි මණි මුක්තා ලතා වීණා වෙලෙප් නාමැති ජන්තුයෙහි

බහා හෘඞගනාද නැමැති ගායනා කෙරෙමින් මුඛර පරභෘතාදි නානා වෘතානාන්විත විහගස්වර නැමැති ගීතිකා කිය කියා මාරුතාචාර්‍ය්‍යයාගේ නියොගලෙසම ශාඛා නැමැති හස්තොද්ගත කොට පල්ලව නැමැති රතතුල්තල ලෙලවමින් සිටි සිටි තැනම සිට බුදුන් වැඩියයි යනු අසා පූජා නෘත්‍යය පිණිස නිරන්තරයෙන් රඟදෙන්නාක් වැනිවූ විටප නාටක සමූහයාගෙන් ගැවසීගත්තාවූ මිණිමුතු දිමුතු මල්සැති සහිත යොහොඹු වැකොඳ සෙව්වන්දි සීනිදි බොලිදි තමළු ලිය ලාඞගලි නාගවල්ලි ඔලිඳ වස්සිකා කොසාතකී පිප්ඵලී ගුඤ්ජාගලොචිකා කාරවල්ලී යසියනාදීවූ නොයෙක් ලිය ජාතියෙන් වළඳනාලද සුපුෂ්පිත මන්ද මාරුත ලලිත අතුපතර ඇති අශ්වත්ථ කපිත්ථ වට කවිඨ අම්බ, ටක අරිඨ හරීටක කණ්ටකී විභීතක කුටජ පාටලී මධූක මහීරුහ ශ්‍රෙණීන් හා සහකාර කෙසර පුණ්ඩරීක තින්දුක තිලක නක්තමාල ආමලක ඛදිර කරඤ්ජක වකුල අශොක ශාඛාහරිත පුෂ්ප මකරන්ද ඵල පල්ලවාදීන් ධරා බුද්ධ පූජාවට පෙරමග බලා සිටියාක් වැනිවූ නොයෙක් පාදප පන්තීන් හා කරෙරි චතුරඞ්ගුල ඉන්දීවර ජම්බු ජම්බීරසන්තිර බදර සින්දුවාර බන්ධුජීව බජ්ජුර යඥඞ්ග පාරිභද්දක කමුක චූත ශෙවතපණ්ණි කදම්බ නිපාහිනී අර්ජුන මුචලින්ද සිම්බලී මදන චම්පෙය්‍ය පුචිමන්ද කණිකාර සිරීස ආදීවූ ශාඛා මණ්ඩල මණ්ඩිත වෘක්ෂ සමූහයෝ බුඩපූජා පිණිස අපමණ කුසුම ස්තබකයන් උචහනයකොටගෙන බුදුන් වඩනා පෙරමග බලා සිටින්නාක්මෙන් සැදී සිටිනාහ.

එම රමණීය රුකන් යට දෙපස නැතිතලා වැලිතලා රැළදිදී තෙම තෙමා හැලිගසා පැන නැගෙන ගඟුල්හැළි තිවි තික්මුණු තැන්හි පාඨීන මංගුර සිඟු රොහිත මුජ පාවුස සතවංක සවංක තළම්භ කුළීර කුම් දඬුරාදිවූ මච්ඡ ගුම්බ සඤ්ජානා කන්දර පදර නිර්ඣරාදියෙන් හා පද්මොත්පල පුණ්ඩරීකාදීවූ පුෂ්පකානන සුපුෂ්පිත ජාතස්සර වාපි සොබ්භ පුෂ්කරණී ආදීවූ තන්හි සිසිර නීර ක්‍රීඩාකොට පානය කිරීමෙන් සගොචර ග්‍රහණයකොට වෘක්ෂච්ඡායා වැලිතලා ක්‍රීඩාමණ්ඩලාදියෙහි අභිප්‍රායානුකූල ලෙස වාසයකරන්නාවූ හරිණගණ සහිත අභවෙහෙල කැල හා තෙසුත් සකාලත්‍ර පුත්‍ර ගජ ගවර පුණ්ඩරීක ශාර්දූල ගවකණී සූකර අච්ඡ තරච්ඡ රොහිත පසද රුරු සරභ ප්ලවඞ්ගම කාළක නකුල සසාදිවූ චතුෂ්පද ජාතීන් හා කීර මයූර බර්බර චකොර කුරර කපිඤ්ජර පාරාපත පරභෘත ධූම්‍යාට අරිඨ උලූක කුක්කුභ තිත්තිභ සාරස බලාක කාදම්බ සකුන්ත කුනත්තී තිත්තිර සාලික චක්‍රකුක්කුටා දීවූ විහගගණා නුචරිත අමිතවත සිරින් ගැවසීගත් දිග පුළුල තුන් තුන් යොදුන් සමන්ගිරි අරණෙහි වනදෙවියන්ගේ ක්‍රීඩා නෘත්‍ය මණ්ඩලයක් එකාලොක කාරණ පිණිස

නැඟූ සුවඳ තෙල් වතල ප්‍රදීප ඇඟෑමෙන් බබලන සුපුෂ්පිත සපුතුරුපෙළින් හා ගිරිකූට මෙඝකූටයයි දැක සඳැස්පිල්කැල විදහා නෘත්‍යයට පටන්ගත් මයූර සමූහයක් මෙන් සුපුෂ්පිත ගිරිනිල්වැල් වැලඳි ඝන නීලමලින් ගැවසීගත් මහත් කසගොළු පන්තීන් හා අපමණ තාරකා සමූහයෙන් බබලන ශරත්නභොමණ්ඩල වැනිවූ මිණිමුතු නාගපාදප පන්තීන් හා වනහිස පතිත උල්කාපාත සමූහ කොල හිස තුරු වෙලෙප්හි පැකිළ හිතනව විසිර ශාඛාතුර ලග්නව ලඹ දෙන්නාක්මෙන් මිණි දූදිරිමල් කැන් ලෙලෙන විසිතුරු ඇසළ තුරු පෙළින් හා ත්‍රිමදගලිත හස්තීන්ගේ අන්‍යොන්‍ය යුඬයෙහි දන්තඝට්ටනයෙන් උද්ගත විස්ඵුලිඞ්ග කදම්බය තුරුහිස රැඳුනාක්මෙන් සුපුෂ්පිත පාටලී වෘක්ෂප න්තීන් හා පහළ විදුලිය බිඳුයෙන් ගැවසීගිය නිල් මහමේකුළු මෙන් මලින් ගැවසීගත් දෙඹ කිණ සාලවිටප පන්තීන් හා බිනුදූල් දුම්සළා පැන තැගි ලැව්ගිනි තලප්මෙන් මලින් ගැවසීගත් සෑල පාලි හඳු වනමහිරුහපෙළින් හා තුරුපියන් සා අතින් ගෙන සමුවරද පුෂ්පයට දිගුසාළ සුපිපි මල් අතුල් ඇති ලාඞ්ගලීලිය වැලඳි මුහුළු පාදප පන්තීන් හා පවතින් වගල මල්පෙති මුවරද ප්‍රවාහ රජ්ජු සහාඩව ස්වභාව සඤ්ජාත මාණික්‍ය ඛානන් සහිත රුවන් පොරොඳු බහමින් ගිරිසිඛර මුදුනෙන් වැහෙන කිරිදහර වැනි ගඟුල් හැලි කන් සවරි ලෙළන එගිරිමුදුන රඟදෙන නිල්ගල කැලන් හිවි සුනිල් බල කොටු සරහමින් සමන් ගිරිරජහු පිරිවර කළ ගජසෙනගක් වැනිවූ උදයගිරිකුළු සමූහයෙන් හා ඝාණේරුකා හිඹකා සහ පාවූල තලා පිටිවල බැස ගුගුරමින් කෙළයන ත්‍රිමදගල ගජරළින් දැක නභොමණ්ඩලයෙන් භූමියට බැස ගමන්ගත් මෙඝකූට සමූහයකැයි බලා සිටිනා වල වැසි සුගුන් සහිත මුග්ධ විග්ධ වැදි දූලඳුන් ගෙන් හා පද්මරාග මාණික්‍ය ඛානතීන් රත්වූ සඳල වන ලැහැප් ළපලුයයි බුදිත අදහසින් ගොස් එතැන්හි මිහිමඩල බලා සහලගුරුයයි දදින් තැතිගෙන වෙන ළපලු තොල නොදී දිවෙමින් වෙහෙස පිඳිනා මුවරළුන්ගෙන් හා තිරන්තරයෙන් පවත්වනලද දිව්‍යමයවූ ආතතය විතතය ආතතවිතතය ඝනය සුසිරය යන පඤ්චාඞ්ගික තූර්‍ය්‍යභාණ්ඩයන් එකපැහැර අනෙව උපදවනලද වාද්‍යපද භෙදයන් නොවරදවා නෘත්‍යයන් දක්වමින් ඊට සුදුසු ගීතිකා ගායනාවෙන් දිව්‍ය සමූහයා සතුටු කරවමින් දිව්‍යක්‍රීඩාවෙහි නියුක්ත දෙව දෙවඟනන්ට වාසස්ථානවූ රන් රිදී මාණිමය වෘක්ෂ පර්වතාදි විමාන මාලාවෙන් විසිතුරුවූ බුඬපූජොත්සවයට සුදුසුවූ මයූර ග්‍රීවයක් මෙන් නෙල පෙනෙන වන මධ්‍යයෙහි පිහිටියාවූ ගිරිකුළින් පැනනැඟෙන රළරැළින් විසිතුරුව දිගන හුණු ගංගා

සමූහ නැමති සොණ්ඩ පන්තීන් දිගුකොට උත්තුඞ්ග වෘත්ත ගිරි කූට නැමැති කුම්භස්ථල වලින් හා අනෙකප්‍රකාර පාරොහ නැමැති දළසමූහයෙන් විරාජිතවූ නිර්ඣර නැමැති මදජලධාරා වගලගිරිපයන් නැමැති කපොලාදීන් සොභමානවූ හිමපාත නැමැති ශ්වෙතවර්ණයෙන් සර්වාඞ්ගධවලවූ ඓරාවත හස්තිරාජය කු මෙන් තෙල පෙනෙන සමන්තකූට පර්වත මස්තකයෙහි ඔබවහන්සේගේ මේ මෘදු කොමළ ශ්‍රීපාදය ඔබා පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි සකල ලොක වාසීවූ සත්ව යන්ට අභිවෘද්ධි වර්ධනය කළ මැනවැයි ආරාධනා කෙළේය. **එසේ හෙයින් දක්වන ලදමැයි.**

" පාරොහදන්තොචිතකූටකුම්භො
අනෙකසොණ්ඩිකබ්භසවන්තිහත්ථො,
යො නිජ්ඣරාසාරමදප්පවාහො
ගජොරිවාභාති සුරාධිපස්ස.

එවං විධො විපිනරාජිවිරාජිතෙහි
කූටෙහි නෙකසුරසුන්දරි මණ්ඩිතෙහි,
අත්‍යුච්චනීලසිඛිගීවසමානවණ්ණො
එසො සමන්තගිරි මෙ වසතී මුනින්ද.

එවං පතිතමතසො සුමනාභිධානො
වත්වාන තත්ථ මසමංගමනෙපයන්තං,
කාසාථ සොපි මුනි තස්ස වචං පටිච්ච
සබ්භික්ඛුතිකබ්මි ජිනොගගනායනම්හි. "

යනාදීන් සකල ලොකහිත විධායක විපදෙන්තමයාණන් වහන්සේ සුමන නම් දිව්‍යරාජයාණන් කළාවූ ආරාධනා පිළිගෙන අසූ මහසව්වන් වහන්සේ ඇතුළුවූ පන්සියයක් රහතුන් වහන්සේ පිරිවරා කැළණිපුරයෙහි සිට බ්‍රහ්මසේනාව පිරිවැරූ සහම්පතී නම් මහාබ්‍රහ්මරාජයාසේ අහසට පැනනැඟී නික්මුණු කල්හි සමන් දෙව්රජතෙම නානාරාග ප්‍රභා භාසුර උත්තර සාටකයක් එකාංශකොට බහා සාභිසෙකාභිරාම නිර්ජරාභරණයෙන් සැරහී දිගුපුළුල් සෙල් දිවදුහුල් ඇඳ ඉන්ද්‍රචාප විද්‍යුල්ලතාලිඞ්ගිත වාරි ධාරාග්‍ර සම්පාත මෙචක මෙඝකූටයක් මෙන් සර්වඥයන් වහන්සේගේ දක්ෂිණ ශ්‍රීහස්තය දෙසාවෙහි සිට පරමාදර දක්වා නම්තව අතංදෙමින් නික්මුණු කල්හි ඔහට ඉදිරියෙහි විවිධ පදභෙදවාද්‍ය උපදවා දිව්‍යමය භෙරිමණ්ඩල මධ්‍යයෙහි සිට ෂඩ්විධ පාද සුසැට හස්ත අෂ්ට නයන පඤ්ච ශිර්ෂාදිවූ ලක්ෂණාන්විත නව නාට්‍ය රසොපෙත ලීලා දක්වමින් රඟමඬුලු බැඳ අනෙකවිධ නෘත්‍යාඞ්ග දක්ව දක්වා සිය දහස් ගණන් දෙව දෙව සත්‍රීහු පිරිවරා නික්මුණාහ. එසේම පඤ්චාඞ්ගික තූර්‍ය්‍යභාණ්ඩයන් එකවිට අනෙව දෙරණතල උපුල්

වන්නාක්මෙන් මහත් ඝොෂා පවත්වා සර්වාභරණයෙන් සජ්ජිත දිව්‍යභට සියදහස්ගණන් පිරිවරා ඔවුනොවුන් පරයා නික්මෙති එසේම ඡත්‍ර චාමර ධජ පතාක පිල් කලප් තාලවෘන්ත විසිරි පත් රන්රිදී ඝට පූර්ණකුම්භ මල් කලස් මල්මාලා රන්රිදී ලියවැට ආදීවූ පූජාභාණ්ඩ ගෙන සියදහස්ගණන් දිව්‍යප්සරාවන් හා අමරශ්‍රෙණීහු පරිවෘතව නික්මෙති, එසේම පුෂ්පජාලක ස්තබක අසොක පල්ලව සහකාර නාග අශ්වත්ථ කිසලය නාගවල්ලි ලතා සැති විතානමෙන් අහස්කුස නිරතුරුව ඉසිමින් රන් රිදී මල් මුතුමැණික් කපුරු වර්ෂා වස්වමින් ශක්‍ර බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වර යක්ෂ රාක්ෂස සිද්ධ විද්‍යාධරාදීහු ස්වකීය මහ සෙනග පිරිවරා රැස්වසිට දිව්‍යාභරණ දිවඹටුනු උත්තරසාටක ආදිවූ ප්‍රමාණාතික්‍රාන්ත අනර්ඝ වස්තුන් පූජා පිණිස ඉසිමින් රන්ගිරිමුදුනෙන් දිවන බලාකාවලීන් මෙන් අපමණ දිවසළු හිසනටවමින් අසුරුසන් දෙමින් හස්තපොථන ශබ්දපවත්වමින් ඔල්වරහඬ ගසමින් සාධු ක්‍රීඩාවෙන් මහත්වූ ගීතිකා ධ්වනි පවත්වා දසදිගුන් පුරමින් මෙරුයුගන්ධර මහාසාගර තීර ප්‍රාන්තව සමන්කුළද්වීබලා නික්මෙන්නාක්මෙන් සර්වඥ ප්‍රමුඛ ශ්‍රාවක සහිත දිව්‍යසෙනාව අහසින් නික්මුණු කල්හි,

"ගච්ඡන්තෙ ගගනායතෙන සුගතෙ හානුසි සන්තො තදා,
වාරෙසුං සුරියාතපඤ්ච ජලදා සිංචිංසු භූම්‍යා ජලං,
මන්‍දමන්‍දසුගන්ධමුඩපවනා පාපෙන්ති සීතං සුඛං,
දෙවාදී ධජඡත්තචාමරකරා පූජෙන්ති මානෙන්ති ච."

යනාදීන් දිව සෙනඟ පිරිවරා සමස්ත සත්ව හිතොපදෙශක ලොකනාථ ද්විපදොත්තමයාණන් වහන්සේ ගගනායනොද්ගතව වඩනාකල්හි සූය‍ර්‍යමණ්ඩලය තෙම චණ්ඩප්‍රභා සමූහය චන්ද්‍රකාන්ති මෙන් මෘදුකොට තෙමේ ආතප නිවාරණය පිණිස මස්තකයෙහි දුන් ධවලාතපත්‍රයක් මෙන් අහස සිටගත. එසඳ මෙඝපටල ගගන මස්තකොද්ගතව පුෂ්පාසනයෙක ජලසිඤ්චනය කරන්නාක්මෙක් මඳින් මඳින් පුෂ්කර බින්දු වර්ෂා සාරන්ට වන. නොයෙක් දෙසින් සුවඳින් මන්දමාරුත හමා බසිමින් මුළුලොව එක් සුවඳපිඩක්මෙන් සිහිල්කරවන්ටවන. මෙසේ සමස්ත භුවන ගර්භයෙහි අනෙකාද්භූත ප්‍රාදුර්භූත කෙරෙමින් දෙවියන් විසින් පවත්වනලද අප්‍රමාණ පූජොත්සව විඳිමින් නීල පීත ලොහිතාවදත මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වරයයි කියනලද සවණක් ඝන බුද්ධරශ්මි මාලාවෙන් මුළුලොව පුරමින් සමන්තකූට මස්තකයට පැමිණි පූගතොරස සහස්‍ර කිරණ පරිවෘත සුගත බාලාකීමණ්ඩලය සමන්තකූට උදයගිරි මස්තකයට පැමිණ අපර සාගරාන්තමාගීය නිරීක්ෂණය කලාක්මෙන් පන්සියයක් භික්ෂූන් වහන්සේ පිරිවරා අපරදිග් බලා වැඩසිට මහාසුමන දිව්‍යරාජොත්තමයාගේ

ආරාධනාවෙන් අටතුරාසියක් මඞ්ගල ලක්ෂණයෙන් විරාජමානවූ තුනගුල් අඩු වඩු දෙරියන් පමණ අයම් ඇති මෘදු අරුණතර වර්ණ වාම ශ්‍රීපාදය සමන්තකූට මස්තකයෙහි සලක්ෂණ කොට පිහිටුවූ සේක. **එසේ හෙයින් දක්වනලදමැයි–**

තස්මිං සමන්තනගමුද්ධනි ලොකනාථො
ඡබ්බණ්ණරංසිනිකරං දිසි පත්ථරන්තො,
භික්ඛූහි සො පරිවුතො පරසාගරන්තං
ඔලොකයං ඨිතිමකාසි අනොමවණ්ණො.

ලංකාවධූ සුමනකූට කිරීටකූටං
සජ්ජෙසි තඞ්ඝජිතරාජමණී වහන්ති,
ඉච්ඡත්ථදං සිවදමප්පටිමං තිලොකො
නංදන්ති හො භජථ සෙවථ සබ්බකාලං.”

යනාදීන් මහාසුමන දෙව්රජහු ආදීවූ ප්‍රමාණාතික්‍රාන්ත කාමලොක නානිමිස නා විතාදීවූ සකල ලොකයා මනාලෙස සන්තොෂ කරවා ත්‍රිවිධරත්නයෙන් සම්පූර්ණවූ ශ්‍රීලඞ්කාද්වීප භාණ්ඩාගාරය තමන්වහන්සේට හිමිබවට ලැබූ ලාඤ්ඡනයක්සේ ශ්‍රීපාදය එබූ සේක. එසඳ සමන්තකූට පර්වත රාජයා පාදලාඤ්ඡනාභිෂෙකය පැලඳි මඞ්ගල්‍යයෙහි ෂඩ්වර්ණ බුද්ධරශ්මි නමැති නානා වර්ණ සළු විදහැඳ දිවසුවඳ මල්වශී නමැති අඞ්ගරාග තවරා දිව්‍ය රත්න ධාරා ධරනැමැති ආභරණ පැළඳ අකාලසුපුෂ්පිත කුසුම් නැමැති මල්දම් පැලඳ සමුද්‍ර ඝොෂා නැමැති පසඟ තුරුව යමින් භෘඞ්ගනාද නැමති ලයාන්විත ගායනාකොට මේඝ නාද නැමැති අත්පොළසන් දිදී මහීනාද නැමැති ඔල්වරහඬ ගසමින් එකහෙළා බහු පිරිවරා සිටි සේනාවක් වැනිවූ පර්වත වෘක්ෂ ගංගා නිර්ඣර සරසි වාහිනී මහී සමුද්‍ර ගගනාදීහු කුල් මතින් අකාල මේඝනැමැති ජලධාරා ඉස ඉස තෙමි තෙමී ක්‍රීඩා නෘත්‍යයට පටන්ගත්හ. එසඳ සර්වඥයන් වහන්සේ මහසඟ පිරිස් පිරිවරා ඒ ස්ථානයෙන් නික්ම ඒ සමන්තකූට පර්වත පාර්ශ්වයෙහි **භගවාලෙන** දිවාවිහාරකොට වැඩහිඳ එතැන්හිඳු පාරිභොගික චෛත්‍යයකොට එතතින් නික්ම **රුහුණු** ජනපදයට වැඩ **දීඝනඛ** චෛත්‍යය පිහිටන්නාවූ ස්ථානයෙහි සපිරිවරින් සමාපත්තියට සමවැද මොහොතක්කල් වැඩහුන්සේක එසේ හෙයින් දක්වනලදමැයි **සමන්තකූට වර්ණනාහි–**

දිවාවිහාරං භගවා සසංඝො–කත්වාන තස්මිං පන කඤ්චිකාලං
මහීයමානෙසු සදෙව කෙසු–තතො ගතො රොහණමණ්ඩලං සො.

තස්මිං සසංඝො මුනි දීඝවාපියං
ථූපස්ස ඨානෙ පරමාය භූමියා,
ගරුං කරොන්තො පන තං මහීතලං
නිරොධභාවෙන නිසීදි සත්ථුජො.”

යනාදීන් දීඝවාපී ස්ථානයෙහි පන්සියයක් රහතුන්වහන්සේ පිරිවරා මුහුර්තයක්කල් සමාපත්තියට සමවැද වැඩහිඳ ගරුඬසෙනාව පිරිවැරූ ගුරුළු රාජයක්හුසේ ස මීරණ පථොද්ගතව **අනුරාධපුර** නුවරට වැඩ **මහාමේඝවනොද්‍යානයෙහි** මැද **ශ්‍රීමහාබෝධීන්** වහන්සේ පිහිටන්නාවූ ස්ථානයෙහිද **රත්නමාලි චෛත්‍යය** පිහිටන්නාවූ ස්ථානයෙහිද **ථූපාරාම චෛත්‍යය** පිහිටන්නාවූ ස්ථානයෙහිද අසූමහ සව්වන්වහන්සේ ආදීවූ පන්සියයක් රහතුන් පිරිවරා සමාපත්තියට සමවැද මොහොතක් මොහොතක් කල්වැඩහිඳ සමාපත්තීන් නැගී එතන්හි රැස්වූ අප්‍රමාණ දිව්‍යසමූහයාට ධර්මදෙශනාකොට සතරමග සතරඵලයට පමුණුවා ජනාව බොධනයකොට, එතනින් නික්ම **ලෝවාමහපාය** පිහිටන්නාවූ ස්ථානයෙහිද, **ලහබත්ගෙය** පිහිටන්නාවූ ස්ථානයෙහිද * **ජන්තාඝර පොකුණ** පිහිටන්නාවූ ස්ථානයෙහිද **රුවන්පාය** පිහිටන්නාවූ පතන් භූමිස්ථානයෙහිද සපිරිවරින් මුහුර්තයක් මුහුර්තයක් වැඩහිඳ රැස්වූ දෙවියන්ට ධර්මදෙශනාකොට චතුරාර්‍ය්‍ය මාර්ග ඵල පදනය කෙරෙමින්. එතනින් නික්ම **මියින්තලාගල** මුදුනෙහි **මහසල සෑය** පිහිටන්නාවූ ස්ථානයෙහි පරමතර රමණීය ගුණාන්විත† චිතරාග නිසාර පරිවෘත අමිත සමෘද්ධින් වැඩ සිට සම්පප්‍රාප්ත නිර්ජර චතුර්මුඛ භොගීන්ද්‍ර විහගාධිපති විද්‍යාධර රාක්ෂස යක්ෂ සිද්ධ ගන්ධර්වාදීන් තමා වසඟකොට සද්ධර්මාමෘත පානය කරවා සංසාරවෘත්ත පථය සෘජුකොට නිර්වාණපුරයට ඒ ක්ෂණයෙහි ප්‍රවෙශ සත්පථය දක්වා ශ්‍රී ලංකාද්වීපයට ආරක්ෂා දෙමින් ජම්බුද්වීපයට වැඩිසේක. **මේ අප බුදුන් ලක්දිවට වැඩි තුන්වෙනි ගමනය.**

මෙසේ අනාථ නාථවූ ධර්ම රාජොත්තමයාණන් වහන්සේගේ ලක්දිවට වැඩි තුන්තරා ගමනයෙහිම ස්ථාන නිෂද්‍යාදි ඊර්යාපථ පරිවර්තනයෙන් කාලාතික්‍රාන්ත කල තුදුස් තැනම පාරිභොගික චෛත්‍යය නම් වෙයි එසින් **අනුරාධපුර** නුවර ප්‍රසිද්ධව පන්සියයක් රහතුන් වහන්සේ පිරිවරා වැඩහුන් සප්ත ස්ථානයෙන් ථූපාරාම භූමි ප්‍රදෙශයෙහි දක්ෂිණ අකු ධාතුන්වහන්සේ වඩා චෛත්‍යය කැරවූ පරිදි කෙසේදයත්? අප බුදුන් බුදුව වෛනෙය්‍යජන කමලාකාර ප්‍රබොධ විකර්තනයා මෙන් ලොකම්බරයෙහි ප්‍රාදුර්භූතව සුවාසූදහසක් ධර්මස්කන්ධ

* “දන්තාධර” † “රාගොරග නිකර ගිරි රහ අසුරු සඟ ධූරුස” ඇතැම්.

ප්‍රභාවයෙන් මොහාන්ධකාර දුරලා සූවිසි අසංඛ්‍යයක් සත්ත්වයන් දහම් නැවට නංවා සංසාරසාගරයෙන් එතර කෙරෙමින්, කුශල ධර්මවර්ධනයෙහි අකුශල මල අවලොකනය පිණිස ධර්මාදර්ශයද ක්ලේශව්‍යාධියට ධර්ම ඖෂධයද අනාගත සත්ත්වයන්ට තබා, කර චරණ ශරීර ස්පර්ශවූ ශාඛා පාෂාණ පලාල මාත්‍රයකුදු දැක වැඳ පිදුවන්ට අදදක්වා ස්වර්ග මොක්ෂ සම්පත් සිද්ධකොට දෙන ලෙස චිත්‍රාකෘති ස්ථාන කොට තබා සියලුම බුද්ධකෘත්‍යයන් සිද්ධකොට නිමවා අනුපාදිසෙස නිර්වාණ ධාතුයෙන් පිරිනිවන් පෑකල්හි, සතරන් කඳක් වැනිවූ බුද්ධශරීරයෙහි ඡවිමාංශ ලොහිත නහර චර්ම ආදිවූ ධාතූන් වහ්නිදෙවියා තමාගේ ආත්ම සඵලත්වය දක්වා පූජා කෙරෙමින් ගත්කල්හි, දන්තධාත්වාදී සප්ත ධාතූන් හැර අස්ථි ධාතූන් තුන් ප්‍රකාරයෙකින් වෙන්ව මුතු රැසක්මෙන් රන්දෙණ ඇතුළෙහි පිහිටි කල්හි ඒ ධාතූ වරුන් වහන්සේ පිණිස අටදිගින් රජහු අටදෙනෙක් සෙනා වාහන සන්නද්ධව අවුත් ඔවුනොවුන් හා යුද්ධයට පටන්ගත්හ. එකල්හි ඔවුන්ට ගුරුවූ ද්‍රොණ බ්‍රාහ්මණයාණන් විසින් ඒ හැම රජුන්ට අවවාද කියා යුද්ධ සංසිඳුවා ඔවුනොවුන්ගේ අභිප්‍රාය ලෙසම රන්දෙණෙහි පිහිටි සොළොස්නැළියක් පමණ ධාතූ වරුන් වහන්සේ දෙනැළිය බැගින් අට කොටසක් කොට බෙදා දුන් කල්හි, ඒ රජහු අටදෙනම මහත්වූ සන්තොෂයෙන් පූජා පවත්වමින් තම තමන්ගේ නුවරවලටම ගෙනගොස් ධාතූ පිහිටුවා චෛත්‍යයන් බැඳ පූජා කළාහුය. ධාතූබෙදීමට පසුගැසී ආවාවූ පිප්පලී නුවර මෞර්ය නුවර වාසීහු අවුත් ධාතූ නොලැබ චිතකයෙහි අඟුරු උකාගෙන ගොස් තම තමන්ගේ නුවර පිහිටුවා දාගැබ් බැඳ පූජා කළාහුය. ද්‍රොණ බ්‍රාහ්මණ තෙම ධාතූ බෙදූ මැන දුන් රන්නැළිය පිහිටුවා දාගැබ් බැඳ පූජා කෙළේය. දක්වනලදමැයි, ථූපවංශයෙහි–

"එකො ථූපො රාජගහෙ–එකො වෙසාලියා පුරෙ,
එකො කපිලවත්ථුස්මිං–එකො ච අල්ලකප්පකෙ.

එකො ච රාමගාමම්හි–එකො ච වෙඨදීපකෙ,
එකො පාවෙය්‍යකො මල්ලෙ–එකො ච කොසිනාරකෙ.

එතෙ සාරීරිකා ථූපා–ජම්බුදීපෙ පතිට්ඨිතා,
අඞ්ගාරකුම්භථූපෙහි–දස ථූපා භවන්ති තෙ.'

තවද ද්‍රොණ බ්‍රාහ්මණයාගේ හිසින් ශක්‍රයා ගත් දකුණු දළදා වහන්සේ රත්නකරඬුවකින් වඩාගෙන ශක්‍ර පුරයට ගෙන ගොස් පිහිටුවා සිළුමිණිසෑය බැඳ අද දක්වා පූජා කරන්නේය.

මෙසේ චෛත්‍යයන් පිහිටි කල්හි මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ඒ ධාතූවරුන් වහන්සේට මතුවන අන්තරාය දිවසින්

දූක ධාතු නිධානයක් කරනලෙස අජාසත් මහරජහු ගිවිස්වා ගෙන රජගම් නුවර ධාතු නොහැසී සිරිලක පිහිටන බව දැන ඒ ධාතු පමණක් තබා ඒ ඒ නුවර පිහිටි සෙසු ධාතු ගහීවලින් ඔවු නොවුන් වැඳ පුදන පමණකට ධාතු ශේෂ තබා හැම ධාතුවරුන් වහන්සේ තමන්වහන්සේගේ ආනුභාවයෙන් රැස්කොට අජාසත් මහුරජහු ලවා රජගහ නුවර ධාතු නිධානයක් කරවූසේක. එසින් මෑත භාගයෙහි අප බුදුන් පිරිනිවී දෙසිය අටළොස් හවුරුද්දක් සම්පූර්ණවූ කල්හි ජම්බුවීපයෙහි රජ පැමිණි බින්දුසාර රජුහුගේ පුත්‍රවූ ධර්මාශෝක රජතෙම රජගහනුවර මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේගේ විධානයෙන් අජාසත් රජහු නිධාන කළ ධාතු නිධානයෙන් මිඳක් එහි තබා හැම ධාතුවරුන් වහන්සේ ගෙනවුත් ජම්බුවීපයෙහි තමාගේ නමින් කැරවූ සුවාසූදහසක් විහාරවල පිහිටුවා සුවාසූදහසක් දාගැබ් බැඳවූයේය. මේ ධර්මාශෝක නරපතිහු කැරවූ සුවාසූදහසක් චෛත්‍යයන්ගේ උත්පත්ති කථාවය.

තවද ශ්‍රී ලංකාද්වීපයෙහි ශාසන ප්‍රතිෂ්ඨා කළාවූ මිහිඳු සුග තොරශෝත්තමයාණන් වහන්සේ හිල්මස දෙපෝදවස් මහාසංඝයා වහන්සේ පිරිවරා සෑගිරි වෙහෙරින් නික්ම අනුරාධපුරයට අවුත් දෙවනපෑතිස්ස මහරජහුගේ ආරාධනායෙන් ඔහුගේ රාජ භවන යෙහිදීම වළඳා ඕහට අනමෙවුති ධම්මදෙශනාකොට ඉක් බිති රජහට කියනසේක්: මහරජ අප බුදුන් නුදුටුවේ බොහෝ කල, එසේහෙයින් දඹදිවට ගොස් බුදුන් දැක එම්හයි කීසේක. එබසට මහරජ කියනුයේ: ඇයි ස්වාමීනී ලොවුතුරා සර්වඥයන් වහන්සේ පිරිනිවන්පෑසේකැයි කියා තවින් වහන්සේම පළමු වෙන් අපටවදළසේක්වේද, දැන්ගොස් ලොවුතුරාබුදුන් කෙසේ දක්නාසේක්දැයි කිය. එබසට මිහිඳු යතිඳුන් වහන්සේ කියන සේක්: මහරජ බුදුන් පිරිනිවන් පෑවෙත් සැබව, එනකුදුවුවත් උන්වහන්සේගේ ශාරීරික ධාතූන්වහන්සේ වැඩහිඳිනාසේක. එසේ හෙයින් ධාතූන්වහන්සේ බුදුන් සජීවකාලයක් වැනිසේක එසේහෙයින් ධාතූන් දක්නා පිණිස යනබව දැන්වූම්හයි කීසේක. එබසට දෙවනපෑතිස්ස ලංකේශ්වර තෙම කියනුයේ: ධාතූන්වහන්සේ ලද්දෙම් පිම්හම් පිහිටුවා ථූපයක් බඳනෙම්වේදැයි කිය. මහරජ එසේවීනම් සුමන සාමණේරයන් සමග කථා කරවයි කීසේක. එකල්හි මහරජතෙම සුමන සාමණේරයන් වහන්සේට යාච්ඤාකොට ධාතු ගෙන එන ලෙසට ආරාධනා කෙළේය සුමන සාමණේරයන් වහන්සේද කියනසේක්: මහ රජ එසේවීනම් මහාවීථිය හාඑවැපිපියා සුදුවැල්ලෙන් තවරාධජ පතාක පූර්ණ ඝටාදීන් සජ්ජිතකොට සපිරිවරින් පෙහෙවස්සමාදන්ව සම්භාලාවචරයන් වයවමින් මඟුලැතු සර්වාලංකාරයෙන්

සරභා ඔහු මසානයෙහි චෛත්‍යච්ඡත්‍රයක් තාංවා සායණ්හ සමයෙහි මහානාග වනෝද්‍යානයට නික්මෙව, ඒ මහානාග වනෝද්‍යානයෙහිදී තෙපි ධාතු ලබන්නාහු වේදැයි කීසේක, මෙසේ මහාරජහට කියා ගිවිස්වා මහාසංඝයා වහන්සේ හා සමග **චෛත්‍යගිරි** විහාරයට ගොස් **මහෙන්ද්‍ර** ශ්‍රමණේන්ද්‍රයාණන් වහන්සේ සුමන සාමණේරයන් වහන්සේට ආමන්ත්‍රණයකොට සුමනයෙනි ජම්බුද්වීපයෙහි තොප මුත්තන්වූ **ධර්මාශෝක** මහරජහු සමීපයට ගොස් **පාත්‍ර** ධාතූන්වහන්සේ හා ශාරීරික ධාතු ඉල්වාගෙන ශක්‍රභවනයට ගොස් සක්දෙව්රජහුගෙන් **දකුණු අකු** ධාතූන් වහන්සේ හැරගෙන එවයි කීකල්හි, සුමන සාමණේරයන් වහන්සේද යහපතැයි ගිවිස අහසට පැනනැගී ගොස් **පැළලුප්** නුවර මහවාසල් දොරට බැස ඒනුවර පූර්වදිග්භාගයෙහි ශාලවෘක්ෂ මූලයෙහි නිර්මිතකළාවූ මණ්ඩපයෙහි වඩමින් ශ්‍රී ලංකාද්වීපයට ගෙනෙන බෝධීන් වහන්සේට කරන පූජාව දැක ධර්මාශෝක මහරජහු සමීපයට ගොස් තමන්වහන්සේ ගියපවත් ඔහට කියනසේක්: මහරජ තොපගේ යහලු ලංකාධිපති **දේවානම්පියතිස්ස** මහරජ බුද්ධශාසනයෙහි අතිප්‍රසන්නව ලක්දිව චෛත්‍යයක් පිහිටුවනු කැමති හෙයින් ධාතු ගෙනයනු පිණිස ආම්හයි කීසේක. එපවත් ඇසූ ධර්මාශෝක පෘථිවීශ්වරයාණන් බුදුන් පරිභෝග කළ පාත්‍ර ධාතූන්වහන්සේ ගෙන සුවඳ සුණ්ණයෙන් වත්කොට උතුම් මුතුරුසක් වැනිවූ ශාරීරික ධාතුයෙන් පුරා සධාතුකපාත්‍ර ධාතූන් වහන්සේ සුමන සාමණේරයන් වහන්සේට දුන්කල්හි උන්වහන්සේ ඒ ධාතුවරුන් වහන්සේ ගෙන ශක්‍රභවනයට ගොස් ශක්‍රදෙවේන්ද්‍රයා දැක කිමෙක්ද දිව්‍යරාජයාණෙනි අප ලංකාද්වීපයට ගමන්කාරවා තෙපි කුමක් පිණිස ප්‍රමාදවූදැයි කීසේක. එබසට ශක්‍රදෙවේන්ද්‍රතෙම කියනුයේ: කිමෙක්ද ස්වාමීනි මාගෙන් කවර ප්‍රමාදයෙක්ද? මා විසින් කළමනා කිම්දැයි කීය. එබසට සුමන සාමණේරයන් වහන්සේ කියනසේක්: දිව්‍යරාජයාණෙනි තොප අත **දකුණු දළදා** වහන්සේ හා **දක්ෂිණ අකු** ධාතූන්වහන්සේ ඇත, එයින් අකුධාතූන්වහන්සේ දුනමැනවැයි කීහ. එකල්හි ශක්‍රයාද යහපතැයි ගිවිස යොදනක් උස ඇති සිළුමිණිසෑය තමාගේ ආනුභාවයෙන් ඔසවා දකුණු අකු ධාතූන් වහන්සේ ගෙනදුන් කල්හි සුමන සාමණේරයන් වහන්සේද එහැම ධාතුවරුන් වහන්සේ ගෙන **චෛත්‍යගිරි** විහාරයට වැඩිසේක.

එකල්හි මිහිඳු යතිඳුන් වහන්සේ ප්‍රමුඛ මහාසඞ්ඝයා වහන්සේ ධර්මාශෝක මහරජහු විසින් දෙනලද්දාවූ සධාතුක පාත්‍ර ධාතූන්වහන්සේ චෛත්‍යගිරි විහාරයෙහිතබා ශක්‍රයාදුන් දකුණු අකුධාතූන් වහන්සේ ගෙන පස්වරු භාගයෙහිම **මහානාගවන**

යට වැඩීසේක. එකල්හි සුමන සාමණේරයන් වහන්සේ කීලෙ සම මහත්වූ උත්සවයෙන් ගොස් එතැන්හි සිටියාවූ දෙවනපෑතිස්ස මහරජහු දක දකුණු අකුධාතුන් වහන්සේ දක්වූසේක. එකල්හි මහරජ සිතනුයේ: එකාන්තයෙන්ම මූන්වහන්සේ බුදුන්ගේ ශාරීරික ධාතු වීනම් මේ ධවලච්ඡත්‍රය ඒ දසාවට නම්නව මංගල මාතංගතෙම ස්වකීය ජාණුව භූමියෙහි පිහිටුවාවා, ධාතුකරඬුවමාගේ මස්තකයෙහි පිහිටාවයිසිතූය. එකල්හි ඔහු සිතූසිතහා සමගධවලච්ඡත්‍රයදධාතුදසාවටනම්නවීය, මංගල දන්තාවලයාද ජාණුවෙන් භූමියෙහි පිහිටියේය. ධාතුකරඬුවද දෙවනපෑතිස්ස නරඉසුරාණන්ගේ මස්තකයෙහි පිහිටියේය. එපවත්දුටු ලංකාධිපති තෙම අමෘතාභිෂික්ත ගාත්‍රයෙන් යුක්තයක්හු මෙන් මහත් සන්තොෂයට පැමිණ ධාතු කරඬුව ඉභ කුම්භ මස්තකයෙහි තුබුයේය එකල්හි සරාජසෙනා සහිත සුරාසුර හිරණ්‍ය ගර්ගන්ධර්වාදීහු මහත් කොට සාධුකාර දුන්හ. එසඳ පොකුරු වැසි මල්වැසි සුවඳ සුණු වැසි වසින්ටවන, දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝන කඩ බොල් මහපොළොව සාධුනාද ගර්ජනාකොට පැතතැංගේය. එසඳ ගජ රජ අනෙක තාලාවචර උදාරතරපූජා විඳින් විඳිමින් පශ්චිම දිශාභිමුඛව පසු පස්සෙන් බසිමින් නැගෙනහිරි වාසලට පැමිණ ඒ වහසල් දෙරටුවෙන් ඇතුලුනුව රට වැද සියලු පුරවාසීන් විසින් ගන්ධමාලා දීප ධූප පූජාවෙන් සාධුනාද පවත්වන්ට වන්කල්හි, දකුණු වහසලින් නික්ම ථූපාරාම දගැබ පිහිටුවන තැන පශ්චිම දික්හි **ප්‍රමොදවස්තු** නම්වූ බොධිස්ථානයෙහි ථූපාරාමය පිහිටන තැනට මුහුණලා ධාතුන් වහන්සේ බාගත නොදෙමින් සිටියේය.

ඒ ථූපාරාම භූමියද පළමු වෙමකප බුදුවූ තුන් බුදුන්ගෙන් **කකුසඳ** ජිනොත්තමයාණන් වහන්සේගේ ධම්කරධාතුවද, **කොණාගමන** ධර්මරාජොත්තමයාණන්වහන්සේගේ **පටී** ධාතුවද, **කාශ්‍යප** සර්වඥයන්වහන්සේගේ **ජලසාටිකා** ධාතුවදැයි යන මේ ත්‍රිවිධ ධාතූන්ම පිහිටියාවූ **ස්ථානය** වන්නේය. එසේ හෙයින් ඒ ඒ බුද්ධොත්පාද ඇවෑමෙන් යම්සේ මල මූත්‍ර කුණපාදීන් ඒ ස්ථානය අපවිත්‍ර නොවනු පිණිස කණ්ටක ගච්ඡ ගුල්මාදීන් ගහණව සිටින්නේය. එදවස එලෙස දුටු රාජපුරුෂයෝ ඇතු ඉදිරියෙහි තුබූ වනගුම්බය පැහැර කණුමුල්හැර හෙරිතලයක් මෙන්භූමිය සම කළාහුය. එකල්හි මිරදෙහුයාගේ අභිප්‍රාය දැන දිය සිඳී වලල් පැලීගිය අභයවාපියෙන් මැටිකැට ගෙන්වා පුහු පුහුව ඉභකුම්භ ප්‍රමාණ මැටිගොඩක් කොට තබා නැවත දගැබබඳනා ලෙස උළු ගස්වන්ට පටන්ගත්හ. එකල්හි කුඤ්ජරෙන්ද්‍රතෙම එතැන්හි සාරනලද සුරභි කුසුම සමලංකෘත මණ්ඩපයෙහි දහවල් සිට රාත්‍රිභාගයෙහි ථූපස්ථානය වට ඇවිදිමින් සිටී මෙසේ

කීපදවසක් ගිය කල්හි දෙවානම්පියතිස්ස වසුධාධිපතිතෙම භූමිය තලවූ කොටම්හිඳු මාහිමියන්වහන්සේඅතින් විචාරනුයේ: ස්වාමීනි චෛත්‍යය කොබඳුකොට බැඳ විය යුතුදැයි කීහ. මහරජ ධාන්‍ය රැශියක්මෙන් සෑය බැඳවිය යුත්තේයයි කීකල්හි යහපතැයි ගිවිස ජංඝා ප්‍රමාණ උස ථූපාරම්භයකොට ධාතූන්වහන්සේ වඩනු පිණිස මහත් සත්කාර කොළේය. සකල නගරවාසීහුද ජනපදවාසීහුද ධාතු පූජා දක්නා පිණිස රැස්වූවාහුය. එකල්හි ඇත් කුඹපිට වැඩහුන් ධාතූන් වහන්සේ සකල සත්වයන් බලබලා සිටියදීම සත්තලක්පමණ අහසට පැන නැගිසේක. එකල්හි එතෙන රැස්වූවාවූ මහජනයා එම්බල තෙලෙ කිමෙක්ද දෑගැබ බඳනා තබා ගෙනා ධාතූන්වහන්සේ අහසට පැන නැගිසේක. ඒ ආශ්චර්‍ය්‍ය නොබලවූනැයි කිය කියා සිටි කල්හි ධාතූන්වහන්සේගෙන් බුඩරූපයෙක් නිර්මිතවිය. ඒ ක්‍ෂණයෙහි බලග ධාතු නොවෙයි බුදුකෙනෙකුන් වහන්සේයයි කියමින් මහත්කොට සාධුකාර දෙමින් සිටි කල්හි ධාතු ශරීරයෙන් සවර්ණක් රැස් විහිදින්වවන, එදූන හැම සත්වයන් විසින් ආශ්චර්‍ය්‍යයටපැමිණ ඉදිරු බලන කලින් මහත් ගිනිකඳෙක් පැනනංගේය, තෙලෙ බලවයි කියා මුවනොහරනාතුරු ගිනිකඳ නැගි තැනින් දියකඳෙක් නික්මිණ. මෙසේ ගණ්ඩම්බවෘක්ෂ මූලයෙහිදී බුදුන් යමකප්‍රාතිහාර්‍ය්‍ය කළාක්මෙන් විහිදුවනලද අනල ජලකඳ සමූහයෙන් ලංකාවීපය අතුරුනොහැර වසමින් ප්‍රාතිහාර්‍ය්‍යකොට ධාතූන්වහන්සේ දෙවනපෑතිස්ස මහරජාණන්ගේ හිස්මුදුනෙහි පිහිටිසේක. එසඳ භූපාලතෙම තමා ලද්දාවූ ආත්මම සඵලවියයි මාරුත සුපූරිත කදලි මෘග හස්තාවක් මෙන් සන්තොෂයෙන් සුපූරිත ගාත්‍ර ඇතිව අපමණ සත්කාරයෙන් ධාතු ප්‍රතිෂ්ඨාවකොට තිස්රියනක් උස ථූපාරාමචෛත්‍යය බැඳවූහ, ඒ ධාතු පිහිටුවන මඟුලෙහි මහරජහුගේ භාතෘ මත්තාභය නම් රජකුමාරතෙම දහසක් පුරුෂයන් හා සමග මහණවිය, මෙසේ ඇතුළුනුවරින් පිටිනුවරින් මහණවූවාහු තිස්දහසෙක්වූහ. මෙසේථූපාරාම චෛත්‍යය පිහිටුවා මහරජද රජහුගේ බිසෝවරුද අමාත්‍යවරුද නුවරවාසීහුද ජනපදවාසීහුද දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණාදීහු හැම වෙනවෙනම ආශ්චර්‍ය්‍යමත්වූ පූජා පැවැත්වූහ. දක්වනලදමැයි-

"සකධාතුසරීරකෙනාපෙවං-පරිනිබ්බාණගතොපි ලොකනාථො
ජනතාය හිතං සුඛංච සම්මා-බහුධාකාසි ජිනෙ ඨිතෙ කථාව කා"

මේ ථූපාරාමකථාවයි.

තවද ධර්මාශොක මහරජහු පාත්‍ර ධාතූන් වහනේසේ පුරඑවූ ශාරීරික ධාතූන්වහන්සේ ගෙන පිහිටුවාලංකාවීපයෙහි යොදනකට චෛත්‍යයක් බැඟින් කැරවූහ.

දක්වනලදමැයි-

“නිධාපෙත්වාන සම්බුද්ධ-ධාතුයො පත්තමත්ථකං,
කාරාපෙසි මහාරාජා-ථූපෙ යොජනයොජනෙ” යි.

**මේ යොජන ථූපකථා නම-**

තවද **රත්නමාලි චෛත්‍ය** ස්ථානයෙහි සුලිඛිතාක්ෂර වාදස රතනොත්සෙධ ශෛලස්තම්භයක් පිහිටුවා රතනමාලි චෛත්‍ය ස්ථානය නියමකොට පාත්‍ර ධාතූන්වහන්සේ ස්වකීයවූ රාජ භවනයෙහිම තබා අපමණ පූජාකළහ. මේ ථූපාරාමචෛත්‍ය කථාවය. තවද මහ මෙවුනා උයනමැද දක්ෂිණ ශාඛා බොධීන් වහන්සේ පිහිටි පරිදි කෙසේදයත්? ශ්‍රී ලංකාද්වීපයෙහි බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨා කළාවූ මිහිඳු මාහිමියන් වහන්සේ මේ ථූපාරාම ධාතු ප්‍රතිෂ්ඨාවට පළමු මහාමෙඝ වනොද්‍යාන ප්‍රතිග්‍රහණයෙන් සකල ලොකාභිවෘද්ධි වර්ධනයකොට ඒ මහමෙවුනා උයන පිළිගත් දවස් වදාළාවූ ධර්මය අසා දෙවනපෑතිස්ස මහරජාණන්ගේ මල්වූ **මහානාග** නම් යුවරජහුගේ අග බිසෝවූ **අනුලාදේවී** පන්සියයක් පුරාඞ්ගනාවන් පිරිවරා එදවස් සකෘදාගාමි මාර්ග ඵල ප්‍රාප්තව දෙවනපෑතිස්ස මහරජහට තමා මහණවනු අභිප්‍රාය ඇතිබව දැන්වූකල්හි එපවත් අසා දෙවානම් පියතිස්ස නරෙශ්වර යාණෝද මහෙන්ද්‍ර ශ්‍රමණෙන්ද්‍රයන් වහන්සේට දැන්වූහ එසඳ උන්වහන්සේ නැවත මහරජහට කියනසේක්: මාතුගමදීක්ෂාය භික්ෂූන්ට අනුදන්නා ලද්දේ නොවෙයි, **සංඝමිත්‍රා** ස්ථවිරීන් පැමිණි කල්හියයි ප්‍රතික්ෂෙප කළසේක, එබසට ස්වාමිනි උන් වහන්සේ කොතැන්හි වසනසේක්දැයි පුළුවුත්හ. මහරජ පැළලුප්නුවර අප සහෝදරිවූ සංඝමිත්‍රා නම් බහුශ්‍රැත භික්ෂුණීහොම වෙසෙයි. ගිය දවසත් බුදුවරයන් වහන්සේගේ **ශ්‍රී මහාබොධි දක්ෂිණශාඛාව** මේ සිංහලද්වීපයෙහි පිහිටියේය. එසේ හෙයින් අප බුදුන්ගේ අශ්වත්ථ බොධි දක්ෂිණශාඛාවද මේ මහමෙවුනා උයනෙහි පිහිටන ලෙස කළ අධිෂ්ඨාන ඇති සේක. තොප මිත්‍රවූ **ධර්මාශොක** මහරජහට අස්නක් යැවූයෙහි වීනම් දක්ෂිණශාඛාව හා සමග සංඝමිත්‍රා ස්ථවිරීනුත් එවන හෙයින් එදවස් ආකල මොවුන් පැවිදි කැරවිය ඇකැයි කිසේක. එපවත් අසා මහරජද යහපතැයි ගිවිස වස් ඇතුළත එක්දවසක් මිහිඳු යතිඳුන් වහන්සේගේ සමීපයෙහි සපිරිවරින් හුන් මහරජ තෙම අමාත්‍යවරුන් හා සමග කථාකොට තමාගේ බෑනවූ අරිෂ්ට නම් අමාත්‍යයාණන් කැඳවා මාගේ අදෘෂ්ට මිත්‍රවූ ධර්මාශොකනම් මගධෙශ්වරයාණන් කරා ගොස් බොධීන් වහන්සේ සමග සංඝමිත්‍රා ස්ථවිරීන් වහන්සේ වැඩමකරවා ගෙන එන ලෙස යන්ට පිළිවන්දැයි විචාළහ. එබසට අරිෂ්ට කුමාර තෙම තමා පැවිදිවෙන්නට අවසර දෙතොත් හැම පිළිවනැයි කීහ.

එබසට මහරජ කියනුයේ: මේ සියලු කාරියම නිෂ්පාදනය
කොට ගෙන අවුත් පැවදිව ගනුවයි අවසර දුන්හ. ඒ අරිෂ්ට
කුමාරතෙම යතිඳු නිරිඳුන් දෙතෙනින්ම අසුන්-ගත වප් පුර
දියවක් දවස සපිරි වරින් ජම්බුකොල පට්ටන නම් තොටට
ගොස් නැව්නැගී තෙරුන් වහන්සේගේ අධිෂ්ඨානයෙන් එම
දවස් පැළලුප් නුවරට ගොස් ධර්මාශෝක මහරජහු දැක ගෙන
ගිය අසුන් දෙමින් දෙවයන්වහන් ස ඔබ ගේ යහළුරජහුගේ මල්
භාර්යාවන් පැවිදිවනු කැමතිව වසන හෙයින් දීක්ෂා කෘත්‍යය
පිණිස වැඩමකරවන සංඝමිත්‍රා ස්ථවිරීන් වහන්සේ හා සමග
දක්ෂිණ සාඛා බෝධීන් වහන්සේත් වැඩමකරවුව මැනවයිකීහ.
රජහට මෙපවත් කියා සංඝමිත්‍රා ස්ථවිරීන් වහන්සේටද එලෙසම
දැන්වූහ. සංඝමිත්‍රා ස්ථවිරිද එපවත් අසා පියරජහු සමීපයට ගොස්
බෑණින්වහන්සේ කියා එවූලෙසම කීහ එබසට මහරජ අසනුයේ:
මැණියන් වහන්ස මහින්ද ස්ථවිරයන් වහන්සේත් මාගේ මුණු
බුරුවූ සුමන සාමනේරයන් වහන්සේත් ලංකාවීපයට වැඩි
සේක ඒ සියලු ශෝකයම නුබවහන්සේගේ මුහුණ දැක සන්
හිඳෙන්නේය, ඉදින් තමුන්වහන්සේත් වැඩපුසේක් වීනම්
කෙසේදැයි කීහ, එබසට මහරජ බෑණන් වහන්සේගේ වචනය
ලංඝනයත් කළ නොහැක්ක. අනුලා නම්වූ ක්ෂත්‍රිය කන්‍යාවන්
සහිත දහසක් ස්ත්‍රීහු මහණවන ලෙස බලා හිඳිති, එසේ හෙයින්
යායුතුයයි කීහ. එබසට ධර්මාශෝක මහරජතෙම කියනුයේ:
එසේ වීනම් මැණියන්වහන්ස බෝධීන් වහන්සේත් වැඩම
කරවා ගෙන වඩනේ යහපතැයි කී කල්හි සොඳයයි ගිවිස්සහ.
එදවස ධර්මාසොක මහරජතෙම සිතනුයේ: කල්පාන්ත වහනිය
බ්‍රහ්මාණ්ඩය දක්වාත් සකල ලෝකය භස්මකොට බෝධි ස්ථාන
යට හයක්මෙන් පසුව වහ්නි එතැන්හිවදනේය. ඒ බෝධීන්
වහන්සේ පිහිටි භූමිය මුදුනෙහි අකණිට්ඨා බ්‍රහ්මලෝකය දක්වා
දිව්‍ය බ්‍රහ්ම විමානයකුත් නොපිහිටියේය, ඒ ස්ථානයෙහි බෝධීන්
වහන්සේ නොමැතිව තිබෑදිත් චක්‍රවර්තිරජක්හු පැන නැගී
ඍද්ධිමත් හස්තිරත්නය දක්වාත් මුදුනෙන් යානොහී පර්වතයක
පැහැරසිටියාක් මෙන් එතැන්හිමසිටකාලක්‍රියා කාළේල. මෙසේ
මහානුභාව සම්පන්නවූ ශ්‍රී මහාබෝධීන්වහන්සේගේ දක්ෂිණ
ශාඛාව ඡේදනය කරණු පිණිස කවරෙක් නම් ශස්ත්‍රයක්
හෙළාද, හෙළ ශස්ත්‍රය කෙසේ නම් පැහැරගනීද, සැතකින්
නොකපා බෝධිශාඛාව කෙසේ ගමන් කරවම්දැයි සිතා අමාත්‍ය
යන් පිළිවිසි කල්හි ඔවුන් අතුරෙන් මහාඤදම නම් අමාත්‍ය
තෙම කියනුයේ: දෙවයන්වහන්ස මහාසංඝයා වහන්සේ ගෙන්

සාර්ථ සාර්ථඥ පණ්ඩිත බොහෝ භික්ෂූන්වහන්සේ ඇත උන්වහන්සේලා අතින් පිළිවිස්නේ යහපතැයිකීහ. මහරජ එපවත් අසා යහපතැයිගිවිස මහාසංඝයා වහන්සේ රාජ ගෘහ යෙහිදීම වළඳවා අනුමෙව්නි බණ අසා ඉක්බිති මේපවත් දැන්වූහ. එපවත් අසා මොග්ගලිපුත්ත තිස්ස මහාස්ථවිර යන් වහන්සේ කියනසේක්: මහරජ බුදුන් විසින් පළමුව පඤ්ච මහා අධිෂ්ඨානයක් කරනලද්දේය. හේ කෙසේදයත්? මහාබෝ ධින් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ධර්මාශෝක මහරජහු රේඛා වක් දුන්කල්හි තෙමේම මුලොච්ඡේදනව රන්කටාහයෙහි පිහිටා වයි කළාවූ අධිෂ්ඨානයද, එහි පත්‍ර ඵලයෙන් සවර්ණක්ඝන බුදු රැස් විහිදෙනා ලෙසද, දක්ෂිණ ශාඛාව අහසට පැනනැගී වලා ගැබ ඇතුළෙහිම නොපැනී සතියක් පිහිටනබවද, ථූපාරාමයෙහි දකුණු අකුධාතූන්වහන්සේ පිහිටන දවස් යමක ප්‍රාතිහාර්‍ය්‍ය කරනබවද, රුවන්වැලි මහසෑයෙහි ද්‍රෝණයක් පමණ ධාතූන් වහන්සේ පිහිටන දවස් බුඩරූපයමවා යමක ප්‍රාතිහාර්‍ය්‍යකරන බවදැයි යනමේ පඤ්ච අධිෂ්ඨානයයි කීසේක.

මහරජාණන් මේ පඤ්ච අධිෂ්ඨානයන් අසා මහත්වූ ප්‍රීතිප්‍ර මොද්‍යයෙන් පැළලුප් නුවර පටන් බෝධිමණ්ඩලය දක්වා සත් යොදුන් අතුරුමග නොයෙක් විසිතුරු බහා සරහමින් බෝධින් වහන්සේ වඩනු පිණිස රන්කටාරයක් කරවන ලෙසට රත්රන් රැස්කරවා රන්කරුවන් පිළිවිස්නා කල්හි සක්දෙව් රජහුගෙන් නියොගලත් විශ්වකර්ම දිව්‍යපුත්‍රයාණන් ස්වර්ණකාර වේෂයකින් එතැන්හි පෙනී රන්කටාරය කරවනලෙස ධර්මාශෝක මහරජහු ගෙන් නියොග ලැබ එහැම රත්රන් අතින් පිරිමැද තමාගේ ආනුභාවයෙන් වට නවරියන් උස පස්රියන් පමණවූ පුළුල තුන් රියන් දිගද එපමණක්වූ ඝනය අටඟුල් පමණවූ මෝ්විට නාබ ඇත් සොඬක් පමණවූ ප්‍රභාවයෙන් හිරුමඬලක්වැනි රන්කටා රය මවාදුන් කල්හි, ධර්මාශෝක ලොකාධිපති තෙම එම විටම බිහට මහත් සන්නාහයෙන් සත්කාරකොට ගමන්කරවා ඉක් බිතිව; සමස්ත භූෂණ භූෂිත ශ්වේතවෙල මාලාගන්ධ විලෙපනා දීන් මඞ්ගල වේෂභූෂිතව මඟුලැත් වාහනාරූඪව විශිෂ්ට මණි ඝටා කිරණ පත්‍ර කිරීට සංඝාට මස්තකාභිකානතා ශොභාවෙන් දීප්තිමත්ව එසේම මූර්ධාභිෂික්ත ක්ෂත්‍රිය සහස්‍රපරිවෘතව නිර න්තර ප්‍රභින්න මදගන්ධ ගන්ධ කුඤ්ජරාන්ධකාර රූඪ ප්‍රබල පදාති බලබහල කලකල්රව ඵරිත ඵලකායුධ භ්‍රමණොද්ගතොද්‍යාන චපල චඤ්චල තුරග නිකර මුඛර මුරජව බධිරීකෘත දිගන්තර ශ්‍රොතපථ විවරයමාණ මෘදඞ්ග මද්දල පටහ කාහල සංඛධවනි ප්‍රබොධිත උද්ධූතධූත චාමීකර චාරු චාමර සහස්‍ර විද්‍රැම රුක්ම දණ්ඩා තපත්‍ර සංඝට්ටිත ගගන සජ්ත යොජනායාම ත්‍රියොජන

විස්තාර විස්තෘතවූ චතුරඞ්ගිනී වාහිනීන් පරිවෘතව සුගතෞරස සහස්‍රසංඛ්‍යා ප්‍රමාණ සහ සුවර්ණකටාහය හා සමග මහාබෝධි මණ්ඩලයට ගොස් පැමිණියහ, එකල්හි සමග ගිය මහසෙනඟ පිට මළුයෙහි සිටුවා ගණප්‍රධාන කාරක මහාසංඝයා වහන්සේ ගෙන් දහසක් රහතුන්වහන්සේ හා අභිෂෙකප්‍රාප්ත දහසක් මහමිහිපතින් පිරිවරා ඇතුළු මළුවට වැද ශ්‍රී මහා බෝධින් වහන්සේ වටතිර ඇද පරික්ෂෙපකොට සංඝයාවහන්සේ හා මහ රජුන් පිරිවරා සාණිප්‍රාකාරාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටව දෙහොත් මුදුනෙහි තබාගෙන බෝධින්වහන්සේගේ ශාඛාමණ්ඩලය බැලූ කල්හි එසින් දක්ෂිණශාඛාව මුලින් කඳට සතරරියනක් තබා ශෙෂය අන්තර්ධානවිය. එසේ හෙයින් දක්වන ලදමැයි. **බෝධි වංශයෙහි—**

“තස්ස දක්ඛිණසාඛාය-චතුහත්ථප්පමාණකං,
ඨානං ඛන්ධං ච ඨපයිත්වා-සාඛා අන්තරධායි තං” යි.

මෙසේ ශාඛාය අන්තර්ධානවූ කල්හි සපිරි වරින් සිටි ධර්මාශොක නෘපාධිපතෙම ඒ ප්‍රාතිහාර්යය දැක මහත්වූ ආශ්චර්යයට පැමිණියේ. ජම්බුද්වීපය බෝධීන්වහන්සේට පූජාකෙළෙමියි කියා රහතුන් වහන්සේ අත දක්ෂිණොදකය වත්කළේය. එසඳ අදෘශ්‍යමානවූ දක්ෂිණශාඛාව පළමු තිබූ තැනම පිහිටිබව දැක ඒ ක්ෂණයෙහි සර්වරත්නමය පීඨයක්මැද ගෙනගිය රන්කටාරය තබා තෙමේ පූර්වදිශාභිමුඛව රන්හිණින් රත්නපීඨ මස්තකයට පැනනැගීසිට රන්තෙල්ලෙන් සිරියෙල් රෙඛාවක් දක්ෂිණශාඛාව කඳට වෙන් වන්ට උවමනා තැන හෙළා දෙහොත් මුදුනෙහි තබාගෙන සිට ධර්මාශොක මහරජතෙම කියනුයේ: ඉදින් මේ ශ්‍රී මහාබෝධීන්වහන්සේ ශ්‍රී ලංකාද්වීපයෙහි පිහිටිය යුතුසේක් වීනම්ද ඉදින් මම බුද්ධශාසනයෙහි විමතිරහිත භක්තියක් ඇත්තේවීම්නම්ද, මේ දක්ෂිණශාඛාව මූලොච්ඡින්නව මේ කනක කටාහයෙහි පිහිටාවයිකියා සත්‍යක්‍රියා කොළේය. ඒ සත්‍යක්‍රියාව හා සමග දක්ෂිණශාඛාව සිරියෙල් රෙඛාව දුන්තැන්හි වෙන්ව සුවඳකලල් පිරූ රන් කටාරය ඇතුළෙහිම පිහිටියේය. **දක්වන ලදමැයි.—**

“ලෙඛාඨානෙ මහාබොධි-ඡින්දිත්වා සයමෙව සා,
ගන්ධකද්දමපූරස්ස-කටාහස්සොපරිඨිතා” යි

මෙසේ බෝධිශාඛාව වෙන්ව සුවඳකලල් පිරූ රන්කටාරයෙහි පිහිටි කල්හි ඇඳි රෙඛාවෙන් මත්තෙහි තුනඟුල් පමණ තැන නැවතත් සිරියෙල් හිරක් ඇන්දැහ. එසඳ එතනින්ද බුබුළු දසයක් පැනනැගී මුල්දසයෙක් පිටත්විය. එසින් මත්තෙහි තුනඟුලකට රෙඛාවක් බැගින් අනිකුත් නවරාජියක් දුන්හ, එසින්ද රාජියකට මුල් දසයක් බැගින් අනූවෙක් මුල් දළු පිටත්

විය. පළමුවෙන් බට මුල් දසය සතරඟුල් පමණ දිගුවිය, තෙසු අනුවම අංකුරාකාරව සිටියේය. මේ ප්‍රාතිහාර්‍ය්‍ය සත්රුවන් පීඨයෙහි සිටියාවූ ධර්මාශෝක ලෝකෝත්තමතෙම ප්‍රත්‍යක්‍ෂයෙන් දුක උත්තමාඞ්ගයෙහි බද්ධාඤ්ජලිව මහත් ශබ්දපවත්වා සාධුකාර දුන්නේය. එකල්හි භික්‍ෂූන් වහන්සේද සාධුකාර ඝෝෂා පැවැත්වූසේක. දහසක් රත්නකිරීටධර නරවර නිකර සහිත පිරිවර මහසෙනග සාධුකාරදෙමින් උතුරුසළු හිස නටවමින් අත්පොළසන් දෙමින් ඔල්වරහඬ ගසමින් අපමණ සන්තොෂයෙන් නැටූහ. පෘථිවියෙහි පටන් අකනිෂ්ඨ බ්‍රහ්මලොකය දක්වා දිව්‍ය බ්‍රහ්මාදී හැම සත්‍වයෝම එකපැහැර සාධුකාරදී බැණ නැංගාහ. එකල්හි ධර්මාශෝක ලෝකානන්දනයාණන් ප්‍රීතින් පිරුණාවූ ශරීර ඇතිව මුදුනැදිලිබැඳ එතැන්හි සිටිකල්හි මහත්මුල් දශය සහ සියක්මුල් හාටකකටාහ ස්ඵුටවලය ජාද්‍ය නානාවිධ සුගන්ධ කර්දමයෙහි නිමග්නවිය. දක්වන ලදමැයි-

"එවං සතෙන මූලානං-තත්‍ථ සා ගන්‍ධකද්දමෙ,
පතිට්ඨාසි මහාබොධි-පසාදෙන්තී මහාජනං" යි

යනාදීන් මහාජනයා ප්‍රසන්න කරවමින් රුවන්පීඨමස්තකයෙහි පිහිටි තපනීය ද්‍රෝණියෙන් අහසට පැනනැගී සවණක් ඝන බුද්ධ රශ්මි මාලාවෙන් මුළුලොව පුරමින් සතෙරතා සහිත ජීමූත කදම්බයක් මෙන් දශීනා වසානය දක්වා අහසට පැන නැගී ගොස් ආදෘශ්‍යමානව සද්දවසක් ගගනතලයෙහි වැඩිසිටිසේක. දක්වන ලදමැයි-

* "සා කටාහා මහාබොධි-උග්ගන්ත්වාන තතො නභං,
අට්ඨාසි හිමගබ්භම්හි-සත්තාහානි අදස්සනා" යී.

මෙසේ දක්‍ෂිණ ශාඛාව අහස් කුස අදෘශ්‍යමානව සද්දවසක් සිටිනා කල්හි ධර්මාශෝක වසුධාධිපතීන්‍ද්‍ර තෙම සර්වරත්නපීඨයෙන් බැස සද්දවසක් එතැන්හිම වැස නිරන්තරයෙන් අප්‍රමාණ පූජා කොළේය සත්වැනි දවස සමස්ත සත්‍වයන්ට දෘශ්‍යමානව විගත වලාහක විප්‍රසන්න චක්‍රවාලාභ්‍යන්තරයෙහි සම්පූර්ණව ඛන්‍ධ සාඛාපසාඛා ඵල පත්‍රයෙන් ප්‍රතිමණ්ඩිතව රත්න කටාහයෙහි පිහිටියාක්මෙන් දක්වා නොයෙක් ප්‍රාතිහාර්‍ය්‍ය ප්‍රාදුර්භූත කළසේක. එයින්කීහ-

"සුබෙ නභසි දිස්සිත්‍ථ-සා කටාහෙ පතිට්ඨිතා,
මහාජනස්ස සබ්බස්ස- මහාබොධි මනොරමා"යි

---

* "සකටාහා" මහාවංස.

මෙසේ දක්ෂිණ ශාඛොත්තමයාණන් වහන්සේ ධරණීතලාවතීර්ණ නොව නිර්මල ගගනතලයෙහිම වැඩසිට අපමණවූ ප්‍රාතිහාර්‍ය්‍ය දක්වූ කල්හි, චන්ද්‍රගුප්ත රාජකුමාරයාණන් විසින් සිංහචර්මාවනද්ධ රත්නචන්දන හෙරිය ඛදිරසාර ප්‍රහරණයෙන් ධ්වනි පැවැත්වූ කල්හි, සරුජකපක්ෂීන් චිත්ත සන්තොෂාකාරවා මස්තක සාරවතීර්ණ සුරද්‍රැමයක්හුසේ භූමියට බට කල්හි හැම තමතමන් මුවනොපොහොනා ලෙස මහීතල වෙවුල්වා සාධුකාර දුන්හ. දක්වනලද මැයි–

"පවත්තමහි මහාබොධි–විවිධෙ පාටිහාරියෙ,
විම්හාපයන්තී ජනතං -පඨවීතලමොරුහි" යි

එසඳ නරෙන්ද්‍රතෙම ප්‍රාතිහාර්‍ය්‍යයෙහි ප්‍රසන්නවූ සිත් ඇත්තේ සොළොස් දෙශයකින් ප්‍රතිමණ්ඩිතවූ දඹදිව පූජා කොළෙමියි කියා අනවතප්ත අභිෂෙක ජලය වඩා සද්දවසක් එතැන්හිම වැඩසිටියදී පූජාකොළේය ධර්මාශොක මහරජහුගේ අගබිසෝවූ අසන්ධිමිත්‍රා දෙවීද සොළොස්දහසක් රාජ ප්‍රමදාවන් පිරිවරා රාජහංස ලීලා විලාස නින්දිත මාතඞ්ග ලීලාවෙන් ශ්‍රී මහා බොධීන් වහන්සේ කරා අවුත් සර්වාභරණයෙන් පූජාකළහ. ඒ ස්ථානයෙහි රැස්වූවාවූ අභිෂෙක ප්‍රාප්ත හැම නරපතිහුද රත්නකිරීට සහස්‍රාදීන් පූජාකළහ. ඉක්බිති සපිරිවර මහරජාණන් ශ්වෙත තුරග භාසුර ධවලාතපත්‍ර සමුස්සිත මඞ්ගලරථ යානාවෙහි ස්වර්ණ කටාරය සහිත බොධීන්වහන්සේ පිහිටුවා ගොඩගමන්ගත් මණී ආකාරයමෙන් මහත් පෙරහරින් සජ්ජිත රථයකින් නික්ම අවුත් පාටලි පුත්‍ර පුරප්‍රවරයට වැද පූර්ව දිශාභාගයෙහි ශාලද්‍රැම මූලයෙහි නිර්මිත කරනලද ශාලාවෙහි වඩා හිල්මස පුර පැළවිය දවස් පූජා කරන කල්හී, අප්‍රමාණ ආශ්චර්‍ය්‍ය ප්‍රාදුර්භූතවිය.

"ඉති කුසුමපුරෙ සරෙ සරංසා–බහුවිධවාරුධජාකුලා විසාලා
සුරුචිරපවරොරුබොධිපූජා–මරුනරචිත්තවිකාසිනී අහොසි"

යනාදීන් සුරනර මනනයන විකාසනය කළ කල්හි මගධෙශ්වරතෙම සංඝමිත්‍රා ස්ථවිරීන් සමීපයට ගොස් ස්වාමීනි මාගේ මෑණියන්වහන්ස තමන්වහන්සේ මේ ශ්‍රී මහාබොධීන් වහන්සේ වැඩමකරවාගෙන ශ්‍රී ලංකාද්වීපයට වැඩියමැනවැයි ආරාධනා කොට සපිරිවර මිධුමිණ්ඩ නම් උරගරාජයා හා සපිරිවර අටලොස් දිව්‍ය කුලයන්ගෙන්ද රැකවල්ලවා ක්ෂත්‍රියකුල අටක්ද බ්‍රාහ්මණ කුල අටක්ද සිටුකුල අටක්ද කුටුම්බිකකුල අටක්ද වාණිජ කුල අටක්ද ධනුග්‍රහකුල අටක්ද තරච්ඡකුල අටක්ද කාලිඞ්ග කුල අටක්ද කප්පකකුල අටක්ද බලත්කුල අටක්ද පෙසකාර

කුල අටක්ද කුම්භකාරකුල අටක්ද මාලාකාරකුල අටක්ද ගන්ධකාරකුල අටක්ද සිබ්බනකාරකුල අටක්ද සූදකකුල අටක්ද කම්කාරකුල අටක්ද ලොහකාරකුල අටක්ද සුවර්ණකාරකුල අටක්ද වඩ්ඪකීකුල අටක්ද චිත්‍රකාරකුල අටක්ද වාද්‍යකුල අටක්ද ශ්‍රතනකාරකුල අටක්ද උද්‍යානපාලකුල අටක්ද දෙමින් සූර්‍යවංශාභිජාත ධර්මාශොකයන්ගේ සහෝදර රාජකුමාරවරුන් අටදෙනකු හා සුමිත්‍රය බොධිගුප්තයයි යන ශාක්‍යකුමාරවරුන් දෙදෙනා හා මේ දශදෙනාම තමහට සමවූ ස්ථානාන්තරයෙහි පිහිටුවා බාල සුමිත්‍රා කුමාරයන්ට මේ සිසලු කුලම පාවාදී ජ්‍යෙෂ්ඨ බොධිගුප්ත කුමාරයන්ට බොධීන්වහන්සේ භාරකොට බොධිස්ථානය පිණිස රජකුමාරිකාවරුන් සතර දෙනෙකුට සුවර්ණභිංකාර අටක්ද රජතභිංකාර අටක්දැයි යන සොළොසක් දෙමින් සමඟ සලස්වා භික්ෂුණීන් එකොළොසක් හා සමග සංඝමිත්‍රා ස්ථවිරීන්ද අරිෂ්ටකුමාරයන්ද රජකුමරුවන්ද බොධීන්වහන්සේ වඩනා නැවට නංවා තෙසු කුලයන් වෙන නැව්වලට නංවා ගංගාවෙන්ම අවුත් සද්දවසකින් තාම්‍රලිප්තගම් තොටට පැමිණියහ. ධර්මාශොක මහරජද සපිරිවරින් තීරයෙන් අවුත් ඒ ස්ථානයට පැමිණ අනිලබල වෙග විලුලිත සමුද්‍ර වෙලාතටයෙහි සජ්ජිත මණ්ඩපයට බොධීන්වහන්සේ වැඩව කරවා ක්ෂත්‍රිය ශ්‍රෙෂ්ඨි බ්‍රාහ්මණ වනිතාවන්ගෙන් ක්ෂත්‍රිය ප්‍රමදාවන් හස්තයෙහි සුවර්ණශංඛය තබා ශ්‍රෙෂ්ඨියොෂිතාවන් කර තාමරස මස්තකයෙහි රජත ශංඛය පිහිටුවා බ්‍රාහ්මණරමණීන් පාණිතලෙහි දක්ෂිණාවෘත්ත ශංඛය ප්‍රතිෂ්ඨාකොට එහි අනවතප්තොදකය වත්කොට ඒ සඞ්ඛතොමුඛයෙන් බොධීන්වහන්සේට අභිෂෙක ජලය වඩා සපිරිවර දක්ෂිණ ශාඛා ශාඛිප්‍රයාණන්වහන්සේ නැව් නගමින් තෙමේ කරවටක් දියට බැස දෙහොත්මුදුන් දිදී සිට ගමන් පසුකොට දර්ශනාවසානයෙහි තීරප්‍රාප්තව සපිරිවරින් අවුත් සිය නුවරට වන්හ. එකල්හි වාහිනී හා මුදුනෙන් භුගු තරඟ වැළඹිද දෙබී කොරෙමින් නික්මුණු නැවින් වඩනා අශ්වත්ථද්‍රුමයාණන්වහන්සේ මුහුදු මැදදී සංඝමිත්‍රා ස්ථවිරීන්ට යාච්ඤාකොට බෝධීන්වහන්සේ ඉල්වාගෙන මහත් පෙරහරින් නාගභවනයට ගෙනගොස් ඒ ඵණිපතිහු සහිත හැම උරගනාමෙනෙවි තිසාර සැරහී සද්දවසක් එකාවන්ව පූජොත්සව පවත්වා නැවත ගෙනවුත් වැඩිකල්හි එදවස්ම ජම්බුකොල පටුන්තොටටම වන්හ.

එපවත් අසා දෙවනපෑතිස්ස මහරජතෙම අනුරාධපුර නුවර පටන් දඹකොළ පටුනුගමට මග සරහා මහත් උත්සවයෙන් ගොස් ජම්බුකොල පටුනු තොටටම වන්හ. එකල්හි රළපතර සංහිඳුණාවූ සාගරයෙහි නැතිහලා ජලහලා මස්තකයෙහි කමල කුවලයොත්පල පුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිතවූ පියුම් විලක්සේ සජ්ජිතවූ විලාසය දක අහස්කුස පවත්වනලද දිව්‍යතූර්‍ය ඝොෂා

වන් අසා සියලු නාලාවචර පරිවෘතව පුෂ්ප දීප ධූපාදීන් පූජා කොට ප්‍රීති වේගයෙන් බෝධින්වහන්සේට පෙර ගමන් කොට සමුද්‍රයෙහි ගල ප්‍රමාණ සලිලාභ්‍යන්තරයට බැස සවර්ණක් ඝන බුද්ධ රශ්මි මාලාවන් විහිදුවමින් සමුද්‍ර මස්තකයෙන් වැඩි බෝධින්වහන්සේ තමන්ගේ හිස් මුදුනෙහි තබාගෙන මා ලද්දාවූ මනුෂ්‍යාත්මභාවය සඵලවීයයි උද්දාම චිත්තයෙන් බෝධිගුප්ත ප්‍රමුඛ රාජකුලයා පිරිවරා සමුද්‍රයෙන් තීරප්‍රාප්තව මුහුදු වැලිතලා වෙරළස රමණීයවූ මණ්ඩපයෙහි පිහිටුවා සකල ලංකාද්වීපයෙහි රාජ්‍යසම්පත්තිය බෝධින්වහන්සේට පූජාකොට රාජ්‍ය බෝධිගුප්ත ෂෝඩශ රාජකුලයන්ගේ හස්තයෙහි පිහිටුවාදෙමින් තමන් චාරපාල ස්ථානයෙහි සිට එතැන්හි තුන්දවසක් පිහිටුවා පූජාකොට තුන්වැනි දවස් උදාසන්හිම සාලශ්‍රේ හාටක පටධ්වජ මාලා විලාසිත රථවාහනයකට වඩාගෙන මහත් උත්සවයෙන් නික්මුණු කල්හි, එසඳ අශ්වත්ථ ද්‍රැමෙන්ද්‍රයාණන්වහන්සේගේ උත්සවයට පැමිණි අකාල මේඝරාජයන් පිදූ ඉන්ද්‍රචාප සහස්‍රයක් බඳුවූ විචිත්‍ර නානාවර්ණ චිත්‍ර කර්මාන්තයෙන් ශෝභමානවූ මකරතෝරණ පන්තීන් හා, ක්ෂීර සාගරයෙන් පැන නැඟී පෙණ බුබුළු මාලාවන් වැනිවූ අසමාන ශ්වෙතච්ඡත්‍ර දහස් ගණනින් හා බෝධින්වහන්සේ වඩනා උත්සවය දක්නා පිණිස සදෙව්ලොව සොළොස් බඹතලය සිස්කොට වහ වහා දිව අවුත් ආකාශයෙහි ඔවුනොවුන් පරයා ඉදිරි ඉදිරිව බලමින් දුටු සතුටින් නටන දිව සෙනඟක් මෙන් මහතුර අහස අතුරු නොදී ලෙළන නානාවර්ණ ධ්වජ ශ්‍රේණීන් හා, චලපත්‍රෝත්තමයාණන්වහන්සේ දක්නා ලෝභයෙන් ස්වකීයවූ දිව්‍ය විමානයන් හා සමග අහසින් බැස එම මග දෙපස අතුරු නොහැර නික්මුණු දිව්‍යවිමාන සමූහයක් මෙන් නානාවිධ විචිත්‍රාලංකාරයෙන් සරහාගෙන ඔවුනොවුන් පරයා උද්වහනය කොට දිවන්නාවූ රුවන්මඤ්චු සමූහයෙන් හා, එ සලපත්කුජ පූජෝත්සවයෙහි ඝන නීල මේඝකූට සහස්‍රයන් පෘථිවි මණ්ඩලයෙහි අවතීර්ණව මේඝනාද පවත්වමින් උනුන් පසුකොට දිවන්නාක්මෙන් නිසානපිට බැඳි සගර්ජිත හස්ති සමූහයෙන් හා, පූජෝත්සවයට සමුද්‍රරාජයා මෙහෙයූ මහරළ පන්තියක් මෙන් පෙළින් පෙළ එන්නාවූ අශ්ව පන්තීන්හා, කෙළලක්ෂයක් සක්වළ සූර්‍ය්‍ය චන්ද්‍රයන් පුදට එකාවිට පැමිණියාක් මෙන් අතිනතින් ගෙනයන විසිරි පත් තල් වැට ආලවට්ටම් දහස්ගණනින් හා, අහස් ගඟ රළ පෙළ පවතින් පැහැර ඉසිනාක්මෙන් අතිනතින් ගෙන විහිදුවන චාමර ශතසහස්‍රයෙන් හා, මරුත් වෙයින් විසිරයන සුදු වලාකුළුමෙන් හිස හිස නටවන ශුඬසාටක සමූහයෙන් හා, ජම්බු අංකුරොත්පාටනය කොට ගෙන පූජා පිණිස ගෙන පෙළින් පෙළ එන්නාක්මෙන් බබළන්

නාවූ රන්වැට ප්‍රදීප සහස්‍රාදීන් හා, උත්තර සාගරයෙන් පැන නැගී උදක බුද්බුදශ්‍රේණියක් මෙන් සුරක්ත හස්තතල මස්තක යෙහි තබාගෙන පූජා කෙරෙමින් ගෙනයන කමල කුවලය කලඹින් පිරි සුවර්ණඝට පන්තීන් හා බෝධිද්‍රුමෝත්සවයෙහි සුපුෂ්පිත පුෂ්කරණී සමූහයක් උද්ගතව පෙළ සැදී නික්මුණාක් මෙන් ශිසින් හිස තබාගෙන නික්මුණු මල්බාලා සමූහයෙන් හා, මාර්ගාන්තරයෙහි හිවි සිටි ජනගහන නැමැති ශිලාතල මස්තක යෙහි සත්කාර නෘත්‍යය කරන මයූර සමූහයක් මෙන් අතින තින් ගෙන ලෙළවමින් යන පිල්කලඹ සහස්‍රාදීන් හා, නානාවිධ භෙරී තූර්ය භාණ්ඩයන් වයන පදනුසාරව නෘත්‍ය දක්ව දක්වා බහුරූ බැඳ යන විකට ජන සහස්‍රාදීන්ගෙන් හා, එසේම ජනගහන ගගනයෙහි විදුලියකැල පහරනාක්මෙන් නඛකාන්ති භ්‍රමණය කොට රතතුල් ලෙළව ලෙළවා ලීලා දක්වමින් සැරහි නික්මුණු නාටක ස්ත්‍රී සමූහයෙන් හා, පූජා මාර්ග සජ්ජිතයට ඝතරන් තැඹිලියසි පැහැරගෙන තොරණාදියෙහි බැඳගනිතිසි යන ශංකාවෙන් මෙන් පිච්තුරු උතුරු සළුපටින් පයොධර වසා විලිබීරුවෙමින් ශාන්තව නික්මුණු කුලහන සහස්‍රාදීන් හා, ජනන හස්තලයෙහි බබළන තාරකා සමූහයක් මෙන් රන්කරඬු රිදී කරඬු රන්කෙණ්ඩි රිදී කෙණ්ඩි රන් රිදී භිංකාරාදිය ගෙන සැරහී නික්මුණු දැසි ජන සහස්‍රාදීන් හා, ඒ පූජාපථය උභයපාර්ශ්වයෙහි පිහිටි රජත ප්‍රාසාද සමූහයක් මෙන් බබළන්නාවූ කදලි තොරණ පන්තීන් හා, මෙසේම නොයෙක් ලෙස වලුමලින් සදමින් පිහිටුවූ කදලි පූග වෘක්ෂ පෙළින් සූර්‍යාතප දුරලන වන රේඛාවක් මෙන් ශොභමානවූ මහොත්සව ජනිත ඒ රාජ පථයෙන් දක්ෂිණ ශාඛා මහාබොධීන් වහන්සේ වැඩමකරවාගෙන ගොස් උතුරු වහසලින් නුවරට වැද අමිතසිරි නිකරයෙන් ප්‍රභාස්වරවූ රාජ විපියෙන්ම ගොස් දකුණු වහසලින් නික්ම පලලව නැමැති ධජමාලා මලිත පුෂ්ප නැමැති සුදු වියන් බැඳි සපුමල් නැමැති පහන් දල්වනලද කෙතකී කුසුම නැමැති චාමර විහිදුවන ලද්දාවූ මහාමෙඝ වනොද්‍යාන නැමැති මඞ්ගල ශාලාවට වැද පූර්ව බුද්ධ කෘත්‍යය නිරීක්ෂණයෙන්ම අප බුදුන් පළමු දීඝනබයෙන් පන්සියයක් රහතුන් පිරිවරා අවුත් ධ්‍යානයට සමවැද මොහොතක්කාල් වැඩහුන්නාවූ මහාමෙඝ වනොද්‍යානයට තිලකයක් වැනිවූ භූමි ප්‍රදෙශය සුමන සාමණේරයන් වහන්සේ පළමුකොට කිලෙසම සුසැදි මුතුරුසක්මෙන් සුදුවැලිතලා අතුළ භූමියට දක්ෂිණ ශාඛා මහා බොධීන් වහන්සේ ස්වර්ණ කටාරයෙන්ම වැඩූහල්හි, ඒ ක්ෂණයෙහි අසූඅතක් උස අහසට පැන නැඟී වටින් සකල ලංකාද්වීපය හා උඩින් බ්‍රහ්මාණ්ඩය දක්වා සව

ණක් සහ බුද්ධරශ්මි මාලාවෙන් පුරමින් ප්‍රාතිහාර්‍ය දක්වා ගගන තලයෙහි වැඩ සිටිසේක කියනලදුයේමැයි, බොධිවංශයෙහි-

“හත්‍ථතො මුත්තමත්තා සා-අසීතිරතනං නභං,
උග්ගන්ත්වාන තතො මුඤ්චි- ඡබ්බණ්ණරංසියො සුභා”

යනුහෙයින් අහස්කුස වැඩසිටි බොධින්වහන්සේගේ ප්‍රාතිහාර්‍ය දුටු දසදහසක් පුරුෂයෝ අනුක්‍රමයෙන් විදර්ශනා වඩා රහත්ව පැවිදි වූවාහුය. චලදල කුජොත්තමයාණන් වහන්සේ දිවාභාගයෙහි නභොගර්භයෙහිම වැඩසිට දිනකර අවරගිරිශිඛර ප්‍රාප්තවූ කල්හි වසුන්ධරා වනිණ්ව හිල්පුර පසළොස්වක්ලත් ගති රොහිණියෙන් බොධින්වහන්සේ බිමට බැස සවිරව පිහිටා රන් දෙණ වැලඳ උතුරු මුවවිටින් භූමියට මුල්බැස එතැන්හි ඇවිත සේක. එපවත් දුටු සකල දීපවාසීහු සාධුකාර දෙමින් අපමණවූ පූජාකළාහ. එයින් මෑත සද්දවසක් ඇවෑමෙන් පැසීහෙත බොධි ඵලයක් මිහිඳු යතිඳුන් වහන්සේ හස්තයෙන් ගෙන දෙවනපෑතිස්ස මහරජහුගේ අතට දෙමින් රොපණය කරවූතෙතින් උද්ගතවූ අටක් බෝපැලවෙන වෙනම ජම්බුකොලපට්ටනමයැතවක්ක නම් බමුණුගමයෑ ථූපාරාම විහාරයෙහිය, ඊශ්වර ශ්‍රමණාරාමයෙහිය, මහියඞ්ගණ විහාරයෙහිය, සෑගිරියෙහිය, කාදරගමුයෙහිය රුහුණුචන්දන ගාමයෙහිය, යනමේ අටතැන පිහිටවූහ. සෙසු බොධි ඵල සතරින් ජනිතවූ ඇසතුකුරු දෙතිසම ලංකාද්වීපයෙහි යොදනකට විහාරයක් බැගින් කරවා එහි පිහිටුවූහ. මෙසේ දෙවනපෑතිස්ස මහරජහුප්‍රතිෂ්ඨාකළ එක්සාලිසක් ද්‍රුමෙන්ද්‍රයන්ගේ ඵල මූලාදියෙන්ම මේ ශ්‍රී ලංකාද්වීපයෙහි හැම ශ්‍රී මහා බොධින් වහන්සේ පිහිටිසේකැයි දතයුතු. මෙහැම බොධින් වහන්සේලාම පාරිභොගික චෛත්‍ය නම් වනසේක. මේ ශ්‍රීමහා **බොධි කථාවය.**

තවද පන්සියයක් රහත්ගණයා පිරිවරා ධ්‍යානයෙන් මෝහොතක්කල් වැඩහුන් මහ පුලිල මළුයෙහි දෙවනපෑතිස්ස නරෙන්ද්‍රයාණන් පළමු අකුරු කොටා සිටුවූ ටැඹෙහි තමන්ගේ නම දැක දුටුගැමුණු මහරජතෙම රත්නමාලි චෛත්‍යය ඒ ස්ථානයෙහි කරවූයේය. කෙසේදයත්? මණිමාලී චෛත්‍යය බඳවනු පිණිස දුටුගැමුණු මහරජ තෙම රාත්‍රියෙහි සිතා සැතපුණේ බොහෝ නරයන්ට දුක්දී දෙමළ සටන්කොට ලංකාව එකච්ඡත්‍ර කොළෙමි, මේ පින්කම කරනු පිණිසත් නරයන්ට දුක්දෙන්නේ කෙසේදැයි වෙදනාවිය. එකල්හි සක්දෙව් රජතෙම එපවස් දැන උළුද රත්රන් රිදී මුතු මැණික්ද යන මේ ආදිය සිංහලද්වීපයෙහි ඒ ඒ තන්හි නිර්මාණය කරවාදුන් කල්හි, ඒ හැම තුබූ තුබූ තැන්වලින් ගෙන්වා ගෙන ධාතුගර්භය කරවන්ට

පටන්ගෙන හැම කර්මාන්ත නිමවා ධාතුවඩනු පිණිස සොළොස් හැවිරිදි **සෝණුත්තර** නම් සාමණේරයන් වහන්සේ ධාතු ගෙනෙනු පිණිස ගමන්කරවූ කල්හි, උන්වහන්සේ ගොස් පූර්වයෙහි **ද්‍රෝණ** බ්‍රාහ්මණයාණන් බෙදූ ධාතු අට කොටසින් **රාමගම්** නුවර **කෝලිය** රජුන්ට දුන් ධාතු කොටසය පිහිටුවා **රාමග්‍රාම** යෙහි ගංඅස බැඳි චෛත්‍යය මහවතුරු පැහැර ගිනනව ගඟවැටි ධාතුකරඬුව මහවතුරෙන් ගොස් සමුද්‍රයට වැද මුහුද රුවන්වැල්ලෙහි සවණක් රැසින් දිලිහි දිලිහී තුබූලෙස **මංජෙරික** නාගභවනයෙහි **මහාකාලනාගේන්ද්‍රයා**හට කීකල්හි මහත්වූ සමෘද්ධීන් දසකෙළ දහසක් උරගසේනාව පිරිවරා අවුත් මහත්වූ උත්සවයෙන් සධාතුක කරණ්ඩකය මිණිකරඬුයෙක්හි බහාගෙන තමා හිස්මුදුනෙහි තබාගෙන තමාගේ නාගභවනය වම ගෙන ගොස් සයානුකෙළක් වස්තුයෙන් පූජාකොට සර්වරත්නමයවූ ප්‍රාසාදාභ්‍යන්තරයෙහි සකල මණිමය චෛත්‍යයක් නිර්මිත කොට එහි ධාතුකරඬුව වඩා පූජාකරන කල්හි ධාතු පිණිස ගිය සෝණුත්තර සාමණේරයන් වහන්සේ උරග පුරාධිපතිවූ මහකෙළ නාගනම් ඵණීන්ද්‍රයාගේ ඉදිරියෙහි සිට ධාතු ඉල්වූ කල්හි ඔහු විසින් ධාතුදීමට මැලිව බෑනවූ වාසුලදත්තයාට සංඥකළ කල්හි,

"සතයොජනමාවට්ටං-දීඝං තිසතයොජනං,
ඵණානෙකසහස්සානි-මාපයිත්වා මහිද්ධිකා.

සිනෙරුපාදමූලම්හි ධූපායනෙනා ච පජ්ජලං,
ආභුජිත්වාන සො භොගෙ-නිපජ්ජි වාලුකාතලෙ:

අනෙකානි සහස්සානි-අත්තනා සදිසෙ අහී,
මාපයිත්වා සයාපෙසී-සමන්තා පරිවාරිතෙ,,සී.

මෙසේ ඔවුන් ධාතු දීමට මැලිව ධාතුකරඬුව ගෙන මහත් වෙස් මවාගෙන සපිරිවරින් මහමෙර පල්ලට වන්කල්හි -සෝණුත්තර සාමණේරයන් වහන්සේ පළමු පටන්ම රත්නමාලී චෛත්‍යයෙහි පිහිටුවන්ට නියමකොට තුබූ ධාතු හෙයින් ක්ෂණික ඍද්ධියෙන් ඔහට නොහඟවාම ධාතුකරඬුව ඇරගෙන නාරජුනි තෙපි සිටුවයි කියා මහපොළොවකිමිද අවුත් අනුරාධපුරයෙහි තමන් වහන්සේ වසන පිරිවෙනෙහිම පෙණුනුසේක. **ඒසේ හෙයින් දක්වනලදි**-

"ධාතුකරණ්ඩමාදය-තිඪ නාගාති භාසිය,
නිමුජ්ජිත්වාන පථවිං-පරිවෙණම්හි උට්ඨහි,,යි.

මෙසේ සෝණුත්තර සාමණේරයන් වහන්සේ ධාතුකරඬුව වඩාගෙන වුත් ශක්‍රයා විසින් නිර්මිතකළාවූ සර්ව රත්න මණ්ඩප යෙහි මිණි අස්න මුදුන ධාතුකරඬුව වැඩූකල්හි, මාජෙරික උරග

පුරාධිපතිවූ මහාකාළ නාගේන්ද්‍රතෙම සධාතුක කරඬුව ගෙන සොණුත්තර සාමණේරයන් වහන්සේ නික්මුණු බව දැන මහත් ශෝකයෙන් නාගභවනයෙහිම උරගසේනාව රැස්ව රන් අතල වතල තමලුලිය කලප් වැනි ධම්මිල්ල කලාපයන් විහිදා පිට හෙළා රන්මලසුන් මුදුනෙහි පිදූ ලාඹගලී මල් කලප් මෙන් දෙඅතුල් හෘදයෙහි තබාගෙන නීලෝත්පල වැනි නේත්‍රවයෙන් හෘදයෙහි ගත් ශෝකාග්නි පිටත්ව රත්ව ආපොධාතු සාක්ෂ්‍යා ඉතිරෙන්නාක්මෙන් වැහෙන කඳුළුධාරාවෙන් හෘදය මස්තකය වහන්ගෙන හන් පලන් වස්ත්‍රාභරන නොත් කොරෙමින් පවනින් කම්පිතවූ කනකලතා සහිත චාමීකර ශාල වනයක් සේ එකහෙළා ක්ෂුභිතව සිටි සිටි තැනින් පොළොව කිමිද උඩ නැගෙමින් අනුරාධපුරනුවරට අවුත් මහාසංඝයා වහන්සේ සමීපයට රැස්ව අනේකප්‍රකාර අඳෝනා නෙපුල් කිය කියා වැනි වැනී අඬ අඬා මහාසංඝයා වහන්සේ ඉදිරියෙහි සිටියහ. දක්වනලද්දමැයි–

"තදා සො නාගරාජාපි–වඤ්චිතමනා මයං ඉති.
සපරිසා* නාගා සබ්බෙපි–පරිදෙවිංසු පීණ්ඩිතා. †
පරිදෙවමානා ආගන්ත්වා–නාගා සංඝස්ස සන්තිකෙ,
බහුධා පරිදෙවිංසු/–ධාතුහරණදුක්ඛිතා,,

යනාදීන් හඬමින් සවාමීනි කිසිවක්හට පීඩාවක් නොකොට අපගේ කුශලානුභාවයෙන් දැහැමෙන් ලැබගත් ධාතූන් මෙසේ නිරවශේෂ කොටම අප කෙරෙහි නිෂ්කාරුණාවෙන් මෙන් ඇරගෙන ඇවිත් ලෝකයාහට ත්‍රිවිධ සම්පත් සාදාදෙන්ට වැඩ සිට අපට සිඩවන සවර්ග මොක්ෂ සම්පත්තියට බාධාකොට තමන් වහන්සේට සිඩවන්නේ කිම්දැයි කියා ඇඬූහ.

"තෙසං සංඝො'නුකම්පාය–ථොකං ධාතුමදාපයි,
තෙ තෙන තුට්ඨා ගන්ත්වාන–පූජාභණ්ඩානි ආහරුං.,,

යනාදීන් ඔවුන් කියන අඹුනක වචනයන් අසා අනුකම්පාවෙන් ඔවුන් වැඳ පුදාගන්නාලෙස ධාතු ප්‍රමාණයක් දෙවූසේක. එසඳ ඔව්හු මහත් සන්තෝෂයට පැමිණ භික්ෂූන් වහන්සේට හා ධාතුවරුන් වහන්සේට පූජාකොට තමන් ලත් ධාතු මහත් පූජා පෙරහරින් මස්තකයෙහි තබාගෙන නාගභවනයට ගෙනගොස් සත්රුවන් ප්‍රාසාදය ඇතුළෙහි බැඳ නැගූ මාණික්‍ය චෛත්‍යයට වඩා අද දක්වා පූජාකරන්නාහ. ශක්‍රයා මැවූ මිණි අස්නෙහි වැඩූ සධාතුක කරණ්ඩකය මහසංඝයා වහන්සේ හා සමග සපිරිවර දුටුගැමුණු මහරජාණන් මහත් පෙරහරින් වඩාගෙන ගොස් රුවන්වැලි මහසෑයෙහි පිහිටුවූවා ඒ ක්ෂණයෙහි පහළවූ අද්භූත ප්‍රාතිහාර්‍ය්‍ය දැක මහත් සන්තොෂයෙන් එක්සිය

* "පරිදෙවි,, † "පීළිතා,, / "ධාතාහරණ,, මහාවංස

සිසිරියන් උස බැන්දවූ රත්නමාලී චෛත්‍යය අද දක්වා සකල
ලොකවාසී සත්වයන්ට උභය ලොකාර්ථසිද්ධි සම්පාදනය
කරන්නේය. මේ අප බුදුන් ධ්‍යානයෙන් වැඩහුන් පැනඹමළු
යෙහි දුටුගැමුණු මහරජහු විසින් කරවූ රත්නමාලී චෛත්‍යය
නම් වේ. **මේ රුවන්වැලි චෛත්‍යය කථාවය.**

තවද මුචලින්ද මාලකනම්වූ භූමිප්‍රදෙශයෙහි ලෝවාමහපාය
පිහිටු පරිදි කෙසේදයත්? දවසෙක දුටුගැමුණු මහරජතෙම
තමාගේ රාජභවනයෙහි භාණ්ඩාගාරයන් බලනුයේ: රන්කරඬු
යෙක රන්පතෙක ලියා තුබූ අස්තෙක මෙයින් මතු එක්සිය
සතළිස් අවුරුද්දක් ඇවෑමෙන් දුටුගැමුණු නම් රජෙක් මණිමාලි
නම් චෛත්‍යයක් කරවා මිදෙල්මළුයෙහි ලෝවාමහපාය නම්වූ
පොහොයගෙයක් කරවන්නේයයි මිහිඳු මහහිමියන් වහන්සේ
අනාගතය දිවසින් දැක දෙවන්පෑතිස්ස මහරජහට කියා රන්
පතක ලියවා තුබූ අස්න දැක කියවා මිහිඳු යතිඳුන් වහන්සේ
එදවස්ම මා දුටුසේකැයි උදග්‍රචිත්තයෙන් අත්පොළසන්
දෙමින් සමාධිව උදැසන්හිම සපිරි වරින් මහමෙවුනා උයනට
ගොස් මහාසංඝයා වහන්සේ රැස්කරවා, ස්වාමීනි මහාසංඝයා
වහන්සේට උපොසථ ගෘහයක් මුචලින්ද නම් මාලකයෙහි කරවා
දෙමි, හෙද දෙව්ලොව දිව්‍ය විමානයක්සේ කරවනු කැමැත්
තෙමි, එසේ හෙයින් භික්ෂූන්වහන්සේ දෙව්ලොවට ගමන්
කරවා සුරවිමනක් පෙතිකඩෙක අඳවා ගෙන්වා දුනමැනවයි
කීය. සංඝයාවහන්සේද එපවත්අසා රහත් අටදෙනෙකුන්
වහන්සේ සුරපුර ගමන්කරවූ කල්හි වැඩි අටදෙනා වහන්සේ
දෙදෙව්ලොවින් ක්ෂුද්‍ර විමානයක් පරීක්ෂාකොට නොදැක
ත්‍රයස්ත්‍රිංශද් භවනයෙහි කොළවර ස්වල්පවූ කුශලයක්කළ
භරණීනම් දිව්‍ය ස්ත්‍රියගේ දොළොස් යොදුන් උසඇති
අටසාළිස් යොදුන් වට ඇති ආකාශස්ථවූ දිව්‍යවිමානය දැක
දැහිගුලෙන් පෙතිකඩෙක ලියාගෙන වුත් භික්ෂූන් වහන්සේට
දුන්හ, ඒ පෙතිකඩ මහරජ දැක එලෙසම ලෝවාමහපාය
කරනලෙස භූමිය සමකරවා දිග සියක් රියන් හා එපමණම
පුළුලගෙන පදකොට එක්දහස් සසියයක් වැම් පිහිටුවා සියක්
රියන් උසගෙන නවමහල් කොට එකි එකී මහලෙහි සියයක්
සියයක් කුළුගෙවල් කොට එකි එකී කුළුගෙහිම සෙවෙනි පල
මුඳුනෙහි රන්රිදී දැල්ව සා එහි රන්රිදීමයවූ කිඞ්කිණික මාලා
පනතින් එල්වා රන්රිදි මිණිකොත් පිහිටුවා ඒ කුළුගෙවල
නොයෙක් රත්නයෙන් විසිතුරුවූ පිළිකාඩවල ඒ ඒ ස්ථානයෙහි
නානාවිධ රත්නයෙන් විචිත්‍රවූ පෙති පතරින් සැදි පද්මොත්
පල පනතින් සරහමින් එහි එකි එකී මාලයෙහි සියගණන්
ගබඩාද නොයෙක් රත්නයන් නිමග්න කළ ස්වර්ණරජතමය

සිංහපඤ්ජර ව්‍යාලපඤ්ජර මකරපඤ්ජර ජාලපඤ්ජර ලතාපඤ්ජරා දිවූ නොයෙක් පඤ්ජර සමූහයෙන්ද, ඒ ඒ තැන්හි සිංහපන්ති ව්‍යාලපන්ති මකරපන්ති කීර චකෝර පන්ති තිසර බර්බර පන්තීන්ද සොභමානවූ දූවවළලු භිත්ති පිළිකඩවල් නිමවා, වෛශ්‍රවණයාගේ නාරිවාහන මණ්ඩපයෙහි විසිතුරු අසා එම ලෙස ප්‍රාසාදමධ්‍යයෙහි සර්වරත්නමයවූ ස්තම්භ ප්‍රතිෂ්ඨා කොට නොයෙක් රත්නයෙන් සරහනලද දූවවන් බැඳ එහි පෙළින් පෙළ ස්වර්ණද්‍රුම මුක්තාලතා මිණි දැල් එල්වා සප්තවිධ රත්නමයවූ මණ්ඩපයෙහි ස්ඵටිකමය භූමිය මැද දන්තමයවූ ආසනයක් පිහිටුවා එදළකඩපිට අටුවක් තබා අනර්ඝවූ පසතුරුණු අතුට එහි මුදුනෙහි දළකඩ විජිනිපත්‍රයක් තබා ඵලිකමය වහන් එළවා තබා ඒ මණ්ඩපයෙහි උඩ සුදුවියන් බඳවා එහි සියගණන් සූර්ය චන්ද්‍ර බිම්බ දිව්‍යවිමන් පෙනෙන්නාක් මෙන් අධොමුඛවූ මැණික් බැඳ කර්ණිකාවෙන් හා ස්වර්ණකොශරයෙන් යුක්තවූ රක්ත ශ්වෙත පද්ම ශ්‍රේණීන් සජ්ජිතකොට එහි අතුරතුර ස්වර්ණ රජත මණි තාරකාදීන් ඔබා සමන්වා රන් රිදී මිණි පල්ලව ලෙළදෙන රජතරුක්ම රත්නද්‍රුමයන් එල්වා, ආසන මස්තකයෙහි සජ්ඣු දණ්ඩානුබද්ධ සර්වරත්නමය කුඩ පුඩු ගොනැස් කොඳු පන්තීන් විචිත්‍රවූ ශ්වෙතච්ඡත්‍රයක් පිහිටුවා ඡත්‍රාන්තයෙහි ස්වර්ණ රජත මුක්තා මණි විද්‍රුමාදිවූ නානාවිධ ද්‍රුමයන් අග මිණි කිකිණි බඳවා, එම මණ්ඩපයෙහි අටදිග රන් රිදීමයවූ අටමඟලා සොලොස් මඟලා පිහිටුවා මෙසේ වර්ණනා විෂයාතික්‍රාන්තවූ සමස්ත ශ්‍රී ශොභමාන කොට ලෝවාමහපාය කරවා එහි ගබඩා වක් පාසාම මාහැඟිවූ මඤ්ච පීඨ බිසි බිම්බොහන විතාන තිරජවනිකා මහරුතිලි ආදී කප්පිය භාණ්ඩයන් හා, ඇත්වැට සිටිවැට ලියවැට දඹුවැට පාදපීඨ පාදකඨලිකා වටවිල් තඹකො තලා ස්වර්ණභිංකාර ස්වර්ණඝට ආදීවූ සෙනාසන පරිෂ්කාර ලව මීන් පවුරු පදනම් වහසල් වේදිකා සෙවෙනි සොපාණ මාලාදීවූ හැම තඹලොහො උළින් කරවූ බැවින් ලෝවාමහාප්‍රාසාද නම්වූ ඒ පොහොය ගෙය චතුර්විධ මාර්ගඵල ප්‍රාප්ත ධුතගුණාන්විත පෘථග්ජනාදිවූ සියලුම සංඝයාවහන්සේට දුටුගැමුණු මහරජ තෙම ස්වහස්තයෙන් ස්වර්ණභිංකාරය ගෙන මණිවර්ණ ජලධාරා වෙන් මහීගර්ජිතාකරවා හස්තොදක කොට පිළිගන්වා සත් දවසක් සියලු මහා සංඝයාවහන්සේට අසදෘස දානයමෙන් මහ දන් පැවැත්වූයේය. දක්වන ලදමැයි, **ථූපවංශයෙහි**-

“පාසාදහෙතු වත්තානි-මහාරාජෙන චාගිනා,
අනග්ඝානි ඨපෙත්වාන-අහෙසුං තිංසකොටියො,, යි.

මෙසිදු අප බුදුන්ගේ පාරිභොගික චෛත්‍ය කථානම්වේ.

**මේ ලොහමහාප්‍රාසාද කථාවය.**

තවද මේ දුටුගැමුණු මහරජතෙම රුසිමාලක ස්ථානයෙහි ලහබත්ගෙය කරවමින් පතන් භූමි ස්ථානයෙහි රත්නප්‍රාසාදය කරවමින් ජනතාසර ස්ථානයෙහි පිරිත්පැන් පොකුණ කරවමින් මෙසේ මහමෙවුනා උයනෙහි මහාවිහාරය **සිංහවික්‍රාන්තයෙන්** කරවිය. ඒ සිංහවික්‍රාන්ත නම් කවරහයත්? මෘගෙන්ද්‍රයකු දකුණත් පසට කරකැවී පසුබලා සිටියාක්මෙන් වෙයි, එසේ සිටි කණ්ඨීරවයාගේ වාලධිය කෙළවර සපශීස්ථානයෙහි **බෝධිගෘහය** විය, දක්ෂිණ පාදස්ථානයෙහි **ලෝවාමහාපාය** විය, වාම පාද ස්ථානයෙහි **සන්නිපාත සාලාව** විය, වාමෝදර පාර්ශවයෙහි **රුසිමාලකාය** විය, දක්ෂිණ හස්තස්ථානයෙහි **ලහබත්ගෙය** විය, වාමහස්ත ස්ථානයෙහි **මහාථූපය** විය, කණ්ඨ ස්ථානයෙහි **කණ්ඨකථූපය** විය, කර අඹරා දකුණුපස බැලූ සඳ දෘෂ්ටිය හුණුවාවූ **ස්ථාන**යෙහි **ප්‍රතිමාගෘහය** විය, මේ සිංහවික්‍රාන්ත නම්වේ. මෙ සිංහවික්‍රාන්තයෙන් මහමෙවුනා උයනෙහි කරවූ මහාවිහාරය ස්ථානවශයෙන් පාරිභොගික චෛත්‍යය වෙයි. එහි ජනිත වස්තුවශයෙන් මහාබෝධි පාරිභොගික වෙයි. මණිමාලී චෛත්‍යය ධාතු චෛත්‍යය නම්වෙයි. මේ හැම චිත්තීකෘතාර්ථයෙන් චෛත්‍යය නම් වීයයි දතයුතු. තවද **තිසාවැව** සමීපයෙහි ධාතුපිහිටුවූ ජයමහකොන්තය පිහිටුවා දුටුගැමුණු මහරජතෙම **මිරිසවැටිදාගැබ** තිස්රියනක් උස බැඳවිය, තවද **මහසෙන්** රජ අසූඅතක් උස අහසට පැන නැඟී දෙවියන් එල්වාපෑ පටි ධාතුවෙන් භාගයක් කපාගෙන පිහිටුවා **දෙනා වෙහෙර** එක්සිය තිස්රියනක් උස කරවිය, **කාසුප්රජ** ධර්මධාතු පිහිටුවා **හගිරිවෙහෙර** එක්සිය සතලිස් රියනක් උස කරවිය, අප බුදුන් රහත් පන්සියයක් පිරිවරා වැඩ සිට දෙවිබඹුන්ට බණ දෙසූ "**මිහින්තලාගල** මස්තකයෙහි තිස් රියනක් උස **මහසෑයක්** **මහදළිකා මානා** රජකරවිය, තවද දුටුගැමුණු මහරජහු මල් **ශ්‍රද්ධාතිෂ්‍ය** මහරජතෙම එක්සිය අසූ රියනක් උස **දීඝනඛචෛත්‍යය** කරවිය, මෙසේ දක්වනලද අප බුදුන්ගේ පාරිභොගික චෛත්‍යය, ධාතුචෛත්‍යය, ධර්ම චෛත්‍යය, ශාරීරික චෛත්‍යය, උද්දේසික චෛත්‍යයයි කියන ලද පඤ්චප්‍රකාරවූ චෛත්‍ය විභාගයන් සංක්ෂෙපයෙන් දක්වන ලදී. මෙසේ මේ පඤ්චවිධවූ චෛත්‍යයෝම සකලලොකවාසී සත්වයන්ට කැමති කැමති සැපත් සිද්ධකොට දෙන්නාවූ පින්වත් මහොත්තමයන්ගේ ආත්ම සංසර්ගීවූ පමණින් සමස්තලොකවාසීන්ගෙන් අප්‍රමාණවූ පූජාසත්කාර ලැබ ලොකප්‍රසිද්ධව ඔවුන්ට අභිමතාර්ථයන් සිද්ධකොට දුන්හ. එසේ හෙයින් සියලු සත්වයන් විසින් පරවැඩෙහි මෙහෙයනලද කල්‍යාණාත්මයන් ලැබ තුන්භුවනය තම තමා නතුකොට ගතයුතු. **දක්වනලදමැයි.**

"පරමචරිතමෙතං ධීමතං තං විදිත්වා
සුජනපථ සුගන්ත්වා එසමානා සමුත්ථිං,
නිහිතසුගතධාතුං චෙතියාදිං මහිත්වා
ලභථ සහිතමමෙහා භොගසග්ගාපවග්ගං."

මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
සම්බුද්ධ චක්‍රවර්තීන්ගේ චෛත්‍ය සංග්‍රහ කථානම්වූ
තෙළෙස්වන පරිච්ඡේදය
නිමවනලදී.

——o:o——

## 14 වෙනි පරිච්ඡෙදයං

——⌣——

### නැවද මේ සද්ධර්මරත්නාකරයෙහි සම්‍යක්සම්බුද්ධ චක්‍රවර්තීන්ගේ චෛත්‍ය කථාවන්ට අනතුරුව සම්මජ්ජනානිසංස ප්‍රකාශකවූ ඵුස්සදෙව ස්ථවිර කථානම් කවරහයත්?

මේ මතුකියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේදයත්?** ප්‍රසන්න චිත්තයෙන් මළුව හැමදීමෙන් පඤ්චානිසංසයෙක් වෙයි. කෙසේදයත්? මළුව හැමදිකල්හි ස්වකීය චිත්තය ප්‍රසන්නවෙයි, ඒ හැමදි මළුව දුටු අන්‍ය සත්ත්වයන්ගේ චිත්තයද ප්‍රසන්නවෙයි, හැමදපු පිරිසිදු ස්ථානය දුටු දෙවතාවන්ගේ චිත්තයද ප්‍රසන්නවෙයි, ප්‍රසන්නයෙන් ජනිතවූ කුශලයද රැස්වෙයි, එම කුශලයෙන් මත්තෙහි ස්වර්ග සම්පත්තියද සිඩවෙයි, **මේ හැමදීමෙහි පඤ්චානිසංසනාම.** මේ පඤ්චානිසංසයන් අතුරෙහි "**සකචිත්තංපසීදති**" යන්නෙහි, **කාළකන්ද ඵුස්සදෙව ස්ථවිරයන්වහන්සේගේ** ප්‍රවෘත්ති කථාව පළමු දක්වනු ලැබේ. කෙසේදයත්? ශ්‍රද්ධාබුද්ධි සම්පන්න සත්පුරුෂ ජනයන්ට වාසස්ථානවූ **සිංහලද්වීපයෙහි රුහුණු** නම් ජනපදයෙක් විය. ඒ ජනපදයෙහි රත්නත්‍රයොපාසිත උපාසක ජනයන් විසින් විසිතුරුවූ ගොචර ග්‍රාම සම්පන්නවූ සුවිශුද්ධ ප්‍රාකාරාඞ්ගණ ගොපුර සංඝාරාම ප්‍රතිමාලය බොධි චෛත්‍යාදීන් සජ්ජිතවූ සුගන්ධොරස රුසි නිවසිත **කාළකන්ද** නම් විහාරයෙක් විය, ඒ විහාරයෙහි එක් පිරිවෙනක වසන්නාවූ ශීලාචාර ගුණසම්පන්න **ඵුස්සදෙව** නම් එක් තෙරනකෙනකුන් වහන්සේ සිඛුවරු මකාරඤ

රාසියක් මෙන් ඉතා සුදු වැලිතලාවෙන් ගැවසිගත් දාගැබ් මළු
වක් හැමද සකස්කොට හැඳ පෙරව දුගඩ පටලයක්මෙන්
තැනිතලාවූ ඒ දාගැබ් මළුව බල බලා බුද්ධාලම්බන ප්‍රීති උපද
වමින් වැඩසිටිසේක. එකල්හි දේවපුත්‍රමාරතෙම මෙසේ මුනි
ගුණ සලකමින් වැඩසිටි ඵුස්සදෙව ස්ථවිරයන්වහන්සේ තමාගේ
දිවසින් දැක සිතනුයේ: මේ මහණ දැන් මේ මළුව හැමද බුද්ධ
ගෞරවයෙන් බල බලා සිටියේ මත්තෙහි අධිගමයක් ලද්දේ
නම් මාගේ මුහුණ කුඩාවෙයි, එසේ හෙයින් මොහට අධිගමයක්
සිඬවිය නොදෙමියි සිතා මහත් රොෂයෙන් තමා වසන දිව්‍ය
ලොකයෙන් නික්ම ඇසිල්ලකින් ඒ ස්ථානයට පැමිණ තමාගේ
දෙවාත්මභාවය හැර එතනට නුදුරු පර්වත ප්‍රාන්තයෙක්හි වන
රෙබාවක වසන විරූප රූපයෙන් යුක්තවූ කළු වඳුරකුමෙන්
මවාගෙන ශාඛාග්‍ර මුදුනෙහි සිට කොළනැගි අතුපතර ලෙළව
මින් බිමට පැන දිව අවුත් පවුරු මුදුනෙන් වහා මළුවෙහි පැන
වැටී තෙරුන්වහන්සේ බල බලා සිටියදීම මහත්වූ රොෂයෙන්
තමාගේ වලිමූඛය රැලි මැකෙනලෙස ඇද දසන් පෙනෙනසේ
පොපියමින් බැම නඟ නඟා උන්වහන්සේගේ මූණ බල බලා
දෙඅත් දෙපසින් වැලි ඉස ඉස හැමදි මළුව හස්තපාද ප්‍රහරණ
යෙන් විප්‍රකාර කොට තැනින් තැන වර්චස් කොරෙමින් වලග
නඟා පවුරෙන් පිටතට පැන පසු බල බලා දිවෙමින් වනලැහැ
බෙහි අතු අගට පැනනැංගේය. තෙරුන්වහන්සේ ඒ විප්‍ර
කාරය දැක මේ වලිමූඛයා මාවිසින් සකස්කොට හැමදි මළුව
විප්‍රකාර කොළේයයි වික්ෂිප්තව සිත එකඟකොට ගතනොහී
අධිගම ප්‍රාප්තියට අසමර්ථව නැවතත් ඒ මළුව හැමද තමන්
වහන්සේ වසන පිරිවෙනටම වැඩිසේක.

තෙරුන්වහන්සේ දෙවනදවස්ද චෛත්‍යාඞ්ගණයට වැඩ
විනයානුකූල ක්‍රමයෙන්ම නැවතත් බුදුගුණ මෙනෙහි කොට
මළුව හැමදිමින් බුද්ධාලම්බන ප්‍රීති වර්ධනය කොට පළමු දවස්
මෙන් බල බලා වැඩසිටිසේක. එදවස්ද මාරතෙම පළමු දවස්
මෙන් උන්වහන්සේගේ බුද්ධාලම්බන ප්‍රීතිය තෙමේ සහනයකොට
ගතනොහී වික්ෂිප්ත කරවනු පිණිස කුර දත සැඩි දළ වහළ
දික් සිඟින් සකුල් ඇති කුස බිඳී ඉලඇට ඉපිළ කඳට පර්විභා
ගව පිටිපතුල කිරල ඇට විරලව ඇට නහර සම්න් කළ සිරුරක්
මෙන් දුබලවූ ගව මහල්ලකු සැටියෙන් මළුවට පැන තුරත්තිය
කින් දමන ගොමදියමෙන් වර්චස් කොරෙමින් වලග නොමා
බස්නා ගොමදිය සූනොරගින් වට ඉස ඉස මළුව වටම දිවෙමින්
කුර ඇද හැමදි මළුව විප්‍රකාරකොට සුස්ම සුස්මා නැගැ නොඑ
අඟින් පෙණදහර ඉසිමින් විෂමාධ්‍යාශයෙන් විප්‍රකාරකොට
මළුවෙන් පිටතට පැන කැලෑ වන. එකල්හි මළුව බල බලා

සිටි තෙරුන්වහන්සේ දෙමිනස් ස්වභාවයට පැමිණ මළුයෙහි කාළ විප්‍රකාර මකා හැමද නික්මුණුසේක.

තුන්වන දවස්ද පළමු දෙදවසට වඩා මහත්වූ ප්‍රීතියෙන් දාගැබ් මළුව හැමද බල බලා සිටිකල්හි මාර දිව්‍ය පුත්‍ර තෙම කුශල විපක්‍ෂ ක්‍රොධචෙතනා සංහිඳුවාගත නොහී එදවස්ද අවුත් එක්පයක් අවසඟව පසුබැස තිබෙන්නාක්මෙන්ද පයක් ඉදිරිව දණින් වක්ව නැමුණු කොර මිනිසකුමෙන් දෙඅතින් සැරයටි දෙකක් ගෙන ඒ මළුවට බැස බෙහෙදක් බලා ඇවිදිනා එකකුමෙන් හැමදි වැලිමළුව ඇසතුව බල බලා කොනින් මැදට මැදින් සරසට සරසින් කොනට බිමලා පයක් ඇද ඉදිරිකොට පය නඟා තිබියනොහී පතුලහින් වැලි සාරා ඉස ඉස මළුව වටම ඇවිදිනේය. එවිට බල බලා සිටි තෙරුන්වහන්සේ සිතන සේක්: මේ විහාරයට වටින් යොදුනක් මානේ ගොදුරු ගම් කොට මාවසන මෙතෙක්කල් ඒ හැම ගම්වලින් මෙසේවූ භයානක රූප ඇති කොරකු නුදුටු විරිමි, එසේහෙයින් අදින් ඊයේ දවසින් මෙසේවූ කොරෙක් යොදුනකින් බැහැර සිට මෙතනට පලාඑන්ට අසමර්ථ වන්නේය. ඉදින් එසේ ආයේ වීනමුත් මාළඟට අවුත් දැක වැඳ කරුණු පිළිවිස චෛත්‍යය වැඳ මග බැස යනමුත් මළුයෙහි මෙබඳුවූ විප්‍රකාරයක් නොකරන්නේය, එසේ හෙයින් මේ මාගේ බුද්ධාලම්බන ප්‍රීතිය නැතිකරවන්ට ආ මාරයාවනැයි සිතා එතකුදුවූවත් ඕහට කියනසේක්: එම්බල කොර තෝ පෙරකළ අකුශලයෙන් වඬකගාත්‍රව මෙබඳු අකුශල පල විඳිනෙහිය, දැන් මේ සකස්කොට හැමදි දාගැබ් මළුයෙහි මෙසේවූ විප්‍රකාරයක් කරන්නට තෝ මාරයාදැයි කීසේක. ඒ ඵුස්සදෙව ස්ථවිරයන් වහන්සේ මෙසේ ඔහු අතින් විචාළ කල්හි දෙවියන් විසින් වක්‍ර වචන මුසව, කිම නොපිළිවන් හෙයිනුත් තෙරුන්වහන්සේ යුහුව විචාළ හෙයිනුත් කොර මාරයා කියනුයේ: ස්වාමීනි මම මාරයයි කියා බයින් මදක් පැකිළ සිහි එළවාගතනොහී බලාසිටියේය. එකල්හි තෙරුන්වහන්සේ යහපත තෙපි නොබවයි ඕහට ප්‍රිය වචනයෙන් කථාකොට ඔහු සතුටුකරවා නැවත ඕහට කියනසේක්: එම්බා මාරය තෝ බුදුන් බුදුවන දවස් බුදුවිය නොදෙමි අවුත් යුද්ධකොට පැරදගියේ වේද, එදවස්ද පසුවද බුදුන් දුටුවේ වේදැයි කීසේක. එසේය ස්වාමීනි බුදුන් හැඳිනම දුටුයෙමි වේදැයි කීය. එබසට තෙරුන්වහන්සේ කියනසේක්: එම්බා මාරයෝනම් මහානුභාව ඇතියහ, එසේහෙයින් බුද්ධරූපය මෙන් ශොභාවත්වූ බුද්ධ ශ්‍රීශරීරය මවා දක්වන්ට පිළිවන්දැයි විචාළසේක, එබසට මාර දිව්‍ය පුත්‍රතෙම කියනුයේ: තෙරුන්වහන්ස බුදුහුනම් අරාගී අද්වෙෂී අමොහීවෙති, මම සරාගීසද්වෙෂී සමොහියෙමි, එසේහෙයින් බුදුන්

ප්‍රත්‍යක්‍ෂයෙන් දුටත් දෙවතාවෙක් බුදුන්ගේ රූපය කෙසේ මවා දක්වියහෙද, එතකුදුවුවත් මහාමෙරු පර්වතය කැඩපතින් පැවාමෙස් ලෙසයක් දක්වමි, බැලුව මැනවැයි කියා දෙතිස්මහා පුරුෂ ලක්‍ෂණාශීත්‍යනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා කෙතුමාලාලංකාර යෙන් විරාජමානව සවර්ණක් ඝන බුදුරැස් විහිදුවමින් අහස වැඩ සිටියාක්මෙන් අටලොස්රියනක් උස බුද්ධකාය මවා දක්වීය. එවිට තෙරුන්වහන්සේ ඒ බුද්ධරූපය දැක සිතනසේක්: සරාගී සද්වේෂී සමොහීවූ මාරයා මවාගත් බුද්ධරූපය මෙසේ බබලනකල අරාගී අද්වේෂී අමොහීවූ ජීවමාන බුද්ධරූපයෙහි ශොභාව කියනුම කවරේදැයි බුද්ධාලම්බන ප්‍රීති ප්‍රතිලබ්ධව විදර්ශනා වඩා එවිටම සිවුපිළිසිඹියා පත් රහත්වූසේක. එකල්හි දෙවපුත්‍ර මාර තෙම උන්වහන්සේ රහත්වූ බවදැන මහණ මා රැවටියයි මහත් ක්‍රොධයෙන් කිපෙමින් තමාගේ වාසස්ථානයටම තික්මීණ. එකල්හි දුර්ජනයක්හු අමනාපයකට කැවූ විෂයකින් ශරීරයෙහි පූර්ව ව්‍යාධිය සංහිඳ් ශුද්ධාත්මයක් ලද්දක්හුමෙන් තෙරුන්වහන්සේද සකල කෙලශයන් ප්‍රහීණකොට වජ්‍රකාය ලදින් තමන් වහන්සේ ලත් නිවන් සම්පත්තිය ආවර්ජනා කොරෙමින් තමන් වහන්සේ වසන සෙනාසනයටම ගොස් චතුර්විධ බ්‍රහ්ම විහාරයෙන් යෙදී ධ්‍යානාමෘතයෙන් සතුටුව සත්ත්වානුග්‍රහයෙන් ජගද්හි වෘද්ධි වර්ධනය කෙරෙමින් වැඩවසනසේක. හේ එසේමය, ගන්ධ හස්තින් අනුභවකළාවූ ඕයලුම හොජනය ඔවුන්ගේ උදරාභ්‍යන්තරයට පැමිණසුවඳවත් වූවාක්මෙන් සත්පුරුෂයන්ට කොතෙක් දුර්ජනකම් කළත් ඒහැම ඔවුන්ගේ ශුද්ධචිත්තාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටව අසත්පුරුෂ කාලුෂ්‍යාපගමයෙන් ශුද්ධවෙමින් අභිවෘද්ධි වර්ධනය කරවනබව මෙසින් අදහාගෙන සත්පුරුෂ ජනයන් විසින් වෛර අවෛර කවරතරම් සන්ධියක් හටත් අවැඩක් නොසිතා

පරාර්ථ සිද්ධිය කටයුතු. **දක්වනලදමැයි—**

"ඉති යතිවරචිත්තං වික්ඛිපිත්වාන මාරො
සිවමධිගමබාධත්ථාය වායාමකාසි,
නිජමතිපථ පත්වා පස්සි සන්තානං තථාපි,
ජහථ සුජනතිස්සං තං මනෙ සන්නිධාය."

**මෙතෙකින් මේ සද්ධර්මරත්නාකාරයෙහි**
**ප්‍රථම සම්බුජ්ජනානිසංස ප්‍රකාශකවූ පූසදෙව ස්ථවිරකථානම්වූ**

## තුදුස්වන පරිච්ඡේදය

**කියා නිමවනලදී.**

---

# 15 වෙනි පරිච්ඡේදය.

**තවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**සම්මජ්ජනානිසංස ප්‍රකාශකවූ දත්තභික්ෂුකථානම් කවරහයත්?**
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කොසේදයත්?** ත්‍රිවිධරත්නාකරවූ මේ ශ්‍රී ලංකාද්වීපයෙහි **රුහුණුපුරට** ශ්‍රමණ ගුණාභිරාම සුගතෞරස මහාසංඝයාවහන්සේට වාසස්ථානවූ ශ්‍රමණසාරූප්‍ය විහාර වින්‍යාසයෙන් ශොභමානවූ **ලොකන්දරනම්** විහාරයෙක් විය. එහි වසන්නාවූ මහාසංඝයාවහන්සේ අතුරෙන් **දත්තනම්** එක් ළදරු භික්ෂුකෙනෙකුන් වහන්සේ එම වෙහෙර භූමිභාගනාවගේ මස්තකයෙහි විරාජමාන රජත කිරීටයක් වැනිවූ ස්තූප ප්‍රාන්ත වර්ති ප්‍රාකාර වලයාන්තරයෙහි රළපතර සංහිඳුණාවූ ක්ෂීරසාගරයමෙන් සුදුවැලිතලාවෙන් නිම්ලවූ දගැබ් මළුවක් හැමද මහත් ප්‍රීති ප්‍රමොද්‍යයෙන් ඒ හැමදී මළුව බලබලා එක්පසෙක බුද්ධානුස්මෘති භාවනා කෙරෙමින් වැඩසිටිසේක. ඒ ක්ෂණයෙහි ඒ කුශලානුභාවයෙන් ජනිතවූ සමාධීන් අවදාත කසිණ සමාපත්ති ප්‍රතිලාභයට පැමිණ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා විදර්ශනා වඩමින් සොවාන් මාර්ගය ඵලය සකෘදාගාමි මාර්ගය ඵලය අනාගාමි මාර්ගය ඵලයයි කියනලද ත්‍රිවිධ මාර්ගඵලයට පැමිණ නිර්වාණ සම්පත්තිය හස්ත ප්‍රාප්ත කළංසේක. මෙසේ පරවැඩෙහි නියුක්තවූ මහොත්තමයන්ගේ අසවීන් පවා ප්‍රතිෂ්ඨාකළ චෛත්‍යය වටභූමියද ප්‍රසන්න චිත්තයෙන් බලබලා සිටියවුන්ට නිවන් සම්පත් දෙනකල එබඳු උත්තමයන් සජීව කල්හිද ඔවුන්ගේ ධාතූන්ටද ඔවුන් සදෘශවූ ප්‍රතිමාරූපයන්ටද තමාගේ ශක්ති පමණින් ආහාර දීප ධූප පුෂ්පාදීවූ වස්තුයෙන් පූජාකොට වැඳවුන්ට සිද්ධවනස්වර්ගමොක්ෂ සම්පත්තය කියනුම කවරේද, එසේහෙයින් මේහැම නුවණැති සත්පුරුෂයන් විසින් සලකා පරම ප්‍රතිෂ්ඨාව තමහටද මුළුලොවටද අභිවෘද්ධිම සිද්ධකරන්ට උත්සාහ කටයුතු. **කියනලද්දේමැයි.**—

"සුසන්තදන්තොඉති භික්ඛු සාධුකං
සංසොත සම්මට්ඨචෙතියඞ්ගණං,
සමික්ඛ තොසෙන අලත්ථ සන්තියං
කාරොථ මත්තචිානිධ පුඤ්ඤසඤ්චයං."

**මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි**
**දෙවන සම්මජ්ජනානිසංස ප්‍රකාශක දත්තභික්ෂු කථානම්වූ**
**පසළොස්වන පරිච්ඡේදය**
**කිසා නිමවනලදී.**

# 16 වෙනි පරිච්ඡෙදය.

---

**කවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**තිස්සප්‍රශ්න කථානම් කවරහයක්?**
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේදයත්?** එක්සමයෙක්හි සකල ශ්‍රීන් විරාජිත **ලංකා** ද්වීපාභ්‍යන්තර ප්‍රදෙශයෙක්හි ස්වකීය නාමයෙන් ප්‍රසිද්ධවූ **ජම්බුකොලපට්ටන** නමැයි යන පටුන්ගමෙක් විය. ඒ පටුන්ගමෙහි තුන්බොධි පිහිටියාවූ **දඹකොල** නම් විහාරයෙක්විය. ඒ විහාරයෙහි චතුර්විධ බ්‍රහ්මවිහාරයෙන් විහරණයකරන්නාවූ බොහෝ භික්ෂූන්වහන්සේ අතුරෙන් **තිස්ස** නම් එක් නවක භික්ෂුකෙනෙකුන් වහන්සේ එම දඹකොල වෙහෙර දෑගැබ් මළුවක් හැමද කුණු ගොඩකොට මුසුන්හල මූස්න තබා කුණු දමනු පිණිස කවවරබෑහය සමීපයෙහි උක්ලාප ගුපියගෙන සිටිසේක. එකල්හි අන්‍යදෙශයෙක්හි සිට නැව්නැගී ආවාවූ **තිස්සදත්ත** නම් එක් තෙරකෙනෙකුන් වහන්සේ නැවින් ගොඩ බැස ජම්බුකොල විහාරයෙහි ඒ මලුව ගැමද කුණු දමනු පිණිස කුණුගොටුව ගෙන සිටිය තිස්සනම් භික්ෂූන්වහන්සේ සමීපයට අවුත් හැමැන් දුවූ දෑගැබ් මළුව බලබලා සිටිසේක්. මේ මළුව එකාන්තයෙන්ම භාවිතචිත්තානන්තමයක්හු විසින් හැමදිවනැයිසිතා එතැන්හිසිටි භික්ෂූන්ගෙන් පිළිවිස ඒදහර භික්ෂූන් වහන්සේ බවදැන ජනිතවූ බහුමානයෙන් සිතනසේක්: මෙබඳු ජනොත්තම තෙම මාගේ චිත්තයෙහි ජනිතවූ කාංක්ෂා දුරුකරන්ට සමර්ථවනැයි උන්වහන්සේ අතින් ප්‍රශ්න දහසක් විචාළසේක. උන්වහන්සේද එතැන්හිම වැඩසිට තෙරුන්වහන්සේගේ සැක දුරලා ඒ ප්‍රශ්න දහසම හස්තාමලකයක් මෙන් දැන උත්තානී ස්වභාවයෙන් විසර්ජනය කළසේක. එකල්හි තෙරුන්වහන්සේ කියනසේක්: ඇවැත්නි මේ මළුව සුවිශුද්ධකොට දුටු දුටු ජනයන් සන්තුෂ්ටවන ලෙස හැමැන්දැක්මෙන් ග්‍රන්ථිස්ථාන මලප්‍රක්ෂාලනය කොට ප්‍රශ්න දහසම විසර්ජනය කළබව ඉතාම යහපතැයි සාධුකාරදෙමින් එතැන්හිම වැඩසිට ලබ්ධාධිගමයක්හු මෙන් සම්මජ්ජිතාභිඝණයෙහි සිත් පහදවා ත්‍රිවිධ සම්පත්තියම හස්තප්‍රාප්ත වනලෙස ප්‍රාර්ථනාකළසේක. එසේහෙයින් සත්පුරුෂයන්ගේ විද්‍යමාන ගුණයෙහි පැහැද එයින්ජනිතවූ කීර්ති බහුමානාදියට භාජනව සකලලොක පූජ්‍යව උභයලොකාර්ථසිද්ධි සම්පාදනය කටයුතු. **කියනලද්දේමැයි.**—

"පසාදනීයෙසු ගුණෙසු අඤ්ඤෙහා–පසාදනං සාධුජනස්ස ධම්මො,
තමත්ථමඤ්ඤාය සුසජ්ජනානං–ගුණෙ විදිත්වාන විනාථ ධම්මං."

**මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි**
**තුන්වන සම්මජ්ජනානිසංස ප්‍රකාශකවූ තිස්සප්‍රශ්න කථානම්වූ**
**සොළොස්වන පරිච්ඡෙදය**
**කියා නිමවනලදී.**

# 17 වෙනි පරිච්ඡේදය

---

**කවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**චතුභික්ෂු කථානම් කවරහෙයක්?**

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**හේ කෙසේදයත්?** ජිනවර පරිභොග අශෙෂ භූමිප්‍රදෙශ සිංහල ද්වීපයෙහි ඊදිසාභිධාන නාම චිහ්න වින්‍යාසාදීන් අප්‍රසිද්ධවූ එක්තරා විහාරයෙක්හි වසන ලොකොත්තර ගුණ සම්පන්න එක් තෙරකෙනකුන් වහන්සේ අවික්ෂිප්ත චිත්තයෙන් යුක්තව දුගැබ් මළුවක් හැමද බුද්ධානුස්මෘතියෙන් ප්‍රමුදිතව බලබලා වැඩ සිටිසේක. එකල්හි **ශොනක** දෙශයෙන් තෙර සතරදෙනකුන් වහන්සේ චිත්තීකෘත ස්ථාන දර්ශනය වන්දනය පිණිස නික්ම ඒ ඒ තන්හි උද්දෙසික ශාරීරික පාරිභොගිකාදී විශිෂ්ට දෙව ප්‍රතිෂ්ඨිතවූ බොහෝ පූජනීය ස්ථාන වැඳ පුදමින් ඒ විහාරයට පැමිණ සකස්කොට හැමැන්දුවූ මළුව දැක ඉඳු බීලයෙන් ඇතුළට නොවැද වහසල් දොරටුයෙහිම සිට ජග්ගිතාඞ්ගණය බලබලා බුද්ධාලම්බන ප්‍රීතින් ඒ ක්ෂණයෙහි ධ්‍යාන උපදවමින් පූර්වේනිවාසානුස්මෘතිඥානය ලැබ ඒ සතරදෙනා වහන්සේගෙන් එක් තෙරකෙනකුන් වහන්සේ අෂ්ට කල්පාන්තරයක් දක්නා පමණ දිවැස් ලත්සේක, එක්කෙනෙකුන්වහන්සේ ෂොඩශ කල්පාන්තරයක් දක්නාතරම් දිව්‍ය චක්ෂුෂ් ප්‍රතිලාභය කළසේක. එක්කෙනකුන්වහන්සේ එක්විසි කල්පයක් දක්නාතරම් විශුද්ධ බුද්ධි දිව්‍ය විලොචනය ලත්සේක. එක්කෙනකුන් වහන්සේ සමත්‍රිංශත් කල්පාන්තරයක් දක්නාතරම් දිව්‍ය චක්ෂුෂ් ප්‍රතිලාභය කළසේක. මෙසේ හැමැන්දුවූ මළුව දුටු පමණකින්ම උත්තමයන්ගේ ගුණ දැනගන්නාකල ඔවුනොවුන් හා සම්භාෂණයෙන් - ත් පුරුෂයන්ගේ ගුණය ප්‍රාඥයන්ට දැනෙන්නේමය, එසේහෙයින් ධාර්මික මධ්‍යස්ථ සත්පුරුෂයන් විසින් මාත්සර්ය්‍ය දුරුකොට ප්‍රසාදනීයවූ විද්‍යමාන ගුණයෙහි පැහැද ස්වර්ගමොක්ෂ සම්පත්තිය හසුන ප්‍රාප්ත කටයුතු.

**කියනලදුයේමැයි—**

"යතිහි දිස්වාන විධොතමඞ්ගණං
පසන්නචිත්තෙන දිවක්ඛලත්ථ තං,
තම්බම්මසද්ධාය පි හො ගුණෙසිනං
පරායනත්ථාය කරොථමානනං."

**මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි**
**සතරවන සම්මජ්ජනානිසංස ප්‍රකාශකවූ චතුභික්ෂු කථානම්වූ**
**සතළොස්වන පරිච්ඡේදය**
**කියා නිමවනලදී.**

---

# 18 වෙනි පරිච්ඡේදය.

---

**කවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**අන්‍යතර ස්ථවිර කථානම් කවරහයත්?**
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

හේ කෙසේදයත්? නරවර හරිඳු ගුප්ත ගඟනම්ව ධර්‍ම භාණ්ඩාගාරිකා ලංකාවීපයෙහි ත්‍රිවිධරත්නාකර වර සිරි නිකර යෙන් ප්‍රභාස්වරවූ එක්තරා විහාරයෙක්හි වසන්නාවූ ශ්‍රමණ ගුණ මිණි රත්නාකර ස්ථවිරකෙනෙකුන් වහන්සේ ජනපද චාරිකාවෙහි වඩනාසේක්: ජනසඤ්චාර විරහිත මහිත චෛත්‍ය බොධි ප්‍රතිමාගෘහ ප්‍රාකාරාඞගණාදීන් සජ්ජිතවූ විහාරයකට පැමිණ ඒ ස්ථානයෙහි උක්ලාපාදීන් පතිතව නොසකස්ව තුබූ බොධි මළුවක්ද දාගැබ් මළුවක්ද හැමද කසල දමා ජලස්නානය කරනු පිණිස පඹිත ධෙනූන්ගේ කුහුල් බුරුළු තනයෙන් විදුනා කිරි දහරමෙන් ගිරි ඉවුරු යටින් උනා ජලධාරා දමමින් එක්වන් තික්ම හැලිගසා ශෛලාන්තර ප්‍රහරිත සඵීතොම්බ ශිඛරොද්ගත වෙගයෙන් විශාලව කලාලොපගතජ ලොගුණ්ඨිතාවහන යෙහි ප්‍රහරණ මන්දමාරුත සහගත ජලබින්දු වර්ෂාවෙන් පරිශෙෂ තටාග්‍ර ජල චලන වලි ලලිත රැළි පෙළින් සිසිරකර කිරණ සනන්හ උභයපාශෙර්ෂාදිත පුලිනතල තෙම තෙමා ගලාහෙන පහන්වූ සිහිල් දියකඳින් පිරි සොඳුරු ගිරිකඳුරකට ගොස් ජලස්නානය කරනකල්හි ඒ හැමදීමෙන් සුවිශුද්ධ මළු පෙළින් සැදි විහාර සමීපයෙහි මධුරනාදයෙන් කන්කළු කොවුළු සිලි මුව තිල්ගල කාදම්බ තඹසිළු සුව සාලිකා චකොරාදීවූ විහඟ ගණයා විසින් ගැවසීගත් සුපුෂ්පිත ඇසළ මුහුළු කොබෝලීල පළොල දොඹ කොළොඹ බෙලි සෑල සල් කිතුල් පළු ගිවුළු කරවීර මොර මුරුත පර කරඳ තිඹ කුඹුක් අඹ කෙහෙල් දඹ තිඹිරි පොල් පුවක් දේතළු ආදීවූ විසිතුරු තුරු පතර බඳු නැගි තමලු ලිය කොඳ ඔලිඳ ගිරිතිල්ල යොහොඹු ඉදි දෑසමන් මේ ආදි ලිය වැළඳි අතුපතර සැදි නොමඳ තුරු අතුරු නොදී සැදි වනමුඳුන විමන්කැල දෙවතාවෝ හැමදී මළු පෙළ දුටු සතුටු සිතින් අගිල් කළුවැල් ගුගුල් සඳුන් සුණු ආදීවූ සුවඳ දුම් දෙවන වස්තූන් හා පතුල් ගල්වන සුවඳ තෙල් පිරූ බඳුන්හා පහන්කඩ තෙල් සහිත ප්‍රදීප කපාල සහ ලියවැට ආදියද, නා සපු දුනුකේ කිණ දොඹ යොහොඹු වැකොඳ ඉද්ද සෙවුවණ්ඩි ජයසුමන මහනෙල් උපුල් නෙළුම් ආදීවූ සුවඳ මල් කලප් හා කපුරු තකුල් ලමහ පුවක් ගිඹුරු සුණු සහිත බෙහෙත් ආදියගෙන පහන් සිතින් සුප්‍රති පන්නතාදීවූ සුගන්ධරස ගුණ මෙනෙහි කරමින් සුවිශුද්ධ ද්ව දුහුල් උතුරු සළු ඉස්-වෙළු බැඳ හැඳ පැළඳ සැදි මඟුල් වෙස්

ගෙන විහාරයෙහි රැස්ව සිටියහ. එසඳ තෙරුන්වහන්සේ ජලස්නානය කොට සුසංයම ඉරියාපථයෙන් යුක්තව සංහුන්ගමනින් වෙහෙරට පැමිණ ඒ විහාරයෙහි රැස්ව සිටියාවූ ජනයන් දැක උපාසකවරුනි තෙපි කවරනම් ගමෙහි වසන්නාහුද දැන් මෙතැන්හි කවර කාරණයක් පිණිස අවුදූයි විචාළසේක. එබසට ඔහු කියන්නාහු: ස්වාමීනි අපි හැම බැහැරින් ආවෝ නොවම්හ. මේ වෙහෙර වට වසන වනවාසීම්හ; මෙසේ මේ විහාර සමීපයෙහිම බොහෝ කලක් වසන්නාවූ අපි හැම මෙතෙක්කල් මෙතන්හිම පුරුදුව හිඳ මේ වෙහෙර කළහැන් පටන් මෙසේ වත් පිළිවෙත් සරු පිරිසිදු හැමදීමක් පළමු හැමදි කෙනෙකුන්වහන්සේ නැති හෙයින් නුඹවහන්සේ මේ කළාවූ වතෙහි පැහැද නුඹවහන්සේට පූජා කරනු පිණිස සුවඳ දුම් මල් පහන් ගෙන ආම්හ. එසේහෙයින් අප හැම කෙරෙහි කරුණාවෙන් මේ පූජාභාණ්ඩ පිළිගෙන අපට මතු මත්තෙහි ස්වර්ගමොක්ෂ සම්පත් සිද්ධකරවුව මැනවැයි කීහ. එකල්හි ඒ තෙරුන්වහන්සේ ඔවුන් හැමදෙනාකී බස් අසා මැනවැයි ඔවන්ට සම්මජ්ජනානිසංසාදීන් ධර්මදෙශනා කොට ත්‍රිවිධ සම්පත්තීන් සිද්ධවනලෙස අති ප්‍රමුදිත කරවා මුඛ නොසැහෙන ලෙස සාධුකාර දෙවමින් ඔවුන් විසින් මහිත සමස්ත පූජාසත්කාරයට භාජනව සීල සමාධ්‍යාදී විද්‍යාමාන ගුණයෙන් ඔවුන් ප්‍රසන්නකරවූසේක. කෙසේද යත්?

"චිත්තං පසීදති සකංච පරම්පි චිත්තං
දෙවාපි ඉක්ඛිය තමත්තමනාපිහොන්ති,
පාසාදිකෙන චිත්තපුඤ්ඤඵලානුභොන්ති
සග්ගෙපි පෙච්චමුප්පත්ති භවෙය්‍ය ජග්ගි."

යනාදීන් හැමදීමෙහි අනුසස් නම් පිරිසිදුවූ කුල ශිල ඥන ගුණ රූප ශ්‍රද්ධා කීර්ති මධුර වචන සුවිශුද්ධ විද්‍යායෙහි නිපුණවීම යයි යන මේ දසයෙන් එකක් එකකටම දසයක් දසයක් බැගින් සියයක් කුශල ඵල විපාක දෙනබැවින් හැමදීමෙහි අනුසස් මෙබඳුයයි ශ්‍රද්ධාබුද්ධිසම්පන්න ජනයන් විසින් නිරන්තරයෙන් මෙතෙහි තබාගෙන දාගැබ් මහබෝ සංඝාරාම ප්‍රතිමාගෘහාඞ්ගණ සුවිශුද්ධ චිත්තයෙන් හැමද කුසල් රැස්කොට දිව්‍ය මනුෂ්‍ය සම්පත් වළඳා කෙළවර අමාමහ නිවන් දකින්ට උත්සාහ කටයුතු. කියනලද්දේමැයි--

"සුද්ධත්වක්ඛණගුණසීලසුරූපසද්ධා
කාරුඤ්ඤභාරතිසිලොකසුසාරවිජ්ජා,
එකෙකමස්ස දසම්ච්ච ගුණෙ ගණෙත්වා
ජගහාතිසංසමවබුජ්ඣ සතං ඵලන්ති."

මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
**ෂස්වනසම්මජ්ජනානිසංස ප්‍රකාශක අන්‍යතරසථවිරකථා නම්වූ**

## අටළොස්වන පරිච්ඡේදය

**කියා නිමවනලදී.**

# 19 වෙනි පරිච්ඡේදය.

---

**නවද මේසද්ධර්මරත්නාකරයෙහි**
**අභය ස්ථවිර කථානම් කවරහෙයක්?**
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේදයත්?** සමස්තලොකෛක දිවාකර පරහිත නිරත ධර්‍ම රාජොත්තමයාණන්වහන්සේ සකලජනාවබොධය කෙරෙමින් මුළුලොව සරහා වැඩසිට අනුපධිශෙෂ නිර්‍වාණපුර ප්‍රවිෂ්ටවූ නොබෝ කලක් ගියකල්හි ලොකොත්සවජනක ත්‍රිවිධරත්නාමෘත විමල ජල සම්පූර්‍ණවූ ශෛලතල ශෛවාල මෘගානිමිස පක්ෂි දර්‍දුර නිසාචර විහගසඤ්චාරිත කුශල බීජොද්ගත භෘහොද්‍යාත ශස්‍ය කෙසර ප්‍රාසාදලය පත්‍ර පරිවෘත කිඤ්ජිමාමොද නානාවර්‍ණ භ්‍රමරගණානුචරිත නගර නිගමග්‍රාමාම්භොරුහාභිරාම මහීධර පද්මකුඩ්මල විවිධරත්නාකර වරාටක නානාවිපින පුෂ්කරපර්‍ණ නානාවිධ ධන පුෂ්කර මධු ප්‍රවාලයවෙෂ්ටින් ප්‍රවිෂ්ට පෘථිවීශ්වර නැමැති කුඤ්ජරශ්‍රෙණීන්ට මනොඥ ස්පර්‍ශ දායක සිසිරනීර ක්‍රීඩාමණ්ඩලවූ මේ ශ්‍රී ලංකාද්වීප පද්මසරසියෙහි සඤ්ජාතසහස්‍ර පත්‍රයක් වැනිවූ අනුරාධපුරවරාසන්නයෙහි සුප්‍රතිපන්නතාදි අමිත ගුණගණාන්විත යතිගණානුචරිත ත්‍රිවිධ චෛත්‍යාදිත පරමදර්‍ශනීයවූ විහාරයෙක් විය. ඒ විහාරයෙහි ප්‍රාකාර වෙදිකා ගෛරික කර්‍ම නිර්‍මිත භිත්ති ස්තම්භ සොපාන මාලාදීන් පරමතර රමණීයවූ එක් පිරිවෙනෙක්හි ශීලාචාර ගුණ ශ්‍රුත රූප ශ්‍රීන් අපමණ ශොභමාන අභයනම් එක් තෙරකෙනකුන්වහන්සේ වැඩවසනසේක. ඒ අනුරාධ පුරප්‍රවරාභ්‍යන්තරයෙහි අභිරූප යෞවන ලලනා මනනයනාකර්‍ෂණ ශොභමානානඞ්ගාකාර මූර්තියක් ඇති අමාත්‍ය පුත්‍රයෙක් සමස්තශ්‍රීන් අනුභව වැඩ වසන්නේය. මේ දෙදෙනාම සුවිශුද්ධ ශීලාචාර ස්වරූපාදීන් විරාජිතව වසන කල්හි මේ අමාත්‍ය පුත්‍රයාද අභය ස්ථවිරයන් වහන්සේද වෙන වෙනම දුටු දුටු ජනයෝ ඔවුන්ගේ රූපශොභාවෙහි අතිප්‍රසන්නව අහෝ මේ ලොකයෙහි කළමනානම් කුසල් මයයි කුශලයෙහි ලොභ උපදවා මොහු යටගියදවස කොබඳු කුශලයක් කළාහුද, අපි එබඳු පිරිසිදුවූ පිනක් කොටගත මුහුණුමෝවේදැයි සිතමින් ඔවුනොවුන් දැක පින් කොටගන්ට උත්සාහ සිතන්නාහුය. මෙසේ ඒ දෙදෙනාගෙන් තෙරුන් වහන්සේ දුටුවාහු ඔවුනොවුන් හා කථාකරනකල සබඳිනි මේ අභය ස්ථවිරයන්වහන්සේට සදෘශවූ රූපයක් කොයි ඇද්දැයි විචාළකල අමාත්‍ය පුත්‍රයා අඳුනන්නාහු නොපි කුමක් කියවුද, මේ තෙරුන්වහන්සේට සදෘශ රූපයක් ඇති කෙනෙක් නම්

ඇතුළුනුවර වසන අමාත්‍ය පුත්‍රයෙක් ඇත, ඒ අමාත්‍ය පුත්‍රයා විනා සෙසු කෙනකුන් කියනොහැක්කේයයි යෙති. ඒ කියන අමාත්‍ය පුත්‍රයාගේ රූපය දුටුවාහු පින්වත්ති මෙබඳු රූපයෙක් නෙපි දුටු විරූද්දැයි කීකල්හි මේ රූපයට එක්වැනිවූ රූපයක් ඇතිසේක් අභය ස්ථවිරයන්වහන්සේයයි කියති. මෙසේ බවු නොවුන්ගේ රූප විශෙෂය ඔවුනොවුන් මධ්‍යයෙහි කියා උනුන් දක්නාතරම් සන්තොෂ ජනිත කරවමින් කලක් ගියකල්හි එක් දවසෙක සමස්තලොකයාහට අභිමතාර්ථ ප්‍රදානය කරන කල්ප වෘක්ෂයක් වැනිවූ ශ්‍රීමහාබොධින් වහන්සේගේ අවයව ශ්‍රීධර දක්ෂිණ ශාඛා නැමැති චින්තාමාණික්‍යරත්න ප්‍රතිෂ්ඨිතවූ මහ මෙවුනා උයනෙහි පිහිටි රුවන්වැලිමහසෑයට මහත් පූජොත්සවයක් කරනු පිණිස මහමෙවුනා උයන නඳුන්වනයක් මෙන් සරහා හැම සිඩස්ථානවල පූජාවට පටන්ගත්හ. එදවස් අමාත්‍ය පුත්‍රතෙම සර්වාභරණයෙන් සැරහී මනහර වස්ත්‍රයක් හැඳ එසේම සැරහුණාවූ ඉතාමිත්‍ර අමාත්‍ය පුත්‍ර ගණනක් පිරිවරා රුවන්වැලි මහසෑය ආදිවූ සිඩස්ථාන වන්දනා පිණිස නික්ම එනුයේ: නැගෙනහිරිදොරටුයෙන් අවුත් රත්නමාලීනම් චෛත්‍යාඞ්ගණයට බටුයේය. එදවස් අභය ස්ථවිරයන් වහන්සේගේ මෑණියන්දෑ අලුත රඳන්කළ ප්‍රසාදවහවූ රන්වන් සිවුරක් පුතණුවන් වහන්සේට වෙහෙරට එවා මේ සිවුර වැළඳගෙන මාගේ ස්වාමින්වහන්සේ රුවන්වැලි මහසෑය වඳනා පිණිස වඩනාසේක්වයි වෙහෙරට කියා එවූහ. එබස් අසා අභය ස්ථවිරයන් වහන්සේද කෙසමස්සුන් බහා මෑණියන්දෑ එවූ අලුත් සිවුර වැළඳගෙන භික්ෂුසංඝයාවහන්සේ පිරිවරාම චෛත්‍ය වඳනා පිණිස නික්ම අවුත් පැලදිග වහසලින් ඇතුල් මළුවට වැද රත්නමාලි චෛත්‍යය ඇතුළෙහි දුටුගැමුණු මහරජහු විසින් සප්තවිධ රත්නයෙන් කරවූ හැම බුඩ කෘත්‍ය ප්‍රතිමාරූප ආදීයෙන් සජ්ජිතවූ ධාතුගර්භයෙහි ගුණ වර්ණනා කෙරෙමින් මහත් භක්තියෙන් පත්කඩ තබා වඳනාසේක්:

"ජිතභූතලභූපනිවාසයුතෙ–සුරභූරුහසන්නිභකාමදදෙ,
වරභූපතිජප්පදමම්බුරුහෙ–සුචිභූසුරසාමිනිමොළිනිහෙ.
මුනිධම්මසුධාකරභූතනජනෙ–ජිනසංඝසුධාකරසම්මහරෙ,
පරිභාවිතභාකරමඤ්ජුඝරෙ–රතනාපණසෙණිසතොරුචිරෙ.
අමරාලයවාසිසහාරිහරෙ–විපුලාමලසම්පදතාපහවෙ,
අමරාවතිකිත්‍යනුරාධපුරෙ–අජරාමරමෙසිනරෙහි කතං,
සනරාමරමොළිසිදෙවකතං–රතනාවළිජොතිහි ජොතයිතං.
මුනිනො වරධාතුජදෙහධරං–පණමෙ රතනාවළිථූපවරං.
සකලං කමලාසරතප්පභවං–විපුලං චතුදීපවරං සගිරිං,
රතනුල්ලසිතං ඛහියන්ගරුං–පණමෙ රතනාවළිථූපවරං

සකලං තාරනාථවරං පවරං-සිසිරප්පුනිභාකරබිම්බයුතං,
සුවිසාරද සාරදසාවකනං-පණමෙ රතනාවලිථූපවරං.

සුගතං වජිරාසනබොධියුතං-සමරං සබලං නමුචාගමනං,
නමුචීවධුයාගමනං දමනං-පණමෙ රතනාවලිථූපවරං.

කමලාසනයාචනතො දිසනං-අමතාසනභූතලමොහරණං,
ධනපාලකආලවකා දමනං-පණමෙ රතනාවලිථූපවරං

බකසච්චකකාසසපනං දමනං-ඛිහයං හරිතුං ගහතො ගමනං,
නගරං සුමහං වරලිච්ඡවිනං-පණමෙ රතනාවලිථූපවරං.

යනාදීන් බුදුගුණ මෙසෙහි නිධාන කොරෙමින් වැඩ නැ. සිට පත්සාඩ අනුලා ජනනූයෙහි බනාගෙන සංඝයාවහන්සේ පිරිවරා එක්පසෙක හොපුරච්ඡායාවෙහි වැඩසිටිසේක. එකල්හි අමාත්‍ය පුත්‍රයා පිරිවරා ආචාහුද අභය ස්ථවිරයන්වහන්සේ පිරිවරා ආචාහුද ඔවුනොවුන් දුක සමාධිව දෙදෙනා එකතෙනදී උනුන් දක්වනු කැමතිව අමාත්‍ය පුත්‍රයා කැඳවාගෙන ගොස් තෙරුන්වහන්සේ දක්වූහ. එකල ඒ මහතෙරුන් වහන්සේ දුක මහත් ආදර ගෞරවයෙන් පසඟ පිහිටුවා වැඳ අපමණ සන්තොෂයෙන් තෙරුන්වහන්සේ බල බලා එකත්පසෙක සිටියහ. එකල්හි ඔහු හා සමග තෙරුන්වහන්සේ සතුටු සතුටුව පිළිසඳර කථාකොරෙමින් වැඩසිටි කල්හි එතැන්හි රැස්වූ ජනයෝ ඒ දෙදෙනා ඔවුනොවුන් හා සමග කියන්නාවූ ප්‍රිය වචනයන් අසා හැම උනුන් මුහුණ බලමින් කලකින් එකතැන්ව එක්වැනි රූපශොභාවෙන් උනුන් ඇස දක්වා එක්වැති ප්‍රිය කථා කරන සැටි බලවයි කිය කියා මහත් සන්තොෂයෙන් සිටියහ. එකල්හි තෙරුන්වහන්සේ ප්‍රිය පුත්‍රයකු හා සමග කථා කරන ප්‍රෙමහරිත මැණිනෙනෙකුන්සේ අමාත්‍ය පුත්‍රයා බලා ඕහට කියනසේක්: එම්බා දරුව පෙර තෙපි මහලුවහත්දූ හැමදී මළුයෙහි කුණු දමාලා දැන් රූ ඇත්තම්හයි බැහවෙමින් මෙතනට අවුදූයි කීසේක. එබස් අසා පිරිවරා සිටි ජනයෝ එකපැහැර මහතෙරුන්වහන්සේ වැඳ වැතිර කිඹෙක්ද ස්වාමිනි නුඹවහන්සේගේ පූර්වකාරණාව නුඹවහන්සේට මුත් දැන් අප හැමට කවරබවත් නොදනෙයි එසේ හෙයින් අප ඇමට පූර්ව චරිත්‍රය හැඟෙනලෙස ප්‍රකාශකොට වදාළමැනවැයි කීහ.

එකල්හි තෙරුන්වහන්සේ මළුහැමදී තමන් වහන්සේගේද කුණු දැමූ මහලු මිනිසාණන්ගේද පූර්ව චරිතය ගෙනහැර එතැන්හි රැස්වූ ජනයන් මධ්‍යයෙහි ප්‍රකාශකොට දක්වනසේක්: යටගිය දවස තුන් රජයකින් සජ්ජිතවූ මේ සිංහල ද්වීපයෙහි එක්පසෙක පූර්ණකාත සුකාශාභාග්‍රයෙන් ප්‍රතිලභ්‍යමාන කාලඥෙහපතිය ම ඃ

මෞක්තිකාදී නානාවිධ රත්නයෙන් හා විවිධදෙශජ ඛොම කොසෙය්‍යාදී පට්ටසාටක කාශිකාම්බර ප්‍රාවාර කම්බලාදී අච්ඡාදන පාරුපණ ආස්තරණසාණි විතානාදීවූ අනෙකාම්බර විශෙෂයෙන් හා මනොඥ ස්තන්‍යාමෘත ප්‍රදායක සතෙලක අජෙළක ගව මහිෂාදීන් සම්පූර්ණව ජඞ්ගණාදීන් හා ස්වකීය කාලානුකූල සශ්‍යඵල දායක සාලිසීසොද්භාරයෙන් මඳක් නම්නවූ හැල්පඳුරු සුපිරි නොසිඳුරු උරුකෙත්වතින් හා ලසුන හලිද්දි සිඞ්ගිවෙර හිරිවෙර සූපෙය්‍ය පර්ණ මුද්ග මාසාදීන් හා රම්භාම්බ ජම්බීර පර්ණසාසන තාල හින්තාල නාලිකෙර ක්‍රමුක වෘක්ෂාදීන් සජ්ජිත අනෙක උද්‍යාන පන්තීන් හා තවද ස්වකීය විභවානුරූප ස්වර්ණ රජත තාම්‍ර ලොහ මෘද් දන්ත කාෂ්ට නාලිකෙර කපාලාදීවූ ක්‍රීඩා භාජන සදාගෙන ඔවුනොවුන් පරයා ඔබිමොබ දිවෙමින් පුලින පාංශුන් පැහැරගෙන අතුල් සුන්වලින් මැන මැන බෙදමින් භාජන තබා පුරාගෙන ඩොවන පවන භුක්ජනාකාර දක්වමින් පාංශු වැකි උදර තන හස්තපාදාදීන් යුක්තව අන්‍යොන්‍ය විරොධ ප්‍රහරණ පරුෂ භාෂා භණනයෙනුදු ක්ෂණයෙකම සහනය කොරෙමින් සිහිමඳව ඔවුනොවුන් හා ප්‍රිය සම්භාෂණයෙන් සන්තොෂව වෙදිකා ස්ථල නිම්බකොසාන්ත අඞ්ගණ තෙලක සාලා සූචිමාර වතිමාර සාලාදිවූ නොයෙක් තැන්හි කෙළිමඬුලු බැඳගෙන ඔබිනොබ දිවෙමින් අඬමින් අද නෙත් මද නෙපුලෙන් සැනහෙමින් බොලඳින් ආර්ද්‍රවූ වචනාමෘත බින්දූන් මාතෘ පිතෘ නප්තෘ ආදීන්ගේ කර්ණාන්තයෙහි බහමින් මධුරාර්ද්‍ර වචනාමෘත පුෂ්පයන් ඔවුනොවුන්ට දෙමින් ප්‍රෙමණීය වචනයන් කිය කියා කෙළනාවූ අපමණ සූනු බිලිඳුන්ගෙන් හා තවද යෞවන ජන ශබ්ද ගන්ධයෙන් දන්ධකාරවන මනොඥ තනු ප්‍රභාසම්පන්න රූපවත් මඤ්ජුවාණී භණිත ශ්‍රවානන්දාවහ අනෙකප්‍රකාර විශිෂ්ට ප්‍රමදාභරණ භූෂිතව විචිත්‍ර වස්ත්‍රාලංකාරයෙන් සැරහී විබුධවධූන්මෙන් ක්‍රීඩා පරව සරන අතරුන ශාන්ත තරුණ ස්ත්‍රීන්ගෙන් ගැවසීගත්තාවූ ගෘහපංතීන් හා තවද ධර්ම ලාලස විසාරද ශ්‍රද්ධාවත් උපභොග පරිභොග වස්තුවෙන් ආඪ්‍යවූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශූද්‍රාදීවූ ඉසුරුමත් මහාජනයාගෙන් ගැවසීගත් ග්‍රාමශ්‍රෙණීන්ගෙන් හා අධුනාගත නානාවිධාර්ථීන්ට අභිමත ප්‍රදාන සුරද්‍රුම නිභ සභා සාලා වල්ලි මණ්ඩප මන්දමාරුතොපණීත ශෛත්‍ය ද්‍රුමච්ඡායාදීවූ මනොනන්දන ප්‍රදෙශ ශොභිත ප්‍රඛ්‍යාත රුහුණු නම් ජනපදයෙහි අනෙකප්‍රකාර වර්ණාභි රක්ත මාරුතානුගත කෙතු මාලාකුල ජම්බු අංකුරොද්ගත ප්‍රභා නිභ සාතකුම්භ පූර්ණ කුම්භ ස්තූපාවලින් ලලිත ශ්‍යාමල පෘථුල උත්තුඞ්ග කූටාගාරහරිත විවිධ භූමිප්‍රභෙදයෙන් හෘදයඞ්ගමවූ තිස්ලක්ෂයක් පමණ ප්‍රාසාද

සමූහයෙන් ගැවසිගත්තාවූ උරග පුරොද්ගතව පරිවර්‍තිත වූවාක් මෙන් අනෙක සතසහස්‍ර පරිමිත පසාරිතාපර්‍ණ පතනීන් ශ්‍යාමාන වහවූ සියගණින් වීපි පතාකියෙන් නිරන්තරවූ එකාවන්ව පෞෂධාඞ්ග ශීල නිත්‍ය ශීල චාරිත්‍ර ශීල පාලන දානාදී කුශල ක්‍රියාවෙහි නියුක්ත මහජනයාගෙන් ගැවසිගත්තාවූ දන් මාගමයයි යන පුරප්‍රවරාසන්නයෙහි පරමරමණීයවූ භූමි ප්‍රදෙශයෙක්හි මුනි මැදුරු දාගැබ් මහබෝ සංඝාරාම විහාර විනයාසයෙන් ශොභමානව කෙළගණින් භික්ෂු සංඝයා වහන්සේට වාසස්ථානවූ **කාදරගමු** පුරයෙහි විහාරයෙක් විය ඒ විහාරයෙහි ශ්‍රද්ධාබුද්ධිසම්පන්න උපාසකයක්හු විසින් කරවා කප්පිය පරිෂ්කාර සහිතව පිළිගන්වනලද එක් පිරිවෙනෙක්හි වත් පිළිවෙත් සරු ක්ෂීණ යෞවන එක් තෙරකෙනකුන්වහන්සේ වැඩ වසනසේක. **එසේහෙයින් කියනලදී**—

"ලංකාතලෙ කාවරගාමකො'ති—පසිද්ධනාමො'සි පුරු විහාරෙ,
බහූහි ථූපෙහි විරාජමානො—මුනින්දබිම්බාලයපන්තියුත්තො.
විභූසිතො බොධිමහීරුහෙහි—විරාජිතො සෙතසු'මාලකෙහි,
'සුදස්සනීයො පරිවෙණකෙහි—පීතිං පවඩ්ඪෙති සදා ජනානං.
තස්මිංවසන්තො මුනිරාජපුත්තො-සුපෙසලො
තෙකගුණාධිවාසො.
කතාදරෙ සබ්බජනෙහි සම්මා—කාරෙති අත්තත්ථ පරත්ථසිද්ධිං."

යනාදීන් සියලු ජනයන්ට කුශල ක්ෂෙත්‍රව වසන්නාවූ ඒ තෙරුන්වහන්සේ දවසෙක ඒ මහා විහාරයෙහි සුලක්ෂණ වළය රක්ෂාවරණාභ්‍යන්තරවූ සුවිසද පුලිනතල මැද චම්පක නාග කණිටක වෙත්‍ර ප්‍රසූන ස්තබකාදී සජ්ජිතවූ තුන්මාල් පියවසා මස්තකයෙහි පද්ම බුද්බුද චතුරස්‍රකාණ්ඩ සුරංගාණ්ඩාධිවජත්‍ර මස්තකයෙහි ද්වාත්‍රිංශත් වර ධරණීධර කිරීට විද්‍යොත මණි සුබද්ධ සුවර්‍ණ ශෘංගයකින් ශොභමානව භික්ෂාටනයට භස්මාඞ්ගරාග ගත් මහෙශ්වරයා නිශ්චලව හුන් කෛලාසකූටය රළපතර සංකීර්‍ණ ක්ෂීර සාගර ජලතලා මධ්‍යයෙහි නොපිහිටියෙන් මුත් එබඳුයයි යන උපමා විෂයාතික්‍රාන්තව මිහිමඬල මැඩ ශිලන එලිකමය ධරණීධර සිඛරයක්මෙන් අත්‍යුච්ච සථූල ස්තූපය සිසාරා පිහිටි මහවැලි මළුව හැමඳ කුණු ගොඩගසාට ඒ විහාරයෙහි ප්‍රතිමා ගෘහ ජඞ්ගනාදියෙහි නියුක්තගත වයස්ථාම යෞවන දනාදීන් යුක්ත ප්‍රාග්භාර මහලු මිනිසකුට කුණු දමන්ට කීකල්හි ඒ උපාසකාදි මහත්වූ සමාධින් කුල ශීල රූප ඥාන සුවිශුද්ධත්වය ප්‍රාර්‍ථනා කොරෙමින් කුණුගොඩ දමා කුසල්රැස්කොළේය. එකල්හි දාගැබ් මළුව හැමදි මහ තෙරුන්වහන්සේ ඒ වෛහෙර මහණදම් පුරා වැස කාල්‍යාමකින් ඒ ආත්ම භාවයෙන් චුතව අපරිමිත ශ්‍රී සෞභාග්‍යයෙන් විරාජිත මෙම ශ්‍රී ලංකාවීපයෙහි **අනුරාධපුර**

නුවරට නුදුරු නොහා සසමය භක්ති පුරස්සර කුලදරුවන්ට වාසස්ථානවූ එක් ගමෙක් විය. ඒ ගම්හි උභයකුල පරිශුද්ධ ආචාර ශීල ශ්‍රද්ධා සම්පන්නා එක් කුලයෙක්හි අභිනව යෞවනයෙන් ජනනන්දනය කරවන එක් පුරුෂයෙක්හු තිස්ස භාව භාවයෙන් ප්‍රෙමණීයවූ ආචාර ශීල පාලිත කාන්තාවකගේ කුස පිළිසිඳ දස එකඩ මසක් වැස බිහිවූහ. එසඳ පූර්වයෙහි දගැබ් මළුව ඇමදි කුශලානුභාවයෙන් රන්රුවක් මෙන් සියලු සත්වයන්ට වඩා ප්‍රභාවත්වූ රූපසම්පත්තියක් ලැබ වැඩිවිය පැමිණ බුදුසසුන් වැද මහණව අභය ස්ථවිරයන්වහන්සේයයි යන නමින් ප්‍රසිද්ධව විදර්ශනා වඩා රහත්ව නිවන් දිටිමි, එකල්හි ඒ දගැබ් මළුයෙහි කුණු දමූ වයෝවෘද්ධ මිනිසාණෝද ඒ ආත්ම භාවයෙන් චුතව මෙම ශ්‍රී ලංකාද්වීපයෙහි සකල භූපාල මූලාලය පවත්ති විකල විලොප දුර්ගාවල සමස්ත නාගරාඞ්ග සම්පත්තීන් සමෘද්ධ ත්‍රිවිධ රත්නමණීන් සනාථ අනුරාධපුර නුවරෙහි ධනාඪ්‍ය එක් අමාත්‍යයෙක්හට පුත්‍රව ඉපිද ඉතා යහපත්වූ රූපයෙන් දුටු දුටුවන් නෙත් හයා නොයන තරම් රම්‍යවූ ශොභාවෙන් යුක්තව වැඩිවිය පැමිණ අමිත මනුජශ්‍රී අනුභව කරන්නාහ, ඒ මේ අමාත්‍ය පුත්‍රයා අද දිටිමි, එසේහෙයින් මේ අමාත්‍ය පුත්‍රයා නම් එදවස් හැමදි මළුයෙහි කුණු දමූ මහලු උපාසකයාය, ඒ මළුව හැමිදි මහතෙරුන්වහන්සේ නම් තමන්වහන්සේයයි කියා මේ පූර්ව චරිතය ගෙනහැර දැක්වූසේක. එකල්හි එහනට රැස්වූ හැම ජනයෝ ප්‍රීතිමත්ව සාධුකාර දෙමින් ඔල්වරසන් දෙමින් අත්පොළසන් දෙමින් උතුරුසළු හිස නටවමින් ඔවුනොවුන්ගේ උරෙන් උර පහරමින් සන්තොෂ ගීතිකාවෙන් තෙරුන්වහන්සේට ස්තුති පූජා කළාහ. මෙසේ දගැබ් මළු හැමදි කුශලයෙන් අභය ස්ථවිරයන්වහන්සේ ලද්දාවූ ප්‍රසාද සංවර්ධන කුශල ඵලයද කුණු දැමූ අමාත්‍ය පුත්‍රයා විසින් ලද්දාවූ කුශල ඵලයද සිත් තබාගෙන තමහට වැඩකැමති සියලු සත්වයන් විසින්ම මළු හැමදීම ආදිවූ යහපත් සුකෘත කර්මයෙහි නියුක්තව සකල කෙලශයන් ප්‍රහීණ කොට චතුරාර්‍ය සම්පත්ති සංඛ්‍යාත නිර්වාණ සම්පත්තිය හස්ත ප්‍රාප්ත කරන්ට උත්සාහ කටයුතු. කියනලද්දේමැයි—

"එවං සො සුගතොරසො සුමනසා සම්මජ්ජනෙනඞ්ගණං
සම්මා සග්ගපවග්ගියං ලභි ඵලං උක්කලාපකාවජ්ජකො,
එවං සග්ගමනුස්සභොගමමිතං සාරං අලද්ධබ්භුතං
අම්හෙ තං විය සම්පදං ලභථ සම්පාදෙථ මොක්ඛප්පදං."

**මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි**
**සවන සම්මජ්ජනානිසංස ප්‍රකාශක අභය ස්ථවිර කථානම්වූ**

## එකුන් විසිවන පරිච්ඡේදය.

**නිමා නිමවනලදී.**

# 20 වෙනි පරිච්ඡේදය

## කවද මේ සද්ධර්මරත්නාකරයෙහි සම්මජ්ජනානිසංස කථාවන්ට අනතුරුව සංඝාද්ගුණ අම්බමූල අන්‍යතර ස්ථවිර කථානම් ආවරණයක්?

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

කවරෙද්දයත්? සකලලොක හිත විධායකවූ උද්ඝටිතඥය විපංචිතඥය නෙයයයි යන ත්‍රිවිධවූ සම්‍යක් සම්බුද්ධවරයන් වහන්සේගෙන් දීර්ඝායුෂ්කවූ බුදුන්ගේ ත්‍රිවිධ ශාසනය බුදුන් පිරිනිවි බොහෝකලක් නොපවත්නා හෙයින් සම්මුඛ ශ්‍රාවකයන් වහන්සේගේ ළඟ මහණව තිසගත් භික්ෂූහු විනා තුන්වැනිව ඒ භික්ෂු තෙම වෙන කෙනෙකුන් මහණ කරවා තිසදී ශාසනය වර්ධනය කළ නොහෙන්නාහ ඒ භික්ෂූන්ගේ ආයුෂ්කල්පය සම්පූර්ණවීමෙන් මත්තෙහි ඒ ශාසනය නොපවත්නේය ආයුෂය මඳවූ සර්වඥවරයන් වහන්සේගේ ත්‍රිවිධ ශාසනය එ බුදුන් පිරිනිවි කල්හිදු ශ්‍රාවකයෝ අනුබුද්ධ කෘත්‍යය සිද්ධකොට මහණ කැරවීම් තිසදීම් කර්මස්ථානදීම් ආදිවූ ශ්‍රමණ කෘත්‍යයන් සිද්ධකොට ජගදභිවෘද්ධි වර්ධනය කොරෙමින් ධර්මදෙශනාකොට හෙතු සහිත සත්ත්වයන්ට සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් මාර්ග ඵල දෙමින් නිවන් දක්වා පරිච්ඡේද කාලාන්තරයක් මුළුල්ලෙහි පිළිවෙළින් ඒ ශාසනය පවත්වනසේක. එසේ හෙයින් අපගේ සර්වඥයන්වහන්සේ නිවන්පුර වැඩි පන්දහසක් හවුරුදු දක්වා මහා සංඝයාවහන්සේ ශාසනය පවත්වනසේක. ඒ ශාසනොපකාරීවූ අනූනය ප්‍රතිඝ පරිත්‍යක්තවූ පක්ෂ එෂණයට නොනැමෙන වජ්‍ර පර්වතමෙන් ඍජු ගුණඇති පක්ෂපාත රහිත සුගතෞරස මහාසංඝයා වහන්සේගේ විද්‍යමාන ගුණ සමූහයෙන් මඳක් ප්‍රකාශකොරෙමි. හෙද නිවන්පුරට වදනා කැමති සත්පුරුෂයන් විසින් අවික්ෂිප්තව ඇසියයුතු, පන්දහසක් අවුරුදු මුළුල්ලෙහි බුද්ධශාසනය පවත්නාවූ මේ සිංහලද්වීපයෙහි බොහෝ භික්ෂූන් වහන්සේට වාසස්ථානවූ එක්තරා විහාරයෙක්හි සිට කිසි කටයුත්තක් පිණිස එක් තෙරකෙනෙකුන් වහන්සේ එකාකීව අධ්වනමාර්ග ප්‍රතිපන්නව වඩනාසේක්: එක්තරා ගමක සැතපී උදසන්හී කළමනා ශ්‍රමණ කෘත්‍යය සම්පාදනය කොට ගැටවවු ගන්වා පාත්‍රය සරුප්ලෙස අල්වා ගොචරග්‍රාම ප්‍රවිෂ්ටව භික්ෂාචාර වෘත්තියෙන් හැසිර එකලට බොහෝ දුර්භික්ෂ හෙයින් අහර නොලැබ ගමතින් කැළඹුණු හෙයින් යාත්‍රාවට අසමර්ථව ඵලගෙන පැසුණු එක් අඹගසක් මුල චෛත්‍ය ඡායාවෙහි හිඳිනට අසමර්ථව සැතපුණුසේක. අහෝ මහාත්මයන්ගේ ධර්ම

ගෞරවයක් ආශ්චර්ය්‍ය නියාය, ගම්නාහාර වෛකල්‍යයෙන් ජීවිතාවසාන වන තරම් ශරීර මර්දනය උවද ශික්ෂාපද මර්දනය නොකෙරෙමියි බොහෝ මධුරාම්‍රඵල පතිතව තිබුණාසින් එක අඹගෙඩියකටත් අත නොපොවා ඒ හැම හලාහල විෂමෙන් සලකා සැතපුණුසේක. හේ එසේමය.

"ධනං චජෙ යො පන අඞ්ගහෙතු
අඞ්ගං චජෙ ජීවිතං රක්ඛමානො,
අඞ්ගං ධනං ජීවිතං චාපි සබ්බං
චජෙ නරො ධම්මමනුස්සරන්තො."

මෙසේ ඒ ගිලන් භාවයට පැමිණි තෙරුන්වහන්සේ සහකාර ද්‍රැම මූලයෙහි සයනය කළ කල්හි උන්වහන්සේ පූර්වකෘත අපරාපර්‍ය්‍ය වේද්‍ය කුශල කර්මානුභාවයෙන් ඒ ස්ථානයට නුදුරු අසල් ගම්වැසි වයෝවෘද්ධ උපාසකයෙක් අඹ ඇසිඳ කන්ට ඒ ගසමුලට පැමිණියේ: එතැන්හි ආහාර විකලත්වයෙන් සැතපෙන්නාවූ තෙරුන්වහන්සේ දැක ළයපිරුණු ශොකයෙන් උන්වහන්සේ ළඟට ගොස් බණ්ණවා මාගේ ස්වාමිදරුවාණන්වහන්ස මේ තමන් වහන්සේට පැමිණියේ කවර අනාථ සරණයෙක්දැයි හඬ හඬා බැණවියදීත් බැණ නැඟී ගත නොහෙන හෙයින් අඹරස මර්දනයකොට පාද වළඳවා එතනින් නැඟිසිට යාමට ශක්ති මඳ බව දැන තෙරුන්වහන්සේ තමාගේ කරමුදුනේ තබාගෙන තමා වසන ගමට යනු පිණිස නික්මුණේය. එකල්හි තෙරුන්වහන්සේ මදක් සිහිපත්ලදින් ඔහුගේ කරමුදුනෙහිම හිඳ සිතනසේක්:

"න පිතා නපි මෙ මාතා–න ඤාතී නපි බන්ධවො,
කරොන්තෙත'දිසං කිච්චං සීලවන්තස්ස කාරණා."

යනාදීන් සිතනසේක් දැන් මේ පුරුෂතෙම පිතෘ නොවෙයි, මාතෘත් නොවෙයි, ඤාතිහුද නොවෙයි, අවශ්‍ය බන්ධු වගී බන්ධු පුරුෂයකුත් නොවෙයි, පූර්වකෘතොපකාරයට ප්‍රත්‍යුපකාර කරන්නෙකුත් නොවෙයි, ඒ හැම නොවිසිට මෙබඳු කෘත්‍යයක් කරනුයේ ගුණ සලකාමය, එසේහෙයින් සිල්වත් ගුණවත්වූ මා විසින් ඔහට කුශලය මහත්කොටම වර්ධනකළ මැනවැයි තමන් වහන්සේ තමන්වහන්සේටම අවවාද කොටගෙන භාවනා කෙරෙමින් විදර්ශනා වඩා ඔහුගේ කරමුදුනෙහිම හිඳ රහත්වූසේක. මෙසේවූ ව්‍යසනයෙකින් හිඳ අනුන් තමන්හට කළාවූ ගුණ සලකා සිත එකඟ කොටගෙන භාවනා කෙරෙමින් සොවාන් මාර්ගය ඵලය සකෘදාගාමි මාර්ගය ඵලය අනාගාමි මාර්ගය ඵලය අර්හත් මාර්ගය ඵලයයි යන සතරමග සතර ඵලයට පැමිණ කෙලෙසුන් සිඳ රහත්වූසේක. මෙසේ රහත්ව තිවත් දුටුවාවූ

ඒ තෙරුන්වහන්සේ මහත් සන්තොෂයෙන් සාරතබාගෙන තමා කළ කුශලානුභාවයෙන් ඒ ආත්ම භාවයෙහිම ලත් තිවන් භාරයක් මෙන් උද්වහනය කොටගෙන තමාගේ වාසස්ථානයටම ගොස් සරුප්නැහක සකස්කොට හිඳිනා අසුන් පනවා එහි වඩාහිඳුවා අපමණ සන්තොෂයෙන් පසඟ පිහිටුවා වැඳ පිරිසුදු සෙත සුන් පනවා සතපමින් දවන දවස් මහදන්දී අනුමෙවුති බණ අසා සවර්ග මොක්ෂ සම්පත් සිඬවන ලෙස කුශල වර්ධනය කොළේය. මෙබඳු ආශ්චර්‍යයීමත්වූ සංඝරත්නයෙහි ගුණ විශෙෂය සත්පුරුෂයන් විසින් නිරන්තරයෙන් සිත තබාගෙන තමතමන්ගේ ශක්ති පමණින් පූජාකොට ත්‍රිවිධ සම්පත් සිඬකරනලෙස මෙම ගුණ නිරන්තරයෙන් මෙනෙහි කටයුතු. **දක්වනලදමැයි-**

"සංවෙගං ජනයිත්වාන-සම්මසිත්වාන යොනිසො,
තස්සපිණ්ඩගතො සන්තො-අරහත්තමපාපුණි."

**මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි**
**ප්‍රථම සංඝාද්භූත අම්බමූල අන්‍යතර ස්ථවිර කථානම්වූ**
**විසි වන පරිච්ඡේදය**
**කීෂා නිමවනලදී.**

——०ः०——

# 21 වෙනි පරිච්ඡේදය.

**කවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**සංඝාද්භූත මිත්‍ර ස්ථවිර කථානම් කවරහෙයක්?**
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේදයක්?** මේ ශ්‍රී ලංකාවිපයෙහි සකල සම්පත්තින් අවිකලවූ රුහුණු නම් ජනපදයෙක් විය, ඒ ජනපදයෙහි **කාසක** නම්වූ මහත් ගිරිගුහාවෙකැ මිත්‍ර ස්ථවිරයයි යන නමින් ප්‍රසිඬ සීලාචාර සම්පන්න එක් භික්ෂුකෙනෙකුන් වහන්සේ වැඩවසන සේක. එකල්හි උන්වහන්සේ භික්ෂාචාර වෘත්තියෙන් හැසිරෙන්නාවූ ගොචර ග්‍රාමයන් අතුරෙන් එක් ගමෙක වයොවෘඬ ශ්‍රඬාවත් උපාසිකා කෙනෙක් වසන්නාහු ඒ තෙරුන්වහන්සේ දුටුකල්හි පටන් තමන්ට පුත්‍ර සෙනහ උපන් හෙයින් පැදෙන පමණින් උන්වහන්සේට උපස්ථාන කරන්නාහ. මෙසේ උපස්ථාන කරන්නාවූ උපසිකාවෝ එක් දවසෙක්හි දරු එලාඑලශාබාදීවූ ජීවනොපසාරණ පිණ්ස වන අතුරකට නික්මෙන්නාහු තමන්ගේ දුවණියන් කැඳවා කියන්නෝ එම්බා දියණියෙනි මම දර පලා ආදිය ගෙනෙන පිණිස වලටයෙමි, එසේහෙයින් නුඹ කිසිවකැටික් ප්‍රමාදනොවී ගෙයි අඇවල් තැන නැවුන් සැලියෙහි

පැර පැස තුබූ සුදුහැල්සාල අසවල්තැන කිරිය අසවල්තැන සැලියෙහි එලගිතෙල අසවල්තැන මුට්ටියේ උක්සකුරුය අසවල් තැන සැලියෙහි කාකාළපැනිය, මේ හැම ඇරගෙන අප්‍රමාදව යහපත්සැටියේ දන් පිස තබා නුඹගේ බෑණන් වහන්සේ වැඩි කල සකස්කොට මා මෙතන සිටියාසේම දන් පිළිගන්වාලා නුඹත් එම බතින්ම බත් අනුභව කරන්න, මම ඊයේ දවස පිසූ බතින් තිබූ පැන්බත් අද උදුසන අනුභව කෙළෙමි, පුතාණෙනි මා, දහවල් බත්කන්නේ කිම්ද සවස මා එනකාලට ශාකපර්ණ බහා තිඹුඹු සහලින් ඇඹුල් කැඳ පිස මටත් තබාලන්නැයි කියා වලට නික්මුණාහ. එකල තෙරුන්වහන්සේ කල්තබාම ගැට වටු ගන්වා පාත්‍රය අතින්ගෙන භික්ෂා චාත්තියෙන් වඩනාසේක්: ඒ ගෙදර සමීපයට පැමිණිසේක: ඒ උපාසිකාවන් දියණියන්ට කියන මෙහෙවර අසා සිතනසේක්: මේ උපාසිකාවෝ මෙ ජාති යෙහි මට නෑසියකමක් ඇති කෙනෙකුත් නොවෙයි. මාගෙන් කිසි උපකාරයක් විඳිකෙනකුත් නොවෙයි. එතකුදුවූවත් තුමූ උදුසන සිහිල් බත් අනුභවකොට දවහල් බතුත් නොකා සවසට තිඹුඹු සාලේ ඇඹුල් කැඳ පිස තබන්ට කියා මට හැල්සාලෙහි බත් කිරින් පිස එලගිතෙල් වත්කොට කාකාළ පොල්පැණි මිශ්‍ර කොට උක්සකුරු සහිතව පිළිගන්වාලන්නැයි කියති. මෙසේ මට දෙන්නාවූ ආහාරය ක්ෂේත්‍ර වස්තු ආදිවූ තමන් ජීවනෝපා යක් උදෙසා දෙන දෙයකුත් නොවෙයි, එකාන්තයෙන්ම පර ලොව ලබන ත්‍රිවිධ සම්පත්තිය උදෙසාම ප්‍රාර්ථනාකොට දෙන් නාහුමය, මා විසින් ඒ දිව්‍ය මනුෂ්‍ය නිර්වාණ සම්පතැයි යන ත්‍රිවිධ සම්පත්ති දෙන්ට හැකිව මේ ආහාරය වැළඳිය යුතුය, සරාගීව සද්වේෂීව සමොහිව නොවැළඳිය යුත්තේයයි සිතා සිඟනු පිණිස පාත්‍ර පසියෙන් එළියට ගත් පාත්‍රය දෙවෙනිවත් පසියෙහි බහා බැඳගෙන ගැටවටු ගළවා සිවුරු වැළඳගෙන පාත්‍රය කරලා ආපසු කස්සක නම් ලෙනට වැඩ පාත්‍රය මුදා ඇඳයට තැටිලිපත පිට වත් තමා තබා සඟළ සිවුරගෙන සිවුරු වසයෙහි තබා ඇට නහර සම් මස් ජීර්ණවයේ නමුත් රහත් නොවී මේ ස්ථානයෙන් නොනැඟී සිටිමියි අධිෂ්ඨාන කොට සැපවිහරණවූ ආසනයෙහි වැඩඋන්සේක. එකල්හි මඳකාලක් භාවනාකොට එම පෙරවරු භාගයෙහිම විදර්ශනා වඩා සොවාන් ආදිවූ සතර මග සතර ඵල යට පැමිණ නිර්වාණ සම්පත්තිය සිඬකළසේක. එකල්හි ඒ ගිරි ලෙන දොර සමීපයෙහි වෘක්ෂයෙක වසන දෙවතාවෙක් උන් වහන්සේ කෙරෙහි ප්‍රසන්නාව උදාන වශයෙන් කියනුයේ:

“නමො තෙ පුරිසාජඤ්ඤ-නමො තෙ පුරිසුත්තම,
යස්ස තෙ ආසවා ඛීණා-දක්ඛිණෙය්‍යොසි මාරිස.”

යනාදීන් උදාන වශයෙන් ප්‍රශංසාකොට ස්වාමීනි නුඹවහන්සේ සේම රහතුන්වහන්සේට දන් දෙන්නාවූ මැයැල්ලෝ දුකින්මි;

මහත් සම්පත්තියෙහි පිහිටා යෞවනශ්‍රීන් ජ්‍යොතිෂ්මත්ව සුර සිරි විඳිමින් කොළවර අමාමහ නිවන් දක්නාහු වේදැයි කීහ. එකල්හි දිව්‍ය පුත්‍රයා කීවාවූ උදාන වචන ඝොෂාව අසා තෙරුන් වහන්සේ හුනස්නෙන් පැනනැගී දොරහැර අවුත් වේලා බලා වැළඳීමට පෙරවරු වේලා ඇතිබව දැන ගැට වටු ගන්වා පාත්‍රය අතින් ගෙන පිඩු පිණිස ගමට වන්සේක. එකල්හි උන්වහන් සේගේ කුලුපගවූ මැහැලි උපාසිකාවන් කිලෙසම දුවණියෝද දත් පිළියෙළකොට ගෙන හුන්නාවූ මාගේ බෑණන්වහන්සේ වඩනාසේකැයි සිතා දොර හැර පෙරමග බල බලා හිඳ තෙරුන් වහන්සේ ගෘහද්වාරයට වැඩ සිඟා සිටිකල්හි පාත්‍රය ගෙන ගිතෙල් පැනි සකුරු මිශ්‍රවූ මධුරක්ෂීර පායාසයෙන් පාත්‍රය පුරා මිත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිගැන්වූය. එකල්හි ඒ තෙරුන් වහන්සේ ඒ ළදැරියට දානානුමොදනා ධර්මය වදුරා පාත්‍රය ගෙන ඈ බල බලා සිටියදීම අහසට පැනනැගී තමන් වහන්සේ වසන ගිරිගුහාවටම වැඩ අහර වළඳා ඔවුන්ට කුශල වර්ධනය කළසේක. එකල්හි වල්ගිය මෑණියෝ අවුත් කිමෙක්ද දියණියනි තොපගේ බෑණන්වහන්සේ වැඩිසේක්දැයි විචාළහ. එබසට ඒ ළදැරි කියන්නී අනේ මාගේ මෑණියෙනි බෑණන්වහන්සේ මෙතෙක් කල්සේ නොවනසේක. අද දවස ඉතාම යහපත්ව ජ්‍යොතිෂ් මත්ව බබළන්නාවූ රූපශොභාවක් ඇතිසේක, අභිනව සුපුෂ් පිතවූ පියුමක් මෙන් ශොභාමානවූ මුඛමණ්ඩලයක් ඇතිසේක, අම්මේ මම වෙන වෙන කියාගත නොහෙමි, මාගේ බෑණන් වහන්සෙ අද මාගේ ඇසට ඉතාම යහපත්ව බබළන සේකැයි කීය. එබස් අසා ඒ උපාසිකාවෝ සිතන්නාහු: එසේකල මාගේ පුතණුවන්වහන්සේ තමන්වහන්සේ ලත් ප්‍රව්‍රජ්‍යායෙහි සඵ ලබ්ධය අද දවස් මස්තක ප්‍රාප්ත කළසේක්වනැයි දැන මහත්වූ සන්තොෂයට පැමිණ පුත තොපගේ බෑණන්වහන්සේ ශාසන යෙහි උත්කෘෂ්ටභාවයට පැමිණිසේකැයි කියමින් එතැන්පටන් වඩ වඩා ශ්‍රද්ධා උපදවමින් උන්වහන්සේට උපස්ථාන කොට ඒ ආත්මභාවයෙන් චුතව ඒ කුශලානුභාවයෙන් සුරසිරින් විසිතු රුවූ දිව්‍යලොකයෙහි දිව්‍යවිමානයෙක ඉපද අප්‍රමාණවූ දිවසැපත් වැළඳූහ. එසේහෙයින් ත්‍රිවිධභව භොග දායකවූ අප්‍රමාණ ගුණාන්විත සීලවන්ත ශාන්ත සුගතොරස මහසංඝයාවහන්සේට චතුර්විධ ප්‍රත්‍යයෙන් උපස්ථාන කොට කැමැති වස්තු සිද්ධකරන්ට උත්සාහ කටයුතු. කියන ලදුයේමැයි–

"දානං දත්වාන ගතවයසා මාතුගාමෙන ථෙරෙ
සම්මොදිත්වා සුරපුරසිරිං ලද්ධභාවං විදිත්වා,
සද්ධාවන්තෙන ගුණපගුණං සාධු සාසනඤ්ච කත්වා
දාතුං යුත්තං සකජනතා සීලවන්තෙසු දානං.

ශම්භොකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
දෙවන සංසාද්භූත මිත්‍ර ස්ථවිර කථානම්වූ
එක් විසිවන පරිච්ඡේදය
කියා නිමවනලදී.

# 22 වෙනි පරිච්ඡේදය.

## තවද මේ සද්ධර්මරත්නාකරයෙහි ධම්මදින්න ස්ථවිර කථා නම් කවරහයත්?

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේදයත්?** අප බුදුන්ගේ සද්ධර්මමන්දිරාකාරවූ මේ ශ්‍රී ලංකාද්වීපයෙහි ත්‍රිවිධරත්නොපාසිත මහිත අමිත ජන නිසෙවිත රුහුණු නම් දනව්වෙහි මහගු උරු සිරින් විසිතුරු **කාලගුරු** නම් වෙහෙර වසන සත්ව චිත්තානුකූල නිර්මලධර්ම **ධම්මදින්න** නම් මහ තෙරකෙනෙකුන්වහන්සේ භික්ෂු සංඝයාවහන්සේට කර්මස්ථාන භාවනාකසිණ පරිකර්මොපදෙශාදිවූ අවවාද දෙමින් මහසඟපිරිස් සද්ධර්ම මාර්ගයෙහි හසුරුවා සංඝපරිනායකව වසනසේක. එකල්හි ඒ ධම්මදින්න නම් ස්ථවිරයන්වහන්සේ එක් දවසෙක දිවාවිහාරස්ථානයෙක්හි වැඩහිඳ දිවසින් බලනසේක්: කිම්ද්‍යෙහෝ අපගේ ආචාර්ය්‍ය **උච්චවාලිකා** වාසී **මහානාග** ස්ථවිරයන් වහන්සේට ශ්‍රමණ කෘත්‍යාධිගමය මස්තකප්‍රාප්තාවී ද්‍යෙහෝ නොවී ද්‍යෙහෝයි බලා උන්වහන්සේ රහත්නුවූ බව දැන මම දැන් උන්වහන්සේ සමීපයට නොපැමිණියෙම් විම්නම් රහත්වීම ප්‍රමාදවන්නේයයි දැන වැඩහුන්නාවූ තැනින් අහසට පැනනැගී සෘද්ධිප්‍රාතිහාර්ය්‍යයෙන් දෙවියන් පොළඹමින් අහසින් ගොසින් තමන්වහන්සේගේ ආචාර්ය්‍යවූ මහානාග ස්ථවිරයන්වහන්සේ දිවා විහාරයෙන් වැඩහුන්නාවූ ස්ථානයට ගුවනින් බටසේක. එසේ වැඩි තෙරුන්වහන්සේ ආචාර්ය්‍යයන්වහන්සේට මහත්වූ භක්තියෙන් වත් දක්වා පත්කඩ තබා වැඳ එකත්පස්ව උන්සේක. එකල්හි මහානාග ස්ථවිරයන්වහන්සේ ශිෂ්‍යයාණන් වහන්සේට කියනසේක්: කිමෙක්ද ධම්මදින්නයෙනි අකාලයෙහි කුමක් පිණිස අවුදැයි විචාළසේක. එබසට ධම්මදින්න ස්ථවිරයන්වහන්සේ කියනසේක්: ස්වාමීනි ඔබවහන්සේගෙන් ප්‍රශ්න විචාරනු පිණිස ආයිමියි කීසේක. එබසට මහානාග ස්ථවිරයන් වහන්සේ කියනසේක්: ඇවැත්නි ප්‍රශ්න විචාරව, හැකිපමණක් විසර්ජනය කරමෝවේදැයි කීසේක. එසඳ ශිෂ්‍යයාණන් වහන්සේ ආචාර්ය්‍යයන්වහන්සේ අතින් ප්‍රශ්න දහසක් පුළුවුත් සේක. උන්වහන්සේ විචාළාවූ ප්‍රශ්නදහසම ආචාර්ය්‍යයන්වහන්සේද විසර්ජනය කළසේක. එසේ විසඳූ ප්‍රශ්න දහසට පිළිවෙළින්ම මහත් සමාධිව ප්‍රශංසාකොට ස්වාමීන්වහන්ස නුඹවහන්සේගේ ප්‍රඥව අති තීක්ෂණය කවර කලෙක්හි නුඹවහන්සේ මාර්ගඵලයට පැමිණිසේක්දැයි දැන්වූසේක. එබසට මහනාග ස්ථවිරයන් වහන්සේ කියනසේක්: ඇවැත්නි මඳකලෙක්ද දැන් පූරාම සැට

අවුරුද්දෙක් නොවේදැයි කීසේක. ස්වාමීනි සමාපත්තියටත් සම වදනා සේක්දැයි පුළුවුත්හ. ඇවැත්නි සමාපත්තියට සමවැදිමුත් අප ඇමට ආශ්චය‍ර්යයෙක්දැයි කීසේක. ස්වාමීනි එසේ වීනම් තමන්වහන්සේට ඉදිරියෙහි මහත් හස්තිරාජයකු මැවුව මැන වැයි කීසේක. ආචාය‍ර්යයන් වහන්සේද එවිට ශිෂ්‍යයාණන් වහන්සේ කීලෙසම හස්තිරාජයකු මවනසේක්. මහත්කන්තල පුවළු දළ දළින් බබළන සප්තස්ථාන ප්‍රතිෂ්ඨිත සම්පූර්ණ ගාත්‍ර ඇති ධවල නිර්මල කෙළෙස් කුළුවැනි පැහැදුළු ත්‍රිමදගල ගජරාජ යකු මැවූසේක. ඒ ගජේන්ද්‍රයා දැක ශිෂ්‍යයාණන් වහන්සේ කියනසේක්: ස්වාමීනි ඇතු මැවූ තියාව ඉතාම යහපත, තෙල සිටිනා නාගෙන්ද්‍රයා නුඹවහන්සේට අභිමුඛව එනලෙස මැවුව මැනවැයි කීහ. තෙරුන්වහන්සේද උන්වහන්සේ කීලෙසම තමන්වහන්සේ ඉදිරියට ඇතු එන ලෙස අධිෂ්ඨාන කළසේක. එකල්හි පළිඟු කුළක් මෙන් සිටි ඒ භෛරව ගජරාජයා රජත යක්හු ඔසවා සල පහළ බාන් වැටියක්සේ සොඬ බිම පැහැර පෙණදිය ඉසමින් අකුලා මුඛයෙහි තබාගෙන කන්තල සිටුවා වාලධිය නගමින් හිස සලා ගුගුරා මදමතින් ඇවිස කිසිසතක්හු දුටුවන දන්තියක්හුසේ තෙරුන්වහන්සේගේ අභිමුඛයට සෙද එන්ටවන. මෙසේ තමන්වහන්සේම නිර්මිත කළාවූ දන්තා වලයා එනවෙගය දැක තැතිගෙන එවේලෙහි හුනස්නෙන් නැඟී දිවන්ට පටන්ගත්සේක. ඒ ක්ෂණයෙහි ශිෂ්‍යයාණන්වහන්සේ ගුරුන්වහන්සේට කියනසේක්: ස්වාමීනි මේ කිමෙක්ද රහතුන් වහන්සේටත් භයෙක් ඇද්ද ඉනුත් තමා මැවූ නාගෙන්ද්‍රයා තම හට කුමක් කෙරේදැයි කියා ගුරුන්වහන්සේගේ සිවුරුපට අල්වා ගෙන භය නොගත මැනවැයි කීහ. එසඳ තෙරුන්වහන්සේ සිතනසේක්: අතිස මාකොලේ කිම්ද, මෙතෙක්කල් මා රහත්මී සිතූ පමණක් විනා නොරහත්බව මටමදැනුනේ අද දවසය, පළමු කර්මස්ථාන ලැබ භාවනාකෙරෙමින් ගුරු උපදෙශවූ ලෙස පිළි පැදගත නොහි රහත්ව ගතනුහුණු තියාවේදැයි සිතා කලකිරු ණාවූ සිත් ඇතිව අතිජාත ශිෂ්‍යපුත්‍රවූ කල්‍යාණ මිත්‍රයාණන් වහන්සේ කෙරෙහි පැහැද මාගේ ශිෂ්‍යවූ ධම්මදින්නයෝ මට අවශ්‍යයෙන්ම පිහිටව සසරින් ගැලවීමට සිටියෝ වේදැයි කියා ශිෂ්‍යයාණන්වහන්සේ සමීපයෙහි උත්කුටිකයෙන් හුන්සේක. එසඳ උන්වහන්සේ කියනසේක්. ස්වාමීනි අද මම නුඹවහන් සේට අනුකම්පාවෙන් මා වසන විහාරයෙන්ම ආයෙමි, එසේ හෙයින්ම මම ඔබවහන්සේට අවශ්‍යයෙමි, කිසිසැකයක් නොසි තුව මැනවැයි කියා ගුරුන්වහන්සේට රහත්වන උපදෙශ කියා කර්මස්ථාන දුන්සේක. තෙරුන්වහන්සේද ශිෂ්‍යයාණන්වහන්සේ අතින් කර්මස්ථානගෙන ඒ ක්ෂණයෙහිම සක්මනට නැඟීසිට මඳක්

සක්මන් කරන්ට පටන්ගත්සේක: පළමු පියවරින් දෙවෙනි පියවර තබා තුන්වැනි පියවර තිබූ ක්ෂණයෙහි විදර්ශනා වඩා සිවු පිළිසිඹියාපත් රහත්වූසේක. එසේ හෙයින් ශිෂ්‍යව සිට පවා ඒ කියන ගුරුන්වහන්සේම දුන්නාවූ කර්මස්ථානයෙන් රහත්ව උන්වහන්සේට කළාවූ උපකාරය තමන්වහන්සේගේ චිත්තයෙහි නිධානකොට තබාගෙන ගුරුන්වහන්සේට දෙලොවින්ම වැඩ සිද්ධකරනු කැමතිසේක: උන්වහන්සේගේ ප්‍රමාදකමය උන්වහන්සේටම හඟවා සිත් ගෙන රහත්වීමට උපදෙශ දී සසරින් ගැලවූසේක. එසේහෙයින් නිවන්පුර සිරි ප්‍රාර්ථනා කරන සත්පුරුෂයන් විසින් කෘතොපකාරයෙහි ගුණ දැන ප්‍රත්‍යුපකාර කොරෙමින් ධම්මදින්න ස්ථවිරයන්වහන්සේ මෙන් පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි කීර්ති ප්‍රබන්ධය පවත්වාගන්ට උත්සාහ කටයුතු. කීසේක ලදුමෙසේමැයි—

"කතුපකාරං සුජනා හි නිච්චං-සුධම්මදින්නව සදා විදිත්වාං,
සුහිඤ්ජිතං මච්ඡරියං ච තුච්ඡං-ජනාථ හො ඉච්ඡිත ගාභිසන්තං."

මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
තුන්වන සංඝාද්ගුණ ධම්මදින්න ස්ථවිර කථානම්වූ

## දෙවිසි වන පරිච්ඡේදය

කියා නිමවනලදී.

---

## 23 වෙනි පරිච්ඡේදය

---

කවදා මේ සද්ධර්මරත්නාකරයෙහි
*පිටිමල්ල ස්ථවිර කථානාම කවරහෙයින්?
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය. †

කෙසේදයත්? සුවාසූදහසක් රාජධානියෙන් ප්‍රතිමණ්ඩිතවූ ජම්බුද්වීපයෙහි එක්තරා නුවරෙක්හි ජනිතව වැඩි විය පැමිණ පිටිමල්ලයයි යන නමින් ප්‍රසිද්ධව ආයුධ ශිල්පාදීවූ බොහෝ ශිල්පශාස්ත්‍රයෙහිද කොවිප්‍රාප්තව ධෛර්‍ය බල පරාක්‍රමයෙන් යුක්තව රණධරණීමසංහීර ත්‍රිමද ගල ගජේන්ද්‍ර යකුසේ අතිශයෙන් සමර්ථව බොහෝ සංග්‍රාම භූමිවල ජයගෙන රජුන්ගෙන් ජයපිරිදු කුඩකොඩි පඩි ප්‍රසාද ලැබ වසනුයේ යුද්ධයෙන් ජයගන්ට අවිෂයවූශූරයොධ ප්‍රධාන ධජිනීන් සහිතවූ රාජධානි තුනක් ජයගෙන ජයධ්වජ නංවමින් රුපුජන පරාජය කොට ගත් ජයකොතු හා සමග මහ තැඹ නැඟී

---

* "පීතිමල්ල" සාරසංගහ.

† "හේ මේ මතුකියන පරිද්දෙන් දතයුතු" ඇතැම්.

රුදුනතක රත්නාකරයෙන් මෙතරව අවුත් සිංහලම්පයට බැස සිංහලාධීශ්වර පෘථිවීශ්වරයාණන් දුටහ. එකල්හි ලංකෙශ්වර තෙම දළ දඹි වඩින යොධයාණන් දැක පෙර වැඩි පඬිකා කුඹ කොඩී ලැබ රුපු දප මැඩි යොධයෙකැයි ඔහු කෙරෙහි පැහැද සගයාණෙනි තෙපි අපට සේවයකොට සිටුවයි කියා රඳවාගෙන ඔහු වැඩිතරමෙක තනා මිමකඩයෙන් සිතන්නාහ. එකල්හි ඒ පුරුෂයාද අප්‍රමාදව රාජසෙවය කෙරෙමින් භයපක්ෂපාතව වසනුයේ: එක්දවසෙක * කිලඤ්ජකාසන ශාලාවාරයෙන් පිටත්ව යනුයේ: බුදුන් විසින් භික්ෂූන්වහන්සේට අවවාද පිණිස දෙශනා කරනලද්දාවූ "**රූපං භික්ඛවෙ න තුම්හාකං තං පජහථ තං වො පහීණං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති**" යනාදීන් භික්ෂූන් වහන්සේ කරන්නාවූ ධර්මසාකච්ඡා අසා සිතනුයේ: රූපයත් තමාගේ නොවේල, වෙදනාවත් තමාගේ නොවේල, හැමදුකට භාජනවූ රූපවෙදනාදිය හලකල්හි බොහෝකලක් වන්නාවූ හිත සැප පිණිස වේල, එසේ වේනම් මාවිසින්ද ඒ රූපවෙදනාදිය හල යුත්තේයයි සිතා මේ සද්ධර්මාංකුසයෙන් කෙලවගසහ සිත්නැමැති මතැත්හු රඳවම් සිතා එතනින් නික්ම ගොස් මහමෙවුනා උයනෙහි කරවනලද්දාවූ මහාවිහාරයට සොස් බුද්ධශාසනයෙහි මහණව උපසම්පදාව ලැබ උභයප්‍රාතිමොක්ෂය ප්‍රගුණකොට ශ්‍රමණ ධර්මයත් පුරමින් වැස එක් දවසෙක ඒ විහාරයෙන් භික්ෂූන් තුන් නමක් ගෙන ගවරවැලිමළුවයයි යන තැනට ගොස් අධිගමප්‍රතිලාභය පිණිස භාවනා කෙරෙමින් සක්මන් කරනසේක. අධිගමයක් ලැබගත නොහී රාත්‍රි දිනයෙහි අධිකවූ වීර්‍ය්‍ය කෙරෙමින් කකුල් ඉදිම පැලී වණව පතුල් බිම තබන්ට බැරිව ජානුවෙන් චංක්‍රමණයට පටන්ගත්සේක. එකල්හි ඒ වෙනහි මුවදඩ ඇවිදිනා වැද්දෙක් රෑ අන්ධකාරයෙහි යන එන කලබ පමණක් දැක ඉඳුරාවිමසාගත නොහී මෘගයෙකැයි යනසංකාවෙන් තියුණුහියක් දුනුපිට තබා තදව ඇද විද්දේය. එසඳ මහතෙරුන්වහන්සේ හිය වැදගත්කල්හි කවරෙක්දැයි කීසේක, එබස් අසා වැදි සඟ කෙනෙකුන් බව දැන ස්වාමීනි වැද්දෙකිමියි මුවකැයි සිතා විද්දෙමියි කීය. ඒ මහතෙරුන්වහන්සේ වැද්දාට තෝ නොබවයි කියා ලගට කැඳවා ගෙන විදිතැනින් ශ්වාසය පවත්නෙන් භාවනාවට ශක්තිමඳව පෘථුජ්ජනව කාලක්‍රියාව වුවහොත් නොයෙදෙයි සිතා ඔහුලවා විදවැදගත් තෙන කොළකැටියක් ගන්වා විදිමුඛයෙන් ස්වාසය නොපැවැත්තදී ඇඟ වතුරුවා ගෙන හිඳුවයි කියා ඔහු එසේම ඇඟ වතුරුවා ගෙන උන්කල්හි ඔහු මෙර වැතිර හිඳ විද්දහු කෙරෙහි නොගැටී දුක්ඛවෙදනාව මඳකුත් නොසලකා භාවනා කෙරෙමින් විදශීනා වඩා සතරමග සතරඵලයට පැමිණ සිවුපිළිසිඹියාපත් රහත්ව ඒ ස්ථානයෙහිමවැඩහිඳ වටින් භික්ෂූන්වහන්සේ රැස්වන ලෙසට මඳක් ශබ්ද පැවැත්වූසේක.

---

* "ලංකඤ්ජනශාලා වාරයෙන්" බොහෝ

එකල්හී එපවත් ඇසූ භික්ෂූන් වහන්සේ එතැන්හී රූස්ව වැහෙන්නාවූ රුධිර ධාරාවෙන් තෙත්වූ සකල ශරීරය දැක මහත්වූ චිත්ත ඛේදයට පැමිණ ස්වාමීනි මේ පැමිණියේ කවර අනර්ථයෙක් දැයි විචාළසේක, එබසට විපීමලල සථවිරයන් වහන්සේ කියනසේක්: ඇවැත්නි පූර්වෝපචිත අකුශලකර්මයෙන් කෙලශ කාලුෂ්‍යස පහවීමට පළමු ශරප්‍රහාරයෙක් අවුත්වන, ඒ ශරය ඇද දමා කරන භාවනා නොහැර ඒ ක්ෂණයෙහිම කෙලශ යනුත් පහකළ නියාව කීසේක: එකල්හි රූස්වූ භික්ෂූන්වහන්සේ මහත්වූ ආශ්චර්යයට පැමිණ ස්වාමීනි මෙබඳුවූවෙදනාවක් සහ නයකොට කෙසේ සිත එකඟකොට ගත්සේක්දැයි කියා මුව නොසැහෙන පරිද්දෙන් ගුණ කථනයකොට ස්වාමීනි ඉදින් බුදුහු මෙකලට ජීවමානව වැඩසිටිසේක් වීනම් එකාන්තයෙන්ම හිස පිරිමැද මෛත්‍රී කරනසේක් වේදැයි කියා මහත්ව විස්මයපත් වූසේක. එසඳ තෙරුන් වහන්සේ රූස්වූ භික්ෂූන්වහන්සේට අව වාද වශයෙන් කියනසේක්: ඇවැත්නි මේ රූපය සැපය දුකය උපෙක්ෂායයි යන ත්‍රිවිධ වෙදනාවම විඳුනේය. එසේ හෙයින් චිත්තය ඒ රූපයෙන් වෙන්කොට කර්මස්ථානාදියෙහි නියුක්ත කළකල දුක්ඛවෙදනාදිය දුරුවෙයි, ඒ දුරුවූකල නිවන්සැප ලැබෙයි, ඒ නිවන්සැප ලද්දහට මත්තෙහි මඳකුත් දුකෙක් ලංනොවෙයි, සැප බොහෝ වන්නේයයි යනාදීන් ධර්මදෙශනා කළසේක. මෙසේ බණ කියා ලොකයෙහි ජනිතවූ සියල්ලම අනිත්‍යයයි කියා සකල සත්වයන් විසින් නිත්‍යවූ නිර්වාණ සම්පත්ති යම හන්ත ප්‍රාප්ත කටයුත්තේයයි ප්‍රකාශකොට උදන් අනාවඳ රනසේක්: මෙසේ වදාළසේක.

"භාසිතං බුද්ධසෙට්ඨෙන-සබ්බලොකග්ගවාදිනා,
න තුම්හාකං ඉදං රූපං-තං ජහෙය්‍යාථ භික්ඛවො.
අනිච්චා වත සංඛාරා-උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති-තෙසං වූපසමො සුඛො" යි

මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
සතරවන සංසාද්භූත විපීමලල සථවිරකථා නම්වූ

## තෙවිසිවන පරිච්ඡේදය

කියා නිමවනලදී.

# 24 වෙනි පරිච්ඡේදය.

## තවද මේ සද්ධම්මරත්නාකරයෙහි චිත්තලපබ්බත විහාරවාසි අන්‍යතර ස්ථවිර කථානම් කවරහයත්?

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේදයත්?** අප බුදුන් තුන්වාරයෙක වැඩ පරිත්‍රාණ ප්‍රතිෂ්ඨා කළාවූ සිංහලද්වීපයෙහි අතුල පර්වතයෙන් ගැවසීගත්තාවූ **සිතුල්පව්** නම් විහාරයෙක්විය. ඒ විහාරයෙහි ශීලාචාර ගුණසම්පන්නවූ එක් තෙරකෙනකුන්වහන්සේ වාසය කරනසේක. මෙසේ වාසය කරන්නාවූ ඒ තෙරුන් වහන්සේට එක් දවසෙක්හි උන්වහන්සේ පූර්වයෙහි කළාවූ අපරාපරිය වේද්‍ය කර්මයෙක් ප්‍රසන්නතව මහත්වූ රුජාවෙක් කුක්ෂියෙහි පහරින්ට වන. එසඳ ඒ උදර ව්‍යාධියෙන් පීඩිතවූසේක්: ඒ රුජාව සහනයකොට ගතනොහී මහත්කොට නතනමින් ආශ්වාසය තදකොට හෙළ හෙළා ඔබිනොබ පෙරළෙමින් බොහෝ වෙහෙස විඳිනාසේක. මෙසේ උන්වහන්සේ බඩරුජාවෙන් විඳිනා අපමණ වෙහෙස දැක ඒ ස්ථානයට පැමිණි එක් සාමණේර කෙනෙකුන්වහන්සේ මහත්වූ කරුණා උපදවා තමන් වහන්සේට පැමිණි ව්‍යසනයක්මෙන් චිත්තඛෙදයට පැමිණ උන්වහන්සේට මේ ආයාසය කවර ලෙසකා සංහිඳී යේ දෝහෝයි සිතා විචාරනසේක්: ස්වාමීනි නුඹවහන්සේ මෙබඳු ආයාසයකින් ඔබිනොබ පෙරළනසේක් එබඳුවූ රුජාව තමා කොතැන්හි ගැනීදැයි විචාළසේක, එබසට ඒ තෙරුන්වහන්සේ කියනසේක්: ඇවැත්නි මේ රුජාව මේ ශරීරයෙන් එකතැනක ගනිතියි කියා නැත, සකල ශරීරයෙහි හැමතැන්හිම පහරනේය, දන්නාතෙක් කල්පටන් මෙබඳු වෙදනාවක් නොවූයේයයි කීසේක. එබසට දහර සාමණේරයන්වහන්සේ කියනසේක්: ස්වාමීනි එසේවීනම් තදකොට හෙළන්නාවූ සූස්ම මඳක් ඉවසා බැලුව මැනවැයි කීහ; එබසට තෙරුන්වහන්සේ යහපත ඇවැත්නියි කියා මහත්කොට හෙළන්නාවූ සූස්ම මඳක් රඳවා ඉවසූසේක. එසඳ ආශ්වාසය සහනය කළහෙයින් හෘදය මැදින් විදුරණව අතුණු බහන් සහ පතිතව ඇඳ ඇතිරිලි මුදුනෙහි බඩවැල්ගොඩ පුරාගත, එකල්හි ඒ බඩවැල්ගොඩ එතැන්හි සිටි දහර සාමණේරයන් වහන්සේට අක්වා ඇවැත්නී දුන් බඩරුජාව ඉවසූ නියාව් යහපත්දැයි කීසේක. එබස් අසා දහර සාමණේරයන්වහන්සේ මූස පත්ව ලය පැළීයන්නාක්මෙන් මහත් ශොක හෘදයෙන් ජනිතව මූවෙන් බසකුත් කියාගත නොහී කරබාගත්සේක. එසඳ

තෙරුන්වහන්සේද ඒ ක්ෂණයේ වියෂී වඩා ජනිතවූ වෙදනාව සහනයකොට භාවනා කෙරෙමින් එවිටම සිවු පිළිසිඹියා පත් රහත්ව අනුපාදිසෙස නිර්වාණ ධාතුයෙන් පිරිනිවන් පෑසේක. එකල්හි ඒ ස්ථානයට රැස්වූ බොහෝ භික්ෂූන්වහන්සේ හා උපාසකාදීවූ බොහෝ ජනයෝ අහෝ ආර්යයන්වහන්සේගේ ගුණ නම් මෙසේම ආශ්චර්ය්‍ය නියාදැයි කියා මහත්වූ විසමයට පැමිණ සාධුකාර දෙමින් සංසර්තනයෙහි ගුණ සලකමින් කළමනා හැමකෘත්‍යයන් සම්පාදනයකොට ධාතුපූජාකළහ. එසේහෙයින් මෙබඳු මහොත්තමවූ සංසරතනයෙහි ගුණ මෙනෙහිකොට එයින් ජනිතවූ ඉෂ්ට විපාකයෙන් මතු ස්වර්ගසම්පත්තිය හා අමෘත මහා නිර්වාණ සම්පත්තිය සිද්ධකටයුතු. කියනලදමැයි-

“ අතීව චිත්තස්ස දදන්තභෙදං-මුහුත්තමත්තං සහනක්ඛමිත්වා, ,
අලත්ථ මොක්ඛං ඉමමප්පමමෙහා-චිනාථ මක්ඛන්ධය සිවං ච සග්ගං ”

මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
පස්වන සංඝාද්භූත චිත්තලපබ්බත විහාරවාසි
අන්‍යතර ස්ථවිර කථානම්වූ
## පසුවිසිවන පරිච්ඡේදය
කියා නිමවනලදී.

---

## 25 වෙනි පරිච්ඡේදය.

---

කවද මෙසද්ධර්මරත්නාකරයෙහි
වෙහාතික නාගස්ථවිර කථානම් කවරහෙයක්?
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

කෙසේදයත්?

සමන්තකූට නියසීසපුෂ්ප මස්තකයෙහි ශ්‍රීපාදලාඤ්ඡන නිමග්න සද්ධර්ම භාණ්ඩාගාරවූ මේ ශ්‍රී ලංකාද්වීපයෙහි මංහල නම් නුවර සමීපයෙහිවූ එක්තරා ගමෙක වාසයකරන්නාවූ සාධු ගුණ සම්පන්න උපාසිකා කෙනෙකුන්ගේ පුත්‍රවූ මහානාගය චූලනාගයයි යන කුමාරවරු දෙදෙනෙක් වූහ. ඒ දෙදෙනා වැඩිවිය පැමිණ සර්වඥශාසනයෙහි ප්‍රසන්නව දෙමව්පියන් ගිවිසවාගෙන ඒ දෙබෑයෝම චිත්තලපර්වත විහාරයටගොස් එහි වසන්නාවූ එක් තෙරකෙනෙකුන්වහන්සේ උපාධ්‍යායකොට මහණව බණපුහුණු කොට උපසම්පන්නව ත්‍රිපිටකාගමයෙහි පාරප්‍රාප්තව මහානාගස්

ථිරය චූළනාගස්ථවිරයයි සුගතශාසනයෙහි ප්‍රඛ්‍යාත වූසේක. මෙසේ ප්‍රසිඞ්ව සිතුල්පව් වෙහෙර වාසය කරන්නාවූ ඒ දෙබෑයන් වහන්සේට තිස් අවුරුද්දෙක් අතික්‍රාන්ත විය. මෙසේ වසන්නාවූ ඒ දෙදෙනා වහන්සේ ග්‍රන්ථධුරය තබා විදර්ශනාධුරයෙහි නියුක්තව කසිණ පරිකර්මාදී ධ්‍යාන භාවනා කොට නොබෝ කලකින් විදර්ශනා වඩා සිවු පිළිසිඹියා පත් රහත් වූසේක. මෙසේ ඒ දෙදෙනාවහන්සේම එක්දවසෙක්හි සිතුල්පව් විහාරයෙන් නික්ම මහෙලනම්වූ රාජධානියට ගොස් එම නුවර මහෙලක නම් විහාරයට වැඩ එදවස් ඒ විහාරයෙහි සැතපෙමින් දෙවන දවස් උදෑසන කළමනා ශ්‍රමණ කෘත්‍යය සම්පාදනය කොට ගැට වටූ ගන්වා කසින් සිවුරු හා අතින් පාත්‍රය ගෙන මෑණියන්ද වසන්නාවූ ගමට වැඩ ගෙපිළිවෙළින් සිඟමින් වඩනාසේක. එකල්හි සිඟමින් වඩනා දෙදෙනාවහන්සේගෙන් මහානාග ස්ථවිරයන් වහන්සේ මෑණියන්දෑගේ ගෙයි දොරකඩ සිඟාවැඩ සිටිසේක. එසඳ චූලනාග ස්ථවිරයන් වහන්සේද එතැන්හිම සිඟා වැඩ සිටිසේක. දොරසිඟා වැඩ සිටි දෙදෙනා වහන්සේම මෑණියන් දැක මහත් ආදරයෙන් තමන්දෑට උපන්නාවූ කැඳිත්තක් ගෙනවුත් මහානාග ස්ථවිරයන් වහන්සේගේ පාත්‍රයට පිළිගන්වා උන්වහන්සේ බලාසිට කිමෙන්ද්‍යෙහෝ මුන්වහන්සේ මාගේපුත්‍රවූමහානාගයෝ යයි දැන විචාරන්නාහු: ස්වාමීනි නුඹවහන්සේ කවරනම් විහාරයක වැඩවසනසේක්ද, කවර දවසක මෙතැන්හිවැඩිසේක්දතම්න් වහන්සේ මාගේ පුත්‍රවූ මහානාගයෝනොවේදැයි කිහ. එබසට උන්වහන්සේ කියනසේක්: උපාසිකාවෙනි ඒ ප්‍රවෘත්තිය තෙල සිටිනා තෙරුන් අතින් විචාරාගනුවයිකියාතමන්වහන්සේවඩනා භික්ෂාවෘත්තියෙන්ම වැඩපුසේක. එතැන්හි සිටි තෙරුන්වහන්සේට දෙවැනිවත් එලෙසම කැඳ පිළිගන්වා සිට විචාරන්නාහු; ස්වාමීනි නුඹවහන්සේ මාගේ පුත්‍රවූ චූළනාගයෝ නොවේදැයි කිහ. එබස් අසා තෙරුන් වහන්සේ කියනසේක්: කිමෙක්ද උපාසිකාවෙනි තොප කියන්නේ පළමුයෙන් සිඟාගෙනවැඩි තෙරුන් වහන්සේ අතින් විචාරා නොගත කල කියන්නේ කිම්දැයි කියා පිළිගත් කැඳ හැරගෙන වැඩපුසේක. මෙසේ වඩනා දෙදෙනා වහන්සේ පිට පසු බලා සිට නොකිකරු පුතුන් වැදූ මට එසේම උවමැනවැයිසිතා ද්‍යෙහෝ මැලිවහන්සේ ගෙටවැදලා පසුපස්සේ නොගොසින් හුන්දෑය. අහෝ උත්තමයන්ගේ ගුණ මහිමයෙකා. කුලයා කෙරෙහි ඇල්ම තබා සුත ප්‍රේමයෙන් වදා වඩා වර්ධන කොටගත් මෑණියන්දෑ කලකින් දුටු ගමනේ පවා පුළුවුත් වචනයට ඇල්මක් ඇතිව ප්‍රතිවචනයක් නොදී තමන් වහන්සේගේ ආර්‍ය්‍ය ධර්‍මයම මෙනෙහි කොට අනුනය රහිතවූ ශ්‍රමණ ධර්‍මයම

පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි ධර්මපිටකයන්ගේ තුබ තුබම පැවැත්වූසේක. එසේහෙයින් ශ්‍රමණ ගුණාන්විත හැම භික්ෂූන් වහන්සේ විසින් කුලයා කෙරෙහි සිත් නොඇලවා තමා රක්ෂාකරන ප්‍රතිපත්ති ආගමාදීවූ ශ්‍රමණ ධර්මයෙහිම සිත් අලවා ධර්මපථයෙන් ගොස් නිර්වාණ පුර ප්‍රවිෂ්ටව නිවන් සැප විඳින්ට උත්සාහ කටයුතු. **කියනලද්දේමැයි.**

"එවං මහානුභාවාතෙ—නාගථෙරාව තාදිනො,
කුලෙ අනුනයං හිත්වා—ධම්මඤ්ඤසෙ භවාථ භො.,,

**මෙතෙකින් මේ සද්ධර්ම රත්නාකරයෙහි**
**සවෙනි සංඝාද්භූත මෙහානික නාග ස්ථවිර කථානම්වූ**

## පස්විසි වන පරිච්ඡේදය

**කියා නිමවනලදී.**

—o:o—

## 26 වෙනි පරිච්ඡේදය.

**තවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**මිලක්ඛලුද්දක කථානම් කවරහයත්?**
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේද යත්?**

දිගු බිත විතත දීඝිතීන් විස්මිත දනානධාතෞෂධී රාජිත දෙවඤ්ඤසය තුල්‍ය හෙළදිව රුහුණු *මඬුළු නම් විහාරයට ගොදුරුගම්වූ පසල්දනව්වෙක වසන **මිලක්ඛ** නම් වැද්දෙක් බොහෝ ප්‍රාණඝාත කෙරෙමින් එයින්ම තමාගේ පුත්‍රදාරාදීන් රක්ෂා කෙරෙමින් ජීවත් වන්නේය. ඒ තමාගේ ජීවිකාව පිණිස වනයෙහි උල් මල උගුළු එහුල් සියගණන් බැඳ එයින් බොහෝ ප්‍රාණීන් ජීවිතක්ෂයට පමුණුවා සමහරදවස් එම වනයෙහිදීම අංගාරමාංශ පල හා අනුභවකරන්නේය. මෙසේ වසන්නාවූ ඒ ලුද්දක තෙම දවසෙක වනාන්තරයෙහි ඇවිදිනේ උලක හුණු චතුෂ්පාදයකු කපා පලහා වනයෙහිදීම මාංස අනුභවකොට උල් එහුල් ආදිය බලා ඇවිදිමින් විඩාව පිපාසායෙන් පීඩිතවූයේ: එම වනයෙහි වසන්නාවූ එක් තෙරකෙනෙකුන් වහන්සේගේ ආශ්‍රමපදයකට ගොස් චංක්‍රමණාන්තයෙහි පිළපිට වත්ලෙසම තැන්පත් කොට තිබූ උදක භාජනයක් දැක දිය බොන අභිප්‍රායෙන් ඒ භාජන පියානය හළුයේය. එකල්හි ඒ භාජනය ඇතුළෙහි අත තෙමන

* "ගාමෙණ්ඩවාළ මහාවිහාරස්ස" සාරසංගහ.

පමණකුත් දිය නැති බව දැක එතන්හි වාසය කරන්නාවූ තෙරුන්වහන්සේට කිපී කියනුයේ: එම්බා මහණ සැදැහැ ඇත්තැන් දෙන්නාවූ සිවුපසය අනුභවකොටලා රුදුවල් නිද්‍රාවෙන්ම දවස්හරනමුත් පිපාසිතව පැමිණි කෙනෙකුන්ගේ තලුතෙමෙන පමණකුත් දියත්තක් කළපල්ලෙහි නොතබනකල කිම්දැයි කියා අසන්තුෂ්ටවිය. එකල්හි තෙරුන්වහන්සේ සිතනසේක්: මූ කියන්නේ කිමෙක්ද, මම දැන් දිය භාජනයක් පුරා පිළ පිට තබාවත් පිළිපැද සිටිමි, එසේ තබනලද්දාවූ සම්පූර්ණ උදක භාජනය කවර කාරණයක් පිණිස දැන්නැතැයි කියන්නේදැයි සිතා තමන්වහන්සේ ගොස් ඒ බදන පිධාන හැර එහි පුරා තුබූ දිය දැක ඔහු කැඳවා එම්බා පුරුෂය තොපතලු තෙමෙන පමණදිය නැතැයි කීමුත් භාජනය පුරාම දිය තිබෙන බව බලාගනැයි කියා පිධානය හැර ජලය පෑසේක. එකල්හි උන්වහන්සේ අතින් දියවත් කරවාගෙන පිපාසා සංහිදෙන පමණ උදක පානය කෙළේය. මෙසේ දිය බී සැනපෙමින් එතැන්හි සිට සිතනුයේ: මෙසේ දිය පුරා තුබූ භාජනය මා ඇල්ලූ ක්ෂණයෙහි ජලය අන්තර්ධාන විය, එසේ හෙයින් මෙසිද්ධ අකුශල බලයෙක, තවද කළාවූ නොයෙක් අකුශලයෙන් මතු මතුත් කුමකින් කුමක් වේදෝහොයි චිත්ත ව්‍යසනයට පැමිණියේ මහත්වූ අකුශල භයින් තැතිගෙන අත තුබූ දුනුදඬු දමා තෙරුන්වහන්සේ වැඳ වැතිර කියනුයේ: ස්වාමීනි තුඹවහන්සේ මාකෙරෙහි අනුකම්පා උපදවා ශාසනයෙහි මා මහණ කරවුව මැනවැයි කීහ. එබස් අසා ඕහට කෙසාදිවූ පඤ්චකර්මස්ථානය දී පැවිදි කරවූසේක.

එකල්හි පැවිදිව ශ්‍රමණධර්මය රක්ෂා කෙරෙමින් දුන් කර්මස්ථානලෙසම භාවනා කරන්නාහට බොහෝ මෘගශූකරයන්මැරූතැන්ම වැටහෙන්නේය, නිරන්තරයෙන් එම වැටහෙන්නාහට ශරීරයෙහි දාහඅටගන්නේය. කර්මස්ථානගෙන කොතෙක් භාවනා කළත් කෘෂිකර්ම උද්වහනාදියට චෞරවූ වෘෂභයකු මෙන් කර්මස්ථාන වීථියට චිත්තාරම්මණය නොබස්නේය. මෙසේ කර්මස්ථාන ප්‍රගුණ කොට ගත නොහී අනේ මා කෙළේ කිමෙක්දෝහොයි ඉදිරි භික්ෂුභාවයෙන් තමහට වන්නාවූ ප්‍රයෝජනයෙක් වේදෝහෝ නොවේදෝහොයි සිතා මහණ කරවූ තෙරුන්වහන්සේ ළඟට ගොස් පසඟ පිහිටුවා වැඳ ස්වාමීනි මහණදම් පිරීමට නොහැක්කෙමියි කීහ. එපවත් අසා තෙරුන්වහන්සේ කියනසේක්: එම්බා මිලක්ඛයෙනි එසේ වීනම් අමු දිඹුල්දඬු කපා ගෙනවුත් ගොඩ කොට ලවයි කීසේක. ඒ මහණද තෙරුන්වහන්සේ කීලෙසම දඬුගොඩ කෙළේය. මෙසේද කොට ඉක්බිති කියනුයේ: ස්වා

මීති ඉදින් මා විසින් කළමනා කිම්දැයි විචාළේය. එබසට තෙරුන් වහන්සේ කියනසේක්: තොප එක්සාළාවූ මේ දඹුගොඩ වටින් ගිනි මොළවා දවමින් ශෙෂයකුත් නොතබවයි කීසේක. එබස් ඇසූ මිලක්ඛනම් මහණ තෙම තමා රැස්කළාවූ දඹුගොඩ සතර පිටින් ගිනිදල්වා දවන්ට උත්සාහකොට තෙත්දඹු හෙයින් දවන්නා තබා ගිනි පමණකුත් මුළුකොට ගතනොහී බොහෝ වෙහෙස විඳිමින් ස්වාමීනි මේ දඹුගොඩ දවන්නා තබා ගිනි පමණකුත් මුළුකොට ගත නොහෙමියි කීහ. එපවත් අසා තෙරුන් වහන්සේ ඕහට කියනසේක්: තෙපි ඉදින් ගිනි පමණකුත් මුළුකොට ගතනොහැකිවූ නම් මඳක් එතැනින් ඉවත්ව ගනුවයි කියා ඒ ස්ථානයෙහි පෘථිවිය තමන්වහන්සේගේ ආනුභාවයෙන් විවර දක්වා අවීචිමහ නිරයෙන් ඛද්යෝතිමියකු පමණ ගිනිපුපුරක් ගෙන්වා ඒ දඹුගොඩෙහි බහාලූසේක. ඒ ක්‍ෂණයෙහි ඒසා අමු දඹුගොඩ වියළි පරඬලා ගොඩක්සේ දැ හස්මවිය. එසඳ තෙරුන් වහන්සේ අවීචිමහ නිරයෙහි පැසී දුක් විඳිනා සත්වයන් ඕහට දක්වා එම්බා මිලක්ඛයෙනි තොපි සිවුරුහැර ගියාහම් තෙල අවීචියෙහි පැසෙන සත්වයන් මෙන් නිරාවල වැටී දුක්විඳිනා වේදැයි කියා බණ වදාළසේක. උන්වහන්සේ වදාළබණ අසා නිරය භයින් සියලඟ ඩහ සෙල්වී නැතිගෙන ස්වාමීනි මේ සර්වඥ ශාසනය මෙසේම අද්භූතදැයි කීහ. එබසට කියනසේක්: ඇවැත්නි මේ සුගත ශාසනය කෙළවරක් නැත්තාවූ ආශ්චර්ය්‍ය අද්භූතත්වයන් පහළ කරන්නේ වේදැයි වදාළසේක. එබස් අසා ස්වාමීනි එසේවී නම් මේ නෛර්‍ය්‍යාණිකවූ ධර්මය අභ්‍යාසයම ප්‍රධාන වේදැයි කියා එතැන්පටන් අඛණ්ඩකොට මහණදම් පුරණසේක්: මහත් ව්‍යායාමයෙන් වත්ත පටිවත්තාදීන් පූරණය කොට ධර්මයෙහිම සිත් අලවා රාත්‍රින්දිනයෙහි අප්‍රමාදව ධ්‍යාන භාවනා කෙරෙමින් එකීභූතව හිඳිනා කල්හී නිද්‍රාවට පැමිණි කල්හිද පෙරසේ දුඃස්වප්න නොදැක ශුභ ස්වප්න දකිනාසේක්. ධ්‍යානභාවනාවෙන් ප්‍රයත්න කොට සක්මන් කරන කල්හිද ශරීර සන්තාපනය කරන කල්හිද නිදි එතෙයි සිතා පිදුරු වැටියක් තෙමා තමා හිස තබාගෙන දෙපතුල් දියෙහි තබා හිඳිනාහ. දවසෙක මෙසේ වීර්‍ය්‍ය කරන්නාවූ ඒ මහණතෙම පානීය භාජනයක් ගෙන උදකතීර්ථයට ගොස් පැන් පරහා භාජනය උරමස්තකයෙහි තබා වැහෙන්නාවූ උදකොපච්ඡේදය කෙරෙමින් සිටිකල්හි එසඳ තෙරුන්වහන්සේ සාමණේරයන්හට අවවාදවශයෙන් මෙසේ බණක් වදාරනසේක. **කෙසේදයත?**

> “උට්ඨානවතො සතිමතො-සුචිකම්මස්ස නිසම්ම කාරිනො,
> සඤ්ඤතස්ස ච ධම්මජීවිනො-අප්පමත්තස්ස යසො’ භිවඩ්ඪති”

යනාදීන් තෙරුන්වහන්සේ දෙන්නාවූ අවවාද ධර්මය අසා මේ ගාථාව අපඋදෙසාම දෙසනලද්දැයි සිතා උට්ඨානවත්හුනම් මාසේම

විය යුත්තාහ, සමාතිවත්හුද මාසේම වියයුත්තාහ, අප්‍රමාදවූවා හුද මාසේම වියයුත්තාහයි මෙසේ ඒ හැම ගුණම තමන්වහන්සේ කෙරෙහි පිහිටුවා සිටි පියෙහිම සිට අනාගාමි මාර්ගඵල ලබමින් තුටු පහටුවූ සිත් ඇතිව මාවැනිවූ හැම සත්ත්වයෝම නිර්වාණසම්පත්තිය පිණිස වීර්‍ය වැඩීමෙහි ප්‍රමාද නොවෙත්වයි කියා නිවන් පුරයිරි ප්‍රාර්ථනා කරන්නාවූ හැම සත්ත්වයෙනි තොපි හිත වීර්‍ය නොඒ උඨානාදීන් වීර්‍ය වඩා ස්වර්ගමොක්‍ෂ සම්පත්තිය සිඬකරවයි අනුශාසනය කොට තමන් වහන්සේ වීර්‍යයෙන් ලද්දවූ නිවන් සම්පත්තිය ප්‍රකාශ කොට උදන් අනාවද්‍රනසේක්: මෙසේ වදාළසේක.

"අලං පලාලපුඤ්ජාහං-සිසෙනාදය චඬකම්ං,
පතෙතාසමි තතියං ඨානං-අහො ලාභාති මාරිස."

**මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි**
**සත්වෙනි සංඝාද්භූත මිලක්ඛ ලුද්දක කථා නම්වූ**

## සවිසිවන පරිච්ඡේදය.

**කියා නිමවනලදී.**

---

# 27 වෙනි පරිච්ඡේදයං

**නැවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**කොරණ්ඩකවිහාරවාසිසත්ථිරභාගිනෙය්‍යකථානම්කථාවරහයක්?**

* මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය

**කෙසේදයත්?** අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ රජෝත්තමයාණන් වහන්සේගේ පාරිභොගිකාදිවූ පඤ්චවිධ චෛත්‍යස්ථානයන්ට වාසස්ථානවූ සිරි ලක්දිව මායා රජයෙහි **කැකුලෙණිය** නම් ගමෙක් විය. ඒ ගමට නුදුරුව චෛත්‍ය බොධිද්‍රැම ප්‍රතිබිම්බාලය සංඝාරාමාදීන් ශොභමානවූ **කැකුලෙණිය** නම් විහාරයෙක් විය. ඒ විහාරයෙහි එක් සංඝාවාසයක සීලාචාර සම්පන්න අප්‍රමාණ ගුණාන්විත එක් තෙරකෙනෙකුන් වහන්සේ වසනසේක. උන්වහන්සේගේ සහොදර නැගණියන් පුත්‍ර කුමාරයෙක් ලදරු අවස්ථාවෙහිම සර්වඥ ශාසනයෙහි ප්‍රසන්නව මහණවීමෙහි අභිප්‍රාය ඇතිව මවුපියන්ගෙන් අවසරගෙන මයිලණුවන් වහන්සේ වසන විහාරයට ගොස් එපවත් දැන්විය. තෙරුන් වහන්සේද ඔහුගේ අභිප්‍රාය දැන මහණ කරවූසේක, මෙසේ ඔහු

---

* **"මේ මතු කියන පරිද්දෙන් දතයුතු."**

මහණ කරවාපුහුණු කැරවිය යුතු මහණ බණ උගන්වා උපසම්පදා කරවා ත්‍රිපිටක ධර්මාගමාදිය ප්‍රගුණ කරවනු පිණිස රුහුණු ජනපදයට කැඳවාගෙන ගොස් ගණාචාර්‍ය්‍යවූ බුද්ධාගමාදියෙහි අභිශයින් පටුතර තෙරකෙනෙකුන් වහන්සේගේ සමීපයෙහි බුදුබණෙහි නිපුණවනු පිණිස රඳවමින් වැඩිසේක. එකල්හි කල් යාමකින් ඒ දහර භික්ෂුහුගේ මෑණියෝ තමන්ගේ බෑණන් වහන්සේ දක කියන්නාහු: ස්වාමීනි මාගේ පුතණුවන් වහන්සේ නොදක්නේ නොමඳ කලක, එසේහෙයින් උන්වහන්සේ නොද ක්නාවූ මට ඇසිල්ලකුත් සැපයෙක් නොම ඇත. උන්වහන්සේ දක ශොක සංහිඳුවාගන්නා පිණිස කැඳවාගෙන අවුත් මා ඇස දක්වාලුව මැනවැයි කිව. මෙසේ ඔවුන් කීවාවූ අඩුනක මිශ්‍ර යාච්ඤාවචනයන් අසා යහපතැයි ගිවිස රුහුණු ගොස් බෑනණුවන් දක එපවත් කීහ. උන්වහන්සේද එපවත් අසා තමන්වහන්සේ උගතමනා බණදහම් සම්පූර්ණව නොනිමිහෙයින් මයිලණුවන් වහන්සේ හා සමග නොවැඩිසේක. මෙසේ කිපවාරයක බෑණන් වහන්සේ අතින් පුතණුවන්වහන්සේ විචාරා නොදක දවසෙක තෙරුන් වහන්සේට කියන්නාහු: ස්වාමීනි නුඹවහන්සේ මාගේ පුතණුවන් වහන්සේ දකින්ට උවමැනවැයි කියා කියන මාගේ යාච්ඤාවට ඇතිසැටියේ මට කියා ගතනොහී නුඹවහන්සේ ඔබි නොබ ඇවිදිනාමුත් මාගේ දරුවන් ඇතැයි නොසිතමියි කීව. එබස් ඇසූ තෙරුන් වහන්සේ මහත්වූ ශොකයෙන් මර්දිතවූ සිත් ඇතිව නැගණියෙනී තොපි එසේ නොසිතව, තොපගේ පුතණුවෝ සැපසේම වෙසෙති, මේවාරයෙහි රුහුණ ගිය කල කවර තරම් කටයුත්තක් ඇතත් තොපගේ පුතණුවන් තොපඇස දක්වාලමි, ළතැවිලි නොවවයි කියාලා බෑනණුවන් කැඳවාගෙනඑනු පිණිස කැකුලෙනනිය නම් විහාරයෙන් නික්ම රුහුණු යන්ට වැඩපුසේක.

එකල්හි රුහුණු සිට මෙකියන ළදරු භික්ෂූන් වහන්සේද එක් ද්වසෙක කල්පනා කොට තමාගේ උපාධ්‍යායවූ මයිලණුවන් වහන්සේන් නොදක්නේ නොමඳ කල, ළමන්දුන් ඇතුළුවූ බන්ධුනුත් නොදක්නේ බොහෝකලැයි සිතා මෙපවත් ගුරුන්වහන්සේට දන්වා වැඳ අවසරගෙන රුහුණ වසන විහාරයෙන් නික්ම අවුත් මහවැලිගඟ අස රමණීයවූ ඡායාසම්පන්න සුදුවැලි තලාවෙන් යුක්තවූ එක්රුකක් මුල සැතපී උන්සේක. එකල්හි මොබ සිට රුහුණු යන උන්වහන්සේගේ මයිලණුවන් වහන්සේද එතැන්හි පැමිණ දුටුසේක. මෙසේ දුටු තෙරුන්වහන්සේ කියනසේක්: එම්බා භද්‍රමුඛයෙනි තොපගේ මව්පිය දෙදෙන තොප දක්නා කැමැත්තාහ. එසේහෙයින් දූන් අප එනුයේ: තොප

කැඳවාගෙන යනු පිණිසයයි කීසේක. එබසට ඒ දහර භික්ෂූන් වහන්සේ කියනසේක්: ස්වාමීනි ඔබවහන්සේ කලක් නුදුටු හෙයින් දක්නා වැඳ ලමන්දුන් ඇතුළුවූ බන්ධුනුත් දක්නා-යනු පිණිස එන්නෙමි, දුන් ඔබවහන්සේ දක්නා කටයුතු සිඛවිය, ඉදින් මව්පිය දෙදෙනා දක්නා එන්නෙම් වේදැයි කීසේක. එබසට තෙරුන්වහන්සේ කියනසේක්: එම්බා භද්‍ර මුඛයෙති තොපගේ මෑණියොත් කලක් තොප නුදුටුහෙයින් මහත් ශොකයෙන් පීඩිතව අප අතින් බොහෝසේම විචාරති, එසේහෙයින් ඔවුන්ගේ ශොක සංහිඳුවා පලාඑවයි කියා ඕහාට අවසර දෙමින් රුහුණු වැඩිසේක. එකල්හි ඒ දහර භික්ෂූන් වහන්සේ අවුත් මව්පිය දෙදෙනා වසන ගම සමීපයෙහි කැකුලෙන්තියනම් විහාරයට අවුත් එම විහාරයෙහි තමාගේ පිතෘහු විසින් සඟසතු කොට කැරවූ සෙනාසනයට පැමිණ එතැන්හි පත්පා සිවුරු තැන්පත් කොට තබා සැතපී වැඩහුන්සේක. දෙවන දවස් ඔහුගේ පිතෘවූ උපාසක තෙම කිසි කටයුත්තක් පිණිස එම විහාරයට පැමිණියේය. එසඳ තමා කැරවූ සෙනස්නෙහි අමුතුව වත් පිළිවෙත් සපයා තිබුවා දක්නා ඒ විහාරයෙහි වසන නෙවාසික භික්ෂූන් අතින් විචාරනුයේ: ස්වාමීනි මා කැරවූ සෙනස්නෙහි ආගන්තුකව අවුත් සැතපෙනසේක්: කවුරුන් වහන්සේදැයි කීය. එබසට ඔහු කියන්නාහු: උපාසකයෙනි ඊයේ දවස අභිනව තමෙක් අවුත් තොපගේ සෙනස්නෙහි සැතපෙනසේක. තොපි ගෙස් වැඳ දක්නා එවයි කීසේක. එබස් අසා ඒ උපාසක තෙම ඒ සෙනස්නට ගොස් උන්වහන්සේ දක්නා පසඟ පිහිටුවා වැඳ පිළිසඳර කථාකොට එදවස්ම වස්වසන දවස් හෙයින් එවිටම ආරාධනා කොට කියනුයේ: ස්වාමීනි අද දවස් මේ සෙනාසන යෙහිම වස් ඉටා වස් තුන් මස මට අනුග්‍රහ කොට මාගේ ගෙයි දීම වළඳා වස් අන්තයෙහි මාගේ ගෙට වැඩමවා වැඳ පුදා ගත්කල පසුව බැහැර වැඩිය මැනවැයි කීය. උන්වහන්සේද ඔහු කළාවූ ආරාධනාව මුවෙන් නොබැණ ඉවසූසේක.

එකල්හි උපාසක තෙම තමා වසන ගෘහයට ගොස් තමාගේ භාර්‍ය්‍යාවට කියනුයේ: සොඳුර අපගේ සෙනාසනයට ආගන්තුක කෙනකුන්වහන්සේ වැඩිසේක. උන්වහන්සේට යහපත්කොට මේ වස් තුන් මසම උපස්ථාන කරන්ට උව මැනවැයි කීය. එබසට උපාසිකාවෝද යහපතැයි ගිවිස දෙවන දවස් යහපත්වූ ඛාද්‍ය භොජ්‍ය පිළියෙළ කොට තබාගෙන උන්හ. එකල්හි වේලා බලා ඒ දහර භික්ෂූන් වහන්සේ ගැට වටු ගන්වා පාත්‍රය අතින් ගෙන දෙමව්පියන්ගේ ගෙදෙරට අවුත් සිඟා වැඩ සිටිසේක. එකල්හි මව්පිය දෙදෙනාම පසඟ පිහිටුවා වැඳ පාත්‍රය ගෙන තමන්ගේ ගෙට වැඩම කරවා ගෙන ගොස් හිඳිනා අසුන් පනවා එහි වඩා හිඳුවා තමන් පිළියෙළ කොට තිබූ උතුම්වූ ඛාද්‍ය භොජ්‍යය පිළිගන්වා වළඳවා වළඳා අන්තයෙහි දුවටු දියදී

බෙහෙසත් පිළිගන්වා එතැන්හි හිඳ අනුමෙවුනි බණ අසා ඔවුන් අවසරගත් කල්හි නැවතත් තමන්වහන්සේ සැතපෙන වෙහෙරටම වැඩිසේක. මෙසේ වස් තුන් මස මුළුල්ලෙහි දවසින් දවසට වඩ වඩා උතුම්වූ ඛාද්‍ය භොජ්‍ය පානීය වගී පස බෙහෙත් ආදියෙන් බොහෝ උපස්ථාන කොට වස් තුන් මස නිමි කල්හි දවසෙක ඒ ගෘහයෙහිදී වළඳා අනතයෙහි ඔවුන්ට අනුමොදනා බණ දෙසා පින් දෙමින් ඉක්බිති කියනසේක්: උපාසකයෙනි වස් තුන් මස සම්පූණි විය, ඉදින් අපි බැහැර යම්හයි කීසේක. එබස් අසා ඒ දෙදෙනම කියන්නාහු: ස්වාමිනි සෙට දවස් මෙතැන්හිදී වළඳා ඉක්බිතිව වඩනේ යහපතැයි කීහ. මෙසේ කියමින් උන්වහන්සේ වෙහෙරටම වැඩමකරවා දෙවන දවස් පළමුසේම දන් පිළියෙළ කොට උන්වහන්සේ එතැන්හි වැඩි කල්හි පෙරසේම වළඳවා ඉක්බිතිව තාන් කඩක්ද තලතෙල් පිරූ කුලාවක්ද උක්සකුරු කැටියක්ද පිළිගන්වා දෙදෙනම පසග පිහිටුවා වැඳ මඳක් තැන් පසු ගමන් කොට අවසර ගෙන සිටියහ. එකල්හි ඒ දහර භික්ෂු තෙම ඔවුන්ට අනුමොදනා බණ කියා එසිත්ම නික්ම රුහුණු ජනපදයටම ගමන් ගත්සේක.

එකල්හි පළමුයෙන් රුහුණු ගිය උපාධ්‍යායවූ මයිලණි වහන්සේද වස් අනතයෙහි පවරා නැවතත් තමන්වහන්සේ වසන කැකුලෙනනිය නම් විහාරයට එනසේක්: පළමුව ඔවුනොවුන් වහන්සේ දුටු මහවැලිගං අස රුක් සෙවණෙහිදීම දැක එතැන්හි උන්වහන්සේ වැඩ හිඳිනා ලෙස අස්නක් පනවා වැඩහුන් කල්හි පත්කඩ තබා වැඳ එකත්පස්ව සිටිසේක. එකල්හි තෙරුන් වහන්සේ කියනසේක්: භද්‍රමුඛයෙනි කිමෙක්ද තොපගේ මව් පිය දෙදෙනා දුටුදැයි කීසේක. එබසට උනවහන්සේ කියනසේක්: ස්වාමිනි මේ වස් තුන් මසම ඔවුන්ගේ සෙතස්නෙහිම විසූම්හ. අපටත් ඔහුම වස් තුන් මසම උපස්ථාන කළාහු වේදැයි කියා ඔවුන් පිළිගැන්වූ තාන් කඩ තෙරුන්වහන්සේට දන් දෙමින් උක්සකුරු වළඳවා, කුලාවෙන් තෙල් පය ගල්වා ස්වාමිනි මට ගුන්ථධුර විදශීනාධුර පිරිමට රුහුණම සැපයයි කියා වැඳ අවසර ගෙන වැඩිසේක.

එසඳ තෙරුන්වහන්සේ තමන්වහන්සේ වසන වෙහෙරට අවුත් පැනපි දෙවන දවස් නැගණියන් දක්නා පිණිස උන් වසන ගමට වන්සේක. ඒ උපාසිකාවෝ තෙරුන්වහනසේ වැඩි දවස් පටන් මාගේ පුතණුවන් වහන්සේ අද දවස්ම කැඳවාගෙන වඩිනාසේක. සෙට දවස්ම කැඳවා ගෙන වඩිනාසේකැයි කිය කියා පෙරමග බල බලා සුහුණු කැරල් කඩට කන් දිදී තමන්ගේ ගෙට කිසිවික්හු පැමිණි කල්හි උන්

අතින් පෙහෙන විචාරමින් ඉනුත් යහපත් වචනයන් අස අසාම සතුටු වෙමින් උන්කල්හි එදවස් ගම්මැදට පැමිණ එන්නාවූ ඒ තෙරුන්වහන්සේ දුර දැක මාගේ පුතණුවන්වහන්සේ කැඳවාගෙන බැණන්වහන්සේ එනසේක්නැයි කියා මහත් සන්තොෂයට පැමිණ උන්වහන්සේට පසුව එන කෙනෙකුන් නොදැක එසේ වීනමුත් මඳක් පසුව ගියසේක්වනැයි සිත සිතා දුන් දුන් එළිබස්නා සේකැයි බල බලා සිට ගෙදර සමීපයට බැයන්වහන්සේ එන තෙකුත් තමන්ගේ පුතණුවන් නොදැක පෙර මා සිතූවා සැබෑවූවනැයි හෘදයට මෙර පෙරළුවාසේ ශොක භාරය ධරාගත නොහීබැයන්වහන්සේගේ පාමූලඅඬාපෙරළීගියහ, එවිටතෙරුන්වහන්සේ සිතනසේක්: කිමෙක් දෝ හෝයි මා ගියපසු මෙතන දරුබිලිඳුන්ගෙන් කිසිවක්හට අඩුවෙක් වීදෝහොයි සිතා හෘදය ඉපිල සංවෙගයට පැමිණ විචාරනසේක්: කවර කාරණයක් පිණිස තෙපි මෙසේ හඬවුදැයි කීසේක. එබසට ඔහු කියන්නාහු: සවාමීනි නුඹවහන්සේ කුමක් කියනසේක්ද, මෙතනින් මට කියා වැඩියේ මාගේ පුතණුවන්වහන්සේ කැඳවාගෙන එමියි කියාලා නොවෙද; එසේ වැඩි නුඹවහන්සේ තනිවම වැඩියේ මාගේ දරුවන් ඇති හෙයින් දැයි කීහ, එබසට තෙරුන්වහන්සේ කියනසේක්: එම්බා තෙපි කුමක් කියවුද, මෙදෑ මේ වස් තුන් මස තොපගේ සෙනාසනයෙහි වස් වැස තොපගේ ගෙයිදීම වළඳ තොපගෙන් උපස්ථාන විඳ වස් අන්තයෙහි වස්ත්‍රයකුත් තෙල් කුලාවකුත් උක්සකුරු කැටියකුත් පිළිගෙන තොපට බණ කියා ගියෝ තොපගේ පුතණුවෝ වේද, එකල්හි මා මෙතන සිට තොපගේ කියමනින් උන් කැඳවාගෙන එනු පිණිස යන කලට උයින් මේතනට එන්නාවූ මහවැලිගං අසදී දැක උන්ට අවසර දෙමින් මෙපිට එවා අපි රුහුණු ගොස් මෙවක මෙදිග එම්හයි නැවතත් අවුත් මේ මහවැලිගං අසට පැමිණි කල්හි මෙතන සිට යන තොපගේ පුතණුවෝත් එතැන්හි අප දැක තොප දුන් තෙල්කුලාවෙන් තෙල්ගෙන පය ගල්වා උක්සකුරු කැටිය වළඳවා තොප දුන් නාවූ වස්ත්‍රය අපට පිළිගන්වා ගියෝ වේදැයි කියා පාත්‍රයෙහි තිබූ තාන් කඩ ගෙන දැක්වූසේක.

එකල්හි උපාසිකාවෝ සකල ශරීරය අමාවිලක ගැලූවාසේ සිහිලසව එම විටම ලත් දිව සැපයක්සේ මහත්වූ සන්තොෂයෙන් නැගී සිට තමන් පුතණුවන් ගිය දසාවට දණ්ඩනමස්කාරයෙන් වැඳ වැතිර මාගේ පුතණුවන්වහන්සේ මෙසේ නොසිතිය හැකිවූ ශ්‍රමණ ගුණයක් ඇතිසේක්ද, අහෝ මේ කවර ආශ්චර්‍ය්‍යයෙක්ද ලොවුතුරා බුදුහු කුලයා කෙරෙහි සිත් නොඇලවන ලෙසත් කුලයා සිත්ගන්නා පිණිස නෑකම් ඉතසාම් බිණීම්ආදිය නොකළ මැනවැයි බණ වදාළේ මාගේ පුතණුවන්වහන්සේ වැනිආර්‍ය්‍යයන්

උපාසිකාවෝද තමන්ගේ ගෙය ගිනි ගෙන දා නැසුණු පසු වඩ වඩා ඇඟ ගිනි ගත්තාසේ දෙන දන් කඩ වෙයි සිතා ළතැවිලිව දැගිය ගෙය නොබිඳුණු වළඳ සබල එකතැන් කොට සාල් සුඟක් ලදින් ඇරගෙන උවමනා සූපව්‍යඤ්ජන සපයා පළමු දවස් මෙන් දන් පිස තබා දැගිය ගෙයිම නොවැටී සිටි භිත්තියක් අස සෙවනෙහි උන්වහන්සේ වැඩහිඳිනා ලෙසට අස්නක් පනවා දූවටු දිය පිළියෙළ කොට *පරහා තබා පෙරමඟ බල බලා හුන්නාහුය. එසඳ ඒ භික්ෂූන්වහන්සේද වළඳන වේලා බලා ගැට වටු ගන්වාගෙන අතින් පාත්‍රයගෙන ඒ දා ගිය ගමට වැද පෙර අවුත් වළඳන කුලූපග මැහැලි උපාසිකාවන්ගේ ගෙදොරට වැඩිසේක. එකල්හි ඒ උපාසිකාවෝද උන්වහන්සේ දැක වැඳ ආරාධනා කොට වැඩම කරවාගෙන ගොස් නොවැටී සිටි භිත්ති අසබඩ සෙවනෙහි තමන් පනවා තිබූ ආසනයෙහි වඩා හිඳුවා තමන් පිළියෙළ කළාවූ දන් වැළඳවූහ. ඒ භික්ෂූහුද උපාසිකාවන්ට අනුමෙවුනි බණ කියා පෙර දවස වළඳාලා වඩිනාක්මෙන් පාත්‍රය බැඳ පිට ලාගෙන නික්ම විහාරයටම වැඩිසේක.

එවිට ඒ මැහැලි උපාසිකාවන්ගේ දුවණියෝ මෙ පවත් දැක අනේ මාගේ මෑණියෙනි අප උපස්ථාන කරන අපගේ ස්වාමීන් වහන්සේ ඉතාම නිෂ්ඨුරසේක. කාරුණා ශාසනයෙහි වැඩසිටි යත් නිෂ්කාරුණාසේක. අප ඇමට මෙසේම නිෂ්ඨුර වෙද්ද තෙසු ගෙවලදී වළඳන භික්ෂූන්වහන්සේ වැඩ හැමදෙනාගේ කාරුණු පිළිවිස කම්පිතව බණ කියා වැඩිසේක. මුන්වහන්සේ කරබාගෙන වැඩ හිඳ වළඳාලා කාරුණු පිළිවිස්නා තබා අපට උරණක් මෙන් මුවෙන් නොබැණම නික්මුණුසේක. මෑණියෙනි එසේහෙයින් තෙසු ඇමදෙනා වහන්සේම ඉතා යහපත්සේක. අපගේ ස්වාමීන්වහන්සේම ඉතා අයහපත්සේක. අඟගේ ස්වාමීන් වහන්සේම නිෂ්කාරුණාසේකැයි කිව. එබසට උන්ගේමෑණියෝ කියන්නාහු: පුතණ්ඩ නොපි කුමක් කියවුද, ඒ හැම භික්ෂූන් වහන්සේලා නුඹ ඇමට යහපත, මාගේ ස්වාමීන්වහන්සේ මට යහපත් සේකැයි කිව. මෙසේ කියා තමන්ගේ කුලූපග ඒ භික්ෂූන්වහන්සේගේ අප්‍රමාණ ශ්‍රමණ ගුණයන් දුවණියන් ඇතුළුවූ හැමදෙනා මධ්‍යයෙහි †ප්‍රශංසාකොට කීහ. මෙසේ ශ්‍රමණ ගුණාන්විත ඒ භික්ෂූන්වහන්සේ කුලයා කෙරෙහි මමත්වයක් නැතිව තමන්වහන්සේගේ ධර්මයම සිහිකළසේක. එසේ හෙයින් සියලු ප්‍රත්‍යය ලාභයෙහි ඇල්මක් නොකරන්නාවූ අනුනය ප්‍රතිඝ රහිත අලෙපචඡ භික්ෂූන් වහන්සේ විසින් කුලයා කෙරෙහි නොඇලී ධර්මපථානුවර්තීව ත්‍රිවිධ සම්පත් සාධාගන්ට උත්සාහකටයුතු. **කියන ලදුයේමැයි**–

* "පුවරු" † "ප්‍රකාශ කොට"

"එවං කුලෙසු මතිමා සතිපුබ්බයො ච
හිත්වා මමායනමතං ලවලාභහෙතු,
මොක්ඛප්පදායකවරං මුනිනා සුවුත්තං
ධම්මඤ්ජසං භජථ සාධුතරං සුරම්මං.

මෙපමණකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
නවවැනි සංසාද්භූත ශ්‍රාමණ්‍යභාව මහල්ලිකා කථාතම්වූ
අටවිසිවන පරිච්ඡේදය
කියා නිමවනලදී.

—— ०ះ० ——

## 29 වෙනි පරිච්ඡේදය

**තවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**සංඝරක්ඛිතස්ථවිරභාගිනෙය්‍ය කථාතම් කවරහයත්?**

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේදයත්?** අප බුදුන් සමයෙහි දඹදිව රජකරන **පසේනදි කොසොල්** මහරජුගේ **ශ්‍රාවස්ති**නම් පුරප්‍රවරයෙහි එක්තරු වීථියක වාසය කරන්නාවූ එක් කුලදරුවාණ කෙනෙක් සද්ධර්මරාජෝත්තමයාණන්වහන්සේගෙන් බණ අසා පැහැද ගිහිගෙයි සිට සද්ධර්මයවූ පරිද්දෙන් පිළිපැදීම නොපිළිවන් හෙයින් ගිහිගෙන් නික්ම බුදුසසුන් වැද මහණව උපසම්පන්නව **සංඝරක්ඛිත** ස්ථවිරයන්වහන්සේයයි යන නමින් ප්‍රසිද්ධව ශාසනාම්බරයෙහි විජරාජයා මෙන් මෛත්‍රී අමෘත රශ්මීන් ලොක පූජ්‍යව රහත්වූ සේක,. උන්වහන්සේගේ නැගණියෝද පුතකු කෙනෙකුන් වදා උන්ට නම් තබන්නාහු: මයිලණුවන්වහන්සේගේ නමමතබන්ට වුව මැනවැයි කියා **සංඝරක්ඛිත කුමාරය**යි නම් තුබූහ. එකල්හි සංඝරක්ඛිත කුමාරයෝ වැඩිවිය පැමිණ බුදුසස්නෙහි පැහැද මයිලණුවන් වහන්සේ කෙරෙහිම මහණව උගතමනා බණ දහම් ඉගෙන විසිහැවිරිදිව උපසම්පන්නවමයිලණුවන්වහන්සේට ජීවිතයක් මෙන් සුවච කීකරුව වත් පිළිවෙත් කෙරෙමින් වැස කල්යාමකින් එක්තරු ගමකට ගොස් වස් වසනසේක්: එ ගම්හී ජනයන්ට ප්‍රිය ජනිත කරවා බණ දෙසමින් වැස වස් අන්තයෙහි සත්රියන් කඩක් හා අටරියන් හිණ කඩක් වස්සාවාසික ලාභයයි කියා පිළිගැන්වූ කල්හි ඒ වස්ත්‍ර දෙක ලැබගෙන සිතනසේක්: මේ අටරියන් කඩ දිගින් පුළුලින් මහත්ව සිහින් මොළකිනු

ඉතා යහපත්ව තිබෙයි. එසේ හෙයින් මේකඩ මාගේ උපාධ්‍යාය වූ මයිලණුවන්වහන්සේමට සුදුසුය, උන්වහන්සේට මපිළිගන්වමියි සිතාගෙන සත්රියන් කඩ තමන්වහන්සේට සිවුරටයයි සිතාගෙන වස් අන්තවූ පසු එතැනින් නික්ම උපාධ්‍යායන් වහන්සේ දක්නා පිණිස අද්ධාන මාර්ග ප්‍රතිපන්නව සිඟා වළඳා අවුත් වෙහෙරට පැමිණිසේක, එදවස් තෙරුන් වහන්සේ සිඟා වළඳනු පිණිස විහාරයෙන් බැහැර වැඩපුසේක.

එකල්හි මේ සංඝරක්ෂිතනමක් වහන්සේ මයිලණුවන් වහන්සේ සිඟා වළඳා එනතෙක් උන්වහන්සේ වැඩහිඳිනා විහාරයෙහි වත්පිළිවෙත් කොට පාද ධොවන දිය පෙරහා තබා වැඩහිඳිනා ලෙස අස්නකුත් පනවා මයිලණුවන් වහන්සේ දැන් දැන් වඩනාසේකැයි සිත සිතා පෙරමග බල බලා වැඩහුන්සේක. එකල්හි තෙරුන්වහන්සේ ගොදුරු ගම්හි හැසිර වළඳා අනතයෙහි විහාරයට වඩනාසේක, එකල්හි බෑනණුවන් වහන්සේ දුර එනු දැක පෙර මගට ගොස් පාත්‍රයත් සඟළ සිවුරත් ඇරගෙන තෙරුන් වහන්සේ ඉදිරිකොට වැඩම කරවාගෙන අවුත් තමන්වහන්සේ පැනවූ අස්නෙහි වඩා හිඳුවා පත්සලා ගිම් නිවුණු කල්හි වළඳන ලෙස පිළිවිස පය සෝදවා තෙත් සිඳ තෙල් ගල්වා පත්කඩ තබා වැඳ සිට ස්වාමීනි මම වස් විසූ තැනින් අටරියන් කඩක් හා සත්රියන් කඩක් වස්සාවාසික ලාභය පිණිස ලදිමි, එයින් අටරියන් කඩ මට අනුග්‍රහ කොට පිළිගනු මැනවැයි කියා ගෙනවුත් පාමුල තබා පත් සලමින් වැඩ සිටිසේක. එසඳ තෙරුන් වහන්සේ තමන්වහන්සේ අමිස් හෙයින් සංඝරක්ෂිතයෙනි අපගේ තුන් සිවුරුම තරව තිබෙයි නොපිම් තෙල වස්ත්‍රය ප්‍රයොජන විදුවයි කිසේක. එබසට උන්වහන්සේ කියනසේක්: ස්වාමිනිවස්ත්‍රයලත් තැන් පටන්ම නුඹවහන්සේටම දෙමියි නියමකොට තිබීමි මාගේ චිත්තප්‍රසාදය සංකුචිත නොකොට මේ වස්ත්‍රය ප්‍රයොජන වූන මැනවැයි දෙවැනිවත් ආරාධනා කළසේක. එබසට තෙරුන් වහන්සේ දෙවැනිවත්නොඉවසූසේක, තුන්වැනිවත්කියනසේක් ස්වාමීනි ත්‍රිකොටි පරිශුද්ධවූ දක්ෂිණාවෙන් ලත් මේ වස්ත්‍රය ප්‍රතික්ෂෙප නොකළ මැනව නුඹවහන්සේට ප්‍රයොජන වුනොත් අපට මහා ලාභයයි කිසේක; මෙසේ යාච්ඤාකොට කියදිත් තමන්වහන්සේ උත්කෘෂ්ට තෙචීවරික හෙයිනුත් රට සිත්ගත්ම ඇත ලාගත් අපිස්සාමක් නොවන හෙයිනුත් අලපත නෙළුම්පත වක්කළ ජලබිඳුවක්සේ තමන්වහන්සේගේ චිත්තය ලාභයෙහි නොඇලී වෙන්ව පිරිසිදුව තිබෙන හෙයින් චිත්ත ශුද්ධියෙන්ම වස්ත්‍රය ප්‍රතික්ෂෙප කළසේක

ඒ වේලෙහි සංඝරක්ෂිතයන් වහන්සේ තමන්වහන්සේ පිළිගැන්වූමාවූ වස්ත්‍රය නොගත් හෙයින් සිතනසේක්: කිමෙක්ද මම

මුන්වහන්සේට ගිහි කලත් අවශ්‍ය බැනාණුයෙමි, මාගේ මැණි
යොත් නැඟණියෝය, මගේ තෙසු නැයෝත් මෙම නයින්
අවශ්‍යයෝය, දෙවැනිව මමත් මුන්වහන්සේ කෙරෙහිම මහණව
සුවච කීකරුව වත් පිළිවෙත් කෙරෙමින් දූත් සඞ විහාරිකව
සිටියෙමි, මෙසේ නොයෙක් කාරණයෙන්ම අවශ්‍යව සිටියදීත්
මාසනනක මේ එක වස්ත්‍රය විවරත් ප්‍රයොජන විදින්ට මැලි
සේක, එසේ මැළිකලම මහණව මුන්වහන්සේ ලඟ සිටියායෙන්
කම් කිම්දැයි සිතා එසේවීනම් ගිහි වෙමි, ගිහිවූ කලත් ගිහි කම්
කටුළුත් බැලූකල ඉතාම අවුල, එසේහෙයින් ගිහිවූකල කවර
ලෙස ජීවත් වෙම් දෝහෝයි යනින්ම සතිවූහත් කරනසේක්:
දූන් සිවුරු හරන පමණකට මේ සත්රියන් කඩ ඇත, අටරියන්
කඩ විකොට කවර බඩුවක් ගෙන දියුණුකොට ගනිම්දෝ
හොයි සිතනසේක්: එළුවන් බොහෝ දරුවන් වදන හෙයින්
මේ ඉණකඩ මිලයෙන් එළුදෙනුන් ඇරගනිමි, ඒ එළුදෙනුන්
වැදූ වැදූ එළුවන් විකොට වස්තු උපයාගෙන එයින් ක්ෂෙත්‍ර
වස්තුවක් ඇරගෙන උපයා රැස්කොට සුදුසු තැනකින් යහපත්
විවාහයක් තබාගනිමි, ඒ විවාහය ගෙනාකල ඒ සිහිත්ති මට
පුතණු කෙනෙකුන් වදයි, ඒ කුමාරයන්ට මාගේ මයිලණුවන්
වහන්සේගේ නම් තබමි, එසේ නම් තබාගෙන රථයක් ඉදිකර
වාගෙන දරුවනුත් මාගේ සිහිත් යයත් එක්ව අපගේ මයිලණු
වන් වහන්සේ දකින්ට එම්හ, ඒ එන ගමනේ අතුරු මඟදී
දරුවන්මට වඩාලා මේ ගැල පදුවයි කියමි, එසේ කියාල්හි
කුමක්පිණිසදැයි කියා ඕතොමෝම මම දරුවන් වඩාගෙනයෙමි,
නුඹ ගැල පැදගෙන යන්නැයි කියාලා දරුවන් මටත් නොවඩා
තමාටත් අත බරුයිකියාලා පසුව මට රොස්ව දරුවන් බිමට
දමාපියයි, ඒ බිම හුණු දරුවන් පිටින් ගැල්සක මිරිකාගෙනයයි
එසේ කල්හි දරුවන් හඬන හඬ අසා වැඩ දුටුපිය තී මා ඉල්ලු
ගමනේ මටත් දරුවන් නොවඩා කුමක් පිණිස බිම හෙළා
මෙනෙක් මුළා කෙළෙයි දැයි කියා කෙල තිට බැටක් දෙමියි සිත
කොප තද විසින් පදනා ගැල තබා ඔබිනොබ බලා, ඉපලක්
නොදැක රථය පදිනා කැවිටිලියම මුල පෙරළා තරකොට අල්වා
ගෙන පිටි දෙමැද අවුරා පහරක් ගසමියි සිතුසේක්: සල සලා
සිටි තල් වැටින්ම මයිලණුවන් වහන්සේගේ හිසට පිළි පිළිනො
ගත් රොස් පලවන්නාසේ ඇදගෙන පහරක් ගැසූසේක් එකෙ
ණෙහිම අනේ මාකොළේ කිම් දෝයෝයි සිතා විමතිව බලා සිටි
සේක. එවිට තෙරුන්වහන්සේත් සංඝරක්ෂිතයන් තල්වැටින්
මා හිසට ගසන්ට කාරණා කිම්දෝහෝයි දිවසින් බලනසේක්:
උන්වහන්සේ සිතු සියල්ලම මුලපටන් තමන්වහන්සේගේ
දිවසින් දැක බෑනාණුවන් වහන්සේට කියනසේක් එම්බා

සංඝරක්ෂිතයෙනි තොපගේ ගැණුන් මැරීම නොහිද, අප මහල්ලන්ට ගසන්නේයයි කීසේක. එබස් අසමින් පිළි පිළිගැන්වීම් මේ කුමක් වීදැයි තැතිගෙන දූන් මා සිතූ සියල්ලම මාගේ මයිලණුවන්වහන්සේ දැනගත්සේක, අනිස එසේවූ තෙන සසුන් වැද හිඳීමෙන් කම්කිම්දැයි සිතාසලමින්සිටිතල්වැටබිමටදමාගිහිගෙට යනු පිණිස දොරට පැන නික්මුණුසේක එවිට උන්වහන්සේගේ මයිලණුවන් වහන්සේ සිතනසේක්: මොහුනික්මෙනුයේඑකාන්තයෙන්ම ගිහිවනු පිණිසමයයි එතන සිටි උන්වහන්සේගේ ඉතාමිත්‍ර භික්ෂූන් පසුපස්සෙහි ලුහුබඳවා නොකමැති ලෙසම අල්වාගෙන්වාගෙන ලොව්තුරා බුදුන්කරා නික්මවූසේක.

කරුණා නිධානවූ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂූන් දැක ඇයි මහණෙනි තොපි හැම දැන්මෙතනට කුමක් පිණිස ආවාහුදැයි වදාළසේක. එසඳ එතැන්හි රැස්වූ භික්ෂූන් වහන්සේ බුදුන්ට දන්වනසෙක්: ස්වාමිනි මේ මහණ ගිහිවනු කැමතිව නික්මිණ, එසේ නික්මුණු අපි හැම යානොදී අල්වාගෙන මෙතනට ආම්හයි කීහ එපවත් අසා බුදුහු වදාරනසේක්: ඒ සැබෑද මහණ තෝ සිවුරු හරනට නික්මුණේයයි විචාළසේක එබසට සංඝරක්ෂිතයන් වහන්සේ කියනසේක්: සබව ස්වාමීනි ලජ්ජාවකින් එසේ සිතිනැයි කීසේක. එබසට බුදුහු වදාරනසේක්: ඇයි මහණ එසේ සිතන්ට කාරණා කවරේද? තා අල්පපුරුෂයකුත් නොවත් වීර්‍ය්‍ය ඇත්තාවූ මාවැනි උත්තම පුරුෂවූ ධර්ම රාජයක්හට පුත්‍රව එසේ හීන වීර්‍ය්‍යවන්ට කාරණා කිම්ද පිතෘන්ට ඇති වීර්‍ය්‍ය පුත්‍රයන්ට නැද්ද, මෙබඳුවූ බුදුසස්නෙහි මහණව සෝවාතැයි කියා හෝ සකෘදාගාමීය අනාගාමීය අරහතැයී කියා හෝ සියල්ලවුන් විසින් කියවා ගත නොහෙයිද, එම්බා මහණ තෝ හීන වීර්‍ය්‍යනොවී වීර්‍ය්‍යකරවයි වදාළ කල්හි ඒ භික්ෂූන්වහන්සේද වස්සාවා සිත ලත් තැන් පටන් තල්වැටින් මයිලණුවන් වහන්සේගේ හිසට පහළ තැන් දක්වා පැවති ප්‍රවෘත්තිය නොහැරම බුදුන්ට දන්වමින් මයිලණුවන්වහන්සේ මා සිතූ සියල්ලම දත් හෙයින් ලජ්ජා බලවත්ව නික්මුණෙමියි කීසෙක. බුදුහු එසඳ තෙපි ඊට අභිමානයක් නොසිතා හිඳුවයි චිත්තය නම් පාත අජටාකාසයෙහි පටන් උඩ අජටාකාසය දක්වා දුරුවූතැන් අරමුණුකරන හෙයින් දුරයන්නාවූ මේ චිත්තයවෙයි, එසේහෙයින් තා සිතින් මෙතෙක් සිතිවිලි සිතන්ට අරුමය කිම්ද, තවද මේ චිත්තය එකාවිට දෙතුන් සිතක් පවත්නට නැතිහෙයින් සොරුන් හා එක්නොවන මහසොරකුසේ තනිවම හැසිරෙන්නේය, එසේ හෙයිනුත් මේ චිත්තය අජ්ජකරන්ට බැරිය, නැවත මේ චිත්තය දැක හැඳිනගන්ට ශරීරවත්වූ සැටියකුත් නැත්තේය, අරූප ස්වභාවයක් හෙයින් එක්තරා

පැහැයකුත් මේ චිත්තයට නොමඇත්තේය, ඒසේ හෙයින් මොහු මෙබඳුයයි බුදුනොව දැනගන්ට නොපිළිවන. මෙසේවූ චිත්තය යම්කිසි ස්ත්‍රී පුරුෂ ගෘහස්ථ ප්‍රව්‍රජිත දිව්‍ය බ්‍රහ්ම යක්ෂ රාක්ෂස සිද්ධ විද්‍යාධරාදිවූ යම් කියිවෙක් සකල ක්ලේශයන් කෙරෙන් දුරු කොට ගෙන කර්ම ක්ලේශ විපාක වර්තයෙන් මිදුනේ විනම් එතෙම අමාමහ නිවන් දකිතියි වදාළසේක. මෙසේ බුදුන් වදාළ කල්හි දේශනා කෙළවර සංඝරක්ෂිතයන් වහන්සේ සෝවාන් මාර්ගඵල ලදින් පළමුවන මගින් නිවන් දැක සසර සයුරෙන් එතරවූසේක. තෙසුත් බොහෝ දෙන සතරමග සතර ඵලයට පැමිණ නිවන් දුටහ. එසේහෙයින් සත්පුරුෂ ජනයන් විසින් චිත්තසන්තානය පිරිසිදු කොට සසර සයුරෙන් එතරව අමාමහ නිවන් දකින්ට උත්සාහ කටයුතු. වදාරන ලදමැයි-

"දූරඞ්ගමං එකචරං-අසරීරං ගුහාසයං,
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති-මොක්ඛන්ති මාරබන්ධනා" යි

**මෙසේ නොයෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි**
**දසවන සංඝාද්භූත සංඝරක්ෂිත ස්ථවිරභාගිනෙය්‍ය කථානම්වූ**
## එකුන් තිස්වන පරිච්ඡේදය
**කිසා නිමවනලදී.**

---

## 30 වෙනි පරිච්ඡේදය.

---

**තවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**ව්‍යාලවඤ්චිත කථානම් කවරහෙයක් ?**
මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේද යත් ?** අප බුදුන් සමයෙහි දඹදිව එක්තරා විහාරයෙක්හි වසන සැට දෙනෙකුන් වහන්සේ කාරුණ්‍යාභිධානවූ සම්‍යක් සම්බුද්ධ රාජොත්තමයාණන් වහන්සේ කරා එළඹ උපන් සොම්නසින් පත්කඩ තබා වැඳ එකත්පස්ව සිටිකල්හි බුදුහු උන්වහන්සේලාගේ චරිත බලා භාවනාවට සුදුසු කර්මස්ථාන දී වදාළසේක. එකල්හි ඒ සැට දෙනාවහන්සේ බුදුන්ගෙන් අවසරගෙන නික්ම ගොස් ඵල පල්ලව මලින් සශ්‍රීකවූ වෘක්ෂ සමූහයෙන් හා නෙත්‍රයට මුත් ආරොහණයට අවිෂයවූ අත්‍යුච්චභයානක ගිරිකුළු පෙළින් හා ගිරිමුදුනෙන් විසිතුරු මහා ශබ්ද පවත්වා පැතනැගී හැලිගසා දිවන සිහිලස ගඟුල් හැලි සමූහයෙන් හා සමන්තා නානා ගොචර ග්‍රාමාදීන් යුක්තවූ පර්වත ප්‍රාන්තයෙහි පර්ණශාලා පිළිවෙළින්ම කරවා ගෙන අසළ ගොදුරු ගම් නිසා වැස ධ්‍යාන භාවනාදියෙහි නියුක්තව වාසය කරන සේක. එකල ඒ වනයෙහි බොහෝ සතුන් වනසා ජීවත්ව

වසන්නාවූ ව්‍යාඝ්‍රයෙක් දවසෙක ගොදුරු පිණිස ඇවිදිනේ මූන්වහන්සේලා වසන පර්ණශාලා සමීපයට පැමිණ මනුෂ්‍ය ගන්ධය ආඝ්‍රාණය කොට පන්සල් පිළිවෙළින් කොළවර තුබූ ගෙට වැද එහි සැතපුණු භික්ෂුහු අල්වාගෙන වෙනෙහි වැද අනුභව කොළේය. උදෑසන ඇමදෙනා වහන්සේ රැස්වන තැනට උන් වහන්සේ නාහෙයින් කවර උපද්‍රවයෙක් වී ද්‍යෝහෝයි මහත්වූ වේදනාවෙන් ඔබිනොබ බලා නොදැක හුන් කල්හි, දෙවන දවස් රාත්‍රියෙහිදු ව්‍යාඝ්‍රයා පළමු දවස් ආ සලකුණෙන්ම අවුත් දෙවැනි ගෙයි සැතපුණු තැනැත්තන් වහන්සේ අල්වාගෙන තමා වසන මහවෙනෙහි ගෙන ගියේය. එතැන්හි වසන භික්ෂූන් වහන්සේ දෙවන දවස්හිදු දෙවනගෙයි වසන භික්ෂුහු නොදැක වන ලැහැප් ලිය මඬුළු වැලිතලා ගහුල් හැලී ගිරිගුහාදිවූ නොයෙක් තැන ගොස් විමසා බලා ඇවිද ව්‍යාඝ්‍රයා ගිය පද සලකුණු දැක මූන්වහන්සේලාට උපද්‍රව කොළේ මේ ව්‍යාලයාවනැයි සිතා තුන්වැනි දවස් ඔහු බය ගන්වා ලුහුබඳවනු පිණිස පොළු මුගුරු සපයා තබා වැඩහුන් ගෙවල් වලම නොසැතපී බලාහුන් කල්හි, තුන්වැනි වාරයෙහිද මධ්‍යම රාත්‍රියෙහි ව්‍යාලයා තිසොල්මන්ව අවුත් තුන්වැනි ගෙයි වසන භික්ෂුහු අල්වාගත, උන්වහන්සේ ව්‍යාලයා ගත් බව දැන මහත් කොට ශබ්ද පැවැත්වූසේක. ව්‍යාලයාද ඒ ශබ්දයට භය නොගෙන තමාගත් ගැන්ම තදකොට අල්වාගත. එකල්හි ගෙවල හුන් හැම භික්ෂූහු වහා වටින් මළුවට බැස ශබ්ද පවත්වා පොළු මුගුරු ගෙන ඔහු වටලාගෙන ගස් ගල් මුල් ආදියෙහි පැහැර භයගැන්වියදීත් නො හැරම ගෙන නික්මිණ. එකල්හි ඒ හැමදෙනා වහන්සේ ගලවාගත හැකැයි සිතා පසුපස් සෙහිම ගොස් ඕහට බොහෝ භය දැක්වූසේක. ඒ ව්‍යාලයා තමා අල්වාගත් ගොදුරු හෙයින් කොතෙක් දෙනා භය ගැන්වූවත් නොහැරම වනමැද වැටී නික්මගිය, මෙසේ නික්මුණාවූ ඒ ව්‍යාඝ්‍රයා එක් තෙනක තබාගෙන අනුභව කරන්ට වන්නොත් තමාගේ ගොදුරු ගලවා ගනිතියි සිතා ද්‍යෝහෝ මනුෂ්‍යයන් විසින් නැගෙන්ට උගහටවූ පර්වත ශිඛරයක් මුදුනට පැන නැංගේය. එකල්හි පසුපස්සෙහි නික්මුණු ඒ භික්ෂුහු එතතින් මත්තෙහි යන්ට අසමර්ථව උන්වහන්සේට හඬගා කියන්නාහුඃ ඇවැත්නි මෙයින් මත්තෙහි අප විසින් තොප ගලවා ගන්ට කළමනා ව්‍යායාමයෙක් නුපුළුවන, එසේ හෙයින් මහා පුරුෂයාණෙනි ඉදින් නුඹට සහායෙක් නම් නුඹගේ වීර්‍ය්‍යයමය, ඉදින් මෙවැනි තැනකට පැමිණිකල කළමනා නම් සම් වැඩියක් වීර්‍ය්‍යමය, එසේ හෙයින් අධිගමයට වීර්‍ය්‍යාධාරව ගින වීර්‍ය්‍ය නොවයි කීසේක. එවිට ව්‍යාඝ්‍රයාට අසුව යන ඒ භික්ෂුන්වහන්සේද උන් වහන්සේලා කියා හඬ නැඟූ හිතෙසි වචනයන් අසා එසේ වීනම් එම යහපතැයි නොපමාව භාවනාකල මැනවැයි සිතා භාවනාවට පටන් ගත්සේක.

එවිට ව්‍යාලයාද ඒ පර්වත මුදුනට කිසිවකුත් ආ නොහැකි නියාව දැන ගෙන ගිය ගොදුරු ගල් මුදුනෙහි එක්තෙනක හොවා මඳක් බලා සිට පය පටන් ඈට කිලිල් කඩසේ බිඳ බිඳ කන්ට පටන්ගත, එසඳ ඒ මහාත්මයාණන් වහන්සේ කන්නාවූ ව්‍යාලයා කෙරෙහි භයකුත් නැතිව වෛෂයකුත් නූපදවා කිලිල් කඩසේ බිඳ කන බලවත් වේදනාව මඳකුත් නොසලකා සීල විසුඞි ආදිවූ සප්ත විසුඞි පරම්පරාවෙන් ගොස් දණ මඩල මස් නොකන තුරු සෝවාන් මාර්ග ඵලයට පැමිණ ඌරුවෙහි මස් අනුභව නොකරන තුරු සකෘදගාමි මාර්ග ඵලයට පැමිණ නාභි මස් අනුභව නොකරන තුරු අනාගාමි මාර්ග ඵලයට පැමිණ හෘදය වස්තුව අනුභව නොකරන තුරු අර්හත් මාර්ග ඵලයට පැමිණ ඒ ක්‍ෂණයෙහි සියලු සසර දුකින් මිදී රහත්ව අමාමහ නිවන් දුටුබව කියා උදන් අනා බණ වදාළසේක. මෙසේ මහා පුරුෂයෝ මෙබඳු මහා ව්‍යසනයකටද පවා පැමිණ එබඳු ව්‍යසනයෙහි මඳකුත් කාලනොකිරී සසර කාලකිරී සියල්ලවුන් කෙරෙහිම මෛත්‍රි කෙරෙමින් පෙර උත්තමයන් විසින් පැමිණියාවූ අමාමහ නිවන් පුර පැමිණිසේක. මෙසේ සිහි කරන්වද අවිෂයවූ ව්‍යසන සහනය කෙරෙමින් සිත එකඟ කොට ගෙන අහෝ කෙසේ නම් රහත්වූ සේක්ද? මේ ලොකයෙහි කිසි සත්ව යෙක් තෙමේ විදිනා ව්‍යසනයට පළමු කොට ව්‍යසනයෙහි ගුණ නොදන්නෙන් මුන් කවරෙක් නම් ආත්ම ප්‍රෙම කෙරේද, පරව යෙහි ප්‍රමාද වේද, එසේ නොව රූ දෙවෙහි නොපමාව ධ්‍යාන භාවනාදිවූ කුසල කාරණයෙහිම නියුක්ත වන්නේය. හේ එසේ මය, ඉඳින් මෙබඳු ව්‍යසනයෙහි කාලාවූ වීර්‍ය්‍ය ඇසුවාවූ කිසිවෙක් යෙහෙන් සිවු පසයෙන් යපී සැපයෙන් හිඳ කෙසේ නම් ශ්‍රමණ භාවයෙහි ප්‍රමාද වේද, එසේ ප්‍රමාද වීමට සිතිනුත් නොසිතන්නේමය. එසේ හෙයින් සියලු සත්වයන් විසින්ම දානයෙන් සිඬවන්නාවූ පඤ්චකාම සම්පත්තියද සිල් රැකීමෙන් සිඬවන්නාවූ රූපාවචර සුගති සම්පත්තියද, ප්‍රඥායෙන් සිඬවන්නාවූ නිවන් සම්පත්තියද කාරුණාවෙන් සිඬවන්නාවූ බුඞ පදවි සම්පත්තියදැයි යන මේ සියලු සම්පත්තියම වීර්‍ය්‍යයෙන්ම සිඬවන බැවින් සකල සත්වයන් විසින් වීර්‍ය්‍යයෙහි අප්‍රමාදව කැමති කැමති සම්පත් සිඬ කොට ගන්ට උත්සාහ සිතුව යහපති. දක්වන ලදමැයි-

"මනුස්සදෙවිස්සරියඤ්ච මොක්ඛං-යඤ්ච සුද්ධොන ච සීලපඤ්ඤා
බලෙන සිජ්ඣනති තථෙව ලොකෙ-පධානභූතං විරියං මහන්තං"යි

මෙනොකින් මේ සද්ධර්මරත්නාකරයෙහි

ඒකාලොක්ඛන සංඛ්‍යාත ව්‍යාලවස්තුවිත ප්‍රකාශනාමවූ

තිස් වන පරිච්ඡේදය

නිමවන ලදී

---

# 31 වෙනි පරිච්ඡේදය.

---

### කවද මේ සද්ධර්මරත්නාකරයෙහි
### විභූෂණ ස්ථවිර කථා නම් කවරහයක්?

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේදයත්?** අප බුදුන් සමයෙහි කොසොල් රජහු රජ කරන ශ්‍රාවස්ති නම් පුර ප්‍රවරයෙහි එක්තරා පිළියක වාසය කරන්නාවූ එක් කුල පුත්‍රයෙක් කෘෂි කර්මාදීන් ජීවත් වෙමින් වසන්නේ සීසාන්ට ගොස් වෙහෙහි වසන්නාවූ ගොන් සොයා පෙරවරු මුළුල්ලෙහි වෙහෙහි තැනින්තැන වෘක්ෂච්ඡායාදියෙහි ගොන් බලා ඇවිද දෙවෙලා මධ්‍යයෙහි ගොන් දක තමා ගෙන වුත් ගවයන් සිටිනා තැනට බැණලා උදුසන පටන් ගොන් බලා කැලවල ඇවිදි හෙයින් විඩාව ක්ෂුධාවෙන් පීඩිත වෙමින් තෙල විහාරයට ගියෙම් නම් බතක් දෙත සේකැයි සිතා විහාරයට ගොස් භික්ෂූන් වහන්සේ වැඳ එකත්පස්ව සිටියේය එසඳ තෙරුන්වහන්සේ ඔහු දක වළඳ අනතුයෙහි ඉතිරිව තිබූ බතක් අනුභව කරවයිකියා දෙවූසේක. ඒ බත් යහපත්වූ සූප ව්‍යඤ්ජනයෙන් යුක්තව තිබූ හෙයින් යපෙන පමණම අනුභවකොට දිය බී සා පිපාසා නිවා හසන මුඛ ධෝවනය කොට භික්ෂූන්වහන්සේ අතින් විචාරණුයේ: ස්වාමීනි කිමෙක්ද අදදවස් ආරාධනාකොට අමුතුව දුන් දානෙක් ඇද්දැයි විචාළේය. එවිට ඕහට කියන සේක්: උපාසකය භික්ෂූන් සිඟා ගියත් වෙසේම ආහාරය උප දනේ වේදැයි කීසේක. එකල්හි ඒ මිනිසා හනුයේ: කිමෙක්ද ඇඳගත් කෝනම් සේලය නුමුඳු කෙනෙක්ද උපයා සොයා කැවත් මේ වළඳ ඉතිරිවූ බත් විවරක් යහපත් බත් මාලුවක් කැ නොහෙම්හ, මේ භික්ෂූහු සිඟායන පමණ වෙහෙසක් විනාකිසින් ව්‍යසනයක් නොවිඳ මෙ ස් මධුරවූ ආහාරය ලබන කල තමා ගිහිව සිට සීසා වපුට වැට බැඳ රැ දවල් රැක බලා මිරිකා අවු කොටු හනා එහි ඇද පැදලා ලුණු ඇඹුල් දුරු මිරිස් තෙල්පොල් මාලු පිනි සොයා වෙහෙස විඳ ප්‍රයොජන කිම්ද, නිරතුලෙන් මහණව සිත්සේකාලා හිඳිම්සිසිතා ශුඩ ශුඹාවක් නැතත් තමන් මහණ කරවන්ට භික්ෂූන් වහන්සේට යාච්ඤාකොට කිහ, ඒ භික්ෂූන් වහන්සේද යහපතැයි කියා මහණකොටලා මහලු පැවිදි කරවූසේක. වත් පිළිවෙතෙයි හැසිර වසතත් වැළඳිමෙන් කයට දුක් නොදෙත හෙයින් සුවසේ වළඳ වැඩහිඳ ඇඟ මස් ලේ ඇතිව ගෙන සිඟාකෑමෙන් ප්‍රයෝජන මෙතෙක්ම වේදැයි සිතා සිවුරු හැර නික්ම ගිහිගෙට ගොස් වසනුයේ ඇසිල්ලකුත් එක තැනක හිඳින්ට අවසර නැතිව මෙහෙවරෙහි ව්‍යාවෘතව ඇවිද

සයට වේලාවකට බතක් නොලැබීමෙන් දුර්වලව නැවතත් සිත නුයේ: මෙසේ දුක්ගෙන ප්‍රයොජන කිම්දැයි නැවතත් විහාරයට අවුත් මහණව සැපයෙන් වළඳලා සිගිල් සෙවණ හිඳ පුෂ්ටිමත්ව ගෙන තෙමේ තමාම බලා වෙබඳු යෞවනයක සිට මහණදම් පුරන්නේ කිම්දැයි නැවතත් සිවුරු හැර උපයා සොයා කමින් කල්යාමකදී සිතනුයේ; ගිහිගෙයි විසීම නම් ඉතාම ව්‍යසනය මේ කවර දුකෙක් දැයි නැවතත් මහණවනු පිණිස වෙහෙරට අවුත් මහණකළ මැනවයි කීහ. එබසට භික්ෂූන් වහන්සේත් මොහු මහණව සිටිනා ගමනෙක් ඉතාම සුවච කීකරුව සිටිනේ යයි සිටිනා තෙක්වත් පළිවෙත් කරවාගනුම්හයි සිතා ඔහු කී කී සේම මහණකරවනසේක, මෙසේ වරින්වර සවුරයක් මහණව සවාරයක් සිවුරුහැර ගියහ, භික්ෂූන් වහන්සේද උන් සිත්සේ ඇවිදි හෙයින් ගුණ විශෙෂයකට පමුණුවා ගත නුහුණු වත් චිත්‍රහස්තයයි යන නම් තබා ආමන්ත්‍රණය කරනසේක,

මෙසේ වරින්වර සිවුරු පොරවමින් හරිමින් ඔබිමොබ පැන ඇවිදිමින් සිටියදීම ඇඹෙණියන් බඩ දරු කෙනෙක් ඇතිවූහ. සත්වන වාරයෙහි සිවුරුහැර ගිහිගෙයි වැස දවසෙක ගොස් සීසා නගුල් විය දඬු ගෙන ගෙට අවුත් බිතක්කන නගුල් වියදඬු තබාලා හිණ රෙද්ද කඩ හෙයින් අඳිනාකඩ ඇරගන්නාපිණිස වැද හෝනා කුස්සි ගෙට වන්හ. එ වෙලාවට ඔහුගේ ඇඹෙණි යෝත් මෝල් කොටා විඩාව තමා බව නොදැන අපර හරව වැද හෙව නිදන්නීය. එසේ කල්හි ඇසී පිය පියා නිබෙතත් මූව විව රව දෙකොනින් කුණුකෙළ ධාරා වැහෙන්නේය. දැරි ඇතිහෙ සින් බඩත් මහත්ව තිබෙන්නේය, ගෙට ගිය මිනිසා මේ හැම දැක නිවණට අරමුණුවූ අසුභ දසයෙන් මේ උඬුමාතකඅසුභයක් මෙන් වැටහුණු හෙයින් අනිත්‍යය සලකා මෙතෙක් කල් මම අත්‍යන්ත පරිශුඬවූ බුදු සසුන් වැද මහණව මේ මාගම් කුණපය නිසා පිරිසිඳු සස්නෙහි ප්‍රීති සැප විඳිනෙම් මෙපමණක් සලකා ගත නුහුණුයෙම්, එසේවූ මම දැන් මෙසේවූ කුණපයක් දිවිමියි අඳිමින් සිටි කඩ ඉදුරු ඇඳ නොගෙනම කඩපට බඩ තුරෙහි ගන්ව ගන්වාම ගෙන් නික්මුණේය. එසඳ දෙර සිටි නැඳණි යෝ දෙරට පිටත්වූ බෑනණුවන් දැක කුඹුරෙහි සිට දැන්ම ගෙට අවුත් ගෙයි මඳකුත් නොසිට කඩ එකතින් ගෙන පටක් දවට දවටා දෙරට පැන වෙහෙර බලා නික්මෙතියි කිබිඅපේහොයි දුවණියන් වැදහොත් කුස්සි ගෙට කරපොවා නිදන දුවණියන් දැක මෑ අසඬසඬතව වැද හෙව නිදන ලෙස බලාම දැක සිත කල කිරි අපේහෝ ගෙන් නික්ම වෙහෙරට යනවනැයි සිතා දුව ගසා

පුබුදුවා කාලකන්නිය නැගී සිටුව තිගේ වල්ලභයා තී වැදහොත් අපරහර දැන කාලකිරි ද්‍රෝහෝ විහාරය බලා නික්මිණ, මෙවක් පටන් හිට ආලය හැර පියා ගියයි සිතමියි කිවුය, එබසට ඒ ස්ත්‍රී කියන්නී ආදින් කිප වාරයෙක පෙරවා ඇරපු සිවුරු වේද දැනුත් කිප දවසක් එසින් බලා පියා එන්දැයි කියා අම්ම නුඹ නොදෙඩා හිඳින්න, උසින් සිවුරෙ සිටිනා කෙනෙක්ද දැන් දැන් ගෙදෙර සිතාලා තුඹුම එති උන්ගේ සිතිවිලි මට දැනෙයි බලන් නැසි කිවූය, එසේ නික්මුණාවූ ඒ පුරුෂයා තමාගේ සිතට වැටහී ගියාවූ අසුභයම සිහි කොරෙමින් ඒ අසුභයම එල්බ ගෙන තිල කුණු මෙනෙහි කොරෙමින් මහණවන්ට යමින් සිට මග අතුරෙහිදී සෝවාන් මාර්ගී ඵල ලදහ. මෙසේ සෝවාන්ව වෙහෙරට ගොස් භික්ෂූන්වහන්සේ වැඳ තමා මහණ කරන්ට ආරාධනා කොළේය. භික්ෂූන්වහන්සේද ඔහු සෝවාන්වූ කියාව නොදැන නොප මහණ කරවන්ට අපට බැරිය නොපට මහණවීම තම් ලඝු තරම් දෙයක්ද ඉදින් මෙවර මහණ නොවීම පලායවයි කීසේක. එබස් අසා තමාගේ සිත තරය තමහටම දැනෙන හෙයින් ස්වාමීනි මේ එකවාරයම මහණ කරවුව මැනවැයි කීහ. භික්ෂූහුද තමන්වහන්සේලාට අත් පා මෙහෙවර කිරීමෙන් උපකාරීව සුවච්ච සිටි හෙයිනුත් මහණ කරවන්ට අභිප්‍රාය ඇතිවම මහණ නොකර වම්හයි කිවෝ උන්ගේ සිත තරය ලවාගන්ට වූවමනා හෙයින් මිස මහණ නොකරවනු පිණිස නොවන හෙයින් නැහ කින් මහණ කළසේක. මහණවූ දවස් ගණනකින්ම සකෘදාගාමී අනාගාමී අර්හත් මාර්ගී ඵල පිළිවෙළින්ම ලැබ සිවු පිළිසිඹියාපත් රහත්වූසේක. ඒ විහාරයෙහි භික්ෂූන්වහන්සේද ඔවුන්වහන්සේ රහත්වූ බව නොදැන උන්වහන්සේ හා සමග කථා කරනසේක්: කිම්ද ඇවැත්නි දැන් යන ගමන බෙහෙක් කල් පමාව ගියේ නොසැලකුණු තියාද, මෙවර කල් ගියේ කුමක් පිණිස දැයි කීසේක. එබසට උන්වහන්සේ කියනසේක්: ස්වාමීනි මෙතෙක් කාලයක් සසර ඇවිද කල් ගිය හෙයින් ගිහිගෙට යාම පිට පිටම කල් නොගියේය. දැන් භව සයුර සිඳු න්ට කල් නොගිය හෙයින් ගිහිගෙට යාමට කල් ගියේයි කීසේක. මෙසේ කියමින් දක්වනසේක්:

"යෙන දෙවොපපත්‍යස්සං-ගන්ධබ්බා වා විහඞ්ගමො,
යක්ඛත්තං යෙන ගච්ඡෙය්‍යං-මනුස්සත්තං ච අබ්බජෙ.
තෙ මය්හං ආසවා ඛීණා-විද්ධස්තා විනලීකතා"

යනු හෙයින් සිවුරු හරනට ගමන් තබා භව ගමනුත් නැතිවියයි තමන්වහන්සේ සිවු පිළිසිඹියාපත් රහත්ව අමාමහ නිවන් දුටුබව හැඟවූසේක. එවිට භික්ෂූන්වහන්සේලා සන්තුෂ්ටව උන්

වහන්සේ බුදුන් ළඟට කැඳවා ගෙන ගොස් දක්වමින් ස්වාමීනි අප මූන්ට මෙලෙස කී තෙන මුසිත් අපට මෙසේ කියා තමන් රහත් නියාව හැඟවූය, අපට ඒ නොදැනුණේයයි දැන්වූසේක. බුදුහු එපවත් අසා උන්වහන්සේලාට වදාරනසේක්: එම්බා මහණෙනි උන් කීයේ සබාමය, යම් කෙනෙකුන්ගේ චිත්තය රාගයෙන් රැඳී නොතිබේද ද්වේෂයෙන් කැළඹී නොතිබේද එසේ වූවහුගේ අභිත් මාර්ගයෙන් නටුවාවූ පාප සමූහය ඔහු දසා පෙරළා ඉදින් මඳකුත් නොබලත්නෝය, එසේ හෙයින් මාගේ පුත්‍රවූ චිත්‍රහස්ත ස්ථවිරයෝ තමන්ගේ චිත්තය තරයක් නැති අවදියේ ඔබ්නොබ ඇවිද්දත් දැන් කුසල විපාක නැමති වතුවල ඇති නිවන් නැමති ගල මුදුනෙහි අභිත් ඵල නැමැති මැඹ සිටුවා සිත් නැමති දමින් බැඳපු හෙයින් දැන් යන ගමන් හළුවෝ වේදැයි වදාළසේක. මෙසේ කාරුණාතිධානවූ බුදුරජාණන් වහන්සේ වදාළ කල්හි දෙශනා කෙළවර බොහෝසත්වයන්ට ධර්මාභිසමයවූයේය. එකල්හි එක් දවසක් භික්ෂූන්වහන්සේ ඔවුනොවුන් හා කථාකරනසේක්: ඇවැත්නි රාග ද්වේෂ මොහ මදමාන මාත්සර්‍ය්‍යාදිවූ මේ කෙලශයෝ නම් කාවර තරමුන්ටත් චිඩාසොට මූත් නොරඳති මෙසේ රහත්වන්ට තිසි කුලදරුවාණෝ පවා සත්වාරෙක සිවුරු හැර සත්වාරෙක මහණව රහත්වූ හෙයින් මූත් තව තවත් සිවුරු නොහරිද්දැයි කියා කථාවක් ඉපදවූසේක. එකල්හි අප බුදුහු භික්ෂූන්වහන්සේ කාරන සාකච්ඡාව දිව කතින් අසා එසඳ සුදුසුවූ බුඩ ලීලාවකින් ධර්ම සභාවට වැඩ පතවනලද බුද්ධාසනමස්තකයෙහි පලක් බැඳ වැඩ හිඳ වදාරනසේක්: එම්බා මහණෙනි මා එන්නාට පූර්ව භාගයෙහි කාවර කථාවකින් යුක්තව හුණුද්දැයි වදාළසේක. එකල්හි භික්ෂූන්වහන්සේ කියනසේක්: ස්වාමීනි ඔබවහන්සේ විසින් නොකියන්ට වදාළ දෙතිස් කථාවන් අතුරෙන් එක් කථාවෙකිනුත් යුක්තව උනුමෝ නොවම්හ. දැන් චිත්‍ර හස්ත ස්ථවිරයන් වහන්සේ කෙලෙසුන් නසා රහත්වූ බව කිය කියා උනුම්හයි කීසේක. එබසට බුදුහු වදාරනසේක්: එම්බා මහණෙනි සොරකම් කරන සොරු පවා ගේ වලට වැද සොරකම් කරන්නාහු වස්තු ඇතිව තිබෙන ගෙවල් බලා වස්තුවෙහි තරම් පදම් බලා වැද සොරකම් කරනමුත් දිළිඳු ගෙයකට නොවදනාහුය. ඉදින් කෙලෙස් සොරු එසේ තරම් පදම් සලකාන්නාහු නොවෙති. කාවර තෙනකත් සොරකම් කෙරෙති, ඉදින් මූන් මූර්ජිමත්ව එක් තැනෙක රැස්කරනොත් සරසින් සක්වළත් පටුය උසින් බඹලොවත් මිටිය, එසේ හෙයින් මේ කෙලශයෝම බොහෝවූවාහුම වෙති, එසේ හෙයින් පාරමිතා භූමියෙහිදී අප වැන්නවුන් පවා ඔබ්නොබ ගස්වන්නෝ වෙත සාච්‍රැන් බලද්දැයි වදාරා ඉකුත්වත් ගෙනහැර දක්වා වදාළසේක.

**මේ කෙසේදයත්?** යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්ම දත්ත නම් රජහු රජකරන සමයෙහි කුද්දාල නම් මානවක යෙක් තිඹිනව රුකෙකයි එතකුදුවූවත් ඔහට ඇති රක්‍ෂාවක් නම් වරා මනාවක් හා උදලුකෙටියෙක් ඇත. එපමණකින් ජීව ත්ව ගත නොහී වරා මනාවක් උදලු කෙටියත් සෙමෙහි තබා තපසට යෙමියි කියා ගෙන් නික්ම ගොස් හිමවතට වන. මෙසේ තපසට හිමවතට වන් කුද්දාල මානවක තෙම වල්කලා හැඳ සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වන මූල ඵලා හාරයෙන් ජීවත්ව වෙනෙහි වසනුයේ: ගිමන් ගිමන් අට මස එතැන්හි තපස්කොට වසන කල්හි දවසෙක වැසි වැස බිම තෙමී ගොවි තැනට පදන් දුන් කල්හි එපවත් දැක දැන් මෙ වෙනෙහි තපස් කොට වසන් තෙම් කිම්ද, මම කිසිත් නැති එකෙක් නොවෙමි එන ගමනේ තබාලා ආ වරා මනාවක් හා මැදින් ගෙවි දෙකොනින් උල්ව තිබෙන උදලු කෙටියෙක් ඇත, ඒ වරා මනාව මේදෘ වපුටගත නුහුණු වොත් මත්තට බිජුවට ඇස වෙයි සිතා තාපස ප්‍රව්‍රජ්‍යාව හැර ගිහි වෙමින් ගමට අවුත් උදලු කෙටිය ගෙන එක් තැනක් උදළු ගා තනා වරා බිජුවට වපුට වැට බැඳ රැකා බලා පැසුණු කල්හි දෘ මිරිකාගෙන වරා නැළියක් වෙනම මැත තබා ඉතිරි වරා සුභ කා නිමවාලා ඉදින් හිඳ කරන ගොවිතැනෙක් නැත, එසේ හෙයින් දැන් මෙතන අත පිට අත තබා හිඳිනා බලාත් නිකම් හිඳිනා ගමනේ තපස් කළ යුතුයයි නැවතත් හිමවතට ගොස් තාපසව වන මූල ඵලා හාරයෙන් ජීවත්ව වැස වරා නැළියත් උදලු කෙටියත් සිත සිතා කිසිත් ධ්‍යාන භාවනාදියක් නොකොට හිඳ පළමුසේම කාලට වැසිපොද ගසා බිම මොලොක් වූවා දැක දෙවැනිවත් ගිහිව අවුත් පෙර තුබූ වරා නැළිය හා උදලු කෙටිය දැක මෙසේවූ රක්‍ෂාවක් තිබැදී මා මහණවූයේ කිම්දැයි සිතා එක් තැනක් උදලු ගා වල් හැර වරා නැළිය වපුට රැකා බලා දෘ මිරිකා ඉතුත් වරා නැළියක් වෙනම තබා සෙසු වරා තබාගෙන කා බී නිමි කල්හි නැවතත් හිමවතට ගොස් මහණව තපස් කොරෙමින් මෙසේ එක වරා නැළිය හා උදලු කොටිය නිසා සත්වරෙක වෙනෙහි වැද කරන තපස් හැර ආයේමි' මේ උදලු කොටියත් වරින් වර ගෙවි ගෙවී කොටිව ගිය පමණක් විනා මුන්දලා කරවාලන කාරිය ගෙවෙන්නෙත් නැත, කොටි වන්නේත් නැත, එසේ හෙයින් මේ දෙකාම තිබු තිබූ පමණින් වෙහෙස විඳ අවැඩ සිඩවන මූත් වැඩෙක් සිඩකොටගනා නො දෙති, එසේ හෙයින් මේ දෙකාම එක් තැනෙක තිබුවද වලකට දැමුවද නැවත ගිය තැනකින් අවුත් මේ වරා නැළිය හා උදලු කොටිය සාරා සොයා ඇවිදින්ට සැලකෙයි, එසේ හෙයින් මීට

කුමක් කෙරෙම් දෝහෝයි සිතා නුවණක් සිතනුයේ: ගඟට ගෙන
ගොස් දියට දැමූ කල යහපතැයි සිතා වරා නැළියක් උදලු කෙටි
යක් ඇරගෙන ගංතෙරට ගොස් තමාට වෙහෙසදෙන සතුරන්
දෙන්නකු අල්වාගත් ගමනේ ගැලවී නොයන ලෙස එක්ව මිරිකා
බැන්දක්මෙන් වරා පොච්ටනිය උදලුපායෙහි තරකොට බැඳලා
ගඟබඩ සිට ඇස් වසාගෙන ඉසවට තුන් විටක් සිසාරා ගඟදිය
මැඳට දමමින් ඇස අයා බලා හුණු තැන් නොදැක "ජිතං මෙ,
ජිතං මෙ" කියා තුන්විටක් හඬ ගැසීය. එකල්හි බරණැස්
රජහු සටනට ගොස් පසල් දනව්වක් ජයගෙන බරණැස් ගඟ
සමීපයෙහි කඳවුරු බැඳ හිඳ ජලස්නානය පිණිස ගඟට බැස සිටි
කල්හි මේ කුද්දාල පණ්ඩිතයන් දිනා ගියෙමියි යන බස අසමින්
රජදරුවෝ නම් තමන්ගේ වික්‍රම පතළ ජයඝොෂාවට ප්‍රසන්න
වන මුත් අනිකෙක්හු ගත් ජයට ප්‍රිය නොවන හෙයින් කුද්දාල
පණ්ඩිතයන් ළඟට කැඳවා කියන්නාහු: එම්බා සගය මම සතුරන්
ලුහුබඳවා ජයගෙන අයිමිය. තොපිත් දිනාගියෙමියි කීව, ඒ කවරේ
දැයි විචාළහ. එබසට කුද්දාල පණ්ඩිත තෙම කියනුයේ: දෙවයන්
වහන්ස සටනට ගොස් නුඹ වහන්සේ ජය ගතත් නැවත එම
සතුරෝ පිට බලයක් ලද්දුනම් පසු පස්සෙහිම ලුහුබඳවා ගෙන
අවුත් නුඹ වහන්සේ පරදවති, එසේවූ දිනීම් ජය ගැනීමටම ගත
නොහැක්ක, මම වනාහි මසුරු සතුරන් පරදවාපීමි, ඔහු දෙවැ
නිව මා පරදවාගත හෙන්නා තබා මාගේ දිසාවත් බැලිය නො
හෙති, එසේවූ දිනීම් දිනීම් නම් වන්නේය, එසේ හෙයින් මා
ජයගත් ජයම යහපතැයි කියා ගඟදිය බල බලා සිටියහ. මෙසේ
ගඟදිය බල බලා සිටි කුද්දාල පණ්ඩිත තෙම දියපීරා අභිප්‍රායානු
කූල ධන සමූහයක් ඇරගන්නාසේ ධ්‍යාන උපදවා එතැන්හිම
සිට අභිඥලාභීව අහසට පැනනැඟී පලක් බැඳ හුන්හ. බරණැස්
මහ රජහු ඒ ක්‍ෂණයෙහි සිටි තැනම සිට අහසට පැනනැඟීපලක්
බැඳ හුන් බව දැක ආශ්චර්‍ය්‍යයට පැමිණ වැඳ වැතිර කුද්දාල
පණ්ඩිතයන්ගෙන් බණ අසා පහන්සිත් ඇතිව තමන් මහණ
කරන්ට ආරාධනා කොට තමන්ගේ සතර ගව්වක් ගලා සිටි මහ
පිරිස හා සමඟ මහණ වූහ. අනිකුත් නුවරක රජ්ජුරු කෙනෙක්
බ්‍රහ්මදත්ත රජහු මහණ වූහයි යනු අසා එසේ කල ඒ නුවර රාජ්‍ය
සම්පත්තිය අපටම නතුය, සටන් කොට ගන්නා රජ සැපත්
බලාත් මෙසේවූ නිරාකුල රාජ්‍ය සම්පත්තිය යහපතැයි සිතා සිවු
රඟ සෙනඟ පිරිවරමින් බරණැස් නුවරට අවුත් ධන ධාන්‍ය
සම්පත්තීන් පිරිතුබූ නුවරදැක මෙබඳු නුවරක්හැර ගොස් මහණ
වූයේ මීට වඩා එයින් ඵල ඇති නියා වේදැයි තුමූත් ගොස් කුද්දාල
පණ්ඩිතයන් දැක උන්ගේ ගුණෙහි පැහැද සහ පිරිවරින් මහණ

වූහ. මෙසේ ක්‍රමයෙන් සත් රජ්ජුරුකොනෙක් සත් සෙනඟක් හා සමඟ අවුත් කුද්දාල පණ්ඩිතයන් දැක පැහැද මහණ වූහ. මේ හැම දෙන වසන පන්සල් දිගින් පුළුලින් අටවිසි ගව් පමණ විය. මේ හැම දෙනම ධ්‍යාන උපදවා ගෙන අපරිහීණ ධ්‍යානයෙන් බ්‍රහ්ම ලොකයෙහි උපන්හ. එකල කුද්දාල පණ්ඩිතයෝ නම් සව් නේ ගෙවා දැන ලොවුතුරා බුදුවූ මම්මය, එසේ හෙයින් අප වැනි තවුන්ගේ චිත්තය පවා මෙසේ චලිත කළාවූ කෙලශයෝ මහ මෙර පරයන සුලඟ පුළුන් නොබලන්නාසේ මූන් බලද්දැයි වදාරා ධර්මදෙශනා කළසේක. එසේ හෙයින් මේ ලොකයෙහි නුවණැත්තවුන් විසින් මේ අනුශාසනා සිත තබා කිසිලෙසකිනුත් කෙලෙස් සතුරන්ට ඇ:සර නොහැර කුශල ධර්මයම සම්පූර්ණ කොට තුන් තරා බොධියෙන් එක්තරා බොධියකට පැමිණෙන්ට උත්සාහ කටයුතු. **වදාරන ලද්‍ද ගාථා මැයි**–

“ අනවට්ඨිතචිත්තස්ස-සද්ධම්මං අවිජානතො,
පරිප්ලවපසාදස්ස-පඤ්ඤා න පරිපූරති.
අනවස්සුතචිත්තස්ස-අනන්වාහතචෙතසො,
පුඤ්ඤපාපපහීනස්ස-නත්ථි ජාගරතො භයං.”

**මෙතෙකින් මේ සද්ධර්ම රත්නාකරයෙහි**
**දෙලොස්වන සංසාද්භූත චිත්‍රභක්ත ස්ථවිර කථානම්වූ**

## එක්තිස් වන පරිච්ඡෙදය

**කියා නිමවනලදී.**

—— ०:० ——

# 32 වෙනි පරිච්ඡෙදය.

**තවද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**මාතිකමාතා කථානම් කවරහයත්?**

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

——————

**කෙසේදයත්?** අප තිලොගුරු බුදුන් සමයෙහි **පසේනදි කොසොල්** මහරජහුගේ විජිතයෙහි පර්වතාශ්‍රය ජනපදයක මාතිකා නම් ගමෙක් විය. එකල්හි භික්ෂූන් සැට දෙනෙකුන් වහන්සේ ලොවුතුරා බුදුන්කරා එළඹ දැක වැඳ කර්මස්ථාන ගෙන භාවනාවට සුදුසු පියසක් බලා දනව් සැරිසරා වඩනාසේක්: පෙර වරුවේකා සිඟා වැළඳීමට වේලා බලා අසල් හෙයින් පර්වතාශ්‍රයවූ ඒ ඈළ ගමට සිඟා වින්සේක. එකල්හි එගම නායක මාතිකානම් උපාසකයෙක් ඇත. ඒ ග්‍රාමභොජකයාගේ මෑණියෝ වැඩි

භික්ෂූන් සැට දෙනාවහන්සේ දැක අතිප්‍රසන්නව තමන් වසන ගෙය සුවඳ පිරිබඩ ගෙන ආසන පනවා එහි භික්ෂූන් වඩා හිඳුවා උදුසනම සිහා වැඩි හෙයින් කැඳ අවුළුපිළියෙළ කොට වළඳවාලා නොබෝ කලකින් දනුත් වළඳවාලා ඉක්බිති අනුමෙවුනි බණ අසා ස්වාමීනි දැන් වඩනේ කොයිදැයි විචාළහ. එබසට කියන සේක්: උපාසිකාවෙනි පාසු තැනකට යම්හයි කීසේක. ඒ උපාසිකාවෝත් වයොවෘඩ පමණක්ම නොව ඥානවෘඩ කමකුත් ඇති හෙයින් මුන්වහන්සේලා වස්වසන තැනක් සොයා යන සේකැයි උන්වහන්සේලා කී බසින්ම දැනගෙන එවිට පසඟ පිහිටුවා වැඳ ස්වාමීනි නුඹ ඇමදෙනාවහන්සේ ඉදින් මේ වස්තුන් මසමෙතන විසූසේක් වීනම් මමද තිසරණ පිහිටා පන්සිල්සමාදන්ව පොහොයෙන් පොහොයෙහි පෙහෙවස් රකිම්යි කිවුය. එබසට භික්ෂූහුද අපිත් භාවනාවට සුදුසු තැනක් සොයම්හ එසේ හෙයින් දැන් මුන්ම මුල්කොට ගෙන සිවුපසයෙන් අපාසු නොවිඳ භාවනා මුදුන්පත් කොට ගෙන සසර සයුරෙන් එතර වම්හයි ආරාධනා ඉවසූසේක. උපාසිකාවෝද උන්වහන්සේලා සැප විහරණයෙන් වාසය කරවනු පිණිස විහාරයක්කරවාදුන්හ. ඒසැටදෙනාවහන්සේත් ඒ විහාරයෙහි වසන සේක්: එක් දවසක් රැස්ව ඔවුනොවුන් වහන්සේ අපවාදලෙස කියන සේක්: ඇවැත්නි අප හැම ඉදින් ධ්‍යාන භාවනාදියෙහි ප්‍රමාද නොවියයුතුය, මේ ශ්‍රඬාවත් උපාසිකා තොමෝ

> "න පිතා නච මෙ මාතා-න ඤාති නච බන්ධවෝ,
> කරොති ඊදිසං කිච්චං-සීලවන්තස්ස කාරණා."

යනු හෙයින් මෙ උපාසිකා තොම අප සැටනමින් එක් තම කට උවත් මේ ජාතියෙම නෑ කමක් නැත්තීය, හඳුනන්නේත් මේ ගමනේමය, එතකුදු වුවත් සිල්වත්සේක ගුණවත් සේකැයි යන අදහසින් තමනුත් සසර දුකින් මිදෙන ලෙස නෑ සියකෙනකුන්ට කරන උපස්ථානයකට වැඩි තරම්ව උපස්ථානත් කෙරෙති, එසේ හෙයින් උන්ගේ අදහස් ලෙසටම අපත් විසුවමැනව, එසේ නොවිසුමෝ නම් උන් කරන උපස්ථානයෙහි අදහස ශුඬ බැවින් උන්ට දෙන්නාවූ විපාකයෙහි අඩුවෙක් නොවන්නේය, අප හැමගේ පිළිවෙත් අඩුවීමෙන් අප හැමටම අධිගම බාධකයයි කියා කථා කොරෙමින්.කාලමතා දෙය පාබා අතිශොක ව්‍යාවෘත වුමෝත් නම් නිරාදෙර කෙසේ නම් වසමෝද, කමටහන් උගන්නමෝත් කාරුණා නිධානවූ මහා පුනි පන්තියෙහි හැසිරෙන්නාවූ බුදුන් ගෙන්ම උගත් හෙයින් ඒ බුඬආඥාවට විංචාවක් නොම කරන්

නේය. අප උගතමනා කර්මස්ථානත් ඒ බුදුන්ගෙන්ම උගත් හෙයින් බුද්ධවරහු නම් ඡායාවක්සේ විසුවත් තමාගේ ශුද්ධඅදහසින් මුත් වංචාවෙන් ඔවුන් සිත්ගත නොහැක්ක, එසේ හෙයින් උන්වහන්සේ සිත්ගෙන සසරින් ගැලවෙන්ට සිතන්නාවූ අපි හැම උපෙක්‍ෂා විය නොහැක්ක, ප්‍රමාදවිය නොහැක්ක එසේ හෙයින් දෙනමක් එක තැනක නොසිටිය යුතුය, නොහිඳියුතුය, සව සත් පිරිත් කරන වේලෙත් උදෑසන සිඟා යන වේලෙත් එකතැන් වම්හ, සෙසු වේලෙහි දෙනමක් එකතැන් නොවම්හ, එනකුදුවුවත් ගිලන් කෙනෙක් ඇතහොත් වෙහෙර මැද බැඳ එල්වා තිබෙන මිණියේ ගසාලන්නාම ඒ ශබ්දයසලකුණෙන්එකතැන්ව ඊට සුදුස්සක් කරම්හයි, මෙසේ කතිකා කොට ගෙන ධ්‍යාන භාවනාදියෙහි නියුක්තව එසැටදෙනා වහන්සේම විවෙක ස්ථානවලම වෙන වෙනම වාසය කරන සේක.

මෙසේ වාසය කරන කල්හි එක් දවසක් උපස්ථාන කරන උපාසිකාවෝ තෙල් මී සකුරු ආදිවූ ගිලන්පස බෙහෙසත් ගෙන්වාගෙන කොලි කොල්ලන් පිරිවරා සවස්මාන විහාරයට අවුත් විහාර මධ්‍යයෙහි සංඝයාවහන්සේ නොදැක මේ වෙහෙර වසන භික්‍ෂූන්වහන්සේ කොයිවැඩිසේක්දැයි එතැන්හී සිටියවුන් අතින් විචාළහ, ඔවුන් විසින් තමන් වහන්සේලා වසන රාත්‍රි ස්ථාන දිවා ස්ථානවලම වැඩහිඳිනා සේකැයි කී කල්හී එබස් අසා උපාසිකාවෝ විචාරන්නාහු: දැන් උන්වහන්සේලා අප විසින් දක්නට පිළිවන්දැයි විචාළහ. එබසට භික්‍ෂූන්වහන්සේලා කියාගත් කතිකාව දන්නාවූ මිනිස්සු කියන්නාහු: තෙල බැඳ එල්වා තිබෙන මිණියෙහි දණ්ඩකින් ගැසූකල් ඇමදෙනා වහන්සේම රැස්වන සේකැයි කීහ, එපවත් අසා මිණිය සොලවා ශබ්ද පැවැත්වූහ. එසඳ භික්‍ෂුසංඝයාවහන්සේ මිණියෙහි ශබ්දය අසා කිසිවෙක්හු ගිලන්වූ නියායයි හුන් හුන් තැනින් වහා නික්ම අවුත් විහාර මධ්‍යයට රැස්වූසේක. එකල්හි දෙනමක් එක්ව නොඇවිත් ඒ ඒ තැනින් තනි තනිවම එන්නාවූ භික්‍ෂූන්වහන්සේ ඒ උපාසිකාවෝ දැක මාගේ ස්වාමිදරුවූ මේ භික්‍ෂූන් වහන්සේ ඔවුනොවුන් වහන්සේලා කැටිව විරුද්ධයක් ඇතිසේක් වනැයි සිතා වැඩි සංඝයාවහන්සේ වැඳ ස්වාමීනි නුඹවහන්සේලා තනි තනිව හිඳිනේ උනුන් වහන්සේලා කැටීව විරුද්ධයකින්දැයි විචාළහ. එබසට උපාසිකාවෙනි අප හැමගේ ඩබරෙක් නැතැයි කීසේක. එසේ ඩබරක් නැතිකල සිඟාවඩිනා කල එක්ව වඩින්ටත් දැන් වෙන වෙනම සිටින්ටත් කාරණා කිම්දැයි විචාළහ. උපාසිකාවෙනි වෙන වෙනම වැඩහිඳ අපි හැම මහණදම් පුරම්හයි කීසේක. එබසට උපාසිකාවෝ කියන්නාහු:

ස්වාමීනි මහණදම් නම් කුමක්දැයි විචාළහ. එබසට කියනසේක්: දෙතිස් කුණප කොට්ඨාසය මෙනෙහි කිරීමෙන් කායගතාසති කර්මස්ථානයෙහි යෙදෙම්හ. තිලකුණු මෙනෙහි කරම්හයි කීසේක. උපාසිකාවෝ එපවත් අසා ස්වාමීනි ඒ හැම නුඹවහන්සේලාට මුත් අපට නොවටනේදැයි විචාළහ. එබසට භික්ෂූහු කියත්තාහු. උපාසිකාවෙනි ධ්‍යාන භාවනාදිය සියලු රෝගයට හිත බෙහෙතක් මෙන් සෑමටත් යහපතැයි කීසේක. එසේ වීනම් ඒ ධ්‍යාන භාවනාදී ක්‍රමය මටත් වදාළ මැනවයි කීහ. ඔවුන්වහන්සේලාද යහපතැයි කියා භාවනා ක්‍රමය නොවරදවා ඒ උපාසිකාවන්ට කීසේක. එකල්හි උපාසිකාවෝද භාවනා ක්‍රමය ඉගෙන භාවනාභි යොගයෙහි යෙදී තමන්ට භාවනාක්‍රමය ඉගැන්වූ සංඝයාට පළමුව අනාගාමී වූහ. ඒ අනාගාමී මාර්ගය ලැබීම හා සමගම සිවු පිළිසිඹියා වන්ද ලෞකික අභිඥාවන්ද ලත්හ. මෙසේ උපාසිකාවෝ සමාපත්ති සැපයෙන් හිඳ එයින් නැඟී දිවසින් බලත්තාහු: මාගේ භික්ෂූන්වහන්සේ මා ලත් මේ ගුණ විශේෂයට කවර කලක පැමිණිසේක් දෝහොයි බලා අධිගමයක් තබා ධ්‍යාන පමණකුත් නොලත් නියාව දිවසින් දැක සෙනාසන ඵාසු ඇද්දෝහෝයි නැද්දෝහොයි බලා එයිත් ඵාසු නියාව දැක ආහාර සප්පාය සැප දෝහෝ දුක් දෝහොයි දිවසින් බලා උන්වහන්සේලාගේ අභිප්‍රාය ලෙස ආහාර සම්භ නොවන හෙයින් ආහාර සප්පාය නැති නියාව දැක එවක් පටන් නොයෙක් ප්‍රකාරයෙන් කැඳ අවුලුපත් වර්ගද නොයෙක් රස ඇති බත් මාලුද පිළියෙළ කරවා උන්වහන්සේලා තමන්ගේ ගෙයිම වඩා හිඳුවා ස්වාමීනි අභිප්‍රාය දෙයක් වැළඳුව මැනවැයි ආරාධනා කොරෙමින් සිතු ලෙසටම වළඳවති. එතැන්පටන් සප්පායවූ භොජනය ලදින් කාය සැප ඇතිවත් ධ්‍යාන භාවනාදියට සිත එකඟ විය, එකඟවූ සිතින් භාවනා කොට විදර්ශනා වඩා සිවු පිළිසිඹියාපත් රහත්ව සිතනසේක්: අනේ මේ උපාසිකාවෝ අපට බොහෝ උපකාරී වූහ ඉදින් යම්සේ අපි භොජනයෙන් සැපයක් නොලදුමෝ නම් මාර්ග ඵල ප්‍රතිවෙධ කළ නොහෙම්හ. දැන් වස් තුන් මසත් ඉක්මිණ, වස් පවරාලා අපි බුදුන් දකින්ට යම්හ. එසේ හෙයින් අප කළාවූ කෘත්‍යය සිඬව දැන් බුදුන් දැක්මට යාම මුත් නිසාම සිඬපීයයි කියා උපාසිකාවන්ට කියනසේක්: අප කළමනා කෘත්‍යය සිඬවිය, අපි බුදුන් දකින්ට යම්හයි කීසේක. උපාසිකාවෝද තමන් කළ උපස්ථානය සප්‍රයොජනවූ හෙයින් සමාධිව යහපත ස්වාමීනි වැඩිය මැනවැයි පසු ගමන් කොට මඳක් තැන් ගොස් ස්වාමීනි නව නවත්ම මොබ වඩනේ යහපතැයි ආරාධනා කොට අවසර ගෙන සිටියහ.

ඒ සැටදෙනා වහන්සේද සැවැත්නුවරට වැඩ බුදුන් දැක වැඳ එකත්පස්ව හුන් කල්හි බුදු විසින් සුව දුක් කිම්දැයි මහණෙනියි වදාළසේක. ස්වාමීනි කිසිත් අපහසුවෙක් නැත, අප ගියතෙන ඇළගමුයෙහි මාතිකානම් උපාසකායකුගේ මෑණි කෙනෙක් අපගේ අදහස් දැන මෙබඳු භොජනයක් දුන්නු නම් යහපතැයි සිතූ කල්හි ඒ සිතූ සිතූ ලෙසම භොජන සපයා දෙතියි කියා ඒ උපාසිකාවන්ගේ ගුණ කීසේක. එපවත් අසා එක්තරා භික්ෂු කෙනෙකුන් වහන්සේ උන්ගේ ගුණ මෙබඳු වීනම් මමත් ඔබ යාතුයයි බුදුන්ගෙන් කමටහන් ගෙන ස්වාමීනි මමත් මේ භික්ෂූන් වහන්සේලා විසූ ඇළ ගමටම යෙමි කියා අවසර ඇරගෙන දෙවුරමින් නික්ම මඟ තුර සැතපී එගමටම වැඩිසේක. එ ගමට වැඩ මාතික මාතු උපසිකාවන් කරවූ විහාරයට වැඩ එදවස්ම සිතනසේක්: මේ වෙහෙර කාරවූ උපාසිකාවෝත් පරසින් දනිත්ල, මම වැලින් ගමනින් විඩාව ගියෙමි, විහාරය හැමඳගන්ට නොහැක්කෙමි, මේ විහාරය වට හැමඳනා පිණිස මිනිසකු එවූ නම් යහපතැයි සිතූසේක. උපාසිකාවෝද තමන්ගේ ගෙසිම හිඳ දිවසින් බලා ඒ කාරණය දැන මිනිසකු වෙහෙරට එවා හැමඳවූහ. ඒ භික්ෂුහුද දෙවැනි වක් සිතනුයේ: මම ගමන් විඩාව දිය පිපාසා ඇතියෙමි, මේ උපාසිකාවෝ පැන් පවස් සංසිඳුවනු පිණිස ශර්කරා දියත්තක් යොදා එවූ නම් යහපතැයි සිතූසේක. උපාසිකාවෝද උන්වහන්සේගේ අදහස් දැන මධු ශර්කරා බහා යෙදූ ගිලන් පසක් වෙහෙරට එවා වැළඳවූහ. දෙවන දවස් උදෑසනම යහපත්වූ ද්‍රවාපු දිය කැඳ හා අතිරස පල ලාළු සහිත අවුලුපත් එවූනම් යහපතැයි සිතූසේක. උපාසිකාවෝද එසේම කැඳ අවුලුපත් පිළියෙළ කොට එවූහ. කැඳිත්පා වළඳාලා මඳක් සැතපී සිතනසේක්: මේ වේලාවට අතුරුපස වළඳන ලෙස අවුලුපත් එවූනම් යහපතැයි සිතූසේක. උපාසිකාවෝද එසේම අවුලුපත් පිළියෙළ කොට වෙහෙරට එවා වැළඳවූහ. ඒ භික්ෂූන්වහන්සේද සිතනසේක්: මේ උපාසිකාවෝද අප සිතූ සිතූ සියල්ලම ගෙණ බැණ ගත්තාසේ එවාලති, අද දවාලට සකස් කොට මධුරවූ යවකොමු හා මියුරු බ්‍යඤ්ජනයෙන් යුක්ත ඝෘතක්ෂීරය හා ශුද්ධවූ ආහාරයක් ගෙන්වා ගෙන තුමූත් අවුනම් යහපතැයි සිතූසේක. උපාසිකාවෝද මාගේ ස්වාමිදරුවන් වහන්සේ දන් හා සමග මා දක්නා කැමතිසේ කැයි දන් ගෙන්වා ගෙන තුමූත් ඒ විහාරයට හොසින් දන් පිළිගැන්වූහ.

උන්වහන්සේද දන් වළඳා අනන්තරයෙහි මාතික මාතාවෝ නම් තුඹදැයි විචාළසේක. උපාසිකාවෝද උන්වහන්සේ කීබස් අසා එසේය ස්වාමීනි මමය මෙතැන්හි වැඩි කෙනෙකුන් වහන්සේට

උපස්ථාන කරන්නෙමියි කිහ, එවිට ඒ භික්ෂු තෙම කියනුයේ: තෙපි පරසිත් දනුදෑයි විචාළසේක. එබසට උපාසිකාවෝ කියන්නාහු: ස්වාමීනි කුමක් නිසා එසේ විචාළෙදෑයි කිවුය. එබසට ඒ භික්ෂු තෙම කියනුයේ: උපාසිකාවෙනි තොපි මා සිතූ සියල්ලම, දැනගෙන ඒ වූ ලෙසම නිෂ්පාදනය කළහෙයිනැයි කිසේක. එබසට කියන්නාහු: ස්වාමීනි පරසිත් දන්නා ඇමදෙනා වහන්සේ බොහෝසේක් වේදෑයි කිය. එබසට උන්වහන්සේ කියනසේක්: මම භික්ෂූන්වහන්සේගේ පරසිත් දැනීම් විචාළෙම් නොවෙමි තොප පරසිත් දන්නා බව වේද මා විචාළේයයි කිසේක. එසේ උන්වහන්සේ කීකල්හී ඒ උපාසිකාවෝ කියන්නාහු: ස්වාමීනි අබිගම ලත් කෙනෙක් මූත් පරසිත් නොදන්නොත් මෙසේ කෙරෙත් දැයි කිවුය. එසේ කියේනම් ගුණ විශෙෂයකට පැමිණියාහු තමන් ලත් ගුණ විශෙෂය කාරුණෙක මුත් නොකරුණෙක අනුන්ට නොහඟ වන්නාහ. මේ මහාත්මයන්ගේ ස්වභාව ධර්මයෙක. උපාසිකාවන් කිවාවූ මේ ප්‍රවෘත්තිය අසා ඒ භික්ෂු තෙම සිතනුයේ: පෘථග්ජනයෝ නම් යහපතත් සිතති. කෙලෙශ වසඟවූ සිත් ඇති හෙයින් නපුරත් සිතති, ඉදින් මා යහපත සිතුයෙන් මූත් කිසියම් නපුරු සිතක් සිතුයෙම් නම් සොරකම් කළාවූ බඩු සහිතවම සොරකු අල්වා ගත්තාසේ මා සිතුවා දැන ගෙන වෙහෙසකට පමුණුවා පියති, ඒ නපුර ප්‍රකාශ කොට සත්‍යයන් ලවා නුගුණ හෝ කියවා පියති, මෙසේවූ තැනැත්තන් සමීපයෙහි දවස් ඇරීමට වඩා නමාගෙන පලායාම යහපතැයි සිතා උපාසිකාවෙනි අපි අදම යම්හයි කිසේක. එබස් අසා කියන්නාහු: ස්වාමීනි නුඹවහන්සේ දැන් කොයි යන සේක් දැයි විචාළහ, අනික් කොයි යමෝද අපගේ බුහුන්ගේ සමීපයටම යම්හයි කිසේක. උන්වහන්සේ මෙසේ කීකල්හි පෘථග්ජන සන්තානයට කුමක් සිතෙතත් තමන්ට නුසුදුස්සක් නොසිතන හෙයින් ස්වාමීනි රඳන බව යහපතැයි කියා එතන වැඩහිඳීමට ආරාධනා කළහ. එසේ ආරාධනා කළදීත් උන්වහන්සේ මෙතන රැඳීම නොපිළිවන බුදුන් ළඟටම යම්හයි කිසේක. ස්වාමිනි එසේවීනම් ඇත මෑත නොවැඩ බුදුන් ළඟටම වැඩිය මැනවැයි කිහ.

උන්වහන්සේද ඒ ඇළගමු වෙහෙරින් එදවස්ම පිටත්ව ක්‍රමයෙන් අවුත් බුදුන දුටුසේක. බුදුහු ඒ භික්ෂූහු දැක ඇසි මහණ මහණ දම් නුපුරා ආවේදෑයි වදාළසේක. එසේය ස්වාමීනි ඇළගමු විහාරයෙහි රැඳීම උගහටය, එසේ හෙයින් නොරඳා පලා ආම්හයි කිසේක. එබසට බුදුහු වදාරනසේක්. එම්බා මහණ කුමක් පිණිස එතැන්හි රඳන්ට බැරිද්දැයි වදාළ කල්හි ස්වාමීනි ඒ උපාසිකාවෝ අපින් සිතූදෑ දනිති, අප පෘථග්ජන හෙයින් කුමක්නම් සිතම්හ,

එසේ හෙයින් තපුරුසිතක් සිතාපුමෝ නම් උන් අනාගාමි නියාව
තමන් වහන්සේ නොදැන පරසිත් දැන්ම පෘථග්ජනයන්ටත් ඇති
හෙයින්, අප මාර්ගඵල නොලත් වනැයි සිතා අප කෙරෙහි මෙසේ
සිතූසේකැයි තුමූ දැනගෙන වෙහෙසීමක් කොළෝ නම් යහපත්
නොවන්නේයයි සිතා එතන දවස් නොහැර අයිම්සි කීසේක.
එබසට බුදුහු වදාරන සේක්: මහණ නා ඔබයන්ට බැරිදැයි විචාරා
වදාරා නොහැක්කෙමියි කීකල්හි කිම්ද මහණ නෝ බොහෝ ද
නබා එකක් රැකගත නොහෙයි දැයි වදාළසේක. එබසට භික්ෂු
තම කියනුයේ: ස්වාමීනි එකක් රැකගන්නේ නම් කවරේ දැයි
පුළුවුත්සේක. එබසට බුදුහු වදාරණසේක්: එම්බා මහණ තා
එකක් රැකගන්ට කියේ නම් තාගේ චිත්තය පමණක් රැකගන්ට
කීනියාය, යමෙක් වනාහි හසුරුවා ගත නොහැකි චිත්තය අසුරු
සණකට කෙලලක්ෂයක් පමණ පැවැත්ම වෙයි යනු ඖදාරික වශ
යෙන් කී හෙයින් චිත්තය ලඝුව පෙරළෙන්නේය. එම්බා මහණ
මේ චිත්තය ලබන තැනෙක් වෙවයි නොලබන තැනෙක් වෙවයි
නිසි තැනෙක් වෙවයි නොනිසි තැනෙක් වෙවයි නොබලාම
පවත්නේය. මේ යහපත් ජාතියය, මේ යහපත් ගොත්‍රයය, මේ
අභිනව වයසය, මේ වෘද්ධ වයසය, මේ තරම් තැනය, මේ නොත
රම් තැනයයි නොසලකා යම් යම් තැනක පවත්නා කැමැත්තේ
වී නම් ඒ තැන්ම ගොස් පවත්නේය. එසේ හෙයින් චිත්තය මහ
මුහුද මළාවූ කුණපයක් එක්ව නොපවත්නාක්මෙන් රාග ද්වේෂ
මොහ මදමානයයි යන කෙලශයන් හා එක් නොකොට පවත්වා
ගත යුත්තේය. යම්සේ මහ මුහුද මුතුමැණික් ආදිවූ බොහෝ
රත්නයන් ධරන්නේත් පිටතට උතුරුවා නොදමන්නේය.
එමෙන් ශීල සමාධ්‍යාදී ගුණරුවන් කෙතෙක් වූවත් බොහෝයයි
ඒ ඇම නොහැර නැවත නැවතත් රක්ෂා කටයුත්තේය. නැවත
මහ මුහුද තමා කෙරෙහි වසන මහසතුන් ඇත්තේද; ඒ සතුන්
සිත් අලවාද එසේම ලජ්ජි ප්‍රිය ශීලීවූ සත්පුරුෂයන් තමා කෙ
රෙහි සිත් අලවා භජනය කරවිය යුත්තේය. යම්සේ මහ මුහුද
චතුරෙන් පිරුණාවූ **ගංගා යමුනා අචිරවතී සරභූ මහීයයි** යනා
දිවූ දහස් ගණන් ගංගාවල ජල ප්‍රවාහය රැස්වීමෙනුත් අප්‍රමා
ණව වස්නා වර්ෂාවෙනුත් මුහුද පිරී වෙරළ නොඉක්මේද, එපරිද්
දෙන්ම ලාභසත්කාරාදිය නිසා ජීවත්වීම පිණිසත් එහි සිත්
නොඇලිය යුත්තේය. යම්සේ මහ මුහුද ගංහෝ ආදියෙන්
නොපිරේද එපරිද්දෙන්ම උද්දෙස පරිපුච්ඡාදිවූ සද්ධර්ම ශ්‍රවණ
යෙන් තෘප්තියක් නැතිව නැවත නැවතත් පුරමින් තමාගේ
චිත්තය දමනය ලාගත් කල මෙලොවින් පරලොවින් වැඩිම
සිද්ධකරන්නේයයි වදාළසේක. බුදුහු මෙසේ වදාරා මහණ

තෝ අනිකක් නොසිතා නික්ම ගොස් එතැන් ඇලගමූ විහාරයෙහිම වාසය කරවයි වදාළසේක.

උන්වහන්සේද බුදුන් වදාල අවවාදය පිළිගෙන අන්‍ය චිත්තයක් නැතිවම ඒ උපාසිකාවන්ගේ විහාරයටම වැඩිසේක. උපාසිකාවෝද එපවත් දිවසින් බලනුවෝ වැඩියාවූ ඒ භික්ෂූන් වහන්සේ දැක සිතන්නාහු: මාගේ ස්වාමීන් වහන්සේට අවවාද දුන් ඇදුරු කෙනෙකුන් වහන්සේ ඇතිව දෙවැනිව වැඩි නියායයි තමන්ගේ නුවණින්ම දැන අදහස් ලෙසට බුදුන්ගෙන් කමටහන් ලදත් අභිප්‍රාය ලෙසට දත් තුමූ ඉදිකරවා දුන්හ. උන්වහන්සේද භොජන සප්පාය ලදින් කිප දවසකින්ම විදර්ශනා වඩා රහත්ව නිවන් දුටුසේක. මෙසේ රහත්ව වැඩහිඳ අනේ උපාසිකාවෝ භව සයුරෙන් එතරවීමට නැවක් මෙන් පිහිටවූ නියාව යහපත, මේ ජාතියෙහි පිහිටවූවෝ වේද, සසර ඇවිදිනා කල සෙසු ජාතිවලත් මෙසේම මට පිහිට වූ ද්දෝහෝයි කියා, දිවසින් බලනසේක්: ජාති එකුන් සියයක් මේ උපාසිකාවෝ තමන් වහන්සේටම පාදපරිචාරිකා ව වස්ත්‍රාභරණ අන්න පානාදිය ගෙන හැඳ පැලඳ කා බී සැපසේ වසන්නාහු: අන් පුරුෂයන් එක්ව බැඳී මුන්වහන්සේ එකුන් සියයක් ජාතියෙහිම ජීවිතක්ෂයට පැමිණවූ බව දැක ඒ භික්ෂු තෙම මෙසේ ඒ උපාසිකාවන්ගේ නුගුණ රාශිය දැක අනේ මේ මැහැල්ල කළ දෙයක් බලවයි අමා මුදුනේ වසයක් ලූවාසේ මේ ජාතියෙහි පිහිටවූ පමණක් විනා යටගිය දවස නවඅනූ ජාතියක්ම මගෙන් ප්‍රයොජන විඳ ඒ හැම නොසලකා අනුන්ගේ බසට අතඹීම කළෝ වේදැයි සිතූසේක. එසඳ උපාසිකාවෝත් තමන්ගේ ගෙයිම හිඳ මාගේ ස්වාමීන්වහන්සේට මහණ දම් මස්තක ප්‍රාප්ත වී ද්දෝහෝයි දිවසින් බලන්නාහු: රහත්වූ නියාව දැන නැවතත් මාගේ ස්වාමීන් වහන්සේ දැන් රහත් වූසේක. රහත්වෙලා වැඩහිඳ මා කළ උපකාරය සිතා යටගිය දවසත් මා කළ උපකාර ඇද්දේ හෝ නැද්දේ හොයි බලනසේක් වනැයි සිතා ඒ උපාසිකාවෝත් තමන් ගිය ජාතිවලත් විසූ ස්කන්ධ පටිපාටිය දිවසින් බලන්නාහු: උන්වහන්සේ දුටු පිළිවෙළම දැක වැලිත් ඒ එකුන් සියක් ජාතියෙහිම වෙන පුරුෂයන් හා බැඳී මුන්වහන්සේ නැසූයේ සැබෑමය, එතකාදුවූවත් මෙතෙක් නුගුණ රාශිය දැක කුමක් සිතූසේක් ද්දෝහොයි උපාසිකාවෝ බලන්නාහු: මුන් කෙළේ කිම් ද්දෝහොයි සිතූ නියාව දැන වන්නාට කුමක් වෙවයි සසර සිටිනා කල වෙනත් ජාතිවල කළ උපකාරයෙක් නැද්දෝහොයි උපාසිකාවෝ දිවසින් බලන්නාහු: නවඅනූ ජාතියෙන් එපිට සියක්වන ජාතියෙහිදී මුන්වහන්සේට පාදපරිචාරිකාව අභිප්‍රාය ලෙස වසමින් යෙහෙන් දවස් හරණා කල්හි දවසෙක මරණට පැමිණි

තැන ගලවාපු නියාව දැක සවාමීනි දන්වහන්සේ බලමින් සිටි කඳ පිළිවෙළින් එකුන් සියයක් ජාතිය තබා මත්තෙහි සියක්වන ජාතිය බලා වදාළ මැනවැයි සිතූහ. උන්වහන්සේද, එපවත් දැන උපාසිකාවන් සිතූ ලෙසම සියක්වන ජාතිය බලා ඒ ජාතියෙහි උන් කළ උපකාරය දිවසින් දැක සියක්වන ජාතියෙහි මට උපකාරව සිටියෝ වේදැයි සතුටු වූසේක. මෙසේ චිත්ත වසඟව ප්‍රත්‍යයන් කෙරෙහි ලොභ උපදවා ඒ ඉපදවූ ලොභයෙන් චිත්ත බෙදයට පැමිණ ඒ විහාරයෙහි තොරඳම තික්ම ගොස් සකලදෙය මණ්ඩලය ගසනා මලකයක්සේ අනාවරණ ඥානයෙන් විදහා දැන සමස්ත සත්ත්වයන් කෙරෙහි පතළාවූ කරුණා ඇති මුනිරජහු කරා ගොස් පත්කඩ තබා වැඳ එකත්පස්ව සිට දෙහොත් මුදුනෙහි තබාගෙන දන්වනසේක්: සවාමීනි ඔබවහන්සේ වැඳ කමටහන් ගෙන භාවනා කරනු පිණිස වදාළ ලෙසම ඇලගමූ ගොස් මාතික මාතෘන්ගේ විහාරයෙහි වැස ඔවුන්ගෙන් උපස්ථාන විඳ ආහාර සප්පාය ලදින් චිත්තය එකඟ කොට ගෙන භාවනා කොරෙමින් රහත්ව පෙර විසූ කඳ පළිවෙළ බලත්තෙම් එකුන් සියයක් ජාතියෙහි ඒ උපාසිකාවන් කළාවූ තදකම් දැක ඒ උපාසිකාවන්ගේ උපදෙශයෙන් සියක්වන ජාතිය බලා ඒ සියක්වන ජාතියෙහි කළාවූ උපකාරයට සතුටුව අභිප්‍රායානුකූලව දවස් ගණනක් ඒ විහාරයෙහිම වැස තික්ම ආයෙමියි දැන්වූසේක. එබසට බුදුහු ඒ භික්ෂූන්වහන්සේට තොප කෙළේ ඉතාම යහපත, මා දෙශනා කළාවූ ධර්මය ලෙසම සිත එකඟ කොට ගෙන සසර සයුරෙන් ගොඩ නැඟී අමාමහ නිවන් දුටුයෙහි වේදැයි වදාළසේක. එසේ හෙයින් සියලු සත්ත්වයන් විසින්ම චිත්ත වසඟ නො [illegible] සියලු කෙලෙසුන් නසා අමාමහ නිවන් දකින්ට උත්සාහ සිතුව යහපති. දක්වන ලදමැයි-

"දුනනිග්ගහස්ස ලහුනො-යත්ථ කාමනිපාතිනො,
චිත්තස්ස දමතො සාධු-චිත්තං දන්තං සුඛාවහං."

මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
ලෙලෙස්වන සංඝාද්භූත මාතිකමාතෘ කථානම්වූ
## දෙතිස්වන පරිච්ඡේදය.
කියා නිමවනලදි.

---

# 33 වෙනි පරිච්ඡේදය.

## කවද මේ සද්ධර්මරත්නාකරයෙහි සංසාද්භූත සාරාවාර්ථ අනතුරුව නිද්‍රාස්වප්න විභාවන කථානම් කවරහෙයක්?

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

කෙසේදයක්? සවප්නයන් දක්නා කල්හි නිද්‍රාවට පැමිණියේ දක්නේද? නොහොත් පුබුදුයේ දක්නේද? නොහොත් නොනිදනුයේ දක්නේද? නොහොත් නුපුබුදුනේ දක්නේදැයි? කියත් හොත්, ඉදින් හුදෙක් නිද්‍රාවට පැමිණියේ දක්නේ වීනම් අභිධර්මයට විරුඬ වන්නේය. ඉදින් පුබුදුයේ දක්නේ වීනම් විනයට විරුඬ වන්නේය. ඉදින් නොනිදනුයේ දක්නේ වීනම් කිසිවකුත් නොදක්නේය, ඉදින් නුපුබුදුනේ දක්නේ වීනම් සවප්නයක් නම්ම නොදක්නේය. මෙසේ නිද්‍රාවට පැමිණියේද පුබුදුයේද නොනිදනුයේද නුපුබුදුනේ දැයි යන මේ සතර දෙනම සවප්න නොදක්නාහු වීනම් ඉදින් කවරෙක් දකීද? එසේ නොවෙයි මේ සතර ආකාරයම හැර කපි නිද්‍රාවට පැමිණියේ සවප්න දක්නේයි. කපි නිද්‍රානම් කවරහයත්? වානර ජාතිහු රාත්‍රි භාගයෙහි අතු වෙලෙප් වල හිඳ උනුහැඟ වැතිර නිද්‍රාවට පැමිණියාහු මඳක් ඇසිපිය වැසී නිද්‍රාවෙන් ශරීරය අව සඟව ගිලිහෙයි යන භයින් නිද්‍රාව ලඝුව පරිවර්තිතය වන්නේය. එසේම යමක්හුගේ නිද්‍රාවෙන් චිත්තය භවාඞග නොව පුහුව ඉගිලේද, සම්මෝහය දුරුව උදක්ම නුපුබුදුනේද, එසේහෙයින් හුදෙක් නුපුබුදුනේද හුදෙක් නොනිදන්නේද සවප්න දක්නේයි. මෙසේ සවප්න දක්නේ කුසල චිත්ත යෙනුත් අකුසල චිත්තයෙනුත් අව්‍යාකෘත චිත්තයෙනුත් දක්නේයි. දහගැබ් මහ බෝ මූනිමැදුර සිඞසථාන වදිනාක් මෙන්ද සවප්නයෙන් දක්නේ කුසල චිත්තයෙන් දක්නේ නම් වෙයි. දූල්පත් වට ලමින් සතුන් අසුකොට නසන්නාක් මෙන්ද සතුරුව හිඳිනන් ලුහුබඳවා අල්වා ඇතබැඳ වෙහෙස වැදින්නාක් මෙන්ද සවප්න දක්නාහු තමූන් තමා සිංහ ව්‍යාඝ්‍ර දිවි බලු යමදූ ගිනිදූල් ආදියෙන් වෙහෙස විඳිනාක් මෙන් දක්නාහු වීනම් අකුසල චිත්තයෙන් සවප්න දක්නාහු නම් වෙති. අව්‍යාකෘත චිත්තයෙන් දක්නාකල දහගැබ් මහබෝ ප්‍රතිමාරූප දකිමින් වදිමින් සිට ප්‍රාණඝාත කරන්නාක් මෙන්ද මහ වනමැද සතුන් ලුහුබඳවා දිවන්නාක් මෙන්ද දක්නාහුයි. මේ සියලු සවප්නයන් ශෛක්‍ෂ

යන්ට මුත් අශෛක්ෂයන්ට නොපෙනෙන්නේයි. මෙසේ පෙනෙන්නාවූ ස්වප්න සතර ආකාරයෙකින් දක්නාහුය.

කෙසේදයත්? ධාතුක්ෂොභයෙන්ද අනුභූත පූර්වයෙන්ද දෙවතා උපසංහාරයෙන්ද පූර්වනිමිත්තයෙන් දැයි යන මේ සතර කාරණාවෙන් දක්නාහුයි, එයින් ධාතුක්ෂොභයෙන් ස්වප්න දක්නා කල වාත පිත්ත ශ්ලේෂ්මා යයි යන ත්‍රිවිධ දොෂය උත්සන්නව අනෙක ප්‍රකාරවූ සිහින දකිති. කෙසේදයත්? වායු කිපුණුකල ස්වප්න දක්නාහු: අහසින් සිසයන පවන් හා සමග ධාවනයකරන්නාක් මෙන් පෙනෙයි, පිත් කිපීමෙන් ස්වප්න දක්නා කල උමතුව ඔබිමොබ සිසැරි භ්‍රමණය කරන්නාක් මෙන් පෙනෙයි, ශ්ලෙෂ්ම කොප්‍යව ස්වප්න දක්නා කල ගංහෝ වල්හි දිය කෙළිනාක් මෙන් පෙනෙන්නේය. මේ ධාතුක්ෂොභ ස්වප්නනම්, අනුභූත පූර්ව නම් නිද්‍රාවට පූර්වයෙහි කිසිවක්හු හා සමග කිසියම් කාරියක් කියමින් හුන්නේද, එම ස්වප්නයෙහුදු පෙනෙන කල ඒ කියමින් හුන්කාරියමය, මෙ නම් වස්තුවක් උව මැනව, මෙ නම් සිඞස්ථානයක් වදින්ට උව මැනව, මෙ නම් රටකට වෙළඳ මෙහි යන්ට උව මැනව, මෙ නම් රටක් ගන්ට උව මැනවැයි සිතා උන්කල එලෙසම පෙනෙන්නේය, කිසියම් ශාස්ත්‍රාදියක් දහවල් හදාලේද එලෙසම ස්වප්නයෙහුදු හදාරන්නේය. මේ අනුභූත පූර්වවූ ස්වප්නනම්, දෙවතොපසංහාර නම්: කිසිවක්හු කෙරෙහි දෙවතාවෝ ප්‍රසන්නවද අප්‍රසන්නවද වැඩ ඇවැඩ දෙක කරනු කැමැතිව අනෙකප්‍රකාර ස්වප්න දක්වන්නාහුයි. එයින් කිසියම් සත්වයක්හට දෙවතාවෝ ප්‍රසන්නව අවුරුද්දක් ඇවෑමෙන් ඔහුට ලක්ෂයක් වස්තු හෝ රාජ්‍ය සම්පත්තියක් හෝ ලැබෙන්නේ වීනම් රුධිර පානය හා සමග අලුත් මිනිමස් අනුභව කරන්නාක් මෙන් දක්වති. යමෙක් මණ්ඩලෙශ්වර වන්නේ වීනම් නීවයකු විසින් සෙනා වාහන සහිතාඞව ඔහු වසන ගෘහය වටලූවාක්හු මෙන් දක්වති. රජෙක් වෙතත් රාජ්‍යයක් ලබන්නේ වීනම් ඔහු වසන නුවර නීවයකු විසින් සෙනා වාහන සහිතාඞව වටකළාක් මෙන් දක්වති, යමක්හුගේ පුත්‍රදාරාදීන්ට අභිවෘද්ධියෙක් පැමිණෙන්නේ වීනම් අභිෂෙක ප්‍රාප්තව හුන්නාවූ රජක්හුද ශස්ත්‍ර ලඞකාරයෙන් සැරහූ මඟුලැතක්හුද සරහනලද වෘෂභයකුද ශස්ත ප්‍රාප්තවූ කනක රාසියක්ද දක්වති යමක්හට මහත්සම්පත්තියෙක් ශස්ත ප්‍රාප්ත වේ නම් ශුභ්‍රවූ වෘෂභ රාජයක්හු පිටට පැන නැංගාක් මෙන්ද ශස්ත්‍ර ලඞකාරයෙන් සැරහූ ලක්ෂණාන්විත විනීත ඇත් රජක්හු පිටට පැන නැංගාක් මෙන්ද ප්‍රසාද ලඞකාරයෙන් ප්‍රසාද වහවූ ප්‍රාසාදයක් මුදුනෙහි හිඳිනාක් මෙන්ද බොහෝ ගිරිකූළින් පිරිවරනලද පර්වත කූට

යක් මුදුනෙහි හිඳිනාක් මෙන්ද මහ වන මැද හැම වෘක්ෂයන්ට උස්ව සිටිනා දිඹුල් නුග බෝ ආදීවූ අපුෂ්ප ඵල ඇති වනස්පති රුකක් මුදුනෙහි හිඳිනාක් මෙන්ද අමේධ්‍ය ඇඟ ගල්වන්නාක් මෙන්ද මහත් කඳුළුධාරා ඉසිමින් අඬන්නාක් මෙන්ද අහසින් සීඝයන්නාක්මෙන්ද දක්වති. යමෙක් ස්වකීයකුලයට ප්‍රධානවේ නම් ප්‍රාසාදයක් මුදුනෙහි හිඳ බත් අනුභව කරන්නාක්හු මෙන්ද මුහුදු දිය මුදුනෙහි පලක්බඳ හිඳිනාක් මෙන්ද දක්වති. යමෙක් ප්‍රඥවෙන් ප්‍රඛ්‍යාත වනුයේවීනම් දියමැද නෙළුම්පතක් මුදුනෙහි හිඳ ඝෘතමිශ්‍රවූ මධුර ක්ෂීර පායාසයක් අනුභව කරන්නාක්හු මෙන්ද දක්වති. යමක්හට සකලාභිවෘද්ධි වර්ධිත වනුයේ වී නම් ආසන යෙහිද සයන යෙහිද යානාවෙහිද ශරීරයෙහිද වාහනයෙහිද හිඳිනා ගෘහයෙහිද ගිනිගෙන ඇවිල නැගෙන කල්හි පුබුදුවති. යමක්හට යශස් වර්ධිත වේ නම් ඝෘත ලාභයක් දක්වති. මෙසේ ඉෂ්ටවිපාක දෙන ස්වප්නයන් දක්වති. අනිෂ්ටවිපාක දායක ස්වප්න දැක්වීමද මෙසේ මැයි, මෙයින් ප්‍රථම යාමයෙහි ස්වප්නය අවුරුද්දකින් විපාකදෙන්නේය. මධ්‍යම යාමයෙහි දැක්වූ ස්වප්නය අට මසකින් විපාකදෙන්නේය අන්තිමයාමයෙහි දැක්වූ ස්වප්නය පස්මසකින් විපාකදෙන්නේය අලුයම් වේලෙහි දැක්වූ ස්වප්නය දසදව්සකින් විපාකදෙන්නේය. මෙසේ ස්වප්න දක්වන්නාවූ දෙවතාවෝ ප්‍රසන්නාවූවාහු නම් ඉෂ්ටානිෂ්ට දෙකම ඇති ලෙසම දක්වති, අප්‍රසන්නවූවාහු නම් ඔවුන්ට අනර්ථ පමුණුවනු පිණිස හිතෙහි කාමක්සේ ස්වප්න දක්වා ඒ හිතෙහි කාමින් අනර්ථ පමුණුවති. එසේ දක්වන්නාවූ ස්වප්නයන්ගේ කාරණා මේ ඔතු කියන පරිද්දෙන් දතයුතු.

**කෙසේදයත්?** යටගිය දවස ලක්දිව රුහුණු ජනපදයෙහි *ක්ෂීරනාග නම් මහා විහාරයෙක් විය. ඒ විහාරයෙහි වාසය කරන්නාවූ බොහෝ භික්ෂු සංඝයා වහන්සේ අතුරෙන් අසඞ්ඝතකාර්වූ යුහුසුලු එක් මහ තෙරකෙනකුන් වහන්සේ තමන් වහන්සේට කිසි ප්‍රයොජනයක් පිණිස ඒ විහාර සමීපයෙහි සිටි දෙවතා අධිගෘහීත නාගසක් ඒ වෙහෙර භික්ෂුසංඝයා වහන්සේ හා රක්ෂාවෙහි සිටි ආරාමිකයනුත් නොගිවිස්වාම සිඳුවාපුසේක. එකල්හි ඒ නාගසෙහි වසන්නාවූ දෙවතාවා ඒ තෙරුන් වහන්සේ කෙරෙහි කිපී මෙබඳු අසඞ්ඝතකාරීවූ සුවච නොවන පරවැඩෙහි ලොභයක් නොකරන අවැඩකාරු මහණුට අනර්ථයක් පමුණුවාලන්ට උවමැනවැයි සිතා මා විසින් මොහට කිසිවක් කිරීමට පාපභයින් නොහැක්කෙමියි කොරුටික ඥනයක් සිතා පළමුකොට මේ මහණු මා කෙරෙහි ප්‍රසන්න කරවා ගෙන පසුව

* ‘රුහුණෙ කිර නාග මහාවිහාරය’’ සාරසංග්‍රහ.

සුදුසු කෙනෙකුන් ලවා මේ මහණුට නිගඬක් කියමියි සිතා පළමු කොට ඕහට ශුභ ස්වප්න දක්වමින් උන්වහන්සේට බොහෝ වැඩ සිද්ධකොට තමා කෙරෙහි පහදවා ගෙන පක්ෂව වසනුයේය. මෙසේ වාසයකෙරෙමින් කල්යාමකින් දවසෙක අලුයම්වේලෙහි ස්වප්නයක් දක්වනුයේ: දෙවතාස්වභාවයෙන් අවුත් වැඳ ළඟසිට නොසතුටු ආකාර දක්වා කියනුයේ: ස්වාමීනි නුඹවහන්සේට සත් දවසකින් අඬුවෙක් වෙයි කීය. ඒ කිමෙක්දැයි විචාළ කල්හි තමන් වහන්සේට චතුර්විධ ප්‍රත්‍යයෙන් උපස්ථාන කරන්නාවූ කුලූපග යස පිහිටව සිටි මෙ නුවර රාජ්‍ය ශ්‍රී විඳිනා මහරජ තෙම මෙසින් සත් දවසක් ගියකල ස්වර්ග සම්ප්‍රාප්තිය ලබන්නේ වේද එපවත් නුඹවහන්සේ රාජ පුරුෂයන්ට කියා තබාලුව මැනවැයි කීය, ඒ තෙරුන්වහන්සේද මිත්‍ර ප්‍රතිරූපකවූ දෙවතාවා කියාලූ බස පළමුසේම සැබවයි සිතමින් උදෑසන්හිම එනුවර රාජ පුරුෂයන් කැඳවා නොසතුටුවසිට මෙපවත්කීසේක. එබස්ඇසූ ඇමැතියෝ තෙරුන්වහන්සේ කීලෙසම නුවර ප්‍රකාශ කොට කීහ, එකල්හී නුවරවාසීහු මහත්සොකයෙන් වැලප නුවරඑක කොලාහල කලාහුය. ඒ මහරජ තෙම නුවර වාසීන්ගේ අඬුනක ප්‍රලාප රොදන ශබ්දයන් අසා මෙ කිමෙක්දැයි කී කල්හි, ක්ෂීරනාග විහාරයෙහි වසන ඔබවහන්සේගේ කුලූපගවූ මෙනම් මහතෙරුන්වහන්සේ ස්වප්නයක් දුටුමියිකියා නුඹවහන්සේට ආයුෂය සතියකැයි කී සේක. එපවත් අසා නුවර වාසීහු හඬනාහුයයි කීහ එබසට මහ රජ කියනුයේ: මහතෙරුන්වහන්සේ කීබස සැබෑවීනම් තෙපි හැම ඊට උපකාර කරව බොරුවීනම් මම ඊට නිගඬ දන්නෙම් වේදැයි කියා එදවස් පටන් දවස එකයි දෙකයි ගැන සත්දවසක් ඉක්මුණු කල්හි තමහට කිසි පීඩාවක් නොදැක මුන්වහන්සේ මෙබඳුවූ බොරුවක් කීවේ තමා කෙරෙහි සතුරුව නුවරින් වෙන්කරනු පිණිසයයි වරදවා සිතාගෙන අටවන දවස් තෙරුන් වහන්සේගේ හස්තපාද ඡේදනයකරවා තෙරුන්වහන්සේගේ අස[illegible]තකාරී වරද තමාගේ ඇඟ ලාගෙන එපවින් පොමේ ගොස් නරකයෙහි උපන. මෙසේ ඒ දෙවතාවාද තමා වසන නාගස සිඳුවාපු පමණකට කිපී ඔවුන්ගේ හස්තපාදයන් සිඳුවීය එසේ හෙයින් දෙවියන් දක්වන්නාවූ ස්වප්නද සමහරෙක් විද්‍යමානය සමහරෙක් අවිද්‍යමානම වෙයි, එතකුදුවුවත් අවංකවූ ඉෂ්ට දෙවතාවන් විසින් දක්වන ලද්දාවූ ස්වප්න හැම සත්වයන්ට සකලාභිවෘද්ධි වර්ධනය කෙරෙමින් චිත්ත නන්දනය කරවන්නේයි. මේ **දෙවතා උපසංහාර නාම.**

පූර්ව නිමිත්තයෙන් දක්නා ස්වප්නනම් කවරහයත්? බෝධිසත්වයන්වහන්සේ ලැබීමට පූර්වභාගයෙහි මහාමායා දෙවීන් විසින්.

දුටුවාවූ ස්වප්න වැන්න. බුදුන් බුදුවන්ට පූර්වභාගයෙහි දෙවන දවස් දුටුවාවූ පංච මහා ස්වප්න වැන්න. පසෙනදී කොසොල් මහරජහු විසින් මතු කලියුග කාල ප්‍රවෘත්තිය මේයයි යනු පිණිස දක්වීමෙන් එදවස් රෑ දුටු සොළොස් ස්වප්නයන් වැන්න. මේ ත්‍රිප්‍රකාර ස්වප්නයන් අතුරෙන් බෝධිසත්වොත්පත්තිය පිණිස මහාමායාදෙවීන් දුටු ස්වප්න නම් කවරහයත්? අප මහා බෝධිසත්වයන් වහන්සේ මහාමායා දෙවීන් කුස පිළිසිඳිනා ඇසළමස මැදිපොහෝ දවසට පළමු සත් වෙනිද පටන් සකල වස්තුවෙන් අවිකල කපිලවස්තු පුරයෙහි ඇසළ කෙළිනම්වූ මහත් උත්සවයෙක් විය. ඒ උත්සවයෙහි සියලු ජනයෝම ඉස් සොධා නහා සුවඳමල් පැළඳ සුවඳ විලවුන් ගෙන තිසි ලෙස කාබී කෙළිමින් සෙමින් නෘත්‍ය ගීතාදියෙන් සන්තුෂ්ටව කාලාතික්‍රාන්ත කොට සත් දවසක් මගුල් කෙළි කෙළිති. එකල ශුද්ධොදන මහරජද සොළොස් කළයක් සුවඳ පැනින් ඉස්සොධා නහා ලක්ෂයක් අගනා මනහර සළුවක් හැඳ සුසැටක් ආභරණයෙන් සැරහී ශක්‍රදෙවෙන්ද්‍ර ලීලාවෙන් සහ සෙන් ඇමති ගණයා පිරිවරා උත්සව කෙළි බලනුයේය. එකල මහාමායා දෙවීද දෙවඟනක මෙන් සැරහී පන්සියයක් පුර ස්ත්‍රීන් පිරිවරා මඟුල් පොකුණට වැද ජලක්‍රීඩා කොට ලක්ෂයක් අගනා කසී සළුවක් හැඳ සුපුෂ්පිත ස්වර්ණලතාවක්සේ නානා රත්න නිමග්න'ප්‍රමද භරණ භූෂිතව රාජභවනයට වැද එහි මතු මහල් තෙලෙහි සරහනලද ශ්‍රී යහන් ගබඩාවට වැද කොඳසර පුෂ්ප රාසීන් බහා අතුළාවූ යහනාවෙසා බැස හෙව එදවස් රාත්‍රියෙහි නිද්‍රාවට පටන් ගත්හ. එසඳ බුදුන්ගේ ප්‍රතිසන්ධි වෙලාවෙහි මහාමායා දෙවී මෙබඳු ස්වප්නයක් දුටහ. කෙසේදයත්? ඒ ක්ෂණයෙහි සතර වරම් රජහු තුන්ගව් උස දිව්‍ය ශරීරයෙන් සොභාවත්ව දෙවීන් සැතපුණු යහන සමීපයට අවුත් මහත් ආදරයෙන් මහාමායා දෙවීන් සපුමල් දමක්සේ සාර හොවා ගෙන පන්සියයක් යොදුන් උස ඇති හිමාලය පර්වත මුදුනෙහි පසේ බුදුවරයන් වහන්සේ වැඩ සිට සිවුරු වළඳනා සැටයොදුන් දිග පුළුල ඇති මනොසිලා ගලතල අස සතර යොදනක් උස සල්රුක මුල යොදනක් උස පමණ මල් ගොඩක් මුදුනෙහි වඩාලූ නම. එසඳ වරන් රජුන්ගේ දිව්‍ය ස්ත්‍රීහු සතර දෙන දිවසරන් පිරිවරා අවුත් බිසවුන් වඩා ගෙන ගොස් පණස් යොදුන් දිග පුළුල ඇති අනවතප්ත විල දෙව් දූවරුන් බැස දියකෙළිනා තොටදී, දෙවීන් නාවා දිවසළු හඳවා දිව්‍යා භරණයෙන් සරහා රිදීමයවූ කෛලාසකූට පර්වත මුදුනෙහි පිහිටි රන් පහය ඇතුළට ගෙන ගොස් දිව්‍ය යානාවක් පතාවා පශ්චිම දිග්භාගයට සිරසලා සතප්වා දක්ෂිණ දිග්භාගයෙන් ජම්බුද්වීපය ඇතුළත් කොට දෙවීන් පිරිවරා සිටියෝ නම.

ඒ රිදී පර්වතයට නුදුරු තැනසිටි ඝනරන්මයවූ දෙසියක් ගව්උස ඇතිචිත්‍රකූට පර්වත මුදුනෙහිසිට හැලි ඇත්පැටවෙක් නමාගේරිදී දමක් වැනිවූ සොඬ සුහින් සුදු නෙළුම්මලක් අල්වාගෙනචිත්‍රකූට පර්වතයෙන් බැස බිසවුන් බල බලා සැතපිනදීම ඒ රිදී පර්වත මුදුනට නැඟී රන්පායට වැද බිසවුන් සැතපුනු යානාව වට කොට තුන්යලක් ප්‍රදක්ෂිණා කෙරෙමින් දක්ෂිණ භාගයෙන්බිසවුන්ගේ කුසට ප්‍රවිෂ්ටවූයේ නම. එකෙණෙහි බිසව් පිබිද නැඟී සිට යාන පිට උන්හ. එසඳ දේවීන්ගේ බඩ විදුරු පුරාලූවාක් මෙන් බර විය. බිසව් නොනිදුම සිඳ පහන්වූ කල්හි සුඩොදන මහ රජහු කරා ගොස් දැන්වූහ එසඳ සුදෙවුන් මහරජ තෙම වෙදයනි නිපුණවූ බමුණන් සුසැටක් ගෙන්වා චතුමධුර මිශ්‍රකොට පිසූ නිරුදක පායාසය ලක්ෂයක්වට නාරන්තලිසුසැටක්වසාඒපායාස රන්තලි බමුණන් ඉදිරියෙහි තබා ක්ෂීරපායාසය අනුභව කරවා රන්තලි හැම බමුණන්ට දන් දෙමින් **කපුරු සාකුල් නාරඟ ලමඟ ඉඟුරු** යසි යන මේ පස්පල වතින් යුතු බුලත් දෙමින් බමුණන් සතුටු කරවා බිසවුන් දුටුවාවූ මේ සවප්නය ඔවුන් අතින් කවරකාරණයෙක් දැයි විචාළහ, ඒ බමුණෝහැම සවප්නය පරීක්ෂා කොට තෝරා කියන්නාහු: දෙවයෙනි ඒ නොපගේ මහාමයා දෙවීන් දුටුයේ දරු සීනයෙක, එසේ හෙයින් සුදු ඇත් පැටවෙක් නම් බුදුවන බුඩාංකුරයෙක, ශුඩපද්මයෙක් නම් ප්‍රබුඩවූ සම්‍යක් සම්බෝධි ඥනය, සොඬින් ගත්තේනම්බුදුවනලොභයෙන් ඒ සම්‍යක් සම්බෝධි ඥනය හස්තප්‍රාප්ත කොට ගෙන සිටි නියාය, කුක්ෂියට වන්නේ නම් ත්‍රිභුවන කුක්ෂිය අතුරු නොහැර කීර්ති පතුරුවන්ට වන් නියාය, එසේ හෙයින් දෙවීන්කුස විශුඩ ඥානය ඇති දරු ගර්භයෙක් ප්‍රතිසන්ධිගත. එතෙම චක්‍රවර්ති රජ හෝ වෙයි නොහොත් ලොවුතුරා බුදු වන්නේයයි කියා සවප්නය තෝරා මහ රජහු සන්තොෂ කරවමින් අවසර ගෙන ගියාහුය. මේ බුඩාංකුරොත්පත්තියට පූර්වනිමිත්තවූ මහාමයා දෙවින් දුටු ප්‍රතිසන්ධි සවප්නය.

තවද අප බුදුන් බුදුවන්නාට දෙවන දවස් දුටු පංච මහා සවප්නය නම් කවරහයත්? මෙසේ ශ්‍රී මහා බෝධිසත්වයන් වහන්සේ බුදුවන්ට දෙවැනි දවස් සිතනසේක්: සෙට වෙසඟ මැදි පොහොදිනය, වෛශාඛ යොගයත් යෙදින, එසේ හෙයින් සෙට දවස් බුදුවන්නේ නියමයයි සිත සිතා සැතපුණු සේක් මඳක් නිද්‍රාවට පැමිණි සේක. එදවස් විටෙක දක්නාසේක්: මේ මහපොළව යහනක් කොට හිමාලය පර්වතය බිම්බොහණයක් කොට සතර මහා සාගරයෙහි සතර

ගාතය ගල ගලං ඇඟිලි අගින් සක්වළ ගල පිරිමැද මැද ඌර්ධ්ව මුඛව සැතපුණු සේක් නම්. එකෙණෙහි සදිව්‍ය ලෝකය සොළොස් බඹතලයයි යනාදිවූ හැම තැන්හි වසන දෙව්බඹුන් හා විමාන එකාඞගණව පෙනෙන්නට වන් නම මෙසේ දැක ඒ ක්ෂණයෙහි පිබිද තමන්වහන්සේ ස්වප්නයෙහි අර්ථ පරීක්ෂා කරනසේක්: මහ පොළව සහනක් වූයේනම් සම්‍යක් සම්බෝධි ඥානය පිටිවහල්ව ඝහනක් මෙන් තැනෙන වන, හිමාලය පර්වතය බිම්බෝහනයක් වූයේ නම් මට බුඞ ඥානය මුදුන් පත් වන නියාවය, සතර මහා සාගරයෙහි හස්ත පාදයන් ගලා චක්‍රවාටය ඇඟිල්ලෙන් පිරිමැද්දේ නම් චක්‍රවාලාභ්‍යන්තරය අතුරු නොහැර ධර්මය ප්‍රවත්වා සම්පූර්ණකොට ඒ සඞ්ර්ම සාගරයෙහි නිමග්නව කෙලෙන නියාවය, ඌර්ධ්වමුඛව සැතපුණුකල්හී මුළුලොව එකාඞගණවූයේනම් සංසාර සාගරයෙහි අධොමුඛව කලක් ගික්මුණාවූ ආත්මය සෙටදවස ඌර්ධ්වමුඛව එසේම භවයෙහි අධොමුඛවූ සත්වයන් ඌර්ධ්ව බුඞ ඥානයෙන් දක්මට එකාඞගණ වන නියායයි. මෙසේ ස්වප්නය සිතින් විමසා ඒකාන්තයෙන් මම සෙට බුදු වෙමියි සිතූසේක. තවද එම රෑ විටක දක්නා සේක්: සුරකතවූ ඊතණ අඞකුරයක් තමන්වහන්සේගේ නාභි මණ්ඩලයෙන් පැන නැඟී නගුලිසක් පමණ මහත්ව සියක් යොදුන් උස්ව තැවත මහත්ව දහසක් යොදුන් උස්ව වැඩී වැඩී සදෙව්ලොව ගෙවා සොළොස් බඹතලය ගෙවා ගොස් තණගොබ මුදුන්ව නික්මමින් සිටියදිම වටින් තණකොළු ශාඛා පත්‍ර වට පැතිර මුළු සක්වළ අතුරු නොහැර වසාගෙන ඉඳුනිල්මිණි සැනක්සේ ගැවසී සිටියේ නම. මෙසේවූ ස්වප්නයක්ද දැක පිබිද මෙසිදු අනික් කාරණාවෙක් නොවෙයි බුදු මඟුලටම කාරණාවූ සීනයෙක, තිතණ නම් බුදුවීමෙහි හුණුවාවූ තෘෂ්ණාවය, ඒ තෘෂ්ණා සැහැ ශාන්ති වෘක්ෂය උස්ව මහත්ව ලොව පුරා ගන්නේ නම් මුළුලොවට ශුභ ශාන්ති පැමිණෙන නියාය, ඒ ශාන්ති වෘක්ෂය නාභිය මැදින් නැඟිහෙයින් ඒ ලොකාභිවෘඞිය තමන්වහන්සේ නිසාම මුළුලොව දළු ලන්නේයයි සිතා මේ දෙවන ස්වප්නයෙන්ද බුදු බවට කාරණා දැක, තවද එම රාත්‍රියෙහි එක් විටෙක දක්නා සේක්: හිස කළුවූ සර්වාඞග ධවලවූ පණුවෝ ජාතියෙක් නාම, මෙසේ ලක්ෂ සුමහස් ගණන් කෘමිහු ඒ ඒ දිගින් අවුත් තමන්වහන්සේ සිසාරා අතුරු නොදී ගලාගෙන දෙපත්ලෙහි පටන් දෙදණ දක්වා පැන නැඟී වසාගත්තු නාම, එ වේලෙහිදු පිබිද අති ප්‍රසන්නව ඉතා නිල්වූ කෙස්වැටිය ඇති ශුද්ධ වස්ත්‍ර හැන්දාවූ නොහොත් සුවිශුඞවූ වංශ ඇති වෛනෙය්‍ය ජනයෝ පාද මූලයෙහි රැස්ව සරණ ගැන්මට කාරණයයි සිතා සනිටුහන්කොට

මේ තුන්වන ස්වප්නය තෝරා සෙට බුදුවන්නේ නියමයයි සනිටුහන් කළසේක. තවද එම රාත්‍රියෙහි එක් විටෙක දක්නාසේක්: නොයෙක් පැහැ ඇති ලිහිණියෝ සතර දෙනෙක් සතර දිගින් දිව අවුත් බෝසතුන් පාදමූලයෙහි හිඳ ඇසිල්ලකින් තමන්ගේ පූර්ව පැහැය හැර ඉතා සඞ්ඛ ධවලව එක වර්ණවූ සුදුපැහැ ලැබ ගියෝ නම. එවේලෙහිදු පිබිද සතුටු වෙමින් සිතනසේක්; ලිහිණියෝ සතරදෙන නම් රජ බමුණු වෙළඳ ගොවි යයි යන චතුර්වර්ණයෝය, ඔවුන් ඇඟ නොයෙක් පැහැ ඇතිවූයේ නම් නානා වර්ණ නානා ජාති නානා ඡන්දික නානා දෘෂ්ටි ඇති නියාවට කාරණාය. ඔවුන් මෙහනට පැමිණියේ නම් නොයෙක් ජාතීන් ස්වපාද මූලයට රැස්වන්ට කාරණාය, ඒ ලිහිණියෝ සමීපයට පැමිණ තමන්ගේ වර්ණ හැර ශ්වේත වර්ණව ගියේ නම් බුදු සසුන් වැද මහණව පිරිසිදුවූ සිත් ඇතිව නිවන් දක්නා නියායයි සිතා මේ සතරවන ස්වප්නය විභාගකොට බුදු වෙම්ම යයි සනිටුහන් කළසේක. තවද එම රාත්‍රියෙහි එක් විටෙක ස්වප්නයක් දක්නාසේක්: යොදනක් උසඇති අමේධ්‍ය පර්වතයක් මුදුනට පැනනැඟී ඔබිනොබ සක්මන් කොට ඇවිදිනා සේක් නම, එකල එහින් අමේධ්‍ය බින්දුවක් පමණක් ශ්‍රී පාදයෙහි නොවැක්කේ නම. එවේලෙහිදු පිබිද මහත් සන්තොෂයෙන් ඒ ස්වප්නයෙහිද අර්ථ විමසන සේක්: මෙයිදු සෙට බුදුවීමට කාරණාය, අමේධ්‍ය පර්වතය නම් චතුර්විධ ප්‍රත්‍යයාදිවූ බොහෝ ලාභසත්කාර සමූහය, එහි මුදුනෙහි සක්මන් කරන්නේ නම් බොහෝ ලාභ සත්කාර පැමිණීමට කාරණාමය, එයින් බිඳුවක් පමණක් පය නොඇලුණේ නම් ඒ හැම ලාභසත්කාර කෙරෙහි ස්වල්පයකුත් ඇල්මක් නැති නියාවයයි මෙසේ පස්වන සිහයද ඇතිසැටියේම තෝරා නියම දැන සෙට දවස් බුදුබව සිඬවන්නේ නියමයයි සනිටුහන් කොට අලුයම් වේලෙහි හුනස්නෙන් පැන නැඟී නික්ම ගොස් අජපාල නිග්‍රෝධ මූලයෙහිදී සුජාතාවන් දුන් කිරිපිඬු පිළිගෙන නේරඤ්ජරා ගංතෙරදී වළඳා තලිය උඩුගං බලා හැර සල්වෙනෙහි දිවා විහාරකොට බෝමැඩට වඩිනාසඳ අතරමගදී සොත්ථිය නම් බ්‍රාහ්මණයකු දුන් කුසතණ පිළිගෙණ ගොස් බෝමුල්හි සලාහෙළා පොළොව පලා නැඟී තුදුස් රියන් විදුරසුන් පැන නැඟී හිඳ මාර පරාජය කොට සවාසනා සර්ව ක්ලේශයන් ප්‍රහීණකොට එදවස් අරුණු සම් වේලෙහිම ස්වප්නය දැක සනිටුහන් කළ නියාවටම ලොවුතුරා බුදුව උදන් අනා මුළුලොව සතුටු කරණා නිවන් සම්පත් දෙවූසේක. මේ පූර්ව නිමිත්තයෙන් බෝධිසත්වයන් වහන්සේ දුටු පංච මහා ස්වප්න නම.

තවද පසේනදි කොසොල් මහරජහු දුටු සොළොස්ස්වප්න කුමක් කවරහයන්? එක්දවසෙක්හි කොසොල් මහරජ තෙම රාත්‍රී

යෙහි නිද්‍රාවට පැමිණියේ පශ්චිමයාමයෙහි සොළොස් ස්වප්නයක් දැක භයින් ත්‍රස්තව පිබිද මේ දුටුවාවූ ස්වප්නයෙන් කවර දොෂයෙක් වේ දෝහොයි යහන්හි නොනිදම හිඳ පහන් කොට පීය. එදවස් පාන්වූ කල්හි ශාන්ති බමුණන් හා පුරොහිතවරු රජ්ජුරුවන් දකින්ට පැමිණියහ. එසඳ මහ රජාණන් බමුණන් දැක සිටි කල්හි බමුණෝ වෙද මන්ත්‍රාදිය කියමින් ශාන්ති කොට ඉක්බිති කීයන්නාහු: දෙවයන් වහන්ස කිමෙක්ද රාත්‍රියෙහි සැපසේ නිදා පිබිදිසේක්දැයි විචාළහ. එබසට කොසොල් මහ රජාණෝ කියන්නාහු; කිමෙක්ද ආචාර්‍ය්‍යවරයෙනි ඊයේ රෑ අලුයම වේලෙහි සොළොස් ස්වප්නයක් දිටිමි එවේලෙහි පටන් භය ගෙන නොනිදම හිඳ පහන් කොළෙමියි කීහ. එබසට බමුණෝ කියන්නාහු; දෙවයන්වහන්ස කොසේවූ ස්වප්නයක් දුටුසේක් දැයි විචාළාහුය, එබසට මහරජාණෝ තමන් දුටු සොළොස් ස්වප්න මෙන මෙනම කීහ. බමුණෝ එපවත් අසා අත සළා දෙවයන් වහන්ස තුඹවහන්සේ දුටුයේ ඉතාම අනර්ථකාරීවූ ස්වප්නයෙක, එසේ හෙයින් මේ ස්වප්න විපාකයෙන් රාජ්‍ය භොග ජීවිතාන්තරාදිවූ ත්‍රිවිධ අන්තරායෙන් එකක් වන්ට කාරණායයි කීහ. එබසට මහරජ කියනුයේ; එම්බා පුරොහිතයෙනි මිට දොෂ නිවාරණවූ ප්‍රතික්‍රියා කළ හැකිද නොකළ හැකිදැයි විචාළහ. දෙවයන්වහන්ස ස්වප්නය උග්‍රබැවින් තැතින් මුත් ප්‍රතික්‍රියා කළ නොහැක්ක. එතකුදුවුවත් ඒ ස්වප්නවල දොෂා දොෂ පහකොට ගත නොහෙමෝ නම් උගත් වෙද මන්ත්‍රාදියෙන් ප්‍රයොජන කිම්දැයි කීවාහුය. කවර පනතක දොෂ දොෂ පහකරිවුදැයි කීහ. එබසට බමුණෝ කියන්නාහු දෙවියන් වහන්ස සර්වචතුෂ්ක නම් යාගයක් කළ කල දුඃස්වප්න දොෂ පහව ශුභ ශාන්ති වෙයි කිවුය. පසේනදි කොසොල් මහරජද වුවමනා ශුභ ශාන්තිමයයි සිතා ආචාර්‍ය්‍යවරයෙනි එසේ වුවහොත් නොප සිතුලෙසම යාගකාරවයි නියොග කළහ. බමුණෝද තමන්ට කන බොනදෑ ආදිවූ බොහෝ වස්තු ඇරගන්ට උපමාවෙක් දැන් පෙනුණැයි සිතා නොයෙක් ලෙස මහ රජාණන් තැති ගන්වමින් රජගෙන් පිටත්ව ගොස් රජහු කී මෙහෙවර ලෙසම සුදුසු මිනිසුන් ඇරගෙන යාග ශාලාවක් කරවා සියල්ලෙන්ම සතරක් සතරක් බැගින් ඒ යාග ශාලාවට රැස්කරන්නාහු; චතුෂ්පද ජාතීන්ගෙන් සතර සතර දෙනා බැගින් යාග ස්තම්භයෙහි බඳවා එසේම පක්ෂිනුදු බඳවා තැවතත් මෙනම් මෙනම් දෙය වුවමැනවැයි බමුණෝ ඔබිනොබ දිව පැන ඇවිදිනාහුය, එකල්හි මල්ලිකාදේවී මෙසේ දිව පැන ඇවිදිනා බමුණන් දැක රජ්ජුරුවන් කරා ගොස් කියන්නාහු; දෙවයන්වහන්ස මේ බමුණෝ අමුතුව පැමිණි කාරියක්

ඇත්තාසේ දිව පැන ඇවිදිති, ඒ කිමෙක්දැයි විචාළහ. එබසට කොසොල් මහරජ කියනුයේ; තෙපි පොහොසත්ව ගොස් දැන් මෙතන පැමිණි අඩුවැඩියක් නොදන්නා වේදැයි කීහ. එබසට මල්ලිකාදෙවී කියන්නී දෙවයන් වහන්ස එසේ නොවදාළමැනව, ඇති සැටියේම කිවහොත් ඊට සුදුසු කාරිය දැනගත නොහැක්කේදැයි කිවුය. එබසට මහරජ කියනුයේ; දෙවීනි ස්වප්න සොළසක් දිටිමි, ඒ විපාක බමුණන් අතින් විචාළ ගමනේ බමුණෝ යහපත් නොවෙයි කියා ඊට ප්‍රතික්‍රියා කරනු පිණිස සර්වචතුෂ්කයයි යන යාගයක් කරන්ට උත්සාහ කෙරෙතියි කීහ. දෙවයන්වහන්ස නුඹ වහන්සේට නුවණ මඳද, සමස්ත ලෝකය ඇතඹුලුසේ දන්නා ධර්මරාජෝත්තමයාණන් වහන්සේ මේ සැවැත්නුවර සමීපයෙහිම දෙවුරම වැඩවසමින් සිටියදී ගිනියයි සිතා ඌරගමඩුළු එක්කොට ගින්නෙන් ප්‍රයෝජන පිණිස පිඹ මුළුකරන්ට උත්සාහ කරන්නවුන්සේ මෙ බමුණන් ඇරගෙන කුමක් පිණිස වෙහෙස විඳිනාසේක්දැයි කියා, නුඹවහන්සේ නොපමාව සර්වඥයන් වහන්සේ ළඟට ගොස් දුටු ස්වප්නවල තොරතුරු විචාරාගත මැනවැයි කීහ.

එබසට කොසොල් මහරජ තෙම යහපතැයි ගිවිස මල්ලිකා දේවීන් කීලෙසම දෙවුරම් වෙහෙරට ගොස් සකල ඥෙය මණ්ඩලය පිරිසිඳ දන්නාවූ මුනිරජහු දැක පසඟ පිහිටුවා වැඳ එකත් පස්ව හුන්නේය. මෙසේ හුන්නාවූ කොසොල් මහරජහට බුදුහු වදාරන සේක්; එම්බා මහරජ තෙපි කවර කාරණයක් පිණිස උදෑසන්හිම අවුදැයි විචාළසේක. කොසොල් මහරජ දෙහොත් මුදුන් දිදී කියනුයේ; ස්වාමීනි අලුයම් රාත්‍රියෙහි ස්වප්න සොළසක් දැක භය ගෙන නොනිඳම හිඳ පහන් කොට උදයෙහි බමුණන්ට කීකල්හි බමුණෝ එපවත් අසා ඒ සීන දෙසනු පිණිස සර්වචතුෂ්ක නම් යාගයක් කරම්හයි කිවුය. එසේවූ යාගය කරන කල්හි බොහෝ ප්‍රාණීහු නැසෙති, එසේ නැසෙන ප්‍රාණීනුත් ගොඩලා මේ ස්වප්නවල තොරතුරුත් සැකහැර විසඳා වදාළ මැනවැයි කීහ. එසඳ සකල ලොකඥ සර්වඥයන් වහන්සේ මොහු දුටු ස්වප්නයන්ගේ විභාග ප්‍රකාශකරනු පිණිස වදාරනසේක්; එම්බා මහරජ තොප දුටු සීන අප ඉදිරියෙහි කියවයි වදාළසේක. එසඳ කොසොල් මහරජතෙම දෙහොත් මුදුන් දිදී තමා සීන දුටු සැටියේ කියනුයේ;

"උසභා රුක්ඛා ගාවියො ගවා ච
අස්සා කංසො සිගාලී ච කුම්භො
පොක්ඛරණී අපාකචන්දනං
ලාපූනි සීදන්ති සිලා පලවන්ති
මණ්ඩූකියො කණ්හසප්පෙ ගිලන්ති
කාකං සුවණ්ණා පරිවාරයන්ති
තසා වකා එළකානං භයාති"

යනාදීන් ස්වප්න දුටු ලෙසම පිළිවෙළින් කියනුයේ: ස්වාමීනි එක් ස්වප්නයක් ප්‍රථමයෙන් මෙසේ දිටිමි, අඳුන්වන් පැහැ ඇති වෘෂභයෝ සතරදෙනෙක් පොර අරයා කුරුඳු තප්ලමින් සතර දිගින් පොරට එන්ට වන් කල්හි මහාජනයෝ රැස්ව ඒ ගොන් පොර බලම්හයි මහත් අභිප්‍රායෙන් සිටි කල්හි ගොන්සතර දෙනම උනුන් හා අරයන පොර නබා ලඟටත් නොපැමිණ ඒ ඒ දිග පලා ගියහ. මේ පළමුවන ස්වප්නය දැක මීට විපාක කිම්දැයි කීය. එබසට බුදුහු වදාරනසේක්; මේ ස්වප්නයට විපාක තොප අප සමයෙහි නොවෙයි, අනාගතයෙහි රාජ ධර්මයෙහි නොපවත්නාවූ කෘපණ රජුන් සමයෙහි කලි වර්ධනවන්ට වන් කල්හි මන්ත්‍රීහු අධර්මිෂ්ඨ වෙති, ඔවුන්ගේ අධර්මතාවෙන් සේවකයෝ ක්‍රෑරවෙති, සේවකයන්ගේ තදකමින් ජනපදවාසීන් ආදිවූ සකලු සත්වයෝ දයාවක් නැතිව උනුන් කෙරෙහි ස්වල්පවූ කටයුතු නිසා වෛරබැඳ සියින්ම බොහෝ ගලිල ගෙන ඔවුන් නසන්ට උත්සාහ කෙරෙති, එසේවූ කාලයෙහි සියලු කාරණා වෙන්ම ධර්මය ක්ෂයව අධර්මය වර්ධනවෙයි, එකල්හි කලට වස්නා වැසි නොවැස සුලං ආදිය විපරීතව පවත්නේය, එකල්හි රට දනව් දුර්භික්ෂ වෙයි, එයින් පීඩිතවූ සත්වයෝ කලට ගොවිතැන් බත් කිරීමට වැසි පතා ඉඳිනාහ, එසේ කල්හි ඔවුන් පොලඹන් නාක් මෙන් මේඝ කූට සතර දිශාවෙන් උද්ගතව මහත් ගර්ජනා කෙරෙමින් දැන් දැන් වැව් පොකුණු උතුරුවා දියගලයි සිතා සිටි කල්හි වැසිකුළු සතර දිසින් කලු ගොන් පොර අරයා සතර දිගින් අවුත් ලංනොව ගොන්ගේ පොර බලන්ට බොහෝ මිනිසුන් රැස්ව සිටිකල්හි මඳකුත් ලංනොව ඒ ඒ දිග ගියාක්මෙන් වැසි නොවැස ඒ ඒ දිග වැසි කුළු පලායන්නේය. මේ කාරණය තොප දුටු ස්වප්නයෙහි විපාකය, එපමණමුත් තොපට කිසි අනතරායෙක් නොවෙයි, අනාගතකාලයෙහි සත්වයන්ට පැමිණෙන්නාවූ අසුභයයි වදාරා දෙවැනි ස්වප්නය කියවයි වදාළසේක. එසඳ කොසොල් මහරජ කියනුයේ: ස්වාමිනි මහත් වෘක්ෂයන් සිටි තෙන කුඩා ගස් වියත් උස රියන් උස එල නැඟී පලලව මලින් සශ්‍රීකව සෙසු මහත් වෘක්ෂයන් අභිභවමින් සැදී සිටියා දිටිමියි කීහ. එබසට බුදුහු දෙවන ස්වප්නයෙහි විපාක වදාරනසේක්: එම්බා මහරජ මතු ලොව පිරිහී මනුෂ්‍යායුෂකවූ කල්හි සත්වයෝ බාලයෙහිම කුටුම්බ ස්ථාපනය කොට පුත්‍ර දූතෘන් ලැබ දෙමව්පිය මුතුන් මිත්තන් නොපිළිවිසම උන්ට වඩා තුමූ ස්වශක්තියෙන්ම පුත්‍රදාරාදීන් රක්ෂාකොට වෙසෙමින් මහත් ගස් අභිභවා කුඩා ගස් එල පලලව මලින් සශ්‍රීකවූවා සේ දෙමව්පියන්ට වඩා රැකෙති. මෙසිඳු අනාගතයෙහි ලොව පවත්නා ලාමක ස්වභාවයෙක,

මෙසිහිනත් තොපට උපද්‍රවයෙක් නොම ඇත්තේය, එහෙයින්
තුන්වන ස්වප්නය කියවයි වදාළසේක. එසඳ මහරජ කියනුයේ;
ස්වාමිනි එදවස්ම ජාතවූ වැස්සන්ගෙන් මව් දෙනුන් සිට කිරි
බොන්නා දිටිමියි කීහ. එපවත් අසා බුදුහු වදාරනසේක්: එම්බා
මහරජ මෙසිහින එනදවස කිරිබතප් රහිතවූ ළදරුවූ අඳනා සත්ව
යෝ වශී ජ්‍යෙෂ්ඨවූ ගරුතර තැනන් නොපිළිවිසම තම තමන්
සිතූ සිතූ ලෙසම කුටුම්බසංස්ථාපනය කොට රැකෙමින් දෙමවුපිය
බෑයන් මූනුන් මිත්‍ර ආදිවූ වැඩි ජ්‍යෙෂ්ඨයන්ට වස්ත්‍ර ආහාරාදීන්
උපස්ථාන නොකෙරෙති, ගරුකොට නොසිතති, එසේ උපස්ථාන
නොලබන්නාවූ මව්පිය ආදීහු එකියන දරුවන්ගේ ගෙහිම දුවූ
වක් කොට බත් පිළි ඉල්ලාගෙන ජීවත්වෙති, එසේ තමන් නිසා
රැකෙන ගරුතර තැනන් කෙරෙහි ආදර නොකෙරෙති, මේ
තමන් වදාගත් වැස්සන්ගේ තනයෙන් කිරිබොන මහඟදෙන්නු
වැනියහ. එසේ හෙයින් මේ ස්වප්නයෙනුදු තොපට වන අනතු
රයෙක් නොම ඇත්තේය.

සතරවන ස්වප්නය කියවයි වදාළසේක. එසඳ කොසොල්
මහරජ කියනුයේ: ස්වාමිනි බර පිරූ මහගැල් අදිනා ලෙසට බල
වත්වූ යහපත් වෘෂභයන් යුග පරම්පරායෙන් වැල් කැරලි අග
යොදා බාල වස්සන් රථය මුල යොදා රථය අදනා ලෙස සත්කල
කල්හි මූල බැඳි වස්සෝ ගැල අදින්ට ශක්තිමද්ව කරින් විය දමා
රථය ඇදනත නොහී වෙහෙස විද වෙළඳුනට ගැල් ගෙන යා
නොහී සිටිහැයි කීහ. එසඳ බුදුහු වදාරනසේක්; එම්බා මහරජ මේ
ස්වප්නයටත් විපාක අනාගතයෙහිම වෙයි, මතු පක්ෂග්‍රාහීවූ
නුවණ මඳ රජදරුවෝ පරම්පරා දැන්මෙහිද ඒ ඒ කාර්‍ය්‍යයෙහිද
සමර්ථවූ වංශවත් මහා අමාත්‍යවරුන්ට යස පිරිවර නොදී කාර්‍ය්‍යා
කාර්‍ය්‍ය නොදන්නාවූ නුවණමඳ ක්‍රීඩා පර බාල ජනයන්ට ස්ථානා
න්තර දී රාජ්‍යානුශාසනයෙහි යෙදවති, එසේ රජහුගෙන් නිගො
ගලන් රාජ්‍යාභ්‍යන්තර ළදරු අමාත්‍යවරු තමන් ලත් ඓශ්වර්‍ය්‍ය
යන් ධරාඅත නොහී සුක්තාසුක්ත විනිශ්චයන් කුමක් බවත් නො
දැන සිතූ සිතූවක්ම කියමින් රජහු ළඟන්වති, එපවත් අසා රජ
තෙම එම් සැබවයි සිතමින් සියලු විනිශ්චයම උන් පිළිබඳ කෙ
රෙති, එසේකල්හි රාජකාර්‍ය්‍යද අධිකරණ විනිශ්චය ආදියද පිරි
හෙන්නේය, එසේකල්හි සියලු සත්ත්වයන්ම චිත්තඛේදයට පැමිණ
ධර්මාධිකරණයෙහි නියුක්තවූ ප්‍රඥාවත් මහා අමාත්‍යවරුන්ට කී
කල්හි ඔහු කියනකල රාජ නිගොගලත් අභ්‍යන්තර කුඩා මන්ත්‍රී
වරුන්ටම කියා පිරිමස්වා ගන්නැයි කියා ලොක නීති ධර්ම නීති
රාජකාර්‍ය්‍ය ආදියෙහි ව්‍යාවෘත නොවෙති, එසේකල්හි ගැල සමීප
යෙහි වැල් කැරල්ල මූලබැඳී වස්සන් ගැල අදින්ට බැරිව විය

දමා සිටියාක්මෙන් ඒ ළදරු මන්ත්‍රීවරු මහොත්සාහයෙන් රජකාර්‍ය්‍ය කාරම්භයයි ව්‍යසන වීදන් පිරිමිස්වා ගතනොහී රජහට සියල්ලෙන්ම පිරිහීම වන්නේය, එසේහෙයින් මහරජ මේ ස්වප්නයෙනුත් තොපට වන අනතුරක් නොම ඇත්තේයයි වදාරා පස්වැනි ස්වප්නය කියවයි වදාළසේක. සර්වඥයන්වහන්සේ විසින් වදාළාවූ ස්වප්නවිසර්ජනය අසා සතුටුව නැවතත් කොසොල් මහරජ කියනුයේ; ස්වාමීනි, දෙදිසාවෙන් මුව දෙකක් ඇති අශ්වයෙක් දෙපිටින්ම දෙන තණ කන්නේය, කොතෙක් කෑවත් දුන් දුන් තණ කනමුත් තෘප්තියක් නැත්තේය, මෙසේ දෙදිසාවෙන්ම තණ අනුභවකරන අශ්වයකු දිටිමියි කීක. එබසට බුදුහු වදාරන සේක්; මේ ස්වප්නයටත් විපාක අනාගතයෙහිම වන්නේය. මහරජ එනදවස සත්‍යකාරුණ්‍යව මඳවූ ධනාර්ජනවූ රජදරුවන් සමයෙහි වසනු උපදවාගන්නා පිණිස අල්ලසෙහි ලොල්වූ විනිශ්චයෙහි අශුද්ධවූ උභය ලොකාර්‍ය රහිතවූ කෘපණ අධිකරණ නායකයන් විනිශ්චයෙහි සලස්වති, එසේකල්හි යුක්තියෙහි ආයූනත පරීක්‍ෂා නොකොට අල්ලසෙහිම ආයූනත පරීක්‍ෂාකෙරෙමින් යුක්ති ඇති තැනට නැති කොට නැති තැනට යුක්ති ඇති කොට යුක්ති ඇත්තන් නැති ගන්වා බෙණෙති, යුක්ති නැත්තාහු දුන් නාවූ අල්ලස් බලයෙන් ජයගෙන සිටිති, එසේකල්හි යුක්ති ඇත්තවුන් සිතනකල අපට තමා කෙතෙක් යුක්ති ඇතත් යුක්ති නැත්තවුන් ජය ගන්නේ අල්ලස් බලයෙන්මය, අපිත් දුන්නා යම් පමණක අල්ලස් දුන්නොත් විනා මුත් ජය ගන්ට බැරියයි ඔවුනොවුන් පරදවා මෙසේ දෙපක්‍ෂයෙන්ම අල්ලස් දෙති. මහරජ අශ්වයා දෙදිසාවෙන්ම කෑම කන්නා සේ දෙපිටින් දුන් අල්ලස්ම අධිකරණ නායකවරු ඇරගෙන දෙපක්‍ෂයටම කිසිවකුත් කියාගත නොහී තුෂ්ණීම්භූතව හිඳ උනුන් මුහුණු බලනමුත් ඇති යුක්ති මාර්ගය නොබලත්. එසේකල්හි දෙලොවින්ම උනට අවැඩමුත් අර්ථ සිද්ධියක් නොවන්නේමය. එසේහෙයින් මහරජ මේ ස්වප්නයෙනුදු තොපට වන ව්‍යසනයෙක් නොම ඇත්තේය.

තවද සවැනි ස්වප්නය කියවයි වදාළසේක. එසඳ මහරජ කියනුයේ; ස්වාමිනි සතරන්තලියෙක සිහාලයන්හු මූත්‍රකෘත්‍යය කරනු දිටිමියි කීහ. එබසට බුදුහු වදාරනසේක්; මේ ස්වප්නයටද විපාක අනාගතයෙහිම වන්නේය. මහරජ මතු ධාර්මික නොවන් නාවූ රජදරුවෝ තමන් කෙරෙහි භයින් සමානවූ කුල ජනයන් කෙරෙහි වෛෂ පරව ඔවුන් නිසිවූ ස්ථානාන්තරයක නොපිහිටු වති, ඔවුන් ජීවත්වනු පිණිස යශස් නොදෙති, කුල ජනයන් ළං නොකොට අකුලීනයන්ම අභ්‍යන්තර කරවාගෙන ඔවුන්ට දසී දාස් ගවමහිසාදීවූ උපභොග පරිභොග සම්පත් දීලති, එසේකල්හි

කුලජනයෝ දුගීව ජීවත්ව ගන්ට ලෙද මඳ හෙයින් රක්‍ෂාව ඇති අකුලීනයන්ට තමාගේ දූ දරු මුනුපුරන් රක්‍ෂා කරනු පිණිස පාවා දෙමින් තුමූද ඔවුන් හා ආශ්‍රය කොට ගෙන රැකෙති, එකල්හි අකුලීනයෝද කුල ස්ත්‍රීන් රඳවාගෙන දරු මුනුපුරන් ලැබ වශීය මහත් කොට ඔවුන්ගේ නෑසියන්ටද උපකාරී වෙති. එසේහෙයින් රත්තලියෙහි ජර සිගාලයා කළ මූත්‍ර කෘත්‍යය වැන්න. එසේහෙයින් මේ ස්වප්නයෙනුදු තොපට භයෙක් නොම ඇත්තේය. තවද සත්වැනි ස්වප්නය කියවයි වදාළසේක. එසඳ කොසොල් මහරජ කියනුයේ: ස්වාමිනි එක් මිනිසෙක් වරමන් දක් අඹර අඹරා පුටුවෙක හිඳ පය මුල කැටි කරන්නේය, පුටුව යට කැනහිල් දෙනෙක් හිඳ අඹර අඹරා පය මුල කැටි කරන වරමන්ද අනුභව කරන්නා දිටිම්හි කිය. එසඳ බුදුහු වදාරන සේක්; එම්බා මහරජ මේ ස්වප්නයට විපාක නම් එන දවස ස්ත්‍රීහු දුරාචාරීව තමන්ගේ පුරුෂයන් කෘෂි වණිජාදීවූ දුකින් උපයාගත් සම්පත්තිය තුමූ චොර පුරුෂයන් හා එක්ව ගෙන ඔවුන් කවනු පොවනු පිණිස වලලහයා උපයා රැස්කළ සම්පත්තිය පුටුවයට හිඳ නොගඟවාම වරමන්ද කන සිගාල ධේනුව මෙන් නසා සිතු වක් කරන්නීය. මේ කාරණයෙනුත් තොපට උපද්‍රවයෙක් නැත, එසේහෙයින් අටවැනිවූ ස්වප්නය කියවයි වදාළසේක. එසඳ කොසොල් මහරජ කියනුයේ: ස්වාමීනි මාලිගා දොරකඩ බොහෝ සිස්වූ කුම්භ වට පිරිවරා තබා දිය පිරී තිබෙන මහත් කුම්භයක් මැද තබා ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍රයයි යන සතර ජාතිවූ සියලු සත්‍වයෝම දිය කළ සිය දහස් ගණන් ඇද මැද තිබූ දිය කුම්භයෙහිම වත් කෙරෙති, සිස්ව තිබෙන්නාවූ ඝටයන් නුවනගිනුත් නොබලති, මැද පිරි කුම්භයෙහි වත්කළ වත්කළ දිය ඉතිර ඉතිර වැගිරෙයි, එසේ වීනමුත් නැවත නැවතත් එහිම දිය වත් කරන්නා දිටිම්හි කීහ. එබසට බුදුහු වදාරනසේක්: මහරජ මේ සීනයටත් විපාක අනාගතයෙහිම වෙයි. එන දවස රජ යුවරජ මහා අමාත්‍යාදීහු දුක්පතුන්ට වෙහෙස දී උන්ගේ ස්වල්පවූ ධාන්‍ය කහවණුවෙක් ඇත් නමුත් ඔවුන් රැකෙන්ට මඳකුත් නොතබා ඇරගෙන තමන්ගේ සම්පූර්ණව තිබෙන භාණ්ඩාගාරවලම පුරති, තුමූත් ත්‍යාග භොග දෙත් නමුත් වස්තු ඇති මහතුන්ටම දෙන මුත් දිළිඳුන්ගේ දසාව නුවනගිනුත් නොබලති, එසඳ මෙසේ පිරි කළයෙහිම දිය පුරන්නාසේ පොහොසතුන්ටම දෙති, එසේ හෙයින් තොප දුටු මේ ස්වප්නයෙන් තොපට උපද්‍රවයෙක් නැත්තේය. නවවැනි ස්වප්නය කියවයි වදාළසේක.

එසඳ නවවැනිවූ ස්වප්නය කියන්නාහු: ස්වාමීනි පස් පිඬු මෙන් ගැවසීගත්තාවූ වපින්ම තොංව ඇති පොකුණක වපින්

සිපද චතුෂ්පදාදීන් බැස පැන් බොන තැන් පැහැදී තිබෙයි, මැද කිසි කෙනෙකුනුත් නොබස්නා තැන් දිය කැලඹී තිබෙයි, මීට කාරණා කිම්දැයි පුළුවුත්හ. මහරජ මීට කාරණා නම් එන දවස රට රකින්ටයයි හිඳිනා මහරජහු රාජ ධර්මයෙහි නොපවතිත්, ඔවුන් එසේ නොපවත්නා කල්හි මන්ත්‍රීවරු අධර්මිෂ්ට වෙති, එසේ කල්හි රට මැදවල ස්වකීය ස්වකීයවූ ප්‍රවේණි ගම් පරම්පරා වෙන්ම වටාගෙන හිඳිනා සත්පුරුෂ ජනයන්ට හිමිකම් නැතිව අහිමියන්ට සැලසෙයි, එසේ කල්හි සත්පුරුෂයෝ ඔවුන් කරන තදකමින් මිරිකී ඒ ඒ දිග පලාගොස් ප්‍රත්‍යන්තවල මලය දේශයෙහි තමන්ට රක්ෂා ස්ථානවල බලාගෙන කඳු මුදුන් ආදීවූ පර්වතාශ්‍රය වලට ගොස් කටුසර ශස්‍යයන් කොටගෙන දුකසේ රැකෙමින් හිඳිති, රට මැද ගම් කම්හයි උන් අහිමියෝද ලෙදක හිඳ ගත නොහී පර්වතාශ්‍රයව වල් හිඳිනා සත්පුරුෂයන් ළඟට ගොස් ජීවත් වෙති, එසේ කල්හි පොකුණෙහි වට දිය පැහැදී තිබෙන්නාක් මෙන් වට ප්‍රත්‍යන්ත මලය දේශවල වැටෙන්නේමය, මැද යහපත් ක්ෂෙත්‍ර වස්තු පොල් පුවකින් සැදි ගම් බිම් පාලුව අසත්පුරුෂ සංචාර වන්නේය. එසේ හෙයින් මේ ස්වප්නයෙනුත් අනාගතයෙහි ලොවට වන අවැඩ මුත් නොපට කිසි භයෙක් නොම ඇත්තේයයි වදාරා **දශවැනි ස්වප්නය** කියවයි වදාළසේක. එසඳ කොසොල් මහරජ කියනුයේ; ස්වාමීනි එක සැළ පැසෙන්නාවූ බත් සරියේම තුන් * පතනෙක පැසෙන්නේ එක් භාගයෙක බත් ඉතා උක්කිරිව එක් භාගයෙක බත් සාල්ව එක් භාගයෙක බත් යහපත්ව පැසෙන්නා දිටිමියි කීහ එබසට බුදුහු වදාරනසේක්; මහරජ මේ ස්වප්නයෙහි විපාකත් අනාගතයෙහි ධාර්මික නොවන්නාවූ රජ යුවරජ මහා අමාත්‍යාදීහු වෙද්ද, ඔවුන්ගේ අධර්මතාවෙන් පන්තියෙන්ම රට දතව් වැසි මනුෂ්‍යයන් හා ලොකපාල දෙවතාවෝද හිර සඳ නක්ෂත්‍ර රාශීහුද යන මේ සියල්ලෝම සම්‍යක් වර්තනයෙන් නොපවත්නාහ, එසේකල්හි ගොවිතැනට කලට දෙන වැසි දිය හැම තැන්හි එක් කලට නොදෙන්නේය, එසේ වැසි දිය නොදී සමහර ජනපදවල වැසි වැස පැලපත කුණු කොට නසන්නේය, පූදිනා කල්හි මල් කට දිය වැද කරල් කිරි වැද යානොදී බොල් කරන්නේය, පැසුණේ නමුත් වතුරෙන් වැස්සෙන් ගොයම් බිම හෙළා කුණු කොට නසන්නේය, එක් ජනපදයෙක මහත් නියං කොට පැලපත දවා නොහොත් ගොයම් බඩඋයා පිදු යා නොදෙන්නේය, නොහොත් කිරි වැද යානොදී කරලින් නසන්නේය, එක් ජනපදයක කලට වැසි වැය පැලපතෙහි පටන් ගොයම් පැසී ද මිරිකනතෙක් යහ

---

* "ප්‍රඩගුවක."

පත්ව වැසි දිය දෙන්නේය, මෙසේ සමහර ජනපදවල වැස්සෙන් නසා සමහර ජනපදවල නියඟින් නසා සමහර ජනපදවල යහපත්ව පැසෙන්නාසේ එක සැලෙනි බත් තුන්පතතෙක පැසුණු දුටුයේ නම් එක රජහුගේ විජිතයෙහි ශස්‍යයන් තුන්පතතෙක වන හියායයි වදාළසේක. මෙසේ වදාරා මේ ස්වප්නයෙන්ද තොපට වන උවදුරෙක් නැත, අනාගතයෙහි ලොවට වන උවදුරැයයි වදාරා මහරජ එකොළොස්වැනි ස්වප්නය කියවයි වදාළසේක. එසඳ මහරජතෙම නැවත කියනුයේ; ස්වාමීනි ලක්‍ෂයක් වටනා හඳුන් හරක් කුණු මොරට විකුණන්නා දිටිමියි කීහ. එබසට බුදුහු වදාරනසේක්; මහරජ එන දවස ශාසනය පිරිහෙන්ට වන්කල්හි භික්‍ෂූහු ග්‍රන්ථධුර විදර්ශනාධුර ආදිවූ ශාසන ක්‍රමයෙහිද ත්‍රිවිධ රත්නයට කළමනා මානනාදියෙහිද ලොභය නැතුව මෙලොවින් ජිවත්ව ගන්නා පිණිස සිවුපසයෙහි ලොභ උපදවා කුලයා සිත්ගෙන කඩ පිඩු උපදවා ගැන්මෙහුම වැයම්විඳ අකප්පිය වචනාදියෙන් සමාදන් කොට ප්‍රත්‍යය උපදවමින් තවද බුදුන්ගේ අනර්ඝවූ නවලොකොත්තර සද්ධර්මය ස්වල්පවූ ලාභයන් නිසා ගෘහස්ථයන්ට බණ කියා ලාභය උපදවන්ට උත්සාහ කෙරෙති, ප්‍රත්‍යය ලොභයෙන් සිහිවිලි වෙන් කොට මාවිසින් ඔවුන්ට බණ කියා ස්වර්ග මොක්‍ෂ සම්පත් සිඹකාළ මැනවැයි සිතා නිශ්ශරණාධ්‍යාශයෙන් සිත සුඹ කොට ගෙන බණ කිය නොහෙති, ලාභය තකා බණ කියති, මාගේ කාපිකකමද මධුරස්වරයද වාක් ලීලාවද මොහු අසා මට බොහෝ ලාභ සත්කාරදෙතියි සිතාම බණ කියති, සමහර භික්‍ෂූහු මාලිගාවෙහිය වහසල් වලෙහිය වීථිවලය මංසන්ධි හොනටු රූප්පාදියෙහිය යනාදිවූ තැන්වල හිඳ පස් මදටක් නිකක් පමණ ස්වල්පවූ කහවණු නිසාත් මහත් ලෙස කටහඬ ලීලා දක්වා බණ කියති, මා විසින් නිර්වාණ සම්පත්තිය අගය කොට දෙසන්නාහු ලක්‍ෂයක් අගනා හඳුන් හරය කුණු මොරට විකුණන්නාක් වැනියහ. එසේහෙයින් මේ ස්වප්නයෙනුත් තොපට වන උවදුරෙක් නොම ඇත්තේයයි වදාරා දොළොස් වැනි ස්වප්නය කියවයි වදාළසේක.

* එසඳ ස්වාමීනි මහත් කුළු ගෙවල් පමණ ගල් දිය මතුපිට නැවිමෙන් ඉල්ප වියලි ලබු දියෙහි යට ගිලී ගියා දිටිමියි කීහ, එබසට බුදුහු වදාරනසේක්; මහරජ මෙයිදු මතුරාජ ධර්මයෙහි ප්‍රමාදවූ රජුන් දවස ලොකයෙහි යහපත පෙරළෙන්ට වන්කල්හි රජදරුවෝ කුල පුත්‍රයන්ට යශස් නොදෙති, අකුලීනයන්ටම යශස් දෙමින් ඇති කෙරෙති, එසේ කල්හි අකුලීනයෝ ඉසුරුමත් වෙති. කුලජයෝ දිළිඳු වෙති, එසේ කල්හි කුලජවූ නුවණැති සත්

* තෙළෙස්වන ස්වප්නයද මෙහිම ඇතුළත් වී තිබේ.

පුරුෂ ජනයන්ගේ බරවූ බස් අසාරකොට ලඝු කෙරෙති, අකුලීනවූ අඥාන අසත්පුරුෂ දුර්ජනයන්ගේ බස් සාරකොට බරකොට ස්ථිර කෙරෙති, කුලජවූ සත්‍වයෝ ප්‍රවේණි ග්‍රාමක්ෂෙත්‍ර ආදිවූ කිසි ලාභ සත්කාරයක් නොලැබ දිළිඳුව ඒසා මහත් කුළු ගෙවල් පමණ ගල් ඉල්පෙන්නාක් මෙන් ලඝු වෙති, අකුලීනයෝ වියලි ලබු බරව දිය ඇතුළෙහි ගැලෙන්නාක් මෙන් වස්තුවෙන්ද ප්‍රභුත්වයෙන්ද අධිකරණ බිණීමෙන්ද ගරු වන්නාහ, එසේ හෙයින් මහරජ අනාගතයෙහි තුච්ඡ සත්‍වයෝ බරවෙති, කුලජ සත්‍වයෝ ලඝු වෙති, ඒ කාරණයෙන් මේ ස්වප්න යෙනුදු තොපට වත උපද්‍රවයෙක් නොම ඇත්තේය, එසේ හෙයින් මහරජ **තුදුස් වැනි ස්වප්නය** කියවයි වදාළසේක. එසඳ කොසොල් මහරජ කියනුයේ; ස්වාමිනි මීපුප් පමණ මැඩි පැටියෝ මහත්වූ කෘෂ්ණ සර්පයන් වේගයෙන් ලුහුබඳවා අල්වාගෙන ගලන්නා දුටිමියි කීය. එසඳ බුදුහු වදාරනසේක්: මහරජ අනාගතයෙහි ලෝකවාසී සත්‍වයෝ කෙලෙශ වසඟව ළඳරුවූ ස්ත්‍රීන් තබාගෙන තුමූ ඔවුන්ගේ වසඟව තමාගේ උපභෝග පරිභෝග ආදීවූ සියලු සම්පත්තිය ඔවුන් නතු කොට ඒ ස්ත්‍රීන්ගේ විධානයෙන්ම වියදම් කෙරෙති, එසේ කල්හි වස්තු හිමිවූ පුරුෂයන් කිසි කලක අසවල් රන් රුවන් වස්ත්‍රාභරණ ධනධාන්‍යාදිය කොයිදැයි විචාළ කල්හි ඔහු තමන්ගේ ප්‍රධානත්‍වයම පවත්වා ඒහැම වස්තුයෙන් තුඹට කාරිය කිම්ද මම ඒ හැම දන්නෙම්වෙදැයි කියා උන් කීවා වියදම් කරන්ටත් නොදී ඔහු කීබස් නොඉවසා ආක්‍රොශකොට මැඩියන් මහ නයින් ගලන්නාක් මෙන් ඔහුගේ සිහිවිලි නොරපා තමාගේ ආධිපත්‍යයම පවත්වන්නාහ, එසේ හෙයින් මේ කාරණයෙනුත් තොපට උපද්‍රවයෙක් නොම ඇත්තේයයි වදාරා **පසළොස්වැනි ස්වප්නය** කියවයි වදාළසේක. එබසට මහරජහු කියනුයේ; ස්වාමිනි ඇතුළෙන් පිටින් කෘෂ්ණවූ කිසි ගුණ සාරයක් නැති විහගාධමවූ කපුටුවෙක් රන්වන් හංසයන් පිරිවරා ගෙන ඇවිදිනා දිටිමියි කීය. එබසට බුදුහු වදාරනසේක්; මහරජ අනාගතයෙහි රජදරුවෝ ශිල්ප ශාස්ත්‍රාදිය දැරීමෙහි ප්‍රමාදව වෙසෙති, එසේ හෙයින් ශත්‍රු භයින් සමාන ජාතිවූ කුල පුත්‍රයන්ට තනතුරු නොදී තමන්ට මෙහෙකරුවූ අකුලීනයන්ට තනතුරු දෙති, එසේ කල්හි ජාති සම්පන්න කුලපුත්‍රයෝ ස්වශක්තීන් රජහට කිසිවක් කියාගත නොහී ජීවත්වන්ට අසමර්ථව යශසෙහි පිහිටියාවූ ජාති ගොත්‍ර හීනවූවන් පිරිවරා ඇවිදිති, මෙසේ කල්හි රන්වන් හංසයන් කාවුන් පිරිවරා ඇවිදිනාක් වැන්න, එසේ හෙයින් මේ ස්වප්න යෙනුදු තොපට භයෙක් නොම ඇත්තේයයි වදාරා **සොළොස්වැනි ස්වප්නය** කියවයි වදාළසේක.

එසඳ මහරජානෝ කියන්නාහු: පෙර සැබවින් දිවියෝ එළුවන් ලුහුබඳවා අල්වාගෙන කනවා දුටිමි. දැන් සිහිනෙන් එළුවෝ දිවියන් ලුහුබඳවාගෙන ගොස් අල්වාගෙන කත් නම, ලඟ සිටි සෙසු සෙසු දිවියෝ එළුවන්ට හයින් ඒ ඒ අත දිවමින් මහවල්වදිත් නම, මේ කාරණය කවරේදැයි විචාළහ. එබස් අසා තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ රාජොත්තමයාණන්වහන්සේ ස්වප්නය තෝරා **පසේනදි කොසොල්** මහරජාණන්ට වදාරණසේක්: මහරජ මේ ස්වප්නයත් අනාගතයෙහිම රාජධර්මයෙහි ප්‍රමාදවූ රජුන් දවස අකුලීනයෝ රාජාඪ්‍යවෙති, ඉසුරුමත් වෙති, කුලපුත්‍රයෝ අප්‍රසිද්ධවෙති, නිර්ධනවෙති, එකල්හි රාජාභ්‍යන්තරවූ අවශෙෂ ජාතිහු කුලජයන්ගේ ග්‍රාමක්ෂෙත්‍ර ආදිය තමන්ට වුව මැනවැයි උදුරති, එසේ උදුරාගත් කල්හි කුලජයෝ පෙර තොපි අපගේ ඇසුරුව හිඳ රැකී ජීවත්වගෙන දැන් අපගේ ගම් කුඹුරු උදුරවූදැයි කියා යුක්ති කියම්හයි ගොස් විනිශ්චය ස්ථානයෙහිදී කාට කිම්දැයි විචාළ කල්හි රාජාභ්‍යන්තරව සිටි අවශෙෂ ජාතිහු කුලජයන්ට කියනකල තොපටත් ගම් ඇත්ද, තොපගේ විචර තොපට නොදන්නේද, තොපිත් අප හා සමන යුක්ති බණවූද, රජ්ජුරුවන්වහන්සේට දන්වාලා තොපට කරන කාරිය බලා හිඳුවයි ඔවුන්ගේ කර පිටිකර ගස්වා අපහා කැපිව යුක්ති බැණ තොපට වන දෑ බලාහිඳුවයි කියා හයගැන්වූ කල්හි කුලපුත්‍රයෝ රාජ වල්ලභවූ අවශෙෂයන්ට හයින් තමන් සන්තක කෙත් වත් අරම් ආදිය තොපටමයයි කියා ඒ අකුලීනයන්ටම හැර ඔවුන් සිත්ගෙන තමන් බැඳගත් පැලට වැද හයින් කිසිවකුත් නොකියා ඒ එළුවන් දුටු දිවියන් මෙන් සැඟවී සිටිති, මේ කාරණයෙනුත් තොපට කිසි උපද්‍රවයකුදු නොම ඇත්තේයයි වදාරා මහරජ **මේ සොළොස් ස්වප්නය** දැන් මතු නොවෙයි පළමුත් රජහු දුටුවෝ වේදැයි වදාරා **මහා සුපින ජාතකය** දේශනාකොට වදාළසේක. එසඳ බොහෝ දිව්‍ය මනුෂ්‍යයෝ සද්ධර්මශ්‍රවණයකොට අමෘත මහා නිර්වාණ පුර ප්‍රාප්ත වූහ. එසේ හෙයින් අතීත අනාගත වර්තමාන සංඛ්‍යාත ත්‍රිවිධකාලය හස්තාමලකයක්මෙන් අනාවරණ ඥානයෙන් දක්නා සියලු සත්වයන් සිතට උපන් හය දුරුකොට සකලාභිවෘද්ධි සිද්ධකොට දෙන කරුණා නිධානවූ ද්විපදොත්තමයාණන් වහන්සේට මහත් භක්තීන් පූජාකොට අමාමහ නිවන් දකින්ට උත්සාහ කටයුතු **දක්වනලදමැයි**=

"ඉති තිවිධපදඤ්ඤූ ලොකනාථස්ස සම්මා
සහිතජන මනිත්වා හොගමත්තාය නිච්චං,
නිජමතිපථ පත්වා සම්මසිත්වා ගුණොඝං
ලභථ තිවිධභොගං චාථ මොක්ඛං ච අමොහා."

**මෙතෙකින් මේ සද්ධර්ම රත්නාකරයෙහි**
**නිද්‍රාවිභාවන ස්වප්නදීපන කථානම්වූ**

## තෙතිස්වන පරිච්ඡේදය

**කියා නිමවනලදී.**

# 34 වෙනි පරිච්ඡෙදය.

---

**තවද මේ සද්ධර්ම රත්නාකරයෙහි**
**ස්වප්නාදිපන් කථාවන්ට අනතුරුව දක්වූ**
**කර්ම විභාගනම් කවරහයත්?**

මේ මතු කියන්නේ එහි පිළිවෙළ කථාවය.

**කෙසේදයත්?** සියලු සත්වයන් විසින් කරනලද්දාවූ කුශලාකුශල කර්මයෝ සෞත්‍රාන්තික වශයෙන් ඒකාදශ ප්‍රභෙද වෙත්. කෙසේදයත්? **දෘෂ්ටධර්මවෙද්‍ය කර්මය, උපපද්‍යවෙද්‍ය කර්මය, අපරාපර්‍ය්‍යවෙද්‍ය කර්මය, යද්ගරුක කර්මය, යද්බහුල කර්මය, යදාසන්න කර්මය, කෘතත්වාත් කර්මය, ජනක කර්මය, උපස්ථම්භක කර්මය, උපපීඩක කර්මය, උපඝාතක කර්මයයි** මෙසේ එකොළොස් වැදෑරුම්වූ කර්මයන් අතුරෙන් ප්‍රඥවර්ජනා ප්‍රත්‍යය සන්තීරණයෙන් ගුණ මධුරත්වය විඳගැන්මෙහි එක්වූ ශුද්ධාචිත්තය කුසල ජවන චිත්තනාම් වෙයි. විද්‍යමානවූ යහපත් ගුණයා තමාගේ චිත්තයට නිශ්චය කොට දැනෙමින් සිටියදීම අභූතය පෙරදැරි කොට සැලකීමෙන් ගුණයෙහි විපරීතවූ පැවැත්තාවූ චිත්තය අකුශල ජවන චිත්ත නම්වේ. මේ ජවනයන් අතුරෙන් ලද්දාවූ ආවර්ජනා ප්‍රත්‍යය ඇති යම් ජවනයෙක් බොහෝසේ සත්වරෙක එක ජවන වීථියෙහි දිවේද, නෙවත් පවතීද, ඔවුන් අතුරෙන් ප්‍රඥාලම්බනවූ ප්‍රථම ජවන චිත්තය ශ්‍රද්ධාව හා එලුණු ක්ෂණයෙහි නිෂ්පන්නවූ කර්මයෙක් ඇද්ද, ඒ කර්මය දෘෂ්ටධර්මවෙද්‍ය කුශල කර්ම නම් වෙයි, අවිද්‍යාලම්බන ප්‍රථම ජවන චිත්තය ක්ලේශ වසඟවූ ක්ෂණයෙහි ජනිතවූ කර්මය දෘෂ්ටධර්මවෙද්‍ය අකුශලකර්ම නම් වෙයි, මේ දෘෂ්ටධර්ම වෙද්‍ය කුශලාකුශල කර්ම දෙකම මේ ආත්ම භාවයෙහිම විපාක දෙන්නේය, එසේ විපාක නුදුන්නේවීනම් අභාව කර්ම නම් වේ. මෙපරිද්දෙන් පැවැත්තාවූ ජවනයන්ගෙන් සත්වන ජවන චිත්තය උපපද්‍ය වෙද්‍ය කර්ම නම්වේ. ප්‍රථම ජවනය හා සත්වන ජවනයට අතුරු පස් ජවන්හු අපරාපර්‍ය්‍යවෙද්‍ය කර්ම නම් වෙත්. මෙයින් දෘෂ්ටධර්මවෙද්‍ය කර්මය ප්‍රවෘත්ති විපාකය දෙනමුත් ප්‍රතිසන්ධි නොදෙන්නේය. එහෙයින් ඉහ ආත්ම භාවයෙහිම විපාක නුදුන්නේ වීනම මත්තෙහි කිසිකලෙකත් විපාක නොදෙන්නේමය. බැදපු බිජුවටක් මෙන් ඇස්ව අවිපාක භාවයට පැමිණෙන්නේය. එසේ හෙයින් අභාව කර්ම නම් වේ. මේ දෘෂ්ටධර්ම වෙද්‍ය කර්මය කුශල පක්ෂයෙහි **කාකවලිය** සිටාණන් හා **පූර්ණක** සිටාණන්ට මෙන් කුසල විපාක දෙන්නේය. අකුශල පක්ෂයෙහි **චිංචමාණවිකාව සුප්‍රබුද්ධශාක්‍යය දෙවදත්තය කෝකාලිකය නන්දගො**

**ඝාතකාය නන්දයක්ෂයායි** යන මොවුන්ට දුන්නාවූ විපාක මෙන් අකුශල විපාක දෙන්නේය. මේ දෘෂ්ට ධර්මවේද්‍ය කර්මය තෙම මුව වැද්දහුගේ උපමාවෙන් දතයුත්තේය. කෙසේදයත්? යම්සේ මුව වැද්දෙක් මුව දඩ ගොස් නිති මුවන් පියලෙන තෙනක තෙමේ ඉඳුරා සැඟවී ගියා දුනු මිටලා සිටිකල්හි අභිමුඛයෙහි සම්ප්‍රාප්තවූ මෘගයක්හු දැක ඍජුව බලා ඇද විදි සැරය ඉදින් නොවැරද්දේ වීනම් ඒ මෘගයා ඒ ස්ථානයෙහිම හෙන්නේය, විදිසැරය වැරද ගියේ වීනම් ඒ මෘග තෙම හයින් ත්‍රස්තව මහ වනෙහි වදනා මුත් වැද්දහුගේ සැරපසට ලංනොවන්නේය. භයගෙන දිවපු මෘගයා හෙයින් වැදි කෝතෙක් ප්‍රයොග කෙළේවීනමුත් ඔහු අසුකොට ගත නොහෙන්නේය, දෘෂ්ටධර්මවේද්‍ය කර්මයාගේ විපාකය සැරය නොවැරැදි කල් වැන්න,අවිපාක භාවය සැරය වැරදිකල් වැන්න මේ කර්මය ඉහ ආත්ම භාවයෙහි විපාක දෙන බව මෙසේ දතයුතු කෙසේදයත්?

**රාජගෘහ** නම්වූ පුර ප්‍රවරයෙහි **බිම්බිසාර** මහරජාණන් රාජ්‍ය ශ්‍රී අනුභව කරන කල්හි ඒ නුවර **කාකවළිය** නම් මහ දුගියෙක් සහඹුව වාසය කරන්නේය. එකල්හි දවසෙක ඔහු බැලමෙහෙයට නික්මුණු කල්හි ඔහුගේ භාර්‍යාතොම එදවස් දෙදෙනා යපෙන පමණකටත් ආහාරයකට ආධාරයක් නොම ඇතිහෙයින් පණ්ණම් බිලයාගු නම් ඇඹුල් කැඳක් පිස තබා තමාගේ දුගියා එනතෙක් බලාහුන. එදවස් **මහාකාශ්‍යප** ස්ථවිරයන් වහන්සේ නිරොධ සමාපත්තීන් නැඟී අද දවස් කවර සත්ත්වයක්හට අනුග්‍රහ කෙරෙම් දෝහොයි දිවසින් බැලූසේක්. ඒ කාකවළිය නම් මහදුගියා දැක හුනස්නෙන් නැඟී සිට ශරීර ප්‍රතිජග්ගනාදිය කිරීමෙන් සුපිළි සන්ව ගැට වටුගත්වා පාත්‍රය අතින් ගෙන ඔහුගේ ගෘහද්වාරයට ගොස් සිහා වැඩ සිටිසේක, එකල ඒ දුගියාගේ භාර්‍යාතොම සිහා වැඩ සිටි තෙරුන්වහන්සේ දැක මේ උත්තමයාණන් වහන්සේට වැළඳීමට සුදුසුවූ උතුම් ආහාරයක් පිළිගන්වාලන්ට අප දුගී හෙයින් නොපළිවන, එතකුදුවුවත් අරුනු කිම යහපත් නොවන්නේය, තමහට උපන් ආහාරයක් පිළිගැන්විය යුත්තේමයයි සනිටුහන් කොට මහත් ආදරයෙන් තෙරුන් වහන්සේ වැඳ පාත්‍රය ගෙන තමා පිළියෙළකළාවූ පණ්ණම්බිලයාගු නම්වූ ඇඹුල් කැඳිත්ත නිරවශෙෂ කොටම පාත්‍රයෙහි බහා පිළිගැන්වූව, මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේද පිළිගත් කැඳ පාත්‍රය වෙහෙරට ගෙනවුත් ලොවුතුරා බුදුන්ට පිළිගැන්වූසේක, එසඳ බුදුහු තමන් වහන්සේ යපෙන පමණක් ගෙන සෙසු කැඳ පන්සියයක් දෙනා වහන්සේට වැළඳීමට දෙවූසේක, එකල්හි කාකවළියනම්වූ මහදුගියාද බැලමෙහෙයට ගියේ තැනින් තැන බැලමෙහෙ

ගත්තාවුන් පරීක්ෂාකොටගෙන ගොස් දෙව්රම් වෙහෙරට වන. එසඳ දෙව්රම් වෙහෙර සිටි දුගියාට ඒ කැඳින් මඳක් දෙවූ කල්හි ඒ දුගියාද කැඳ අනුභවකොට එතැන්හි සිටියේය. එසඳ මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ ලොවුතුරු බුදුන් අතින් විචාරනසේක්: ස්වාමීනි මේ යාගු දානයෙන් ඔවුන්ට කොබඳු කුශල ඵලයෙක් දේදැයි විචාළසේක. එබසට බුදුහු වදාරනසේක්: එම්බා මහාකාශ්‍යප ස්ථවිරයෙනි මෙතැන් පටන් සදවසක් ගොස් සත්වෙනි දවස් කාකවලිය නම් දුගිතෙම මහත් ඓශ්වර්‍ය්‍ය ලැබ සිටුපට බැඳ සේෂ්ඨත් නොවා කාකවලිය නම් මහසිටාණෝයයි යන නමින් ප්‍රසිද්ධ වන්නේයයි වදාළසේක. බුදුන් වදාළාවූ මෙපවත් දුගි තෙම අසමින් තමාගේ ගෙට ගොස් කියනුයේ: සොඳුර තොප අද මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේට දුන්නාවූ කැඳින්තෙනි අනුසසින් මෙයින් සත්වන දවස් අපට සිටු තනතුර ලැබෙතියි බුදුහු වදාළසේකැයි කීය. එපවත් අසා ඒ දුගිද්‍ද කියන්නී එම්බා මේ නුවර ධනවතුන් අරුම හෙයින් නුඹලාටම සිටු තනතුරු දීපු නියාවේදැයි කියා කවරෙක් වේවයි දුටුවක් දකුම්හ. බුදුන්වදාළේ ඇති දෙයක්ම වනැයි පහන් සිතින් හුන්කල්හි. සවෙනි දවස් එනුවර රජකරන බිම්සර මහරජතෙම සපිරිවරින් නුවර ප්‍රදක්ෂිණා කොට යනුයේ: නගරසන්නයෙහි අමුසොහොනෙක දිවස් හුලතැබූ පුරුෂයෙකු දුටුයේය. ඒ දිවස් හුල උන් පුරුෂතෙම මහරජහු දැක මහත්කොට ශබ්ද පවත්වා කියනුයේ මහරජාණන් වහන්ස නුඹවහන්සේට මෙහෙ නිමවන්ට පිළියෙළකළ රාජභොජ්‍ය යෙන් බත් අනුභව කරනු කැමැත්තෙමි, ඒ රාජ භොජනය එවුව මැනවැයි අඬගා කීය. මහරජතෙම එපවත් අසා කරුණා වෙතනාවෙන් යහපතැයි කියා නික්මුණේය. එදවස් සවස මහරජහට මෙහෙ වඩනු පිණිස රාජ භොජනය එළවූකල්හි දිවස් හුල තුබූ පුරුෂයා කී වචනය සිහිකොට මහරජතෙම කියනුයේ: එම්බා සහයෙනි නුවරින් පිටත අමුසොහොනෙහි දිවස්හුල උන් පුරුෂයෙක් රාජභොජනය ඉල්වීය, ඔහට මේ රාජභොජනය ගෙනගොස් දෙන්නට සමර්ථයක්හු ගෙන්වයි කීහ.

එබසට රාජපුරුෂයෝ මිනිසකු පරීක්ෂාකොට ලැබගත නුහුණුවාහු රජහට දැන්වූහ. එබසට මහරජ කියනුයේ: එම්බා සගයෙනි දහසින් බැඳි පියල්ලක්වත් බැඳ දී ගෙන්වයි කීහ. එබසට රාජපුරුෂයෝ දහසින් බඳ පියල්ලක් ගෙන නුවර ගොස් මේ දහසින් බඳ පියල්ල ගෙන නුවරින් පිටත අමුසොහොනෙහි දිවස්හුල තිබූ මිනිසාට රාජ භොජනය ගෙනගොස් දෙවමින් එවයි කියා

තුන්විටෙක නුවර කියවූ කල්හි, තුන්වන වාරයෙහි කා කවළිය දුගීයාගේ භාර්‍ය්‍යාතොම රාජභොජනය ගෙන ගොස් දෙමියි කියා එදහසින් බඳ පියල්ලගෙන රාජපුරුෂයන් හා සමග ගොස් රජහු දැක මෙපවත් කීහ, එසඳ මහරජ කියනුයේ; එම්බා තෙපි ස්ත්‍රීව සිට භයනැතිව කෙසේ යවූදැයි කීකල්හි, දේවයන්වහන්ස පුරුෂ වෙෂයකින් පංචායුධ සන්නාඬව බත්තලිය ගෙන යෙමියි කීව, මහ රජ එපවත් අසා ඒ ස්ත්‍රිය එම ලෙසම සරහා බත්තලිය දී නික්ම විය. ඒ ස්ත්‍රීතොම පුරුෂ වෙෂයෙන් පංචායුධ සන්නාඬව බත් තලිය ගෙන නුවරින් නික්මනයන කල්හි එනුවරින් පිටත තල් ගසෙක වසන දීඝනළුලනම්වූ යක්‍ෂයෙක් තමාගේ වෘක්‍ෂමූලයෙන් නික්මෙන්නාවූ ඒස්ත්‍රිය දැක එම්බා මේ රුක්සෙවණට පැමිණ ගොදුරුව සිට ගැලවීයන්ට කාරණා කිම්දැයි සිටුව සිටුව නොයවයි කිය එබසට ඒ ස්ත්‍රී කියන්නී එම්බල යක්‍ෂය තාගේ රුක් සෙවණට පැමිණියත් තට ගොදුරුවන්ට කාරණා නැතැයි කිව. එබසට යක්‍ෂයා කියනුයේ: කවර කාරණයෙක්ද ඇතිසැටියේම කියවයි කීහ. එබසට තමා රාජදූත හෙයිනැයි කිව කවර දූත මෙහෙවරක යෙයිද්දැයි විචාළේය. තෙල දිවස්හුල හිඳිනා පුරුෂයාට රජහුගේ මෙහෙවරින් රාජභොජනය ගෙන දෙනු පිණිස යෙමියි කිම, එබසට දීඝතළුල යක්‍ෂතෙම කියනුයේ: එසේවීනම් මාගෙ නුත් අස්නක් ගෙන යායෙහිද්දැයි කිය එබසට ස්ත්‍රී කියන්නී තොප ගෙන් දුන් අස්නෙක් ඇත්නම් තොප දෙන්ට කී තැනකට දෙමි යි කිව. එබසට යක්‍ෂයා කියනුයේ: එම්බා තෙපි යන ගමනේම කියාගන යන කල දීඝනළුලයක්‍ෂයාණන්ගේ භාර්‍ය්‍යාවූසුමන දෙව් රජහුගේ දුහිතෘවූ කාළිනම් දෙව්දූතොම පුත්‍රයකු වැදූහයි හඬගා කියාලවයි කියමින් තොප කියන්නාවූ දූත වචනයට පඬුරු පිණිස මේ තල්ගස මූල තිබෙන නිධාන සත තෙපි අරගනුවයි කීය. එබස් අසා ඒ ස්ත්‍රීතොම යක්‍ෂයා කීලෙසම දීඝතළුල යක්‍ෂයාණන් ගේ භාර්‍ය්‍යාවූ සුමන දෙව් රජහුගේ දූවූ කාළී නම් දෙව් දූ පුතකු වැදූහයි අඬගා කියමින් නික්මුණාය. එකල්හී යක්‍ෂ සමාගමයෙහි හුන්නාවූ සුමන දෙව රජ් පෙම එපවත් අසමින්ම මහත් සමාධි යෙන් මනුෂ්‍යයෙක් මට ප්‍රිය වචනයක් කියන්නේයයි කියා ඈ තමා වසන වෘක්‍ෂමූලයට ගෙන්වාගෙන ඈ කීවාවූ අස්න අසා ප්‍රසන්නව තමා වසන වෘක්‍ෂච්ඡායා මණ්ඩලය ඇතුළත තිබූ බොහෝ නිධානයන් දක්වා හැරගන්ට කිය.

මෙසේ ඒ ස්ත්‍රීතොම තමා යන මග දෙවියන්ගෙන් බොහෝ සංග්‍රහ විඳගෙන බත් තලිය ඇරගෙන යන්නී දිවස්හුල උන් මිනිසා ළඟට පැමිණ එම්බා තොපට රාජ භොජනය ඇරගෙන ආමියි කිව. හෙද බත් ගෙනා බව අසා හුල හුන් වේදනාවටත්

වඩා ආහාර තෘෂ්ණාව බහුල හෙයින් සතුටුව යොහොතවයි කියා බත් ළඟට ගෙන්වාගෙන බත් කමින් තිම් කල්හි මූබය පිටත වැකී ඉඳුල් උලු බත් කෑවූ තැනැත්තියටම පිසින්ට කීය. එකල්හි ඒ පුරුෂ වේෂයෙන් ගිය ස්ත්‍රීද තමාගේ අතින් ඔහුගේ මූබය පිටත වැකුණු ඉඳුල් උලු පිස හෙළුව. එසඳ ඒ හුල හුන් පුරුෂයා ඇගේ අත මුහුණ වැදගත්තාවූ මොළොක්හිම මේ ස්ත්‍රියකගේ අතැ ස්පර්ශයයි දැන අනුරාග චිත්තයෙන් ඇගේ ඉසකෙස් වැටිය තමාගේ කටින් ඩැහැගත්තේය. එකල ඒ ස්ත්‍රී තමාගේ කෙස්වැටිය ඔහුගේ කටින් ගලවාගත නොහී තමා අත තිබූ කඩුවෙන් කපා ඔහුගේ මූබයටම හැර නැවත අවුත් නුවරට වැද මහරජ දුටුය ඒ මහරජතෙම ඒ ස්ත්‍රිය අතින් ආ ගිය පවත් විචාරා තතු ලෙසම අසමින් එම්බා තොප බත් ගෙනගොස් හුලහුන් එකා කෑවූ ලෙස අපට නොයෙස් දැනේද, තොප බත් ගෙන ගොස් කැවීම් කීවත් සාක්ෂියක් ඇතොත් මුත් නොදැනෙතයි කීහ එබසට ඒ ස්ත්‍රී තොම රජහට කියන්නී දේවයන්වහන්ස මාගේ හිසකෙස් වැටිය ඔහුගේ මූබයෙහි තිබෙන බව බලාවන් සැක හල මැනවැයි කීව, මෙසේ තමා ගොස් ඔහු බත් අනුභව කරවූ නිසාව බිම්සර මහරජහට සැකහරවා කියා නැවත කියන්නී යනමග තල්ගසෙක වසන යක්ෂ යකු තමාට කී අස්නක් සුමනදේව රජහට කී පවතුත් තල්ගසමුල තිබූ නිධාන සතත් සුමනදේව රජහුගේ වෘක්ෂ මූලයෙහි තිබූ බොහෝ නිධානත් තමහට සතුටුපඬුරුකොට දුන්නියාව කියමින් දෙවන දවස් රාජපුරුෂයන් ඇරගෙන ගොස් ඒ සියලු නිධානම තුබූ තුබූ තැනින් උගුළුවාගෙන ඒ මහත්වූ ධන රාශිය ගෙන්වා ගෙනවුත් මහරජහට දැක්වූහ මහරජතෙම ඒ සියලු ධනරාශිය දැක ජනිතවූ මහාවිස්මයෙන් එකැම ඔවුන්ගේ පිණින්ම උපනැයි කියා ඇගේ විල්ලහවූ කාකවලිය දූගියා ගෙන්වාගෙන පට බඳවා සිටු ස්ථාන් නංවා ඒ යැම වස්තු ඔවුන්ටම පැමිණුවා කාකවලිය මහසිටාණෝයයි කියා එනුවර මහාධන සිටුවරුන් සිටිනා ස්ථානාන්තරයෙහිම පිහිටවූහ. මේ කාකවලිය සිටුතෙම මහපුජ් මහතෙරුන් වහන්සේට පිළිගැන්වූ කැඳින්නෙහි අනුසසින් ඉහාත්ම භාවයෙහිම එම නුවර මහාධන සිටු විය මේ දෘෂ්ටධර්ම වේදනීය කුශලකර්ම විපාකය.

තවද ඒ රජගහ නුවර සුමන සිටාණ කෙණෙකුන්ගේ ගෙයි පුණ්ණ නම් දූගියෙක් බැලමෙහෙ කොට ජීවත්ව තමාගේ භාර්යාව හා උත්තරා නම් දියණියකොනෙකුන් රක්ෂා කෙරෙයි, මෙසේම ඔහු එසේ කල්හි දවසෙක ඒ රජගහ නුවර සත්දවසක් නකත් කෙළිපා පිණිස රාජවිධානයෙන් බෙරලැවූහ. එපවත් අසා සුමන

සිටාණෝ උදුසන්ගිම නැගිසිට පූර්ණිකා නම් දුගියාණන් බණවා, එම්බා පූර්ණිකාවෙනි අපිත් අපගේ දුස කම්කාරුදීවූ සියලු දෙනාමත් අද නකත් කෙළි කෙළම්හ, තෙපිට නකත් කෙළි කෙළද, නො හොත් බැලමෙහෙ කරන්ට යවුදැයි විචාළහ. එබස් අසා දුගියා කියනුයේ; ස්වාමිනි කෙළිකළ නම් පොහොසත් කොතෙකුන්ටමුත් අප වැනි දුගීන්ට එයින් ප්‍රයොජන කිම්ද, පෙසු දෑ තබා අද දවස් අප හැම යපීගන්නාලෙසට සාල් නැළියක් මනාවතාටත් ලෙද මද, එසේ හෙයින් නකත් කෙළි තබා හොන් . ගෙයක් ගෙන සෑන්ට යෙමි කියා නගුල් විගදඬු කැවිටි ආන් ගෙන සීසාන්ට යනුයේ; තමාගේ ගෙට ගොස් ඇඹෙණියන් බණවාලා සොඳුර නුවර ජන යෝ අද නකත්කෙළි කෙළිති, අපි දුප්පත් හෙයින් බැලමෙහෙයට යම්හ, එසේහෙයින් තෙපි දහවලට මෙතෙක් දවස් පිසන තරමින් වඩා බත් මාලු පිස ගෙනෙනවයි කියා සීසාන්ට වෙලට ගියේය. එද වස් දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන්වහන්සේ නිරොධ සමා පත්තීන් නැගී අද කවරක්හට අනුග්‍රහ සොරම්දෝහොයි දිවසින් බලනසේක් පූර්ණිකා නම් දුගියාණන් දැක අද මා එතැනට ගියකල තමන්ට උපන් ආහාරය පිළිගන්වා එම කුසලානුභාවයෙන් අද දවස්ම සිටු තනතුරට පැමිණෙන්නයි දිවසින් දැක ගැට වටු ගත්වා පාත්‍රය අතින්ගෙන සීසානා දුගියාණන් සමීපයටගෙස් කුඹුර වටා අත් අස කැලයෙ බල බලා වැඩ සිටිසේක. එසඳ පූර්ණිකා නම් දුගි යාණෝද මහතෙරුන් වහන්සේ දැක සාතා සී තබා උන්වහන්සේ කරා අවුත් පසඟ පිහිටුවා වැඳ සිතනුයේ මුන්වහන්සේ වතල තැබ බලබලා සිටිසේක් දැවටුදඬෙන් ප්‍රයොජන ඇති නියාවනැයි සිතා දැවටුලී පිළිනැන්වීය, ඉක්බිති මහතෙරුන්වහන්සේ පාත්‍රයත් පෙරනත්කඩත් දෙවාලූසේක. මූමෙන් තොවැණ දුකත් දියෙන් ප්‍රයොජන ඇතිවනැයි සිතා පාත්‍රය ගෙනගොස් පැන් පෙරා පිළි ගැන්වීය, එසඳ දැවටුදියෙ වළඳා ශරීරය ප්‍රතිජගනායකොට පාත්‍රය ගෙන එතැන්හී මඳක් සිට ඇතුළු නුවර බලා නික්මුණුසේක. එකල්හි ඒ පූර්ණිකා නම් දුගියාගේ ඇඹෙණියෝ තමන්ගේ වල්ලභ යාණන් සීසානා තැනට බත් මාලු පිසගෙනා තමන්ගේ උත්තර නම් දියණිගත් ගෙයි රඳවා තුමූ බත් නැටගිය තබාගෙන අවුත් මඟට බැස වඩනා තෙරුන්වහන්සේ දැක වස්තුවෙන් දුගීවුවත් ශ්‍රද්ධාචිත්තය බහුලහෙයින් එසඳ සිතන්නී කියිතලෙක පිළිගන්වා ලන්ට සුදුස්සෙක් සම්භ වීතම් කුශලක්ෂෙත්‍රවූ අපගේ ස්වාමිදරු වාණන්වහන්සේ සම්භාවකොටගත නොහෙම්හ, ස්වාමිදරුවාණන් වහන්සේ අරුමයක්සේ ලදුමෝ නම් පිළිගන්වාලන්ට සුදුස්සක් සම් භවකොට ගතනොහෙම්හ, අදවූකල් ගුණසම්පන්නවූ උත්තමයා

ණන් වහන්සේත් සම්භ වූසේක, ඉතා මධුරතරයක් නැතත් මාගේ අදහසින් පවිත්‍රවූ බත් පමණක් ඇත, එහෙයින් මෙතෙක් කල් බොහෝදෙනාට කුශලයෙන් සංග්‍රහ කොට ගෙන ආසේක්; අපසේවූ දුගීත්වත් දුන් අනුග්‍රහකාරත්තේ නියම්යයි ශ්‍රද්ධාවිතානය පෙරදූරි කොට බත් පැස හිසින් බා තබා මහතෙරුන් වහන්සේ ළඟට ආදරයෙන් නැමි නැමී නුදුරුව ගොස් වැඳලා ස්වාමිදරුවාණන් වහන්ස ගැත්තවුවත් මිඹියවත් කරුණාකොට අපගේ දුක්පත් දන්සුග ඉවසා වදාළ මැනවැයි ආරාධනා කොට පැසින් බත් ගෙන හෝස් පාත්‍රයට පිළිගන්වන්ට වත්හ. එසඳ මහ තෙරුන් වහන්සේද බත් පිළිගන්නාසේක්; ආහාරයෙන් භාගයක් පිළිගන්වාපුකල ඔවුන්ටත් භාගයක් වුවමනා වේදැයි සිතා පාත්‍රය අතින්වසාගත්සේක. බත්පිළිගන්වන නැනැත්තෝද මහතෙරුන් වහන්සේගේ අදහස් දැනලා කියන්නාහු; ස්වාමීනි මේ එක්කෙනෙකුන්ට පොහොනා බත් සුග දෙභාගයකළ කල * ඔබත් නොපොහොනේය; ගැත්තවුන්ට මෙලොවින් කරන සංග්‍රහ තබා පරලොවින් කරන සංග්‍රහකොට වදාළමැනවැයි ආරාධනාකොට පැසෙහි බත් සුගකුත් නොතබා පාත්‍රයට පිළිගන්වමින් මේ ආහාරය දන් දුන්නාවූ කුසලයෙන් අති මධුරවූ නිවන් රසය ලබමෝවයි කියා ප්‍රාර්ථනාකොට ගත්හ. ඒ ආහාර පිළිගත් සැරියුත් මහතෙරුන් වහන්සේ ඒ තොප ප්‍රාර්ථනා කළ ලෙසම සිඬවේවයි කියා ඔවුන් අදහස් සහපත්වන ලෙසට බණ වදාරා ආහාර ගෙන වැඩපුසේක. එකල්හි ඒ උපාසිකාවෝද නැවතත් තමන් ගෙට ගොස් සාල් සුගක් සොයා බත් පිස ගෙන එන්ට වත්හ. එකල පූර්ණක නම් දුගියාණෝද කල් ඇති හෙයින් බිත්‍රුවට දැමුණක් විවර සීසා නිමවන තෙක් බත් නොගෙනා හෙයින් විඩා පත්ව ගොන් මුදා තණ බිමට හැර ක්ෂුධා ඉවසාගත නොහී තෙමේ එක් සෙවණෙක බත් ගෙනෙන පෙරමග බල බලා හුන්හ. ඔහුගේ ඇඹෙණියෝද වේලා තාංවා බත් ඇරගෙන එන්නාහු සීසා ගොන් උනාහැර රුක්සෙවණ උන් දුගියාණන් දැක අනේ මාගේ මිනිසා උදෑසනත් බත් කාලා එන්ට නොවූ හෙයින් සා විඩාව පෙරමග බලබලා හුන්නේ මාදැක නොරතුරු නොදැක කිපෙමින් ළඟ තිබූ කැවිපිලිය මූල පෙරළා ගැසුයේ වී නම් මාගේ දනාධ්‍යාශය නපුරුව ඔහු අනුමෝදන් කරවන කුසලටත් බාධා වෙයි සිතා ලංනොවී දුරම සිට අඩගා කියන්නී හිමියාණෙනි අද එක දවස් මා කළාවූ කුසලය අනුමෝදන්ව සිත පහදවා ගනුමැනව, මම අද දවස් කල් තබාම

---

* "ඔබත් මොබත් නොසෑහෙන්නේය" ඇතැම්.

තුඹට බත් පිසගෙන එන්නෙම් අතුරෑමගදී දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ දැක තුඹට පිසගෙන එන බත් ඔබට පිළිගන්වා පියා නැවත ගෙට ගොස් බත් පිසගෙන එන හෙයින් කල් ගියේය, එසේ හෙයින් ඒ දුන්නාවූ දනෙහි පින් අනුමෝදන් වන්නැයි කිව. ඒශබ්දය අසා පූණ්ණිකා නම් දුගියාද ක්ෂුධාවෙන් පීඩිතව කන් අගුලුවැටී ඈ කියන්නාවූ බස තෝරා අසාගත නොහී කිම්ද තොපි කියන්නේයයි කීහ. එබසට හයගෙන නැවතත් තමා කි ලෙසම තෝරා අස්වා කිව, එබස් අසා දුගියා අපමණ සතොෂයට පැමිණ එම්බා සොඳුර තොප දුන් දනය ඉතාම යහපතැයි පින් අනුමෝදන්ව අප සසර සිටිනාතෙක් කල් මුළුල්ලෙහි බතින් වෙහෙසක් නොවිඳිමෝවයි කියා සිත පහදවා ප්‍රාර්ථනා කොට ගත්තේය එසඳ තමාගේ අඹුව එලුවූබය් අනුභවකොට වේලා ගොස් බත්කෑහෙයින් ඈගේ ඇකයෙහි ගියතඹා මඳක් සැතපුණේ විඩාවෙන් නිදිගෙන පිබිද හිස ඔසවා වෙල් මැද බැලූයේය එකල්හි තමා උදුසන පටන් සීසෑ තැන් සියල්ලම කිතිහිරි මල් පිටික්සේ රත්රන් පිඩවලු ගැසී බබළන තියාව දුට, එසඳ තමාගේ ඇඹෙණිය බණවා එම්බල කෙලි මාකාල් වරදවා බත්කෑමෙන් ඇස් බමණ හෙයින්දෝහෝ නෙල සීසෑතැන් සියල්ලම රන්වන්වපෙණෙන්නේයයි කීය, එබස් අසා ඒ දුගී දූද කියන්නී ස්වාමිපුත්‍රයාණෙනි මා කල්යවා කෑ බතෙක් නැත, එතකුදු වුවත් මගේ ඇසටත් එසේම පෙණෙන්නේයයි කිව, එසඳ පූණ්ණිකා නම් දුගියා තමා උන් තැනින් නැඟීසිට සීසෑ තැනට ගොස් ඉන් එක පිඩවල්ලක් ඇරගෙන නඟුලිස ගසා බලා රත්රන් බව දැන අනේ මේ කිමෙක්ද, දම්සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේට දුන් දනෙහි විපාක අදම කල්නොයවා පලදුන්සැටියයි සිතා මෙතෙක් රත්රන්සඟවා තබාගත ප්‍රයොජනවිඳගතත් නොහැක්ක,සොඳුර සුවක්කාරමෝ දූයි කියා කථාකොට බත්නෙකා පැස රත්රන්පුරාගෙන රජගෙට ගොස් රත්රන්පැස රජුඉදිරියේ තබා පාමින් දෙවයන්වහන්ස අද මා සැතැන්මුළුල්ලම රත්රන්විය,ඒහැම රත්රන් භාණ්ඩාගාරයෙහි රැස්කරවාගත මැනවැයි කීය, එපවත් අසා මහරජ සිතනුයේ; නොකාරැණෙක, මෙසේ වන්ට කාරණා නැත, තොප අද කුමක් කළාදූයි විචාලහ එබසට ඔහු කියන්නාහු; දෙවයන්වහන්ස අද අප කළ දෙයෙක් නම් දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේට දනක් දුනුමීහ, මෙපමණමුත් වෙන කළ දෙයෙක් නැතැයි කිවුය. එබසට මහරජාණෝ සිතන්නාහු; උන්වහන්සේට දුන් දනෙහි විපාක කල් නොයවා අදම පලදුන් තියාවේදූයි සමාධිව ඔවුන් අතින් පිළිවිස්නා, මහරජතෙම ඔවුන්ට කියනුයේ; අප දූන්

ජට කළමනා කිම්දැයි විචාළේය එබසට ඔහු කියන්නාහු; දෙව
යන්වහන්සේය ගැල් දහස් ගණන් ගමන් කරවා රත්රන් පටවා ගෙ
න්වා ගත මැනවයි කීහ, මහරජාණෝද එපවත් අසා රාජපුරුෂ
යන් හා ගැල් දහස් ගණන් යැවූහ. ඒ රත්රන් ගෙනෙන්ට ගිය
රාජපුරුෂයෝ මහරජහුගේ නම කියා ගැලෙහි පැටවූ රත්රන්
ළබවලු මැටිකැටි විය, බිම තුබුවා රත්රන්මය, රාජපුරුෂයෝ මෙ
පවත් දැක නැවත අවුත් රජහට කීහ මහරජ එපවත් අසා ඔවු
න්ගේ පිණින් උපන් රත්රනට අපගේ නම් කියා ගැල්හිපට්වන්ට
කාරණා කිම්ද, පූණික නම් දුගියාණන් සන්තක රත්රනැයි කියා
ගැල්වල පටවා ගෙන එවයි කීහ. රාජපුරුෂයෝද එසේම කියා ඒ
හැම රත්රන්ම ගැල් පුරා පටවාගෙනවුත් සෙණ්ඩුවාළු මළුවෙහි
රැස්කළහ. ඒ රැස්කළාවූ රත්රන්ගොඩ වඩුවෙන් අසූරියන් උස
විය, අවටින්ද ඊට සුදුසු ප්‍රමාණ භූමිය පුරා සිටගත, එසඳ මහර
ජාණෝ නුවරවාසීන් රැස්කරවා ඔවුන් අතින් විචාරන්නාහු; මෙ
නුවර මෙතෙක්වස්තු කවුරුන්ට ඇද්දැයි විචාළහ. ඒවිචාළ රජහට
නුවරවාසී කියන්නාහු; සෙස්සන්ට මෙච්චර වස්තු ඇත්තේ රජව
සිටි නුඹවහන්සේට ඇත්නම් වේදැයි කීහ. රජ්ජුරුවෝ එපවත්
අසා මෙතෙක් වස්තු ඇති තැනැත්තන්ට සිටු තනතුරුම සුදුසු
වේදැයි කියා බොහෝ පරිවාර සම්පත් දෙමින් සිටු සේසත් නංවා
ඔහු බහුධන සිටාණෝයයි පට බඳවා තනතුරු දුන්හ. සිටු පට
බඳවාලා පළමු සිටාණ කෙණෙකුන්ගේ ගෙබිමක් දක්වාලා එතැ
න්හි ගෙවල් කරවා හිඳුවයි විධාන කළහ. ඒ පූණික නම් බහුධන
සිටාණෝද ඒ ගෙබිම වල් හරවා බිම් තනන්නාහු; බොහෝ වස්තු
කටාරම් දැක රජහට කියා යවා ඒ ඇසූ රජහු විසින් ඒ වස්තුද
ඔහුගේ පිණින්ම ලත් හෙයින් ඔහටමයයි කීකල්හි කීප දවසක් ඇ
තුළත ගෙබිම් තනවා මාළිගා කරවාගෙන ගෙවදිනා මඟුලුත් සිටු
පටබැඳි මඟුලුත් එකවිටම කරන්නාහු; සතියක් මුළුල්ලෙහි බුදු
පාමොක් මහාසංඝයා වහන්සේට මහදන් දුන්හ. එකල්හි බුදුහු
ඒ පූණික නම් බහුධන සිටාණන්ට බණ වදාළසේක, ඒ වදාළ බණ
අසා සිටාණෝද ඔහුගේ භාර්‍ය්‍යාවෝද උත්තරා නම් දියණියෝද
යන තුන්දෙනම ඇසූ බණින් සෝවාන් මාර්ගඵලයෙහි පිහිටියාහ.
මෙසේ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේට දන්දෙමින්
එම් ආත්මභාවයෙහි පූණික නම් දුගියා ලද්දාවූ සිටු සම්පත්තිය
දෘෂ්ටධර්මවේද්‍ය කුශලකර්ම නම් වෙයි.

දෘෂ්ටධර්මවේද්‍ය අකුශලකර්ම නම් කවරහයත්? හේ මේ මතුකී
යන පරිද්දෙන් දතයුතු. කරුණා නිධානවූ ධර්ම රාජෝත්තමයා
ණන් වහන්සේ සර්වඥමෘත වර්ෂා වස්වමින් වෙනෙය්‍ය ජන ගංගා

යන් විස්මයපත් කරවමින් මුළුලෙව් සෙත්‍රාග බබුළුවන කල්හි එ සිය් ජනිතවූ බොහෝ ධාන්‍යයන් එක් තැනෙකැහි රැශිකළාක් මෙන් බුද්ධශාසනයට ලාභ සත්කාර බොහෝව උපදින්ට වන, තීර්ථකයෝ හිරු රැසට නිෂ්ප්‍රභාවූ ඛද්‍යෝතිම්බයන්සේ ලාභ සත්කාරයෙන් පිරිහී බුද්ධශාසනයෙහි වෛරපරව කළහැකි දෙයෙක් නැතැත් කියා ජයගනුම්හයි අසමමුඛයෙහි වීථිසන්ධිවල ඒ ඒ තැන්හි සිටගත බෞද්ධයන් දක තොපි කුමක් කරවුද, ශ්‍රමණ භවත් ගෞතමයෝම තොපට බුද්ධද, අපි බුදු නොවමෝද, උන්ට දුන්දෙයම විපාක වැඩී ගියේද, අපට දුන් දෙයෙහි විපාක අඩුද, ඔහුම තොපට නිවන්දෙද්ද, අපි තොපට නිවන් දිගත නොහෙමෝද, උන්ට දුන් දානයට වඩා අනුසස් නැතැයි නොසිතව, අපටත් දන් දුනහොත් බොහෝ අනුසස් දක්වාලම්හයි, මුව නොපොහොනාලෙස කියා ඇවිදත් ලාභසත්කාර නොලදින් තනිව ගිඳ ඔවුනොවුන් හා මන්ත්‍රණය කොට කවර ලෙසකින් මොවුන්ගේ ගුණ මකා නුගුණයක් උපදවා ලාභසත්කාරයෙන් පිරිහෙළමෝදැයි කියමින් රහස් ප්‍රයෝගයක් සිතන්නාහු; එකලට සැවැත් නුවර චිංචමාණවිකා නම්වූ පරිබ්‍රාජිකාව උගන්වාගෙන නුගුණයක් උපදවම්හයි කියා හැම ගිවිස්වාගන උන් කල්හි දවසෙක එකියන චිංචමාණවිකා තොම තීර්ථකාරාමයට ගොස් ඔවුන් වැඳලා සිටියාය, ඇදුක තීර්ථකයෝ කථාවක් නොකොටම සිටියාහ. චිංචමාණවිකාත් තමාගේ වැරද්දක් ඇද්දෝහොයි සිතා චකිතව තුන්විට දක්වාත් වැඳ ස්වාමීනියි කියා උන්ගෙන් බසක් නොලදින් තොමෝම කථාවක් උපදවන්නී කථා නොකරන්ට මාගේ කවර වරදෙක්දැයි කීව. එබසට තීර්ථකයෝ කියන්නාහු; ඇයි චිඤ්චමාණවිකාව ශ්‍රමණ භවත් ගෞතමයන් විසින් ලොකයා සිත්ගෙන අපට උපදනා ලාභ සත්කාර සියල්ලම තමන්ටම තිළ සිටුවා ගත්තෝ වේදැයි කීහ. එසඳ මාණවිකා කියන්නී ස්වාමීනි මම මෙතෙක් දවස් එපවත් නොදනිමි, අද දැනගත් වේලෙහි පටන් කළමනා කිම්දැයි කීව. එබසට තීර්ථකයෝ කියන්නාහු; තොපි අපට වැඩක්සේ කැමැත්තා නම් තොපගේ උපදෙසයකින් ශ්‍රමණ භවත් ගෞතමයන්ට නුගුණයක් උපදවාලිය ඇකැයි කීහ. එබසට ස්වාමීනි කෙසේදැයි, කීව, එවිට කියන්නාහු; නී විසින් උන්ට නුගුණයක් ඉපදවූකල වඩදිය වෙලාවට ගංදිය උඩුගං බලා නික්මුණුසේ සියලු ලාභයම අපකරා එන්නේ වේදැයි කීහ. එබසට මාණවිකා තොම කියන්නී ස්වාමීනි මා ඉන්දදී මේ විචරකට සිතින් වෙහෙස විඳුනේ කිම්ද, උන්ට නුගුණ උපදවාලා ලාභ සත්කාරයෙන් පිරිහෙළම්කියාලා එතනින් නික්මගොස් ස්ත්‍රීමායමෙහි තමා දක්ෂ ඉඟියින් එතැන් පටන් චිංචමාණවිකා තොම ඇවැත් නුවර

වාසීන් සවස වෙහෙරට ගොසින් බුදුන්ගෙන් බණ අසා රෑ විහාර යෙන් නික්ම එන වේලාවට තොමෝ රහිඳුගොව්වකු ඉස් රන්පල සක් පෙරවගෙන සුවඳතරඹුවකින් නික්මුණාසේ සියලඟින් සුවඳ විහිදුවා මඟදිග අතින් ගිසින් සුවඳ මල් වගුරුවාගෙන දෙව්රම් බලා නික්මෙයි. එනුවිලෙහි නුවර වාසීහු මෑ දැක මෙවේලෙහි තොප කොයි යවුදැයි විචාළකල්හි මා සන එන තැන් තොපි විචාරා සිටිනාද, තොපට එසින් කායෂ් කිම්දැයි කියා තමාසේම පවිටු අදහස් ඇත්තවුන්ට මතු සාංකා උපදනා ලෙසට ගැබ් ගත්නා බස් කියාලා ජේතවන විහාරය දිසාවෙහි තීර්ථකාරාමවල ලැගලා උදෑසන ශ්‍රද්ධාවත් උපාසකවරුන් විසින් අපි පළමුව බුදුන් වඳුම්හයි විහාරයට නික්මුණු වේලාවට තොමෝ දෙව්රම් ලැගලා එන එකකුමෙන් නුවරට එන්නීය. එසඳ ඈ දුක තොප ලැග එන්නේ කොයි සිටදැයි විචාළවුන්ට මා කොයි ලැගි කිම, තොපි විචාරසිටියාදැයි කියාගෙන තමා යනගමන් පලාගොසින් මෙසේ මසක් දෙල මසක් ගියකල තොප කොයි වගාසින් ලගුදැයි විචාළවුන්ට අන්කු කොයි ලැගිම්ද, අප රෑ ඇතිව ඇති මූලාවේද, දෙව්රම් වෙහෙර ගොස් ශ්‍රී ගන්ධකුටියේ සැතපුණුයේ අද ඉඳද, තොපි මා අසින් කුමක් විචාරවුද, යන එන ආකාරයෙන්ම නො දනේදැයි කියා පෘථග්ජනයන්ට සැක උපදවමින් මෙසේ තුන් සාර මසක් විචර ගියකලට කඩරෙදි තබාලා තමාගේ බඩමගත්ම තිබන ලෙසට වෙලාගෙන දූරි ඇති සැවියක් දුටුදුටුවන්ට ගන වමින් බඩ වසා රන්පලසක් පෙරවගෙන ශ්‍රමණ භවත් ගෞතම යන්ට දුව දරුකෙනෙක් බඩ පිළිසිඳ ගත්හයි නුවණ නැත්තවු න්ට කියා ගිවිස්වීමෙන් බොහෝ අකුසල් උපදවාගෙන එතැන් පටන් අට නව මසක් ගියකල තමාගේ බඩ දර දඬුලිපියක් බැඳ ගෙන දෙව්රත් බඩත් වසා පලසක් පෙරවගෙන අතුල් පතුල් පිටි ගෙරිහනු ඇටලා තලා උදුම්වාගෙන වදන දවස් මස් ලංවූවාගේ ගහවා එක්දවසෙක සවස්වේලෙහි අනාථනාථ වූ ශරණ සමුද්‍ර ධර්මරාජෝත්තමයාණන් වහන්සේ සකලශ්‍රීන් විරාජමානවූ ධර්ම සභාමණ්ඩපයෙහි බුද්ධාසනාරූඪව සිවුවණක් පිරිස් පිරිවරා වැඩ හිඳ කුරවීකනාද නිර්විශේෂාෂ්ටාඞ්ග සමුපේත බ්‍රහ්මඝෝෂා විහිදුවා ධර්මදේශනාකාරනකල්හි චිංචමාණවිකාවතොම දම්සභාමණ්ඩපයෙහි රැස්වලත් බණ පිරිස්මැද බුදුන් ඉදිරියෙහි සිටගෙන තුඹ මහණ යෙහිසි නිද බොහෝ දෙනා එවලා බණ කියනදෑය. අසත්තවුන් අසා පිසිතොයන තරම් කටහඬත් යහපත, ජටත් වසා රූප සො භාවත් යහපත, මාගේ බබත් නුඹට දුව දරුකෙනෙක් ඇතිවූය, දූත් වදන දපස් මස් ලංවිය, වදන ගේකුත් තියම නැත, අගිරම ණිව කොට හුන් ගෙවලදී වදන්නටත් බැරිය. එතකුදුවූවත් තව

දක්වා තෙල් මිරිසකට ප්‍රයොජනයකුත් නැත, තමා බුදුකම් හස්මා, ගිහිගෙයි ඊට උත්සාහ නොකරතත් ඉතව ගිහිනා අනේපිඬු කොසොල් විශාඛාදීන්ම කියා තෙල චිංචමාණවිකාවෝ දූරි ඇත් තෝයයි කියා අපට ද දරුවෝයයි එළියේ නොකියතත් තුළුන්ට කළමනා දෙය අප සිට කරවන්නාක්මෙන් කරවයි විධාන නොකරන්නේත් ඇයිද, එදවස් පැරූත්ත නැතිකල දූන් පැරූත්ත කියන්ට උවමනාදැයි කියා සධාතුක පුරුෂයක්හට සකාමිකා කාන්තාවක් කියන සමධුර මැසිවිළිසේ අමෙධ්‍යයක් ගෙන චන්ද්‍රමණ්ඩලය දූෂ්‍ය කරන්ට උත්සාහ කරන්නියක මෙන් මෙසේ නොයෙක් බස් බිණුව. ඒ මාණවිකාව විසින්ම බිණියහැකිද, පළමු කළ අකුශල කර්මය තෙම එදවස් තස්නතන් මෙසේ බණන ලෙසට ඇට සමමත කොටලා තෙමේ නට, එසේ හෙයින් උගේ විධානය උගුළුවා ගන්නාහි ඒ චිංචමාණවිකාද බුදුන්ට බිණුව, එසඳ බුදුහු තමන්වහන්සේ සිවුවණක් පෂීදව වදුරන ධර්මය අතුරෙහි සන්ධිකොට තබාලා මඳක් වැඩහිඳ වදුරනසේක්; එම්බල චිංචමාණවිකාව තීගේ බස් සැබෑ වී නමුත් බොරු වී නමුත් දන්නමෝ තෙපිලා අපිලාම වේදැයි වදාළසේක. එවිට චිංචමාණවිකා කියන්නී සත්පුරුෂයන්ගේතුඩ බොරුවෙක් නොවැකෙන්නේය, ඇති ලෙසම කිසියාව යහපත, ශ්‍රමණ භවත් ගෞතමයෙනි දෙවෙනි තුන්වෙනිවත් එසේම කියාලව කීමෙන් ප්‍රයොජන නැත, එසේ කියාලාම නොතබා වැදීමට උවමනා ගෙවලුත් තෙල් මිරිස් ආදියත් සපවන ලෙදක් කියාලව, බණ අසුන් නැගීලා කත් සල සලා හිඳ රට ඇත්තන්ට බණ කීමෙන් ප්‍රයොජන නැතැයි කීව එකල්හි ඒ අසත්‍ය වචනය ප්‍රසිද්ධවූ හෙයින් ඒ ක්ෂණයෙහි ශක්‍ර දෙවේන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු විය. එසඳ දහසක් නුවණැස් ලා මිනිස් ලොව බලනුයේ; මාණවිකාව බුදුන්ට කීබස් බොරුබව දැක දිඹුලෙහි මල් ඇතැයි කියන්නාක් මෙන් කියන බොරු බස් බොරු නියාව හගවනු පිණිස දෙව් මිනිසුන් මධ්‍යයෙහි ප්‍රකාශ කළ මැනවැයි කියා දෙවියන් සතර දෙනෙකු ඇරගන ඒ ක්ෂණයෙහි දෙව්ලොවින් අවුත් දෙවුරම් ධර්මසභාවෙහි පැමිණ කිසිවක්හටත් අදෘශ්‍යමානව දෙවියෝ සතර දෙනම මූෂිකා වෙස් මවාගන චිංචමාණවිකාවට නොදැනෙනසේ පිටිපස්සෙන් නැඟී දරම්පිය බඩ බැඳගත් වැල් සතරම එකවිටම කපා එළුන. එවිට වසා පෙරවාගත් කඩ වාතමණ්ඩලියාවෙක් අවුත් පැහැරදැමිය ඇ දැරි ඇතියෙමි කියා බඩ බැඳනස් දරම්පිය ඇගේ පිටපත්ලෙහිම; වැටී සම්මස් හිඳ ලෙහෙබත් ලෙහෙබුවිය රැස්වහුන් බණපිරිස එපවත් දැක කාලකන්නි කෙල්ල තිසකලඹකාවූ බුදුන්ට මෙලෙසකීම කිරී

මේ කාරණා කිම්දැයි හිස බොල්කෙල වක්කරත්තාගේ අතින්
පයින් කැපීන් වැලින් මරා තලා විහාරයෙන් පිටත්කරපීහ. එසඳ
ඇ තමා බුදුන්ට පෙනෙන තැන්පියවා මඳක්ගියසඳ මහපොළොව
ඇ සිටි තැනින් පැලී විවරව අවීචිමහා නරකයෙන් ගිනිදූල්අවුත්
ඇපෙර රත්පලස් පෙරවියාගේ මාණවිකාවගේ සකලශරීරය ගිනි
දූලින් වෙලා ගෙන එවුම නෙත ගොස් අවීචියෙහි ඉපදීය.
මෙසේ චිංචමාණවිකාව ලවා තීර්ථකයන් බුදුන්ට පරිභව කැරවූ
නියාව නුවර ප්‍රකාශවිය. එකල්හී පළමු ඒ තීර්ථකයන්ට උපදනා
මඳ මඳ ලාභයෙක් ඇත්නම් එයින් පිරිහිණ, පාත්තුබ තෙල් ගෑ
කළ වඩ වඩාලා පාතබබලන්නාසේ බුදුන්ට ලාභසත්කාරඑතැත්
පවත් බලවත් විය. එදවස් දම්සභාවෙහි රැස්වූ සිවුවණක් පිරිදව
ධම්දෙශනාකොට මාගීඵල දෙවමින් බොහෝදෙනා මූව තොපො
ගොතා ලෙස සාධුකාර දෙවූසේක. මේ දෘෂ්ටධර්ම වේද්‍ය අකුශල
කර්මනම් වෙයි.

තවද අප බුදුන්ගේ මයිල්වූ සුප්‍රබුද්ධ නම්වූ ශාක්‍ය රජතෙම
තමාගේ දියනියවූ යශෝධරා දේවීන් වැන්දඹුකොට හැරපියා බුදු
වන්ටපලාගියයේහැයි කියා තමාගේපුත්‍රවූ දෙවදත්තස්ථවිරයන්
අජාසත් රජහු පහදවාගෙන බුදුන්ට අපරාධයට මෙහෙසූ නාලා
ගිරි නම් ඇතු දමනයලාහෙත තමන්ගේ පුතණුවන්ට ඉකුත්වත්
දක්වා බොහෝ නුගුණ කියාලා ලොකප්‍රසිද්ධ කලහේහැයි වරදවා
සිතා ශාසනයෙහි මහණ කොටලා උත්වගත්සේකීවා තොකොට
සෙසු භික්ෂූන්වහන්සේට ස්ථානාන්තර දෙවූසේහැයි කියාද බුදුන්
කෙරෙහි නිෂ්කාරණයේ වෛර පරව සුප්‍රබුද්ධ ශාක්‍ය තෙම එක්
දවසක් ආරාධනා කළ තැනකට බුදුන් වළඳන්ට වඩනා දක
යාතොාදෙමියි කියා වඩනා මග අවුරාගෙනහිඳ සුරාපානය කරන්
තේය, එසඳ බුදුහු මහණගණයා පිරිවරා එතනට වැඩිකල්හී සුප්‍ර
බුද්ධ රජහට කියන්නාහු: බුදුහු වඩනාසේක මගින් පහවූව මැන
වැයි කීවුය. ඒ අසා සුප්‍රබුද්ධ ශාක්‍ය තෙම කියනුයේ: බුදුහු නම්
අපට වයසින් වැඩි මහලු නොවෙති, නැකම්නුත් මගේ සහොදර
නැහණ්ඩියන්ගේ පුත, මාගේ බෑනණුවෝය, එසේහෙයින් මා හුත්
මගින් මට ආදර දක්වා ඉවත්ව පලායන්ට කියව, මම මගින් ඉව
ත්ව නොයමි කීය. තව තමන් ලඟ සිටියවුන් විසින් ඉවත් වන්ට
කියද්දී එලෙසම කියාලා ඉවත්නොවීම හිඳිති. එසඳ බුදුහු මයිල
නුවන්ගෙන් මග අවසර නොලදත් කරුණාවෙන්ම වඩනා
මගින් වැලකීයයේක. එසඳ සුප්‍රබුද්ධ ශාක්‍යයෝ තමන්ගෙන් දූතය
කු ලඟට කැඳවා එම්බා සගය බුදුන් පසුපස්සෙහි ගොස් කියන
කාරණ දෙයක් ඇත්නම් අසාගෙන අවුත් මට කියාලමයි කීවුය,

බුදුරජාණන්වහන්සේත් සසර ගමනින් නැවති දවස් සිනා පහළ නොකළත් එදවස් සිනා පහළ කළසේක. බුදුන්ගේ සිනා පහළ කිරීම නම් සෙසු ජනයන්සේ දන්තයන්පෙන්වා දන්තාවරණයන් විවර කොට මුව ගයා දියකළ මුණින් නමන හඬසේ මහත්කොට ශබ්ද පවත්වා සිනාවෙක් නැත. බුදුන් සිනාසෙන්ට සිතා මුව ප්‍රබෝධකළ කල්හි සතර දළදා වහන්සේගෙන් සුදු බුදුරැස් කිරි දහර සතරක්සේ නික්ම එක්වලා ඉඳුනිල්මිණි දාගබක් වට පිළී පවුරක් බඳනාසේ ශිරෝධාතු වට තුන්විටක් ප්‍රදක්ෂිණා කොටලා රන්පියුම් ගබකට වදනා ශ්වෙත හංසාවලියක් මෙන් නැවතත් මුඛ ගර්භයට වදනේය. බුදුන් එසේ සිනා පහළකළ කල්හි ආනන්ද ස්ථවිරයන්වහන්සේ බුදුන්ට පෙරටුව බද්ධාඤ්ජලිව සිට ස්වාමිනි ත්‍රිලෝගුරු බුදුරජාණන්වහන්ස දැන් සිනා පහළකිරීමට කාරණා කිම්ද, නොකරුණෙක සිනා පහළ නොකරත් උඹ, ඒට කාරණා අසනු කැමැත්තෙමියි කීසේක. බුදුහු එබසට වදාරණසේක්: සුප්‍රබුද්ධ ශාක්‍යයන් අප ඇමට සිඟායන්ට අවසර නොහළ අකුසලායෙන් අදට සත්වන දවස තමන්ගේ මාලිගාවෙහි යටමාලේ හිණි පාමුලදී පොළොව පලා වැද නිරයෙහි හෙන්නාහු වේදැයි වදාළසේක. මෙසේ බුදුන් වදාළ කල්හි රහස් අසන්ට ගිය තැනැත්තේ එපවත් අසමින් අවුත් සුප්‍රබුද්ධ ශාක්‍යයන්ට කීය. ශාක්‍යයෝ එපවත් අසා අපගේ බෑනණුවෝ තම් වන දෙයක්මුත් නොවන දෙයක් නොකියති, යම්බසක් කිවුනම් එම සිද්ධවන්නේ නියමය, එසේ විනමුත් බොරුවකින් හසු කෙරෙමියි සිතා මූන්වහන්සේ තමා සත්වනදවස් පොළොවගිලිතිකියන තැනැත්තන්වහන්සේ සාමාන්‍යයෙන් නොකියා යටමාලේ හිණිමුලදී පොළොවට වදිතියි බිම් නියමයක්කීයාවූය, සත්වනදවසයයි දවසත් නියමකොටවූය. මෙවක් පටන් සද්දවස ඉත්මෙතතෙක් යටමාලට නොබසිමියි සිතා යටමාලට නොබට කල හිණි පාමුලත් නැත, මේඅතුරට අප සුදුසු කාරණය සිතතබව නොදන්වන; උඩුමාලට පෝරු විනා පොළවක් නැතිබැවින් භූමි නියමය වැරදීමෙන් කාල නියමයත් වරදනේය, මේදනම වැරදිකල උත්කීබසත් වරදනේය එකල බුදුන් බොරුවෙන් හසු කෙරෙමියි සිතා තමන්ට අනුභවයට සිටි සියල්ලක්ම සත්මහල් ප්‍රාසාදයෙහි මුදුන් මාළෙහි තබා නෙක සත්මහලේම ඉණිමං පනති උගුලුවා ඉවත්කොට මාළෙන් මාළෙහි මහ දොරවල් අගුලු ලවා එකී එකී දොරකඩ මල්ලවයන් දෙදෙනකු බැඟින් සිටුවා මාඉදින් සිඟිනැතිව යටට බසිනොතින් අල්වා රදමයි මල්ලවයන්ට අර තරවම සම්මත කොට සත්වන මහලේ ශ්‍රී යහන් ගබඩාවට වැදහුන්හ. බුදුහු මොහු කළ සියල්ල

ප්‍රයොගම අසා භික්ෂූන්වහන්සේම වදාරනසේක: එම්බා මහණෙනි
ඒ සුප්‍රබුද්ධයෝ මතුමහල් තලය කඩා අහසට නැගිලා හුන්නත්
නැව් නැගී ගොස් මුහුදු මැද හුන්නත් පර්වත විවරයකට වැදලා
හුන්නත් මේ අකුසලයෙන් පොළව ගිලින්නේ නියමය, එතකුදු
උවත් කියාලූ සත්වන දවස් තමා වසන මාලිගාවෙහි හිණිපාමුලදී
භූමි වදනේ නියමයයි වදාළසේක මෙසේ වදාරා එකියන සත්වන
දවස් බුදුන් සිඟා වැඩලා නැවත විහාරයට වැඩිකල්හි සුප්‍රබුද්ධ
ශාක්‍යයන්ගේ මංගල අශ්වයා යට මාලෙහි සිටියේ උන්මත්තව
ගොස් භිත්තිවල පහරනේය එසද උඩුමාලේ හුන් සුප්‍රබුද්ධ ශාක්‍ය
යෝ ඒ ශබ්දය අසා කිමෙක් දැයි විචාළහ. එසද එතන සිටියෝ
කියන්නාහු: දෙවයන්වහන්ස තුඹවහන්සේගේ මංගල අශ්වයා
උන්මත්තව ගැසෙන්නේය, තුඹවහන්සේ දක මුත් නොසං
හිඳෙයි කිවුය. එබස්අසා ඔහු සංහිඳුවනු පිණිස උන් තැනින්
නැගීසිට දොර සමීපයට ගියහ, එසද ඔහුගේ අකුසලානුභාවයෙන්
දොර තෙමේම හැරීගියේය ඉවත් කරවූ හිණිමං මතු තුබූ තුබූ
තැනම පිහිටියේය. දොරකඩවල රැක සිටි මල්ලවයෝ ඔහු දොර
කඩින් පිටත්ව යන්ට යන බව දැක අල්වා උඩුමාලට දමම්හයි
සිතා සුප්‍රබුද්ධයන් අල්වා යටමාලට දැමුහ මෙසේ මල්ලවයන්
මහලින් මහලේ සිටීම පාත බලාදැමූ කල්හි සුප්‍රබුද්ධයෝ යටමාලේ
හිණිපාමුලට පැමිණසිටිසද දෙලක්ෂ සතළිස් දහසක් යොදුන්ගන
කඩ බොල් මහ පොළවින් එක්ලක්ෂ විසිදහසක් පස් පොළව
විවරව සුප්‍රබුද්ධයන් ඇදගන ගොස් අවීචියෙහි හෙළීය. එසේ
හෙයින් නුවණැත්තවුන්විසින් සුප්‍රබුද්ධයන් අකුසලයෙන් මිදෙනු
පිණිස කෙතෙක් උත්සාහ කළත් නොමිදුණු නියා දැන නවලො
කොත්තර සද්ධර්ම නැමැති ප්‍රාසාදරූඪව නිවන්සැප වළඳන්ට
සිතන්නවුන් විසින් සියල්ලවුන් කෙරෙහිම මෛත්‍රීකොට සකල
කෙලශයන් සංහිඳුවා නිවන්පුර පැමිණෙන්ට උත්සාහ සිතුව යහ
පති. මේ සුප්‍රබුද්ධ ශාක්‍යයන් කළාවූ දෘෂ්ටධර්ම වෙද්‍ය අකුශල කර්ම
යෙක.

තවද **දෙව්දත්** මහතෙරුන් විසින් බුද්ධාණතිය උගුලුවා
සංඝයා භෙදකොට බුදුන්ට අපරාධ ලෙස බොහෝ ප්‍රයොග
කෙරෙමින් වද යොදා කළාවූ අකුශලකර්මය ඔහට මේ ආත්මභා
වයෙහිම විපාක දෙමින් භූමිය විවරකොට ගෙනගොස් අවීචිමහා
නිරයෙහි හෙලා විඳුවන්නාවූ අකුශලකර්මයද මේ දෘෂ්ටධර්මවෙද්‍ය
අකුශලකර්මය නම් වෙයි. තවද දෙවදත්ත ස්ථවිරයන් වහන්
සේට ශ්‍රාවකවූ **කොකාලික** මහණතෙම **සැරියුත් මහමුගලන්**
දෙදෙනාවහන්සේ කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් නොතකා තමාගේවිචාරන්

නොදුන බිණුවාවූ අකුශල විපාකයෙන් එම ආත්මභාවයෙහි පොළොව පළාගෙන ගොස් පදුම නම් නිරයෙහි හුණුයේය. මෙසිදු දෘෂ්ටධර්මවේද්‍ය අකුශලකර්මය. තවද සැවැත් නුවර නන්ද නම් ගොඝාතකයෙක් පනස් අවුරුද්දක් මුළුල්ලෙහි ගොඝාතක කර්මයෙන් ජීවත්වනුයේ: එක්දවසෙක බත් අනුභවකරන්ට හුන්නේ මාංස නැතිව බත් නොකනහෙයින් එදවස් මස් නොලැබ පට්ටියෙහි සිටි ජීවමාන ගොනකුගේ දිව කපාගෙන අඟුරු මුඩුනෙහි ලා පලහා අනුභවකරන්ට පටන්ගන්නාකල්හි ඒදිව අනුභවකරන් නා තබා ඊට පළමු තමාගේ දිවමුලින් සැඩී ඒ බත් ගොඩෙහිවැටිණ. එකල්හි මහ හඬින් හඬ හඬා කාලක්‍රියා කොරෙමින් නිරුවන. මෙසිදු දෘෂ්ටධර්මවේද්‍ය අකුශල කර්මයෙක. තවද නන්ද නම් යක්ෂයෙක් එක්තරා යක්ෂයකු හා සමග කිසි කටයුත්තක් පිණිස අහසින් යනුයේ: ධර්මසේනාපති සැරියුත් මහතෙරුන්වහන්සේ රාත්‍රිභාගයෙහි * දික්නොවූ කෙසමස්සු ඇතිව අභ්‍යාවකාසයෙහි වැඩහුන්බව දැක හිසට පහරක් දෙනු කැමැත්තෙමි එක්වයන යක්ෂයාට කිය, හෙතෙම මහත් කමපාවට පැමිණ නොකලමනා දෙය නොකරවයි කියා වැලක්වියදීම පහලේය එසඳ උන්වහන්සේගේ හිස පුළුන්රැලක් වැදගත් පමණක් නොදැනුණේය. එසේද ලවත් එම අකුසල විපාකයෙන් එවිටම දශීනාවසානයෙහිදී පොළව පළාගෙන අවීචියෙන් මහත් ගිනිකඳෙක් දිව අවුත් හඬම හඬවා ඔහු වෙලා ඇදගෙන ගොස් අවීචියෙහි හෙළිය, මෙසිදු දෘෂ්ටධර්මවේද්‍ය අකුශලකර්මයෙක.

තවද මේ මහාභද්‍රකල්පයට යට ලක්ෂයක්වන කපින් මත්තෙහි එක බුදුකෙනෙකුන් වහන්සේගෙන් සාරවූ සාර නම් කල්පයෙහි බුදුවූ පියුමතුරා නම් බුදුන් සමයෙහි ද්විතීය අග්‍රශ්‍රාවිකාවූ අසමා නම් භික්ෂුණියක දැක මමද මෙසේම බුදුකෙනෙකුන්වහන්සේට අග්‍ර ශ්‍රාවිකා වෙම්වයි කියා උන්වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි වැදහෙව උන්වහන්සේ අතින් මෝකොමෝ මේ කල්පයට ලක්ෂයක්වන කපින්මත්තෙහි ගෞතමනම් බුදුකෙනෙකුන්ගේ ශාසනයෙහි මහණව උත්පලවණ්ණා සර්වවිරීශධියනනාමින් ද්විතීය අග්‍ර ශ්‍රාවිකාව නිවන් දකිතියි විවරණලැබ එතැන් පටන් කල්ලක්ෂයක් මුළුල්ලෙහි දානාදිවූ කුසල් රැස්කොට දිව්‍ය මනුෂ්‍යලොකයෙහි සැරි සරමින් දිව්‍ය මනුෂ්‍ය සම්පත් වළඳා, අප බුදුන් බුදුවූ මේ බුද්ධොත්පාදයෙහි දෙව්ලොවින් චුතව අවුත් සැවැත් නුවර සිටු කුලයක ඉපද නිලුපුල් දමක් මෙන් ප්‍රභා සම්පන්නව ශෝභමානවූ රූපශ්‍රියක් ලදහ. මෙසේ නිලුපුල් දමක් වැනිවූ

* “දික්වූ කෙසමසසු, ඇතැම්, “තමොරෙපිතෙහි සොඥඝී” ශනූ, සැරසංගහ,

ශරීර වර්ණයක් ඇතිහෙයින් උත්පල වර්ණා දේවීයයි නම් තුබූහ. ඉක්බිති ඒ උත්පලවර්ණා දේවීතොම වැඩිවිය පැමිණ යෞවන ප්‍රාප්තව දුටු දුටුවන්ගේ නෙත්‍රයෙහි ඇඳි රසාඤ්ජනයක් මෙන් නෙත්‍ර ශිශිරත්වයට පමුණුවා මනොනන්දනය කරමන්නාහ. එකල ජම්බුද්වීපයෙහි මොවුන්ගේ රූපශ්‍රීය ඇසූවාවූ රජ යුවරජ ශ්‍රේෂ්ඨි ආදීහු උත්පලවර්ණා දේවීන්ගේ පිතෘවූ සිටාණන්ට බොහෝපඩුරු ගමන්කරවා උත්පලවර්ණාදේවීන්ගෙන්වාගන්ට බොහෝප්‍රයත්න කොට දූතයන් යවූහ. එකල්හි උත්පලවර්ණා දේවීන්ගේ පිතෘවූ සිටු තෙම සිතනුයේ: මම දූන් මෙකී රජ යුවරජ සිටුවරුන්ගෙන් එකක්හට මාගේ දුව පාවා දුනිම්නම් සෙසු හැම මට සතුරු වෙති, එසේහෙයින් ඒ සියල්ලවුන්ම මට මිතුරුවන ලෙස උපායක් කෙරෙම්යි සිතා තමන්ගේ දුහිතෘවූ උත්පලවර්ණා දේවීන් ලඟට කැඳවා කියන්නාහු: අමම නුඹපිණිස මේ දඹදිවරජ යුවරජඇමති සිටුවරුන්ගෙන් පඩුරු පාක්කුඩම් නොඑවූකෙනෙක්නැත. එසේ හෙයින් ඒ සියල්ලවුන්ම වෙදනා නොකරවා නුඹ මහණ වන්නේදැයි විචාලහ. එකල උපුල්වන් දේවීද තුමූ මෙම ජාතියෙහි අපගේ බුදුන්ම අග්‍රශ්‍රාවිකා වන්ට කප් ලක්ෂයක් පාරමිතා පුරා ආ කෘතාධිකාර උත්තම සත්‍රියක හෙයිනුත් නිවන් දක්නා පශ්චිමාත්මභාවය හෙයිනුත් පිය සිටුහු කීවාවූ වචනය ශතපාක සහස්‍රපාක තෛලයක් හිස සිහිල්වනලෙස මුදුනෙහි වත්කලාක්මෙන් මුදුනෙන් පිළිගෙන මහත් සමාධින් යහපත මහණවෙම්යි කීහ. එකල්හි සිටු තෙම මහත් සත්කාර කොට දියණියන් මෙහෙරට කැඳවාගෙනගොස් මහණකරවීය එකල්හි මහණවූතොමනොබෝදවස කින්ම භික්ෂූණීන් පොහොයකරන්නාවූ උපොසථ සාලාව හැම දීනා පිළිවෙළින්මවත්කිරීම මූන්ටපැමිණියේය එදවස්මෝතොම පහන් ලමින් පොහොගෙය වත්කොට කුණු දමා හස්තපාද ධොවනයකොට පොහො ගෙයි සිට ඇවිලෙන්නාවූ පානක් බලා ගෙන සිටි කල්හි ඒ ඇවිල නැගෙන්නාවූ ප්‍රදීප ශිඛාවම නිමිත්තකොට ගෙන නැවතත් එම ප්‍රදීපයම බලබලා සිට තෙජොකසිනය අරමුණුකොට ධ්‍යාන උපදවා එම ධ්‍යානය පාදකකොටගෙන සතර මග සතර ඵලයට පැමිණ සිවුපිළිසිඹියාපත් රහත්ව අමා මහ නිවන්දුටහ. මෙසේ භාගීඵලප්‍රාප්තවූ ඒ උත්පලවර්ණා ස්ථවිරීතොම එයින් මෑත භාගයෙහි දවසෙක ජනපද චාරිකාවෙහි ගොස් ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් දක්වා සැරිසරා ඇවිද නැවත අවුත් අන්ධවනයෙහි වැදඋන් කල්හි එතැන්හි ශ්‍රද්ධාවත් උපාසකයෙක් කිළියක් කැපලෙස කරවා දෙමින් යානක් පනවා වට තිර ඇද පරික්ෂිප්ත කෙළේය එකලට භික්ෂුණීන් අරණ්‍යයෙහි වාසය

කිරීම බුදුන් විසින් නොවලකන ලද්දේය, එසේහෙයින් ඒ අන්ධ වනය මැද කැප කිළිමෙයයි වසන්නාවූ උත්පලවණ්ණා මහාසථවිර තොම දවසෙක ඒ අන්ධ වනයෙහි සිට පෙරවරු ගැට වට්ටු ගන්වා, පාත්‍රය අතින් ගෙන පිඬු පිණිස සැවැත් නුවරට නික්මුණාහ. ඒ උත්පලවණ්ණා මහාසථවිරින්ගේ මයිලණුවන්ගේ පුත්‍රවූ නන්දමාණවක නම් පුරුෂයෙක් ඒ උත්පලවණ්ණා සථවිරින් ගිහි කාලයෙහි පිළිබඳ සිත් ඇත්තේ ඔවුන් ජනපද චාරිකාවෙහි ගොස් අන්ධවනයට ආබවඅසා එදවස් උන් පිඬු පිණිස සැවැත්නුවරට වත්තියාව දැන තෙමේ ඒ මහා සථවිරින් එන්ට පළමුව අන්ධ වනයට ගොස් ඔවුන් සැතපෙන ගෙට වැද ඇඳයට සැඟවී හුන්නේය. එකල්හි උත්පලවණ්ණා මහා සථවිරීද සැවැත්නුවරදී වළඳාලා පස්වරු භාගයෙහි තමා වසන වනයට අවුත් ගෙට වැද දොර වසා ඇඳපිටඋන් කල්හි බැහැරසිට අව්වෙහි අවුත් ගෙයි හුන් හෙයින් ඇඳිරියක් මෙන් ගෘහ ගර්භය ඉඳුරා නොපෙනෙන්නේය. එකල්හි අඬා මංචකයෙහි නිලීනවහුන් නන්දමාණවකතෙම එළිබැස මංචකමස්තකරූඪව අද්භුතය තෝ නොනැස නොනැසැයි කියාවැලකියදීම සථවිරීන් අභිභවනයකොට තමා ප්‍රාර්ථිතකර්මය සිඬකොටගෙන ගෘහයෙන් නික්මුණේය. ඉක්බිති ඒ නන්දමාණවකයා සාලාවූ අධර්මයදුටුවාවූ මහා පෘථිවීතොම ධරාගත නොහී විවර වූවක්මෙන් ඒ ක්ෂණයෙහි මහපොළවද්දුරුව සථවිරීන්ගේ දර්ශනාවසානයෙහි පොළව විවරවූ තැනින් අවීචියෙන් ගිනිදැල්අවුත් නන්දමාණවකයා වෙළා ගෙනගොස් අවීචියෙහිම හෙළීය. මෙයිද් දෘෂ්ටධර්මවෙද්‍ය අකුශල කර්මනම්වෙයි. මේදෘෂ්ටධර්මවෙද්‍යකර්මයෙහි කුශලාකුශලවිපාකයයි දතයුතු. මෙසේ මෙකී කුශල අකුශල කර්මයෝ ඉහාත්මභාවයෙහි විපාකදීගත නුහුණුවා නම් ඉදිප් මත්තෙහි කිසිකලක විපාකදීගත නොහෙන්නාහුය, එසේහෙයින් අභාවකර්ම නම්වේ.

දිට්ඨධම්මවෙදනීයං-පඨමං ජවනං භවෙ,
අලද්ධාසෙවනත්තා තං-අසමත්ථං භවන්තරෙ.,

මේ දෘෂ්ටධර්මවෙද්‍ය කර්මය. උපපද්‍ය වෙද්‍ය කර්ම නම් කවරහයත්? සත්වන ජවන චෙතනාව උපපද්‍යවෙද්‍යකර්ම නම්වේ. ඒඋපපද්‍ය වෙද්‍ය කර්මය කළාවූ සත්වයාහට මේ ආත්ම භාවයෙන් චුතවගියකල දෙවන ජාතියෙහි විපාකදෙන්නේය, ඒ උපපද්‍ය වෙද්‍ය කර්මය වනාහි කුශල පක්ෂයෙහි අෂ්ට සමාපත්ති වශයෙන් විපාක දෙන්නේය අකුශලපක්ෂයෙහි පංචානන්තර්‍යකර්ම වශයෙන් විපාක දෙන්නේයයි දතයුතු. එයින් කුශලය අෂ්ටසමාපත්තිවශයෙන් විපාකදීම්නම්, අෂ්ට සමාපත්ති ලාභීවූ උත්තම පුරුෂයෙක් සත් සමාපත්තියක් තබා එක සමාපත්තියෙකින් බ්‍රහ්මලොකයෙහි උප

දෙන්නේය, සෙසු සමාපත්තීහු එහිම අන්තර්ගත වනමුත් සමාපත්තිය කට ජාතියක් බැගින් නූපදනාහ. එසේහෙයින් සෙසු සමාපත්ති කුශල කර්මය අභාව කර්මය නම්වේ. මේ උපපද්‍ය වේද්‍ය කුශල කර්මය. උපපද්‍යවේද්‍ය අකුශලකර්මයනම්, ඉදින්කිසි පාපිපුරුෂ යෙක් මාතෘ ඝාතක කර්මයද පිතෘ ඝාතක කර්මයද අර්හන්ත ඝාතක කර්මයද ලෝහිතොත්පාදක කර්මයද සංඝභේදක කර්මයදැයි යනමේ පංචානන්තර්‍ය කර්මයම කෙළේද, ඒතෙම නියතගති කම් කල හෙයින් මේ ආත්ම භාවයෙන් චුතව දෙවනජාතියෙහි එකාන්තයෙන්ම නිරයෙහි ඉපද කල්පයක් මුළුල්ලෙහි මහදුක් විඳින්නේය. ඒ අකුශල විපාකයද ඒ ආනන්තර්‍ය කර්මපසින් එක ආනන්තර්‍යකර්මයක් විපාකදුන්කල්හි සෙසු ආනන්තර්‍යකර්මයෝ සතර දෙන එහිම අන්තර්ගත වනමුත් එක එක ආනන්තර්‍ය කර්මයකට වෙන වෙනම විපාක දෙන්ට වෙන වෙනම ප්‍රතිසන්ධි නොදෙන්නේය මේ කර්ම ස්වභාවයයි දතයුතු. මේ උපපද්‍ය වේද්‍යකර්මයද දෙවනජාතියෙහි කිසියම් කාරණයකින් විපාකදීගත නුහුණුයේ වීනම් මත්තෙහි සාවර කලකත් විපාක නොදෙන බැවින් යටකී මෘග ව්‍යාධෝපමාවෙන්ම අභාවකර්ම නම්වේ. අහෝසිකර්මය නම්ද එම වෙයි, මේ උපපද්‍ය වේද්‍යකර්මයෙහි කුශලාකුශල විපාකනම.

"වෙදනීයනතුපපජ්ජ-පරියොසානම්පිනං,
පරිනිට්ඨිතකම්මන්තා-විපච්චති අනන්තරෙ."

මේ යටකී එක්වැනි සත්වැනි ජවන චිත්තයන්ට අතුර සිටි පංචජවන චිත්තයෝ අපරාපර්‍ය වේද්‍යකර්මයෝ නම්වෙති. ඒ අපරාපර්‍ය වේද්‍ය කර්මය නම් කවරහයත්? අපරාපර්‍ය වේද්‍ය කර්මය කළාවූ සත්වයන්ට මේ ජාතිය දෙවන ජාතිය තුන්වන සතරවන දසවන සියක්වන දහසක්වන ලක්ෂයක් වනද එයින් මත්තෙහි අසවල් වන ජාතියෙහි විපාක දේයි යන නියමයක් නැත්තේය ඒ අපරාපර්‍ය වේද්‍ය කර්ම කළාවූ සත්වයන් නිවන් නොදක්නා තෙක්ම මේ අතුර අවසරලත්විටක විපාකදෙන්නේය, ඔහු නිවන් නොදක සසර සිටිනා තෙක්කල් මුළුල්ලෙහි දුන දුනැයි කියා අවසරබලා විපාක දෙන්ටම සිටිනාමුත් අභාවකර්ම නොවන්නේමය. කුමක් මෙන්ද, මුව වැද්දෙක් සුනඛයකුගෙන දඩයියේ මෘගයකු දක සුනඛයාට දක්වූ කල්හි ඒ සුනඛ තෙම සමාන වනු ම්පදිකායාහෙයින් පසුපස්සෙහි නොහැරම දුන්ගතිම් දුන්ගතිම්යි සිතා ලුහු බඳවා දුවන්නේ අවසරයක් ලත් විටෙකම අල්වනමුත් නිරුත්සාහවමනනා සිටිනේය. එපරිද්දෙන්ම මේ අපරාපර්‍යවේද්‍ය කර්මයෙහි නොහැසී විපාකදෙන්ට නිබඳපරිදිනම්, කිසිවෙක් තමා

උපයාගත් ධාන්‍යයක් කොටුවෙක්හි රැස්කොට තබාලා පමණක් නොව ප්‍රයෝජන විඳිමින් අමුතුව අමුතුවත් උපයු ධාන්‍යය කොටුවෙහිම රැස්කෙරේද, මඳක් ප්‍රයෝජනයටගෙන බොහෝවලපයා රැස්කරන බැවින් කොටුගුලු පිරුණුවනම තිබේද, එමෙන් අපරපර්යාය වේද්‍ය කුශලාකුශල කර්මයෝද සමහරෙක් විපාක දුනත් බොහෝසේ කොටුගුලුවල රැස්කළ ධාන්‍යය මෙන් මතු මත්තෙහිත් විපාක දෙන්නම සිටිනාහුය. ඒ අපරාපර්යාය වේද්‍ය කර්මයෙන් මුක්තවූ සත්වයෙක් මේ ලොකයෙහි නොම ඇත්තේය.

"සෙසානි වෙදනීයානි-පරියායෙ පරෙ පන,
ලද්ධාසෙවනතො පාකං-ජනෙනන්ති සති පච්චයෙ."

මේ අපරාපර්යාය වේද්‍ය කර්ම නම්වේ. යද්ගුරු කර්මය නම් කවරහයත්? කිසිවක්හු විසින් කරනලද්දාවූ කුශල කර්මයට අකුශල කර්මය ගුරුව තිබේද, අකුශල කර්මයට කුශල කර්මය ගුරුව තිබේද, ඒ යද්ගුරු කර්ම නම්වේ කෙසේද? ඒ වනාහි කුශල පක්ෂයෙහි සධාතුකචෛත්‍ය බන්ධනාදීවූ මහාසී කුශලයක් කෙළේ කුණු කිපිලිකාදීවූ ලඝු ප්‍රාණීයක්හු ජීවිතෙන්ද්‍රියෙන් තොර කෙළේද; අකුශල පක්ෂයෙහි කිසිවෙක් පංචානන්තර්ය කර්ම කෙළේ අශුභ චේතනාවකින් සුනඛාදියක්හට ආහාර ලොපාණියක් දුන්නේද, මෙසින් මහාසීවූ කුශලය දියමුදුනෙහි තුබූ මුංඇටක්පමණ වී නුමුත් අකුරෙක් හෝ යගුළියෙක් හෝ දියපිට ඉල්පෙන්ට නොහැකිව ඇතුළෙහිම දියෙහි ගෑලේද, එපරිද්දෙන් කුසලය බරහෙයින් එම පළමු විපාක දෙන්නේය අකුශල පක්ෂයෙහි පංචානන්තර්ය කර්මයෙහිද මෙසේමැයි. මේ යද්ගුරු කර්ම නම් වෙයි. යද්බහුල කර්මනම් කවරහයත්? යමක්හු විසින් කරනලද කුශලාකුශලකර්ම දෙකින් වනාහි යමෙක් බහුලවේද, ඒ කර්මය යද්බහුලනම්වේ. හෙද බොහෝ කාලයක් ලබ්ධාසෙවන වශයෙන් දතයුත්තේයි. යමෙක් වනාහි බලවත්වූ කුශලකර්මයෙහිත් සොම්නස් උපදවාද, අකුශල කර්මයෙහි බහුලවූ සන්තාප උපදවාද, මේ යද්බහුල කර්ම නම්වේ. කුමක්මෙන්ද, යම්සේ මල්ලවයෝ දෙදෙනෙක් යුධභූමියට බැස යුධකරන කල්හි එයින් බලවත් එකෙක් දුර්බලයා හෙළා නික්මේද, එපරිද්දෙන්ම දුර්බලකර්මය මර්දනය කොට ආසෙවන වශයෙන් බහුලවූ හෝ සන්තාපවශයෙන් බහුලවූ හෝ කුශලාකුශලකර්මය යද්බහුලවශයෙන් විපාක දෙන්නේය. මේ යද්බහුලකර්ම නම්වේ. යදාසන්නකර්මය නම් කවරහයත්? යම් සත්වයෙක් කුශලාකුශලකර්ම දෙකම කෙළේද, එහෙයින් ඔහු මරණාසන්නයෙහි අකුශලයෙක් සිහිවීනම් අපායෙහි ගෙන්නේය.

කුශලයෙක් සිහිවී නම් දෙව්ලොව ඉපද දිව්‍ය සම්පත් විඳින්නේය. කුමක් මෙන්ද, යම්සේ සඟ මහලු තෙලකාදිවූ බොහෝ ගවයන් ගවපාලයෙක් සවස රැස්කොට ගෙනවුත් ගාලෙහි ලා ඉදිදොර දඬු ලමින් රැකවල්කොට ගියේද ගෙතෙම උදෑසන අවුත් ගවයන් තණකිඹවට හරින පිණිස ගාල්දොර ඉදිගල කල්හි එහි පුරසිටි ගවයන්ගෙන් බලවත් වෘෂභරාජයන් ඇතත් ඉදිදොරකඩ ලංවසිටි මහලු ගවයෙක් හෝ වස්සෙක් හෝ බලසම්පන්න වෘෂභයෙක් තමා හෝ සිටියේවී නම් ඉදිදොර සිටි එකා පිටත්වූකල මූන් සෙසු ගවයන් නික්මයන්ට අවසර නොපෙනෙන්නේය. එපරිද්දෙන්ම කළ කුසල් අකුසල් කෙපමණක් ඇතත් මරණාසන්නයෙහි ප්‍රත්‍යුතම චුතිචිත්තයට ආසන්නවූ කුශලා කුශල කර්මයෙක් පලමුකොට විපාකදෙමින් භාගීර්ථයකට නොපැමිණියොත් සෙසු කුසල් අකුසල් විපාක දෙන්නෝය යන් එසේ මැයි.

යටගිය දවස මධු අඩගණ නම් ග්‍රාමයෙක්හි වසන්නාවූ දෙමළ දෙවාරික පුරුෂයෙක් හැමදවස්හි උදෑසන්හිම තැඟිසිට සිලිකවූ ලනු ගෙනගොස් බිලිබාගෙණවුත් ගෙනා මච්ඡයන් තුන් භාගයක්කොට එක්භාගයක්දී සහල්ගෙන එක්භාගයක්දී කිරිදී තෙල් ගෙන එක්භාගයක් තිසිලෙසපිස පුත්‍රදාරාදීවූ සියල්ලෝම අනුභවකොට ජීවත්වෙති. මෙසේ ප්‍රාණඝාතකොට වසන්නාහු පනස් අවුරුද්දක් ඉක්මුණුකල්හි මෑතභාගයෙහි ඒ දෙමළ දෙවාරික තෙම වෘඩව යාර්ගතනොහී නෙයිම අනුෂ්ඨාන සෙය්‍යාවට පැමිණියේය. එකල්හි ගිරිවිහාර වාසීවූ චූලපිණ්ඩපාතික තිස්ස ස්ථවිරයන් වහන්සේ දවසෙක එගමට සිඟාවැඩිසේක. එකල්හි මේඅනුෂ්ඨාන සෙය්‍යාවෙන් සැතපෙන්නාවූ පුරුෂයා දුන ඔහුගේ ගෘහ සමීපයට ගොස් වැඩසිටිසේක එසඳ ඔහුගේ භාර්‍ය්‍යාව දොරකඩට කර පොවා තෙරුන්වහන්සේ දුක නැවත ගෙට වැද තමන්ගේ වල්ලභයාට කියන්නී හිමියනෙනි එක් තෙරකෙනෙකුන් වහන්සේ දොරකඩ සමීපයට වැඩිසේකැයි කීවුය එබසට දෙමළ දෙවාරිකතෙම කියනුයේ: එම්බල දූත් පනස් අවුරුද්දක් දක්වා මෙගම්හි වැස තෙරකෙනෙකුන් වහන්සේ ලඟට නොගියවිරිම් දුන් කුමක් පිණිස උන්වහන්සේ ලඟට යෙම්ද: තෙරුන්වහන්සේට ආපසු වඩින්ට කියාලවයි කීය. එබස්අසා ඒ මැහැලි කියන්නී ස්වාමීනි මෙතෙන ඉස්නාව නොවෙයි, අනික් ගෙදරකට වැඩපුව මැනවයි කිව. එබසට තෙරුන්වහන්සේ කියනසේක්: එම්බා උපාසිකාවෙනි තොපගේ වල්ලභයාණන්ට ශරීර ආයාස කිම්දැයි විචාලසේක. එබසට ස්වාමීනි දුර්වලකම් වැඩියකැයිකිව එබස්අසමින් තෙරුන්වහන්සේ ඇතුළුගෙට වැද ඔහට කියනසේක්: එම්බා පුරුෂයාණනි

තෙපි මඳක් සිහි උපදවාගෙන පන්සිල් ඇරගනුමැයි කීසේක. ඒ අසා යහපතැයි කීය, තෙරුන්වහන්සේ ඔහු ත්‍රිවිධසරණයෙහි පිහිටුවා පන්සිල් දෙන්ට පටන්ගත්සේක. එසඳ පන්සිල් ගෙන නිමි කල්හිම තෙරුන්වහන්සේ වැඩහුන්සේක උන්වහන්සේ වැඩි නොබෝකලකින්ම කාලක්‍රියාකොට ආසන්නකුසලානුභාවයෙන් නිඳ පිබිදියක්හුමෙන් චාතුර්මහාරාජික දිව්‍යලෝකයෙහි යොදුන් ගණන් උස දිව්‍යප්‍රාසාදයක දිව්සෙනඟ පිරිවරා දිව්‍යශ්‍රීසොභාවෙන් බබලමින් උපන්හ. එසඳ ඒ දෙමළ දොවාරිකතෙම දෙව්ලොව ඉපද ඒක්ෂණයෙහිම කවරකුසලයකින් මේදිව්‍යලොකයෙහි උපන් නියාදැයි දිවසින් බලනුයේ: තෙරුන්වහන්සේ දුන් පංචසීලානුභාවයෙන් ලත් දිව්‍යසම්පත්තිය බව දැක ඒ ක්ෂණයෙහිම දිව්සෙනඟ පිරිවරා දෙව්ලොවින් නික්ම අවුත් තෙරුන්වහන්සේ දැක පසඟපිහිටුවා වැඳ සක්මන් කෙළවර සිටියේය. තෙරුන්වහන්සේ දිව්‍යපුත්‍රයා දැක එම්බා තෙපි කිනම්හුද, කවර දෙව්ලොවක සිට දැන් අවුදැයිවිචාළසේක. එබසටදිව්‍ය පුත්‍රතෙම කියනුයේ: ස්වාමීනි නුඹවහන්සේ පන්සිල්දුන් දෙමළ දොවාරිකයායි කීය එම්බා තෙපි කොතැන්හි ඉපද මෙතැන්හි අවුදැයි කියා විචාළසේක. ස්වාමීනි චාතුර්මහාරාජික භවනයෙහි ඉපද ඔබවහන්සේ දැක වැඳ වඩ වඩා කුශල වර්ධනය කොට ගන්නා පිණිස මෙතැන්හි පැමිණියෙමියි කියා තෙරුන්වහන්සේ ප්‍රදක්ෂිණාකොට වැඳ නැවතත් තමා වසන දිව්‍යලොකයටම ගොස් දිව්සිරි විඳිනේය. මම යද සනා කුශල කර්මයෙහි විපාකය

යදුසන්ත අකුශල කර්මයනම් කවරහයත්? සිරිලක අනුරා ශංභා නම් ගම මහා වාචකාල නම් උපාසකයෙක් තෙම වසනුයේය. ඒ උපාසකයා බුද්ධශාසනයෙහි ප්‍රසන්නව දානමානාදී කුසල් කෙරෙමින් මාර්ගඵල උපදවනු පිණිස ධ්‍යාන භාවනා කරනු කැමැත්තේ සෝවාන් මාර්ගඵල ලදමැනවැයිකියා තිස්අවුරුද්දක් මුළුල්ලෙහි ද්වත්තිංසාකාර කර්මස්ථාන භාවනා කෙරෙමින් ඒ තාක් කල් මුළුල්ලෙහි ආලෝක පමණකුත් නොලැබ සිතනුයේ: දැන් තිස් අවුරුද්දක් මුළුල්ලෙහි සෝවාන් මාර්ගඵල ලබනු පිණිස ද්වත්තිංසාකාර කර්මස්ථාන භාවනා කෙළෙමි, එසේ භාවනා කොට වෙහෙස විඳත් ආලෝක පමණකුත් නොලදිමි, එසේ හෙයින් මේ බුද්ධ ශාසනය නෛර්යාණික නොවන සැටිය, ශුද්ධවූ බුද්ධ ශාසනයෙක් වී නම් මේකලාවූ භාවනාවෙන් මාර්ගඵලයක් ලද මනාවේද, මාර්ගඵලයක් නොලදුමේව් අශුබ නියා වේදැයි දෘෂ්ටි විපර්යාසයට පැමිණ තමාගේ හේතුව නුමුකල බව නොදැන නෛර්යාණික ධර්මයට අනාදර සිතුයේය. ඒ සිතුවාවූ දෘෂ්ටි විපර්යාස චිත්තය

මරණාසන්නයෙහි ප්‍රත්‍යුතව ඒ චිත්තය හා සමග කාලක්‍රියා කොට මහවැලිගඟ තවුස්බක් පමණ දිගඇති එපමණට පුළුපු මහත් ශරීරයක් ඇතිව කිඹුල්ව උපන්නේය. ඒකිඹුලාද දවසෙක ගොදුරු සොයා ඇවිදිනේ කසා නොවට පැමිණියේය. එදවස් ගැල්ටැම් පිරූ ගල් සැටක එපමණ බර අදින්බ පුදුසු පමණ ගව සමූහයක් යොදා ගැල් මෙගොඩ ගෙනෙනු පිණිස කසා තොටට පැමිණ මෙගොඩ එළඹූ කල්හි ඒ ටැම් පිරූ ගැල් සැටත් අදනාවූ ගව සමූහයත් මේ සියල්ලම ඒ කිඹුල්තෙම ගෙලමින් තවද ක්‍ෂුධාව සංසිඳුවාගත නුහුණුයේය. මේ බුද්ධශාසනයට වරදවා සිතූ අනාදරයෙන් ලද්දාවූ යදසතන අකුශල කර්ම විපාකය. මේ යදුසතන කුශලා කුශල කර්ම නම්වේ.

කෘතාත්වාත්කර්මනම් කවරහයත්? මෙසිත් විතිර්මුක්තවඅඥාන වශයෙන් කළාවූ කර්ම කෘතත්වාත් කර්ම නම්වේ. ඒ කර්මය වනාහි යම්සේ කුශලපක්‍ෂයෙහිහෝ අකුශලපක්‍ෂයෙහිහෝ පැමිණ විපාක දෙනකල්හි කිසියම් උන්මත්තකවූ පුරුෂයෙක් දුනුහී ගෙන තමා උමතු හෙයින් කෙපමණක්ඇද කොතැන්හී කුමකට කුමක් පිණිස විදිනාබවත් නොසලකා සැරය හැරපිද ඒසැරයගොස් හැදීමෙන් හෝ ලකින්හෝ සෘජුව බැලීමෙන්හෝ මේ කිසි දෙයකිනුත් ගරු භාවයක් නැතිව ශරයගොස්වැටේද, උන්මත්තකයා විදි ශරයෙහි කිසිවකිනුත් ගරුභාවයක් නැත්තාසේ කෘතත්වාත් කර්ම විපාකයද අනියම්ව ගරුභාවයකුත් නැතිව ප්‍රාප්තවූ යම්කිසි තැනෙක්හිඅසාරව විපාකදෙන්නේය. අඥානභාවයෙන් නොදැන අසාරවශයෙන් වික්‍ෂිප්තව කළාවූ කුශලා කුශල කර්මයෝ එපරිද්දෙන්ම අගරුව විපාක දෙන්නාහුයි. මේ කෘතත්වාත් කර්මය නම්වේ.

ජනක කර්මයනම් කවරහයත්? යම්කිසිවක්හු කුසලයක් කල කල ඒ කළාවූ කුසලානුභාවයෙන් පිරිසිදුවූ ක්‍ෂත්‍රිය වංශයක ප්‍රති සන්ධි දෙමින් යහපත්ලෙස ගර්භ පරිහාරයලැබ උපන් කල්හිදු සත් කාර සලබන්නේය, මෙසේ සත්කාර ලැබ එතැන් පටන් ප්‍රවෘත්ති යෙහි අනික් කර්ම විපාකයෙක් ජනිතව වඩනට නුවූයේ ආහාර වස්ත්‍ර යානාසනාදිවූ ඓශ්චර්යයක් ලැබ ගත නොහී අපර පක්‍ෂ යෙහි චන්ද්‍රයාමෙන් අඩුව අඩුව අවුත් දුක්ඛිතව ජීවත් වන්නේය. මේ ජනකකර්ම කුශල ප්‍රතිසන්ධිය නම්වේ. ජනකකර්ම අකුශල ප්‍රති සන්ධිය නම් කවරහයත්? යම්සත්වයෙක් අකුසලයක්කොට ඒතමා කළාවූ අකුසලයෙන් දුක්ඛිතවූ කුලයෙක හෝ හීන කුලයක හෝ දසියෙක බඩ හෝ ප්‍රතිසන්ධිගෙන ඔවුන් නිරන්තරයෙන් මෙහෙ වරෙහි ව්‍යාවෘත්ත වන කල්හි තැලී තැලී බොහෝ වෙහෙසවිඳ

ඔවුන් කන බොන වේලාවට කන බොන දෙයක් නොලබ ක්‍ෂුධාවෙන් පීඩිතවන කල්හි එහිනුන් ඉවසෙනසේද ජනවීමට තිබූ ගෘහමංචාදිවූ සැප තැනක් නොලදින් පැමිණි තැනක ජාතව සප්පායවූ තෙලොදක භොජනාදියක් සුදුසු ලෙස නොලැබ දුක්ඛිත ජීවිකාවෙන් වඩිනවෙමින් මවුපියන්ගෙන් ලබන්වට එහින් ජීවත්වන්වවත් කිසිවක් නැතත් ප්‍රවෘත්තියෙහි අතික් කර්මඵලයෙක් ප්‍රස්තුතව පූර්වනිමාසවඤ්‍යාමෙන් වස්ත්‍රාභරණ අන්නපානාදියසමහව රාජ රාජ මහාමාත්‍යාදීන්ලග අභිප්‍රාය ලෙස දවස් ඇර සෙවය කෙරෙමින් සිත්ගෙන තම් තනතුරු ලැබ උපභොග පරිභොග සම්පත් දැසි දැස් ගවමහිෂාදීවූ සියලු ඓශ්වර්‍ය්‍යම ක්‍රමයෙන් ලැබගෙන සුඛිතව ජීවත්වන්නාහ. මේ ජනක අකුශල ප්‍රතිසන්ධි නම. මේ ජනක කුශලා කුශල ප්‍රතිසන්ධි නම් වේ.

උපස්තම්භකකර්මය නම් කවරහයත්? කිසිවෙක් ප්‍රසන්නචිත්තයෙන් කුසලයක්කොට ඒ කුසලානුභාවයෙන් ඒ ජාති ගෙළමර කුශල ප්‍රතිසන්ධි දෙමින් සුගතියෙහි ඉපද ඒ කුශලකර්මයෙන් ජනිතවූ නොයෙක් ඓශ්වර්‍ය්‍ය අනුභවකොට ඒ ජාතිය ක්‍ෂයවූ කල්හි ඒජාතියෙහිසිට කරගත් කුශලකර්මයකින් හෝ අපරාපර්‍ය්‍ය වේද්‍ය කුශල කර්මයකින් හෝ ගෘහයකට සිටුවූ ස්තම්භයක් ජීර්ණවූ කල්හි අලුත්ව ස්තම්භයක් සිටුවූවාසේ පූර්වයෙහි කෘතසුකෘත කර්මයෙක් උපස්තම්භව සුගති ප්‍රතිසන්ධි දෙමින් ස්වර්ගයෙහි උපදනේය, මෙසේ නොයෙක් ලක්‍ෂගණන් හවුරුදු දිව්‍යමනුෂ්‍ය ලොකයෙහිඉපද සුගතියෙන් සුගතියට සැරිසරා ඇවිද දුර්ගතියකට නොපැමිණ දිව්‍ය මනුෂ්‍ය ලොකයෙහි උපදවනුයේ ප්‍රථමයෙන් කළාවූ කුශලකර්මයට උපස්තම්භ වූවාක් මෙන් ඒ ඒ ජාතිවල ප්‍රතිසන්ධියකටම කුශල කර්මයෝ උපස්තම්භව දුර්ගතියකට යානොදෙන්නාහුය. මේකුශලොපස්තම්භ නම්. කිසිවෙක් ඉහාත්ම භාවයෙහි අකුශල කර්මයක් කොට ඒ අකුශල කර්මයෙන් දුර්ගති භවයෙහි ඉපද බොහෝ දුක් අනුභව කෙරෙමින් එතැන්හි මැර නැවතත් එතැන්හිදී කොටගත් අකුශල කර්මයකින් හෝ පූර්වකෘත අපරාපර්‍ය්‍ය වේද්‍ය අකුශල කර්මයෙන් හෝ ඔහු ඒඅපායෙන් චුතවන කල්හි වෙනතැනෙක්හි ඔහු උපදිනා ප්‍රතිසන්ධිචිත්තයට උපස්තම්භව නැවතත් අපායෙහිම උපදනේය, මෙසේ නොයෙක් ලක්‍ෂගණන් ජාතියෙහි පිළිවෙළින්ම ඒ ඒ ජාතියෙහි ජනිතකරවන ප්‍රතිසන්ධියට අකුශලකර්මයෝ උපස්තම්භව උපදවා බොහෝදුක්විඳුවා ඇවිදුවන්නාහුය. මේඅකුශල කර්ම උපස්තම්භක නම් වෙයි. මේ කුශලා කුශල උපස්තම්භක කර්ම නම්වේ.

තවද උපපීඩක කර්ම නම් කවරහයත්? පෙර තමාකළ කුශලා කුශල කර්මයකින් ප්‍රතිසන්ධි දුන්කල ප්‍රවෘත්තියෙහි උපන් දුක් සැප

දෙකට එසේම පෙර කළ කුශලා කුශල කර්මයෙන් එකෙක් උදුව පීඩා කෙරෙමින් කලක් නොපවැත්තදී බාධාකරන්නේය. කෙසේ දයත්? කුශල කර්මය විපාක දෙන කල අකුශල කර්මයෙක් උපපීඩකව ඔහු විපාකදීමට නොදෙයි, අකුශල කර්මය විපාක දෙන්ට වන්කල්හි කුශලකර්මයෙක් උපපීඩකව විපාකදී ගත නොදෙන්නේයි. හේ එසේමය, යම්සේ වර්ධනවන්නාවූ වෘක්ෂලතා දියක් කිසිවෙක් ශස්ත්‍රයකින් හෝ දණ්ඩකින් හෝ ඡේද්‍ය භේද්‍ය කෙළේනම් එකල ඒ වෘක්ෂලතාදිය වර්ධනය නොවන්නේය, එසේ හෙයින් කුසල විපාක දෙනුයේ අකුසලයෙන් පීඩිත වන්නේය. අකුසල විපාක දෙනුයේ කුසලයෙන් පීඩිතව විපාකදෙන්ටනොපිළිවන් වෙයි. මෙයින් සුනඛඛනකයාගේ අකුශල කර්මය කුශල කර්මයට උපපීඩක විය. චෞරඝාතකයාගේ කුශල කර්මය අකුශල කර්මයට උපපීඩක විය කෙසේදයත්? රජගහ නුවර වසන්නාවූ ඝාතකාළ නම් මිනිසෙක් රජහට අභ්‍යන්තරව සිටියේය. ඒ පුරුෂයා නුවර චෞර කර්මාදියකළ සොරුන් අල්වාගෙන අවුත් රජහට පෑකල්හි මහරජතෙම මොවුන්ට නිග්‍රහකරවයි කියා ඒ ඝාතකාළයාහට පාවාදෙන්නේය. ඒ පාවාදුන් සොරුන්ට කළමනා වධකොට රජහු සිත්ගෙන වසන්නේය. මෙසේ වසන්නාවූ ඒ ඝාතකාළයාට පනස් අවුරුද්දක් අතික්‍රාන්තවිය. මෙසේ ඒ ඝාතකාළ නම්වූ චෞරඝාතකතෙම චෞරඝාත කර්මය කොටම ජීවත් වන්නේය මෙසේ රාජසේවය කොට කල්යාමෙන් වයෝවෘද්ධවූ කල්හි දවසෙක මහ රජහට කියන්නාහු: දේවයන් වහන්ස චෞරඝාතකයා ඉතාම දුර්වලවිය. චෞරඝාත කර්මය ඕහට නොපිළිවනැයි රජහට දන්වූහ. එබසට මහරජ කියනුයේ සගයෙනි එසේවීනම් ඔහු ඒ තනතුරෙන් පහකොට අනිකෙකු සලස්වයි කීහ. එබස්අසා අමාත්‍යවරු ඔහුඉවත්කොට අනිකෙකු සැලැස්වූහ. එතැන් පටන් චෞරඝාතකතෙම දුඃඛිත භාවයට පැමිණ තර වස්ත්‍රයක් ඇඳගන්ටද සුගන්ධ පුෂ්ප මාලාදියක් පළඳින්ටද මධුරවූ ක්ෂීර පායාසාදි ආහාරයක් අනුභවකරන්ටද සීත ධෞවත ස්නානාදි ශරීරසැපයක් නොලැබ කලක් මලිනව හුන්නේය මෙසේ හුන්නාවූ චෞරඝාතක තෙම දවසෙක තමාගේ භාර්‍යාවකැඳවා කියනුයේ: එම්බා සොඳුර අද්දවස් මම යහපත්වූ ක්ෂීර පායාසයක් අනුභව කරනු කැමැත්තෙමියි කීය. මෙසේ තමාගේ භාර්‍යාවට කියා ගිසින් නහා එනු පිණිස දිය තොටට ගොස් ඉස් සෝධා නහා අමුතුවස්ත්‍රයක් හැඳ සුවඳ මල් පැළඳ තමාගේ ගෙටම එනුයේ: අතරමඟදී ධම්මසේනාවී සැරියුත් මහතෙරුන් වහන්සේදැක අද සතිළිඹු භාවය පහකෙළෙමි. ආර්‍යයන් වහන්සේ

දිවිම්හි මහත් සන්තෝෂයට පැමිණ තෙරුන්වහන්සේ තමාගේ
ගෙට වැඩම්කරවා ගෙනගොස් අස්නක් පනවා වඩාහිඳුවා අලුත්
එළගිතෙල් උක්සකුරු සුණුසහිත කිරිබත් පිළිගැන්වූහ. එසඳ
කිරිබත් පිළිගෙන සැරියුත් මහතෙරුන්වහන්සේ ඔහට කුසලානු
මෝදනා කොට බණ වදාළසේක. ඒ වාතකාල පුරුෂ තෙම දම්
සෙනෙවි සැරියුත් මහතෙරුන්වහන්සේගෙන් බණඅසා සෝවාන්
මාර්ගයට මෑත පිළිලබන්නාවූ අනුලෝම ක්ෂාන්තිය ලැබ තෙරුන්
වහන්සේ නික්මුණු කල්හි පසු ගමන්කොට ගෙයි මඳක් තැන්
අවුත් අවසරගෙන ආපසුගෙට එනුයේ අතරමග වද සිටි දෙනක
ඇනතැසී තවුතිසා භවනයෙහි දිව්සිරින් විසිතුරුවූ දිව්‍යප්‍රාසාද
යකඋපන්නේය. එකල්හි ධර්මසභාමණ්ඩපයෙහි රැස්වහුන්භික්ෂූන්
වහන්සේ ඔවුනොවුන් මහන්සේ හා සමග කථාකරන සේක්.
ඇවැත්නිඅද චෝරඝාතක තෙම සකිලිට්ඨභාවයෙන් මිදී අදම කාල
ක්‍රියාකෙළේය, කොතනකඋපන් දෝහොයි කියා සාකච්ඡා කෙරෙ
මින් හුන්හ. එසඳ තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ රාජෝත්තම
සාණන්වහන්සේ ශ්‍රී ගන්ධකුටියෙහි වැඩහිඳ ධර්මසභාවෙහි ජනි
තවූ කථාස්වරූපය දිව කනින් අසා වදරා ශ්‍රී ගන්ධකුටියෙන් නික්
ම බුද්ධ තෙජසින් දිලිහි දිලිහි ධර්මසභා මණ්ඩපයට වැඩහුන්නාවූ
භික්ෂු පර්ෂද බුද්ධතෙජසින් වලිත කරවමින් පනවනලද බුද්ධාසන
මස්තකයෙහි වැඩහුන්සේක. එකල්හි සුපිළිසන්වූ භික්ෂූන් වහන්
සේ දෙහොත් මුදුනෙහි තබාගෙන නමස්කාර කළකල්හි බුදුහු
භික්ෂූන්වහන්සේබලා මහණෙනි මා එන්නාට පූර්වභාගයෙහි තෙපි
කිනම් කථාවකින් යුක්තව උනුදූසි වදාරා වැඩහුන් කල්හි එබස්
ඇසූ භික්ෂූන් වහන්සේ විසින් ස්වාමීනි චෝරඝාතක තෙම අද දව
ස්ම සකිලිට්ටු භාවයෙන් මිදී අද දවස්ම කලුරියකෙළේය, එතෙම
මෙතෙක් පාපකර්මයන්කොට කොතැන්හි උපන්දෝහොයි කිය
මින් උනුම්හයි කීසේක. එබසට බුදුහු වදාරනසේක්. මහණෙනි
ඒ චෝරඝාතක තෙම අදදවස් ධර්මසේනාපතිවූ ශාරීපුත්‍ර ස්ථවිර
යන්ට දුන්නාවූ දානයෙහි අනුසසින් ත්‍රයත්‍රිංශද් භවනයෙහි දිව්‍ය
ප්‍රාසාදයක නොයෙක් දිව්‍ය සේනාව පරිවරා දිව්‍ය රාජව ඉපද
දිව්‍ය සම්පත්තිය ලද්දේ වේදූයි වදාළසේක. එසඳ භික්ෂූන් වහන්
සේද බුදුන්ගෙන් එපවත් අසා නැවතත් දන්වනසේක්. ස්වාමීනි
චෝරඝාතක තෙම බොහෝකලක් මනුෂ්‍යඝාත කර්මය කෙළේය,
එසේහෙයින් ඔබවහන්සේ විසින්ම ප්‍රාණඝාත අකුශල කර්මය
මහත්කොට වදාරනලද, එසේහෙයින් මොහු කළාවූ මහත් අකු
ශල කර්මය විපාක නොදේ දැයි දන්වූසේක. එසඳ බුදුහු වදාරන
සේක්. මහණෙනි ඒ එසේමය, ඉදින් අකුශලකර්මය කළාහට බල
වත්වූ කල්‍යාණ මිත්‍රසභායෙක් පැමිණියේවී නම් මෙසේතුමීසු විඳා

කය නොදෙන්නේමය. එසේහෙයින් අනතිමයෙහි ද්‍රුතනාවූ දූතයෙහි අනුසසිනුත් එදවස්ඇසුවාවූ ධර්මයෙහි අනුසසිනුත් අනුලොමක්ෂාන්තිය ප්‍රතිලාභයවූයේය. එසේහෙයින් මේ ආත්මභාවයෙන් චුතව දෙව්ලොව උපන්නේ වේදැයි වදාරා මේ මතුකියන ගාථාව වදාළසේක. කෙසේද,

“සුභාසිතං සුණිත්වාන-නාගරියො චොරඝාතකො,
අනුලොමඛන්තිං ලද්ධාන-මොදති තිදිවං ගතො”ති

මෙසේ ඝාතකාල චොරඝාතකයාගේ කුශලකර්මය අකුශල කර්මයප්‍ප පීඩාකෙලේය. සුනක්ඛත්තයාගේ අකුශල කර්මය කුශල කර්මයට උපපීඩක වූපරිදි නම්, අකුශලකර්මය කුශල කර්මයෙන් ජනිතවූ ප්‍රවෘත්තියට පැමිණ කුශල කර්මඵල දීනතනොදී අකුශලඵලය නිෂ්පාදනය කරන්නේය. පැමිණියාවූ කුශල කර්මයට පීඩාකොට නිරොජ කොට හෙවත් ඕජස් රහිතකොට වියලා නිරස කරන්නේය. කෙසේද, ඕහට උපද්‍රව එළවන්නේය, භොග නසන්නේය, මව්කුස පිළිසිඳුන් කල්හි එතැන්පටන්ම මෑණියන්ට අස්වසෙක් හෝ සැපයෙක් හෝ නොමවන්නේය, මාතෘ පිතෘන්ට පීඩාව උපදවන්නේය, බොහෝ උපද්‍රව පමුණුවන්නේය, දරුවා මව්කුසින් බිහිවූ තැන්පටන් ගෘහයෙහි සියලු භොගයෝම දියෙහි බහන ලද්දාවූ ලවණයක්මෙන් රාජ චොර ශත්‍රෘ ආදීන් විසින් විලීන භාවයට පමුණුවන්නේය, පලමු කිරි බොහෝකොට දෙන්නාවූ දෙනුන්ගේ කිරිද මඳවන්නේය, විනීතවූ ගවමහිෂාදීහුද කුළුව සීසෑමට ඉසිලීමට නොයන්නාහුය, සරක් පට්ටිවල කුර රොග ආදීවූ උපද්‍රව උපදනේය, දැසිදස් ආදීහු කීකරු නොවෙති, කලාවූ ශස්‍යයෝද යහපත්ව ඵල නොදෙන්නාහ, ගෙයිතුබූ වස්තුව ගෙන්ම නස්නේය, වලතිබූදෙය වළින්ම අපවත්වන්නේය, මෙසේ ක්‍රම ක්‍රමයෙන් කනබොන දැද ඕහට දුලභව නොලැබෙන්නේය, ඔහු මව්කුසින් බිහිවූ කල්හි තනයෙහි කිරි සිඳෙන්නේය, මෙසේ ඒ දරුවා කිසි පරිහරණයක් නොලදින් ඕජස් රහිතව මලිනව පීඩා විඳින්නේය, මෙසේ අකුශලයෙන් කුශලය උපපීඩිත වන්නේය. මේ **උපපීඩක කුශලාකුශල** කර්ම නාම.

උපඝාතක කර්ම නම් කවරහයත්? කුශල ස්වභාවයද අකුශල ස්වභාවයද සමානව සිටියේද, මඳක් එක් කර්මයෙක් දුර්වල වී නම් ඒ කර්මය මර්දනයකොට ඒ දුර්වල කර්මයෙන් දෙන විපාකය පිළිබහා තබා තමාදෙන්නාවූ විපාකයට අවකාශ කොට ගන්නේය මෙසේ ඒ කර්මය විසින් අවකාශ කළ කල්හි දෙන්නාවූ විපාකය උපදනේ නම්වේ. **උපච්ඡේදක** කර්මයද මෙමයයි කියත්. කුශල

කර්ම විපාක දෙන කල්හි එක් අකුශල කර්මයෙක් ජනිතව ඒ කර්මය උපච්ඡේදනය කෙරෙයි, අකුශල කර්මයක් විපාක දෙන කල්හි එක් කුශලකර්මයෙක් උපස්ථිතව ඒ කර්මය සිඳ හෙළන්නේය. මේ උපච්ඡේදක කර්මයෙන් අජාසත් මහ රජහුගේ ආනන්තර්‍ය්‍ය කර්මය කුශලච්ඡේදක විය. අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේගේ සීල සමාධ්‍යාදිවූ කුශල කර්මය අකුශල ඡේදක වූයේයි. මේ උපඝාතක කර්මයයිකියාද, උපච්ඡේදක කර්මායයි කියාද කියත්. දීර්ඝායුෂ්කවූ කර්මයෙන් උපන්නාහටද මේ උපච්ඡේදක කර්මය පැමිණියේ වී නම් ආයුෂ එතැන්හි සිඳුවන්නේය. කුමක් මෙන්ද, යම්සේ පුරුෂයෙක් අට ඉස්බක්තැන් තික්මෙන වෙග දනවා සැරයක් විදීද, ඒ සැරය ධනුයෙන් පිටත්වූ ක්ෂණයෙහිම අන්පුරුෂයෙක් එතැන්හි සිට මුගුරකින් පැහැර සැරය එතැන්හිම එළාද, එපරිද්දෙන්ම දීර්ඝායුෂ්කවූ කර්මයෙන් උපන්නහුගේ උපච්ඡේදක කර්මය පැමිණ ආයුෂය සිඳුවන්නේය. කෙසේද, සොරුන් වසන වනයකට හෝ මෙහෙයන්නේය, කිඹුල් දුනිමුවරආදිවූ චණ්ඩයන් වසන ජලප්‍රවාහයකට හෝ පමුණුවන්නේය, අනිකුත් උපද්‍රව ස්ථානයකට හෝ පමුණුවන්නේය, මේ උපච්ඡේදක කර්ම නම්වේ.

මෙසේ දක්වනලද්දාවූකර්ම එකොළොසින් මූල දෙවෙනිවූ උපපද්‍යවේද්‍ය කර්මය හා තුන්වෙනිවූ අපරාපර්‍ය්‍යවෙද්‍ය කර්මය යන මේ දෙකින් ප්‍රතිසන්ධීන් දෙමින් ප්‍රවෘත්ති විපාකයත්, දෙන්නේය, පළමුවෙන්වූ දෘෂ්ටධර්ම වෙද්‍යකර්මයෙන් ප්‍රවෘත්ති විපාකය දෙනමුත් ප්‍රතිසන්ධියෙක් දීගත නොහෙන්නේය, රහතුන් වහන්සේට වනාහි උපපද්‍ය වේද්‍ය කර්මයද අපරාපර්‍ය්‍ය වෙද්‍ය කර්මයදැයි යනමේ කර්මයෝ දෙදෙනම කර්ම ක්ෂයකරවූ අර්හත් මාර්ගයෙන් නසනලද්දාහුම වෙති. මේ දෘෂ්ටධර්ම වෙද්‍ය කර්මයක් ඇති කල්හි ඒ දෘෂ්ටධර්ම වෙද්‍යකර්මයතෙම රහත්බවට පැමිණියාවූ උත්තමයන් වහන්සේලාටද විපාක දෙන්නේම වෙයි, යනු දක්වනු පිණිස "අරහන්තානං හි උපපජ්ජවෙදනීයං ච අපරපරියවෙදනීයං චාති ඉමානි ද්වෙ කම්මානි කම්මක්ඛයකරෙන අරහත්තමග්ගෙන සමුග්ඝාතිතානි, දිට්ඨධම්මවෙදනීයං අත්ථි තං අරහත්තප්පත්තස්සාපි විපාකං දෙති යෙව" යි කීහෙයින් මෙහි විද්‍යමානවූ අර්ථ සැලකියයුතු. මෙසේ සෞත්‍රාන්තික පර්‍ය්‍යායෙන් එකොළොස් කර්මයෝ විභාගකොට දක්වනලද්දාහුයි.

අභිධර්මපර්‍ය්‍යායෙන් වනාහි කර්මයන් සොළොසක් දක්වනලැබේ. ඔහු කවරහයත්? පාපකවූ කර්මයෝ ගතිසම්පත්තිය, උපධිසම්පත්තිය, කාලසම්පත්තිය, ප්‍රයොගසම්පත්තිය, ගතිවිපත්තිය, උපධිවිපත්තිය, කාලවිපත්තිය, ප්‍රයොගවිපත්තියයි කියා අට

දෙනොත්ද, කල්‍යාණකර්ම සමාදානයෝ: ගතිවිපත්තිය, උපධිවිපත්තිය, කාලවිපත්තිය, ප්‍රයොගවිපත්තිය, ගතිසම්පත්තිය, උපධිසම්පත්තිය, කාලසම්පත්තිය, ප්‍රයොගසම්පත්තියයි මෙසේ දක්වනලද අටදෙනාහු ඇතුළුව සොළොස්කර්ම කෙනෙක් වෙත්. එහි විභාග කවරහයත්? අනිෂ්ටාලම්බනානුභවයට නිසි පාපකර්ම ඇති කල්හිම සුගති භවයෙහි උපදීද, ඔහුගේ පාපකර්ම ගතිසම්පත්තීන් බාධිතව විපාක නොදෙන්නේ නම්වේ. යමෙක් පාපකර්මයෙන් දාසියකගේ හෝ කර්මකාරියකගේ හෝ කුස පිළිසිද ඉපද උපධිසම්පන්නත්ව හෙවත් රූපශ්‍රීන් යුක්තව වැඩිවිය පැමිණ සිටීද, එකල ඔහුගේ ස්වාමිපුත්‍රයෙක් මොහුගේ රූපශ්‍රිය දැක තමහට ජාත පුත්‍රයක්හු මෙන් සිතමින් ඔහු සැපයෙන් වර්ධනය කොට භාණ්ඩාගාරික ස්ථානාන්තරාදියක තබමින් ඒස්ථානාන්තරයෙන් නිසිලෙස පරිහරණය කෙරෙයි, මෙබඳු සත්වයාගේ විද්‍යමානවූ පාපකර්මය උපධිසම්පත්තීන් බාධිතව විපාක නොදෙන්නේ නම් වේ, යමෙක් ප්‍රථම කල්පයෙහි මනුෂ්‍යයන් කෙරෙහි හෝ සුලභවූ අන්නපානයන් ඇති කාලයෙහි හෝ උපදීද, ඔහුගේ විද්‍යමානවූ පාපකර්මය කාලසම්පත්තීන් බාධිතව විපාක නොදෙනු නම් වේ. යමෙක් සම්‍යක් ප්‍රයොග නිසා ජීවත්වෙයි, යමක්හු ඔම්පයට එළඹෙන්ට සුදුසුකාලයෙහි එළඹෙයි, එන්ට සුදුසුකාලයෙහි පලාඑයි, දුරගමනකට සුදුසුකල්හි නික්මයෙයි, සුදුසු ස්ථානයක්හි ලැඟුම්දානය කෙරෙයි, සුදුසුකාලයක චෞරකර්ම කෙරෙයි, මෙබඳුවූ සත්වයාගේ විද්‍යමානවූ පාපකර්මය ප්‍රයොගසම්පත්තීන් බාධිතව විපාක නොදෙනු නම් වේ. දුර්ගතිභවයෙහි උපන්නාවූ සත්වයාගේ පාපකර්මය ගතිවිපත්තිය පිණිස විපාකයදෙනුනම්වේ. යමෙක් දාසියක කුස පිළිසිඳ දුර්වර්ණව උපදීද, පුරුෂයෙක්වීනම් ඇත් අස් ගවමහිෂදීන් බලනගේ හෝ සලස්වති, තෙලමලා වහන් ආදිය හෝ තබන්ට සලස්වති; ස්ත්‍රියක්වීනම් ගසනි අශ්ව ශූනකාදීන්ට හසන පචනාදී නින්දිතවූ කර්මයන් සලස්වති, මෙබඳු සත්වයාගේ පාපකර්මය උපධිවිපත්තිය පිණිස විපාකදෙනුනම්වේ. යමෙක්දුර්භික්ෂ කාලයෙහි හෝ පිරිහෙන්නාවූ සැපත්ඇති කාලයෙහි හෝ අන්තඃකල්පාන්තයෙහි මනුෂ්‍යයන් කෙරෙහි හෝ උපදීද, ඔහුගේ පාපකර්මය කාලවිපත්තියපිණිස විපාකදෙනුනම්වේ යමෙක් ප්‍රයොග සම්පාදනය කරනසේ නොදනීද, උපසංක්‍රමණාදියට නිසි කල්හි උපසංක්‍රමණය නොදනීද, අපසංක්‍රමණයට ලැඟුම්දානයට චෞරකර්මයට නිසි නිසිවූ කාලයෙහි ඒහැම නොදනීද, ඔහුගේ පාපකර්මය ප්‍රයොග විපත්තිය පිණිස විපාක දෙනුනම්වේ මේ අනිෂ්ටාලම්බන අෂ්ටකය.

යමෙක් ඉෂ්ටාලම්බනානුභවයට නිසි කර්මයක් ඇති කල්හි ගොස් දුර්ගතිභවයෙහි උපදීද, ඔහුගේ කුශලකර්මය ගතිවිපත්තීන් බාධිතව විපාක නොදෙනුනම්වේ. යමෙක් කුශලානුභාවයෙන් රාජ රාජ මහාමාත්‍යාදිවූ කුල ගෘහයෙක්හි ඉපද අන්ධ බධිර මූග කුබ්ජ පක්ෂඝාතආදිවූ ඉන්ද්‍රියවිකලත්වයකට පැමිණියේද, එකල්හි ඔහට ස්වකීය කුලානුචිත රජ යුවරජ සෙනෙවිරත් භාණ්ඩාගාරිකාදිවූ ස්ථානාන්තරයක් නොපමුණුවති, එසේහෙයින් ඔහට ඒ කුශලය උපධිවිපත්තීන් බාධිතව විපාක නොදෙනු නම්වේ. යමෙක් දුර්භික්ෂකාලයෙහිද සම්පත්තික්ෂයකාලයෙහිද අනාථඃ කල්පාන්ත සත්ත්වයන් කෙරෙහිද උපන්නේ වීනම් ඔහුගේ කල්‍යාණ කර්මය කාලවිපත්තීන් බාධිතව විපාකනොදෙනුනම්වේ. යමෙක් ප්‍රයොග සම්පාදනය නොදනීද, ඔහුගේ කල්‍යාණ කර්මය ප්‍රයොග විපත්තීන් බාධිතව විපාක නොදෙනුනම්වේ. යමෙක් කල්‍යාණ කර්මයෙන් සුගති භවයෙහි උපදනේද, ඔහට ඒ කුශලකර්මය ගතිසම්පත්තිය පිණිස විපාකදෙනුනම්වේ. යමෙක් රාජ රාජ මහාමාත්‍යාදීන්ගේ කුලයෙහි ඉපද උපධිසම්පත්තියට ප්‍රාප්තව ගෙවන් රූපශ්‍රීන් ආත්මය සමෘද්ධව සිටියේද, ඔහුගේ රූපසම්පත්තිය දැක මෝහට රජ යුව රජ සෙනෙවිරත් ආදිවූ උතුම් ස්ථානාන්තර උචිතයහයි තරුණවයසෙහිම ස්ථානාන්තරයට පමුණුවති, මෙබඳු සත්ත්වයාගේ කල්‍යාණකර්මය උපධිසම්පත්තිය පිණිස විපාකදෙනුනම්වේ. යමෙක් ප්‍රථමකල්පයෙහි මනුෂ්‍යයන්කෙරෙහි හෝ සුලභවූ අන්නපානයන් ඇති කාලයෙහි හෝ උපදීද, ඔහුගේ කල්‍යාණ කර්මය කාලසම්පත්තිය පිණිස විපාක දෙනුනම්වේ. යමෙක් සුදුසු කාලයෙහි ස්ථානාන්තර ප්‍රාප්ත ධනවත් ප්‍රභූ සත්ත්වයන් කරා ගොස් ඔවුන් සිත්ගෙන මධුරවූ වචනයන් කියා සෙවනය කොට සිටීද, ඒ ප්‍රභූ සත්ත්වයන් කිපී කිසිවක්හට වධාදියක් යොදන කල්හි තෙමේ ඔහු ඇස නොපැනීම ඉවත්වයේද, ඒ ප්‍රභූ සත්ත්වයන්ට ආපදාවක් පැමිණි කල්හි නෙට ගමට රටවත් නොපැමිණ අන්‍ය රටක හෝ දේශාන්තරයක හෝ පලායේද, සොරකමට සුදුසු තැන්හි සොරකම්කොට වස්තු රැස්කෙරේද, එසැව වස්තු පැහැර ගන්නා පිණිස ප්‍රයත්නය කරන තැන්හි මධුර වචනයෙන් හා යාචඤාකිරීමෙන් අල්ලස්දීමෙන් වස්තුවට හානියක් වියනොදේද, තෙමේත් සැපසේජීවත්වේද, මෙසේ ඒ ඒ ප්‍රයත්නයෙහි ප්‍රයොගසම්පාදනයට සමර්ථවේද, ඔහුගේ කල්‍යාණ කර්මය ප්‍රයොග සම්පත්තිය පිණිස විපාක දෙනුනම්වේ. මෙසේ අභිධර්මපර්‍ය්‍යායයෙහි දක්වූ සොළොස් කර්මයෝ කියා නිමවනලද්දහුය.

තවද මාර්ගී පර්‍ය්‍යායයෙන් ද්වාදශ කර්ම කොතෙක් දක්වනු ලැබෙත්. ඔහු කවරහුත්? අගුණ්කාමිය අගුණ්කාම විපාකය,

අභූත්කර්මය, නාභූත්කර්ම විපාකය, අභූත්කර්මය, අස්තිකර්මවිපාකය, අභූත්කර්මය, නාස්තිකර්ම විපාකය, අභූත්කර්මය භවිෂ්‍යත් කර්මවිපාකය, අභූත්කර්මය, නභවිෂ්‍යත්කර්ම විපාකය, අස්ති කර්මය, අස්තිකර්මවිපාකය, අස්තිකර්මය, නාස්තිකර්මවිපාකය, අස්ති කර්මය, භවිෂ්‍යත්කර්ම විපාකය, අස්තිකර්මය, නභවිෂ්‍යත් කර්ම විපාකය, භවිෂ්‍යත්කර්මය, භවිෂ්‍යත්කර්ම විපාකය, භවිෂ්‍යත් කර්මය, නභවිෂ්‍යත්කර්ම විපාකයයි, යන මොහු ද්වාදශ කර්ම විපාක යෝයි. මොවුන්ගේ විභාගතම්, යම්කර්මයෙක් ගියදවස ව්‍යවහිත වූයේ කිසි ප්‍රත්‍යයකින් අතීතයෙහිම විපාක වාර ලදින් ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දේද, හේ අභූත්කර්මය අභූත්කර්ම විපාකයයි කියනලද, යම් කර්මයෙක් එනාහි අතීතයෙහි විපාකවාර නොල දින් ප්‍රතිසන්ධි ප්‍රවෘත්තිවිපාකයනොලදීද, ඒ අභූත්කර්මය නාභූත් කර්ම විපාකයයි කියනලද යම් කර්මයෙක් එනාහි අතීතයෙහි ව්‍යවහිතවූයේ දැන් විපාකදෙමින් සිටියේද, එතෙම අභූත්කර්මය අස්තිකර්ම විපාකයයි කියනලද, එසේනොවනුයේ අභූත්කර්මය නාස්තිකර්ම විපාකයයි කියනලද, යමෙක් අතීතයෙහි ව්‍යවහිත වූයේ අනාගතයෙහි විපාක වාර ලදින් ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක දේද, හේ අභූත්කර්මය භවිෂ්‍යත්කර්මවිපාකයයිකියනලද, එසේ නොවනුයේ අභූත්කර්මය නභවිෂ්‍යත්කර්ම විපාකයයි කියනලද, යම් කර්මයක් දැන් ව්‍යවහිතවූයේ කිසි ප්‍රත්‍යයකින් දැන්ම විපාක වාරලද්ද, හේ අස්තිකර්මය අස්තිකර්මවිපාකයයි කියනලද, එසේ නොවනුයේ අස්තිකර්මය නාස්තිකර්ම විපාකයයිකියනලද, යම් කර්මයක්එනාහි දැන් ව්‍යවහිතවූයේඅනාගතයෙහිවිපාකවාරලැබේද, හේ අස්තිකර්මය භවිෂ්‍යත්කර්ම විපාකයයි කියනලද එසේ නොවනුයේ අස්තිකර්මය නභවිෂ්‍යත් කර්මවිපාකයයිකියනලද; යම් කර්මයක්අනාගතයෙහි ව්‍යවහිතවේද, අනාගතයෙහිමවිපාක වාර ලැබේද, හේ භවිෂ්‍යත්කර්මය භවිෂ්‍යත්කර්මවිපාකයයි කිය නලද, එසේනොවනුයේ භවිෂ්‍යත්කර්මය නභවිෂ්‍යත් කර්මවිපාක යයි කියනලද, මෙසේ ප්‍රතිසම්භිත් මාර්ග පර්යායයෙන් විභාග කරන ලද්දාවූ ද්වාදශකර්මයෝ දක්වනලද්දාහුයි. මෙසෙයින්කියනලද මෙ දොළොස් කර්මයෝද අතුරෙහි දක්වූ සොළොස්කර්මයෝද ප්‍රථම යෙන් සෞත්‍රාන්තිකලෙශයෙන්දක්වූ එකොළොස්කර්මයෙහිමඅන් තර්ගතවෙති. මෙයින් මාර්ගපර්යායයෙන් කී ද්වාදශකර්මයෝත් අභිධර්ම පර්යායයෙන් කී ෂොඩශ කර්මයෝත් සෞත්‍රාන්තික පර්යායයෙන් කී එකොළොස් කර්මයන්ගෙන් අටදෙනෙකු ඇතුළුව මෙකී කර්මයෝ සතිස්දෙනම දෘෂ්ටධර්මවේද්‍යකර්මය උපපද්‍යවේද්‍යකර්මය අපරාපර්‍ය්‍යා වේද්‍යකර්මයයි කියනලද තුන්කර්මයෙහිම අන්තර්ගතවෙත්. මෙහැම කුශලාකුශලකර්ම විභාග නම් වූ එසේ හෙයින් වදාරනලදමැයි-

"පාකකාලවසෙනාථ-කාලාතීතවසෙන ච,
චතුධෙවමපි අක්ඛාතං-කම්මමාදිච්චබන්ධුනා"

මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
කුශලාකුශල කර්ම විභාග ප්‍රකාශකවූ
## සූතිස්වන පරිච්ඡේදය
නිමවනලදී

# 35 වෙනි පරිච්ඡෙදය.

---

**කවුද මේ සද්ධර්මරත්නාකරයෙහි**
**ශරණ ශීල ප්‍රභෙද කථාකම් කවරහයෙහ්?**

**මේ මතුකියන්නේ එහි පිළිවෙළ කථාවය.**

හේ කෙසේදයත්? මේ ශරණ ශීලය නම් ශරණගමනය සිල් පිහිටීමයයි විවිධවේ. එහින් ශරණ ගමනය නම්, ලොකොත්තර ශරණ ගමනය ලෞකික ශරණ ගමනයයි විවිධවේ. එහින් ලොකොත්තර ශරණ ගමනය නම්, චතුරාර්‍ය්‍ය මාර්ගසත්‍යයන්ගේ දැකීත යෙති ශරණ ගමනයන්ගේ සකිළිටු භාවය හැරීම හෙතුකොට ගෙණ නිර්වාණ රම්මණව රත්නත්‍රය ඇදහීම කෘත්‍යයකොට ශරණ ගමනය සිඩවන්නේය මේ ලොකොත්තර ශරණ ගමනයෙහි සියලු දුක් ක්‍ෂයවීම ආනිසංස නම්වේ. සොවාන් ඵලය සකෘදාගාමි ඵලය අනාගාමිඵලය අර්හත්ඵලයයි යනාමේ චතුර්විධ ශ්‍රමණ ඵලය විපාක ඵල නම්වේ. මේ ලොකොත්තර ශරණ ගමනයෙහි සකිළිටු භාවයෙක් නොමඇත්තේය, භෙදයක්දු නොමඇත්තේය, සංවර භෙදින්ද, භවාන්තරයෙහිද, මේ ආර්‍ය්‍යශ්‍රාවක තෙම අන්‍ය ශාස්තෘ කෙනෙකුන් නොඋදෙසන්නේය. තවද ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම රහත් නොව භවාන්තරගතවූයේද තමාගේ ප්‍රාණපරිත්‍යාගයෙනුත් අන්‍ය ප්‍රාණියක් නොනසන්නේය, සුරාපානාදියක් නොකරන්නේයි, හේ එසේමය, යම්සේ ජාතිමත් හංසයෙක් කිරි හා ජලය මිශ්‍ර කොට වත් කළත් ජලය තබා කිරි පමණක්ම බොන්නේය. දිය බින්දුවකුත් නොබී වෙන්කරන්නේය, එපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවකද සුරා මිශ්‍ර කරණලද ක්‍ෂීරයක් මුඛයේ වත්කළ කල්හි කිරි පමණක් ගිලලනමුත් සුරා බින්දුවකුත් නොගිලෙන්නේය, මේ ලොකොත්තර ශරණ ගමන නම්වේ

ලෞකික ශරණ ගමනය නම්, බුද්ධාදි රත්නත්‍රයෙහි ගුණප්‍රාඥ සත්වයන්ගේ චිත්තයට නිශ්ශංකාවෙන් අරමුණුව ශරණ ගමනයන්ගේ සකිළුටු භාවය සංහිඳීමෙන් ශරණය සිඩමන්නේය, හෙද අර්ථවශයෙන් බුද්ධාදීරත්නත්‍රයෙහි ගුණ ඇදහීම පිළිඇබීමෙන් ශ්‍රද්ධා මූලිකවූ සම්‍යක්දෘෂ්ටිවූ දශපුණ්‍යක්‍රියා වස්තුවෙහි සෘජු භාව ප්‍රතිලාභය ශරණ ගමන නම්වේ. මේ ශරණ ගමනය මනාහි ආත්ම නිර්‍ය්‍යාතනය, තත්පරායණය, ශිෂ්‍යභාවොපගමනය, ප්‍රණිපාත යයි චතුර්විධවේ. එයින් ආත්මනිර්‍ය්‍යාතනය නම්, යම්සි ශ්‍රද්ධාවත් පුරුෂයෙක් සිඝනකල අදපටන් මාගේ ආත්මය තුනුරුවන්ට පරිත්‍යාග කෙරෙම්යි සිතා ආත්මය තුනුරුවන් විෂයෙහි

පරිත්‍යාග කෙළේද, මේ ආත්ම නිය්‍යාතන ශරණගමන නම්වේ. තත්පරායණයනම්, අද පටන් මම තුනුරුවන්පරායණයෙමියි සාක්ෂි කොට ත්‍රිවිධරත්නයෙහි පරායණ භාවයට පැමිණියේද, මේ තත් පරායණ ශරණගමන නම්වේ. ශිෂ්‍යභාවොපගමනයනම්, අද පටන් මම තුනුරුවන්ටම අතවැසියෙමියි සාක්ෂිකොට මෙසේ ත්‍රිවිධරත් නයට ශිෂ්‍ය භාවයට පැමිණියේද, මේ ශිෂ්‍යභාවොපගමන ශරණ ගමනනම්වේ. ප්‍රණිපාතයනම්, අද පටන් මම තුනුරුවන්ම වඳිමි, තුනුරුවන් කරම එළඹෙමි, තුනුරුවන්ටම අඤ්ජලිකර්ම කෙරෙමි, තුනුරුවන් දැකම සනතුෂ්ටවෙමි, අන්‍ය ශාස්තෘන්වහන්සෙකුන් නො උදෙසමි, අඤ්ජලි සාමීචි කර්මාදිය ත් වෙන ශාස්තෘ කෙනෙකුට නොකරමි, මෙබව හැම දෙනාම දතුවයි කියා සාක්ෂි කොට බුද්ධාදී රත්නත්‍රයෙහි මහත් ආදරයෙන් යටත්ව නීච ප්‍රවෘත්තියෙන් භක්ති ඇතිව පැවතීම ප්‍රණිපාත ශරණගමනනාමවේ. මේ චතුර් විධවූ ආකාරයන් අතුරෙන් එක් ආකාරයක් කරන්නහු විසින් ත්‍රිවිධරත්න ශරණගතවූයේනම්වේ. තවද මාගේ චිත්තය බුදුන් ටම පූජාකෙරෙමි, ජීවිතය ආත්මයපිදීමි, ජීවිත ප්‍රමාණයෙන් තුනු රුවන් සරණ ගතිමි, ජාති ප්‍රමාණයෙන් තුනුරුවන් සරණ ගතිමි, භව ප්‍රමාණයෙන් තුනුරුවන් සරණගතිමි, මට ත්‍රිවිධරත්නයම ප්‍රතිෂ්ඨාධාරය, ත්‍රිවිධරත්නයම රක්ෂස්ථානය. ත්‍රිවිධරත්නයම නිලී යනස්ථානය, ත්‍රිවිධරත්නයම පරම ප්‍රතිෂ්ඨාධාරයයි මෙසේ පිහි ටීම ආත්ම නිය්‍යාතන ශරණගමනනම්වේ තවද ඒකාන්තයෙන්ම අන්‍ය ශාස්තෘවක්හු භක්තීන් නොදකිමි, මාගේ සම්‍යක් සම්බුද්ධ රාජෝත්තමයාණන්වහන්සේමදකිමි, මාගේ ශාස්තෘන්වහන්සේම දකිමි, මාගේ විපන්දෘත්තමයාණන්වහන්සේමදකිමි, මාගේ මුනීන්ද්‍ර යාණන්වහන්සේම දකිමි, මාගේ ලෝකනාථ ස්වාමීන්වහන්සේම දකිමි, මාගේ අනධිවරයාණන්වහන්සේමදකිමි යනාදීන් මෙවචන යන් කියා මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ විසින් ගත්තාවූ සරණ ශිෂ්‍යභාවොපගමන ශරණ ගමනනම්වේ තවද,

"සො අහං විචරිස්සාමි-ගාමාගාමං පුරාපුරං
නමස්සමානො සම්බුද්ධං-ධම්මස්ස ච සුධම්මතං"

යනාදීන් ආළවකාදීන් ගත් සරණය තත්පරායණ ශරණ නම්වේ. තවද බ්‍රහ්මායුනම් බ්‍රාහ්මණ තෙම ලොවුතුරා බුදුන් දැක තමා හුන් අස්නෙන් පැන නැගී උතුරු සළුව ඒකාංශ කොට බහා ගෙන භාග්‍යවතුන්ගේ ශ්‍රීපාදයුග්මය පසඟපිහිටුවාවැද සිඹිනනා දෑතින් දෙපතුල් හඹ හඹා හිස පිසිමින් බ්‍රහ්මායු අහං භො ගො තම බ්‍රාහ්මණො බ්‍රහ්මායු අහං භො ගොතම බ්‍රාහ්මණො"ති

තුන්විටක් අස්වා කියමින් ගත්තාවූ ශරණය ප්‍රණිපාත ශරණගම
නය නම්වේ. තවද මේ ප්‍රණිපාත ශරණ ගමනය ඥාතිය භයය
ආචරියය දක්ඛිණෙය්‍යයයි චතුර්විධවේ. එයින් ඥාතිවසයෙන්ප්‍රණි
පාතනම්, යම්සේ ශාක්‍යවංශයෙහි ජාතවූ පුරුෂයෙක් හෝ ස්ත්‍රී
යක් හෝ කොලිඝවංශයෙහි ජාතවූ පුරුෂයෙක් හෝ ස්ත්‍රියක්හෝ
බුදුහු අපට ඥාති සම්බන්ධයක් ඇතිසේක, නෑකමින් ඉදිරිවසිටිනා
තැනැත්තන්වහන්සේට නොවැඳීම යුක්ත නොවන්නේයයි සිතා
ශාක්‍යකොලියයෝ එපරිද්දෙන් වඳිද්ද, ඔවුන්ගේ ප්‍රණිපාතයෙන්
ශරණ ප්‍රතිෂ්ඨිතවූයේනම් නොවේ. යම් සත්වයෙක් සිතනකල මේ
ශ්‍රමණභවත්ගෞතමයන්වහන්සේත් රජපූජිතසේක,මහත්වූආනු
භාවඇතිසේක, එසේහෙයින්මුන්වහන්සේට නොවැඳීකල්හිඅනර්ථ
යක් පමුණුවාලනසේකැයි සිතා භයින් වඳීද, එකල්හිදු සරණ
ගත්තේ නම්නොවේ. යම්සත්වයෙක්වනාහි බුදුන් බොධිසත්වකාල
යෙහි යම්කිසි ශිල්පයක් උගත්තේද, ඒ උගත්තාවූ ශිල්පයඋගත්
බව සිහිකෙරෙමින් හෝ බුදුවූකාලයෙහි දුන් ශිල්පයක්සිහිකොට
හෝ නොහොත්,

"එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය-ද්වීහි කම්මං පයොජයෙ,
චතුත්ථං ච නිධාපෙය්‍ය-ආපදාසු භවිස්සති." යි

මෙසේ අනුශාසනාවක් ඉගෙන මුන්වහන්සේ මාගේ
ආචාර්‍ය්‍යයන්වහන්සේයයි කියා වදිනේද, සරණගත්තේනම් නො
වේ. යමෙක් වනාහි මේ සර්වඥයන්වහන්සේ සකලලොකවාසී
සත්වයන් දෙනලද්දාවූ සියලු දානයන්ම පිළිගෙන ඔවුන්ට කළාවූ
සකලාභිවෘද්ධි වර්ධනය වඩ වඩා මහත් කෙරෙමින් සියලුසැපදෙන්
නාවූ අග්‍ර දක්ෂිණීය භාවයෙන් උතුමවූ නිවන් මෑණිකෙනෙකුන්
වහන්සේයයි මහත්වූ ශ්‍රද්ධා චිත්තයෙන් නමස්කාරකෙරේද, ඒ
නමස්කාරයෙන් සරණගතවූයේනම්වේ. මෙසේ ගත්කාලද සරණ
ඇති උපාසකයෙක්හෝ උපාසිකාවක්හෝ අන්‍ය තීර්ථකයන් සමීප
යෙහි පැවිදිවූ නුමුදු ඥාති සම්බන්ධයක් ඇත්තේයයි කියා ඔහු
වැන්දේ වී නමුදු සරණගමනය නොබිඳෙන්නේය. එසේම රාජ
භයින් කිසිවක්හට වඳිනාහටද එකාන්තයෙන්ම සරණසීලය නො
බිඳෙනුබව කියනුම කවරේද, යමෙක් වනාහි රාජ පූජ්‍යව සිටි
නේද, එසේකල්හි කිසිවෙක් සිතනකල මෝහට නොවඳිනකල්
තෙමේ බොහෝජනයන් සිත්ගෙන ඔවුන් විපක්ෂකරවා තමහට
අනර්ථයක් පමුණුවන්නේයයි ඔහට වඳීද, එසේ වැඳීමෙන් සරණ
නොබිඳෙන්නේමවේ. එසේම කිසි ශිල්පයක් ඉගැන්වූ තීර්ථයක්
හටද මේමට ගුරුම ශිල්ප ඉගැන්වූයේයයි කියාවඳීද, තමාගත්තා
වූ සරණය නොබිඳෙන්නේමය මේලෞකිකශරණගමනයෙහි අනු

සස් නම් සුගති භව සම්පත්තිය ලැබීමද සියලු භොග සම්පත්තිය ලැබීමද සරණගමනය ඵලනම් වෙයි වදාරන බුදුරජාණන්වහන්සේ

"යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ-න තෙ ගමිස්සන්ති අපායං,
පහාය මානුසං දෙහං-දෙවකායං පරිපූරෙස්සන්ති" යි,

යනාදීන් දෙශනා කළසේක. තවද එක් දවසෙක දෙව් ලොවට අධිපතිවූ ශක්‍රදෙවෙන්ද්‍රතෙම අසූදහසක් දෙවියන් පිරිවරා මහත්වූ දිව්‍යානුභාවයෙන් දිලිහි දිලිහී සුගත ශ්‍රාවකවූ මුගලන් මහතෙරුන්වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ එකත්පස්ව සිටියාහ. ඒ ශක්‍රදෙවෙන්ද්‍රයාහට ආයුෂ්මත්වූ මුගලන් මහතෙරුන් වහන්සේ වදාරනසේක්. එම්බා ශක්‍රදෙවෙන්ද්‍රයාණෙනි බුද්ධසරණ ගැන්ම යහපතැයි වදාරා ඒ බුද්ධරත්නයෙහි සරණගතවීම හෙතු කොටගෙන සමහර සත්වකෙනෙක් කාබුන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාතවූ දිව්‍යලොකයෙහි උපදනාහුය, එසේ සරණ සීලයෙහි කුසලානුභාවයෙන් දිව්‍යලොකයෙහි උපන්නාවූ සත්ව තෙම සෙසු දෙවියන් දශප්‍රකාරයකින් මැඩපවත්වන්නේය. ඒකවර දශප්‍රකාරයකින්දයත්? දිව්‍ය ආයුෂයෙන්ද දිව්‍ය වර්ණයෙන්ද දිව්‍ය සැපයෙන්ද දිව්‍ය යසසින්ද දිව්‍යාධිපත්‍යයෙන්ද දිව්‍යරූපයෙන්ද දිව්‍යශබ්දයෙන්ද දිව්‍යගන්ධයෙන්ද දිව්‍යරසයෙන්ද දිව්‍යස්පර්ශයෙන් දැයි යනමේ දශප්‍රකාරයෙන් සෙසු දෙවියන් මර්දනයකොට දිවසිරි විඳිනේය. එසේම තුනුරුවන්කෙරෙහිද සරණගත් ඵලය දතයුත්තේය. මේ සරණ ගමන ප්‍රභෙද නම්වේ

ශීලය නම් කවරනායත්, පඤ්චශීලය, අෂ්ටාඞ්ගශීලය, දශශීලය, නොයෙක් සංවරශීලයයි යනාදී වශයෙන් නොයෙක් ප්‍රභෙදවේ, හෙද සමාධානොපධාරණයෙන්ශීලනම්වෙයි, නොහොත් සමාධානය ශීල නම්වෙයි, නොහොත් උපධාරණයෙන් ශීලනම් වෙයි, නොහොත් ශිරොර්ථයෙන් ශීලනම්වේ, නොහොත් ශීතලාර්ථයෙන් ශීලනම්වේ, නොහොත් ශලනාර්ථයෙන් ශීලනම්වෙයි, නොහොත් ශාලාර්ථයෙන් ශීලනම්වෙයි. කෙසේදයත්? යමේක් ශීලසමාදානයෙන් උද්වහනය කොට මතු ඵල රස විඳිනා පණිස උත්සාහවත්ව දරාද එසේහෙයින් ශීලනම්වේ, කායකර්මාදීන්ගේ අවිප්‍රකීර්ණතාවෙන්වූ සමාධානයශීලනම්වේ, නොයෙක්කුශලකර්මයන්ට ප්‍රතිෂ්ඨාවනබැවින් උපධාරණය ශීලනම්වෙයි, යම්සේ ශිරශ්ඡෙදනය කළ කල්හි සියලු ආත්මභාවයනැසේද, එසේහෙයින්ම ශීලභෙදවූකල්හි සියලුම ගුණශරීරය විනාශයට පැමිණේයි, ඒකාරණයෙන් ගුණ ශිරස්යයි යන තෙරුත්තික විධින් ශීලනම්වේ, නොයෙක් කෙලශවත්හිය සංහිඳුවන බැවින් ශීතලාර්ථයෙන් ශීල නම්

වෙයි, සියලුම අකුශලධර්මයන් ශලනයකොට සපිරවිය නොදෙන බැවින් ශලනාර්ථයෙන් ශීලනම්වෙයි, සර්ව ධර්ම ප්‍රවෙශයට හෙවත් සියලු කුශල ධර්මයන් වැදලා හිඳීමට ශාලාවක් වැනිහුයි ශාලාර්ථ යෙන් ශීලනම්වෙයි, මේ ශීලයයි යන පදයෙහි අර්ථයි. තවද මේ ශීලයෙහි ඵලනම් කවරහයත්? ශීලය නම් බිසමුහුදුතරණයටමහා නැවක, කුශල චන්ද්‍රයා දීප්තිමත් කල කිරිමුහුදුය. කුසල ලතාව ජනිතකරවන බීජය, ගුණනැමැතිරත්නයපිරු විදුරුමැඳුරුය, බහු මාන බිඟුමුළු වනලූ මල්කැනක, සියලු සම්පත්තීන් ලබවකැඳවන අත්සනක, මෘත්‍යුභයට නොබිනා වීරපුරුෂයෙක, සකලලොක වාසීන් තමහට දැසිකල ක්‍රය පත්‍රයෙක, ස්වර්ගමොක්ෂ වෘක්ෂයට නැගෙන මගඅරළුවෙක, දෙව්බඹනා මනුජසඞ්ඝගජන් මුදුන්තමා දෙසට නමන රන්අකුස්සෙක, සදෙව්ලොව නැමැති සමහල්පායට පැනනැගෙන රුවන් හිණෙක, සත්ව ශරීරය ප්‍රසන්න කරන රස ගුලියෙක, ධර්මනැමැති චක්‍රවර්තීහට ඔටුන්නෙනක, සියල්ලවුන්ගේ මනදෙළ පුරන කප්රුකෙක, බුද්ධසසුන් නැමැති මහ විල්හි ප්‍රබුද්ධ ගුණ සුවඳ වහනාකරන මහ පියුමක, ත්‍රිවිධරත්නොත්පත්තියට මහමුහුදෙක, ශ්‍රද්ධා ඇදිහිලි හස මුළු සරන පියුම් විලෙක, දුකඛිත අන්ධකාරය පහකරන සූර්‍ය්‍යමණ්ඩලෙක, * මෛත්‍රී උළුලින් සුළුණු සිලිල්වාහන් මහදෙරක, කෙලශනැමති ඇත් සමුහපලනසිංහනබ පඤ්ජරයෙක, නිර්වාණපුර ප්‍රවෙශයට මහවාසල් දොරෙක, භවාහි නී තරණයට මහනෞවෙයෙක, සියලු රජ මුළු කිරුළු කුළු මුදුන් සිළු මිණෙක, සතර අපායට හෙළු මහ අගුලෙක, ජාතිජරා මරණාදිවූ මහගිනිකඳට මහමෙඝයෙක, සකල සත්වයාහට අභයස්ථානයෙක, අෂ්ටාර්‍ය්‍යපුද්ගල නෙලඹ පුත්‍රයන් කසනප්‍රාප්තවූ අපිරාශියෙක, බුද්ධ ශාසන විලොපනිකාය විෂයට දිව්‍යමන්ත්‍රයෙක, මුළුලෝවාසීන් වජ්‍රකාය ලබන අමෘත පුඤ්ජයෙක, එසේහෙයින් මෙබඳු සීලය රක්ෂාකරන්නවුන්විසින් මානලිහුගේ රථසකින් මිරිකෙනගුරුළු බිලිඳුන් දැක ජීවිතයෙහි ආලසහැර ලුහුබැඳ එන අසුර සතුරන් මැදට වන් සක්දෙව් රජහුමෙන්ද, සිල්රකිමින්හිඳ ගොදුරු සො යන කල්හී සීලය පරීක්ෂාකරනු පිණිස මලමස් වෙසක්ගෙන අභි මුඛයට පැමිණියහු අජීවගයි ගැලවරල අග සැළුණාදැක සිලහෙද මෙයි සනහසින් ගිනිගත් යපතක්වෙලෙහි මුවෙන්දමුවාපේදියෙ හිම ගෙලාපු සුජාතනම් කොකින්නා මෙන්ද, තුන්හවුරුද්දකට කනවණු දෙමින් ගිය පුරුෂයා එනතෙක් අතුරෙයි මෙන තැන කින් දුන් දහසක් කහවණු නොගත් ශණිකාව මෙන්ද, මස්පිසන ලෙස මරන්ට දුන් කුකුලා නොමරා දම්ගෙඩියට හිසදී නොව ඔබ

* “මෙත්වුලින්” ඇතැම්.

වාහන් පොරව දූක බියනොව කුකුළා හැර ඔහුට මාරුව දීම් පිදු
පුරුෂයා මෙන්ද, වටුමස් අනුභව කරනු කැමතිව ත්‍රිකොටි පරි
ශුඬව නොලදහි තුන්අවුරුද්දකින් පුරුෂයකු තෝරාගෙන තමා
ගේ අදහස කී සැඳුහැතිසස රජහු මෙන්ද, නාගභවනයෙහි අප
මණ දිව සැපත්හැර මිනිස්ලොවට අවුත් සීල සමාදානයෙන් වැස
මස් පිණීස විද අමුණා තඩලාගෙනෙන වැද්දන්ට කිසිවක් නො
කළ සංඛපාල නාරජහු මෙන්ද, එසේම නාග සම්පත් හැර මිනිස්
ලොවට අවුත් තුඹසක් මුදුනෙහි පෙහෙවස් රැකගෙන කල්හිඅහි
ගුණ්ඨිකයක්හු අතට පැමිණ පඤ්ච වධයක් විඳිමින් සීලහෙද
හයින් ඔහට කිසිවක්නොකල චම්පෙය්‍ය නාරජහුමෙන්ද, බිජුවට
රකිනා කිරළක මෙන්ද, වාලධියෙන් රළක්පමණ නැසෙතියිනිරන්
තරයෙන් සිහිඇතිව වාලධිය රක්‍ෂාකරණ සෙමරක මෙන්ද, එකම
ප්‍රිය පුත්‍රයක්හු නිරන්තරයෙන් සිහිඇතිව රක්‍ෂාකරන ප්‍රෙමහරිත
මවක මෙන්ද, එකම ඇසක් රක්‍ෂාකරන මනුෂ්‍යයක්හු මෙන්ද,
මෙබඳු සීලය අඛණ්ඩ කොට නිර්මල ලෙස රක්‍ෂාකටයුතු. එසේ
හෙයින් වදාරණලදමැයි-

"කිකීව අණ්ඩං චමරීව වාලධිං-පියං ව පුත්තං නයනංව එකකං,
තථෙව සීලං අනුරක්ඛමානකා-සුපෙසලා හොථ සදා සගාරවා"යි

මෙබඳු නිර්මල ශීල සම්පන්නවූ මහා පුරුෂතෙම මහත්වූ භො
ගයට පැමිණෙයි, කීර්ත්‍ය දශ දිශාවෙහි පතුරුවයි, යම් පර්ෂදක්
මැදට වදිනම් විශාරදව එළඹෙයි, සිහිමුළා නැතිව කාලක්‍රියා
කෙරෙයි, අපමණවූ ස්වර්ග සම්පත්තීන් බබලන දෙව්ලොව ඉපද
දිව්‍යෛශ්වර්‍ය්‍යයද ලබන්නේයි, ඒ එසේමැයි, එක් සමයෙක්හිඅප
ත්‍රිලෝගුරුසම්‍යක්සම්බුද්ධරාජොත්තමයාණන්වහන්සේකොසොල්
රට ශ්‍රාවස්ති පුරප්‍රවරාසන්නවූ ජෙතනම් රාජකුමාරයාවිසින් රෝ
පිත සංවර්ධිත විකසිත මහීරුහ ශ්‍රෙණීන් විසින් සොභමානවූ
ජෙතවනනම් උයන්හී සිවුපනස් කෙළක් ධනවියදම්කොටඅනේ
පිඬු මහසිටාණන් විසින් බුදුන් උදෙසාම කරවා පිළිගන්වනලද
ජෙතවනාරාමයෙහි චතුර්විධෛර්‍ය්‍යාපථයෙන්යුක්තව සුරනරපිරිස්
සතුටුකරවා වැඩවසනකල්හි වෙළඳු සත්සියයක් වෙළඳාම් පිණිස
මහනැව් නැගී සමුද්‍රයට පැමිණියාහ, එකල්හි ඒ නැව මුහුදු මැද
ශරවෙගයක්මෙන් ධාවනය කරන්නේය, එකල්හි නැව මුහුදට
පැමිණි සත්වනදවස සමුද්‍රයෙහි මහත්පවනොත්පාතයෙන්මහත්
රළපහර නගමින් ඔවුන් නැගි නැව දිය දමා ගලාහෙමින් දිය
පුරන්ට වන, එකල්හි එහි වසන ජනයෝ තමතමන්ගේ දෙවි
යන් නම් කිය කියා අඬද අඬද මහහඬින් හඬන්ට වන්හ, ඒසඹ

යන් අතුරෙන් එක් පුරුෂයෙක් නැව් නැගෙන දවස් එක් භික්ෂුකෙනෙකුන් වහන්සේට දන්දෙමින්වලඳවා අනුමෙවෙනි බණඅසා, සරණ සීලයෙහි පිහිටියේය. ඒ පුරුෂතෙම එදවස් නැව නැසෙන කල්හි අනික් පිළිසරණෙක් නොලැබ සිතනුයේ; මේප්‍රස්ථාවෙහි ප්‍රතිෂ්ඨාවෙක් නම් කිම්දෙහොයි සිතා තමා නැව්නැගෙන දවස් භික්ෂුකෙනෙකුන් වහන්සේට දන්දෙමින් ගත් සරණ සීලය සිහිකෙරෙමින් තමා පිරිසිදුලෙස පිහිටි සරණ සීල හෙයින් එම ආවර්ජනා කෙරෙමින් ප්‍රීතීන් හුන් කල්හි එම සරණ සීලය අනුසසින් දියෙහිනොගැලී රළපිටමම පලක්බැඳ හුන්නේය. සෙසු වෙළඳහු මොහු භය චකිත රහිතව රළමුදුනෙහි උන්බව දැකවිචාරන්නාහු; මහාපුරුෂයාණෙනි සියල්ලවුන්ම දියෙහිගැලීනාදී නුඹ රළ මුදුනෙහි පලක් බැඳ භයක් නැතිව හිඳින්ට කාරණා කිම්දැයි විචාළහ, එසඳ ඒ වෙළඳාණෝ ඔවුන්ට කියන්නාහු; එම්බා පුරුෂයෙනි මමනැව්නැගෙන දවස් භික්ෂුකෙනෙකුන් වහන්සේට ප්‍රසන්නවූ චිත්තයෙන් දන්දෙමින් උන්වහන්සේගෙන් සරණ සීලය ගෙන සිල්හි පිහිටියෙමි, ඒසීලයෙහි ආනුභාවයෙන් මෙතැන්හි භයක් නැතිව දිය මුදුනත හුන්නෙමියි කීය, එබසට එ වෙළඳහු කියන්නාහු; මහාපුරුෂයාණෙනි එබඳුමහානුභාවසම්පන්නසරණ සීලය අපටත් නපුරුදැයි කීහ, එබසට ඒපුරුෂයා කියනුයේ තෙපි හැම කුමක් කියවුද, සරණ සීලය සියල්ලවුන්වම යහපතැයිකීය, එබසට එ වෙළඳහු කියන්නාහු; එසේවී නම්ඒ අභය දායකවූසරණ සීලය අපටත් දෙවයි කීහ, එකල්හි ඒමහාපුරුෂතෙම එවෙළඳුන් සත්සියය සියක් සියක් බැගින් සත් කොටසක් කොට බෙදා පන් සිල් දෙනුයේ; ඔවුන් අතුරෙන් පළමුවැනි සියක්දෙන ගොප් මස ගැලෙන පමණ දියෙහි සිට සරණ සීලය ගත්හ, දෙවෙනි සියය දණපමණ දියෙහිසිට සරණසීලය ගත්හ, තුන්වනසියය හිණමස් පමණ දියෙහිසිට සරණසීලය ගත්හ, සතරවනසියය නාභිපමණ දියෙහි සිට සීලයෙහි පිහිටියාහ, පස්වන සියය තනමත්තක් පමණ දියෙහි සිට සිල්ගත්හ, සවනසියය ගෙළපමණ දියෙහි සිට සිල්ගත්හ, සත්වන සියය මුඛයට කරදිය වදිමින් සිටියදීම සරණ සීලය ගත්හ, මෙසේ ඒ පුරුෂතෙම එවෙළඳ සත්සියයම සරණ සීලයෙහි පිහිටුවා ඔවුන්ට අවවාද කියනුයෙ; එම්බා පුරුෂයෙනි තොපට අනික් ප්‍රතිෂ්ඨාවෙක් නැත, තොපහැමගත් මේසරණසීලයම තොපට පිළිසරණය, එසේහෙයින් මේසීලයම ආවර්ජනාකරවයි හඬගා කීයේය, එබස් ඇසූ එවෙළඳහු සත්සියයම එදවස් ඒ මුහුදු දියෙහිගැලී කාලක්‍රියාකොට ආසන්නකාලයෙහි ගත්සරණ සීලය හෙයින් ඒ ආනුභාවයෙන්ම දෙවෙනිවූ තව්තිසාදිව්‍යලොක

යෙහි මහත් දිව්‍ය ඓශ්චර්‍ය්‍යයෙන් යුක්තවූ දිව්‍ය විමාන සත්සිය යක උපන්හ. එහැමදෙනාහටම එකතැනම දිව්‍ය විමාන පහළවිය. එයින් හැමදෙනාට සරණසීලය දුන් උත්තම පුරුෂයාහට සියක් යොදුන් ස්වර්ණමයවූ දිව්‍යවිමානයක් විමන් සත්සියයට මධ්‍යයෙහි ජනිතවිය, සෙසු විමන් ඒ විමන පිරිවරා පහළවිය, එයින් පසු පසුව සීලයෙහි පිහිටියවුන්ට දිව්‍යප්‍රාසාදඋසින් මහතින් අඩුඅඩුව ජනිතවූවාහ, එසීන්හැමදෙනාහට පසුවසීලයෙහි පිහිටියවුන්ගේ දිව්‍ය ප්‍රාසාද දොළොස් යොදුන්ම වූහ, ඒ දිව්‍ය පුත්‍රයෝ සත්සිය යම දිව්‍යලෝකයෙහි උපන් ක්ෂණයෙහිම තමන්කල පින්කම්කිම දෝහෝයි දිවසින් බලන්නාහු එ ආචාර්‍ය්‍යවූ වෙළඳ දිව්‍ය පුත්‍රයා නිසා තමන් දිව්‍ය සම්පත්තිය ලත්බව දැක මහත් සන්තොෂයෙන් ඔවුනොවුන්හා සාකච්ඡාකොට සබඳිති අපහැම සම්‍යක් සම්බුද්ධවූ සර්වඥයන් වහන්සේ කරාගොස් දැකවැඳ අපගේ ආචාර්‍ය්‍යවූවෙළඳ දිව්‍යපුත්‍රයාණන්ගේ ගුණ කියම්හයි කියා මධ්‍යමයාමයෙහි අවුත් බුදුන්කරා එළඹ ආචාර්‍ය්‍යවූ වෙළඳ දිව්‍යපුත්‍රයා තමන් හැමට පිහිට වහල්වූ නියාව බුදුන්ට දන්වා අප්‍රමාණ සන්තොෂයෙන් පස්වනක් ප්‍රීතින් පිනා බුදුන්වට ප්‍රදක්ෂිණාකොට වැඳ අවසරගෙණ තමන් බැව් අස්වා කියා තමන් වසන දෙව්ලොවටම ගියහ.

**පස්වනක් ප්‍රීති** නම් කවරහයත්, **ඛුද්දකා ප්‍රීතිය**, **ඛණිකා ප්‍රීතිය**, **ඔක්කන්තිකා ප්‍රීතිය**, **උබ්බෙගා ප්‍රීතිය**, **ඵරණා ප්‍රීතියයි** පඤ්චවිධවේ. ඔවුන්අතුරෙන් ඛුද්දිකාප්‍රීතිය නම්, ශරීරයෙහිලොමු දැහැගැනුම් මාත්‍රයක්ම කරනු හැක්කේ ඛුද්දිකා ප්‍රීති නම්වේ. ඛණිකා ප්‍රීතිනම්, ක්ෂණ ක්ෂණයෙහි විදුලිපහරන්නාක්මෙන් සතුටු සතුටුවනුයේ ඛණිකා ප්‍රීතිනම්වේ. ඔක්කන්තිකා ප්‍රීතියනම්, සමුද්‍ර තීරයෙහි රළ පැහැර විදා බස්නාක්මෙන් ශරීරයෙහි පැතිරපැතිර බස්නේ ඔක්කන්තිකා ප්‍රීතිනම්වේ. උබ්බෙගා ප්‍රීති නම්, බලවත්ව ලඳුවූ ශරීරය පුළුන් පිඩක්සේ අහසට නගන පමණ පමුණුවන්නාවූ ප්‍රීතිය උබ්බෙගා ප්‍රීතිනම්වේ, හේ එසේමය, **පුණ්ණවල්ලික** විහාරවාසීවූ **මහාතිස්ස** ස්ථවිරතෙම දෙපෝ දවසෙක්හි සවස තමන්වහන්සේ වැඩවසන විහාරයෙහි දාගැබ් මලුවට ගොස්වට ප්‍රදක්ෂිණා කොට වඳිමින් චන්ද්‍රාලොකයෙන් බබලන්නාවූ රාත්‍රිය දැක **රුවන්වැලි** මහසෑයට අභිමුඛව වැඩසිට සිතනසේක්; එකාන්තයෙන් මේ වේලාවට භික්ෂුභික්ෂුණී උපාසකඋපාසිකාවයයි යන සිවුවනක් පර්ෂද්හු රුවන් **රත්නමාලි**චෛත්‍යය වඳනාහුයයි සිතා සිතා ප්‍රකෘතීන්ම ඒ රත්නමාලී චෛත්‍යය දුටුවාක්මෙන් සිතටවටහමින් බුද්ධාරම්මණවූ උද්වෙගාප්‍රීතියඋපදවා භූමිතලයෙහි පහළ හූවටක්සේ අහසට පැන නැගී රුවන්වැලිදාගැබ් මලුවෙහිම

ලගාස්වැඩසිටියේක. තවද එසේම ගිරිකණ්ඩකනම් විහාරයට නුදු
රු තැන්හි චන්නකාලක නම් එක් ගමක වසන්නාවූ එක්තරකුල
යෙක්හි ධඤ්ඤවතීනම් ස්ත්‍රියක් තමාගේ පුරුෂයා හා සමග බණ
අසනුපිණිස ගිරිකණ්ඩක විහාරයටයනු කැමතිව තමාගේදූවණි
යන් ලඟට කැඳවා අම්ම නුඹ ගරුභාරහෙයින් අකාලවූ රාත්‍රියෙහි
යාම ඊමට නොහැකිද්දය, එසේහෙයින් අපි ගොස් චෛත්‍යය වැඳ
බණ අසා අවුත් නුඹටත් පින් දෙම්හ. එසේහෙයින් නුඹට පින්
පිණිස අපි බණ අසන්ට යම්හ නුඹ රඳන්නැයි කියා දූවනියන්
ගෙහි රඳවා තුමූ දෙදෙනම විහාරයට යනු පිණිස නික්මුණාහ.
එසඳ ඒ ළඳුරිතොම බණ අසන්ට යනුකැමති වූවත් මව්පියන් කී
බස් උගුලුවා ගතනොහී ගෙදෙරම රැඳුණාය. මෙසේ රැඳුනාවූ ඒ
ළඳුරිතොම දොර මිදුලට බැස බබලන්නාවූ චන්ද්‍රාලෝකය බලබලා
සිට ගිරිකණ්ඩක විහාරයෙහි දගැබදක ඒදගැබ් මලුවෙහිදීපධූප
පූජාකරන්නවුන් දුටුවාය එසඳ ඒ සිව්වනක් පර්ෂද්හු සුවඳදුම්මල්
පහන්ආදියෙන් චෛත්‍යයට පූජාකොට වටප්‍රදක්ෂිණා කෙරෙමින්
වඳනාවුන්ද සඞ්ඝයාවහන්සේ විසින් දෙශනා කරණලද්දාවූ ධර්මය
ඇසීමදයනමේ සියල්ලම සිතින්මවටහමින් එතැන්හිසිටියාවූළඳුරි
තොම තමාගේ ධඤ්ඤවතී නම්වූ මෑනියන් විහාරයට ගොස්එබඳු
චෛත්‍යාඞගණයෙහි වටප්‍රදක්ෂිණාකිරීමද මෙබඳුවූ ගුණඇති මධු
රවූ ධර්මකථාවන් ඇසීමද ලබතියි සිතමින් මුතුරැසක් වැනිවූ
චෛත්‍යයදැක උද්වේගාප්‍රීතියඋපද අහසටපැනනැගී දෙමව්පියන්
විහාරයට වදනාට පළමුව තොමෝ ගොස් දාගැප් මලුවට බැස
චෛත්‍යය ප්‍රදක්ෂිණා කොට වැඳ භික්ෂූන් විසින් දෙශනා කරන්
නාවූ ධර්මය අස අසා සිටියාය. එසඳ මව්පිය දෙදෙන විහාරයට
අවුත් තමන්ගේ දූවනියන් දැක අම්ම නුඹ ගෙයිරඳවාලා ආවමෝ
වේද, දැන් මෙතැන්හි අපට පළමුව කෙසේ පැමිණියෝදැයි විචා
ළාහ. එබසට එළඳැරි කියන්නී අම්ම මම අහසටපැනනැගීඅවුත්
මෙතැන්හි පැමිණියෙම් කිව එබසට මෑණියෝ කියන්නාහු;
ආකාශයෙන් ක්ෂීණාශ්‍රවයන් වහන්සේමුත් තෙපිසෑඩියක් නැතිම
කෙසේ අවුදැයි විචාළහ. එබසට ඒළදැරිකියන්නී මෑණියනිචන්ද්‍රා
ලෝකයෙන් චෛත්‍යය පෙනෙන හෙයින් ඒබලබලා සිටියෙම්බුද්ධ
ගුණ අරමුණුව බලවත්වූ ප්‍රීතිඋපන්නේය. එකල්හි මම සිටිබවත්
උන්බවත් නොදැන බුඩාලම්බන ප්‍රීතීන් මත්ව අහසට පැනනැගී
දාගැබ්මලුයෙහිමපිහිටියෙමියිකියා මෙසේ උබ්බෙගාප්‍රීතියමහත්
බවකියා සන්තොෂ කරවූය මෙසේ අහසට පැනනැගෙන පමණ
උපන් මහත්ප්‍රීතිය උබ්බෙගා ප්‍රීතිනම්වේ. ඵරණා ප්‍රීතිය නම්,සකල
ශරීරය අවසර නොහැර දියපිරි ගිරිකුහරයක් මෙන් චිත්ත සම්
පූණිවනුයේ ඵරණාප්‍රීති නම්වේ, මේ පස්වනක් ප්‍රීතිනම.

තවද මේ මහාභද්‍ර කල්පයෙහි තුන්වැනිව බුදුවූ කාශ්‍යප සම්‍යක් සම්බුද්ධරාජොත්තමයාණන් වහන්සේ මුලුලොවසරනාවැඩ වසන කල්හි එක් දවසෙක සොරහු දහසක් ඉදත ඒ ඒ තැන්හි සොරකම්කොට ඇවිදිනාහුය. එකල්හිජනපදයෙක්හි එක්ගමෙක සොරකම්කොට බොහෝ වස්තු ඇරගෙන යන්නාහ. එකල්හිජනපදවාසී මනුෂ්‍යයන් ඔවුන්ලුහුබඳවා ගෙනයනකල්හි ඔවුන්ට අසුනොවී පලාගොස් මහවනයකටවැද සැඟවීමට නිසි වජ්‍රවනගහනාදියක් නොලදින් සමීපයෙහි ගිරිගුහායෙක වසන තපස්වී කෙනෙකුන්දැක ස්වාමීනි අපටපිහිටවව සිටිය මැනවයිකීය. එබසට එම්බා තෙපි කුමක් පිණිස පිහිට සොයවුදැයි කීසේක, එබසට ඔහු කියන්නාහු; ස්වාමීනි සොරකම්කොට ජීවත්වන්නාවූ සොරුම්හ. දුන් ගමෙක සොරකම් කොට ගෙන දිවන කල්හි පසු පස්සෙහිම ජනපදවාසීහු ලුහුබඳවාගෙන අවුත් අසල්වූහ, මේ ප්‍රස්ථාවෙහි වද්නා අත්තැතිහෙයින් නුඹවහන්සේගේ පිළිසරණටවනුම්හයි කීහ. එබසට උන්වහන්සේ කියනසේක්; එම්බා මේ ප්‍රස්ථාවට තොපට නිසි පිළිසරණෙක් නොම ඇත්තේය තෙපි හැම්දෙන සරණසීලයෙහි පිහිටවයි කීසේක. එබස් අසා ඒහැම සොරහු යහපතැයි කියා සරණසීලයෙහි පිහිටියාහ. ඒ භික්ෂූන්වහන්සේද ඔවුන්ට කියනසේක්; එම්බා තෙපි හැමදෙනම දුන් සිල්වත්ව සිටියව, එසේහෙයින් තොපගේජීවිතය විනාශ වේනමුත් අනුන්කෙරෙහි වෛර නොබඳුවයි අවවාද කළසේක. උන්වහන්සේ දුන් අවවාදයෙහි පිහිටා එතැන්හි සිටිකල්හි පසුපස්සෙහි ලුහුබඳවාගෙනඑන ජනපදවාසී මනුෂ්‍යයෝ සොරුන් අල්වාගෙනවටලා ඒහැමදෙනම ජීවිතක්ෂයට පැමුණුහ. එකෙණෙහිම ඒහැමසොරහුම ගත්තාවූ සීලයෙහි අනුසසින් දිව්‍යලොකයෙහි උපන්හ: ඔවුන් කෙරෙන් චෞර ජ්‍යෙෂ්ඨතෙම ඒහැමදෙනාට නායකවිය. සෙසු සොරහු ඔහුට පිරිවර දිව්‍යපුත්‍රවඋපන්හ. ඒදිව්‍යලොකයෙහි ඉපද දිව්‍යසම්පත්ලද්දාවූ සොරුදසමසදිව්‍යලොකයෙහි ච්‍යුති ප්‍රතිසන්ධිවශයෙන් ඔබිනොබ සැරිසරාඇවිද අපමණවූ දිව්‍යසම්පත්අනුභවකොටඑක් බුද්ධාන්තරයක් ගියකල්හි අප බුදුන්බුදුව සැවැත්නුවර වැඩවසන කල්හි ඒ දිව්‍යපුත්‍රයෝ දහසම දිව්‍යලොකයෙන් චුතව අවුත් සැවැත්නුවරට නුදුරු තැන්හි දහසක් කෙවුලන් වසන ගමෙක්හි උපන්හ. එකල්හි ඒහැමදෙනම වැඩිවිය පැමිණ සූත්‍රනිපාතයෙහි කී පරිද්දෙන්ම කපිලමත්ස්‍යයාගෙන බුදුන්කරා ජේතවන විහාරයට ගොස් බණ අසා මහණව රහත්වූහ. එසේ හෙයින් වදාරණලදමැයි.–

"ඤාතිනං ච පියො හොති-මිත්තෙසු ච විරොචති,
කායස්ස භෙදා සුගතිං-උපපජ්ජති සීලවා."යි

තවද රජගහ නුවර දරිද්‍රවූ නීචක්‍රියාවෙහි නියුක්තවූ සියලු සත්‍වයන් විසින් නින්දිතවූ බොහෝ දෙනාට නමස්කාර කරන සුනීත නම් චණ්ඩාලපුත්‍රයෙක් පූර්වයෙහි හෙතුසම්පත් ඇතියේමේ ජන්මයෙහි පැවිදිවසීලාදීවූ අපමණශ්‍රමණ ගුණයෙහි පිහිටියේය. එකල්හි ශක්‍ර බ්‍රහ්මාදීවූ හැම සත්‍වයෝම ඔහුගේ ශ්‍රීපාදය නිරන්තරයෙන් මෙසේ නමස්කාර කරන්නාහුය, කෙසේදයත්?

"නමො තෙ පුරිසාජඤ්ඤ-නමො තෙ පුරිසුත්තම,
යස්ස තෙ ආසවා ඛීණා-දක්ඛිණෙය්‍යොසි මාරිස"

යනාදීන් නමස්කාර කොට වඳනා පුදනා ලද එකල්හි ඔහු ශක්‍ර බ්‍රහ්මාදීවූ දිවසෙනඟ පිරිවරා සිටියහු දැක බුදුහු සිනා පහළ කොට ඔවුන් මහාබ්‍රහ්මයාටත් වඩා උතුම්බව වදාළසේක. එම සුනීතනම මහතෙරුන් වහන්සේ විසින් කියන ලදමැයි—

"තතො දිස්වාන මං සත්ථා-දෙවසංඝපුරක්ඛතං,
සිතං පාතු කරිත්වාන-ඉමමත්ථං අභාසථ."

තපෙන බ්‍රහ්මචරියෙන-සංයමෙන දමෙන ච,
එතෙන බ්‍රාහ්මණො හොති-එතං බ්‍රාහ්මණ මුත්තමං."යි

එසේ හෙයින් ශීලයම ලෞකික ලොකොත්තර ඓහලෞකික පාරලෞකික සියලුසම්පත්තියටම කාරණා වන්නේය, එසේ හෙයින් වදාරණලදී—

"සීලමෙවෙධ සික්ඛෙථ-අස්මිං ලොකෙ සුසික්ඛිතං:
සීලං හි සබ්බසම්පත්තිං-උපනාමෙති සෙවිතං,
සීලං රක්ඛෙය්‍ය මෙධාවී-පත්ථයානො තයො සුඛෙ,
පසංසං විත්තලාභං ච-පෙච්චසග්ගෙ ච මොදනං.
සීලවා හි බහු මිත්තෙ-සඤ්ඤමෙනාධිගච්ඡති,
දුස්සීලො පන මිත්තෙහි-ධංසතෙ පාපමාචරං.*
අවණ්ණං ච අකිත්තිංච-දුස්සීලො ලභතෙ නරො,
වණ්ණං කිත්තිං පසංසං ච-සදා ලභති සීලවා.
ආදිසීලං පතිට්ඨා ච-කල්‍යාණානං ච මාතුකං,
පමොක්ඛං සබ්බධම්මානං-තස්මා සීලං විසොධයෙ.
වෙලා ච සංවරෙසීලං-චිත්තස්ස අභිහාසකං,
තිත්ථඤ්ච සබ්බබුද්ධානං-තස්මා සීලං විසොධයෙ.

* "දුස්සීලො පාපමිත්තෙහි=ධංසතෙ පාපමාචරෙ"

සීලං බලං අප්පටිමං-සීලං ආවුධමුත්තමං,
සීලං ආභරණං සෙට්ඨං-සීලං කවචමබ්භුතං.

සීලං සෙතු මහෙසක්ඛො-සීලං ගන්ධො අනුත්තරො
සීලං විලෙපනං සෙට්ඨං-යෙන වාති දිසොදිසං

සීලං සම්බලමෙවග්ගං-සීලං පාථෙය්‍ය මුත්තමං,
සීලං සෙට්ඨො අතිවාහො-යෙන වාති දිසොදිසං.

ඉධෙව නින්දං ලභති-පෙච්චාපායෙ ච දුම්මනො,
සබ්බත්ථ දුම්මනො බාලො-සීලෙසු අසමාහිතො,

ඉධෙව කිත්තිං ලභති-පෙච්චසග්ගෙ ච සුම්මනො,
සබ්බත්ථ සුමනො ධීරො-සීලෙසු සුසමාහිතො,

සීලමෙව † ඉධ අග්ගං-පඤ්ඤවා පන උත්තමො,
මනුස්සෙසු ච දෙවෙසු-සීලපඤ්ඤාණතො ජයං"යි

මේ පඤ්ච සීලයෙහි පිහිටන පරිදි නම්, ශ්‍රද්ධාවත් උපාසක උපාසිකාවරුන් විසින් ත්‍රිවිධරත්නයෙහි නම් වෙන වෙනම දෙවැනි තුන්වැනිව වාග්භෙද කොට නවවිටෙක කියමින් සරණ ගෙන නැවත නිත්‍යශීල වශයෙන් හෝ යෙදෙන දවසක හෝ සමාදන්වන කල එළු මාගධාදී කිසියම් භාෂාවකින් හෝ මෙසේ සමාදන් වියයුතු. කෙසේද, පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි, යි වාග්භෙද කොට කියමින් සමාදන්ව පිහිටීම පඤ්චශීල ග්‍රහණ නම් වේ. මේ පඤ්චශීලය වෙන වෙනම සමාදන් උවහොත් එකක් බිඳුනත් සෙස්ස නොබිඳෙන්නේමය. පඤ්චශීලය එක්ව සමාදන්වූවහොත් එකක් බිඳුණු කල්හි හැමම බිඳෙන්නේයි. මේ හීන මධ්‍යම ප්‍රණීත වශයෙන් ත්‍රිවිධ වේ. හෙද ඉදින් නුවණමඳ සත්වයන් විසින් කුශල චිත්තයෙන් සමාදන්වූ සීලය හීනවෙයි, අනිකක්හු විසින් සීලයෙහි ගුණ කියා තෙපි නිවන් දහම් පසක් කරනු සඳහා මෙබඳු සීල සමාදන්වවයි කීකල්හි තෙමේද නුවණින් යුක්තව දුන ශ්‍රද්ධාවෙන් සමාදන්වූ ශීලය මධ්‍යම නම් වේ. අනිකක්හු විසින් නොකියවාම තෙමේම තමාගේ නුවණින් සීලයෙහි ගුණ මෙබඳුයයි සිතාගෙන එබඳු සීලය සමාදන්ව ලෞකික ලොකොත්තර සම්පත්තිය සිද්ධකොට ගන්න මැනවයි කුසල චිත්තයෙන් සමාදන්වූ

† "ඉදං අග්ගං" ඇතැම්.

සීලය උත්කෘෂ්ට නම්වේ. එසේහෙයින් ප්‍රාණඝාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය මුසාවාදය සුරාපානයයි යන මේ පසින්ම සුරාපානයෙහිපාපය මහත්වේ, කවරහෙයින්ද? උභයලොකාපිසිද්ධිසම්පාදනය කිරීමෙහි සමර්ථවූ උත්තම පුරුෂයන් පවා උන්මත්තභාවයට පමුණුවා ආර්‍ය්‍යමාර්ගී ධර්මයට අන්තරායකාරක හෙයින් සුරාපානය මහා සාවද්‍යවේ. මෙතැන්හි පාණස්ස අතිපාතො=පාණාතිපාතො, යතුහෙයින් පාණාතිපාත නම් ප්‍රාණඝාත කිරීම ප්‍රාණය වැනසීමයයි යන අර්ථයි, ප්‍රාණය නම් මෙතැන්හි ව්‍යවහාර වශයෙන් සත්ත්වයාට නමක, පරමාර්ථවශයෙන් ජීවිතෙන්ද්‍රියයි. එබඳුප්‍රාණයෙහි ප්‍රාණයයි යන සංඥාඇතිව ජීවිතෙන්ද්‍රිය නැසීමට උපක්‍රම උපදවා කයින් හෝ වචසින් හෝ උත්සාහකොට මැරීම ප්‍රාණඝාත නම්වේ. ඒ ඒ සත්ත්වයාගේ ගුණවිශෙෂයෙන් භෙදවේ. ගුණවිරහිත තිරිශ්චීන ගතවූ ප්‍රාණීන් අතුරෙන් මහත් ශරීරඇතිප්‍රාණීයක්හු මැරීමෙහි අකුශලඵලමහත්වෙයි, ක්ෂුද්‍රප්‍රාණීයක්හුමැරීමෙහි අකුසල ඵලයද ක්ෂුද්‍රවෙයි, කවරහෙයින්ද? ඔහු නසාගැන්මට කරන්නාවූ ප්‍රයොගය පමණින් අකුසලයද වේ, තවද මනුෂ්‍යයන් මැරීමෙහිද ඔවුන්ගේ ගුණවශයෙන් අකුශල බොහෝවේ, චිත්තයක්‍රූර සත්ත්වයාට වඩා මෘදුසත්ත්වයා මැරීමෙහි අකුශලයද බොහෝවේ. මේ සත්ත්ව මරණයෙහිද අඞ්ගපසෙක්වේ, ප්‍රාණියක්හු බවය, මේප්‍රාණියෙකැයි සංඥාඇතිබවය, මොහු මරමියන වධක චෙතනාවය, ඔහුනැසීමට දුනු තෙප් උගුලු මලආදිය සරනා දුවපැනඇවිද කරන්නාවූ ප්‍රයොගය, ඒ උපක්‍රමයෙන් ඔහු ජීවිතක්ෂයට පැමිණි බවයයි, යන මේ ප්‍රාණඝාතයෙහි පංචාඞ්ගනම්වේ, අදත්තාදානයෙහි පඤ්චාඞ්ග නම්, අනුන් සන්තක බවය, අනුන් සන්තකයයි සංඥ ඇති බවය, සොරසිත්ඇතිබවය, ගැන්මට කළමනා උපක්‍රමය, එඋපක්‍රමයෙන් ගැන්මය, යනමේ අදත්තාදානයෙහි පඤ්චාඞ්ගනම්වේ, කාමමිථ්‍යාචාරයෙහි චතුරඞ්ගනම්, නොපැමිණියයුතු වස්තුවක් බවය. එහි සෙවන චිත්තය, සෙවන ප්‍රයෝගය, මාර්ගී ප්‍රාප්තිය, ඉවසීමය යන මේ මිථ්‍යාචාරයෙහි චතුරඞ්ගනම්වේ. තවදමුසාවාදයෙහි චතුරඞ්ග නම්, අවිද්‍යමාන බවය, ඇතිදෙය සඟවනු අභිප්‍රාය ඇතිබවය, කියන බස් සැඟවීමට කළමනාඋත්සාහය, මොහුකීවේ බොරුයයි ඔහු එකෙණෙහිම දැනගැන්මය,යි යන මොහු මුසාවාදයෙහි චතුරඞ්ග නම්වේ, තවද සුරාපානයෙහි පිට්ඨ සුරාය, පූවසුරාය, ආහාර සුරාය, කිණ්ණ පක්ඛිත්ත සුරාය, සම්භාර පක්ඛිත්ත සුරාය,යි යන මෙයින් එක්තරා සුරාවක් බවය, එ සුරාපානය කොට මත්වීමට බොනු කැමතිවීමය, මත්වීමට කාරණ ව්‍යායාමය, බොමින් සතුටුවීමය,යි යනමේ සුරාපානයෙහි චතුරඞ්ග නාම්වේ.

මේ පඤ්චශීලය නම් වේ.

පෝෂධ අෂ්ටාඞ්ග ශීලයෙහි පිහිටන පරිදි නම්, ශ්‍රද්ධාවත් උපාසක උපාසිකාදීන් විසින් පිරිසිදුව හැද පිරිසිදු සිතින් සමාදන්වූ පෝෂධ අෂ්ටාඞ්ගශීලය මහත්ඵලවෙයි, කිලිටුවූසිතින් විසූ පෙහෙවස් මහත්ඵල නොවන්නේය, එසේහෙයින් පිරිසිදුව සිට පිරිසිදු සිතින් පෙහෙවස් සමාදන් වියයුතු කෙසේදයත්? සෙට පොහෝ දවස පෙහෙ වෙමියි, එහෙයින් ආහාරාදිය කල්තබා පිළියෙළකර වයි විධානකොට එපරිද්දෙන්ම පෙරවරු කල්තබා ආහාරඅනුභව කොට දිය පෙරාගෙන දැවටූ කාත්‍යය සිඬකොට භික්ෂුවක් ලඟට හෝ භික්ෂුණියක් සමීපයට හෝ පාලි ධර්මය දන්නා උපාසකයක්හු ලඟට හෝ උපාසිකාවක සමීපයට හෝ බුද්ධ ප්‍රඥප්තිය පමණක් දන්නා කිසිවක් ලඟට හෝ එලඹ ආදර දක්වා සිට පෙහෙවෙමියි කීකල්හි ත්‍රිවිධරත්නයෙහිනම් වෙන වෙනම දෙවැනි තුන්වැනිව වාග්භෙදකොට එක්වමකියමින් සරණගෙන නැවත පෝෂධාංග ශීල වශයෙන් ප්‍රාණඝාත අදත්තාදාන අබ්‍රම්සර මුසාවාද සුරාපාන විකාලභොජනයයි යන ශික්ෂාපද සයද, "නච්චගීතවාදිතවිසූකදස්සන මාලාගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනඨානා" යයියන ශික්ෂාපද දෙක එකක්කොට "උච්චාසයන මහාසයනා" යයි යන ශික්ෂාපදය ඇතුළුව මේශික්ෂාපදඅට වෙනවෙනම වාග්භෙද කොට සමාදන් වියයුත්තේය. එලෙස සිල්සමාදන් කරවන ලෙස ඇදුරක්හු නොලදහොත් බුද්ධප්‍රඥප්තිය ලෙසට පෝෂධාංගශීලය තමා විසින්ම වාග්භෙදකොට තමා ඉටාගතයුත්තේය. මෙසේ පෙහෙවස් රක්නාහු විසින් පරපීඩාවට සුදුසු කර්මාන්ත නොකළ යුත්තේය. අනුන්ලවාද නොකරවියයුත්තේය. ආයව්‍යය ක්‍රයවික්‍රයෙන් දවස නොහල යුත්තේය. ගෙහිදී වැළඳූ නිත්‍ය භක්තික භික්ෂුවක් මෙන් අහර අනුභවකොටලා විහාරයටම ගොස් ධර්මයෙන් යුක්තකථා හෝ පාලිධර්මය හෝ අස අසා හිඳකල්යවියයුත්තේය, නොහොත් එක්තරා කර්මස්ථානයක්හෝ මෙනෙහිකටයුත්තේය. මෙසේ විසූ පෙහෙවස් මහත්ඵල මහානිසංස වන්නේයි. හේ එසේමය, යමෙක් වනාහි මේ සොළොස් මහා ජනපදයකින් යුක්තවූ මේ සකල ජම්බුද්වීපය හෙරිතලයක්මෙන් සමකොට තනවා දණ පමණ කපි පමණ රත්රුවනින් පුරා එහි සප්තවිධරත්නයෙන් යුක්ත චක්‍රවර්තිරාජ්‍යය කෙරේද, එබඳුවූ මහත් ඓශ්වර්‍යයම එක් දිවාරාත්‍රියෙක්හි රක්ෂා කළාවූ අෂ්ටාඞ්ගශීල සමන්වාගත පෙහෙවස්හි කුසල ඵලයට සාදෘශ්‍ය නොවන්නේය. මේ පෙහෙවස් රක්ෂාකළාවූ කුසල ඵලයම මහත් වන්නේය. ඒ එසේමැයි මේ පෙහෙවස් රක්ෂාකළාවූ කුසලඵලය සොළොස්කොටසක්කොට

එයින් එක් කොට්ඨාසයක් සොළොස් කොට්ඨාසයක් කොට මෙසේ සොළොස්වාරයක් සොළොස් කොට්ඨාස කළ කල්හි එයින් එක් කොට්ඨාසයක කුසලඵලයටවත් සාදෘශ්‍ය නොවන්නේය. ඊටකාරණා කිමයත්? මනුෂ්‍යයන් ලබන චක්‍රවර්ති රාජ්‍යසම්පත් ආදිවූ සියලු සම්පත්තියම සීල ඵලයෙන් ලබන දිව්‍ය සම්පත්තියට අතිශයින් සාදෘශ්‍ය නොවනබැවින් සීල ඵලයම මහත් වන්නේයි.

තවද මෙහි "ප්‍රාණාතිපාතා වේරමණී" යන්නෙහි ප්‍රාණඝාතයෙන් වැළැක්මය හෙවත් ප්‍රාණඝාතයකරනුපිණිස ජනිතවූ වෛරය හරනේයයි යනු අර්ථයි. කුසල චිත්තය හා එක්වූවාවූ ඒ විරතිය හෙවත් වැළැක්ම සම්පත්තවිරතිය සමාදානවිරතිය සමුච්ඡේදවිරතියයි ත්‍රිවිධවේ. ඔවුන් අතුරෙහි සමාදන්වූ සිල් නැත්තේද තමාගේ කුලජාතිවංශයසලකා ප්‍රාණඝාතාදිය නොකරන්නේද තමාගේ වයස්වූපරිච්ඡේදෙන් පුරුෂවත්කම්සලකා ප්‍රාණඝාතාදිය නොකරේද, තෙමේ බහුශ්‍රැත ආගම පුරාගමාදිය කථනයෙන් ලොකප්‍රසිද්ධව සත්වයන්ට ප්‍රීති ඵලවා * වසනහෙයින් බහුශ්‍රැතකම් සලකා ප්‍රාණඝාතාදිය නොකෙරේද, මේ ජාතිවයස් බහුශ්‍රැතභාවාදිය සිහිකොට අපවැන්නවුන්ට මෙබඳුවූ පාපයන්කිරීම යුතුනොවන්නේයයි සම්ප්‍රාප්තවූ වස්තූන් ව්‍යතික්‍රම නොකොට උපදනාවූ විරතිය සම්පත්ත විරති නම්වේ. හේ එසේමැයි,

මේ සිංහලද්වීපයෙහි එක්තරා ගමක චක්කන නම් උපාසකයෙක් වෙසෙයි, ඒ උපාසකයා බාලකාලයෙහිපටන් උන්ගේ මෑණියන්ට රෝගයෙක් උපන්නේය. ඒ රෝගය කල්ගොස් අසාධ්‍යවූහෙයින් වෙදවරු බොහෝදෙන වෙදකම්කොට ඵාසුකොට ගත නුහුණුවාහුය, මෙසේ කල්ගියකල්හි දවසෙක ඒ රොගය දුටු වෛද්‍යයාණ කෙනෙක් කියන්නාහු; මේ රොයට වෙදකමට අලුත් ශශ මාංසයක් ලදහොත් මේ රොගයට වෙදකම්කොට ඵාසු කළ හැක්කේයයි කීහ. එපවත්අසා දවසෙකවක්කනනම් උපාසකයාගේ බෑනැණියෝ †ඕහටකියන්නාහු; එම්බා මලණුවෙනි තෙපි ගොයම් වෙලට ගොස් වට පරීක්ෂාකොට ඇවිද සාවෙකු අල්වාගෙනඑවයි කියා මලණුවන් යවූහ. ඒ ඇසූ චක්කන තෙමේ ගොයම් කෙතට ගොස් ඒ ඒ තැන්හි බලා ඇවිදුනේය. එකල්හි සාවෙක් වනලැහැබෙක ඉඳ ක්ෂුධායෙන් අවුත් ඒලා ගොයම් කනු පිණිස කෙතට වන්නේය. එසඳ සාවුන් බලා ඇවිදිනා චක්කනනම් මිනිසාණෝ

---

* "වයසහෙයින් ජම්ආදිය සිහිකොට අපවැන්නවුන්ට මෙබඳු පාපයන්කිරීම යුතු නොවන්නේයයි සම්ප්‍රාප්තවූ ජාති වයස් බහුශ්‍රැත භාවාදි වස්තූන්" පොත්. † "චක්කණස්ස භාතෘ" [illegible].

ඒ සාවා දූක අල්වනු අභිප්‍රායෙන් මහත් වෙග දනවා පසුපස්සෙහි ලුහුබඳවාගත්තේය. මෙසේ ලුහුබඳවා ගෙනගොස් සාවා ලංකොට වැලකින් බැඳගත්තේය. එකල්හිබැඳගත් සාවා කිරිකිරියන ශබ්ද පවත්වා ඇඬූයේය එසඳ චක්කන නම් මිනිසාණෝද ඔහු ඇඬුඅඬ අසා අල්වාගෙන ඔහු බලා සිතනුයේ; ඉදින් මාගේ මෑණියන්ගේ රොගයට බෙහෙත්කරවම්යි මහත් සමාධිව නැවතත් එකෙණෙහිම සිතනුයේ; මොහු නසා බෙහෙදට මස්ගැන්ම මාවැනි පුරුෂයක් හට නුසුදුසුය, ඉදින් මාගේ මෑණියන්ගේ ජීවිතය රක්‍ෂා කරනු පිණිස මේසාවාගේ ජීවිතය නැසීම යහපත් නොවන්නේය,ඉදින් මොහු ජීවිතෙන්ද්‍රියයෙන් තොර කෙළෙම්නම් මාගේ වංශයටසුදුසු නොවන්නේය, දන්නා තැන් පටන් මෙතැනදක්වා ප්‍රාණඝාතය කුත්නොකෙළෙම්, මතුකලක් පාපඵලවිඳීමටත් කාරණයයිසලකා සාවාගේ පිට පිරිමැද තොපි දූන් සාවාණෙනි භය නොගනුව, තොප ජීවිතයට අඩුවෙක්නොමවන්නේයයිකියා ඕහට ප්‍රියවචනයෙන් ආමන්ත්‍රණයකොට එම්බා සාවාණෙනි තොප ගොස් වනයෙහි සස ජාතීන් හා සමග තණ පැන් අනුභවකොට ජීවත්වයි කියා බැඳි වැල මුදා හැරපූයේය, මෙසේ තමා අල්වාගත් සාවාවල හැර තමා වසන ගෙදරටම ආයේය. එසඳ ඔහු දුටු බෑණනියෝ කිම්ද මල සාවුන් බෙහෙදට ගෙනාවේදැයි කීහ, එබසට චක්කන නම් මිනිසාණෝ කියන්නාහු; බෑණනියනි තුඹ කී පැවිරේම වෙලට ගොස් බලා ඇවිදිනෙමී සාවෙකු දූක අල්වාගෙන මරම් සිතා නැවතත්පාපභයින් හැරපීම්යිකීයේය. ඔහුගේ බෑණනියෝ එපවත්අසා ඕහටකිපී කියන්නාහු; වැඩදුටුවලණ්ඩ දූකගේඅල්වා ගත් සාවා මක්නිසා ඇරපීදැයි කීහ. එබස් අසා චක්කන නම් මිනිසා මෑණියන් සමීපයට ගොස් මෙපවත් කියා නැවත තමා ප්‍රාණඝාත නොකරන නියාවටත් ගිය දවස නොකල නියාවටත් සත්‍යක්‍රියා කරනුයේ; මම යම් දවසෙක ජාතවීම්ද එතැන් පටන් දූනදූන ප්‍රාණියක්හු ජීවිතෙන්ද්‍රියයෙන් තොරකල නියාවක්නොදනිම්යි කියා සත්‍යක්‍රියාකොට මෑණියන්ඉදිරියෙහි සිටියේය. එසඳ අභිඝාතකොට සිටියාවූ ක්‍ෂණයෙහි ඔහුගේ මෑණියන්ගේ රොගය අලපත තෙළුම්පත ගත් දියත්තක්සේ පහව නිරොගීවූහ. මේ උත්තමයන් විසින් ප්‍රාණඝාත නොකරන බවය.

සමාදන්වූ පෙහෙවස් ඇත්තාහු වනාගී තමාගේ ජීවිතය පරිත්‍යාගකොට වීනමුත් අනුන්ගේජීවිතයරැක තමා සමාදන්වූ සීලයම අඛණ්ඩ කොට රක්‍ෂාකරන්නාහුමය යේ එසේමය, උභතර වඩ්ඪමාන නම් ගමෙක වසන්නාවූ එක් උපාසකයෙක් අනුබද්ධ විහාරයෙහි වැඩි ඕ මංගලබුද්ධරක්ඛිත සැම්වූ එක්තොරසෙනානුත්

වහන්සේගේ සමීපයෙහිදී පෙහෙවස්සමාදන්ව වසන්නේය. ඒ උපාසක තෙම දවසෙක තමාගේ කෙතට සීසානා පිණිස ගියේය. එදවස් සාතා ගොන්ගෙන් එකකු නොදැක ඔහු බලනු පිණිස වෙනෙහි වන්නේ උත්තරවඩ්ඪමාන පර්වතය මුදුනට පැන නැඟී ගවයා බලා ඇවිදින්නේය. එකල්හි ඒ වෙනෙහි ඇවිදුනාවූ පුරුෂයා පිඹුරෙක් දැක අල්වා වෙළාගෙන ගලන්ට උත්සාහකරන්නේය. ඒ ක්ෂණයෙහි ඒ පුරුෂයා සිතනුයේ: ඉදින් මේ පිඹුරු තමා අත තිබූ හියුණු මුවහත් ඇති කැත්තෙන් පොලු පොලු කොට ඔහුගේ හිසපටන්වලගට කැපීගා වගුරුවම්යි සිතා නැවත සිතනුයේ: මොහුගේ ජීවිතෙන්ද්‍රියයෙන් දුරුකිරීම තමහට සුදුසු නොවන්නේයයි සිතා එලෙස කළොත් තමාගේ යාවජීවව ගුරුන්වහන්සේගෙන් ගත්තාවූ පෙහෙවසට විරුඩයයි තුන්විටක් කොට සිතමින් තමාගේ ජීවිතය තිබැදී ශ්‍රෙෂ්ඨවයශීලයට මලිනභාවයක් නොකෙරෙම්යි උරෙහි ලූබූ කැත්ත ඇරගෙන ඉවත දැමූයේය. එකල්හි සියළඟ වෙළාගන්ට උත්සාහකරන මහ පිඹුරුද තමා වෙළාගත් දරණවැළයෙහෙන් ලිහිල්කොට මූද ඕහට කිසි පීඩාවක් නොකොට අහස අදමින් වෙනෙහි වැදගියේය. මෙසේ අන්‍යප්‍රාණයට උපද්‍රවයක් නොකළ කල්හි මෙම ජාතියෙහි ප්‍රාණභය නොවනබව මෙයින් දතයුතු.

මේ ප්‍රාණඝාත නොකිරීමෙහි ඵලනම්, ඒ සත්ව තෙම ආරෝග්‍ය පරිණාහ සම්පත් ඇති වන්නේය, ජවසම්පන්නය, ප්‍රතිෂ්ඨිතපාද ඇතිවන්නේය, මනොඥවන්නේය, සුවිවන්නේය, සෞභාග්‍යය ඇති වන්නේය, මහත්බලඇතිවන්නේය, විශිෂ්ටවූ ශබ්දඇතිවන්නේය, අභෙද්‍යවූ පර්ෂද් ඇතිවන්නේය, සිත චකිත නොවන්නේය. ශරීර භෙද්‍යයක් නොවන්නේය, අනුන්ගේ උපක්‍රමයෙන් නොනැසෙන්නේය, බොහෝ පරිවාර ඇතිවන්නේය, මනාවූ රූප ඇති වන්නේය, මනාවූ සටහන් ඇතිවන්නේය, කිසි ව්‍යාධියක් නැති වන්නේය, කිසිකලෙකත් ශොකයක් නොවන්නේය, සියලු ලෝවැස්සන්ට ප්‍රියවන්නේය, ප්‍රියයෙන් මනාපයෙන් අමුක්ත වන්නේය, දීර්ඝායුෂය ලබන්නේයයි යනමේ සියල්ලම ප්‍රාණඝාත නොකළාවූ කුසලයෙහි ඵලනම්වේ. අදින්නාදානයෙන් වැළැක්මෙහි ඵලනම්, මහත් ධන ඇතිවන්නේය, බොහෝවූ ධාන්‍යයන් ඇතිවන්නේය, අනන්ත භොග ඇති වන්නේය, නූපන්නාවූ භොග උපදන්නේය, උපන්නාවූ භොග කලක්පවත්නේය, කැමැත්තාවූ භොගයෙක් වහා ලැබෙන්නේය, රාජ චොර උදක අග්නි අප්‍රියන්විසින් නොනස්නේය, අසාධාරණවූ හෙවත් උත්කෘෂ්ටවූ ධනලැබෙන්නේය, ලොකොත්තර ගුණයක් නැතිබව නොදතෙන්නාක් මෙන් සැපයේ වසන්නේය, මේ අදත්තාදානයෙන් නැවැතීමෙහි ඵලනම්වේ. අබ්‍රහ්ම

මරියාව නොකිරීමෙහි ඵලනම්, පසමිතුරන් දුරුවනබවය, සියලු ජනයන්ට ප්‍රියවනබවය, අන්නපාන වස්ත්‍රාදිය යහපත්ලෙස ලැබීමය, සැප සයන ලබනබවය, සැපයෙන් නිදනබවය, සැපයෙන් පුබුදිනාබවය, අපාය භයින් මුක්තවනබවය, ස්ත්‍රී බව ලැබීමට හා නපුංසකාත්මය ලැබීමට හා අයොග්‍යවනබවය, ක්‍රොධ නොකරන බවය, ප්‍රත්‍යක්‍ෂවූ කායශ්‍රී ඇතිවනබවය, ශොකහන්නාවූ බඩඇතිවනබවය, අධොමුඛ නොවනබවය, ස්ත්‍රී පුරුෂයන් ඔවුනොවුන්ට ප්‍රිය වන බවය, සම්පූර්ණවූ ඉන්ද්‍රියන් ඇතිවන බවය, සම්පූර්ණවූ ලක්‍ෂණයන් ඇතිවනබවය, කිසිදෙයකටක් සැක නැතිවන බවය, අල්පවූ උත්සා ඇතිවන බවය, සැප විහරණයෙන් වසන බවය, කවරදෙයකිනුත් භයක් නැතිවනබවය, ප්‍රිය විප්‍රයොගයක් නැතිවන බවයයි යනමේ අබ්‍රහ්මචර්‍ය්‍යාව නොකිරීමෙහි ඵලනම්වේ. මුසාවාද නොකීමෙහි ඵලනම්, ප්‍රසන්නවූ ඉන්ද්‍රියයන් ඇතිබවය, විශිෂ්ටවූ මධුරභාරතියෙන් යුක්ත බවය, සම සුභ්‍රවූ නිර්මලදන්ත ඇතිබවය, ශරීරය ඉතා ස්ථූලනොවන බවය, ඉතා කෘශ නොවන බවය, ඉතා මිටිනොවන බවය, ඉතා උස්නොවන බවය, සැපවූ ස්පර්ශ ඇතිබවය, මහනෙල්මල් සුවඳවහනය කරන්නාවූ පද්මයක් වැනි මුඛ ඇති බවය, නිලුපුල් පෙති වැනිවූ නෙත්‍ර ඇති බවය, ලෙහෙවන් මෘදුවූ ජිහ්වා තයනානන ඇතිබවය, ලඝුජනයන්ගේ උඩගු නොවනබවය, දුටු දුටුවන් සම්පසස්වීමට කැමති වන බවයයි යනමේ මුසවා නොකීමෙහි ඵලනම්වේ. සුරාපානය නොකිරීමෙහි ඵලනම්, අතීත අනාගත වර්තමානයයි යනතුන්කල්හිම තමා කලමනාකෘත්‍යයෙහි විභාග වහාදැනගැනීමය, හැමකල්හිමසිහිඇතිව වසනබවය, කිසිකලෙකත් උමතුනොවනබවය, වජ්‍රඥතඇති බවය, හැමදවස්ම කිසිදෙයකටත් අලසවාසිනොවනබවය, ප්‍රමාද නොවනබවය, චිත්තසම්මොහ නොවනබවය, භයනොගන්නා බවය, සාරම්භනොවන බවය, සියලු වාදයෙන් ජයගන්නා බවය, කෙලාම් නොකියන බවය, පරුෂ වචනයන් නොකියන බවය සම්ඵප්‍රලාප නොදොඩන බවය, රුදෙවෙහි යහපත් කෘත්‍යයෙහි නොපමා වනබවය, කෙලෙහිගුණ දන්නාබවය, කලමනාකාරිය නුවණින් යුක්තවම කරනබවය, මසුරුනොවන බවය, ත්‍යාගවත් බවය, නිත්‍යශීල ආචාරශීල පංචශීලාදීවූ සිල් පිරීමෙහි අලසකාරි නොවනබවය, වංක ගුණ රහිතවූ සෘජුගුණ ඇතිවන බවය, කිසිවක්හු කෙරෙහි ක්‍රොධ නොකරනබවය, භය ලජ්ජා ඇති බවය, සෘජුවූ දෘෂ්ටි ඇති බවය, ජනප්‍රධාන වන බවය, ප්‍රඥාවෙන් අසදෘශ වනබව්ය, පණ්ඩිත වනබවය, බැගරවද තමහටද වැඩ කැමතිබවයයි යනමේ සුරාපානනොකිරීමෙහි ඵලනම්වේ විකාරී

භොජන නොකිරීමෙහි ඵලනම්, බුදුන් අනුදන්නාවූ කාලයෙන් අන්‍යකාලය විකාල නම් වෙයි බුදුන් අනුදත් කල්නම්, පහන්ව අරුණු නැගි තැන්පටන් පසළොස් පැය ඇතුළත කාලනම්වෙයි, එයින් අන්‍යවූයේවිකාලනම්වේ, ඒවිකාලයෙහි අනුභවකරන්නාවූ භොජනය විකාලභොජන නම්වේ, ඒ විකාලභොජනය කෙලෙශොත්පත්තියට කාරණ බැවින් පෙහෙවස් රක්නහු විසින් අනුභව කළකල්හි අකුශලයවන්නේයි, විකාලභොජනයෙන් වැළැක්කේ කුශලඵලවිඳිමන්යි. නච්චගීතවාදිත විසූකදස්සන නම්, තමාවිසින් නෘත්‍ය දක්වීමය, ගීතස්වරයෙන් ගීතිකාශබ්ද පැවැත්වීමය, භෙරිතූර්‍ය්‍ය භාණ්ඩයන් අනෙකවවාද්‍ය පැවැත්වීමය, අනුන්නටනානැටීම බැලීමය, අනුන් කියන ගීතිකා ප්‍රියව ඇසීමය, අනුන්ගේ භෙරිතූර්‍ය්‍ය භාණ්ඩාදියගෙන වයන වාද්‍යඇසීමය, යනමේ නච්චගීතවාදිත විසූක දස්සනනම්වේ, මාලාගන්ධවිලෙපන ධාරණමණ්ඩනවිභූසනට්ඨානනම්, සැරහෙනු පිණිස මල් පැළඳීමය, සුවඳ විලෙපනයන් ඇඟ ගල්වා ඔරු සැරහීමය යනමේ මාලාගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨාන නම්වේ. මේදෙකම අෂ්ටාඞ්ග ශීලයට එක්කොටකීවද, මෙයිදුසිල්රක්නාහට අකුශලපක්ෂයෙහිම සිටිනා බැවින් මෙයින්වැළැක්නාහට කුසලඵලමවේ. ඒ නච්චගීතවාදිතයද තමාහුන් තැනකටහෝ සිටි තැනකටහෝ පැමිණියේවිනම්ද යම් තැනෙක්හි නික්මුණු කල්හි එතැන්හි එළඹ සිටියේනම්ද දක්ම වරදනැති, ධම්මූපසංහිතවූ ගීතිකාවනොවටනේය, ගීතූපසංහිතවූ ධර්මය වනාහි වටනේමැයි. උච්චාසයන මහාසයනනම්, වඩුරියන් උස්වූ මඤ්චපාද ඇති හැඳද පුළුන් බහාලද තිලිද යතරඟුල් පමණින් දික්වූ රෝමයන් ඇති කොදුපලස් ඇතිරියද යනමේ ආසනරණවල සැතැප්ම නොවටනේය. මෙහිනොසැතපෙන්නහු විසින් ලබන්නාවූ සීලකුසලඵලය මහත්වන්නේයි. මේඅෂ්ටාඞ්ග පෝෂධ සීලය නම්වේ.

දශසීලය නම්, දශප්‍රකාර අඞ්ගසම්පත්තීන් යුක්තවූ සීලයයි. සෙද ශ්‍රද්ධාවත්කුලපුත්‍රයන්ගෙන් මගඵලවනුකැමතිකුලපුත්‍රයක්හු පැමිණිකල්හි අපලොකනකර්මයෙන් සංඝයා අනුදන්වාහෝ අනුපසම්පන්නයක්හු ලවා හෝ කෙසමස්සුන් බහවා හොමපුණු සුවඳ සුණුයෙන් උලා නාවා ඔහුවත් තෙරුන් පා වඳවා සිවුරු අතින් ගන්වාවත් තෙරුන් අභිමුඛයෙහි තුදුරුළු සිටුවා සියලුදුක්ගෙවා නිවන් දක්නා පිණිස ස්වාමිනි මේ සිවුරු ගෙන මට දෙමින් මා මහණකල මැනවැයි කියවා තුන්විටක සදමින් සිවුරු ගෙන වැළඳවූකල්හි නැවතත්වත් තෙරුන්පාවඳවා උක්කුටුකාසයන් හිඳුවා ඇඳිගොත් මුදුනෙහි තබවමින් ස්වාමිනි මම සරණසිල් ගනිමියි කියවූකල්හි එත් තෙරුන් විසින් පද වෙනවෙන තෝරා දීග්ගනීන

මහාරත්නකොට තුන්තුන්විට නොපිරිහෙළාදෙදෙනම උච්චාරණ ශුද්ධකොට පළමු සරණගමන කරවා නැවතත් පද වෙන වෙන නොතොරා එක්කොට බිඳූ අන්තකොට සරණ ගමන කරවූ කල්හි එසඳ ශාසනයෙහි පිහිටියේනම්වේ ඉක්බිති "පාණාතිපාතා වෙරමණීසික්ඛාපදංසමාදියාමි"යි යනාදී දශශික්ෂාවම් පාළි වචනයෙන්ම කියා දසසිල් සමාදන්වියයුත්තේමැයි මේ පැවිදිවූ සාමණෙර තැන්ද සිල්සමාදන් වන පරිදිය. උපාසකවරුද දසසිල් සමාදන්වෙත්මය. අබ්‍රහමචය්‍ය්‍යා ශික්ෂාපදය පඤ්චශීලය සාධාරණ නොවෙයි. ජාතරූප රජත ශික්ෂාපදය අෂ්ටාඞ්ගශීලයට සාධාරණ නොවෙයි. මෙසේ පඤ්චශීල අෂ්ටාඞ්ගශීල දශශීලකොට්යක්සංවර ශීලය යනාදිවූ නිර්වාණාරම්මණ සීලයන් රක්ෂාකරන්නවුන්විසින් වීය්‍ය්‍යවත්ව චතුසම්පජඤ්ඤයෙන් යුක්තව සීලයන් රක්ෂා කටයුතු වීය්‍ය්‍යනම්, නූපන්නාවූ අකුශල ධර්මයන් නූපදනා පිණිස කළමනා ව්‍යායාමය, උපන් අකුශල ධර්මයන් නසනු පිණිස කළමනා ව්‍යායාමය,නූපන්නාවූකුශලධර්මයන් උපදනාපිණිස කළමනා ව්‍යායාමය. උපන්නාවූ කුශල ධර්මයන් සම්පූර්ණව සපිර වනු පිණිස කළමනා ව්‍යායාමයයි මෙසේ වීය්‍ය්‍ය චතුර්විධ වෙයි. චතුසම්පජඤ්ඤ නම්, නූපන්නාවූ පාපකවූ අකුශලධර්මයන් නූපදනා පිණිස ඡන්දය උපදවා ව්‍යායාම් කෙරේද, වීය්‍ය්‍ය වඩාද, චිත්තයෙන් ගෙන අදහාද, උපන්නාවූ පාපක අකුශල ධර්මයන් හරනා පිණිස ඡන්දය උපදවා ව්‍යායාම් කෙරේද, වීය්‍ය්‍ය වඩාද, චිත්තය නුවාහෙන සිටීද, අදහාද, නූපන්නාවූ කුශල ධර්මයන් උපදනා පිණිස ඡන්දය උපදවාද, ව්‍යායාම්කෙරේද, වීය්‍ය්‍යඅරඹයාද, චිත්තයඋපදවනුපිණිස අදහාද, උපන්නාවූ කුශලධර්මයන් සථාවරය පිණිසද අසම්මෝහය පිණිසද බොහෝසේ වඩිනවනු පිණිසද විපුලත්වයවනු පිණිසද භවනු පිණිසද සම්පූර්ණවනුපිණිසද ඡන්දය උපදවාද, ව්‍යායාම් කෙරේද, වීය්‍ය්‍ය අරඹයාද, චිත්තපග්‍රහණය කරයිකෙරේද, පදහනය කෙරේදැයි යනමෙ චතුරය්‍ය්‍ය සම්‍යක් ප්‍රධාන නම්වේ සීලයනම්-

"නවකොටිසහස්සානි-අසීතිං සතකොටියො,
පඤ්ඤාසං සතසහස්සානි-ඡත්තිංසාච පුනාපරෙ"

යනාදීක්‍රමයෙන් දක්වනලද නවකෙළදහස්එක්සියඅසූකෙළි පනස්ලක්ෂ සතිස් සංවරයකින් යුක්තවූ ප්‍රාතිමොක්ෂ සංවර සීලය ඉන්ද්‍රිය සංවරසීලය ආජීවපාරිශුද්ධි සීලය ප්‍රත්‍යය සංනිශ්‍රිත සීලයයි චතුපාරිසුද්ධිසීලයයක්වේ. මේ සතර සංවර සීලයෙන් යුක්තවූවාහු වෙරල ඉක්මනොයන මුහුදමෙන් ජීවිත සඳහාත් ශික්ෂාපද ඉක්ම නොපවත්නාහ, එසේහෙයින් මේ සීලය සත්පුරුෂ සේවනය

සද්ධර්මශ්‍රවණය යොනිසොමනසිකාරය ධර්මානුධර්මප්‍රතිපත්තියයි යන මේ චතුර්විධධර්මප්‍රතිලාභයෙන්වූ ෂොඩශප්‍රඥාවෙන්මසිද්ධවන්නේයි එසේහෙයින් තුන්තරාබොධියෙන් එක්තරා බොධියකට පැමිණෙනු කැමති ශ්‍රද්ධාවත් ප්‍රාඥයන් විසින් නිත්‍ය පංචසීලයද පොහොය අෂ්ටාංගසීලයද වියයිඇති දසසිල් දු රැක කුසල එලම්ද ගත මනාමය ප්‍රව්‍රජිත කුලපුත්‍රයන් විසිනුදු වත්ත ප්‍රතිවත්තයෙහි හැසිර ප්‍රතිපත්ති පූජාවෙන් බුදුන් පුදමින් සිල් මල සොඩා පිරිසිදු සීලයෙහි පිහිටා සීලසංරක්ෂණය කටයුතු. දක්වනලදමැයි—

"සීලං සබ්බද්දං සෙඨං-සීලං කවච මුත්තමං,
සීලං සාධුතරං තාණං-එතන සීලං සුරක්කතං."

මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
ශරණශීල ප්‍රභෙද කථා නම්වූ
## පන්තිස්වන පරිච්ඡෙදය
කියා නිමවනලදී.

---

## 36 වෙනි පරිච්ඡෙදය.

තවද මේ සද්ධර්මරත්නාකරයෙහි
දානාදි කුශල කර්මසංග්‍රහ කථානම් කවරහයත්?

කෙසේදයත්? දානයනම්, අනන්ත අප්‍රමාණවූ දශවිධවූ රත්නාදි සර්වෝපකරණ පරිත්‍යාගයන් දානයයිකීවාහුයි දානයනම් දස පාරමිතාවෙන් ප්‍රථම පාරමිතාවය, සතර සංග්‍රහ වස්තුවෙන් පළමුවන සංග්‍රහවස්තුවය, ත්‍රිවිධපුණ්‍යක්‍රියා වස්තුවෙන් පළමුවනපුණ්‍ය ක්‍රියා වස්තුවය, දශරාජ ධර්මයෙන් පළමුවන රාජධර්මය. එසේ හෙයින් මේ දානය සප්තවිධ කාම ස්වර්ගයෙහි සියලු සම්පත්ම සිද්ධ කොට දෙන චින්තාමාණික්‍යයක් වැන්න. එසේහෙයින් මේදානය දායක ශුද්ධියෙන්ද ප්‍රතිග්‍රාහක ශුද්ධියෙන්ද දාන ද්‍රව්‍ය ශුද්ධියෙන්ද මහත්ඵල විද්‍රවන්නේයි. එබැවින් දානය දෙන්නාවූ දායකයෝ: දානදාසය, දානසහාය, දානපතීයයි තුන්දෙනෙක්වෙත්. යමෙක් මධුරවූ වස්තුව තෙමේ වළඳා අමධුරවස්තුවක් දන්දෙන්නේවීනම් හේ දානදාසනම්වෙයි. යමෙක් මධුරවූහෝ අමධුරවූහෝ තමා අනුභවකරනලෙසම දන්දෙන්නේ වීනම් ඒ පුරුෂතෙම දානසහාය නම්වේ. යමෙක්තෙමේ අමධුරවස්තුව අනුභවකොට මධුරවස්තූන්

සපයා දන් දෙන්නේවී නම් ඒ පුරුෂතෙම දානපති නම්වේ. එක්
තැනෙක වැස එක්තැනෙක්හි නොවස්නා මේඝයක් මෙන් එක
තැනකටම දන් දෙමින් සෙස්සන්ට නොදෙනුයේ දන් දීමෙනුදු
පක්ෂග්‍රාහීහෙයින් කරුණා කුශලඵලය ප්‍රදෙශ වර්ෂී මේඝනම්වේ.
චාතුර්ද්වීපිකමහාමේඝයක්හැමතැන්හිවර්ෂාකරන්නාක්මෙන්සියල්
ලවුන්ටම සම මෛත්‍රී කොට පිළිපැදෙන පමණකින් දන්දෙනුයේ
කුශල ඵල සර්වත්‍රවර්ෂී මේඝ නම්වේ වැසිනහා නොවස්නා මේඝ
මෙන් දන් දෙනුවන්මැ කිසිවක්හටත් ස්වල්පමාත්‍රයකුදු දන්නො
දෙනුයේ කුශල ඵල අවර්ෂී මේඝ නම්වේ. දන්දෙන්නවුන්විසින්
ත්‍රිවිධ චෙතනාවශුද්ධකොට දියයුත්තේය. කෙසේද? දන්දෙන්නාට
පූර්වභාගයෙහිමාදෙන්නේ මෙසේවූ කුශලඵලයක්ලබනදානයකැයි
සන්තුෂ්ට වියයුත්තේය දන්දෙමින්සිට මෙබඳුගුණඇති ප්‍රතිග්‍රාහ
කයන් විෂයෙහි මෙබඳුවූ දානවස්තුව දෙමින් නිධානකොට තබා
මත්තෙහි මෙහි ඵල බහුලව විඳිම්වයි චිත්තප්‍රසාද ඵලවා දන් දිය
යුත්තේය, දන්දෙමින් ඉක්බිතිවමාදුන්නේසාරවූ ප්‍රතිග්‍රාහකයන්
වහන්සේට මනාවූ දානවස්තුවෙකැයි සිතුසිතූ විටම සොම්නස්
වියයුත්තේය, මේ ත්‍රිවිධ චෙතනාවෙන් ශුද්ධවූ දානය දානසම්පදා
නම් වේ. **එයින් කීහ.**

"පුබ්බෙව දානා සුමනො-දදං චිත්තං පසාදයෙ,
දත්වා අත්තමනො හොති-එසා යඤ්ඤස්ස සම්පදා" යි.

යමෙක් තෙමේ දන් දෙන කල්හි අනුන් සමාදන් නොකරවා
තමාශක්තීන් උපයාගත්දෙයම දන්දේද? හෙතෙම මහත්වූ භොග
සම්පත්තිය ලබන්නේය, පරිවාර සම්පත්තිය නොලබන්නේය යම්
සත්වයෙක් තෙමේ දන්දෙමියි කියා බොහෝදෙන සමාදන් කරවා,
ඔවුන්ගෙන් බොහෝ වස්තු උපදවාගෙන එපමණක්ම දන්දෙමින්
තමාඋපයාගත් දෙයින් ස්වල්පයකුත් දන්නොදේද? හෙතෙමපරි
වාර සම්පත් ලබනමුත් භොග සම්පත් නොලබන්නේය. යමෙක්
තෙමේතමා ස්වශක්තීන්සොයාගත්තාවූ භොගයෙනුත්දන්දෙමින්
සමාදනුදු කරවා දන්දේද, හෙතෙමේ භොග සම්පත්තියත් ලබන්
නේය පරිවාරසම්පත්තියත්ලබන්නේය. යමෙක්තෙමේ තමාගේ
වස්තුවකින් දානයක්නොදේද, අනුන් සමාදන්කරවාත් නොදේද,
ඒ මනු පුරුෂතෙමඋපන්උපන්ජාතියෙහි භොග සම්පතුදු පරිවාර
සම්පතුදු නොලබන්නේමැයි. ප්‍රසන්න චිත්තයෙන්ශුද්ධකොටදන්
දෙන්නාවූ සත්වතෙම බොහෝදෙනාට ප්‍රියවන්නේය සජ්ජන සම්
ගමලබන්නේය. ඔහුගේකීර්තිය දශදිශාවේපවත්නේය,ගෘහස්ථධර්ම
යෙන්පහනොවමනොනසඳනසැප විඳින්නේය,මේආත්මභාවයෙන්

මත්තෙහි දිව්‍යලෝකයෙහි ඉපිද අපමණ දිව්‍යසම්පත් විඳින්නේය. මේ දානයෙහි පංචානිසංස නම්වේ.

යමෙක් තමාම් තමා දෙන්නාවූ දානය කර්මඵල ගුණ අදහා ආගන්තුකයන්නට දේද, ගමිකයන්හට දේද, ගිලනක්හට දේද, දුර්භික්ෂයෙහි දේද, ශස්‍යයක් කොට එයින් ඵලලූකල ප්‍රථමයෙන් අග්‍රදානය සිල්වතුන්නට දේද, මේ කාලදාන නම්වෙයි. යම් සත්ත්වයෙක් තමා දෙන්නාවූ දානය නොසකස්කොට දේද, දෙන්නාවූ දෙය්‍ය ධර්මයෙහිද ප්‍රතිග්‍රාහකයන් කෙරෙහිද ආදර නොකොට දේද, මේ දානය නොපි දෙමයි කියා අනුන් අතින් දෙවාද, දමනදෙයක් මෙන් කාලකින් කාලක දෙනුයේද, නිරාදරව දේද, ආගාමිඵලයෙහි ආදර නැතිව දේද, මේ අසත්පුරුෂ දාන නම්වෙයි. යම් සත්ත්වයෙක් තෙමේ තමා දෙන්නාවූ දානය සකස්කොට දේද, දෙය ධර්මයෙහි ගෞරවයෙන් ප්‍රතිග්‍රාහකයන් පරීක්ෂාකොට දේද, ආදිකෙලවරක් නොපෙනෙන්නාවූ සංසාරචාරකයෙහි ව්‍යුත්ප්‍රසක්ති වශයෙන් සංවරණය කරනකල්හි අප්‍රමාණ ජාතිවල සකසකයන් නොමඇතිව ජනිතවූ ජාති පමණ නැත. එසේහෙයින් දුන් මේ දෙයධර්මය ශුද්ධවූ ප්‍රතිග්‍රාහක ක්ෂෙත්‍රයෙහි සපිරකොට පිහිටුවන්නෙම් අනුන් ලවා නොදෙවා ස්වහස්තයෙන්ම දුනමැනවැයි සිතා තමාගේ අතින්ම දුන් දේද, කලින් කලෙක නොදී නිරන්තරයෙන් දුන් දේද, අනාගතයෙහි තමහට උපදිනා කර්මඵල අදහා දේද, මේ සත්පුරුෂ දාන නම්වේ. යමෙක් ශ්‍රද්ධාවෙන් දුන් දෙන්නේවී නම් ශුද්ධවූ කුල ශීල ඥානගුණයෙන් සියලු සත්ත්වයන්ට ප්‍රියවන්නේයි මහා භොගද ඇති වන්නේයි. යමෙක් සකස්කොට දුන්නේවී නම් ඔහුගේ පුත්‍ර දාර දාසකර්මකරාදීහු කීකරු වන්නාහ. කාලයෙහි දුන්දුන්නේ පැමිණි පැමිණි කල්හි මහා භොග ඇතිවෙයි. භොග අනුභව කරන්ට නිසි වයස ඔහට උපදනාවූ සකල සම්පත්තීහු විපුලව උපදිති. මාත්සර්‍ය්‍යයක් නැත්තාවූ ශුද්ධ චිත්තයෙන් දුන් දුන්නේ වී නම් උදාරවූ පඤ්චකාම ගුණයෙන් පරිභොගයට සුදුසු වස්තූන්ගේ ප්‍රතිලාභයට චිත්තය නමනු වන්නේය. තමහටද අනුන්ටද වෙහෙස නොකොට දුන්දුන්නේවී නම් මහාභොගද වෙයි. ඔහුගේ සම්පත් තියට ගින්නෙන් දියෙන් සොරුන් සතුරන්ගෙන් රජ්ජුරුවරජ මහ ඇමතියන්ගෙන් භයක් නොවන්නේය. මෙසේ සත්පුරුෂදාන නම්වෙයි.

තවද මේ ලෝකයෙහි දානයයි දෙන්නාවූ මද්‍යදානය, සමජ්ජ දානය ස්ත්‍රීදානය, වෘෂභදානය, චිත්‍රකර්මාන්ත දානයයි පසක්වේ. එයින් මද්‍යදානය නම්, සුරාබීජ ආදිකොට මෙරය ක්‍රදමා සුරා කිරීමට නිසි වස්තූන්ගෙන් රා බොන්නවුන් සතුටු කරවා කුශල

ඵල ලබම්හයි දන්දීමය. සම්පජ්ජ දානය නම්, නෘත්‍යකාරාදීන්ට
භොග දෙමින් පින් පිණිසයයි කියා නෘත්‍ය ගීත වාද්‍ය යොදවා
අනුන් බලන ලෙස සලස්වා ඔවුන්ට නෘත්‍ය ගීත වාද්‍යාදිය දන් දී
මය. සත්‍රී දානය නම්, අම්බලම් ශාලාවීථි ආදියෙහි යෞවනයෙන්
යුත් ස්ත්‍රීන් භොගදී රඳවා ඔවුන්ට වස්ත්‍රාභරණ අන්නපානාදියදෙ
මින් නිරන්තරයෙන් ඔවුන් සැරහී සිටිනා ලෙස සලස්වා කුසල්
පිණිසයයි සත්ව සාමාන්‍ය කොට දන් දීමය. වෘෂභ දානනම්, ගොයූ
ථ වල ගර්භග්‍රහණය පිණිසයයි වෘෂභයන් විසර්ජනයකෙරමින් දාන
ය පිණිසයයිපැවැත්වීමය, චිත්‍රකර්මාන්තදානයනම්, යෞවනමෙදම
ප්‍රභූත අවිවෙකිතායුත්ජනයන්විසින්සෙවනානුකූලවූ වනශාලා
පානීය මණ්ඩප පුස්කරණී නීවිශාලාඋද්‍යාන ශාලාදීවූ තන්හිදෘෂ්ට
ජන විනෙතනෝන්මාදකරවන මෛථුනධර්මසමායොජිත නානාකාර
ප්‍රමදා පුරුෂස්වරූප ප්‍රතිභාගම්චිත්‍ර චිත්‍ර කර්මාන්ත කරවා දානයයි
පැවැත්වීමයයි කියත්. මේ පසම් දන් පිණිස යයි පැවත්වීම
නොවටනේයයිකියත්. එතකුදුවවුත් සෙසුසතර ගැර නෘත්‍ය ගීත
වාද්‍යාදිය පූජා පිණිස කරවනලද්දේ මහත්වූ කුශල ඵල දෙන්
නේයයි සිවලී සර්ව්‍රපාදනයෙහි කියනලදුයේ මැයි. කෙසේද?
යටගිය දවස අත්ථදර්ශී නම් බුදුරජාණන් වහන්සේ අනුපාදිශෙෂ
නිර්වාණ ධාතුයෙන් පිරිනිවන් පෑ නොබෝකලකින් වරුණ නම්
දිව්‍යරාජයෙක් සපිරිවරින් භෙරි තූර්‍ය භාණ්ඩාදීන් සජ්ජිතකොට
ගෙණ ඒ බුදුන් සපිරිවර පස්මරුන් බිඳ ජයගෙන බුදුවන්ට පිටදී
වැඩහුන් සඳුනුරු ශ්‍රීමහාබෝධීන් වහන්සේ ලඟට ගොස් සජීව
සම්‍යක්සම්බුඬරාජොත්තමයාණන්වහන්සේයහිතවූබොධින්වහන්
සේ දුටුවාක්මෙන් මහත්වූ ප්‍රීතීන් මත්ව තමා පිරිවර කොටනිරන්
තරයෙන් සිටිනාවූ නෘත්‍යගීත වාද්‍යාදීන් ඒවම්පෙයය බොධින්ව
හන්සේටපූජාකොටඒබොධීන්වහන්සේගේ සමීපයෙහිම මළුයෙහි
පලක් බැඳ මහත්වූ ප්‍රීතීන් බොධින්වහන්සේ බලබලාහුන්නේය,
ඒ වරුණ නම් දිව්‍යරාජතෙම එදවස් එවෙලාවට තමාගේ ආයුෂය
පිරිහුණු හෙයින් එනැන්හිම කාලක්‍රියාකොට නිර්මාණරති නම්
දිව්‍යලොකයෙහි යොදුන් ගණන් උසඇති දිව්‍යප්‍රාසාදයෙක දිව
සෙන් පිරිවරා ඉපද දිවසැපැත් ලදහ. දක්වනලදමැයි ථෙරාපද
නයෙහි—

"වරුණෝ නාම නාමෙන-දෙවරාජා අහං තදා,
උපට්ඨෙහිං සම්බුඬං-සයොගබලවාහනො.
නිබ්බුතෙ ලොකනාථම්හි-අත්ථදස්සීනරුත්තමෙ,
තුරියං සබ්බමාදාය-අගමං බොධිමුත්තමං.

වාදිතෙන ච නච්චෙන-සබ්බතාලා සමාහිතො,
සම්මුඛං වීය සම්බුද්ධං-උපගිං බොධිමුත්තමං
උපඨිත්වා තං බොධිං-ධරණීරුහ පාදපං,
පල්ලඞ්කං ආභුජිත්වාන-තත්‍ථ කාලං කතො තදා.
සකකම්මාභිරුළ්හො සො—පසන්නො බොධි මුත්තමෙ,
තෙන චිත්තප්පසාදෙන—නිම්මාණං උපපජ්ජසං.
සඨි තුරියසහස්සානි—පරිවාරෙන්ති මං තදා,
මනුස්සෙසු ච දෙවෙසු—වත්තමානෙ භවා භවෙ."

යනාදීන් මේ භද්‍රකල්පයට පන්සියයක් වන කප්පෙහි පටන් මෙතැන් දක්වා නරක තිර්‍යක් ප්‍රෙත අසුරකායයි යන සතර අපායට නොගොස් අප බුදුන්සමයෙහි සසුන්වැද මහණවකෙලෙසුන් සිඳ අමාමහ නිවන්දිටිමියි කියා ප්‍රකාශකරන් නාවූ ඒසිවලී ස්ථවිර යන් විසින්ම කියනලදී.

"ස්වාගතං වත මෙ ආසි—බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා—කතං බුද්ධස්ස සාසනං."

යනාදීන් තමන්වහන්සේ නෛර්‍යාණිකවාද්‍යයෙන් සපු බොධීන් වහන්සේට පූජාකරවීමෙන් ලත් කුශල ඵලය ප්‍රකාශ කොටමෙසේ දක්වූසේක.

තවද ශ්‍රමණ බ්‍රාහ්මණ කෘපණ අඩිකවණිබ්බකාදීවූසොලොස් වැදෑරුම්වූ යාචකයන්ට මහදන් පවත්වා මහත් ශ්‍රද්ධාවෙන්සාධාරණකොට දීමද, පහෙනක දනයද, ආගම ශ්‍රද්ධාය අධිගම ශ්‍රද්ධායඅවකල්පන ශ්‍රද්ධාය ප්‍රසාදශ්‍රද්ධායයිසිවතුර්විධ ශ්‍රද්ධාවෙන්දන්දීමයි. ආගම ශ්‍රද්ධානම් සම්‍යක්සම්බොධි සත්වයන් අභිනීහාර කාලයෙහි පටන් එක්වම පැවැත්තාවූ ශ්‍රද්ධාය. අධිගම්ශ්‍රද්ධානම්ආර්‍ය්‍යශ්‍රාවකයන්සත්‍ය ධර්මප්‍රතිවෙධයෙන්ලද්දාවූශ්‍රද්ධාය. අවකල්පනශ්‍රද්ධානම් බුද්ධධර්මසංඝ යනතුනුරුවන් කෙරෙහි අවකල්පන ස්වභාවයෙන් කරනලද්දාවූ ශ්‍රද්ධාය, ප්‍රසාදශ්‍රද්ධානම් ප්‍රසාදෙත්පත්තීන් ජනිතවූශ්‍රද්ධායි. මෙබඳුවූ ශ්‍රද්ධා ඇත්තාහු භික්ෂූන්වහන්සේ සිඟාවඩනා දැක පෙර ගමන් කොට උන්වහන්සේ ඉදිරිව වඩනා කල්හි පසුපස්සෙහි අනුව එමින් ආසන ශාලාවෙහි වැඩසිටුවමින් භොජනශාලාවහැමද පිරිබඩ ආදිය ගන්වමින් අසුන් පනවමින් පැන් පෙරා තබමින් දැවටු දඬු ආදියද එලවා තබමින් කුශල් පුරනුයේ කායින් කුසල් පුරන්නේ නම් වෙයි. තවද භික්ෂූන්වහන්සේ සිඟාවඩිමින්ආහාරයනොලැබ කැලඹුණාවූ ඉන්ද්‍රියන් ඇතිව වඩනා ශ්‍රාන්තභාවය දැක කම්පිතවූ සිත් ඇතිව තෙමේ කිසිවක් දිගනන්නාහෙනු යේඑම්බෑණ්‍

පුරුෂයෙහි මූන්වහන්සේට කැඳතක් පිළිගන්වාලව, ඛාද්‍ය භොජ්‍යයන් පිළිගන්වාලව, ආහාරයක් පිළිගන්වාලව, ව්‍යඤ්ජනයක් පිළිගන්වාලව, ගිතෙල් මධු ශක්කරාදිය පිළිගන්වාලවයි යනාදීන් කියාද, දහගප් මහබෝ පිළිම ආදියට සුවඳමල් පහන් පූජාකරවයි කියාද, සත්පුරුෂයෙනි පන්සිල් රකුව, පෙහෙවස් රකුව, දසසිල් රකුව, බණඅසව, චෛත්‍යබෝධි ප්‍රතිමාගෘහ ආදිවූ සිද්ධස්ථාන වඳුවයි යනාදීන් ශ්‍රද්ධාධ්‍යාශයෙන් කියන්නාවූ පුරුෂතෙමවචනයෙන් කුසල් රැස්කරන්නේ නමවේ. තවද භික්ෂූන්වහන්සේ සිඟාවඩිනා දැක මූන්වහන්සේ ආහාරයක් ලත්සේක් වීනම්ඉතාම යහපතැයි සිතාද යහපත්වූ චීවරයක් හෝ නොහොත් කප්පිය භාණ්ඩයක් ලත් සේක්වීනම් යහපතැයි සිතනුයේ සිතින් පින් රැස්කරන්නේ නම් වේ. මෙබඳුම කුසලයන්වරදවා සිතනුයේ අකුසල් රැස්කරන්නේ නම්වේ, තවද බාලදරුවෝ දෙමව්පියන් ධාතු පෙති පිළිමවඳිනා දැකඑසේමඅපිත්දෙමව්පියන් කාරණදැකරම්හයි කියා ධාතු පෙති පිළිම වඳිත්ද, පුෂ්ප පූජා කෙරෙද්ද, මෙබඳුම කරනුයේ කුසලයයි නොදන්නාහටද කුශල චේතනායම වන්නේයි තිරශ්චීනාදිවූ මෘග පක්ෂීහුද තිරිසන් සත්වූ වවුලන් ඇසූ බණ මෙන් ධර්මය අසත්ද, සංඝයා වඳිද්ද, දැක සතුටුවෙත්ද, මෙසේදැනදනොදැනද මඤ්ඤනාදීවූ සුකෘත කර්මයන් කරන්නාවූ තිරිසනුන්ට කුශලචේතනායම වන්නේය. තවදබාලදරුවෝඅතින් පයින් මව්පියන් පහරිද්ද, භික්ෂූන් දැක කිපි සිතින් ගසන්ට අත ඔසවද්ද, ගලින් ගසද්ද, ආක්‍රොශකොට බෙණෙද්ද, ගවයෝ භික්ෂූන් දැක එලවා හයගන් වද්ද, සිංහ ව්‍යාඝ්‍රාදීහු පස්‍රපස්සෙහි ලුහුබඳවා භික්ෂූන්ට බොහෝ අනය ව්‍යසනය කෙරෙද්ද, දැනද නොදැනද ඔවුන් මෙසේ කල කල්හි අකුශලකර්මයම සිඬවන්නේයි. නොදන්නාහු විසින්කරන ලද්දවූ කුශලකර්මයට වඩා දන්නාහු විසින් කරනලද්දවූ කුශල කර්මය මහත්ඵල මහානිසංසවන්නේයි. යම් සත්වයෙක්හට ශ්‍රද්ධාය, ශීලය, ශ්‍රැතය, ත්‍යාගය, ප්‍රඥාය යි කියනලද පඤ්ච ධර්මයෝබහුල වෙත්ද, ඒසත්වතෙම කුශල් කොට ප්‍රාර්ථනා නොකෙළේද, ඔහුගේ ඉපදීම අසවල් තැනකයයි නියම නොවන්නේය. මේ පඤ්ච ධර්ම යෙන් හීනවූ යම් සත්වයෙක් කුශල්කොට ප්‍රාර්ථනා කෙළේද, ඔහු උපදනාවූ ස්ථානයද අනියම වන්නේය, කිසියම් සත්වයෙක්හට ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥායයි යන පඤ්ච ධර්මයෝ ඇද්ද, හෙතෙම දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීවූ කිසියම් සුගති සම්පත්තියක් ලබම්වයි ප්‍රාර්ථනාකෙළේ වීනම් ඔහු ඒ ප්‍රාර්ථනා කළ කළෙයම සිතූයම්තැනක ඉපදීම නියතගතිවන්නේය, යම්සේ අහසට දැමූදඬු කැබැල්ලෙක් අගින් හෝ මුලින් හෝ මැදින් හෝ බිම වැටෙතියි යන එක්තැන

කැයි නියම නැද්ද, එසේම සත්වයන්ගේ ප්‍රතිසන්ධිග්‍රහණය නියමයක් ඇත්තේ නොවෙයි. එසේහෙයින් කුශල කර්මයක් කොට යම් දිව්‍ය මනුෂ්‍යාදි සම්පත්තියක් ලබම්යි ප්‍රාර්ථනාමකට යුක්තතේය, එසේ ප්‍රාර්ථනා කරතත් මේපසඳුව ධර්මයෙන් යුක්තවම ප්‍රාර්ථනාකළහොත් ඔහු සිතූ යම්ම තැනක උපදනේයි.

තවද දාන විශුද්ධිහු චතුර්ප්‍රකාරවෙත්? කෙසේද, කිසි දානයෙක් දායකයන්ගෙන් විපාක මහත් වන්නේය, දන් පිළිගන්නවුන්ගේ වශයෙන් නොවන්නේය, කිසි දානයෙක් පිළිගන්නාවුන්ගේ වශයෙන් මහත්පලවන්නේය, දෙන්නවුන්ගේ වශයෙන්නොවන්නේය, කිසිදානයෙක් දායකයන්ගේවශයෙන්ද ප්‍රතිග්‍රාහකයන්ගේ වශයෙනුදු මහත් පල දෙන්නේය, කිසිදානයෙක් තෙම දායකයන්ගේ වශයෙන්ද ප්‍රතිග්‍රාහකයන්ගේ වශයෙනුදු මහත්පල නොදෙන්නේයි, මෙසේ දක්ෂිණා නොම් චතුර්විධ වන්නීය, ඔවුන් අතුරෙහි කිසි කල්‍යාණ පුරුෂයෙක් දායක වේද, පාපධර්මීවූ ප්‍රතිග්‍රාහකයක්හට දානය දේද, ඒ දානය දායක ශුද්ධින් මහත්ඵල වෙයි. ප්‍රතිග්‍රාහකයාගේ වශයෙන් නොවේ මේ එසේමය, වෙස්සන්තර මහරජතෙම ජූජක බ්‍රාහ්මණයාහට තමාගේ ප්‍රියවූ දරුදෙදෙන දන් දුන්නේය, එකල්හි මහපොළව දානානිසංසයෙන් ශතසහශ්‍ර රාව පවත්වමින් කම්පිත වූයේය, ඒ ජූජකයා පාපධර්මිවූවද දායකවූ වෙස්සන්තර මහරජාණන් කල්‍යාණ පුරුෂව සිට කලණ අදහසින් දන් දුන් බැවින් මහත්ඵල වූයේය, ප්‍රතිග්‍රාහක වශයෙන් නොවේ. තවද කිසිවෙක් තෙමේ අධර්මිෂ්ඨව කිසිගුණලවයක් නැතිව සිට සිල්වත්වූ ධර්මිෂ්ට කල්‍යාණ පුරුෂයක්හට දන්දුන්නේ වේද, ඒ දානය පිළිගත් සත්පුරුෂයාගේ වශයෙන් මහත්ඵල මහානිසංස වෙයි, දායකයාගේ වශයෙන් නොවේ. තවද කිසි දායක ප්‍රතිග්‍රාහක දෙදෙනම අධර්මිෂ්ඨ පාප ධර්මයෙහි ප්‍රතිෂ්ඨිතාහුද, ඒ දානය දන්දෙන්නවුන්ගේ වශයෙන්ද පිළිගන්නවුන්ගේ වශයෙන්ද, මහත්පල නොදෙන්නේයි, කුමක් මෙන්ද, වඩ්ඪමානවාසි ලුද්දකයාහට මෙනි, ඒ වඩ්ඪමානක නම්වූ වැදිතෙම ප්‍රේතයන්ට පත්තිදානයක් දෙනුයේ, එක් දුස්සීලයක්හට තුන්වාරයෙක දන්දෙමින් ප්‍රේතයක්හට පින්පෙත් දුන්නේය, ඒ තුන්වාරයෙහි දානයෙන්ම ප්‍රේතයාහට පත්තිප්‍රාප්ත නුවූයේය, එසඳ තුන්වාරයෙහි ඒ අමනුෂ්‍යතෙම දුස්සිලයෙක් මාළුදෙසා දෙන්නාවූ දානය නොපැමිණෙන ලෙස විලුම්පනය කරන්නේයයි මහත්කොට හඬගැසීය. එකල්හි ඒ වැදිතෙම සිල්වත් භික්ෂූන්හට දන්දෙමින් ඔහට පින් පෙත් දුන්නේය, එකල්හි යක්ෂයාහට දානපලයපැමිණියේයි, තවද කිසිවෙක් තෙමේසිල්වත්ව ධාර්මිකවකල්‍යාණපුරුෂව සිට එසේම

සිල්වත්වූ ධාර්මිකවූ කල්‍යාණ පුරුෂයක්හට දන් දුන්නේවිනම් එ දානය දායකයාගේ වශයෙන්ද පිළිගන්නවුන්ගේ වශයෙන්ද ශුද්ධ වේ. කෙසේද? සැවැත් නුවරදී මල්ලිකා දේවින් කිලෙසම කොසොල් මහරජහුදුන් අසදෘශ මහාදානයමෙනි මේ චතුර්විධවූ දක්ෂිණා විශුද්ධි නම් වේ.

මේ දානයෙහි විශෙෂ සම්‍යක්සම්බුද්ධරාජෙත්තමයාණන්වහන්සේගෙන් අසනු පිණිස එක්සමයෙක්හි සුමනා නම් රාජකුමාරිකාවක් පන්සියයක් රථ පිරිවරා මහත් උත්සවයෙන් ජෙතවන විහාරයට ගොස් පන්සියයක් කුමාරිකාවරුන් පිරිවරා බුදුන් කරා එළඹ වැඳ එකත්පස්ව හිඳ බුදුන්ගෙන් විචාරන්නී ස්වාමීනි භාග්‍යවත්වූ බුදුරජාණෙනි ඔබවහන්සේගේ ශ්‍රාවකයෝ දෙදෙනෙක් ශ්‍රද්ධාවෙන් සදෘශයෝය, සීලයෙනුත් සදෘශයෝය, ප්‍රඥාවෙනුත් සදෘශයෝය, ඔවුන් දෙදෙනා අතුරෙන් එක්කෙනෙක් තමන් ලද්දවූ කිසිවක් දන්දෙමින් අනුභව කෙරෙති, එක්කෙනෙක් ලත්දෙය කිසිවක් හවත් නොදීම අනුභව කෙරෙති, මේ දායක අදායක දෙදෙනම දිව්‍යලොකයෙහි උපන්කල දෙදෙනාගේ වෙනසක් ඇද්දැයි විචාළීය. මෙසේ විචාළාවූ සුමනා රාජකුමාරිකාවට බුදුහුවදුරනසේක්, සුමනාව අපරිභොග දුෂ්පරිභොග අස්ථාන නියොජිත ශ්‍රද්ධාදෙය විනිපාතනය කුලදූෂණයට නොපමුණුවා සාරාණීය ධර්මයෙහි සිටදන් දුන් දායකතෙම දිව්‍යායුෂයෙන්ද දිව්‍යවර්ණයෙන්ද දිව්‍ය සැපයෙන්ද දිව්‍යයසසින්ද දිව්‍යාධිපත්‍යයෙන්ද සෙසු දෙවියන් අභිභවමින් එදන් නුදුන් නාවූ දිව්‍යපුත්‍රයාද මේ පංචප්‍රකාරයකින් මැඩ පවත්වන්නේයැයි වදාළසේක. ස්වාමීනි එසේ කල්හි දෙදෙනා මනුෂ්‍යව උපන්කල්හි විශෙෂ කිම්දැයි විචාළීය. එසඳ මෙසේ විචාළාවූ සුමනා රාජකුමාරිකාවට බුදුහුවදුරනසේක්, සුමනාව එ දෙදෙනාගෙන් දායක පුරුෂතෙම මනුෂ්‍යආයුෂයෙන්ද මනුෂ්‍ය වර්ණයෙන්ද මනුෂ්‍ය සැපයෙන්ද මනුෂ්‍යයසසින්ද මනුෂ්‍ය ආධිපත්‍යයෙන්දැයි යන මේ පඤ්චප්‍රකාරයෙන් සෙසු ජනයන්ද මේ අදායකපුරුෂයාද අභිභවමින් තෙමේ ජොතිමත්ව බබලන්නේයයි වදාළසේක. නැවතත් විචාරන්නී ස්වාමීනි ඒදෙදෙනාම පැවිදිවූ කල්හි දෙදෙනාගේ විශෙෂ කිම්දැයි කීවුය, එසඳ බුදුහු වදාරනසේක්, සුමනාව දායකතෙම බක්කුල ස්ථවිරයන්මෙන් ශිකිල් මහතෙරහු මෙන් අකාඳ මහතෙරුන්මෙන් පිළින්දිවච්ඡ මහ තෙරුන්මෙන් චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යයයයි සතර චාතුර්විධ ප්‍රත්‍යයෙන් අදායකයාහට වඩා අග්‍ර ලාභී වන්නේයයි වදාළසේක. නැවත රාජකුමාරිකා කියන්නී ස්වාමීනි මේ දායකඅදායක දෙදෙනා වහන්සේ රහත්වූකල වෙනසෙක් ඇද්දැයි විචාළී.

එබසට බුදුහුමදුරණසේක්, සුමනාව ඒදායක අදායක දෙදෙනාම රහත්වූකල කිසි ගුණානුභාවයකින් වෙනසක් නොම ඇත්තේ යයි වදුරා මමයේ දානය නිවන්දක්නා ජාති දක්වා විශිෂ්ටවූ ඵල දෙන්නේයයි වදාළසේක, මෙසේ දානයෙහි ඵල සුමනා රාජකුමාරිකාවන්ට වදුරා නැවත භික්ෂූන්වහන්සේට වදාරණසේක්, එම්බා මහණෙනි මේ ලෝකවාසී සත්වයෝ මා සේම දානයෙහිඵල දනිත් නම් මඳක් ලදත් දන් නොදී අනුභව නොකෙරෙති, ලෝභිවූ කිලුටෙක් ඔවුන්ගේචිත්තයෙහි බැඳව නොසිටීනේමය. දානයෙහි අනුසස් දන්නා සත්වයෝ ආලෝපයක් පමණද බත්සරලුවක් පමණද එයින් වැඩියක්ද ලද්දාහු වීනම් බෙදා නොදී අනුභව නොකරන්නාහුයයි වදාළසේක.

තවද මනාපවූ වස්තුවක් දන්දුන් සත්වතෙම මනාප වස්තූන් ලබන්නේය, අග්‍රදානයක් දුන්නාවූ සත්වතෙම අග්‍ර වස්තූන් ලබන්නේය, උතුම්වූ දානයක් දුන්නේ උතුම්පදවියට පැමිණෙන්නේය ශ්‍රේෂ්ඨවූ දානයක් දුන්නාවූ සත්වතෙම ශ්‍රේෂ්ඨවූ පදවි ප්‍රාප්ත වන්නේය, ඔහුට උපනුපන් තන්හි දීර්ඝායුෂ හා මහත් යසස් තේජස් ඇතිවන්නාහුයයි වදාළසේක, ඒවව භගවනු පිණිය උග්‍රදෙවපුත්‍රයාහට වදාළේ මැනනා.

"මනාපදායී ලභතෙ මනාපං - අග්ගස්ස දාතා ලභතෙ පුනග්ගං,
වරස්ස දාතාවරලාභි හොති - සෙට්ඨං දදෙ සෙට්ඨුපෙති ඨානං.
යො අග්ගදායී වරදායී - සෙට්ඨදායී ච යො නරො,
දීඝායු යසවා හොති - යත්ථ යත්ථුපපජ්ජති" යි

යනාදීන් දානයෙන්සිද්ධනොවන්නාවූලෞකිකලෝකෝත්තර සම්පත්තියෙක්නම්නොම ඇත්තේය. කවරේද? ශක්‍රසම්පත්තිදෙන්නේය, මාරසම්පත්තිදෙන්නේය, බ්‍රහ්මසම්පත්තිදෙන්නේය, චක්‍රවර්ති සම්පත්තිදෙන්නේය, ශ්‍රාවක පාරමිතා ඥානය දෙන්නේය, ප්‍රත්‍යෙක බොධි ඥානය දෙන්නේය, සම්‍යක්සම්බොධි ඥානයදෙන්නේයයි වදාළසේක.

තවද දානයෙහිවිභාගනම්කවරනයත්? ජම්බුද්වීපයෙහිවාරවතී නම් නුවර වාසුදෙවය, බලදෙවය, අර්ජුනය, ප්‍රද්‍යුම්නය, චන්ද්‍රදෙවය, සුසීදෙවය, සඟදෙවය, අග්නිදෙවය, සනය, අංකුර යයි යන රජහු දසබෑනෝකෙනෙක් වූහ. ඒදසබෑ රජදරුවෝම සවකීයවූ සේනාවාහන සන්නාහව ඒ ඒ දිශාවෝස් තෙසැට දහසක් රාජධානි හැම යුධයෙන් ජයගෙන ජම්බුද්වීපය තමන් නතුකොට වාරවතී නුවරටම අවුත්වෙසෙමින්ජම්බුද්වීපය දසකොටසක්කොට බෙදාගත්හ. එකල්හි එයින්කොටසක් ලබන්ට සුදුසුවූ දසබෑයන් වම බුහුන්වූ අංජන දේවීන් සිහි නොකළහ. එකල්හි ඔවුන් හැම

දෙනාහටබාලවූ අඞ්කුරනම් රජතෙම තමා ලත්භාගය තමන්ගේ බූනැණියන්ටදෙමින් තෙමේ වෙළඳාම්කොට රැකෙමියි කියා තමා ලත් රාජ්‍ය කොට්ඨාසය බූහුනැණියන්ට දීන. මෙසේතමාගේ රාජ්‍ය කොට්ඨාසයදෙමින් තමන්ගේවැඩිමාලූදස බෑදෙනාට කියන්නාහු තොප සන්තක ජනපදවලට මාගෙන් වෙළඳාමෙහි ගියවුන්අතින් සුංගම්නොගනුවයිකියා ඔවුන් ගිවිස්වා අරවාගෙන ඒ අඞ්කුරරජ තෙම වෙළඳාමෙන්ජීවත්වන්නේය. එකල්හි වාසුදෙවනම් මහරජ තෙම තමාගේ දාසයක්හු භාණ්ඩාගාරික ස්ථානාන්තරයෙහි තබා ඔහට කුලදුවක් ගෙන්වා පාවාදින. ඒ කුලදූ තොම ඒභාණ්ඩාගාරිකයාහට පුතකු වැදූව ඒ පුත්‍රයා වැඩි වඩිනාවූකල්හි පිතෘතෙම කාලක්‍රියාකොලේය. ඔහුගේ අභාවයෙහි වාසුදෙව නම් මහරජතෙම භාණ්ඩාගාරික තනතුරු පුත්‍රයාහටම දුන්නේය. ඔහු මහත් ඓශ්වර්යයෙන් යුක්තව රජකුලෙහි පැලඹෙමින් ඇවිදිනා කල්හි ඔහුගේ පිතෘ පක්ෂය තොරතුරු මඳක් දන්නාහු: එපවත් මඳින් මඳින් කියනා කල්හි ප්‍රසිඩව එපවත් නිශ්චය කරනු පිණිස අඤ්ජන දෙවීන්සමීපයට ගොස් ස්වාමිනී නුවරවාසීන් සිතට කාංක්ෂාවෙක් උපන, ඒ කාංක්ෂාව දුරුකළ මැනවැයි කීහ. අඤ්ජනදෙවීඑපවත් අසා කිමෙක්ද තොප සිතට උපන් කාංක්ෂාවෙක් නමැයි විචාළහ එබසට නුවරවාසීහුකියන්නාහු: දෙවීන්වහන්සමේකුමාරයන්ගේ කුලදොෂයකින් සැකයෙක් උපනැයි කීහ. එසඳ අඤ්ජන දෙවී නුවරවාසීන්ට සිඛවොපමාව කියා ඔහුගේ කුලදොෂය නිදොෂ කොරෙමින් කාංක්ෂා දුරුකළහ. ඒ භාණ්ඩාගාරික කුමාර තෙම මෙපවත් පළමු නොදන්නේ ප්‍රකාශවූපසු ඊට ලජ්ජාඇතිව ඒ චාරටිනී නුවර වසන්ට මැලිව නික්ම ගොස් රෞරුව නම් නුවර වැස සන්නාලි මෙගෙවරින් ජීවත්වන්නේය. ඒ රොරුව නම් නුවර වාසයකරන්නාවූ අසය්හ නම් සිටාණ කෙනෙක් බොහෝ යාචකයන්ට දන්වැටතබාදෙන්නාහ එකල්හි ඒතුණ්ණා දරුවාගේගෘහය සිටාණන්ගේගෙට පෙනෙනහැන වන්නේය යාචකයෝ බොහෝ දෙන අවුත් අසය්හ සිටාණන්ගේ ගෙට දන් පිණිස ගාමට මග කොසේදැයි විචාළකල්හි මේ තුණ්ණා දරුතෙම කුසීතනොවී ප්‍රසන්න චිත්තයෙන් අතදිගුකොට තෙමලෙ පෙනෙනන්නේ දනපතිවූ අසය්හ සිටාණන්ගේ ගෙයයි කියා දක්වන්නේය. මෙසේ දන්දෙන ගෙය මේයයි අතදිගුකොට පෑවාවූ කුසලානුභාවයෙන් ඒ ආත්මභාවයෙන් චුතව මයාන් කාන්තාරයක නුගගසෙක දෙවතාවඋපන. ඒ දිව්‍යපුත්‍රයා ඕසියම් කාරණාවෙක අතදිගුකළ කල්හි ඔහුගේ හස්තයෙහි පඤ්චාඞ්ගුලියෙන් කැමැති කැමැතිවස්තුව වගතයවන්නේය. ඔහුගේ හස්තය නම් එසේ කැමැති කැමැති වස්තු දෙන

බැවින් කල්පලතාවක් වැන්න මෙසේම මහත්දිව්‍යානුභාවයෙන් යුක්තව ඒ නුගවෘක්‍ෂ විමානයෙහි ඒ දෙවතාවෘ දිව්‍යසම්පත් විඳ වාසය කරනකල්හි එසමයෙහි වාරවත්නම් නුවරසිට පළමුකි අඞ්කුර රජු හා බමුණෙක් දහසක් ගැල් බඩු පටවා ගෙන කාම්බොජදෙශසට වෙළඳම්පිණිස යන්නාහුය. එකල්හි මෙසේ වෙළඳම් පිණිස යන්නාවූ ඒ දෙදෙනා සැටයොදුන් පමණ කාන්තාර භූමියට ගොසින් වත්හ. ඒ කාන්තාරභූමියෙහි ගමන්කරන්නාහු: දහවල් සූර්‍ය්‍ය රශ්මි තදව හුණුවූ වැල්ලෙහි යානොහැකි ගැල්යටවැද නිඳ රෑ රෑ ගමන්කරති. මෙසේ ගමන්කරන්නාවූ ඔහු කාන්තාර මධ්‍යයට පැමිණ ගෙනගිය ජලය නිම් කල්හි ගැල් අදිනා ගවයන් හා එහි මනුෂ්‍යයෝ පිපාසාවෙන් පීඩිතව තමන් යානොහෙනබව ඒ අංකුර රජහට කීහ. එකල්හි අංකුර රජතෙම කියනුයේ මේ කාන්තාරය වපිත් තිම්මක් දුක විලෙක් ඔයෙක් සෙවණෙක් පෙනේනම් බල්‍ාගෙනඑවයි අසුන්පිට්න් දූතයන් සතරදෙනෙකු සතරදිසාවෙහි නික්මවීය. ඔහු සතරදෙන මිගන් වෙග දන්වා අසුන් විඝිදුවාගෙන සතරදිසාවෙහි දිවමින් තුන්දෙනෙක් කිසි වකුත් නොදුක නැවත ආවාහුය. එයින් එකෙක් ඒ දිව්‍ය පුත්‍රයා වසන නුගය දුක අවුත් අංකුර රජහටකීය. එසඳ සපිරිවර රජු සහිත ගැල්දහසම ඒනුගරුක සෙවණට පැමිණ ශීතලච්ඡායාවෙහි මඳක් සැතපී හිඳ සිතන්නාහු: මෙබඳු ශාඛාවිටප සම්පන්නවූ නුග වෘක්‍ෂයෙහි මහෙශාක්‍ය දෙවතාවෙකු වසන්ට කාරණය, එසේ හෙයින් මෙබඳුවූ නිග්‍රොධයෙහි වසන්නාවූ දිව්‍යපුත්‍රයා විසින් අප හැම පිපාසාසන්සිඳුවාගන්නාලෙස සිහිලස ජලයක්දුන්නේවීනම් යහපතැයි සිතූහ එකල්හි ඒ නුගයෙහි වසන්නාවූ දිව්‍යපුත්‍ර තෙම අංකුර රජ්ජුරුවන් හැඳිනගෙන ඔවුන් කියන්නාවූ වචනය අසා ඔවුන් කෙරෙහි උපන්නාවූ මෛත්‍රියෙන් ඒ නුගගස විටපවය මැදින් දෙවතාවා දෘශ්‍යමාන රූපයෙන් සැදී පැහැදී සියල්ලවුන් ටම පෙනී පෙනී සිට තමාගේ කල්පලතාවක් වැනිවූ හස්තය දිගු කෙළේය ඒ දික්කළ අත පසඟිල්ලෙන්ම ආකාශ ගංගා පසක් හුණුවාසේ ජලධාරා බසින්ට වන, එකල්හි සපිරිවර මහරජතෙම කැමැති පරිද්දෙන් ජල ස්නාන පානයකොට නැවතත් සිතන්නා හු: මෙබඳුවූ දිව්‍යපුත්‍රතෙම භොජනයක්දුනිනම් යහපතැයිසිතූහ. උන් සිතූලෙසම දිව්‍යභොජනය පහළවිය. ඒදිව්‍යාහාරය අනුභව කොට නැවතත් අපහැම ඇඳපැලඳගන්නාලෙස දිව්‍යවස්ත්‍ර දිව්‍යා භරණ දිව්‍ය මාල්‍ාගන්ධ විලෙපනාදීසද දුනිනම් යහපතැයි සිතූහ, දිව්‍ය පුත්‍රයාණෝද ඔවුන් සිතූලෙසම දිව්‍යවස්ත්‍ර දිව්‍යාභරණ දිව්‍ය මාල්‍යගන්ධ විලෙපනාදිය දුන්හ, නැවතත් සිතන්නාහු අප හැම

සැතපෙන ලෙස ගයනායන දුනහොත් මැනවැයි සිතූහ. ඔවුන් සිතූලෙසම දිව්‍යමය හැඳ පුළුු බීසි බිමෙබොගනාදීවූ ආභරණයන් දුන්හ, අභිප්‍රාය ලෙස එහි සැතපෙමින් පිබිද බමුණුතෙම රජහට කියනුයේ; අපකැම වස්තු පිණිස දූන් කාම්බොජයට බඩු පටවා ගෙන යුමට යමෝද, අපට උවමනාවස්තුවමවේද එසේහෙයින් උවමනා වස්තු දෙන්නාවූ මේ නුගගසෙහි වසන්නාවූ දිව්‍යපුත්‍රයා තිරකොට අල්වාගෙන ආපසු නුවරට යම්හ, එසේ ගියකල්හි මේ දිව්‍යපුත්‍රයා අපකැමැති යම්ම වස්තුවක් අපගේනුවරදිත් මෙසේම දීලන්නේයයිකීය. එබසට අංකුරරජ ඒබමුණාටකියනුයේ: එම බල මිත්‍රද්‍රොහිය අපට මෙසේවූ කාන්තාර මාර්ගයෙහිදී උපකාර කළාවූ දිව්‍ය පුත්‍රයාණන්ට එවැනි බසක් කියනු තබා සිතිනුත් නොසිතවයිකීහ, එකල්හි බමුණාකියන්නාවූ මිත්‍රද්‍රොහිවචනයන් දිව්‍යපුත්‍රතෙම අසා බමුණා සන්තක ගැල් පන්සියයම අනතර්ධාන කොට බමුණාට නොදක්වූයේය. එකල්හි ඒ බමුණා තමා වෙළඳ මට ගෙනයන ගැල් පන්සියයම නොදැක යකුන් බැඳගෙන වස්තු ගන්නා තබා ගැල්පුරාගෙන යන බඩුත් නැතිවීයයි මහත් කුතු හලයෙන් උත්තැතින් නැඟීසිටගොස් ඇතමැතබලා ගැල් පන්සියයම නොදැක මහත් දොම්නස්විය. එසඳ අංකුර රජතෙම ඒ දිව්‍යපුත්‍රයාණන්ට යාච්ඤාකොට ගැල්පන්සියයම බමුණාටදක්වා දීන. එකල්හි අංකුරරජතෙම ඒ දිව්‍යපුත්‍රයා අතින් විචාරනුයේ: කිම්ද දිව්‍යරාජයාණනි නොපගේහස්ත පඤ්චාඞ්ගුලියෙන්කැමැති කැමැති දෑපහළවන්නේය. එහෙයින් තෙපි ශක්‍රදෙවේන්ද්‍රයාණ කෙනෙක්ද, නොහොත් එයින් මත්තෙහි දිව්‍යලොකවලින්කවර කෙනෙක්ද, කවර දෙව්ලොව වසන මහෙශාක්‍ය දිව්‍යපුත්‍රයාණ කෙනෙක්ද, කවර පිනක් කොට මෙබඳු ආනුභාවයක් ලද්දෙහි දැයි පුළුවුත්හ. එයින් කීහ.

"පාණි තෙ සබ්බසොවණ්ණො–පඤ්චධාරො මධුස්සවො,
නානාරසා පග්ඝරන්ති–මඤ්ඤෙහං තං පුරින්දදං.
තෙන පාණි කාමදදො–තෙන පාණි මධුස්සවො,
තෙන තෙ බ්‍රහ්මචරියෙන–පුඤ්ඤං පාණිම්හි ඉජ්ඣති."

යනාදීන් මෙසේ අංකුර රජහු විචාළ කල්හි ඒ දෙවතාවා කියනුයේ: මහරජ මම ශක්‍රදෙවේන්ද්‍රයෙකුත් නොවෙමි, මහෙශාක්‍ය දිව්‍යරාජයෙකුත් නොවෙමි, මිට පූර්ව ජන්මයෙහි මම රෞරුව නු වර සනතාලිගෙමහෙවර කොට රැකුණුයෙක්මි, එකල් ඒ නුවර දිළිඳුන්ට පහන් දන්දෙන අසය්හ සිටාණන්ගේ ගෙට මග විචාළ ... යෙයි අත ඔසවා ... සිකින් අත දිගුකොට පෙන්ලු ...

පිතින් මේ නුගයෙහි රුක්දෙවිව ඉපද දිවසැපත් විඳිනෙම් දන් දෙනගෙය පැපිතින් මා අත දිගුකළකල්හි පසඟිල්ලෙන් කැමැති කැමැති වස්තු ලැබෙන්නේයයි කීහ. එයින් කීහ.

"තෙන පාණී කාමදදෙ-තෙන පාණී මධුස්සවො,
තෙන මෙ බ්‍රහ්මචරියෙන-පුඤ්ඤං පාණිම්හි ඉජ්ඣති."

යනාදීන් ඒ දනයෙහි අනුසස් ඇසූ අංකුර රජතෙම තමා ආකාම් සිඹකොට්ගෙන නුවරටගොස් ඒ මාරවතී නුවර දොළොස් යොදුනක්තැන් භූමිප්‍රදෙශයක පිළිවෙලින්ම ලිප් බඳවා දසවාදහසක් දවස් මුළු දඹදිව වැස්සන්ට මහ දන්දින මෙමගේ දන් දෙනගෙය අතනගා පෑ පමණකින් මෙතෙක් දිව්‍යසම්පත් ලත්කලදන් දුන්නවුන් ලබන දිව්‍යසම්පත් කියනුම කවරේද? මෙපරිද්දෙන් නොයෙක් අනුසස් ඇතිදනය දෙනුවනු විසින් සිල්වතුන් හැඳින උන්වහන්සේලාට දුන් දානයෙහි මහත්ඵලමහානිශංසවන්නේය. කෙසේද? ගවර වළසා හෝ මොළමඟහි හෝ යම් ප්‍රාණී කෙනෙක් උපදිද්ද ඒ ප්‍රාණීහු මෙයින් යපෙත්වයි කියා යම් සත්වයෙක් ආහාර පවත භාජනාදිය ධොවනයකොට දියදමුයේවිනම් මෙපමණකින්පවා කුසල්පිරෙන්නේය මනුෂ්‍යයන්ටදුන්නාවූ දානයෙහි ඵල කියනුම කවරේද, එනකුදුවූවත් සිල්වත් නොනට දුන් දානයෙහි ඵල මහත්වෙයි, තෙසු සාමාන්‍ය තැනට දුන් දානයෙහි ඵල එසේ මහත් නොවන්නේය. හේ එසේමය.

අප බුදුහු බුහුවූ සත්වන අවුරුදු ඇසළ පුර පසළොස්වක උතුරුසළනකාතින් සැවැත්නුවරදීතීර්ථකමානමර්දනයකොරමින් යමක ප්‍රාතිහාර්යය දක්වා මාතෘ දිව්‍යපුත්‍රයාණන් ඇතුළුවූ දිව්‍ය බ්‍රහ්මයන්ට අනුග්‍රහ පිණිස මිනිස්ලොව සිට තුන් පියවරින් ශක්‍ර භවනයටවැඩ ඔහුගේ එක පුණ්ඩරීකනම් උයනෙහිපිහටි පරසතු රුකට පිටලා පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වැඩහුන්සේක. එකල්හි ශක්‍ර බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වරාදීවූ සියලු දිව්‍ය බ්‍රහ්ම සේනාව රැස්වන්නාටපළමුව අංකුරය ඉන්දකයයිගත දිව්‍යපුත්‍රයෝදදෙන උනුන් හාසමඟ කථාකොට බුදුහු අද බණදෙසනු පිණිස මේදිව්‍ය ලොකයට වැඩ පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වැඩහුන්සේක අපි දෙදෙනම පළමුයෙන්ගොසින් බුදුන්ළහමගිඳබණඅසන්ටඋවමැන වැයිකියා දෙදෙනමඅවුත් එයින් ඉන්දකනම් දිව්‍ය පුත්‍රතෙම බුදුන්ගේ දකුණු දණඹල සමීපයෙහිහුන්නේය. අඞ්කුරනම් දිව්‍යපුත්‍රතෙම වම් දණඹල සමීපයෙහිහුන්නේය. ඔවුන් දෙදෙනාගෙන් අංකුරනම් දිව්‍යපුත්‍රයා දෙවිසන්වපිත් එන් එන් මහෙශාක්‍ය දෙවි

* "දස වා දහසක් හැවුරුදු" ඇතැම.

යන්ට ඉඩම් හැර හැර පසු බසිමින් ගොස් දෙළොස් යොදනක් තැන්හි අවසරයක් දැක එතැන්හි ගැගැටි ගැහ වී හුන්නේය. ඉඳකනම් දිව්‍යපුත්‍රයා තමා හුන්තැනම හුන්නේය. එකල්හි පරචිත්ත විජානනයෙහිදක්‍ෂවූ ශාස්තෲන්වහන්සේ මේ දිව්‍යපුත්‍රයන් දෙදෙනා හැම දෙවියන් රැස්වන්නාට පළමුව අවුත් මා සමීපයෙහි හුන් බවත් අංකුර දිව්‍යපුත්‍රයා දෙළොස් යොදනක් හුන් තැනින් පසුගියනියාවත් ඉඳකදිව්‍යපුත්‍රයා හුන්තැනම හුන්නියාවත් දැක බණට පළමුව මේ දිව්‍යපුත්‍රයන් දෙදෙනා ගිය ජාතියෙහි කළාවූ කුසල ඵල දිව්‍යබ්‍රහම සේනාව මධ්‍යයෙහි ප්‍රකාශ කොට දක්‍ෂිණා ක්‍ෂෙත්‍ර ශුඩිවූ දානයෙහි අනුසස්කියමින් පසුව ධම් දෙශනාකළමැනවැයිසිතා බුදුහු පාණ්ඩුකම්බලශෛලාසනයෙහිම වැඩහිඳ අංකුර දිව්‍යපුත්‍රයා බලා මධුමද මුදිත ලලිත රතිකර මනොහර කුරවීකනාදයෙන් සුධර්‍මා නම් දිව්‍ය සභාව එක සුමද පිඩක්සේ කෙරෙමින් බ්‍රහ්මඝොෂා විහිදුවා වදාරනසේක්:

"මහාදානං තයා දින්නං-අංකුර දීඝමන්තරෙ,
සුවිදූරෙ නිසින්නොසි-ආගච්ඡ මම සන්තිකා"

යනාදීන් එම්බල අංකුරය ගිය ජාතියෙහි දෙළොස් යොදනක් තැන් බඳ ලිප්බඳවා දසවාදහසක් දවස් දඹදිව සත්වයන් රැස්කරවා දන්දෙමින් මේ දිව්‍යලොකයෙහි ඉපද දූන් බණ අසනු පිණිස ගැම දෙවියන්ට පළමුව අවුත් මාගේ වාම පාර්ශවයෙහි හිඳ දූන් හුන්නාවූ සථානයෙහි හිඳගත නොහී දෙළොස් යොදනක් පසු බැස ගොස් හිඳින්ට කාරණා කිම්ද එසේ නොහිඳ මෙසේ අවුත් හිඳුවයි වදාළසේක. එසඳ අංකුර දිව්‍යපුත්‍රයා බුදුන් වදාළ වචනය මුදුනෙන් පිළිගෙන හුනස්නෙන් නැඟී සිට දෙනොත් මුදුනෙහි තබා වැඳසිට කියනුයේ: එසේය සවාමීනි මම ගිය ජාතියෙහි දඹදිව මාරවති නම් රාජධානියෙහි අංකුර නම් රජව ඉපද දනයෙහි අනුසස් අසා දන් දුන මැනවයි ආහාරාදිය පිසනු පිණිස දෙළොස් යොදනක් තැන් මුළුල්ලෙහි බඳ ලිප් බඳවා දසවා දහසක් දවස් * මුළුල්ලෙහි සකල ජම්බුද්වීප වාසීන්ටම මහදන් දිනිම්, මෙසේ මහදන් දෙනකල්හි මා දෙන දන් පිළිගන්ට සිල්වත් කෙනෙකුන්වහන්සේ නොලැබ ඒ හැම දුෂ්‍යවූ ශීලඇති පාපිහුම දන්ගත්හ, එසේහෙයින් මා දූන්නාවූ දානය මාගේ චිත්තශුඩියෙනුත් දානය මහත්බැව්නුත් ඒ දානඵලයෙන්දූන් සවර්ගලොකයෙහි උපදිමින් බොහෝ දිව්‍යසම්පත් වඳිනෙම්, එතකුදුවූඑත් ඉඳක දිව්‍යපුත්‍රයාණන්මෙනා හුන්තෙනමහිඳ බණඅසාගත නුහුණුයෙම්, ඒ ඉඳකදිව්‍යපුත්‍රතෙම සිල්වත් ගුණවත්වූ අනුරුධ මහතෙරුන් වහන්සේට එක බත් සරළුවක් පිළිගන්වාලූ කුසලානුභාවයෙන්

* සවුරුදු ඇතැම්,

දුන් දිව්‍යසේනාව මධ්‍යයෙහි තරු පිරිවැරූ පූර්ණචන්ද්‍රයාසේ මහත් ආනුභාවයෙන් දිලිහි දිලිහී හිඳිනේයයි කීය. එයින් කීහ.

"ඔවාදිතො භාවිතත්තෙන-අංකුරො එතදබ්‍රවි,
කිං මයහං තෙන දානෙන-දක්ඛිණෙය්‍යෙන සුඤ්ඤකං.
අයං සො ඉන්දකො යක්ඛො-දජ්ජා දානං පරිත්තකං,
අතිරොචති අම්හෙහි-චන්දො තාරගණෙ යථා."

යනාදීන් අංකුරයා කීකල්හි බුදුහු ඉන්දක දිව්‍යපුත්‍රයාහට වදරන සේක්: එම්බා ඉන්දකය තා හා සමග බණ අසන්ට අවුත් හුන් අංකුර දිව්‍යපුත්‍රතෙම හුන්තැන හිඳගතනොහී දෙලොස් යොදනක් තැන් පසුබට්වූයේය. තෝ දූන් හුන් තැනින් නොඉගිල හිඳිනෙහි වෙද, තෝ ගිය ජාතියෙහි කවරනම් පිනක් කොළෙහිදැයි වදාළසේක. එකල ඉන්දක දිව්‍යපුත්‍රතෙම තමා හුන් තැනින් පැන නැගී බුදුන්ට අභිමුඛව සිට මුදුනෙහි ඇඳිලි බැඳ වැඳ කියනුයේ: ස්වාමීනි පූර්වජාතියෙහි දුගීව ඉපද දොර දොර සිඟමින් ජීවිකාවෘත්තිය කරන කල්හි එක්දවසෙක සිඟා නික්මුණු කල්හි එක් ගෘහයකින් බත්සැන්දක් මාළුදෙසා ගෙනාවුය, එකණෙහි බුදුන් මල්වූ අනුරුද්ධ මහතෙරුන්වහන්සේ එම දොරකඩට සිඟාවැඩිසේක, එවිට මට ගෙනා බත්සැන්ද උන්වහන්සේට පිළිගන්වාපීමි, එසේ සිල්වතුන් වහන්සේට පිළිගැන්වූ බත් සරළුවෙහි අනුසසින් දූන් දිව්‍යලොකයෙහි ඉපද සියලු දෙවියන්ට වැඩිතරම්වූ දිව්‍ය තෙජසින් බබලමින් දිව්‍යසම්පත් අනුභවකරමියි කීය. ඒ ඉන්දක දිව්‍යපුත්‍රයා බුදුන්ට මෙපමණ දන්වමින් ස්වාමීනි නිසරු කෙතක කෙතෙක් බිජුවපුළත් ඵල විපුල නොවන්නේය, ගොවියාගේ සිතට සතුටුත් නොවන්නේයි, එසේහෙයින් දුෂ්‍යවූ සිල් ඇති සඨකූට කෛරාටික ඥතමායාවී ලුබ්ධ අසත්පුරුෂයන්ටදුන්නාවූ දානය ඵල විපුලනොවෙයි. දන්දුන්නාවූ දායකයාහට සන්තොෂත් නූපදවන්නේය. යම්සේ සරුකෙතකමඳබිජුවටක් වපුලේවීනමුත් ඵල බොහෝ වන්නේය. එපරිද්දෙන්ම සිල්වත් ගුණවත් උත්තමයන්වහන්සේට මඳ දානයක් දුනත් එයි කුසලඵල මහත්වන්නේයයි කියමින් සිල්වත් නොවනතැනට දුන් දානයෙහි ඵල මහත් නොවන නියාවත් සිල්වත් තෙනට දුන් දානයෙහි ඵල මහත්තියාවත් මෙපරිද්දෙන්ම කියේය. එසේහෙයින් දක්වනලදමැයි.

"උජ්ජඞ්ගලෙ යථා ඛෙත්තෙ-බීජං බහුකම්පි රොපිතං,
න ඵලං විපුලං හොති-නපි තොසෙති කස්සකං.
තථෙව දානං බහුකං-දුස්සීලෙසු පතිට්ඨිතං,
න ඵලං විපුලං හොති-නපි තොසෙති දායකං.

"යථාපි භද්දකෙ ඛෙත්තෙ-බීජං අප්පම්පි රොපිතං,
සම්මා ධාරං පවෙච්ඡන්තෙ-ඵලං තොසෙති කස්සකං.
තථෙව සීලවන්තස්ස-ගුණවන්තස්ස තාදිසු,
අප්පකම්පි කතං කාරං-පුඤ්ඤං හොති මහප්ඵලං"යි

යනාදීන් ඉන්ද්‍රකයාගේ බස් අසා බුදුහු වදාරනසේක්: එම්බල අංකුරය තෝ ලබන්ට පැමිණි යාචකයන්ට දන්දුන් පමණක් විනා සිල්වත් කෙනෙකුන් නිශ්‍රයකොට දන්නුදුන්නෙහිවේද, එසේහෙයින් තා දොළොස්යොදනක් බඳ ලිප් බඳවා දසවා දහසක් දවස් මුළු දඹදිව වැස්සන්ට මහ වතුරක්සේ අතුරුනොහැර දුන්නාවූ දානය ඉන්ද්‍රකයා තමාට ගෙනා බත් හැන්ද සිල්වත් තැනට පිළිගන්වාලූ කුසලයට සරිනොවන්නේයයි වදාළසේක. මෙසේ දානඵල මහත්භාග වදාරා දන්දෙමින් මහත්ඵල විඳිනා කැමැති සත්පුරුෂයන් විසින් සිල්වත් ගුණවත් මහත්මයන් හැඳින දන් දිය යුත්තේයයි වදාළසේක. වදාරනලදමැයි,

"විචෙය්‍ය දානං සුගතප්පසත්ථං-යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ

යනාදින් දානයෙහි අනුසස් දිව්‍ය බ්‍රහ්ම සෙනාව මධ්‍යයෙහි ප්‍රකාශකොට වදාරා ධර්මදෙශනා කෙරෙමින් දිව්‍යලොකය උපුරුවා සාධුකාර දෙවමින් එතැන්පටන් තුන්මසක් දිව්‍යලොකයෙහි වැඩහිඳ අභිධම් දෙශනාකොට වදාරා දිව්‍ය බ්‍රහ්ම සෙනාව සන්තොෂකරවූසේක. මෙසේ සිල්වත් තැනට දුන් දානයෙහි මහත්ඵල මහානිශංස වන හෙයාව දන සියලු සත්වයන් විසින් තම ශක්ති පමණින් දාන පරිත්‍යාගයකොට එයින් ජනිතවූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් අනුභව කරන්ට උත්සාහ සිතුව යහපති.

තවද එක් කලෙක්හි අපමහ බෝසතාණන් වහන්සේ බරණැස් නුවර මහරජහට පුරෝහිතව වෙලාම බ්‍රාහමණ යයි යන නාමින් ලොකප්‍රසිද්ධ වූසේක, ඒ වෙලාම්නම් බ්‍රාහ්මණ තෙම අභිනව යෞවන අවස්ථාවෙහිම ජම්බුද්වීපයෙහි සුවාසූ දහසක් රජධානිවල රජුන් පුත්‍රවූ සුවාසූ දහසක් රජ කුමාරවරුන් සකල ශිල්ප ශාස්ත්‍රයෙහි නිෂ්පත්තියට පමුණුවා ඒ සියලු රජ කුමාරවරුන්ට ආචාර්යභූපයෙහි සිටිනාහ. ඒ රාජකුමාරවරු මෑතභාගයෙහි තමතමන්ගේ නුවරවල රාජ්‍ය සම්පත්තියෙහි පිහිටා රජසිරිවිඳිනාහු: අවුරුදුපතාම බරණැස් නුවර බ්‍රහ්මදත්ත මහරජහට සේවය කරනු පිණිස එළඹෙන්නාහුය මෙසේ මහරජහු කරා එළඹ සේවය කොට තමන්ට ගුරුවූ පුරෝහිත වෙලාම බ්‍රාහ්මණයාණන් කරා ගොස් ආචාර්යයන්වහන්ස අපි ගෑමරාජ්‍යම බ්‍රාහ්මණයාණන් කරාගොස්

සම්පත්තියෙහි පිහිටා සිටියම්හ, නුඹවහන්සේ කැමැතිදෙයක් අප ඇමට කියමැනව, එසේ කීකල්හි අපි හැම නුඹවහන්සේගේ අභිප්‍රාය සිඬකොට දෙම්හයි කියමින් තම තමන්ගේ නුවරවලටම යෙති. මෙසේ ඒ වෙලාමබ්‍රාහ්මණයා තමා මහත්ඓශ්වර්‍ය්‍යයෙන් බරණැස් නුවර වසන කල්හි එක්දවසක ඉස් සෝධා නහා තමාගේ අනෙකාතිවෙසනයෙහි හිඳ මහත්වූ ශ්‍රී සම්පත්තිය දකිමින් නැවත සමස්ත වස්තූන් දක්නා පිණිස කොටුගුළු අගුළු හරවා සත්වන කුල පරම්පරාවෙහි පටන් පැවත ආවාවූ බොහෝ වස්තූන් දැක එයින් වන අය විය දැමුදු සියිත්ම සනිටුහන්කොට මේ වස්තුරාශිය රැක තබාගෙනහිඳ මතු අසත්පථවීනම් යහපත් නොවන්නේයයි සිතා එනුවරරජකාරන බරණැස්රජහුකරා ගොස් කියනුයේ: දේවයන්වහන්ස මාගේ භාණ්ඩාගාරවල පුරා තිබෙන්නාවූ වස්තු ඉතාම බොහෙව, ඒ හැම වස්තූන් ජම්බුද්වීපයෙහි බොහෝජනයන් රැස්කරවා දන්දෙනු කැමැත්තෙමියි කීහ එබසට මහරජ කියනුයේ: එම්බා පුරොහිතයාණෙනි තොප සන්තකවූ ඒ සියලු වස්තුන්ම තොප කැමැත්තක්කරවයි කීහ එබස්අසා වෙලාම බ්‍රාහ්මණ තෙම තමාගේ පරිවාර ජනයන්ට මෙසෙවර කියා ඒ බරණැස් ගංගාතීරයෙහි සුදුසුවූ භූමිප්‍රදෙශයක දෙළොස්යොදනක් තැන්හි බඳ ලිප් බඳවා ඒ භූමිප්‍රදෙශයෙහි තැන්තැන ඝෘත තෙල මධු ශර්කරා තිල තණ්ඩුල මරිච ලවණාදීවූ උපකරණ රැස්කොට තබනු සඳහා මහත් ගුළු බඳවා ඒ සියලු දානොපකරණයන්ම එහි පුරා රැස්කරවමින් තබා මෙතෙක් මෙතෙක් තෙනට මෙතෙක් මෙතෙක් දෙන සිට දන විධානය කරවුයි කියා මිනිසුන්ට විධාන කොට සමයන්ට වුවමනා යම් දෙයක්ඇත්නම් ඒ සියල්ලක් කිසිවකුත් අඩුනොකොට දුන මැනව, ඉදින් කිසියම් උපකරණයෙක් නොම ඇත්තේ නම් ඒහැම මට කියා අරගනුවයි විධාන කෙළේය මෙසේ පරිවාර ජනයන්ට විධාන කොට දන විධානයට කලස්වා නැවතකියන්නාහු: අසවල්දවස්පටන් වෙලාම බ්‍රාහ්මණයාණන්ගෙන් මහදන් දෙනකාලැයි බරණැස් නුවර බෙර ලවමින් ජනයන්රැස්කොට දන්දෙන දවස් වෙලාමබ්‍රාහ්මණ තෙම දහයක් වටනා සළුවක් හැඳ පන්සියයක් වටනා උත්තර සාටකයක් එකාංශ කොට බඟාගෙන සර්වාභරණයෙන් සැරහී දනාඞ්ගණයට ගොස් තමන්දෙන්නාවූ දනයෙහි ශුබත්වය විමසනු සඳහා ස්ඵටික මණි වර්ණ ජල සම්පූර්ණවූ සවර්ණභිඞ්කාරයක්ගෙන මේ ලොකයෙහි මාදෙන දානය පිළිගන්ට සුදුසු පුද්ගලයෙක් ඇත්තම් මේ සවර්ණභිඞ්කාර කර්ණිකාවෙන් ජලයනික්ම භූමියෙහි පතිතවේවයි නොහොත් ජලය තුබුසේම නොනික්ම සිටිවයි කියා සත්‍ය ක්‍රියා

කොට සුවර්ණභිංකාර කර්ණිකාව අධොමුඛ කෙළේය. එකල්හි ඒ
රන්කෙණ්ඩියෙහිපුරාතුබූ ජලයමඳකුත්නොගිලිහි භිංකාරයෙහිම
රැඳුණේය, එසඳවෙලාම බ්‍රාහමමණතෙම මේජම්බුද්වීපයෙහි මාගේ
දානය පිළිගන්ට සුදුසු දක්ෂිණාර්හ පුද්ගල කෙනෙක් නොම ඇති
වන, එසේ හෙයින් මාගේ දානඵලය යහපත් නොවෙයිසිතා නැව
තත් සිතන්නාහු, එසේවීනම් ප්‍රතිග්‍රාහකයන් අශුද්ධවූවත් දායක
ශුද්ධියෙන් දානයෙහි ඵල මහත්වන්නේ වීනම් මේ භිංකාරයෙහි
කෙමිය අධොමුඛ කළ කල්හි ජලය වහනයවේවයි සිතා කෙණ්ඩි
කෙමිය දෙවෙනිවත් නැමූහ. එසඳ කෙණ්ඩි කෙමියෙන්ජලධාරාව
නික්ම සුළුපිත නාලයක් මෙන් ගොස් භූමිමණ්ඩලය ගලා සිටගත.
එකල මේදන්නාවූ දානය දායකවූ මාගෙන්ම ශුද්ධ වන්නේයයි
සිතා දාන ශාලාවට වැදපිළියෙළකළාවූ දානොපකරණ සම්භාරය
දැක පැමිණියාවූ යාචක සමූහයාට මධුගොළක තිල සකබලිකාදීවූ
මධුර ඛාද්‍යයන්හා මුද්ග මාෂක හර්ජිත තිල තණ්ඩුල මධු ශර්කර
ක්ෂීර නාලිකෙරචූර්ණාදිය බහා පිස ප්‍රතිපාදනය කරනලද රස
කැඳ ආදියෙන්හා මධුරරසයෙන් ආර්ද්‍රවූ සූපව්‍යඤ්ජනසෑත ක්ෂීර
මොරු නවනීතදධිතෙලාදින්සහිත ආහාරයද, අඹජම්බු මොච
මොච ඉක්ෂු පානීය ආදිවූ පානවර්ගද්‍රයයි යනමේ හැම සත්වයන්
ගේ අභිප්‍රායානුකූල ලෙස දන් දෙමින් සතුටු කරවන්නේය,
මෙලෙස මේ දානයෙහි නැති වස්තුවෙක් නම් නොමඇතැයිකියන
තරම් දවසින් දවස වඩ වඩා කාලාතික්‍රාන්ත වනකල්හි නැවතත්
සිතනුයේ; අන්න පානාදියම මතු නොව හිරණ්‍ය ස්වර්ණාදීවූඅනර්ඝ
වස්තූනුත් දානවිෂයෙහිපැවැත්වුව මැනවැයි සිතා මහත්රන්තලි
යක් කරවා ජම්බුද්වීපයෙහි සුවාසූදහසක් රාජධානිවල රාජ්‍යශ්‍රී
විඳිනා තමාගේ ශිෂ්‍යවූ රජදරුවන්ට දූතයන්හාසමඟ රන්තලිය
දෙමින් කියා යවනුයේ; මෙබඳුවූ තලිවලින් රිදී තලිපුරා රත්රන්
එවන්නේය, රන්තලි පුරා රිදී එවන්නේය,රන්රිදී පාත්‍රපුරා සත්
රුවන් එවන්නේය, ඇතුන් සරහා එවන්නේය, රථ සරහා
එවන්නේය, කිරිදෙනුන් සරහා එවන්නේය, ස්ත්‍රීන් සරහා
එවන්නේය, ආසන සරහා එවන්නේය, වස්ත්‍ර මිටි එවන්නේයයි
කියා සුවාසූදහසක් රාජධානිවල සුවාසූදහසක් රජුන්ට මෙපවත්
කියා දූතයන් යවූයේය, එකල සුවාසූදහසක් රජදරුවෝ කියන්
නාහු;සබඳිනිබොහෝකලකින්ආචාර්යයන්වහන්සේ අපට අනුග්‍රහ
කොට සතුටුවචනයක් කියා එවූ නියායයි සන්තොෂයෙන් පුත්
තව සුවාසූදහසක්රාජධානිවලරජදරුවෝ තමන්ගේ ආචාර්යයන්
කියාඑවූලෙසම සතුටුපඬුරු එවන්නාහු; සුවාසූදහසක් රන්තලි
පුරා රිදීකැට බහමින් එහි අතුරු පුරා රිදී පඩූ සමන්වාලමින් එහි

අතුරු පුරා රිදී මසු බහා සමන්වමින් එහි අතුරු පුරා රිදී සුනු සමන්වා පුරවමින් එවූහ තවද එසේම සුවාසූදහසක් රිදීතලි පුරා රන්කැටද රන්පලුද රන් මසුද රන්සුනුද්‍ධයි යනාදී ආදිය අතුරු සමන්වා පුරමින් පෙරසේම රිදීතලි එවූහ. තවද එසේම සුවාසූ දහසක් රන්රිදී තලිපුරා සත්රුවන්ම එවූහ. තවද සවර්ණාභරණ යෙන් සැරහූ සුවාසූදහසක් ගසනී සමූහයාද සිංහචර්මයෙන් පරිෂ්කෘත සමිරත්නයෙන් සැරහූ සුවාසූදහසක් රථද: තවද සවර්ණමය අලංකාරයෙන් සරසනලද සුවාසූදහසක් කිරිදෙනුන්ද,කිරිදොනා පිණිස සවර්ණරජත භාජනද එවූහ. තවද අභිනව යෞවන ප්‍රාප්තවූ රූප සොභා සම්පන්න සුවාසූදහසක්ස්ත්‍රීන් සර්වාභරණයෙන් සරහා එවූහ. විසිතුරුවූ ආස්තරණ අතුල සුවාසූදහසක් ආසන එවූහ. ක්ෂෞම කෞෂෙයාදිවූ වස්ත්‍රයෙන් සම්පූර්ණ නානාවර්ග සුවාසූදහසක් පිළිම්පි එවූහ එකල්හි මෙසේ එවූ දන සම්භාර යන් මහත් ප්‍රදෙශයෙක්හි රැස්කොට සැදූහ, එසින් රන් රිදී තලිසැම රැස්කොට තබනුයේ; බිජුවට සතර මුහක් වපුරන් නාවූ භූමිප්‍රදෙශයෙහි තලිසතරක් තිබුමට ඉඩවගාවිය, තලි පත්ලෙහි සතය නවරියන් පමණය. එතැන්ප ග් පා මුවවිට දක්වා අට්රියන් සතය, තලිය මුවවිට මුදුනෙහි අසුන් සතර දෙනෙකු යෙදූ රථයක් පැදගත හැකිකේය, මෙබඳුවූ මහත් රන් රිදී තලි හා සමග මුතු මැණික් ආදිය බෙදා දන් දෙනු පිණිස දන් ගන්නා යාචකයන් වෙන වෙනම කොට්ඨාස කොට සිටුවා ප්‍රථමයෙන් තලිය ඇතුලෙහිපුරා තුබූ රිදීබෙදා දන්දෙමින් නැවත ඒ රන්තලිය සැඩිසැඩියෙහිදි වෙන්වෙන්කොට ගලවා, වෙන්වෙන්කොට දෙමින්, තවද සුවාසූදහසක් රිදී තලි පුරා තුබූ රන්රන් බෙදාදෙමින් ඒතලි සන්ධි ගලවා වෙන වෙනම දන්දෙමින් තවද සුවාසූ දහසක් රන්රිදී තලි පුරාතුබූසත්රුවන් බෙදාදෙමින් ඒතලිද සන්ධිවලින් ගලවා දන්දෙමින්, තවද සර්වාභරණයෙන් විභූෂිතවූ සුවාසූ දහසක් හස්තීන්ද රත්නාලංකාරයෙන් බබලන සුවාසූ දහසක් රථද, අලංකාරයෙන් සැරහූ සුවාසූ දහසක් කිරි දෙනුන්ද ප්‍රමදා භරණයෙන් සැරහූ සුවාසූ දහසක් ස්ත්‍රීන්ද මුක්තා මාණික්‍යාදී රත්නයෙන් සැරහුවාවූ සුවාසූදහසක් ආසනද නානා වර්ගයෙන් විභාගවූ සුවසූදහසක් පිළිම්පිද යන මේ සියල්ලම මහවතුරක් සේ අතුරු නොහැර දන්දුන්නේය, එදවස් ඒවේලාම බ්‍රාහ්මණයාණන්ගේ පරිවාර ජනයෝ දන්ගත්තවුන්ට උපස්ථාන කරන්නාහු සමහරුන් අඳුම් තබා දැලි බහවති, සමහරුන් නිය වට කරවති, සමහරුන් හිස් සෝධා නහවති, සමහරුන් හිස පීරා බඳවති, සමහරුන් හිඳ සුවඳ සුනු ගල්වති, සමහරුන් ඇඟ උලා

නහවති, සමහරුන් හිස තෙල් ගල්වති, සමහරුන් සුවඳ විලවුන් ගන්වති, සමහරුන් සුවඳ මල් පලඳවති, සමහරුන් වස්ත්‍රාලංකාර යෙන්සරහති, සමහරුන්ආභරණ පලඳවති, සමහරුන් අන්නපාන යෙන් සන්තර්පණය කෙරෙති. සමහරුන්ගේ දරුවන් ඉස් සෝධා නාවා සුවඳඇඟ ගල්වා සුවඳමල් පලඳවා කුමාරාභරණයෙන් සරහා ප්‍රණීතවූ ඛාද්‍ය භොජ්‍යයන් කවා පොවා ඔවුන්ගේ දෙමව් පියන්ගේ උකුලෙහි වඩාලති, දෙමව්පියෝ මේ දරුවෝ අපගේ වෙද්දෙද්දෝ නොවෙද්දෙද්දෝහෝයි සැක ඇතිව පෙරතමන් දරුවන් ගේ ලකුණු බලාහැඳින ගනිති, මෙසේ සියලු සත්වයන්මඔවුනො වුන් නොහඳුනනපරිද්දෙන්වස්ත්‍රාභරණාදියෙන් සරගත්තාහුය. මෙසේ ඒවෙලාම බ්‍රාහ්මණයාණන්ලෞකිකමහජනයාට දුන්නාවූ මහාදානයට සත් අවුරුදු සත්මස් සත්දවසෙක් අතික්‍රාන්තවිය.

මෙසේ අතුරු නොහැර දුන්නාවූ දානයෙහි කුශල ඵලය තිස රණ පිහිටි එකක්හට දුන්නාවූ දානයෙහි සොළොස්වන කොටස යෙන් එක්කොටසයෙනඵලයටත්නොහඟනේය, එසේම තිසරණ පිහිටියන් සියක් දෙනහටදුන් දානයසරණසීලයෙහි පිහිටි එකක් හට දුන් දන් හා සමනොවන්නේය. මෙසේ ශරණසීලයෙහිපිහිටි සියක්දෙනහට දුන්දන් සොවාන් එක්පුද්ගලයක්හට දුන් දන් හා සමනොවන්නේය, සෝවාන් එසියයක් දෙනාහට දුන් දන් සෙදගැමි එක් පුද්ගලයක්හට දුන්දන් හා සම නොවන්නේය, සෙදගැමින් සියක්දෙනහට දුන් දන් අනාගැමි තැනකට දුන්දන් හා සම නොවන්නේය, අනාගැමි සියක්දෙනාහට දුන් දන් රහත් එක නෙනකටදුන්දුන්හා සමනොවන්නේය, රහත් සියක් නෙන කට දුන්දන් එක පසේබුදුකෙනෙකුන් වහන්සේට දුන් දන් හා සමනොවන්නේය; පසේ බුදුන් සියක්දෙනා වහන්සේට දුන්දන් සම්‍යක්සම්බුද්ධවූ එක් කෙනෙකුන් වහන්සේට දුන් දනින් සොළොස් කලාවෙන් කලාවක් පමණත් නොහඟනේය, ඉදින් ජම්බුද්වීපය මහරිතලයක් මෙන් තනා එහි අසුන් පනවා එහි සෝවාන් දස පනතියක්වඩාහිඳුවා සෙදගැමින් පස්පනතියක්වඩාහිඳුවා අනාගැමින් අඩුතුන් පනතියක් වඩාහිඳුවා රහතුන් අඩු දෙපනතියක් වඩාහිඳුවා පසේබුදුන් එක්පනතියක් වඩාහිඳුවා මෙතෙක්දෙනා වහන්සේට මහත් සත්කාරයෙන් දුන්දනට වඩා එක ලොවුතුරා බුදුකෙනෙකුන් වහන්සේට දුන්දානයම උත්කෘෂ්ට වන්නේය, ඒ ලොවුතුරා බුදුකෙනෙකුන් වහන්සේට දුන් දානයට වඩා බුදු පාමොක් මහාසංඝයා වහන්සේට දුන් දන් මහත්ඵල මහානිශංස වන්නේයි, ඒදානයට වඩා දහගබ් මහබෝ ප්‍රතිමාගෘහයෙන්

යුක්තවූ ධර්මය පවත්නාවූ විහාරයක සතරදිගින් වැඩි මහාසංඝයා
වහන්සේ සැතපෙනු පිණිස සාංඝික සංඝාරාමයක් කරවා දොරලි
දොරබා ලවමින් සුරක්ෂිතකොට කෙසියතුරෙන් දොරඅරනා ලෙස
සලස්වා හසනපාද ධොවනාදි පානීය භාජන තබා පවත්නා ලෙස
කරවා දුන් සාංඝික ආවාස දානයෙහිපල මහත්වන්නේය, ඊටවඩා
ප්‍රසන්නවූ චිත්තයෙන් තුනුරුවන්ගේ ශරණශීලය ගත් කුශල ඵල
මහත්වන්නේය; ඊට වඩා ශරණශීලයෙහි පිහිටා පඤ්චශීල සමා
දානයෙහි කුසල ඵල මහත්වන්නේය, ඊටවඩා කිරිබිඳක් දෝනා
පමණකල් විනාඩුත් සියළු සත්වයන් කෙරෙහි මෛත්‍රී භාවනා කළ
හොත් එහි කුසල ඵල මහත්වන්නේය; මේහැම කුසල ඵලයටවඩා
අසුරුසණක් පමණකල් විනාඩුත් අනිත්‍යය, දුක්ඛය, අනාත්මයයි
යන තිලකුණු භාවනා කළහොත් එහි කුසල ඵලය මහත්වන්
නේය; මේතිලකුණු භාවනාව කිරීම ඒකාන්තයෙන්ම තුන්තරා
බොධියෙන් එක්තරාබොධියකට පමුණුවනහෙයින් මේතිලකුණු
භාවනාවම සියල්ලටම අග්‍ර වේ, මෙසේ මේ තිලකුණු භාවනාවම
සියලු කුසලයටම අග්‍රබැවින් මේතිලකුණු භාවනාකොට මාර්ගඵල
ප්‍රාප්තවූ උත්තමයන් විෂයෙහිම දානමානාදිවූ කුසල සම්භාරයන්
නිධානකොට එයින් ජනිතවූ ත්‍රිවිධ සම්පත්තීන් සිද්ධ කටයුතු
බැවින් ත්‍රිවිධ රත්නයම ප්‍රතිෂ්ඨාධාරකොටදානාදී කුශලකර්මයන්
රැස්කොට ගත යුත්තෝය,

ත්‍රිවිධරත්නයටකෙසේදන්දියයුත්තේද? බුදුන් ජීවමානකාල
යෙහි චතුර්විධප්‍රත්‍යයෙන් උපස්ථානකොට කුසල් රැස්කෙරෙමින්
පිරිනිවන් පෑ කල්හිද බුදුන් උදෙසා ධාතු චෛත්‍යාදියෙහි පූජා
පවත්වමින් කුශල් සම්භාරයන් රැස්කරනුයේ, බුදුන් විෂයෙහි
පූජාකෙලේනම් වේ, තවද ධර්මයට පූජාකිරීම නම් ධර්මය මෙනෙහි
නිධාන කොට ධරාගෙන ඒධර්මය සත්වයන් ලඟන්වා කියමින්
ඔවුන් උභයලොකාර්ථසිද්ධි සම්පාදනය කරන්නාවූ ධර්මධරයන්ට
සිව්පස දානයෙන් ඔවුන් අභිප්‍රාය ලෙස උපස්ථානකොට ධර්මය
චිරාත්කාලයක් පවත්නාලෙස වර්ධනය කරන්නවුන් විසින් උභය
ලොකාර්ථ සිද්ධි සම්පාදනයකොට වසන්නාහු ධර්මපූජා කරන්නාහු
නම්වෙති, තවද සංඝයා විෂයෙහි දන්දීමනම් මහාසඞ්ඝයාවහන්සේ
ගේ සුපටිපන්නාදිවූ ගුණ මෙනෙහි කොට අචලවූ ශ්‍රද්ධාවෙන් සිව්
පසයෙන් උපස්ථානකොටකුසල්රැස්කරන්නාහු සංඝයා විෂයෙහි
පූජාකරන්නාහු නම්වෙති, මෙසේ තුනුරුවන් විෂයෙහි දානමා
නාදින් පූජාකරන්නාවූ භය භක්ති පුරස්සර ජනයන් විසින්
මතු විඳිනා දාන ඵල තබා මෙමම ජාතියෙහිදු ඔවුන්ට දෙවියෝද

අභිප්‍රායානුකූලවූලෙස අපි සිඞි සම්පාදනයෙන් ඔවුනුදු නිරන්තරයෙන් රක්‍ෂා කරන්නාහුම වෙති, ඒ කෙසේද?

"යස්මිං පදෙසෙ කප්පෙති—වාසං පණ්ඩිත ජාතියො,
සීලවන්තෙත්ථ භොජෙත්වා—සඤ්ඤතෙ බ්‍රහ්මචාරියො,
යා තත්ථ දෙවතා අසු—තාසං දක්ඛිණමාදිසෙ,
තා පූජිතා පූජයන්ති—මානිතා මානයන්ති නං,
තතො නං අනුකම්පන්ති—මාතා පුත්තං ව ඔරසං,
දෙවතානුකම්පිතො පොසො—සදා භද්‍රානි පස්සති"යි,

යනාදීන් ශුද්ධවූ චිත්තයෙන් දනමානාදියෙහි නියුක්තව වසන්නාවූ සත්ත්වයන් දෙවතාවෝ රක්‍ෂාකරන්නාහු වෙති, ඒ කෙසේදයත්? යටගිය දවස එක් දිනෙක්හි අප මහබෝසතාණන් වහන්සේ වෙළඳ කුලයෙක ඉපද වැඩීවිය පැමිණ ගෘහවාසය කෙරෙමින් පුත්‍රදාරාදීන් දැහැමෙන් රක්‍ෂාකොට වාසය කරණ කල්හි ඕහට ඉක්බිතිව මලණුකෙනෙක්ද ඉපිද වැඩිවිය පැමිණී යහ. මෙසේ ඔවුන් දෙදෙනා දැහැමෙන් ජීවත්ව වසන කල්හි ඔවුන්ගේ පිතෘතෙම කාලක්‍රියා කෙළේය, එකල්හි ඒ දෙබෑයන්ම පිතෘහු සන්තකවූ බඩුවක් වෙළඳම් කොට ගෙන එම්හයි කියා බැහැර ගමකට දෙදෙනම සමග ගොස් වෙළඳම් කොට කහවණු දහසක් ලදින් ඒ කහවණු දහසම එක්කොට පොදියක් බැඳගෙන නැවතත් තමන් වසන ගමටම එනුපිණිස උදසන්හිම කාකී මගට බත්මුලකුත් බැඳගෙන දෙදෙනමඅවුත් අතුරුමග ගංගාවක්සමීපයෙහි රුක්සෙවණක හිඳ බැඳගෙන ආබත්මුල දෙදෙනම එක්ව හිඳ අනුභවකොට හසන මුඛ බොවනය කෙරෙමින් මලණුවන් එතෙන හිත්දදී වැඩිමහළු වෙළඳුණෝ ඒ බතින් ඉතිරිවූ බත්පුහ ඇරගෙන ගංතොටට ගොස් මච්ඡයන්ට බත්ලමින් ඒ ගංගාවෙහි වසන දෙවතාවන්ට පින් දුන්හ. එසඳ ඒගංගාවෙහි වසන දෙවතාවෝද වෙළඳුණන් දුන්නාවූ පින් අනුමෝදන්ව පළමු තමන් විඳුනාවූ දිව්‍ය ඓශ්වර්‍ය්‍යයට වඩා නැවතත් මහත් දිව්‍ය සම්පත් ලදින් මහත් සන්තොෂයෙන් තමන් ලද්දාවූදිව්‍ය සම්පත්තිය ආවර්ජනා කෙරෙමින් වසන්නාහ, එකල්හි ඒ වෙළඳුණෝ ගඟ අස රමණීය වැලිතලායෙක්හි උතුරුසළුව අතුටලා මඳක් සැතපී නිදිගත්හ; එසඳ මලණුවෝ තමන් සොරසිත් ඇතිහෙයින් සොර කමෙහි දක්‍ෂ බැවිනුදු තමන් ගෙනයන කහවනු දහස බැඳි පොට්ටනිය හා සමග නැවතත් එපමණම ගල්පොට්ටනියකුත්බැඳ ඇරගෙන උන්කල්හි වැඩිමහලු වෙළඳුණෝ පිබිද නික්මෙමුහයි කියා මල

ණුවන් කැඳවා ගෙන දෙදෙනම ඔරුවට නැගී ඔරුව පැදගෙන ගංගා මධ්‍යයට පැමිණි කල්හි බාල වෙළඳාණෝ ගඟ මැදෙහිදී අත තිබූ කහවනු පොට්ටනිය දියෙහි වැටී ගියේයි කියා කහවනුපිණිස ගල්පොට්ටනිය දියෙහි එළම්හිසිතා කහවනු පොට්ටනියම දියෙහි හෙලා පුහුසුළුව බෑණන් හඳුනන්නාලෙස ශෝකයක් මෙන්කිය නුයේ, අනේ බෑණන්වහන්ස මාගේ ප්‍රමාදයෙන් අතතුබූ දහසින් බඳපියල්ල මෙතනදියෙහි වැටීගියෙ, කුම් කෙරෙම්දෝහොයිබෑගෑ පත්ව බෑණන්ට කීය, එබසට මැඩිමහලු වෙලඳාණෝ සැබෑවයයි සිතා ගෙන මලණුවන් අත වැරැද වැටීගියා ඊට නලමනා කිම්ද, බැසලා ඇරගන්ටක්බැරිළුව, එසේහෙයින් නුඹ ඊට සොක නොක රන්නැයි මලණුවන් සන්හිඳුවා නික්මගොස් ගොඩට බැස තමන් වසන ගමට වන්හ, එකල්හි ඒවෙලඳ දෙබෑයන්ගෙන් මලණුවෝ සිතන්නාහු, අද මම් බෑණන් වහන්සේ යහපත් කොටම වඤ්චිත කෙරෙමින් දහසින් බඳ පියල්ල මා තතුකොට ගතිම්යි සිතා තමා වසන ගෙයි පච්ඡන්නවූ එක්තැනෙක්හි ගිඳ අනතුබූ පොට්ටතිය මූදපිහ. එකල්හි ඒතුබූයේ ගල්පොට්ටනිය බව දැක ලපැලී යන්නාක්මෙන් මහත් ශොකයෙන් ඇඳට නැගී ගෙට පිටිපා ඇඳ වැලඳගෙන මහත්කොට සුසුම්ලලා හොත්තේය. එකල්හි ගංගා වෙහිවසන දෙවතාවන් මසුන්ට ඒ බතෙහි පින් අනුමෝදන්වදිව සැපත් ලත් හෙයින් ඒ වෙලඳාණන්ට අලාභ නොවන ලෙස ගඟ වැටුණු දහසින් බඳ පියල්ල දෙවතානුභාවයෙන් මච්ඡයකු ගලන ලෙස තලකල්හිඑසඳ මහත්මච්ඡයෙක් කහවණු පොට්ටනියගැල යපිගං බලා දුවනුයේ, කෙවුලන් බැඳි දැලක බැඳුණේය, එකල්හි දැලබැඳි කෙවුලෝ මසුන්ගෙන නුවරටගොස් විකුණන්නාහු,මච්ඡයා මහත්හෙයින් මිල විචාළවුන්ට මහත්කොටඅගයකීහ, කොපමණෙක්ද? එසඳ මස්විකුණන කෙවුලෝ සෙසුමසුන් තබා ඒඑකමච්ඡයාටම සතක් අධිකවූ කහවණු දහසක් මිලයයි කියා මේ මච්ඡයා ගන්නා කෙනෙක් එක් දහස් සතක් කහවණුදී ඇරගනුවයි කීහ, එසඳ කෙවුලන් මච්ඡයාට කී අගය අසා ඇසුඇසූ ජනයෝකියන්නාහු එම්බා සගයෙනි කාවරකලෙක දහසක්කහවණු අගනාමච්ඡයකුන් ඇද්දැයි නොපි කුමක්පිණිස එසේමිල කියවුදැයිකීහ,එබසටඔහුකියන්නාහු, එම්බා සගෙනි! අපගේමච්ඡයාටමිලඑලෙසමය, කනුනම්ඇරගනුවයිකියම්න්වීථියෙහිගෙපිළිවෙලින්ම ගොස් පළමු කහවණු ගඟ හෙළු වෙළඳාණන් වසන ගෙටම ගොස් මච්ඡයා මිලදී ඇරගනුවයි කීහ, එබසට වෙලඳාණෝ කියන්නාහු, තෙපි මේ මච්ඡයා කොතෙක් මිලයට විකුණවුදැයි විචාළහ. එබසට මස් විකු

ණන්නාහු තෙපි කුමක් නුසුවුද වෙන තැනකට දෙමෝ නම් එක් දහස් සතක් කහවණුවට දෙම්හ නුඹට මිනම් කහවණු සතකට දෙම්හයි කීහ එපමන් අසා වෙළඳ තෙම කහවණු සතක්දී මච්ඡයා ඇරගෙන තමාගේ ගෙටදීන. ඔහු ඒ මච්ඡයාගේ උදරවිදාරණය කොට බඩ තුබූ දහසින් බඳ පියල්ල දැක ඒ දහසින් බඳ පියල්ල වෙළඳුණන් අතට දුන්හ. ඒවෙළඳතෙම කහවණු දහස දැක එහි තමා අතින් එබූ ලාඤ්ජනය දැක තමාගේ බවදැන සිතන්නාහු; මේ මච්ඡයාගෙනා පුරුෂයෝ මොහුවෙනතැනකට විකුණතොත් එක්දහස් සත් මස්සකැයි කියා මට සත් මස්සකට දුන්හ. එසේ හෙයින් මා සතු වස්තුව වෙන තැනකට නොපැමිණෙන හෙයින් වනැයි සිතා මේ කාරණාව කිසි කෙනෙකුත්වත් නොදැනෙත්නේය මෙපවත් කිසිවක්හට කීවත් අදහාත් නොගන්නේයයි සිතා මීට කාරණා කුමක් පිණිස විදෙනෙහොයි සමාධිව හුන්කල්හි ඒ ක්ෂණයෙහි එදවස අනුභවකොට ඉතිරිබත් මසුන්ට දන් දුන් පින් අනුමෝදන්වූ ගංගාවෙහි වසනදෙවතාවෝ එතැන්හි ආකාශයෙහි දෘශ්‍යමාන රූපයෙන් සිට කියන්නාහු; එම්බා සත්පුරුෂයාණෙනි තොප එදවස් මසුන්ට දන් දුන් පින් අනුමෝදන්වූ ගංගාවෙහි වසනා දෙවතාවෝ නම් අපිය, එදවස් තොප දුන් පින් අනුමෝදන්වැ මහත් දිව සැපත් ලදුම්හ, ඒ උපකාරය සලකා තොපගේ වස්තුවන් රැකදෙමින් මේකහවණු දහසත් නොපට්ම පත් කළම්හයි කියමින් වෙළඳුණන්ගේ මලණුවන් කළාවූ වංචා ප්‍රයොග සියල්ලම ආද්‍යවසානය කොට වෙළඳුණන්ට කියා නැවතත් කියන්නාහු, එම්බා තොපගේ මලණුවෝ තමන් කළ චාටුක්‍රියාවෙන් කහවණු දහස ලැබගත නුහුනුවෙසින් ලතැවිලිව දැන් දක්වා මහත් ශොකයෙන් වෙහෙස විඳුනෝයයි කියා චාටුසින් ඇතිඅසත් පුරුෂයන්ට වංචාවෙන් වස්තු උපදවා ගනිම්යි සිතුවත් සිඩ නොවන්නේය. අභිවෘද්ධියකුත් නොවන්නේයයි අසත්පුරුෂයන්ගේනු ගුණ ප්‍රකාශකොට ඔහට කියාදැන් තොපදුන්නාවූ සත්පුරුෂදානයෙහි අනුසසින් තොපට සියළු ඓශ්වර්‍ය්‍යම සිඩකොට දෙම්හයි සිතා දැනුදු මේ දහසින් බඳ පියල්ල තොපට්ම පත්කරවූම්හ, එසේ හෙයින් මේ වස්තුව තොපගේ මල්වූ සොරනුවන්ට නොදී සියල්ලම තෙපි රක්ෂාකොට තබාගෙන ප්‍රයොජන විඳුවයිකීහ. එ වෙළඳුණෝද දෙවතාවන් කී වචනයට මහත් සන්තොෂව එතකුදු වූවත් මලණුවන් කෙරෙහිඇති ස්නෙහයෙන් මදකුත් නොතැලී ඒකහවණු දහසින් පන්සියයක් මලණුවන්ට දෙමින් පන්සියයක් තුමූ තබාගෙන ප්‍රයොජන විඳිමින් දනාදී පින්කම් කොට සත්පුරුෂ ධර්මයෙහිම පිහිටියාහ.

මෙසේ දානාදිවූ කුසල කර්මයකළාවූ සත්පුරුෂ සත්වයෝ මේ ජාතියෙහි තමන්ගේ සකලසම්පත්තීන් නොපිරිහී ඥාති මිත්‍රාදීන් හා සමග සකල සම්පත් අනුභව කරන්නාහුය. තවද එම දානාදි කුශලකර්මය කොට සියලු සත්වයන්ට පින් දෙමින් පරාර්ථයද සිද්ධ කරන්නාහුය එසේ ඔවුන් දුන් පින් අනුමෝදන්වූ දිව්‍යමනුෂ්‍යාදි සියළු සත්වයන්ගෙන් කරුණා මෛත්‍රී ආරක්ෂාදිවූ මානනාදියද ලබන්නේය. තවද ප්‍රිය පුත්‍රයක්හට මෑණි කෙනෙකුන් නිරන්තරයෙන් ඇදගිලි ඇතිව රෑදෙබෙහි නොපමාව ඔහුම රක්ෂා කරන්නාක් මෙන් හැම දවස්ම දෙවියෝද ඔහු රක්ෂා කරන්නාහුය. එම කුසල ඵලයෙන් මතු තුන්තරා බෝධියෙන් එක්තරා බෝධියකට පමුණුවන්නේමය එසේ හෙයින් ප්‍රාඥවූ සත්පුරුෂයන් විසින් ශ්‍රද්ධාධ්‍යාශයෙන් යුක්තව දානාධ්‍යාශයද පෙරදැරිකොට ශක්ති පමණින් දියයුතු දානයෙහි අප්‍රමාදව ත්‍රිවිධ සම්පත් හා සම්භ ප්‍රශංසා ලැබ කල්ප වෘක්ෂයක්මෙන් කැමැති කැමැති වස්තු සිද්ධකොට දෙන්නාවූ දානාදි කුශලකර්මය මසුරුසතුරා දුරුකොට දානමිත්‍රයා භජනය කොට සකලාභිවෘද්ධි වර්ධනයකොට ගතයුතු එසේ හෙයින් දක්වන ලදමැයි.

"එවං පසාදකුසුපගතමනසා සුද්ධභාවෙන නිච්චං
දත්වා දානං පයාති තිදිවං හොති පාසංසියො ච,
තස්මා දානං සුරතරුසමං ඉච්ඡිතත්ථප්පදානං
මච්ඡෙරාරිං හනථ සතතං දානමිත්තං භජෙථ."

මෙතෙකින් මේ සද්ධර්මරත්නාකරයෙහි
දානාදි කුශලකර්ම සංග්‍රහ කථාත්මවූ

## සතිස්වන පරිච්ඡේදය

කියා නිමවනලදී.

ඒවං උදුරහදයෙන මනොදයෙන
ලොකුත්තමෙන මිගතා කතසබ්බකිච්චං,
කත්වාන සාධුජනතාය සහෙවහං ච
පප්පොමි සන්තතරසන්තිපුරං සුරම්මං,,

සමස්තලොකයෙහි විද්‍යමාන අනෙකාර්ථයන් විභාගකොට ප්‍රකාශ කළ හෙයින් විභජ්ජවාදී නම්වූ ලොවුතුරා බුදුන් විසින් දෙශනා කළාවූ සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර සද්ධර්ම මෙතෙහි තබා ඒ සද්ධර්මයවූ පරිච්ඡෙදන් පිළිපැද ප්‍රතිපත්තීන් බුදුන් පුදන හෙයින් විභජ්ජවාදියයි කියනලද මහා ස්ථවිරයන්වහන්සේ සම්බන්ධිවූ වචනයක් හෙයින් ථෙරවාද නම්වූ මේධර්මය ප්‍රථමයෙන් පන්සියයක් ස්ථවිරයන්වහන්සේ රැස්ව සංගායනා කළහෙයින්ද දෙවැනිව සත්සියයක් මහාස්ථවිරයන් වහන්සේ රැස්ව සංගායනා කළ හෙයින්ද තුන්වැනිව දහසක් මහා ස්ථවිරයන්වහන්සේ රැස්ව සංගායනා කළහෙයින්ද ස්ථවිරනිකායයි මෙසේ ත්‍රිවිධ නාමයකින් යුක්තවූ ශාසන ධර්මයට ප්‍රතිපක්ෂව සිට බුදුන් වදාළ ශික්ෂාපද ක්‍රමයට සුදුසු ලෙස දවස්හැර ප්‍රතිපත්තිපිරීමෙන් ව්‍යසන විඳ ප්‍රයොජන කිම්දැයි වංචාවෙන් ජනයන් පහදවාගෙන සැපසේ වසම්හයි සිතා බුද්ධ භාෂිතවූ ශික්ෂා පද ධර්මයන්ම රක්ෂා කරන්නවුන් මෙන් බුදුබණයයි පෙරළා තමන් කියන නොබණ බණයයි යනුයන්ට ගහවමින් තමතමන් සිතූ සිතූ ලෙසට ලාභසත්කාර උපදනාලෙස බුදුබණ වෙන වෙනම විපරීතකොට ස්ථාවිරීය නිකායට විපක්ෂව වෙන්වූ මහා සංඝිකය, ගොකුලිකය, එකව්‍යවහාරිකය ප්‍රඥප්තිවදීය, බාහුලිකය, චෛත්‍යවාදීය, මහිංසාසකය, වජ්ජිපුත්තකය, ධර්මොත්තරිය, භද්‍රයානිකය, ඡන්නාගාරිකය, සම්මිතීකය, සර්වාස්ති වාදීය, ධර්මගුප්තිකය, කාශ්‍යපීය, සංක්‍රාන්තිකය, සූත්‍රවාදීය, හෙම වතය, රාජගිරිය, සිද්ධාර්ථකය, පූර්වශෛලීය, අපරශෛලීය, වාජිරිය වාදීය, වෛතුල්‍යවාදීය, අන්ධකය, අන්‍ය මහාසංඝිකය, ධර්මරුචිය, සාගලිකය අමරවික්ඛෙපිකය, අධිච්චසමුප්පන්නිකය, අන්තානන්ති කය, සස්සතවාදීය, එකච්චසස්සතවාදීය, අසඤ්ඤිවාදීය, නෙවසඤ්ඤි නාසඤ්ඤිවාදීය, උච්ඡෙදවාදීය, දෘෂ්ටධර්ම නිර්වාණවාදීයයි යනමේ සතිසක් භින්නවූ නිකායාන්තරයන්හා අසම්මිශ්‍රව ජාතිරංගමාණික්‍ය රත්නයක්සේ, නිර්මලව පැවත ආවාවූ ස්ථාවිරීයනිකායයි කියනලද ශ්‍රී බුද්ධශාසනයෙහි පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධසංඛ්‍යාත ත්‍රිවිධ ශාසනොද්වහනයෙන් ප්‍රතිපත්ති ශාසනයොද්‍යොතනය කළ තෙළෙස් ධුතාංගධර අරණ්‍යවාසී මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් පැවතඅවුත් සිංහලද්වීපයෙහි ශාසන

ප්‍රතිෂ්ඨිත අනුරාධපුර නුවර මහමෙව්නා උයනෙහි කරනලද මහාවිහාරයෙහි වාසය කරන්නාවූ මහාසංඝයා වහන්සේගේ පරම්පරාවෙන් අසම්භින්නාන්වය නොහළ පලාබද්ධගල වනවාසීවූ ධර්මකීර්ත්තිපරම්පරානුගතව ස්වදෙශ විදෙශයෙහි ව්‍යාප්තවූ කීර්ත්තියෙන් සම්භාවිත බහුමාන භාජනව ස්වසමය සමයාන්තර තත්වය හා අනෙක භාෂාදී ශාස්ත්‍රාගම විෂයෙහි අශෙෂඥවූ ලාවුතුරු බුදුබව පතා දාන ශීල භාවනාදීවූ සුචරිතයෙහි හැසිර භවකාන්තාරයෙහි දී සැපදායකවූ කාමාවචර කුසලයනුදු රස්කාරනුපිණීස ගත ගත ස්ථානයෙහි බොහෝ බත් මල්පහන් ආදියපූජාකරවමින්,තවද දෙශාන්තරයෙහි ජරාවාසව තුබූ ශ්‍රී ධාන්‍යකමක නම් ගල්විහාරයක් කර්මාන්තයෙන්පෙර පරිද්දෙන්ම ප්‍රකෘතිමත්කරවමින් ඒසලපිළිමගෙහි හැමදවස් ජලස්නානය කරවන අවලොස්රියන් උස වැඩසිටි කිරිසල පිළිම සාමින් දැඟුල්පමණ සුවඳකලල්ගල්වා එහි සෙවූ වනාතිය මල් හටුවෙන් හවු ගසා සදමින් පූජාකොට දෙවනදවස් උදයන මල්පිළිමයක් මෙන් වැඩසිටි සල පිළිම සාමින් සුවඳ දියෙන් ජල ස්නානය කරවා දෙවැනිව තලතෙල් කළුසින් නාවා තුන්වැනිව කිරින්නහවා සතරවැනිව සුවඳ සුණුඋශ්‍රා ප්‍රසන්නජලයෙන් සුවිශුද්ධකොට ජල ස්නානයකරවමින් තලිපුරා පිඬු කිරිබත් හා ඇතුල පාබත් අවුළුහැර පනසින්පනස පන්දහසක් පිඬුපුදවා පූජාකරවමින්, තවද තලතෙලින් එකදවස්ම පාන් කවදහසක් ලවා ඉද්දමල් විසිකෙළක්ද ජය සමන් මල් සත් පණස් ලක්ෂයක්ද පූජාකොට මෙසේ නොයෙක් පූජාකරවමින්, තවද ස්වදෙශයවූ සිංහලවීපසමවැඩ බොහෝපින්රැස්කෙරෙමින් අලවතුගෙර්පර්වතාග්‍රයෙහි ගල්මෙහෙවරින් විසිතුරුවිහාරයක්ද සිඳුරුවාණෙණිහි ගඩලාදෙණියේ ගල්අතල මුදුනත ශෛලමය මහත්පිළිමගෙයක්හා දානැබ් පසමුදුනෙහිපිහිටි විසිතුරුගල්කර්මාන්තයෙන් යුක්තකොට සතර දිගට වාරාහිමුඛ ගල් පිළිම ගෙවල් සතරක් හා වහසල් පවුරු පදනම් ආදීවූ සියලු විහාර වින්‍යාසයෙන් සොභමානවූ සද්ධර්මතිලකනම් මහාවිහාරයක්දකරවා බොහෝ පින්රැස් කෙරෙමින්,තවද බොහෝසංඝයාවහන්සේට අසනපිරිවහනතැන් වදුරා බෞද්ධාගම ශාස්ත්‍රාදියපුහුණුකරවා සම්පිකරවමින්තිසමුකනතෙර මහතෙර පදවි අස්වමින් ශාසනාභිවෘද්ධි වර්ධනයකොට, තවද පාරමීසතකය, ජිනානුරාගචරිතයයි යන ධර්ම ප්‍රබන්ධ දෙකක් හා නොයෙක් ගද්‍ය පද්‍ය බන්ධන ධර්මදෙශනාදී අපමණ පෙලේ වැඩ වඩමින් එක්සියදසඅවුරුද්දක් ආයුෂවලඳා වැඩසිට අපවඋපාධ්‍යායව මහණ මහලු පැවිදි කරවූ නණ්ණවාශිෂ්‍ය වංශාභිජාත ශීලවංශ සර්විරාභිධාන ප්‍රථම නාමධෙයක් ඇති ධර්මකීර්ත්ති මහා ස්වාමිපාද

ශාණන්වහන්සේගේ අනුජාතශිෂ්‍ය පුත්‍රවූ මහදෑලිශාවංශ ප්‍රදීපායමාන අනෙක ශාස්ත්‍රාගමඥ සංඝ ගණයා ත්‍රිපිටක වචන වාචනාභිවෘද්ධි දානයෙන් ශාසනය වර්ධනය කෙරෙමින් සත්වානුග්‍රහ පිණිස **සද්ධර්මාලඞ්කාර** නම්වූ මහා ධර්ම ප්‍රබන්ධයක් හා **බාලාවතාර** නම්වූ ශබ්දශාස්ත්‍රයට **සංක්ෂෙප සන්නයක්** හා **ජිනබොධවලි** නම්වූ මාගධික පද්‍ය ප්‍රබන්ධයක් හා නෙසුත් ගද්‍ය පද්‍ය ප්‍රබන්ධ උපදවා පරාර්ථ සංසිද්ධියෙහි තත්පරව වෙසෙමින් ලොකබහුමාන භාජනවූ **දෙවරක්ෂිත** ස්ථවිරාභිධාන **ජයබාහු** මහා ස්ථවිර නම්වූ පූර්වනාමයක්ඇති **දෙවන ධර්මකීර්ති** මහා ස්වාමිපාදයාණන් වහන්සේගේ අනුජාත ශිෂ්‍ය පුත්‍රවූ **විමලකීර්ති** මහා ස්ථවිරපාදයන් විසින් පරරාජ කිරීට භෘඞ්ග චුම්බිත පාදාරවින්ද සමස්තජන මධ්‍යස්ථකරුණා ගුණාන්විත ලංකාශාසනොපකාර අභිරක්ෂිත රත්නත්‍රයොපාසිත අකලඞ්ක භක්තිපුරස්සර අසංභීර වීර වික්‍රමමෙතමන්දිර ශ්‍රීමත් ශ්‍රී **පරාක්‍රමබාහු** මහා රජොත්තමයාණන්ගේ අනුමතියෙන් මේ **සද්ධර්මරත්නාකර** නම්වූ ධර්මව්‍යාඛ්‍යානය රචනාකරනලදී.

තේ එසේම නොවේද, කෙශරීන්ද්‍රවංශොද්භූත සිංහ පොතකයෝ තෘණ භක්ෂණය නොකොට ත්‍රිමදගලිත හස්තිරාජයන්ගේ කුම්භස්ථලය පළා මෙදස් මාංශ අනුභවකොට රුධිරපානයකළාහුයයි යනු ආශ්චර්යයක් නොවන්නාක්මෙන් ධර්මකීර්ති පරම්පරානුගත ශිෂ්‍යානු ශිෂ්‍ය පුත්‍රයන් විසිනුදු ධර්මප්‍රබන්ධ කිරීම කියනුම කවරේද, තේ ආශ්චර්යයක් නොමවන්නේයි. එතකුදුවුවත් ඉහාත්ම භාවයෙහි ලභ්‍යමානවූ කීර්ති ප්‍රශංසාදී අර්ථසිද්ධියක් පිණිස නොවේ. යටගිය දවස **අග්නිදෙවබ්‍රාහ්මණ** නම් අපමහා බෝසතාණන් වහන්සේ විසින් **රෙවත** නම් බුදුන්ට සොලොස් දහසකින් ස්තුති පූජාකොට බුදුබව ප්‍රාර්ථනාකළාක්මෙන් මෙතැන්සිදු මේසතිසක් **පමණ පරිච්ඡෙදයෙන් යුක්තවූ සත්විසිදහස් දෙබණවරක්** සුප්‍රතිෂ්ඨිත ග්‍රන්ථප්‍රමාණවූ ධර්මපද්‍ය **පුෂ්ප** රාශියකින් තුනුරුවන් පූජාකොට මේ ධර්මරසදානයෙන් සත්වයන් සන්තොෂ කරවූවාක් මෙන් එන දවස බොහෝ ජනයන්ට නිවන්රසබෙදදෙමින් පරවැඩ සිද්ධකොට ලොවුතුරු බුදුවෙම්වයි යන අභිමත ප්‍රාර්ථනාව සිද්ධකොට ගන්නාපිණිස කුශලාධ්‍යාශයෙන්රචනාකළාවූමේධර්මප්‍රබන්ධයෙන් සංජනිත ඉෂ්ටවිපාක දායක සියලු කුසලඵල සමහාරයම මෙකට සිවුපස දානයපවත්වාඋපස්ථානකොට සියලුවැඩටම මුල්වපිහිටව සිටි මෙම අපමහාරජොත්තමයාණන්විසින් අසංස්කාරික ස්වභාවයෙන්හෙවත්ස්වහස්තයෙන්කළාක්මෙන් බද්ධාඤ්ජලිව අනුමෝදන් වෙමින් මේ පිහිටින් මෙම ජාතියෙහි ආයුෂය වර්ණය සැපය බලයයි යන චතුර්විධ ධර්මයන් වර්ධනයකොට සකලශ්‍රීන් අනුභාවූ රජ්ජ

සම්පත් විඳ, මත්තෙහිදු දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා සම්‍යක් සම්බෝධි ඥානය හසත ප්‍රාප්තකිරීම යහපති, ගෙත් පුණ්‍ය කුසල ඵල සඵලව ලත් මම ආත්මභාවයෙහිම එක්සියවිසි හවුරුද්දක් පමණකල් මුළුල්ලෙහි පරමායු වළඳනතෙක් ජරා විළි පිළි රෝගාන්තරාය දුරුව ලෝසසුන් බබුළුවා චිරාත්කාලයක් දහැමෙන් වාසයකරන ලෙස ආයුෂය වර්ධනය වීමද, වර්ණනම් ශරීර ප්‍රභාරූප යෞවන ගුණඥාන සංස්ථානප්‍රශංසා රාජසෘද්ධි යශස් තෙජස් ආදිවූ අප්‍රමාණ වර්ණප්‍රතිලාභ වර්ධනවීමද, සැපනම්, ධන ධාන්‍ය උපභොග පරිභොග වස්තුව වර්ධනවීමෙන් වන්නාවූ සැපද, නූපන් භොග ඉපදීමෙන් වන්නාවූසැපද, උපන්භොග බොහෝකලක් නොනැසී පැවැත්වීමෙන් වර්ධනවන්නාවූසැපද, කැමැතිභොගවහාලැබීමෙන් උපදනාවූ සැපද, සම්භොග උදකාග්නි චොර අප්‍රියයන් විසින් නොනැසීමෙන් උපදනාසැපද, නෙත්‍රමාධුර්‍ය්‍යවූ රූප රස සැපද කර්ණමාධුර්‍ය්‍යවූ ශබ්ද රසසැපද, ඝ්‍රාණ මාධුර්‍ය්‍යවූ සුගන්ධ රසසැපද, ජිහ්වා මාධුර්‍ය්‍යවූ අන්නපානාදී අසන රස සැපද, කාය මාධුර්‍ය්‍යවූ ආස්තරණ බිසි බිම්බොහනාදී අනෙකවිධ ස්පර්ශසැපද, මනො මාධුර්‍ය්‍යවූ දන්තධාත්වාදි ත්‍රිවිධරත්නයෙහි ගුණ සලකමින් වඳන මානන දන චෙතනා මෛත්‍රී භාවනාදිවූ මනොනුකූල නොයෙක් චින්තනන්දනයෙන්වර්ධනවන්නාසැපද, බලනම්, ජල පංකාවන ගිරිදුර්ගී නගර වරණාදීන් පරික්ෂිප්තවූ ස්වකීය පුරප්‍රවරයෙහි බලද, පංච ප්‍රධානින් සහිත අභෙද්‍ය චිත්ත සංකල්පනාඇති පක්ෂපාතවූ බොහෝ මන්ත්‍රීවරයන්ගේ බලද, පරරාජසෙනා මර්දනයකෙරෙමින් ජයගෙනදෙන වික්‍රමාන්විත ප්‍රබල පාබල මහසෙනග සහිත එකීභූත හස්ති අශ්වසෙනා බලද, හිතෛෂීවූ ඥාති මිත්‍ර දාසිදාසාදී නොමඳ පරිවාර බලද, රන්රිදී මුතුමැණික් සංඛ්‍යාත අප්‍රමාණ වස්තුබලද සපිරිවර ජනපදධිපතීන්හා නිත්‍යාවරණයෙහි නියුක්තව සිටින සදෙස දෙසවාසී ජනසමූහ සංඛ්‍යාත රාෂ්ට්‍රබලද, පාප ශත්‍රු මර්දනයපිණිස රැස්කළාවූ බොහෝකුසල සෙනාබලද, ආයුරාරොග්‍ය ශ්‍රී ප්‍රඥා මධුර වාක් කාය ශක්ති ආත්ම සැප විශෙෂයෙන් වර්ධනයකොට නිරන්තරයෙන් ආරක්ෂා ලන්නාවූ තුනුරුවන්ගේ බලද, කුශලකර්මානුකූල අනෙකඵලප්‍රදාන ප්‍රවෘත්ති ස්ථිතියට උපස්තම්භව සිටිනා නක්ෂත්‍ර හොරා රාශි කරණ මුහුර්ත චන්ද්‍ර සූර්‍ය්‍යාදිවූ සියලු ග්‍රහබලද, රන්රුවන් වස්ත්‍රාභරණ යාන වාහන ග්‍රාමක්ෂෙත්‍රාදිවූ නොයෙක් පුදපඬුරු ලැබගෙන නිරන්තරයෙන් ආරක්ෂාවෙහි සිටිනා පිරිවර සහිත සතරවරම් දෙව්රජුන් හා තෙසුන් ලොකපාල දෙවදෙව ස්ත්‍රීන්ගෙන් පවත්වනලද ආරක්ෂාබලද, පූජ්‍යදෙවයන්ලත් ස්වකීය කායබලදැයි මෙසේදක්වනලද ආයුවර්ණසැපබල

යයි යන චතුර්විධ ධර්මයන් වර්ණනාව මෙම ජාතියෙහි සකලාභිවෘද්ධින් චිරාත්කාලයක් රාජ්‍යශ්‍රී විඳ මෙයින් මත්තෙහි මෙම මඟුල් සක්වල සකල සමෘද්ධීන් සොභමාන රාජධානිවල දිව්‍ය මාලිගා වැනිවූ ප්‍රාසාදවල වෙසෙමින් චක්‍රරත්නය මාණික්‍ය රත්නය ස්ත්‍රී රත්නය පරිනායක රත්නය ගෘහපති රත්නය හස්ති රත්නය අශ්ව රත්නයයි යන සප්තවිධ රත්නයන් ප්‍රධානවූ සක්විති සැපහිත් අනූන චක්‍රවර්තිරාජ්‍යය කෙරෙමින් අප්‍රමාණවූ මනුෂ්‍ය සම්පත් අනුභවකොට එයින් මත්තෙහි චාතුර්මහාරාජිකය තාවතිංසය යාමය තුසිතය නිර්මාණරතිය පරනිර්මිත වසවර්ති යයි යන සදිව්‍යලෝකයෙහි රන්රුවන්මය දිව්‍ය මාලිගාවල දිව්‍ය සේනාව පිරිවරා දිවසිරිවිඳිමින් එයින්මත්තෙහි බ්‍රහ්මපාරිසජ්ජය බ්‍රහ්මපුරෝහිතය මහාබ්‍රහ්මය පරිත්තාභය අප්පමාණාභය ආභස්සරය පරිත්තසුභය අප්පමාණසුභය සුභකිණ්ණකය වෙහප්ඵලයයි යන දශවිධවූ බඹලොවින් මහබඹසෙන් පිරිවරා ප්‍රීතිසැප අනුභව කෙරෙමින් බ්‍රහ්මසැපත්විඳ මෙසේ බොහෝකාලයක් දිව්‍යමනුෂ්‍ය සම්පත් අනුභවකෙරෙමින් ප්‍රඥාවිශිෂ්ට ශ්‍රද්ධා මුහුකුරුවා පරමතර රසාන්විත නිර්වාණ සම්පත්ති සංඛ්‍යාත සම්‍යක්සම්බෝධි ඥානය හස්තප්‍රාප්ත කෙරෙමින් සකලාභිවෘද්ධි වර්ණනාකිරීම යහපති.

එපරිද්දෙන්ම ජනානන්දනයට හෙතුවූ මේ ධර්මයට මැදහත්වූ නුවණැති සජ්ජනයන් විසින් සිත හෙළා කන්තමා අසමින් මෙතෙහි තබාගෙන මේ ධර්මයවූ පරිද්දෙන් පිළිපැද පර වැඩෙහිම නියුක්ත වෙමින්, හෙවත් සෙසු සැප තබා ඒ ක්ෂණයෙහිම හස්තප්‍රාප්තවූ නිර්වාණසම්පත්තිය දක්වා සංසාරදුක්ඛය මෙන්ගැර සත්වයන් විඳිනා සසරදුක් නිවන්සැපයක් මෙන් සිතාගෙන සසර වැද සත්වයන්ට පිහිටව ඔවුන් හාසමග යසරින් ගොඩනැඟී අමාමහ නිවන්දුටු සුමෙධ තාපසව උපන් අපබුදුන් ඇතුළුවූ සම්‍යක්සම්බුද්ධ වරයන්වහන්සේ මෙන් සත්වාභිවෘද්ධියෙහි නොපමාව හැමකල් හිම සැපයෙහි පිහිටා අමාමහ නිවන්දකින්ට උත්සාහ කටයුතුයි.

---

ඉමං ලිඛිතපුඤ්ඤෙන මෙත්තෙය්‍යං උපසංකමෙ,
පතිට්ඨහිත්වා සරණෙ-සුපතිට්ඨාමි සාසනෙ.
රම්මා භවන්තු සකලාපි ච රාජධානී
ධම්මෙ රමන්තු ජගතිපති චන්දභානු
සම්මොදයන්තු ජනතං සුභකාලමෙසා
සබ්බෙ භවන්තු සුඛිතා මුදිතා සමග්ගා.

චිරස්ථතු.

# ශුද්ධි පත්‍රය.

---

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 2 | 7 | නමස්කාර | නමස්කාරය |
| ,, | 34 | නීලමපීත | නීලපීත |
| ,, | ,, | ලොහිතාවදතා | ලොහිතාවදාතමා |
| 3 | 3 | රනගිලි | රතැගිලි |
| 13 | ගාථාව | | සන්තො සන්තෙහි සහ<br>පුරාණ ජටිලෙහි විප්ප<br>මුත්තො විප්පමුත්තෙහි<br>සිඞ්ගීනික්ඛසවණ්ණො<br>රාජගහං පාවිසි භගවා ,, |
| 15 | 30 | තනානමස්සාමි | තන්නමස්සාමි |
| 16 | 7 | ප්‍රවෘතතීන් | ප්‍රවෘත්තීන් |
| ,, | 21 | අතපපය | අතප්පය |
| ,, | 24 | අතගාමී | අනාගාමී |
| ,, | 31 | දිවසැට | දිවැසට |
| ,, | 32 | ධවජමාලාඇති<br>අභිඥ නැමැති | (මෙපිකාවැඩියි) |
| 20 | 29 | උදුම | උදැම |
| 22 | 12 | චිත්තානන්තතිය | චිත්තසන්තතිය |
| 23 | 4 | නම්වේ | නම්වේ |
| ,, | 8 | සමෘතිසම්‍යක්සමාධි | දෘෂ්ටි |
| 24 | 8 | හෙරඬ්ඬ | හෙරඬ්ඬක |
| 26 | 34 | මූලාදීවූ | මූලාදීවූද |
| ,, | 35 | භවනාදිවූ | භවනාදීවූද |
| 28 | 5 | නැම් | නැමී |
| 35 | 29 | ලඩනගා | උඩනගා |
| ,, | 34 | එකාලෙකවිද | එකාලොකවිද |
| 36 | 10 | කුසුමාලි | කුසමාලි |
| 37 | 1 | අනෙහෙදවූ | අනෙකහෙදවූ |
| ,, | 28 | උන් න්ගේ | උන් උන්ගේ |
| ,, | 38 | යෙදූන් | යොදුන |
| 39 | 8 | පබළුන් | පබලුවන් |
| 40 | 4 | ආනාසානචායතනා | ආකාසානචායතනය |
| 44 | 17 | කම්මධයො | කම්මධාරයො |
| ,, | 26 | අඛ්‍යාතපදය | ආඛ්‍යාතපදය |
| 45 | 17 | ,, | ,, |
| ,, | 20 | නාමඛ්‍යාතො | නාමාඛ්‍යාතො |
| 46 | 17 | නවවේ | නම්වේ |
| ,, | 27 | උපාසිකයසි | උපාසිකායසි |
| 47 | 33 | නීකසිනය | නීලකසිනය |
| 69 | 8 | ඔමූනොවූන් | ඔවුනොවුන් |
| 72 | 19 | නමහාදිසානං | තුමහාදීසානං |
| 76 | 21 | හෙදවනාගි | හෙදවනාගි |
| 80 | 35 | විපවිතඥ | විපචිතඥ |
| 85 | 16 | අඥය | අභසින් |

| පිට | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 87 | 28 | මෙබඳු මඟක්හු | මෙබඳු මඟත්හු |
| 88 | 20 | ඌගගා | ඌගඟ |
| 92 | 34 | ජඟධතව | ජනිතව |
| 97 | 12 | පාරඩාර | පාරුවාර |
| 99 | 31 | ලොංශකකාතම | ලොංගකාතතම |
| 100 | 28 | අමාරසෙ ද | අමාරසබෙද |
| 102 | 2 | මහරුහැවිව | මහරුවිව |
| 108 | 12 | සුහසසාතම් | සුළුසසානම් |
| ,, | 34 | වසන්තාවූ | වසන්නාහු |
| 110 | 28 | බුඩාතතරයක් | බුඩාතතරයක් |
| 114 | 6 | වීවරෙ | චීවරෙ |
| ,, | 21 | සරිවඩු | සිරිවඩු |
| 118 | 22 | තිවත් රදෙර | තිවත්පුරදෙර |
| 121 | 10 | චුඹිත | චුම්බිත |
| ,, | 25 | සැඳුනාවූ | සැඳුනාවූ |
| 127 | 25 | කාළහාර | කළහාර |
| 131 | 28 | මාලමවන් | මාලාමෙන් |
| 133 | 4 | මදකොළින් | මදකොණින් |
| 138 | 13 | සනාතිහ | සනාතිහ |
| 145 | 28 | බෝමඩ | බෝමැඩ |
| 146 | 26 | සතුති සෙෂා | සතුති සොෂා |
| 147 | 10 | යෙදුත් | යොදුන් |
| 150 | 23 | ඊෂහීපථ | ඊගහීපථ |
| ,, | 26 | පිණි | පිණිය |
| 153 | 13 | මහෙශවරාදීවූ | මගෙශවරාදීවූ |
| 155 | 17 | මුලදසාව | මුලදසාව |
| 155 | 18 | හන්තැතිගෙත | හයින්තැතිගෙන |
| 156 | 8 | හවෙයයං | හවෙයය |
| 159 | 29 | දෙකි | මදකින් |
| ,, | 33 | කාරහ | කාරමහ |
| ,, | 35 | තපය | අනපය |
| 161 | 7 | ඓශවයර්ය | ඓශවයර්ය |
| 163 | 2 | දඹුවම්න් | දඹුවමින් |
| ,, | 9 | ආශවයර්ක් | ආශවයර්යක් |
| 166 | 16 | නාග සත කුමාරං | නාගසෙන කුමාර |
| 168 | 4 | වෙහෙසෙන්නේය | වෙහෙසන්නේය |
| 173 | 33 | දෙවියගෙන් | දෙවියන්ගෙන් |
| 176 | 31 | ප්‍රාසාදවහවූ | ප්‍රසාදවහවූ |
| 179 | 21 | වෙම්සී | වෙමියි |
| 180 | 37 | යානාවාහතකින් | යානවාහනයකින් |
| 191 | 35 | පැවිණි | පැමිණි |
| 192 | 10 | සැවර | සැරව |
| 195 | 11 | කොමෙල්‍ය | කොමල්‍ය |
| ,, | 16 | පිරිබඩගත | පිරිබඩගත |
| 195 | 33 | අජ්ජු නාගාදිහු | අජ්ජු නාගාදිහු |
| ,, | 34 | සම්පුලල | සම්පුලල |
| 201 | 37 | වහන්වස්ට | වහන්සේට |
| 209 | 25 | අකනීණක | අකනිණක |

| පිට | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 211 | 21 | අචිනෙතය්‍යවූ | අචින්තෙය්‍යවූ |
| ,, | 36 | බුධඥනය | බුද්ධඥනය |
| 213 | 10 | ව්‍යජිත | ව්‍යජන |
| 217 | 14 | වැවහාර වැවහිත | ව්‍යවහාර ව්‍යවහිත |
| 218 | 34 | පහැයක් | පැහැයක් |
| 224 | 34 | විද්‍රුතයක් | මිද්‍රුතයක් |
| 227 | 4 | ඉග | ඉහ |
| 236 | 9 | මගාකාශ්‍යප | මහාකාශ්‍යප |
| 238 | 4 | චතුර්ගුතා | චතුර්භූතා |
| 243 | 20 | සොෂාකරිවමින් | සෝෂාකරවමින් |
| 249 | 17 | සපදනචාරිකාඞ්ගයා | සපදානචාරිකාඞ්ගය |
| ,, | 28 | හැර | හර |
| 258 | 27 | සතට | සිතට |
| 259 | 32 | මඩ්ඣිමනිකාය | මජ්ඣිමනිකාය |
| 260 | 28 | ඉතිවුත්තක | ඉතිවුත්තක |
| 261 | 23 | ජොතියන් | ජොතියෙන් |
| ,, | 24 | වැඩසිට | වැඩසිට |
| 262 | 16 | රජිතං | රජතං |
| 265 | 18 | භිසවුකගේ | භිසවකගේ |
| 266 | 21 | සෙඳ වැඳ | සෙද වැද |
| 271 | 22 | චෙටිකා | චෙටිකා |
| 274 | 24 | නික්ඛම්මිත්වාන | නික්ඛමිත්වාන |
| 275 | 18 | පෙරහරන් | පෙරහරින් |
| ,, | 32 | රහත්වූහ | රහත්වූහ |
| 277 | 11 | කොකාගමනව | කොනාගමනනම |
| 282 | 8 | කාලපුමනස දීය | කාලපුමනය දීඝ |
| 283 | 24 | බුඩභාෂිත | බුද්ධභාෂිත |
| 293 | 14 | දනපදය | ආනන්දය |
| 296 | 7 | පිහුටුවා | පිහිටුවා |
| 309 | 11 | විජ්ජුලිඞ්ග | මිජ්ජුලිඞ්ග |
| 315 | 6 | මහුරජහු | මහරජහු |
| 319 | 19 | මාතුගාමදිකාය | මාතුගාමදිකාව |
| 335 | 31 | වගල | වගල |
| 336 | 12 | එමිට | එමිට |
| 343 | 10 | ගාගහාදත්තා | ගාමහාදත්තා |
| 345 | 16 | ගණකගෙයනුදු | ගණකගෙයනුදු |

| පිට | පෙළ | අසුඬ | ශුඬ |
| --- | --- | --- | --- |
| 351 | 22 | කොසේදශක් | කොසේදශත් |
| 354 | 36 | මහහාභ | මහානාග |
| 355 | 1 | සමපතනියමත් | සමාපත්තියටත් |
| 356 | 14 | සුඛමමදිනනවසඳවිදිනුවං | සුඛමමදිනනංවසඳවි දිනුවා |
| 357 | 16 | කෙලවශසග | කෙලශවසන |
| ,, | 25 | වෙනගි | වෙනෙගි |
| 361 | 19 | කිමමත්දේශහෝ | කිමෙක්දේශහෝ |
| 363 | 32 | නාවේදේනොයි | නොවේදේහෝයි |
| 364 | 33 | පරහා | පෙරහා |
| 373 | 32 | මොලකිනු | මොලොකිනුත් |
| 374 | 2 | වහන්සේමට | වහන්සේටම |
| පිට | පෙල | අසුඩ | සුඩ |
| 377 | 12 | දකින්ව | දකින්ට |
| ,, | 13 | එකවරං | එකාවරං |
| 388 | 35 | තෙව | වෙත |
| 392 | 8 | බික්ෂු | භික්ෂු |
| 397 | 22 | හිතෂි | හිතෙසි |
| 398 | 1 | කියම්සි | කියවම්සි |
| 399 | 8 | දවසට | දවසට |
| ,, | 9 | අවිකල | අවිකල |
| 401 | 2 | නම් | නම |
| 405 | 13 | සයලු | සියලු |
| 406 | 29 | ධරුඅත | ධරුගත |
| 407 | 26 | උතත් | උතුන් |
| 416 | 9 | නික්මනයන | නික්මයන |
| 418 | 7 | යපිගත්නාලෙසට | යැපිගත්නංලෙසට |
| ,, | 29 | වලලභ | වලලභ |
| ,, | 32 | විඩනා | වඩනා |
| ,, | 36 | වහන්සෙ | වහන්සේ |
| 419 | 10 | ආහා?රයෙන් | ආහාරයෙන් |
| ,, | 19 | පිළිහත් | පිළිගත් |
| 420 | 28 | වහන්ස | වහන්ස |
| ,, | 34 | දුනුම්හ | දුනුමහ |
| ,, | 35 | උත්වහන්සේ | උත්වහන්සේ |
| 421 | 2 | කාරවා | කාරවා |

| පිට | පෙළ | අසුඬ | ශුඬ |
|---|---|---|---|
| 422 | 31 | ඇකැයි | ඇතැයි |
| 423 | 3 | සුවඳ | සුවඳ |
| ,, | 38 | අභිරමණෙකොට | අභිරමණයකොට |
| 424 | 20 | ප්‍රෙසා්ජන | ප්‍රයොජන |
| 426 | 26 | භුත්මෙතනෙක් | භුක්මෙතනෙක් |
| ,, | 35 | බැහින් | බැගින් |
| 427 | 22 | අවීතියෙහි | අවීචියෙහි |
| 422 | 19 | සහසු | සහස්‍ර |
| ,, | 34 | නැවහ | නැවත |
| 429 | 37 | වාසය | වාසය |
| 432 | 13 | ගුරුව | ගුරුව |
| 433 | 3 | ගාලෙහිලා | ගාලෙහිලා |
| ,, | 20 | දෞවැරික | දෞවාරික |
| 435 | 12 | කෘතාඤ්ජාත් | කෘතඤ්ජාත් |
| 436 | 1 | නොලබ | නොලැබ |
| 439 | 3 | භාවයෙන් | භාවයෙන් |
| ,, | 27 | අපරපරියෙ | අපරාපරියෙ |
| ,, | 30 | දිඨධම්මවෙදනියං | දිඨධම්මවෙදනියං |
| ,, | 34 | සාළෙසක් | සොළසක් |
| 441 | 1 | උපයි | උපධි |
| 444 | 5 | මිවිධ | විවිධ |
| ,, | 6 | ,, | ,, |
| ,, | 9 | තිර්ණා | තීර්ණා |
| 445 | 12 | ප්‍රවෘත්තියෙන් | ප්‍රවෘත්තියෙන් |
| ,, | 30 | නමස්සාමානො | නමස්සමානො |
| 446 | 28 | පැවිදිවුනුමුදු | පැවිදිවූනමුදු |
| ,, | 35 | තීර්පිකයක්හටද | තීර්ථිකයක්හටද |
| ,, | 29 | පණිස | පිණිස |
| 447 | 29 | කියවූද | කියවූද |
| 450 | 20 | පමිණි | පමණ |
| ,, | 27 | චන්ද්‍රාලොකයෙක් | චන්ද්‍රාලොකයෙන් |
| 451 | 31 | වණිත | පණිත |
| 453 | 7 | ශමාදනං | ප්‍රමොදනං |
| 454 | 25 | බදුනු | බැදුනු |
| 455 | 25 | පංචාධිගනම්මේ | පංචාධිගනම්මේ |
| 456 | 23 | උත්සා | උත්සාහ |
| 461 | 10 | වලැක්කාහට | වැලැක්කාහට |
| 462 | 13 | | |

| පිට | පෙල | අසුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 465 | 4 | පණාතිපතා | පාණාතිපාතා |
| 466 | 36 | ක්දඩා | දුක්ඛං |
| 467 | 15 | එතකුදුවවුත් | එතකුදුවූවත් |
| ,, | 24 | දූටුවාක්මෙන් | දුටුවාක්මෙන් |
| 468 | 14 | සනාතිකෙ | සනාථිකෙ |
| ,, | 16 | කෘභ්‍ය | කෘත්‍ය |
| ,, | 26 | ශ්‍රාඩැය | ශ්‍රඩාය |
| 469 | 8 | තමවේ | කම්වේ |
| ,, | 20 | දරුවෙර් | දරුවෙරී |
| ,, | 29 | නොලේද | නොකාලේද |
| ,, | 34 | සම්පතතියස් | සම්පත්තියක් |
| ,, | 37 | එැටෙති | වැටෙති |
| 471 | 27 | සැපයෙත්ශ | සැපයෙත්ද |
| ,, | 34 | තරුන්මෙන්ද | තෙරුන්මෙන්ද |
| ,, | 35 | යකදුඤොර්විධ | යනවතුර්විධ |
| ,, | 36 | වදුලසේක | වදලසේක |
| ,, | ,, | තැවත | නැවත |
| ,, | ,, | දුයකඅයවයක | දුයකඅදුයක |
| 472 | 24 | නොමඅ්න්තේය | නොමඇත්තේය |
| 473 | 23 | ප්‍රකශ | ප්‍රකාශ |
| 476 | 26 | පිහරි | පිහිටි |
| 481 | 3 | බ්‍රාහමමණතෙම | බ්‍රාහ්මණතම |
| ,, | 15 | කාලිකෙරවූණිණ | නාලිකෙරවූණීණ |
| ,, | 25 | එවනෙත්තේය | එවත්තේය |
| 482 | 27 | සකිවලිත් | හැකිවලින් |
| ,, | 32 | සූවසුදගසක් | සුවාසූදගසක් |
| 483 | 23 | දුන්දුන් හා | දුන්දන් හා |
| 484 | 36 | දුතිඵල | දුතඵල |
| 485 | 10 | රක්ෂාකරන්ාහු | රක්ෂාකරන්නාහු |
| ,, | 34 | සම්ග | සමග |
| 487 | 4 | ඒවජයාගෙන් | ඒ මවජයාගේ |
| 488 | 12 | දුතාඛ්‍යශයද | දුතාඛ්‍යාශයද |

මෙහි ඇතමතැනක න, ණ, ල, ළ, ශ, ෂ, යනාදියම්පයයීංශව වැටී තිබේ. ඒ තැන් සුධිපත්‍රයට යොදන්ට ගියොත් සුධිපත්‍රය මහත්වන බැවින් නොයෙදීමු. ඒ නුවනැත්තෝ පිළිගන්වා.